3 1761 07144149 7

ලස්සනට පොත්බදින්නෝ
ඇ. වී. පණ්ඩිත සහ සමාගම
තිරාණාගම, දොඩන්දූව

D. 16

ගාථාපදාර්ථ විවරණ සහිත

# පාලිථූපවංසගැටපදය.

වැලිගම

අග්‍රබෝධි විහාරාධිපතිවංශවර්ණනාධිකාරි ආචාර්ය

බද්දේගම කීර්තිශ්‍රී ධම්මරතන නායකස්ථවිර

පාදයන්වහන්සේ

විසින් සම්පාදිතයි.

---

ඩී. ජේ. සමරවික්‍රම ලොකුහෙට්ටි මහත්මයා

විසින්

කොළඹ හුණුපිටියේ ජිනාලඞ්කාර යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදී.

1928.

LIBRARY
UNIVERSITY OF TORONTO
BQ
354
G37
1936

# Pali Thupawansa Getapada.

With The

# PARAPHRASE OF STANZAS.


By

*Rev. Baddegama Kirthi Sri Dhammaratana High Priest,*

The Principal of

Agrabodhi Pirivena

WELIGAMA.



Printed By

*D. A. Samarawickrama LOkuhetti Esq.*

At Jinalankara Press.

HUNUPITIYA

COLOMBO.

1923.

# සංඥාපනය.

### ගාථාපදාර්ථ විවරණ-සහිත

## පාළිථූපවංස ගැටපදය.

මේ වනාහි "පාළිථූපවංසය" නමැති ප්‍රශස්ත මාගධීග්‍රන්ථය උද්ග්‍රහණධාරණාදීන් පරිශීලනය කරන ආධුනික ජනතානුග්‍රහබුද්ධිපූර්වකව සම්පාදනය කරනලද්දකි. මෙහි "ථූපවංසය"යනු "සුවණ්ණමාලී"නම් අසදෘශ මහාචෛත්‍යරාජයාගේ වංශය හෙවත් කථා ප්‍රවෘත්තිය දීපඞ්කරපාදමූලයෙහි පටන් සවිස්තරව ප්‍රකාශකිරීමෙන් ගද්‍යපද්‍යමිශ්‍රාත්මකව විරචිත මධුරමනොහර මාගධී භාෂාමය ග්‍රන්ථයකි.

පුණ්‍යකාමීසකලසජ්ජනයන්ගේ මනඃ ප්‍රසාදවහවූ ඒ මේ අත්‍යුත්තම චෛත්‍යරාජයා පිළිබඳ පුරාවෘත්තය ප්‍රකාශකොට කරන ලද "සිංහල ථූපවංසය" "මාගධී ථූපවංසය"කියා දෙකක් පැවති බව පෙනේ. "සිංහල ථූපවංසය" සිංහලද්වීපවාසීන්ට මුත් තදන්‍ය දේශිකයන්ට ප්‍රයොජන රහිතවිය. පුරාණ "මාගධී ථූපවංසයද" විරුද්ධ ක්‍රමාගත ශබ්දබාහුල්‍යයෙන් හා කියයුතුමවූ බොහෝකරුණුත් එහි නොකියනලදහෙයින් මෙම ද්විතීය මාගධී ථූපවංසය කරනලද බැව් පෙනේ.

මෙහි ප්‍රස්තුත "සුවණ්ණමාලී" මහාචෛත්‍යරාජයා නම්, ශ්‍රීබුද්ධවර්ෂ 382 වැන්නෙහිදී ලඞ්කාරාජ්‍යශ්‍රී පදප්‍රාප්ත "දුටුගැමුණු අබා" මහ රජාණන් විසින් අනුරාධපුර මහමෙවුනා උයන්හි කරවනලද අති ශ්‍රෙෂ්ඨචෛත්‍යය වේ.

එහි ලුහුඬුපිළිවෙල "මහාවංශයෙහි:-

"දීපප්‍රසාදක ක්ෂීණාශ්‍රව "මහාමහෙන්ද්‍ර" ස්ථවිරතෙමේ "දෙවනපෑතිස්" මහරජහු උපස්ථම්භකකොට ගෙන ශ්‍රීබුද්ධවර්ෂ 236 වැන්නෙහි ලක්දිව සම්බුද්ධශාසන ප්‍රතිෂ්ඨාපනය කරවා වදාළේය, ඒ රජ තෙම ථූපාරාමය පිහිටුවා ඉක්බිති දක්ෂිණ මහාබොධිශාඛාව ගෙන්වා ප්‍රතිෂ්ඨාපනයද කරවී, දිනක් රජු සමග වඩනා මහතෙරුන් වහන්සේ සපුමල් ලැබ එක් බිම්පෙදෙසෙක පුදා නැමද සිටිකල මහත්වූ භූමිකම්පාවක්වූව, රජතෙම එපවත් විචාළේය, එසඳ මහාමහෙන්ද්‍රස්ථවිරතෙම නරෙන්ද්‍රයාණෙනි මේ ස්ථානය කාශ්‍යපාදී

සතර බුදුවරයන්වහන්සේලා විසින් සෙවුනාලද්දේය, අනාගතයෙහි සවිඥ ශාරීරිකධාතු සම්බන්ධවූ ද්‍රෝණයක් නිධාන්කොට උසින් (120) එක්සියවිසිරියන් ප්‍රමාණව කරනලද "සවර්ණමාලීය"යි ප්‍රසිද්ධ මහ සෑයෙක් වන්නේය'යි වදාළේක.

රජතෙමෙ මමම ඒ චෛත්‍යය කරවන්නෙමි'යි කීයේය, ඌපිවී පාලයාණෙනි! මෙහි තොපට බොහෝ කටයුතුවෙති, නෙපි ඒ කටයුතුකරව්, මෙයින් එම් (140) එක්සිය සතලිසකින් මත්තෙහි තොපගේ මුනුබුරෙක් නෙම එය කරවන්නේය, මහරජාණෙනි! තොපගේ සොහොවුරු මහානාගනම් යුවරජුගේ පුත්‍රවූ යටාලතිස්ස නම් නරේන්ද්‍රයෙක් වන්නේය, ඔහුගේ පුත්‍රවූ ගොඨාභය නම් නරේන්ද්‍රයෙක් වන්නේය, ඔහුගේ පුත්‍රවූ කාවන්තිස්ස නම් නරේන්ද්‍රයෙක් වන්නේය, ඔහුගේ පුත්‍රවූ මහත් යසස් ඇති "දුටුගාමණී අභය" නම්වූ මහරජෙක් වන්නේය, මහත් තෙජස් හා වික්‍රම ඇති හෙතෙමේ මෙකී අසදෘශ මහා චෛත්‍යය කරවන්නේය'යි වදාළේක.

රජතෙමේ ස්ථවිරයන්වහන්සේගේ වචනයෙන් එපවත් ලියවා (12) දොළොස්රියන් ගල්ටැඹක් සිටවිය, එපවත් දුහිහුලන් ලියන ලද රන්පටකුදු රාජභාණ්ඩාගාරයෙහි තැබ්බවීය, ඉක්බිති දුටුගැමුණු රජතෙමෙ ඒ අනාගතවාක්‍යය දැක මහාමහෙන්ද්‍රස්ථවිර යන්වහන්සේ විසින් මම දක්නාලද්දෙමි'යි ප්‍රමුදිතව අසඞ්ඛ්‍යයක් අගනා වස්තු සූවිස්සක් හැර කෙළදහසක් ධනපරිත්‍යාගයෙන් ශාස්තෘන්වහන්සේගේ අටවෙනි ධාතුද්‍රෝණය පිහිටුවා ශ්‍රීලඞ්කා ධරණ්‍යකමුකුටශ්‍රීන් විරාජිත "සවර්ණමාලී" මහාචෛත්‍යය කරවී.

ධාතුප්‍රතිෂ්ඨාපන මහාමහොත්සවයෙහි සවිඥ ශාරීරික ධාතුහු අහසට නැගී ද්වාත්‍රිංශද්මහාපුරුෂලක්ෂණාශීත්‍යනුබ්‍යජන ව්‍යාම ප්‍රභාකෙතුමාලාදීන් බබළන්නාවූ බුද්ධවෙෂධාරීව ගණ්ඩම්බනම් වෘක්ෂමූලයෙහිදී මෙන් යමාමහපෙළහර කළාහුය, ඒ දුටු ද්වාදශ කොටියක් දිව්‍යමනුෂ්‍යයෝ රහත්ව නිවන්දුටහ, සෙසු සෝවාන් ආදි තුන්පෙලෙන් නිවන් දුක්කාහු ගණනපථාතික්‍රාන්තාවූහ, රජ තෙමෙ දෙඅතින් ධාතූන්ගෙන ඉදින් ධාතූහු නිරවුල්වන්නාහුද, ඉදින් ධාතූහු ම්භාජනයාට පිළිසරණවන්නාහුද, ශාස්තෘන්වහන්සේ පරිනිර්වාණමංචකයෙහි හොත් ආකාරයෙන් ශයනය කෙරෙත්වා'යි සිතා චෛත්‍යගර්භයෙහි මනාකොට සරසා පිළියෙළකරනලද රුවන්පලඟෙහි තුබූයේය, ධාතූහුද එපරිද්දෙන්ම නිර්මිත බුද්ධ විලාසයෙන් ශයනය කළාහුය.

දුටුගැමුණුරජතෙමේ සුවිසිවසක් පමණවූ තමන්ගේ රාජ්‍ය කාලය තුළ මෙම රුවන්මැලි මහසෑය ඇතුළු එකුන්සියයක් වෙහෙර කරවීය, තවද සසුන් විෂයෙහි මහත් සැදැහැ ඇත්තේ නානාවිධ පින්කම්හි ඇලුණේවිය. මෙම චෛත්‍යය දුටුගැමුණු රජතුමාගේ රාජ්‍යාවසානය පමණේදී කරවනලද බැවින් මීට හවුරුදු 2060 කින් මත්තෙහියයි කල්පනාවේ.

මෙම විතීය පාලිථූපවංසය රචනාකළ මහාස්ථවිරොත්තමයාණන් වහන්සේ නම්; මීට වර්ෂ (673) හයසිය තුන්සැත්තෑවකට පෙර දඹදෙණිනුවර අග්‍රරාජධානියකොට ලංකාරාජ්‍යශ්‍රීපදප්‍රාප්ත "කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු" නරේන්ද්‍රයන්ගේ ධර්මාගාරයෙහි (පුස්තකාලයෙහි) නියුක්තවූ ශාස්ත්‍රාන්තර ප්‍රචලිත වජ්‍රඥාන ඇති සකල පිටකත්‍රය පාරාවාරපාරදර්ශී "වාගීශ්වර"නම් මහාස්ථවිරස්වාමිපාදයන්වහන්සේය, මෙය "මහින්දසෙන"නම් පිරිවෙන් වැසි ත්‍රිපිටකධර මහාස්ථවිරතුමකුගේ ආරාධනායෙන් කරනලද බව ග්‍රන්ථපරිසමාප්තියෙහි පෙනේ, ශාස්ත්‍රාගමට එකඟව මධුර මනොහර පාලිභාෂායෙන් රචනාකරනලද මෙම පොත ඇතම් ආචාර්‍යවරු පාලිභාෂාව ඉගෙනගන්නා ශිෂ්‍යයන්ට අර්ථ කියවීමත් පුහුණුකරවාගෙනද ආවෝය, මේ වනාහි දීපංකරපාදමූලයෙහිදී ලත් නියතවිවරණය පටන් මහාචෛත්‍යාවසානය දක්වා දැනගතයුතු කරුණු රාශියක් අන්තර්ගතකරනලද ග්‍රන්ථයෙකි.

අභිනීහාරකථා, බුද්ධානං ථූපකථා චෙව අභිනීහාරකථා, චූලාමණිදුස්සථූපවනකථා, දසථූපකථා, ධාතුනිධානකථා, චතුරාසීති සහස්සථූපකථා, ථූපාරාමකථා, බොධිආගමනකථා, යොජනථූපකථා, මහියඞ්ගණථූපකථා, මරිචවට්ටිවිහාරකථා, ථූපසාධනලාභකථා, ථූපාරම්භකථා, ධාතුගබ්භරූපවණ්ණනාකථා, ධාතුනිධානකථා, මහාචෙතියකථා, යන සොළොස් පරිච්ඡේදයකින් හා ග්‍රන්ථපරිසමාප්ති ගාථාපංක්තියකින්ද යුක්තයි.

මෙම ග්‍රන්ථය ලංකාවේ ඉතා ටිකතැනක තිබෙන නමුත් භාවිත කරන්නවුන්ට පොත සපයාගැනීම දුෂ්කරව පැවැතිහෙයින් මෙහි තත්වය සලකා මීට හවුරුදු 25 කට පමණ පෙර අප විසින් ඉතා අමාරුවෙන් පොත් කීපයක් සපයාගෙන අපගේ ආචාර්‍යොත්තමවූ පැලියගොඩ විද්‍යාලංකාරපරිවෙණාධිපතිව වැඩසිට ස්වර්ගස්ථවී වදාළ ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය මහොපාධ්‍යායධුරන්ධර රත්මලානේ ධර්මකීර්තිශ්‍රී ධර්මාරාමාභිධාන කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන

සඞ්ඝනායක මාහිමියාණන්වහන්සේගෙන් ලබනලද විශිෂ්ටාධාරත් ඇතිව යථාශක්තීන් ලිපිදෙස්හැර වැලිගම ඇණ්ඩෘ සමරවික්‍රම හාමු මහත්මයා ලවා පෑලියගොඩ "සත්‍යසමුච්චය" යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවනු ලැබුයේය. එම මුද්‍රිත පොත සුලභවූවායින් පසු සමහර ආචාර්යවරයෝ පිරිවෙන්වල ඉගෙනගන්නා ශිෂ්‍යයන්ට මූලදීම පාලිනාමාඛ්‍යාත වරනැඟිලිඳක උගන්වා ඉක්බිතිව මෙම පාලිථූප වංසය ඉගැන්වූවාහුය, සමහරතැන්වල මේදක්වාත් එසේකරනු ලබනබව දනිමු.

"ප්‍රාචීනභාෂෝපකාර සමිතියේ" විභාගවලට හා ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමා විසින් පරිවෙණාධිපතීන් වහන්සේලාගේත් කැමැත්තලෙස පිරිවෙන්වල ඉගැන්වීමට වලංගු කරතිබෙන පුස්තකලේඛනයෙහිද මේ පොත ප්‍රථමවාර්ෂිකවර්ගයට ඇතුලත්කර තිබේ.

මෙය හදරන හදුරවන දෙපක්ෂයටම පහසු පිණිස සන්නයක් හෝ ගැටපදයක් කරතැබීම උවමනා කර්තව්‍යයක්ය'යි උගත් ස්ථවිර කීපනමකගේම ආරාධනා ඇතිවූහෙයිනුත් ගාථාවලට පදානු සන් නය හා පාලිවාක්‍යගම්වල අමාරු පදවලට සන්නයත් ලිවීමෙන් ආධුනිකයන්ට හිතපිණිස "ගාථාපදානු විවරණ සහිත පාලිථූපවංස ගැට පදය" සම්පාදනය කෙළෙමු. මෙය සතුටින් භාවිතකර ප්‍රයොජන ගැනීමෙන් ශාසනොපකාරීවෙත්ය"යි අපෙක්ෂාකරමු.

මෙහි ප්‍රමාදස්ථාන ඇතහොත් අනුකම්පාපූර්වකව අපවෙත දන්වා එවූවිට මතුවරකදී ඇතුළත් කිරීමෙන් ප්‍රසිද්ධ කරවනබව සකල සුධීන් විසින් සැලකියයුතුයි.

මීට,

වැලිගම අග්‍රබොධිවිහාරපරිවෙණාධිපති

බද්දේගම සිරිනි ශ්‍රී ධම්මරතනනායකස්ථවිරයෝය.

1923 මැයි 1[illegible] වෙනි දිනදීය.

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 1 | 19 | හිතහෙතු | හිතහෙතු |
| 2 | 15 | සීයලු | සියලු |
| ,, | 20 | චත්තාබ්බමෙවච | චත්තාබ්බමෙව ච |
| ,, | 23 | ථූපවංශය | ථූපවංසය |
| 3 | 8 | රැස් | රැස් |
| ,, | 28 | කපිලවහයා | රම්මා,රම්‍යවූ;කපිලවහයා |
| ,, | 29 | රම්මා, රම්‍යවූ; එයින් | එයින් |
| 5 | 11 | භොජසිඹාන | භොජසිඹාන |
| ,, | 18 | සරණගමනෙ | සරණාගමනෙ |
| 7 | 7 | පිහිනිවිසේක | පිරිනිවිසේක |
| 11 | 10 | තථෙම | තථෙව |
| ,, | 12 | පිරිනිසේක | පිරිනිවිසේක |
| 16 | 11 | චම්මපරියොගනඩ | චම්මපරියොනඩ |
| 17 | 8 | නිරකලාල් | නිරකළාල් |
| ,, | 16 | මහාවෘත්තව | මහාවෘත්තවූ |
| 19 | 23 | එව | එව |
| 21 | 26 | පණීස | පිණීස |
| 22 | 30 | අබහුගණ්ජ | අඛහුසඝඤ්ජි |
| 23 | 19 | මහාම | මහාව |
| ,, | 22 | රැස්කරවා | රැස්කරවා |
| 24 | 4 | විෂමයකරවූ | විසමයකරවූ |
| 25 | 11 | මතුයෙහි | මතුයෙහි |
| ,, | 17 | සූදගනා | සූදගණා |
| 26 | 18 | රැස්කරන | රැස්කරන |
| 30 | 7 | උපපණ්ඩසි | උපපණ්ඩසි |
| ,, | 27 | පූජෙතුං | පූජෙතුං |
| 32 | 15 | කැවිටිලියක් | කැවිටිලියක් |
| 33 | 9 | බීණසවාගෙව | බීණාසවාගෙව |
| ,, | 18 | යහපත්යොග | යහපත්යොග |
| 35 | 4 | මාමට්ටං | මාවට්ටං |
| ,, | 8 | මහඞ්කො | මහිඞ්කො |
| ,, | 26 | සසසිසසාම | පසසිසසාම |
| 38 | 37 | පමසිඛො | පඤ්චසිඛො |

# ගාථාපදාර්ථ විවරණ සහිත
# පාලි ථූපවංස ගැටපදය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

1 යස්මිං සසිංසු ජිනධාතුවරා සමන්තා
ඡබ්බණ්ණරංසිවිසරෙහි සමුජ්ජලන්තා
නිම්මාය ලොකහිතහෙතු ජිනස්ස රූපං
තං ථූපමබ්භුතතමං සිරසා නමිත්වා.

2 වක්ඛාමහං සකලලොකහිතාවහස්ස
ථූපස්ස සබ්බජනනන්දනකාරණස්ස
වංසං සුරාසුරනරින්දවරෙහි නිච්චං
සම්පූජිතස්ස රතනුජ්ජලථූපිකස්ස.

"ජිනධාතුවරා (ජිනස්ස) රූපං නිම්මාය" (යස්මිං මහාචෙතියෙ) "සසිංසු" "(අහං) තං ථූපං නමිත්වා" "අහං (ථූපස්ස) වංසං වක්ඛාමි'

යනු මෙහි ක්‍රියාකාරකපදසම්බන්ධයි. කෙබඳුවූ ථූපයක් වැඳ කවරක්හුගේ වංශය කියත්තෙහිද යත් ?.

ජිනධාතුවරා, උතුම් සර්වඥධාතූහු; සමන්තා, හාත්පසින්; ඡබ්බණ්ණරංසිවිසරෙහි, ෂඩ්වර්ණරශ්මි සමූහයෙන්; සමුජ්ජලන්තා, අතිශයින් දිලිහෙන්නාහු; ලොකහිතහෙතු, ලොකාර්ථය හෙතුකොට ගෙන; ජිනස්ස, සර්වඥයන් වහන්සේගේ; රූපං, ශ්‍රී ශරීරය; නිම්මාය, නිර්මිතකොට ගෙන; යස්මිං, යම් (රතනවාලිමහා) චෛත්‍යයෙක්හි, සසිංසු, ශයනය කළාහුද; අබ්භුතතමං, අතිශයින් අද්භූතවූ; තං ථූපං, ඒ මහා චෛත්‍යය; සිරසා, උත්තමාඞ්ගය කරණකොට ගෙන; නමිත්වා, වැඳ.

සකලලොකහිතාවහස්ස, සියලුලොකයාහට හිතසැප එළවන්නාවූ; සබ්බජනනන්දනකාරණස්ස, සියලු ජනයන්ගේ මනොනන්දනයට හෙතුවූ; සුරාසුරනරින්දවරෙහි, සුරඅසුරනරශ්‍රෙෂ්ඨයන්

විසින්; නිච්චං, සතතයෙන්; සම්පූජිතස්ස, මනාකොට පුදනලද; රතනුජ්ජලථූපිකස්ස, රත්නයෙන් උජ්වලිතවූ ශෘඞ්ගඇති; ථූපස්ස, (ඒ මහා)චෛත්‍යයාගේ; වංසං, වංශය හෙවත් කථාප්‍රවෘත්තිය; අහං, මම; වක්ඛාමි, කියන්නෙමි.

3 කිඤ්චාපි සො යතිජනෙන පුරාතනෙන
අත්ථාය සීහළජනස්ස කතො පුරාපි
වාක්‍යෙන සීහළු භාසෙනාභිසඞ්ඛතත්තා
අත්ථං න සාධයති සබ්බජනස්ස සම්මා.

සො, ඒ වංශය තෙම; පුරාතනෙන, පූර්වකාලිකවූ; යතිජනෙන, යතිජනයා විසින්; පුරාපි, පූර්වයෙහිද; සීහළජනස්ස, සිංහලද්වීපවාසී ජනයාට; අත්ථාය, වැඩපිණිස; කිඤ්චාපි, කිසිසේත්; කතො, කරන ලද්දේ නමුදු; සීහළභාසෙන, හෙළදිව්හිවූ හෙවත් සිංහලද්වීපයෙහිවූ; වාක්‍යෙන, වාක්‍යයෙන් හෙවත් වචනපඞ්ක්තියෙන්; අභිසඞ්ඛතත්තා, විරචිතහෙයින්; සබ්බජනස්ස, සියලු දෙශවාසී ජනයාට; සම්මා, මනාකොට; අත්ථං, අර්ථසිද්ධිය; න සාධයති, (යම්හෙයකින්) සිද්ධ නොකෙරේද.

4 යස්මා ච මාගධනිරුත්තිකතොපි ථූප-
වංසො විරුද්ධනයසද්දසමාකුලො සො
වත්තබ්බමෙව ච බහුම්පි යතො න වුත්තං
තස්මා අහං පුනපි වංසමිමං වදාමි.

යස්මා ච, යම්හෙයකින්; මාගධනිරුත්තිකතො, මාගධභාෂාවෙන් කරනලද; සො ථූපවංසො අපි, ඒ ථූපවංශය තෙමේත්; විරුද්ධනයසද්දසමාකුලො, විරුද්ධක්‍රමාගතශබ්දයෙන් ආකුලවූයේද; යතො, යම්හෙයකින්; වත්තබ්බං එවච, කියයුතුවවූ; බහුම්පි, බොහෝ කරුණුත්; න වුත්තං, (එහි) නොකියන ලද්දේද; තස්මා, එහෙයින්; අහං, මම; පුනපි, නැවතද; ඉමං වංසං, මේ ථූපවංශය; වදාමි, කියමි.

5 සුණාථ සාධවො සබ්බෙ පරිපුණ්ණමනාකුලං
වුච්චමානං මයා සාධු වංසං ථූපස්ස සත්ථුනො.

සබ්බෙ සාධවො, සියලු සත්පුරුෂයෙනි; මයා, මා විසින්; පරිපුණ්ණං, (කත්වා) සම්පූර්ණකොට; අනාකුලං, (කරිත්වා) නිරාකුලකොට; වුච්චමානං, කියනු ලබන්නාවූ; සත්ථුනො, බුදුන්ගේ; ථූපස්ස වංසං, ස්තූපය පිළිබඳ වංශය හෙවත් කථාප්‍රවෘත්තිය; සාධු, මනාකොට; සුණාථ, ශ්‍රවණය කරව්.

අබ්භුග්ගතෙන, අභිනික්ඛන්තාභීසෙන්; (ඉතා උස් වූ අභීෂෙන්); චාතුද්දීපිකමහාමෙඝො විය, සිව්දිව් මහවැසි සෙයින්; පුප්ඵධූපගන්ධගහනො, මල්දුම්ගඳගත් අත්ඇතිව; විප්පකතචෙසව, අඩාල කල්හිම; ජයසුමනකුසුමසදිසවණ්ණො, බඳුවද මල්බඳු පැහැඇති; සුවණ්ණපාමඬගෙන, රන්පමුදමකින් (රන්හෙළිඹියකින්); ලාඛාරසෙන, ලාක්ෂාරසයෙන්; තින්තා, තෙත්වූ; කිංසුකකුසුමවණ්ණං, කැළ මල්වණීවූ; අපරිමිතසමයසමුපචිතාය, අප්‍රමෙයකාලයෙහි රැස් කරනලද; සරදසමයරජනිකරො, සරත් කාලයෙහි චන්ද්‍රතෙම; ගගනතලං විය, අහස්තලය හොබ්වන්නාක් මෙන්; අජිනජටාවාක චීරානි, අඳුන්දිවසම් දළමඬුළු වැහැරිසිවුරු; සමොධානෙත්වා, රැස්කොට.

6 දීපඞ්කරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො
උස්සීසකෙ මං ඨත්වාන ඉදං වචනමබ්‍රවි.

ආහුතීනං පටිග්ගහො, කම්පල අදහා දෙන සත්කාර දානප්‍රග්‍රහණයට යොග්‍යවූ; ලොකවිදූ, හැමපරිද්දෙන් සියලු ලොකය අවබොධකළාවූ; දීපඞ්කරො, දීපඞ්කරසම්බුද්ධතෙම; මං, මාගේ; උස්සීසකෙ, හිස්දෙර; ඨත්වාන, වැඩසිට; ඉදං වචනං, මේ වචනය; අබ්‍රවී, වදාළසේක.

7 පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ බුද්ධො ලොකෙ භවිස්සති.

ජටිලං, ජටාධාරිවූ; උග්ගතාපනං, කෙලෙස්තවන උග්‍රතපස් ඇති; ඉමං තාපසං, මේ තාපසයා; පස්සථ, බලව්; ඉතො, මෙයින්; අපරිමෙය්‍යෙ කප්පෙ, අප්‍රමෙය කල්පයෙහි; ලොකෙ, ලොකයෙහි; බුද්ධො භවිස්සති, බුදුවන්නේය.

8 අහු කපිලව්හයා රම්මා නික්ඛමිත්වා තථාගතො
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං.

කපිලව්හයා, කිඹුල්වත් නම් පුරයක්; අහූ, වන්නීය; තථාගතො, තථාගතතෙම; රම්මා, රම්‍යවූ එයින්; නික්ඛමිත්වා, නික්ම; පධානං පදහිත්වාන, ප්‍රධන්වීර්‍ය්‍යකොට; දුක්කරකාරිකං කත්වා, දුෂ්කර ක්‍රියාකොට.

9 අජපාලරුක්ඛමූලස්මිං නිසීදිත්වා තථාගතො
තත්ථ පායසම්ගය්හ නෙරඤ්ජරමුපෙහිති.

තථාගතො, ඒ තථාගතතෙම; අජපාලරුක්ඛමූලස්මිං, අජපාල න්‍යග්‍රොධවෘක්ෂමූලයෙහි; නිසීදිත්වා, වැඩහිඳ; තත්ථ, එහි; පායසං,

ක්ෂීරපායසය; අගය්හ, පිළිගෙන; නෙරඤ්ජරං, නෙරංජරානම් නදිය කරා; උපෙහිති, පැමිණෙන්නේය.

10 නෙරඤ්ජරාය තීරම්හි පායාසාදාය සො ජිනො
පටියත්තවරමග්ගෙන බොධිමූලං හි එහිති.

සො ජිනො, ඒ ජිනතෙම; නෙරඤ්ජරාය, නෙරංජරානම් නදියගේ; තීරම්හි, තීරයෙහිදී; පායාසං, කිරිබත; ආදාය, ගෙන; පටියත්තවරමග්ගෙන, පිළියෙළකරනලද උතුම් මාර්ගයෙන්; බොධිමූලං හි, බොධිමූලය කරා; එහිති, එළඹෙන්නේය.

11 තතො පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරො
අස්සත්ථරුක්ඛමූලම්හි බුජ්ඣිස්සති මහායසො.

තතො, ඉක්බිත්තෙන්; මහායසො, මහත්වූ යසස්ඇති; අනුත්තරො, ශ්‍රෙෂ්ඨවූ ඒ තථාගතතෙම; බොධිමණ්ඩං, බෝමැඩ; පදක්ඛිණං කත්වා, පැදකුණුකොට; අස්සත්ථරුක්ඛමූලම්හි, අශ්වත්ථබොධිවෘක්ෂමූලයෙහිදී; බුජ්ඣිස්සති, (බුද්ධත්වය) අවබොධකරන්නේය.

12 ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

ඉමස්ස, (සුමෙධතවුස්වූ) මොහුගේ; ජනිකා මාතා, ජනිකා මාතෘතොමෝ; මායා නාම, මහාමායානම් දෙවියක්; භවිස්සති, වන්නීය; පිතා, පියතෙම; සුද්ධොදනො නාම, සුද්ධොදන නම් මහරජෙක් වන්නේය; අයං, මේතෙම; ගොතමො හෙස්සති, ගෞතමනම් වන්නේය.

13 අනාසවා වීතරාගා සන්තචිත්තා සමාහිතා
කොලිතො උපතිස්සො ච අග්ගා හෙස්සන්ති සාවකා.

කොලිතො, කොලිතතෙමේද; උපතිස්සො ච, උපතිස්සතෙමේය යන දෙදෙන; අනාසවා, ආශ්‍රවරහිතවූ; වීතරාගා, පහකරනලද රාගඇති; සන්තචිත්තා, ශාන්තවූ සිත්ඇති; සමාහිතා, සමාහිතවූ; අග්ගා සාවකා, අග්‍රශ්‍රාවකයෝ; හෙස්සන්ති, වන්නාහුය.

14 ආනන්දො නාමුපට්ඨාකො උපට්ඨිස්සතිමං ජිනං
ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා.

15 අනාසවා වීතරාගා සන්තචිත්තා සමාහිතා
බොධි තස්ස භගවතො අස්සත්ථොති පවුච්චති.

ඉමං ජිනං, මේ සර්වඥයන්ට; ආනන්දො නාම, ආනන්දනම්; උපට්ඨාකො, උපස්ථායකයෙක්; උපට්ඨිස්සති, උපස්ථානය කරන්නේය;

ඛෙමා, ඛේමානම් භික්ෂුණීද; උප්පලවණ්ණා ච, උත්පලවර්ණානම් භික්ෂුණීද යන දෙදෙන; අනාසවා, ආශ්‍රවරහිතවූ, වීතරාගා, වීත රාගීවූ; සන්තචිත්තා, සන්හුන් සිත් ඇති; සමාහිතා, සමාහිතවූ, අග්ගා සාවිකා, අග්‍රශ්‍රාවිකාවෝ; මහෙසිනො, ඍත්නාහුය; තස්ස භගවතො, ඒ බුදුන්ගේ; බොධි, බොධිවෘක්ෂය තෙම; අස්සත්ථොති, අශ්වත්ථයයි; පවුච්චති, කියනු ලැබේ.

## අභිනීහාර කථාවයි.

—+—

සකලං ධම්මධාතුං, සියලු ස්වභාවධර්මයන්ගේ ප්‍රකෘතිය; විචිනන්තො, සොයන්නේ.

16 තදා තෙ භොජයිත්වාන සසඞ්ඝං ලොකනායකං
උපගඤ්ඡුං සරණං තස්ස දීපඞ්කරස්ස සත්ථුනො.

තදා, එකල්හි; තෙ, ඒ රම්මනගරවාසී උපාසකයෝ; සසඞ්ඝං, සඞ්ඝයා සහිතවූ; ලොකනායකං, ලෝකනායකවූ දීපඞ්කර සර්වඥයන්වහන්සේ; භොජයිත්වාන, වළඳවා; තස්ස දීපඞ්කරස්ස සත්ථුනො, ඒ දීපඞ්කරනම් සර්වඥයන්වහන්සේගේ; සරණං උපගඤ්ඡුං, සරණ ගියාහුය.

17 සරණගමනෙ කඤ්චි නිවෙසෙති තථාගතො
කඤ්චි පඤ්චසු සීලෙසු සීලෙ දසවිධෙ පරං.

තථාගතො, ඒ දීපඞ්කර තථාගතතෙම; කඤ්චි, කිසිපුද්ගල කෙනකු; සරණගමනෙ, සරණගමනයෙහි; නිවෙසෙති, පිහිටවූ සේක; කඤ්චි, කිසිපුද්ගලකෙනකු; පඤ්චසු සීලෙසු, පස්වැදෑරුම් ශීලයන්හිද; පරං, අනික් පුද්ගලයකුනකු; දසවිධෙ සීලෙ, දසවැදෑරුම් ශීලයෙහිද පිහිටවූසේක.

18 කස්සචි දෙති සාමඤ්ඤං චතුරො ඵලමුත්තමෙ
කස්සචි අසමෙ ධම්මෙ දෙති සො පටිසම්භිදා.

සො, ඒ සර්වඥතෙම; කස්සචි, කිසිපුද්ගලකෙනකුන්ට; සාමඤ්ඤං, පරමාර්ථයෙන් ශ්‍රාමණ්‍යයයි කියනලද ආර්යඅෂ්ටාඞ්ගික මාර්ගය; දෙති, දුන්සේක, (කස්සචි) උත්තමෙ චතුරො ඵලෙ, උතුම් සතරඵලයන්; (දෙති) කස්සචි, කිසිවෙක්හට, අසමෙ, අසදෘශවූ; පටිසම්භිදාධම්මෙ, (සිවු) පිළිසිඹියා ධර්මයන්; දෙති, දුන්සේක.

19 කස්සචි චිරසමාපත්තියො අට්ඨ දෙති නරාසභො
තිස්සො කස්සචි විජ්ජායො ඡළභිඤ්ඤා පවෙච්ඡති.

නරාසභො, නරොත්තමවූ ඒ තථාගතතෙම; කස්සචි, කිසිවෙක්හට; චිරසමාපත්තියො අට්ඨ, (නීවරණ විගමනයෙන්) ප්‍රධානවූ අෂ්ට සමාපත්තීන්; දෙති, දුන්සේක; කස්සචි, කිසිපුද්ගලයෙකුහට; තිස්සො විජ්ජායො, ත්‍රිවිද්‍යාවන්ද; ඡළභිඤ්ඤා, ෂඩ්අභිඥාවන්ද; පවෙච්ඡති, දුන්සේක.

20 තෙන යොගෙන ජනකායං ඔවදෙති මහාමුනි
යෙන විත්ථාරිකං ආසි ලොකනාථස්ස සාසනං.

මහාමුනි, මහමුනිවූ ඒ සර්වඥතෙම; තෙන යොගෙන, ඒ අනුක්‍රමයෙන්; ජනකායං, ජනසමූහයාට; ඔවදෙති, අවවාදකළසේක; යෙන, ඒ අවවාදය කරණකොටගෙන; ලොකනාථස්ස, ලොකනාථවූ ඒ බුදුන්ගේ; සාසනං, ශාසනය; විත්ථාරිකං ආසි, විශාලවූයේය.

21 මහාහනූ'සභක්ඛන්ධො දීපඞ්කරසනාමකො
බහූජනෙ තාරයති පරිමොචෙති දුග්ගතිං.

මහාහනු, පරිපූර්ණකපොලඵල ඇති; උසභක්ඛන්ධො, වෘෂභරාජයකුගේ කඳට බඳු කඳව ඇති; දීපඞ්කරනාමකො, දීපඞ්කර නම්වූ; සො, ඒ සර්වඥතෙම; බහුජනෙ, බොහෝ ජනයන්; තාරයති, තරණය කරවූසේක; දුග්ගතිං, දුගතියෙන්; පරිමොචෙති, මිදූසේක.

22 බොධනෙය්‍යං ජනං දිස්වා සතසහස්සෙපි යොජනෙ
ඛණෙන උපගන්ත්වාන බොධෙති තං මහාමුනි.

මහාමුනි, මහාමුනිවූ ඒ සර්වඥතෙම; සතසහස්සෙපි යොජනෙ, (නොයෙක්) යොදුන් ලක්‍ෂගණනකින් මත්තෙහි සිටියාවූද; බොධනෙය්‍යං ජනං, සත්‍යාවබොධය කටයුතු ප්‍රජාව; දිස්වා, (බුදුඇසින්) දැක; ඛණෙන, ක්‍ෂණයකින්; තං, ඒ ප්‍රජාව කරා; උපගන්ත්වාන, එළඹ; බොධෙති, අවබොධකරවූසේක.

බන්ධනමොක්ඛං, සංසාරබන්ධනයාගේ මොක්‍ෂය.

23 නහෙව ධාතුයො තස්ස සත්ථුනො විකිරිංසු තා
ඨිතා එකඝනා හුත්වා සුවණ්ණපටිමා විය.

තස්ස සත්ථුනො, ඒ බුදුන්ගේ; ධාතුයො, ධාතූහු; නහි විකිරිංසු එව, නොවිසුරුණාහුමය; තා, ඒ ධාතූහු; සුවණ්ණපටිමා විය, රන්පිළිමයක් මෙන්; එකඝනා හුත්වා, එකඝනව; ඨිතා, වැඩසිටියාහුය.

සතකොට්ටිම සුවණ්ණඝටිකාහි එව, සතකොට කපනලද (හුදු රන්ගුලින්ම;

24 දීපඞ්කරො ජිනො සත්ථා නන්දාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ජිනථූපො ඡත්තිංසුබ්බෙධයොජනො.

ජිනො, පස්මරුන් දිනුවාවූ; දීපඞ්කරො සත්ථා, දීපඞ්කර සර්වඥ තෙම; නන්දාරාමම්හි, නන්දාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේය; තස්ස, උන්වහන්සේගේ, ඡත්තිංසුබ්බෙධයොජනො, සතිස්යොදුනක් උස්වූ; ජිනථූපො, ජිනථූපයතෙම; තත්ථෙව, එහිම (කරවනලද්දේය)

25 පත්තචීවරපරික්ඛාරං පරිභොගඤ්ච සත්ථුනො
බොධිමූලෙ තදා ථූපො තිණියොජනමුග්ගතො.

තදා, එකල්හි; බොධිමූලෙ, බෝමුල; සත්ථුනො, ඒ බුදුන්ගේ; පත්තචීවරපරික්ඛාරං, පාසිවුරු පිරිකර යන; පරිභොගඤ්ච, පාරිභොගික වස්තුන්ද නිධාන්කොට; කරනලද; ථූපො, චෛත්‍යය තෙම; තිණියොජනමුග්ගතො, තුන්යොදුන් උස්වූයේය.

හරිතාලම්මනොසිලාය, රත්හිරියලින්;

26 කොණ්ඩඤ්ඤො කිර සම්බුද්ධො චන්දාරාමෙ මනොරමෙ
නිබ්බායි චෙතියො තස්ස සත්තයොජනිකො කතො.

කොණ්ඩඤ්ඤො කිර සම්බුද්ධො, කොණ්ඩඤ්ඤ නම් සම්‍යක්සම්බුද්ධ තෙම; මනොරමෙ, සිත්කලුවූ; චන්දාරාමෙ, චන්ද්‍රාරාමයෙහිදී; නිබ්බායි, පිරිනිවිසේක; තස්ස, උන්වහන්සේගේ; (ධාතු නිධාන කොට); සත්තයොජනිකො, සත්යොදුන්වූ; චෙතියො, චෛත්‍යයක්තෙම; කතො, කරනලද්දේය.

27. උය්‍යානෙ වසභෙ නාම බුද්ධො නිබ්බායි මඞ්ගලො
තත්ථෙව තස්ස ජිනථූපො තිංසයොජනමුග්ගතො.

වසභෙ නාම උය්‍යානෙ, වසභනම් උයනෙහි; මඞ්ගලො බුද්ධො, මඞ්ගලනම් බුදුරජතෙම; නිබ්බායි, පිරිනිවිසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ජිනථූපො, ජිනචෛත්‍යය; තිංසයොජනමුග්ගතො, තිස්යොදුන් උස්වූයේය.

28 සුමනො යසධරො බුද්ධො අඞ්ගාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ජිනථූපො චතුයොජනමුග්ගතො.

යසධරො කීර්තිධරවූ; සුමනො බුද්ධො, සුමනනම් බුදුරජතෙම; අඞ්ගාරාමම්හි, අඟුනම් අරම්හිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ජිනථූපො, ජිනස්තූපයතෙම; චතුයොජනමුග්ගතො, සිව්යොදුන් උස්වූයේය.

29 රෙවතො පවරො බුද්ධො නිබ්බුතො සො මහාපුරෙ
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

පවරො, ප්‍රවරවූ; සො රෙවතොබුද්ධො, ඒ රෙවතනම් බුදුරජතෙම; මහාපුරෙ, මහාපුරයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තෙසු තෙසු පදෙසතො, ඒ ඒ ප්‍රදෙශයන්හි; ධාතුවිත්ථාරිකං ආසි, දපැතිරීම වූයේය.

30 සොභිතො වරසම්බුද්ධො සීහාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

සොභිතො, සොභිතනම්වූ; වරසම්බුද්ධො, උතුම් සම්‍යක්සම්බුද්ධතෙම; සීහාරාමම්හි, සීහාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තෙසු තෙසු පදෙසතො, ඒ ඒ ප්‍රදෙශයන්හි; ධාතුවිත්ථාරිකං ආසි, ධාතුවිසිරීම වූයේය.

31 අනොමදස්සි ජිනො සත්ථා ධම්මාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ජිනථූපො උබ්බෙධො පණ්ණුවීසති.

ජිනො, පස්මරුන් දිනුවාවූ; අනොමදස්සි සත්ථා, අනවමදර්ශී නම් ශාස්තෘතෙම; ධම්මාරාමම්හි, ධර්මනම් ආරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ජිනථූපො, ජිනචෛත්‍යයතෙම; උබ්බෙධො, උසින්; පණ්ණුවීසති, පස්විසි යොදුන් වූයේය.

අගාමිකාරඤ්ඤෙ, අගාමික අරණ්‍යයෙහි;

32 පදුමො ජිනවරො සත්ථා ධම්මාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

ජිනවරො, ජිනොත්තමවූ; පදුමො සත්ථා, පදුමනම් ශාස්තෘතෙම; ධම්මාරාමම්හි, ධර්මනම් ආරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තෙසු තෙසු පදෙසතො, ඒ ඒ පෙදෙස්හි; ධාතුවිත්ථාරිකං ආසි, ධාතුවිසිරීම වූයේය.

චිණ්ණිවසී ගුම්බා, පුරැළුවී.

33 නාරදො ජිනවසභො නිබ්බුතො සුදස්සනෙ පුරෙ
තත්ථෙව තස්ස ථූපවරො චතුයොජනමුග්ගතො.

ජිනවසභො, ජිනොත්තමවූ; නාරදො, නාරදනම් බුදුරජතෙමේ; සුදස්සනෙ පුරෙ, සුදශීනනම් පුරයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ථූපවරො, උතුම් චෛත්‍යයතෙම; චතුයොජනමුග්ගතො, සිව්යොදුන් උස්වූයේය.

මහාරක්ඛිතො ගුම්බා, මහරැවිතේක්ව.

34 පදුමුත්තරො ජිනො බුද්ධො නන්දාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ථූපවරො ද්වාදසුබ්බෙධයොජනො.

ජිනො, පසේබුදුන් දිනුවාවූ; පදුමුත්තරො ජිනො, පියුමතුරා නම් බුදුරජතෙම; නන්දාරාමම්හි, නන්දාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ථූපවරො, උතුම් චෛත්‍යයතෙම; ද්වාදසුබ්බෙධයොජනො, දොළොස්යොදුන් උස්වූයේය.

35 සුමෙධො ජිනවරො බුද්ධො මෙධාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

ජිනවරො, ජිනොත්තමවූ; සුමෙධො බුද්ධො, සුමෙධනම් බුදුරජතෙම; මෙධාරාමම්හි, මෙධාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තෙසු තෙසු පදෙසතො, ඒ ඒ ප්‍රදෙශයන්හි; ධාතුවිත්ථාරිකං ආසි, ධාතුපැතිරීම වූයේය.

රට්ඨුප්පාදං ගහෙත්වා, රට අයගෙන.

36 සුජාතො ජිනවරො බුද්ධො සීලාරාමම්හි නිබ්බුතො
තත්ථෙව චෙතියො තස්ස තීණි ගාවුතමුග්ගතො.

ජිනවරො, ජිනොත්තමවූ; සුජාතො බුද්ධො, සුජාතනම් සර්වඥතෙම; සීලාරාමම්හි, සීලාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; චෙතියො, චෛත්‍යයතෙම, තීණි ගාවුතෙ, තුන්ගව්වක්; උග්ගතො, උස්වූයේය.

37 පියදස්සී මුනිවරො සලලාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ජිනථූපො තීණියොජනමුග්ගතො.

පියදස්සී මුනිවරො, ප්‍රියදර්ශී මුනීන්ද්‍රනාමතෙම; සලලාරාමම්හි, සලලාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවීසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ජිනථූපො, ජිනචෛත්‍යයතෙම; තීණියොජනමුග්ගතො, තුන්යොදුන් උස්වූයේය.

පුප්ඵඅග්ඝියතොරණාදීනි, මල්ඇගෑ මල්තොරන් ආදියද.

38 අත්ථදස්සී ජිනවරො අනොමාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු ච රට්ඨතො.

අත්ථදස්සී ජිනවරො, අර්ථදර්ශීජිනනාථතෙම; අනොමාරාමම්හි, අනොමාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවීසේක; තෙසු තෙසු ච රට්ඨතො, ඒ ඒ රට්වල; ධාතුවිත්ථාරිකං ආසි, ධාතුපැතිරීම වූයේය.

39 ධම්මදස්සී මහාවීරො කෙලාසාරාමම්හි නිබ්බුතො
තත්ථෙව ථූපවරො තස්ස තීණියොජනමුග්ගතො.

ධම්මදස්සී මහාවීරො, ධර්මදර්ශීනම් බුදුරජතෙම; කෙලාසාරාමම්හි, කෙලාසාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවීසේක; තත්ථෙව, එහිම; තස්ස. උන්වහන්සේගේ; ථූපවරො, උතුම් චෛත්‍යයතෙම; තීණියොජනමුග්ගතො, තුන්යොදුන් උස්වූයේය.

40 සිද්ධත්ථො මුනිවරො බුද්ධො අනොමාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ථූපවරො චතුයොජනමුස්සිතො.

බුද්ධො, චතුස්සත්‍යාවබොධය කළාවූ, සිද්ධත්ථො මුනිවරො, සිද්ධාර්ථ නම් මුනීන්ද්‍රනාමතෙම; අනොමාරාමම්හි, අනොමාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවීසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ථූපවරො, උතුම් චෛත්‍යයතෙම; චතුයොජනමුස්සිතො, සිව්යොදුන් උස්වූයේය.

41 තිස්සො ජිනවරො බුද්ධො නන්දාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ථූපවරො තීණියොජනමුග්ගතො.

ජිනවරො, ජිනනාථනම්වූ; තිස්සො බුද්ධො, තිස්සනම් බුදුරජතෙම; නන්දාරාමම්හි, නන්දාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවීසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ථූපවරො, උතුම් චෛත්‍යය; තීණියොජනමුස්සිතො, තුන්යොදුන් උස්වූයේය.

42 ඵුස්සො ජිනවරො සත්ථා සුනන්දාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

ජිනවරො, ජිනොත්තමවූ; ඵුස්සො සත්ථා; ඵුස්සනම් ශාස්තෘතෙම; සුනන්දාරාමම්හි, සුනන්දාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තෙසු තෙසු පදෙසතො, ඒ ඒ ප්‍රදෙශයන්හි; ධාතුවිත්ථාරිකං ආසි; ධාතු පැතිරීම වූයේය.

සත්තරතනඛචිතං, සත්රුවනින් විසිතුරුකරනලද.

43 විපස්සී ජිනවරොවීරො සුමිත්තාරාමම්හි නිබ්බුතො
තත්ථෙම සො ථූපවරො සත්තයොජනිකො කතො.

වීරො, මහාවීරවූ, විපස්සීජිනවරො, විදර්ශීනම් ජිනෙන්ද්‍රතෙම; සුමිත්තාරාමම්හි, එනම් ආරාමයෙහිදී, නිබ්බුතො, පිරිනිසේක; තත්ථෙව, එහිම; සො ථූපවරො, (උන්වහන්සේගේ) ඒ උතුම් චෛත්‍යයතෙම; සත්තයොජනිකො කතො, සත්යොදුන්කොට කරන ලද්දේය.

44 සිඛී මුනිවරො බුද්ධො දුස්සාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ථූපවරො තිණියොජනමුග්ගතො.

මුනිවරො, මුනීන්ද්‍රවූ; සිඛීබුද්ධො, සිඛීනම් සම්බුද්ධතෙම; දුස්සාරාමම්හි, දුස්සාරාමයෙහිදී නිබ්බුතො, පිරිනිවිසේක; තත්ථෙව. එහිම; තස්ස, උන්වහන්සේගේ; ථූපවරො, උතුම් චෛත්‍යයතෙම; තිණියොජනමුග්ගතො, තුන්යොදුන් උස්වූයේය.

චිත්තීකාරපීතිබහුලො අහොසි, සිත්හිකිරීමෙන් ජනිත ප්‍රීතිය බහුලකොට ඇතිවූයේය.

45 වෙස්සභූ ජිනවරො සත්ථා ඛෙමාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

ජිනවරො, ජිනොත්තමවූ; වෙස්සභූ සත්ථා, වෙස්සභූනම් ශාස්තෘතෙම; ඛෙමාරාමම්හි, ඛෙමාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවිසේක; තෙසු තෙසු පදෙසතො, ඒ ඒ ප්‍රදෙශයන්හි; ධාතුවිත්ථාරිකං ආසි, ධාතු පැතිරීම වූයේය.

46 කකුසන්ධො ජිනවරො ඛෙමාරාමම්හි නිබ්බුතො
තත්ථෙව තස්ස ථූපවරො ගාවුතං නභමුග්ගතො.

කකුසන්ධො ජිනවරො, ජිනොත්තමවූ කකුසඳනම් බුදුරජතෙම, ඛෙමාරාමම්හි, ඛෙමාරාමයෙහිදී; නිබ්බුතො පිරිනිවිසේක; තත්ථෙව,

එහිම, තස්ස, උන්වහන්සේගේ; ථූපවරො, උතුම් චෛත්‍යය; ගාවුතං, ගව්වක්; නභං, අහසට; උග්ගතො, නැංගේය.

පත්තුණ්ණචීනපට්ටකොසෙය්‍යකම්බලදුකූලානිචෙව, පත්තුණ්ණ, පත්තුණ්ණදෙශයෙහි පිළිද; චීනපට්ට, චීනදෙශයෙහි පිළිද; කොසෙය්‍ය, කොසෙය්‍ය පිළිද, කම්බල, පලස්ද; දුකූලානිචෙව, දුහුල්ද; සුවණ්ණපට්ටකච, රන්පටක්ද;

47 කොණාගමනො සම්බුද්ධො පබ්බතාරාමම්හි නිබ්බුතො
ධාතුවිත්ථාරිකං ආසි තෙසු තෙසු පදෙසතො.

කොණාගමනො සම්බුද්ධො, කොණාගමනනම් බුදුරජතෙම; පබ්බතාරාමම්හි, පර්‍වතාරාමයෙහිදී; නිබ්බුතො, පිරිනිවීසේක, තෙසු තෙසු පදෙසතො, ඒ ඒ ප්‍රදෙශයන්හි; ධාතුවිත්ථාරිකං ආසි, ධාතු පැතිරීම වූයේය.

චතාාවතාසම්පත්තියා, චතාරින් සැපයින්; බහි රචනායං, පිටතෙහි පිරවීම පිණිස; කොටිඅග්ඝනකං, කෙළක් අගනාවූ; රතන විචිත්තං, රත්නයෙන් විසිතුරුවූ; එකෙකං සුවණ්ණිට්ඨිකං, එකි එකි රන්උළුක්ද; අබ්භන්තරපූරණායං, ඇතුළත පිරවීම පිණිස; අඩ්ඪකොටිඅග්ඝනකං, අඩකෙළක් (පණස් ලක්‍ෂයක්) අගනාවූ; එකෙකං, එකි එකි රන්උළුක්ද.

48 මහාකස්සපො ජිනො සත්ථා සෙතව්‍යායං හි නිබ්බුතො
තත්ථෙව තස්ස ජිනථූපො යොජනුබ්බෙධ මුග්ගතො.

සත්ථා, ශාස්තෘවූ; මහාකස්සපො ජිනො, මහාකාශ්‍යපනම් බුදුරජතෙම; සෙතව්‍යායං හි, සෙතව්‍යානම් නුවරදී; නිබ්බුතො, පිරිනිවීසේක; තත්ථෙව, එහිම; තස්ස, උන්වහන්සේගේ; ජිනථූපො, ජිනචෛත්‍යය තෙමේ; යොජනුබ්බෙධමුග්ගතො, උසින් යොදුනක් නැංගේය.

49 දීපඞ්කරො ච කොණ්ඩඤ්ඤො මඞ්ගලො සුමනො තථා
අනොමදස්සී බුද්ධො ච නාරදො පදුමුත්තරො.

50 සුජාතො පියදස්සී ච ධම්මදස්සී නරුත්තමො
සිද්ධත්ථ බුද්ධො තිස්සො ච විපස්සී ච සිඛී තථා.

51 කකුසන්ධො කස්සපො චාති සොළසෙතෙ මහෙසයො
ථූපප්පමාණමෙතෙසං පාළියං නෙව ආගතා.

දීපඞ්කරො ච, දීපඞ්කරනම් බුදුරජතෙමේද; කොණ්ඩඤ්ඤො, කොණ්ඩඤ්ඤනම් බුදුරජතෙමේද; මඞ්ගලො, මඞ්ගලනම් බුදුරජ

තෙමේද, සුමනො, සුමනනම් බුදුරජතෙමේද; තථා, එසේම; අනොමදස්සී බුද්ධො ච, අනොමදස්සීනම් බුදුරජතෙමේද, නාරදො, නාරදනම් බුදුරජතෙමේද; පදුමුත්තරො, පදුමුත්තරනම් බුදුරජතෙමේද; සුජාතො, සුජාතනම් බුදුරජතෙමේද; පියදස්සී ච, පියදස්සීනම් බුදුරජතෙමේද; ධම්මදස්සී නරාසභො, නරොත්තමවූ ධම්මදස්සීනම් බුදුරජතෙමේද; සිද්ධත්ථබුද්ධො, සිද්ධත්ථනම් බුදුරජතෙමේද; තිස්සො ච, තිස්සනම් බුදුරජතෙමේද; විපස්සී ච, විපස්සීනම් බුදුරජතෙමේද; සිඛී, සිඛීනම් බුදුරජතෙමේද; තථා, එසේම; කකුසන්ධො, කකුසඳනම් බුදුරජතෙමේද; කස්සපො ච ඉති, කාශ්‍යපනම් බුදුරජතෙමේදැයි; එතෙ සොළසමහෙසයො, මහර්ෂිවූ මේ සොළොස් බුදුවරයෝ වූවාහුද; එතෙසං, මේබුදුවරයන්ගේ; ථූපප්පමාණං, චෛත්‍ය ප්‍රමාණය; පාළියංයෙව, පෙළෙහිම; දස්සිතං, දක්වන ලදී.

52 යස්මා තස්මා මයා සාධු තෙ සබ්බෙපි පකාසිතා
ථූපා සද්ධා ජනා සාධු තෙ වන්දන්තු සාදරං.

යස්මා, යම්හෙයකින්; මයා, මාවිසින්; සාධු, මනාකොට; තෙ සබ්බෙපි ථූපා, ඒ සියලුම චෛත්‍යයෝ; පකාසිතා, ප්‍රකාශකරන ලද්දාහුද; තස්මා, එහෙයින්; සද්ධා ජනා, සැදැහැවත් ජනයෝ; තෙ, ඒ චෛත්‍යයන්; සාධු, මනාකොට; සාදරං, ආදරසහිතව; වන්දන්තු, වඳිව්.

53 සෙසානං පන අට්ඨන්නං සුගතානං හිතෙසිනං
ධාතු විත්ථාරිකා ආසුං තෙසු තෙසු පදෙසතො.

සෙසානං, ඉතිරිවූ; හිතෙසිනං, හිතෛෂීවූ, අට්ඨන්නං සුගතානං පන, බුදුවරයන් අටනමගේ, ධාතු, ධාතූහු; තෙසු තෙසු පදෙසතො, ඒ ඒ ප්‍රදෙශයන්හි; විත්ථාරිකා ආසුං, විස්තාරප්‍රාප්තවූහ.

54. අචෙතනායං පථවී අවිඤ්ඤාය සුඛං දුඛං
සාපි දානබලා මය්හං සත්තක්ඛත්තුං පකම්පථ.

සුඛං දුඛං, සැප දුක් දෙක; අවිඤ්ඤාය, නොදැන පවත්නාවූ; අචෙතනා, චෙතනාරහිතවූ (යම් පෘථිවියක්වීද) සාපි අයං පථවී, ඒ මේ පෘථිවිතොමෝත්; මය්හං, මාගේ; දානබලා, දානබලයෙන්; සත්තක්ඛත්තුං, සත්වරක්; පකම්පථ, කම්පාවූවාය.

අභිගජ්ජිත්වා, අභිගර්ජනය කොට; දුබ්බණ්ණියං, දුර්වර්ණීබවට; ඔක්කාමිනී, පැමිණියයි.

55 යදාහං තුසිතෙ කායෙ සන්තුසිතො නාමහං තදා
දසසහස්සී සමාගන්ත්වා යාචන්ති පඤ්ජලී මමං.

අහං, මම; යදා, යම්කලෙක්හි; තුසිතෙ කායෙ, තුෂිතදිව්‍යනිකායෙහි උපන්නෙම්ද; තදා, එකල්හි; අහං, මම; සන්තුසිතොනාම, සන්තුෂිත නම් දිව්‍යරාජයෙක්වූයෙමි; දසසහස්සි, දසදහසක් සක්වළ දෙවතාවෝ; සමාගන්ත්වා, රැස්ව; මමං, මා; පඤ්ජලී, ඇඳිලිබැඳගෙන; යාචන්ති, යාච්ඤා කෙරෙත්.

56 කාලොයං තෙ මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සු අමතං පදං.

මහාවීර, මහාවීරවූ බොධිසත්වයන්වහන්ස; තෙ, නුඹවහන්සේට; අයං, මේ; කාලො, (බුදුවීමට සුදුසු)කාලය වන්නේය; මාතුකුච්ඡියං, මාතෘකුක්ෂියෙහි; උප්පජ්ජ, ප්‍රතිසන්ධිග්‍රහණය කළ මැනව; සදෙවකං, දෙවියන් සහිත ලොකයා; තාරයන්තො, සසරින් එතර කරවමින්, අමතං පදං, අමෘතපදය; බුජ්ඣස්සු, අවබොධකළමැනව

57 නිබ්බුතා නූන සා මාතා නිබ්බුතා නූන සො පිතා
නිබ්බුතා නූන සා නාරී යස්සායං ඊදිසො පති.

(යස්සා, යම් මවකට; අයං ඊදිසො පුත්තො, මේ මෙබඳු පුත්‍රයෙක් වේද;) සා මාතා, ඒ මව්තොමෝ; නූන, එකාන්තයෙන්; නිබ්බුතා, නිවුණීය; (යස්ස, යම් පියෙකුට; අයං ඊදිසො පුත්තො, මේ මෙබඳු පුත්‍රයෙක් වේද;) සො පිතා, ඒ පියතෙම; නූන, ඒකාන්තයෙන්; නිබ්බුතො, නිවුණේය; යස්සා, යම් ස්ත්‍රියකට; අයං ඊදිසො පති, මේ මෙබඳු ස්වාමියෙක් වේද; සා නාරී, ඒ ස්ත්‍රීතොම; නූන, එකාන්තයෙන්; නිබ්බුතා, නිවුණීය.

පිතුච්ඡාධීතාය, නැන්දණියගේ දුව විසින්; මොලියාසද්ධිං, සිළුමිණ හා සමග; චූලං ඡින්දිත්වා, කෙස්වැටිය සිඳ; චූළාමණිබන්ධනං, චූළාමණිබන්ධනය හෙවත් කෙසකලාපය.

58 ඡෙත්වාන මොලිං වරගන්ධවාසිතං
වෙහායසං උක්ඛිපි සක්‍යපුඞ්ගවො
සහස්සනෙත්තො සිරසා පටිග්ගහි
සුවණ්ණචඞ්ගොටවරෙන වාසවො.

සක්‍යපුඞ්ගවො, ශාක්‍යවංශොත්තමවූ බොධිසත්වතෙම; වරගන්ධවාසිතං, උතුම් සුවඳින් සුවඳකවනලද; මොලිං, සිළුමිණ සහිත

කෙස්වැටීය, ඡෙත්වාන, කපා; වෙහාසං, අහසට; උක්ඛිපි, දැමූයේය; සහස්සනෙත්තො, දහසක් පැණැස් ඇති; වාසවො, සක්දෙව් රජතෙම; සුවණ්ණචඞ්ගොටවරෙන, උතුම් රන්කරඬුවක් කරණකොටගෙන; සිරසා, මස්තකයෙන්; පටිග්ගහි, පිළිගත්තේය.

59 තිචීවරඤ්ච පත්තො ච වාසිසූචි ච බන්ධනං
පරිස්සාවනෙන අට්ඨෙතෙ යුත්තයොගස්ස භික්ඛුනො.

යුත්තයොගස්ස, භාවනානුයොගයෙහි යෙදුණාවූ; භික්ඛුනො, භික්ෂුහුගේ; තිචීවරඤ්ච, තුන්සිවුරද; පත්තො ච, පාත්‍රයද; වාසි, කරයද; සූචි ච, හිඳිකටුවද; බන්ධනං, කායබන්ධනයද; පරිස්සාවනෙන, පෙරහන්කඩ සමග; එතෙ අට්ඨ, මොහු අටදෙන (ශ්‍රමණපරිෂ්කාරයෝ වෙත්.)

60 කිලෙසෙ අප්පහීනෙපි මහාසත්තස්ස තඞ්ඛණෙ
යස්සානුභාවතො එවං දුස්සචූළා හි පූජිතා.

කිලෙසෙ, කෙලෙසුන්, අප්පහීනෙපි, ප්‍රහීණ නොවූද; තඞ්ඛණෙ, එකෙණෙහි; යස්ස මහාසත්තස්ස, යම් මහා බොධිසත්වකෙනකුන්ගේ; ආනුභාවතො, ආනුභාවයෙන්; එවං, මෙසේ; දුස්සචූළා, දුස්සචෛත්‍ය චූඩාමණි චෛත්‍යයෝ; පූජිතා හි, පුදනලද්දාහුමය.

61 තස්මා තස්සං මහාබොධිසත්තානං පටිපත්තියං
න කරෙය්‍ය මහුස්සාහං කො හි නාම බුධො ජනො.

තස්මා, එහෙයින්; මහාබොධිසත්තානං, මහාබොධිසත්වයන්ගේ; තස්සං පටිපත්තියං, ඒ ප්‍රතිපත්තියෙහි; කො හි නාම, කවරනම්වූ; බුධො ජනො, නුවණැති ජනයෙක්තෙම; මහුස්සාහං, මහෝත්සාහය; න කරෙය්‍ය, නොකරන්නේද.

ආළාරං, ආළාර(කාලාම)නම් තවුසා කරාද; උද්දකඤ්ච, උද්දක(රාමපුත්‍ර)නම් තවුසා කරාද; අභිත්ථුතගුණො, වර්ණනා කරනලද ගුණ ඇත්තේ.

බන්ධපදුමානි, කඳපියුම්ද; වල්ලිපදුමානි, ලියපියුම්ද; උල්ලොකපදුමානි, එල්ලන්නාවූ(මෙල්ලඹු) පියුම්ද; මාලාදාම ගවක්ඛිතො විය, මල්දමින් ගවක්ෂනලද්දක් මෙන්ද; ආබද්ධපුප්ඵවටංසකො විය, මනාකොට බඳනාලද මුදුන් මල්කඩක් මෙන්ද; සුපූරිතපුප්ඵචංගොටකං විය ච, මොනවට පුරවනලද මල් සුමුගක් මෙන්ද; පණ්ණච්ඡත්තපප

ණ්ණානි, පත්තබ්බපමණවූවාහු: මහාතුම්බමත්තානං. මහාභිනික්ඛමනේ; පච්චිඩ්ඩානි දමනලද්දූහු; පත්තකිඤ්ජක්ඛරේණුචුණ්ණානි, පත්කෙසරු රොන්සුණු (යන මෙයින්); ඔකිරන්ති, වගුරත්; නාගසුපණ්ණ මනුස්සානම්පි, නාගසුපර්ණ මනුෂ්‍යයන් විසින්ද; උපකප්පනවන්දන චුණ්ණානි, පිළවනලද (පුදනලද) සඳුන්සුණු; "තථාගතස්ස සරීරෙ ඔකිරන්ති"යි යොදනු; කාලානුසාරිතගරලොහිත චන්දනාදී සබ්බ ගන්ධජාතචුණ්ණානි, කලුවැල් තුවරලා රත්සඳුන් ආදී සියලු සුගන්ධ ජාතීන්ගේ සුණුද; හරිතාලඤ්ජන සුවණ්ණරජතචුණ්ණානි, සිරියල් අඳුන් රන්රිදී සුණුද; සබ්බගන්ධවාසවිකතියො, සියලු සුගන්ධද්‍රව්‍ය විකෘතීනු; තපන්තිවාය, තපන්ත්‍රීවාවූ: වච්ඡපරියොගන්ධ, සමින් වසනලද; ඝනසුසිරාදි භෙදානි, ඝනාය සුසිරය යනාදී ප්‍රභෙද දවූ; (තූර්යයන්ද;)

වරවාරණ දෙවතා නාම, වරවාරණ දෙවිතානම්වූ: දීඝායුකා, දීර්ඝායුෂ්කවූ; එකාකිරදෙවතා එක්දෙවතාවෙකෙනෙක්; බලව පච්චූසසමයෙ, ඉතා අලුයම්කාලයෙහි; අඩ්ඪඡ්ඨානි ජාතකසතානි, පන්සියපණස් ජාතකයන්ද; සභාගෙහි සභාගෙහි, සබ්දිනි සබ්දිනිසි; සබ්බංච තාලාවචරං, සියලු පඤ්චාංගික තූර්යයන්ද; චෙල විතානානි, සෙල්වියන්; මණ්ඩලමාලානි, නිසිදන ශාල වන්;

කුසිනාරා යාව සන්ධි සංලසඞකාවීරා ජණ්ණුමත්තෙන ඔධිනා මිඟ රත්තපුප්ඵෙන සන්ථතා හොති, කුසිනාරා, කුසිනාරා නුවරේ; සන්ධි, සන්ධිස්ථානද; සම්ල, මළසහිත අපවිත්‍රස්ථානද; සඞ්කාවීරා, කසළ ගොඩද; යාව, යන මෙකීස්ථාන දක්වා; ජණ්ණුමත්තෙන ඔධිනා, දනපමණ මයිම්ගෙන්; මිඟරත්තපුප්ඵෙන, මදුරාමලින්; සන්ථතා හොති, අතුරනලද්දීවී; අහතෙන වත්ථෙන, අලුත්වස්ත්‍රයෙන්; විහතෙන කප්පාසෙන, පොළනලද කපුපුළුනෙන්; ආයසාය තෙලදෝණියා, අයසාමය තෙල්දෙණෙනි; සබ්බගන්ධානං, සියලු සුවඳින්; පාවාය, පාවානම් නුවරෙහිදී; කුසිනාරං අද්ධානමග්ගං. කුසිනාරා නුවරට යන දීර්ඝමාර්ගයට; පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි, පන්සියයක් පමණ භික්ෂුසමූහයාවූ; චත්තාරො මල්ලපාමොක්ඛා, ප්‍රධාන මල්ල රජදරුවෝ සතරදෙනෙක්; යමකලකාසායෙ ගහෙත්වා, හුවලගිනි සුලුගෙන; හසන නිබමන්තා, කඹුරුසම් පිඹින්නාහු; අරසහස්සපති මණ්ඩිතා, දූවිදහසකින් ප්‍රතිමණ්ඩිතවූ; කප්පාසඅංසු වා, කපුපුලුන් රළක් හෝ; දසාතනන්තු වා, දවළු හුයක් හෝ; මන කාඤ්චිනං කාඤ්චි, මහහඬින් හැඬූහෝය; අයිකතරං, අතිශයින් අයිනවූ; කාරුඤ්ඤං, බැනැපන්ආකාරයක්.

අග්ගබාහුමත්තාපි, අත්කරපමණවූද; උදකවට්ටි, දියබිඳු; ඵලිකාවට්ටංසකාසදිසා, ස්ඵටිකාවතංසකමෙන්; අච්ඡිදන්තානෙකති, අසෙව්දනාක ලෙසත්; (ඇත්දළින් කරනලද දඹුවැනි ඇණියක්;) ධම්මතාව පමාණං, ස්වභාව ප්‍රමාණමවේ; සුවණ්ණතාරකාහි ඛචෙත්වා, රන් තරුවෙන් සරසා; මකුටබන්ධනසඞ්ඛාතා, මකුටබන්ධනසඞ්ඛ්‍යාතවූ; සීසප්පසාධන මඞ්ගලස්ස ල, හිස පොට්ටුනුපළඳින මඞ්ගල්‍ය ශාලාව; යාව, යම් තාක්ද; සානිසිලජ්ජපරික්ඛෙපං, හිරකලාල් පරික්ෂෙපය; සිබ්බනසම්මිස්සාසු, පැත්තූස හමදිනලද; වීථිසු, වීථිවල; සරභමිගපන්ති ලෙඛා, සරභමිගාකාර රතනලෙඛාවෙනි; සතාහිඝරෙහි, අඩසපී ගන් අත්ඇති; ආණිකොටිං ආණිකොටිං, ඇණ කෙළවරින් ඇණ කෙළවර; සන්නාහගවච්ඡිතං විය, සන්නාහයෙන් ගවසනලද්දක් මෙන්, දුක්ඛුප්පට්ටා, දුනුක්ප්‍රාට; මෙනිස්සානං, මෙවන්සනාවූ; අභිසෙකපීඨිකා, අභිෂෙක පීඨිකාවවූ; ගන්ධපරිභාවිතා, සුගන්ධපරිභාවිතවූ; (සුවඳ හල්වනලද්දාවූ) සුවණ්ණඵලකවණ්ණාය, රන්පුවරුවක වණ්වූ; සුවට්ටිතඞ්ගුලීහි, මනාවදහතාව ඇඟිලිවලින්; සුවණ්ණ බිම්බකවණ්ණං, සවණ්බිම්බක වර්ණ ඇති; උරං, ළය; සංසිබ්බිතො විය, සිව්වනය කරන්නාක් මෙන්; පරිභෙදිතොනව, හැඞී මෙන්ම; න පිඤ්ඡති, (කරුණක්) සිදුනොවෙයි; සරීරානං, ශරීර කොට්ඨාසයන් සම්බන්ධ; (ශරීරධාතූන් සම්බන්ධව) ථූපස්ස, චෛත්‍යයක්ද; මහාමහං, පූජාද; බුද්ධසෙහා, බුද්ධශරීරදරුවෝද; මහා පරිහාරා, මහත් පරිහාර හෝ දෙවාදීන්ගේ උපකරණය ඇත්තාහුය; ධාතු පාසනාධ, ධාතුකෙසවනය හෝ පාරිවාසිකා පිණ්ඩස; දොණගජ්ජිතං නාම, දොණගජ්ජිතනාම් රචනාවක්; නිරවා අහෙසුං, නිශ්ශබ්ද වූවාහුය

62 සුණන්තු භොන්තො මම එකවාක්‍යං
අම්හාකං බුද්ධො අහු ඛන්තිවාදෙ
න හි සාධුයං උත්තමපුග්ගලස්ස
සරීරභාගෙ සියා සම්පහාරො.

භොන්තො, රජදරුවෙනි; මම, මාගේ; එකවාක්‍යං, එක්වචනයක්; සුණන්තු, අසත්වා; අම්හාකං, අපගේ; බුද්ධො, බුදුරජතෙම; ඛන්තිවාදෙ අහු, ක්ෂාන්තිවාදීවූයේය; උත්තමපුග්ගලස්ස, (එබඳුවූ ඒ උත්තමපුද්ගලයන්වහන්සේගේ; සරීරභාගෙ, ශරීරභෙදය නිමිත්තකොටගෙන (ධාතුකොට්ඨාසය නිසා); අයං සම්පහාරො, මේ (ආයුධ) සම්ප්‍රහාරය; න හි සාධු සියා, යහපත් නොවන්නේය.

63 සබ්බෙව හොන්තො සහිතා සමග්ගා
සම්මොදමානා කරොමට්ඨභාගෙ
විත්ථාරිකා හොන්තු දිසාසු ථූපා
බහුජ්ජනො චක්ඛුමතො පසන්නො.

භොන්තො, පින්වත්නි; සබ්බෙව, තෙපි හැමදෙනම; සහිතා, සංහිඳෙව්; (නොබිඳෙව්) සමග්ගා, සමගිවව්; සම්මොදමානා, (ඔවුනොවුන්) සතුටුවව්; අට්ඨභාගෙ, (බුදුන්ගේ ශරීර ධාතූන්) අටකොටසක්; කරොම, කරමු; චක්ඛුමතො, පසැස් ඇත්තාවූ බුදුන්ගේ; ථූපා,(ශාරීරික) චෛත්‍යයෝ; දිසාසු, දිසාවන්හි; විත්ථාරිකා හොන්තු, විස්තාරප්‍රාප්තවෙත්වා; බහුජ්ජනො, බොහෝ ජනතෙම; පසන්නො, ප්‍රසන්නවූයේය.

තාදිලක්ඛණං, තාදීලක්ෂණයට; හෙවත් (ලාභාදියෙහි) එක සදෘශතා සඞ්ඛ්‍යාත ලක්ෂණයට; සත්ති පජ්ජරෙන, අඩැවිමැදිරියෙන්; ධුරට්ඨානං, පෙරකඩ තුඹු ස්ථානයට; පච්ඡිමට්ඨානෙ සම්පත්තෙ, පසකඩ පැමිණිකල්හි; මාරවිභීසකසදිසං, මාරභයඞ්කාරයක් සදෘශවූ; විභීසකං, භයානක (යක්ෂරූප) යක්; යක්ඛගාහකඛිපනකඅරොචකෙ, යක්ෂග්‍රාහයෙන් හටගත් සම්ප්‍රතිශ්‍යා අරුචි (යනාදි රොග)ද; බලානුරූපෙන, ශක්තිපරිද්දෙන්; පිප්ඵලිවනියාපි මොරියා, පිප්ඵලිවනනම් නුවර වැසි මොරිය රජදරුවෝද.

64 එකො ථූපො රාජගහෙ එකො වෙසාලියා පුරෙ
එකො කපිලවත්ථුස්මිං එකො ච අල්ලකප්පකෙ.

එකො ථූපො, එක්දාගැබක්; රාජගහෙ, රජගහනුවර පිහිටියේය; එකො, එක්දාගැබක්; වෙසාලියා පුරෙ, විසාලාමහනුවර පිහිටියේය, එකො, එක්දාගැබක්; කපිලවත්ථුස්මිං, කිඹුල්වත්පුරයෙහි පිහිටියේය; ඒකොච, එක්දාගැබක්; අල්ලකප්පකෙ, අල්ලකප්පනුවර පිහිටියේය.

65 එකො ථූපො රාමගාමෙ එකො ච වෙඨදීපකෙ
එකො පාවෙය්‍යකෙ මල්ලෙ එකො ච කුසිනාරකෙ.

එකො ථූපො, එක්දාගැබෙක්; රාමගාමෙ, රාම්ග්‍රාමයෙහි පිහිටියේය; එකොච, එක්දාගැබෙක්; වෙඨදීපකෙ, වෙඨදීපකනම් නුවර පිහිටියේය; එකො, එක්දාගැබෙක්; පාවෙය්‍යකෙ මල්ලෙ, මල්ලරජ දරුවන්ගේ පාවානම් නුවර පිහිටියේය; එකොච, එක් දාගැබෙක්; කුසිනාරකෙ, කුසිනාරා නුවර පිහිටියේය.

66 යෙ තෙ සාරීරිකා ථූපා ජම්බුදීපෙ පතිට්ඨිතා
අඞ්ගාරකුම්භථූපෙහි දසථූපා භවන්ති තෙ.

සාරීරිකා, ශාරීරිකවූ; යෙ තෙ ථූපා, යම් ඒ ස්තූපකෙනෙක්; ජම්බුදීපෙ, දඹදිව; පතිට්ඨිතා, පිහිටියාහුද; තෙ, ඔහුතුමූ; අඞ්ගාරකුම්භථූපෙහි, අඞ්ගාරකුම්භ ථූපයන් හා සමග; දසථූපා භවන්ති, දශ ස්තූපයෝ වෙත්.

67 දසාපි ථූපා පුරිසුත්තමස්ස යෙ
යථානුරූපං නරරාජපූජිතා
සබ්බෙන ලොකෙන සදෙවකෙන තෙ
නමස්සනීයාව භවන්ති සබ්බදා.

පුරිසුත්තමස්ස, පුරුෂෝත්තමවූ බුදුන්ගේ; යෙ දසාපි ථූපා, යම් බදු දශවිහා ස්තූපකෙනෙක්; යථානුරූපං, ශක්තිවූපරද්දෙන්; නරරාජපූජිතා, රජදරුවන් විසින් පුදනලද්දාහුද; තෙ, ඒ ස්තූපයෝ; සදෙවකෙන, දෙවියන් සහිතවූ; සබ්බෙන ලොකෙන, සියලු ලොකයා විසින්; සබ්බදා, සියලුකල්හි; නමස්සනීයාව භවන්ති, නමස්කාර කටයුත්තාහුම වෙත්.

## දසථූපකථා.

පරිවරණසම්පත්තං එව, උපස්ථානයට සුදුසු ධාතුපමණක්ම; (පූජාකරන විවරක්) ලොහසන්ථරං, ලොහපටක්, තම්බලොහවාරං, තම්බලොහමය ගෘහවාරය; ආවිජනරජ්ජුයං, අස්සෙරාද්දෙදකී; කුංචිකාමුද්දිකං, කෙසී යතුරුමුද්ද; වාලසඞ්ඝාටයන්තං, ව්‍යාලරූපයුක්ත යන්ත්‍රයක්; ඵලිකවණ්ණඛණ්ඩෙහි ගහෙත්වා, දූවානවත් කඩුගෙන; අනුපරියායන්තං, සිසාරන්නහු; එකාය එව ආණියා, එකඇණයකින්ම; ගිජ්ඣකාවසථාකාරෙන, උළුසෙවිලි ගෘහයක ආකාරයෙන්; සිලාපරික්ඛෙපං කත්වා, ගලින් වටකොට.

## ධාතුනිධානකථා.

දන්තාපොනකිච්චං, දැහැටිකිස; අඤ්ජනමලකං, බෙත්තෙල්ලිද; අඤ්ජනගරිවකං, බෙත්අරලුද; නිවාසනපාපුරණං, අඳිනා පොරෝනා වස්ත්‍රද; අනුලෙපනගන්ධං, ඇඟගල්වන සුවඳද; අසුත්තමසිකං, හුසින් නොගොතනලද; සුමනපුප්ඵපටං, දෑසමන්මල් පටද; සාලිනො, හැල්සම්බන්ධිවූ; නවවාහසහස්සානි, සාලනවදහසක්; නිප්ඵුසකණෙ, පොතු හා කුඩු නැතිවූන්; අවජා, වලස්සු; විකූලජනනා විශේෂයෙන් නාදකරන්නාහු; කූවං පහරනසි. කුළුපහරත්; ආපාටං කමෙරානිනි, නමුකාරවිසි.

එතන නිම්මිතං සකලසරීර විප්පකිණ්ණපුඤ්ඤප්පභාවනිබ්බත්තාසීතිඅනුබ්‍යඤ්ජනපතිමණ්ඩිතං ද්වත්තිංසමහාපුරිසලක්ඛණසස්සිරිකතාය විකසිතකමලුප්පලපුණ්ඩරීකපතිමණ්ඩිතමිව සලිලතලං, තාරාගණරංසිජාලවිසරවිප්ඵුරිතසොභාසමුජ්ජලමිව ගගනතලං නීලපීතලොහිතාදිභෙදවිචිත්‍රවණ්ණරංසිවිනද්ධබ්‍යාමප්පභාපරික්ඛෙපවිලාසිතාය සඤ්ඣාප්පභානුරාගඉන්ද්‍රධනුවිජ්ජුලතාපරික්ඛිත්තමිව කනකගිරිසිඛරං නානාවිරාගවිමලකෙතුමාලාසමුජ්ජලිතචාරුමත්ථකසොභං නයනරසායනමිව බ්‍රහ්මදෙවමනුජනාගයක්ඛගණානං බුද්ධරූපං.

එතන, ඒ නාරජිනු විසින්; නිම්මිතං, මවනලද; සකලසරීර, සියලු ශරීරයෙහි; විප්පකිණ්ණ, පැතුරුණාවූ; පුඤ්ඤප්පභාව, කුශලප්‍රභාවයෙන්; (පුණ්‍යමහිමයෙන්) නිබ්බත්ත, ජනිතවූ; අසීතිඅනුබ්‍යඤ්ජනපතිමණ්ඩිතං, අසූ අනුව්‍යඤ්ජනයෙන් ප්‍රතිමණ්ඩිතවූ; ද්වත්තිංසමහාපුරිසලක්ඛණ, දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන්; සස්සිරිකතාය, සශ්‍රීකබැවින් හෙවත් සම්පූර්ණ හෙයින්; විකසිත, ප්‍රබුද්ධවූ; කමලුප්පලපුණ්ඩරීකපතිමණ්ඩිතං, පද්මෝත්පල පුණ්ඩරීකයෙන් ප්‍රතිමණ්ඩිතවූ; සලිලතලං ඉව, ජලතලයක් වැනිවූ; තාරාගණ, තාරකා සමූහයාගේ; රංසිජාලවිසර, රශ්මිජාලසමූහයෙන්; විප්ඵුරිත, විස්ඵුරිතවූ හෙයින් බබළන්නාවූ; සොභාසමුජ්ජලං, ශොභාවෙන් උජ්වලිතවූ; ගගනතලං ඉව, අහස්තලයක් වැනිවූ; නීලපීතලොහිතාදිභෙද, නීලපීතලොහිතාදී ප්‍රභෙදඇති; විචිත්‍රවණ්ණ, විචිත්‍රවර්ණවූ; රංසිවිනද්ධ, බුද්ධරශ්මීයෙන් වෙළඳනාලද; බ්‍යාමප්පභාපරික්ඛෙප, බ්‍යාමප්‍රභාපරික්ෂෙපයෙන්; විලාසිතාය, විරාජමානහෙයින්; සඤ්ඣාප්පභානුරාග, සන්ධ්‍යාප්‍රභාවර්ණඇති; ඉන්ද්‍රධනුවිජ්ජුලතා පරික්ඛිත්තං, දේදුන්නෙන් හා විදුලියෙන් වට කරනලද; කනකගිරිසිඛරං ඉව, සුවර්ණපර්වතසිඛරය වැනිවූ; නානාවිරාග, නොයෙක් පැහැයෙන්; විමල, නිර්මලවූ; කෙතුමාලාසමුජ්ජලිත, කෙතුමාලාලඞ්කාරයෙන් සමුජ්වලිතවූ; චාරු, මනොඥවූ; මත්ථකසොභං, සිරොධාතු ශොභාඇති; බ්‍රහ්මදෙවමනුජනාගයක්ඛගණානං, බ්‍රහ්ම දිව්‍ය මනුෂ්‍ය නාග යක්ෂ සමූහයන්ට; නයනරසායනං ඉව, නෙත්‍රාජනයක් වැනිවූ; බුද්ධරූපං, බුද්ධරූපය.

පරිගණ්හි, උපස්ථානකෙළේය; උපසමපරිබාහිරෙන, ව්‍යපශමයෙන් තොරවූ; (සන්සුන්ලීලාවෙන් බැහැරවූ) අභිහරථ, ගෙන එව්; උද්ධාමච්චානි, උස්මිච්චු එලකපිරිවෙස්සු, පුප්ඵ, පුබුදුවූවලද; ද්වත්තිංසල්ලිරුහසතානි, දෙතිස්ලු බින් සකාසක්; (දෙතිසක් නිහිබින්)

සම්පරිච්ඡන්නානි, සිසාරත්හාහු; පඤ්චචූළගාමදාරකවෙසෙන, පස්කොණ්ඩයක් ඇති ගම්දරු වෙසකින්; පුප්ඵසාඵරා, මල් ඇති පිය; සැළුතා වියැ, අඹුලාක්මෙවන්ද; ගන්ධා, සුවඳ; පිංසිතා ඔපිතා විසි, පිසතැබූවාහුමෙනි; (ගල්වාතැබූවාහු මෙනි)

68 සම්බුද්ධ ථූපා සබ්බලොකෙකදීපා
සම්බුද්ධස්ස යෙ සඞ්ඝමොක්ඛාවහා ච
ගිහි සබ්බං නිච්චමච්ඡඳ්දසං ජනෙන
වන්දියන්තා ඉතෙ සබ්බථා සබ්බකාලං.

සබ්බලොකෙකදීපා, සකල ලොකයාහට අසහාය ප්‍රදීපවූ; යෙ ථූපා, යම් මහාචෛත්‍යයෝ; සම්බුද්ධස්ස, සියල්ලන්ට; සඞ්ඝමොක්ඛාවහා ච, සම්‍යග්මොක්ෂ සම්පත් ගෙනදෙන්නාහුද; ජනෙන, සැදැහැවත් ජනයා විසින්; අඤ්ඤං සබ්බං නිච්ච, අන් සියලු සංඝායයන්; ගිහි, ගරු; ඉතෙ සබ්බෙ. ඒ සියලු චෛත්‍යයෝ; සබ්බදා, සියලුකල්හි; සබ්බථා, සියලුපරිද්දෙන්; වන්දියන්තා, නමස්කාර කටයුත්තාහුය.

මහාසිරිසඞ්ඝස්ස ථූපකථා.

දසාමෙදළම්හි ඉති, කිම්වෙම්දැයි; ජෙට්ඨමූල නක්ඛත්තානං නාමෙ හොති, ජෙට්ඨමූල දෙකෙනේ පැමිණෙන පොහොසත්දැදි පොහොය දෙයි; මිගවං කීළිතුකාමො, මුවදඩයම් ක්‍රීඩාකරනුකැමැත්තේ; ජිනාභිනනපවඩ්ඪනො, ධූතනබූන්චසාධාරිවූ; සණ්ඩිකාසාවචසමෙතා, කිසැමුඩු කසාවන්පෙරවී; අයං ඉත, මෙමෙහො චනාහි.

69 සමණා මයං මහාරාජ ධම්මරාජස්ස සාවකා
තවෙව අනුකම්පාය ජම්බුදීපා ඉධාගතා.

මහාරාජ; මහරජ; ධම්මරාජස්ස, ධර්මරාජවූ බුදුන්ගේ; සාවකා, ශ්‍රාවකවූ; මයං, අපි; සමණා ශ්‍රමණයෝ වෙමු; තවෙව, තොපටම; අනුකම්පාය, අනුකම්පා පිණිස; ජම්බුදීපා, ජම්බුද්වීපයෙන්; ඉධ, මෙහි; ආගතා, ආයෙමු.

ඡාතපබ්බතපාදෙ, ඡාතපර්වතපාදයෙහි; යස්ස චෙළුයසිගයා, තුන්උණ්ඩවක්; සුවිභත්ත, මනාකොට බෙදනලද; වණ්ණවත්තා සිජකානුකා, නැවිපතුරෙළු ඇතිව; හංසකුලකව ජීවජීවකාදයො, හංසය සැහැලාන ජීවජීවකාග යනාදිවූ; භයමූතා, අශව රැපසවිහත්

මුතුය, ගජමුත්තා, හස්තිරූපසටහන් මුතුය; රථමුත්තා, රථසටහන් මුතුය; ආමලකමුත්තා, ඇඹුල්ඵල සටහන් මුතුය; වලයමුත්තා, වලයාකාර මුතුය; අංගුලිවෙඨකමුත්තා, අංගුලිවෙඨක සටහන්මුතුය; (මුද්‍රිකා සටහනමුතු) කකුධඵලමුත්තා, කුඹුක්ගෙඩිබඳු මුතුය; පාකතිකමුත්තා, පියවිමුතුය.

70 අහං බුද්ධං ච ධම්මං ච සඞ්ඝං ච සරණං ගතො
උපාසකත්තං වෙදෙසිං සක්‍යපුත්තස්ස සාසනෙ.

අහං, මම; බුද්ධං ච, සර්වඥයන්වහන්සේද; ධම්මං ච, ධර්මයද; සඞ්ඝං ච, ආර්‍ය්‍යසඞ්ඝයාද; සරණං ගතො, සරණගියෙමි; සක්‍යපුත්තස්ස, ශාක්‍යපුත්‍රවූ බුදුන්ගේ; සාසනෙ, සස්නෙහි; උපාසකත්තං, උපාසකබව; වෙදෙසිං, දක්වාගෙනකළෙමි.

71 ඉමෙසු තීසු වත්ථූසු උත්තමෙසු නරුත්තම
චිත්තං පසාදයිත්වාන සද්ධාය සරණං වජ.

නරුත්තම, නරශ්‍රෙෂ්ඨවූ මහරජ; උත්තමෙසු, උතුම්වූ, ඉමෙසු තීසු වත්ථූසු, මේ ත්‍රිවිධවස්තූන්හි, චිත්තං, සිත; පසාදයිත්වාන, පහදවා; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; සරණං වජ, සරණයව.

අචිරසුතං, නොබෝකලකින් ඇසූ; නොහොත් නොඇසූවිරූ; කාසාවපජ්ජොතා, කාසාව වස්ත්‍රයෙන් බබලන්නෝය: ඉසිවාත පටිවාතෙ, භික්ෂූන්ගේ (චීවර වලන කායචලනයෙන් ඇතිවූ) වාතයෙන් ප්‍රතිවාතවූයේය.

72 තෙවිජ්ජා ඉද්ධිප්පත්තා ච චෙතොපරියාය කොවිද
ඛීණාසවා අරහන්තො බහූ බුද්ධස්ස සාවකා.

තෙවිජ්ජා, ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූ; ඉද්ධිප්පත්තා ච, සෘද්ධිප්‍රාප්තවූ; චෙතොපරියායකොවිද, පරචිත්තවිජානනයෙහි දක්ෂවූ, අරහන්තා, අර්හත්වූ; ඛීණාසවා, ක්ෂයකරනලද කාමාදි ආශ්‍රවඇති; බුද්ධස්ස සාවකා, බුද්ධශ්‍රාවකයෝ; බහූ, බොහෝවූවාහුය.

අචිරපක්කන්තස්ස රඤ්ඤො, රජුන් ගිය නොබෝවෙලෙක්හි; අභිඤ්ඤාපාදකං, අභිඥාපාදකකොටඇති; සද්දමනුස්සාවෙසුං, (එකපැහැර) ශබ්දශ්‍රවණයකළාහුය; අබ්භුග්ගඡි, උස්ව නැංගේය; පඨවිසණ්ඨිතියට්ඨානෙ, ප්‍රථිවිකම්පනස්ථානයෙහි: (ආදිකොට දැනැබ බඳිනා ස්ථානයෙහි) භූමිපරිවර්ණසංඛෙපෙන, බිමුතුරුණු

ආකාරයෙන්, තටිපිඤ්ඡසදිසෙහි, තලාලුත් පණුවා, * කොඤ්චකාදීනි, කො ඉපලස් ආදිවූ; විවිධාභරණානි, විසිතුරු ආභරණයන්; උපකෙකාසජාති, උපාකෙකාශකොසරන්; (බල්වරහඩ පැත්වත්) අඩ්ඪතෙය්‍යානං පාණසහස්සානං, දෙදහස් පන්සියයක් ප්‍රාණීන්ට; කුලපුණ්ණානි සඞ්ඛං, කුලෙසහෙලිණියන් හා සමග; අඩ්ඪනවමානං පාණසහස්සානං, අටදහස් පන්සියයක් ප්‍රාණීන්ට; කරණ්ඩකෙචති යඞ්ගතං, ...රණ්ඩකෙ චත්‍යාඞ්ගතය; (මහාමෙඝවනුද්‍යානවිහාරයෙන් වහන්සේ වැඩසිටිය තැන සල දගැබ කරණ්ඩකාමෙචත්‍යය නම්) අඩ්ඪසිංසා ලෙනෙසු: හැටඅටක් ගල්ලෙන්වල; කත්තිකපුණ්ණමායං උපොසථදිවසෙ, ඉල්මස මැදිපොහෝදිනයෙහි; සබ්බතාලාවචරෙ, සියලු පඤ්චාඞ්ගික තූර්‍යවයන්තාවුන්; ගණ්ඨි උබ්බෙට්ටෙත්වා, සුව දිය පිරිබඩනන; එකස්මාකාලඤ්ඤාය, එක්වරුකාලයෙහි; අප සක්කාණෙනා, පසුබස්නෙන්; පහෙජවදුන්තාමකිර, පංගභාජනම් යක්ෂයා විසින් පරිගෘහිතවූ එක්දෙවසථානයක්; ධම්මිකරකං, ඛම්රාවද; උච්චිතාසුවිමලකවචමෙරහි, ඉදුල් අපවිත්‍ර මලකසල ඇත මෙයින්; මා සන්ධුෂසිනි, කිළුටුනොකෙරේවයි;"යණ්ට නසමාකිණ්ණසාමබහිනාඟාගමෙවජ්ජිහී පරිවුතා ජිණ්ති"සිඳකාදනු, අහසවාපිසා, අබාවැමෙවන්; (තිසාවැමෙවකි) සුළුඩරා, මනාම උඩරණසකළුහැකිවූවාහුය; පරිසායනි, සීසාරයි; (වටහැසිමෙරයි) වඩ්ඪං විනාමපනා, මෙවත්‍යවස්තුව ගොධනය කරවා; ජඩ්ඪප්පමාණං ථූපං. ථූපජඩ්ඪාවයයි කියනලද මල් ආසනය පමණ චෛත්‍යය; විනාමෙපනා. රැස්කරවා; ධාතුඛණ්ඩරා පනාළිය, ධාතු(කරඬුව) බාහාපිණීස; ධාතුඋභනස්සනාළං, ධාතු පූජාව දක්නාපිණීස; සතතාලප්පමාණං, සත්තලක් පමණ; (මධ්‍යම ප්‍රමාණ තල්ගස් සතක් පමණයයි සේයි.)

73 එවං අචින්තියා බුද්ධා බුද්ධධම්මා අචින්තියා
අචින්තියෙසු පසන්නානං විපාකො හොති අචින්තියො.

එවං, මෙසේ; බුද්ධා, බුදුවරයෝ; අචින්තියා, අචින්ත්‍යයහ; නොවත් සිතියනොහැකි ගුණැතියහ; බුද්ධධම්මා, බුද්ධධර්මයෝ; අචින්තියා, අචින්ත්‍යයහ; අචින්තියෙසු, අචින්ත්‍යවූවන් විෂයෙහි; පසන්නානං, ප්‍රසන්නවූවන්ගේ; විපාකො, විපාකය තෙම; අචින්තියො හොති, අචින්ත්‍යවෙයි.

---

* පත්අතුට සිංහලපොත්හි.
තවුවක් පණුවා, විජෙපයන්නය.

නිතම්භතා උදකපූජිතානි, නිත්තම්බන දියපෙදින්; අනුපෙඨානා ලෙසා නාම, සපශීරනාකල අවකාශයෙහි නම්; දෙවනාගයක්ඛානං, දිව්‍ය නාග යක්ෂ යන මොවුන්ට; විම්හායකරං, විස්මයකරවූ; පමෙව කං, මෙතනමෙවනුම.

74 එවං ජිනො ධාතුසරීරකෙන
ගතොපි සන්තිං ජනතාහිතඤ්ච
සුඛඤ්ච සම්මා බහුධා කරෙය්‍ය
ඨිතො හි නාථො භවතාතරං කරෙය්‍ය.

එවං, මෙසේ; සන්තිං ගතො, නිවනට පැමිණියාවූ, හෙවත් පිරිනිවියාවූ; ජිනොඅපි, සර්වඥයන්වහන්සේද; ධාතුසරීරකෙන, ධාතුශරීරය කාරණකොටගෙන; සම්මා, මනාකොට; ජනතා, ජනසමූහයාට; හිතංච, හිතද, සුඛංච, සැපද; බහුධා, බොහෝසෙයින්; කරෙය්‍ය, කරන්නේය; ඨිතො, වැඩසිටියාවූ; නාථො, සර්වඥනාථ වනාහි; අනුත්තරං, අනන්තයෙන්; කරෙය්‍ය, කිහාකිනිවාකිය කරනසේක්මය.

## ථූපාරාම කථා.

ජරසරංසිජාලකිසසජ්ජනකෙන, සිනිඳු බැවින් රසවත් (ඔප්ස් වත් ඇතිනව) රශ්මිනංමඩුලින් විහිදුවන්නාවූ, නොනොත් ඔබ්බම්බ හැසිරෙනබැවින් ජීවමානවූවාක්මෙන් රශ්මිජාලා විහිදුවන්නාවූ; බොධිනා, බොධිය; සුවර්ණ්ණතුලිකා ගෙනහාවා, රත්නතල්ල ගෙන: නිබ්බුතිකො භවෙය්‍යං, නිවනිනැත්තාත් වන්නෙමි; විසජ්ජනාවිං, විසර්ජනම්වන; නාමලිත්තිං, තාම්‍රලිප්තිනමුනාටට; "ගච්ඡති වනාර" යන්නෙහි "ඉර" යනු බෙදනයහි නිපාතයයි; පරි සබොධි, මහාබොධිසමෙයි; රාජවරුණුවාරකොකසාගෙන. රජු උනට දෙරනොවුවු කත්හි.

75 එවං ලඞ්කාහිතාය සාසනස්ස ච වුද්ධියා
මහාමෙඝවනෙ රම්මෙ මහාබොධි පතිට්ඨිතා.

එවං, මෙසේ; ලඞ්කාහිතාය, ලඞ්කාවට හිතපිණිස; සාසනස්ස ච, ශාසනයාගේද; වුද්ධියා, වෘද්ධි පිණිස; රම්මෙ, රම්‍යවූ; මහාමෙඝවනෙ, මහාමෙවුනා උයන්හි; මහාබොධි, ශ්‍රී මහාබොධීහුම; පතිට්ඨිතා, පිහිටියේක.

## බොධි ආගමන කථා.

පඤ්චසි අනාගතපුරිනාසතෙනිනි, පන්සියයක් අනාගතපුර සත්‍යන් දුසි; අසදිසො මහාථූපො භවිස්සති, අසදෘශාකාරවූ තාලි මහා චෛත්‍යයක් වන්නේය.

76 නිධාපෙත්වාන සම්බුද්ධධාතුයො පත්තමත්තකා
කාරාපෙසි මහාරාජා ථූපෙ යොජනයොජනෙ.

මහාරාජා, දෙවෙනිපෑතිස් මහරජතෙම; පත්තමත්තකා,(මිනින් තලයෙහි තුබූ) පාත්‍රයක් පමණ; සම්බුද්ධධාතුයො, සම්මාසම්බුදුන්ගේ ධාතූන්; නිධාපෙත්වාන, නිධාන් කරවා; යොජනයොජනෙ, (ලක්දිව) යොදනෙක් යොදනෙක්හි; ථූපෙ. චෛත්‍යයන්; කාරාපෙසි, කරවූයේය.

අස්සනාවිකපුත්තා, අස්නැවියෙකුගේ පුත්වූ; වෙ දමිළා, දෙමළු දෙදෙනෙක්; තරච්ඡවාවාපිං, සරස්නාවැව; අම්බං, අඹයක්; විසෙන යොජෙත්වා, විසයොදා; අම්බමත්ථකෙ ඨපෙත්වා, (විසළු අඹය) අඹ මතුයෙහි තබා; යට්ඨාලවිහාරෙ නාම, යටාල නම් විහාරයෙහි දී; නිකන්තිවසෙන, ආලයවශයෙන්, හත්ථස්සථරුසිප්පෙසු, ඇත් අස් කඩු සිල්පයන්; පුත්තස්ස සක්කාරසමං, පුත්‍රයාට කරනලද සත්කාරය වැනිවූ; දීඝවාපියං, දිගාමඩුල්ලෙහි; අලං ඔරගඞ්ගනානි, ගඟින් මෑත අපට පමණයයි; හෙමසංඛලිකං, රන්හැකිල්ලක්; යොධෙහි, යොධයන් ලවා; සපථං කාරෙසි, දිවිරීම කරවූයේය, ගුත්තසාලං, ගුත්හලට; (මගුල්හලට) චූළඞ්ගණියපිට්ඨියං, යුද්ගනා පිටියේදී; සපථස්සකතත්තා, සපථකළ බැවින්; (දෙබෑයන්ගේ සටනෙක්වී නම් එක්කෙනකුන්ට නතුනොවම්හයි දිවිරූ බැවින්;) දීඝතුණ්ඩිකං, දීඝතුණ්ඩිකා නම්වූ; (දිඝිවූ කණ්ඩධාරීවූ); වළවඬව, වෙළඹද; සුවණ්ණසරකෙ, රන්තැටියෙහි; කාමෙත්වා, ජයකුත්තා යෙහි: පාරගඞ්ගං, මාවැලිගඟින් එතරට; කඤ්චුකථූපං, කඤ්චුක චෛත්‍යයක්.

77 තෙනෙකසං පාණකොටීනං ධම්මාභිසමයො අහු
සරණෙසු ච සීලෙසු ඨිතා ආසුං අසඞ්ඛියා.

තෙනෙකසං පාණකොටීනං, නොයෙක් කෙළගණන් ප්‍රාණීන්ට; ධම්මාභිසමයො අහු, ධර්මාවබොධය විය; අසඞ්ඛියා, සංඛ්‍යාපථාතික්‍රාන්තවූ දෙවතාවෝ; සරණෙසු ච, සරණයන්හිද; සීලෙසු ච, ශීලයන්හිද; ඨිතා ආසුං, පිහිටියාහු වූහ.

78 සොතාපත්තිඵලං පත්වා සෙලෙ සුමනකූටකෙ
මහාසුමනදෙවින්දො පූජියං යාචි පූජියං.

සුමනකූටකෙ සෙලෙ; සමනතකූටපර්වතයෙහි; මහාසුමන දෙවින්දො, මහාසුමනනම් දෙවේන්ද්‍රතෙම; සොතාපත්තිඵලං, සෝ

වාත්එලයට; පත්තා, පැමිණ; පූජිතං, පුදනුවස්, පූජියං, පූජාවස්තු වක්; යාචි, යාච්ඥාකෙළේය හෙවත් ඉල්වූයේය.

79 සිරං පරාමසිත්වාන නීලාමලසිරොරුහෙ,
පාණිමත්තෙ අදා කෙසෙ තස්ස පාණිහිතො ජිනො.

පාණිහිතො, ප්‍රාණීන්ට හිතවූ; ජිනො, සර්වඥතෙම්; සිරං, ශීර්ෂය; පරාමසිත්වාන, පිරිමැද; නීල, නීලවර්ණවූ; අමල, නිර්මලවූ; සිරොරුහෙ, උත්තමාඞ්ගයෙහි ජනිතවූ; කෙසෙ, කෙශධාතූන්; පාණිමත්තෙ, මිටක්පමණ; තස්ස, ඒ සුමන දිව්‍යරාජයාහට; අදා, දුන්සේක.

80 සො තං සුවණ්ණචඞ්ගොටවරෙනාදාය සත්ථුනො
නිසින්නට්ඨානරචිතෙ නානාරතනසඤ්චයෙ.

81 උච්චෙතො සත්තරතනෙ ඨපෙත්වාන සිරොරුහෙ
තං ඉන්දනීලථූපෙන පිදහෙසි නමස්සි ච.

සො, ඒ දෙවේන්ද්‍රතෙම; සත්ථුනො, ශාස්තෲන්වහන්සේගේ; තං, ඒ කෙශධාතුව; සුවණ්ණචඞ්ගොටවරෙන, උතුම් රන්සුමුගකින්; ආදාය, ගෙන; නිසින්නට්ඨානරචිතෙ, වැඩහුන් ස්ථානයෙහි කරනලද; නානාරතනසඤ්චයෙ, නොයෙක් රත්නයෙන් රැස්කරනලද; උච්චෙතො, උසින්; සත්තරතනෙ, සත්රියන් කරඹුවෙක්හි; සිරොරුහෙ, ඒ කෙශධාතූන්; ඨපෙත්වාන, පිහිටුවා; තං, එය; ඉන්දනීලථූපෙන, ඉන්ද්‍රනීලමාණික්‍යමය ස්තූපයකින්; පිදහෙසි, වැසුයේය; නමස්සි ච, නමස්කාර (පූජාදිය)ද කෙළේය.

මෙඝවණ්ණපාසාණෙහි, මේවන්පහණින්;

82 එවමච්චාසිකං කම්මං කරොන්තාපි ගුණාකරා
කරොන්ති පුඤ්ඤං සප්පඤ්ඤා සංසාරභයභීරුකා.

එවං, මෙසේ; අච්චාසිකං, ඉක්මන්වූ; කම්මං, කර්මය; කරොන්තාපි, කරන්නාවූද; ගුණාකරා, ගුණයන්ට ආකරවූ; සංසාරභයභීරුකා, සසරභයින් බියපත්වූ; සප්පඤ්ඤා, සප්‍රාඥපුද්ගලයෝ; පුඤ්ඤං, පුණ්‍යය; කරොන්ති; කෙරෙත්.

මහියඞ්ගණථූපකථා.

අම්බනිජලං, අඹවුවට; අනාරගොබ්බ, අතුරොගොබති; මහා කොළුදමිළං, මාකොටුදමළා, දෙණගාමෙ, දෙණගම්හි; නාල කොලෙ, හල්කොලගම්හි; නාළිසොබ්බ, නාළිසනම්හෙබති; (පොල්වත්තේ) දීඝාභයගල්ලම්හි, දීඝාභයගල්ලෙහි; කච්ඡතිත්ථෙ, කසාතොට; වෙළුනගරෙ, වේළුනම්නුවර; මාතුලභාගිනෙය්‍ය, මයිල් බෑනණුවූ;

83 අජානිත්වා සකං සෙනං ඝාතෙනති සජනා ඉති
සුත්වාන සච්චකිරියං අකරී තත්‍ථ භූපති.

සජනා, ස්වකීය ජනයෝ; සකං සෙනං, ස්වකීය සෙනාව; අජානිත්වා. නොදැන; ඝාතෙනති ඉති, ඝාතනය කෙරෙත්යයි; භූපති, පෘථිවීශ්වරවූ දුටුගැමුණු රජතෙම; සුත්වාන, අසා; තත්‍ථ, එහි; සච්චකිරියං අකරි, සත්‍යක්‍රියා කෙළේය.

84 රජ්ජසුඛාය වායාමො නායං මම කදාචි ච
සම්බුද්ධසාසනස්සෙව ඨපනාය අයං මම.

කදාචිච, කිසිකලෙකත්; රජ්ජසුඛාය, රජසැපය පිණිස; මම, මාගේ; අයං, මේ; වායාමො, න, උත්සාහයක් නොවෙයි; මම, මාගේ; අයං, මේව්‍යාපාරය; සම්බුද්ධසාසනස්ස, සම්බුද්ධශාසනයාගේ; ඨපනාය එව, චිරස්ථායීව පිහිටුවීම පිණිසම වන්නේය,

85 තෙන සච්චෙන මෙ සෙනාකායොපගතභණ්ඩකං
ජාලවණ්ණංව හොතූති තං තථෙව තදා අහු.

තෙන සච්චෙන, ඒ සත්‍යය කාරණකොටගෙන; මෙ, මාගේ; සෙනා, සෙනාවගේ; කායොපගතභණ්ඩකං, හන්පිළිආදි කායොපගතභාණ්ඩ; ජාලාවණ්ණංව, දිළිහෙනගින්නට බඳු වර්ණයම්; හොතූති, වේවයි; (සත්‍යක්‍රියාකෙළේය,) තං, එය, තදා, එකල්හි; තථෙව, එපරිද්දෙන්ම, අහු, වූයේය.

පරිඛාත්තාය පරික්ඛිත්තං, අගළ තුනකින් පිරිකෙව් කරනලද්දේය; දළ්හපාකාරගොපුරං, දැඩිවූ ලෝපවුරෙන් හා වාසලින්ද යුක්තය; අයොවාරයුත්තං අහොසි, යකඩදොරින්ද යුක්තවිය; සිලාසුධා ඉට්ඨකා, ගල්හුණු ගඩොල්; ගොපුරෙ ඨත්වා, දොරකොටුවෙහි සිට; පක්කඅයොගුළෙචෙව, රත්කළ යවටද; පක්කාථිතසිලෙසඤ්ච, කකියවනලද මලසඬද; වෙදනාට්ටා, වේදනාවෙන් පීඩිතවූයේ; අයොවාරවිසාටනං නාම, යකදර බිඳීම නම්වූ; සිලෙසං ධාවිත්වා, (ඇතු

පිට ඇලුණු සැබෑර) මලකඩ සෝද; සුසම්මට්ඨිතං සත්වා, මණ්ණාගද සන්නාහයෙන් යුක්තකොට; චම්මපිඨිසං, සන්නාහය පිට; මහිස චම්මං, මීවුසමක්; සත්තගුණං කත්වා, * සත්පටක්කොට; තෙල චම්මං බන්ධිත්වා, තෙලිසම් බැඳ; පදරං, අශෝවිය පෝරුව; (යදෙර) උම්මාරං, එළිපත: හති, තැසුමයේය; (උද්ඝාටනය කෙළේය) පව ටෙවසි, ඉවතට පෙරළූයේය; ද්වාරපිළනද්වාරං, දොරපෙළූ වෙරය; සදදැල්ළගෙන බිම හෙළින් හිඳුවාලූ වෙරය.)

86 හත්ථී ගහෙත්වා රථචක්කං මිත්තො සකටපඤ්ජරං
නාළිකෙරතරුං ගොඨො නිම්මලො බගාමුත්තකං.

87 තාලරුක්ඛං මහාසොණො ථෙරපුත්තො මහාගදං
විසුං විසුං වීථිගතා දමිළෙ තත්ථ චුණ්ණයුං.

හත්ථී, හස්තිතෙම: රථචක්කං, ගැල්සකක්ද; මිත්තො, නාමි මිත්‍රතෙම; සකටපඤ්ජරං, රියමැදුරක්ද; ගොඨො, ගොටසිම්බරතෙම; නාළිකෙරතරුං, පොල්ගසක්ද; නිම්මලො, සුරනිම්මලතෙම; බගා මුත්තකං, උතුම්කඩුවක්ද; මහාසොණො, මහාසොණතෙම; තාල රුක්ඛං, තල්ගසක්ද; ථෙරපුත්තො, ථෙරපුත්තාභය තෙම; මහා ගදං, මහත් යකඩුවක්ද; ගහෙත්වා, ගෙන; තත්ථ, එහි; විසුං විසුං, වෙන වෙනම; වීථිගතා, විථිගතවූවාහු; දමිළෙ, දෙමළුන්; චුණ්ණ යුං, සුණුකළාහුය.

ගිරිලොකං නාම, ගිරිනිල්නම් නුවරට; මහෙලනගරං, මාතෙල් නුවරට; කාසපබ්බතෙ, කසාගල්බඩ; ජෙඨමූලමාසම්හි, පොසොන් මස; බඟාඵලකං ගහෙත්වා, කඩුපලිස් ගෙන.

88 තත්ථ වාපිජලං ආසි හතානං ලොහිතාවිලං
තස්මා කුලත්ථවාපීති නාමෙනා විස්සුතා අහු.

තත්ථ, එහි; වාපිජලං, වැව්ජලය; හතානං, නසනලද්දවූවන්ගේ; ලොහිතාවිලං ආසි, රුධිරයෙන් කැලඹුණේවිය; තස්මා, එහෙයින්; කුලත්ථවාපීති, කලනාවැවයයි; නාමෙනා, නාමයෙන්; විස්සුතාඅහු, ප්‍රසිද්ධවිය.

---

* ඔයස් පටස්-සිංහලපොත්හි.

89 චරාපෙත්වා තහිං භෙරිං දුට්ඨගාමණී භූපති
න හනිස්සතු එළාරං මං මුඤ්චිය පරො ඉති.

දුට්ඨගාමණී භූපති, දුටුගැමුණු රජතෙම; මං මුඤ්චිය, මාහැර; අපරො, අන්‍යකෙක්තෙම; එළාරං, එළාල රජු; නහනිස්සතුඉති, ඝාතනය නොකෙරේවයි; තහිං, එහි; භෙරිංචරාපෙත්වා, බෙරහසුරුවා.

90 සන්නද්ධො සයමාරුය්හ සන්නද්ධං කණ්ඩුලං කරිං
එළාරං අනුබන්ධන්තො දක්ඛිණද්වාරමාගමි.

සයං, තෙමේ; සන්නද්ධො, සන්නද්ධවූයේ, සන්නද්ධං, සන්නද්ධවූ (යුද්ධය පිණිස සැරහුණාවූ) කණ්ඩුලංකරිං, කඩොලැතු පිටට; ආරුය්හ, නැඟී; එළාරං, එළාලරජහු; අනුබන්ධන්තො, ලුහුබඳින්නේ; දක්ඛිණද්වාරං, දකුණුවාසල්දොරට; ආගමි, පැමිණියේය.

91 පුරෙ දක්ඛිණභාගම්හි උභො යුජ්ඣිංසු භූමිපා
තොමරං ඛිපි එළාරො ගාමණී තං අවඤ්චයි.

පුරෙ, නුවර; දක්ඛිණභාගම්හි, දක්ෂිණභාගයෙහිදී; උභො භූමිපා, භූමිපාලයෝ දෙදෙන, යුජ්ඣිංසු, යුද්ධකළාහුය; එළාරො, එළාලරජතෙම; තොමරං, තොමරය; ඛිපි, (ගැමුණුරජදෙසට) දැමූයේය; ගාමණී, ගැමුණුරජතෙම; තං, ඒ තොමරය; අවඤ්චයි, වැළක්කේ.

92 විජ්ඣාපෙසි ච දන්තෙහි තං හත්ථිං සකහත්ථිනා
තොමරං ඛිපි එළාරො සහත්ථී තත්ථ සො පති.

සකහත්ථිනා, සවකීයවූ කඩොලැතු ලවා; තං හත්ථිං, ඒ පඬිත නම් හස්තිරාජයා; දන්තෙහි, දෙදළින්; විජ්ඣාපෙසිච, විද්ධනයද කරවී; තොමරං, තොමරයද; එළාරං, එළාලරජකරා; ඛිපි, දැමූයේය; තත්ථ, එහි; සහත්ථී, හස්තියා සහිත; සො, ඒ රජතෙම; පති, වැටුණේය.

93 තතො විජිතසඞ්ගාමො සයොග්ගබලවාහනො
ලඞ්කං එකාතපත්තං සො කත්වාන පාවිසී පුරං.

තතො, ඉක්බිත්තෙන්; විජිතසඞ්ගාමො, දිනනලද සඞ්ග්‍රාම ඇති; සයොග්ගබලවාහනො, යානවාහනබලසෙනාසහිතවූ, සො, ඒ දුටුගැමුණු රජතෙම; ලඞ්කං, ලඞ්කාද්වීපය; එකාතපත්තං කත්වාන, එකච්ඡත්‍රකොට; පුරං, නගරයට; පාවිසී, ප්‍රවිෂ්ටවූයේය.

කොළම්බහාලංක නාම ගාමෙ, කොළම්බහාලක නම් ගම, බන්ධාවාරං, කඳවුරට්; නිවෙසෙසි, පිවිෂ්ටවූයේය; වෙගමණ්ඩිභාවයං, වේගමන්දවනුපිණිස; සනිකං සනිකං, සෙමින් සෙමින්; (ගුහුසුළු පොතුව) පවෙච්චාසකකි. පසුබැස්සේය; පුරදෙවස්සපස්ස, පුරදෙව යයි නම් ලද අනුරාධපුරයාගේ පාශ්චිමයෙක්හි; මහාවිහාරසීමන්තෙ, මහාවිහාරසීමාඅන්තයෙහි, උපපණ්ණඩි; පරිහපණ්ණාලේන්ය; බලාන බලං ආගමච්ච, සෑවුතලයෙහි වැදී; උක්කුසිං, ඔල්වරහඬ; පුංඩරීකහ උජ්ජුකංඨපාදෙපනවා, පගිළිමෙන් සෘජුව තබ්බෑ; (හිසමෙකළින්සිටුවා) අමකාභිණිමෙසනාසානං, අමෙත්‍යාඝ්ණියක් මෙසනාසාතනාස; ජනා මඞ්ගලසෑකාගෙහ, සේසන් පිළිබඳ මඞ්ගලසකානාගය (මවු ශුපළදිනා සතිය): චාරිතානුපාලනත්ථාව, චාරිත්‍රය රක්‍ෂාකරනු පිණිසද; සබ්බාපරිවජ්ජදං, සියලු උපකරණ, (වසනාලඞ්කාරාදිය) උපායන සනාතිච්, උපහාරශතයන්ද; (සියගණන් පූජාවසනුද) සධාතුකං කුනානං, ධාතුසහිත ජයකුනානය; උජ්ජුකං ඨමෙපඤ්ඤ, කෙළින් සිටුවූහ; ඔරොධපරිවුතො, අන්තඃපුර සත්‍රින් විසින් පිරිවරනලදුව; කුනානං වමෙඩසථානි, ජයකුනානය ඉදිරිකොටගෙන නික්මෙව්යසි; විස්සරිත්වා, සදහන්නැතිව; මරිචවට්ටියාං, මරිස්වැටියක්; (මලමිරිස් පැස්සක්) අභාසවාපියා, බයාවූවෙව්; (තිසාවැවේ.)

94 යුද්ධෙ දුතෙ ච සූරෙන සූරිනා රතනත්තයෙ
පසන්නාමලචිත්තෙන සාසනුජ්ජොතනත්ථිනා.

යුද්ධෙ, යුද්ධයෙහිද; දුතෙච්, දූතයෙහිද; සූරෙන, සූරවූ; සූරිනා, පණ්ඩිතවූ; රතනත්තයෙ, රත්නත්‍රය කෙරෙහි; පසන්නාමල චිත්තෙන, ප්‍රසන්නවූ නිර්මල සිත්ඇති; සාසනුජ්ජොතනත්ථිනා, බුද්ධසසුන් බබුළුවනු කැමතිවූ.

95 රඤ්ඤා කතඤ්ඤුනා තෙන ථූපකාරාපනාදිතො
විහාරම්භනන්තානි පූජෙතුං රතනත්තයං.

කතඤ්ඤුනා, කෘතඥවූ; තෙන රඤ්ඤා, ඒ රජහු විසින්; රතනත්තයං, ත්‍රිවිධරත්නය; පූජෙතුං, පුදනුපිණිස; ථූපකාරාපනාදිතො, ථූපකරවීමෙහි පටන්; විහාරමහනන්තානි, විහාරපූජාව අව සන්කොට ඇති.

96 පරිච්චත්තධනානෙත්ථ අනග්ඝානි විමුඤ්චිය
සෙසානි හොන්ති එකාය ඌනාවීසති කොටියො.

එත්ථ, මෙහි, සෙසානි පරිච්චත්තධනානි, පරිත්‍යාගකරනලද සෙසු ධනයෝ; අනග්ඝානි විමුඤ්චිය, අනගි වස්තූන්හැර; එකායඌනා

වීසති කොටියො, එකූනවිසිකෙළක් හෙවත් දහනවකෝටියක්; ජහාසි, හළේය.

97 එවං සපඤ්ඤා භිදුරෙ අසාරෙ
දෙහෙ ධනෙ සඞ්ගමනිස්සජිත්වා
කත්වාන පුඤ්ඤං සුඛසාධනං තං
සාරං ගහෙතුං සතතං යතෙථ.

එවං, මෙසේ; සපඤ්ඤා; නුවණැති තැනැත්තෝ; භිදුරෙ, බිඳෙනසුළුවූ; අසාරෙ, හරරහිතවූ; දෙහෙ, ශරීරයෙහිද, ධනෙ, ධනයෙහිද, සඞ්ගං, ඇල්ම; අනිස්සජිත්වා, දුරුකොට; සුඛසාධනං, (ඓහලෞකික පාරලෞකික) සැප සිඩකරනුපිණිස; පුඤ්ඤං කත්වා, පින්කොට; සාරං, (ශීලසාරාදි)සාරය හෙවත් සාරං, නිර්වාණසාරය, ගහෙතුං, ගන්නාපිණිස; සතතං, අනවරත යෙන්; යතෙථ, ප්‍රයත්නකරන්නේය; වෙර් උත්සාහකරන්නේය.

මරිච වට්ටි විහාර කථා.

කිංකුලිකෙන, දැහිනූලෙන්; පටෙ, වස්ත්‍රයෙහි; තදාකාරං, ඒ විමානාකාරය; චළුපුටානිචෙව, පිළිපෙදිද; රජතබිම්බානිචෙව, රිදියෙන් විසිතුරුකරනලද්දැහුද; පවාළවෙදිකාචෙව, පබළුමුවා පිල්කඩද, අපස්සෙනම්පි, පිටාටුවද, අට්ඨමඞ්ගලානි, අටමඟුලද; ආවජ්ජා කුම්භි, බොවන ජලය තබනා සැළද; උළුංකොව, කිණිස්සද; තම්බ මලාකිබිකානි පත, තඹ ලෝ උළුලින් වනාහි.

98 පාසාදගෙහතු චත්තානි මහාචාගෙන රාජිනා
අනග්ඝානි ඨපෙත්වාන අහෙසුං තිංසකොටියො.

මහාචාගෙන, මහත් ත්‍යාගඇති, රාජිනා, රජහු විසින්; පාසාදගෙහතු, ප්‍රාසාදපූජාවගෙහතුකෙටගෙන; චත්තානි, පරිත්‍යාගකරන ලද ධනයෝ; අනග්ඝානි ඨපෙත්වාන, අනර්ඝවස්තුහැර, තිංසකොටියො අහෙසුං, තිස්කෙළක්වූහ.

99 පහාය ගම්මියං තං දත්වාන ධනසචයං
අනුගාමිධනං දනං එවං කුබ්බන්ති පණ්ඩිතා.

පණ්ඩිතා, ප්‍රාඥයෝ; පහායගාමියං, පරලොව යනකල හැර යායුතුවූ; ධනසඤ්චයං, ධනසමූහය; දත්වාන, දී; එවං, මෙසේ:

තං දතං, ඒ දතය; අනුගාමිධනං කුබ්බන්ති, අනුවයන්නාවූ ධන යක් කෙරෙත්.

ඉළුකාරගාමකං කාරෙසි, ගැමෙඩාල් රක්ෂාකරන්නෙක් කරවූයේය; පුබ්බුත්තරකණ්ණෙ, ඊශානකොණෙහි; ආචාරවිසිගාමෙ, අවුරුවිටිනම් ගමෙ; නිසාමරත්තිං දෙපව අනිපපවටෙට, තුන්සම්රාත්‍රියෙහි වැසිවටයල්හි; සොළසකරීසප්පමාණෙ, සොළොස්කිරියක් පමණවූ; මෙවත් තුන්සාළසාරමුණක් පමණවූ; උක්කකඨානි, උස්ව නැංගාවූ; තානි, ඒ රත්පැළ; ඔමකානි, මිටිවනැගි රත්පැළ; තම්බ විසිනාම ජනපදෙ, තඹවිටිනම් දනව්වෙහි පුබ්බදක්ඛිණකණ්ණෙ, අග්නිකොණෙහි; සුමනවාපිගාමෙ, සමන්වැව්නම් ගම; උප්පල කුරුවින්දම්යසකා, උපුල්වන් කුරුඳුමුසුවූ; අම්බඨකොලජනපදෙ, අම්බඨකොලනම් දනව්වෙහි; හළිද්දිසිඬිවෙරාදීනමත්ථාය, කසා ඉඟුරු ආදිය පිණිස; මලයංගතො, මලයරටට ගියේ; පනොදදුරුං, කැවිටිලියක්; පණසඝසිං, කොස්පැළයක්; වණ්ටසාමන්තා, තුවට්ටුව හාත්පස; අපස්සයංලුඤ්ඡිත්වා, වහල්ල උදුරා; අපස්සයානීතං, වහල්ල පහකළ; මනොසිලොදකවණ්ණපණ්ණසයුසං, සිරියෙල්දිය වණ්වූ කොස්පාතු; පණ්ණසම්භෙදජාති, කොස්මිදුලුවලින්; පච්ඡිමුත්තර කණ්ණෙ, වයඹකොණෙහි; පෙලිවාපිගාමස්ස, පෙලවැවුනම්ගම; වාපියා, වැවට; ඔතිණ්ණකන්දරෙ, දියහුණුකදුරැළියෙහි; නිසද පොතප්පමාණා, ඇඹරුම් දරුගල් පමණවූ; උම්මාපුප්ඵවණ්ණා, දිය මෙරළිස්මල් පැහැඇති.

## ථූපසාධනලාභකථා.

ගුළපාසාණෙ, වටගල්: කම්මාරකූටෙහි, කඹුරුකුළින්; ආහනා පෙත්වා, තලවා; චම්මවිනද්ධහි, සමින් වසනලද; පාසාණකොසි මඤ්ජූපරි, ගල්සුණු මත්තෙහි; නවනීතමත්තිකං, නවනීතමැටි; (වෙඬුරෙන් ගනනලද මැටි) තිත්තකත්තා, තෙත් බැවින්; බරංසුධං, ශුඩවූ කරගල්ද, අයොජාලං, යදුල්ද; සුගන්ධමාරුම්බං, සුවඳකලල්ද; ඛීරපාසාණං, කිරිවානාගල්ද; සිලං, ගල්පුවරුද; රසොදකසන්තිතෙන, රසදියෙන් තෙමනලද; කපිත්ථනියාසෙන, ශිවුල්ලාටු වෙන් ගනනලද; පූටබද්ධානි, පොදිකොට බඳනාලද; මහාපල්ලව භොගතො, මහාපල්ලව භොගනම් රටින්; විඤ්ඣාටවිවත්තනිය සෙනාසනතො, විඤ්ඣාටවිවත්තනිය සෙනාසනයෙන්; වනවාසි භොගතො, වනවාසිභොගනම් විහාරයෙන්,

100 භික්ඛූනං දීපවාසීනං ආගතානඤ්ච සබ්බසො
ගණනාය පරිච්ඡෙදො පොරාණෙහි න භාසිතො.

ආගතානඤ්ච, මෙහි පැමිණියාවූ; දීපවාසීනං භික්ඛූනං, ලක්දිව් වැසි භික්ෂූන්ගේ; ගණනාය, ගණනින්; පරිච්ඡෙදො, පරිච්ඡෙදයෙක්; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; පොරාණෙහි, පූර්වාචාර්යයන් විසින්; න භාසිතො, නොකියන ලද්දේය.

101 සමාගතානං භික්ඛූනං සබ්බසං තංසමාගමෙ
වුත්තා ඛීණාසවායෙව තෙ ඡන්නවුති කොටියො.

තංසමාගමෙ, ඒ සමාගමයෙහි; සමාගතානං, රැස්වූ; සබ්බසං භික්ඛූනං, සියලු භික්ෂූන් අතුරෙහි, තෙ ඛීණාසවායෙව, ඒ ක්ෂීණාශ්‍රවයෝම; ඡන්නවුතිකොටියො, සයානූකෙළක්, වුත්තා, කියනලද්දහුය.

සුවණ්ණඛීලං, සුවර්ණඛීලයෙහි; (රන්කණුවෙහි) පටිමුක්කං, ප්‍රවෙශකරනලද; පරිබ්භමනදණ්ඩං, සිසාරනදණ්ඩ; දුප්පරිහාරියඤ්ච භවිස්සතීති, පරිහරණය කරන්ට දුෂ්කරවන්නේයයි; උපදිසන්තො, උපදෙස් දක්වන්නේ; ආවිජ්ඣිත්වා, සිසාරා; පරිබ්භමිතලෙඛායං, වටඇඳි රේඛාවෙහිවූ; භද්දකකම්මෙතනභ, යහපත්යොනලද උතුරුසළුනැකතින්; නානාවිධ මඞ්ගලාභි සංඛතඨානෙ, නානාවිධ මඞ්ගල්‍යයෙන් මොනවට සරසනලද ස්ථානයෙහි.

## ථූපාරම්භ කථා.

පෙසිකානං සතං, මෙහෙකරුවන් සියයක්; එකාහං, එක්දිනකට; එකං පංසුසකටං, එක් පස්නැලක්; ඛෙපෙත්වා, ක්ෂයකොට; එකං පංසුකුම්භං, එක්පස්කුඹක්; (පස්දසඅමුණක්) උදුක්ඛලෙ කොට්ටෙත්වා, වනෙහිලා කොටා; සුපෙපහි වට්ටෙත්වා, කුලුවලින් පොළා; නිසදෙ පිංසිත්වා, දෂගලෙහි ලා අඹරා; උදකපිඨියං ආහනි, පැන්පිට ගැසීය; එළිකසටසදිසං, දූවානකළයකට බඳුවූ; පඤ්චවිධ මුඛවාසසහිතතාම්බූලානී ච, පස්පලවතින්යුත් බුලත්ද; එකං මහල්ලකබිලපීළං, එක්මාලුබිලතැතු; තතො ජාතිසුමනමකුලකුම්භ, දෑසමන් කැකුළුතුන්කුඹක් හෙවත් සමන් කැකුළු සෙළයාළක්; සෙළසත්ථරං, ශෛලමය පුෂ්පාසනය; කොසිවාළජනපදෙ, කොටසර දනව්වෙහි; අපනීතකං කත්වා, පින් අසින්නෙතාකොට.

102 චිත්තප්පසාදමත්තෙන සුගතෙ ගති උත්තමා
ලබ්භතීති විදිත්වාන ථූපපූජං කරෙ බුධො.

සුගතෙ, සර්වඥයන්වහන්සේ කෙරෙහි; චිත්තප්පසාදමත්තෙන, සිතපැහැදීම් මාත්‍රයකින්; උත්තමා ගති, උතුම්ගතියක්; ලබ්භතීති, ලැබෙන්නේයයි; විදිත්වාන, දැන; බුධො, ප්‍රාඥතම; ථූපපූජං, චෛත්‍ය පූජාව; කරෙ, කරන්නේය.

පුප්ඵධානත්තයං, තුන්මාල් පේසාව; චිතං චිතං, ඉදිකරන කරන ලද්ද; ජම්මෙදකවණ්ණපාසාණෙ, මෙදකවන්පහන්සයක්; භණ්ඩපුප්ඵ නිභෙ, බඳුවදමල්පැහැවැනිවූ; සිරිවච්ඡාදීහි, ශ්‍රීවත්සාදියෙන්ද; අප්පිතානි, අවිනතලද්දැහු; සත්තරතනමය වෙදිකා, සත්රුවන්මුවා පිළිකඩ; මහාමලකමුත්තා, මහඇඹුල පලසා මුතු; ගන්ධබ්බං ඝුරුමානං, ගායනාකරන්නාවූ; සූකරමද්දවපටිග්ගහණං, මෘදුවූ ශූකරමාංශ ප්‍රතිග්‍රහණය; අම්බපාසාණවාසී, අඹපහන්වැසි; අට්ටං විනිච්ඡිනන්තො, නඩුවක් විනිශ්චය කරන්නේ; වාලුකාපාකාරපරිච්ඡෙද, වැලිමලුවෙහි පවුරුකෙළවර දක්වා; නිග්‍රොධපිට්ඨිතෙපිටකමහාසීවත්ථෙරො, නුගපිට ත්‍රිපිටක මහාසීවස්ථවිරතෙම.

103 ඉන්දගුත්තමහාථෙරො ඡළභිඤ්ඤො මහාමතී
කම්මාධිට්ඨායකො එත්ථ සබ්බං සංවිදහී ඉමං.

ඡළභිඤ්ඤො, ෂඩ්අභිඥවූ: මහාමති, මහාප්‍රාඥවූ; ඉන්දගුත්තමහාථෙරො, ඉන්දගුත්තමහාස්ථවිරතෙම; කම්මාධිට්ඨායකො, කර්මාධිෂ්ඨායකසේක්; ඉමං සබ්බං; මේ සියල්ල; එත්ථ, මෙහි; සංවිදහි, විධාන කළසේක.

104 සබ්බං රාජිද්ධියා එතං දෙවතානඤ්ච ඉද්ධියා
ඉද්ධියා අරියානඤ්ච අසම්බාධං පතිට්ඨිතං.

එතං සබ්බං, මේ සියල්ල; රාජිද්ධියා, රාජසෘද්ධියෙන්ද; දෙවතානඤ්ච ඉද්ධියා, දෙවතාවන්ගේ සෘද්ධියෙන්ද; අරියානඤ්ච ඉද්ධියා, ආර්‍ය්‍යවරයන්ගේ සෘද්ධියෙන්ද: අසම්බාධං, සම්බාධරහිතව හෙවත් නොගැටී; පතිට්ඨිතං, පිහිටියේය.

ධාතුගබ්භරූපවණ්ණනා කථා.

පූජාපරිවෙණවාසිකං, පුදපිරිවෙන් වැසිවූ; සන්නිසින්නං, සන් සිඳුනාවූ.

105 යොජනසතමාමට්ටං දීඝං තිසතයොජනං
ඵණානෙකසහස්සානි මාපයිත්වා මහිද්ධිකො.

යොජනසතමාවට්ටං, යොදුන් සියයක් වටඇති; තිසතයොජනං, තුන්සියයක් යොදුන්; දීඝං, දිඝීවූ; අනෙකසහස්සානී, නොයෙක් දහස්ගණන්; ඵණා, පෙණ; මාපයිත්වා, මවා; මහිද්ධිකො, මහත් සෘද්ධිඇති.

106 සිනෙරුපාදමූලම්හි ධූමායන්තො ච පජ්ජලං
ආභුජිත්වාන සො භොගෙ නිපජ්ජි වාලුකාතලෙ.

සො, ඒ නාරජතෙම; සිනෙරුපාදමූලම්හි, මහාමෙරුපර්වතපාද මූලයෙහි; ධූමායන්තොව, දුමන්නේ; පජ්ජලං, දිලිහෙන්නේ; භොගෙ, භොගයන්; ආභුජිත්වාන, හකුළා; වාලුකාතලෙ, වාලුකා තලයෙහි; නිපජ්ජි, වැදහොත්තේය.

107 අනෙකානි සහස්සානි අත්තනා සදිසෙ අහි
මාපයිත්වා සයාපෙසි සමන්තා පරිවාරිතෙ.

අනෙකානි සහස්සානි, නොයෙක් දහස් ගණන්; අත්තනා සදිසෙ, තමාවැනිවූ; අහි, නාගයන්; මාපයිත්වා, මවා; සමන්තා, හාත් පස; පරිවාරිතෙ, පිරිවරකොට ඇත්තවුන්; සයාපෙසි, ශයනය කර වූයේය.

108 බහූ දෙවා ච නාගා ච ඔසරිංසු තහිං තදා
යුද්ධං උභින්නං නාගානං පස්සිස්සාම මයං ඉති.

තදා, එකල්හි; තහිං, එහි; බහූ දෙවා ච, බොහෝ දෙවියෝද; නාගා ච, නාගයෝද; උභින්නං නාගානං, නාගයන්දෙදෙනාගේ; යුද්ධං, යුද්ධය; මයං, අපි; පස්සිස්සාම ඉති, බලන්නෙමුයයි; ඔසරිංසු, රැස්වූවාහුය.

109 අනෙකධා අනෙකෙහි රතනෙහි සුසංඛතං
චෙතියං චෙතියඝරං පස්ස භික්ඛු සුනිම්මිතං.

අනෙකෙහි රතනෙහි, නොයෙක් රත්නයෙන්; අනෙකධා, නොයෙක් පරිච්ඡේදින්; සුසංඛතං, මොනවට සකස්කරනලද;

සුනිම්මිතං, මොනවට නිර්මිතකරනලද; චෙතියං, සෑයද; චෙතිය ඝරං, සෑගෙයද; භික්ඛු, ශ්‍රමණයන්වහන්ස; පස්ස, බැලූවමැනව.

අඩ්ඪචන්දක පාසාණෙ, සඳකඩපහණෙහි; පවාළපදුමමහි, පබළු පියුමෙහි.

110 සබ්බාභිසමයො නාග තුම්හාකම්පි න විජ්ජති
සබ්බාභිසමයඨානං නෙතුං යුත්තං හි ධාතුයො.

නාග, නාගරාජය; තුම්හාකං, තොපට; සබ්බාභිසම්මයොපි, සත්‍යාවබොධයෙක්ද; නවිජ්ජති, නොවේ; ධාතුයො, ධාතූන්; සබ්බාභිසමයඨානං, සත්‍යාවබොධය ඇත්තාවූ තැනකට; නෙතුං, පමුණුවන්ට; යුත්තං හි, යුතුමය.

111 සංසාර දුක්ඛමොක්ඛාය උප්පජ්ජන්ති තථාගතා
බුද්ධස්ස චෙවාධිප්පායො තෙන නෙස්සාමි ධාතුයො.

තථාගතා, තථාගතවරයෝ; සංසාරදුක්ඛමොක්ඛාය, සසරදුකින් මුදනුපිණිස; උප්පජ්ජන්ති, උපදිත්; එත්ථ, මෙහි; බුද්ධස්සච, සර්වඥයන් වහන්සේගේද; අධිප්පායො, අභිප්‍රායවෙයි; තෙන, එහෙයින්; ධාතුයො, ධාතූන්; නෙස්සාමි, ගෙනයන්නෙමි.

112 ධාතුනිධානං අජ්ජෙව සො හි රාජා කරිස්සති
තස්මා පපඤ්චමකරිත්වා ලහුං මෙ දෙහි ධාතුයො.

සොහි රාජා, ඒ රජතෙම; ධාතුනිධානං, ධාතුනිධානය; අජ්ජෙව, අදම; කරිස්සති, කරන්නේය; තස්මා, එහෙයින්; පපඤ්චං අකරිත්වා, ප්‍රමාදනොකොට; ලහුං, වහාම; මෙ, මට; ධාතුයො, ධාතූන්; දෙහි, දෙව.

අප්පටිභානො හුත්වා, කිසිවක් නොවැටහුනෙක්වම.

113 සුබුමං කරං මාපයිත්වා භික්ඛු තත්‍ර ඨිතොව සො
භාගිනෙය්‍යස්ස වදනෙ හත්ථමපක්ඛිප්ප තාවදෙ.

සො භික්ඛු, ඒ භික්ෂුතෙම; තත්‍රඨිතොව, එහිසිටියේම; සුබුමං කරං, සියුම් අතක්; මාපයිත්වා, මවා; තාවදෙ, එකෙණෙහිම; භාගිනෙය්‍යස්ස, (නාරජහු) බෑනණුවන්ගේ; වදනෙ, මුඛයෙහි; හත්ථං පක්ඛිප්ප, අතබිගා.

114 ධාතුකරණ්ඩමාදාය තිඨ නාගාති භාසිය
නිමුජ්ජිත්වා පඨවියං පරිවෙණම්හි උඨහි.

ධාතුකරණ්ඩං, දාකරඬුව: ආදාය, ගෙන; නාග, නාගය; තිඨ ඉති, සිටුවයි; භාසිය, කියා; පඨවියං, පෘථිවියෙහි; නිමුජ්ජිත්වා, ගැලී; පරිවෙණම්හි, (පුද) පිරිවෙන්හි; උඨහි, නැඟී සිටියේක.

115 භාගිනෙය්‍යො'ථ කුච්ඡිම්හි අපස්සිත්වා කරණ්ඩකං
පරිදෙවමානො ආගන්ත්වා මාතුලස්ස නිවෙදයි.

අථ, නැවත; භාගිනෙය්‍යො, බෑනණුතෙමේ; කුච්ඡිම්හි, කුසෙහි; කරණ්ඩකං, දාකරඬුව; අපස්සිත්වා, නොදැක; පරිදෙවමානො, හඬමින්; ආගන්ත්වා, අවුත්; මාතුලස්ස, මාමාට, නිවෙදයි, දැන්වූයේය.

116 තදා සො නාගරාජාපි වඤ්චිතම්හ මයං ඉති
පරිදෙවි නාගා සබ්බපි පරිදෙවිංසු පිණ්ඩිතා. *

තදා, එකල්හි, සො නාගරාජාපි; ඒ නාරජතෙමේද; මයං, අපි; වඤ්චිතම්හ ඉති, රවටනලද්දම්හයි; පරිදෙවි, හැඬූයේය; පිණ්ඩිතා, රැස්වූ; සබ්බෙපි නාගා, සියලු නාගයෝ; පරිදෙවිංසු, හැඬුවාහුය.

විලීන සොකම්ව, වැගිරෙන ශොකයක්මෙන්; අස්සුධාරං, කඳුළු ධාරාව.

117 පරිදෙවමානා ආගන්ත්වා නානා සඞ්ඝස්ස සන්තිකෙ
බහුධා පරිදෙවිංසු ධාතාහරණදුක්ඛිතා.

නාගා, නාගයෝ; පරිදෙවමානා, හඬමින්; ආගන්ත්වා, අවුත්; ධාතාහරණදුක්ඛිතා, ධාතුගෙන ඒමෙන් දුඃඛිතවූවාහු; සංඝස්ස සන්තිකෙ, සංඝයාගේ සමීපයෙහි, බහුධා, බොහෝසෙයින්; පරිදෙ විංසු, හැඬුවාහුය.

චිරපරිහටධාතුයො, බොහෝකලක් පරිහරණය කළ ධාතූන්.

118 තෙසං සංඝො'නුකම්පාය ථොකං ධාතුම්දාපයී
තෙ තෙන තුට්ඨා ගන්ත්වාන පූජාභණ්ඩානි ආහරුං.

සංඝො, සංඝතෙම; තෙසං, ඔවුන්ට; අනුකම්පාය, අනුකම්පා වෙන්; ථොකං ධාතුං, ධාතුස්වල්පයක්, අදාපයී, දෙවූයේක; තෙ,

* "පීඩිතා"යි සමහර පොත්වල තිබේ, එසේකල (ශොකයෙන්) පීඩිතවූ නියා අර්ථගතයුතුයි.

ඔහුතුමූ; තෙන, එයින්; තුට්ඨා, සතුටුව; ගන්ත්වාන, ගොස්; පූජාභණ්ඩානි, පූජාභාණ්ඩයන්; ආහරුං, ගෙනාවාහුය.

119 බ්‍රහ්මා ඡත්තමධාරෙසි සන්තුසිතො වාලවීජනිං
මණිතාලවණ්ටං සුයාමො සක්කො සංඛන්තු සොදකං.

බ්‍රහ්මා, බ්‍රහ්මතෙම; ඡත්තං, ඡත්‍රය, අධාරෙසි, දැරූයේය; සන්තුසිතො, සන්තුසිතනම් දිව්‍යපුත්‍රතෙම; වාලවීජනිං, වල්විදුනාව; (ඇලමින් සිටියේය); සුයාමො, සුයාමනම් දිව්‍යපුත්‍රතෙම; මණිතාලවණ්ටං, මිණිතල්වැට, (දැරූයේය); සක්කොතු, සක්දෙව්රජතෙම; සොදකං, දියසහිතවූ; සංඛං, ශඞ්ඛය; (එඹිමින්සිටියේය.)

120 චත්තාරො තු මහාරාජා අට්ඨංසු ඛග්ගපාණිනො
සමුග්ගහත්ථා ද්වත්තිංසා දෙවපුත්තා මහිද්ධිකා.

චත්තාරොතු මහාරාජා. සතරවරම් මහරජදරුවෝ; ඛග්ගපාණිනො, කඩුනත් අත්ඇත්තාහු; අට්ඨංසු, සිටගත්හ; මහිද්ධිකා, මහත් සෘද්ධිඇති; ද්වත්තිංසා දෙවපුත්තා, දෙතිස් දිව්‍යපුත්‍රයෝ; සමුග්ගහත්ථා, සුමුගුගත් අත්ඇතිව.

121 පාරිච්ඡත්තකපුප්ඵෙහි පූජයන්තා තහිං ඨිතා
කුමාරියොපි ද්වත්තිංසා දණ්ඩදීපධරා ඨිතා.

පාරිච්ඡත්තකපුප්ඵෙහි, පරසතුමලින්; පූජයන්තා, පුදමින්; තහිං ඨිතා, එහි සිටියහ; ද්වත්තිංසා කුමාරියොපි, දෙතිස්දිව්‍යකුමාරිකාවෝද; දණ්ඩදීපධරා, දඬුවැටපහන් ධරමින්; ඨිතා, සිටියාහ.

122 පලාපෙත්වා දුට්ඨයක්ඛෙ යක්ඛසෙනාපතී පන
අට්ඨවීසති අට්ඨංසු ආරක්ඛං කුරුමානකා.

අට්ඨවීසති යක්ඛසෙනාපතී පන, අෂ්ටවිංශති යක්ෂසෙනාධිපතීහු වනාහි; දුට්ඨයක්ඛෙ, දුෂ්ටවූ යක්ෂයන්; පලාපෙත්වා, පලවා; ආරක්ඛං කුරුමානකා, ආරක්ෂාකරමින් (සිටියහ.)

123 වීණං වාදයමානොව අට්ඨාපඤ්චසිඛො තහිං
රඞ්ගභූමිං මාපයිත්වා තිම්බරූ තුරියඝොසවා.

පඤ්චසිඛො, පඤ්චශිඛනම් දිව්‍යපුත්‍රතෙම; වීණං වාදයමානොව, වීණාවාදනය කරමින්ම; තහිං, එහි; අට්ඨා, සිටියේය; තිම්බරූ, තිම්බරුනම් ගාන්ධර්වදෙව්පුත්තෙම; රඞ්ගභූමිං, නෘත්‍යභූමියක්; මාපයිත්වා, මවා; තුරියඝොසවා, තූර්‍යඝොෂා ඇතිව; (සිටියේය.)

124 අනෙකා දෙවපුත්තා ච සාධුගීතප්පයොජකා
මහාකාළො නාගරාජා ථූයමානො අනෙකධා.

අනෙකා දෙවපුත්තා ච, නොයෙක් දිව්‍යපුත්‍රයෝද; සාධුගීතප්පයොජකා, සාධුගීතිකා යොදන්නාහුවූහ; මහාකාළො නාගරාජා, මහාකාළ නම් නාරජතෙම; අනෙකධා, නොයෙක්පරිද්දෙන්; ථූයමානො, ස්තුතිකරමින් සිටියේය.

125 දිබ්බතුරියානි වජ්ජන්ති දිබ්බසංගීති වත්තති
දිබ්බගන්ධානි වස්සානි වස්සාපෙන්ති ච දෙවතා.

දිබ්බතුරියානි, දිව්‍යතූර්‍ය්‍යයන්; වජ්ජන්ති, වාදනයකෙරෙත්; දිබ්බසංගීති, දිව්‍යසංගීතයද; වත්තති, පවතී; දෙවතා, දෙවතාවෝ; දිබ්බගන්ධානි, දිව්‍යසුවඳැති; වස්සානි, වර්‍ෂාවන්; වස්සාපෙන්ති, වස්වත්.

ගන්ධබ්බදෙවතා, වාද්‍යකරන දෙවතාවෝ; සුවණ්ණපිණ්ඩිකසෙතච්ඡත්තං, රන්පුබුදුසේසතින්; සීලපතිට්ඨං, (සිවුපිරිසිදු) ශීල නමැති ආධාරඇති; සමාධිදණ්ඩං, සමාධි භාවනා නමැති දඬුඇති, ඉන්ද්‍රියසලාකං, ඉන්ද්‍රිය නමැති ගොණ්ඇස් ඇති; බලමාලං, දශබල නමැති මාලා පත්‍රපඞ්ක්ති ඇති; මග්ගඵලපත්තසංඡන්නං, මාර්ගඵල නමැති පත්සෙවෙනි ඇති; විමුත්තිවරසෙතච්ඡත්තං. විමුක්ති නමැති උතුම් සේසත; උස්සාපෙත්වා, ඔසවා; ඤාණාභිසෙකං පත්තො, ප්‍රඥ නමැති අභිෂෙකයට පැමිණිසේක්.

126 අනාකුලා කෙහිචිපි යදි හෙස්සන්ති ධාතුයො
ජනස්ස සරණං හුත්වා යදි ඨස්සන්ති ධාතුයො.

යදි, ඉදින්, ධාතුයො, ධාතූහු; කෙහිචිපි, කිසිවකුන්ගෙනුත්; අනාකුලා හෙස්සන්ති, නිරාකුලවන්නාහුද; යදි, ඉදින්; ධාතුයො, ධාතූහු; ජනස්ස, ජනයාහට; සරණං හුත්වා, සරණව; ඨස්සන්ති, සිටිත්ද.

127 සත්ථුනිපන්නාකාරෙන පරිනිබ්බානමඤ්චකෙ
නිපජ්ජන්තු සුපඤ්ඤත්තෙ සයනම්හි මහාරහෙ.

පරිනිබ්බානමඤ්චකෙ, පිරිනිවන් මඤ්චකයෙහි; සත්ථුනිපන්නාකාරෙන, ශාස්තෘන්වහන්සේ වැදහොත් ආකාරයෙන්; සුපඤ්ඤත්තෙ, මනාකොට පනවනලද; මහාරහෙ, මාහැඟිවූ; සයනම්හි, ශයනයෙහි; නිපජ්ජන්තු, වැදහෝනා සේක්වා.

128 ආසාළ්හිසුක්කපක්ඛස්ස පණ්ණරස උපොසථෙ
උත්තරාසාළ්හනක්ඛත්තෙ එවං ධාතු පතිඨිතා.

ආසාළ්හීසුක්කපක්ඛස්ස, ඇසළමසශුක්ලපක්ෂයසම්බන්ධිවූ; පණ්ණරසඋපොසථෙ, පසළොස්වක් පොහොයෙහිවූ; උත්තරාසාළ්හනක්ඛත්තෙ, උතුරුසළ නැකත ඇතිකල්හි; එවං, මෙසේ; ධාතු. ධාතුහු; පතිඨිතා, පිහිටියාහුය.

129 සහ ධාතුපතිට්ඨානා අකම්පිත්ථ මහාමහී
පාටිහීරානි නෙකානි පවත්තිංසු අනෙකධා.

සහධාතුපතිට්ඨානා, ධාතුපිහිටීම හා සමග; මහාමහී, මහාපෘථිවී තොමෝ; අකම්පිත්ථ, කම්පාවූවාය; අනෙකධා, නොයෙක්පරිද්දෙන්; නෙකානි පාටිහීරානි, නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍යයෝ; පවත්තිංසු, පැවැත්තාහුය.

සංකම්පි. කම්පාවූවාය; සම්පකම්පි, වෙසෙසින් කම්පාවූවාය; සම්පවෙධි, වෙවුලූවාය; සංඛුභි, කැළඹුණේය; නිච්ඡරිංසු, නිකුත් වූවාහුය; ඛණිකවස්සං, ක්ෂණිකවර්ෂාව; හෙවත් අකල්මෙඝය; කාඤ්චනමාලිකසෙතච්ඡත්තාන; රන්මල්ඇති ධවලච්ඡත්‍රයෝය.

130 තිට්ඨන්තං සුගතං තිලොකමහිතං යො පූජයෙ සාදරං
යො වා සාසපබීජමත්තමපි තං ධාතුං නරො පූජයෙ
තෙසං පුඤ්ඤඵලං සමානමිති තං චිත්තප්පසාදෙ සමෙ
ඤත්වා තං පරිනිබ්බුතෙපි සුගතෙ ධාතුං බුධො පූජයෙ.

යො, යම්සත්වයෙක්තෙම; තිලොකමහිතං, තුන්ලෝවාසීන් විසින් පුදනලද්දාවූ; තිට්ඨන්තං සුගතං, ජීවමාන සර්වඥයන්වහන්සේට; සාදරං, ආදර සහිතව; පූජයෙ, පුදන්නේද; යො නරො වා, යම්සත්වයෙක්තෙම; තං, උන්වහන්සේගේ; සාසපබීජමත්තං අපි, අබැටක් පමණවූද; ධාතුං, ධාතුරත්නයට; පූජයෙ, පුදන්නේද; පරිනිබ්බුතෙපි, පිරිනිවියාවූද; සුගතෙ, සර්වඥයන් වහන්සේ කෙරෙහි; චිත්තප්පසාදෙ, චිත්තප්‍රසාදය; සමෙ, සමව ඇතිකල්හි; තෙසං, ඔවුන්ගේ; තංපුඤ්ඤඵලං, ඒ කුශලඵලය; සමානං ඉති, සමානයයි, ඤත්වා, දැන; බුධො, ප්‍රාඥතෙම; තං ධාතුං, ඒ ධාතුරත්නයට; පූජයෙ, පුදන්නේය.

ධාතු නිධාන කථා.

උදරෙන සද්ධිං, ගැඹුර හා සමග; චතුරස්සකොට්ඨකං, සතරැස් කොටුව; ඡත්තකම්ම, (සැළයහි) සැත්කම් හා; කඤ්චුකං කාරෙත්වා, සැට්ටයක් කරවා; පටිමුඤ්චාපෙත්වා, ප්‍රවෙශකරවා; චිත්තකාරෙහි, සිත්තරුන් ලවා; වෙදිකාච, මුදුන්පිල්කඩ; පුණ්ණඝටපඤ්චඞ්ගුලි පන්තියො ච, පුන්කලස් පසඟුල් පඞ්ක්තීන්ද; චෙළුමය ඡත්තං, හුණ දඬුමුවා ඡත්‍රය; වෙදිකාමුඛනි, පිල්කඩ මුදුනෙහි; ඛරපත්තමයෙ, කරපත්මයවූ; චන්දසුරියෙ, චන්ද්‍රසූර්‍ය්‍යයන්; ලාඛාකුඞ්කුමෙහි; ලාකා හා කොකුමෙන්; කරින්දනදීසීසෙ, කිරිඳිමොහොය හිස; පඤ්ජලිපබ්බතෙ, පඤ්ජලිනම් පව්වෙහි.

131 ථෙරපුත්තාභයත්ථෙරො මා භායි මනුජාධිප
කිලෙසසත්තුං අජිනිත්වා අජෙය්‍යො මච්චුසත්තුකො'ති·

මනුජාධිප, නරශ්‍රෙෂ්ඨවූ මහරජ; මාභායි, බියනොවෙව; කිලෙසසත්තුං, කෙලෙස් නමැති සතුරා; අජිනිත්වා, නොපරදවා; මච්චුසත්තුකො, මරසතුරා; අජෙය්‍යොඉති, පැරදවියනොහැක්කෙක් යයි; ථෙරපුත්තාභයත්ථෙරො, ථෙරපුත්තාභය ස්ථවිරතෙම (වදාළ සේක.)

සබ්බොයෙව ලොකසන්නිවාසො, සියලු ලෝවැසි තෙමේම; ජාතියා අනුගතො, ජාතිය අනුවගියේය, ජරාය අනුසටො, ජරාවෙන් වෙළුදනලද්දේය; ව්‍යාධිනා අභිභූතො, ව්‍යාධියෙන් මඩනාලද්දේය; මච්චුනා අබ්භාහතො, මරහු විසින් පරදවනලද්දේය.

132 යථාපි සෙලා විපුලා නභං ආහච්ච පබ්බතා
සමන්තා අනුපරියෙය්‍යුං නිප්පොථෙන්තා චතුද්දිසා.

සෙලා, ශෛලමයවූ; විපුලා, මහත්වූ; නභං ආහච්ච, අහසහැපී; පබ්බතා, පර්‍වතයෝ (සතරදෙනක්) චතුද්දිසා, සිව්දිගුන්; නිප්පොථෙන්තා, සුණුවිසුණුකරමින්; යථාපි, යම්සේ; අනුපරියෙය්‍යුං, අනු පරිවර්තනය වෙමින් එන්නාහුද,

133 එවං ජරා ච මච්චූ ච අධිවත්තන්ති පාණිනො
ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ
න කිඤ්චි පරිවජ්ජෙති සබ්බමෙවාභිමද්දති·

එවං, මෙසේ; ජරාච, ජරාවද; මච්චු ච, මරණයද; (ව්‍යාධියද විපත්තියද යන මොහු) ඛත්තියෙ, ක්ෂත්‍රියයන්ද; බ්‍රාහ්මණෙ, බ්‍රාහ්මණයන්ද; වෙස්සෙ, වෛශ්‍යයන්ද; සුද්දෙ, ශුද්‍රයන්ද; චණ්ඩාල පුක්කුසෙ, සැඬොල්බඹුරුකුලයන්හි ජාතවූවන්ද(යන); පාණිනො,

සත්වයන්; අභිවත්තන්ති, අභිභව නය කෙරෙත්; හෙයින් මැඩපියත්; කිඤ්චි, කිසිවෙක්; න පරිවජ්ජෙති, අත්නොහරි සබ්බංඑව, සියල්ලම; අභිමද්දති, හාත්පසින් මැඩපියයි.

134 න තත්ථ හත්ථීනං භූමි න රථානං න පත්තියා
න චාපි මන්තයුද්ධෙන සක්කා ජෙතුං ධනෙන වා.

තත්ථ, එහි; හත්ථීනං, හස්තිසෙනාවට; න භූමි, භූමිනොවෙයි; රථානං, රථසෙනාවටද; න, (භූමි) නොවෙයි; පත්තියා, පාබල සෙනාවද; න, (භූමි නොවෙයි) මන්තයුද්ධෙන, මන්ත්‍රයුද්ධයෙන්ද; ධනෙනවා, වස්තු දානයෙන්ද; ජෙතුං, ජයගන්ට; නචසක්කාඅපි, නොහැක්කේමය.

135 මහායසා රාජවරා ගතා තෙ
සබ්බෙ මහාසම්මතආදයොපි
අනිච්චභාවං බලදෙවආදී
මහා බලාචෙව තථා ගමිංසු.

136 යෙ පුඤ්ඤවන්තාති ගතා පසිද්ධිං
මහද්ධනා ජොතියමෙණ්ඩකාදි
උපාවිසුං මච්චුමුඛං සභොගා
සබ්බෙපි තෙ රාහුමුඛං සසීව.

මහායසා, මහත් යසස් ඇති, මහාසම්මතආදයො අපි, මහාසම්මතආදීවූ; රාජවරා, (යම්බඳු) රාජොත්තමයෝ වූවාහුද; තෙ සබ්බෙ, ඔහු හැමදෙන; අනිච්චභාවං, අනිත්‍යභාවයට; ගතා, ගියාහුය; බලදෙවආදී, බලදෙවආදීවූ; මහාබලාචෙව, මහබලැතියෝද; තථාගමිංසු, එසේම (අනිත්‍ය බවට) ගියාහුය; පුඤ්ඤවන්තාති, පුණ්‍යවන්තයෝයයි; පසිද්ධිං ගතා, ප්‍රසිද්ධියට ගියාවූ; මහද්ධනා, මහධන ඇති; ජොතියමෙණ්ඩකාදී, ජොතියමෙණ්ඩකාදීවූ; යෙ, යම් සිටු පුත්‍රයෝ වූවාහුද, තෙ සබ්බෙපි, ඔහු හැමදෙනද; සභොගා, භොග සහිතව; රාහුමුඛං, රාහුමුඛයට පත්, සසීව, චන්ද්‍රයාමෙන්; මච්චුමුඛං, මරහුගේ මුඛයට; උපාවිසුං, පැමිණියාහුය.

137 යො ඉද්ධිමන්තෙසු තථාගතස්ස
පුත්තෙසු සෙට්ඨො ඉති විස්සුතොපි
ථෙරො මහාරාජසහෙව ඉද්ධි-
බලෙන සො මච්චුමුඛං පවිට්ඨො.

මහාරාජ, මහරජ; තථාගතස්ස, තථාගතයන් වහන්සේගේ; පුත්තෙසු, පුත්‍රවූ; ඉද්ධිමන්තෙසු, සෘද්ධිමතුන් අතුරෙහි; සෙට්ඨොති,

ශ්‍රේෂ්ඨයයි, විස්සුතො, පතළාවූ; සොපි ථෙරො, යම් ස්ථවිරකෙනෙක් වීද, සො, ඒ (මහාමෞද්ගල්‍යායන) ස්ථවිරතෙමේද; ඉද්ධිබලෙන සහ එව, ඍද්ධිබලය හා සමගම: මච්චුමුඛං, මරහුගේ මුඛයට; පවිට්ඨො, පිවිසියේක.

138 සබ්බස්සු සත්තෙසු ජිනං ඨපෙත්වා
නෙවත්ථි පඤ්ඤාය සමොපි යෙන
සො ධම්මසෙනාපතිසාවකොපි
ගතො මහාරාජ අනිච්චතංව.

මහාරාජ, මහරජ; ජිනං ඨපෙත්වා, සර්වඥයන් වහන්සේ හැර; සබ්බස්සු සත්තෙසු, සියලු සත්ත්වයන් අතුරෙහි; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; යෙන, යමෙකු හා; සමොපි, සමානකෙනකුත්, නෙවත්ථි, නැද්ද; සො ධම්මසෙනාපතිසාවකොපි, ඒ ධර්මසෙනාපති (ශාරීපුත්‍රමහා) ශ්‍රාවකකෙමේද; අනිච්චතං, අනිත්‍යබවට; ගතොව, ගියේමය.

139 සයම්භුඤාණස්ස බලෙන සන්තිං
ගතා මහාරාජ සයම්භුනොපි
සබ්බෙපි තෙ ඤාණ බලූපපන්නා
අනිච්චතං නෙව අතික්කමිංසු.

මහාරාජ, මහරජ; සයම්භුඤාණස්ස, ස්වයම්භූඥානයාගේ; බලෙන, බලයෙන්; සන්තිං, නිර්වාණයට; ගතා, පැමිණියාවූ; සයම්භුනොපි, (සම්බුද්ධ) පසේබුදුවරයෝ වූවාහුද; ඤාණබලූපපන්නා, ඥානබලයෙන් සමන්විතවූ; තෙ සබ්බෙපි, ඒ සියලු පසේබුදුවරයෝද; අනිච්චතං, අනිත්‍යබව; නෙව අතික්කමිංසු, නොමඉක්මෙව්වාහුය.

140 තිලොකනාථො පුරිසුත්තමො සො
අනිච්චභාවං සමතික්කමිත්වා
නාසක්ඛි ගන්තුං සුගතොපි රාජ
අඤ්ඤස්සු සත්තෙසු කථාව නත්ථි.

රාජ, මහරජ, තිලොකනාථො, ලෝකත්‍රයට නායකවූ; පුරිසුත්තමො, පුරුෂොත්තමවූ; සො සුගතො අපි, ඒ සර්වඥතෙමේද; අනිච්චභාවං, අනිත්‍යබව; සමතික්කමිත්වා, ඉක්මවා; ගන්තුං, යන්ට; නාසක්ඛි, නොහැකිවිය; අඤ්ඤස්සු සත්තෙසු, අනික් සත්ත්වයන් කෙරෙහි; කථාව, කථනයකුදු; නත්ථි, නැත.

141 තස්මා මහාරාජ භවෙසු සත්තා
සබ්බෙපි නාසුං මරණා විමුත්තා
සබ්බම්පි සංඛාරගතං අනිච්චං
දුක්ඛං අනත්තාති විචින්තයස්සු.

මහාරාජ, මහරජ; තස්මා, එහෙයින්; භවෙසු, භවයන්හි; සබ්බෙපි සත්තා, සියලු සත්ත්වයෝ; මරණා, මරණින්; විමුත්තා නාසුං, නොමිදුණාහු වූහ; සංඛාරගතං, සංස්කාරයන්ට ඇතුළත්වූ; සබ්බම්පි, සියල්ලම; අනිච්චං, අනිත්‍යය; දුක්ඛං, දුක්ඛය; අනත්තාති, අනාත්මයයි, විචින්තයස්සු, වෙසෙසින් චින්තනය කරව.

142 දුතියෙ අත්තභාවෙපි ධම්මච්ඡන්දො මහා හි තෙ
උපට්ඨිතෙ දෙවලොකෙ හිත්වා දිබ්බසුඛං තුවං.

දුතියෙ අත්තභාවෙපි, දෙවනඅත්බැව්හිද; (මීට පූර්ව්‍යාත්මභාව යෙහිද) තෙ, තොපගේ; ධම්මච්ඡන්දො, ධර්මච්ඡන්දය හෙවත් කුශල කරණයෙහි අභිප්‍රායය; මහාහි, මහත්මැයි; දෙවලොකෙ, දෙව්ලොව; උපට්ඨිතෙ, එළඹසිටිකල්හි; තුවං, නුඹ; දිබ්බසුඛං, (ඒ) දිව්සැප; හිත්වා, හැර.

143 ඉධාගම්ම බහුං පුඤ්ඤං අකාසි ච අනෙකධා
කරණම්පෙකරජ්ජස්ස සාසනජොතනාය තෙ.

ඉධාගම්ම, මෙහි අවුත්; අනෙකධා, නොයෙක් පරිද්දෙන්; බහුං පුඤ්ඤං, බොහෝ පින්කම්; අකාසිච, කෙළෙහි, තෙ, තොප; එකරජ්ජස්ස කරණම්පි, එක්රාජ්‍යයක් කිරීමද; (රාජ්‍යය එක් සත්කිරීමද) සාසනජොතනාය, සම්බුද්ධශාසනය බබුළුවනුපිණිසමය.

144 මහාරාජ කතං පුඤ්ඤං යාවජ්ජදිවසා තයා
සබ්බං අනුස්සරෙය්‍යෙව සුඛං සජ්ජු භවිස්සති.

මහාරාජ, මහරජ; තයා, නුඹවිසින්; යාවජ්ජදිවසා, අද දවස දක්වා; කතං, කරනලද; සබ්බංපුඤ්ඤං, සියලු පින්; අනුස්සරෙය්‍යෙව, සිහිකළමනාමය; සජ්ජු, වහාම; (එකෙණෙහිම) සුඛංභවිස්සති, සුවවන්නේය.

අපස්සයානිච්ඡනිා. පිරිදී හල්මුසේකැයි කියා.

145 එකූනසතවිහාරා මහාරාජේන කාරිතා
එකූනසතෙකොටීහි විහාරෙරා මරිචවට්ටි ච.

මහාරාජෙන, මහරජහු විසින්; එකූනසතවිහාරා, එකුන්සිය සත් විහාරයෝ; කාරිතා, කරවනලද්දාහුය; මරිචවට්ටිවිහාරෙරාච,

(එසින්) මිරිසවැටි විහාරයත්; එකූනසතකොටීහි, එකුන්සියකෙළකින්; (කරවනලද්දේය.)

146 උත්තමො ලොහපාසාදෙ තිංසකොටීහි කාරිතො
මහාථූපෙ අනග්ඝානි කාරිතා චතුවීසති.

උත්තමො, උතුම්වූ; ලොහපාසාදෙ, ලොහොපහය තෙම; තිංසකොටීහි. තිස්කෙළකින්, කාරිතො, කරවනලද්දේය; මහාථූපෙ, මහසෑයෙහි; කාරිතා, කරවනලද; අනග්ඝානි, අනගිවූ; චතුවීසති, වස්තු සූවිස්සක් හැර.

147 මහාථූපම්හි සෙසානි කාරිතානි සුබුද්ධිනා
කොටිසහස්සං අග්ඝන්ති මහාරාජ තයා පුන.

මහාරාජ, මහරජ; සුබුද්ධිනා, මනාබුඩිඇති; තයා, නුඹ විසින්; මහාථූපම්හි, මහසෑයෙහි; කාරිතානි, කරවනලද; සෙසානි, සෙසු කර්මාන්තයෝ; කොටිසහස්සං, කෙළදහසක්; අග්ඝන්ති, අගනාහුය; පුන, නැවත.

148 කොලම්බනාමමලයෙ අක්ඛක්ඛායික ඡාතකෙ
කුණ්ඩලානි මහග්ඝානි දුවෙ දත්වාන ගණ්හිය

කොළම්බනාමමලයෙ, කොළම්බනම් මලයරටැ, අක්ඛක්ඛායික ඡාතකෙ, බුළුකනසායෙහි, * මහග්ඝානි, මහාඝිවූ; කුණ්ඩලානි දුවෙ, මිණිකොඩොල් සගළ; දත්වාන, දීකොට; ගණ්හිය; මිලගෙන.

149 ඛීණාසවානං පඤ්චන්නං මහාථෙරානමුත්තමො
දින්නො පසන්නචිත්තෙන කඞ්ගුඅම්බිල පිණ්ඩකො.

ඛීණාසවානං, ක්ෂීණාශ්‍රවවූ; පඤ්චන්නං මහාථෙරානං, පන්සියයක් මහතෙරුන්ට; පසන්නචිත්තෙන, පහන්සිතින්, උත්තමො, උතුම්වූ; කඞ්ගුඅම්බිලපිණ්ඩකො, ඇඹුල් සහිත තණසාලේ පිණ්ඩපාතයෙක්; දින්නො, දෙනලද්දේය.

150 චූළඞ්ගණියයුද්ධම්හි පරජ්ජිත්වා පලායතො
කාලං කොසාපයිත්වාන ආගතස්ස විහායසා.

චූළඞ්ගණියයුද්ධම්හි, චූළඞ්ගණිය යුද්ධයෙහිදී, පරජ්ජිත්වා, පැරද; පලායතො, පලායන්නාහු විසින්; කාලං කොසාපයිත්වාන, කාල ඝොෂණය කරවා; විහායසා, අහසින්; ආගතස්ස, වැඩියාවූ.

---

* මඩුකනසායෙහි-සිංහලපොත.

151 ඛීණාසවස්ස යතිනො අත්තානමනපෙක්ඛිය
දින්නං සරකභත්තානි පුඤ්ඤපොත්ථං අවාචයී.

ඛීණාසවස්ස යතිනො, ක්ෂීණාශ්‍රවයතිකෙනකුට; අත්තානං, තමන්; අනපෙක්ඛිය, අපෙක්ෂා නොකොට; (නොතකා) සරක භත්තං, රන්තැටියෙහි බත; දින්නං ඉති, දෙනලද්දේයයි; පුඤ්ඤ පොත්ථං, පින්පොත; අවාචයී, කියවී.

සප්පිසන්නිත්ත, ගිතෙලින් තෙමනලද; සුපරිසුද්ධවට්ටිකා, සුපිරිසිදුපහන් වැටියෙන් යුක්තාවූ; තෙලුළෙලාපකඤ්ච, තෙල්උපුල්වා කිරිබතක්ද; සතපක්කජාලපූවෙ, ගිතෙලින් බදනාලද මහදල් කැවුම්; (එළගිතෙලින් බදනාලද පුලුප් බදනා) ඔසාරෙතුං, හඳ රන්ට; කම්මමාලකෙ, කම්මාලකයෙහි; (පොහොනෝකරන මලුවෙහි.)

152 එවං අසාරෙ නිච්චයෙ ධනානං අනිච්චසභාවං සතතං සපඤ්ඤො
කත්වාන චාගං රතනත්තයම්හි ආදාය සාරං සුගතිං වජන්ති.

සපඤ්ඤො, සප්‍රාඥයෝ; අසාරෙ; නිසරුවූ; ධනානං නිච්චයෙ, ධන රැස්කිරීමෙහි; අනිච්චසභාවං, අනිත්‍ය ස්වභාවය; සතතං, නිරතුරු; එවං, මෙබඳුයයි දැන; රතනත්තයම්හි, රත්නත්‍රය විෂයෙහි; චාගං කත්වාන, (ඒ නිස්සාර ධනය) පරිත්‍යාගකොට; සාරං, සාරය; ආදාය, ගෙන; සුගතිං, සුගතියට; වජන්ති, යෙත්.

මහාමෙතිය කථා.

මහින්දසෙනනාමම්හි වසන්තොපරිවෙණකෙ
පත්තචීවරපාදෙ යො පිටකත්තයපාරගො.

සද්ධාසීලගුණූපෙතො සබ්බසත්තහිතෙ රතො
තෙන සාධු සමජ්ඣිට්ඨො යමහං කාතුමාරභිං.

මහින්දසෙනනාමම්හි පරිවෙණකෙ, මහින්දසෙන නම් පිරිවෙනෙහි; වසන්තො, වාසයකරන්නාවූ; පිටකත්තයපාරගො, පිටකත්‍රයෙහි පරතෙරට ගියාවූ; සද්ධාසීලගුණූපෙතො, ශ්‍රද්ධාශීලගුණයෙන් යුක්තාවූ; සබ්බසත්තහිතෙ රතො, සියලු සත්ත්වයන්ගේ හිතසැපයෙහි ඇලුණාවූ; පත්තචීවරපාදෙ, පත්තචීවරපාද නම්වූ; යො, යම් මහාස්ථවිරකෙනෙක්වීද; තෙන, ඒ මහතෙරුන්විසින්; සාධු, මොනවට; සමජ්ඣිට්ඨො, ආරාධනාකරනලද; අහං, මම; යං, යම්ප්‍රකරණයක්, කාතුං, කරන්ට; ආරභිං, ප්‍රාරබ්ධවීම්ද.

සොදානි නිට්ඨං සම්පත්තො ථූපවංසො අනාකුලො
පරිපුණ්ණො සබ්බථා සාධු පණ්ඩිතෙහි පසංසිතො

අනාකුලො, නිරාකුලවූ; සබ්බථා, සර්වප්‍රකාරයෙන්; පරිපුණ්ණො, සම්පූර්ණවූ; පණ්ඩිතෙහි, ප්‍රාඥයන් විසින්; සාධු, මනාකොට; පසංසිතො, ප්‍රශස්තවූ; සො ථූපවංසො, ඒ (මේ) ථූපවංසය තෙම; ඉදානි, දැන්; නිට්ඨං, නිමාවට; සම්පත්තො, පැමිණියේය.

යං පත්තං කුසලං කම්මං කරොන්තෙන ඉමං මයා
තෙන එතෙන පුඤ්ඤෙන සත්තා ගච්ඡන්තු නිබ්බුතිං.

ඉමං, මේ ථූපවංසය; කරොන්තෙන, කරන්නාවූ; මයා, මා විසින්; යං කුසලං කම්මං, යම් කුශලකර්මයකට; පත්තං, පැමිණෙන ලද්ද; තෙන එතෙන පුඤ්ඤෙන, ඒ මේ කුශලකර්මය කරණකොටගෙන, සත්තා, සත්වයෝ; නිබ්බුතිං, නිවනට; ගච්ඡන්තු, පැමිණෙත්වා.

අනන්තරායෙන යථා ච සිද්ධි
මුපාගතො ථූපවරස්ස වංසො
තථෙව සද්ධම්මසිතා ජනානං
මනොරථා සීඝමුපෙන්තු සිද්ධිං.

යථා ච, යම්පරිද්දෙකින්; අනන්තරායෙන, අන්තරායවිගමනයෙන්; ථූපවරස්ස, උතුම් චෛත්‍යය සම්බන්ධවූ; වංසො, වංශයතෙම; හෙවත්, ථූපවරස්සවංසො, උතුම් ථූපවංසයතෙම; සිද්ධිං, නිමාවට; උපාගතො, පැමිණියේද; තථාඑව, එපරිද්දෙන්ම; ජනානං, සත්වයන්ගේ; සද්ධම්මසිතා, සද්ධර්මාශ්‍රිතවූ; මනොරථා, චිත්තසංකල්පනාවෝ; සීඝං, වහා; සිද්ධිං, පරිනිෂ්පත්තියට; උපෙන්තු, පැමිණෙත්වා.

පටිසම්භිදාමග්ගස්ස යෙන ලීනත්ථදීපනී
ටීකා විරචිතා සාධු සද්ධම්මොදයකාමිනා.

සද්ධම්මොදයකාමිනා, සද්ධර්මයාගේ වර්ධනය කැමැත්තාවූ; යෙන, යම් තෙරනමෙකු විසින්; පටිසම්භිදාමග්ගස්ස, ප්‍රතිසම්භිදාමාර්ගයට; ලීනත්ථදීපනීටීකා, ලීනාර්ථදීපනී ටීකාතොමෝ; සාධු, මනාකොට; විරචිතා, විරචිතද.

තථා පකරණෙ සච්චසංඛෙපෙ අත්ථදීපනා
ධීමතා සුකතා යෙන සුට්ඨු සීහළ භාසතො.

ධීමතා, ප්‍රාඥවූ; යෙන, යම් නරේන්ද්‍රයකු විසින්; තථා, එසේම; සච්චසංඛෙපෙ පකරණෙ, සච්චසඞ්ඛෙප නම් ප්‍රකරණයෙහි; අත්ථදීපනා, අර්ථවර්ණනාතොමෝ; සුට්ඨු, මනාකොට; සීහළභාසතො, සිංහලභාෂාවෙන්; සුකතා, කරනලද්දීද.

විසුද්ධිමග්ගසංඛෙපෙ යෙන අත්ථප්පකාසනා
යොගීනමුපකාරාය කතා සීහළ භාසතො.

යෙන, යම් නරේන්ද්‍රයකු විසින්; විසුද්ධිමග්ගසංඛෙපෙ, විශුද්ධිමාර්ගසංක්ෂෙපයෙහි; අත්ථප්පකාසනා, අර්ථවර්ණනා තොමෝ; යොගීනං, යොගාවචරයන්ට; උපකාරාය. වහල් පිණිස; සීහළභාසතො, සිංහලභාෂාවෙන්; කතා, කරනලද්දීද.

පරක්කමනරින්දස්ස සබ්බභූපාලකෙතුනො
ධම්මාගාරෙ නියුත්තො යො පිටකත්තයපාරගො.

සබ්බභූපාලකෙතුනො, සියලු මහීපාලයන්ට ධ්වජයක් බඳුවූ; පරක්කමනරින්දස්ස, (ඒ කලිකාලසාහිත්‍ය සර්වඥපණ්ඩිත) පරාක්‍රමබාහු නරේන්ද්‍රයාගේ; ධම්මාගාරෙ, ධර්මාගාරයෙහි, හෙවත් පොත්ගුල්වහාරයෙහි; නියුත්තො, අධ්‍යක්ෂකවූ; පිටකත්තයපාරගො, පිටකත්‍රයෙහි පාරප්‍රාප්තවූ, යො, යම් ස්ථවිරකෙනෙක්වීද.

සාසනං සුඨිතං යස්ස අන්තෙවාසික භික්ඛුසු
තෙන වාගිස්සරත්ථෙර පාදෙන ලිඛිතො අයං.

යස්ස, යම් ස්ථවිරකෙනකුගේ; අන්තෙවාසිකභික්ඛුසු, අතැවැසි භික්ෂූන් අතුරෙහි; සාසනං, අවවාදනු ශාසනය; සුඨිතං, සුප්‍රතිෂ්ඨිතද; තෙන වාගිස්සරත්ථෙරපාදෙන, ඒ වාගීශ්වර ස්ථවිරපාදයන් විසින්; අයං, මේ ප්‍රවරතර සුවිශුද්ධ ථූපවංසාභිධාන මාගධී සද්ධර්මප්‍රකරණය; ලිඛිතො, ලියනලදී.

**ගාථාපදාර්ථ විවරණ සහිත පාලි ථූපවංස ගැටපදය**
**මෙතෙකින් පරිසමාප්තවී.**

# සාරත්ථදීපිකා

නාම

# රසවාහිනීටීකා

පොරාණාචරියෙන ධීමතා සිරිසිඛණ්ඩත්ථෙරවරෙන

විරචිතා.

විජ්ජොදයපරිවෙණාධිපතිනො

තිපිටකවාචිස්සරාචරියස්ස **සිරිසුමඞ්ගලාභිධානස්ස**

පධානසංඝනායකත්ථෙරවරස්ස

සිස්සභූතෙන

විජ්ජොදයපරිවෙණවාසිනා "**ලේල්වල**" නාමගාමජෙන

**සිරිනිවාස**ත්ථෙරෙන ලෙඛකාවපාඨනිරාකරණෙන

විසොධිතා.

විජ්ජොදයපරිවෙණෙ

උපප්පධානෙනාචරියෙන **ඤාණිස්සර**ත්ථෙරවරෙන

පටිග්ගහිතා.

**සී. බොතේජු** නාමිකෙන සොගතෙන

ජිනාලඞ්කාර මුද්දාලයෙ මුද්දාපිතා.

බු. ව. **2450.**

# විඤ්ඤාපනං.

බුද්ධං සබුද්ධවිදිතාඛිලසච්චධම්මං
ධම්මඤ්ච සබ්භුපගතං විහතාරිසඞ්ඝං,
සඞ්ඝං මහග්ඝගුණතානුගතං යතත්තං
තත්තානන්තරායනිචයං සදයං නමාමි.

සාරත්ථදීපිකා නාමෙසා පුබ්බෙ පොරාණකෙහි මහාඛීණාසවත්ථෙරෙහි සීහලාය නිරුත්තියා ඨපිතාය මහාවිහාරෙ ගුත්තවඞ්කපරිවෙණමජ්ඣාවුත්ථෙන සසමයසමයන්තරකොවිදෙන සීලාද්‍යනෙකගුණගණාභරණභූසිතෙන රට්ඨපාලත්ථෙරවරාචරියෙන පඤ්ඤා අසෙසදෙසවාසීනමත්ථාය මාගධාභිධානාය මූලභාසාය සුපරිවත්තිතාය සත්ථුසාසනානුකාරිණියා රසවාහිනියා නාම පසත්ථප්පකරණියා තත්ථ තත්ථ ජාතානං දුබ්බොධියානං පාඨානමත්ථසාරුද්දීපනමත්ථයතා නානාසත්ථවිසාරදෙන ධීමතා **සිරිසිද්ධත්ථ**ත්ථෙරවරෙන සමාසවිසෙසනානත්ථනිරුත්තිලක්ඛණානි නිද්දිසන්තෙන සම්පාදිතා.

සා පන කිත්තිස්සිරිරාජසීහනාමිකස්ස සිරිලඞ්කාධිපතිනො කාලෙ ස්‍යාමරට්ඨතො ලද්ධාපි මගධක්ඛරලෙඛණත්තා සකලත්ථසිද්ධිමනාවහන්ති පවත්තා, තදා තස්සා තත්‍ර තත්‍ර පාකටීකරණමිච්ඡන්තෙන “**දරමිටිපොල**” නාමගාමජෙන සීලවතා **ධම්මරක්ඛිත**ත්ථෙරෙන සීහලක්ඛරෙහි පරිවත්තිතා සමානා සාරත්ථදීපිනියා රසවාහිනියා දුබ්බොධනීයානං පාඨානං සුබොධනොපකාරත්තමුපයාතා.

තථාපි සා කාලන්තරෙන අබ්‍යත්තපටිපොත්ථකලෙඛකප්පමාදුබ්භාවෙහි දොසෙහි ආකුලබ්‍යාකුලීභූතා විවිධවිරුද්ධත්ථතමුපගතා තප්පයොජනමපෙක්ඛන්තානං චිත්තාරාධනමකරොන්තී පවත්තා, තස්මා තම්මලාපහරණෙන සුබොධත්ථතමුපනීය ආධුනිකානං චිත්තාරාධනඤ්චෙව සාසනොපකාරතඤ්චිච්ඡන්තෙන මයා පරලොකං ගතස්ස “**උඩලමත්ත**” නාමගාමජස්ස **ආනන්ද** මහාථෙරවරස්ස චෙව විජ්ජොදයපරිවෙණාධිපතිනො පුජ්ජාචරියස්ස

තිපිටකවාචිස්සරස්ස **සිරිසුමඞ්ගලා**භිධානස්ස පධානසඞ්ඝනාය
කත්ථෙරවරස්ස ච ආනන්දපරිවෙණාධිපතිස්ස **ධම්මරතන**ත්ථෙර
වරාචරියස්ස ච සිස්සභූතෙන විජ්ජොදයපරිවෙණවාසිනා
"**ලේල්වල**" නාමගාමජෙන **සිරිනිවාස**නාමිකෙන විජ්ජොදය
පරිවෙණෙ උපාචරියස්ස **රතනසාර**යතිනො චූපත්ථම්භමුපගම්ම
කතිපයපොත්ථකානි සමොලොකෙත්වාන විසොධිතා.

විජ්ජොදයපරිවෙණෙ උපප්පධානාචරියෙන **ඤාණිස්සර**ත්ථෙර
වරෙන්'ඔසානසුද්ධිපත්තාවලොකනෙන සුන්දරම්ති පටිග්ගහිතා

අම්හෙහි පටිලද්ධෙසු පොත්ථකෙසු රසවාහිනියා ඔසානෙ
විජ්ජමානානං තිණ්ණං කථාවත්ථූනං ටීකා න දිස්සන්ති, සො
ඌනභාවො කථම්භූතොති ච න ඤායතෙ.

මම චෙපි පමාදෙන භවන්ති වීදූසම්මතා,
යෙ දොසා තෙ විසොධෙන්තු සමාධිසම්මතං ගතා.

H. Siriniwasa.

# SARATTHA DIPIKA

OR

# RASAVAHINI TIKA.

සාරත්ථදීපිකා

නාම

# රසවාහිනීටීකා.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

---

සත්ථුප්පසත්ථචරණං සරණං ජනානං
බ්‍රහ්මාදිමොලිමණිරංසිසමාවහන්තං,
පඞ්කෙරුහාභමුදුකොමලචාරුවණ්ණං
වන්දාමි චක්කවරලක්ඛණමාදධානන්ති.

තත්ථ 'සත්ථු'ති සදෙවකෙ ලොකෙ සාසකස්ස අනුසාසකස්ස භගවතො. 'පසත්ථ'න්ති දෙවමනුස්සෙහි පසංසිතං. 'චරණ'න්ති පාදයුගලං. 'සරණ'න්ති සරණභූතං. 'ජනාන'න්ති කිලෙසජනනට්ඨෙන ජනානං, සකල සම්පත්තියා බ්‍රූහිතොති බ්‍රහ්මා, බ්‍රහ්මා ආදි යෙසන්තෙ බ්‍රහ්මාදයො, තෙසං මොලි (මකුටො) බ්‍රහ්මාදිමොලි, බ්‍රහ්මාදිමොලිසු විජ්ජතො මණි බ්‍රහ්මාදිමොලිමණි, බ්‍රහ්මාදිමොලිමණීනං රංසි බ්‍රහ්මාදිමොලිමණිරංසි, බ්‍රහ්මාදිමොලිමණිරංසියො සමාවහතීති බ්‍රහ්මාදිමොලිමණිරංසිසමාවහං. 'පඞ්කෙරුහ'න්ති පදුමං තස්ස පදුමස්ස. 'චාරුවණ්ණ'න්ති අතීව මුදුභූතං කොමල පත්තචාරුවණ්ණං. 'චක්කවරලක්ඛණමාදධාන'න්ති එකෙකස්මිං පාදතලෙ මජ්ඣෙ සහස්සාර සනෙමික සනාභිකසබ්බාකාරපරිපුණ්ණ වරචක්කලක්ඛණසන්නිහිතං තං එවං භූතං සත්ථුචරණං වන්දාමි'ති සම්බන්ධො. තදනන්තරං ධම්මරතනපණාමං දස්සෙන්තො ආහ.

**සිද්ධං ජිනෙන චිරකාල මනඤ්ඤිතෙන**
**යං භාවකො සමධිගච්ඡති ඛෙමමග්ගං,**
**යං කප්පරුක්ඛ රුචිදන මණීව භාති**
**තං ධම්මමග්ගමසමං පණමාමි නිච්චන්ති.** *

තත්ථ 'සිද්ධ'න්ති එත්ථ සිද්ධසද්දො නිප්ඵන්නො නිච්චනිප්ඵන්න පසිද්ධවසෙන, සිද්ධමාකාසං සිද්ධමමතං සිද්ධො කොචි සප්පුරිසොච්චාදිසු විය; ඉධ පන නිප්ඵන්නත්ථො, සිජ්ඣතීති සිද්ධො නිප්ඵජ්ජතීති අත්ථො. '**ජිනෙනා**'ති සබ්බඤ්ඤුනා. '**අනඤ්ඤිතෙනා**'ති අතඤ්ඤිභූතෙන. '**යං**'ති යංධම්මං. '**භාවකො**'ති සම්භාවකො පුග්ගලො ඛෙමමග්ගං සමධිගච්ඡතීති යොජනා. '**යංකප්පරුක්ඛරුචිදන මණීව භාතී**'ති යො ධම්මො කප්පරුක්ඛො ඉව තථාරුචිදනසමත්ථමණි ඉච්ච **භාති** විරොචති. '**තං ධම්මමග්ග**'න්ති තං අග්ගං ධම්මං. '**අසම**'න්ති කෙනචි අසදිසං නිච්චං පණමාමී'ති යොජනා. ඉදානි සංඝරතන පණාමං දස්සෙන්තො ආහ.

**සන්තින්ද්‍රියං සුගත සූනුවරං විසුද්ධං**
**යං දක්ඛිණෙය්‍යමතදං සුචි පුඤ්ඤඛෙත්තං,**
**තාණෙසිනං සරණමුජ්ඣිත සබ්බදුක්ඛං**
**වන්දාමි සඞ්ඝමනඝං සිරසා මහග්ඝන්ති.**

තත්ථ '**සන්තින්ද්‍රිය**'න්ති සන්තං සමිතං චක්ඛාදිපඤ්චින්ද්‍රියමෙතස්සාති සන්තින්ද්‍රියො තං. '**සුගතසූනුවර**'න්ති සුගතස්ස වරපුත්තභූතං, එත්ථ හි සූනුසද්දො පුත්තපරියායො "ගතං මුනිනො රසසූනුනානුගං" වියච සුගතස්ස සූනුනො'ති ආදිසු වියච. '**දක්ඛිණෙය්‍යමතද**'න්ති දක්ඛිණෙය්‍යං අමතදන්ති ඡෙදො, දක්ඛිණෙය්‍යන්ති වරදක්ඛිණෙය්‍යං තෙනාහ ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො'ති, සුචින්ති වත්තබ්බෙ ඡන්දානුරක්ඛණත්ථං අනුනාසිකලොපො. '**තාණෙසින**'න්ති තාණං ලෙනං පරායණං එසීනං ගවෙසීනං සත්තානං. '**සරණ**'න්ති සරණභූතං. '**උජ්ඣිතසබ්බදුක්ඛ**'න්ති සබ්බං අපායදුක්ඛං වට්ටදුක්ඛඤ්ච උජ්ඣිතං උක්ඛිත්තං, උජ්ඣිතං සබ්බදුක්ඛමස්සා'ති උජ්ඣිතසබ්බදුක්ඛො තං සඞ්ඝං. '**අනඝ**'න්ති අඝස්ස දුක්ඛස්ස අභාවා අනඝං. '**මහග්ඝ**'න්ති මහග්ඝමණිසදිසං. තදනන්තරං සාණත්තිකං පුබ්බපඤ්චකං දස්සෙන්තො ආහ.

---

* අස්සං ගාථායං 'යංභාවකො' යංකප්පරුක්ඛ ඉච්චාදිසු 'යො භාවිතො' යොකප්පරුක්ඛ, ඉච්චාදිවසෙන කත්ථචි දිස්සති.

**යං පත්තමෙත්ථ රතනත්තයවන්දනෙන**
**පුඤ්ඤෙන තෙන දුරිතං සකලං පනුජ්ජ,**
**වක්ඛාමහං සුමධුරං රසවාහිනිං තං**
**භො භො සුණන්තු සුජනාභි මුදාවහා සා.**

**තත්ථ තත්ථුප්පන්නානි වත්ථූනි අරහා පුරෙ**
**අභාසුං දීපභාසාය ඨපෙසුං තං පුරාතනා.**

**මහාවිහාරෙ තඞ්ගුත්ත වඞ්කපරිවෙණ වාසිකො,**
**රට්ඨපාලොති නාමෙන සීලාචාරගුණාකරො.**

**හිතාය පරිවත්තෙසි පජානං පාලි භාසතො,**
**පුනරුත්තාදිදොසෙහි තමාසි සබ්බමාකුලං,**
**අනාකුලං කරිස්සාමි තං සුණාථ සමාහිතා.**

**විත්ථාරතා පුරෙ වො'චුං යස්මා තස්මා හි භාසිතං,**
**එතමා දරණී යං හි සාධු සාධූහි සබ්බදා'ති.**

තත්‍රා'යං යොජනා, එත්ථ එතිස්සං මයා රතනත්තයවන්දනෙන යං පුඤ්ඤං පත්තං 'තෙන පුඤ්ඤෙන' තෙන පුඤ්ඤාභිසන්දෙන සකලං නිඛිලං 'දුරිතං පනුජ්ජ' මනසි උජ්ඣානසමත්ථතෙන දුරිතන්ති ලද්ධවොහාරං අන්තරායං දූරීභූතං කත්වා තං සුමධුරං ධම්මමධුරං අත්ථමධුරවන්තං රසවාහිනිප්පකරණං වක්ඛාමි භො භො තුම්හෙ රසවාහිනිං සුණන්තු, රසවාහිනී 'සුජනාභිමුදාවහා, සප්පුරිසානං අභිමුදං පීතිපාමොජ්ජං ආවහා, ධම්මරසං අත්ථරසං ආවහති එත්ථා'ති රසවාහිනී, ධම්මරසො'ති පාලි ධම්මරසො, අත්ථරසො නාම තස්සට්ඨකථාරසො, කුසලා වා ධම්මා ධම්මරසො තෙසං විපාකො අත්ථරසො උභොපෙතෙ සබ්බරසානං පවරා උත්තමා, තෙනාහ භගවා, "සබ්බං රසං ධම්ම රසො ජිනාතී"ති ආදි, තදුභයං රසං වහති එත්ථ එතිස්සා'ති රසවාහිනී නාම–තදනන්තර ගාථාසු. තත්ථෙච්චාදිසු තත්ථ තත්ථ ඨානෙ උප්පන්නානි වත්ථූනි පුරෙ අරහා දීපභාසාය අභාසුන්ති සම්බන්ධො. ඨපෙසුන්ති පට්ඨපෙසුං නිට්ඨපෙසුං, තන්තිවත්ථුං, මහාවිහාරෙ වුත්තං තං ගුත්තන්ති පාඨො, තං වත්ථුං ගුත්තං ගොපිතං රක්ඛිතන්ති අත්ථො. **'වඞ්කපරිවෙණවාසිකො'**ති එවන්නාමකෙ පරිවෙණෙ වාසිකො. **'සීලාචාරගුණාකරො'**ති සීලාචාරාදීනං ගුණානං ආකරො පභවට්ඨානභූතො. **'පරිවත්තෙසී'**ති පාලිභාසතො පරිවත්තෙසි පජානං, භික්ඛුජනානං හිතත්ථායාති අජ්ඣාහාරො. **'පාලිභාසතො'**ති මගධභාසාය. **'පුනරුත්තාදිදොසෙහී'**ති අබ්‍යාපිතා නිබ්‍යාපිත පුනරුත්තාදි දොසෙහි තං සබ්බං පුබ්බෙ කතං ආකුලං හුත්වා ඨිතං අහං එතෙහි දොසෙහි අනාකුලං කරිස්සාමී'ති යොජනා. **'සමාහිතා'**ති

සමාහිතචිත්තා එකග්ගචිත්තා. '**වීතරාගා**'ති අරහන්තො. '**එතමාදරණීයංහි සාධු සාධූහි සබ්බදා**'ති නිච්චං එතං රසවාහිනිප්පකරණං සාධුකං සාධූහි සප්පුරිසෙහි සබ්බදා ආදරණීයං හොති.

ඉදානි තත්ථ තත්ථුප්පන්නානං වත්ථූනං ආදිතො පට්ඨාය උප්පත්තිං දස්සෙන්තො තත්ථ තෙසන්ති ආදිමාහ. '**තත්ථා**'ති තස්සං වුච්චමානරසවාහිනියං. '**තෙසං වත්ථූන**'න්ති තෙසං තෙසං වත්ථූනි ද්විධා භවන්තී'ති ජම්බුදීපෙ සීහලදීපෙචාති ද්විධාභවන්ති. '**තත්ථා**'ති තාසු ද්වීසු උප්පත්තීසු. '**ජම්බුදීපෙ තාලීසා**'ති ජම්බුදීපෙ තෙසං තෙසං කතකම්මානං වසෙන තා තා වත්ථුප්පත්තී චතුවග්ගසඞ්ගහිතා චත්තාලීසවත්ථුප්පත්තියො හොන්ති. '**සීහලදීපෙ තෙසට්ඨී**'ති සීහලදීපෙ තෙසං තෙසං කතකම්මානං වසෙන තා තා වත්ථුප්පත්තියො ඡබ්බග්ගසඞ්ගහිතා තෙසට්ඨි වත්ථුප්පත්තියො හොන්ති, උභයං සම්පිණ්ඩිත්වා දසවග්ගෙහි සඞ්ගහා සතවත්ථූහි මණ්ඩිතා රසවාහිනී නාමෙසා සතවත්ථූතිපි වුච්චතී'ති; තත්ථ ජම්බුදීපුප්පත්තිවත්ථූනි තාව කථීයන්තෙ. '**ජම්බුදීපො**'ති වෙත්ථ පන සිනෙරුපබ්බතරාජස්ස දක්ඛිණදිසාභාගෙ දසසහස්සයොජනවිත්ථාරො සබ්බබුද්ධානං චෙව චක්කවත්තීනං ච නිබ්බත්තිගබ්භභූතො නිච්චං එකසතරාජනිවාසභූතො බොධිරුක්ඛරතනපල්ලඞ්කෙනුපසොභිතො එසො ජම්බුදීපො නාම, තස්මිං ජම්බුදීපෙ තත්ථ තත්ථ ගණ්හිත්වා කත්වා ඉදං නාම ඵලං පච්චනුභොතී'ති අයමුප්පත්ති ජම්බුදීපුප්පත්තී'ති වෙදිතබ්බා, තස්සා ච වත්ථුභූතානි පුරෙ වීතරාගෙහි ඨපිතානි ගෙය්‍යභූතානි අක්ඛරාවලිපතිමණ්ඩිතානි වචනානි ජම්බුදීපුප්පත්තිවත්ථූනි නාම, තත්‍රාපි චත්තාලීසවත්ථූනි, වග්ගෙසු ධම්මසොණ්ඩකවග්ගාදි, වත්ථූසු ධම්මසොණ්ඩකවත්ථුආදි, තස්මිං ආදිභූතෙ ධම්මසොණ්ඩකවත්ථුම්හි අයං යොජනා වෙදිතබ්බා. '**දානාදයො**'ති ආදිසද්දෙන සීලභාවනාපත්තිදානානුමොදනාවෙය්‍යාවච්චාපචායනදෙසනාසවණදිට්ඨුජ්ජුකම්මානිචෙව සඞ්ගණ්හාති. '**මසක්කසාරෙ විය**'ති මසක්කසාරං නාම ඉන්දනගරං තස්මිං විය. '**රජ්ජන්තම්හි**'ති එත්ථ ඉධෙති රාජිද්ධියා ඉධෙ සම්බන්ධෙ මකාරො පදසන්ධිකරො රාජිද්ධියෙතිපි පාඨො. '**පුරමුත්තමම්හී**'තිපුරෙ උත්තමම්හීති ඡෙදෙ එකාරස්ස අකාරං කත්වා නිග්ගහීතාගමංච පුරමුත්තමම්හීති වුත්තං. '**හාරී**'ති මනොහාරී. '**නයනුස්සවෙනා**'ති නයනස්ස උස්සවභූතෙන ජනභූතෙන, සෙසේසුපි එසෙව නයො. '**සිවමාදධාන**'න්ති නිබ්බාණාවහං. '**ධාමපති**'න්ති මෙඝපතිනා, විනාසද්දයොගෙ නිස්සක්කෙ උපයොගවචනං, විනාමාතුජං මාතුජෙන වා වචාදිසු විය. '**නිසානාථ**'න්ති චන්දෙන. '**දධා**'ති දධානි. '**කල්ලොලමාලීය**'න්ති කල්ලොලමාලී අයං. '**විනාවෙල**'න්ති මරියාදය ත්රෙන

වා විනා. 'සුමණ්ඩිතො'ති සුට්ඨුමණ්ඩිතපසාධිතො. 'කුපවො'ති කුචෙලො දුත්ථිවත්ථවසනො, කුපටොති වා පාඨො, ජිණ්ණපටවසනො'ති අත්ථො. 'තිසම්පද'න්ති මනුස්සසග්ගනිබ්බාණසඞ්ඛාතං තිසම්පදං. 'රාජත්ත'න්ති රාජභාවං. 'ලොලතා'ති සොණ්ඩකභාවො. 'සුභීම'න්ති සුට්ඨුභයානකං. 'අඤ්ජනකූටවණ්ණ'න්ති අඤ්ජනපබ්බතසිඛරවණ්ණං. 'දිත්තග්ගිසංකාසවිසාලනෙත්ත'න්ති පජ්ජලිතග්ගිසදිස විසාලනෙත්තමයවන්තං. 'විපිටග්ගනාස'න්ති විපිටාවිය ඛීණනාසග්ගං. 'ගජ්ජිතාසිමඝොස'න්ති මෙඝගජ්ජිතසදිසභෙසමඝොසං. 'කරෙරුහ'න්ති නඛං. 'විසාලඝොනායතභග්ගහනු'න්ති විසාලෙන ඝොනෙන ආයතෙන භග්ගහනුකත්ථෙන සමන්නාගතං. 'ගදායුධෙනඞ්කිතමඤ්ඤබාහු'න්ති ගදායුධෙන ලඤ්ඡිතවිකාරබාහුං. 'දඨොඨිම'න්ති භෙසම දඨාධරං. 'සවලීලලාට'න්ති වලිසහිතනලාටං. 'වත්තන්තරස්මි'න්ති පබ්බතන්තරෙ. 'කරොමි කිං දෙහමිමං ඨපෙත්වා'ති අහං ඉමං මම දෙහං ඨපෙත්වා කිං කරොමි අඤ්ඤං ධනධඤ්ඤං නත්ථි ඉදං දෙහං ඨපෙත්වා කිං දස්සාමි මම දෙහමෙව දස්සාමී'ති අධිප්පායො. 'කරොමහ'න්ති කරොමි අහං. 'අච්චනීය'න්ති පරිච්චජනීයං. 'පභවාමී'ති පහොමි. 'දුබ්බන්ධියා'ති ගීවං දුබ්බන්ධිත්වා මතාය. 'දුග්ගවිසාදනෙනා'ති අනරියෙන විසඛාදනෙන—අවසානගාථායං, අමෙහා සන්තො අමිතසිරිං වාපි ජීවිතං වාපි න සුඛං අනපෙක්ඛා තමරියපසත්ථං ධම්මං එව ආචරන්ති, ඉහ ලොකෙ තුම්හාදිසානං තනුතරවිභවානං අප්පමායූනං කො කුසලපමාදෙ අත්ථීනු'ති අත්ථො. අයං ගාථා මාලිණීනාමං.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

ධම්මසොණ්ඩක වත්ථුං පඨමං.

---

දුතියෙ 'පීතිවාච'න්ති අත්තමනජං වාචං. 'උදහරී'ති පච්චුදාහාසි. 'පතාපවා'ති කිලෙසාරයො තපනසීලො. 'වසී'ති පඤ්චවසීහි වසීභූතො. 'පාදප'න්ති පුප්ඵිතලතාසාලිංගිතාහි සාඛාහි සහ ආමොදකරං. 'ඡප්පදලීනිසෙවිත'න්ති ඡප්පදෙහි රුදිතගීතෙහි සඤ්චාරිතං සමත්තාලිනිසෙවිතන්තිපි පාඨො සොයෙවත්ථො. 'ජලාසය'න්ති සරං. 'ආසාරසාරධාරාහි නිජ්ඣරසතසංකුල'න්ති ඝනඝනධාරාහි සම්පුණ්ණනිජ්ඣරසතෙහි ආකුලං. 'සිකතාතල'න්ති සෙලමයතලං. 'නිච්ඡර'න්ති නිච්ඡාරෙන්තො. 'මධුරං ගිර'න්ති මධුරං බ්‍රහ්මසරං වාචං. 'මිගව'න්ති මිගවධානං. 'සඛාණො'ති කණ්ඩසහිතො. 'සසරාසනො'ති කණ්ඩසරසහිතො. 'සාලෙ'ති විසාලෙ. 'උදිතෙ කුලෙ'ති

උච්චෙ ඤාතෙ කුලෙ.'**කරමුක්ඛිපා**'ති කරප්පධානං කත්වා.'**මම ගිර**'න්ති මම වචනං-අවසාන ගාථායං. '**තනුතරකාල**'න්ති ඉතරකාලං. '**කුසිත**'න්ති ආලසියං. '**දුල්ලභස්සා**'ති දුල්ලභස්ස භගවතො; අයං ගාථා මාලිණී නාම.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

**මිගළුද්දකස්ස වත්ථුං දුතියං.**

තතියෙ '**මහානිදාඝො**'ති මහාඋණ්හපරිළාහො. **වාපි** නාම සයංජාතසරො, **පොක්ඛරණී** නාම ඛතසරො, **ගිරිකන්දරො** නාම ගිරිගබ්භරො, **නිජ්ඣරො** නාම පබ්බතපපාතො. '**පූතිපාදපෙ**'ති පූතිභාවෙන සුසිරීභූතෙ එකස්මිං මහාරුක්ඛෙ.'**නරකාවාටෙ**'ති ජිණ්ණපපාතාවාටෙ.'**විවෙකං ලද්ධා**'ති විවෙකං එකෙකාරහභාවං ලභිත්වාව. '**අත්තානං විජහන්ති**'ති සම්පත්තත්තභාවං ජහන්ති තරුණමානවකාදිභාවං පාපුණන්ති. ගාථාසු යථා නිම්බො මධුරොදකසිත්තො සංවඩ්ඪිතො මධුරං න යාතෙව භියේ‍යා සොමත්තාය කසාසමෙව පරිවඩ්ඪෙති.'**ඛලූ**'ති එකන්තෙන,අත්තනා කතො අග්ගි සීතලං නදදෙ අථඛො උණ්හමෙව.'**නාමිත්තො ලභතෙ සුඛ**'න්ති අමිත්තො කිංචි සුඛං නලභතෙ. '**උදකප්පසන්නෙනා**'ති පසන්නෙන උදකෙන. '**පහරිත්වා**'ති පරිධොවිත්වා. '**නවකම්මෙනා**'ති අත්තනො නවකම්මකරණෙන. '**එවම්පිදිසො**'ති එවම්පි ඊදිසොති ජෙදෙ. '**නරාධමො**'ති නිහීනමනුස්සො, අකස්මා ඉච්චාදිසු පන දෙව යෙසං තුම්හෙ මම උපකාරං අකත්ථාති න කුප්පන්ති නිමිත්තාතො පසීදන්ති අසාධූනං අවිජානන්තානං බාලානං එතං සීලං එසා පකති හොති-අවසානගාථායං. '**භො**'ඉති වුත්තාකාරෙන, සුඛම්හා වා අඩ්ඩතො වා ධනම්හා වා පතිතා චුතාපි මිත්තා සඛානං පරමතරපතිට්ඨා යස්මා හොන්ති විරහිතසඛීනං යස්මා වුඩ්ඪි නත්ථි තස්මා තුම්හෙ මිත්තවන්තො හුත්වා මහන්තං කුසලධම්මං විනාථාති; අයං ගාථා මාලිණී නාම.

නනමයයයුතායං මාලිනීභොගිසීහි.

**තිණ්ණං ජනානං වත්ථුං තතියං.**

චතුත්ථෙ '**කෙවලං විත්තවිනාසාය භවති**'ති කෙවලමෙව පතිකුලවන්තියා විනාසාය භවති.'**නිදහිතු**'න්ති නිධෙතුං. '**චතුද්දිසාගතජිනපුත්තාන**'න්ති චතූහි දිසාහි ආගතානං භික්ඛූනං. '**ආපානභූත**'න්ති මහාමග්ගපස්සෙ ඨපිත උදපානසදිසංගතං. '**දෙවදුමොවා**'ති

කප්පරුක්ඛො විය. '**පුප්ඵූපහාරාදිවිතානලඞ්කතා**'ති පුප්ඵගන්ධකාදිනා චෙව සෙතචෙලවිතානෙන ච අලඞ්කතා. '**පදීපපඤ්ඤත්තසුභාසනාවලී**'ති පදීප ඉති අවිභත්තිකනිද්දෙසො පදීපෙනෙත්‍යත්ථො, පඤ්ඤත්තසුභාසනාවලි දානසාලාති යොජනා. '**සුඛාසනාසීනවසීභිලංකතා**'ති සුඛසම්ඵස්ස මුදුපච්චත්ථරණෙ ආසනෙ ආසීනවසීභි ආසනපන්තීහි අලංකතා, දානසාලාතිස්ස විසෙසනං. '**තස්සාසී**'ති තස්සා ආසි. '**තස්මි**'න්ති තස්මිං නගරෙ. '**සුවිසුඤ්ඤචිත්තා**'ති සුවිසුඤ්ඤචිත්තා. '**බුද්ධෙනීනාමා**'ති එවන්නාමිකා උපාසිකා. '**ගුණග්ගා**'ති සීලාදිගුණෙන අග්ගා. '**පුබ්බන්තා**'ති පුබ්බදිසතො. '**අපරන්ත**'න්ති පච්ඡිමදිසං. '**සොණ්ණමාලාහී**'ති සුවණ්ණමාලාහි. '**පාටලිපුත්තනගරූපවනෙ**'ති පාටලිපුත්තනගරස්ස උපවනෙ දක්ඛිණපච්ඡිමදිසාභාගෙති අත්ථො. '**නජහන්ති**'ති න පජහන්ති අයමෙව වා පාඨො—අවසානගාථායං. '**කච්ඡා**'ති වත්තබ්බ ජන්තුනුරක්ඛණත්ථං කච්ඡසඞ්ගහං වජන්තී'ති වුත්තං. '**කථමුපෙක්ඛා**'ති කථං උපෙක්ඛා. '**දානමානාදි කම්මෙ**'ති දානසීලභාවනාපූජාදිකම්මෙ; අයං ගාථා මාලිණී නාම.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

**බුද්ධෙනියා වත්ථුං චතුත්ථං.**

පඤ්චමෙ '**රතනත්තයමනන්තානුභාවපාසෙන බද්ධො**'ති නමො බුද්ධස්සාති වචනසඞ්ඛාතරතනත්තයමනන්තානුභාවපාසෙන බද්ධො, සම්, ගාථාසු තස්ස ඉච්චාදි ගාථාසම්පන්න දුල්ලභං සබ්බසම්පත්තිදායකං බුද්ධවචනං යස්ස මුඛෙ සදා වත්තති තං තස්ස මුඛං මුඛං නාම. '**මණිකාමදදො**'ති කාමදදෙ මණී. '**එවං විඩොරගො**'ති එවං විඩො විසඋරගො. '**මහග්ඝං බහල**'න්ති අනග්ඝං ඉති අවහාතබ්බං—අවසානගාථායං. අවිදිතසත්තො '**ධනවිසෙසඃ**' සුවණ්ණපුප්ඵත්තය සඞ්ඛාතං ධනවිසෙසං. '**යස්සා**'ති යස්ස සම්මාසම්බුද්ධස්ස. '**නාමප්පකාසා**'ති නමො බුද්ධස්සාති වචනමත්තෙන නාමප්පකාසනෙන. '**විදිතජනනිකායො**'ති විදිතො ජනනිකායොති පරිවත්තෙතබ්බො. '**නලභති**'ති වත්තුං නලභති. '**ජිනනාමං**'ති බුද්ධො භගවාත්‍යාදිකං ජිනස්ස නාමං අයං ගාථා මාලිණී නාම.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

**අග්ගිගුණ්ඨිකස්ස වත්ථුං පඤ්චමං.**

ජෙට්ඨ 'ජෙට්ඨක'න්ති ජෙට්ඨපුත්තං. 'නිච්ඡනෙතා'ති න ඉච්ඡනෙතා. 'පුණ්ඩරීකාදිසම්භව'න්ති එත්ථ පුණ්ඩරීකසද්දො ව්‍යග්ඝසද්දපරියායො වුත්තොති අභිධානප්පදීපිකායං, "ව්‍යග්ඝො තු පුණ්ඩරීකො"ති * 'සමාතපග්ගි වාතාදි උදකාසනි සම්භව'න්ති † චෙත්ථ ආතපො ච අග්ගි ච වාතො ච ඉච්චාදීහි ච උදක අසනිපාතෙහි ච සම්භවං උප්පජ්ජනන්ති අත්ථො. ආතපොති සුරියාතපො අග්ගීති දවඩාහාදී, වාතොති සරීරජාදිභෙදො, උදකන්ති මහොඝො, අසනීති ගග්ගරාදි නාවිධාසනියො. 'පජ්ජරාදීහී'ති පහාරෙන ජරා පජ්ජරා පහාරජරොගා, තෙ ආදයො යෙසන්තෙ පජ්ජරාදයො තෙහි. 'විසමොතුහි සම්භව'න්ති විසමෙහි උතූහි සම්භවං. 'අනන්තකෙනා'ති මාරසත්තුනා. 'තං වූපසමෙතු'න්ති තං ලොභං උපසමං කාතුං. 'පාරලොකිකා'ති පරලොකත්ථා. 'කාමක්ඛන්තා'ති කාමෙන අක්ඛන්තා. 'සරණානාන'න්ති සරන්තානං සප්පුරිසානං. 'සොදරි'න්ති භගිනිං. 'විභාවෙන්තී'ති භාවනාවසෙන චින්තෙන්ති, ඉච්ඡිතදායිනො දෙවාතිම්හිනා සම්බන්ධීයති§—අවසාන ගාථායං, 'ධඤ්ඤම්පි මනසෙවං දෙවදෙවං සරන්තා'ති ඊදිසං අපි ගුණවන්තං දෙවදෙවං මනුස්සා ධඤ්ඤං අපි මනසා සරන්තා පරමතරපතිට්ඨං පාපුණන්තී'ති තුම්හෙ මහන්තා භගවති ගුණරාසිං ජානමානා ජනා සබ්බදා සරණසීලං භජථාති; අයං ගාථා මාලිණී නාම.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

සරණත්ථෙරස්ස වත්ථුං ඡට්ඨං.

---

සත්තමෙ 'රණෙ ජිතෙ'ති සඞ්ගාමෙ ජිතෙ පරාජිතෙ වා. 'සොකග්ගී'ති සොකපාවකො, සොකග්ගිනා පදිත්තාහං සොකෙ සොකං කථං ඛිපෙ කොනාම බුද්ධො ජලන්තග්ගිම්හි පලාලං පක්ඛිපෙය්‍ය නෙතය්‍යත්ථො. 'තං තප්පයෙ'ති තං අභිසෙකං තප්පයාමි, රාජ ඛලු එකංසෙන නිප්පාපිතං පුග්ගලානං පාවකෙ පාතනං පාපොයෙව හොති තස්ස ච කම්මස්ස ඵලං පාපං පච්චන්තො දිට්ඨධම්මෙ පරලොකෙ සම්පරායෙ ච හොති. 'රොගෙනාතුරඉත්ථීසු'ති රොගෙන ආතුරෙසු මාතුගාමෙසු. 'න වධාරහා'ති වධස්ස අරහා න හොති. 'සොදරා'ති සහ එකමාතුයා උදරෙ ජාතා භාතරො. 'භින්දාන සරණත්තය'න්ති සර

* ඉධ පන දීපිසීහව්‍යග්ඝානං අත්ථිතාය මහිසො පි ගහෙතබ්බො තෙන වුත්තං නිඝණ්ඩුකෙසු 'පුණ්ඩරීකො තු කළම්බණ්ඩො මහිසො දුබ්බිසොපථො'ති—අයම්පි පාඨො කත්ථචි දිස්සති.

† 'සුවාතානපග්ගිවාත උදකාසනි සම්භව'න්ති පි පාඨො දිස්සති.

§ එත්ථ "සම්බන්ධීයති"ති පඨො එව දිස්සති.

ණන්තායමඤ්ඤත්‍ර. **'පච්චන්ත'** න්ති පච්චන්තං යෙව–අවසානගාථායං, **'සා'** ති සා වෙස්සාමිත්තා. **'ජලිතදහනමජ්ඣෙ'** ති පජ්ජලිතග්ගිනො මජ්ඣෙ. **'අනෙන'** ති පච්ඡිමභවෙ. **'නිබ්බුතිංචාපි'** ති නිබ්බානඤ්ච. **'කථං න ලභෙථ'** ති කස්මා න ලභෙථ ලභෙය්‍යෙවාති අත්ථො, අයං ගාථා මාලිනීනාම.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

**වෙස්සාමිත්තාය වත්ථුං සත්තමං**

---

අට්ඨමෙ **'තුණ්ණකාරො'** ති නානාවිත්‍ර සිප්පකාරො. **'එකස්සාපි'** ති එකස්සාපි භික්ඛුනො. **'රාජමාසෙ'** ති මුග්ගානි. **'සන්නිස්සරෙ'** ති භණවති. **'කාමභොගීනහ,'** න්ති කාමභොගීනං අහං නිස්සෙක්ක වෙතං සාමිවචනං. **'චතුභි ච ඉද්ධීහි'** ති චෙතියට්ඨානකෙ වුත්තප්පකාරෙහි ඉද්ධීහි. **'සට්ඨිසන්සහස්සාධිකා තිස්සො ච වස්සකොටියො'** ති මනුස්ස ගණනායෙව, දිබ්බගණනාය පන වස්සසහස්සමත්තමෙව. **'චරම ත්‍රසුඛනත්‍යත්‍රා'** ති වරමිති සුඛන්ති අත්‍රාකාරා. **'න සාතං වින්දතෙ'** ති සා තං ඉට්ඨං කන්තං සුඛං න්වින්දතෙ. **'සබ්බථාමෙනා'** ති සබ්බථාම වෙනෙනන ඤාණබලෙන. **'සාවතා'** ති යත්තකෙ පදෙසෙ. **'පට්ඨිවිනිස්සිතා'** ති පට්ඨිං නිස්සාය වසන්තා. **'නාණහක්ඛසරතො'** ති නිබ්බානාභිරතො—අවසානගාථායං, ඉති වුත්තප්පකාරෙන බොධියා ගතිනියතස්ස මහාතුස්ස සකවසමුප්පනෙත්වා දුක්ඛානි දෙති මාදිසානං අනියතගතිකානං කා කථා භවතීති මඤ්ඤෙත්වා භො නිවත්තුං භජථාති. අයං ගාථා මාලිනීනාම.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

**මහාමත්‍යාතුවත්ථුං අට්ඨමං.**

---

නවමෙ **'අම්බපාන'** න්ති ආදීනි විනයෙ වුත්තානෙව. **'ඉමස්මිං කොලම්බෙ'** ති ඉමස්මිං කුම්භෙ. **'සන්දිට්ඨික'** න්ති ඉමස්මිංයෙව අත්තභාවෙ විපාකං දදාතීති සන්දිට්ඨිකන්ති වුත්තං. **'අකාලික'** න්ති කාලන්තරං විනා විපාකං දෙති. **'මුද්දිකරසා'** ති මුද්දිකපානකාරණා. **'සුධන්නාවා'** ති සුධුරසං–අවසානගාථායං, විපුලං න අප්පමත්තකං ජිනසාසනෙ සාරං එවං ජානමානො ජනො ථොකමත්තස්ස මුද්දිකපාණස්ස දානහෙතුනා විපුලභොගං ලභති භො තුම්හෙ තීසු වත්ථුසු විදිතගුණගණා හුත්වා බලු සීලවනෙතසු දානහෙතුනා තිස් ලොකුත්තරවිසෙසං ලභථාති. අයං ගාථා මාලිනීනාම.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

**බුද්ධවම්මවාණිජස්ස වත්ථුං නවමං.**

---

දසමෙ **'දෙවපූජනනගරෙ'** ති එවන්නාමකෙ නගරෙ. **'අඩ්ඪනාළිමත්ත'** න්ති අඩ්ඪ අඩ්ඪ නාළිමත්තං වීච්ඡාවචනමෙතං. **'භත්තුක්ඛලි'** න්ති සුපක්කභත්තස්ස පුණ්ණං උක්ඛලිං. **'එකනවුතෙ'** ති ඉතො භද්දකප්පතො එකනවුතෙ සාරනාමකෙ එකස්මිං කප්පෙ. **'ලොකෙකනායකො'** ති තිලොකස්ස එකනායකො අසදිසපඤ්ඤූනායකො. **'අබ්‍යාබාධො'** ති අබ්‍යාපජ්ඣො සො එව වා පාඨො, බ්‍යාබාධරහිතොත්‍යත්ථො. **'අනීඝො'** ති නිද්දුක්ඛො. **'රම්භාම්බජම්බුසන්තීරපූගපුණ්ණාගපාටලීනාගාදී'** ති එත්ථ **රම්භා** ති කදලියො, අම්බා ති චූතා, ජම්බූ ති ජම්බුයෙව, **සන්තීරා** ති සන්තීරරුක්ඛා තිම්බරරුක්ඛා, තෙ රම්භාම්බජම්බුසන්තීරා ච පූගපුණ්ණාගපාටලීනාගාදයො ච. **'පදුමුප්පලකල්හාරකුමුදකානනමණ්ඩිතෙ'** ති එත්ථ **කල්හාරං** නාම සොගන්ධියජාතිකා, කුමුදං නාම සෙතපුප්ඵා නීලදණ්ඩා කුමුදගච්ඡා. **'මධුමත්තාලිපාලිහි'** ති මධුකරානං යෙව මත්තභමරානං පන්තීහි. **'සාරසීසරසංකුලෙ'** ති සාරසී වුච්චන්ති හංසා පංචවණ්ණෙහි හංසෙහි සෙවිතසරෙන ආකුලෙ ති අත්ථො. **'නිච්චුස්සවෙ'** ති නිච්චකත ඡණෙ. **'රූපෙනග්ගා'** ති රූපෙන අග්ගා-අවසානගාථායං, **'භික්ඛුස්සා'** ති තස්ස ගිලානභික්ඛුනො. **'දත්ත'** න්ති භෙසජ්ජදත්තං. **'දිබ්බමනුජසුඛ'** න්ති දිබ්බසුඛං චෙව මනුස්සසුඛං ච. **'සාලත්ථා'** ති සා අලත්ථ. **'විදිතකුසලපාකා'** ති විදිතා කුසලස්ස කම්මස්ස පාකා යෙහි තෙ විදිතකුසලපාකා, තුම්හෙ ති යොජනා. **'කිංනලබ්භෙථා'** ති කිං න ලබ්භෙථ-අයං ගාථා මාලිනීනාම.

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

**රූපදෙවියා වත්ථුං දසමං.**

**ධම්මසොණ්ඩකවග්ගො පඨමො.**

**තස්ස වග්ගස්ස උද්දානං.**

ධම්මසොණ්ඩො මිගලුද්දො, තිණ්ණං ජනානමෙව ච
බුද්ධෙනි අහිගුණ්ඨො ච සරණොචෙව වෙස්සාමිත්තා
මන්ධාතා බුද්ධවම්මො ච රූපදෙවීති තෙ දසාති.

---

ඉති පරමවිසුද්ධසද්ධාබුද්ධිපතිමණ්ඩිතෙන දීඝපබ්බතනිගමවාසිනා වසීභූතෙන සිරිවඩ්ඪනචමූපතිනො ආචරියභූතෙන තෙන චතුහි පච්චයෙහි අකිලමාපෙත්වා සක්කච්චං උපට්ඨිතෙන සබ්බදිසාසු පත්ථටකිත්තිමතා දිසාපාමොක්ඛාචරියෙන සිද්ධත්ථොති ගරූහි ගහිතනාමධෙය්‍යෙන කවිනා විරචිතා සීහලවත්ථූනං අත්ථවණ්ණනාසාරභූතා පඨමස්ස ධම්මසොණ්ඩකවග්ගස්ස අත්ථවණ්ණනාභූතා මධුරරසවාහිනීටීකා සමත්තා.

---

දුතියවග්ගස්ස පඨමෙ **'සපදානචෙතනා'**ති සපදානචාරිකධුතඞ්ගචෙතනා. **'පුත්තොපම'**න්ති පුත්තඋපමං, බුද්ධපුත්තාදිවචනං. **'මුනිසූනවො'**ති බුද්ධපුත්තා. **'අනඞ්ගයුද්ධම්හී'**ති මාරරණෙ. **'නද්ධා සොධාවා'**ති සන්නද්ධපඤ්චායුධා සූරයොධා ඉව. **'දප්පිතා'**ති දප්පෙන උද්ධතා ඉතා ගතා පවත්තා. **'සීවෙය්‍ය'**න්ති සීවරට්ඨෙ ජාතං. **'සංසාමෙත්වා,'**ති සංසරිත්වා. **'වණ්ණවජ්ජාදනමොලංවා'**ති * වණ්ණබන්ධනචොලංව, භවෙති යොජනා. **'රසගෙධවිවජ්ජිතා'**ති සාදුරසෙ තණ්හාගෙධවිරහිතා. **'භාවනාසාඛ හෙතු'**න්ති භාවනාසනාය හෙතුභූතං. **'ධුතඞ්ගඝොසා'**ති මහාපවාහො, ධුතසඞ්ඝාතිපි පාඨො. **'අධුනාගත'**න්ති නචිරාගතං. **'පඤ්චවිධරාජකකුධභණ්ඩ'**න්ති එත්ථ කං වුච්චති පඨවී තස්ස කූටො කකුටො තස්ස භණ්ඩං කකුටභණ්ඩං රඤ්ඤො කකුටභණ්ඩං රාජකකුටභණ්ඩං ඛග්ගාදිපඤ්චවිධං, අභිධානප්පදීපිකාටීකායං "කුකආදනෙ ධො වණ්ණවිපරියයො" තස්ස ගමනකාලෙ ආදාතබ්බතො කකුධං ච තං භණ්ඩං චෙති කකුධභණ්ඩන්ති වුත්තං කෙ පන තෙති?

ඡත්තං චාමර මුණ්හීසං ඛග්ගො සුවණ්ණ පාදුකා
ඉමෙ කකුධභණ්ඩානි භවන්ති පංච රාජුනන්ති.

වුත්තානි තානෙව. **'සතසාඛඩො'**ති අනෙකාහි සාඛාහි සම්බද්ධො. **'මහා'**ති මහන්තො, මහන්ති වා පාඨො. **'නීලම්බුදොපමො'**ති අබ්භකූටසදිසො–අවසානගාථායං, **'සරට්ඨ'**න්ති අත්තනො රට්ඨං. **'කුරුදීපසොභ,'**න්ති ජම්බුදීපං සොභිතං කුරුමානො. **'වසුධාධිපො'**ති මහාරාජා–අයං ගාථා උපජාති නාම.

අනන්තරොදීරිතලක්ඛණා චෙ පාදාවිමිස්සා උපජාතියො තා.

**නන්දිරාජස්ස වත්ථුං පඨමං.**

---

දුතියෙ **'දුච්ඡාදිතත්තා'**ති දුබ්බලෙන නිවාසිතත්තා. **'දුදික්ඛ'**න්ති පෙක්ඛනෙන දුක්කරං. **'චක්ඛුමූසන'**න්ති චක්ඛුමූසනකං. **'ඉච්ඡිතිච්ඡිතදාතාරො'**ති යං ඉච්ඡාමි තං ඉච්ඡිතිච්ඡිතං දාතාරො හුත්වා. **'සුරපාදපා'**ති දිබ්බකප්පරුක්ඛා. **'න සම්මාදින්නවත්ථස්සා'**ති සම්මාපකාරෙන සද්ධාබහුලතාය වා නදින්නස්ස භයද්දිතෙන දින්නස්ස වත්ථස්ස. **'අසොභනෙන'**ති අඛෙත්තභූතෙ චොරෙ–අවසානගාථායං, **'මන්ත්වානා'**

---

* වණ්ණවජ්ජාදනචොලම්හා ඉතිපි පාඨො.

ති සුත්වා. '**දද්දරා**'ති දද්දර, ගාථාබන්ධනවසෙන ආකාරස්ස රස්සො. '**විසෙසභාගී**'ති සො දුසකො විසෙසභාගො හොතීති. අයං ගාථා වසන්තතිලකා නාම.

වුත්තා වසන්තතිලකා තභජාජගාගො.

**අඤ්ඤතරමනුස්සස්ස වත්ථුං දුතියං.**

---

තතියෙ '**කීළාපරො**'ති කීළාපරෙතො කීළාපරායණොවා. '**සඨාභිරන්ත**,න්ති සඨාජ්ඣාසයං. '**අධුනාගතෙහී**'ති සපදියෙව සම්පත්තෙහි. '**මහාඵෙණසමාකුලා**'ති මහන්තෙන ඵෙණපිණ්ඩෙන ආකුලවිකුලභූතා. '**බහූම්මියො**'ති බහුඋම්මියො. '**උභොකූලෙ**'ති උභතො තීරෙ. '**උත්තරන්ති**'ති* සුරසුරායන්ති. '**මකරදන්තිකා**'ති මහන්තෙන කඨරදණ්ඩෙන, තදිංතරන්තාකිරඑකංමාසංගහෙත්වාතරන්තාබලවන්තා හොන්ති. '**විසසත්ත**'න්ති ඝොරවිස දෙඩ්ඩුභාදීනං සත්තානං. '**අයොසාර**'න්ති අයසලාකං. '**අසිපත්ත**'න්ති අසිං. '**ඛීරසලාකංචා**'ති ඛීරමිස්සකං සලාකභත්තංච. '**අද්දූ සූපස්සය**'න්ති උපස්සයකුටිවිහාරාදිකං අද්දසි. '**පාවාරං**'ති මහාපාවාරං, තං පාවාරන්ති වුත්තං-අවසානගාථායං, '**සුමනො**'ති සුන්දරමනො. '**භාගිස්සා**'ති භාගීඅස්සාති ඡෙදො, භාගවා භාවයස්සාති අත්ථො. '**විභවානුරූප**'න්ති අත්තනො සම්පත්තියානුරූපං. '**නිබ්බුතිපදං කරෙග**'න්ති නිබ්බාණපදං ගච්ඡතං. අයං ගාථා වසන්තතිලකා නාම.

**විසමලොමකුමාරස්ස වත්ථුං තතියං.**

---

චතුත්ථෙ '**උස්සව**'න්ති † මහාජනං. '**අසීතිහත්ථවෙලග්ගෙ**'ති අසීතිහත්ථුබ්බෙධෙ වෙළුපරම්පරාය අග්ගෙ. '**තොරණඝටිකාපන්තියො**'ති තොරණානං ච දීපඝටිකානං ච පන්තියො, තොරණං වුච්චති තත්ථ තත්ථ ගාමාදිපක්ඛසූපත්තත්ථං උස්සාපිතමහාකෙතු. '**ඔතරන්ති**'ති සමොසරිංසු සමාගච්ඡිංසු. '**අහොසාහ**'න්ති අහොසිං අහන්ති ඡෙදො. '**යතො**'ති යෙන සච්චෙන. '**ගරූ**'ති ගාරවභාවං. '**උදකපූජනාමා**'ති එවන්නාමකං පූජං සුරභීති සුගන්ධො. '**නරොරගා**'ති මනුස්සා ච නාගා ච. '**චතුරත්තනගබ්භ**'න්ති චතුහත්ථප්පමාණෙ ගබ්භෙ-අවසානගාථායං, '**කුමාරිකෙව**'න්ති කුමාරිකා එවන්ති ඡෙදො. '**ලද්ධා**'ති ල

---

* උග්ගිරන්ති'ති කත්ථචි.

† ඡණුස්සව'න්ති කත්ථචි.

භිජ්ජාන. 'නෙකම්භව'න්ති අනප්පකං සම්පත්තිවිභවං. 'පදාතා'ති නිබ්බාණප්පදාතා. 'කුසලප්පයොගෙ'ති කුසලසමවායෙ. අයංගාථා වසන්තතිලකා නාම.

## කඤ්චන දෙවියා වත්ථුං චතුත්ථං.

පඨමෙ'සුවපොතකො'ති සුකපොතකො.'පරිජිණ්ණගත්තභාව'න්ති පරිජිණ්ණසරීරං. 'වනඛණ්ඩ'න්ති වනපත්ථං. 'සුවරාජෙ'ති සුවපොතකෙ. 'අරණී'න්ති අග්ගිමත්ථනදණ්ඩං.'මයා කතං මය්හමිද'න්ති ඉමස්ස මයා උපකාරො කතො අයං මය්හං පුන පච්චුපකාරං කරිස්සති. 'වෙස්සානර'න්ති අග්ගිං. 'සමාලිම්පතී'ති සම්මා පකාරෙති. 'සපෙමො'ති පෙමසහිතො. 'විග්ගහ'න්ති සරීරං. 'පෙමසා'ති පෙමෙන. 'සොරගො'ති සො ආසිවිසො.'අස්සා'ති අස්ස පරිපාලිතස්ස.'නිහීනජච්චෙනා'ති හීනජාතිකෙන කාපුරිසෙන. 'නරාධමෙනා' ති නරචණ්ඩාලෙන. 'දීනෙනා'ති කපණෙන. 'අසාධුකො'ති නසුන්දරො. 'දුක්ඛනුදො'ති දුක්ඛපනූදනො. 'සඞ්ගමො හොතූ'ති සඞ්ගමො සෙය්‍යො හොතීති අජ්ඣාහාරො-අවසානගාථායං, 'එවංවිධො'ති එවංපකාරො. 'එරුසො'ති චණ්ඩො.'පරමංසභොජී'ති පරසත්තස්ස මංසභුජනසීලො. * 'දයාසා'ති කරුණාය. 'සුගතිං උපගතො'ති සුන්දරගතිමන්තං දෙවලොකං උපගතො. 'සතතං'ති සමිතං. 'වො'ති තුම්හාකං. 'විභවචා'ති නිබ්බාණං ච. අයං ගාථා වසන්තතිලකා නාම.

## ව්‍යග්ඝස්සවත්ථුං පඤ්චමං.

ජඨෙ 'මජ්ඣණ්හෙ'ති මජ්ඣන්තිකෙ, මජ්ඣන්තෙති වා පාඨො. 'ඛහලාතපෙනා'ති ඝොරෙන සුරියාතපෙන. 'ධම්මෙනා'ති සමෙන. 'ඉධා'ති ඉමස්මිං ලොකෙ. 'චෙ'ති එකන්තෙන. 'පඤ්චවිධංඅට්ඨවිධ'න්ති පඤ්චසීලානි චෙව අට්ඨසීලානි ච.'සප්පුරිසධම්මෙසූ'ති සප්පුරිසකරෙසු පාණාතිපාතා වෙරමණීආදිසු තෙසු ධම්මෙසු.'කතවෙදිකො'ති අත්තනො පරෙහි කතූපකාර ජානනකො. 'අද්දසාහ'න්ති අද්දසිං අහන්ති ඡෙදො. 'මමු'න්ති මං. 'සංසය'න්ති මම සංසයං. 'අගාධාපාරගෙ'ති අප්පතිට්ඨෙ අපාරගෙ.'භීමෙ'ති භිංසනකෙ. 'දුරිතාතරෙ'ති † දුරිතෙ චෙව අතරිතබ්බෙ ච. 'කලිඞ්ගර'න්ති කට්ඨඵලකං. 'ධණ්සත්ථව

* පරමංසහාරී'ති පරසත්තස්ස මංසහරණසීලොති කත්ථචි.
† දුරිතාකරෙ ඉතිපි පාඨො.

ස්සා'ති බණෙන්ත තාම්බූලපත්තාදානවසෙන සම්ඵවකතස්ස. 'ඵලකංස ක'න්ති අත්තනොපතිට්ඨාඵලකං,නං මිත්තධම්මමෙව ඵලකස්සදානං ච තුය්හ ංසමුද්දස්මිං පතිට්ඨා ආසීත් යොජනා-අවසානගාථායං, 'ඛලු'ති එකන්තෙන. 'දෙවතාහි'ති අප්පාදනෙපචමි. 'සප්පුරිසත'න්ති සප්පු රිසභාවං. අයං ගාථා වසන්තතිලකා නාම.

**ඵලකඛණ්ඩදින්නස්ස වත්ථුං ඡට්ඨං.**

---

සත්තමෙ'**චොරෙනන**'න්ති චොරකම්මං කරොන්තං.'**ආරක්ඛකා න**'න්ති බන්ධනාගාරිකානං.'**පටිපාදෙත්වා**'ති නිවෙදෙත්වා, සම්පටිච්ඡා පෙත්වා වා, රූපෙන ඉච්චාදි ගාථායං ගුණසීලවිවජ්ජිතෙන රූපෙන කිං නු පයොජනං අත්ථි මිච්ඡාලයස්ස කිතවස්ස කෙරාටිකස්ස කිමත්ථං සියා දනාදිචාගවිගතෙන ධනෙන කිං වා පයොජනං අත්ථි ව්‍යසන කාලපරම්මුඛෙන විනාසුපගතකාලෙ පරම්මුඛෙන මිත්තෙන කිං ප යොජනමත්ථීති යොජනා, වාරිපූරෙඉච්චාදිගාථායං යථා සොබ්භ ම හා වාරිපරිපූරෙ අන්තො විසමං වා සමං වා ඨානං න පඤ්ඤායතෙව එවං අසාධූනං මනසි සම්භාවං කූටකරණං න පඤ්ඤායතෙව. '**පක තායමසාධූන**'න්ති අසාධූනං අයං පකති අයං ධම්මතා.'**භාව**'න්ති ජි මහඋජුකභාවං.'**අනුවජ්ජිට්ඨාහාරං ලභනදිවසතො**'තිඋච්ඡිට්ඨානුගතාහා රලභනදිවසෙ හි.'**මනුස්සඝිනා**'තිඡාරවනෙතන පූරාණමනුස්සඝිනා. '**චිතකතොඛමුක්කඅලාතෙහි**'ති පුරා චිතකතො ගහිතෙහි අලාතෙ හි. '**මනුස්සඝිනා**'ති දබ්බිගතිකෙන මනුස්සඝිනා. '**හිරිකොපින**'න්ති අඞ්ගජාතට්ඨානං. '**වාතාවරණ**'න්ති සානිකිච්චං. '**පිපථලිරූකෙඛ**'ති පි ලගූරුකෙඛ. '**රත්තන්ධකාරෙ**'ති තිමිසෙ. '**කුණපාදකෙහි**'ති කුණප ඛාදකෙහි සොනසිගාලාදීහි. '**ඉධා**'ති ඉමස්මිං සුසානෙ.'**සීසෙ**'ති මනු ස්සසීසකපාලෙ.'**සාගහෙතු**'ති යඤ්ඤහෙතු. '**බුද්ධසමො**'ති බුද්ධසදිසං. '**අඤ්ඤ**'න්ති අඤ්ඤං දුක්ඛං නත්ථීති සම්බන්ධො. '**බුද්ධවිනාසායා**'ති බුද්ධභාව විනාසනත්ථාය.'**ඉම**'න්ති ඉමං මනුස්ස මංසං සම්මාඛාදිතුන්ති වදති. '**නිවත්ථසාඨො**'ති භංගනිවත්ථො. '**හිරිසංවරාසා**'ති හිරි කොපිනපටිච්ඡාදනත්ථං. '**සම්මා**'ති භොපුරිස. '**සුභාසුභාමිස්සිතාසී තවාතො**'ති සුභෙන ච අසුභෙන ච ගන්ධෙන මිස්සිතසීතවාතො. '**සසංඅචිතෙතා**' ති සසමෙව අචිත්තකො වාතො. '**අචින්තභාවා**'ති අචිත්තකභාවතො, '**දෙහ**'න්ති සරීරං. '**අසාධුකාස්සා**'ති අසප්පුරි සස්ස. '**මිත්තපධංසකස්සා**' ති මිත්තධම්මධංසිනො, සමාවහතො න්තා චවාදිසු එවරූපො වාතො යදිසමාවහන්තො සියා මෙ සරීරං ඵුසති අපෙජදනි සොඝඛගති දුක්ඛංදදත්ති.හො දෙවතෙ තංසඛගතිකරණං දුක්ඛං අතිච්චසංච පරිවජ්ජිතුං ඉදං ඝුවෙලං මයා සානිසංබෙපෙන බන්ධි

තතො වදති,භො පුරිස කතනාසකො කතුපකාරනාසකො තෙ තං කිං කම්මං අකාසි ධනඤ්ච ධඤ්ඤඤ්ච සමං නාසහෙතු කිං තෙ අකාසි අථ තෙන තව මාතාපිතා බන්ධවො ඛෙත්තවත්ථුආදී අනෙකෙ කිං විනාසිතා තං කාරණං මෙ වදෙහීති පුච්ඡති, භො රාජතො යං මහන්තං භයං හොති යඤ්ච සබ්බස්ස හරණාදිභයං යඤ්ච වධාදිකං භයං හොති තං සබ්බං භයං අකතඤ්ඤුනා අසප්පුරිසෙන හොති සො අකතඤ්ඤු අසප්පුරිසො තෙහි ආරාව දූරතොව පරිවජ්ජනීයො හොති, භො යස්මා යං චොරාරිභයං අථ යං ච උදකෙනාපි ච අග්ගිනා ච භයං ලොකෙ අත්ථි තං සබ්බං අකතඤ්ඤුනා කාරණෙන හොති තස්මා සො ආරාව පරිවජ්ජනීයො හොති. '**සමත්ථං ගිර**'න්ති සම්ඵප්පලාපං. '**ධුත්තජනෙහී**'ති සොණ්ඩජනෙහි. '**අසිව**'න්ති අක්ඛෙමං.'**අනිට්ඨ**'න්ති අකන්තං—අවසානගාථායං,'**සංවජ්ජා**'ති සුට්ඨු වජ්ජෙත්වා. '**සජ්ජනසංගමෙනා**'ති සාධුජනසමාගමෙන. '**අභිසමනුනාථා**'ති පාපුණාථ. අයං ගාථා වසන්තතිලකා නාම.

**චොරසභාගස්ස වත්ථුං සත්තමං.**

---

අට්ඨමෙ '**නීලවල්ලී**'න්ති නීලතාම්බූලං. '**තක්කම්බිලෙනා**'ති අම්බිලතක්කෙන. '**අනෙනා භවෙය්‍යාසෙවා**' ති අනෙනා කුච්ඡිගබ්භයෙව.'**ධනුනො ගුණ**'න්ති ධනුනො ජියං. '**භුඞ්කාර**'න්ති කුක්කුරසද්දං.'**ගුණමත්තනි කත**'න්ති අත්තනි පරෙහි කතං ගුණං—අවසානගාථායං, '**සාධූ**'ති සප්පුරිසජනා. '**ඉසිනා චා**'ති බ්‍රාහ්මණකඉසිනා ච, ජදිස්සස්ස පුත්තස්ස කුම්භිභෙසජ්ජදානෙන පකතං මෙත්තං ච පුත්වා.'**ත**'න්ති තං සබ්බං කුසලකම්මං. අයං ගාථා වසන්තතිලකා නාම.

**මරුත්තබ්‍රාහ්මණස්ස වත්ථුං අට්ඨමං.**

---

නවමෙ '**භාතාවා**' ති භාතා වා කනිට්ඨා වා. '**පති වා**'ති උදහු තෙ සාමිකො. '**දෙවරො**'ති උදහු තව සාමි භාතා තෙනාහු—

පිතුභාතා මාතුලො ච මාතුභාතා ච මාතුලො
ජායාය භාතිකො සාලො සාමිභාතා තු දෙවරො'ති.

'**ඤාතී**'ති පරපක්ඛඤාති. '**සාලොහිතො**'ති අත්තපක්ඛඤාති. '**අතාණ**'න්ති තාණරහිතං, භඞ්ගචාදිසු භඞ්ගබල්ලොලමාලාය * භගාහි තරඞ්ගමාලාහි උත්තරන්තං උල්ලාලිතං මහණ්ණවං මහාසමුද්දං පහාය පිපාසිතො ලොකො පාතුං ඉච්ඡන්තො ඛුද්දකතළාකං යාති, ත

---

* **තුඞ්ගකල්ලොලමාලාහී**'තිපි පාඨො.

ඵෙව මනුජාධිප මහාරාජ විජ්ජමානෙසු මනුජෙසු අප්පගුණෙසු සාධු කො ගුණො යස්මිං තිට්ඨති මනං මම එකංසෙ'ව ච තස්මිං පුග්ගලෙ තිට්ඨති පහත්වාන මනං; හත්ථිමිච්චාදිසු මහාසරීරං මතහත්ථිං පහාය මංසත්ථිකා ජන්තුනො මංසත්ථං මංසහෙතුත්ථාය එකකං ධාවන්තං සසං අනුබන්ධන්ති තථා සාධාරණෙසු ජනෙසු විජ්ජමානෙසු පරිත්තම්පි කතං සාධුගුණං ජානන්තං අභෙච්ච. '**එතෙන මහාසුභාසිතා**'ති මයං එතෙන පුරිසෙන සුභාසිතා අම්හ භවාම–අවසානගාථායං, මාතුගාමාපී'ති ඤාතබ්බො. '**සාධුචරිත**'න්ති සප්පුරිසානං චරිතං. '**සුවිසජ්ජනා**'ති සුවිවුත්තිසප්පුරිසා තුම්හෙ ධම්මෙසු සද්ධෙ වසන්තිථා'ති යොජනා. අයං ගාථා වසන්තතිලකා නාම.

**පානීයදින්නස්ස වත්ථුං නවමං.**

---

දසමෙ '**දුත**'න්ති පාසදූතං. '**ලඤ්ජනමුද්දික**'න්ති අක්ඛරං ජිඤ්ජිත්වා කතමුද්දිකලඤ්ජනං, අථවා '**ලඤ්ජන**'න්ති ලඤ්ජනමෙව '**මුද්දික**'න්ති අඞ්ගුලිමුද්දිකං. '**යද හෙ පහොති**'ති යද තව දාතුං සමත්ථො හොති. '**එත්තකෙනා**' ති එත්තකෙන උපකාරෙන. '**වායසා**'ති කාකා. '**නීලමක්ඛිකා**'ති නීලවණ්ණමහාමක්ඛිකා. '**කුණපෙ සත්තා**'ති හත්ථිඅස්සාදිකුණපෙ ලග්ගා එව. '**අච්ඡන්ති**'ති තිට්ඨන්ති. '**සත්තසත්තා**'ති සත්ත මානවා. '**නවාරිසා**'ති වාරෙතුං නසක්කා. '**කතූපකාරමත්තාන**'න්ති පරෙහි අත්තනි කතං උපකාරං. '**සොමමොවා**'ති සොම බ්‍රාහ්මණොවිය–අවසානගාථායං, මින්දෙන ච උපකාරෙන නන්දිතමනා සුජනා අත්තනො පාණම්පි දෙන්ති ඉති තුම්හෙ විදිත්වා මා මිත්තදුහී භවථ සෙතුයෙන උපකාරී ච කතඤ්ඤූ කතවෙදිකා අථ භවථාති. අයං ගාථා වසන්තතිලකා නාම.

**සහායස්ස පරිච්චත්තජීවිතකස්ස වත්ථුං දසමං.**

**නන්දිරාජවග්ගො දුතියො.**

**තස්ස වග්ගස්ස උද්දානං.**

නන්දිරාජඤ්ඤුත්තරො ච විසමලොමො ච කම්නා
බ්‍යග්ගො උලුකබණ්ඩා ච චොරසහායමෙව ච
මරුකෙතා පානීයදින්නො ච සොමදත්තෙන තෙ දසා'ති.

---

ඉති පරමවිසුද්ධසද්ධාබුද්ධිවිරියප්පටිමණ්ඩිතෙන දීඝපබ්බතනිගමවාසිනා වසීභූතෙන සිරිවඩ්ඪනවමූපනිනො ආචරියභූතෙනා තේන වත්ති පච්චයෙහි අකිලමාපෙත්වා සඞ්ගහිතුපහිතෙන සබ්බදිසාසු පත්ථට කි

තන්තිමතා දිසාපාමොක්ඛාචරියෙන සිද්ධත්ථොති ගරූහි ගහිතනාමධෙය්‍යෙන කතා විරචිතා ජම්බුදීප වත්ථුස්සත්ථවණ්ණනා සාරභූතා දුතියස්ස තම්බිරාජවග්ගස්සත්ථවණ්ණනාභූතා මධුරරසවාහිනී ටීකාස මත්තා.

---

තතියස්ස යක්ඛවඤ්චිතවග්ගස්ස පඨමෙ **'තුණ්ඩගාමො'**ති එවං නාමකො ගාමො තස්මිං හි ගාමෙ තුණ්ඩකාරා යෙභුය්‍යෙන වසන්ති තන්නිස්සිතවොහාරෙන තුණ්ඩගාමො'ති පඤ්ඤායි, තුණ්ඩකාරගාමො'ති වා පාඨො. **'ආවිසිත්වා'**ති පවිසිත්වා. **'භයාවහ'**න්ති මහාභයං ආවහන්තං. **'බුද්ධභත්තිකජන්තුන'**න්ති බුද්ධභත්තියුත්තානං ජනානං. **'මුදමාවහ'**න්ති පමුදං ආවහං. **'මහාඝන'**න්ති මහන්තං ඝනත්ථසදිසං. **'මහබ්භුත'**න්ති මහාඅච්ඡරියං. **'ජම්භිතො'**ති ජම්භිතකායො. **'භමෙන්තො ධාවිතං දිස්වා තිම්බරෙව සුසියුග්ගතො'**ති සො යක්ඛො තං සරණගතං දිස්වා භමෙන්තො තිම්බරොව බහිධාවි. **'සිම්බලිතූලභට්ටංව චණ්ඩවාතෙන ඛණ්ඩිත'**න්ති වාතමණ්ඩලිකාය ආහතං සිම්බලිතූලභට්ටං භස්සිතම්පිව, ධාවීතියොජනා-අවසානගාථායං. **'අපෙන්තිසක්ඛාපී'**ති මහෙසක්ඛා යක්ඛා ජහන්ති. **'භජෙථා'**ති තුම්හෙ සුගතිං භජෙථා දුක්ඛං ජහාථ. අයං ගාථා උපජාති නාම.

අනන්තරොදීරිතලක්ඛණා වෙ පාදවිමිස්සා උපජාතියො තා.

**යක්ඛවඤ්චිත වත්ථුං පඨමං.**

---

දුතියෙ **'ගුළ'**න්ති අක්ඛං. **'සිඛිනොනාද'**න්ති සිඛිස්ස ජනං. **'භුජගාන'**න්ති සප්පානං. **'මන්තස්ස ජප්පතා'**ති මන්තජප්පනෙන. **'විලය'**න්ති විලීනභාවං චුණ්ණභාවං. **'කිබ්බිස'**න්ති කිබ්බිසං දළ්හබන්ධනං. **'පිසාචකා'**ති යක්ඛා. **'සිත'**න්ති සිත්ථකං. **'පෙතා පෙතෙනවා'**ති පෙතා අපෙන්ති එව. **'වජිරංගුහ'**න්ති වජිරපාසාණගුහම්පිව. **'තමෙවනාවං දීපංක'**න්ති තං එව අක්ඛරවයං නාවාසදිසං. **'කවචං සුභ'**න්ති සොභනදළ්හකවචසදිසං. **'තමෙව සිරසි භාසන්තං කිරීටං රතනාමය'**න්ති සිරසි ජොතෙන්ත රතනමය මකුටසදිසං. **'ලලාටෙ තිලක'**න්ති ලලාටාසත්තවටංසකම්පිව. **'කප්පූරං නයනම්භසෙ'**ති නයනම්හෙ කප්පූරමොසධම්පිව. **'තාඩඞ්ක'**න්ති සුවණ්ණකුණ්ඩලසදිසං තාරහාරාඑකාවට්ටි සෙඑවට්ටිභූතා. **'හාරා'**ති මුත්තාහාරා, ජන්තුසුතිකණ්ණෙසු ලංකතා. **'අඞ්ගද'**න්ති කෙයූරං. **'සාරශෙඛ'**ති මණිබන්ධෙ. **'වලය'**න්ති මුත්තාවලයං. **'අඞ්ගුලීසඞ්ගුලීයංචා'**ති දසසු අඞ්ගුලීසු මුද්දිකම්පිව. **'බන්ධං මඞ්ගලසම්මත'**න්ති මඞ්ගලසම්මතං බන්ධංවි

ස. '**සොණ්ණානනන්ත**'න්ති සුවණ්ණානනන්තං. '**බාණෙන සසරාසන**'න්ති බාණෙන සරෙන සහිතං සරකලාපමිව. '**දුරිතාපහ**'න්ති * සබ්බදුරිතාපහං. '**ලොකලොචනසත්ථුනො**'ති තිලොකස්ස චක්ඛුභූතස්ස සත්ථුනො. '**බුද්ධායෙති ගිර**'න්ති බුද්ධාය ඉති වචනං. '**මිච්ඡාදිට්ඨිකසූනුනා**'ති මිච්ඡාදිට්ඨික බ්‍රාහ්මණස්ස පුත්තෙන. '**පිසාචාපි සුඛා**'ති පිසාචාපි සවණ්ණං කත්වා. '**බුද්ධගුණෙ පහාරො දින්නො**'ති ජිනවකෙක පහාරො තසා දින්නො. '**බුභුක්ඛිතස්සා**'ති භොත්තුමිච්ඡන්තස්ස කුමාරස්ස, ඡාතස්සෙත්‍යත්ථො. '**කඤ්චනතට්ටකෙ**'ති සුවණ්ණසරාවකෙ–අවසානගාථායං. '**සුපිනෙනපෙව**'න්ති සුපිනෙනපි එවං. '**ලපනෙනා**'ති කථනෙන. '**සරාථා**'ති සරෙථ අයමෙව වා පාඨො, අනුස්සරෙථෙත්‍යත්ථො. අයම්පි ගාථා උපජාති නාම.

**මිච්ඡාදිට්ඨිකස්ස වත්ථුං දුතියං.**

---

තතියෙ '**පාදපීඨ**'න්ති අධොතපාදට්ඨපනපීඨං. '**ඉස්සරභත්තිකො**'ති පරමෙස්සරලද්ධිකො. '**තිපුර**'න්ති තීණි පුරානි. '**ලලාටනයනග්ගිනා**'ති ලලාටෙ ඨිතනයනග්ගිනා, සො කිර ඉස්සරො රුට්ඨො භූමියම්පි අන්තලික්ඛෙපි ඵරුසෙන චක්ඛුනා ඔලොකෙන්තො අනෙකෙ සත්තෙ මාරෙති තං සන්ධායෙවමාහ. '**තිසූලෙනා**'ති තිසූලායුධෙන. '**ජටාකලාපමාවත්ත**'න්ති ජටාබන්ධං ආවත්තං. '**තිසෙසා**'ති උමා භගවතී ආදිකා තිසෙසා. '**ජටාසෙකං සමුබ්බහෙ**'ති ජටාය, එකං සම්ම උබ්බහෙය්‍ය. '**හත්ථිචම්මම්බරධරො**'ති හත්ථිචම්මසඞ්ඛාත වත්ථවසනො. '**මධුපානෙ චා**'ති මධුපානකම්මෙ ව්‍යාවටො. '**මනුස්සට්ඨිධරො**'ති මනුස්ස අට්ඨිධරො. '**සීසකපාලෙනා**'ති මනුස්සසීසට්ඨිකපාලෙන. '**එසභුජති**'ති එසො භොජනං භුජති. '**ගුණරාසින**'න්ති ගුණපුඤ්ජානං. '**චරාචරාන**'න්ති ජඞ්ගමථාවරානං. † '**ධරාඅඝ**'න්ති අඝං මහාපථවි. '**එවමිද්ධිවිධා**'ති එවං ඉද්ධිවිධා. '**පගෙවා**'ති කා කථාව. '**නානාසමයවාදිනො**'ති නානාලද්ධිවාදිනො ජනා. '**රාමකාලෙ**'ති දසරථරඤ්ඤො පුත්තභූත රාමරාජකුමාරකාලෙ. '**පාදුකාචාසිඅබ්භුතා**'ති තිණපාදුකා අඤ්ඤමඤ්ඤපටිහනනෙන අබ්භුතා අහොසි. '**දඨාජරංසිරජිතා**'ති රදනවසං ජරංසිරජිතං. '**පඞ්කජමුද්ධනි**'ති පදුමස්ස උපරි. '**ආසභිංවාච**'න්ති සීහනාදවචනං අසම්භීතවචනං. '**අග්ගො සෙට්ඨො**'ති ආදිනා 'අග්ගොහමස්මි ලොකස්ස සෙට්ඨොහමස්මි ලොක

---

* මුදිතාවහන්ති පි පාඨො.

† චරාචරානන්ති ගිනුත්තරානං ඉච්චපි පාඨො දිස්සති.

ස්ස ඡජ්ජොතමස්මිං ලොකස්ස අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො'ති ආසභිං වාචං. 'නන්දූපනන්දභොගින්ද'න්ති එවං නාමකං භුජගින්දං දීපෙති. 'විජේ'ති බ්‍රාහ්මණෙ-අවසානගාථා පාකටාව. අයම්පිගාථා උපජාති නාම.

## පාදපීඨිකාය වත්ථුං තතියං.

---

චතුත්ථෙ 'ජෙජ්ජහෙජ්ජ'න්ති ජේතබ්බං භිත්තබ්බං කම්මං. 'සුධපාසණ්ඩිසෙසූ'ති සො කිර මිච්ඡාගාහෙන බුද්ධසාසනං පාසණ්ඩීති මන්ත්වා එවමාහ. 'බද්ධාඝාතත්තා'ති පුබ්බෙ ආඝාතං බන්ධිතත්තා. 'අසොධෙත්වා'ති විනිච්ඡයං අකත්වා. 'නිම්බසූලෙ'ති පුචිමන්දරුක්ඛෙන කතසූලෙ. 'විප්ඵුරන්තහත්ථතලෙ'ති විප්ඵුරිතහත්ථතලෙ. 'නවමණිමයූඛසම්භින්නපීතාභාසතාය'ති මයූරපිඤ්ජසම්භින්නනවමණීනං පීතආභාය ජාතතාය. 'ජාතිහිංගුලකසුවණ්ණරසධාරාවිය'ති ජාතිහිංගුලස්ස ච සුවණ්ණස්ස ච රසධාරම්ව. 'සුඛුමං සූක'න්ති සුඛුමභූතං සූකං. 'නිම්බජලලියා'ති නිම්බරුක්ඛජල්ලිතො. 'අභිසපී'ති අභිසපි, අපදානගාථාසු. 'නිසූල'න්ති සූලාකාරෙන ජයිපුප්ඵෙහි එකනාලෙහි කතං කණ්ණිකාරහත්ථකං. 'අම්බරෙ'ති ආකාසෙ. 'සාලරාජාවා'ති රුක්ඛානං රාජා ජම්බුරුක්ඛො විය. 'විචිත'න්ති විචිත්තතො. 'උද්ධවණ්ණා'ති වණ්ණානි උද්ධං කත්වා. 'ඣාය'න්ති ඣත්තාකාරෙන ඣායං. 'සත්ථුනො'ති බුද්ධස්ස උපරිතිසෙසො. 'සහස්සඛණ්ඩ'න්ති සහස්සඛණ්ඩප්පමාණං. 'සතගෙණ්ඩු'න්ති සතගබ්භං. 'ධජාලු'න්ති ධජපතාකබහුලං. 'හරිතාමය'න්ති සුවණ්ණමයං. 'සොවණ්ණමයා'ති සුවණ්ණමයා. 'තූලික'න්ති දිබ්බතූලමයං. 'විකතිසක'න්ති නානාවිචිත්‍රචිත්තිකං. 'උද්දලොමික'න්ති උද්ධංගතලොමිං. 'එකන්ත'න්ති එකන්තලොමිං. 'තාලෙහී'ති තාලාවචරෙහි. 'වෙවණ්ණියං නජානාමි'ති පණ්ඩුපලාසාදිකං මම සරීරෙ විවණ්ණං නජානාමි. 'සුකතමූලෙන'ති කුසලමූලෙන—අවසානගාථායං, 'සහෙතුකා'ති සහෙතුකපටිසන්ධිකා. 'පාප'න්ති එවමස්ස විපාකං. 'ආරකා'ති දූරතොව. අයම්පිගාථා උපජාතිනාම.

## උත්තරසාමණෙරස්ස වත්ථුං චතුත්ථං.

---

පංචමෙ 'චොලරට්ඨෙ'ති එවං නාමකෙ රට්ඨෙ. 'මාහිස්සරිකා'ති මහිස්සරභත්තිකා. 'දෙවාලයෙ'ති දෙවානං පූජනට්ඨානෙ. 'දිජ්ඣන්තාවා'ති අග්ගිනා දඩ්ඪාව. 'සහස්සරංසි දිවාකරො'ති අනෙකරංසි සුරියො

ඉව. 'සොණ්ණතනො'ති සුවණ්ණාදාසසදිසමුඛො. 'සමණී'ති මණි සහිතො. 'විවට්ටො'ති නිවත්තවට්ටො විකතො පාකතො. 'අනිලො විය'ති වාතො විය. 'කුවාදගච්ඡදහනො'ති ඛණ්ඩිත පරවාදසංඛාත ගච්ඡ දහන සීලො. 'අගදො'ති ඔසධො. 'දෙවින්දාසුරසිද්ධෙහී'ති දෙවඉන්ද අසුරසිද්ධවිජ්ජාධරෙහි. 'තෙසමග්ගො'ති තෙසං අග්ගො. 'සතාපචා'ති සාරිතාපනො–අවසානගාථායං, 'අනබ්භුත'න්ති අනුභූතං අතිවිය අච්ඡරියං අථවා අනබ්භුතන්ති අනච්ඡරියං අයමෙත්ථ යොජනා සන්ධරිධරමානකාලෙ යෙ කුසලානි කරොන්ති තෙ අච්ඡරියං භගවතො ඉද්ධිං දිස්වාන, යෙ තෙ ජනා පරිනිබ්බුතම්හි මුනින්දෙ පුඤ්ඤානි කරොන්ති තෙ අබ්භුතං භගවතො ඉද්ධිං දිස්වාන; අයම්පි ගාථා උපජාතිනාම.

## කාවීරපට්ටනවත්ථුං පඤ්චමං.

---

ඡට්ඨෙ 'ඉමමෙවවරතර'න්ති ඉමමෙව චොරකම්මං පවරතරං. 'අප්පබලතනා'ති අප්පතරකායබලහෙතුතො. 'කතිපයසහායෙනා'ති කතිපයෙහි චොරෙහි. 'තට්ටතට්ටායමානදෙහො'ති තටතටම්ව සද්දං කුරුමානදෙහො, 'දුග්ගති වාරණ'න්ති දුග්ගති නිවාරණං. 'සොපාන'න්ති සොපානසදිසං. 'භද්දඝටොවියා'ති දිබ්බනානස්ස පුණ්ණඝටම්ව. 'කුකාසනෙ'ති නරකගාමිමග්ගෙ. 'පිණ්ඩපාතස්ස වාහසා'ති පිණ්ඩපාතස්ස කාරණා. 'සීලම්පී'ති සීලම්පි රක්ඛිතබ්බං—අවසානගාථායං, 'සාරිපුත්තෙන'ති සාරිපුත්තස්ස. 'නිග්ගිතසපදන'න්ති අප්පං පිණ්ඩපාතමත්තං පදින්නං. 'කාමත්ථා'ති කාමියථ. 'පරත්ථා'ති පරලොකෙ. අයම්පි ගාථා උපජාතිනාම.

## චොරඝාතකවත්ථුං ඡට්ඨං.

---

සත්තමෙ 'උච්ඡුසතනකම්මෙනා'ති යනෙත උච්ඡුං පීළෙත්වා වික්කායිකකම්මෙන. 'උළුඩකමත්ත'න්ති චූලඋදකොළුඩ්කපූරප්පමාණං. 'සත්ථාගිරනත'න්ති සත්ථාජ්ඣාසයං. 'සමාකිරි'න්ති සම්මාපක්ඛිපිං. 'ව්‍යපගත'න්ති ව්‍යපාතිගතං. 'ජිඝච්ඡාකබලිසොබහු'ති භොජනපුණ්ණබහු උක්කලියො මම ජානන්ති. 'පචුරං ජාතරූප'න්ති බහුලං ජාතරූපං. 'පීණිතමානසො'ති පීතියා පීණිතමනො. 'ධම්මසාමිනො'ති සම්මාසම්බුද්ධස්ස. 'මුනිවාහසා'ති භගවතො කාරණා. 'නාවමඤ්ඤානබ්බ'න්ති න අවමඤ්ඤිතබ්බං. 'නිබ්බාණමපී'ති * නිබ්බාණසංඛාතං අත්ථ

---

* නිබ්බාණත්ථන්තිපි පාඨො.

ඵලං නිබ්බාණමෙවවා නිබ්බාණත්ථං-අවසානගාථායං, 'සරාථදෙවිං ඉධලාජදායී'න්ති ඉමස්මිං මනුස්සලොකෙ පච්චෙකබුද්ධස්සපංචසතපුත්තලාභත්ථාය පංචසතං ලාජං දත්වා ලාජදායීති පාකටං පංචන්නං පච්චෙකබුද්ධසතානං මාතරං දෙවිංසරාථාති ඉමස්ස හි විත්ථාරො උප්පලවණ්ණථෙරිගාථඨකථාය ගහෙතබ්බොති. අයම්පිගාථා උපජාතිනාම.

**සද්ධූපාසකස්සවත්ථුං සත්තමං.**

---

අට්ඨමෙ '**උය්‍යොගං කත්වා**'ති භතියා උය්‍යුත්තං කරිත්වා. '**ලද්ධිවාපෙ**'ති අත්තනො සස්සත්ථාය පරදින්නලද්ධිවාපෙ ච. '**උපහාර**'න්ති උපහාරමෙව වාදනංච, '**සබ්බසොවණ්ණමයො**'ති සබ්බසුවණ්ණමයො. '**සොණ්ණසිඞ්ගසතාකිණ්ණො**'ති අනෙකසුවණ්ණකූටාකිණ්ණො. '**දුද්දිකො**'ති පෙක්ඛමානස්ස චක්ඛුස්ස මුසනකරණභාවෙන දුද්දික්ඛො. '**සොණ්ණමාලා**'ති සුවණ්ණමාලා. '**පුප්ඵවඩ්ඪකිනා**'ති තවකන්තපුප්ඵසංඛාතෙන වඩ්ඪකිනා කතො. '**පමදා**'ති දිබ්බනාටිකායො. '**තන්තියො**'ති වීණාතන්තියො. '**ආතතාදයො**'ති ආතතනාමකාදයො පඤ්චඞ්ගිකතුරියා, ආදිසද්දෙන චෙත්ථ,

ආතතං චෙ ව විතතමාතත විතතංඝනං
සුසිරං චෙති තුරියං පංචඞ්ගික මුදීරිත'න්ති.

ඉමානි සංගණ්හාති. '**උල්ලඞ්ඝන්ති**'ති උල්ලඞ්ඝිත්වා උල්ලඞ්ඝිත්වා කීළන්ති. '**සෙළෙන්ති**'ති ඔට්ඨෙහි අපාකටං සද්දං කරොන්ති. '**සිලාඝන්ති**'ති අභිත්ථවන්ති, අයමෙවවා පාඨො. '**පරත්ථා**'ති පරලොකෙ. '**අනුසිතො**'ති අනු පුනප්පුනං අසිතො. '**කල්‍යාණවිමුඛා**'ති පුඤ්ඤතො පරම්මුඛා. '**කාම**'න්ති එකන්තෙන. '**දීනො**'ති වරාකො. '**අනාලයො**'ති අනාලම්බො. '**බීජං**'ති පුඤ්ඤබීජං. '**සුඛිතො සියා**'ති සුඛෙන ඉතො යාතො භවෙය්‍ය. '**පායාසං අමතං අදං**'ති සො අහං පායාසසඞ්ඛාතං අමතං අදාසිං-අවසානගාථායං, '**පත්ථයෙව්හො**'ති පත්ථයන්තා භවෙය්‍යව්හො. අයම්පිගාථා උපජාතිනාම.

**කපණස්ස වත්ථුං අට්ඨමං.**

---

නවමෙ '**පච්ඡිමාලොප**'න්ති සබ්බපච්ඡිමං ආලොපං. '**උක්කාසිත්වා**'ති උක්කාසිත සද්දං කරිත්වා. '**කාකණිකමත්ත**'න්ති අප්පකං කාකණිකං නාකණිකං, පුබ්බකාලික සාලිසීසන්තාමිඛානප්පමාණං නාකණිකා

මත්තත්තං කථෙන්ති එකච්චෙ ආචරියා, කාකනිකමත්තන්තාව අඩ්ඪමාසකන්ති ජාතකටීකාකාරා, කාකනිකං නාම දියඩ්ඪවීහීති තණ්ඩාවි තරණී ටීකාකාරා. '**බුභුක්ඛිතා**'ති භොත්තුමිච්ඡන්තා. '**කරුණාපූරිතහදයො**'ති කරුණාය පුණ්ණහදයො. '**සොපී**'ති සොපි සමණො. '**දයාපරො**'ති දයාලුකො. '**සුධන්නං**'ති දිබ්බභොජනං. '**පදෙසරජ්ජමකාසහ**'න්ති පදෙසරජ්ජං අහං අකාසිං–අවසානගාථායං. '**පච්ඡිමාසපිණ්ඩියා**'ති පච්ඡිමාලොපස්ස. '**සවණාය ධම්මස්සා**'ති ධම්මස්ස සවණාය. '**බහුදායකස්සා**'ති බහූනං දදන්තස්ස දායකස්ස.

දෙවපුත්තස්ස වත්ථුං නවමං.

---

දසමෙ '**ඝාතනාසා**'ති සෙව භත්තපරිභොගො ඝාතනො තස්ස ඡායා, ඝාතනායාති සෙව කතනතිකස්ස භත්තපරිභොගච්ඡායාති වුත්තං හොතීති විනයට්ඨකථායං. '**පරිවෙණමහෙ**'ති පරිවෙණස්ස නියාදිතදිවසෙ කතපූජාය. '**නවදධිච පටලමධුචා**'ති ඉදං වයං. '**වඩ්ඪෙත්වා**'ති මූලං වඩ්ඪෙත්වා. '**ඛුරගෙහයෙවා**'ති කෙසොරොපණත්ථාය සීසකුපධානට්ඨපිතමත්තෙ එවාති සංයුත්තභාණකා, ඛුරගෙහයෙවාති කෙසොරොපනස්සාවසානම්වජ්ජන්තීති ඛද්ධකභාණකා. '**මනුජාමරනාගාන**'න්ති මනුස්සදෙවනාගානං. '**මං විනතං පාදෙ**'ති අත්තනො පාදවයෙ ඔනතං මං. '**අපිචෙස මහාභොගො**' ති අපිච එසො ඛත්තියො මහන්තජ්ඣාසයො. "භොගො බ්‍යාධිමහි ජ්ඣාසයෙ"ති නිඝණ්ඩුසු වුත්තං. '**සුදස්සනො**'ති එවං නාමකො. '**දායාදො**'ති පුත්තො. "දායාදො බන්ධුවෙ පුත්තො"ති අනෙකත්ථෙ වුත්තං. '**ධම්මනිම්මිතො**'ති පුඤ්ඤකම්මමාපිතො. '**අඩ්ඪප්පත්තො**'ති අධිකම්පත්තො. '**ජකාමගෙහ**'ති ජකාමාවචරානං ජෙට්ඨභාවෙ. '**දයිතො**'ති ඤාතීහි අනුකම්පිතො. '**පත්ථිතො**'ති මාතාපිතූහි පත්ථෙත්වා ලද්ධපුත්තො. '**කම්මන්තව්‍යාවටො**'ති කම්මන්තෙසු ව්‍යාවටො උස්සුක්කො. '**පූගො**'ති ගණො. '**ඔරක**'න්ති ලාමකං. '**කාර**'න්ති අධිකාරං. '**සත්තුකස්සා**'ති සපත්තස්ස. '**රුට්ඨො**'ති කුද්ධො. '**චාරරොධ**'න්ති චාරපිදහනං. '**තාපසස්සිනො**'ති තාපසස්ස. '**එකාහං**'ති එකදිවසං. '**පාපයන්ත**'න්ති තං නිරයං පාපුණිං. '**චාරරොධස්ස වාහසා**'ති සත්තුනො චාරනිරුද්ධකාරණා. '**ජහදුනෙනා**'ති රුචියා උපායං අසක්කොන්තෙන. '**රෙවතමද්දසා**'ති ඛදිරවනියං රෙවතත්ථෙරං පස්සි–අවසානගාථායං, '**මහබ්භුත**'න්ති† මහච්ඡරියං. '**පුඤ්ඤානුභාවචසිරිං සිරිමත**'න්ති සිරිසාරමහග්ඝතානං සීවලිත්ථෙරාදීනං පුඤ්ඤ

† මහග්ඝතන්ති, මහග්ඝතං වෙපුල්ලප්පත්තන්ති කත්ථචි.

නුභාවෙච සිරිංච සුත්වා. '**කුසීත**'න්ති ආලසියං. '**කාමදො**'ති හො න්තො කාමදත්තුම්පි ඡෙකාති සෙසො දට්ඨබ්බාති අත්ථො. අයං ගාථා ඉන්ද්‍රවංසා නාම.

සා ඉන්ද්‍රවංසා ඛලු යත්ථ තා ජරා.
**සීවලිත්ථෙරස්ස වත්ථුං දසමං.**

**යක්ඛවඤ්චිතවග්ගො තතියො.**
**තස්ස වග්ගස්ස උද්දානං**

යක්ඛ වඤ්චිත මිච්ඡාදිට්ඨි පාද පිසී ච උත්තරො
කාවීර පට්ටනං චොර ඝාතකො සඞ්ඝුපාසකො
කපණො දෙව පුත්තො ච සීවලිත්ථෙරෙන තෙදසා'ති.

---

ඉති පරමවිසුද්ධ—පෙ—අත්ථවණ්ණනාසාරභූතා තතියස්ස යක්ඛ වඤ්චිතවග්ගස්ස අත්ථවණ්ණනාභූතා මධුරරසවාහිනීටීකා සමත්තා.

.........................................

චතුත්ථස්ස මහාසෙනවග්ගස්ස පඨමෙ '**මිත්තාපභාව**'න්ති මිත්තසද්ද භාවං. '**කොට්ටෙති**'ති උදුක්ඛලමුසලෙහි කොට්ටෙති. '**පප්පොටෙති**'ති සුප්පෙන පප්පොටෙති. '**මනං පති**'ති සබ්බසම්පත්තිවිත්තානං නිස්සාය. '**ඛීරසාගර**'න්ති එවං නාමකං. '**සන්නිධි**'න්ති සන්නිචයං. '**ථෙය්‍යස්සා**'ති ථෙය්‍යපරිභොගස්ස. '**නාපෙවිණ**'න්ති තං එවං ඉණ පරිභොගං අනාදියිත්වා. '**සුභෙරතා**'ති පුඤ්ඤකම්මෙ රතා–අවසාන ගාථායං, '**ආසාසෙන කතා**'න්ති අත්තනො ආසාසෙන කතං කම්මං. '**ඔනත්වාන**'ති නමිත්වා. '**කාරෙ**'ති කාරෙය්‍ය. අයං ගාථා කුමාරලලිතා නාම.

කුමාර ලලිතා ජසගා.

**මහාසෙනරඤ්ඤො වත්ථුං පඨමං.**

---

දුතියෙ '**අභයුත්තරචෙතියෙ**'ති එවං නාමකෙ. '**අධොතාසනෙ**'ති අපරිසොධිතෙ පුප්ඵාසනෙ. '**භගවන්තස්සා**'ති භාග්‍යවන්ත ස්ස, භාග්‍යවන්තස්සාතිපි පාඨො, සිරිමන්තස්සාත්‍යත්ථො. '**සාසිරූපී**'ති සා සුරූපී ආසි. '**මොරෙව ලභතෙඵල**'න්ති මොරොවිය කම්මසරික්ඛකං ඵලං ලභතෙ. '**ලලනානනානි**'ති විචිත්‍රමුඛානි. '**චලලොචනානි**'ති චලිතචක්ඛූනි. '**තරුණාරුණානි**'ති තරුණසුරියස්ස විය අරුණවණ්ණානි. '**චලිතාධරාණී**'ති නිබ්බුතවදනානි (හත්ථපාදාදීහි සහි තානි සමෙතානි.) '**මනුජො**'ති ජනො. '**සනභනපිය**'න්ති චතුප්පියං.

'නීචජන්ති'ති නීචජාතිකම්පි. 'සමෙති'ති සමාගච්ඡති. 'ඡමාසමත්තිකා'ති භූමියං මත්තිකා. 'චාමිකරජාතිකාසා' ති චාමිකරො වුච්චති සුවණ්ණවණ්ණො සුවණ්ණවණ්ණත්තාය හංසො 'පිචාමිකරො, සුවණ්ණහංසොති අත්ථො, තස්ස ජාති චාමිකරජාතිකා සුවණ්ණහංසජාතීති අත්ථො. 'සිගාලධෙනූ'ති සිගාලනාමිකා ධෙනු සිගාලීති අත්ථො. 'සීහවරෙනා'ති වරකෙසරසීහෙන. 'කාමෙති'ති මච්ඡිතා කුලසම්පත්තමෙව කාමෙති පිහෙති. 'අනුපකකුලො'ති අගරහිතො. 'ගන්ධබ්බ'න්ති ගන්ධබ්බසිප්පං. 'සරසෙනා'ති සහත්ථවනාටකරසෙන. 'කිඤ්චිඅපනෙත්වා'ති ථොකං විවරිත්වා. 'කම්බලභද්දපීඨෙ'ති කම්බලපරිසොනධෙසුගන්ධරස භද්දපීඨෙ. 'දසනරංසිනා'ති දන්තප්පභාය. 'සුරත්තාධරෙනා'ති සුරත්තදන්තාවරණෙන. 'මන්දහසිත'න්ති මන්දහසනං. 'රසෙඩ්ඪාසකාසා' ති රසෙඩ්ඪ නිවෙසනා. 'ආපදෙ'ති උපද්දවෙ. 'ලලනා'ති විලාසමත්තා. 'කාමලාලසා'ති කාමලා වුච්චති කාමලාභො අත්තනො කාමෙන පරෙසම්පිහෙතීති කත්වා තස්සාලයා කාමලාභාලයාති වත්තබ්බෙ භකාරලොපවසෙන කාමලාලයාති වුත්තං. 'නීලකබ්බණ්ඩකාණ්ඩෙහි'ති නීලකබ්සංඛාතෙහි කක්කලකාණ්ඩෙහි. 'විඩෙණ්ඩසී'ති විලෙඛසි. 'මුඛම්බුජෙ'ති මුඛපදුමෙ. 'සත්තා'ති ලග්ගා. 'මමනෙත්තමධුබ්බතා'ති මම චක්ඛුචඤ්චමධුකරා. 'නසරන්තා' ති න ගච්ඡන්තා. 'තඤ්ඤෙවා'ති තං එව තස්සා මුඛම්බුජෙ. 'තෙ'ති මධුකරා. 'සහෙවතෙහි'ති මධුකරෙහි සහෙව. 'උල්ලඞ්ඝඋඩ්ඩෙනො'ති උල්ලඞ්ඝම්ව උඩ්ඩෙතො හුත්වා. 'ලජ්ජාගම්භීරපරිඛ'න්ති හිරිසංඛාතං ගම්භීරපරිඛං. 'ධිතිපාකාරමුග්ගත'න්ති පඤ්ඤාසංඛාතං උග්ගතං පාකාරං. 'චන්දනස්සා'ති චන්දනසාරස්ස. 'අගම්මගමනා'ති අගන්තබ්බඨාන ගමන හෙතු. 'නරානං දූරතො යාති සිරී'ති මනුස්සානං දූරතො සිරි අප ගච්ඡති. 'කිත්තිචායුබලංබුද්ධී'ති කිත්ති ආදයො පි අගම්මගමනා අපගච්ඡන්ති. 'අයසංචසගච්ඡති'ති සො අගම්මගමනා අයසඤ්ච පප්පොති. 'අමෙජ්ඣ'ති මෙධිනො භාවො මෙජ්ඣං, න මෙජ්ඣං අමෙජ්ඣං තස්මා බාලාති අත්ථො, දුම්මෙධාතිපි පඨන්ති. 'පීරතන'න්ති ඉත්ථිරතනං. 'යුවාක'ති යුවති. 'දූසකකුලා'ති කුච්ඡිත කුලතො අපි. 'ගාහියා'ති ගහනීයා එව. 'ගුහාසයො'ති* කාමසංඛාතස්ස ගුහාසයස්ස නිවාසො. 'නරාධමො'ති චණ්ඩාලමනුස්සො නිහීනපුරිසො වා–අවසාන ගාථායං, 'අසොණිසො'ති සුණෙන අපච්චවෙක්ඛිත්වා, අධොතාසනෙ පුප්ඵපූජාකරණෙන. 'ඊදිසංගති'න්ති ඊදිසං ඵලනිප්ඵත්තිං. අයං ගාථාඉන්දවංසා නාම.

**සුවණ්ණතිලකාය වත්ථුං දුතියං.**

---

* ගුථාසයො'තිපි දිස්සති.

තතියෙ **'විසොසිංසූ'**ති ඛිලමත්ථං විනොදයිංසු. **'සන්නාසිනො'**ති යස්මිං බොධිරුක්ඛමූලෙ නිසින්නො. **'ජෙසී'**ති අජෙසි. **'සසෙනං මකරධජ'**න්ති සෙනාසහිතං මකරධජවන්තං දෙවපුත්තමාරඤ්ච, සො හි මකරසදිසත්තා මකරධජොති ලද්ධනාමො. **'පදමකොපය'**න්ති පදං අකොපයන්තො. **'සත්තරත්තින්දිව'**න්ති සත්තාහං. **'නෙත්තනලනීරජරංසිනා'**ති විමලනීරජරංසිනා නෙත්තවසෙන. **'නෙත්තාලිපාලිපාතනා'**ති නෙත්තා ඉව අලී නෙත්තාලී, පක්ඛසංඛාතමධුකරා, නෙත්තාලීනං පාලි නෙත්තාලිපාලි, තෙසං පාතනා නෙත්තාලිපාලිපාතනා. **'මෙචකාකාරපත්තෙහී'**ති මෙචකආකාරපත්තෙහි. **'සිඛණ්ඩී වියා'**ති මයූරා විය. **'භාතී'**ති ජොතලති. **'සො'**ති යො භගවා. **'සුරපාදපො වා'**ති දෙවානං කප්පරුක්ඛො විය. **'ය'**න්ති යො බොධිරුක්ඛො, යො මහීරුහොති යොජනා. **'සමුපාසතී'**ති යං බොධිරුක්ඛං උපාසෙන්තො උපට්ඨහන්තො. **'දූසිත'**න්ති පදුට්ඨිකං. **'නිහඤ්ඤතී'**ති නාසයති. **'සචාතනාසා'**ති සෙව භොජනත්ථාය. **'සන්ධිකවාතෙනා'**ති සන්ධිසදිසෙන අබ්භන්තරෙ කුපිතවාතෙන, සො කිර කුපිතො හදයවත්ථුං ජිජ්ඣිත්වා කොපෙතීති. **'පමිසාදසී'**න්ති අද්දසිං. **'එත්ථ කානනෙ'**ති ඉමස්මිං වනසණ්ඩෙ. **'මෙ ගත්ත'**න්ති මම සරීරං. **'සිවත්ථමලිනම්බර'**න්ති මලිනවත්ථනිවත්ථං. **'විකිණ්ණඵලිනගෙහකි කෙසෙහී'**ති ඉන්ද්‍රියසුත්තකොට්ඨාසෙහි ආකිණ්ණකෙසෙහි, ඉන්ද්‍රියසුත්තං හි ඵලිනන්ති වුච්චති. **'විරලාකුල'**න්ති විරලඤ්චෙව ආකුලවිකුලඤ්ච. **'ඌකාගුම්බපටිසඞ්කුල'**න්ති ඌකාගුම්බෙහි පටිසඞ්කුලං. **'ආසජ්ජන'**න්ති ආපජ්ජනං මම සිරං. **'සුනීලමුදුධම්මිල්ල'**න්ති සුනීලඤ්චෙව මුදුඤ්ච ධම්මිල්ලයුත්තං. **'සමුබ්බහෙ'**ති සමාවහාමි—අවසානගාථායං. **'කපණා'**ති වරාකා. **'ථූලකුචෙලකෙනා'**ති ථූලපිලොතිකසාටකෙන. **'පූජාපරා'**ති පූජාපරායනා. **'සම්මා'**ති සම්මාපකාරෙන ආලපනං වා එතං. අයම්පි ගාථා වසන්තතිලකා නාම.

**කපණාය වත්ථුං ඡත්තිංසං.**

---

චතුත්ථෙ **'ඔරභාගෙ'**ති හෙට්ඨාභාගෙ පරභාගෙති වා. **'ගමනායන'**න්ති ගමනියං අයනං, ගන්තබ්බමග්ගොති අත්ථො. **'ධොතමුත්තාසමාභාසා'**ති ධොතමුත්තාසමාය සෙතආභාය. **'දුස්සතොරණපන්තියො'**ති දුස්සෙහි ලම්බිතානං තොරණත්ථම්භානං පන්තියො. **'කලධොතහෙමරම්භාදිනානාතොරණපන්තියො'**ති එත්ථ රම්භාති චූලකදලියො, ලොකෙ පුප්ඵකදලීති වුත්තා, ආදිසද්දෙන තරුණතාලනාලිකෙරපූගපත්තාදයො සඞ්ගහිතා, රජතසුවණ්ණරම්භාදීහි ඔලම්බිතානං නානාතොරණානං පන්තියොති අධිප්පායො. **'අනෙකතොරණුපරි තොරණා'**ති අනෙකතොරණානං උපරි උස්සාපිතතොරණා,

'**කුසුමගන්ධිකා**'ති පුප්ඵගන්ධිකා. '**දීපිතා**'ති ජලිතා. '**පදුමුප්පලසනනීරපුප්ඵපල්ලවලඞ්කතා**'ති පදුමං ච උප්පලං ච සනනීරං ච පදුමුප්පලසනනීරානි, සනනීරං වුච්චති කල්හාරං, පුප්ඵං ච පල්ලවං ච පුප්ඵපල්ලවානි, පදුමුප්පලසනනීරානි ච තානි පුප්ඵපල්ලවානි චෙති පදුමුප්පලසනනීරපුප්ඵපල්ලවානි, තෙහි අලඞ්කතාති පදුමුප්පලසනනීරපුප්ඵපල්ලවලඞ්කතා. '**ඝම්මාලායො**' ති මහාවාපිපන්තියො. '**සොගන්ධවාරීහි**' ති සුගන්ධජලෙහි. '**වනමාසී**' ති රුක්ඛා ආසි. '**කෙතනොඝො**'ති මහාකෙතු. '**මන්දමන්දසමීරණා**'ති මන්දමන්දෙරිතවාතා. '**පාදපථෙ**'ති පාදනික්ඛිපනාරහෙ පථෙ. '**සිත්තසම්මට්ඨභූමිය**'න්ති රජොහතුපහනාය වාරිනා සිත්තසම්මජ්ජිතභූමියං. '**ලාජාදිපඤ්චපුප්ඵානී**'ති ලාජාදිකානි පඤ්චවිධානි පුප්ඵානි, පොරාණා පනාහු:—

> නාඞ්ගියාවට්ටමකුලං මල්ලිකාමකුලං තථා
> දබ්බතිණඤ්ච සිද්ධත්ථං ලාජපඤ්චමකානිමෙ'ති:—

'**චතුරා**'ති භාවහාවලීලා ඉමෙහි චතූහි වණ්ණසණ්ඨානවිලාසභාවෙහි ඉති චාතුරියෙහි සමන්නාගතා නාරීති ජාතකටීකාකාරා, අථවා **චාතුරා**ති ඡෙකා දක්ඛා. '**රසභාවනිරන්තරා**'ති නච්චාදීරසභාව පුණ්ණා. '**කංස**'න්ති එකං තුරියවිසෙසං, තං පන වංසගහණෙනෙව සඞ්ගහිතං. '**වංසාදී**'ති සුසිරගණෙව, ආදිසද්දෙන සෙසං ආතතං විතතං ආතතවිතතන්ති තිසෙසා තුරියජාතියො සඞ්ගණ්හාති. '**ගායකෙත්ථා**'ති ගායකා එත්ථාති ඡෙදෙ. '**ලයානුගත**'න්ති රාගාදිලයානුගතං. '**සාධුවාදෙහී**'ති සාධුකාරනිග්ඝොසෙහි. '**භෙරීනං නින්නාදෙහි චා**'ති භෙරීනං අභිනාදෙහි ච. '**කරීන**'න්ති හත්ථීනං. '**හයාන**'න්ති අස්සානං. '**හෙසිතෙහී**'ති හෙසෙති සද්දං කුරුමානෙහි සද්ධිං. '**නෙකවිටඞ්කසඞ්ඝතී**'ති අනෙකසතෙහි විටඞ්කගණෙහි. '**සොකාරීහී**'ති සොකඅරීහි, අථවා සොකරිහිති සො ම ගෙහා කරීහි හත්ථීහි ආකුලො. '**අට්ඨමඞ්ගලමුඛගායනා**' ති ජනතාචාමරාදිඅට්ඨමඞ්ගලෙ උග්ගායන. '**පමදා**'ති නාරියො. '**පපාසී**'ති උදපානෙහි. '**සිනානත්ථ**'න්ති මඞ්ගසිවනත්ථං. '**පොක්ඛරඤ්ඤො**'ති පොක්ඛරණියො. '**ඛතා**'ති ඛණිතා. '**ඨපෙත්වාන මහාගඞ්ග**'න්ති මහාගඞ්ගා අඤ්ඤත්‍ර යංකිඤ්චි ඉධමෙත්ථ නත්ථීති අධිප්පායො. '**යස්සත්ථායා**'ති යස්සා ගඞ්ගාය අත්ථාය. '**ලම්බිතානි චා**'ති ආලම්බිතානි. '**මානෙනුපත්ථද්ධචෙතසා**'ති මානෙන උපත්ථද්ධමනසා. '**මාමානස්ස වසීහොථා**'ති තුම්හෙ මානවසිකා මා හොථ. '**මානොපලාලිතො**'ති මානෙන ආලුලිතමනො. '**මක්කටො**'ති මක්කටො විය. '**නිබ්බණා**'ති වාණසඞ්ඛාතා වනතො නික්ඛන්තා හොථ, තෙනාහ භගවා "වනං ඡින්දථ මා රුක්ඛං වනතො ජායතෙ භය" න්ති ආදි. '**කරජකාය**'න්ති

එත්ථ කරං වුච්චති මාතුසම්භවං සොනිතාදි, කරතො ජාතො කරජො කරජො එව කායො කරජකායො, තස්මිං:—අවසානගාථායං. '**සදෙව කාන**'න්ති දෙවතාසහිතානං මනුස්සානං. '**ආයතනෙ**'ති සුඛෙත්තෙ. අයං ගාථා වංසට්ඨා නාම.

වදන්ති වංසට්ඨමිදං ජිතාජරා.

**ඉන්දගුත්තත්ථෙරස්ස වත්ථුං චතුත්ථං.**

---

පඨමෙ '**කුසිනාරායං උපවත්තනෙ**'ති කුසිනාරායං පච්ඡිම දක්ඛිණදිසාභාගෙ. '**අහතෙන වත්ථෙනා**'ති අභිනවෙන ඛලි මක්ඛිතසාටකෙන. '**අයසායදොණියා**'ති සුවණ්ණදොණියා. '**තීණි සාඛපුප්ඵානී**'ති තීණි සාඛාපබුද්ධපුප්ඵානි, එවනාමකානිති වා, කෙචි සාතපුප්ඵානීතිපි පඨන්ති. '**ඛරවාතෙනා**'ති ඛරෙන උදරවාතා බාධෙන. '**නමහ**'න්ති තං අභනන්ති ඡෙදො. '**පරිභාවිත**'න්ති සුගන්ධිතං '**මධුබ්බතනිසෙවිතා**'ති මධුකරනිසෙවිතා. '**පිඤ්ජරිතා**'ති පිඤ්ජරවණ්ණිතා. '**ඉම**'න්ති මම සරීරං. '**මොහජෙනා**'ති මොහජාලෙන. '**පූතිභූතං කලෙබර**'න්ති පුරාණභාවං පහාය ගතොරගොපමං සරීරං. '**අපවිද්ධ**'න්ති ඡඩ්ඩිතං. '**කුණපාලය**'න්ති අසිතිකිමිකුලාවාසභූතං. '**උපායනෙනා**'ති උපායනෙන. '**තණ්හායසඤ්ඤුණ්ණතා අගො**'ති තණ්හාය අසඤ්ඤුණ්ණතා අවිජිරියං. '**මහ**'න්ති පූජං. '**භාසමානං**'ති ජොතයමානං. '**උදික්ඛථා**'ති ඔලොකෙථ. '**අනුමත්ත**'න්ති පරමානුභෙදමත්තම්පි. '**හානං**'ති තං ඵලභානං න හොති:—ඔසාන ගාථායං. '**භූති**'න්ති සම්පත්තිං. '**සාත**'න්ති කන්තං. '**කාමත්ථ චෙ කාථා**'ති තුම්හෙ චෙ කාමයථ පුඤ්ඤානි කත්ථ කරිත්ථාති. අයම්පි ගාථා උපජාතිනාම.

**සාඛමාලපූජකාය වත්ථුං පඤ්චමං.**

---

ඡට්ඨෙ '**දානසෙසද**'න්ති දානස්ස ඉදන්ති ඡෙදො. '**දිවසම්පති**'න්ති දිවසං නිස්සාය. '**පුප්ඵඵලපල්ලවෙසී**'ති පුප්ඵෙහි ච ඵලෙහි ච පල්ලවෙහි ච පුප්ඵඵලපල්ලවෙහි, කොමලපත්තෙහි ච. '**විනතා**'ති විනතා, අයමෙව වා පාඨො, උඩ්ඩනාත්‍යස්සත්ථො. '**අකද්දමානින්නසුපතිත්ථෙසී**'ති අකද්දමෙහි අනුපුබ්බනින්නෙහි තිත්ථෙහි. '**නාභු**'ති න අහොසි. '**පුරාතනං**'ති පොරාණං. '**අදසී**'ති දදසි. '**පත්ථට**'න්ති පත්ථරිතං. '**පත්ථොදනෙනා**'ති පත්ථප්පමාණෙන ඔදනෙන, එකපත්ථො නාම පකතිනාලිති ජාතකටීකාකාරො:—ඔසානගාථායං. '**දානාවය**'න්ති දානානුගතං මග්ගං. '**මාකත්ථා**'ති මාකරිත්ථ. අයම්පි ගාථා උපජාති නාම.

**මොරියබ්‍රාහ්මණස්ස වත්ථුං ඡට්ඨං.**

සත්තමෙ ඔසානගාථායං, අනුරජෙසු පෙමං ජෙත්වාන ඉධ මාතු සෙ එවං දනං දදනාති කො නාම සම්ඛො නරො දනස්ස ඵලං සරන්තො දනං නාදසි අදසි යෙවාති අත්ථො. අයම්පි ගාථා උපජාති නාම.

## පුත්තවඩ්ඪං සත්තමං.

---

අඩ්මෙ 'මලයවාසිනො'නාති එවංනාමකෙ දෙසෙ වාසිනං ජනානං. 'එකා චෙටිකා'ති එකා කුලදාසි කුමාරිකා. 'සහසා'ති තුරිතා. 'විස්සජ්ජයන්තො'ති සට්ටාපෙන්තො. 'ලිම්බො'ති පත්තාම්බා. 'පුණ්ණඤ්ච'ති පත්තපූරඤ්ච. 'උපපත්තිතඤ්ච'ති මුඛතො ගලිත්වා පත්ත පස්සෙ ලග්ගිතඤ්ච. 'පණිදහි'ති පණිධානමකාසි. 'ආණා'ති මම ආණා පවත්තති. 'චුම්බටකා කාතබ්බා'ති පත්තාධාපනත්ථාය චුම්බටාකාරං කත්වා. 'භූමිජො'ති රාජා. 'සඛාණී'ති සුන්දරකථා. 'සුබ්බතා'ති සුන්දරවතා. 'ඉච්ඡද'ති ඉච්ඡිතිච්ඡිතද. 'මධුදො'ති මධු දායකො. 'නිග්‍රොධො'ති නිග්‍රොධසාමණෙරො, සො හි බින්දුසාරරඤ්ඤො ජෙට්ඨපුත්තස්ස සුමනරාජකුමාරස්ස පුත්තොති, ඉදං හි සමන්තපාසාදිකාය ච වුත්තං. 'තිස්සො'ති දෙවානං පියතිස්සො රාජා. 'පාරමාදිකො'ති පරසමුද්දෙ තීපාතීති පච්ඡිමසාමුද්දිකස්ස එවං වාදකො. 'උප්පලංව යසොදකො'ති එත්ථ රස්සකාරන්ත වාසද්දෙන උප්පලං වා යං කිඤ්චි කුමුදං වා ජලජං පුප්ඵජාතං වා සමුච්චෙති. 'අඤ්ඤදඤ්ඤං නානා'ති නානා නව වචනං මයා කථිතං. 'පරිසොසාපෙති'ති පරිසොසානං පාපෙති. 'සත්තානුමොදනාසාකා'ති භාතුසාදිනනාය පත්තියා අනුමොදනාස්ස විපාකෙන. 'අසෙසො'ති අසිඑසොති ජෙදෙ. 'දන්තපොණකිච්චං'ති දන්තසොධනකිච්චං. 'අගදාමලකං'ති දිබ්බොසධආමලකං. 'නිස්සුසකානි'ති නිග්ගත ඌසකානි. 'කුටං පහරන්තී'ති කුටං භින්දනාති. 'සලිලතල'නාති සරතලං. 'අක්ඛිපූජංකාමා'ති අක්ඛිනා අනඤ්ඤදවිහිතකං කත්වා ඔලොකන පූජං. 'බාහිරකපාසණ්ඩ'නාති කිලෙසෙ පාසණ්ඩනතීති පාසණ්ඩා, තන්නාමකං බාහිරකපබ්බජිතං. 'පණ්ඩරඟ'නාති හලිද්දිරාගවත්ථනිවත්ථං පබ්බජිතගණං. 'අභිහරථා'ති ආනෙථ. 'වෙතියෙහිපහිතකුද්දලො'ති වෙතියං භින්දිතුං පහරිතකුද්දලො. 'සුධාභූමි'ති සුධාය කත භූමි. 'කණ්ඩරූපකානී'ති කණ්ඩමයසත්තරූපානි. 'පරිචරණකාබ්භන්තරනාති' තත්ථ පුඤ්ඤං කත්වා දෙවමනුස්සෙසු උපක්ඛානාබ්භාරභ ධාතුං ඨපෙත්වා. 'දායාදො'ති පිතුහි දින්නදායං ආදදාති ගණ්හාතීති දායාදො, පුත්තො තිඅත්ථො. "දායාදෙ බන්ධවෙ පුත්තෙ" ති නිඝණ්ඩුසු වුත්තං. 'පුත්තානං මනා'නාති එත්ථ පුත්තො ච ධීතා ච පුත්තාති එක සෙසෙන වුත්තං පුත්තධීතරානං මනානාති අත්ථො. 'උපබ්බාජෙත්වා,' ති ගිහිභාවං පාපෙත්වා. 'යති'ති භික්ඛුවො. 'තිතත'නාති පුබ්බාපරමු

මනසඞ්ඛාතානං තිස්සන්නං චෙතනානං. “සම්පුණ්ණත්තා” ඉච්චාදිසු ගාථාසු සම්පුණ්ණත්තා මධුපපදෙ වාණිජො සබ්බත්ථ භවෙ සබ්බද කාලෙ සබ්බසම්පත්තිං. **'අභිසමනුභොසි'**ති අනුභොසි. **'මුටසීවරඤ්ඤෙ'**ති මුටසිවරාජෙ. **'සූනො'**ති පුත්තො. **'දසපුත්තෙසූ'**ති නිද්ධාරණෙ සත්තමී. **'සම'**න්ති සහ. **'නිධයො'**ති මහානිධී. **'භින්නනාවාගතානි ච'**ති වාණිජකානං භින්නනාවාය ඨිතානි. * **'තත්‍ර ජාතානි ච'**ති තස්මිං රතනාකරෙ ජාතානි. **'රතනානී'**ති. කහාපනානි **'තිස්සො'**ති එකා ලතායට්ඨි එකා පුප්ඵයට්ඨි එකා සකුණයට්ඨීති තිස්සො. **'තාසූ'**ති තාසු තිසු යට්ඨිසු. **'එත්ථා'**ති එතිස්සං ලතායට්ඨියං. **'කකුධඵලාකතිකා'** ති කකුධඵලාකාරා, ආකතිසද්දො හෙත්ථ ආකාරවාචකො; පදුමාකතීති ආදිසු විය. **'ඉච්චෙතා'**ති ඉති එතා මුත්තාති යොජනා. **'සමුද්දා'**ති සමුද්දතො. **'සබ්බං පුඤ්ඤවිජම්භිත'**න්ති සබ්බපුඤ්ඤස්ස විජම්භයකරං, විජම්භිතන්ති වා පාඨො, සොභමානන්ති අත්ථො. **'නරුත්තම'**න්ති සහායරාජානං ආලපති. **'වජාහී'**ති ගච්ඡාහි. **'අත්තසත්තමො'**ති අත්තානං සත්තමං කරොන්තො, තෙනාහු:—

“මහින්දො නාම නාමෙන සඞ්ඝත්ථෙරො තදා අහු
තතො ඉට්ටියො උත්තියො භද්දසාලො ච සම්බලො
සුමනො සාමණෙරො ච ඡළභිඤ්ඤො මහිද්ධිකො
භණ්ඩුකො සත්තමො තෙසං දිට්ඨසච්චො උපාසකො
එතෙ නාගා මහාපඤ්ඤා ජම්බුදීපා ඉධාගතා'ති”:—

කදා තෙ ආගතාති චෙ සම්මාසම්බුද්ධස්ස පරිනිබ්බාණතො ද්වින්නං වස්සසතානං උපරි ඡත්තිංසතිමෙ වස්සෙ ආගතාති විනයට්ඨකථායං. **'මිගව'**න්ති මිගවධං. **'පමත්තං විජ්ඣිතු'**න්ති පමත්තං අත්තානං අජානන්තමිගං විජ්ඣිතුං. **'ඉසිවාතපටිවාතො'**ති ඉසීනං නිවාසන පාරුපනවාතෙන පටිවාතො හුත්වා. **'රුක්ඛාපමාදිකා'**ති එත්ථ අම්බරුක්ඛූපමෙන. ථෙරො කිර චින්තෙසි අයං රාජා පඤ්ඤවෙය්‍යත්තෙන නුඛො උදාහු නොති එකං සමීපෙ ඨිතං අම්බරුක්ඛං සක්ඛිං කත්වා පුච්ඡි, කො ච නාමායං මහාරාජ රුක්ඛොති? අම්බරුක්ඛො භන්තෙති, ඉමං අම්බරුක්ඛං ඨපෙත්වා අඤ්ඤො අම්බරුක්ඛො අත්ථීති? අත්ථි භන්තෙ අඤ්ඤෙ අනෙකා අම්බරුක්ඛාති, ඉමං ච අම්බරුක්ඛං අඤ්ඤෙ ච අම්බරුක්ඛෙ ඨපෙත්වා අඤ්ඤෙ රුක්ඛා අත්ථීති? අත්ථි භන්තෙති අඤ්ඤෙ පනසාදයො අනෙකා රුක්ඛාති, අත්ථි පන මහාරාජ අඤ්ඤෙ අම්බරුක්ඛෙ ච අනම්බරුක්ඛෙ ච ඨපෙත්වා අඤ්ඤෙ රුක්ඛාති? සො යෙව භන්තෙ අම්බරුක්ඛො ති, එවමාදිනා උපමානෙන තස්ස පඤ්ඤවෙය්‍යත්තියං අඤ්ඤාසි, තෙනාහු. **'තස්ස පඤ්ඤං,**

* “භින්නනාවාගතානිච” කත්ථචි දිස්සති.

**වෙශ්‍යත්තිංසඤ්ඤා**'ති ආදි. '**මහිසස්සා**'ති රාජිනො. '**මහාමත්ති**'ති මහාපඤ්ඤො ථෙරො. '**අඩ්ඪතෙය්‍යානි පානසහස්සානී**'ති පඤ්චසතාධිකානි ද්විසහස්සපාණානි. '**අඩ්ඪනවපමාණං පාණසහස්ස**'න්ති පඤ්චසතාධිකා අට්ඨසහස්සජනා. '**බොධිනෙය්‍යම්බුජෙ**'ති බොධනෙය්‍ය පදුමෙ විකාසෙ ඵුල්ලෙ අකාසි. '**කුමුදාකරෙ**'ති කුමුදවනෙ. '**පාරවාදිඤ්ඤදෙසනා**'ති පරසමුද්දෙ ඛිපාහිනි වාදස්ස දෙසෙන. '**ජානෙව**'න්ති අයං මජ්ඣිමො භාතිකො වානිජො ජාතො. '**පරසාගරෙ**'ති ලඞ්කාදීපෙ. '**ඉස්සරො**'ති රාජා හුත්වා. ඔසානගාථායං:—'**එලනී**'ති එළං දෙති. '**සොනිසො**'ති ඤාණෙන. '**කුබ්බථා**'ති කරොථ. '**සෙ**' ත්‍යාදිසු යෙ සප්පුරිසා යත්ථ කත්ථචි ගන්ත්වා නසොචන්ති තාදිසෙ කම්මෙ කුබ්බථාති සෙසො. අයම්පි ගාථා උපජාති නාම.

**තෙභාතිකමධුවානිජකානං වත්ථුං අට්ඨමං.**

---

නවමෙ '**සාසනොතාරහෙතො**'ති සාසනස්ස ඔතිණ්ණහෙතො. '**මහාසොබ්භ**'න්ති මහන්තං ආවාටං. '**මරුතනරුක්ඛා**'ති මාරුත රුක්ඛා, අයමෙව වා පාඨො, ආරවධාරුක්ඛාත්‍යත්ථො. '**සුක්ඛපාරිභද්දදණ්ඩක**'න්ති සුක්ඛං කොවිළාරදණ්ඩකං පසවනෙතා උපචිත නෙත්වා. '**නිබ්බිජ්ඣන්තී**'ති වාචාය අතිවෙධෙන්ති. '**චක්කවත්ති**'න්ති චක්කවත්තිභාවං. '**මහාභිතිකර**'න්ති මහන්තං භෙසමකරං. '**මකරධජ**'න්ති මාරසෙනං. '**පලාපය**'න්ති පලාපයන්තො. **කිලෙසාරිසහස්ස**'න්ති දියඩ්ඪසහස්සකිලෙසාරයො. '**නයනංසුජලසෙකෙහී**'ති අනිමිසෙහි අක්ඛිහි. '**ජිනසෙවිත**'න්ති ජිනපූජිතං. '**ඕඝො**'ති පාකටො. '**රතනාදීහී**'ති රතනඝරාදිහි. **නිරාමයො හොති**'ති අරොගො හොති. '**පච්චත්ථෙචා**'ති දිට්ඨධම්මෙ ච. '**පරත්ථ චා**'ති පරලොකෙ ච. '**තදත්ථ**'න්ති තං අත්ථං. '**උපාසනීය**'න්ති උපට්ඨාතබ්බං. '**යා**'ති යා නාරී. '**තිණ්ණකඞ්ඛා**'ති බුද්ධෙ ධම්මෙ සංඝෙ ච තිණ්ණවිචිකිච්ඡා. '**ජල**'න්ති ඔභාසෙන්තී. '**නීලධම්මිල්ලහාරා**'ති සුනීලමුදුසිනිද්ධකෙසබන්ධභාරධරා. '**සොණ්ණදෙලාභසවණ්ණා**'ති සුවණ්ණදෙලාසමාන කණ්ණා. '**සුභපයොධරා**'ති සුන්දරථනවයධරා. '**සතරංසීහි සසමිස්සසඤ්ඤාබ්බුදසමාධරා**'ති සඤ්ඤු වුච්චන්ති රජතං සරීරරංසීහි මිස්සිත රජතඅබ්බුදසමාධරා. '**පරිගලී**'ති හසී. අවසානගාථායං:—'**දුමින්ද**'න්ති දුමරාජානං බොධිරුක්ඛං. '**සම්පූජිත**'න්ති අනිමිසෙහි අක්ඛිහි සුට්ඨුපූජිතං. '**සභාගවා**'ති සො පුඤ්ඤස්ස භාගී. '**අනීතිකො**'ති නිද්දුක්ඛො. අයං ගාථා භද්දිකා නාම.

නනරලහුගුරූහි භද්දිකා.

**බොධිරාජධීතාය වත්ථුං නවමං.**

---

දසමෙ ‘**වනකම්මිකෙනා**’ති වනෙ කම්මිකාරකෙන ජනෙන. ‘**වට්ටිත**’න්ති වට්ටිකතං. ‘**සාමණෙරගණෙනා**’ති සාමණෙරෙ පවත්තෙන. ‘**සිඛා**’ති කෙසබද්ධා. ‘**පණ්ණසූචියා**’ති මහාසූචියා. ‘**පොත්ථක**’න්ති රිත්තපොත්ථකං. ‘**අනෙනා**’ති අනන්තනො සුනඛිකාලෙ ආලොපදනෙන. ‘**ධීරා**’ති තං ආලපති. ‘**තව දාසිකා**’ති තව දාසි. ‘**සුඛිතා**’ති සුඛාපිතා. ‘**ඉස්සරා**’ති අධිස්සරො. ‘**තාදිසී**’ති තං සදිසා. ‘**ජනාසි**’ති ජානිස්සසි. ‘**භික්ඛිත්වානා**’ති භික්ඛාය චරිත්වා. ‘**අලද්ධගොචරා**’ති අලද්ධාහාරා ආසි. ‘**පහායත්තහිතෙ**’ති පහාය අත්තහිතෙති ඡෙදො:—අවසානගාථායං. ‘**තිසද්ධෙසු**’ති අතීතද්ධා අනාගතද්ධා පච්චුප්පන්නද්ධාති තීසු අද්ධෙසු. ‘**අසැඳ**’න්ති අසැඳං පටිසරණං. ‘**ඉච්ඡිතත්ථදායක**’න්ති ඉච්ඡිතිච්ඡිතදාතාරං. ‘**සුරපාදප**’න්ති කප්පරුක්ඛසදිසං රතනත්තයං. අයම්පි ගාථා භද්දිකා නාම.

**කුණ්ඩලියා වත්ථුං දසමං.**

**මහාසෙනවග්ගො චතුත්ථො.**

---

තස්ස වග්ගස්ස උද්දානං.

මහාසෙනො ච සුවණ්ණ තිලකා කපණ්ණ තථා
ඉන්දගුත්තො සාඛමාලා මොරියබ්‍රාහමණොපි ච
මධුවානිජකො පුත්තමාරකො බොධිසීතු ච
කුණ්ඩලියාති චතුත්ථ වග්ගෙ වත්ථුදසෙරිතානි.

ඉතිපරමවිසුද්ධ—පෙ—චතුත්ථස්ස මහාසෙනවග්ගස්ස අත්ථවණ්ණනාසාරභූතා මධුර රසවාහිනී ටීකා සමත්තා.

එත්තාවතා චතුවග්ගසීතා සමචත්තාලීසවත්ථුපතිමණ්ඩිතා ජම්බුදීපුප්පත්ති වත්ථුකථා නිඨිතාති.

ධම්මසොණ්ඩො තු පඨමො නන්දිරාජා ච දුතියො
තතියො යක්ඛවඤ්චිතවග්ගො චතුත්ථමෙව ච,
මහාසෙනොත්වචත්තාරො වග්ගා හි ජම්බුදීපිකා
සමතාලීසවත්ථුමති මණ්ඩිතා නිඨිතාධුනාති.

ජම්බුදීපුප්පත්ති වත්ථුකථා නිඨිතා.

# සීහලදීපකථා කථීයන්ති.

ඉදානි සීහලදීපුප්පත්තිවත්ථූනි කථීයන්ති. සීහලදීපුප්පත්තියම්හි ඡවග්ගා සට්ඨිවත්ථූනි, වග්ගෙසු පඨමො, මිගපොතකවග්ගො, වත්ථූසු මිගපොතකවත්ථු ආදි, මිගපොතකවත්ථුම්හි අයමානුපුබ්බීකථා වෙදිතබ්බාති අත්ථො.

**'උද්දලොලකවිහාරං නාමා'**ති එවං නාමකං විහාරං. **'විහාරොපවනෙ'**ති තස්ස විහාරස්ස උපවත්තනෙ වනෙ, පච්ඡාභාගෙති අත්ථො. **'පදොසෙ'**ති සූරියත්ථංගමිතමත්තෙ. **'මිගභූතෙනත්තනා'**ති පුරිමභවෙ අත්තනා මිගභූතෙන. **'ඛුරග්ගෙයෙවා'**ති එත්ථ කෙසොරොහනත්ථං ඛුරධාරාය අග්ගෙ ඨපිතමත්තෙයෙවාති අත්ථො, තං සංයුත්තට්ඨකථායං වුත්තං; විනයටීකායං පන "පුබ්බහෙතුසම්පන්නෙන කතාභිනීහාරෙන කුලපුත්තෙන පඨම කෙසවට්ටියා ඔරොපනක්ඛණෙ සොතාපත්තිඵලෙ පතිට්ඨිතං, දුතියාය කෙසවට්ටියා ඔරොපියමානාය සකදාගාමිඵලෙ, තතියාය අනාගාමිඵලෙ, සෙසානම්පන ඔරොපනං ච අරහත්තඵලසච්ඡිකිරියා ච අපච්ඡා අපුරෙ අහොසි, තං සන්ධායෙතං වුත්තං ඛුරග්ගෙයෙවා"ති. **'පරිමජ්ජන්තො'**ති ඉධ ඨිතො චාදසචත්තාළිසසහස්සයොජනෙ ආකාසෙ ඨිතං චන්දමණ්ඩලං පරාමසන්තො. ගාථාසු භණන්ත යො පුරිසො ගන්ත්වා තීරට්ඨො මහොදධිං දිස්වා අපස්සන්තො සකලසමුද්දන්ති සඤ්ඤාය අයං සමුද්දො මයා දිට්ඨොති භාසති, එවමෙව යථා ඉධ සාසනෙ යො භික්ඛු කෙචි කිලෙසෙ අත්තනො ඣානබලෙන වික්ඛම්භිත්වානපි අබුධං කුප්පධම්මං ඣානබලං ලද්ධාන සො කිලෙසානං අප්පහනත්වාන ලද්ධොකාසම්හි අධිමානවසෙන මඤ්ඤති; තථෙව යො භික්ඛු තණ්හාදාසව්‍යථො තණ්හාදාසභාවං ගතො අමුත්තො යෙව තණ්හාය වසෙ වත්තන්ති, යො භික්ඛු අලක්ඛිං නිස්සිරිකං භීමං අනපායිං අනත්ථදං තණ්හං පජහෙය්‍ය, සො භික්ඛු මාරබන්ධනා මුත්තොති මාතුලස්ස ඔවාදං අදාසි. **'තයජ්ජා'**ති තයා අජ්ජ. **'දිස්වා'**ති කත්වත්ථෙ ත්වාපච්චයො. **'පටිවිංසො'**ති අත්තපටිවිංසො. **'උච්ඡිණ්ණං යෙවා'**ති අම්හාකං උච්ඡිණ්ණං යෙව. **'පත්තචීවරමාදසා'**ති හත්ථෙන පත්තං කායෙන චීවරං ගහෙත්වා:—අවසානගාථායං, දෙසෙන්තානං භික්ඛූනං සද්ධම්මන්තෙ නිම්නානං විචිනිය ධම්මං.

සද්ධං ලද්ධා මනුජත්තභාවං ච පුඤ්ඤප්පවත්තිං ච; ලභන්ති, මතිමා බුද්ධෙ සබ්බං විහිතං කත්වා සාධු සුභාවිත ඉතො චුතො මුතිකා වණ්ණනියෙ විමානෙ කිං නරමති,[*] රමතෙවාති අත්ථො; අයං ගාථා වුත්තිසඤ්ඤාවසෙන මන්දක්කන්තා නාම, ඡන්දසඤ්ඤාවසෙන අච්චසී නාම, මභනතතගගවසෙන හි මන්දක්කන්තා, ගරුලහුනියමෙන ච, සත්තරසක්ඛරවසෙන ච අච්චසී, තෙනාහු:-

“අක්ඛරනියමො ඡන්දං ගරුලහුනියමො භවෙ වුත්ති”ති:-

ඉතොපරෙසුපි එසෙව නයො, අයං ගාථා පන ඔසානගාථා, අනුසාසිනීතිපි වත්තුං වට්ටති.

මන්දක්කන්තා මභනතතගා ගො යුගුප්ඵස්සකෙහි.

**මිගපොතකවත්ථුං පඨමං.**

---

දුතියෙ “**හිරඤ්ඤසුවණ්ණාදිනෙකවිභවසමාකිණ්ණභූසසරජ්ජනසමූහසමාකුල**”න්ති හිරඤ්ඤසුවණ්ණමණිමුත්තාවෙළුරියාදි අනෙකසම්පත්තීහි සමාකිණ්ණභූතඉස්සරජනගණෙහි සමාකුලං. ‘**නච්චගීතවාදිතෙහි නිච්චං ජනානන්දන**’න්ති නච්චෙහි චෙව ගීතෙහි ච වාදිතෙහි ච නිච්චං ජනානං මනොනන්දනකරං. ‘**නිරන්තරදන්තකීළාපසුතානෙකජනාකුල**’න්ති සන්තතං දන්තකීළාසු පසුතෙහි අනෙකජනෙහි ආකුලං; ධම්මං සොණ්ඩන්ති කාමෙන්තීති ‘**ධම්මසොණ්ඩා**, ධම්මකාමාති අත්ථො. ‘**භූමිගතාමත්ථකාභිනවරජතකිරීටමිවා**’ති භූමිභාගසඞ්ඛාතාය අඞ්ගනාය වනිතාය මත්ථකෙ අලඞ්කතරජතමකුටමිව. ‘**අනඤ්ඤවිහිතා**’ති අඤ්ඤෙහි විහිතා අහුත්වා. ‘**නිබ්බිසො**’ති විගතවිසො. ‘**කිබ්බිස**’න්ති කටුකවිසං; ඔසානගාථායං. ‘**කිබ්බිසං චාපහාසි**’ති කිබ්බිසං කටුකවිසං පුත්තස්ස අපහාසි. ‘**දිබ්බමනුජ**’න්ති දෙවලොකජඤ්ඤෙව මනුස්සලොකජඤ්ච, අයම්පි ගාථා මන්දක්කන්තා නාම මභනතතගගයුත්තාති.

**ධම්මසොණ්ඩකාසිකාය වත්ථුං දුතියං.**

---

තතියෙ ‘**ඔසරන්ති**’ති සන්නිපතන්ති. ‘**තිණත්ථම්භෙහ**’ති වංසරුක්ඛත්ථම්භෙහ, “තිණලතාන්ත ඔසධයො”ති ආදිසු විය බහිසාරතාලනාලිකෙරවංසාදයො තිණන්ති සඞ්ඛං ගතා. ‘**ඨානොකාස**’න්ති ඨිතොකාසඤ්ඤෙව තිසිතෙනාකාසච. ‘**රොමඤ්චිතතනො**’ති උද්ධග්ගලොමසරීරො. ‘**සප්පා**’ති නීලසප්පා, සිලුත්තොති වදන්තෙව, ඝොරානසප්පාතිපි පාඨො, ඝොරං ආනං විසං අස්සාති ඝොරානො, කණ්හසප්පාති

අත්ථො. 'නිසීදනමංස'න්ති නිසීදනකූටමංසං, ආනිසදමංසන්ති පාඨොපි සුන්දරො. 'එසා ආවුසො විසං මම සාවසෙස'න්ති එසො ආවුසො මම සරීරෙ විසං සාවසෙසං අත්ථි. 'ත'න්ති තං විසසෙසං. 'තස්සා'ති තස්ස භගවතො, කත්තරි සාමිවචනං. 'පක්කාතු'න්ති අපෙතුං විගන්තුං කිං වියාති ආහ. 'ආපො විය පොක්ඛරසම්හා'ති 'අප්පවා'ති පාලියත්ථඤ්ච. 'ධම්මා'ති පාලිධම්මා. 'තරෙවා'ති තරො ඉව මහාපළුවොව. 'මහාගඞ්ගෙ'ති මහොසධොව. 'මච්චුජරපහාණො'ති මච්චුජරාසඞ්ඛාතාමයප්පහාණො. 'සබ්බීතිනාසකො'ති සබ්බුපද්දවනාසාය. 'සබ්බද්දසෙනා'ති සබ්බස්ස තිලොකෙ අත්ථස්ස දනෙන. 'චින්තාමණී භද්දඝටොවා'ති චින්තාමණි විය ච අක්ඛයදිබ්බභත්තාදිපුණ්ණවාපි විය ච. අවසානගාථායං. 'පාපෙසාසං විසමභිභූස'න්ති යො භික්ඛු අභිභූසං අඝං විනාසං පාපෙසි. 'භවන්තා'ති විපල්ලාසො, භවන්තාත්‍යත්ථො. 'දදනී'ති දස්සති. අයම්පි ගාථා මඤ්ඤකකතතා නාම.

කුණ්ඩරජ්ජවාසිත්ථෙරස්ස වත්ථුං තතියං.

---

චතුත්ථෙ 'ගාමන්තසෙනාසන'න්ති ගාමන්තෙ කතසෙනාසනං. 'පිධායා'ති ථකෙත්වා. 'කම්පමානහදයො'ති දයාය කම්පමානහදයො, න උත්‍රස්තතාය. 'න තං සො සරතෙ චොරො'ති මිත්තදුබ්භිතාය තං උපකාරං නසරතෙ. 'චොරෙ'ති චොරෙන. 'අත්තනො ධම්ම'න්ති අත්තනො චාලසභාවං. 'කඞ්ඛන්ති'ති සංසයං කරොන්ති. 'යො සා'ති යො සුනඛො, ඉධ සාසද්දො සුනඛවාචකො ආකාරන්තපුල්ලිඞ්ගො, යථා "යත්ථ සා උපසීතො හොති" ති ච, 'සා ච වාරෙන්ති සූකර''න්ති ච. 'අද්දෙසොවා'ති අදුට්ඨොයෙව, අවසානගාථායං. 'පඨමසමයෙ'ති පඨමවයෙ. 'පඤ්චකාමානුගිද්ධො'ති රූපාදිකෙ පංචකාමගුණෙ අනුගිද්ධො. 'මද'න්ති දප්පං. 'නිභවවිභව'න්ති භවවිභවකරං නිබ්බාණං. අයම්පි ගාථා මඤ්ඤකකන්තා නාම.

ආරඤ්ඤකමහාභයත්ථෙරස්ස වත්ථුං චතුත්ථං.

---

පඤ්චමෙ 'ධනාගමන'න්ති ධනස්සාධිගමනකාරණං. 'චෙතියසඞ්ග'න්ති චෙතියස්ස ධයසඞ්ගං, තං කිර ආජානන්තො කොචි භින්දිතුං නසක්කොති. 'ආසායා'ති ආසායිත්වා. 'විරජ්ජන්ති'ති ගන්ධං යෙව විරජ්ජන්ති, කුණපෙ සුඬු රජ්ජන්තීති යොජනා. 'සංසාරඛාණුකා'ති සංසාරෙ නිඛාතඛාණුසදිසා බාලා. 'රොගභාගිනො'ති භිසක්කා. 'භෙදමුපෙන්ති'ති විභවං විනාසං එන්ති. 'යාති'ති උපගච්ඡති.

**'සම්බුද්ධාගමපොත්ථක'**න්ති සම්බුද්ධවචනලෙඛනපොත්ථකං. ඉසා නගාථායං. **'අමරා'**ති දෙවතායො. **'අකතපුඤ්ඤතා'**ති අකතකල්‍යාණා, ඝොරාපායං ගච්ඡන්තෙවාති සම්බන්ධො. **"ජහථ භජථාපුඤ්ඤඤ්ච පුඤ්ඤානී"**ති අපුඤ්ඤං ජහථ පුඤ්ඤානි භජථ. **'පඤ්ඤා'**ති පඤ්ඤාවන්තා. අයං ගාථාපි මන්දුකකන්තා නාම.

සිරිනාගස්ස වත්ථුං පඨමං.

---

ඡට්ඨෙ **'තාලවත්ථුකනාමකී'**ති තාලවත්ථුකෙ වනෙ. **'සුදස්සනපධානසාලාය'**ති සුදස්සන නාමාය පධානසාලාය. **"යොසො"** ත්‍යාදි ගාථාසු, තිස්ස එසො උපාසකො තවපිතාවා භාතා වා මාතුලො වා න හොති, තව ඤාති සුහදෙ ච දිට්ඨසම්භත්තකො දිට්ඨමිත්තො ච සම්භත්තො දළ්හමිත්තො ච න හොති, තස්ස කොචි උපකාරොපි පුරෙ තයා කතො නත්ථි, සො තං භවන්තං සීලවන්තොති ඤත්වා තුය්හං අත්තභාපණීතසන්තකං භොජනං දස්සති, යදි ත්වං තස්ස මහන්තතරං ආනිසංසං ඉච්ඡසි සරාගො මීයමානොපි මරමානොපි තං භොජනං නභුඤ්ජාහි. **"ඔවදිත්වනෙ"** ත්‍යාදිමහි සො ථෙරො අත්තානං ඔවදිත්වා විපස්සනං වඩ්ඪෙත්වා දුක්ඛක්ඛයං අරහත්තං සච්ඡිකත්වා බුද්ධස්ස සාසනසොභනකො හුත්වා තදා භත්තකිච්චං අකාසීති. **'කරජකාය'**න්ති කරං වුච්චති මාතාපෙත්තිකසම්භවො, තතො ජාතං කරජං, කරජං එව කායො කරජකායො, තං කරජකායං. **'බ්‍රහ්මදෙය්‍ය'**න්ති සෙට්ඨ ආදෙය්‍යං අපුනාදාතියදෙය්‍යං. **'වඩ්ඪමානනගර'**න්ති එවන්නාමකං නගරං. **'දුබ්බුට්ඨිකා'**ති අවුට්ඨිකා. **'ජිනස්සරතො පානීයසට'**න්ති ජාතස්සරතො උදකස්ස පූරං වාපියසටං, ඔසා නගාථායං. **"අවෙජ්ජරම්භා"** ත්‍යාදිසු හො අවෙජ්ජරං කතසුචරිතං පුග්ගලං. **'නිජ්ජරා'**ති ජරාය අභාවෙන නිජ්ජරාති ලද්ධනාමා දෙවතායො, අභිගන්ත්වා මානෙන්ති, අථ තස්ස පුග්ගලස්ස නිජ්ජරා ථුතිමුඛා වණ්ණනං වණ්ණයන්ති, එවං වුත්තනයෙන තුම්හෙ විබුධමනුජා ඤත්වා සුගතිං භජමානා සතතං පුඤ්ඤං කුරුථ, ලොකෙ මා ඛණං න ඛණං තුච්ඡං යාතූති. අයම්පි ගාථා මන්දුකකන්තා නාම.

සබාහිස්සාමච්චස්ස වත්ථුං ඡට්ඨං.

---

සත්තමෙ **'මාතුලරුක්ඛ'**න්ති තන්නාමරුක්ඛං. **'පඤ්චමෙතානුවා,'**ති සඞ්ඛ්‍යායං කත්වා. **'සකිංදෙවා'** ත්‍යාදිගාථාසු සකිං එකවාරමෙව සා සඞ්ගති තං පුග්ගලං පාලෙති, බහුවාරම්පි අසබ්භි සඞ්ගමො න තං පා

ලෙ ති. '**නපාපිකො**'ති කොචි ලාමකො න හොති. '**එව**'න්ති එකන්තෙ
න. "**ජීරන්ති**" ත්‍යාදිසු "**රාජරථා**"ති රාජූනං රථා. '**සුචිත්තා**'ති සුව
ණ්ණකම්මවෙචිත්තියාදීහි සුචිත්තා සුට්ඨුවිචිත්තා ජීරන්ති, සතං සප්පුරිසා
නං තිවිධො සුචරිතධම්මො ජරං න උපෙති, සන්තො හවෙ එකංසෙන
සබ්භි සද්ධිං පවෙදයන්ති, නභඤ්ච සභාවතො පථවිතො ච පථවී සභා
වතො නභතො ච අඤ්ඤමඤ්ඤං අනන්තභූතම්පි දූරෙති ආහු කථය
න්ති, පාරං සමුද්දස්ස සමුද්දපාරස්සාපි තං දූරෙ ආහු. '**මාඝවජ්ජා**'ති
මාඝො අජ්ජාති ඡෙදො. '**බදලතාපණ්ණා**'න්ති බදලීලතාපණ්ණං.
'**දිවසන්තරමපතී**'ති මම ඔතදිවසතො අනන්තරදිවසම්පි. '**චාමරමො
රහත්ථා**'ති මොරපිඤ්ඡවිචිත්‍රචාමරහත්ථා. '**සුරඞ්ගනා**'ති දෙවච්ඡරා.
'**ලයාවියුත්ත**'න්ති තාරාදිලයසංයුත්තං, ලයොති එත්ථ ගායන්තීනං
වීණාදීනං ච පුරාතනදස්සනං. '**සවණාමත**'න්ති සොතස්ස අමතස
දිසං. '**පග්ගය්හ වීණාදිසවංසතන්ති**'ති වීණාදයො පග්ගහෙත්වා.
**නාතික්කමං ගීතිස්සරං සරෙනා**'ති ගීතසරං තන්තිසරෙන අනති
ක්කම්ම. '**ලසන්තියො**'ති ලාලයන්තියො, අයමෙව වා පාඨො, විලා
සෙන්තියොති අත්ථො. '**තං පරිතො සසන්ති**'ති තං භවනං පරිතො
සසන්ති-භෙරිආදයො තුරියභෙදා එව, තත්ථ;–'**භෙරී**'ති මහාභෙරි
යො, දුන්දුභීති වුත්තා. '**මුදිඞ්ගා**'ති මුදිඞ්ගභෙරියො. '**මුරජා**'ති පණවා.
'**ඩෙණ්ඩිමා**'ති මඞ්ගලභෙරී. "**සුසිරාදයො**"ති වංසසංඛාදයො, සුසිරාදි
තුරියගණා අනෙකාව. '**පභස්සරූපා**'ති තුඞ්ගරූපා. '**සොවණ්ණමයා**'ති
සුවණ්ණවිකතිආදයො. * '**වස්සගෙහතා**'ති වස්සකොට්ඨාසගණ
නාය. '**මුනින්දබිම්බාලයසන්තියුත්තො**'ති මුනිනො බිම්බස්ස ආල
යභූතගබ්භාරපන්තියුත්තො. "**විරාජිතො සෙතතමාලකෙහි**"ති සෙත
තමාලකෙහි විහාරො විරාජිතො. '**ඵුල්ලසිතොදකසම්පුණ්ණස
මාකුලානෙකජලාසයෙහී**'ති පංචවණ්ණපදුමපුප්ඵාදිසමුපුල්ලෙහි සී
තොදකසම්පුණ්ණෙහි අනෙකජලාසයෙහි සමාකුලභූතෙහි; පරි
ඛාතලාකසරෙහි යුත්තො විහාරොති සෙසො. "**වීසාධිකෙ**" ත්‍යා
දිසු සමන්තා වීසාධිකෙ සත්තසතෙ ඛ්‍යාමමත්තෙ ඨානෙ පාකාර
ගොපුරකොට්ඨකෙහි පරික්ඛිත්තො, සත්තාධිකෙහි ඡබ්බීසසතෙහි
පරිවෙණපන්තීහි ච දස්සනීයො. '**තස්සිං තදෙකො**'ති තස්මිං විහාරෙ

---

* "සමාරිජඤ්ඤා"ති පාඨො පාලියං අදිස්සමානොපි එත්ථ දිස්සති,
"සමාරිජඤ්ඤා"ති ආලපති, අථවා මාරිස ජඤ්ඤාති වත්තබ්බෙ
ගාථාබන්ධසුඛත්ථං සමාරිජඤ්ඤාති වුත්තං, අත්ථගහණකාලෙ පන මා
රිස ජඤ්ඤාති ගහෙතබ්බං, තත්ථ මාරිසාති ආලපනං, ජඤ්ඤාති යදි
ජානාසීති අජ්ඣාහාරො" ඉටචත්‍රවීකා, වීමංසිත්වා ගහෙතබ්බා.

තාදිසං එකො සමණො අහොසිං. '**අදදිං තතොපි**'ති තතො ච මම පටිවිංසතො සඞ්ඝස්ස උපඩ්ඪභත්තං අදදිං. '**මමිදං පදතං මමිදං වත**'න්ති මම ඉදං එවං දත්තං, මම ඉදං එවං වත්තං. "**සඞ්ඝායෙ**" ච්චාදි මහි සඞ්ඝාය දානෙ දින්නෙ සන්තෙ අප්පම්පි දානං පකතං මහාවිපාකං එව හොති. ඔසානගාථායං, යෙ හො සන්තා කුසලනිරතා ඛෙත්තං පුඤ්ඤක්ඛෙත්තතා ඔලොකෙත්වා අඤ්ඤං අපි දෙය්‍යධම්මබීජං දත්වා අහො එවං අනප්පභොගං ලභන්ති, භොජනෙන එකං කබලම්පි භත්තං ලද්ධාන සුසීලෙ දින්නං තං දානං තස්ස තිදිවමනුජභොගං දත්වා පච්ඡාභාගෙ සිවස්ස ච භාගී අස්සාති. අයම්පි ගාථා මන්දක්කන්තා නාම.

**සමණගාම වත්ථුං සත්තමං.**

---

අත්ථෙ '**ඉස්සර**'න්ති ඉස්සරභාවං. '**තස්සා**'ති තස්මිං දෙවගාමෙ. '**දූරභරණෙනා**'ති දූරං හරිත්වා වුට්ඨානසීලෙන. '**පුරතොකත්වා**'ති පුරෙ චරං කත්වා, පුබ්බඞ්ගමං කත්වා වා. '**නිච්ඡිත**'න්ති නියතං. '**බ්‍රාහ්මණතිස්සචොරභය**'න්ති බ්‍රාහ්මණතිස්සං නාම දාමරිකචොරභයං, සා පන භයස්සුප්පත්ති විත්ථාරතො සමන්තපාසාදිකාය ගහෙතබ්බා. '**විතක්කමාලකො**'ති විතක්කට්ඨානෙ මහාමාළකෙ, තත්ථ කිර භික්ඛූ පාතො වුට්ඨාය සබ්බං කත්තබ්බං වත්තං කත්වා පිණ්ඩපාතවෙලාය උපගන්ත්වා තස්මිං මාළකෙ සන්නිපතිත්වා අජ්ජ මයං කත්ථ පිණ්ඩාය පවිසිස්සාම, අජ්ජ කස්ස සඞ්ගහං කාතුං වට්ටති, අජ්ජ කස්ස සද්ධා තික්ඛා, කස්ස මග්ගඵලූපනිස්සයො පරිපාකං ගතොති. විතක්කෙත්වා තතො තතො අනුරූපං ඤත්වාව ගච්ඡන්ති, තස්මා සො විතක්කමාළකොති පඤ්ඤායිත්ථ. '**කරණ්ඩප්‍රරූපකෙ**'ති නත්තමාලරූපකෙ, 'නත්තමාලොකරණ්ඩෙ ප්‍රාතු,ති පරියායො වුත්තො. '**සංසාරමහාවිදුග්ගෙ**'ති විදුග්ගසංසාරම්භොසෙ. '**ව්‍යාකරෙසී**'ති බ්‍යාකරොසි. '**සොණ**'න්ති සුවණ්ණං. '**ඣාපිත**'න්ති ජාතපක්ඛිත්තං. '**වට්ටෙත්වද**'ති වට්ටෙත්වා අදා. '**බුභුක්ඛිතස්සා**'ති භොත්තුමිච්ඡිතස්ස. '**පරිත්තබීජෙනා**'ති පරිත්තකෙන වපිතබීජෙන. '**යොහතත්වකොප**'න්ති යො කොපං හන්ත්වා, යො හතකොපොතිපි පාඨො, ඔසානගාථායං. '**දත්වානෙක**'න්ති දත්වාන එකං. '**සාතනා**'ති සුනාබස්ස. '**යතිනෙ**,'ති භික්ඛූනං ඉස්සරො අයං ථෙරො. '**තං නො වට්ටසරණං භවතී**'ති තෙ තං දානං මනුස්සාදිකෙ ත සම්බං තස්මිං වට්ට සරණං භවති. අයම්පි ගාථා මන්දක්කන්තා නාම.

**අභයථෙරස්ස වත්ථුං අට්ඨමං.**

---

නවමෙ ‘**මණිපල්ලඞ්කස්ස කාරණා**’ති මණිපල්ලඞ්කස්ස අච්ඡෙදනකාරණා. ‘**පත්තාධොවනසාඛ**’න්ති පත්තාධොවනාමුචනත්ථං සාඛාභඞ්ගං. ‘**රාජායතනරුක්ඛො**’ති ඛීරිකාරුක්ඛො, ‘ඛීරිකා රාජායතන”න්ති පරියායො. ‘**උබ්බිග්ගා**’ති [illegible], අයමෙව වා පාඨො. ‘**සහරුක්ඛෙන සුමනෙනා**’ති ඡත්තමිව මත්ථකෙ ධාරියමානෙන රාජායතනරුක්ඛෙන සුමනෙන දෙවරාජෙන පච්චාසමණෙන. ‘**නභසා**’ති නභසි අයමෙව වා පාඨො. ‘**වුට්ඨිවාතන්ධකාරෙහී**’ති නවගවුඩ්ඪුප්පාදනෙන ච ජලගවාතුප්පාදනෙන ච චතුරන්ධකාරුප්පාදනෙන ච. ‘**දසසතකිරණො වියා**’ති සහස්සරංසි සුරියො විය. ‘**පතීතා**’ති පතීතා හුත්වා. ‘**අද්දූ**’න්ති අද්දංසු. ‘**භුජගෙ**’ති නාගෙ. ‘**ඉමං පාදරහ**’න්ති ඉමම්පි දානං පාදරහං, කාලං ආගමෙථාති යොජනා. ‘**අජ්ජාපී**’ති අජ්ජ අපි. ‘**රතනිදසිතතමාගමි**’න්ති රත්තියං දසීභාවං ආගමිං. ‘**දුග්ගතාපාභතං**’ති දුග්ගතාය මයා පාභතං. ‘**මහානාමිකෙ ඝරෙ**’ති එවනාමකෙ ඝරෙ, තස්ස කිර තීරෙසු තුඞ්ගී සෙභූයෙන පරුළ්හන්ති, තස්මා තාහි සො එවං ලද්ධනාමො. ‘**මුචලින්දවන**’න්ති කච්චිකාරවනං, සො හි රුක්ඛො මුචලානං රුක්ඛානං ඉන්දත්තා මුචලින්දො නාම, තත්ථ පන පුප්ඵගුණගුළභූතං සුපක්කකාරඵලසණ්ඨානං දූරෙ ඨිතස්ස කච්චි තුම්බො කාරපක්කඵලොති චිත්තං ජනෙති, තදුපාදාය කච්චිකාරොත්වෙව පඤ්ඤායිත්ථ, අථවා “නිචුලො මුචලින්දො වා”ති පරියායො, තෙසං වනං, මුචලින්දවනං. ‘**සුබ්බතා**’ති සුන්දරවතා. ‘**ඉතිමත්වානා**’ති ඉති අඤ්ඤාය. ‘**ඛෙත්තගත**’න්ති ඛෙත්තමෙව ගතං ඔතිණ්ණං. ‘**ඡෙජ්ජභෙජ්ජාදිනා**’ති ඡින්දිත්වා භින්දිත්වාති ආදිනා කාරණෙන–‘**මහායාග**’න්ති මහායඤ්ඤං, ඔසානගාථායං. ‘**පඤ්ඤායුපගතම්මනො**’ති පඤ්ඤාසම්පයුත්තචිත්තො. ‘**ආතුම**’න්ති අත්තානං. ‘**කතවදූස**’න්ති පරස්ස දූසං කත්වා (දූතං අදාසි). ‘**පයති**’ති පයාති ගච්ඡති. ‘**සුරතරුසම**’න්ති දෙවානං කප්පරුක්ඛසදිසං; සුරතරූපමන්තිපි පාඨො. ‘**මච්ඡෙරාරි**’න්ති මච්ඡෙරසඞ්ඛාතං සපත්තං. ‘**භවතා**’ති භවන්තා, විපල්ලාසොයං, අයම්පි ගාථා මන්දක්කන්තා නාම.

**නාගාය වත්ථුං නවමං.**

---

දසමෙ ‘**අවමඞ්ගල කොලාහල සද්දෙනා**’ති අවමඞ්ගලභූතෙන තත්ථ තත්ථ ලද්ධියානුලොමෙන කතනිග්ඝොසෙන, යථාහ;–

“යන්දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච
යො චාමනාපො සකුණස්ස සද්දො” ත්‍යාදි.

‘එකං සාරරුක්ඛ’න්ති එකං මහාසාරරුක්ඛං, තිලරුක්ඛන්තිපි. ‘ජල්ලිමුපාදය’න්ති ජල්ලිමත්තං උපාදය; රුක්ඛස්ස හි බහිද්ධා තචො පපටිකා නාම, තදනන්තරං තචො තචපෙග්ගු නාම, අන්තරෙ ජල්ලි නාම. ‘පාණිකා’ති සිතපටගා. ‘පුඤ්ඤවන්ත’න්ති පුඤ්ඤවන්තානං. ‘අජ්ජනනාසා’ති අජ්ජභොගාය. ‘අලඞ්කතා’ති අභිසඞ්ඛරිතා. ‘සඤ්චිත’න්ති සඤ්චයිතං උපචිතං. ‘ලෙඛනසත්ථ’න්ති පොත්ථනිකං. ‘අත්තනො මංසං’ති මය්හං ඌරුමංසං. ‘සම්බලභත්තෙනා’ති සම්බලභත්තෙන. ‘චිරගාමී’ති චිරෙන ආගාමි, ඔසානගාථායං. ‘සද්ධාබල’න්ති සද්ධාය බලවභාවං. ‘ජයම්පතී’ති ජයම්පතිකානං. ‘පුරෙත්ව දානස්සා’ති පුරෙත්වාති වත්තබ්බෙ රස්සං කත්වා වුත්තං, අයං ගාථා වසන්තතිලකා නාම:–

වුත්තා වසන්තතිලකා තභජා ජගා ගො
**වත්තුලපබ්බතස්ස වත්ථුං දසමං.**

## මිගපොතක වග්ගො පඤ්චමො.

---

තස්සවග්ගස්ස උද්දානං.

මිගපොතකො සුතධම්මො කුණ්ඩරජ්ජාරක්ඛකා
සිරිනාගො සද්ධාතිස්සො සම ගාමාභයාපිච
නාගා වත්තුල පබ්බතො ච දසවත්ථුනි පඤ්චමෙ.

**ඉති පරමවිසුද්ධ=සද්ධා=පඤ්චමස්ස මිගපොතක වග්ගස්ස අත්ථවණ්ණනා භූතා මධුරරසවාහිනීටීකා සමත්තා.**

---

ඡට්ඨස්ස උත්තරොලියවග්ගස්ස පඨමවත්ථුම්හි **‘තත්ථ තත්ථ විභූතෙ ධම්මවිනයෙ’**ති තස්මිං තස්මිං පදෙසෙ ආවිභූතෙ විත්ථාරභූතෙ ධම්මෙ ච විනයෙ ච. **‘ගොපාලචෙටකො’**ති ගොපාලභූතො චෙටකො, මනුස්සා හි මන්දදසකෙ බාලදාරකා නාම, කීළාදසකෙ චෙටකා නාම, පිලා චාතිපි වදන්ති, තතො කුමාරා නාම, තතො මජ්ඣිමපුරිසා නාම, තතො වුඩ්ඪා නාම, තතො මහල්ලකා නාම, තතො සයිකා නාම හොන්ති, අභිධානප්පදීපිකායම්පනාහ:–

“දාසො ච චෙටකො පෙස්සො
කිංකාරො පරිචාරිකො”ති:–

පරියායො වුත්තො, තත්ථ ගොපාලචෙටකො ගොපාලදාසොති අත්ථො භවති. **‘කුචෙලො’**ති මලිනවත්ථනිවත්ථො. **‘පාදදුම්දණ්ඩ**

**භඤ්ඤා**'ති මාසාකාරානං කීළාදණ්ඩා පාදපරම්පරාදණ්ඩා විය කතො, පාදදුමං යං ලොකෙ දුද්දණ්ඩන්ති වදන්ති, ගොපාලකානං කිරෙනං ඛිඩ්ඩාචාරිකං, සො තං ගහෙත්වා ගතො, තෙන වුත්තං පාදදුමදණ්ඩගහෙත්වාති. '**පාටිවාසික**'න්ති එකරත්තාතික්කන්තං. '**පිල්ලක**'න්ති තං පිල්ලකං, පිල්ලකං කපණං වරාකං. '**අසක්කත**'න්ති සම්මා අකතං. '**නිද්ධොත**'න්ති සුධොවිතං. '**ඛාරසාහත**'න්ති භස්මෙන ආහතං, 'නිද්ධොතක්ඛාරසාහත'න්ති වා පාඨො, නිද්ධොතං සුධොතං අක්ඛාරසං අම්බිලං පූතිරසං තෙන ආහතං තෙන භුඤ්ජනත්ථාය ආහතං. '**සුඛාපෙතී**'ති තං දාරකං සුඛං පාපයති. '**හත්ථං මොචෙසී**'ති කුම්භතො හත්ථං මොචෙසි. '**එකමුතෙන එකෙන ගණ්හාතී**'ති එකමුතෙන එකස්මිං හත්ථෙ මුත්තමත්තෙන එකෙන ඉතරෙන හත්ථෙන ගණ්හාති. '**න විසං විසන්ති අක්ඛාත**'න්ති අඤ්ඤං විසං න විසන්ති අක්ඛාතං, රඤ්ඤො කොපං විසං වුච්චති. '**රාජකොපානලාදඩ්ඪා**'ති රාජකොපග්ගිනා දඩ්ඪා, "කාලොත්‍යාදිම්හි, "**කාලො**" මච්චු රඤ්ඤො කාරණං හොති වා අථවා රාජා කාලකාරණං මච්චුස්ස කාරණං හොති. '**මාහු නො**'ති අත්‍ර නො මරණසංසයො මාහොතු. '**යං යෙන විත්ත**'න්ති ආදීසු යං විත්තං අනයෙන අධම්මෙන අසමෙන යෙන ජනෙන ලද්ධං, තං විත්තං ලද්ධකස්ස රාජාදිභයං දෙති, දෙවතාපි රාජාදයොපි යෙන කෙනචි විනාසං කාතුං න සක්කොන්ති, අවසානගාථායං. යො දායකො ගුණාධාරජිනත්‍රජානං භික්ඛූනං අප්පම්පි දෙය්‍යවත්ථුං ච සද්ධාය දදාති, සො පෙච්චලොකෙ සංසාරමහාවිදුග්ගෙහ සම්පත්තිසඞ්ඛාතාය නාවාය අත්තානං පතිට්ඨාපෙතීති, අයම්පි ගාථා වසන්තතිලකා නාම.

උත්තරොලිය වත්ථුං පඨමං.

---

දුතියෙ '**දාරපරිග්ගහ**'න්ති දාරගහණං, දාරාභරණං වා. '**කෙවලා**'ති සකලා. '**සුසිද්ධා**'ති උදකස්සාභාවෙන සුසිද්ධා. '**එලිනා**'ති චූල්ලිතමක්ඛිකා. '**ගතා විනාසං ජලජා**'ති නදීආදීසු මච්ඡකච්ඡපාදයො විනාසං ගතා. '**ආරකා**'ති දූරතොව. '**මරීචි**'න්ති මිගතණ්හිකං. '**තොයසන්දිනො**'ති උදකසන්දිනො හුත්වා. '**සිතපණ්ණා**'ති පතිතපණ්ණා. '**වනා**'ති රුක්ඛා. '**භූජකා**'ති පබ්බතං ජාතා. '**චණ්ඩානිලසමාහතා**'ති චණ්ඩෙන වාතෙන සමාහතා. '**ජීවිතාසෙ**'ති ජීවිතාසජ්ජනත්ථාය;-

"මහාසමයො පවනස්මිං දෙවකායා සමාගතා
ආගතම්හ ඉමං ධම්මසමයං දක්ඛිතාය අපරාජිතසඞ්ඝන්ති;-

ආදීසු විය හි තදත්ථෙ ආයෙපච්චයො, ජීවිතාසාතිපි පාඨො, ජීවිතාසාවත්තානි අත්ථො-"**ජම්බුදීපස්සා**'ති උපයොගෙ සාමිවචනං, ජ

ම්බුදීපන්ති අත්ථො. '**වාහසා**'ති කාරණා. '**සඞ්ඝරක්ඛ**'න්ති සභාගපණ්ණං. '**සකිච්චපසුතා**'ති අත්තනො කම්මට්ඨානමනසිකාරාදිකිච්චප්පසුතා. '**නිවාරෙත්වා**'ති නිවාරණං කත්වා, විනාසං කත්වා. '**කුක්කුච්චාසන්නා**'ති අකප්පියසඤ්ඤිනො. '**එකං සක්ඛරපාසාණ**'න්ති එකං සිලාපොතකං. අවසානගාථායං, එකස්ස භික්ඛුස්ස එකවාරං දින්නස්ස ඉදං ඵලං ඉති මන්ත්වා භවන්තා දෙය්‍යධම්මෙ සති තුම්හෙ මහාබොන්තං විචෙය්‍ය සද්ධාය දානං දදථාති යොජනා, අයං ගාථා ඉන්දවජිරා නාම.

“ඉන්දදිකා සා වජිරා ජගා ගො”.

**නිම්බසුමනත්ථෙරස්ස වත්ථුං දුතියං.**

---

තතියෙ '**පවෙධමානගත්තො**'ති පවෙධමානසරීරො. '**පරිගිලිතනලාලො**'ති පරිගිලිතලාලො, අයමෙව වා පාඨො. '**ලභෙය්‍යමඞ්ග**'න්ති ලභෙය්‍යං අඞ්ගන්ති ඡෙදො. '**අසෙනන තු**'ති පච්ඡිමභවෙ පනා කුණ්ඩ'න්ති සාලිසීසං. '**පණ්ණසූපෙනා**'ති සාකසූපෙන. '**බිලඞ්ගදුතියෙනා**'ති කඤ්ජියදුතියෙන. '**ඝතකුම්භම්වා**'ති ඝතපූරිතකුම්භං ච. '**ලොකනායකො**'ති තිලොකස්ස චක්ඛුභූතො. '**භජන්ත**'න්ති විභජන්තගතනං. '**බුභුක්ඛ**' න්ති භොත්තුමිච්ඡිතං. '**දෙවසහබ්‍යත**'න්ති දෙවතාහි සහභාවං. “**මාරොපී**'ති එත්ථ පිසද්දෙන මාරොපි අඤ්ඤෙ කොචි වාතිදං සම්පිණ්ඩෙති. '**තිසම්පද**' න්ති තිවිධසම්පත්තිං, ඔසානගාථායං. '**අච්ඡෙර**'න්ති අච්ඡරියං. '**අබ්භුණාතර**'න්ති * අතිසයෙන අබ්භුතං. '**අබ්බුධො**'ති නබ්බුධො. අයම්පි ගාථා වසන්තතිලකා නාම:–

“වුත්තා වසන්තතිලකා තභජා ජගා ගො.”

**පූවපබ්බතවාසිතිස්සත්ථෙරස්ස වත්ථුං තතියං.**

---

චතුත්ථෙ '**නිගල**'න්ති උද්දාතං. '**ආලක**'න්ති පාකාරං. '**සළලී චලපත්තාදයො**'ති සළලකීරුක්ඛ අස්සත්ථරුක්ඛාදයො †. '**මණිචම්මෙන වම්මිතා**'ති මණිමයචම්මෙන වම්මිතා සූරයොධා විය. '**නෙසජ්ජිකෙකාසනිකා**'ති නෙසජ්ජිකා ච එකාසනිකා ච. '**සූපසෙකං ඵලසඞ්ඛිත**'න්ති සූපසෙකෙන ඵලෙන සජ්ජිතං. '**සාරසාඛ**'න්ති සාරරුක්ඛසාඛං. '**සමණකිච්චං මඤ්ඤකං පාපෙත්වා**'ති පබ්බජිතකිච්චං නිට්ඨං පාපෙත්වා. '**මධුරං සභාව**'න්ති මධුරසභාවවන්තං, පූතං දිස්වා න කස්ස පුග්ගලස්ස චිත්තස්ස පීතිං නකරොති කරොති එවාති සෙ

---

* අභූතපුබ්බං, කත්ථචි. † “සළලකීපලාසපත්තාදයො”ති සළලකීරුක්ඛ කිංසුකරුක්ඛානං පත්තඞ්කුරපල්ලවාදීනි, කත්ථචි.

සො, පූතනත්ති එත්ථ වත්තපටිපත්ති වෙදිතබ්බා. '**ආනුභාවමහන්ත
තා**'ති සා ආනුභාවමහන්තතා. '**එන**'න්ති ඉමිනා යොජෙතබ්බං.
ඔසානගාථා පාකටාව. අයම්පි ගාථා ඉන්දවජිරා නාම.

**චූළතිස්සවත්ථුං චතුත්ථං.**

---

පඨමෙ '**අජ්ජෙවා**'ති අජ්ජෙව. '**කිච්ච**'න්ති කත්තබ්බං. '**ආත
ප්ප**'න්ති පාපස්ස ආතාපනට්ඨෙන ආතප්පන්ති ලද්ධනාමං විරියං. '**සං
ගර**'න්ති කතිකං, අයමෙත්ථ අත්ථො, නො අම්හාකං තෙන මහාසෙ
නෙන මච්චුනාඅජ්ජ වීතිනාමෙහි ඉමස්මිං මාසෙ වා ඉමස්මිං වස්සෙ වා
වීති නාමෙහි, සුවෙ පරමාසෙ වා පරවස්සෙ වා මං ගණ්හාහීති එවමාදි
සංගරං නහි අත්ථීති. '**ඛණෙ**'ති බුද්ධුප්පාදසඞ්ඛාතෙ නවමෙ ඛණෙ.
'**මා උපච්චගා**'ති මා උප්පතිත්වා අතික්කමිත්වා අගා. '**සෙදිතමත්තකාර
පණ්ණිතා**'ති අලොනකෙන විධූපනෙන සෙදිතමත්තෙන කාරරු
ක්ඛපණ්ණෙන. '**වස්සගෙහනා**'ති වස්සගණනාය වාරප්පත්තං.
**සුණ්ඩදෙණ්ණිය**'න්ති සුවණ්ණදෙණියං; අයමෙව වා පාඨො. '**උ
ච්චිතං නොච්චිතං එත**'න්ති එවං ඛම්හනන්තිපි නො ඛම්හනන්තිපි. '**ගර
හා**'ති ගාරය්හභාවතො. '**සාමිකෙන නිබ්බද්ධිත්වා**'ති සාමිකෙන පී
ළෙත්වා. '**ඉමිනා ඛණසමවායෙනා**'ති ඉමිනා බුද්ධුප්පාදඛණසමවා
යෙන. "**කුජ්ඣන්ති**" ත්‍යාදිගාථායං භීමා භුජගා භෙරවා මහාසප්පා
ඝට්ටනපහාරාදිකෙ හෙතුම්හි කාරණෙ ච සති කුජ්ඣන්ති, නාසති; හෙ
තුම්හි කාරණෙ ච අසන්තෙපි නරාධමභුජඞ්ගමා අධම්හීනනරා
කුජ්ඣන්තෙව. '**නරාධමභුජංගමා**'ති හීනනරසඞ්ඛාතා භුජඞ්ගමා.
'**කපිලගාවින**'න්ති කණ්හගාවිනං, ඔසානගාථායං. '**වඩ්ඪෙත්වා
සඛ**'න්ති වත්තබ්බෙ ගාථාබන්ධසුඛත්ථං රස්සං කත්වා "**වඩ්ඪෙත්ව සඛ**"
න්ති වුත්තං. '**වඩ්ඪෙත්වා**'ති වඩ්ඪාපෙත්වා. අයං ගාථා පාදාකුලකං නාම:–

" යමතීතලක්ඛණවිසෙසයුතං
මත්තාසමාදිපාදභිහිතං
අනියත වුත්තපරිමාණසහිතං
පථිතං ජනෙසු පාදාකුලකං."

**තිස්සාය වත්ථුං පඤ්චමං.**

---

ඡට්ඨෙ '**මාලකෙ**'ති බොධිපූජනමාලකෙ, චිත්තකම්මාලකෙ වා. '**මත්ති
කාකම්ම**'න්ති චිත්තකාරකම්මං. '**ගන්ධපඤ්චඞ්ගුලික**'න්ති ගන්ධෙන පඤ්
චඞ්ගුලිරාජිකං. '**කීළනසීලතාය**'ති කෙළිපකතිතාය. '**චක්ඛුසොතාදි
නා**,දිගාථායං රූපසද්දාදිගොචරෙ චක්ඛුසොතද්වාරාදීනි තෙන සබ්බෙ
නකුලපුත්තෙන සදා වාරෙතබ්බානි, ඉන්ද්‍රියසංවරං පාලෙතබ්බන්ති සෙ
සො. '**අනෙසන**'න්ති පුප්ඵදානාදිඑකවීසති අනෙසනං. '**චත්තාරොප
ච්චයෙ**'ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලාන පච්චයෙ. '**යොනිසො**'

ති උපායෙන වා සුඤ්ඤෙන වා. '**සග්ගාපවග්ගසම්පත්ති**'ති මනුස්සසම්පත්තිසග්ගසම්පත්තිනිබ්බානසම්පත්තීති තිස්සො සම්පත්තියො. '**අපූරෙන්තො**'ති වුඩ්ඪිං කත්වා න පූරයන්තො. '**ජවාලාතසමො සො හි**'ති සච්චං සො එවරූපො ජවස්ස දුභතන්තං ගහිතාලාතසමො විඤ්ඤූහි නින්දිතො හොති. '**තාලිම්පිත්වාන මීළ්හෙන**'ති සාසනස්ස විසුකභූතෙන අනාචාරසඞ්ඛාතෙන මීළ්හෙන අනාලිම්පිත්වාව. '**සංසාමෙත්වා,**'ති පටිසාමෙත්වා. "**භාරමකංසු**"ති සාමිකමකංසු. '**දළිද්දං නෙව කාමෙන්ති**'ති දළිද්දං නරං නෙව ඉච්ඡන්ති. '**ධම්මතා**'ති පුරාතනා. "**අකුලීනො**" ච්චාදිගාථායං සො පුග්ගලො අකුලීනොපි භොගී එහා ගවා සබ්බසිප්පානං පභූ චෙ හොති සබ්බෙ මාතාදයො තං උපාසන්ති උපගච්ඡන්ති. '**නිම්මානුසකෙ**'ති නිහතමනුස්සකෙ, සුඤ්ඤෙති අත්ථො. '**පංචසතකරීස**'න්ති එකෙකං කරීසං චතුරම්මතං හොති, අභිධානෙ පන;-

"ධනුපංචසතං කොසො
කරීසං චතුරම්මනන්ති":-

වුත්තං. '**තං තදුපකක**'න්ති තස්මිං කාලෙ තං සස්සං පක්කඵලං (ලාසිතබ්බං.) '**ලාවනා ගහෙත්වා**'ති දාත්තං ගහෙත්වා. '**උදකොලොණිමන්තෙන්තා**'ති ලොණොදකුත්තරිහගමන්තෙන. '**හොළුලෙලාපක**'න්ති සප්පිනා උල්ලොපකං, භත්තන්ති සෙසො. '**ඔරිමපාරිමතිර**'න්ති ඔරිමතො පාරිමතීරං පාරිමතො ඔරිමතීරං. '**ඉතො**' ත්‍යාදිගාථායං ඉතො දිවසතො අධිකං දානං කථං සෙව අහං දස්සාමීති විචාරෙන්තී, සා උපාසිකා දාසිගණෙහි පරිවුතා ගෙහමජ්ඣෙ අච්ඡි. '**බිලගභාජනෙ**'ති කඤ්ජියභාජනෙ. **මච්චුවෙගෙන අද්දිතො**'ති මච්චුබලෙන පීළිතො. '**අජ්ඣාලම්බන්ති**'ති ඔලම්බන්ති අවලම්බන්ති. '**අග්ගයානවිමානාදී**'ති දිබ්බරථවිමානුය්‍යානකප්පරුක්ඛාදි. '**අච්ඡරසනමණ්ඩිතෙ**'ති අනෙකාකාරච්ඡරිය විභූතිවිභූසිතෙ. '**සග්ගං නීයාති**,'ති සග්ගපුරං නීයාති. '**විලාප**'න්ති විපල්ලාසං. '**නිස්සාරෙ**'ති සාරරහිතෙ. '**අසුචි**'න්ති අපවිත්තං. '**කිමිකුලාලය**'න්ති අසීතිකිමිකුලාවාසං *. '**එත්ථෙද**'න්ති එත්ථ ඉදන්ති ඡෙදො. ඔසානගාථායං, පරමචරිතනත්‍යාදිසු තුම්හෙ භවන්තො ධීමන්තානං එතං පරමං චරිතං විදිත්වා දිවිමනුජසුඛං ච නිබ්බුතිං ච පත්ථයන්තා විමලසීලෙ බුද්ධපූජෙතාසු දානං දදථ, තං දානං තුම්හාකං සුරතරුසදිසං දෙවකප්පරුක්ඛසදිසං ආභවග්ගං කාමදං භවිස්සතීති. අයම්පි ගාථා මාලිනී නාම;-

"නනමයයයුතායං මාලිනී භොගිසීහි."

**අරිසාගලනිස්සස්ස වත්ථුං ඡට්ඨං.**

---

* 'ඉත්ථද'න්ති ඉත්ථං ඉදන්ති ඡෙදො, ක්වචි.

සත්තමෙ '**මහානිදාඝෙ**'ති ගිම්හකාලෙ මහාපරිළාහෙ. '**අකාලික**'න්ති කාලරහිතං, තඞ්ඛණෙ විපාකදානසමත්ථං. '**නිධාන**'න්ති සුනිහිතං නිධිභූතං. '**සබ්බලොකවසීකාර**'න්ති සබ්බලොකානං අත්තනාධිකරණභූතං. '**පරමොසධ**'න්ති තං දානං පරමොසධීභූතං. '**කාමදෙද මණිමුත්තමො**'ති සබ්බකාමදදො උත්තමො මණි විය. '**භද්දඝටො**'ති දිබ්බභද්දකලසදිසො. '**සුරපාදප**'න්ති දෙවානං කප්පරුක්ඛපටිභාගං. '**උත්තමාධමමජ්ඣිමෙ**'ති උත්තමෙවා හීනෙවා මජ්ඣිමෙවා '**පුරණො කරෙ**'ති පුබ්බඞ්ගමං කරෙය්‍ය. '**වුය්හමානඵෙනාවලීභඞ්ගමානතුඞ්ගතරඞ්ගමාලං විකිණ්ණජලකණිකාකිණ්ණසමීහිතජලවෙගජනිතනිඝොසසංසොසිත**'න්ති වුය්හමානඵෙනපිණ්ඩාවලිභඞ්ගමානං තුඞ්ගතරඞ්ගමාලං උත්තුඞ්ගාහි වීචිමාලාහි ආකිණ්ණං විකිණ්ණජලකණිකාකිණ්ණං ජලඵුසිකාකිණ්ණං සමීහිතජලවෙගෙහි ජනිතසද්දං කුරුමානං, ඔසානගාථායං. '**සභායෙ**' ත්‍යාදීසු එවං සුජනා විදිත්වා න දානං සධාය දත්වා මහාවිභූතිං පච්චනුභොන්ති, කො අබුද්ධස්සතො දායකස්ස දින්නානං බහුදානං අසෙසයිත්වා නිඛිලමෙව වත්තුං සක්කොති? න සක්කොතෙවාති. අයම්පි ගාථා උපජාති නාම:-

"අනන්තරොදීරිතලක්ඛණා වෙ
පාදවිමිස්සා උපජාතියො තා."

**ගාමදාරිකාය වත්ථුං සත්තමං.**

---

අට්ඨමෙ '**පලාලං චාලෙන්ති**'ති පලාලං මූලෙ ගහෙත්වා පලාලගහණත්ථංවා විරළසස්සස්ස වා අසුද්ධසස්සං සංචාලෙන්ති. '**බලං පුණන්ති**'ති බලං පරිස්සාවෙන්ති. '**රාගානලෙනා**'ති රාගග්ගිනා. '**දොසරක්ඛසපීළිතා**'ති දොසසඞ්ඛාතෙන රක්ඛසෙන පීළිතා. '**මුච්ඡිතා**'ති විසඤ්ඤිතා. '**නාකතං නු**'ති අකතං නුන. '**කිඤ්චි ආයතිකාරණං**'ති යං කිඤ්චි පුඤ්ඤං ආයතිකාරණං, සුඛකාරණං. '**කිච්ඡෙනා**'ති කිච්ඡෙන කසිරෙන. '**සුඛං මය්හං නභතො පඨවී යථා**'ති යථා පඨවි නභතො දූරෙ හොති, එවං මය්හං සුඛං දූරෙ හොති, මය්හන්ති නිස්සක්කෙ සාමිවචනං මයා දූරෙති අත්ථො. '**භණෙ**'ති නවමො භණො. '**කාම**'න්ති එකංසෙන. '**ඉදානි තං න උද්ධරෙ**'ති ඉදානි මම අත්තානං න උද්ධරෙය්‍යං. '**මක්ඛිතං මලමුත්තෙහී**'ති නීයාසාදීහි මලමුත්තෙහි මක්ඛිතං. '**අපවිද්ධ**'න්ති ඡඩ්ඩිතං; ඉදං වුත්තං හොති, මහාරාජ ලොකෙ යං කිඤ්චි පිලොතිකං යෙන කෙනචි මලෙන මක්ඛිතමත්තං මලෙහි අපවිද්ධං ජෙගුච්ඡං ඡඩ්ඩිතං හොති, යථා පන ඉසිද්ධජං අරහන්තධජභූතං කාසාවපිලොතිකං දිස්වා යස්මිං තස්මිං පිලොතිකෙ විය අනාදරො න කරෙය්‍යාසීති. '**එසාසං එසා නත්තනකො රාජා**' ති රාජ

සො අයං ඛණ්ඩකො ඛණ්ඩකො හුත්වා උස්සිතො සො අරහත්තාධි ජොයෙව. 'හත්ථගාමිං කත්වා'ති පරිභොගභාවං කරිත්වා, ඔසාන ගාථායං. "**අහොනුභාව**"ත්‍යාදිසු, කපණාය සුපෙසලස්ස සඞ්ඝස්ස දින්න දානස්ස මහානුභාවං පස්සථ, ධම්මා තස්මා දත්වා භවභොගස මපදං ලද්ධා ආසි හිය්‍යොපි පඤ්චසතවාරං තං පරිදහෙත්වා ඛීණාසව තං ගතා ආසුන්ති. අයම්පි ගාථා උපජාති නාම.

**ධම්මාය වත්ථුං අට්ඨමං.**

---

නවමෙ '**පඨමපකොපකාරණ**'න්ති පඨමතරං පකොපකාරණං සුපහත්තාදිං. '**විලොප**'න්ති විලුම්පිතභොගං, විලොමන්තිපි පාඨො, අනනුලොමිකභණ්ඩන්ති අත්ථො. '**උලෙලාල**'න්ති ආලුළිතං. '**ඉධ පට්ඨ**'න්ති ඉමස්මිං රාජකුලෙ පට්ඨං. '**අවංචයා**'ති සායෙව. '**චරන්ති ඡහි භූතලෙ**'ති "යමාදිචක්ඛුම්මච්චූහි සුවෙරදහනෙහි වා"ති ඉමෙහි ඡහිකාරණෙහි භූතලෙ චරන්ති. '**පුස්සූ පුස්සූරූපෙනා**'ති පුස්සූඅපුස්සූසභාවෙන. '**පභස්සරංදිසි සීතංසු**'ති සීතරංසි දිසි පභස්සරෙන්තො. '**තාරාලි පරිවාරිතො**'ති අට්ඨවීසතිනක්ඛත්තපරිවුතො. '**අදයාපකරො**'ති අදයාපනෙනා නික්කාරුණිකො, අදයො පරෙ නිපිවා පාඨො, පරෙ පුග්ගලෙ අදයොති අත්ථො.'**ධනදානෙන නොසෙති**'ති ධනස්සදානෙන වා තොසෙති. '**අග්ගීව දහතෙ රාජා**'ති දහතෙ රාජා අග්ගිරිව, එකමෙවග්ගීච්චාදිසු සො දුරූපාසිතං දුන්නු උපාගතං නරං එකමෙව අග්ගි දහති, සබ්බං කුලං සබන්ධුං සචරාචරං සපුත්තදාරං සධනං රාජග්ගි දහති, දහතා අග්ගිනා දඩ්ඪකාලතො කෙචි තරවො තිට්ඨන්ති. '**අපරාධිනො**'ති කතාපරාධා. "**දූරෙ**" ච්චාදිසු රාජානො නාම දූරෙ ඨිතාති නාවමන්තබ්බා, රාජානො දීඝබාහුකා දීඝහත්ථා, මහතෙජිනො විය ලොකොපපීළිතං දිසං සහසා දළ්හං ගණ්හන්ති ගහෙත්වා විනාසං පාපෙන්ති. "**පරස්ස හරෙ**"ති චොරෙ. '**පක්ඛපාත**'න්ති අත්තනො පක්ඛපතිතං. '**සපෙම**'න්ති අත්තනි පෙමසහිතං. '**මලයං ගන්ත්වා**'ති මලයදෙසං ගන්ත්වා. '**කිංචිසඞ්ඝං නිස්සාය**'ති කිංචිසඞ්ඝං නාම අම්හාකං ඊතරං නිස්සාය.'**තාසාකවජ්ජපසාදිසා**'ති සුංසුමාරකුම්මසදිසා, උපලක්ඛණමත්තමෙවෙතං වුත්තං, අථවා යෙ කෙචි සත්තාපි භයෙ උප්පන්නෙ පිඨං ජහන්තියෙව. '**නීලවෙල්ලිතධම්මිල්ලා**'ති භද්දෙ ත්වං සුගන්ධවෙල්ලිතනීලකෙසබන්ධා. '**ඵුල්ලපඞ්කජකානනා**'ති විකසිතපදුමසදිසමුඛා.'**නීලායතවිසාලක්ඛා**'ති නීලක්ඛී ආයතක්ඛී විසාලක්ඛී. '**නයනුස්සවා**'ති නයනස්ස උස්සවභූතා. '**හෙමවල්ලීව ලීලායා**'ති චණ්ඩවාතෙරිතහෙමලතොනතඩපවෙධමානගච්ඡලීලාය.'**මනොරමෙ**'ති තං ආලපති.'**සුවාන**'න්ති සුවං ධුවං. '**තතො**'ති තස්මා.'**අජ්ජතනා**'ති අජ්ජආදිං කත්වා. '**කාරණං**

**විසා**'ති යුත්තං විය. '**ධවො**'ති සාමිකො, තෙනාහ අභිධානෙ:-

"ධවො තු සාමිකො භත්තා
කන්තො පති වරො පියො"ති:-

අයං භත්තුපරියායො. '**විධවා**'ති විගතසාමිකා. '**පුත්තී**'ති මිත්තා ධීතරං ආලපති. '**භොගී**'ති වසාහි. '**සාධාභඞ්ග**'න්ති භුඤ්ජිතං සව්‍යඤ්ජනං සාබං. '**පෙලාසා**'ති සාටකපනිධානමඤ්ජූසාය, ඔසානගාථායං. "**දනෙනි**" ත්‍යාදිසු, සන්තා දනෙන තිදිවං වජන්ති, සන්තා නරෙසු මනුස්සෙසු සිරිං දනෙන ලභන්ති, සන්තා සිවං පුරං දනෙන ලභන්ති, තස්මා පණ්ඩිතො ඉති ඤත්වාව දනෙ සතතං සමිතං දදෙය්‍යාති. අයම්පි ගාථා උපජාති නාම.

**කිඤ්චිසඞ්ඛාය වත්ථුං නවමං.**

---

දසමෙ '**චිත්තස්ස අවිසෙසතා**'ති චිත්තස්ස අවිසිට්ඨභාවචින්තනතා' සාමඤ්ඤචින්තනතාත්‍යත්ථො. "**අයං**" ඉච්චාදිගාථාය, යථා ලතා අයං කණ්ටකරුක්ඛොති වා විසරුක්ඛොති වා චන්දනරුක්ඛොති වා නවිසෙසෙති සබ්බමෙව ආරොහති. '**කාමන්ධා**'ති කාමෙන මොහිතචක්ඛුකා. '**වනිතා**'ති ඉත්ථියො. '**ලතාවියා**'ති සබ්බං කණ්ටකාදිභෙදං රුක්ඛං නවිජහන්ති ලතා විය. '**ජඩ්ඩිතපතිතගෙහකුඩ්ඩන්ති**' සාමිකෙන ජඩ්ඩිතගෙහභිත්තිමූලං, සුඤ්ඤාගාරකුඩ්ඩමූලන්ති අත්ථො, සත්තාදිවසං නිරාහාරාති සම්බන්ධො. '**සෙරිචාරී**'ති අත්තනො මනච්ඡන්දෙන මාතාපිතූනං පන ඨෙනත්වා චාරිනී. '**අනුද්ධතො**'ති උද්ධතො න සියා. '**අචපලො**'ති පාපස්ස දප්පවිරහිතො සියා. '**නිපකො**'ති ඨානොචිතාය පඤ්ඤාය සමන්නාගතො. '**පසංස**'න්ති පසංසනං. '**දිබ්බමස ගුළපූවෙ**'ති දිබ්බගුළසහිතපූවෙ. '**මහාපාළිසමගී**'ති එවංනාමකෙ උපස්සයෙ, ඔසානගාථා පාකටාව. අයම්පි ගාථා උපජාති නාම.

**සද්ධාසුමනාය වත්ථුං දසමං.**

**උත්තරොළියවග්ගො ඡට්ඨො.**

---

**තස්ස වග්ගස්ස උද්දානං.**

උත්තරොළිය නම්බසුමනො පූවපබ්බතතිස්සකො
චූළතිස්සො ච තිස්සො ච අරියගලතිස්සකො
ගාමදාරිකා ධම්මා ච කිංචිසඞ්ඛා තථෙවච
සද්ධා සුමනාවත්ථූනන්ති දසවත්ථූනි ඡට්ඨමෙ.

---

ඉති පරමවිසුද්ධ=පෙ=අත්ථවණ්ණනා සාරභූතාජ්ඣස්ස උත්තරොළිය වග්ගස්ස අත්ථවණ්ණනාභූතා මධුරරසවාහිනීටීකා සමත්තා.

සත්තමස්ස සොධවග්ගස්ස පඨමෙ කාකවත්ථුම්හි '**තිස්සවාපිපාළියා**'ති තිස්සවාපිආලියා. '**හෙඨිමමරියාදය**'න්ති හෙඨිමදිසාය මරියාදය. '**මාතුලවිහාර**'න්ති එවංනාමකං විහාරං, තස්මිං කිර මාතුලො උස්සන්නො හොති, තෙනෙතං මාතුලවිහාරන්ති වොහරිංසු. '**චින්තාසමො නත්ථි සරීරසොසනො**'ති ඉදං නාම කරිස්සාමි ඉදං කත්වා ඉදං නාම ලභිස්සාමීති ආදිනා චින්තෙන්ත සමං සරීරසොසනං නත්ථි, තෙනාහ භගවා, "යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං"ති ච "අචින්තිතම්පි භවති චින්තිතම්පි විනස්සතී" ති ච. '**අඩ්ඪකසමානී**'ති අඩ්ඪානගමනසදිසානි. '**නිග්ගිතලජ්ජො**'ති නිග්ගතලජ්ජකො (තණ්හාසමො නත්ථි) තෙනාහ භගවා:–

"තණ්හාය ජායතී සොකො තණ්හාය ජායතී භයං
තණ්හාය විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං"ති.

"**බුද්ධසමො**'ති ජිඝච්ඡාසමො, තෙනාහ භගවා:–

"ජිඝච්ඡා පරමා රොගා සඞ්ඛාරා පරමා දුඛා
එතං ඤත්වා යථාභූතං නිබ්බාණං පරමං සුඛ'න්ති.'

'**එතස්ස සබ්බස්සා**'ති එතස්ස සබ්බස්ස අඝස්ස. "**දනස්ස**" ඉච්චාදිසු ඉමෙ භදන්තා දනස්ස ගුණං ජානන්ති, ජානිත්වා ච පන දනස්ස ඵලංච ආසිංසමානා මම ආහාරං දස්සන්තීති ඉච්චෙව මඤ්ඤමානා ඉධාගතොස්මි. '**කාකරුත**'න්ති කාකසද්දං. '**පිලොතිකා වට්ටෙත්වා**'ති දීපික වට්ටාකාරෙන වට්ටාපෙත්වා. '**තෙලෙන තෙමෙත්වා**'ති තෙලෙන තෙමෙත්වා. '**ජාලං ගණ්හාපෙත්වා**'ති අග්ගිජාලං ගණ්හාපෙත්වා. '**පළුළුකාලෙ**'ති අග්ගිජාලාජටාය දඩ්ඪකාලෙ. '**සො තං භුත්වා සුඛිතො**'ති තස්මිං කිර කාලෙ එස කාකො තං පණීතාහාරො හොති. "**මා ධංකො**" ත්‍යාදිගාථාසු, භන්තෙ අහං තුම්හෙහි එසො මාධංකො ච පලො ඉති වා එසො තිරච්ඡානගතො ඉති වා සදා මඤ්ඤිතබ්බො, අථඛො මම වචනං යුත්තං තුම්හෙහි ඤත්වාව ගාහියං ගහෙතබ්බං, භන්තෙ මීළ්හගූථෙ පතිතං මණි ගහණීයං, තථා කද්දමෙ ජාතං උප්පලං ගහණීයං, ගොරොචනා නාම කාසිලාවිසෙසො, ගොහි චෙව ගහණීයා යස්මා හොති, අථො තස්මා මම සුභාසිතං තුම්හෙහි ගහණීයමෙව, ඔසානගාථායං. "**කතූපකාර**" ත්‍යාද්‍යාදීගාථාසු, භො කාකා පි ථෙරස්ස පිලොතිකදනෙන කතූපකාරං අත්තානං හදයෙ කරොන්තො ථෙරස්ස පුන උපකාරං කරොන්තී, සප්පඤ්ඤා එතං කාරණං හදයෙ කත්වා මිත්තාදුභිනො මා හොථ, කතඤ්ඤුනො හොථාති, අය ළුළි ගාථා උපජාති නාම.

**කාකස්ස වත්ථුං පඨමං.**

දුතියෙ ‘**මිලක්ඛජනපදෙ**’ති මිලක්ඛකානං ගොමංසභක්ඛකාදිජ
නානං නිවාසට්ඨානෙ ජනපදෙ. ‘**පණ්ණසණ්ඨසී**’ති පණ්ණසරුක්ඛසණ්ඨිං. ‘**ම**
**ස්සුරෙ**’ති අග්ගිදිවා. ‘**වසෙ**’ති ඉම වසෙ. ‘**ඉසිකූටක**’න්ති ඉසීයා
සිඞ්ගාරකුටකම්මං. ‘**ඉසිමාය**’න්ති හමුකුක්ඛිපනාදිකං ඉසිමායං
**අවිරොධෙත්වා**’ති අවිරොධෙත්වා, අයමෙව වා පාඨො. ‘**තාපසී**’ති තාප
සිං. “**මනෙනභරිජ**” න්ත්‍යාදිගාථායං යථා යො පුග්ගලො මත්තෙ
හරාජං මත්තවරවාරණරාජං මොහහෙතුනා මක්කටංසුනා නිබන්ධෙ
ය්‍ය, එවං බන්ධනමපි මුහුත්තමෙව නහොති විරසිනිකං ච, තථා,
යො හිසාබූ යොබ්බනකාලෙ රාගමත්තෙහං රාගසංඛාතං වාරණරා
ජං තපොබන්ධනෙන බන්ධති න විරසින්නකං හොති. ‘**නක්ඛ**
**ඤ්ඤද**”න්ති නක්ඛි අඤ්ඤදං. ‘**මධුර**’න්ති සාතං. ‘**භුවී**’ ති පඨවිසං. “**මා**
**මොහෙන විරොධෙථා**”ති ත්වං මොහෙන මා කාමං විරොධෙහි. ‘**විකි**
**ණ්ණපඞ්කජකෙසරම්වා**’ති පදුමකෙසරෙහි විකිණ්ණම්ව. ‘**ථොකෙ**
**නෙවා**’ති අප්පමත්තකෙන එව. ‘**තුලාකොටි**’ති තුලාය උභතො
කොටි. ‘**කොපපසාද**’න්ති කොපන්තං ච පසාදෙන්තං ච (යාති). ‘**චීව**
**රකුටි**’න්ති චීවරච්ඡන්නකුටිං. “**නෙකසතසහස්සෙසු**” ච්චාදිසු යථා
ගඟා උත්තමාධමමජ්ඣිමෙ ජනෙ නෙකසතසහස්සෙසපි නහායන්තෙ
සබ්බදා තිත්තිං නායාති පාහෙවඡති. ‘**තිත්ති**’න්ති පුරිසෙසු තිත්තිං.
“**කුලාකුල**’න්ති කුලීනන්තිපි අකුලීනන්තිපි (නවිඥාතාන්ති) වනිත්
නාම දුප්පූරා, එකා වනිතා එකස්ස පුරිසස්ස භරියා නවිජ්ජතීති, අථ
ඛො සබ්බෙ ලොකෙ උත්තමාධමමජ්ඣිමහීනජන්තුනො අඤ්ඤසා ම
ගෙන ගච්ඡන්ති, අඤ්ඤසං සබ්බෙසං සාධාරණං, එවං ලොකෙ අස
ද්දසුතා පියො චණ්ඩාව සබ්බෙසං සාධාරණා. ‘**සබ්බා භා**’ති සබ්බ
නා පියො, (සබ්බං සකලං පජං සහන්ති.) ‘**අධිකාන**”න්ති පපිකා
නං. ‘**අනන්දනුභොනනාන**’න්ති අනුභොන්තානං ජනානං අන
න්දදායිකා. ‘**කිම්ඵලං යථා**’ති විසරුක්ඛඵලං යථා. ‘**කරොන්තෙකස්ස**
**පෙමන්තා**’ති තා පියො එකස්ස පුරිසස්ස පෙමං කරොන්ති, (පරං
පුරිසං වචසා සඤ්ඤමං කරොන්ති.) ‘**නුජ්ජවල්ලරිදණ්ඩසම්**’න්ති ඔ
නතග්ගහවෙළුසාඛායඩ්ඨියා. ‘**මුඛකාභලෙනා**’ති හෙරි මුඛෙ පහට
සද්දවාවාකරණෙන, මුඛනාලෙනාතිපි පාඨො, තත්ථ නාලෙනාති මුඛ
පපනාරකෙන හෙරිදද්දරිපපහරණෙනාති අත්ථො. ‘**විකාසං අකාසී**,
ති මිච්ඡාචාරසඞ්ඛාතං අසද්ධම්මවිස්සාසං අකාසි. ‘**තෙලකටාහෙ**’ති
පක්කඨිතෙ තෙලකටාහෙ. ‘**ධම්මගාථාකං සතපමාණං කත්වා**’ති
කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපක”න්ති එවමාදිකං
සතං සප්පුරිසානං ධම්මකථාවචනප්පමාණං කත්වා. ‘**අනිසා**
**මෙත්වා න** ඉදච තු මහාරාජ සො අනිසාමෙත්වා යස්ස දෙසං

ආරොපෙත්වා නිග්ගහං කුබ්බති, සො භූපාලො සරභො සත්තාර
බාහිරො අරඤ්ඤෙ මෙණ්ඩො ඉව එළකො ඉව විනස්සති, එත්ථ ච
'අට්ඨාපදෙ චතුපාදස්සරො මෙණ්ඩො'ති එත්ථ විය ඉධ මෙණ්ඩොති
එළකො අධිප්පෙතො. "දීනං චා"ති දලිද්දං ච. "දීඝ ෂොතකිසෙ"
නාති අතිප්පමාණං සන්තානසීලං. "විසයෙසු නිරතො"නාති පඤ්චකාම
ගුණසඞ්ඛාතෙ ආරම්මණෙ අභිරත්තං. "නිකඩ"නාති කාටුකකම්ම
කාරණං. "ඛර"නති චණ්ඩං. 'අද්ධකාර'නති ජමාසිකාදිවෙතනස්ස අද
සිං. "කුසිත"නති චත්තාලීසාය රාජකිච්චෙසු කුසීතං. "ධ්‍යස
නෙ හීරූ"නති ධනාදිබ්‍යසනෙ භීරුතජ්ජිකං. "ධූමකෙතුවා"ති
ධූමකෙතු ඉව පාවකං, සප්පො ඉව අම්භසි ආකාසෙ පක්ඛිත්තානට
බිඤ්ඤ ඉව විස්සන්දති. "රාජධම්මා"ති රඤ්ඤොධම්මා නාම. "සඤ්ඡාර
ඛා"ති සබ්බ පජානං නෙතා රක්ඛා, වුඩ්ඪපඤ්ඤූපසෙවනං ලොක
වොහාරවිඤ්ඤුතාති ච ඉදං චතුබ්බිධං මඞ්ගලං රඤ්ඤො, අත්තනො
පරිපාලනං හොති. "අජ්ඣගත"නාති අකුටිලකරණං. "තෙ"ති
තෙ තිවිධා රාජධම්මා රඤ්ඤො, විභූසනානි හොන්ති, යො භූපති
දීනං දලිද්දං අමිත්තං අපි අත්තනො සරණගතං බ්‍යසනෙසු අනු
ගණ්හාති, සො භූපති වෙ එකංසෙන භූපති නාම හොති, රාජනො
නාම පජානං ධම්මාධම්මතො පාලනා ධම්මිකසමණබ්‍රාහ්මණභරණෙ
න ච දීනානං දලිද්දානං විත්තාදානෙනාති ඉමෙහි තීහි කාරණෙහි
තිදිවං ගතා, මහාරාජ රාගරත්ත පුග්ගලස්ස රාගරක්ඛසො
හදයෙ ඔතිණ්ණො, ඵරුස පුග්ගලස්ස කොධරක්ඛසො හදයෙ
ඔතිණ්ණො, ඉමෙ වෙරක්ඛසාතව හදයෙ සමුට්ඨහන්ති, එතෙ රක්ඛ
සා. "ඛන්තිමෙත්තා" යි ඛන්තිසඞ්ඛාතමෙත්තා. "වාදිසා" ති
අත්තනො ඨානප්පං සඞ්කමනත්ථායච විරියං කුරුමානා වාරෙතබ්බා,
ඛයානුගාථායං, "ඉච්චමතුත"නාති ඉමිනා පකාරෙනපවත්තං. 'සාධු
ධම්මා'ති සාධුපඤ්ඤවා, සතතං නරකොපගාමිං පාපං අකත්වා
සග්ගාපවග්ග සුඛදං කුසලං සතතං කරෙය්‍යාති. අයම්පි ගාථා
වසන්ත තිලකා නාම.

කාකවණ්ණතිස්ස රඤ්ඤො වත්ථුං දුතියං.

---

තතියෙ "අනොපම"නාති උපමාරහිතං. "අඩ්ඪවිධපානමුඛවාස
භූතාන තාම්බූලාදීහී"ති අම්බ ජම්බු ආදීහි අට්ඨපානෙහි ච කප්පූරා
දියුත්තෙහි තාම්බූලාදීහි ච, එත්ථ,මුඛං වාසයති සුරභිකරොතීති-මුඛ
වාසං, කප්පූරාදී. "පුඤ්ඤකම්මුනා"ති පුබ්බෙ කත පුඤ්ඤකම්මෙන.
"පතිසාමිතධඤ්ඤාවියා"ති පටිසාමෙත්වා ඨපිත ධඤ්ඤං විය,
"තසෙසවං" ත්‍යාදි ගාථාසු "තෙසෙසවං"ති තදෙසා එවං. "උසභි
සභෙ"ති සීසස්ස උභපස්සෙ. "ධාමෙකාරෙන සසෙසනා"ති වාම

තො ඉතරෙන පස්සෙන, දක්ඛිණපස්සෙනාති අත්ථො. “සීසච්ඡින්නාසි ධොවන”න්ති සීසච්ඡින්නඅසිං ධොවිත්වා ගහිතඋදකං. “උප්පණ්ඩුප්පණ්ඩුකජාතා”ති පක්කම්බුකඵලම්ව උග්ගතපණ්ඩුවණ්ණජාතා. “ඡඩ්ඩිතනික්කුජ්ජිතනාවාසා”ති ඡඩ්ඩෙත්වා නික්කුජ්ජිතාය නාවුකාය. “වඩ්ඪමානකච්ඡායායා”ති වඩ්ඪන්තියා ඡායාය, සායණ්හකාලෙති අත්ථො. “අසිධොතපානීයෙනා”ති අසිං ධොවිත්වා ගහිත පානීයෙන, “සූර” ඉච්චාදිගාථාසු “මෙරුසාරො”ති මෙරුපබ්බතො විය සාරභූතො. “සොභෙස්සති”ති සොභනං කරිස්සති. “සොකධම්මරාජා”ති ධම්මාසොකරාජ, වුත්තභෙදස්ස විකාරොයං, උත්තරි අප්පරියති අනෙනාති=උත්තරප්පරණං, තස්ස. “සබ්බසෙත”න්ති සබ්බඞ්ගධවලං. “එසො” ඉච්චාදි ගාථාසු “අඩ්ඪුත්තරසහස්ස”න්ති අඩ්ඪාධිකං සහස්සං. “උබ්බත්තා”ති උබ්මුඛපත්තා “උම්මාරෙනා”ති උම්මාරස්ස මජ්ඣෙ. “එකංසං කත්වානා”ති එකෙන විභාගෙන කත්වා, එකතො කත්වාති අත්ථො. “උච්ඡිට්ඨහත්ථ”න්ති භුඤ්ජිත්වා ඡඩ්ඩිත හත්ථං. “විමුඛා”ති පරම්මුඛා. “අද්වෙහකා”ති ද්වෙහරහිතා, අවිපක්ඛාති අත්ථො. “හත්ථස්සථරුසිප්පෙසූ”ති හත්ථිසිප්ප අස්සසිප්ප ඛග්ගසිප්පෙසු. “කතුපාසනො”ති කත උපාසනවන්තො, උපාසනොති චෙත්ථ සිප්පදස්සනං. “ඔරගඞ්ගං”ති ගඞ්ගාය අපාරභාගං. ‘ඉත්ථාලඞ්කාර’න්ති ඉත්ථීනං ආභරණං. “හෙමසඞ්කලිං”ති සුවණ්ණෙහි කතකච්ඡබන්ධනං. “චෙතියමහදිවසෙ”ති චෙතියපූජාකරණදිවසෙ. “මහස්සාගතකිච්චං”ති ආගමනෙ කත්තබ්බං භවිස්සති. “දමිළකචවර”න්ති දමිළසඞ්ඛාතං කචවරසමූහං. “නික්ඛිත්තසරසත්ති තොමර භෙණ්ඩිවාලාදි නානායුධෙහී”ති නික්ඛිත්තෙහි සරාදීහි නානාවිධෙහි ආයුධෙහි; සරන්ති චෙත්ථ වාණං; සත්තීති ආයුධවිසෙසො, තොමරන්ති හත්ථිනං පාදවිජ්ඣනකණ්ටකං; භෙණ්ඩිවාලන්ති භෙදන ඛානපාලනකං හත්ථප්පමාණෙන කතං සත්ථභෙදං. “වෙදනට්ටා”ති වෙදනාය පීළිතො. “ඛග්ගඵලකො”ති ඛග්ගංච සරාදි වාරණඵලකඤ්ච. “ඛග්ගමුග්ගිරිත්වා”ති ඛග්ගං උස්සාපෙත්වා “අවඤ්චයී”ති වාරෙසි. “සහත්ථී”ති හත්ථිසහිතො. “පති”ති පරිපති. “අපච්චොසක්කිත්වා”ති පතිඔසක්කනං අපගමනං අකත්වා. “උප්පණ්ඩසී”ති පරිහවං අකාසි. “උක්කුට්ඨිං අකාසී”ති හත්ථතාලසද්දං අකාසි. “පුඞ්ඛෙනා”ති සරමූලෙන. “තෙළුල්ලොපකභත්තං”ති තෙලෙන උල්ලොපකතභත්තං, ඔසාන ගාථායං:-“සාධිවො”ති භො සප්පුරිසා; විරියන්ති වත්තබ්බෙ වුත්තිවසා දීඝං කත්වා වීරියන්ති වුත්තං. අයං වුත්ති සද්දූල වික්කීළිතා නාම.

දුට්ඨගාමිණී අභයමහාරඤ්ඤො වත්ථුං තතියං.

චතුත්ථෙ "නිබ්බාණමතපාන"න්ති නිබ්බාණසඞ්ඛාතං අමතපානං. **"අඞ්ගාරපක්කසම්භාරපක්ඛිත්තාදිනානාශාකෙහී"**ති අඞ්ගාරපක්ක පාකෙන ච ජීරකාදි සම්භාරපක්ඛිත්තාදීහි නානප්පකාරශාකෙහි ච. "අනූපම"න්ති උපමාරහිතං, අප්පමාණන්ති අත්ථො, ගාථාසු "සග්ගඛණ්ඩංව භාසුර"න්ති සග්ගස්ස කොට්ඨාසං ඉව ඔභාසන්තං. "දමිළා"ති වත්තබ්බෙ වුත්තාභෙදය "දමිළා"ති වුත්තං. "සාසනකණ්ටකෙ"ති සාසනස්ස කණ්ටකසමානෙ; ගාථාසු "සග්ගාපවග්ගසුඛද"න්ති සග්ගසුඛඤ්ච නිබ්බාණසුඛඤ්ච දදන්තං. "සධෙනා"ති සධාවෙන්තෙන. "ජාතකොධසා"ති උප්පන්නකොධෙන. "අන්වහ"න්ති දිනෙ දිනෙ—ඔසාන ගථාසං, කතූපාසනවන්තා මහාවිරියබලසම්පන්නා අභිමානං පහාය ලොකස්ස චෙව සාසනස්ස ච එවං අත්ථං හිතං කරොන්ති, සූරපඤ්ඤව අඤ්ඤෙනාපි පුරිසො තථා කරෙය්‍යාති. අයං ගාථා උපජාති නාම.

## නන්දිමිත්තස්ස වත්ථුං චතුත්ථං.

---

පඤ්චමෙ **"යෙ පොසෙය්‍යා"**ති තෙ සජීවෙ පොසෙන්තා. ත්‍යාදිසු ගාථාසු, 'සත්තෙ සත්තා'ත්‍යාදිසු සත්ත පාණෙ සත්තො ති සඤ්ඤෑව හොති වධකචිත්තඤ්ච හොති උපක්කමො ච හොති තෙන පයොගෙන ජීවිතනාසො චාති සාහත්ථො චතුරඞ්ගිකො එව. "තාඩනඤ්චා"ති පහරනඤ්ච. "නක්කසප්පාදුපද්දව"න්ති නක්කසප්පාදිහි උපද්දවං ලභති, නක්කො වුච්චති සුංසුමාරො. **"සීසක්ඛි කුච්ඡිරොගො ච වණ්ණො කච්ඡුකො කිසො"**ති සීසරොගොති ච අක්ඛිරොගොති ච කුච්ඡිරොගොති ච වණරොගොති ච කච්ඡුකණ්ඩු රොගොති ච කිසරොගොති ච. "රොගාන"න්ති යථාවුත්තා රොගානං. 'විසොගී' ති විසොගසීලො. පරපරිග්ගහභණ්ඩා ච පරපරිග්ගහිතසඤ්ඤිතා ථෙය්‍යාදිසු එකචිත්තඤ්ච ඨානාචාවනමෙව ච පයොගො ච ඉති පඤ්චඞ්ගං අදින්නං සාහත්ථිකං මතං. "ගිලන්තලාලො"ති පරිගලිතබෙලො. "ජිනනාසො"ති ජිණ්ණආසංසො නරො. "අසබ්භං සුතිතාපන"න්ති සුතිතාපනං අසබ්භං හදයන්තාපනං ඵරුසං වාචං භාසන්ති. "නික්ඛිත්තකණ්ඩ"න්ති ආකාසෙ ඛිපිතකණ්ඩං. 'රාජචොරාරිජම්හීතිං'ති රාජජං චොරජං අරිජං භයං. "අග්ගිනාසනිජං භීති'න්ති අග්ගිනා ජාතං ච අසනිජං ච භයං. "පාපරොගො"ති ලාමකරොගො. "විවණ්ණො"ති විපරීතවණ්ණො, කත්ථචි සරීරප්පදෙසෙ කාලො කත්ථචි රත්තො. "විරූපී"ති විපරීත රූපී, උබ්බාමනො වා හොති අධො වාමනො වා උභය වාමනො වා ලකුණ්ඨකො වා ඛුජ්ජො වා ඛඤ්ජො වා.* "විකලඞ්ගො"ති විකලො

---

* විකටඞ්ගා-කත්ථචි,

මකබුයොනමූඛහනුකාදිඅඞ්ගා.'දුද්දසො'ති පියමාතුයාපි දුද්දසිකො පගෙව පරස්ස."වම්මසිම්ගෙතාහී පෙතොවා"ති චම්මනහාරුපරියොනද්ධඅට්ඨි සමන්නාගතො පෙතො ව. "ඊතකං යානි පුම්මාසද"ති ආනඤ්ඤෙර වත්ථුනා දීපෙතබ්බං. "ලද්ධිගුහණචිත්ත"න්ති මුසාලද්ධිගහනචිත්තං. "කාදනුලොමිකා"ති තාය ලද්ධියා අනුලොමිකා. "කණ්ණකඨොරක"න්ති කණ්ණෙ විජ්ඣිතකණ්ටකම්ව කණ්ණෙ විසිත්තසප්පම්ව ච කඨොරං, "තස්ස" තස්සාදිසු අත්තනා යං තං අකතං කම්මං අභාසිතං වාචං අභූතං දෙසසඤ්ඤිතං කම්මං තස්සෙව රූහතෙ අසුචිසුචිකාමෙම අජානන්තා."අසඤ්ඤතො"ති අසඤ්ඤතො. "මහාජලො"ති මහලාලො වදන්තො එකං වදති. "දිගම්බරො"ති උත්තානවුත්තිකො. "නිවවුත්ති"ති හීනවුත්ති."දසකං හජ්ජ"න්ති දසන්නං කාලාවකාදිහත්ථීනං. "සොළසතාලිසුරාපුණ්ණං පිඨ"න්ති සොළසතාලිමත්තස්ස පුණ්ණසරාවකං. "අකම්මසීලො"ති කම්මකරණඅසීලො. 'සම්පසි'ති සුඤ්ඤඅපෙපසිති නිවෙදසි. "පුණ්ණවඩ්ඪනවත්ථානී"ති එවංනාමකානි. "වඩ්ඪමානවජ්ජාය"න්ති අතික්කන්ත මජ්ඣන්තිකාය. "අත්තනො පරිහාරෙන භත්ත"න්ති අත්තනො පටියාදිත භත්තං. "ඛාචිත්වා"ති සාසිත්වා. "ධාරං ඨපෙසි"ති ධාරං සන්නිසිතං පඨපෙසි. "අසිසිඛ"න්ති අය සක්ඛරං—අවසානගාථායං, "විභාසා"ති ඔභාස. "බලවා"ති වචන විපල්ලාසොයං,බලවනෙතාති අත්ථො,අයං ගාථා උපජාති නාම.

සූරනිම්මලස්ස වත්ථුං පඤ්චමං.

---

ඡඨෙ "මහීයමානො"ති පූජියමානො. "කාලගමෙජ"ති තරුණ කාලගමෙජ. "යොබ්බනංඨා"ති යොබ්බනෙ ඨිතො-අවසානගාථායං, "නානාසය"න්ති නානාආසයං,අථවා "නානා"ති නානාවිධෙසි. "මුතිමා"ති පඤ්ඤවා. "කුලීනො"ති මහාකුලො උත්තමකුලා මහාසයො, අයං ගාථා උපජාති නාම.

මහාසොණ වත්ථුං ඡට්ඨං.

---

සත්තමෙ "රුක්ඛෙ ඉම්බරසඤ්ඤිතෙ"ති පාසාණසිලාතං නාම සංපුණ්ණන, අථවා "ඉම්බරසඤ්ඤිතෙ"ති ධාණුසඤ්ඤිතෙ රුක්ඛෙ. "කඳන්තික"න්ති තස්ස ගොධාභයස්ස සන්තිකං. "කාදුපාදසා"ති තං එවං අත්තනා කතං කම්මං උපාදය. "මිගවං"ති මිගවධඤානං. "කොටසුම්බරකඛගෙඩ"ති කොටසුම්බරවනෙ එකස්මිං ඉම්බ

රසඤ්ජිතෙ රුක්ඛක්ඛන්ධෙ. "මයූරපිඤ්ජරම්මා"ති මොරපක්ඛකලාපමිව. "පණ්ණිකා නවෙඡන්නා"ති පණ්ණියා පහරිත්වා. "මහාතිත්ථපට්ටනෙ"ති එවං නාමකෙ පට්ටනෙ. 'ජනදමිළරක්ඛා'ති ජනෙනාති නාමෙන දමිළරක්ඛා. "චතුජාතිගන්ධෙනා"ති කුඞ්කුමං යවනපුප්ඵං තගරං තුරුක්ඛොති එවං වුත්තෙන චතුජාතිගන්ධෙන. "මාලති භූමිකාචම්පකාදි කුසුමානී"ති වනමාලික වස්සිකී චම්පකාදීනි. * "තාඩඞ්ක හාරක කටක කණ්ණපූරාදී"ති තාඩඞ්කං වුච්චති කෙසාලඞ්කාරමාලාලඞ්කාරං, හාරකං වුච්චති මණිමුත්තාහාරං, කටකං වුච්චති හත්ථපාදවලයාලඞ්කාරං, කණ්ණපූරං නාම කණ්ණෙසු පූරකාලඞ්කාරං, යං ලොකෙ කුණ්ඩලොති වොහරන්ති, ආදිසද්දෙන චෙත්ථ මුඛපුල්ලවටංසකෙ ගීවගමෙඛලාදීනි සඞ්ගණ්හාති. "සුවණ්ණවිත්ථ"න්ති සුවණ්ණසරාවකං. "නිකෙතම්ව"ති දෙවවිමානම්ව. "සටවාපිකොලම්බාදයො"ති සට්ටමහාචාටි චූලදොණිආදයො උපදංසෙති සුරායසජ්ජිතභෙබ. "ආමොද"න්ති ආමොදමානං. "මුඛතුග්ගතසෙතඵෙණ පරිවත්තිත විරූපනයනා"ති මුඛතො උග්ගතසෙතඵෙණසහිතා ලාලාමෙව හෙට්ඨුප්පරි පරිවත්තිත විහත නයනා හුත්වා. "අරෙ"ති අනාදරාලපනමෙතං. "දසමහාචොරයක්ඛා සිඞ්ඝිතචෙටකා"ති ඉමෙ අනෙකා සවසෙන ආලපනපදානි. "වාමපාදෙන පොථිතො"ති එවං පොථිතො තව දෙහතො හසමං සියා. "පොරිස"න්ති පුරිසාකාරං පුරිසවායාමං. "දිස්සමානො ත්වමාගච්ඡා"ති මා අනුමත්තම්පි ඔක්කමිත්වා ගච්ඡාති, ත්වං ආගච්ඡාති ඡෙදො. "කරොමසෙ"ති කරොම, සෙ කාරො නිපාතමත්තො, කරමසෙති වා පාඨො. "භීමලොචනො"ති භෙසම්චක්ඛු. "නදම්බාලසිගාලො"ති භීතජම්බො ජරසිගාලො කුන්නාදං භීරුදං සිගාලවස්සිතං නදන්තො කෙසරසීහො. "කන්දජෙස්සති"ති යක්ඛා මෙ හසන්තීති යොජනා. "මමාගතො"ති මං ආගතො මම සන්තිකං ආගතො ච. "විදූං"ති ආනුකාඵෙන්ති. "මාතුවඡගජ්ජනංගජ්ජා"ති ත්වං තුච්ඡං ගජ්ජනං විකප්පනං මා ගජ්ජාසිපි කාතෙඑ. "විපලලපිලලකා"ති පපඤ්ච මාවිලප. "සසඞ්ඛාපො"ති තරුණසසො. "සුඛෙ" ති සඟාමෙ, ඛග්ගම්ග වියාණෙන වා පරිත්තවජිරෙන වා මෙරුං හනන්ති, මෙරු පන ඛග්ගම්ග විසාණපරිත්ත වජිරානං කිඤ්චි කාතුමෙව නසක්කොති, තව දෙහබලං මම එකඞ්ගුලිපබ්බතො සමුට්ඨිතෙන බලෙන විලයං යාති. "එහජ්ජා"ති එහි අජ්ජ. "යුජ්ඣිදනී"ති ඉදානි යුජ්ඣාහි. "යදාගච්ඡා"ති යදි ආගච්ඡාසි, ත්වං යදි පුරිසොති සම්බන්ධො. "සත්තමවාසරෙ"ති සත්තමදිවසෙ. "දික්ඛතී"ති පස්සති. "ජයාජය"

* තාඩඞ්ක පාදඞ්ගුලි කනකකටකනූපුරාදීති=මුද්‍රිත රසවාහිනියං.

න්ති තව මම ජයං වා පරාජයං වා. “සාපතෙය්‍ය”න්ති සපතිස්ස ඉදං සාපතෙය්‍යං, සත්තූනං පඤ්ඤායතීති අත්‍ථො, හිරඤ්ඤසුවණ්ණාදීනං ධනානමෙතං අධිවචනං, තව සාපතෙය්‍යං ඉදං පුත්තස්ස, ඉදං දාරාදීනං ඉදඤ්චිදඤ්ච අසුකස්සාති එවං සාපතෙය්‍යං විචාරෙත්වා. “පරලොකවිධි”න්ති පරලොකගාමිමග්ගකරං පුඤ්ඤං. “යුද්ධාසාගමනං වර”න්ති තව යුද්ධාය ආගමනං වරතරමෙව හොති. “ආයොගවත්‍ථෙනා”ති ආයොගභූතෙන වත්‍ථෙන. “අව්හයතී”ති පක්කොසති. “සෙනං ඉම”න්ති සෙ ජනා තව ඉමං කාරණං. “මඤ්ඤාමහෙ”ති හො ගොඨසිම්බර මයං මඤ්ඤාම. “සමානජාතීහී”ති තව සමානජාතීහි මනුස්සෙහි යුද්ධං තෙ තව සදිසං සදූ හොති. කදලෙරණ්ඩ”න්ති කදලිදණ්ඩකඤ්ච එරණ්ඩදණ්ඩඤ්ච. “ජුම්හතී”ති විලපති, සො මාණවො සාරං ඛදිරවනං තජ්ජිම්හතෙ නරම්භතෙ බුද්බුදාවාටනදීවාපි සොසෙන්තොපි අයං දිවාකරො රම්මිහන්තං චතුරාසීතියොජනසහස්සගම්භීරං සමුද්දං නිම්මුජ්ජිත්වා තාපෙතුම්පි න සක්කොති, මක්ඛවසුතානාති ජිඤ්ඤං චාලයං චාලයන්තො ධංසෙන්තො. “බාලපල්ලවෙ”ති තරුණපල්ලවානි. “වායමානානිලො”ති වායමානොපි වාතො මෙරුං චතුරාසීතියොජනසහස්සුග්ගතං අචලරාජානං කම්පිතුං නෙව සක්කොති. *“බලවප්පරෙ”ති බලවෙ අපරෙ පුග්ගලෙ. “පොථයම්භුජෙ”ති උභොභුජෙ පොථයන්තො. “මාගච්ඡා”ති මා ආගච්ඡාහි. “මතොවියා”ති මරන්තො විය, මත්තොති වා පාඨො සුරාමදමත්තො වියාතිඅත්‍ථො. “කොසබ්භන්තරෙ”ති පඤ්චධනුසතිකෙ පදෙසෙ. “ජයභෙරිනාදසංගතදිසාමුඛො”ති ජයමංගලභෙරිනො දණ්ඩෙන පහටදිසාභිමුඛො හුත්වා, තස්ස කිර මංගලමහුස්සවපෙක්ඛා පුරොධා භෙරිතලෙ දණ්ඩෙන පහටක්ඛණෙ ගන්තබ්බන්ති ආහංසු, සො තෙන සඤ්ඤාණෙන උට්ඨහිත්වා දිසාභිමුඛො ගච්ඡති, තෙන වුත්තං, ‘ජය:පෙ:මුඛො’ති, ඉදං කිරස්ස පබ්බජිත්වා අරහත්තප්පත්තස්ස පුබ්බනිමිත්තං. ‘ජිනතපපාත’න්ති පබ්බතදද්දරං. “සංගාමසොණ්ඩා”ති සංගාමෙ සූරයොධා. “පරාභිභූ”ති පරසත්තෙ අභිභූය්‍ය. ‘රුද්දස්සා’ති කක්ඛලස්ස. “සිර”න්ති සීසං, අයමෙව වා පාඨො. “විනාසයි”න්ති විනාසයන්තො. ‘තතො’ති අහං යතො කාලතො අග්ගඵලංඅනුප්පත්තො තතො මයා අග්ගමග්ගා සිතානකිලෙස සීසං ච අනාසයං කත්වා විනාසයිංති-ඔසානගාථායං, “විචෙය්‍යදාන”න්ති ඛෙත්තං විචිනිත්වා දින්නදානං. “අනෙන”ති පච්ඡිම භවෙ. “එව”න්ති ඉමිනා පකාරෙන, අසංගාථා වසන්තතිලකා නාම.

ගොඨසිම්බරස්ස වත්‍ථුං සත්තමං.

---

* බලවංපුරෙ-මුද්දිත රසවාහිනියං.

අට්ඨමෙ "කෙචී"ති සහස්සවත්ථුං ආදිං කත්වා. "ථෙරා"ති ධම්මදින්නත්ථෙරාදයො ආචරියා. "කීළාගොළකෙ වියා"ති කීළන්තානං ගුළකකීළාභණ්ඩම්ව. "ගදමකාරයී"ති ගදංවුච්චති චතුස්සර මුග්ගරං තං තස්ස කාරෙසි, පරං පහරණගදූති ආදිසු විය ආයුධ විසෙසො වා, තං කිර මහන්තං පඤ්චහත්ථවිත්ථතං සත්තහත්ථායාමතාය. "සො"ති සො කුමාරො, තාය ගදාය ආගච්ඡ ආහන්ත්වා පහරිත්වා ඛණ්ඩාඛණ්ඩිකං කත්වා. "අඞ්ගුලියො පවිඨානා"ති ඛීණඞ්ගුලිපඨිතං රාජිඨානං. "ආරාධෙසු"න්ති ආයාචිංසු. "සංසඤ්ඤෙන්තා"ති කථෙන්තා. "සද්ධාදරා"ති සද්ධාආදරෙන. "කොබුද්ධො"ති කො පණ්ඩිතජාතිකො නරො, රත්තියං චරන්තො දිවෙපි ආචාමෙ දිවා චරන්තො පතියස්සති. "පස්සමන්ත"න්ති අත්තානං පස්සන්තා ජානන්ති බහුස්සුතං ජානන්ති, ඉධ ලොකෙ පන එකන්තෙන තං එවං භූතං පුග්ගලො නික්කාරුණො වතායං පුරිසොති ජානන්ති. "අවජ්ඣනචීවරා"ති තෙහි අවජ්ඣිත්වා ගහිතචීවරා. "හීනා"ති උත්‍රස්තචිත්තා. "වනංව දහනා"ති වනම්ව දහනා අග්ගිනා. "නිඛිලං සීහලං ඉදං"න්ති ඉදං සකලං සීහලදීපං. "දමිළග්ගිනා"ති දමිළසඞ්ඛාතෙන අග්ගිනා. "කොචිනං"ති කොචි පුග්ගලො තං දමිළග්ගිනා නිබ්බාපෙති. "පගුනා"ති තුම්හාදිසෙන ඉස්සරෙන. "සමෙතු"න්ති සමං උපසමං එතුං යාතුං උපසමෙතුන්ත්‍යත්ථො. "ලද්ධං"න්ති පත්තං තස්මිං පන අත්තභාවෙ දීපඞ්කර සත්ථුනො පාදෙ අරහත්තමග්ගඵලං පත්තුං සක්කුණෙය්‍යත්තා ලද්ධං. "නිබ්බාණ"න්ති අරහත්තඵලමධිප්පෙතං, තෙනාහ:-

"සක්කා ගහෙතුම්පි භවස්සපාරං
සන්තොසු කාරුඤ්ඤතරභාවතො"ති.

"උපසම්බාජෙත්වා"ති ගිහීභාවං පාපෙත්වා. "උපඨානං කරොන්තො"ති මහන්තෙන උපකාරෙන උපකාරං කරොන්තො-අවසාන ගාථායං, "දයාලවො"ති දයාලුකා. "කිත්ති"න්ති කිත්තිසද්දං. "පරත්ථචරණා දිසි නඤ්ඤඤ යන්ති"ති ආදි පඨමමෙව පරත්ථචරණහෙතුතා කිත්තිං යන්ති, පච්ඡා සිවඤ්ච යන්ති, වො තුම්හෙ ඵාමවිභවං සක්කිත්තිං යදි ලබ්ධාන. "කප්පඨිති"න්ති ආයුකප්පඨිතිකං. "කත්ථපරත්ථමෙවා"ති අත්තත්ථපරත්ථං එවං කුරුථ, අයං ගාථා වසන්තතිලකා නාම.

ථෙරපුත්තාභයස්ස වත්ථුං අට්ඨමං

---

නවමෙ "මිගගොකණ්ණසූකරෙ"ති කම්මායත්තකථාපාඨෙ "අට්ඨවීසතියුද්ධෙසූ"ති විජිතනගරාදීසු අට්ඨවීසතියා යුද්ධභූමීසු,

අවසාන ගාථායං-වො තුම්හෙ සුධීමා එවං කුසලං කත්වා මනො රමෙසු තිදිවෙසු ගන්ත්වා ඉධපජාතො එවං බහලෙන උපෙතො අයං භරණො හොතීති මන්ත්වා තථාවිධෙ කුසලෙ සචිත්තං රමෙථ රමාපෙථාති යොජනා, අයං ගාථා උපජාති නාම·

භරණස්ස වත්ථුං නවමං

---

දසමෙ "මහා මහින්දත්ථෙරෙන ලංකායං සද්ධම්ම පතිට්ඨාපිතෙ" ති භගවතො පරිනිබ්බාණතො ඡත්තිංසාධිකෙ ද්විසතෙ වස්ස මතික්කන්තෙ අසොක ධම්මරඤ්ඤො, පුත්තභූතෙන ථෙරෙන ධම්ම විතය ලංකායං පතිට්ඨාපිතෙ. "පණ්ණාකාරපූරස්සරා" ති පණ්ණාකාරපෙසනස්ස මඞ්ගලස්සරං නිච්ඡරන්තො, පණ්ණාකාරහාරකාති ඉකෙචි. "මහන්තං භෙසාරව" න්ති මහන්තං භෙසිතසද්දං. "මධලෙ ධාවන්තො" ති පරිවට්ටාහාරෙන ධාවන්තො. "උත්තරියං මොචෙතී" ති නිවාසනත්ථං මොචෙති. "පටිපාදෙසී" ති නිවෙදෙසි. "වස්සාභාරොව පිඤ්ඡ" න්ති වස්සාභාරො ඉව පිඤ්ඡස්ස ඡෙදෙ. "අනාදරො" ති සො අනාදරො හුත්වා. "උත්තරිසංබන්ධිත්වා" ති හෙට්ඨා අත්තනො ගීවායං උත්තරියං බන්ධිත්වා පලිවෙඨෙතීති අත්ථො. "හෙට්ඨාවුත්තනයෙනෙවා" ති හෙට්ඨා ජම්බුදීප වත්ථුස්මිං වුත්තනයෙන එව. "දෙහල" න්ති වෙහලානී දෙහලං, විත්ථාරතො පනස්ස දෙහලො මහාවංසෙ වුත්තනයෙන ගහෙතබ්බො, අවසාන ගාථායං-එවංවිධං සග්ගසිරී ච මනුස්සසිරී ච ඨාමං ච යසං පාපාභිරතස්ස නහොති තස්මා තුම්හෙ සග්ගසු පවත්තං සිරිං සරන්තා අප්පමත්තා හුත්වා සුචරිතං චරථ, අයං ගාථා උපජාති නාම.

වෙළුසුමනස්ස වත්ථුං දසමං.

---

යොධවග්ගො සත්තමො.

තස්සුද්දානං

කාකො කාකවණ්ණො ච දුට්ඨගාමිනී නන්දිකො
සුරනිම්මලො මහාසොණො අථොපි ගොඨසිම්බරො
ථෙරපුත්තාභයො භරණො වෙළුසුමණොති තෙදසාති.

ඉතිපඨම=පෙ=සමත්තා.

---

අට්ඨමවග්ගස්ස පඨමෙ "උක්ඛිත්තසීසො" ති උත්‍රසිතෙ ධාවන්තො. "එරුකිම්පසු" ති එරුසුනා කත්තබ්බසිප්පෙසු නච්ඡකාරණ්නත්ථො.-අවසානගාථායං, "ආකාසංගත" න්ති විත්ථාරගතට්ඨානං වු

ඨානගතං වා. '**ධනසහායකම්මභජථා**'ති ධනසඞ්ඛාතං සුහදං භජථ. '**දිබ්බමග්ගපදං**'න්ති සිවභූතං මග්ගපදං. '**අගදං**'න්ති උත්තමොසධභූතං. '**සද්ධිං චර**'න්ති ඡායාව අනපායිනා සද්ධිං චරන්තං, තෙනාහ භගවා:— "ඡායාව අනපායිනීති, යො අනුගාමිකොති ච", අයං ගාථා සද්දූලවික්කීළිතා නාම.

**ඛජ්ජදෙවස්ස වත්ථුං පඨමං.**

———

දුතියෙ '**අය්‍යකපය්‍යකාදිනා**'න්ති එත්ථ මාතාපිතූනං මාතාපිතරො අය්‍යකා නාම, තෙසං මාතාපිතරො පය්‍යකා නාම, අය්‍යකා ච පය්‍යකා ච=අය්‍යකපය්‍යකා, තෙ ආදි යෙසං මාතුලාදීනං තෙ හොන්ති= අය්‍යකපය්‍යකාදයො, තෙසං. '**ඵුස්සනක්ඛත්තෙන ජාතභාවෙනා**'ති ඵුස්සනක්ඛත්තයොගවසෙන ඵුස්සපුණ්ණමිදිවසෙ ජාතත්තා. '**පලවඞ්ගමවිහඞ්ගමාදයො**'ති* පලවෙන රුක්ඛගෙහ ගච්ඡන්තීති=පලවඞ්ගමා මක්කටා, විහෙ ආකාසෙ ගච්ඡන්තීති=විහඞ්ගමා,සකුණා, තෙ ආදයො යෙසං තෙ පලවඞ්ගමවිහඞ්ගමාදයො. '**සද්දවෙධීවාලවෙධිවිජ්ජුවෙධී**'ති එත්ථ සද්දෙන වෙධතීති= සද්දවෙධී, අයං හි සත්තානං වාචානිච්ඡාරසද්දෙන විජ්ඣිතුං සක්කොති, දූරෙ ඨිතං වාලං වෙධතීති= වාලවෙධී,විජ්ජන්තරෙ වෙධතීති=විජ්ජුවෙධී, දූරෙ ඨිතං නිබ්බසනපටලසඤ්ඡන්නය වාලං වෙධෙතුං සක්කොති. '**හත්ථස්සථරුසිප්ප**'න්ති හත්ථිසිප්පඅස්සසිප්පථරුසිප්පං. '**බද්ධචම්මසත**'න්ති සතපටලචම්මකසඞ්ඝාටං. '**අසනොදුම්බරමය**'න්ති අසනරුක්ඛවිකති උදුම්බරරුක්ඛවිකති. '**අඩ්ඪසොළසඅඞ්ගුල**'න්ති අඩ්ඪසොළසඅඞ්ගුලබහලං. '**නිබ්බෙධසති**'ති නිවිජ්ඣිස්සති. '**අට්ඨුසභ**'න්ති අසීතිහත්ථිකවිසතිබ්‍යාමමත්තං ඨානං. '**සොතපුටපාටනසමත්ථ**'න්ති කණ්ණපුටපාටනසමත්ථං:—අවසානගාථායං, '**භවවිභව**'න්ති භවෙසු විභවං. '**ඛිඩ්ඩාලස්‍ය**'න්ති ආලසියං හිත්වා, අයං ගාථා සද්දරා නාම.

**ඵුස්සදෙවස්ස වත්ථුං දුතියං.**

———

තතියෙ '**මධට**'න්ති නිද්දලං. '**ආරොහපරිණාහවා**'ති ආරොහො

---

* 'පලවඞ්ගමාදයො'ති මුද්දිත රසවාහිනියං.

වුච්චති උභෙවා,තෙන තිරියො වාමනො පටිසෙධිතො, පරිනාහො නාම ආවට්ටකො, ආරොහො ච පරිනාහොති ච සොභනො අස්සාති=ආරොහ පරිනාහවා, උභයෙන වත්තාරො දොසෙ පටිසෙධෙති. **‘අනින්දිතඞ්ගපච්චඞ්ගා’**ති අඞ්ගා වුච්චති ඡබ්බිධඞ්ගා, තෙනාහු:—

‘‘ජඞ්ඝා බාහුසිරො මජ්ඣං
ඡලඞ්ගමිදමුච්චතෙ’’ති

පච්චඞ්ගා වුච්චති කණ්ණනාසිකාදිඅඞ්ගා, තෙනාහු:–‘‘පච්චඞ්ගා කණ්ණචූළාඵලිඞ්ගකුලීරකාදික’’න්ති, අඞ්ගා ච පච්චඞ්ගා ච අඞ්ගපච්චඞ්ගා, අනින්දිතා අඞ්ගපච්චඞ්ගා යස්ස සො=අනින්දිතඞ්ගපච්චඞ්ගා. **‘කෙසාස්සා’**ති කෙසා අස්ස. **‘අග්ගවෙල්ලිතා’**ති ඝණගවෙල්ලිතා. **‘සම්පහඪ’**න්ති සුට්ඨුපහංසිතං. **‘ඵුල්ලංකොකාසසාදිස’**න්ති සුඵුල්ලිතකොකනදසදිසං. **‘දීපසිඛාභා’**ති දීපසිඛාසදිසා. **‘ගන්ධිවදලාකාරා’**ති නීලරුක්ඛපුප්ඵපත්තසදිසා. **‘අස්සා’‘සුමධරාරුණා’**ති අස්සා අධරාරුණා ආසුං, අධරා හෙට්ඨිම හනුකා වුච්චති. **‘දන්තාස්සා’‘සුං සාමා විවරා’’**ති අස්සා දන්තා සාමා චෙව විවරා ආසුං, අථස්ස සමා විරලාතිපි වදන්ති, අස්සා දන්තා අවිරලා ආසුන්ති අත්ථො, කෙචි පන දන්තස්සාසමා විරලාති පඨන්ති. **‘දිත්තමුත්තා’‘ලිසන්නිභා’**ති පජ්ජලිතමුත්තාදාමපන්තිසදිසා. **‘භාසුරා’**ති භාසතෙති= භාසුරා,සද්දුරම්මණගහණසමත්ථාති අත්ථො. **‘හෙමලතාකාරා’**ති හෙමලතිගුම්බාකාරා. **‘රතනපල්ලවලඞ්කතා’**ති රතනෙහි පල්ලවෙහි අලඞ්කතා. **‘හෙමලතාකාරා’**ති සම්බන්ධො. **‘හෙමබිම්බනිභ’**න්ති චන්දබිම්බසදිසං. **‘ඌරූ කරිකරාකාරා’**ති මෙ ඌරූ හත්ථිසොණ්ඩාකාරා. **‘පීවරා’**ති චිත්තං ඌරූනං අන්තරෙ පීවරා. **‘අනුපුබ්බසො’**ති අනුපුබ්බෙන විත්ථාරා එතෙන ඌරූනං ආසන්නම්ච සම්පන්නාතං දස්සෙති. **‘මිගජඞ්ඝාවා’**ති එනිජඞ්ඝාවිව. **‘ගුළ්ඵගොපඵකා’**ති ගුළ්ඵසණ්ඨානගොපඵකා. **‘කුම්මුන්නතා’**ති කුම්මපිට්ඨිරිවානුපුබ්බුන්නතා. **‘වට්ටුලඞ්ගුලා’**ති වීසතිඅඞ්ගුලියො ආසන්නම්ච අනුපුබ්බුන්නතා.**‘කමලා’**ති රත්තකමලාභා. **‘තලුණා’**ති මුදුකා, තරුණකමලාරිවාභා. **‘මහාවාපි’**න්ති මහන්තං උදකවාපිකං. **‘උදකවාරගාම’**න්ති එවංනාමකං පදෙසං, ඔසානගාථායං:– **‘සුගතොරසාන’**න්ති බුද්ධපුත්තානං, ‘පාලෙත්වා’ති වත්තබ්බෙ ගාථාබන්ධසුඛත්ථං පාලෙත්වඉති රස්සවසෙන ලිඛන්ති, යථා ‘‘භියොං බන්ධිත්වවාමනො’’ති ආදිසු, අයං ගාථා උපජාති නාම.

**ලඞ්ගියවසභස්ස වත්ථුං නිට්ඨිතං.**

චතුත්ථෙ **'සොපකරණ'**න්ති උපකරණසහිතං, සපරික්ඛාරං වා. **'කාලවල්ලියො'**ති ලතාවල්ලියො. **'මහන්තං නාටක'**න්ති මහන්තං භූමිකං මහාථලං වා. **'උබ්භිතු'**න්ති උච්චාලිතුං. **'වට්ටපාසාණ'**න්ති ආමලවට්ටසිලං. **'තස්සා'**ති තස්මිං ලතානිකායෙ. **අභණතො'**ති පඨවිතලෙ. **'පාදුනී'**ති ලිඞ්ගවිපල්ලාසොයං, පාදෙත්‍යත්ථො. **'වන්දිත්වා'**ඉති වන්දිත්වා. **'ජිනො නො'**ති අම්හාකං භගවා. **'පාරමී'**ති සමතිංසපාරමී. **'චිත්වා'**ති උපචිනිත්වා. **'සුගති'**න්ති ඉධ නිබ්බානමධිප්පෙතං. **'පසත්ථො'**ති පත්ථිතො. **'ධරමානො'**ති ධරන්තො ජීවන්තො. **'ලංකායං යක්ඛුපද්දවං සමෙත්වා'**ති එත්ථ කථං ආගච්ඡාමාති? භගවා කිර බොධිතො සත්තමෙ මාසෙ යක්ඛානං උපද්දවං සමෙතුං එකකොව පඨමෙ ගමනෙ ලඞ්කායං. **'පතිට්ඨාපෙසි සාසන'**න්ති ඔවාදං පතිට්ඨාපෙසි. **'ජළා'**ති එළමූගා. **'පත්තජත්තාදි'**න්ති තෙසං පත්තා ච ජත්තාදයො ච භින්දිංසු. **'උපෙක්ඛිතු'**න්ති මජ්ඣත්තෙන භවිතුං. **'සුසංමට්ට'**න්ති * සුමට්ඨමට්ටං කත්වා සුධොවිත්වා, **'උදකකද්දමසුක්ඛසඞ්ඛාත'**න්ති උදකපරිඛ කද්දමපරිඛ සුක්ඛපරිඛසංඛාතං. **'මහාරණ'**න්ති මහාසඞ්ඝාතං. **'දප්පිතො'**ති දප්පෙන මානෙන ඉතො යාතො පවත්තොති=දප්පිතො. **'අහමරෙ'**ති අහං අරෙ, අරෙති අනාදරෙ ආලපනං. **'මහෙල'**න්ති මහිරාජානං. **'බත්තිංසබලකොට්ඨකෙ'**ති බලානං බත්තිංසබන්ධාවාරෙ. **'සුනිසිතාසිනා'**ති තනුභාවෙන සුනිසිතෙන තික්ඛෙන අසිනා. **'නිරීතික'**න්ති † නිරුපද්දවං,නිරාමයං වා. **'අපරුද්ධො'**ති විරුද්ධො රාජා. **'ගජ්ජන්තො'**ති කුඤ්චනාදං නදන්තො. **'හත්ථ'**න්ති සොණ්ඩං. **'ඊසූ දාඨාසු'**ති වෙ දන්තෙ. **'විරජ්ඣිතු'**න්ති පරිවජ්ජිතුං. **'ගන්තුං චා'**ති ගමිතුං ච. **'ඉමිනා ලද්ධොකාසෙන මයා'**ති මයා ඉමිනා අපරාධසඞ්ඛාතොකාසෙන ලද්ධෙන. **'උස්සුක්කමනො'**ති උස්සුක්කාවිතෙතා. **'වසෙ'**ති මම වසෙ. **'ඉමං පුර'**න්ති ඉමං ලඞ්කාදීපෙ මහාපුරං. **'බුද්ධො'**ති බුද්ධිසම්පන්නො. **'පච්චපෙක්ඛී'**ති පටිඅපෙක්ඛි, **'ඉධා'**ති ඉධ ලොකෙත්‍යත්ථො. **'යොධ ජෙති'**ති යොධ නරො ජෙති ජිනාති, 'චජෙත්'තිපි පාඨො, තස්ස චජෙති ජහාත්‍යත්ථො, **'ඛලූ'**ති එකංසෙන, ඉත්ථිභවුග්ගන්තුං අරිනා සසෙනෙ අසමත්ථො, මහාසත්තො විජෙතුං සමත්ථො හොතීති යොජනා. **'සසූරො'**ති සො සූරො. '

---

* 'සුද්ධමට්ට'න්ති මුද්දිත රසවාහිනියං.

† නිරාසඞ්කන්ති,මුද්දිත රසවාහිනියං.

**යොධො**'ති සො මහායොධො. **'ජිතො සො ච ජගත්තෙ'**ති යො එවං භූතො යොධො සො භවත්තයං අත්තනො පඤ්ඤාසත්ථෙන ජිතො. **'සොවසන්තො'**ති ඉහ ලොකෙ වසන්තො. **'තෙස'**න්ති රාගාදිඅරීනං, ඉතො දීපතො ගන්ත්වාන මයා යත්ථ කත්ථචි ඨානෙ වසතා ඵාසු ලභිතබ්බංව, එත්ථ ගන්ත්වා විහරෙස්සන්ති අජ්ඣාහාරයොජනා. **'සංයම'**න්ති සඤ්ඤතං ඉන්ද්‍රියසංවරං වා. **'අජ්ඣුපාගමී'**ති සමුද්දොදකස්ස අජ්ඣොත්ථරණවෙලඞ්ගතො. **'බොධිසිනාන'**න්ති මහාබොධිරුක්ඛමූලෙ උදකාවසෙචනං. **'වරකනණ්ඩුලාන'**න්ති කුද්‍රූසක තණ්ඩුලානං. **'වාරෙහී'**ති * මං ගන්ථං ගිලිතුං නිවාරෙහි. **'උග්ගලිත්වා'**ති උද්ධං ගලිත්වා. **'තස්සා'භිමානවඩ්ඪනාරහ'**න්ති අභිමානභාවං තස්ස වඩ්ඪනාය අරහං. **'පාසසඞ්ගිනා මිගො විය'**ති පාසයඞ්ගිනා බිතෙනතා මිගො විය, 'පාසයඞ්ගිනා බිතෙනතා විය'තිපි පාඨො,පාසයඞ්ගිනා බිතෙනතා මිගො වියාති අත්ථො. **'භූමිය'**න්ති ඵලෙ පිරභූමියං. **'චොලරට්ඨෙ'**ති චොලිය රට්ඨෙ. **'ඉතො'**ති ඉතො අම්හාකං එතදෙසතො. **'මහානිණො'**ති යො මහාපබ්බතො. ලබුජඉච්චාදි ගාථාසු, ලබුජා ච අම්බා ච ජම්බුයො ච රම්මා ච, ලබුජම්බජම්බුරම්මා, තෙ ආදි යෙසං= අම්බුපනසාදීනං තරූනං තෙසං රාජිහි විරාජිතො **'ලබුජ=පෙ=විරාජිතො'**, තථා,නාගා ච චම්පකාච පුන්නාගා ච= නාගචම්පකපුන්නාගා,ඵුල්ලා එව පාදපා=ඵුල්ලපාදපා,නාගචම්පකපුන්නාගසඞ්ඛාතා ඵුල්ලපාදපා, තෙහි සමුජ්ජලහි විරාජන්තිහි= නාගචම්පකපුන්නාග ඵුල්ලපාදපසමුජ්ජලො,**ලෙණං** නාම ලිනත්ථාය කතඨානං, **පබ්භාරො** නාම † ඡින්නපපාතො, සොබ්භො වා. **'භාසුරො'**ති ඒතෙහි භූසිතො, සිතසෙකනෙන නිරාමිසසුඛඨානියභූතෙන රතනඨානාදිවාඨානෙන සංකිණ්ණෙන. **'මාලකාලි'** මාලකපන්තීහි. **'විරාජිතො'**ති විලසිතො. **'අනන්තසකුණාන'**න්ති අනන්තසකුණානං. **'නෙකනිජ්ඣරෙ'**ති නෙකනිජ්ඣරෙහි. **'නිඝොස'**න්ති අනෙකනදීපභවං පපාතනිඝොසං. **'දෙවදුන්දුභිසන්නිභ'**න්ති දෙවමහාභෙරිසදිසං. **'සිඛිනො'**ති මයූරා. **'මුදා'**ති ආමොදමානා. **'කෙකනාදෙනා'**ති ‡ තෙසං යෙව මයූරානං කෙකාති රාව නින්නාදෙන. **'දෙවානමවෙහනෙනවා'**ති දෙවානං,

ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනෙ
ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො'ති'

---

* 'මාරෙහිති' මුද්දිත රසවාහිනියං.

† සම්භාරො, මුද්දිත රසවාහිනියං.

‡ කෙකානාදෙහිති, මුද්දිත රසවාහිනියං.

යොගීනං අවභාසනවසෙන, යොගීති සද්දවකසාරිනොත්‍යත්ථො,සො අයං පබ්බතසඞ්ඛාතො වාරණො තිදසානං දෙවානං අසුරාරිරණෙ ස්රණො එරාවනවාරණො වියාති යොජනා. **‘එරාවණදන්තගෙහ’**ති සිමන්තිනි ජසඞ්ඝො එරාවනදන්තගෙහ නච්චන්ති. **‘සුරසුන්දරී’**ති එක පඤ්ඤාසාධිකසත්තකොටියො චතුසට්ඨිඑකූනසට්ඨි සහස්සාධිකාලඞ්කතා දෙවා නච්චන්ති. **‘සඞ්ගී’**න්ති සඞ්ගී,සෙලගෙහි සම්බන්ධො. **‘මඤ්ජරී’**ති පඤ්චවණ්ණමඤ්ජරී. **‘පලවඞ්ගෙහී’**ති වානරෙහි, **‘විහඞ්ගෙහි චලිතා’**ති සකුණෙහි ආලුලිතා. **‘සඤ්ජුගුන්තා’‘ලිපාලිහී’**ති යත්ථ යස්මිං උග්ගතාහි භමරපන්තීහි. **‘නභ’**න්ති ආකාසො. **‘නීලම්බුදොපම’**න්ති නීලමෙඝොපමං,නදීත්‍යාදිගාථායං **සරසිකාමිනී** සරසිසඞ්ඛාතවනිතා නදීකන්දරසඞ්ඛාතාහි බාහාහි. **‘ආලිඞ්ගිතා’‘වා’**ති ආලිඞ්ගිතා ඉව,යහිං පබ්බතගෙහ සොභන්ති දිප්පන්ති, පබ්බතසංඛාතං නරාධිපං රාජානං ච ආලිඞ්ගිතා සොභන්ති. **‘දෙවඞ්ගනාහි සඤ්ඤත්තජායා නන්දනසන්නිභා’**ති එතෙ රුක්ඛා සංසිතජායා දෙවඞ්ගනානං නන්දනසන්නිභා සොභන්ති. **‘තාලභින්තාලා’**ති තාලරුක්ඛා ච හින්තාලරුක්ඛා ච. **‘සිඤ්ජිසන්තිරකොණිවකා’**ති සිඤ්ජිකා ච සන්තීරා ච නිගුණ්ඩිකා ච. **‘බුධපඞ්කජකල්හාර කොරවුප්පලමාලිනී’**ති ඵුල්ලපඞ්කජකල්හාරකොරවුප්පලමාලිනී,කුරුතො භාවො කොරවං. **‘පොක්ඛරඤ්ඤො’**ති පොක්ඛරණියො. **‘නරොරගසුරාදීහී’**ති නරා ච උරගා ච සුරා ච තෙ ආදයො යෙසං තෙහි=නරොරගසුරාදීහි. **‘සන්තා’**ති සන්තමනසා. **‘සදෙවාන’**න්ති සදෙවකානං ලොකානං. **‘කුසලොදය’**න්ති කුසලානං උදයජනනං.

**‘සබාලතං’**ති සබාසන්තතිං. **‘මනනිස්සිත’**න්ති හදයෙ දස්සිතං නිස්සිතං නිබාතං. **‘ධම්මම්බුනා’**ති ධම්මකථාවාරිනා, සා සබාලතා වඩ්ඪිතා. **‘චරිතානුකූල’**න්ති රාගාදිකෙ තිකෙ සද්ධාදිකෙ තිකෙති එකච්ඡිකමූල මිස්සිතෙ ති එවංවුත්තාය වොමිස්සකාය චතුසට්ඨි චරිතාසු අඤ්ඤතරිස්සා චරියාය අනුකූලකම්මට්ඨානං, විත්ථාරතො ඉච්ඡන්තෙන විසුද්ධිමග්ගතො ගහෙතබ්බං. ගාථාසු, චම්පකා ච නාගා ච පුන්නාගා ච සාලා ච සලලා ච අගරූ ච සීතලගන්ධිකා ච නීපරුක්ඛා ච අසොකරුක්ඛා ච වකුලාදිකාරුක්ඛා ච සන්ති. **‘දෙවගන්ධිකා’**ති වරගන්ධිකා. තාලඉත්‍යාදිගාථායං, තාලරුක්ඛා ච හින්තාලරුක්ඛා ච සන්තීරරුක්ඛා ච රම්භා ච පූගා ච තාල=පෙ=පූගා, තෙසං පන්තියො,තාලහින්තාල=පෙ=පන්තියො. **‘ද්ධසා**

**ගරළගාහිනා**'ති දුඩ්ඪකසමුද්දසදිසා. '**භොගින්දභොගසඞ්කාසො**'ති නාගානං භොගසදිසො. '**අබ්භුග්ගතො**'ති අභිඋන්නතො. '**සඞ්ඛගීවා**'ති සඞ්ඛරතනායාමො. '**සුඛසම්ඵස්සදෙ**'ති සුඛසම්ඵස්සස්ස දදෙ. '**ඉන්දනීලච්ඡද**'ති ඉන්දනීලවණ්ණච්ඡදනා. '**චාරුචාමීකරජුටිකා**'ද. රජතියහෙමජුටිකා. '**තෙහෙවා**'ති තෙහි එව භික්ඛුහි. ඔසානගාථායං '**එවංවිධ**'න්ති එවං පකාරං, පුඤ්ඤන්ති වත්තබ්බෙ ගාථාබන්ධසුඛත්ථං අනුනාසිකලොපො. '**පුඤ්ඤ**'න්ති සුචරිතං. '**ඵලොදයාවහ**'න්ති ඵලඋදයං ආවහන්තං. '**කරිය්‍යා**'ති * වත්තබ්බෙ රස්සං කත්වා කරිය්‍යඉති වුත්තං. '**සයාති**'ති සො පුග්ගලො යාති. අයං ගාථා ඉන්දවංසා වුත්ති නාම.

**දුට්ඨසෙනස්ස වත්ථුං චතුත්ථං.**

——(०)——

පඨමෙ '**දීනො**'ති දලිද්දො. '**කපණො**'ති වරාකො. '**අනාලම්බිකො**'ති අනාලම්බො. '**සහයූකකුචෙලක**'න්ති යූකෙහි සද්ධිං නව වත්ථයුගං, ඛිලජම්පි නත්ථි පගෙව අඤ්ඤ කටසාරාදිකො සෙය්‍යත්ථං චෙව ආවෙය්‍යත්ථඤ්ච අපසෙය්‍යත්ථඤ්ච හොතීති. '**අස්සසන්තො**'ති මුහුං මුහුං අස්සසන්තො පස්සසන්තො. '**රුදම්මුඛො**'ති රොදමානමුඛො. '**ජිණ්ණාසො ආසී**'ති ජිණ්ණආසාය ආසි, විපල්ලාසොයං ජිණ්ණාසොත්‍යත්ථො. '**අසඤ්ඤතො**'ති † දුස්සීලතා. '**තථාවිධො**' '**පී**'ති ත්ථං එවං මයා වුත්තවිධොපි. '**අත්තසන්තුකො**'ති අත්තනො පටිසන්තුභූතො, යො හි එවංවිධො සො අත්තසන්තුකො අත්තනා අප්පියො නාම:—

අත්තානං චෙ පියං ජඤ්ඤා රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තින්නාමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතොති,

අයම්පන තිණ්ණන්නං යාමානං අත්තනා නගච්ඡති, තෙනාහ ථෙරො, 'අහො මයා සමො නත්ථි තිභවෙ අත්තසන්තුකො'ති. '**සමහ**'න්ති යෙන කුසලෙන අහං. '**තිමිසා**'ති මච්ඡා, '**එතස්සං නජ්ජාය**'න්ති එතිස්සං නදියං. පාඨීනාදිසු පඨීමච්ඡා පාවුසා මච්ඡා

* 'කරොථ'ඉති මුද්දිත රසවාහිනියං.
† 'අධඤ්ඤතා'ඉති මුද්දිත රසවාහිනි~

සිඟුමච්ඡා සවඞ්කමච්ඡා රොහිතමච්ඡා ආදියෙසං සුංසුමාරාදීනං තෙ සිඟු=ප=රොහිතාදයො. '**පාලයන්ත**'න්ති තං අඛණ්ඩං පඤ්ච සීලං පාලයන්තං. '**අලං**'ති පරියන්තං සමත්ථං. '**උප්පලකලාපෙ**'ති උප්පලහත්ථකෙ. '**පුරිසානම්මනොනාගධො**'ති පුරිසානං අනොනාපරියාපනෙනා. '**වසෙ වත්තාපෙතු**'ති වසෙ අනුවත්තාපෙතු. '**සස්සුසසුරගෙහෙ**'ති * එත්ථ සස්සූති භරියාය මාතා, සසුරොති භරියාය පිතා, තෙසං ගෙහෙ. '**නක්ඛත්තපාඨකා**'ති අට්ඨවීසතියා නක්ඛත්තපථෙ ජානනකා ගණකා. '**සුරියග්ගාහො**'ති රාහුනා අසුරින්දෙන ගහිතසුරියො සුරියග්ගාහො නාම. '**නක්ඛත්තුපපීළා**'ති † ඉත්ථං නාම නක්ඛත්තං අසුකෙන නාම නක්ඛත්තෙන ගහෙත වා පීළිතන්ති එවමාදිනා නක්ඛත්තුපපීළා. '**දෙවදුන්දුභී**'ති ඝටසද්දො පඨවිකම්පනාදි යෙසං උක්කාපාතදෙවතා රොදදීනනෙත පඨවිකම්පාදයො. '**ආවරණ**'න්ති ‡ උදකාවරණං. '**නෙදිසං**'න්ති න එදිසං. '**මාදිසා**'ති මම සදිසා. '**කාජින**'න්ති ගත්ජීනං අයමෙව වා පාඨො, '**ලුද්ධො**'ති ලුබ්භන්තො. '**සො**'ති සො කෙසරී. '**තුම්හාකං පුරිසෙහි කාතබ්බං මයාපි කාරාපෙථා**'ති තුම්හෙ පන සයමෙව පුරිසෙහි කාතබ්බං, කරොන්තා සමානාපි මයා කාරාපෙථාති, මයාති එත්ථ උපයොගෙ කරණවචනං, යථා "තිලෙහි ඛෙත්තෙ වපතී"ති. '**හත්ථාලම්බක**'න්ති හත්ථෙන ඔලම්බිතබ්බං භණ්ඩිකං. '**අඩ්ඪකුම්භභාරමත්ත**'න්ති කුම්භභාරස්ස අඩ්ඪභාගමත්තං, චත්තාරි හි සතසහස්සානි එකො කුම්භො වෙ සතසහස්සානි අඩ්ඪකුම්භො. ඔසානගාථායං, '**නිමෙසාන**'න්ති මච්ඡානං. '**අලත්ථ**'න්ති අලභිං. අයං ගාථා උපජාති නාම.

**මහානෙලස්ස වත්ථුං පඨමං.**

——○◌○——

ඡෙඨ '**තෙලමංස**'න්ති මෙදමිස්සිතමංසං. '**මධුමංස**'න්ති හදයමංසාදි. '**එණිමංස**'න්ති පපථාසමංසං. '**පරිභණ්ඩ**'න්ති සානියාදීහි පරික්ඛිත්තං. '**ලාජපච්මානි**'ති ජලජථලජරුක්ඛකිණ්ණලතාගච්ඡපුප්ඵානි ලාජපඤ්ඤමානි, අථවා නාළියාවට්ටාදීනි, තෙනාහු:—

නාළියාවට්ට මකුලං මල්ලිකා මකුලං තථා
දබ්බතිණංච සිඩාත්ථං ලාජපඤ්චමකානිචාති,

---

* 'සසුරස්ස ගෙහෙ'ති මුද්දිත සරවාහිනියං.
† 'නක්ඛත්තපිළා'ති මුද්දිත රසවාහිනියං.
‡ 'මාතිකං'ති මුද්දිත රසවාහිනියං.

‘සද්ධජක’න්ති පුප්ඵද්ධජකසහිතං. ‘අඞ්ගරාගෙන සම්පාදිත’න්ති ඉමිනා තිප්පාරිවාසිකභාවං දස්සෙති. ‘තෙජිද්ධිවික්කමො’ති තෙජො ච ඉද්ධි ච වික්කමො ච යස්ස සො= තෙජිද්ධිවික්කමො. ‘රූපෙන මකරද්ධජො’ති රූපෙන මාරසෙනො. ‘සච්චසන්ධො’ති සච්චෙන සච්චං ඝටෙන්තො සච්චසන්ධො. ‘වාග්මී’ති වාගවා. ‘පවෙච්ඡතී’ති නිවෙදෙති. ‘අනො’ති * අස්සා භණ්ඩමූලා එව. ‘ආයමුඛ’න්ති අයසමානං සුසුඛකමග්ගං. ‘යුගං’න්ති සකටයුගං. ‘අසොකමාලවා’ති අසොකං මාලාපිණ්ඩව. ‘පල්ලවඞ්කුවා’ති රත්තමඞ්කුලඞ්කුව. ‘උප්පලංවා’ති වත්තබ්බෙ රස්සං කත්වා ‘උප්පලංව’ඉති වුත්තං, වාසද්දෙන වෙළු උප්පලං වා යාකාචිපි වා අම්බුජජාතීති අත්ථාධිකං දස්සෙති අයමත්ථො උප්පලං වා අඤ්ඤං කිඤ්චි වා අම්බුජජාතං උදකච කද්දමච පටිච්ච උප්පජ්ජති ඉව යථා එවං තං පෙමං ඉමෙහි කාරණෙහි ජායතෙති. ‘පදුමාකාරා’ති පදුමූපමා. ‘හෙමමොරස්සා’ති සුවණ්ණමොරස්ස. ‘නෙත්තරසායනා’ති නෙත්තානං රසායනා පවරා. ‘ඌරූ’ති වෙ ඌරුයො පවරා උත්තමා. ‘හෙමරම්භොපමා’ති සුවණ්ණකදලික්ඛන්ධොපමා ‘හත්ථෙන පමිතබ්බ’න්ති හත්ථප්පමාණෙන මිනිතබ්බං. ‘තරඞ්ගභඞ්ගී’න්ති වීචිමාලාභඞ්ගිං. ‘රූපසාගරෙ’ති රූපසඞ්ඛාතෙ මහණ්ණවෙ ‘වලිත්තය’මවිච්ඡින්නං’ති තව රොමරාජීයං වලිත්තයං අවිච්ඡින්නං හුත්වා. ‘උරෙරුහානී’ති උරෙ රුහන්තානි සොණ්ණබුබ්බුලකචතඳසමානි සම්බන්ධො. ‘සොණ්ණබුබ්බුලකා’ති සුවණ්ණබුබ්බුලසණ්ඨානා. ‘සමා’ති සමම්මා සමා අවෙකල්ලා හුත්වා ඨිතා. ‘උත්තරසාගරෙ’ති උත්තරකායසඞ්ඛාතෙ රූපසාගරෙ, ‘පාණිපල්ලවලඞ්ඝනානි’ සුරත්තමුදුකරතලසඞ්ඛාතපල්ලවාලඞ්ඝනා. ‘කප්පලතාය සඤ්ජාතා පාරොහා’ති තව සරීරසඞ්ඛාතකප්පරුක්ඛාරූළ්හායලතාය සඤ්ජාතපාරොහා භූතා. ‘වත්තසාරාදිචන්දො, තෙ හාසරංසිවිමිස්සිතො’ති තෙ තව වත්ත මුඛසඞ්ඛාතො සාරදිකචන්දො සහස්සරංසියා විමිස්සිතො. ‘විකාසයතී’ති ඵුල්ලාපෙති. ‘මනොකෙරවකානනං’ති මම මනොසඞ්ඛාතං කුමුදකානනං. ‘පක්කකක්කාරිබීජානං පන්තිවා’ති † සිලාකද්දමෙ පටිපාටියා සමප්පිතානං පක්කකක්කාරිබීජානං පන්තිවිය. ‘දන්තපන්තියො’ති සමචත්තාළීස දසනපන්තියො. ‘හන්ති’ති ආහනති සොභන්ති, ‘රත්තාංසුවිමිස්සිතා’ති නිග්‍රොධපක්කාරත්තාධෙසු විමිස්සිතරංසිමාලා. ‘සිඞ්ගාරමඤ්ජරෙ

---

* ‘තතො’ති පෙල. මු: ර:

† ‘පක්කකරකබීජානං පන්තිවා’ති මු: ර:

**ධජකෙතූ'ව හෙමයට්ඨිය**'න්ති සිඞ්ගාරකරණසඞ්ඛාතෙ මන්දිරෙ හෙමයට්ඨියං ධජකෙතු ඉව. '**විලලිවලලී විරාජන්ති අඞ්ගභඞ්ගා විය කාමුකෙ**'ති දහනාපෙන කාමොව = කාමුකො, කාමො එතස්මින්ති වා=කාමුකො, නිච්චමාලබ්බොහාරෙ පුරිසෙ එථ අභිරමථාති අවහයන්තා විය. '**නීලවෙල්ලිතධම්මිල්ල**'න්ති නීලං නඞ්ගවෙල්ලිතං තව ධම්මිල්ලං. '**නාපිඤ්ජා**'ති ගුනානං පිඤ්ජකලාපාව. '**මාලතිමාලාදාමෙනා**'ති වනමල්ලිකපුප්ඵදාමෙන. 'සුණෙ'ති සුන්දරවණ්ණෙ. '**අමෙජ්ඣ**'ති දුග්ගන්ධහෙතුනා, මණිමුත්තාසදිසං පිරත්තං සුවණ්ණං ලොකො පරිච්චජති, සා රතනිත්ථී දුක්කුලා අපි චණ්ඩාලසඞ්ඛාතෙ දුක්කුලෙ ජාතා අපි ගහෙතබ්බා එවාති. '**චතුරඞ්ගතඞ්ග දෙසෙ**'ති චතුහත්ථඨානෙ. '**නාවමඤ්ඤනාතබ්බ**'න්ති නාතිමඤ්ඤිතබ්බං. '**කටුකාභිත**'න්ති කටුකං අහිතන්ති ජෙදෙ, කටුකමෙව අහිතබ්බං න්‍යපෙථා, අථවා කටුකාභිතන්තීහ සබ්බථා පාපං කටුකවිපාකං, උත්තරපදෙපි එසෙව නයො. 'ධඤ්ඤා'ති පුඤ්ඤලක්ඛණසම්පන්නා. 'ජෙ'ති ඉස්සරස්ස හිනආලපනමෙතං, හෙ ජෙති අනාදරෙ ආලපනාතීති හි වුත්තං. '**භොත්තුකාමා දෙහලිනි**'ති භොත්තුකාම සඞ්ඛාතා දෙහලිනි. '**සුපක්කං දක්ඛං ඵල**'න්ති සුපරිපක්කං සෙරෙය්‍යඵලං "අථො සෙරෙය්‍යකොදඩි,,ති පරියායො. '**කිනාතුසාපීණිතා හොති**'ති සා පීණිතමනා කින්නු හොති. '**ලද්ධා සහකාරජං ඵල**'න්ති සහකාරජඵලං සා ලද්ධාන, සහකාරජඵලං නාම සහකාරඵලං, යං ලොකෙ තිලකඵලන්ති වුත්තං. '**කන්දබුජ්ඣන්ති දිස්වාන චන්දං පඞ්කජකානන**'න්ති මම ආනනසඞ්ඛාතං පඞ්කජං අසොකමාලදෙවියා මුඛසඞ්ඛාතං චන්දං දිස්වා කන්දබුජ්ඣන්ති විකාසති එවාති. '**සාමා**'ති සුවණ්ණවණ්ණා. '**පීණසොණ**'ති පීණිතකප්පිතචිත්තාස්ස. 'ධඤ්ඤා'ති ධඤ්ඤවති. '**සන්ද්‍රසාලිනි**'ති සාලිනී රූපකාන්ද්‍රා. '**කොමලාසඞ්කාසා**'ති කොමලා පංකජපත්තසණ්ඨානා. '**මජ්ඣෙමතාජාතරෙඛා**'ති මජ්ඣෙමතාජසදිසරෙඛා. 'ගම්භීරා'ති ගම්භීරා. '**ගම්භනුගානා**'ති එසා රතනාතුධනනාබ්බනාති. * '**හංසගානා**'ති හංසගමනලීලා.† '**සුපාණී**'ති සුන්දරපාණි. '**සුභොරූ**'ති සුන්දරොරූ. '**භුනං මජ්ඣෙ**'ති භමුකන්තරෙ. '**තිසූල**'න්ති තිසූලලක්ඛණං. '**ජනාකාරං සදිසංවරග**'න්ති ජනානසමානංවරගවෙ. '**මනොලඞ්කි**'ති මනාපමත්තාලඞ්කි 'නාසිකං'ති නාසිකං දෙවියං. '**විලසති**'ති විරොචති.

---

* හාසයන්තා, මු: ර:  † සුවණ්ණී, මු: ර:

'අඤ්ඤාතරසො'ති විදිතරසො. 'අපනීතා'ති අප්පවිනීතා, ඉදං වු
ත්තං හොති එවරූපා කුමාරිකා මම පුත්තස්ස මනාපා තස්මා ම
යා අපනීතා අභවිස්සාති අත්තනොපකාරං දස්සෙති. 'ගොකුණ
පතො'ති මතගොකුණපතො. 'ගොරොචනමෙවා'ති ගොපා
මත්තරෙ ගොරොචනසීලමෙව; තෙනාහු:-

'ගහණීයා පතිමීළෙහ තථා කද්දමතුප්පලං
ගොහි ගොරොචනචෙව වඩ්ඪ වස්සනරෙතථා,'ති

'අත්තනො නාමෙනා'ති අත්තනො නාමසරික්ඛකෙන නී
ලාලියමහාවිහාරන්ති ලද්ධවොහාරෙනාති අත්ථො. 'අමච්චානං ව
චනෙනා'ති දෙවකුමාරො අයමුබා ගණ්හාතීති ආයත්තකා
නං අමච්චානං වචනෙන. 'සාසා'ති යෙන දිබ්බාසධෙන. 'අජි
නම්හෙනා'ති පිවනමනෙන. 'කඬුකච්ඡුවණ්ණාදයො'ති කඬු
ච කච්ඡු ච වණ්ණො ච කඬුකච්ඡුවණ්ණා, තෙ ආදයො යෙසං
දද්දුකුට්ඨාදීනං හොන්ති තෙ කඬුකච්ඡුවණ්ණාදයො, ගණ්ඩාන්ති වණ්ණා
දයොතිපි පාඨො. 'වලිංවලිනා'න්ති වලිත්තාචානං. 'අලමෙව නං ගදං
භුවි'ති ඉමස්මිං පඨවිතලෙ අමතං ඔසධං අලමෙව පරියන්ත
මෙව. 'අබ්‍යාධි'තිමහාබ්‍යාධිරහිතො. 'නිරාතඞ්කො'ති උද්ධතබ්‍යාධි
නිග්ගහතො. 'දුට්ඨගාමිණිරඤ්ඤො රජ්ජෙ පිතා ජනා අහු' තිපි
තා කාකවණ්ණතිස්සරාජා ච ජනා ච නගරවාසිනො දුට්
ඨගාමිනිරඤ්ඤො රජ්ජෙ ආසුං. 'තස්සා' ති තස්ස දුට්ඨගාමිණිර
ඤ්ඤො. 'විස්සුතො'ති පාකටො. 'සුතො'ති ඔරසපුත්තො, 'සම්බ
න්ධ'න්ති පරිබන්ධං, 'තදච්චයෙ'ති තස්ස රඤ්ඤො අච්චයෙන. 'අට්ඨාරස
සමාසමො' ති අට්ඨාරසපච්චන්තිකරාජානො සමාසනෙත්වාසමිතො,
ඔසානගාථායං, 'සුජනජනා'ති ජනානං සුට්ඨුජනභූතා. 'සොභ
දන'න්ති සුභං දනං දත්වා, අථවා සොභදනන්ති සුභං දනං දද
න්තානං, 'ථූපා'ති චත්තබ්බෙ රස්සං කත්වා ථූප ඉති වුත්තං'
'නිධාය'ති විනිධාය ඨපෙත්වා. 'චිණථා'ති උපචිනාථ, 'වසථා'
ති වසිස්සථ. 'ගතාපරමෙම්'ති ගතාපරමෙම්ති ජෙදෙ, රමෙම්
ති සුට්ඨුරම්මතරෙ, වුඩ්ඪියං හෙතු අකාරො; අයං ගාථා මාලිනී
නාම.

## සාලිරාජකුමාරස්ස වත්ථුං ඡට්ඨං.

සත්තමෙ 'නිච්චුස්සව'න්ති නිරන්තරං උස්සවවිතානං. 'මරාලී'
ති ලාමකා. 'සුනා'ති සුනඛී. 'නාවලනා'ති පහරන්ති. 'පතිස්ස

ත්'ති පතිට්ඨා සෙති. '**දුක්ඛභාගී**'ති දුක්ඛස්ස පාපස්ස සාමී. '**යො කාමමීදිසෙ සත්තෙන**'ති යො ජනො කාමම්පි එකංසෙන ඊදිසෙ සත්තෙන දිස්වා. '**ඝාස**'න්ති ආහාරං. '**විනෙත්වාන**'ති එවං විනෙත්වා. '**ජඩ්ඩෙත්වා**'ති අත්තනො ගහිතං කුච්ඡිගතං ඝාසං ජඩ්ඩෙත්වා වමිත්වාති අත්ථො. '**අත්තානමනපෙක්ඛියා**'ති මම අත්තානං ථොකමත්තං අනපෙක්ඛිත්වා. '**වාරං චත්තිංසසංවච්ඡරෙහි කොටිගෙහං සම්පාපුණි**'ති තෙසං පරිවත්තනෙන දානවාරං චත්තිංසසංවච්ඡරෙහි ගෙහෙසු කොටිං පාපුණි, චත්තිංසසංවච්ඡරෙ එකෙකස්මිං ගෙහෙ දානවාරං පත්තොති අධිප්පායො. '**ගාළ්හවෙදන**'න්ති බාළ්හං දුක්ඛවෙදනං පත්තං, සෙසං සුවිඤ්ඤෙය්‍යමෙවාති. අයං ගාථා උපජාති නාම.

**චූළනාගත්ථෙරස්ස වත්ථුං සත්තමං.**

———o ⁂ o———

අට්ඨමෙ '**තෙන වඩ්ඪිතාස සහ**'න්ති තෙන විභාගෙන වඩ්ඪිතෙන සහ. '**ධූමරක්ඛපබ්බතෙ**'ති එවංනාමකෙ පබ්බතෙ. '**පාණිස්සරා**'ති සඞ්ඛා. '**එකපොක්ඛරා**'ති එකතාලෙතබ්බභෙරියො. '**කංසතාලාදිකෙ ඝනෙ**'ති ඝනභෙදෙ කංසතාලාදිකෙ තුරියෙ. '**සඞ්ඛවංසාදී**'ති සුසිරභෙදෙ වංසසංඛාදිතුරියෙ. '**ලයානුයාත**'න්ති තාරාදිලයානුගං ගීතිස්සනං. '**පූජෙථ මෙ සංඝය**'න්ති ඉමං මෙ පූජං කරොථ. '**ඉච්ඡාදසකනෙකෙහී**'ති ඉච්ඡාදසකෙහි අනෙකෙහි. '**කෙනා**'ති ආදිසු කෙන වනෙන කෙන සීලෙන රක්ඛිතෙන. '**දසිදසවා**'ති දසිදසා එතස්ස සන්තීති=දසිදසවා. වත්ථුප්පච්චයො. '**ධනධඤ්ඤවා**'ති එත්ථාපි එසෙව නයො. '**ධම්මදාන**'න්ති ආදිසු අහං සබ්බදානෙසු උත්තමං ධම්මදානං අදාසින්ති අත්ථො. '**යතිනන්දනං**'ති යතීනං නන්දනීයං ආරාමං. '**ධරා**'ති අයං මහී. '**කූටංපි අස්සා**'ති අස්ස පබ්බතස්ස කූටංපි. '**නෙලභාජන =පෙ= සන්තවසිකා**'ති ඉතො තස්ස සුසමතලභාවං දස්සෙති. ඔසානගාථායං:–'**සඞ්ගසම්පත්තිදන**'න්ති සඞ්ගමොක්ඛසම්පත්තිදායකං. '**දිබ්බ**'න්ති දිබ්බසදිසං. '**අනුගාමිනිදන**'න්ති ථාවරජඞ්ගමසමානුගාමිනං චතුන්නං නිධීනං අනුගාමිනිධිභූතං. '**දානමනන**'න්ති දානසඞ්ඛාතං දිබ්බමන්තං. '**ථාමසා**'ති ථාමෙන–අයං ගාථා උපජාති නාම; සඤ්ඤමත්තනගගා සහිතානි.

**මෙසවණ්ණස්ස වත්ථුං අට්ඨමං.**

——(o)——

නවමෙ. 'බහුලමංසූ'ති බහුමංසුම්. 'සසම්භංසූපෙනා'ති සසම්භං සළුපදිස්සෙන. 'සසංඝීරාසි'ති සසංඝං අසීරාසි. 'ඛනිතපත්ත පාණීසූ'ති පත්තෙහි උගනිහතෙසු. 'අඤ්ඤාතො පාසින'න්ති සෙහිපුතෙන ආරාධිකවසෙන පාපිතං. 'නූනාසං තෙන කතකම්මන්ති මඤ්ඤමානො'ති නූන තෙන ථෙරෙන මහාරහං කතං කම්මන්ති චින්තෙන්තො. 'බව්හාබාධතන'න්ති බව්හාබාධස්ස භාවො බව්හාබාධත්තනං, තන්නපච්චයො. 'ජනෙ භූතංවිගහවාසින'න්ති උබ්බිගවාසභාවං ජනෙති. 'භද්දන්තස්ස සන්තිකා'ති භද්දන්තස්ස සකාසතො, 'බන්ධපරිපාටි'න්ති අභෝබාවජ්ජිතනපපවත්තිතබන්ධපරිපාටිං. 'සනරාමරලොක'න්ති සදෙවමනුස්සං ලොකං. 'නිවජ්ජපදං'ති නිබ්බාණගමනමග්ගඵලං. 'රතනත්තයමාමකො'ති රතනත්තයම්හියා යනසීලො, මමන්ති ලබ්භියං නියතො මාමකො, මම බුද්ධො ධම්මො සංඝො චාති රතනත්තයෙ මාමකො එතස්සාති=රතනත්තයමාමකො. 'කරග්ගහණො'ති වරහත්ථග්ගහණො. 'සතිසාර'න්ති සතිසෙසං. 'ජනෙසගෙහො'ති ජනානං ජනෙසු වා අගෙහො සෙට්ඨො, ජනොසභොති වා පාඨො. 'ජානොපචිතපුඤ්ඤස්සා'ති ජාන උපචිතපුඤ්ඤස්සාති ජෙදෙ, ජාන ජානාහීති අත්ථො. ඔසානගාථායං 'අසඞ්ඛකප්පාකපි'ති අනුනාසිකලොපො. * 'චිනපපුඤ්ඤමපි'ති අප්පම්පි පුඤ්ඤං උපචිතං. 'ජහාථදිවස'න්ති දිවසං ජහාථ; අයං ගාථා උපජාති නාම.

ධම්මදින්නථෙරස්ස වත්ථුං නවමං.

—— ◦ ◦ ——

දසමෙ 'රඤ්ඤකපුත්තො'ති රඤ්ඤො නියුත්තො රඤ්ඤකො, තස්ස පුත්තො=රඤ්ඤකපුත්තො. 'විපාකමහි'ති විපාකදානකාලෙ. 'උපමෙතව'න්ති උපමෙතුං. 'අනුබිජම්භා'ති අනුවත්තනතො බිජම්භා. 'මහානීලම්බුදොපමො'ති මහානීලො අම්බුදොපමොති=නීලො මහාඅම්බුදොපමො, නීලම්බුධරසදිසකායො, 'රොපෙති'ති වපති, බුද්ධපුත්තස්සානුසාසනිසඞ්ඛාතෙ භූතලෙතිසම්බන්ධො. 'පවාළවණ්ණා'න්ති පවාළස්සවණ්ණං. 'රාජමාසෙ'ති මහාමාසෙ. 'කම්මාසවණ්ණා'න්ති කාලමාසවණ්ණං, කුම්මාසවණ්ණන්තිපි පාඨො, කබරවණ්ණන්ති අත්ථො. 'කාලමාසමුග්ගෙ'ති නීලමාසමුග්ගපූරිතපක්ඛදුසසතස

* "කතපුඤ්ඤකම්මමපි" ති: මු: ර:

කටෙ, 'නිග්ගුණ්ඩිපුප්ඵා'නාහි* සින්දුවාරිතපුප්ඵවණ්ණං, ඉදං පන පච්චකං යොජෙතබ්බං, නීලමාසපුණ්ණ පංචසකටසතෙ නිග්ගුණ්ඩිපුප්ඵවණ්ණගොනසහස්සං යොජාපෙසි; අවසාන ගාථායං, '**භිඛාලඞ්ග**' නාහි ආලසියං හිත්වා '**සඨානථා**'ති යථා යථා ඉච්ඡති තථා තථා. අයං ගාථා උපජාති නාම.

**රඣිකපුත්තස්ස වත්ථුං දසමං.**

**දුතියො ඝොධ වග්ගො අඨමො.**

වත්ථුද්දානං

බන්ධුජීවො පුස්සදෙවො ලභියාදිවසභො තථා
දඨාසෙනො මහානෙලො සාලිචූලනාගො තථා
මෙඝවණ්ණො ධම්මදින්නො රඣිකපුත්තොති තෙදසාති.

**ඉති පඨම=පෙ=සම්මතා.**

නවමස්ස සිළුත්තවග්ගස්ස පඨමෙ '**දෙවරක්ඛිතලෙණෙ**'ති එවංනාම කෙනඛණිතෙ ලෙණෙ, දෙවරො හි සාමිභාතා, තෙනාහු—"ජායාය භාතිකො ජාරො සාමිභාතා තු දෙවරො"ති, දෙවරෙන ඛතං ඛණිතං දෙවරඛතං. '**සිළුත්තො**'ති සරසප්පො, සිළුත්තො වාති පරියායො, **සවණපථෙ**'ති සවණූපචාරෙ. '**සම්මෙව විඤ්ඤුතො බො**'ති තස්මිං යෙව වම්මිකෙ ආවසන්තො බොධා. '**අජාති ජාතිමානං සො**'ති සො ධම්මො ජාතිමන්තානං ජාතිධම්මපුග්ගලානං අජාතිං නිබ්බාණං කරොති. '**සකණ්ටකාභිතිධම්මො**'ති සකණ්ටකවතිභූතො ධම්මො. '**අපායගමනජ්ඣෙ**' ති සෙසො. '**අමනාපගන්ධෙ**'ති අමනොසධභූතො, '**සොයංධම්මනිවෙසො**'ති හො,! සාධවො සො අයං ධම්මනිස්සරසප්පො, සොයං ධම්මානිහොතිපි පාඨො, හො සො අයං ධම්මාති සුත්වාති අත්ථො, විපල්ලාසොයං, එවං ධම්මාති සුත්වානාති ආදිසු විය. අවසානගාථායං '**උපාසනන්තු**'ති උපසෙවනන්තු, එසො මෙ ගති සරණං පරායණන්ති පයිරුපාසයන්තු. '**ඨානෙ ච ගමනෙ**'ති ඨිතෙච ගමනසමයෙ ච. '**සයනාසනෙ**'ති සෙය්‍යායං ච නිසින්නෙ ච, එතෙ බ්‍රහ්මවිහාරසඞ්ඛාතං චතුඉරියාපථං දස්සෙති; තෙනාහ භගවා:-

'තිට්ඨං චරං නිසින්නො වා සයානො වා යාව තස්ස විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු,ති

"සයනෙ ආසනෙ ඨානෙ
ගමනෙ චාපි සබ්බදාති ච"

* කාලවණ්ණානි, මු: ර:

අයං ගාථා උපජාති නාම, ඡන්දසඤ්ඤවංසට්ඨඉන්දවංසානං පාදසඞ්කුලත්තා තෙනාහ:–

අනන්තරොදීරිතලක්ඛණා චෙ පාදාවිමිස්සාඋපජාතියොතා
එවංකිරඤ්ඤාසුපි මිස්සිතාසු වදන්ති ජාතිස්විදමෙව නාමන්ති.

**සිලුත්තනස්ස වත්ථුං පඨමං.**

දුතියෙ **'විධොලො'**ති එවන්නාමකො. **'නානාඔදකචරා'**ති නානප්පකාරා උදකචරා මිගසූකරමොරීසුවට්ටකාදිමාරකසත්තා. **'බිලාරසංඝො'**ති* බිලාරමූසිකසංඝො. **'සීමකූවෙනිබලිසාදයොපි'**ති† සීමා යො ච කුවෙනී ච බලිසා ච තෙ ආදී යෙසං භූතසත්තානං හොන්ති තෙ සීමකුවෙනිබලිසාදයො, තත්ථ සීමා නාම උබ්බට්ටකමුඛා පච්ඡි, කුවෙණී නාම, කුමිම් "පියං කුවෙණී කුමිනං"ති පරියායො වුත්තො, **'ධනුපාසවාගුරාදිනෙසාදභණ්ඩං'** ති ධනුදණ්ඩනුකූටපාසඋද්දුක්ඛලවාගුරාදිකං නෙසාදභණ්ඩං. **'පක්කලොහිතානී'**ති ආමකලොහිතානි, **'ඛාදනත්ථා'**ති ඛාදනත්ථාය මරණං සන්ධාය, **'මරණස්ස නභායසී'**ති මරණතො නභායසි, භිධාතුයොගෙ අපාදානෙ ඡට්ඨී, යථා 'සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො'තිආදිසු විය. **'ධම්මිස්සරිනා'**ති ධම්මෙන සත්තානං ඉස්සරභූතෙන භගවතා ඊරිතං කථිතං. **'කිඤ්චන'**න්ති කිම්පි භයන්ති සම්බන්ධො. **'නාගින්ද'**ති තං ආලපති. **'වජිරුබ්භවො'**ති කිලෙසසෙලඛණ්ඩපදාලන සමත්ථතාය වජිරභූතො ධම්මො, වධජරුබ්භවොතිපි පාඨො, අයං ධම්මො වධජරාදිඅන්තරායං කරොතීති අත්ථො. **'වද තං සබ්බෙ'**ති, සබ්බෙ ත්වං මය්හං තං ධම්මං වදෙහි **'අවිසංකා'**ති නිරාසංකා හුත්වා. **'භාගසො'**ති භාගෙන. **'මිතො'**ති පමිතො. **'වීතසර'**න්ති රතිවිරහිතං වීතස්සරං. **'විභාවිතු'**න්ති විභාවෙතුං පකාසෙතුං වණ්ණෙතුං. **'යස්ස අයොමයොනද්ධං අග්ගිජාල'**න්ති යස්ස නිරයස්ස අයොමයකපාලෙන ඔනද්ධං අග්ගිජාලං. **'බහල'**න්ති මහාඝනං **'අග්ගිජට්ටාදිත්ත'**න්ති අග්ගිජාලෙනආදිත්තං. **'අණ්ණවොදක'**න්ති ගම්භීරපක්ඛුභිතං ඛාරොදකං, **'චතුද්දිසාතො'**ති චතූහි දිසාහි. **'තස්සන්තොවසමානස්සා'**ති තස්ස පාපකස්ස පුග්ගලස්ස අන්තො නිරයකුච්ඡියං වසමානස්ස. **'සුඛුමාලසරීරිනො'**ති සුඛුමාලසරීරස්ස. **'විලීයමානගත්තස්සා'**ති විලීනගත්තස්ස. **'ඵලන්තස්සා'**ති පක්ඛලන්තස්ස. **මුච්ඡන්තස්සා'**ති විසඤ්ඤීභූතස්ස. **'ආසභගාභිතුන්නස්සා'**ති ආසාභිතුන්නස්ස දුක්ඛෙන අභිතුන්නස්ස. **'ආයාසෙනා'**ති උපායාසෙන දුක්ඛෙන කසිරෙන. **'විකම්පනො'**ති විප්ඵන්දමානස්ස නාථරහිතස්ස

* සාලූරසංඝොති මු: ර: යං: † බලිසාදයොති මු: ර: යං:

'සිම්බලිං'ති සිම්බලිවනං. 'අයොමය' න්ති අයොමයං යට්ඨිං, 'ජාලාමාලාපරික්ඛිත්ත'න්ති ජාලාමාලාය පරික්ඛිත්තං. 'උද්ධං යොජනමුග්ගත'න්ති උද්ධං යොජනං උග්ගතං. 'තාඩයන්තො'ති විජ්ඣන්තො, 'දීනො'ති ඛීනො. 'උබ්බත්තචාතා'ති උපරිකාචාන. 'ජනකසො' තියමපාලො. 'මිනිම්ලෙනො'ති විගතනිම්සො හුත්වා, අනිමිසචක්ඛුත්තිඅත්ථො. 'ගුහය'න්ති ගූහයන්තො ගුප්පපන්තො. 'විජෙනො'ති විගතච්ඡන්නො. 'නඅක්ඛාණෙන පත්තබ්බ'න්ති අක්ඛාණෙන වණ්ණෙතුං පත්තබ්බං. 'අන්තර'න්ති වෙමජ්ඣං. 'නිරයග්ගි ඉධග්ගින'න්ති නිරයෙ අග්ගි ඉධලොකෙ පකතිඅග්ගිනාපි. 'තිසතනිසතවිධසා'ති තිසතසත්තවිධස්ස පොසස්ස. 'හිමවා සාසපන්තර'න්ති හිමවා පබ්බතො සාසපස්ස වෙමජ්ඣං. 'ගූථනිරයො'ති එකො, 'උස්සදනිරයො'ති එකො. 'කුක්කුල'න්ති එකො. 'කොටිසිම්බලි'ති එකො. 'අසිපත්තවන'න්ති එකො. 'ඛාරොදකානදී'ති එකො. 'අඞ්ගාරපබ්බතො'ති එකො. 'සංඝාතො'ති එකො. 'රොරුවො'ති එකො. 'කාලහත්ථී'ති පබ්බතප්පමාණො කාලහත්ථී එකො. 'මහායන්තො'ති යන්තපබ්බතනිරයොති එකො. 'ලොහකුම්භාදිකා'ති එත්ථ ආදිසද්දෙන සංජීවො කාලසුත්තො පතාපො අවීචිනිරයො ච සබ්බං ගය්හතීති වචනබ්යණෙහි. 'අම්හිතා'ති නමිතා. 'හිංසා'ති හිංසක රූපා. 'දුබ්බචා'ති දුබ්බචනීයො අවණ්ණනීයො. 'කිං නුපාදෙ දක්ඛිස්සන්ති' මම පාදෙ කිං නු දක්ඛිස්සන්තීති අසද්දහන්තො 'ඉසීන' න්ති බුද්ධාදීනං ඉසීනං. 'න තං පස්සාමි ආලය'න්ති තං නිරයසඞ්ඛාතං ආලයං න පස්සාමි. 'පතිකාරපථාසි'ති සප්පටිකම්මො සීතොපි. 'එකජාලීකතාන'න්ති එකජාලභූතානං. 'පරිරුද්ධා'ති උපරිඨිතා. 'අතිමජ්ඣදුබ්බස්සපථ'න්ති අති අප්පතරස්ස රාජසම්පත්ති ආදිකස්ස අත්ථාය. 'සම්මුහුත්තෙන තා'ති යං පාණාතිපාතාදිකම්මං කිබ්බිසං මුහුත්තෙන. 'සෙනාය'න්ති යෙන මොහෙන අයං ලොකො. 'අමනෙවා'ති අමනොසධස්මිං. 'හත්ථගතෙ'ති පාණහනනසමත්ථෙ විසයෙ එකාකිස්මිං හත්ථගතෙ; අවසානගාථායං 'පුරෙපනෙකො'ති පුබ්බෙ එකො නරා පන. චරන්තීති යොජනා. 'පනුදිත්වා' ඉති පනුදිත්වා. 'ජිනප්පසත්ථා'ති බුද්ධප්පසත්ථා. අයං ගාථා උපජාති නාම.

**නෙසාදස්ස වත්ථුං දුතියං.**

---

තතියෙ 'සුතං සබ්බ'න්ති සබ්බධම්මං අත්තනා සුතං. 'එකසස්සුතියා' ති එකවාරසවණාය. 'අනඤ්ඤවිහිතා'ති අඤ්ඤනඤ්ඤතං සඤ්ඤං අකත්වා. 'පෙමපාසෙනා' ති සිනෙහපාසෙන. 'ගාළ්හ'න්ති දළ්හං. 'ර

ගසක්ඛිණීසා’ති රාගසඞ්ඛාතාය යක්ඛිනියා ‘විඨා’ති විඨා ආවිසිතා. ‘රාගධම්මෙන ධම්මිතා’ති රාගවෙගෙන තාසිතා. ‘රාගපජ්ජොත’න්ති රාගපජ්ජලිතං පදීපං. ‘රතනීස’න්ති තණ්හාරත්තියං. ‘විසම ජ්ඣෙස’න්ති රාගසඞ්ඛාතෙ විසමෙ මග්ගෙ ‘අජගරොරගසද්දූලඅච්ඡ ව්‍යාලසඞ්කුලාකුලෙ’ති අජගරසප්පමහොරගබ්‍යග්ඝඉක්කතරක්ක සඞ්කුලෙහි ආකුලභූතෙහි. ‘උණ්ණාසකුණහුංකාර අසිවොරුසිවාරුතෙ’ති උණ්ණා ච සකුණා ච හුංකාරා ච අසිවා ච උරුසිවා ච තෙහි රුතෙහි විරාවෙහි, තත්ථ උණ්ණාසකුණාති සකුල සකුණා, හුංකාරොසකුණා විසෙසා. අසිවාති මහාසිවා. උරුසිවාති ඛරුකා. ‘ආමපක්කසුසානෙ’ති ආමකසුසානපක්කසුසානෙසු ‘කාඩානදූතිසං ගණෙහ’න්ති දූතියං කරිත්වා. ‘සආවුධ’න්ති රාගාවුධෙන සහිතං. ‘ගහණං වනසංඝුන’න්ති තණ්හාගහණං ගහණෙණති යුත්තං වෙළුගුම්බගන්ථකගච්ඡගණසංයුත්තං වා. ‘අගා’ති අගමාසි. ‘අපගතාභෙරවා’ති විගිවතතාභයභෙරවා. ‘භායාමහ’න්ති භායාමි අහං ඉති යදි භායෙය්‍යාති සම්බන්ධො. ‘භයංගාසං හා සිතුතිමං’න්ති භයස ජාත ... ‘විවිධසංසාරෙ’ති විවිධස අසාරෙති ජෙදෙ, ... තං ආලපති, ‘ඵෙණවිකිර ...’ති ඵෙණෙනි විකිණෙණ. ‘සලිලණ්ණවෙ’ති මහාසලිලෙ අගාධෙ මහාසමුද්දෙ. ‘චන්දසම්මවනනා’ති චන්දබිම්බ. ‘නීලනාරකී’ති නීලනෙත්තා. ‘ජලධිනාරකති’ති සමුද්දං තරන්ති. ‘කාමිනී’ති කාමිනි අසි ‘උරගපති’ති තං ආලපති ‘ජීවා’ති ජීවාහි. ‘භරියාසො’ති භරියායො. ‘රමනතු’ති රමන්තු. ‘සුණා’ති සුණාහි. ‘චිත්තවසගාහ’න්ති චිත්තාවසස්සගාඩං පතිඩංගත්තා අහන්ති අහං. ‘වාමකරගොරු’ති සුන්දරකරගොරූති ආලපති. ‘මහානිසාය’න්ති මහාතිමිරෙ ‘පාණාධිකො’ති මම පාණතරො පියො ‘නෙවො’ති සාමිකො. ‘ගතිං’ති පරායනං. ‘බාලෙ’ති අනාදරෙ නාලපනං. ‘වඳු’ති වදාහි. ‘දළ්හභත්තිනා’ති දළ්හපෙමා දළ්හභත්තිකා. ‘සභාබිකා මෙ’ති මම සඛිනී; ඔසානගාථායං. ‘සාධුධම්මෙ’ති කුසලධම්මෙ ‘ධම්මානුපෙක’න්ති ධම්මෙන උපෙතං ධම්මූපසඤ්හිතං. ‘අවෙනති’ති එතානි අභිගමෙන්ති පවෙත්ති; අයං ගාථා උපජාති නාම.

සෙට්ඨිධීතාය වත්ථුං නිට්ඨිතං.

---

චතුත්ථෙ ‘එකං සල්ලක’න්ති එවනාමකං සූචිලොමසල්ලං. ‘සල්ලො’ති සල්ලකො. ‘සූචිසො’ති තස්ස ලොමභූතාසූචියො. ‘ගොරූපකෙ’ති ගොයූථෙ. ‘සඤ්ඤපයන්තා’ති සද්දං කුරුමානා. ‘ද්‍රෝණ’ති

දුක්ඛප්පත්තෙන සහායෙ. 'පරම්මුඛා'ති පරාඞ්මුඛා, යස්ස කස්සචි නිසින්නා මුඛං දට්ඨුං අසක්කොන්ති අත්ථො. 'මිත්තපතිරූපා'ති අමිත්තා මිත්තපතිරූපකා. 'විනාසන'න්ති මනසොනුතාපකරණං. 'පාණාතිපාතාදෙසාදිපාපානො'ති පාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාර මුසාවාද සුරාමෙරයාදිපාපතො. 'මඤ්ජුභාණී'ති මඤ්ජුභාණී, අයමෙව වා පාඨො, 'සමමිත්තලක්ඛණං'ති සුමිත්තලක්ඛණං. 'මිත්තානං දිසො'ති මිත්තානං දෙසොපි යො. 'අත්තසත්තුකො'ති අත්තනාව අත්තනො පතිසත්තුභූතො; ඔසානගාථායං:- 'උත්තමමජ්ඣිමාධමෙ'ති උත්තමෙ මජ්ඣිමෙ හීනෙ ච මිත්තෙ. 'තදා තදා යෙහි සියා පයොජනං'ති තදා තදා කාලෙ තං මිත්තකරණං අත්තනි යොජනං සියා. 'දුක්ඛෙන එකො පිසවෙථ තෙ'ති තෙ එවරූපෙ එකොව ඉධලොකෙ දුක්ඛෙන පසවෙ පසවෙය්‍ය; අයං ගාථා උපජාති නාම.

කාණසිගාලස්ස වත්ථුං චතුත්ථං.

පච්ඡිමෙ 'දූරපරිවජ්ජං'ති දූරපරිවජ්ජනං මූලභරියකමෙව ඨපෙත්වාති අත්ථො. 'හාරකෙයූරකටකනූපුරාදී'ති මුත්තාහාරකෙයූර හත්ථපාදවලයාදි. 'උස්සවං'ති ඡනං. 'හරිණො'ති මිගො. 'කලිඞ්ගනෙත්තා'ති කළලනෙත්තා, අයමෙව වා පාඨො. 'එත්ථ අත්ථී'ති එත්ථ හි අත්ථි. 'කන්තදස්සනා'ති කන්තදස්සනා. 'වදනං'ති මුඛං. 'මත්තචක්ඛී'ති මත්තචක්ඛුකා. 'විනෙතා'ති විනා එතා. 'කාමුකං'ති පුරිසං. 'ගජානන'න්ති හත්ථිමුඛං. 'ආසිලිස්සති'ති විනාදිස්සති. 'තෙනෙ විසුං විසුං'ති එතෙ විනා හුත්වා නසොභන්ති. 'ඉන්දජාලකරූපොව'ති මායාකාරානං ඉන්දජාලාවිලාසරූපො ඉව. 'අමෙජ්ඣපොත්ථකො'ති දුම්මෙධානං පොත්ථකොව. 'චින්තිතො'ති චින්තිතකො. 'එකවාරෙනා'ති එකස්මිංයෙව මුඛවාරෙ. 'එකරත්තිපරිවාසා'ති කුච්ඡියං එකරත්තිමත්තම්පි පරිවාසනො. 'උක්කාරූපමො'ති උක්කාරභූමිසමො. 'කාකො'ති වනකාකො මහාකාකො. 'සොණො'ති සොණසිගාලො. 'රාගරත්තා චක්ඛුන'න්ති රාගෙන අන්ධිකතානං චක්ඛූනං. 'ජරාය අනුසටො'ති ජරාය උපද්දුතො. 'මන්තයුධෙනා'ති මන්තෙත්වා යුධෙන මන්තං ජපෙත්වා යුධෙන වා. 'භයානම්පිස්ස නරූච්චති'ති භයානම්පිස්ස නච්ඡාදෙති භත්තංභුජිතුං අස්ස චිත්තං නරුච්චතීති අත්ථො. 'එසො පරමො අපරජ්ඣති'ති තස්ස ච සාමී

නං අයං අත්තනො පරපටිබද්ධානි මයාම්පි ච ගරහානි යොජනා. '**දණ්ඩනාදිකං**'ති දණ්ඩං ආදදන්තීති=දණ්ඩාදනං තං ආදි වධබන්ධන තාලනාදීනං තෙ හොන්ති=දණ්ඩනාදිකා. '**අසය්හං දුක්ඛං**'ති අසය්හං නිරයදුක්ඛං. '**ඡට්ඨාභිඤ්ඤ**'ති ඡට්ඨාභිඤ්ඤා, අයමෙවවා පාඨො. '**කාමං**'ති යථාකාමං. '**සරදබ්භ**'න්ති සරදෙ අබ්භං මෙඝං ආකාසං වා. '**වට්ටිකං**'ති දීපවට්ටිකං. '**වණ්ණුතෙලෙනා**'ති බහුවාරං පච්චිතෙන කාපොතිකවණ්ණෙන සුගන්ධතෙලෙන. '**දීපංකුරුතෙ**'ති දීපං ජලීයතෙ. '**නිග්‍රොධොදුම්බරස්සත්ථපුප්ඵදුමවිභූසිතො**'ති නිග්‍රොධපුප්ඵ උදුම්බරපුප්ඵ අස්සත්ථපුප්ඵදුමෙන පිළන්ධිතො. '**මහාරාජීවකානන**'න්ති මහන්තරාජීඉව කානනං වා. '**කෙරවං වනං**'ති කුමුදවනං කෙරවං චන්දකන්තං චන්දිකං කුමුදං ති පරියායො. '**අතිදක්ඛා**'ති අමනුස්සෙන පරමාරණතො භූතවෙජ්ජා. '**අධුනානික්ඛිත්තං**'ති අධුනා නික්ඛිත්තං ඡඩ්ඩිතං. '**උදකපසතං**'ති පසතමත්තං උදකං. '**දට්ඨොට්ඨා**'ති * දට්ඨ උත්තරාධරොට්ඨා. '**හිමලොචනො**'ති හෙසම්චක්ඛුකො. '**මන්තං පරිවත්තෙත්වා**'ති මන්තං ජපිත්වා. '**අමනුස්සං ආවහෙත්වා**'ති අමනුස්සං ආවිසාපෙත්වා. '**වධායොපක්කමෙ**'ති වධාය උපක්කමෙය්‍ය. '**අලභිං ගුණභාජනං**'ති ගුණසඞ්ඛාතං භාජනං අලභිං. '**සිවාමච්චාව වානිජ**'න්ති සිවනාමො අමච්චො ඉව නන්දිවානිජං වධාය උපක්කමි. '**වීතරණ**'න්ති විගත සංගාමං. '**චතුමාරරණඤ්ජය**'න්ති දෙවපුත්තකිලෙසාභිසංඛාරක්ඛන්ධසංඛාතං චතුමාරරණං. '**කරුණාගුණජ**'න්ති කරුණාසඞ්ඛාතගුණතො ජාතං, කරුණානිසංසතො ජාතං වා. '**පරිපීතාමතරස**'න්ති පරිපීතං අමතරසං. '**පුඤ්ඤාකර**'න්ති පුඤ්ඤස්ස ආකරං සඤ්ජාතට්ඨානභූතං. ඔසාන ගාථායං:—'**ඛලු**'ති එකංසෙන. '**සුඛුද්‍රයානි**'ති සුඛස්ස උදයභූතානි.

**නන්දිවාණිජකස්ස වත්ථුං පඨමං.**

ජඨෙ '**යන්තං හති**'න්ති යං වා තං වා හතිකම්මං, යන්තාහතින්තිපි පාඨො, උච්ඡුයන්තපීළනෙන හතීන්ති අත්ථො. '**සකම්ගිතනාදණද**'න්ති එවන්නාමකං මහාවනං, සෙසං වුත්තනයමෙව:—අවසාන ගාථායං, '**සන්තො**'ති සප්පුරිසා. '**සීලසඤ්ඤමෙ**'ති සීලෙ ච සංයමෙ ච. '**අත්ත**'න්ති චිත්තං. '**නිවෙසෙථා**'ති නියොජෙථ. '**පයාථා**'ති ගමිස්සථ පාපුණිස්සථ, අයං ගාථා උපජාති නාම.

**නකුලස්ස වත්ථුං ජඨං.**

* දට්ඨාධ. මු. ර.

සත්තමෙ 'පරික්ඛීණස්සා'ති තතො පරික්ඛීණං සස්සං. 'භවාභවෙ'ති භවෙභවෙ. 'තිතික්ඛ'න්ති තිතික්ඛාමි සහාමි. 'සිත්ථමත්තමපී'ති එකං සිත්ථමත්තම්පි උළාරං. 'බුද්ධලා'ති බුද්ධස ඛාතා මහග්ඝිතා, සිත්තු ලභතෙ න ලභතෙ. 'අලද්ධනා'ත් අලද්ධභත්තාහාරා, 'විච්ඡඩ්ඩිත'න්ති සන්ථාරඨානාදිසු තත්ථ විච්ඡඩ්ඩිතං. 'නිට්ඨුභිත'න්ති තත්ථ ජනෙහි ඛෙලසිඞ්ඝානිකාදිකං නිට්ඨුභිතං. 'විජාතාන'න්ති විජාතානං ඉත්ථීනං, තාපයන්තං අපෙපාසිතං. 'මල'න්ති ගබ්භමලං. 'ඉදානජ්ජා'ති ඉදානි අජ්ජ. 'කතඤ්ඤූ'ති අත්තනො පරෙහි කතගුණං ජානාතීති=කතඤ්ඤූ, කතං විදති ජානාතීති=කතවෙදී. 'සාලිඛාර'න්ති ධඤ්ඤවුත්ථිඛාරං; ඔසාන ගාථායං:–'සද්ධො'ති සද්ධාවන්තො පුග්ගලො. 'දානවාහන'න්ති දානමයං යානං. 'සීලමයාතපත්ත'න්ති ආතපං තායති රක්ඛතීති=ආතපත්තං, ඡත්තං, සීලමයං ආතපත්තං=සීලමයාතපත්තං, සීලසංඛාතඡත්තං ධාරෙය්‍යාති අත්ථො. අයම්පි ගාථා උපජාති නාම.

අම්බාමච්චස්ස වත්ථුං සත්තමං.

අට්ඨමෙ 'මිත්තං දුභෙති'ති අත්තනො මිත්තං මිත්තධම්මතො දුභති. 'කතං විනාසෙති'ති අත්තනා කතං උපකාරං විනාසෙති. 'කාම'න්ති එකංසෙන. 'නාත්තනොපි සරං හොති'ති අත්තනො සරංපි න අත්තනො සරං ඉති හොතීති අත්ථො. 'උපස්සපති'ති උපගච්ඡති. 'ධිති තං පටිසෙධෙනති'ති ධිති ගරහායං නිපාතො, ධිරත්‍ථු තෙ ඉතිව, තං පන පටිසෙධෙන්තීති අත්ථො. 'ලොකවජ්ජානි'ති වදස්ස භාවො වජ්ජං, ලොකස්ස වජ්ජං=ලොකවජ්ජං, සොකවජ්ජානීතිපි පාඨො, සොකදෙසානීති අත්ථො. 'අවණ්ණො'ති දෙසො, අවණ්ණභණනං වා. 'අවමඤ්ඤන්ති'ති අතිමඤ්ඤන්ති. 'නිරියගමනො'ති නිරච්ජානගතෙ. 'සො භාගී සබ්බදුක්ඛස්සා'ති සො නරො සබ්බදුක්ඛපපත්තනස්ස භාගී භවති,

වානරස්ස වත්ථුං අට්ඨමං.

නවමෙ 'තිදසසූරියෙනා'ති ගිම්හකාලසූරියෙන. 'වනගහණං මිලානං සීතපණ්ණ'න්ති වනං ගච්ඡගුම්බලතාගහණං ච මිලානං තුරාලීනං සංකුචිතපත්තං. 'ඝම්මාභිතත්තා'ති අති උණ්හාභිභූතත්තා. 'බලං පොථෙන්තො'ති බලමණ්ඩලං ධඤ්ඤකරණමණ්ඩලං පොථෙන්තො. 'නාකම්භා'ති නකාරිම්භ. 'අදස්සභත්ත'න්ති භත්තං අදත්වා. 'ලාභො නත්‍ථොතො පට්ඨිව දූරෙ'ති ලාභො අම්හෙහි දූර

නභතො පඨවී ඉව. '**ඉතො චිතො සිබ්බිතමූලකානන**'න්ති ඉතො ච ඉතො ච තුන්නකාරෙන අග්ගලදූප කරණවසෙන සංසිබ්බිතං මූලවත්ථං. '**සායුකාමණ්ඩ**'න්ති උක්කණ්ඨසදිසං මණ්ඩභූතං. '**හත්ථිගවාස්සාමහිසාදිනානාකුලාකුලාන**'න්ති හත්ථී ච ගාවො ච අස්සා ච මහිසා ච ආදී යෙසං තෙ=මහිසාදයො, නානාකුලෙහි ආකුලා=නානාකුලාකුලා මහිසාදයො ච තෙ නානාකුලාකුලා චෙති=මහිසාදිනානාකුලාකුලා, තෙසං මහි=පෙ=කුලානං. '**කුලානමජ්ඣෙ**'ති අඩ්ඪානං කුලානං මජ්ඣෙ ජාතා අහං. '**දීනා**'ති ඛීනා දලිද්දා. '**ඤුඤ්ඤුච්ඡිතා**'ති බහුපුඤ්ඤූපචිතා. '**සෙම ජමාස අමෙන**'ති මයං ජිමායං සයාම. '**ලුද්ධම්පි අප්පන්ති**'ති මම දානං ලුද්ධං ඉති ච අප්පං ඉති ච. '**නිධෙමා**'ති නිදහිස්සාම. '**ගිහිකොපින**'ති අගජානං. '**ඡහිතභවබන්ධනො**'ති විගතසංයොජනො. '**ජයම්පතිත්ත**'න්ති ජයම්පතිභාවං. '**නපෙසඨකාස්සාමා**'ති නපෙපඨා අකස්සාමාති ඡෙදො, අකස්සාමාති කරිස්සාමාති විපල්ලාසොයං. '**ඉමං කිලින්නභොජන**'න්ති ඉමං සංකිලිට්ඨභොජනං. '**දිසාපක්කන්තා**'ති දිසාසු පක්කන්තා. '**ජයම්පතිකා**'ති ජායාච පතිච. '**දානාදිනං කාස්සා**'ති දානාදිනං පුඤ්ඤකම්මානං කස්ස කම්මස්ස, නිද්ධාරණෙ චෙතං සාමිවචනං· '**කදන්නමන්න**'න්ති කුච්ජිතං අන්නං ලාමකං කිලින්නං භත්තං. '**මහාවිභූති**'න්ති මහාසම්පත්තිවන්තං. '**දානෙ**'ති සංසසංඛාතෙ සුට්ඨුදානෙ. '**වසනං ඉධා**'ති ඉමස්මිං ඨානෙ වසන්තානංවා. '**කිත්තකාවතකො**'ති කිත්තකප්පමාණො. '**අපාපකම්මා**'ති තුමෙහ පාපරහිතකම්මන්තා වසිස්සථ. '**අනන්තරා**'ති එකං බුද්ධන්තරං. '**කෙතුමති**'න්ති එවන්නාමකං රාජධානිං. '**මුනිනො සකාසෙ**'ති මුනිනො සාසනෙ, ඔසානගාථායං. '**දානමයනාව**'න්ති දානසංඛාතං නාවං. '**අනූනපඤ්ඤ**'ති අනන්තපඤ්ඤවන්තා. '**සංසාරපාපදුරිතාකරසාගරස්සා**'ති සංසාරසංඛාතස්ස පාපස්ස දුරිතභාවානං ආකාරභූතස්ස සාගරස්ස. '**පසන්ති**'ති ගච්ඡන්ති. අයං ගාථා වසන්තතිලකානාම.

**ජයම්පතිකානං වත්ථුං නවමං.**

දසමෙ '**උපද්දුතා**'ති දූසිතා පීළිතා '**ඉන්දවාරුණිරුක්ඛමූල**'න්ති ඉස්සරභාවෙන ඉන්දසදිසත්තා ඉන්දො ච සො වාරුණො චාති=ඉන්දවාරුණො, ඉන්දවාරුණොව සො රුක්ඛොචාති=ඉන්දවාරුණිරුක්ඛො ඉන්දවාරුණිරුක්ඛස්ස මූලං=ඉන්දවාරුණිරුක්ඛමූලං, තං ඉන්ද=පෙ=රුක්ඛමූලං; පාඨෙ තස්ස මූලං සමීපන්ති විග්ගහො, '**පච්ඡිමාලොපංඨපෙත්වා**'ති පච්ඡිමං ආලොපං ඨපෙත්වා. '**ගන්තසිඩිආස**'න්ති ගන්ත්වා

පිඩෙ තණ්ඩුලං. **'වාසර'**න්ති දිවසං. **'තස්සජ්ජ මම මඞ්ගල'**න්ති තස්ස භික්ඛුනො දස්සනං මම අජ්ජ මඞ්ගලං හොති; තෙන වුත්තං:-

ඛන්ති ච සොවචස්සතා සමණානං ච දස්සනං
කාලෙන ධම්මසාකච්ඡා එතං මඞ්ගලමුත්තමං ති,

**'අකාලික'**න්ති දීඝකාලවිරහිතං. **'අහො'**ති අච්ඡරියං. **'ඛෙත්තමුත්තමකා'**ති ඛෙත්තසෙට්ඨතා; ඔසාන ගාථායං, **'සීලවන්තම්හීස'**න්ති සීලවන්තාරියපුග්ගලාවනියං. **'සඩාලවාලවලයෙ'**ති සඩා ච ආලවාලා=සඩාලවාලා, සඩාලවාලාව සා වලයොචෙති=සඩාලවාලවලයො, තස්මිං සඩාලවාලවලයෙ **'ජනිතකප්පමහාදුමින්දෙ'**ති දානබීජතො ජනිතො කප්පඞ්ඛිමහාකප්පරුක්ඛරාජා. **'ලභතෙ'**ති රොපකො පුග්ගලො ලභති, අයං ගාථා වසන්තතිලකා නාම.

**දෙවපුත්තස්ස වත්ථුං දසමං.**

වත්ථුද්දානං

සිළුත්තො නෙසාදො හෙමො කානසිගාලකො තථා
නන්දිවාතිජනකුලොච අග්ගාමචෙවා වානරො තථා
ජයම්පතී ච නවමො දසමො රුක්ඛදෙවතා,

**ඉතිපරම=සෙ=වීකාසමත්තා.**

**සීළුත්තවග්ගො නවමො.**

දසමස්ස චූලගල්ලවග්ගස්ස පඨමෙ. **'පධානසරසම්'**න්ති පධාන මනුයුත්තානං සීතණ්හාභූතෙ සරෙ. **'එකාදසහි'**හි තිකටුකතිඵල චතුමධුරසඞ්ඛාතෙහි දසහි ඔසධෙහි, දසමූලිකෙහිපි කෙචි. **'චීවර කොඛකො'**ති චීවරපාරුපනාරහට්ඨානෙ. **'සුපටිච්ඡන්න'**න්ති පුර තො ච අනොලම්බන්තං තිමණ්ඩලිකං සුපාරුතං. **'විජමානො'**ති උණ්හපරිළාහවූපසමත්ථං වීජයන්තො. **'පූරිතපාරමිසො'**ති මුහුත්ත ජිනසන්තිකෙ ලද්ධබ්‍යාකරණො කප්පසතසහස්සාධිකානි සොළස අසංඛෙය්‍යානි පූරිතසමතිංසපාරමී, මෙත්තෙය්‍යො හි බොධිස ත්තො ඉතො කප්පසතසහස්සධිකානං සොළසන්නං අසඞ්ඛෙය්‍යානං මත්ථකෙ ජම්බුදීපෙ පභාවන්තො නාම චක්කවත්තිරාජා හුත්වා ද්විසහස්සදීපපරිවාරිතෙසු චතුසු මහාදීපෙසු සත්ත පංචසීලෙසු පතිට්ඨාපෙත්වා ධම්මෙන සමෙන රජ්ජං කාරෙසි, තදා මුහුත්තො නාම සම්මාසම්බුද්ධො ලොකෙ උදපාදි, සො ධම්මචක්කං පවත්තෙත්වා අනෙකසතසහස්සවසීගණපරිවුතො සත්තෙ විනයන්තො තත්ථ තත්ථ විහාසි, අථ රාජා චක්කවත්තී බුද්ධො ලොකෙ උප්පන්නොති සුත්වා ඡත්තිංස යොජනිකාය පරිසාය පරිවුතො භගවන්තං උප

සංකමිත්වා සත්තරතනෙහි පූජෙත්වා වන්දිත්වා පරිසාය සද්ධිං එක මන්තං නිසීදිත්වා ධම්මං සුත්වා පසන්නචිත්තො චක්කවත්තිවිභූතිං පහාය පබ්බජිත්වා රතනත්ථෙරො නාම හුත්වා ගගනතලෙ චන්දො විය පාකටො බුද්ධසාසනෙ ලොකියඉද්ධියා ජොතෙන්තො අට්ඨධම්ම සමොධානෙන බුද්ධත්තං පත්ථෙසි, සම්මාසම්බුද්ධො සම්පජ්ජිස්සති නු ඛො ඉමස්ස පත්ථනාති අනාගතංසඤාණං පෙසෙත්වා ඉතො කප්ප සතසහස්සාධිකානං සොළසන්නං අසඞ්ඛෙය්‍යානං මත්ථකෙ එකස්මිං භද්දනාමකෙ කප්පෙ ගොතමබුද්ධස්ස නාම භගවතො පච්ඡාභාගෙ මෙත්තෙය්‍යො නාම බුද්ධො භවිස්සතීති අද්දස, අථ ඛො භගවා රතනත්ථෙරං චතුන්නං පරිසානං මජ්ඣෙ පාකටං කත්වා බ්‍යාකාසි, තෙන වුත්තං:-

කප්පසතසහස්සම්හි සොළසෙ ච අසංඛියෙ
මෙත්තෙය්‍යො නාම නාමෙන බුද්ධො ලොකෙ භවිස්සති
සඤ්ජාතනගරන්තස්ස කෙතුමති භවිස්සති
මාතා බ්‍රහ්මවතී නාම සුබ්‍රහ්මා නාම සො පිතා
පරෙහිතො සංඛරඤ්ඤො මෙත්තෙය්‍යස්ස භවෙ සදා
අසොකො බ්‍රහ්මදෙවො ච අග්ගා හෙස්සන්ති සාවකා
සීහො නාමස්සුපට්ඨාකො උපට්ඨිහි ච තං ජිනං
පදුමා සුමනා චෙව අග්ගා හෙස්සන්ති සාවිකා
සුමනො චෙව සංඝො ච භවිස්සන්තග්ගුපට්ඨකා
යසවතී ච සංඝා ච භවිස්සන්තග්ගුපට්ඨිකා
බොධි තස්ස භගවතො නාගරුක්ඛොති වුච්චති
අසීතිවස්සසහස්සා ආයු තස්ස මහෙසිනො
අට්ඨපඤ්ඤාසරතනො උග්ගතො සො මහාමුනී ති,

**'කණ්ඩසෙතච්ඡත්ත සතසහස්සෙහී'**ති එත්ථ කන්තසෙතච්ඡත්ත සතසහස්සෙහීතිපි පාඨො, කන්තෙහි මනාපෙහි සෙතච්ඡත්ත සත සහස්සෙහීති අත්ථො. **'සෙතඞ්ගරාගලිත්තඞ්ගා'**ති සෙතඞ්ගොචෙව සෙතවණ්ණඞ්ගරාගෙහි ලිත්තඞ්ගො ච. **'සන්දන'**න්ති රථං. **'ඔභා සයං'**ති ඔභාසයන්තා. **'පණ්ඩරච්ඡත්තෙනා'**ති සෙතච්ඡත්තෙන. **'පතා කායො'**ති කදලියො. **'ධජෙ'**ති මහාධජෙ. **'සෙලෙන්තා'**ති ධ ජෙහි අපාකටසද්දං කරොන්තා. **'විජෙන්ති'**ති විජයන්ති. **'පඤ්චඞ්ගි කානී'**ති:-

ආතතං චෙව විතත මාතතවිතතං ඝණං
සුසිරංචෙති තුරියං පඤ්චඞ්ගිකමුදීරිත න්ති,

එවං වුත්තානි පඤ්චඞ්ගිකානි. **'සත්තසරානුගං'**ති සත්තහි ස රෙහි අනුගතං, විණාය හි සරා සත්ත හොන්ති, ගාමා තයො, මුච්ඡනා

එකවීසති මුච්ඡනායො, එකෙකස්ස සත්තසත්තානිඑකූනපඤ්ඤාස ඨානානි හොන්ති, තෙන වුත්තං:-

සරා සත්ත තයො ගාමා චෙකවීසතිමුච්ඡනා
ඨානානෙකූනපඤ්ඤාස ඉච්චෙතං සරමණ්ඩලන්ති,

සත්ත සරා නාම උසභාදයො, තෙන වුත්තං:—

උසභො ධෙවතො චෙව ඡජ්ජගන්ධාරමජ්ඣිමා
පඤ්චමො ච නිසාදෙති සත්තෙතෙ ගදිතා සරා,ති

තෙසු පන

ඡජ්ජං නදන්ති මයුරා ගාවො නදන්ති උසභං
අජා නදන්ති ගන්ධාරං කොඤ්චා නදන්ති මජ්ඣිමං
පුප්ඵසාධාරණෙ කාලෙ කොකිලො ගෙති පඤ්චමං
අස්සා තු ධෙවතං ගෙති නිසාදං ගෙති කුඤ්ජරොති

තයො ගාමාති එකෙකතන්තිසරො තයො සරසමූහා, තෙන වුත්තං:-

ඡජ්ජො ච මජ්ඣිමො ගාමා තයො සාධාරණො ති ච,

එකවීසතිමුච්ඡනාති තෙසු සත්තසු සරෙසු එකෙකස්මිං තිස්සො තිස්සො මුච්ඡනාති එකවීසති, තෙන වුත්තං:-

සරෙසු තෙසු පච්චෙකෙ
තිස්සො තිස්සො හි මුච්ඡනා ති,

ඨානානෙකූනපඤ්ඤාසාති තත්ථෙකෙකස්මිං සත්තසත්තඨානානි සියුං, තෙන වුත්තං:-

සියුං තථෙව ඨානානි
සත්ත සත්තෙව ලබ්භරෙ ති,

සත්තසු ච සරෙසු ද්වාවීසති සුතියො හොන්ති

තිස්සො ද්වෙ චතස්සො ච චතස්සො කමතො සරෙ
තිස්සො ද්වෙ චතස්සොති ද්වාවීසති සුතී සියුන්ති,

මහාටීකායං පන අඤ්ඤථාව වුත්තා සුතියො, වුත්තං හි තත්ථ:-

චතුරොසුති විඤ්ඤෙය්‍යා පඤ්චමො පඤ්චමෙයිතො
තිසුති පාපිතං ධාරො පතිසුති උසභො තථා
ඡජ්ජොචතුසුති ඤෙය්‍යො තිස්සො ද්වාවීසුතී තථා
චතුසුති ධෙවගොති පඤ්චමොති සුතිමතො ති

සබ්බමෙතං නාම සත්තතො ගහෙත්වා කාතබ්බන්ති. '**තාරාදිලය සංයුතං**'ති තාරො ආදි යෙසං ලයමණ්ඩානං තෙ හොන්ති=තාරාදයො, තාරාදයො ච තෙ ලයා චෙති=තාරාදිලයා; එත්ථ හි:-

උච්චතරෙ රවෙ තාරො අච්චන්තමධුරෙ කලො
ගම්භීරෙ තු රවෙ මන්දො තාරාදී තීසවො කලෙ
කාකලී සුඛුමෙ වුත්තො ක්‍රියාදිසමතා ලයො ති.

'**නන්දිඝො**'ති සතතනන්දියො. '**තම්බබිම්බාධරාචාරු පයොධරභරාසුභා**'ති තම්බබිම්බමිව තිම්බරුසක ඵලසමානා සුභා චාරුපයොධරභාරා, තිම්බබිම්බධරාතිපි පාඨො. '**සබ්බාවයවමණ්ඩිතා**'ති සබ්බෙහි හත්ථපාදෙරුජඞ්ඝාවයවෙහි මණ්ඩිතගත්තා ජනා. '**නච්චනන්ති**'ති නවරසවන්තං නච්චං නච්චන්ති, නාටකානං හි නවනාට්‍යා රසා හොන්ති, තෙනාහු:–

සිඞ්ගාරො කරුණො වීරා බ්භුත හස්ස භයානකා
සන්තො බීභච්ඡ රුද්දානි නව නාට්‍යරසා ඉමෙති,

තෙසං විත්ථාරභෙදො අමරකොසාදිසු ගහෙතබ්බො. '**භාවභාවරසූපෙතා**'ති පියභාවසංඛාතෙන සිඞ්ගාරාදි රසෙන උපෙතා. '**නයනුස්සවා**'ති නයනස්ස දස්සනා උස්සවභූතා. '**සෙතකාලවල්ලිගුම්බ**'න්ති සෙතපුප්ඵවන්තං පිප්ඵලි ගුම්බං. '**රතනමහො**'ති රත්තභපච්චහො. '**රතනමාලවන**'න්ති කනවෙරවනං, නත්තමාලවනන්තිපි පාඨො. '**කඩානාතසංවරං**'ති ආතපසංවරණත්ථං සාඛභඞ්ගං මඩපං කත්වාන. '**සොණ්ණවණ්ණා**'ති සුවණ්ණවණ්ණා. '**කොසාතකිගුම්බ**'න්ති පීතපුප්ඵිතං වනකොසාතකීගුම්බං. '**ගිරිකණ්ණිකවනං**'ති වනකණ්ණිකාවනං, වලලිකාවනන්තිපි වදන්ති. '**වණ්ණවෙනා**'ති වණ්ණෙන ඝිතං දිසවණ්ණං. '**ගාවො චරාපෙ**'න්ති ගාවො චරාපෙන්තො. '**සිකතාතලෙ**'ති වාලිකාකිණ්ණං සමතලං. '**අග්ඝිකාවියා**'ති දීසග්ඝිකමිව. '**ගොපාණසිදණ්ඩක**'න්ති ගොපානසියා දණ්ඩකං, ගොපානසාවිජ්ජනසලාකන්ති කෙචි, '**වලලිමුඛී**'න්ති විලිවමුඛිකං. '**එකංපදරබන්ධ**'න්ති එකං සාරරුක්ඛපදරං, සෙතු කරණත්ථාය උපනෙසි. '**නෙකබ්‍යූහසමාකිණ්ණා**'ති සමන්තතො අනෙකබ්‍යූහෙහි ආකිණ්ණා. '**දුද්දික්ඛො**'ති චක්ඛුප්පසාදනියකරණත්ථාය සුඛෙන අනපෙක්ඛනියො. '**චක්ඛුමොහනො**'ති පස්සන්තස්ස චක්ඛුනො මොහනංකරානො. '**සබ්බසොවණ්ණමයො**'ති සබ්බසුවණ්ණමයො, සබ්බසොවණ්ණමයොතිපි පාඨො, සොයෙව අත්ථො. '**වල්ලිදනාදිනො**'ති විලිවදනාදිකස්ස. '**කත්තපපිටකෙ**'ති සිතත්ති පිටකපූරෙ වදන්ති, තස්ස වෙදිකස්ස කාරකස්ස වා සන්තිකං. '**බොධිවෙදික**'න්ති බොධිපරික්ඛෙපං. '**ඡත්තචාමරකෙතවො**'ති ඡත්තං ච චාමරං ච කෙතුච=ඡත්තචාමරකෙතවො, කෙතු වුච්චති මහාධජො. '**අට්ඨමඞ්ගලආදයො**'ති:–

සංඛෝ චක්කං පුණ්ණකුම්භො ගජො සිරිවච්ඡා තථා
අංකුසො සත්තමො ධජො සොවත්ථිකඤ්ඤති තෙ අට්ඨාති

ඉමෙ අට්ඨ, **'චජෙවා ගහම්ජ්ඣගො'**ති * කුජාදීනං පචනානං ගහානං අට්ඨවීසතියා නක්ඛත්තාදීනං ච මජ්ඣගතො චජෙවිව. **'මඤ්ජු වාණී'**ති මංජුස්සරො මංජුභාණීතිපි පාඨො, සොයෙව අත්ථො. **'ගො පෙසිතො පුරෙ'**ති ඉතො පුරෙ ගොපෙපො අසීති ඡෙදෙ. **'සත්තරත නමයකලසසහස්ස'**න්ති සත්තරතනමයං සතසහස්සකලසං, කලසං වුච්චති උදක ඝටං, තං පන වසනට්ඨානෙ පුප්ඵඝටභූතං.**'අට්ඨුත්තරසතමංගල'**න්ති "පාදෙසු යස්ස ජාතානි වෙ චක්කානි මහෙසිතො"ති එවමාදිකං අට්ඨසතමඞ්ගලවිධානං. **'ධම්මසොඩකදෙවෙයි'**ති ධම්මසවණෙ ධුත්ත දෙවෙහි. **'අභිත්ථුත ගුණඝොසො'**ති අභිත්ථවිතගුණනිග්ඝොසො, **'සකලදෙවනයනමත්තමධුකරාන'**න්ති සකලදෙවානං නයනසඞ්ඛාතානං මත්තාලිගණානං. **'පදුමායමානො'**ති පදුමමිව කුරුමානො.**'දිසා තාහි භාසෙනො'**ති සබ්බා දිසා තාහි පභාහි පභාසෙනෙනා විරොචන්ති. **'කෙතුමතිය'**න්ති කෙතුමතියං රාජධානියං. **'කලිසාසනෙ'**ති කලි වුච්චති දෙසො පරාජයො වා, කලිං සාසති හිංසතීති=කලිසාසනං, තස්මිං, කලිනාසනෙතිපි පාඨො, අපරෙ පන කලිසනාස්සනෙහි වදන්ති. **'පංචගපතිඨිතෙනා'**ති හත්පාදනලාට සංඛාත පංචගපතිඨිතෙන, සෙසං උත්තානමෙවාති. අයං ගාථා ඉඤ්ඤවංසා වුත්ති නාම.

## මූලගලල වත්ථුං පඨමං.

---

දුතියෙ **'අබ්භඤානම්කො'**ති අනෙනවාරිකො. **'සාකච්ජෙනා'**ති සාකච්ඡං කරොනෙනා. **'සමුස්සි'**ති විනස්සි. **'ඉස්සරඝතතිකො'**ති එවනාමකො. **'කතපරිචයො'**ති කත විස්සාසිකො. **'ඉස්සරනිම්මිතො'**ති ඉස්සරෙන බ්‍රහ්මනා නිම්මිතො. **'භස්මධූරාගලිත්තගො'**ති භස්මනා රාගෙන ලිත්තහපච්චගො. **'ජල්ලධරො'**ති රජො ජල්ලධරො. **'පාණිපතෙනනා'**ති පාණිපත්තායමානෙන. **'ජගත්තයෙ'**ති ලොකත්තයෙ. **'සුරාපානොපකරණත්ථාය'**ති සුරාපානපරිභොගුපකරණත්ථාය. **'ඝඞිං ගණ්හෙථා'**ති තාලිසයඞිං ගහෙත්වා. **'අගුණො'**ති සීලාදි ගුණරහිතො. **'හිරිවජ්ජිතො'**ති පාපලජ්ජාය විරහිතො, සීලං තස්ස කුතො අත්ථි.**'සමාධිකො'**ති කො සමාධි භවිස්සති.**'උපඩ්කාතම්පි'**ති එවනාමකානං කිර බාහිරපබ්බජිතානං. **'තිත්තිකඩා'**ති තිත්තිං කත්වා. **'මනුසෙසකස්සා'**ති එකස්ස මනු

---

* ජඥෙවනහමජ්ඣගො, මූ. ර.

ස්සජාතිකස්ස. **'සාරක්ඛෙත්තෙන'**ති අතිසාරභූතඛෙත්තෙන. **'සද්ධා'**ති සද්ධාය. **'කිඤ්චි කිඤ්චී'**ති ථොකං ථොකං. **'එතම්පී'**ති එතං හිරිමත්තම්පි. **'තං දාන'**න්ති තං පණ්ඩරගස්ස දින්නදානං. **'ඛජ්ජභොජ්ජලෙය්‍යපෙය්‍යාදීනී'**ති මොදකාදි ඛාදනීයං ඛජ්ජං ච, අන්නාදි භොජනීයං භොජ්ජං ච, මධුඵාණිතාදි ලෙහිතබ්බං ලෙය්‍යං ච, යාගුපානකාදි පාතබ්බං පෙය්‍යං ච ඛජ්ජභොජ්ජලෙය්‍යපෙය්‍යානි, තානි ආදීනි යෙසං සායිතාදීනි තානි හොන්ති ඛජ්ජ =පෙ= පෙය්‍යාදීනි, ඔසාන ගාථායං:– **'අවෙරමත්ත'**න්ති අවෙරභූතමත්තං. **'ජනා'**ති ජනගණා. **'ඛෙත්තෙස්වනඞ්ගණෙසූ'**ති අනඞ්ගණෙසු බුද්ධපුත්තභූතෙසු ඛෙත්තෙසු. **'පමාදසිත්ථා'**ති පමාදං කරොථ. අයං ගාථා උපජාති නාම.

**පණ්ඩරගස්ස වත්ථුං දුතියං.**

තතියෙ **'සිප්පිආභරණානී'**ති සිප්පිකෙන මාසකරූපෙන කතානි ආභරණානි "සිප්පිකානං සතං නත්ථි කුතො කංසසතං දුවෙ" ත්‍යාදිසු විය හි සිප්පිසද්දො මාසකරූපවාචකො, **'හෙමරජතකොසෙ'**ති සුවණ්ණරජතමයෙ කොසකෙ. **'දානව්‍යාවටා'**ති දානෙ බ්‍යාවටා, දස්සනංච වන්දනං ච දානංච මානං ච මය්හං අභාසීති අජ්ඣාහාරො. **'තෙ මිත්තපතිරූපකා'**ති තෙ අමිත්තා මිත්තපතිරූපකා නාම. **'තුච්ඡවණ්ණන'**න්ති තුච්ඡං මුසාභණනං. **'මිච්ඡාසූ'**ති මිච්ඡාකිරියාසු. **'කෙළිසීලකා'**ති කීළනසීලා. **'දුට්ඨො'**ති කුපිතො. **'ඉණපණ්ණං ඵාලෙත්වා'**ති ඉණලිඛිතං ලෙඛනං ඵාලෙත්වා; අවසානගාථායං:– **'සද්ධා'**ති සද්ධාය, **'ලද්ධ'**න්ති ධම්මෙන ලද්ධං පච්චෙකපච්චයං. **'සාමිනී'**ති භරියා. **'සාමිකො'**ති පති, ඉති තෙ උභොන් අත්ථො. **'සාධූන'**න්ති සප්පුරිසානං. **'සුප්පසන්නා'**ති අත්තනො දානසීලෙසු සුට්ඨුපසන්නා, අයං ගාථා සාමඤ්ඤ ගාථා නාම, චතුප්පදසහිතා ඡන්දසි අනාගතා, තෙන වුත්තං:–

නදිස්සතෙත්ථ යං ඡන්දං පයොගො දිස්සතෙ යදි
විසමක්ඛරපාදන්තං ගාථා සාමඤ්ඤනාමතොති,

**දුබ්බිසි මහාතිස්සස්ස වත්ථුං තතියං.**

චතුත්ථෙ **'දහරසාමණෙරො'**ති **'ඤත්වා'**ති යොජනා, සො කිර අනාගත සඤ්ඤාණෙන ඤත්වා, **'ත'**න්ති තං ධනසාරං. **'විස්සජ්ජාපෙත්වා'**ති වලඤ්ජාපෙත්වා. **'භික්ඛුසඞ්ඝ'**න්ති භික්ඛුසඞ්ඝෙ. **'සීලවා'**ති සීලවන්තො, විපල්ලාසොයං. **'ජීවිතංවෙතෙ'**ති එතෙ

අත්තනො ජීවිතං ඉව, සම්මාසම්බුද්ධස්ස සාසනං පාලෙන්තං. 'සන්නද්ධයොධාවා'ති සන්නද්ධකවචා යුද්ධයොධා ඉව. 'කෙලසාරිසීසපාතනෙ'ති කිලෙසාරීනං සීසපාතනෙ සබ්බකම්මෙ. 'නිරාමය'න්ති නිරොගසමෙතං. 'සම්භාවිතස්ස චිත්තස්සා'ති යං අරියසංඝං භාවිතස්ස පුග්ගලස්ස චිත්තක්ඛයතො. 'හොතෙතං සංඝරතන'න්ති හොති එතං උත්තමං සංඝරතනං. 'තනිස'න්ති බුද්ධධම්මං නිස්සාය සංඝො තනිසො හුත්වා. 'පත්ථා ආගච්ඡන්ති'ති පත්ථරිත්වා වා ආගච්ඡන්ති. 'අත්තනො උපකරණෙහී'ති අත්තනො උපක්ඛරණෙහි උපාසනෙහි වා. 'සයනාසනසම්පන්න'න්ති සයනෙහි ච ආසනෙහි ච සම්පන්නං. 'නච්චන්ති චතුරා එත්ථා'ති එත්ථ නවවිමානෙ චතුරා විලාසසම්පන්නා දෙවකඤ්ඤා නච්චන්ති, යථා "කුසලා නච්චගීතස්ස සික්ඛිතා චාතුරිත්ථියො"ති, නච්චන්ති චතුරා එත්ථාතිපි පාඨො, චතුරාති විච්ඡා ලොපො විපල්ලාසො ච, චතස්සො දෙවකඤ්ඤායො එත්ථ එකස්මිං කූටකෙ නච්චන්තීති අත්ථො. 'භාවභාවවිලාසෙහී'ති භාවභාවසහිතෙහි සිරිවිලාසෙහි. 'නාගසව්හයෙ'ති නාග ඉති අව්හයෙ. 'සමණුද්දෙසො'ති සාමණෙරො. 'නස්සමානමුදික්ඛිස'න්ති පරතො ඉමෙ අධානස්සිස්සන්තීති එවන්තස්ස මානධම්මං උද්දික්ඛන්තො. 'මධුරන්නෙනා'ති රසභොජනෙන. 'පුච්ඡාමි තං දෙවපූජිත'න්ති අහං තං පුච්ඡාමි. 'නවිමං අනුභොන්තස්සා'ති තව ඉමං අනුභොන්තස්සාති ඡෙදො, 'කීවතකො'ති කතිපපමාණො, 'යස්සඅන්ත'න්ති යස්ස ආකාසස්ස අන්තං, චක්ඛුමා පුරිසො පස්සති, 'තංහොති'න්ති තං සම්පත්තිං භුඤ්ජන්තස්ස මම කාලෙ ජිනගොචරං හොති, ඔසානගාථායං:– 'තමෙවලද්ධ'න්ති ධම්මෙන ලද්ධං, 'පචුරානුභාව'න්ති අවෙජ්ජරානුභාවං, පරොසඞ්ඛියො, පච්ජරානුභාවන්ති වා පච්ජානුභාවන්ති අත්ථො, අයං ගාථා උපජාති නාම.

### තිස්ස සාමණෙරස්ස වත්ථුං චතුත්ථං.

පංචමෙ 'වාමනන්තා'ති ලකුණ්ටකත්තා. 'පාදපටෙ'ති පාදෙන අක්කමනීයෙ පටෙ, පාදපුංඡනපටෙතිපි වදන්ති. 'ධුරවිහාරෙ'ති සන්තිකවිහාරෙ. 'වස්සග්ගෙනා'ති වස්සගාමගණනාය. 'ගාමන්ත'න්ති * ගාමන්තරං, අඤ්ඤගාමන්ති අත්ථො, 'අධාන'න්ති දීඝමධානං. 'වස්සවාතෙනා'ති වුට්ඨිඅන්තස්ස වාතෙන. 'සම්භත'න්ති සම්භරිතං. 'සක්කත්ත'න්ති දෙවින්දස්ස භාවං. 'අබුධෙනා'ති අපඤ්ඤවතා. 'අවාචිය'න්ති අවච

* ගාමන්තරං. පෙල.

නීයං අවණ්ණනීයං. '**නිරාමිස**'න්ති ලොකාමිසෙන නිරාමිස රසං. '**නෙත්තරත්තාදිදොසෙහී**'ති චක්ඛුරුහිරාදි දොසෙහි. '**නව දොසමුත්තා**'ති නව දොසවණ්ණිතා. '**දෙවජිව්හග්ගරඞ්ගම්හී**'ති දෙවතානං ජිව්හග්ගසඞ්ඛාතෙ රඞ්ගෙ වාසමණ්ඩලෙ නිච්චං නච්චන්ති මණ්ඩිතා, නව ගුණප්පකාසිනී වනිතාති යොජනා. '**සොධාගතො**'ති සො ඉධාගතොති ඡෙදො, අවසාන ගාථායං:- '**සග්ගසොපාන මග්ග**'න්ති සග්ගමග්ගසොපානං. '**භූසිත**'න්ති අලංකාරභූතං. '**චාරුමග්ග**'න්ති චාරුදස්සනමග්ගං රුචිරමග්ගං වා. '**ඉස්සරමග්ග**'න්ති අග්ගං ඉස්සරියභාවං, අයං ගාථා මාලිනී නාම. සායං මත්තග්ග සහිතාති.

## ගොපාලඋපාසක වත්ථුං පඤ්චමං.

ඡට්ඨෙ '**උපකණ්ණා**'ති මජ්ඣන්තිකාය ආයන්තාගතාය. '**මලින**'න්ති මලග්ගහිතං. '**ථූල**'න්ති ඛරං පටානිභූතං, '**දිබ්බම්බරෙ**'ති දිබ්බවත්ථෙ, අම්බරසද්දො හි වත්ථපරියායො, '**තදහෙවා**'ති තස්මිං යෙව දිවසෙ. '**ථම්භාදී**'ති ථම්භාආදයො යෙසං කූලවංසාදීනං තෙ හොන්ති=ථම්භාදයො, ගොපානසියො ආදයො යෙසං කූටාගාරකණ්ණිකාදීනං තෙ හොන්ති= ගොපානසිආදිකා, තෙසු. '**නානාවිරාගම්බරලඞ්කතානී**'ති නානා වණ්ණවිරාගවත්ථෙහි අලංකතානි. '**පාවාරපච්චත්ථරණත්ථතා තෙ**'ති පාවාරාදිකෙන පච්චත්ථරණෙන අත්ථතා තෙ. '**භාසන්තී**'ති පභාසන්ති. '**කිංකිණිරවකෙහී**'ති කිංකිණික සද්දෙහි නිච්ඡාරෙන්තෙහි. '**අමන්දනන්දවහමාසිනිච්ච**'න්ති මන්දො තනුකො වුච්චති නමන්දො අමන්දො, අමන්දො අනප්පකො නන්දො= අමන්දනන්දො, තං ආවහන්තීති=අමන්දනන්දාවහං, නිච්චං ආසි අහොසීති. '**කණකාවභාසා**'ති සුවණ්ණවණ්ණාභා. '**පයොධරා**'ති පයොධරභාරා, අයමෙව වා පාඨො, '**බිම්බාධරා**'ති තෙහි පයොධරබිම්බෙහි බිම්බධරා. '**මුඛම්බුජා**'ති මුඛසඞ්ඛාතා පදුමා. '**නෙත්තමධුබ්බතෙහී**'ති චක්ඛුවයසඞ්ඛාතමධුකාවතෙහි. '**සුගන්ධකඤ්ඤාපතිසෙවිතාහී**'ති සුගන්ධාහි කඤ්ඤාහි පතිසෙවිතාහි. '**භාසන්තමාලායුතඋත්තමඞ්ගී**'ති ඔභාසන්තෙන මාලායුතෙන උත්තමඞ්ගී, '**පභාසසා**'ති සා පභාසනං අකාසි. '**දිවස්මි**'න්ති දෙව ලොකෙ, අවසාන ගාථායං:- '**ඛණභඞ්ගුර**'න්ති ඛණෙන භජ්ජන සභාවං ඉති. '**ඝටෙය්‍යා**'ති යත්තං කරෙය්‍ය විරියං කරෙය්‍යාතිඅත්ථො, අයං ගාථා වසන්තතිලකා නාම.

## පුබ්බභත්තදායිකාය වත්ථුං ඡට්ඨං.

සත්තමෙ **‘මහාජුරික’**න්ති මහාපොට්ටිකං. **‘හත්ථස්ස ලද්ධාසාස’**න්ති හත්ථස්ස ලද්ධං යාසභාවං කසිරභාවං. **‘ඨානෙපතිට්ඨිත’**න්ති සුබෙත්තසඞ්ඛාතෙ ඨානෙ පතිට්ඨිතං. **‘සො කලිඟරඛණ්ඩක’**න්ති කණ්ටකසහිතං මහාකලිඟරං, නිරත්ථකත්තෙන හි ඛියයකට්ඨං කලිඟරන්ති වුත්තං. **‘හත්ථෙන දූරමකාසී’**ති හත්ථෙන අපනෙත්වා දූරමපනයනං අකාසි. **‘පතිමාසරෙ’**ති බුද්ධබිම්බට්ඨපිත මහාසරෙ, **‘එකග්ගමනො’**ති කම්මක්ඛමභූතකායචිත්තො කමනීය භූතකායචිත්තො කල්ලභූතකායචිත්තො වා, **‘ඛණ්ඩෙ’**ති වත්ථක ණ්ඩ කත්ථචි මහාඛණ්ඩ එකසමීපසිංකෙ, තං හි ඛණ්ඩිකාකාරත්තා ඛණ්ඩන්ති ලද්ධනාමං ඨවිකන්ති කෙචි, **‘පාලියාකතමණ්ඩපෙ’**ති මග්ග පාලියා කතමණ්ඩපෙ. **‘භවාභව’**න්ති හානවඩ්ඪිං. **‘භරියායත්ත’**න්ති භරියාධෙය්‍යං. **‘කලත්තං සඟහෙ’**ති භරියං සඟහෙ භරියං සඟහෙය්‍ය, කලත්තසද්දො හි භරියාපරියායො, තෙනාහු:–

“දාරො ජායා කලත්තං ච ඝරණී භරියා පියා,
පජාපතී ච දුතියා සා පාදපරිචාරිකාති”

**‘දුග්ගුණා’**ති නිග්ගුණා. **‘රූපං පිළීසති’**ති තස්සා රූපසොභත්තං තෙහි දුග්ගුණෙහි පිළීයතෙ. **‘තනූරුහා’**ති ලොමා, **‘සලාලා’**ති බහු ලාලා පග්ඝරිතඑලාවත්ත්‍යෙවා, **‘කුලච්ජා’**ති කුලවයතොජාතා, **‘ඛරා’**ති තද්ධහදයා, **‘ඛල්ලාටා’**ති බල්ලාකාරමහානලාටිකා, විරලකෙසරොමමහාසීසා. **‘සිරාවිතතදෙහිනී’**ති නීලවණ්ණාහි මහාසිරාහි ඉතොචිතොචබද්ධදෙහිනී. **‘ඛජා’**ති වඞ්කපිට්ඨිකා, **‘කාණා’**ති එකචක්ඛුඅන්ධා, **‘කෙකරා’**ති විසම පෙක්ඛණලොචනා, **‘අන්ධා’**ති ද්විචක්ඛුඅන්ධා, කාණාති ච අන්ධාති ච එකචක්ඛුවා ද්විචක්ඛු වා හොතු කාණා නාම, පවත්තිකාලෙ අන්ධා නාම, ජච්චන්ධාති අයමෙව තෙසං විසෙසො. **‘විසමක්ඛී’**ති එකා ඛුද්දකා එකා මහන්තා අක්ඛී. **‘මධුපිඟලා’**ති පිඟලා මධුවිය පිඟලනෙත්තා. **‘නික්ඛන්තබබ්බුවාකාරනෙත්තා’**ති රුක්ඛබිලතො නික්ඛන්ත බබ්බුවාකාරනෙත්තා:–

යත්ථෙකො ලබ්භතෙ බබ්බු දුතියො තත්ථ ජායති
තතියො ච චතුත්ථො ච ඉදං තෙ බබ්බුකාබිලන්ති

එත්ථවිය බබ්බුසද්දො බිලාරවාචකො දට්ඨබ්බො. **‘පිණාකිණ්ණී’**ති පිණ්ඩනාසිකා. **‘වංකනාසා’**ති දක්ඛිණතො වා වාමතො වා ඛණ්ඩ නාසිකා. **‘කුණී’**ති * සෙතකුණී, රත්තකුණී වා. **‘සපොදරී’**ති

* කුණී–පෙල.

ආහාරෙන සුහිතසප්පසදිසොදරා. **‘වණ්ණී’**ති වණ්ණරොගිනී. **‘කාකජ්ජරභාසී’**ති කාකෙන මිව ජජ්ජරභාසිතා. **‘විභාසා’**ති විගතභාසා අපාකටවචනා. **‘අලක්ඛිකා’**ති එවරූපා ඉත්ථී අලක්ඛිකා හොති. **‘ඛරස්සරා’**ති භගස්සරා. **‘කොධමනා’**ති කුජ්ඣනසීලා. **‘සෙරිචාරී’**ති අත්තනො චිත්තවසෙන චාරිණී, **‘මහග්ඝසා’**ති සාධුරසභොජනසීලා. **‘කඨිනා’**ති ථද්ධා. **‘උණ්ණලා’**ති මහාවිධා. **‘විධවා’**ති විගතො ධවො ඉමායාති විධවා. **‘සඞ්ඛයො’**ති ජාතු ගොපපක සඞ්ඛියො රචන්ති. **‘සාරිනී’**ති අතිචාරිනී, අථවා අත්තනො දෙසපටිච්ඡාදනත්ථං පුනප්පුනං සාමිකං සාරෙතීති=සංසාරිනී. **‘අස්සවාගුණවා’**ති අස්සාසපස්සාසවන්තී ගුණවන්තීති මාභායි අහං එවරූපවෙවරූපංච කත්වා ධනං නිබ්බත්තෙස්සාමි ත්වං සුඛං හොහීති එවමාදිනා සාමිකං තුච්ඡස්සාසනවසෙන ගුණවන්තීත්‍යත්ථො. **‘සාධුසාධව’**න්ති සා නාරි ධවං අත්තනො අත්තනො පතිං සාධුකාරිණී හොති, **‘පණිපාතෙ’**ති අත්තපණිපාතනෙන පණිපාතෙතීති රතනත්තයමාමකා වත්ථුත්තයමාමකා හුත්වා, යානාරි නාතිචාරිණී සා පියරූපෙන පුත්තං ජනෙන්තී සකසකරූපෙන ධීතරං ජනෙන්තීති සම්බන්ධො, **‘පක්ඛලති’**ති පක්ඛලිතං. **‘වරිතබ්බාවරෙනිධාති’**ති ඉධ ලොකෙ වරෙන වරිතබ්බා, **‘භිසමුළාල’**න්ති මූලාලසහිතං භික්ඛං, භිසමූලන්තිපි පාඨො, ඔසානගාථායං. **‘සංසාරදුග්ගවිපිනෙ’**ති ගමනවිරහිතෙ සංසාරමහාවිදුග්ගෙ, **‘භයදෙ’**ති අපායභයාදි භයං දෙන්තෙ, **‘දානසූරපාදපමච්චුළාර’**න්ති දානසඞ්ඛාත කප්පරුක්ඛං අතිඋළාරං, **‘සුඛමෙසමානා’**ති සුඛං ගවෙසමානා, **‘අමතප්ඵලානි,**ති අමතසඞ්ඛාතානි තස්ස කප්පරුක්ඛස්සමහප්ඵලානි අනෙතපච්ඡිමභවෙ අනුභොන්තීති. අයං ගාථා වසන්තතිලකා නාම.

**දුතිය ජයම්පතිකානං වත්ථුං සත්තමං.**

අථමෙ **‘මාතායතනනරක’**න්ති * එවන්නාමකං, **‘කෙවට්ටගාම’**න්ති මච්ඡබන්ධානං ගාමං, **‘කණ්ඩ’**න්ති † දණ්ඩං, **‘කථල’**න්ති කපාලඛණ්ඩං, **‘විඤ්ඤාතරසො’**ති ජිව්හාය සායිතරසො, **‘උපද්දුතා’**ති ඵාලිතා, **‘එසනා’**ති ගවෙසන්තා, **‘වත්තුංගිරා මුනිස්සර’**න්ති සම්මාසම්බුද්ධං ඨපෙත්වා කො වස්ස විපාකං සබ්බෙන සබ්බං වත්තුං සක්කොතීති සම්බන්ධො, **‘තාවිනා’**ති සම්මාසම්බුද්ධා අඤ්ඤත්‍ර, **‘සොණ්ණ’**න්ති සුනඛං, **‘සමාගත’**න්ති සුවිද්ධුආගතං, **‘දණ්ඩොණ්ඩො’**ති දණ්ඩො අධරොණ්ඩො යෙන සො=දණ්ඩොණ්ඩො, කුණ්ඩො හි ලොකෙ

* මුගගායතනනරකං-පෙළ. † යොගගං-පෙළ.

සබ්බං අදරොඪං දංසති, පිණ්ඩම්වසංජාතියා ඛිත්තං හත්ථපිණ්ඩං පත්වාපි. '**නන්දනා**'ති තං ආලපති, '**රුදෙනාපී**'ති රුදෙන අපි, සෙසමෙත්ථ උත්තානත්ථමෙවාති.

### සඞ්ඝදත්තචොරස්ස වත්ථුං අට්ඨමං.

---

නවමෙ '**කුඤ්චිකාමුද්දික**'න්ති තාලකුඤ්චිකං ච මුද්දිකච, '**මකරමච්ඡා**'ති ‡ මහා මකරසඞ්ඛාතො බාලමච්ඡා, '**ඡවිමත්ත මපිවිවණ්ණා**'නාහි තස්සා ඡවිමත්තමපි වෙවණ්ණියංනාහොසි, '**කිමිකුලාලයෙ**'ති අසීතිකිමිකුලානං වාසභූතෙ, '**කුණපාවිසොළසා**'ති ද්වත්තිංසකුණපජාතියො, '**අත්තංහොකුණපෙජාතං**'ති අත්තං මහාකුණපෙ ජෙගුච්ඡිතරසජීවකෙ කුණපෙ ජාතං ද්වත්තිංසකුණපා අත්ථි, තෙනාහු:–"පතිතම්හාපි කුණපා ජිගුච්ඡං කායනිස්සිත"න්ති. '**කුණපෙරත**'න්ති අඤ්ඤො කොචි සත්තො වා ජීවො වා එත්ථ නත්ථි, අථ කුණපං එව කුණපෙරතං කරොති, '**තාසිණ්ණාසා**'ති තන්හාය. '**මොහස්ස ආනුභාවමහො**'ති අහොඅච්ඡරියං අයං න යස්ස කස්සචි මොහස්සෙවානුභාවො, '**වායසා**'ති කායං භුඤ්ජිතුං ආසා හුත්වා, කුලලාතිපි පාඨො, මහාගිජ්ඣාති අත්ථො. '**සුවානා**'ති මහාසොණා. '**පච්චෙකංව පටික්කූල**'න්ති පච්චෙකං පච්චෙකං කොට්ඨාසං හුත්වා ඨිතං ලබ්භතෙ, '**ද්වත්තිංසකුණප**'න්ති ද්වත්තිංස කුණප සහිතං, '**ධීරා**'ති පණ්ඩිතා, '**සම්පන්නා**'ති පඤ්ඤාසම්පන්නා, ධිති සම්පන්නාතිපි පාඨො, ඔසානගාථායං:– '**විහාසා**'ති ඔහාය, '**නාව යොබ්බනෙ**'ති දහරෙ, '**සංඛාරගත**'න්ති සඞ්ඛාරධම්මං, අයං ගාථා උපජාති නාම.

### අඤ්ඤතරකුමාරිකාය වත්ථුං නවමං.

---

දසමෙ '**විනයපිටක පරියාපන්න**'න්ති

කොටිසතසහස්සානි අසීති සතකොටියො
පඤ්ඤාසසතසහස්සානි ඡත්තිංසාචපුනාපරෙ
එතෙ සංවරවිනයා සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා සික්ඛාවිනයසංවරෙති,

එවං වුත්තං සික්ඛාපදං, '**අනෙසනසම්භූත**'න්ති වෙළුදානාදිනා එකූනසතියා අනෙසනෙ සම්භූතං, '**යොනිසොපච්චවෙක්ඛිත්වා**'ති "පටිසඞ්ඛායොනිසො පිණ්ඩපාතං පටිසෙවාමී"ති ආදිනා යොනි

‡ මහමච්ඡාති–පෙළ.

සො ඤාණෙන පච්චවෙක්ඛිත්වා, **'සංවිතා'**ති යං සීලං ඨපෙත්වා, **'සීලජල'**න්ති සීලසඞ්ඛාතං සලිලං, **'මල'**න්ති කායමලං චිත්ත මලං, **'සජලදවාතා'**ති සජලා උදකවාතා මහාමණ්ඩලි කා වාතා, **'හරිචන්දන'**න්ති ගොසීතචන්දනං. **'හාරා'**ති මුත්තා හාරා. **'මණයො'**ති මණිආදිරතනානි. **'චන්දකිරණඞ්කුරා'**ති චන්දෙ ච කිරණංකරොචාති විග්ගහො, තත්ථ කිරණඞ්කුරොතී ති=කිරණංකුරො, සුරියො, සොභනෙනවාත්‍යත්ථො, **'වණ්ණරාජා නො මුත්තාමාණිවිභූසිතා'**ති සීලාලංකාරං විනා සොභන්ති සථා යතිනො භික්ඛවො සීලභූසනභූසිතා සොභන්ති, **'යථා'**ති නිපාතමත්තො අයමෙත්ථ යොජනා, යථා රාජානො මුත්තාමණිවි භූසිතා සොභන්ති එවං යතිනො සීලභූසනභූසිතා සොභන්ති, **'අන්ධකාරං'**ති අනුඅන්ධකාරං විවිධන්ධකාරං. **'තපොධනො'**ති § තපොසීලං ධනමෙතස්සාති=තපොධනො, සීලවන්තස්ස භික්ඛුනො කායගන්ධෙ ච පාමුජ්ජති දෙවානං පියං කරොති සීලගන්ධෙ කා එව කථා භවෙය්‍ය. **'ආවිසාති'**ති දසදිසාසු අප්පටිඝො හොති, **'මහප්ඵලාහොනතිනෙය්‍ය'**ත්ථ ඉතිසද්දොහෙත්වත්ථො ඉති තස්මා සීල වා පුග්ගලො පූජාසක්කාරභොජනො හොතීති යොජනා, **'නබාධෙන්ති'**ති නපීලෙන්ති නබ්‍යාබාධෙන්ති නධාසෙන්ති, **'මූල'**න්ති තණ්හාසඞ්ඛාතං මූලං, **'අචචනන'**න්ති සන්තාපනාය. **'අයං නිබ්බාණසම්පද'**ති සා අයං නිබ්බාණසම්පද අත්ථි සා අයං අච්චන්තසන්තා පනාය තං එව නිබ්බාණං, **'නිම්මදෙ'**ති නිග්ගතමදෙ, **'හත්ථිනොසමගනා'**ති හත්ථිනො සිතඨානස්ස සමන්තා, ඔසාන ගාථායං. **'සීල'**න්ති සීලවන්තං. **'පණිපාතයන්ති'**ති පණිපාතං කරොන්ති. **'සීල'**න්ති ධම්මාසිඨානවසෙන වුත්තං, අත්ථො සීලවාති අත්ථො, **'තිලොකෙහි'**ති තීසු ලොකෙසු සත්තලොකෙ හි. **'නමස්සනිය'** න්ති නමස්සනියො. අයං ගාථා උපජාති නාම.

**තිස්ස මහානාගත්ථෙරස්ස වත්ථුං දසමං.**

## චූලගල්ලවග්ගො දසමො.

තත්ථ වත්ථුද්දානං.

චූලගල්ලො පණ්ඩරගො දුබ්බිසීතිස්සමෙව ච
තිස්සො වා සාමණෙරො ච ගොලුපාසකමෙවච
හත්ථපුටදසිකා ච වෙ ජයම්පතිකා තථා
සංසද්දන්තසද්දතරිත්ථි තිස්සනාගොථ දසමො
ජවගලක්ඛිනාසඞ්වත්ථුපත්මණ්ඩිතා සීහලකථාති,

§ තපොවනෙ, මු: ර:

අථ වග්ගුද්දානං.

මිගපොතකො පංචමො ච ජට්ඨො ච උත්තරොළිකියො
සත්තට්ඨො සොධසංයුත්තා සිලුත්තො නවමො තථා
දසමො චූළගල්ලො ච ජවඞ්ගා සීහලෙ මතාති.

**ඉති සතවඤ්ඤුපතිමණ්ඩිතාය රසවාහිනියා**
**අත්ථවණ්ණනා සමත්තා.**

---

එසා විරචිතා තෙන රසවාහිනි වණ්ණනා,
අතිසංඛෙපවිත්ථාරා නානානයාභිලංකතා.

සිද්ධා අනන්තරායෙන සිද්ධත්ථවෙහන සාමිනා,
කවිනා රචිතා යෙන මහානිපාතවණ්ණනා.

ධම්මපදස්සලීනත්ථවණ්ණනා අත්ථවණ්ණනා,
සද්දත්ථභෙදචින්තාය සාරසඤ්ඤිවිලාසිනී.

අට්ඨාරසගණ්ඨිපදං ගොත්‍රජගානගව්හයං,
මිත්තගුණ්ණුපගණ්ණ ගතිදීපනිවණ්ණනා.

අඤ්ඤෙසං නිපුණත්ථානං වණ්ණනා රචිතා බහූ,
කලාදීපසුජෙකෙන සද්දනිඝණ්ඩුකෙසුච.

හොරාසත්ථෙ ආයුබ්බෙදෙ සද්දසත්ථෙසු බහුසු,
වොහාරෙ පරදෙසානං නානාදෙසෙසු පාකටෙ.

අනන්තරායෙන යථා සිද්ධා සාරත්ථදීපිකා,
අනන්තරායෙන තථා භාසා සිජ්ඣන්තු පාණිනං.

බුද්ධොති නාමමත්තස්ස කතකිච්චස්ස තාදිනො,
යාවතාව අයං ඨාතු සාසනත්ථස්ස ඤාතවෙ.
යො බුද්ධො ලොකගරු මෙත්තෙය්‍යො සාරදෙසකො,
තස්සෙව අරහා හුත්වා සාසනෙ පබ්බජෙය්‍යහන්ති.

**ඉති සිද්ධත්ථකවිනා විරචිතා සාරත්ථදීපිකා නාම**
**රසවාහිනී ටීකා සමත්තා.**

# ජාතක ගාථා සන්නය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1 අපණ්ණකං ඨානමෙකෙ දුතියං ආහු තක්කිකා,
එතදඤ්ඤාය මේධාවී තං ගණ්හෙ යදපණ්ණකන්ති.

එකෙ, (බොධිසත්වාදී) සමහර පණ්ඩිතවරකෙනෙක්; අපණ්ණකං, අවිරුඬවූ; ඨානං, කාරණය; ආහු, කියති; තක්කිකා,(තමතමන්ගේ උත්ප්‍රෙක්ෂායෙන් අයුක්තකාජීය කල්පනා කරන්නාවූ) තාර්කිකයෝ;දුතියං, (සාපරාධවූ)දෙවෙනි කාරණය; ආහු, කියති; මෙධාවී, නුවණැත්තේ; එතං, මේ (විරුඬාවිරුඬවශයෙන් සිටි) කාරණය; අඤ්ඤාය, දැන; යං, යමක්; අපණ්ණකං, අවිරුඬද; තං, එය; ගණ්හෙ, ගන්නේය.

**1 අපණ්ණක ජාතකයයි.**

2 අකිලාසුනො වණ්ණුපථෙ ඛණන්තා
උදඞ්ගණෙ තත්ථ පපං අවින්දුං,
එවං මුනී විරියබලූපපන්නො
අකිලාසු වින්දෙ හදයස්ස සන්ති’න්ති.

අකිලාසුනො, (කෞසීද්‍යයෙන්දුරුව) ආරබ්ධවීර්‍ය්‍යවත් උත්තමයෝ; උදඞ්ගණෙ, "උද"යනු නිපාතය;-අඞ්ගණෙ, (මනුෂ්‍යසංචාර ස්ථානවූ) අනාවෘතභූමිප්‍රදෙශඇති; වණ්ණුපථෙ, වාලුකාපථයෙහි හෙවත් වැලිඇතිමගැ; ඛණන්තා, (භූමිය) ඛණනය කරන්නාහු; තත්ථ, ඒවාලුකාපථයෙහි; පපං,(පීයමානත්වයෙන් පපායයි කියනලද)ජලය; අවින්දුං, ලදහ; එවං, එපරිද්දෙන්; විරියබලූපපන්නො, වීර්‍ය්‍යයෙන්හා කායබල ඥානබලයෙන් යුක්තවූ; අකිලාසු, (කෞසීද්‍යරහිත) වීර්‍ය්‍යාන්විතවූ; මුනි, තපස්වීතෙම; හදයස්ස සන්තිං, චිත්තය හටද හෘදය රූපයහටද ශීතලභාවකරණයෙන් ශාන්තිනම්වූ (ධ්‍යානවිදර්ශනා අභිඥා අර්හත් මාර්ග සංඛ්‍යාත) ආර්‍ය්‍ය ධර්මය; වින්දෙ, ලබන්නේය.

**2 වණ්ණුපථ ජාතකයයි.**

3 ඉධ චෙ හි නං වීරාධෙසි සද්ධම්මස්ස නියාමතං,
චිරං ත්වං අනුතපෙස්සසි සෙරිවා යංවවාණිජො’ති.

සද්ධම්මස්ස, සද්ධර්මයට; නියාමතං, ප්‍රතිනියතවූ; තං, ඒශ්‍රොතආපත්තිමාර්ගය; හි,යම්හෙයකින්; ඉධ,මෙහි; විරාධෙසි චෙ, ඉදින් (වීර්‍ය්‍ය නොකිරීමෙන්වැරදවූයෙහිනම්; (නොපැමිණියෙහි නම්); චිරං,බොහෝ කලක්;ත්වං, තෝ; අනුතපෙස්සසි, (ශොචනාදි වශයෙන්) තැවෙන්නෙහි නොහොත් වීර්‍ය්‍ය නොකිරීමෙන් ආර්‍ය්‍ය මාර්ගයෙන් වැරදි හෙයින් බොහෝ කලක් නරකාදියෙහි දුක් අනුභවකොට තැවෙන්නෙහි; කා පරිද්දෙන්ද යත්? සෙරිවායං'ව වාණිජො, සෙරිව නම් වෙළඳ තෙම යම්සේද එමෙනි—සෙරිව නම් වාණිජයා යම්සේ ලක්‍ෂයක්වටිනා සුවර්ණපාත්‍රය ලදින් ඒප්‍රතිලාභයට වීර්‍ය්‍ය නොකොට ඒවස්තුවෙනුදු පිරිහී තැවිහේද, එපරිද්දෙන් තෝද මාවැනි වීර්‍ය්‍යවත්වූ බුදුකෙනකුන්ගේ ශාසනයෙහි මගඵලදම් පූරා මාර්ගප්‍රතිලාභයට වීර්‍ය්‍යය නොකොට තැවෙන්නෙහි, යනුභාවයි.

**3 සෙරිවවාණිජ ජාතකයයි.**

---

4 අප්පකෙන'පි මෙධාවී පාභතෙන විචක්ඛණො,
සමුට්ඨාපෙති අත්තානං අණුං අග්ගිං'ව සන්ධමං'ති.

විචක්ඛණො, වෙළඳමෙහි දක්‍ෂවූ; මෙධාවී, ප්‍රාඥතෙම; අප්පකෙනපි පාභතෙන, ස්වල්පවූද බඩුමිලයෙන්; සමුට්ඨාපෙති අත්තානං, (නොයෙක් උපායෙන් මහත් ධනයද යශසද උපදවා) තමන් (එහි) පිහිටුවයි; ඒ කෙසේදයත්? සන්ධමං, (මුඛවාතයෙන්) පිඹ දල්වන්නාවූ; අණුං අග්ගිං ඉව, මඳවූ ගින්නක් මෙනි.

**4 චුල්ලසෙට්ඨි ජාතකයයි.**

---

5 කිමග්ඝති තණ්ඩුලනාළිකාය අස්සානමූලාය වදෙහි රාජ,
බාරාණසිං සන්තරබාහිරන්තං අයමග්ඝති තණ්ඩුලනාළිකා'ති.

රාජ, රජ්ජුරුවන්වහන්ස; අස්සානං, (පන්සියයක්) අසුන්ගේ; මූලාය, මිලපිණිස; තණ්ඩුලනාළිකාය, සහල්නැළියකින්; කිංඅග්ඝති, කුමක් අගනේදැයි; වදෙහි, කිවමැනවැයි(අස්වෙළඳතෙම රජහට කීයේය; නැවත රජහුවිසින් විචාරනුලැබූ අග්ඝාපනිකතෙම) අයං තණ්ඩුලනාළිකා, මේ සහල්නැළිය; සන්තරබාහිරන්තං, (ප්‍රාකාරපරික්‍ෂෙපප්‍රමාණයෙන් ද්වාදශයොජන සංඛ්‍යාත අභ්‍යන්තරයද ත්‍රිශත යොජනප්‍රමාණ රාජ්‍යමණ්ඩල සංඛ්‍යාත බාහිරයදැයි මෙසේ) අභ්‍යන්තරබාහිරසහිතවූ; බාරාණසිං, (සියලු) බරණැස්රාජ්‍යය; අග්ඝති, අගනේයයි කී.

**5 තණ්ඩුලනාළි ජාතකයයි.**

---

6 හිරිඔත්තප්පසම්පන්නා සුක්කධම්මසමාහිතා,
සන්තො සප්පුරිසා ලොකෙ දෙවධම්මා'ති වුච්චරෙ'ති.

හිරිඔත්තප්ප, (කායදුශ්චරිතාදීන් සංකොචනයයි කියනලද)හිරියෙන්ද (එසේම කාය දුශ්චරිතාදීන් භීතියයි කියනලද) අපත්‍රාපයෙන්ද; සම්පන්නා, (අවිකලවූ මෙකියනලද ගුණවයෙන්) සමෘද්ධවූ; සුක්කධම්මසමාහිතා, (මෙකී හිරිඔතප්පදෙක ආදිකොට ඇති චාතුර්භූමක ලෞකිකලොකොත්තර සංඛ්‍යාත) කුශලධර්මයෙන් සමන්විතවූ; සන්තා, (කායකර්මාදීන් ශාන්තවූ හෙයින්) ශාන්තනම්වූ; සප්පුරිසා (කෘතඥතාදිගුණයෙන් යුක්තවූ)සත්පුරුෂයෝ; ලොකෙ, සත්වලොකයෙහි; දෙවධම්මාති, (රාජාදිවූ සම්මුතිදෙවතාවන්ගේද ස්වර්ගලොකොත්පත්ති ඇති උත්පත්ති දෙවතාවන්ගේද ක්ෂීණාශ්‍රවවූ විශුද්ධි දෙවතාවන්ගේද යන මේ ත්‍රිවිධ) දෙවතාවන්ගේ ධර්මයයි; වුච්චරෙ කියනුලැබෙත්.

6 දෙවධර්ම ජාතකයයි.

---

7 පුත්තො ත්‍යාහං මහාරාජ ත්වං මං පොස ජනාධිප,
අඤ්ඤෙ'පි දෙවො පොසෙති කිඤ්ච දෙවො සකං පජන්ති.

මහාරාජ, මහරජ; තෙ, තාගේ; අහං, මම; පුත්තො, (ආත්මජ) පුත්‍රයෙමි; ජනාධිප, ජනප්‍රධානය; ත්වං, තෝ; මං, මා; පොස, රක්‍ෂාකර; දෙවො, දෙවිතෙම; අඤ්ඤෙ'පි, අන්‍ය(අශ්වබන්ධාදිවූ මනුෂ්‍යයන්ද හස්ත්‍යශ්වාදිවූ තිර්යග්ගත) යන්ද; පොසෙති, පොෂ්‍යය කෙරෙයි; කිඤ්ච සකං පජං, ස්වකීය ප්‍රජාවවූ මා කුමක් හෙයකින් පොෂ්‍යය නොකරන්නේදැයි කීයේය–"කිඤ්ච"යන නිපාතය නින්දාර්ථ අනුග්‍රහාර්ථ දෙක්හි වැටෙයි එසේහෙයින් තොපට පුත්‍රවූ මා රක්‍ෂා නොකරන්නාවාදැයි කීමෙන් නින්දාවද අන්‍යයන් රක්‍ෂා කරන්නාවා දැයි කීමෙන් අනුග්‍රහයද ප්‍රකාශ කළෝ.

7 කඨහාරි ජාතකයයි.

---

8 අපි අතරමානානං ඵලාසාව සමිජ්ඣති,
විපක්කබ්‍රහ්මචරියොස්මි එවං ජානාහි ගාමණී'ති.

අතරමානානං, (නුවණැත්තවුන්ගේ අවවාදයෙහි සිට තුරිත නොව උපායක්‍රමයෙන්)කර්මාන්තයෙහි ප්‍රයුක්තවූයන්ට; ඵලාසා, ප්‍රා

තවූ ප්‍රයෝජනයෙහි) ආශාව නොහොත් ආශාඵලය; සමිජ්ඣති එව, සමෘද්ධවේමය; විපක්ක බ්‍රහ්මචරියොසමි, (දනාවී ප්‍රියවචනසමානාත්මතා සංඛ්‍යාත බ්‍රහ්මචර්‍ය්‍යාමූලකවූ යශස් සම්පත්තීන්ද මුහුකුරුවා සිටි බැවින්) පරිපක්වවූබ්‍රහ්මචර්‍ය්‍යා ඇතිවීමි; ගාමණි, ග්‍රාමණිය; එවං, මෙසේ; ජානාහි, දනු–"අපි"යනු නිපාතයි. "ගාමණී" ශබ්දය ග්‍රාම ජ්‍යෙෂ්ඨයන් කෙරෙහිද සර්වජන ශ්‍රේෂ්ඨයන් කෙරෙහිද වැටෙයි. මෙතැන්හි "ගාමණී" යනුයෙන් තමන් සර්වජනජ්‍යෙෂ්ඨහෙයින් ආත්මවර්ණනය කොට තමන්ටම ආමන්ත්‍රණය කළේ.

**8 ගාමණී ජාතකයයි.**

---

9 උත්තමඞ්ගරුහා මය්හං ඉමෙ ජාතා වයෝහරා,
පාතුභූතා දේවදූතා පබ්බජ්ජා සමයෝ මමා'ති.

මය්හං, මාගේ; උත්තමඞ්ගරුහා, (සියලු අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ට උත්තමයයි කියනලද සිරස්හි ජාත හෙයින්) උත්තමාඞ්ගරුහනම්වූ; වයෝහරා,(පලිතොත්පාදයෙන් ත්‍රිවිධ)වයස හැරගන්නාවූ; ඉමේ, මොහු; (මේ නරකෙස්නු); ජාතා, ජාතයහ; දේවදූතා, මෘත්‍යු මාරයාගේ දූතවූ නොහොත් දෙවතාවෙකුවැනි දූතයෝ; පාතුභූතා, ප්‍රාදුර්භූතවූහ (එසේහෙයින්); මම, මාගේ; පබ්බජ්ජා, ප්‍රව්‍රජ්‍යාවට; සමයෝ, කලැයි.

**9 මඛාදෙව ජාතකයයි.**

---

10 යං අඤ්ඤෙ න රක්ඛන්ති යො ච අඤ්ඤෙ න රක්ඛති,
ස වෙ රාජ සුඛං සෙති කාමෙසු අනපෙක්ඛවා'ති.

යං, යම්පුද්ගලයකු; අඤ්ඤෙ, සෙසු බොහෝ පුද්ගලයෝ; නරක්ඛන්ති,රක්‍ෂානොකෙරෙද්ද; යොච,යමෙක්;අඤ්ඤෙ, සෙසු බොහෝ පුද්ගලයන්; නරක්ඛති,රක්‍ෂානොකෙරේද; රාජ,මහරජ; සො, ඒපුද්ගලතෙමේ; කාමෙසු අනපෙක්ඛවා, (වස්තුකාමක්ලේශකාමයන්හි) අපේක්‍ෂාවක් නැතිව; වෙ, ඒකාන්තයෙන්; සුඛං සෙති, (හුදකලාව කාය විවේක චිත්තවිවේක) සැපයෙන් යුක්තව වාසය කරන්නේය—හුදෙක් ශයනය කරන්නේ නොවෙයි මෙබඳු පුද්ගලතෙමේ සියලු ඊර්‍යාපථයෙහි සැපසේ කල්යවන්නේය, යනු භාවයි.

**10 සුඛවිහාරි ජාතකයයි.**

**1 අපණ්ණක වග්ගයයි.**

---

11 හොති සීලවතං අත්ථො පටිසන්ථාරවුත්තිනං,
ලක්ඛණං පස්ස ආයන්තං ඤාතිසඞ්ඝපුරක්ඛතං,
අථ පස්සසි'මං කාළං සුවිහීනං'ව ඤාතිභි'යි.

සීලවතං, සිල්වත්වූ හෙයින් ආචාරසම්පන්නවූ; පටිසන්ථාරවුත්තිනං, (ධර්මාමිෂවශයෙන් විවිධවූ) පටිසන්ථාරයම ප්‍රවෘත්තිකොට ඇත්තවුන්ට; අත්ථො, අභිවෘද්ධි; හොති, වන්නේය; ඤාතිසඞ්ඝ, බන්ධු සමූහයා විසින්; පුරක්ඛතං, පුරස්කෘතවූ; ලක්ඛණං, ලක්ෂණ(මෘග)යා; ආයන්තං, එන්නාහු; පස්ස, බල; අථ, ඉක්බිත්තෙන්; ඤාතිභි, නෑයන් විසින්; සුවිහීනං එව, විශෙෂයෙන් හීනවූම; ඉමං කාළං, මේ කාළ(මෘග)යා; පස්සසි, බලව—ශීලාද්‍යනෙකගුණාඞ්ගයෙන් යුක්ත ලක්ෂණයන් බන්ධුවර්ගයා පිරිවරා එනපරිද්ද කිසි ගුණවිශෙෂයක් නැති කාළයා බන්ධුවර්ග විරහිතභාවයට පැමිණ එකලාව එන පරිද්ද බලවයි බොධිසත්ත්වයෝ මෘගධෙනුවට නියොග කෙරෙත්.

**11 ලක්ෂණ ජාතකයයි.**

---

12 නිග්‍රොධමෙව සෙවෙය්‍ය න සාඛමුපසංවසෙ,
නිග්‍රොධස්මිං මතං සෙය්‍යො යඤ්චෙ සාඛස්මිං ජීවිතං.

නිග්‍රොධමෙව සෙවෙය්‍ය, (පුත් තෙපි වේවා අනිකෙක් වේවා තමහට වැඩකැමැත්තේවීනම්) න්‍යග්‍රොධ මෘගරාජයාණන් වහන්සේම භජනය කරන්නේය; සාඛං න උපසංවසෙ, ශාඛමෘගරාජයා කරා නොඑළඹෙන්නේය; සාඛස්මිං, ශාඛනම් මෘගරාජයා සමීපයෙහි; යඤ්ච ජීවිතං, යම් ජීවත්වීමෙක් ඇද්ද; (එයටවඩා) නිග්‍රොධස්මිං මතං සෙය්‍යො, න්‍යග්‍රොධ මෘගරාජයාණන් වහන්සේගේ පාදමූලයෙහි වැදහෙව මියයාම උතුම් වන්නේයි.

**12 න්‍යග්‍රොධ මෘග ජාතකයයි.**

---

13 ධිරත්ථු කණ්ඩිනං සල්ලං පුරිසං ගාළ්හවේධිනං,
ධිරත්ථු තං ජනපදං යත්ථි'ත්ථී පරිණායිකා;
තෙ වා'පි ධික්කිතා සත්තා යෙ ඉත්ථීනං වසංගතා'ති.

කණ්ඩිනං, කණ්ඩනය යන නම්ඇති; සල්ලං, අනුප්‍රවෙශනාර්ථයෙන් සල්ලනම් ශරයඇති; නොහොත්: කණ්ඩිනං, කාණ්ඩඇති; සල්ලං, (ශල්‍යනම්වූ) ශරය ඇති; ගාළ්හවෙධිනං, දෘඪකොට විදිනාවූ; පුරිසං, පුරුෂයාට; ධිරත්ථු, නින්දාවේවා; තං, යම් ජනපදයෙක්හි;

ඉත්ථී, ස්ත්‍රියක් තොමෝ; පරිණායිකා, (ගෘහකාර්‍යයෙහි සිට) සංවිධාන කරන්නීද; තං, ඒ ජනපදයට; ධිරත්ථු, නින්දාවේවා; යෙ, යමෙක්හු; ඉත්ථීනං, ස්ත්‍රීන්ගේ; වසං, වශඟභාවයට; ගතා, ගියෝද; තෙචා'පි ස නරා, ඒ පුරුෂයෝද; ධික්කිතා, නින්දිතයහ—මේ ගාථාවෙන් නින්දිත වස්තූන් තුන්දෙනකු දක්වූහ, යනු අභිප්‍රායයි.

**13 කණ්ඩින ජාතකයයි.**

---

14 න කිරත්ථි රසෙහි පාපියො ආවාසෙහි වා සන්ථවෙහි වා,
වාතමිගං ගෙහනිස්සිතං වසමානෙසි රසෙහි සඤ්ජයො'ති.

ආවාසෙහි වා, (නිරන්තරවාසස්ථානවූ) ආවාසයෙහිද; (ඡන්දරාගය); පාපියො, ලාමකය; සන්ථවෙහි වා, මිත්‍රසන්ථවයෙහිද (ඡන්දරාගය); පාපියො, ලාමකය; (ඒදෙතැන්හි ඡන්දරාගයටවඩා), රසෙහි: (මධුරාම්ලාදි ජිහ්වා විඤ්ඤෙයවූ) රසයෙහි ඡන්දරාගය; පාපියො, පාපතරය; න අත්ථිකිර, (ඊටවඩා අධික ඡන්දරාගයෙක්) නොම ඇත්ල; (එසේමැයි,) ගෙහනිස්සිතං, ගෘහස්ථානය ආශ්‍රිතවූ; වාතමිගං, වාතමෘගයා; සඤ්ජයො, සඤ්ජයනම් උද්‍යානපාලතෙම; රසෙහි, රසයෙන්; වසං, (තමාගේ) වසඟ බවට; ආනෙසි, පැමිණවී.

**14 වාත මෘග ජාතකයයි.**

---

15 අට්ඨඛුරං ඛරාදියෙ මිගං වඞ්කා'තිවඞ්කිනං,
සත්තහි කලාහ'තික්කන්තං න නං ඔවදිතුස්සහෙ'ති.

ඛරාදියෙ, ඛරාදියනම් නැනැත්තිය; අට්ඨඛුරං, අටකුරයක් ඇති; වඞ්කා'තිවඞ්කිනං, මුලින් වක්වූ අංඇති හෙයින් වඞ්කාතිවඞ්කයයි කියනලද; සත්තහි කලාහි, සප්තඅවවාදකාලයෙන්; අතික්කන්තං, ඉක්මුණු; නං, ඒමෘගයාට; ඔවදිතුං, අවවාද කරන්ට, න උස්සහෙ, උත්සාහ නැත්තෙමි.

**15 ඛරාදිය ජාතකයයි.**

---

16 මිගං තිපල්ලත්ථමනෙකමායං
අට්ඨක්ඛුරං අඩ්ඪරත්තා'ව පායිං,
එකෙන සොතෙන ඡමා'ස්සසන්තො
ඡහි කලාහ'ති භොති භාගිනෙය්‍යා,ති.

තිපල්ලත්ථං, (දෙඇලයෙන් හා සෘජුවදූයි මෙසේ) ත්‍රිවිධ සයනය කරන්නාවූ; අනෙකමායං, බොහෝ මායා ඇති; අට්ඨ ඛුරං, අටකුරයක් ඇති; අඩ්ඪරත්තා 'පායිං, මධ්‍යරාත්‍රියෙහි බොන්නාවූ; මිගං, (මාගේබෑනණුවූ) මෘගයා; (නොයෙක් මෘගමායම් යහපත්කොට ඉගැන්වීම්) ඒ කෙසේදයත්? එකෙන සොතෙන, යටවූ එක්නාසිකා ශ්‍රොතසකින්; ඡමා, පොළවට; අස්සසන්තො, ආශ්වාසහරනේ; ඡහි කලාහි, ෂට්කලාවෙන්, භාගිනෙය්‍යො, (මාගේ) බෑනණුතෙම, අතිභොති, (වැද්දා) මඩී; නොහොත්; භොති, පින්වතිය; භාගිනෙය්‍යො, (මාගේ) බෑනණුතෙම; ඡහි, ෂට්කලාවෙන්; කලාභතී, ව්‍යාධයා; (වචාකෙරේ)— එනි ෂට්කලානම් පාදයන් සතර ඡදනා ප්‍රසාරණය කොට එකපාශ්වීයකින් ශයනය, කුරයෙන් තෘණ පාංශු ඛණනය, ජිහ්වා නිර්ණාමනය, උදරයාගේ සොපාකෘතියට පැමිණවීමය, මූත්‍ර පුරීෂ දෙදෙනාගේ විසර්ගය, බාහ්‍ය වාත සන්නිරුම්භනය, යනමේ සයෙන් හෝ වැද්දා විසින් අල්වාගෙන අභිමුඛව අදනා කලද, නැවත ඔබට දමාපියන කලද, වමැළයට දමාලන කලද, දකුණැළයට දමාලන කලද, උඩට නගාලන කලද, නගායට හෙළාලන කලදැයි, මේ සතැන්හි හෝ මෘත්‍යු පාශව වැදහෝනා කලද, හේ ෂට්කලානම් වන්නේය.

### 16 තිපල්ලත්ථ මිග ජාතකයයි.

---

17 කාළෙ වා යදි වා ජුණ්හෙ යදා වායති මාලුතො,
වාතජානි හි සීතානි උභොත්ථ මපරාජිතා'ති.

කාළෙ වා, කෘෂ්ණ පක්ෂයෙහිද; යදිවා; නොහොත්; ජුණ්හෙ, ශුක්ලපක්ෂයෙහිද; (යනමේ දෙපක්ෂයෙහි) යදා; යම් කාලෙක්හි; මාලුතො, (පූර්වාදිදිගින් යුක්ත) මාරුතය; වායති, හමාද, (එසමයෙහි ශීතවේ) කුමක් හෙයින්ද යත්? සීතානි, (යම්හෙයකින්) ශීතයෝ; වාතජානි හි; වාතජයෝද එහෙයින්; එත්ථ, මෙහිලා; උභො, (සිංහ ව්‍යාඝ්‍ර තෙපි) දෙදෙනම; අපරාජිතා, නොපැරදවූහු,

### 17 මාලුත ජාතකයයි.

---

18 එවඤ්චෙ සත්තා ජානෙය්‍යුං දුක්ඛා'යං ජාතිසම්භවො,
න පාණො පාණිනං හඤ්ඤෙ පාණඝාතී හි සොචති,ති.

අයං, මේ; ජාති, (ඒ ඒ තන්හි) උත්පත්තියද; සම්භවො, වැඩීමද; දුක්ඛා (ජාත්‍යාදි දුඃඛයන්ට කාරණ හෙයින්) දුඃඛයයි; සත්තා, සත්ත්වයෝ, චෙ, ඉදින්; එවං, මෙසේ, ජානෙය්‍යුං. (පරවධකරන්නේ ජාතිසම්භවයෙහි වධලබන්නේයයි) දන්නාහුනම්; පාණො, ප්‍රාණියෙක්; පාණිනං, ප්‍රාණියක්හු, න හඤ්ඤෙ, හිංස නොකරන්නේය; හෙවත් නොනසන්නේය. කුමක් හෙයින්දයත්?හි, යම් හෙයකින්; පාණඝාති, ප්‍රාණවිනාශකරන්නේ; සොචති, (නරකාදියෙහි) සොක කරන්නේද එහෙයින්සත්ත්වයෙක් සත්ත්වයක්හු දිවි නොගළවන්නේයි

## 18 මතකභත්ත ජාතකයයි.

---

19 සචෙ මුච්චෙ පෙච්ච මුච්චෙ මුච්චමානො හි බජ්ඣති *
න හෙවං ධීරා මුච්චන්ති මුත්ති බාලස්ස බන්ධනන්ති.

සචෙ, ඉදින්; මුච්චෙ, (තෝ මින්) මිදෙනු කැමැත්තෙහිවීනම්; පෙච්ච මුච්චෙ, (යම්සේ) පරලෙව්හි (කර්මබන්ධනයෙන් නොබැඳේද එපරිද්දෙන්)මිදෙව; මුච්චමානො හි; ප්‍රාණවධාදී දුශ්චරිතකොට දැන් මිදෙන්නෙහිද, බජ්ඣති, (මතුපාපපාශයෙන්) බැඳෙන්නෙහිය; (එහෙයින්) ධීරා, නුවණැත්තෝ; එවං, මතු පාපපාශයෙන් නොමිදෙන පරිද්දෙන්;නහි මුච්චන්ති,නොමිදෙත්;බාලස්ස, අඥානයාගේ,මුත්ති, (ප්‍රාණවධකොට) මුක්තිය; බන්ධනං, බැඳීමයි-යමෙක් ප්‍රාණවධකොට අනතුරායෙන් මිදේද ඉහ පරලොව පාපපාශයෙන් නොමිදෙන හෙයින් මිදුණත් බැඳුණානම් වෙයි-යන අභිප්‍රායයි.

## 19 ආයාචිතභත්ත ජාතකයයි.

---

20 දිස්වා පදමනුත්තිණ්ණං දිස්වානොතරිතං පදං,
නළෙන වාරිං පිවිස්සාම නෙව මං ත්වං වධිස්සසී'ති.

අනුත්තිණ්ණං, ගොඩට නොනැගී; පදං, පියවර; දිස්වා, දැක; ඔතරිතං, දියටබට; පදං, පියවර,දිස්වාන, දැක;නළෙන; බටනළින්;

---

* බජ්ඣති-මුද්‍රිත ජාතකට්ඨකථා.

වාරිං, ජලය; පිවිස්සාම, බොම්හ; ත්වං, තෝ; මං, මා; නෙව වධිස්සසි, නොමවධනෙකරෙහි-විල සිසාරා ඇවිද ගොඩින් දියට බට පියමුත් නැඟිපිය නැතිහෙයින් යක්ෂාධිෂ්ඨිත විලෙකැයි දැන බට දණ්ඩක් ගෙන පාරමිතා ධර්මයන් සිහිකොට පිඹ ගැටනැසිකොට වානර සෙනාව හා එක්ව ගොඩහිඳ පැන්පූන-යනු අභිප්‍රායයි.

20 නළපාන ජාතකයයි.

2 සීල වර්ගයයි.

---

21 ඤාතමෙතං කුරුඞ්ගස්ස යං ත්වං සෙපණ්ණි සෙය්‍යසි,
අඤ්ඤං සෙපණ්ණිං ගච්ඡාමි න මෙ තෙ රුච්චතෙ ඵලන්ති·

සෙපණ්ණි, එම්බා ඇද්දෙමට රුක; ත්වං, තෝ; යං, යම්හෙය කින්; සෙය්‍යසි, (ඉදිරියෙහිපල) විසුරුවන්නෙක් වූයෙහිද; එතං, මේ කාරණය; කුරුඞ්ගස්ස, කුරුඞ්ග මෘගයා විසින්; ඤාතං, දන්නාලදී නොහොත්; කුරුඞ්ගස්ස, කුරුඞ්ගයාහට; ඤාතං, ප්‍රකටය; අඤ්ඤං, අනික්; සෙපණ්ණිං, සෙපණ්ණිරුකකට; ගච්ඡාමි, යමි; තෙ, තාගේ; ඵලං, ඵලය; මෙ, මට; න රුච්චතෙ, නොරුස්නේය—මෙසේ වෘක්ෂ ව්‍යාජයෙන් ව්‍යාධයාහට කියා ගසයටට නොපැමිණ මගැගියහ, යනු අභිප්‍රායයි.

21 කුරුඞ්ග මෘග ජාතකයයි.

---

22 යෙ කුක්කුරා රාජකුලම්හි වද්ධා
කොලෙය්‍යකා වණ්ණබලූපපන්නා,
තෙ මෙ න වජ්ඣා මයමස්ම වජ්ඣා
නා'යං සඝච්චා දුබ්බලඝාතිකා'යන්ති.

වණ්ණබලූපපන්නා, වර්ණයෙන් හා කායබලයෙන් යුක්තවූ; කොලෙය්‍යකා, රාජකුලයෙහි ජාතවූ; රාජකුලම්හි, රජගෙහි; වද්ධා, වැඩියාවූ; යෙ කුක්කුරා, යම් බලුකෙනෙක් ඇද්ද; තෙ ඉමෙ, ඒ මේ (සස්වාමිකවූ රක්ෂාසහිත) බල්ලෝ; න වජ්ඣා, අවධ්‍යයහ(වධයට සුදුස්සෝ නොවෙති); මයං, අපි; වජ්ඣා අස්ම, වධාර්හවූම්හ; අයං, මේ වධය; සඝච්චා න, ප්‍රබල වධනම් නොවේ; අයං, මේ වධය; දුබ්බලඝාතිකා, දුර්වල වධනම්වේ.

22 කුක්කුර ජාතකයයි.

---

23 අපි පස්සෙන සෙමානො සල්ලෙහි සල්ලලීකතො,
සෙය්‍යො'ව වළවා භොජ්ජො යුඤ්ජ මඤ්ඤෙ'ව සාරථී'ති.

සල්ලෙහි, ශරයෙන්; සල්ලලීකතො, විදිනාලද; (එහෙයින්ම) පස්සෙන, එක පාශ්වීයෙන්; සෙමානො අපි, හෝනාදවූ; භොජ්ජො ච, භොජ්ජානීයවූ ජාතිසෛන්ධවයාම්; වළවා, බලුඛකාශ්වයාට වඩා; සෙය්‍යො, උතුම්; සාරථි, සාරථිය; මං එව, මාම; යුඤ්ජ, යොද-රථාචාය්‍ය්‍යීය විද්කා දුබ්ලව හොත්තාවූ මම්ම ශ්‍රෙෂ්ඨයෙම් තා යොදත් නට පටන්ගත් නොහික්මුණු අශ්වයා හැර මාම යුඬයට යොදසී, යනු අභිප්‍රායයි.

## 23 භොජාජානීය ජාතකයයි.

---

24 යදා යදා යත්ථ යදා යත්ථ යත්ථ යදා යදා,
ආජඤ්ඤො කුරුතෙ වෙගං හායන්ති තත්ථ වාළවා'ති.

යදා යදා, (පූර්වාන්නාදි) යම් යම් කාලයක්හි වේවයි; යත්ථ, සඞ්ග්‍රාමාදිවූ යම්තැනෙක්හි වේවයි; යදා, යම්ක්ෂණයෙක්හි වේවයි; යත්ථ යත්ථ, යම් යම් යුඬමණ්ඩලයෙක්හි වේවයි; යදා යදා, යම් යම් කාලෙක්හි වේවයි හෙවත් ප්‍රහාරලබ්ධ කාලයෙහිද අලබ්ධකාලයෙහිද; ආජඤ්ඤො, අභිප්‍රාය දන්නා සුලුවූ උතුම් සෛන්ධවයාම; වෙගං, ව්‍යායාම ය; කුරුතෙ, කෙරේද හෙවත් වීය්‍ය්‍යකිරීමට ප්‍රාරම්භකෙරේද; තත්ථ, එහිලා හෙවත් උත්තම අශ්වරත්නය ප්‍රයුක්තකල්හි; වාළවා, බලුංකාශ්වයෝ; හායන්ති, පිරිහෙත්; හෙවත් උත්තමාශ්වයා හා එක්ධුරයෙක්හි දිවිය නොහෙත්, එහෙයින් මාම යොදව, යනු අභිප්‍රායයි.

## 24 ආජඤ්ඤ ජාතකයයි.

---

25 අඤ්ඤමඤ්ඤෙහි තිත්ථෙහි අස්සං පායෙහි සාරථි,
අච්චාසනස්ස පුරිසො පායාසස්ස'පි තප්පතී'ති.

සාරථි, රථපදනව; අඤ්ඤමඤ්ඤෙහි, අනික් අනික්; තිත්ථෙහි, තොටකින්; අස්සං, අශ්වයා; පායෙහි, පොව; පුරිසො, පුරුෂතෙම; අච්චාසනස්ස, අත්‍යාසනයෙන්; (අධිකකොට කෑම කරණකොටගෙන) පායාසස්සපි, (ගිතෙල්ආදීන් අභිසංස්කෘත) මධුරපායාසයෙන්ද;

තපපයි, තෘපතාවේ -මෙහි “අචිණ්ණනස්ස,, යනු කරණාර්ථයෙහි ෂෂ්ඨී සි, මේ තීර්ථයෙහි ස්නාන පානයෙහි නියුක්තවූ අශ්වයා දුන් අනික් අශ්වයෙකුගේ ස්නානයෙන් අපවිත්‍රවූ තීර්ථයෙහි තමාගේ ශෘඞ්ගාර ත්වය හෙතුකොටගෙන ස්නානය නොකැමැත්තේය, එසේ හෙයින් අනිස් තොටක නහවවයි, යනු අභිප්‍රායයි.

## 25 තිත්ථ ජාතකයයි.

---

26 පුරාණචොරාන වචො නිසම්ම
මහිලාමුඛො පොථයමානුචාරි,
සුසඤ්ඤතානං හි වචො නිසම්ම
ගජුත්තමො සබ්බගුණෙසු අට්ඨා‘ති.

මහිලාමුඛො, හස්තිනීමුඛ සදෘශහෙයින් නොහොත් අභිමුඛදර්ශ නයෙන් හොබනා හෙයින් මහිලාමුඛනම්වූ ඇතු; පුරාණචොරා නං, පුරාණචෞරයන්ගේ; වචො, රෞද්‍රතෙපුල; නිසම්ම, අසා; අනුචාරි, ඊට අනුව හැසිරෙන්නේ; නොහොත් (“අනුචාරි,, කියා පාඨගෙන); අනුචාරී, රෞද්‍රවචනයට අනුවූ ප්‍රවෘත්තිඇතිව; පොථ යං, කොපයෙන් යුක්තව ප්‍රහාරය දෙන්නේ; සුසඤ්ඤතානං, කාය වාක් සමාචාරයෙන් සුසංයතයන්ගේ; වචො හි, තෙපුල්; නිසම්ම, පරීක්ෂාකොට අසා; ගජුත්තමො, ගජොත්තම තෙම; සබ්බගුණෙසු, (පූර්වයෙහි තමාගේ සත්හුත්) සියලුගුණයෙහි; අට්ඨා, පිහිටියේයි.

## 26 මහිලාමුඛ ජාතකයයි.

---

27 නාලං කබළං පදාතවෙ න ච පිණ්ඩං න කුසෙ න ඝංසිතුං,
මඤ්ඤාමි අභිණ්හදස්සනා නාගො සිනෙහමකාසි කුක්කුරෙ‘ති.

කබළං, (දෙවයෙහි බතට පළමුකොට දෙන කටුකභෛෂජ්‍යයෙන් යුක්ත) පිණ්ඩය; පදාතවෙ, ගන්නට හෙවත් අනුභවකරන්නට; නාලං, නොපොහොසත; නච පිණ්ඩං, පිඬුකොටගෙනා බතද ගන්න ට නොපොහොසත; න කුසෙ, තෘණද ගන්ට හෙවත් අනුභව කරන්ට නොපොහොසත; න ඝංසිතුං, (නහවනෑවිලෙහි)ශරීරොම ඝර්ෂණය කරන්ටද නොපොහොසත; අභිණ්හදස්සනා, සතතදර්ශ නය හෙතුකොට ගෙන; නාගො, ඇත්තෙම; කුක්කුරෙ, බල්ලකෙ

රෙති; සිනෙහං අකාසි, ස්නෙහකෙළේයයි; මඤ්ඤෙ, හඟිමි.–එහෙ සින් ඒ ප්‍රේමකළ බල්ලා ගෙන්වා ශොකපහකරව යනු අභිප්‍රායයි.

**27 අභිණ්හ ජාතකයයි.**

---

28 මනුඤ්ඤමෙව භාසෙය්‍ය නාමනුඤ්ඤං කුදාචනං,
මනුඤ්ඤං භාසමානස්ස ගරුමභාරං උදද්ධරි,
ධනඤ්ච තං අලභෙසි තෙන ච'ත්තමනො අහු'ති.

මනුඤ්ඤං එව, (පරුෂාදීන් දුරුකොට) මනොඥ වචනයක්ම; භාසෙය්‍ය, බණන්නේය; කුදාචනං, කිසිකලෙක්හිදු; අමනුඤ්ඤං, අමනොඥකොට; නභාසෙය්‍ය, (පරුෂාදීන් මිශ්‍රකොට) නොබණන්නේය; එයින් ප්‍රයෝජන කිම්දයත්? මනුඤ්ඤං, මනොඥකොට හෙවත් ප්‍රේමාන්විතකොට; භාසමානස්ස, බණන්නාහට; ගරුං,(සකට ශතප්‍රමාණ වශයෙන්) බරවූ; භාරං, (මහා)භාරය; උදද්ධරි, ඉදිරිය, නොහොත් තුබූතැනින් පෙරළා පීය; තං, ඒබමුණා; ධනඤ්ච, වස්තු වද; අලභෙසි, ලැබ්බවිය; තෙන, එහෙයින්; අත්තමනො ච, සතුටු වූයේද; අහු,වී—"උදද්ධරි" කීතැන දකාර සංහිතාහෙයින් ආගමවී.

**28 නන්දිවිසාල ජාතකයයි.**

———:o:———

29 යතො යතො ගරු ධුරං යතො ගම්භීරවත්තනී,
තදස්සු කණ්හං යුඤ්ජන්ති ස්වාස්සු තං වහතෙ ධුරන්ති.

යතො යතො, යම් යම් තැනෙක්හි; ධුරං, ධුරය; ගරු, බරද (සෙසු බලිවර්ද්දයෝ ඔසවන්නට නොපොහොසත්හුද); යතො, යම් තැනෙක්හි; ගම්භීරවත්තනී, (දියඹ්ඩ බොහෝ බැවින් හා විෂමවූ සිදුණුඉවුරු ඇතිබැවින්ද) ගැඹුරුවූ මාර්ගයෙක් වේද; තදා, එකල්හි; කණ්හං යුඤ්ජන්ති,(සෙසුගොන් පහකොට)කණ්හනම් බලිවර්ද්දයා යොදත්; සො, හෙතෙම; තං ධුරං, ඒ ධුරය; වහතෙ, උසුලන්නේයි; (අස්සු) යනු නිපාතයි, යම් තැනෙක්හි ඉසිලුවමනා ධුරය බරවිනම් සකට මාර්ගය ගම්භීරවීනම් සෙසුගොන් පහකොට කණ්හනම් බලිවර්ද්දයා යොදති හේ ඒ යුගධුරය ඇද ගොඩ තබන්නේය, යනු භාවයි.

**29 කණ්හ ජාතකයයි.**

---

30 මා මුනිකස්ස පිහයී ආතුරන්නානි භුඤ්ජති,
අප්පොස්සුක්කො භුසං ඛාද එතං දීඝායුලක්ඛණං.

මුනිකස්ස, මුනිකනම් ශූකරයාගේ (භොජනය); මා පිහයී, නොහ මක් ප්‍රාර්ථනා කරව; කුමක් හෙයින්ද යත්? ඒ මුනිකනම් ශූකර තෙම, ආතුරන්නානි, මරණාහාරය (තමනට මරණ බත); භුජති, කයි; අප්පොස්සුක්කො, (මධුරාහාරයට) උත්සාහ නොකොට; භුසං, තමා විසින් ලබනලද රබු හෙවත් තෘණපත්; ඛාද, කව; එතං, මේ; දීඝායුලක්ඛණං, දීර්ඝායුෂ්කවීමට ලක්‍ෂණයයි.

**30 මුනික ජාතකයයි.**

---

**3 කුරුඞ්ග වග්ගයයි.**

---

31 කුලාවකා මාතලි සිම්බලිස්මිං
ඊසා මුඛෙන පරිවජ්ජයස්සු,
කාමං චජම අසුරේසු පාණං
මා ඉමෙ දිජා විකුලාවා අහෙසුන්ති.

මාතලි, මාතලි දිව්‍ය පුත්‍රය; සිම්බලිස්මිං, හිඹුල් වෙනෙහි; කුලාවකා, සුපර්ණපොතකයෝ (එලී හොවිති ඔවුන්); ඊසාමුඛෙන, රථ ශීර්ෂයෙන්; පරිවජ්ජයස්සු, දුරුකරව; අසුරෙසු, අසුරයන් කෙරෙහි; පාණං. ප්‍රාණය; චජම, හරිමු; ඉමෙ දිජා, මේ සුපර්ණපොතකයෝ; වි කුලාවා, විගතවූ කුලාවක ඇත්තාහු; මා අහෙසුං, නොහමක් වෙත්වා– අසුරයන් අත මියමෝ තමුත් අප නිසා සුපර්ණපොතකයෝ රථ යෙන් සැවී නොමියෙත්වයි යන අභිප්‍රායයි.

**31 කුලාවක ජාතකයයි.**

---

32 රුදං මනුඤ්ඤං රුචිරාච පිට්ඨී
වෙළුරිය වණ්ණුපනිභා ච ගීවා,
ව්‍යාමමත්තානිච පෙඛුණානි
නච්චන තෙ ධීතරං නො දදාමීති.

රුදං, (මියුරය නාගේ) ශබ්දය; මනුඤ්ඤං, මනොඥය; පිට්ඨී ච, පිටද; රුචිරා, සිත්කලුය; ගීවා ච, ග්‍රීවයද; වෙළුරිය, වෛදූර්‍ය්‍ය මාණි

කාෂායයකි; වණ්ණූපනිභා, වර්ණයෙහි සදෘශය; පෙබුණාහි ච, පිංජහා රජෝද; ව්‍යාමමත්තානි, ව්‍යාමමාත්‍රයහ; (මේසේවූ රූපීවූවද) තවෙව න, (භයලජ්ජාතැති) කෘතාඥය ගෙනුකොටගෙන; තෙ, තට; ධීතරං, මාගේ) දුව; නො දදමි, නොදෙමි.

**32 නච්ච ජාතකයයි.**

———o8o———

33 සම්මෝදමානා ගච්ඡන්ති ජාලමාදාය පක්ඛිනො,
යදා තෙ විවදිස්සන්ති තදා එහින්ති මෙ වසන්ති.

පක්ඛිනො, (වටු)පක්ෂීහු; සම්මෝදමානා, (විවාදනොකරන්නාහු) සමගිවූවාහු; ජාලං, දැල; ආදාය, (නගා) ඇරගෙන; ගච්ඡන්ති, යෙති; තෙ, ඒ පක්ෂිහු: යදා, යම්කලෙක්හි; විවදිස්සන්ති, විවාද කෙරෙද්ද; තදා, එකල්හි; මෙ, මාගේ; වසං, වශයට; එහින්ති, එ[illegible]—එදවස් උන්හැම්දෙන හැරගෙන ගී සතුටු කරවම්, යන අභිප්‍රායයි.

**33 සම්මෝදමාන ජාතකයයි.**

———o8o———

34 න මං සීතං න මං උණ්හං න මං ජාලස්මිං බාධනං,
යඤ්ච මං මඤ්ඤතෙ මච්ඡී අඤ්ඤං සො රතියා ගතොති.

මං, මා; සීතං, ශීතය; න, බාධනය කරන්නේ නොවෙයි; මං, මා; උණ්හං, උෂ්ණය; න, බාධනය කරන්නේ නොවෙයි; මං, මා; ජාලස්මිං, දැලෙහි; බාධනං, බැඳීමද; න, බාධනය කරන්නේ නොවෙයි, (වැළි පීඩාතම්)කිමිදයත්? යඤ්ච, යම්හෙයකින් නොහොත් යම්බඳුවූ; මං, මා; (නොදක්නාවූ) මච්ඡී, මත්ස්‍ය ධේනුතොමෝ; සො, තේ(මාගේ) මත්ස්‍යයා; අඤ්ඤං, අනික් මත්ස්‍යධේනුවක සමීපයට; රතියා; කාමරතිය පිණිස; ගතො, ගියේයයි; මඤ්ඤතෙ, සිතාද; ඒ මේසිය ලූ දුකට වඩා මා පෙළන්නේය, යනු අභිප්‍රායයි.

**34 මච්ඡ ජාතකයයි.**

———o8o———

35 සන්ති පක්ඛා අපතනා සන්ති පාදා අවඤ්චනා,
මාතා පිතා ච නික්ඛන්තා ජාතවෙද පටික්කමාති.

පක්ඛා, (මාගේ) පක්ෂපත්‍රයෝ; සන්ති, විද්‍යමානයහ; අපතනා, ආකාශගමනයට අශක්‍යයහ; පාදා, පාදයෝ; සන්ති, ඇත්තාහ; අවඤ්චනා, වඤ්චනයකොට යන්නට හෙවත් පියවරතබමින් යන්ට අයොග්‍යයහ; මාතා, (මාගේ)මෑණියෝද; පිතා ච, (මාගේ) පියාණෝද; නික්ඛන්තා, (මාහැර)ගියහ; ජාතවේද, ජාතවේදය; පටික්කම, පහවෙව හෙවත් නවතුව නැවත නොනැඟ සි ජාතවේදයට නියෝග කළෝ,

**35 වට්ටක ජාතකයයි.**

———oĝo———

36 යං නිස්සිතා ජගතිරුහං විහඞ්ගමා ස්වායං අග්ගිං පමුඤ්චති
දිසා භජථ වක්කඞ්ගා ජාතං සරණතො භයන්ති.

යං ජගතිරුහං, යම් වෘක්ෂයක්; විහඞ්ගමා, පක්ෂීහු; නිස්සිතා, ආශ්‍රය කළෝද; සො අයං, ඒ මේ වෘක්ෂතෙම; අග්ගිං, ගිනි; පමුඤ්චති, හරනේය; වක්කඞ්ගා, වක්‍රවූ ග්‍රීව හා පක්ෂ ඇතිහෙයින් වක්කඞ්ග නම්ලද පක්ෂීනි; දිසා, දිගුන්; භජථ, සෙවනය කරව්; සරණතො,. සරණස්ථානයෙන්; භයං, භය; ජාතං, උපනි; යම්හෙයකින් සරණස්ථානවූ වෘක්ෂයෙන් ගිනි පත්ද එහෙයින් නැඟී යව් යනු අභිප්‍රායයි.

**36 සකුණ ජාතකයයි.**

———oĝo———

37 යෙ වුඩ්ඪමපචායන්ති නරා ධම්මස්ස කොවිදා,
දිට්ඨෙව ධම්මෙ පාසංසා සම්පරායෙ ච සුග්ගතින්ති.

ධම්මස්ස, (වෘද්ධාපචායන) ධර්මයෙහි; කොවිදා, දක්ෂවූ; යෙ, යමෙක් නරවූ; වුඩ්ඪං, (කුලවෘද්ධ ගුණවෘද්ධ වයොවෘද්ධ තුන්දෙනා කෙරෙන්)ගුණවෘද්ධ වයොවෘද්ධ දෙදෙනාහට; අපචායන්ති, පූජාකෙරෙද්ද (ඔහු; දිට්ඨෙව ධම්මෙ, මෙම ආත්මභාවයෙහි; පාසංසා, ප්‍රශංසාවිහ වෙති; සම්පරායෙ ච, (මෙලොව හැර යායුතු) පරලොව්හිද; සුග්ගතිං, සුගතියට යන්නාහුයි.

**37 තිත්තිර ජාතකයයි.**

---

38 නාච්චන්තං නිකතිප්පඤ්ඤො නිකත්‍යා සුඛමෙධති,
ආරාධෙති නිකතිප්පඤ්ඤො බකො කක්කටකාමිවාති.

නිකතිප්පඤ්ඤො, වංචාබුද්ධිඇත්තේ; නිකත්‍යා, (තමාගේම)වංචාවෙන්; අච්චන්තං, අත්‍යන්තයෙන්; සුඛං, සුව; න එධති, නොවඩා

හෙවත් නිත්‍යයෙන් කිසි සුවයෙක්හි නොපිහිටා; නිකතිප්පඤ්ඤ, කෛරාටික භාවයෙන් හික්මුණු ප්‍රඥා ඇති පුරුෂතෙම; ආරාධෙති, තමාට හයක්) ආරාධනා කරන්නේයි හෙවත් ලබන්නේයි; කෙසේද යත්? සාකකමකා, කකුළුවාකෙරෙන් ග්‍රීවාච්ඡේදයට පැමිණි, බකො ඉව, කොකු මෙනි—යම්සේ බකයා තමාගේ වචාබුඩින් කකීටකයා කෙරෙන් ග්‍රීවාච්ඡේදයට පැමිණ විනාශයට ගියේද ඔහුමෙන් සමෙක් ශඨප්‍රවෘත්ති ඇත්තේ වීනම් එබඳු විනාශයට පැමිණෙණයි සේයි.

### 38 බක ජාතකයයි.

---

39 මඤ්ඤෙ සොවණ්ණයො රාසි සොවණ්ණමාලාච නන්දකො,
යස්ස දාසො ආමජ්ජතො ඨිතො ථුල්ලානි ගජ්ජතීති.

ආමජ්ජනො, කුලජාතදාසියගේ පුත්වූ; නන්දකො, නන්දකනම්වූ; දාසො, දාසතෙම; යස්ස, යම්තැනෙක්හි; ඨිතො, සිටියේ; ථුල්ලානි, පරුෂකොට; ගජ්ජති, ගර්ජනාකෙරේද හෙවත් බෙණේද; සොවණ්ණයො, ශොභනවූ වර්ණසාමාන්‍යයෙන් (සුවර්ණ රජතාදීන්) නිර්මිතවූ; රාසි, රාශියද; සොවණ්ණමාලා ච, සුවර්ණමාලාද; එස්ස; මෙතැන්හියයි; මඤ්ඤෙ, හඟිමි, "යස්ස" යනුබලා "එස්ස" යනු අධ්‍යාහාරයි.

### 39 නන්ද ජාතකයයි.

---

40 කාමං පතාමි නිරයං උද්ධපාදො අවංසිරො,
නානරියං කරිස්සාමි හන්ද පිණ්ඩං පටිග්ගණ්හාහි.

උද්ධපාදො, ඌර්ධ්වපාද වූයෙම්; අවංසිරො, අධඃකෘත හිස්ඇත්තෙම්; කාමං, ඒකාන්තයෙන්; නිරයං, (අඞ්ගාරකාසු සඞ්ඛ්‍යාතවූ) නරකයකි; පතාමි, හෙමි; (එපාතුදුවූවත්) අනරියං, (ආර්‍ය්‍යයන් විසින් නොකරනලද අදත්ත අශීලාදී) අනාර්‍ය්‍යක්‍රියාවක්; න කරිස්සාමි, නොකරන්නෙමි; හන්ද, එබැවින්; පිණ්ඩං, පිඬුකොට කැමහෙතුකොට ගෙන පිණ්ඩයයි කියනලද බත; පටිග්ගණ්හ, පිළිගනු මැනවි.

### 40 ඛදිරඞ්ගාර ජාතකයයි.

---

### 4 කුලාවක වර්ගයයි.

---

41 යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං,
අජියා පාදමොලුබ්භ
මිත්තකො විය සොචතී'ති.

අත්ථකාමස්ස, අභිවෘද්ධිකැමැත්තාවූ; හිතානුකම්පිනො, හිතයෙන් අනුකම්පා කරන්නහුගේ; සාසනං, අනුශාසනය; ඔවජ්ජමානො, අවවාද කරණු ලබන්නාවූ; යො, යමෙක්; න කරොති, නොකෙරේද;(එසේවූ පුරුෂතෙම) අජියා, එළියගේ; පාදං, පය; ඔලුබ්භ, එල්බගෙන; මිත්තකො විය, මිත්තවින්දකයා පරිද්දෙන්; සොචති, ශොක කරන්නේයි.

41 ලොසක ජාතකයි.

———— ০৪০ ————

42 යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං,
කපොතකස්ස වචනං අකත්වා
අමිත්තහත්ථත්ථගතො'ව සෙතීති.

පූර්වාර්ධය සමයි අර්ථමය; කපොතකස්ස, කපොතකයාගේ; වචනං, වචනය; අකත්වා, නොකොට; අමිත්තහත්ථත්ථගතොව, අමිත්‍රවූ සූදයාගේ හස්තපථයට ගියාවූ කාකයා මෙන්; සෙති, (ව්‍යසනප්‍රාප්තව) හෝනේයි.

42 කපොත ජාතකයි.

———— ০৪০ ————

43 යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං,
එවං සො නිහතො සෙති
වෙළුකස්ස යථා පිතා'ති.

මෙහිදු පූර්වාර්ධයට සමයි අර්ථ ඇත්තේය—යමෙක් මෙක් යත පරිද්දෙන් අවවාද කාරීන්ගේ වචනයෙහි නොහික්මීද, සො, එසේවූ පුරුෂතෙම; වෙළුකස්ස, වෙළුකනම් සර්පයාගේ; පිතා, පියතෙම; යථා, යම්සේද; එවං, එපරිද්දෙන්; නිහතො, නැසුවූයේ; සෙති, හෝනේයි.

43 වෙළුක ජාතකයි.

———— ০৪০ ————

44 සෙය්‍යො අමිත්තො මතියා උපෙතො
නත්වෙ'ව මිත්තො මතිවිප්පහීනො,
මකසං වධිස්සන්ති හි එළමූගො
පුත්තො පිතු අබ්භිදා උත්තමඞ්ගං.

මතියා, ප්‍රඥාවෙන්; උපෙතො, යුක්තවූ; අමිත්තො, අමිත්‍රතෙම; සෙය්‍යො, උත්තමය; මති, ප්‍රඥාවෙන්; විප්පහීනො, විප්‍රහීනවූ; මිත්තො, මිත්‍රතෙම; නත්වෙව, නොම උතුම කුමක් හෙයින්ද යත්? එළමූගො, එළමූගවූ; (ජඩවූ) පුත්තො, පුත්‍රතෙම; මකසං, මදුරුවා; වධිස්සන්ති හි, මරමියි; පිතු, පියාගේ; උත්තමඞ්ගං, උත්තමාඞ්ගය; අබ්භිදා, පැළී.

**44 මකස ජාතකයි.**

---

45 සෙය්‍යො අමිත්තො මෙධාවී යංචෙ බාලානුකම්පකො,
පස්ස රොහිණිකං ජම්මිං මාතරං හන්ත්වාන සොචතී'ති.

අනුකම්පකො, කරුණා ඇත්තාවූ; යංචෙ බාලො, යම්බඳු බාලයෙක් ඇද්ද ඔහුට වඩා; මේධාවී, නුවණැත්තාවූ; අමිත්තො, අමිත්‍රයාම; සෙය්‍යො, උත්තමය; ජම්මිං, ජඩනාවූ හෙවත් බාලවූ; රොහිණිකං, රොහිණීනම් නුවණනැත්තිය; පස්ස, බල; මාතරං, මව; හන්ත්වාන, (මැස්සන් මරමියි මුසලප්‍රහාරයෙන්) මරා; සොචති, ශොක කරන්නී මැයි—"යං" යනු "යො" යී කියා ලිඞ්ගවිපර්‍ය්‍යාසයෙන් ගෙන "චෙ" යනු නාමාර්‍ථයයි ගෙන අර්‍ථකියනු.

**45 රොහිණී ජාතකයි.**

---

46 න වෙ අනත්ථකුසලෙන අත්ථචරියා සුඛාවහා,
හාපෙති අත්ථං දුම්මෙධො කපි ආරාමිකො යථා'ති.

අනත්ථකුසලෙන, අනර්‍ථයෙහි දක්ෂයා විසින්(කරනලද); අත්ථචරියා, අර්‍ථචර්‍ය්‍යාතොමෝ; සුඛාවහා න, සුවඑලවන්නී නොවේ "වෙ" යනු නිපාතයි; දුම්මෙධො, දුර්මේධතෙම; අත්ථං, වැඩ; හාපෙති, පිරිහෙළා; කවරක්හු මෙන්ද යත්? ආරාමිකො, උද්‍යානප්‍රයුක්තවූ; කපි යථා, වානරයා මෙනි.—දුර්මේධයා ගුණවැඩට කරන යම්කිසි අවැඩම එළවන්නේයයි දේසී.

**46 ආරාමදූසක ජාතකයි**

47 න වෙ අනත්ථකුසලෙන අත්ථචරියා සුඛාවහා,
හාපෙති අත්ථං දුම්මෙධො කොණ්ඩඤ්ඤො වාරුණිං යථා'ති

අනත්ථකුසලෙන, අනර්ථයෙහි දක්ෂයා විසින් (කරනලද;) අත්ථචරියා, අර්ථචර්‍යා තොමෝ; සුඛාවහා න, සුවඵලවන්නී නොවේ; මෙහිදු "වෙ" ශබ්ද නිපාතයි; දුම්මෙධො, නුවණනැත්තේ; අත්ථං, (තම හට වන) වැඩ; හාපෙති, පිරිහෙලයි; කවරක්හු මෙන්ද යත්: වාරුණිං, සුරාව (නැසූ); කොණ්ඩඤ්ඤො, යථා, කොණ්ඩඤ්ඤ නම් ශිෂ්‍යයා මෙනි—යම්සේ හේ සුරාව යහපත් කෙරෙමියි ලුණුලා නැසීද එපරිද්දෙන් නුවණනැති තැනැත්තේ යහපතක් කෙරෙමියි නපුරම කෙරෙයි යන අභිප්‍රායයි.

47 වාරුණි ජාතකයයි.

---

48 අනුපායෙන යො අත්ථං ඉච්ඡති සො විහඤ්ඤති,
චෙතා හනිංසු වෙදබ්බං සබ්බෙ තෙ ව්‍යසනමජ්ඣගූ'ති.

යො, යමෙක්; අනුපායෙන, අනුපායෙන්; අත්ථං, අභිවෘද්ධි, ඉච්ඡති, කැමතිවේද; සො, හෙතෙම; විහඤ්ඤති, නසී; චෙතා, චෙතිය නම් රටවැසි චෞරයෝ; වෙදබ්බං, (වෛදර්භනම් මන්ත්‍රය හෙතු කොටගෙන) වෙදබ්භනම්වූ බ්‍රාහ්මණයා; හනිංසු, විනාශකළහ; තෙ සබ්බෙ, ඒසියලු චෞරයෝද; ව්‍යසනං, ව්‍යසනයට; අජ්ඣගූ, පැමිණියෝ.

49 නක්ඛත්තං පටිමානෙන්තං අත්ථො බාලං උපච්චගා,
අත්ථො අත්ථස්ස නක්ඛත්තං කිං කරිස්සන්ති තාරකා'ති

නක්ඛත්තං, නැකැත්; පටිමානෙන්තං, බලන්නාවූ; බාලං, අඥානයාගේ; අත්ථො, අර්ථය; උපච්චගා, ඉක්මයේ; අත්ථස්ස, අර්ථයට; අත්ථො, අභීෂ්ටාර්ථප්‍රතිලාභයම; නක්ඛත්තං, නක්ෂත්‍රනම; තාරකා, තාරකාරූපයෝ; කිං කරිස්සන්ති, කවරනම් අර්ථයක් සාදත්ද? නොසාදතියි සේයි.

49 නක්ඛත්ත ජාතකයයි.

---

50 දුම්මෙධානං සහස්සෙන යඤ්ඤො මෙ උපයාචිතො,
ඉදානි ඛො'හං යජිස්සාමි බහු අධම්මිකො ජනො'ති.

දුම්මෙධානං, දුර්මෙධ මිනිසුන්ගේ; සහස්සෙන, සහස්‍රයකින්; යඤ්ඤො, යාගය තෙම; මෙ, මා විසින්; උපයාචිතො, ආරාධනා කරන ලදි; අහං, මම; ඉදානි තො, දැන් වනාහි; යජිස්සාමි, යාගකොරෙමි; කුමක් හෙයින්ද? අධම්මිකො ජනො, (ප්‍රාණාතිපාතාදියෙහි නියුක්ත) අධාර්මිකවූ ජනතෙම; බහු, බොහෝය; එහෙයින් ඔවුන් ගෙන යාගකෙරෙමියි සේයි.

**50 දුම්මෙධ ජාතකයයි.**

---

5 අත්ථකාම වර්ගයයි.

---

51 ආසිංසෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වො'හං අත්තානං යථා ඉච්ඡිං තථා අහු'ති.

පුරිසො, පුරුෂතෙම; ආසිංසෙථෙව, ප්‍රාරබ්ධක්‍රියානිෂ්ඨාවට ආශාකරන්නේ මැයි; පණ්ඩිතො, උපායමාර්ගයෙහි දක්ෂවූ පණ්ඩිතපුරුෂතෙම; න නිබ්බින්දෙය්‍ය, (මෙහි පාරයට නොයාහෙමි කියා) උත්කණ්ඨාවට නොපැමිණෙන්නේයි; (ආශාච්ඡේදයට නොපැමිණෙන්නේයි) "වො" යනු නිපාතයි; අහං, මම; අත්තානං, තමා; පස්සාමි, බලමි; යථා ඉච්ඡිං, යම්සේ සිතිම්ද; තථා, එසේම; අහු, වී—යම්සේ මම සුසානයෙහි හොත්තෙම් මේ දුඃඛයෙන් මුක්තවූව මැනවැයි යමක් සිතා වීර්‍ය්‍යකෙළෙම්ද ඒ සිතූ දෙයත් කළ වීර්‍ය්‍යයත් මස්තකප්‍රාප්තවූවාම දුටිමි යන අභිප්‍රායයි.

**51 මහාසීලව ජාතකයයි.**

---

52 වායමෙථෙ'ව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වො'හං අත්තානං උදකා ථලමුබ්භතන්ති.

පුරිසො, පුරුෂතෙම; වායමෙථෙව, (නිෂ්ඵල ප්‍රාප්තවෙමියි ව්‍යායාම් නොකෙරේමය; පණ්ඩිතො, ප්‍රාඥපුරුෂතෙම; න නිබ්බින්දෙය්‍ය, (මෙනම්) දෙය සාධාගතනැකිදැයි) උකටලී නොවන්නේය; උදකා, දියෙන්; ථලං, ගොඩට; උබ්භතං, නැංගාවූ; අහං, මම; අත්තානං, තමා; පස්සාමි, බලමි, "වො" යනු නිපාතයි—යම්පුරුෂයෙක් වීර්‍ය්‍යකළනම් ඒවීර්‍ය්‍යඵලය සිඛවනබව මහාසාගරය පීනා වීර්‍ය්‍යයෙන් ගොඩ දුටු මා මෙන් දක්වමි, යනු අභිප්‍රායයි.

**52 චූලජනක ජාතකයයි.**

---

53 තථේ'ව පුණ්ණපාතියො අඤ්ඤ,'යං වත්තතෙ කථා,
ආකාරකෙන ජානාමි නචා'යං භද්දිකා සුරා'ති.

පාතියො, සුරාපාත්‍රයෝ; තථෙව, ඒ යම් ක්‍රමයෙන්; පුණ්ණා, පිරුණාහ; අයං කථා, (යම්) මේ (සුරාවර්ණනා) කථාවක්; වත්තතෙ, පවතීද; (හෝද) අඤ්ඤ, අතික්කම්මය; ආකාරකෙන, ආකෘතීන්; ජානාමි, දනිමි; ච, එකාන්තයෙන්; අයං සුරා, මේසුරාව; න භද්දිකා, භද්‍රනොව විෂයොජිතායයි සේයි.

53 පුණ්ණපාති ජාතකයයි.

---

54 නා'යං රුක්ඛො දුරාරුහො න'පි ගාමතො ආරකා,
ආකාරකෙන ජානාමි නා'යං සාධුඵලො දුමො'ති.

අයං රුක්ඛො, මේ (විෂ) වෘක්ෂය; දුරාරුහො න, දුකින් නැගෙන පරිද්දෙන් වැඩියේ නොවෙයි හෙවත් හිණිපෙති පෙලක් සෙයින් සුවසේ නැගෙන පරිද්දෙන් වැඩියේය; ගාමතො, ගමින්; න'පි ආරකා, දුරුවූයේද නොවෙයි; (තුදුරුය) අයං දුමො, මේ දෘමය; සාධුඵලො න, සාධුඵල ඇත්තේ නොවෙයි කියා; ආකාරකෙන, මේ ආකාරයෙන්; ජානාමි, දනිමි.

54 ඵල ජාතකයයි.

---

55 යො අලීනෙන චිත්තෙන අලීනමනසො නරො,
භාවෙති කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා,
පාපුණෙ අනුපුබ්බෙන සබ්බසංයොජනක්ඛයන්ති.

යොගක්ඛෙමස්ස, චතුර්විධ යොගක්ෂෙමයට හෙවත් නිර්වාණ සම්ප්‍රාප්තියට; පත්තියා, පැමිණෙන පිණිස; අලීනමනසො, උදාරවූ අධ්‍යාසය ඇති; යො නරො, යම් නරයෙක්; අලීනෙන, පසු නොබටුවාවූ; චිත්තෙන, චිත්තයෙන්; කුසලං, (නිරවද්‍යාර්ථයෙන්) කුශලනම්වූ; ධම්මං, (සප්තත්‍රිංශත්බොධිපාක්ෂික)ධර්මයන්; භාවෙති, වඩාද (ඒ මහණ); අනුපුබ්බෙන, අනුක්‍රමයෙන්; සබ්බසංයොජනක්ඛයං, සියලු සංයොජනයන්ගේ ක්ෂයට හෙවත් සකල සංයොජනක්ෂය කරන්නාවූ අර්හත් ඵලයට; පාපුණෙ, පැමිණෙන්නේයි.

55 පංචාවුධ ජාතකයයි.

---

56 යො පහට්ඨෙන චිත්තෙන පහට්ඨමනසො නරො,
භාවෙති කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා,
පාපුණෙ අනුපුබ්බෙන සබ්බසංයොජනක්ඛයන්ති.

යොගක්ඛෙමස්ස, යොගයන්ගේ ක්ෂෙමයට හෙවත් නිර්වාණයට;

පත්තියා, පැමිණෙන පිණිස; පහට්ඨෙන, දුරුකළ නීවරණයන් ඇති; චිත්තෙන, චිත්තයෙන්; පහට්ඨමනසො, (එසේම විගත නීවරණ වශයෙන් දවා ශොභාකළ සුවර්ණයක්සේ) නිර්මලවූ සිත්ඇති; සො නරො, යම්නරයෙක්; කුසලං, නිරාමයාර්ථයෙන් කුශලනම්වූ; ධම්මං, (බොධිපාක්ෂික) ධර්මය; භාවෙති, වඩාද; (සො, හෙතෙම) සබ්බසංයොජනක්ඛයං, සියලුසංයොජනයන්ගේ විනාශයම; අනුපුබ්බෙන, පිළිවෙළින්; පාපුණෙ, පැමිණෙන්නේයි.

56 කඤ්චනක්ඛන්ධ ජාතකයයි.

---

57 යස්සෙ'තෙ චතුරො ධම්මා වානරින්ද යථා තව,
සච්චං ධම්මො ධිතී චාගො දිට්ඨං සො අතිවත්තතී'ති.

වානරින්ද, වානරෙශ්වරය; සච්චං, (වාක්)සත්‍යයද; ධම්මො, (පරීක්ෂා) ඥානයද; ධිති, (අනලස) ධෛර්‍ය්‍යයද; චාගො, (නිස්සඞ්ග)ත්‍යාගයද යන; එතෙ චතුරො ධම්මා, මේ සතරධර්මයෝ;(සතරගුණයෝ) යථා තව, තට මෙන්; යස්ස, යමෙක්හට විද්‍යමානයෝ)ද; සො, හෙතෙම; දිට්ඨං, සතුරා; අතිවත්තති, ඉක්මයේ; සතුරා අභිභවා යෙයි සේයි.

57 වානරින්ද ජාතකයයි.

—— ——:o:——

58 යස්ස එතෙ තයො ධම්මා වානරින්ද යථා තව,
දක්ඛියං සූරියං පඤ්ඤා දිට්ඨං සො අභිවත්තති'ති,

වානරින්ද, වානරප්‍රධානය; දක්ඛියං, (සමීපප්‍රාප්තභය විධ්වංශන ප්‍රකාරදන්නා නුවණින් සම්ප්‍රයුක්ත උත්සාහවීර්‍ය්‍යයයි කියනලද) දක්ෂභාවයද; සූරියං, (සිංහවික්‍රමයක්සේ) නිර්භය භාවයද; පඤ්ඤා, (උපාය)ප්‍රඥාවදැයි යන; එතෙ තයො ධම්මා, මේ ත්‍රිවිධධර්මයෝ; යථා තව, තට පරිද්දෙන්; යස්ස, යමක් හට (ඇත්තාහු)ද; සො, ඒපුද්ගලතෙම; දිට්ඨං, සතුරා; අභිවත්තති, ඉක්මයේ හෙවත් සතුරාමාන භඞ්ගකොට ජයප්‍රාප්තවෙයි සේයි.

58 තයො ධම්ම ජාතකයයි.

——— :o: ———

59 ධම්මෙ ධම්මෙ නා'සි ධම්මෙ අතිධන්තං හි පාපකං,
ධමෙන්තෙන ඇ හං ලද්ධං අතිධන්තෙන නාසිතා'නපි.

ධම්මෙ, (බෙර) ගසන්නේය; ධම්මෙ, ගසන්නේය; නා'සි ධම්මෙ, (කාලාතික්‍රමණයකොට) අතිශයින් නොගසන්නේය; කුමක්

මෙහෙසින්ද යත්? අභිධාවනං ති, (කාලාතික්‍රමිතය කොට) නිරන්තර යෙන් (බෙර) වැයීම වනාහි; පාපකං, පව්ටුය; ධමෙන්තාන, නොයෙක්ප්‍රකාර ණය කරන්නාහු විසින්; සතං, (කාර්ෂාපණ) ශතයක්; ලද්ධං, ලබන ලදී; (ඒ ලබනලද දෙය) අභිධමෙන්තාන, නිරන්තරයෙන් නොකීක රුම බෙරවයන්නාහු විසින්; නාසිතං, නසනලදී.

59 භෙරිවාද ජාතකයයි.

---

60 ධමෙ ධමෙ නා'තිධමෙ අතිධන්තං හි පාපකං,
ධන්තෙනා'ධිගතා භොගා තෙ තාතො විධමී ධමන්ති.

ධමෙ,(සක්)පිඹින්නේය; ධමෙ, පිඹින්නේය; නාතිධමෙ; අධික කොට කල්නොයවා නොපිඹින්නේය; අතිධන්තං හි, අධික කොට පිඹීම වනාහි; පාපකං, ලාමකය; කුමක්හෙයින්ද යත්? ධමෙන්තෙන, සඞ්ඛධමනය කරන්නාහු විසින්; භොගා, භොගයෝ; අධිගතා, ලබනලද හ; තෙ, ඒ (පැමිණියාවූ) භොගයන්, ධමං, (නැවත නැවත) සක් පිඹිනාවූ; තාතො, (අපගේ) පියාණෝ; විධමී, විධ්වංශනය කළෝ.

60 සඞ්ඛධමන ජාතකයයි.

---

6 ආසිංස වර්ගයයි.

---

61 අසා ලොකිත්ථියො නාම වෙලා තාසං න විජ්ජති,
සාරත්තා ච පගබ්භා ච සිඛී සබ්බඝසො යථා,
තා හිත්වා පබ්බජිස්සාමි විවෙකමනුබ්‍රූහයන්ති.

ලොකෙ; ලොකයෙහි; ඉත්ථියො නාම, ස්ත්‍රීහු නම්; අසා, අසාතීත හෙවත් ලාමකයහ; නොහොත් "සාත" ශබ්දයෙන් කායික චෛතසිකසුඛ කියති, එබඳුවූ සුඛය මේස්ත්‍රීන් කෙරෙහි නැත්නුයි "අසා" නම්වූ නොහොත් තමන් කෙරෙහි ප්‍රතිබද්ධවූ පුරුෂයන්ට අසාතයක්ම (දුකක්ම) දෙන්නුයි කියා හෝ අසානම්වූ; තාසං, ඒ ස්ත්‍රීන්ගේ; වෙලා, (කෙලෙසොත්පත්ති නිවාරණයට) මර්යාදාවෙක්; න විජ්ජති, නැත, සාරත්තා ච,(රූපශබ්දාදීයෙහි)සාරක්තයහ හෙවත් විශෙෂයෙන් ඇලුනාහ, පගබ්භා ච කායප්‍රගල්භයෙන් වාක්ප්‍රගල්භයෙන් මනඃ ප්‍රගල්භයෙන් යුක්තයහ, සබ්බඝසො, (සුචි අසුචි යන) සියල්ල භක්ෂණය කරන; සිඛී යථා, වන්හිය මෙන්; (උත්තමා ධම පුරුෂයන් ලොකසවාදවශයෙන් සෙවිනාහ;) තා හිත්වා, (එසේවූ) ඔවුන් හැර; විවෙකං, කායවිවෙකය චිත්ත විවෙකය උපධි විවෙකය යන ත්‍රිවිධ විවෙකයන් අතුරෙන් කාය චිත්ත විවෙක දෙ දෙනා; අනුබ්‍රූහයං, වඩන්නෙමි; පබ්බජිස්සාමි, පැවිදිවෙමි.

61 අසාතමන්ත ජාතකයයි.

---

62 යං බ්‍රාහමණො අවාදෙසි වීණං සම්මුඛවෙඨිතො,
අණ්ඩභූතා භතා භරියා තාසු කො ජාතු විස්සසෙති.

බ්‍රාහමණො, බමුණුතෙම; යං, යම් කාරණයකින්; සමමුඛවෙඨිතො, (ඝන වස්ත්‍රයකින්) මුඛය හා සමග වෙළනලද්දේ; වීණං, වීණාව; අවාදෙසි, වැයීද; හෙවත් තමා වචාකාරන්නට බැමිණිය මෙසේ කරන බව නොදැන වීණාශබ්දයකළේද; ඔහු වචාකල තැනැත්තී කෙසේවූ බැමිණියක්ද යත්? අණ්ඩභූත, බීජභූතවූ හෙවත් මාතෘකුක්ෂියෙන් නොනික්මුනුකල්හිම; ආභතා, ගෙනාවාවූ; නොහොත්; භතා, මාතෘ කුක්ෂිගත කල්හිම රක්ෂාකළාවූ; භරියා, භාර්‍ය්‍යාවන්; තාසු, (කුක්ෂිගත කාලයෙහි සිට රක්ෂාකළද විකාරයට පැමිණෙන) ඒ භාර්‍ය්‍යාවන්කෙරෙහි; කො, කවරනම් නුවණැති පුරුෂයෙක්; ජාතු, එකාන්තයෙන්; විස්සසෙ, විශ්වාස කරන්නේද; නොකරන්නේය යනු අභිප්‍රායයි.

**62 අණ්ඩභූත ජාතකයයි.**

---

63 කොධනා අකතඤ්ඤූ ච පිසුණා ච විභෙදිකා,
බ්‍රහ්මචරියං චර භික්ඛු සො සුඛං න විහාහිසී'ති.

(මහණ ඒනා ප්‍රෙම්කළ ස්ත්‍රීහුනම්) කොධනා, ක්‍රොධීහ; (උපන් ක්‍රොධය වලකාගන්ට නොපොහොසත්හ) අකතඤ්ඤූ ච, කෘතඥයෝද නොවෙති; (කරනලද මහත් උපකාරයකුදු නොදනිති;) පිසුණා ච, ප්‍රියශූන්‍ය කරන කථාද කෙරෙති; විභෙදිකා, මිත්‍රයන් බිඳෙන්ට සුදුසුවූ කථාකරන ස්වභාවද ඇත්තාහ; භික්ඛු, මහණ; බ්‍රහ්මචරියං, (මෛථුන විරති සංඛ්‍යාත) බ්‍රහ්මචර්‍ය්‍යාව; චර, හැසිර(පුරව) සො, හේ (බ්‍රහ්මචර්‍ය්‍යායෙහි හැසිරෙන්නාවූ) තෝ; සුඛං, (ධ්‍යාන සුඛය මාර්ගසුඛය ඵලසුඛය යන ත්‍රිවිධ සුඛය; න විහාහිසි, නොහරණෙහි; මෙකී සුවයෙන් නොපිරිහෙන්නෙහි යනු අභිප්‍රායයි.

**63 තක්ක ජාතකයයි.**

———o:o———

64 මා සු නන්දි ඉච්ඡති මං මා සු සොචි න ඉච්ඡති,
පීනං භාවො දුරාජානො මච්ඡස්සෙ'වොදකෙ ගතන්ති.

මෙහි දෙතන්හිම "සු" යනු නිපාතයි. මං, මා; ඉච්ඡති, (මේ ස්ත්‍රී) කැමැත්තීයයි; මා නන්දි, සතුටු නොවෙව; මං, මා; න ඉච්ඡති, (මේ ස්ත්‍රී) නොකැමැත්තීයයි; මා සොචි, නනමික්ශොකකර; පීනං, ස්ත්‍රීන්ගේ; භාවො, භාවය; (අදහස) දුරාජානො, (ශඨප්‍රයොගයෙන් සගවන හෙයින්) නොදනහැක්ක; කුමක් මෙන්ද? උදකෙ දියෙහි; මච්ඡස්ස, මත්ස්‍යයාගේ; ගතං ඉව, ගමනමෙනි-යම්සේ,

දියෙහි මත්ස්‍යයාගේ ගමන දියෙන් සැඟවිතිබෙන හෙයින් නොදතහැකිද එපරිද්දෙන් ස්ත්‍රීන්ගේ භාවයද ශඨප්‍රයොගයෙන් සැඟවීතිබෙන හෙයින් නොදතහැක්කැ යනු භාවයි.

### 64 දුරාජාන ජාතකයයි.

---

65 යථා නදී ච පන්ථො ච පානාගාරං සභා පපා,
එවං ලොකිත්ථියො නාම නාසං කුජ්ඣන්ති පණ්ඩිතාති.

නදීච, ගඞ්ගාවද; පන්ථො ච, මාර්ගයද; පානාගාරං, සුරාගෘහයද; සභා, (මාර්ගයෙහි බොහෝදෙන සැතපෙන්නට කළ) ශාලාවද; පපා, (පින්) පැන් මඬුවද යන මොහු; යථා, යම්සේ (උත්තමාධම සර්වජනයන්ට සාධාරණයෝ)ද; ලොකෙ, ලොකයෙහි; ඉත්ථියො නාම, ස්ත්‍රීහුද; එවං, එසේ මැයි-යම්සේ මෙකී නදී ආදීහු සර්වජන සාධාරණයෝද එපරිද්දෙන් ස්ත්‍රීහුද උත්තමාධමයන්ට සාධාරණ ප්‍රවෘත්ති ඇත්තෝය එසේහෙයින්; පණ්ඩිතා, (කාරණා කාරණ යෙහි දක්‍ෂවූ) පණ්ඩිත ජනයෝ; ආසං, මේ ස්ත්‍රීන්ට; න කුජ්ඣන්ති, නොකිපෙත්. මෙහි "ච" යනු සමුච්චයෙහි වැටෙයි.

### 65 අනභිරති ජාතකයයි.

---

66 එකා ඉච්ඡා පුරෙ ආසි අලද්ධා මුදුලක්ඛණා,
යතො ලද්ධා අළාරක්ඛී ඉච්ඡා ඉච්ඡං විජායථාති.

මුදුලක්ඛණා, මෘදුලක්‍ෂණාව; අලද්ධා, නොලදින්; පුරෙ, පෙර; එකා, එක්; ඉච්ඡා, තෘෂ්ණාවක්; ආසි, වූව; අළාරක්ඛී, විශාල නෙත්‍රඇත්තී; යතො, යම්තැනෙක පටන්ගෙන; ලද්ධා, ලබනලද්ද; ඉච්ඡා, (ඒ පූර්වයෙහිවූ) ඉච්ඡාතොමෝ; ඉච්ඡං, (ගෘහොපකරණාදි යෙහි අතික්ම) තෘෂ්ණාවක්; විජායථ, ඉපදවී-මෘදුලක්‍ෂණාව වූව මැනවැයි එක් තෘෂ්ණාවක් පළමු හටගත, පසුව මෘදුලක්‍ෂණාව ලදින් ගෘහොපකරණාදීන් නිසා ඉච්ඡාවක් හටගත, එසේ හෙයින් පළමු උපන් තෘෂ්ණාව පසුව උපන් තෘෂ්ණාව ඉපදවූව එපරිද්දෙන් පසුව උපන් ඉච්ඡාවක් අනික් ඉච්ඡාවක් උපදවයි, මෙම ක්‍රම යෙන් මතු මතු ඉච්ඡාවන් වඩා අපායභාක් කරන්නීය, යනු අභිප්‍රා යයි.

### 66 මුදුලක්ඛණ ජාතකයයි.

---

67 උච්ඡඞ්ගෙ දෙව මෙ පුත්තො පථෙ ධාවන්තියා පති,
තඤ්ච දෙසං න පස්සාමි යතො සොදරියමානයෙති.

දෙව, දෙවයෙනි; පුත්තො, පුත්‍රතෙම; මෙ, මාගේ; උච්ඡඞ්ගෙ, උත්සඞ්ගයෙහිමය-ඉනට කඩාලාගත් පලා හා සමයයි සේයි; පති, ස්වාමිතෙම; පථෙ ධාවන්තියා, හුදකලාව මගයන්නාවූ මට (සුලභය); යතො, යම්දෙශයකින්; සොදරියං, සහෝදරයකු; ආනයෙ, ගෙන එම්ද; තඤ්ච දෙසං, ඒ (මාතෘකුක්ෂිසඞ්ඛ්‍යාත) දෙශය; න පස්සාමි, නොදකිමියි-එසේහෙයින් මාගේ බෑණන් මට දෙවයි බෑණන්ම ඉල්වූ, යම්සේ වලට ගොස් උත්සඞ්ගයට පලා කඩනා තැනැත්තියට පලා සුලභද එසේම ගෑනියට පුත්තු සුලභයහ, හුදකලාව මගයනා තැනැත්තියට පුරුෂයෝ සුලභයහ, මාගේ මවුන් නැතිහෙයින් කුසෙහි හොත්තෝ මට දුර්ලභයහ එසේහෙයින් බෑණන් මට දෙවයි ඉල්වූ.

67 උච්ඡඞ්ග ජාතකයයි.

---

68 යස්මිං මනො නිවිසති චිත්තං චාපි පසීදති,
අදිට්ඨපුබ්බකෙ පොසෙ කාමං තස්මිම්පි විස්සසෙති.

යස්මිං, යම් පුද්ගලයක්හු කෙරෙහි; මනො, සිත; නිවිසති, පිහිටාද; චිත්තංචාපි, සිතද; පසීදති,(දුටුපමණෙකින්) පහදීද; අදිට්ඨපුබ්බකෙපි, අදෘෂ්ටපූර්වදවූ හෙවත් පෙර ඒ ජාතියෙහි නුදුටුවිරූදවූ; තස්මිං පොසෙ, ඒ පුරුෂයා කෙරෙහි; කාමං, ඒකාන්තයෙන්; විස්සසෙ, (අනුභූතපූර්වස්නෙහය හෙතුකොටගෙන) විශ්වාසකරන්නේයි හෙවත් විශ්වාසයට පැමිණෙන්නේයි.

68 සාකෙත ජාතකයයි.

---

69 ධිරත්ථු තං විසං වන්තං යමහං ජීවිතකාරණා,
වන්තං පච්චාවමිස්සාමි මතං මෙ ජීවිතා වරන්ති.

යං විසං, යම් විෂයෙක්; වන්තං, හරනලදද; තං, හේ; වන්තං, වමනයකළ; විසං, විෂය; අහං, මම්; ජීවිතකාරණා, ජීවිතයාගේ ප්‍රවෘත්තිය පිණිස; පච්චාවමිස්සාමි, නැවත හරිම්ද; තං, ඒ විෂයට; ධිරත්ථු, නින්දාවේවා; මෙ, මාගේ; ජීවිතා, (වමනයකළ විෂ නැවත හැර) ජීවත්වීමට වඩා; මතං, (විෂය නොහැර ගින්නට වැද) මියනබැම්; වරං, උතුමියි.

69 විසවන්ත ජාතකයයි.

70 න තං ජිතං සාධු ජිතං යං ජිතං අවජීයති,
තං ඛො ජිතං සාධු ජිතං යං ජිතං නාවජීයතීති.

යං, යම්රටෙක්; ජිතං, (සතුරන් අභිභවා) දිනාලද්දේ; අව ජීයති, (සතුරන්විසින්) නැවත පරදවනුලැබේද; නොහොත්, යං ජිතං, (සතුරන් අභිභවා ලබනලද) යම් ජයෙක්; අවජීයති, නැවත (සතුරන්විසින්) පරදවනුලැබේද; තං, ඒ දිනුම; සාධුජිතං න, සාධුජිතයනම් නොවේ හෙවත් මනාකොට පැරදවූවා නොවේ. යං, යමෙක්; ජිතං,(සතුරන් අභිභවා) දිනාලදද; නොහොත්; යං ජිතං, යම් ජයෙක්; නාවජීයති, (සතුරන්විසින්) නොපරදවනුව වේද: තං ඛො ජිතං, ඒ දිනීම වනාහි; සාධුජිතං, සාධුජිතනම්වේ හෙවත් යහපත්කොට දිනුවානම් වේ

**70 කුද්දාල ජාතකයයි.**

---

**7 ස්ත්‍රී වර්ගයයි.**

---

71 යො පුබ්බෙ කරණීයානි පච්ඡා සො කාතුමිච්ඡති,
වරණකට්ඨභඤ්ජොව ස පච්ඡා අනුතප්පතීති.

යො, යමෙක්තෙම; පුබ්බෙ, පූර්වයෙහි; කරණීයානි, කෘත්‍යයන්; පච්ඡා, පසුව; කාතුං, කරන්නට; ඉච්ඡති, කැමැතිවේද; සො, හෙතෙම; වරණකට්ඨභඤ්ජොව, වරණදඬුබිඳි අභියුක්තකයා මෙනි; සො, එබඳු පුද්ගලතෙම; පච්ඡා, පසුව; අනුතප්පති, තැවේ. යමෙක් පළමුකොට කළමනා කටයුත්ත කල්වරදවා පසුව නොකලට කළනම් අමුවරණදඬුබිඳ හිරනැගෙනතුරු දුක්ගත් අපගේ ශිෂ්‍යවූ මාණවකයා මෙනි, එබඳු අඥාන පුද්ගලතෙම බොහෝකාලක් දුකින් පීඩිත වන්නේය යනු අභිප්‍රායයි.

**71 වරණ ජාතකයයි.**

---

72 අකතඤ්ඤුස්ස පොසස්ස නිච්චං විවරදස්සිනො,
සබ්බං චෙ පථවිං දජ්ජා නෙව තං අභිරාධයෙති.

අකතඤ්ඤුස්ස, (තමහට) කළගුණ නොදන්නාවූ; නිච්චං, සතතයෙන්; විවරදස්සිනො, වරදදක්නාවූ (අනුන්ගේ සිදුරු සොයන්නාවූ) පොසස්ස, පුරුෂයාහට; චෙ, ඉදින්; සබ්බං, සියලු; පථවිං, පොළොව හෙවත් චක්‍රවර්තිරාජ්‍යය; (මහාපොළොව පෙරළා දෑපී

වියෙහි ඔජස හෝ) දජ්ජා, දුන්නේ වීනම්බුද්ද; තං, (කෙලෙහිගුණ නොදන්නා) ඒ පුරුෂයා; නඅභිරාධයෙ, තොප ප්‍රසාදයකට පමුණුවා ගත නොහෙන්නේයි.

## 72 සීලවනාගරාජ ජාතකයයි.

---

73 සච්චං කිරෙවමාහංසු නරා එකච්චියා ඉධ,
කට්ඨං විප්ලාවිතං සෙය්‍යො නත්වෙවෙකච්චියො නරොති.

කට්ඨං, (ගඟදියෙහි යන්නාවූ) දරදඬු; විප්ලාවිතං, නගා ගොඩ තබනලද්දේ; සෙය්‍යො, ශ්‍රෙෂ්ඨය; එකච්චියො නරො, (කෘතඥතාදි ගුණනැති) සමහර පුරුෂයෙක් (වතුරෙන් නගා ගොඩසිටුවනලද්දේ); නත්වෙව, නොම උතුම්යැයි; ඉධ, මේ ලොකයෙහි; එකච්චියා, සමහර; නරා, (පණ්ඩිත) පුරුෂයෝ කෙනෙක්; සච්චං එව, සැබවක්ම; ආහංසු කිර, කීහු-ප්‍රයොජනනැති කෙලෙහිගුණ නොදන්නා පුරුෂයා වතුරෙන් නගන්නාව වඩා පචනාදිවූ නොයෙක් ප්‍රයොජනඇති දරදඬු නගන බව යහපතැයි යනු අභිප්‍රායයි.

## 73 සච්චංකිර ජාතකයයි.

---

74 සාධු සම්බහුලා ඤාතී අපි රුක්ඛා අරඤ්ඤජා,
වාතො වහති එකට්ඨං බ්‍රහන්තම්පි වනස්පතින්ති.

සම්බහුලා, බොහෝවූ; ඤාතී, (ඔවුනොවුන් ආශ්‍රය ඇතිව වසන) නෑයෝ; සාධු, ශොභනයහ; අරඤ්ඤජා, අරණ්‍යයෙහි ජාතවූ; රුක්ඛා අපි. වෘක්ෂයෝ පවා; (ඝනව සිටි හෙයින් ශොභනයහ) එකට්ඨං, එකස්ථවූ (හුදකලාව සිටියාවූ); බ්‍රහන්තම්පි, (ශාඛාවිටපාදීන්) මහත්වූද; වනස්පතිං, වනජ්‍යෙෂ්ඨ වෘක්ෂය; වාතො, (පූර්වදික් ආදීන් ආවාවූ) පවන; වහති, (උන්මූලනය කොට) හෙළයි—වල්ගසට පවා සාශ්‍රයබව යුක්තාය මිනිසුන්ට ආශ්‍රය ඇතිබව ශ්‍රෙෂ්ඨය යනු කියනුම කිම්ද යන අභිප්‍රායයි.

## 74 රුක්ඛධම්ම ජාතකයයි.

---

75 අභිත්ථනය පජ්ජුන්න නිධිං කාකස්ස නාසය,
කාකං සොකාය රන්ධෙහි මඤ්ච සොකා පමොචයාති.

පජ්ජුන්න, මේඝය; අභිත්ථනය, ගර්ජනාකර; කාකස්ස, කාකය මූහයාගේ; නිධිං, (මත්ස්‍ය) නිධානය; නාසය, නසා; කාකං,

කපුටුමුල; සොකාය, සොකය පිණිස; රන්ධෙහි, තාපනයකර; මඤ්ච, මාද; සොකා, සොකයෙන්; පමොචය, මුදව; "ච" ශබ්දය සමුච්චයෙහි වැටෙන හෙයින් මාද මානැයන්දයි අර්ථ ගතයුතු.

**75 මච්ඡ ජාතකයයි.**

---

76 අසඞ්කියොම්හි ගාමම්හි අරඤ්ඤෙ නත්ථි මෙ භයං,
උජුමග්ගං සමාරූළ්හො මෙත්තාය කරුණාය චාති.

ගාමම්හි, ගම්හිදු හෙවත් ගම වසන්නේ නමුදු; අසඞ්කියොම්හි, නිශ්ශඞ්කාවෙක්වීමි; අරඤ්ඤෙ, වල්හිදු; මෙ, මට; භයං, කිසිභයෙක්; නත්ථි, නැත; මෙත්තාය, මෛත්‍රියෙන්ද; කරුණායච, කරුණායෙන්ද හෙවත් ත්‍රිකචතුෂ්කධ්‍යානිකවූ මෛත්‍රී කරුණායෙන් කායවඞ්කාදි රහිත හෙයින්; උජු, ඍජුවූ; මග්ගං, (බ්‍රහ්මලොකගාමී)මාර්ගයට; සමාරූළ්හො, ආරූඪවූයෙමි; නොහොත් සෞශීල්‍යය හෙතුකොටගෙන කායවාරාදීන් අකුටිල හෙයින්; උජු, ඍජුවූ; මග්ගං, (දිව්‍යලොකගාමිමාර්ගයට; සමාරූළ්හො,නැංගෙමි කියා මෙසේ හෝ ගෙන අර්ථ කියයුතු—ප්‍රහීණනොවූ ධ්‍යාන ඇත්තාහට බ්‍රහ්මලොකයට ගමන එකාන්තනුයි මෛත්‍රීකරුණා දෙදෙන ඍජුවූ මාර්ගනම් වන්නාහයි කිවි.

**76 අසංකිය ජාතකයයි.**

---

77 ‡ ලාපූනි සීදන්ති සිලා පලවන්ති
මණ්ඩූකියො කණ්හසප්පෙ ගිලන්ති,
කාකං සුවණ්ණා පරිවාරයන්ති
තසා වකා එළකානං භයාහි.

---

‡ අර්ථ කථාවෙහි ආ එකොළොස් ස්වප්නන් සමග සොළොස් ස්වප්න නම්. 1 උසභා 2 රුක්ඛා 3 ගාවියො 4 ගවාච 5 අස්සා 6 සුවණ්ණපාතියො 7 සිගාලීච 8 කුම්භො 9 පොක්ඛරණීච 10 අපාක 11 චන්දනං 12 ලාපූනි සීදන්ති 13 සිලාපලවන්ති 14 මණ්ඩූකියො කණ්හසප්පෙ ගිලන්ති 15 කාකංසුවණ්ණා පරිවාරයන්ති 16 තසාවකා එළකානං භයාහීති.

* විපරියාසො වත්තති නයිධමත්ථීති.

අලාපූනි,ලබුපක්හු; සීදන්ති, ගැලෙති; සිලා, පාෂාණයෝ; ප්ලවන්ති, ඉල්පෙති; මණ්ඩූකියො, මැඩිපැටියෝ; කණ්හසප්පෙ, කෘෂ්ණසර්පයන්; ගිලන්ති, ගිලිති; කාකං, කවුඩුවක්හු; සුවණ්ණා, ස්වර්ණහංසයෝ; පරිවාරයන්ති, පිරිවරති; එළකානං, එළුවන්ට; භයා, භයින්; වකා, වෘකයෝ හෙවත් දිවියෝ; තසා, ත්‍රස්තවෙති, (භයපත්වෙති) "හි" යනු නිපාතය; විපරියාසො, (මේ යාගකර්මය සවජ්න ප්‍රතිඝාතය පිණිසයයි බ්‍රාහ්මණයන්ගේ) විපර්‍ය්‍යාසයෙක් හෙවත් විරුද්ධකොට පෙරළා ගැන්මෙක්; වත්තති,පවති; ඉධ,මේකාලයෙහි; නත්ථි, (මේසවජ්නයන්ගේ නිෂ්පත්ති) නැතියි; මෙතන්හි යකාරද මකාරද සංහිතා පිණිස ආගමවූයේයයිද පාඨ සත්‍යයහෙයින් පාඨයෙහි ආ ගාථාව කී, අවශෙෂ සවජ්න අටුවාවෙන් දතයුතු.

**77 මහාසුපින ජාතකයයි.**

———— ०:० ————

78 උභො ඛඤ්ජා උභො කුණී උභො විසමචක්ඛුලා,
උභින්නං පිළකා ජාතා නාහං පස්සාමි ඉල්ලිසන්ති.

උභො, දෙදෙනම; ඛඤ්ජා, ලුහුඬු පා ඇත්තාහ; උභො, දෙදෙනම; කුණී, කුණුවූ අත් ඇත්තාහ; (දණ්ඩ්වැලඹිවින් පාතලුහුඹුපුරුක් ඇත්තාහයි සේයි) උභො, දෙදෙනම; විසම, විසමවූ හෙවත් නොසමවූ; චක්ඛුලා, අක්ෂිමණ්ඩල ඇත්තාහ හෙවත් වමරුසියහ; උභින්නං, දෙදෙනාගේම (හිසැ); පිළකා, (ඒකාකෘතිවූ) පිළිකාවෝ; ජාතා, ජාතයහ; අහං, මම; ඉල්ලිසං,ඉල්ලිසයා; න පස්සාමි, නොදකිමි—දෙදෙනාකෙරෙන් කවරකු ඉල්ලිසබවද නොදනිමි යනු අභිප්‍රායයි.

**78 ඉල්ලිස ජාතකයයි.**

———— ०:० ————

* අට්ඨකථාවෙහි පෙනෙන "විපරියාසො වත්තති නයිධමත්ථි" යන මේ පදය ජාතක ගාථාපෙළට ඇතුළත්ව නොපැනෙතත් මේ සන්නයෙහි "ලාපූනි සීදන්ති" යනාදි ගාථාවේ අගට පස්වෙනි පද සක්කොට ගෙන අර්ථකියා තිබේ.

79 යතො විලුත්තා ච හතා ච ගාවො
දඩ්ඪානි ගෙහානි ජනො ච නීතො,
අථාගමා පුත්තහතාය පුත්තො
ඛරස්සරං ඩෙණ්ඩිමං වාදයන්තොති.

යතො, යම් කාලෙක්හි; ගාවො, ගොරූපයෝ; විලුත්තාච, පැහැර ගෙනයනලදහුද; හතාව, (මස්කනපිණිස) නසනලදහුද; ගෙහානි, ගෘහයෝ; දඩ්ඪානි, දවනලදහුද; ජනො ච, ජනතෙමේද; නීතො, සිරකොට බැඳගෙන යනලද්ද; අථ, එකල්හි; පුත්තහතාය, හතපුත්‍රිකාවගේ; පුත්තො, පුත්‍රතෙම; ඛරස්සරං, අමධුරවූ ශබ්දඇති; ඩෙණ්ඩිමං, පටහභෙරිය; වාදයන්තො, වාදනයකරමින්; ආගමා, ආයි.

**79 ඛරස්සර ජාතකයයි.**

---

80 යන්තෙ පවිකත්ථිතං පුරෙ
අථ තෙ පූතිසරා සජන්ති පච්ඡා,
උභයං න සමෙති භීමසෙන
යුද්ධකථා ඉදඤ්ච තෙ විහඤ්ඤනන්ති.

භීමසෙන, භීමසෙනය; තෙ, තාවිසින්; යං, යමක්; පුරෙ, පෙර; පවිකත්ථිතං, කියනලද්ද; අථ, නැවත; පච්ඡා, පසුව; තෙ, තාගේ; පූතිසරා, කුණුහෙයින් වැහෙනහෙයින් පූතිශරනම්වූ ශරීරමල ධාරාවෝ; සජන්ති, වැහෙත්; තෙ, තාගේ; යුද්ධකථා, යුද්ධකථාවද; ඉදං විහඤ්ඤං ච, මේ පීඩාවද යන; උභයං, දෙක; න සමෙති, සම නොවේ.

**80 භීමසෙන ජාතකයයි.**

---

**8 වරණ වග්ගයයි.**

---

81 අපායිම්හ අනච්චිම්හ අගායිම්හ රුදිම්හ ච,
විසඤ්ඤකරණිං පීත්වා දිට්ඨා නාහුම්හ වානරාති.

අපායිම්හ, සුරාපීම්හ; අනච්චිම්හ, (හස්තපාදයන් සොළවා) නැටුම්හ; අගායිම්හ, මහත්කොට ගී කීම්හ; රුදිම්හ ච, (නැවත රාපූෂස් නොයෙදෙයි කියා) හැඬුම්හ; විසඤ්ඤකරණිං, විසංඥකරන සුරා; පීත්වා, බී; වානරා නාහුම්හ, (යම්හෙයකින්) වානරයෝ නොවූයෙමුද; දිට්ඨා, (එයම) යෙහෙකැයි; මෙසේ තමන්ගේ නුගුණකිවි.

**81 සුරාපාන ජාතකයයි.**

---

82 අතික්කම්ම රමණකං සදාමත්තඤ්ච දූභකං,
ස්වාසි පාසාණමාසීනො යස්මා ජීවං න මොක්ඛසීති.

රමණකං, ස්ඵටික ප්‍රාසාදයද; අතික්කම්ම, ඉක්ම; සදාමත්තඤ්ච, රජතප්‍රාසාදයද; (අතික්කම්ම, ඉක්මී;) දූභකං, මණිමය ප්‍රාසාදයද; (අතික්කම්ම, ඉක්ම;) "ස්වා'සි"යි තැන "සො ආසි"යි බිඳ; සො (ත්වං), හේ (තෝ); පාසාණං, පාෂාණමයවූ; (උරචක්‍රය විසින්) ආසීනො, අභිෂ්ටවූයෙහි; නොහොත් පාෂාණමය උරචක්‍රයෙන් මඩනාලද්දෙහි; යස්මා, යම්හෙයකින්; ආසි, වීද; (තාව, ඒතාක් හෙවත් තාගේ පාපක්ෂයවනතෙක්) ජීවං, ජීවත්වන්නෙහි; (යස්මා, යම් උරචක්‍රයකින්) න මොක්ඛසි, නොමිදෙහිද; (එබඳු උරචක්‍රයකින් මඩනාලද්දෙහිවී)-උරචක්‍රයනම් පාෂාණමය හෝ අයොමය හෝ වූයේ යම්තාක් තාගේ පාපක්ෂය නොවේද එතාක් ශරීරය කපන බව මුත් තාගේ ශරීරයෙන් පහනොවේයි යනු අභිප්‍රායයි.

**82 මිත්තවින්ද ජාතකයයි.**

---

83 මිත්තො හවෙ සත්තපදෙන හොති
සහායො පන ද්වාදසකෙන හොති,
මාසඩ්ඪමාසෙන ච ඤාති හොති
තතුත්තරිං අත්තසමොපි හොති,
සොහං කථං අත්තසුඛස්ස හෙතු
චිරසන්ථුතං කාළකණ්ණිං ජහෙය්‍යන්ති.

හවෙ, යනු නිපාතය; සත්තපදෙන, (එක්ව) සප්තපදව්‍යතිහාර (ගමනමාත්‍ර)යෙන්; මිත්තො හොති, මිත්‍රවන්නේය; ද්වාදසකෙන පන, දොළොස්දවසක් (එක්ව) විසීමෙන් වනාහි; සහායො හොති, සහායවන්නේය; මාස, මසකින්ද; අඩ්ඪමාසෙන ච, දෙපෝවරෙකින්ද; ඤාතිහොති, නෑයකු හා සමවන්නේය; තතුත්තරිං, එයින් අධිකකාලයක් (එක්ව) විසීමෙන්; අත්තසමොපි හොති, ආත්ම සමානද වන්නේය; සො අහං, හේ මම; අත්තසුඛස්ස හෙතු, ආත්මසුඛය කාරණකොටගෙන; චිරසන්ථුතං, බොහෝ කලක්වැස පුරුදුවූ; කාළකණ්ණිං, කාලකණ්ණිනම්වූ යහළුවා; කථං, කෙසේනම්; ජහෙය්‍යං, හරනෙම්ද-මෙසේවූ යහළුවා කෙසේ ගැරපියම්දැයි මිත්‍රරක්ෂණ ගුණ කීවූ.

**83 කාලකණ්ණි ජාතකයයි.**

---

84 ආරෝග්‍යමිච්ඡෙ පරමඤ්ච ලාභං
සීලඤ්ච වුද්ධානුමතං සුතඤ්ච,
ධම්මානුවත්තී ච අලීනතා ච
අත්ථස්ස ද්වාරා පමුඛා ඡළෙතෙ.

ආරෝග්‍යං, නිරෝගීභාවසඞ්ඛ්‍යාත; පරමං, විශිෂ්ටවූ; ලාභං, ලාභයද; චකාරනි පානමාත්‍රයි; සීලං, ආචාර ශීලයද; වුද්ධ, ගුණවෘද්ධයන්ගේ; අනුමිතං, අනුමතියද හෙවත් ඔවුන්ගේ අවවාදනුවර්තනබවද; සුතං, බාහුශ්‍රැත්‍යයද; ධම්මානුවත්තී, ත්‍රිවිධ සුචරිත ධර්මයෙහි අනුවර්තිතතායද; අලීනතා ච, චිත්තයාගේ අලීනබවද යන මේ; ඉච්ඡෙ, කැමැත්තවන්නේය; එතෙ ඡ, මේ සදෙන; අත්ථස්ස, අභිවෘද්ධියට; පමුඛා, ප්‍රමුඛවූ හෙවත් ප්‍රධානවූ; ද්වාරා, ද්වාරයෝයි හෙවත් අධිගම උපායයෝයි.

**84 අත්ථද්වාර ජාතකයයි.**

———o§o———

85 ආයතිං දොසං නාඤ්ඤාය යො කාමෙ පටිසෙවති,
විපාකන්තෙ හනන්ති නං කිම්පක්කමිව භක්ඛිතන්ති.

ආයතිං දොසං, එෂ්‍යත් දෝෂය හෙවත් මතුඑන දෝෂය; න අඤ්ඤාය, නොදැන; යො, යමෙක්; කාමෙ, වස්තුකාමක්ලේශකාමයන් දෙදෙන; පටිසෙවති, සෙවුනේද; (ඒ අනුභවකරනලද කාමයෝ) නං, ඒ (කාමානුභවයෙහි නියුක්ත) පුරුෂයා; විපාකන්තෙ, විපාකාන්තයෙහි හෙවත් විපාකසඞ්ඛ්‍යාත ඵලදානයෙහි; (නරකාදියෙහි උපන්නාහු) හනන්ති, නසත්; කුමක් මෙන්ද යත්? භක්ඛිතං, අනුභවකරනලද; කිම්පක්කං ඉව, කිම්පක්කනම්වූ විෂඵලය මෙන්-යමෙක් එෂ්‍යත්කාලයෙහි වන අනිෂ්ටවිපාක නොසලකා කාමාස්වාදයෙහි ලොල්ව අනුභවකලද ඒ කාමයෝ අනුභවකරනලද්දාහු විෂයුක්ත කිම්පලයක් බුදින්නාමෙන් * බොහෝ කලක් නරකයෙහි දුක්දෙත් යනු අභිප්‍රායයි.

**85 කිම්පක්ක ජාතකයයි.**

———o§o———

86 සීලං කිරෙව කල්‍යාණං සීලං ලොකෙ අනුත්තරං,
පස්ස ඝොරවිසො නාගො සීලවා ති න හඤ්ඤතීති.

සීලං එව, (කායවාක්ද්වාරාදීන් අව්‍යතික්‍රමසඞ්ඛ්‍යාත) ශීලයම; කල්‍යාණං කිර, සුන්දරල; ලොකෙ, ලොකයෙහි; සීලං, ශීලය; අනු

* දුන්නාසේ-පොත්

නතරං, පේසුඤඤය; (ප්‍රධානය) පසඝ, බලූ; ඝොරවිසො, ඝොරවූ විෂ ඇති; නාගො, සර්පතෙම; සීලවා ඉති, සිල්වත් වෙමිසි; න හඤ්ඤති, (මෙරමාහට) හිංසාවක් නොකෙරේ.

86 සීලවීමංස ජාතකයයි.

———o§o———

87 යසස මඞ්ගලා සමූහතා
උප්පාද සුපිනා ච ලක්ඛණා ච,
සමඞ්ගලදොසවීතිවත්තො
යුගයොගාධිගතො න ජාතුමෙතීති.

යසස, යම්අතීත් ගුණයෙන් යුත් ක්ෂීණාශ්‍රවයෙකුගේ; මඞ්ග ලා, (දිෂ්ඨසුතමුත වශයෙන් සිටි ත්‍රිවිධ) මඞ්ගලයෝ; සමූහතා, මින; කොට නසනලදහුද; උප්පාද, (චන්ද්‍රග්‍රහසූර්‍යග්‍රහාදී) උත්පාදයෝද, සුපිනා ච, (ශුභවූ) සවප්නයෝද; ලක්ඛණා ච, (සුභගද්‍රීහිතාදි) ලක්ෂණ යෝද; (යනාමේ දෘෂ්ටිස්ථානයෝ) (සමූහතා, ම නාකොට නසනලද හුද;; මඞ්ගලදොස, මඞ්ගලදොෂයන්; වීතිවත්තො, ඉක්මිණිද හෙ වත් මොවුන් දුරුකොට සිටියේද; යුග, (ක්‍රොධඋපනාහමක්ඛපලාස යනාදී නසින් දෙකක් දෙකක් එක්ව ආ කෙලශධම්මයන්ගේ වශ යෙන්) යුගනම්වූ ධම්මයන්ද; යොග, (කාමයොග භවයොග දෘෂ්ටියො ග අවිද්‍යායොග යන) යොග ධම්මයන්ද; අධිගතො, අභිභවනයකො ට සිටියේද; සො, ඒ ක්ෂීණාශ්‍රවවූ උත්තමයා; ජාතු, කිසිකලෙක්හි නොහොත් එකාන්තයෙන්; න එති, ප්‍රතිසන්ධිවශයෙන් මේ ලොක යට නොඑන්නේයි—"න ජාතුමෙති" යන්නෙහි මකාර සංහිතා වණිය ආගමයි, "යසස" යනු හැමතැනට යොද අර්ථ ගතයුතු.

87 මඞ්ගල ජාතකයයි.

———o§o———

88 කල්‍යාණිමෙව මුඤ්චෙය්‍ය න හි මුඤ්චෙය්‍ය පාපිකං,
මොක්ඛො කල්‍යාණියා සාධු මුත්වා තපති පාපිකන්ති.

කල්‍යාණිමෙව, කල්‍යාණවූ හෙවත් මෘෂා පාරුෂ්‍ය පෛශුන්‍ය සංප්‍රලාප යනමේ සතරදොෂරහිත භාවයෙන් කල්‍යාණනම්වූ වචන යක්; මුඤ්චෙය්‍ය, හරන්නේය; පාපිකං, (මෙරමාහට අප්‍රිය අමනාපවශ, යන්' ලාමක වූ පුලුක්; නහි මුඤ්චෙය්‍ය, නොහරන්නේය; කල්‍යාණි යාය, කල්‍යාණවූ වචනයාගේ; මොක්ඛො, මොක්ෂය (හැරීම) හෙවත්

කිණීම; සාධු, ප්‍රශස්තය; පාපිකං, ලාමකවූ නෙපුල්; මුඤ්ච, හැර යන වත් මෘෂාආදින් යුක්ත නෙපුල් බැණ; තපති, (මෙලොව පරලොව) තැවෙන්නේයි.

## 88 සාරම්භ ජාතකයයි.

89 වාචාව කිර තෙ ආසි සණ්හා සඛිලභාණිනො,
තිණමත්තෙ අසජ්ජිත්ථො නො ච නික්ඛසතං හරන්ති.

සඛිලභාණිනො, මෘදුවූ බස් බණන්නාවූ; තෙ, තාගේ; වාචා එව, වාචාවම; සණ්හා ආසි, සිලුටුවී; තිණමත්තෙ, තෘණමාත්‍රයෙහි හෙවත් තණකොළක් පමණෙක; අසජ්ජිත්ථො, (කුකුස්කරමින්; ලග්නවූයෙහි; නික්ඛසතං, නිෂ්කසියයක්; හරං, හැරගෙනයන්නෙහි; නොච, නොඇලුණෙහි වී—කුවජපිලය තෘණමාත්‍රයක නොඇලුණාසේ බැණ සුවර්ණනිෂ්ක ශතයක ලොහලපදවා හැරගෙන පලායෙහි යනු අභිප්‍රායයි.

## 89 කුහක ජාතකයයි.

90 යො පුබ්බෙ කතකල්‍යාණො කතත්ථො නාවබුජ්ඣති,
පච්ඡා කිච්චෙ සමුප්පන්නෙ කත්තාරං නාධිගච්ඡතී'ති.

යො, යමෙක්; පුබ්බෙ, පෙර; කතකල්‍යාණො, (අනුන් විසින්) කරනලද උපකාරඇත්තේ; කතත්ථො, (මෙර මාවිසින්) නිෂ්පාදිත කෘත්‍ය ඇත්තේ; නාවබුජ්ඣති, (යහ් අනුන් විසින් කළ ඉෂ්ටය අභිවෘද්ධිය) නොදනීද; පච්ඡා, පසුව; කිච්චෙ, තමාවිසින් කර්තව්‍ය කෘත්‍යයක්; සමුප්පන්නෙ, උපන්කල්හි; (ඒ කෘත්‍යයට) කත්තාරං, කර්තෘ වක්හු; නාධිගච්ඡති, නොලැබේ.

## 90 අකතඤ්ඤු ජාතකයයි.

## 9 අපායිම්හ වර්ගයයි.

91 ලිත්තං පරමෙන තෙජසා
ගිලමක්ඛං පුරිසො න බුජ්ඣති,
ගිලරෙ ගිල පාප ධුත්තක
පච්ඡා තෙ කටුකං භවිස්සතීති.

පරමෙන, උතුම්වූ; තෙජසා, තෙජස්ඇති; (හලාහලවිෂයෙන් ලිත්තං, ලිප්තවූ; අක්ඛං, අක්ෂය (පසඇට); ගිලං, ගලන්නාවූ; පුරි

සො, පුරුෂතෙම; න බුජ්ඣති, (විෂලිප්තබව)නොදනී; අරෙ, කොල; සිල, ගල; පාපධුත්තක, පාපීවූ අසත්පුරුෂය. ශිල, ගල; (පසඇමගල) පවහා, පසුව; (මේ අසත්‍යය ගිලූකල) තෙ, තට; කටුකං, අමිධූරබවයක්; භවිස්සති, වන්නේයි.

**91 ලිත්ත ජාතකයයි,**

———o§o———

92 උක්කාසෙ සූර මිච්ඡන්ති මන්තීසු අකුතූහලං,
පියංච අන්නපානම්හි අත්ථෙ ජාතෙව පණ්ඩිතන්ති.

උක්කාසෙ, (ආයුධප්‍රහාරයෙන්) සම්පවූ යුද්ධයෙහි; සූරං, නිර්භය පුරුෂයා; ඉච්ඡන්ති, කැමැතිවෙති; මන්තීසු, (කතිව්‍යාකතිව්‍ය වශයෙන්) මන්ත්‍රණය කරනකල්හි; අකුතුහලං, (කළමන්ත්‍රණය ප්‍රකාශනොකරනහෙයින්) අකුතුහල පුරුෂයා, (ඉච්ඡන්ති, කැමැතිවෙති) අන්නපානම්හි, මධුරාහාරාදීන් එලවූ කල්හි; පියංච, ප්‍රියවූ පුරුෂයාද; (ඉච්ඡන්ති, කැමැති වෙති;) අත්ථෙ, (ප්‍රශ්නවිසර්ජනාදිවූ එබඳු) අර්ථයක්හෝ; ජාතෙ, උපන් කල්හි; පණ්ඩිතං, (කාරණාකාරණ පරිඥානයෙහි දක්‍ෂවූ) පණ්ඩිතපුරුෂයක්හු; (ඉච්ඡන්ති, කැමැතිවෙත්)

**92 මහාසාර ජාතකයයි.**

———o§o———

93 න විස්සසෙ අවිස්සත්ථෙ විස්සත්ථෙ පි න විස්සසෙ,
විස්සාසා භයමන්වෙති සීහංව මිගමාතුකා ති.

අවිස්සත්ථෙ, (යමෙක් පෙර විශ්වාසව පසුව අවිශ්වාසවීද එසේවූ අවිශ්වාසයා කෙරෙහි; න විස්සසෙ, විශ්වාස නොකරන්නේය; විස්සත්ථෙ පි, (පෙර අවිශ්වාසව විශ්වාසවූ) විශ්වාසයා කෙරෙහිද; න විස්සසෙ, විශ්වාසනොකරන්නේය; කුමක් හෙයින්ද යත්? විස්සාසා, (විශ්වාස අවිශ්වාස දෙපක්‍ෂයෙනිම) විශ්වාසය හෙතුකොටගෙන; භයං අන්වෙති, භයපැමිනෙයි; කුමක් මෙන්ද යත්? මිගමාතුකා, මෘගමාතෘකාව කෙරෙන් හෙවත් මීවින්නකෙරෙන්; (භයපැමිණි) සීහං ඉව, සිංහයා මෙනි නොහොත්; සීහං, විශ්වාස වශයෙන් සිංහයා කරා එළඹි; මිගමාතුකා ඉව. මීවින්නමෙන — මීවින්නන්ගා සිංහයන්හා යම්කලෙක විශ්වාසයක් කල විරූනැත එසේවූ මීවින්න කරා පැමිණි එමෙනි සිංහරාජයා යම්සේ විනාශයට ගියද එපරිද්දෙන් මෙබඳු දෙන්නා හා විශ්වාසය කෙළේ විනාශයට යන්නේය යනු අභිප්‍රායයි.

**93 විශ්වාස භොජන ජාතකයයි.**

———o§o———

94 සොතත්තො සොසීතො එකො භිංසනකෙ වනෙ,
නග්ගො න චග්ගිමාසීනො එසනා පසුතො මුනීති.

සොතත්තො, (සූර්‍ය්‍යාතපයෙන්) විශෙෂයෙන් තැවීනෙමි; සොසීතො, (හිමජලයෙන්) විශෙෂයෙන් තෙත්වූයෙමි; භිංසනකෙ, භයානකවූ; වනෙ, වනලැව්හි; එකො, අද්විතීයවූයෙමි; නග්ගො, පිළිනොහඳනා නොපොරවනා හෙයින් නග්නවූයෙමි; නචග්ගිමාසීනො, ගිනිනොතපනා හෙයින් ගිනිආසන්නව නොහිඳිනෙමි; එසනා, (බ්‍රහ්මචර්‍ය්‍යා) එසනයෙහි; පසුතො, යෙදුනෙමි; මුනි, මේ මෞනය පිණිස ප්‍රතිපන්නායයි ලොකයා විසින් සම්භාවිතවීමි.

## 94 ලොමහංස ජාතකයයි.

———o§o———

95 අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛොති.

සඞ්ඛාරා, (ප්‍රත්‍යයයන් විසින් එක්ව කරනලද ස්කන්ධායතනාදි) සංස්කාරයෝ; වත, එකාන්තයෙන්; අනිච්චා, අනිත්‍යයහ; උප්පාදවයධම්මිනො, ඉපද නැසෙනා ස්වභාවයහ; උප්පජ්ජිත්වා, ඉපිද; නිරුජ්ඣන්ති, නිරුද්ධවෙති; තෙසං, ඒ සංස්කාර ධර්මයන්ගේ; වූපසමො, ව්‍යුපශමශඞ්ඛ්‍යාත නිර්වාණයම; සුඛො, සුවයි.

## 95 මහාසුදස්සන ජාතකයයි.

———o§o———

96 සමතිත්තිකං අනවසෙසකං තෙලපත්තං යථා පරිහරෙය්‍ය,
එවං සචිත්තමනුරක්ඛෙ පත්ථයානො දිසං අගතපුබ්බන්ති.

සමතිත්තිකං, (මුවවිට රෙඛාව දක්වා) සමව පිරුණු; අනවසෙසකං, නොවැගිරෙන්නාවූ; තෙලපත්තං, තලතෙල්පාත්‍රය; යථා, යම්සේ; පරිහරෙය්‍ය, ගෙනයන්නේද; එවං, එසේම; අගතපුබ්බං, (බාලපෘථග්ජනයන් විසින් ස්වප්නයෙහුදු නොගියවිරූ හෙයින්) අගතපූර්වනම්වූ; දිසං, (නිර්වාණසඞ්ඛ්‍යාත) දිශාව; පත්ථයානො, පතන්නේ; සචිත්තං, ස්වකීයවූ චිත්තය; අනුරක්ඛෙ, රක්නේයි.

## 96 තෙලපත්ත ජාතකයයි

———o§o———

97 ජීවකඤ්ච මතං දිස්වා ධනපාලිඤ්ච දුග්ගතං,
පන්ථකඤ්ච වනෙ මූළ්හං පාපකො පුනරාගතොති.

ජීවකඤ්ච, ජීවකයාද; මතං, මළහු; දිස්වා, දැක; ධනපාලිඤ්ච, ධන

පාලියද; දුග්ගතං, දුකට පැමිණියා; දිස්වා, දැක; පන්ථකව, පන්ථකයාද; වනෙ, වලැ; මූළ්හං, (මගෙහොයා) මුළාවූවහු; දිස්වා, දැක; පාපකො, පාපකයා; පුන, නැවත; ආගතො, ආයී—පාපක යන නම අරුචි ඇතිව ජනපදයෙහි නම පරීක්ෂාවට ගියේ ජීවකයා මළහු දැක ජීවකයෝත් මියෙති, ධනපාලී දුගීවූ දැක ධනපාලීත් අනාථ වෙති, පන්ථකයා මංමුළාවූවහු දැක පන්ථකයෝත් මංමුළාවෙති, නම නම් ලොකයෙහි ප්‍රඥප්තිමාත්‍රයෙක ඉන් ප්‍රයොජන නැතැයි නිශ්චයකොට ආය යනු අභිප්‍රායයි.

**97 නාමසිද්ධි ජාතකයයි.**

———o§o———

98 සාධුකො පණ්ඩිතො නාම නත්වෙව අතිපණ්ඩිතො,
අතිපණ්ඩිතෙන පුත්තෙන මනම්හි උපකූලිතො'ති.

පණ්ඩිතො නාම, පණ්ඩිත නම්; සාධුකො, සාධුය: අතිපණ්ඩිතො, නාමමාත්‍රයෙන් අතිපණ්ඩිතනම්වූ පුරුෂතෙම; නතු එවා නොමළතුම්; අතිපණ්ඩිතෙන, අතිපණ්ඩිතවූ; පුත්තෙන, පුත්‍රයා විසින්; මනං, ඇසිල්ලකින්; උපකූලිතො අම්හි, දවනලද්දෙම් විමි.

**98 කූටවාණිජ ජාතකයයි.**

———o§o———

99 පරොසහස්සම්පි සමාගතානං
කන්දෙය්‍යුං තෙ වස්සසතං අපඤ්ඤා,
එකොව සෙය්‍යො පුරිසො සපඤ්ඤො
යො භාසිතස්ස විජානාති අත්ථං.

සමාගතානං, රැස්වූවන් අතුරෙහි; පරොසහස්සම්පි, සහස්‍රය කට අතිරෙකවූ; අපඤ්ඤා, ප්‍රඥාරහිතවූ; තෙ, ඔහු; වස්සසතං, වර්ෂ ශතයක්දු. කන්දෙය්‍යුං, හඬන්නාහු නමුදු; යො, යමෙක්; භාසිතස්ස, භාෂිතයාගේ; අත්ථං, අර්ථය; විජානාති, දනීද; (සො) සපඤ්ඤො, (හේ) සප්‍රාඥවූ; පුරිසොව, පුරුෂතෙමේම; එකො, හුදකලාවූයේද; සෙය්‍යො, උතුම්-නුවණනැත්තවුන් දහසක්දෙනාට වඩා එකම නුවණැතියෙක්තෙමේ උත්තමය යනු අභිප්‍රායයි.

**99 පරොසහස්ස ජාතකයයි.**

———o§o———

100 අසාතං සාතරූපෙන පියරූපෙන අප්පියං,
දුක්ඛං සුඛස්සරූපෙන පමත්තමතිවත්තතීති.

අසාතං, අමධුරය; සාතරූපෙන, මධුරස්වරූපයෙන්ද; අප්පියං, අප්‍රියවස්තුව; පියරූපෙන, ප්‍රියස්වරූපයෙන්ද; දුක්ඛං, දුඃඛය; සුඛස්සරූපෙන, සුඛස්වරූපයෙන්ද; පමත්තං, ප්‍රමත්ත පුරුෂයා; අතිවත්තති, අභිභවී.

100 අසාතරූප ජාතකයයි.

---

## 10 අලීනත වර්ගයයි.

---

101 පරොසහස්සම්පි සමාගතානං
කන්දෙය්‍යුං තෙ වස්සසතං අපඤ්ඤා,
එකොව සෙය්‍යො පුරිසො සපඤ්ඤො,
යො භාසිතස්ස විජානාති අත්ථං

සමාගතානං, රැස්වූවුන් අතුරෙහි; පරොසහස්සම්පි, සියයකට අධිකවූද; අපඤ්ඤා, ප්‍රඥාරහිතවූ; තෙ, ඔහු; වස්සසතං, වර්ෂශතයකුදු; කන්දෙය්‍යුං, වලන්නාහු නමුදු; (පරීක්ෂාකරන්නාහු නමුදු) යො, යමෙක්; භාසිතස්ස, භාෂිතයාගේ; අත්ථං, අර්ථය; විජානාති, දනීද; සපඤ්ඤො, සප්‍රාඥවූ (සො, හේ;) පුරුෂතෙම; එකොව, එක, හුදකලාවූයේම; සෙය්‍යො, උතුම්-නුවණැති සිය යකුදු අවිරුදු සිය යෙකුදු කාරණා කාරණා සොයත් දැක්කනොහෙන එසේහෙයින් නුවණනැත්තන් සියක්දෙනාට වඩා එකනුවණැති පුරුෂයෙක්ම උතුම් යනු අභිප්‍රායයි.

101 පරොසහස්ස ජාතකයයි.

---

102 යො දුක්ඛඵුට්ඨාය භවෙය්‍ය තාණං
සො මෙ පිතා දූභි වනෙ කරොති,
සා කස්ස කන්දාමි වනස්ස මජ්ඣෙ
යො තායිතා සො සහසා කරොතීති.

යො, යමෙක්; දුක්ඛඵුට්ඨාය, දුඃඛයෙන් පහරනලද්දහුට; තාණං, රක්‍ෂාස්ථානය; භවෙය්‍ය, වන්නේද; මෙ, මාගේ; සො පිතා, හේ පියතෙම; වනෙ, වෙනෙහි; දූභි, මිත්‍රද්‍රොහිකර්මය; කරොති, කෙරෙයි; වනස්ස, වනයාගේ; මජ්ඣෙ, මැද; සා, හේ මම; කස්ස, කවරක්හට; කන්දාමි, හඬම්ද; යො, යමෙක්; තායිතා, රක්ෂාකරන්නේද; සො, හෙතෙම; සහසා, සාහසික (කර්ම)යක්; කරොති, කෙරේ.

102 පණ්ණික ජාතකයයි.

---

103 යත්ථ වෙරී නිවිසති න වසෙ තත්ථ පණ්ඩිතො,
එකරත්තං ද්විරත්තං වා දුක්ඛං වසති වෙරිසූති

යත්ථ, යම් තැනෙක; වෙරී, වෛරයෙන් යුක්ත පුද්ගලතෙම; නිවසති, වෙසේද; තත්ථ, එතැන්හි; පණ්ඩිතො, නුවණැත්තේ; න වසෙ, නොවසන්නේයි; කුමක් හෙයින්ද යත්? වෙරිසු, වෛරීන් අතුරෙහි; එකරත්තං වා, එක්දවසක්හෝ; ද්විරත්තං වා, දෙදවසක් හෝ; දුක්ඛං, දුකින්; වසති, වෙසේ-වෛරීන් අතුරෙහි එක්දවසකු දු විසීම දුඛවාසය එසේ හෙයින් වෛරීන් අතුරෙහි නුවණැති පුරුෂතෙම නොවසන්නේයි.

**103 වෙරි ජාතකයයි.**

---

104 චතුබ්භි අට්ඨජ්ඣගමා අට්ඨාහිපිච සොළස,
සොළසාහි ච බාත්තිංසං අත්‍රිච්ඡං චක්කමාසදෙ,
ඉච්ඡාහතස්ස පොසස්ස චක්කං භමති මත්ථකෙති.

චතුබ්භි, සතරදෙනකුවිසිනුදු; (අසන්තුෂ්ටව) අට්ඨ, අටදෙනකු සමීපයට; අජ්ඣගමා, ගියේ; අට්ඨාහිපිච, අටදෙනකු කෙරෙහුදු අසන්තුෂ්ටව; සොළස, සොළොස්දෙනකු සමීපයට (ගියේය); සොළසාහි ච, සොළොස්දෙනකු විසිනුදු (අසන්තුෂ්ටව); බාත්තිංසං, දෙතිස් දෙනකු සමීපයට (ගියේය); අත්‍රිච්ඡං, අධික අධිකයක් පතන්නේ; චක්කං, උරචක්‍රයට; ආසදෙ, පැමිණියේය; ඉච්ඡා, තෘෂ්ණායෙන්; හතස්ස, නසනලද; පොසස්ස, පුරුෂයාගේ; මත්ථකෙ, මස්තකයෙහි; චක්කං, උරචක්‍රය; භමති, බමී.

**104 මිත්තවින්ද ජාතකයයි.**

---

105 බහුම්පෙතං වනෙ කට්ඨං වාතො භඤ්ජති දුබ්බලං,
තස්ස චෙ භායසි නාග කිසො නූන භවිස්සසීති

වනෙ, වනයෙහි; බහුං, බොහෝවූ; එතං, (යම්) මේ; දුබ්බලං, දුර්වලවූ; කට්ඨං, කාෂ්ඨයක්; වාතො, සුළඟ; භඤ්ජති, බිඳීද; තස්ස, ඒ කාෂ්ඨ භජනයට; නාග, නාගය; චෙ, ඉදින්; භායසි, බිය වෙහි නම්; නූන, එකාන්තයෙන්; කිසො, කෘෂවූයෙහි; භවිස්සසි, වන්නෙහිය.

105 **දුබ්බල කට්ඨ ජාතකයයි.**

---

106 සුසුඛං වත මං ජීවන්තං පචමානා උදඤ්චනී,
චොරී ජායප්පවාදෙන තෙලං ලොණඤ්ච යාචතීති.

වත, එකාන්තයෙන්; සුසුඛං, ඉතා සුවසේ; ජීවන්තං, ජීවත්වන්නාවූ; මං, මා; පචමානා, තවන්නාවූ (පෙළන්නාවූ) නොහොත් යමක් යමක් කනුතැමැත්තීද ඒ ඒ තවා රුවිරුවිදු පිසන්නාවූ;

උදඤ්චනී. සැළින්නේ ලිඳින් හෝ පැන් ගැරගන්නා කලේහාවිසමන්; අනුන්ගෙන් වස්තුගැරගන්නාසේ දන්නාවූ; ජනපදවාසීන, ජායා පුමාදගෙන් (අඹුය යන නාමින්)සෙවාපි, සොරක්; සොලං ඉතල්ද: ලොභෙඩ, ලුණුද යන කැමැති කැමැති වස්තු; යාවති, ඉල්වා.

**106 උදඤ්චනි ජාතකයයි.**

———:§o———

107 සාධු ඛො සිප්පකං නාම අපි යාදිසකීදිසං,
පස්ස ඛජ්ජප්පහාරෙන ලද්ධා ගාමා චතුද්දිසා ති.

යාදිසකීදිසං අපි, යම්තාම් බඳුවූ: සිප්පකං නාම, ශිල්පනම්දෙය, සාධු ඛො, ප්‍රශස්තාමය; පස්ස, බලා: ඛජ්ජ, පිළුගේ; පහාරෙන, ප්‍රහාරයෙන් හෙවත් එළෙබිටි ගැසීමෙන්; චතුද්දිසා, සතරදිගුන්ඇති හෙවත් සතරදික්හිවූ; ගාමා, ග්‍රාමයෝ; ලද්ධා, ලබනලදහුයි.

**107 සාලිත්තක ජාතකයයි.**

———)o(———

108 සික්ඛෙය්‍ය සික්ඛිතබ්බානි සන්ති සච්ඡන්දිනො ජනා,
බාහියා හි සුහන්නෙන රාජානමභිරාධයී ති.

සික්ඛිතබ්බානි, හික්මෙන්නට සුදුසුවූ ශිල්පයන්; සික්ඛෙය්‍ය, හික්මෙන්නේය; ප්‍රයොජන කිම්දයත්? සච්ඡන්දිනො, ඒ ඒ ශිල්පයෙහි සච්ඡන්දවූ; ජනා, ජනයෝ; සන්ති, ඇත්මැයි, හි, සම්හෙයකින්; බාහියා, බාහ්‍යජනපදයෙහි උපන්නී; සුහන්නෙන, මනාකොට්කළ පුරීෂ සඟීයෙන්; රාජානං, රජහු; අභිරාධයී, තොෂප්‍රසාදදෙක කරවූද; එසේ හෙයින් යම් විද්‍යාවෙක්හි හික්මිය යුතුයි; යම් සේ ජනපදවාසිවූ ගැහැනිපවා ශ්‍රී අපත්‍රපායෙන් යුක්තව පටයෙන් මුවාව කළ පුරීෂසඟීයෙන් රජ්ජුරුවන් පහදවා අනබිසෙස් තම්ට ගියාද එපරිද්දෙන් යම් යම් විද්‍යාවෙක පහත්ව උගන්නාහට ශ්‍රෙයස් කෙරෙති, එසේ හෙයින් යම් විද්‍යාවක් උගන්නේය යනු අභිප්‍රායයි.

**108 බාහිය ජාතකයයි.**

———*———

109 යදන්නෙනා පුරිසො හොති තදන්නා තස්ස දෙවතා,
ආහරෙතං ඛණං පුබ්බං මා මෙ භාගං විනස්සතී.

පුරිසො, පුරුෂතෙම; යදන්නෙනා, යම්බඳු ආහාරයක් ඇත්තේ; හොති, වේද; තස්ස, ඒපුරුෂයාගේ; දෙවතා, දෙවතාවාද; ත

ඵනනා, එබඳු ආහාර ඇත්තේය; එතං, මේ; කණං පූවං, කුඩු පූව; ආහර, ගෙන; මම, මාගේ; භාගං, කොටස; මා විනාසය, නොනසව.

109 කුණ්ඩපූව ජාතකයයි.

—(o)—

110 සබ්බසංහාරකො නත්ථි සුද්ධං කඞ්ගු පවායති,
අලිකං භාසතායං ධුත්ති සච්චමාහ මහල්ලිකා ති.

සබ්බසංහාරකො, සර්වසංහාර සුවඳ; නත්ථි, නැත; සුද්ධං, (අනික් සුවඳකින් අමිශ්‍ර හෙයින්) ශුද්ධවූ; කඞ්ගු, පුවඟු මල්ද; පවායති, විහිදුනේය; ධුත්ති, ධූර්තිනම්; අයං, මේතොමෝ; අලිකං, බොරු; භාසති, කියයි; මහල්ලිකා, මහල්ලිකා තොමෝ; සච්චං, සැබවක්; ආහ, කීව.

110 සබ්බසංහාර ජාතකයයි.

—:o:—

11 පරොසහස්ස වග්ගො.

—:o:—

111 හංසි තුවං එවං මඤ්ඤසි සෙය්‍යො පුත්තෙන පිතාති රාජසෙට්ඨ,
හන්දස්සතරස්ස තෙ අයං අස්සතරස්ස හි ගද්‍රභො පිතාති.

හංසි, ඉදින්; තුවං, තෝ; රාජසෙට්ඨ, රාජොත්තමය; පුත්තෙන, පුතුම වඩා; පිතා, පියේ; සෙය්‍යො ඉති, උතුමැයි; එවං, මෙසේ; මඤ්ඤසි, හඟනෙහිනම්; හන්ද, එබැවින්; තෙ, තාගේ; අස්සතරස්ස, අශ්වතරයාට වඩා; අයං, මේ; (ගද්‍රභ උත්තම වන්නේය එසට කාරණා කිමෙයත්?) අස්සතරස්ස හි, අශ්වතරයාට වනාහි; ගද්‍රභො, කොටළුතෙම; පිතා, පියේයි.

111 ගද්‍රභ පඤ්හ ජාතකයයි.

—:o:—

112 යෙන සත්තුබිලඞ්ගා ච දිගුණපලාසො ච පුප්ඵිතො,
යෙනා'දමි තෙන වදාමි යෙන නා'දමි න තෙන වදාමි,
එසම්ගො යවමජ්ඣකස්ස එතං ඡන්නපථං විජානාහීති.

යෙන, යම්තැනෙක්හි; සත්තු, හත්සුණු බත් තබා විකුණන අගාතියෙක් ඇද්ද; (යෙන, යම්තැනෙක්හි;) බිලඞ්ගා ච, කාඩි තබා විකුණන අගාතියෙක් ඇද්ද; (යෙන, යම් තැනෙක්හි;) පුප්ඵිතො, පිපුණාවූ; දිගුණපලාසො ච, දෙකක්ව මැදින් බෙදී සිටෙන පත් ඇති කොබිලිල රුකද; යෙන, යම් අතකින්; අදමි, කමිද; තෙන,

ඒ (හංසයා) දිශාවෙන්; වදෑම්, (මග) කියමි; යේන, යම් අතකින්; න අදෑම්, නොකමිද; නෙන, ඒ (හංසයා) දිශාවෙන්; න වදෑම්, නොකියමි; යථාභිරන්තංසා, යම මැදුම් ගම පිහිටි අපගේ ගෙට; එසො, මේ (අප) කීයේ; මග්ගො, මගය; එතං, මේ සහවා කී; අනාන පථං, අනාපථය නොහොත් අගාත පදය (අගාත කාරණය); ඉති නාශි, දතු.

### 112 අමරාදෙවී පඤ්හ ජාතකයයි.

---

113 සද්දහසි සිගාලස්ස සුරාපීතස්ස බ්‍රාහ්මණ,
සිප්පිකානං සතං නත්ථි කුතො කංසසතා දුවෙති.

බ්‍රාහ්මණ, බමුණ; සුරාපීතස්ස, රා බොනලද; සිගාලස්ස, ශෘගාලයාගේ වචනය; සද්දහසි, අදහන්නෙහිද; සිප්පිකානං, බෙල්ලන් සම්බන්ධිවූ; සතං, ශතයක්හුදු; නත්ථි, නැත; දුවෙ කංසසතා, කාෂීපණ ශතයෝ දෙදෙනෙක්; කුතො, කොයින්ද—බමුණ ශෘගාලයාගේ මසුරන් දෙසියයක් තබා බෙල්ලෝ දෙසියයක්හුත් නැතැයි යනු අභිප්‍රායයි.

### 113 සිගාල ජාතකයයි.

---

114 බහුචින්තී අප්පචින්තී ච උභො ජාලෙ අබජ්ඣරෙ,
මිතචින්තී අමොචෙසි උභො තත්ථ සමාගතාති.

බහුචින්තී, චින්තා බාහුල්‍ය වශයෙන් එනම්ලද බහුචින්තී නම් මත්ස්‍යයාද; අප්පචින්තීච, අල්පචින්තා වශයෙන් එනම්ලද අල්පචින්තීනම් මත්ස්‍යයාද යන; උභො, දෙදෙන; ජාලෙ, දැලෙහි; අබජ්ඣරෙ, බැඳුනාහ; මිතචින්තී, අනූනාධික චින්තාවෙන් මිතචින්තී නම්වූ මත්ස්‍යතෙම; අමොචෙසි, දැලින් මිදීය; උභො, (ඒ බහුචින්තී අප්පචින්තී) දෙදෙන; තත්ථ, ඒදිනයෙහි; සමාගතා, (මිතචින්තීහු හා) සමාගම් බවට ගියෝ—බහුචින්තී අප්පචින්තී දෙදෙන තමන්ගේ මොහයෙන් දැලබැඳී මිතචින්තීහු නිසා බන්ධනයෙන් මුක්තව නැවත තේ මිත චින්තීහු කරා නැඟී ආහයි යනු අභිප්‍රායයි.

### 114 මිතචින්තී ජාතකයයි.

---

115 යාස්සඤ්ඤෙ මනුසාසති සයං ලොලුප්පචාරිනී,
සායං විපක්ඛිකා සෙති හතා චක්කෙන සාලිකාති.

සා, ගඹින්; සගං, තොමෝ; ලොලුප්පචාරිනී, ලොල්වූ සමාර ඇත්තී; අමස්සා, අනුන්ට; අනුශාසති, අනුශාසනා කරන්නීද; සා අශං, ඈ මේ; සාලිකා, ශාරිකා තොමෝ; වකෙකන, වක්‍රයෙන්; හතා, නසන ලද්දී; විපක්ඛිකා, විගතවූ පක්ෂ ඇතිව; සෙති. (මැරී ගෙණ) හෝනීයි.

115 අනුසාසික ජාතකයයි.

——○——

116 අතිකරමකරාචරිය මය්හම්පෙතං න රුච්චති,
චතුත්‍ථෙ ලඞ්ඝයිත්වාන පඤ්චමායසි ආවුතොති.

ආචරිය, ඇදුරයාණෙනි; අතිකරං, (තාගේ මෙතෙක්කල් ක්‍රියාවට) අධිකවූ ක්‍රියාවක්; අකරා, කෙළෙහි; මය්හම්පි, (තාගේ ශිෂ්‍යවූ) මටද; ඒතං, මේ (තාගේ) කාරණය; න රුච්චති, නොරුස්සයි; චතුත්‍ථෙ, සතරවන ශස්ත්‍රය; ලඞ්ඝයිත්වාන, පැන; පඤ්චමායසිං, පස්වන ශස්ත්‍රයෙහි; ආවුතො, ඇවිනියෙහි වී—ආචාරීනි තොප පරිචරණය කළ සතරවන ශස්ත්‍රයම පනවයි මා කියවකියවා නොකීතරුව පැන නොපුරුදු පස්වන ශස්ත්‍රය පැනෙම්යි ඇනී ඇවිනී ගියෙහියි යනු අභිප්‍රායයි

116 දුබ්බච ජාතකයයි.

——○——

117 අච්චුග්ගතාතිබලතා අතිවෙලං පභාසිතා,
වාචා හනති දුම්මෙධං තිත්තිරං වාතිවස්සිතන්ති.

අච්චුග්ගතා, අත්‍යුද්ගතවූ; අතිබලතා, (නැවත නැවත කීමෙන්) අතිබල ස්වභාවවූ; අතිවෙලං, කාලාතික්‍රාන්ත කොට; පභාසිතා, භාෂිතවූ; වාචා, වචනතොමෝ; දුම්මෙධං, දුර්මේදස්නු; නුවණ නැත්තහු; හනති, නසා; කුමක්මෙන්දයත්? අතිවස්සිතං, ප්‍රමාණාතික්‍රාන්ත කොට හැඬූ; තිත්තිරං ඉව, වටුවා මෙනි—යම්සේ වටුවා එක්වන් ශබ්ද කිරීමෙන් විනාශයට ගියද එපරිද්දෙන් දුඩමලු කෙනෙක් විනාශප්‍රාප්ත වෙති යනු අභිප්‍රායයි.

117 තිත්තිර ජාතකයයි.

——○——

118 නාචින්තයන්තො පුරිසො විසෙසමධිගච්ඡති,
චින්තිතස්ස ඵලං පස්ස මුත්තොස්මි වධබන්ධනාති.

පුරිසො, පුරුෂතෙම; අචින්තයන්තො, දුකට පැමිණ මේ උපායෙන් මේ දුකින් මිදෙමියි කාරණා නොසලකන්නේ; විසෙසං;

තම්හාගේ දුඃඛ මොචන සඞ්ඛ්‍යාත විශෙෂයම්; න අධිගච්ඡති, නොපැමිණේ; චින්තිතස්ස, චින්තිත කර්මයාගේ; ඵලං, ප්‍රයෝජනය; පස්ස, බල; වධබන්ධනා, වධබන්ධනයෙන් හෙවත් මරණයෙන්ද බන්ධනයෙන්ද; මුත්තොස්මි, මිදුනෙම්වීමි—වධ බන්ධනයට පැමිණි උපාය ඥානයෙහි දක්ෂ පුරුෂ මේ දුකින් කෙසේ මිදෙම්දෝහෝයි සිතා මේ පරිද්දෙන් ඒ වධබන්ධනයෙන් මිදෙන්නට උත්සාහ කරන්නේය යනු අභිප්‍රායයි.

118 වට්ටක ජාතකයි.

---

119 අමාතා පිතරි සංවඩ්ඪො අනාචරියකුලෙ වසං,
නායං කාලං අකාලං වා අභිජානාති කුක්කුටො'ති.

අමාතාපිතරි සංවඩ්ඪො, මව්පිය දෙදෙනා කෙරෙහි නොවැඩී යාවූ; අනාචරියකුලෙ වසං, ආචාර්‍ය්‍යකුලයෙහි නොවිසූ; අයං කුක්කුටො, මේ කුකුළා; කාලං අකාලං වා, හැඬුවමනාකල නොහැඬුවමනා කලැයි හෝ; න අභිජානාති, නොදනී.

119 අකාලරාවි ජාතකයි.

---

120 අබද්ධා තත්‍ථ බජ්ඣන්ති යත්‍ථ බාලා පභාසරෙ,
බද්ධාපි තත්‍ථ මුච්චන්ති යත්‍ථ ධීරා පභාසරෙති.

යත්‍ථ, යම්තැනෙක්හි; බාලා, අඥානයෝ; පභාසරෙ, බෙණෙද්ද; තත්‍ථ, එහිලා; අබද්ධා, බන්ධනයට නොසුදුස්සෝ; බජ්ඣන්ති, බැඳෙති; යත්‍ථ, යම්තැනෙක්හි; ධීරා, ප්‍රාඥයෝ; පභාසරෙ, බෙණෙද්ද; තත්‍ථ, එහි; බද්ධාපි, බන්ධනාහීසෝද; මුච්චන්ති, මිදෙත්.

120 බන්ධනමොක්ඛ ජාතකයි.

---

12 හංස වර්ගයි.

---

121 කරෙ සරික්ඛො අථවාපි සෙට්ඨො
නිහීනකොවාපි කරෙය්‍ය එකො,
කරෙය්‍යුං තෙ ව්‍යසනෙ උත්තමත්‍ථං
යථා අහං කුසනාළිරුචා යතාති.

සරික්ඛො, ජාතිආදීන් සදෘශතෙමේද; කරෙ, (මිත්‍රධර්මය) කරන්නේය; අථවාපි, නොහොත්; සෙට්ඨො, ජාත්‍යාදීන්ශ්‍රෙෂ්ඨතෙමේ

ද; (මිත්‍රධර්මය කරන්නේය) නිහීනසෙකා වාපි, නිහීනාදිවූ නිහීනයෙක්ද
එතො, එතෙමේ; කරෙයා, මිත්‍රධර්මය කරන්නේය; තෙ, ඒමිත්‍රයෝ
ව්‍යසනෙ, ව්‍යසනයෙහිලා; උත්තමත්ථං, උතුම්වූ අර්ථයක්; කාරෙ
ය්‍යුං, කරන්නාහුයි; කාමෙන්ද යත්; රුචායං, බුරුදගසළපන්; අ
හං, මමද; කුසනාළි, දියමෙරළිය ගස ළපන්කුසනාළිද; යථා, යම්
සේද එපරිද්දෙනි ගෙවත් මහෙශාක්‍යවූ මාහාඅල්පේශාක්‍යවූ කුස
නාලියනා මිත්‍රධර්මය කළමෝද එපරිද්දෙනි—එහි මහෙශාක්‍යවූ මම
මට දුඃඛප්‍රතිකාර නොකොටහී කුසනාලි දෙවතාවාගේ බලයෙන්
හැලවිනිම් එහෙයින් හීනාදි විභාග අපෙක්ෂානොකොට මිත්‍රධර්මය
කළමැනව මිත්‍රයෝවූකලී ව්‍යසනයෙහි කිසිවගලත් වෙත්මය යනු
අභිප්‍රායයි.

**121 කුසනාලි ජාතකයයි.**

———✳———

122 යසං ලද්ධාන දුම්මෙධො අනත්ථං චරති අත්තනො,
අත්තනො ච පරෙසඤ්ච හිංසාය පටිපජ්ජති.

දුම්මෙධො, දුර්මෙධයා; යසං, යසස්, ලද්ධාන, ලදින්; අත්ත
නො, තමහට; අනත්ථං, අනර්ථයක්; චරති, හැසිරෙයි; අත්තනොච,
තමහටද; පරෙසංච, මෙරමාහටද; හිංසාය, හිංසාපිණිස; පටිපජ්ජ
ති, පිළිපදී.

**122 දුම්මෙධ ජාතකයයි.**

———)o———

123 අසබ්බත්ථගාමිනිං වාචං
බාලො සබ්බත්ථ භාසති,
නායං දධිං වෙදි න නඞ්ගලීසං
* දධිප්පයං මඤ්ඤති නඞ්ගලීසන්ති.

බාලො, නුවණනැත්තේ; අසබ්බත්ථගාමිනිං, සබ්බත්ථගාමිනිනොවූ,
වාචං, තෙපුල; සබ්බත්ථ, හැමතන්හි; භාසති, බෙණෙයි; අයං, මේ
තෙම; දධිං, දධිද; නවෙදිනො, නොදන්නේය; නඞ්ගලීසං, නගු
ලිසද; (නොදන්නේය) කුමක්හෙයින්දයත්? අයං, මෙතෙම; දධි
මපි, දධියද; නඞ්ගලීසං, නගුලිසයයි; මඤ්ඤති, සිතාද; නොහොත්
දධි, දධිනද; පයං, ක්ෂීරයද; නංගලීසං, නගුලිසයයි; මඤ්ඤති,
සිතාද එසේහෙයිනි.

**123 නඞ්ගලීස ජාතකයයි.**

———:o———

* දධිප්පයං-සම්භර

124 වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
වායාමස්ස ඵලං පස්ස භුත්තා අම්බා අනීතිහං.

පණ්ඩිතො පුරිසො, නුවණැති පුරුෂතෙම; වායමෙථෙව, ව්‍යායාම කෙරේමැයි; න නිබ්බින්දෙය්‍ය, නොකලකිරෙන්නේයි; වායාමස්ස ව්‍යායාමයාගේ; ඵලං, (ප්‍රත්‍යක්‍ෂ, ප්‍රයොජනය; පස්ස, බල; ඒ කවරේදයත්? අනීතිහං, ඉතිසේදවිය ඉමසේදවියයි ශ්‍රැති වශයෙන් නොව ප්‍රත්‍යක්‍ෂ වශයෙන්ම; අම්බා, ආම්‍රඵලයෝ; භුත්තා, (බොහෝ තාපසවරුන් විසින්) අනුභවකරනලදහුයි.

**124 අම්බ ජාතකයයි.**

—·——o§o——·——

125 බහුම්පි සො විකත්ථෙය්‍ය අඤ්ඤං ජනපදං ගතො,
අන්වාගන්ත්වාන දූසෙය්‍ය භුඤ්ජ භොගෙ කටාහකාති.

සො, ඒ පුරුෂ; අඤ්ඤං, (තමාගේ ජාත්‍යාදී ස්වරූපය නොදන්නා) අනික්; ජනපදං, ජනපදයකට; ගතො, ගියේ; බහුම්පි, බොහෝ කොටද; විකත්ථෙය්‍ය, පරිභවවචනාදින් බණින්නේය; අන්වාගන්ත්වාන, නැවත අවුදින්; දූසෙය්‍ය, (තමන්ගේ ස්වාමිතෙම) දූෂණය කරන්නේය; කටාහක, කටාහකය; භොගෙ, සම්පත්තීන්; භුඤ්ජ, අනුභවකර.

**125 කටාහක ජාතකයයි.**

—·——o§o——·——

126 තදෙවෙකස්ස කල්‍යාණං තදෙවෙකස්ස පාපකං
තස්මා සබ්බං න කල්‍යාණං සබ්බං වාපි න පාපකන්ති.

එකස්ස, සමහරෙක්හට; තදෙව, එම; කල්‍යාණං, කල්‍යාණය; එකස්ස, එකෙකුට; තදෙව, තේම; පාපකං, ලාමකය; තස්මා, එහෙයින්; සබ්බං, සියල්ලම; න කල්‍යාණං, කල්‍යාණ නොවෙයි; සබ්බං වාපි, සියල්ලම; න පාපකං, ලාමක නොවේ-සමහරු කිවිස නාසා කපානනිසි, සමහරු කිවිස උත්තම ස්ත්‍රී ප්‍රතිලාභය කෙරෙයි, එසේ හෙයින් සමහරුන්ට ඉෂ්ටවූයකවූ කවයුතා සමහරුන්ට. අනිෂ්ටදායකමය යනු අභිප්‍රායයි.

**126 අසිලක්ඛණ ජාතකයයි.**

——o§o——

127 තෙ දෙසා තානි වත්ථූනි අහඤ්ච වනගොචරො,
අනුවිච්ච ඛො තං ගණ්හෙය්‍යුං පිව ඛීරං කලණ්ඩුකාති.

තෙ දෙසා, එම්දෙශයහ; තානි, ඔහු; වත්‍ථූනි, වස්තූහ; අහංච, මම්ද; වනගොචරො, වනගොචරයෙමි; තං, තා; අනුවිච්ච, දැන, ගණ්හෙය්‍යුං, ගන්නාහ; කලණ්ඩුක, කලණ්ඩුකය; ඛීරං, ක්ෂීරය; පිව, බොං–කලණ්ඩුකය තා විසූ මාතෘකුක්ෂිප්‍රදෙශයද මාතෘගාමීව සිටු වද ක්ෂත්‍රියාදීන්ගේ නොව දසිගකගේ බඩ වනගොචරවූ තිරිසන් සම්පවාදනීම් මම මේ ගොස් තාගේ ස්වාමිදරුවන්ට කීම්නම් කණ්ඩ නාශාච්ඡේදනාදීන් විතාරණට පමුණුවා හැරගෙන යන්නාහුයි ලුබ්ධ කනාව මුඛයෙන් ගත් කිරිත්ත කුලපුත්‍රිය මුද්‍රණෙහැනී දින්නේනා නොව බිපියා වැදගීදු යනු අභිප්‍රායයි.

127 කලණ්ඩුක ජාතකයයි.

———○———

128 යො වෙ ධම්මං ධජං කත්වා නිගූළ්හො පාපමාචරෙ,
විස්සාසයිත්වා භූතානි බිලාරං නාම තං වතන්ති.

යො, යමෙක්; වෙ, එකාන්තයෙන්; ධම්මං, දශකුශලකර්මපථ ධර්මයන්; ධජං කත්වා, ධවජයක්කොටගෙන; භූතානි, සත්ත්වයන්; විස්සාසයිත්වා, විශ්වාසකොටගෙන; නිගූළ්හො, නිගූඪවූයේ; පාපං, පාපය; ආචරෙ, හැසිරේද; (ඔහුගේ) තං වතං, ඒ ව්‍රතය; බිලාරං නාම, බිලාරව්‍රතනම්—යමෙක් අභූතවූ ශාන්තාදී ගුණයෙන් පාපව්‍රතය සඟවාගෙන බළලුන් මූසිකාදී ග්‍රහණයෙහි නිශ්චලසාමෙන් මෙහි ප්‍රාණාතිපාතාදී පාපය සිඞකෙරේද ඔහුගේ ව්‍රතය බිලාරව්‍රතනමැයි යනු අභිප්‍රායයි.

128 බිලාරවත ජාතකයයි.

———○———

129 නායං සිඛා පුඤ්ඤහෙතු ඝාසහෙතු අයං සිඛා
නාංගුට්ඨගණනං යාති අලන්තෙ හොතු අග්ගිකාති.

අයං සිඛා, මේසිඛාතොමෝ; පුඤ්ඤහෙතුන, පින්පිණිසනොවෙයි; අයංසිඛා, මේසිඛාතොමෝ; ඝාසහෙතු, කනපිණිසය; අංගුට්ඨගණනං, ඇඟිලිගිණීමට; නයාති, (මූසිකවර්ගයා) නොයේ; අග්ගික අග්ගිකය; තෙ, තාගේ; (මීයන් ගිණීම); අලංහොතු, පමණවේවා; එතෙකින්මීයන් ගිණීම් නොකැමැත්තේය යනුඅභිප්‍රායයි.

129 අග්ගික ජාතකයයි.

———)o(———

130 යථා වාචාච භුඤ්ජස්සු යථා භුත්තංච ව්‍යාහර,
උභයෙන න සමෙති වාචා භුත්තං ච කොසියෙයි.

කොසියෙ, කොසියාව; යථා වාචාව, (ලෙඩෙම් යන) වාචාව වූ පරිද්දෙන්ම; භුඤ්ජස්සු, (තීගේ රොගයට සුදුසු බෙහෙත්) අනුභවකර; යථා භුත්තං ච, තී අනුභවකළ ප්‍රණීතාහාරවූ පරිද්දෙන්ම; ව්‍යාහර, කිය; යථාභූතංච'සි කියාද පාඨඇත, එහි, යථාභූතවූ පරිද්දෙන්; ව්‍යාහර, කියයනු අර්ථයි; නොහොත් 'යථාවාචං සි' කියාත්, එහිදු මෙම අර්ථයි; තෙ, තීගේ; වාචා, (රොගිම්යි කියන) තෙප්ලද; භුත්තං ච, ප්‍රණීතාහාරය අනුභව කිරීමද යන; උභයං, මේදෙක; න සමෙති, සම නොවේ.

### 130 කොසිය ජාතකයයි.

✻—✻—✻—✻

### 13 කුසනාලි වර්ගයයි.

———

131 අසම්පදානෙනිතරීතරස්ස
බාලස්ස මිත්තානි කලී භවන්ති,
තස්මා හරාමි භුසං අඩ්ඪමානං
මා මෙ මිත්ති ජීයිත්ථ සස්සතායන්ති.

ඉතරීතරස්ස, යම්කිසි හීනවූද උත්තමවූද වස්තුහුගේ; අසම්පදානෙන, අග්‍රහණයෙන්; (නොගැන්මෙන්) බාලස්ස, දන්ධවූ අඥානයාගේ; මිත්තානි, මිත්‍රයෝ; කලී භවන්ති, කිළුටුවූවාහු වෙත්; (බිඳෙති සී සේයි) තස්මා, එහෙයින්; භුසං අඩ්ඪමානං, (සබඳහු විසින් දෙනලද) එකබොල්තිඹ; (බොල්සතර ලාස්ස) හරාමි, ගනිමි; මෙ, මාගේ; මිත්ති, (සබඳනු සමග) මිත්‍රභාවය; මාජීයිත්ථ, හානියට නොයේවා; අයං, මේ මිත්‍රත්වය; සස්සතා, ශාශ්වත වේවා; (සචිරවේවා) "අසම්පදානෙන" යි කිවමනා තැන ගාථාබන්ධනය පිණිස අකාරලොප්කොට අසම්පදානෙනිතරීතරස්ස'යි කිවූ.

### 131 අසම්පදාන ජාතකයයි.

132 කුසලූපදෙසෙ ධිතියා දළ්හාය ච
අනිවත්තිතත්තා භයභීරුතාය ච,
න රක්ඛසීනං වසමාගමිම්හ
ස සොත්ථිභාවො මහතා භයෙන මෙති.

කුසල, දක්ෂවූ ප්‍රත්‍යෙකබුද්ධවරයන්ගේ, උපදෙසෙ, උපදෙශයෙහි (අවවාදයෙහි); දළ්හාය, දෘඪවූ, ධිතියා, ධෛර්‍ය්‍යයෙන්ද; භය,

චිත්තොත්‍රාසමාත්‍රයද; භීරුතාය, ශරීරකම්පා කරන මහත්භයද හෙතුකොටගෙන; අවජිතත්තා ච, නොනැවති හෙයින්ද; රක්ඛසීනං, යකින්නන්; වසං, විසීබවට; න ආගම්මහ, නොපැමිණියම්හ; මෙ, මට; මහතා, මහත්වූ; භයෙන, භයින්; සො සොත්ථිභාවො, ඒ සෙත් බැව් වී.

## 132 පඤ්චගරු ජාතකයයි.

—*—*—*—

133 ඛෙමං යහිං තත්ථ අරි උදීරිතො
උදකස්ස මජ්ඣෙ ජලතෙ ඝතාසනො,
න අජ්ජ වාසො මහියා මහීරුහෙ
දිසා භජව්හො සරණාජ්ජ නො භයන්ති.

යහිං, යම්තැනෙක්හි; ඛෙමං, නිර්භයද එසේවූ; තත්ථ, එතන්හි; අරි, සතුරා; උදීරිතො, නැංගා; "අරි"කිවමනා තැන "අරී"කියා ගාථාහෙයින් දීඝීවී; උදකස්ස, ජලයාගේ; මජ්ඣෙ, මැද; ඝතාසනො, ඝෘතය අසනය කරන හෙයින් ඝතාසනනම්ලද වහ්නිය; ජලතෙ, දිලිහෙන්නේය; මහියා, පොළෝතෙලෙහිවූ; මහීරුහෙ, වෘක්ෂයෙහි; අජ්ජ, අද; වාසො, (අපට) වාසයෙක්; න, නැත; දිසා, (නොයෙක්) දිගුන්; භජව්හො, සෙවව්; අජ්ජ, අද; නො, අපට; සරණා, සරණින්; භයං, භය උපනි.

## 133 ඝතාසන ජාතකයයි.

*——*——*

134 යෙ සඤ්ඤිනො තෙපි දුග්ගතා
යෙපි අසඤ්ඤිනො තෙපි දුග්ගතා,
එතං උභයං විවජ්ජය
තං සමාපත්තිසුඛං අනඞ්ගණන්ති.

සඤ්ඤිනො, (නෙවසංඥානාසංඥායතනලාභීන් කෙරෙන් පිටත්) සංඥාශීර්ෂයෙන් දක්වනලද; යෙ, යම්; (සවිත්තක) සත්ත්වකෙනෙක් ඇද්ද; තෙපි, ඕහුද; දුග්ගතා; (නෙවසංඥානාසංඥායතන සමාපත්තියගේ අලාභයෙන්) දුගීහ; අසඤ්ඤිනො, (සංඥාවගේ අභාව ශීර්ෂයෙන් දක්වනලද අචිත්තකබැව් ඇති) අසංඥභවයෙහි උපන් නාවූ; යෙපි, සම්සත්ත්ව කෙනෙක් ඇද්ද; තෙපි, ඔහුද; දුග්ගතා, (එම නෙවසංඥානාසංඥායතන සමාපත්තියගේ අලාභයෙන්) අනාථයහ,

එතං උභයං; මේ(සංඥභාවයද අසංඥභාවයද යන)දෙක; විවජ්ජය, හරැ; තං සමාපත්තිසුඛං,ඒ (නෛවසංඥනාසංඥායතන) සමාපත්ති සුඛය; අනඞ්ගණං, නිර්දොෂයි,

### 134 ඣානසොධන ජාතකයි.

*—)o((—*

135 චන්දාභං සුරියාභඤ්ච යොධ පඤ්ඤාය ගාධති;

අවිතක්කෙන ඣානෙන හොති ආභස්සරූපගොති.

චන්දාභං, චන්ද්‍රයා වැනිවූ අවදාතකසිණයද; සුරියාභඤ්ච, සූර්‍ය්‍යයා වැනිවූ පීතකසිණයද; යො, යමෙක්; ඉධ, මෙහිලා; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; ගාධති, ආලම්බනයකොට අනුප්‍රවෙශවේද හෙවත් එහි පිහිටාද; නොහොත්; ඉධ, මෙහිලා; චන්දාභං, චන්ද්‍රප්‍රභා යම්තැනක පතළද; සුරියාභං, සූර්‍ය්‍යප්‍රභා යම්තාක් තන්හි පතළද එතාක් තන්හි ප්‍රතිභාගකසිණය වඩා ඒ ආලම්බනයකොට ධ්‍යානය උපදවන්නේය මෙසේ විවිධවූ ආභා; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; භාවති, වඩාද; මේ දෙසැටියෙන් වැඩූ; අවිතක්කෙන, විතර්කරහිතවූ; ඣානෙන, ද්විතීයධ්‍යානයෙන්; ආභස්සරං, ආභාස්වරබ්‍රහ්මලොකයට; උපගො, පැමිණියේ; හොති, වේ.

### 135 චන්දාභ ජාතකයි.

—*—*—*—

136 යං ලද්ධං තෙන තුට්ඨබ්බං අතිලොභො හි පාපකො,

හංසරාජං ගහෙත්වාන සුවණ්ණා පරිහායථාති.

යං, යමක්; ලද්ධං, ලබනලදද; තෙන, එයින්; තුට්ඨබ්බං, තුෂ්ට විය යුත්තේය; අතිලොභො හි, අධිකවූ ලොභය වනාහි; පාපකො, ලාමකයි; හංසරාජං, හංසරාජයා; ගහෙත්වාන, ගෙන; සුවණ්ණා, ස්වර්ණයෙන්;පරිහායථ, පිරිහුණු-යම්සේ සේ ස්වර්ණහංසරාජයා නිත්‍යයෙන් දීලන එක ස්වර්ණපත්‍රයෙන් සතුටුනොව ලොභකොට ගනිම්යි නිති ලබන ස්වර්ණපත්‍රයෙන් පිරිහුණුද එපරිද්දෙන් අධිකයට ලොභ ඉපදවීම පරිහානියට කාරණයයි සේයි.

### 136 සුවණ්ණහංස ජාතකයි.

*—·—*——*

137 යත්ථෙකො ලභතෙ බබ්බු දුතියො තත්ථ ජායති,
තතියො ච චතුත්ථො ච ඉදං තෙන බබ්බුකා බිලං

යත්ථ, යම්තැනෙක්හි, එකො, එක්; බබ්බු, බළලෙක්; ලභති, (මූෂිකාදි කිසිගොචරයක්) ලබාද; තත්ථ, එතන්හි; දුතියො, දෙවැනි බළලෙක්; ජායති, උපද්දි; තතියො ච, තුන්වන බළලෙක්ද; චතුත්ථො ච, සතරවන බළලෙක්ද; (උපද්දි) තෙන, තීගෙ; ඉදං, මේ සඵටිකවූ බිලය; බබ්බුකා බිලං, බබ්බුකා බිලනම්වේ. හෙවත් බළල්බිලනම්වේ; නොහොත්; තෙන, තීගෙ; ඉදං, මේ; බබ්බුකා බිලං, සඵටිකමයවූ බිලයට ලෙන් පැහැර ඒ බළල්ලු සතරදෙනම ජීවිතක්ෂයට පැමිණියෝය.

**137 බබ්බු ජාතකයයි.**

—(—✻✻—)—

138 කිංතෙ ජටාහි දුම්මෙධ කිංතෙ අජිනසාටියා,
අබ්භන්තරං තෙ ගහනං බාහිරං පරිමජ්ජසි.

දුම්මෙධ, දුර්මේධය; තෙ, තට; ජටාහි, ජටායෙන්; කිං, කුමනනම් ප්‍රයොජනද; තෙ, තට; අජිනසාටියා, අඳුන් දිවිසමින්; කිං කුමන ප්‍රයොජනද; තෙ, තාගේ; අබ්භන්තරං, හෘදය; ගහණං, රාගද්වෙෂාදීන් ගහන; බාහිරං, පිටත; පරිමජ්ජසි, තපොවෙෂධාරණකෘත්‍යයෙන් පිරිමදනෙහි රාගද්වෙෂාදීන් යුක්තවූ සිත් ඇතිතට ජටාඅඳුන්දිවිසම් ආදීන් පැවිදිවෙස් ගෙනත් ප්‍රයොජන නැතැයි යනු අභිප්‍රායයි.

**138 ගොධ ජාතකයයි.**

—✻—○—✻—

139 අක්ඛී භින්නා පටො නට්ඨො සඛී ගෙහෙ ච භණ්ඩනං,
උභතො පදුට්ඨකම්මන්තො උදකම්හි ථලම්හි චාති.

අක්ඛී, ඇස්හු දෙදෙන; භින්නා, භින්නයහ හෙවත් හැසි දියෙහිදී ඇස්හු නටන; පටො, (නොඩිබූ) වස්ත්‍රයද; නට්ඨො, නට; (හෙද ගොඩතුබූවා සොරු ගත්හුය); සඛී, යෙහෙළියහා; ගෙහෙ, ගෙහි; (තාගේ අඹුවහා) භණ්ඩනං, (මහාකලහයට පූර්වනාගයයි කියනලද) භණ්ඩනය; උදකම්හි; දියෙහිද; ථලම්හි ච, ගොඩෙහිද යන; උභතො, දෙතැන්හි; පදුට්ඨ, ප්‍රදුෂ්ටවූ; කම්මන්තො, කර්මාන්ත ඇත්තෙයි ඒ.

**139 උභතොභට්ඨ ජාතකයයි.**

—✻✻—

140 නිච්චං උබ්බිග්ගහදයා සබ්බලොකවිහෙඨකා,
තස්මා නෙසං වසා නත්ථි කාකානස්මාක ඤාතිනන්ති.

නිච්චං, නිත්‍යයෙන්; උබ්බිග්ග, උබිගුණාවූ; හදයා, සිත් ඇත්තාහු හෙවත් නිත්‍යයෙන් භයප්‍රාප්ත සිත් ඇතියහු; සබ්බලොක, සියලු ලොකයා, විහෙඨකා, වෙහෙසන්නාහු;තස්මා, එහෙයින්; අස්මාකං, අපගේ; ඤාතීනං, නෑවූ; තෙසං කාකානං, ඒකවුඹුවන්ගේ; වසා, බුරුණුතෙල්; නත්ථි, නැති.

**140 කාක ජාතකයයි.**

———

**14 අසම්පදාන වග්ගයයි.**

———

141 න පාපජනසංසෙවී අච්චන්තං සුඛමෙධති,
ගොධාකුලං කකණ්ටාව කලිං පාපෙති අත්තානන්ති.

පාපජන, ලාමකජනයා; සංසෙවී, සෙවිනා දන; අච්චන්තං, අත්‍යන්තයෙන්; සුඛං, සුව;න එධති,නොවඩා; (නොලැබෙයි සේයි.) කුමක්මෙන්දයත්? ගොධාකුලං, ගොධාකුලයේ; කකණ්ටාව, කකණ්ටකයා මෙන්; අත්තානං, තමා;කලිං, විනාසයට: පාපෙති, පමුණුවා-යම්සේ ලාමකවූ කකණ්ටකයා තමා හා පුරුදුවූ ගොධාකුල විනාසයට පැමිණවීද එපරිද්දෙන් පාපජනද තමා හා එක්වූවනු විනාසයට පමුණුවන්නේය යනු අභිප්‍රායයි.

141 ගොධ ජාතකයයි.

(———)

142 එතං හි තෙ දුරාජානං යං සෙසි මතසායිකං,
යස්ස තෙ කඩ්ඪමානස්ස හත්ථා දණ්ඩො න මුච්චතීති.

යං, යම් කාරණයකින්; මතසායිකං, මළහුමෙන් හෝනෙහිද; තෙ, තාගේ; එතං, ඔම්කාරණය; දුරාජානං, දුරවබොධය; කඩ්ඪමානස්ස, දඬුකෙළවර ගෙන අදනා ලබන්නාවූ; යස්ස තෙ, යම් බඳුවූ තාගේ; හත්ථා, හස්තයෙන්; දණ්ඩො, මුගුරු දණ්ඩ; න මුච්චති, නොමිදේද; එහෙයින් මළාක්හු මෙන් නොන්නාවූ තාගේ කාරණය නොදන හැක්කැයි කියා මර නොදී ගිය.

**142 සිගාල ජාතකයයි.**

———

143 ලසී ච තෙ නිපඵලිතා මත්‍ථකො ච විදාලිතො,
සබ්බා තෙ ඵාසුකා භග්ගා අජ්ජ ඛො ත්‍වං විරොචසීති.

තෙ, තාගේ; ලසී ච, හිස්මුල්ද, නිපඵලිතා, නික්මිණ; මත්‍ථකො ච, මස්තකයද; විදාලිතො, පළතලද; තෙ, තාගේ; සබ්බා, සියලු, ඵාසුකා, පරාළපතු; භග්ගා, භග්නය; අජ්ජ ඛො, අද වනාහි; ත්‍වං, තෝ; විරොචසි, බබළන්නෙහිසි.

### 143 විරොචන ජාතකයයි.

—※—

144 බහුම්පෙතං අසබ්භි ජාතවෙද
යන්තං වාලධිනාභි පූජයාම,
මංසාරහස්ස නත්‍ථජ්ජ මංසං
නඞ්ගුට්ඨම්පි භවා පටිග්ගණ්හාතූති.

අසබ්භි, අසත්පුරුෂය; ජාතවෙද, වහ්නිදෙවතාව; යං, යම් බඳුවූ; තං, තා; වාලධිනා, වාලධියෙන්; අභිපූජයාම, පුදමෝද; එතං අපි, මෙපමණෙකුදු; බහුං, බෙහෙව; මංසාරහස්ස, මාංසානුභවයට සුදුසුවූ තට; අජ්ජ, අද; මංසං, මාංස; නත්‍ථි, නැත; භවං, පින්වත; නඞ්ගුට්ඨම්පි, නඟුටද; පටිග්ගණ්හාතු, පිළිගනීවා-තොපසතු දෙන පවාරකයන නොහෙන තොපසේ හීනජාතීන්ට වාලධිපමණකුත් බෙහෙව එතකුදු පිළිගනුවයි ගිනිදෙවියාට නිත්දා බිණූ.

### 144 නඞ්ගුට්ඨ ජාතකයයි.

!———⌣———!

145 න ත්‍වං රාධ විජානාසි අඩ්ඪරත්තෙ අනාගතෙ,
අබ්‍යායතං විලපසි විරත්තා කොසියායනෙ ති.

රාධ, රාධය; ත්‍වං, තෝ, අඩ්ඪරත්තෙ, අඩ්රාත්‍රය; අනාගතෙ, නො ආකල්හි; න විජානාසි, (මෙතෙක්දෙන අවුයයි) නොදනි; අබ්‍යායතං, අව්‍යක්තාවූ විලාපයක්; විලපසි, බෙණෙයි; කොසියායනෙ, බ්‍රාහමණයා කෙරෙහි; විරත්තා. (බැමිණි) විරක්තය, (නොඇලුණි)-රාධය තෝ පෙරයම මෙතෙක්දෙන අවුය මධ්‍යරාත්‍රයෙහි මෙතෙක්

දෙන එහි නොදන සොරා එන පුරුෂයන් වළකම්හයි අව්‍යක්ත කොට නොහඬා වැදහිඳයි කීය, යනු අභිප්‍රායයි.

### 145 රාධ ජාතකයයි.

———(✻)———

146 අපි නු හනුකා සන්තා මුඛඤ්ච පරිසුස්සති,
ඕරමාම න පාරෙම පූරතෙව මහොදධී.

අපිනු, සී ලෙස්, (අපි නො) අපගේ වනාහි; හනුකා, හනුකයෝ; (දෙහනුවෝ) සන්තා, සාන්තයහ; මුඛඤ්ච, මුඛයද; පරිසුස්සති, වියළෙයි; ඕරමාම, වියළීකරම්හයි දිය අඳුම්හ; න පාරෙම, වියළීකොට නිමවා වකට නොගාහෙම්හ; මහොදධි, සමුද්‍රය; පූරතෙව, ඉසිපමණින් පිරේමැයි.

### 146 කාක ජාතකයයි.

⌒✻—)◦(—✻⌒

147 නයිදං දුක්ඛං අදුං දුක්ඛං යං මං තුදති වායසො,
යං සාමා පුප්ඵරත්තෙන කත්තිකං නානුභොස්සති.

වායසො, කවුඩු; මං, මා; තුදති, විදින්නේය යන; යං, යමක් ඇද්ද; ඉදං, මේ; දුක්ඛං න, දුක් නොවෙයි; සාමා, සාමලඟී; පුප්ඵරත්තෙන පුෂ්පරක්තයෙන් හෙවත් වතුක්මලින් රැඳූවස්ත්‍රයෙන් යුක්තාවී; කත්තිකං, කාර්තිකවාරොත්සවය; නානුභොස්සති, අනුභව නොකෙරෙයි යන; යං, යමක් ඇද්ද; අදුං, ඒ; දුක්ඛං, දුක්-හුල ඇවිනී සිනී යම් දුකෙක් ඇද්ද කාකතුණ්ඩයෙන් විදිනාලද යම් දුකෙක් ඇද්ද ඒ සියලු දුකට වඩා සාමලඟිය රක්තපටධාරීව නොකෙළේද ඒදුඃඛය බලවත්තැයි කියා හඟිම් යනු අභිප්‍රායයි.

### 147 පුප්ඵරත්ත ජාතකයයි.

———:✻:———

148 නාහං පුනං නච පුනං නචාපි අපුනප්පුනං,
හත්ථිබොන්දිං පවෙක්ඛාමි තථාහි භයතජ්ජිතොති.

අහං, මම; පුන, නැවත; නච පුනං, නවද නැවත; නචාපි අපුනප්පුනං, නවද නැවත නැවත; හත්ථිබොන්දිං, හස්තිශරීරයට; න ප

වෙක්ඛාමි, ප්‍රවිෂ්ට වන්නෙමි; අපුනප්පුනං, කී තැන අකාර නිපාතයි; තථා හි, එසේමැයි; භයතජ්ජිතො, භයින් තැතිගත්තෙම් වීමි.

### 148 සිගාල ජාතකයයි.

149 එකපණ්ණො අයං රුක්ඛො න භූම්‍යා චතුරඞ්ගුලො,
ඵලෙන විසකප්පෙන මහායං කිං භවිස්සතීති.

අයං රුක්ඛො. මේ වෘක්ෂය; එකපණ්ණො, (උභය පාර්ශ්වයෙහි) එක එක පත් ඇත්තේය; භූම්‍යා, භූමියෙන්; න චතුරඞ්ගුලො, සතරඟුලක් පමණය වැඩියේත් නොවෙයි; විසකප්පෙන, හලාහලවිෂසදෘශවූ; ඵලෙන, පත්‍රයෙන් යුක්තවූ;අයං,මේ තෙම; මහා, මහත්ව වැඩියේ; කිං භවිස්සති, මතු කුමක් වේදෝ.

### 149 එකපණ්ණ ජාතකයයි.

150 අසන්තං යො පග්ගණ්හාති අසන්තං චූපසෙවති,
තමෙව ඝාසං කුරුතෙ ව්‍යග්ඝො සඤ්ජීවකො යථාති.

යො, යමෙක්; අසන්තං, අසත්පුරුෂයාව; පග්ගණ්හාති, ප්‍රශංසා කෙරේද; අසන්තං, අසත්පුරුෂයා; උපසෙවති වා; සෙවුනේ හෝවේද; තමෙව, ඔහුම; ඝාසං;ග්‍රාසය, කුරුතෙ, කරන්නේයි; කුමක් මෙන්දයත්?ව්‍යග්ඝො සඤ්ජීවකො යථා, ව්‍යාඝ්‍රසඤ්ජීව දෙදෙනා මෙනි-යම්සේ ව්‍යාඝ්‍ර තම් මිය නොත්තු මන්ත්‍ර මතුව නඟාසිටිවූ සඤ්ජීව නම් තැනැත්තනු කා මැරීද එපරිද්දෙන් දුර්ජනයා අනුග්‍රහලද්ද හේ නොසලකා විනාශකරන්නේයයි සේයි.

### 150 සඤ්ජීව ජාතකයයි.

### 15 කකණ්ටක වර්ගයයි.

### එකනිපාතය නිමවන ලදී.

151 දළ්හං දළ්හස්ස ඛිපති මල්ලිකො මුදුනා මුදුං,
සාධුම්පි සාධුනා ජෙති අසාධුම්පි අසාධුනා,
එතාදිසො අයං රාජා මග්ගා උය්‍යාහි සාරථි.

මල්ලිකො, මල්ලිකනම් රජ; දළ්හස්ස, දෘඪසාහසව; දළ්හං, දෘඪප්‍රහාරාදිය; ඛිපති, දෙයි; මුදුං, මෘදුවූ පුද්ගලයා; මුදුනා, මෘදුබැවින්; ජෙති, දිනන්නේය; සාධුම්පි, සාධුවූ පුරුෂයා; සාධුනා, සාධුබැවින්; ජෙති, දිනන්නේය; අසාධුම්පි, අසාධුවූ පුරුෂයාද; අසාධුනා; අසාධුබැවින්; ජෙති, දිනන්නේය; අයං රාජා, මේරජ; එතාදිසො, මෙබඳුගුණ ඇත්තේය; සාරථි, රථාචාර්‍ය්‍යය; මග්ගා, මගින්; උය්‍යාහි, පහව-මල්ලිකනම් රජහුගේ රථාචාර්‍ය්‍යයා බාරානසී රජහුගේ රථපදනාවුට මෙසේ කී.

152 අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ,
ජිනෙ කදරියං දානෙන සච්චෙන අලිකවාදිනං,
එතාදිසො අයං රාජා මග්ගා උය්‍යාහි සාරථීති.

කොධං, ක්‍රොධීහු; අක්කොධෙන, අක්‍රොධයෙන්; ජිනෙ, දිනන්නේය; අසාධුං, අසාධු පුද්ගලයා; සාධුනා, සාධුබැවින්; ජිනෙ, දිනන්නේය; කදරියං, තදමසුරා; දානෙන, දීමෙන්; ජිනෙ, දිනන්නේය අලිකවාදිනං, මෘෂාවාදීහු; සච්චෙන, සබවසින්;(ජිනෙ, දිනන්නේය) අයං රාජා, මේරජ; එතාදිසො, මෙබඳුගුණ විශෙෂ ඇත්තේය; සාරථි, සාරථිය; මග්ගා, මාර්ගයෙන්; උය්‍යාහි, පහව-මෙසේ බාරානසී රජහුගේ රථාචාර්‍ය්‍යයා මල්ලිකනම් රජහුගේ රථපදනාවුට නියොග කෙළේ.

151 රාජොවාද ජාතකයයි.

———:0:———

153 අසමෙක්ඛිතකම්මන්තං තුරිතාභිනිපාතිනං,
සානි කම්මානි තප්පෙන්ති උණ්හංවජ්ඣොහිතං මුඛෙ.

අසමෙක්ඛිතකම්මන්තං, මනාකොට පරීක්ෂානොකොට කරන ලද කර්මාන්ත ඇති; තුරිතාභිනිපාතිනං, සිතූ කටයුත්තෙහි නොවිචාරා වහා පටන්ගන්නා තැනැත්තහු; මුඛෙ, මුඛයෙහි; අජ්ඣොහිතං, තබනලද; උණ්හංව, උෂ්ණභොජනයක් මෙන්; සානි කම්මානි, ස්වකීය කර්මාන්තයෝ, තප්පෙන්ති, තවත්.

154 සීහො ච සීහනාදෙන දද්දරං අභිනාදයී,
සුත්වා සීහස්ස නිග්ඝොසං සිගාලො දද්දරෙ වසං,
භීතො සන්තාසමාපාදි හදයඤ්චස්ස අප්ඵලීති,

සීහො ච, සිංහයාද; සීහනාදෙන, සිංහනාදයෙන්; දද්දරං, රජතපර්වතය; අභිනාදයි, එකනාදකෙළේ; සිගාලො, ශෘගාලතෙම; දද්දරෙ, සඵටික මිශ්‍රවූ රජතපර්වතයෙහි; වසං, වසන්නේ; සීහස්ස, සිංහයාගේ; නිග්ඝොසං, නිර්ඝොෂය; සුත්වා, අසා; භීතො, (මරණභියෙන්) බියපත්වූයේ, සන්තාසං; චිත්තත්‍රාසයට; ආපාදි, පැමිණියේය; අස්ස, ඔහුගේ; හදයඤ්ච, හෘදයද; අප්ඵලි, පැලෙනලදී—තෘණසිංහය පාණ්ඩුසිංහය කෘෂ්ණසිංහය කෙශරසිංහය යන සතර පක්ෂයෙහි සිංහයන් අතුරෙන් මෙතැන්හි හස්තපාදරක්ත කෙශරසිංහයා ගන්නා ලදී.

## 152 සිගාල ජාතකයි.

———:0:———

155 චතුප්පදෙ අහං සම්ම ත්වම්පි සම්ම චතුප්පදො,
එහි සීහ නිවත්තස්සු කිංනු භීතො පලායසි.

සම්ම, සබඳ; අහං, මම; චතුප්පදෙ, චතුෂ්පාදයෙමි; සම්ම, යහළුව; ත්වම්පි, තෝද; චතුප්පදො, චතුෂ්පාදයෙහි; සීහ, සිංහය; එහි, මෙසේ එ; නිවත්තස්සු, නවතු; භීතො, බියපත්වූයෙහි; කිංනු, කුමකට; පලායසි, පලායෙහිද.

156 අසුචි පූතිලොමොසි දුග්ගන්ධො වාසි සූකර,
සචෙ යුජ්ඣිතුකාමොසි ජයං සම්ම දදාමි තෙ.

අසුචි, ශුචිනොවූ; පූති, කුණුවූ; ලොමොසි, රොම ඇත්තෙහි වී; දුග්ගන්ධො, දුර්ගන්ධ; වාසි, හමන්නෙහි; සූකර, ශූකරය; සචෙ, ඉදින්, යුජ්ඣිතුකාමොසි, මා හා යුද්ධකරනු කැමැත්තෙහිනම්; සම්ම, සගළ; තෙ, තට· ජයං, ජය; දදාමි, දෙමි.

## 153 සූකර ජාතකයි.

———*|*———

157 ඉච්ඡුරගානං පවරො පවිඨො
සෙලස්ස වණ්ණෙන පමොක්ඛමිච්ඡං
බ්‍රහ්මං ච වණ්ණං අපචායමානො
බුභුක්ඛිතො නො විතරාමි භොත්තුං.

පමොක්ඛං, මොක්ෂයක්; ඉච්ඡං, කැමැත්තාවූ; උරගානං පවරො, සර්පරාජතෙම; සෙලස්ස වණ්ණෙන, ශෛලවර්ණයෙන් හෙවත් මාණික්‍යස්කන්ධයක්මෙන්; ඉධ, මේවල්කලාවට; පවිඨො, ප්‍රවිෂ්ටවනෙ; බ්‍රහ්මං, ශ්‍රෙෂ්ඨවූ; වණ්ණං ච, වර්ණියද; අපචායමානො, පූජාකරන්නෙම්, බුභුක්ඛිතො, කනුකැමැත්තෙමුද; භොත්තුං, කන්ට; නො විතරාමි, නොපොහොසකිමි.

158 සො බ්‍රහ්මගුත්තො චිරමෙව ජීව
දිබ්බා ච තෙ පාතු භවන්තු භක්ඛා
යො බ්‍රහ්මවණ්ණං අපචායමානො
බුභුක්ඛිතො නො විතරාසි භොත්තුන්ති.

බ්‍රහ්ම, උත්තමවූ, වණ්ණං, වර්ණය; අපචායමානො, පුදන්නාවූ; බුභුක්ඛිතො, කනුකැමතිවූද; යො, යමෙක්; භොත්තුං, අනුභව කරන්නට; නො විතරාසි, නොපොහොසත්ද; (සො, හේතෝ;) බ්‍රහ්මගුත්තො, බ්‍රහ්මයාවිසින්රක්ෂාකරනලද්දෙහි; චිරමෙව, බොහෝකලක්ම; ජීව, ජීවත් වා; තෙ, තට; දිබ්බා, දිව්‍යවූ, භක්ඛා, භක්ෂයෝ හෙවත් දිව්‍යභොජනයෝ; පාතුභවන්තු, ප්‍රාදුර්භූතවෙත්වා; (පහළවෙත්වා.)

### 154 උරග ජාතකයයි.

———ඃ◦ඃ———

159 ජීව වස්සසතං ගග්ග අපරානි ච වීසතිං,
මා මං පිසාචා ඛාදන්තු ජීව ත්වං සරදොසතං.

ගග්ග, ගර්ගය; වස්සසතං, වර්ෂශතයක්, ජීව, ජීවත්වා; අපරානිච වීසතිං, අනික් විසිහවුරුද්දක්ද, ජීව, ජීවත්වා; මං, මා; පිසාචා, පිසාචයෝ; මා ඛාදන්තු, නහමක්කත්වා, ත්වං, තෝ; සරදොසතං, ශරත්ශතයක් හෙවත් අවුරුදුසියයක්; ජීව, ජීවත්වා-ශරත් සෘතුසියයක් ගණන ලද්දේ හවුරුදු සියයෙක්වේනුයි සියක් හවුරුදුහෙහ සමගීම විස්ස හා හවුරුදු එකසිය විස්සක් ජීවත්වයි කීයි.

160 ත්වම්පි වස්ස සතං ජීව අපරානි ච වීසතිං,
විසං පිසාචා ඛාදන්තු ජීව ත්වං සරදොසතන්ති.

ඛුම්පි, තෝද; වස්සසතං, අවුරුදුසියයක්; ජීව, ජීවත්වා; අපර, නි ච, අනිස්ද; වීසතිං, අවුරුදුවිස්සක්; 'ජීව, ජීවත්වා;) පිසාචා; පි සාචයෝ; විසං, හලාහලවිෂය; ඛාදන්තු, කත්වයි; තං, තෝ; සර දෙසතං, අවුරුදු සියයක්, ජීව, ජීවත්වා.

### 155 ගග්ග ජාතකයයි.

——‡——

161 අලීනචිත්තං නිස්සාය පහට්ඨා මහතී චමූ,
කොසලං සේනාසන්තුට්ඨං ජීවගාහං අගාහයි.

අලීනචිත්තං, අලීනචිත්තකුමාරයා; නිස්සාය, ආශ්‍රයකොට; පහ ට්ඨා, ප්‍රහර්ෂිතවූ; මහතී, මහත්වූ; චමූ, සේනාතොම; සේනා, සිව්කීයවූ රාජසේනාවෙන්; අසන්තුට්ඨං, අසන්තුෂ්ටවූ; කොසලං, කොශලරාජයා; ජීවගාහං, ජීවග්‍රාහකොට; අගාහයි, ගැන්වූද.

162 එවං නිස්සයසම්පන්නො භික්ඛු ආරද්ධවීරියො,
භාවයං කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා
පාපුණෙ අනුපුබ්බෙන සබ්බසංයොජනක්ඛයන්ති.

එවං, මේ අලීනචිත්තකුමාරයා ආශ්‍රයකළ සේනාව මෙන්; නි ස්සයසම්පන්නො, ආශ්‍රයසම්පන්නවූ; යොගක්ඛෙමස්ස, චතුර්විධයොග යාගේ ක්ෂේමයට හෙවත් නිර්වාණයට; පත්තියා, පැමිණෙන පිණිස; කුසලං, නිරාමයවූ; (ධම්මං, සප්තත්‍රිංශත් බොධපාක්ෂික ) ධර්මයන්; භාවයං, වඩන්නාවූ, ආරද්ධවීරියො, වඩනලදවීර්‍ය්‍යඇති; භික්ඛු, මහ ණතෙම; අනුපුබ්බෙන, අනුක්‍රමයෙන්; සබ්බ, සියලු; සංයොජන, සංයොජන යන්ගේ; ඛයං, ක්ෂයට; පාපුණෙ, පැමිණෙන්නේයි.

### 156 අලීනචිත්ත ජාතකයයි.

——:o;——

163 යෙන කාමං පනාමෙති ධම්මො බලවතං මිගී,
උන්නදන්ති විජානාහි ජාතං සරණතො භයං.

මිගී, මෘගරාජය; උන්නදන්ති, උන්නතවූදළ ඇතියක්; (උන්නා තදන්තී" කියාද පාඨයි) යෙන, ඊශ්වරතෙම යම් දිග්භාගයකින් සෙ වනයා පහකරනු [illegible] ද ඒ දිශාභාගයෙන්; කාමං, එකාන්තයෙන්; පනාමෙති, (සමන් තැනැත්තනු) පහකරන්නේය; බලවතං, බලවතුන් ගේ; ධම්මො, සභාව ධර්මය; විජානාහි, තෝ එසෙවු නිසීතෙනි සිටින

වුන්ගේ ධර්මයකි දන්න, නොහොත්; මිගී, සිංහධේනු; උන්නාදනතී, උන්නතවූ නාදඇත්තී; යෙන, යම් කාරණයකින්; තාමං, එකාන්තයෙන්; පනමති, පවත්වාද හෙවත් හිංසාකෙරේද; ජනාහි, ඒපරිද්දි තීද දනු; සරණතො, සරණව සිටි තොප කෙරෙන්; භයං, භය; ජාතං, උපනි—යම් හෙයකින් සරණවසිටි තොප කෙරෙන් භය උපන්ද එහෙයින් යම්හ යනු අභිප්‍රායයි.

164 අපි චෙ දුබ්බලො මිත්තො මිත්තධම්මෙසු තිට්ඨති,
සො ඤාතකො ච බන්ධු ච සො මිත්තො සො ච මෙ සඛා
දාඨිනි මාති මඤ්ඤිත්ථො සිගාලො මම පාණදොති.

දුබ්බලොඅපි චෙ,ඉදින් දුර්වලදවූ; මිත්තො, මිත්‍රතෙම; මිත්තධම්මෙසු, මිත්‍රධර්මයෙහි; අපි තිට්ඨති, ඉදින්සිටියේවීනම්; සො, හෙතෙම; ඤාතකො ච, නෑනමුත්වෙයි; බන්ධු ච, බන්ධුනමුත්වෙයි; සො, හෙතෙම; මිත්තො, මිත්‍ර නමුත්වෙයි; සො, හෙතෙම; මෙ, මාගේ; සඛා ච, යහළු නමුත්වේ; දාඨිනි,සිංහිය; මා අතිමඤ්ඤිත්ථො, තහමක් ඉක්මසිත හෙවත් අවඥා නොකර; සිගාලො, ශෘගාල තෙම; මම, මාගේ; පාණදො, ප්‍රාණදුන්මිත්‍රයායි.

## 157 ගුණ ජාතකයයි.

165 නයිදං විසමසීලෙන සොනෙන සුහනුස්සහ,
සුහනූපි තාදිසොයෙව යො සොනස්ස සගොචරො.

සුහනු, සුහනුනම් අශ්වතෙම; සොනෙන සහ, සොනනම් අශ්වයා සමග යම්ප්‍රෙමයක් කෙරේද; ඉදං, මේප්‍රෙමය; න විසමසීලෙන; තමාගේ විෂමස්වභාවයෙන් නොවේ;(සමවූ ස්වරූපයෙන්මැයි) යො, යම්සුහනුනම් අශ්වයෙක්; සොනස්ස, සොනනම් අශ්වයා හා; සගොචරො, සමානගොචරඇත්තේද; සුහනූපි, සුහනුනම් අශ්වයාද, තාදිසො එව, එබඳුමැයි.

166 පක්ඛන්දිනා පගබ්භෙන නිච්චං සන්දානඛාදිනා,
සමෙති පාපං පාපෙන සමෙති අසතා අසන්ති.

පක්ඛන්දිනා, අශ්වයන් මත්තට දිවනස්වභාවයෙන්; පගබ්භෙන, කායප්‍රගල්භසංඛ්‍යාත සීලභාවයෙන් යුක්තවූ; නිච්චං, සතතයෙන්; සන්දානඛාදිනා, රජ්ජුව කනස්වරූපඇති; පාපෙන, පාපස්වරූපයාහා; පාපං, දුශ්ශීලතුරඟ; සමෙති, සම්වන්නේය; අසනං, අසත්පුරුෂයා; අසතා, අනාචාරයෙන් යුක්තයා හා සමඟ; සමෙති, සමවන්නේයි.

## 158 සුහනු ජාතකයයි.

167 උදෙතයං චක්ඛුමා එකරාජා,
හරිස්සවණ්ණො පඨවිප්පභාසො,
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරෙමු දිවසං.

චක්ඛුමා, ( චක්‍රවාලාන්තරාලයෙහි අන්ධකාරවිනාශය කොට චක්‍ෂුඃප්‍රතිලාභය කිරීමෙන් ) චක්‍ෂුෂ්මත්වූ; එකරාජා, සකල චක්‍රවාලාන්තරාලයෙහි ආලොකස්ඵරණය කරන්නාවූන් කෙරෙන් ශ්‍රෙෂ්ඨ හෙයින් එකරාජවූ; හරිස්සවණ්ණො, ස්වර්ණවර්ණවූ; පඨවිප්පභාසො, විෂමමහීමණ්ඩලය බබුළුවානුයි පඨවිප්පභාස නම්වූ; අයං, මෙතෙම; උදෙති, ප්‍රාචීනදිග්භාගයෙන් නැගෙයි සේයි; තං, (තස්මා) එහෙයින්; හරිස්සවණ්ණං, ස්වර්ණයට බඳුපැහැඇති; පඨවිප්පභාසං, පොළොව බබුළුවන්නාවූ; තං, තට, නමස්සාමි, නමස්කාරකෙරෙමි; තයා, තාවිසින්; අජ්ජ, අද; ගුත්තා; ගුප්තාවූවමු හෙවත් රක්‍ෂාකරන ලද්දමු; දිවසං, දවස්; විහරෙමු, සතර ඉරියව්වෙන් වසමු.

168 යෙ බ්‍රාහ්මණා වෙදගූ සබ්බධම්මෙ,
තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු,
නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා,
නමො විමුත්තානං නමො විමුත්තියා,
ඉමං සො පරිත්තං කත්වා මොරො චරති එසනා.

වෙදගූ සබ්බධම්මෙ, සියලු ස්කන්ධධාත්වායතන ධර්මයන් ස්වකීය ඥානයෙන් දැන ප්‍රඥාව ප්‍රකටකොට ගියෝනුයි කියාද නොහොත් ශ්‍රී බොධිමූලයෙහි ත්‍රිවිධමාරයන්ගේ මස්තකමර්දනය කොට දසසහශ්‍රී ලොකධාතුව එකඝොෂණය කොට සර්වඥපදප්‍රාප්තව සංසාරාතික්‍රමණයකොට ගියහෙයින් හෝ වෙදගූනම්වූ; යෙ බ්‍රාහ්මණා, යම්ප්‍රහීණපාපඇති ශුද්ධබ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද; තෙ, ඔහු; මෙ, මාගේ; නමො, නමස්කාරය පිළිගනිත්වා; නොහොත්; තෙ, ඔවුන්ට; මෙ, මාගේ; නමො, නමස්කාරයතෙම; (වේවා) ඒනමස්කාර කරනලද බුද්ධාදීහුද; මං, මා; පාලයන්තු, රක්‍ෂාකෙරෙත්වා; බුද්ධානං, අතීතබුද්ධයන්ට, නමත්ථු, නමස්කාරවේවා; බොධියා, ඒබුද්ධාදීන්ගේ චතුර්මාර්ගඥාන ඵලඥානසංඛ්‍යාත බොධියටද; නමත්ථු, නමස්කාරවේවා; විමුත්තානං, අර්හත්ඵලවිමුක්තීන් විමුක්තයන්ටද; නමො, නමස්කාරවේවා; විමුත්තියා, තදඞ්ගවිමුක්තිය විෂ්කම්භණවිමුක්තිය සමුච්ඡෙදවිමුක්තිය ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිමුක්තිය නිස්සරණවිමුක්තිය යනමේ පංචවිමුක්ති

යටද, නමො අත්‍ථු, නමස්කාරවේවා; මෙසේ පවත්නාවූ ඒ මයූරරාජ්‍යයාගේ ප්‍රවෘත්තිය ප්‍රකාශකරන පිණිස සර්‍වඥයෝ "ඉමං සො පරිත්තං,, යනාදිය වදාළසේක; සො, හේ; මොරො, මයූරයා; ඉමං පරිත්තං, මේ පරිත්‍රාණය; කත්වා, කොට; එසනා, එෂණය පිණිස; චරති, ගොචරභූමියෙහි හැසිරේ.

### 159 මොර ජාතකයී

—‡0‡0✻0‡0‡—

169 එවමෙව නූන රාජානං වෙදෙහං මිථිලග්ගහං,
අස්සා වහන්ති ආජඤ්ඤා යථා හංසා විනීලකං.

ආජඤ්ඤා, කාරණාකාරණ දත්නාවූ; හංසා, හංසයෝ; යථා, යම්සේ; විනීලකං, විනීලකවූ මා; වහන්ති, උසුලත්ද; එවමෙව, එපරිද්දෙන්ම; වෙදෙහං, විදෙහනම්වූ රාජ්‍යයට ඉසුරුවූහෙයින් වෛදෙහනම්වූ; මිථිලග්ගහං, මියුලුනුවර ගෘහපරිග්‍රහකොට වසන්නාවූ; රාජානං, රජුන්ගේ; අස්සා, අශ්වයෝ; වහන්ති නූන, උසුලන්නාහයි හඟිමි; නොහොත්, නූන, ඒකාන්තයෙන්, වහන්ති, උසුලත්.

170 විනීල දුග්ගං භජසි අභූමිං තාත සෙවසි,
ගාමන්තිකානි සෙවස්සු එතං මාතාලයං තවාති.

විනීල, විනීලය; දුග්ගං, පර්වතදුර්ගය; භජසි, සේවනෙහි; තාත, පුත; අභූමිං; තට භූමිනොවූ පර්වතවිෂමස්ථානය; සෙවසි; සේවනෙහි; ගාමන්තිකානි, ග්‍රාමප්‍රාන්තවූ උක්කාරස්ථානයෝද ආමකශ්මශානයද යන ග්‍රාමාන්තිකයෝ. තව, තාගේ; මාතු, මවට; ආලයං, වාසස්ථානයහ; එතං, මේ තාගේ මවට ආලයවූ වාසස්ථානය; සෙවස්සු; සේවා කර-ගොස් වසයි යනුභාවයි.

### 160 විනීල ජාතකයි.

——:‡:——

### 1. දළ්හ වග්ගයයි.

———

171 න සන්ථවං කාපුරිසෙන කයිරා
අරියො අනරියෙන පජානමත්ථං
චිරානුවුත්ථොපි කරොති පාපං
ගජො යථා ඉන්දසමානගොත්තං.

අසතං, අසත්පුරුෂයා; ජානං, දන්නාවූ; අරියො, ආචාරආයුෂ්ය ලිඞ්ග ආයුෂ්ය දර්ශනආයුෂ්ය ප්‍රතිවෙධආයුෂ්ය යන චතුර්විධ ආයුෂ්යන් අතුරෙන් ආචාර ආයුෂ්වූ පුද්ගලතෙම; අනරියෙන, නිර්ලජ්ජීවූ; කාපුරිසෙන, කුත්සිතවූ ක්‍රොධීපුද්ගලයා හා; සන්ථවං, තෘෂ්ණාසංස්තව යක්වේවයි මිත්‍රසංස්තවයක්වේවයි; න කයිරා, නොකරන්නේයි; කුමක් හෙයින්දයත්? චිරං, බොහෝකලක්; අනුවුත්ථොපි, එක්වවිසූයේද ඒ මිත්‍රසංස්තවය නොසලකා; පාපං, පාපක්‍රියාවක්; කරොති, කරන්නේය, කුමක් මෙන්දයත්? ඉන්දසමානගොත්තං, ඉන්‍ද්‍රසමාන ගොත්‍රනම් තපස්වීනු කල මිත්‍රසංස්තවය නොසලකා මැරූ; ගජෙ සඵා, හස්තීහු මෙනි.

172 යථෙව ජඤ්ඤා සදිසො මමන්ති
සීලෙන පඤ්ඤාය සුතෙනචාපි,
තෙනෙව මෙත්තිං කයිරාථ සද්ධිං
සුඛාවහො සප්පුරිසෙන සඞ්ගමො.

සීලෙන, ශීලයෙන්ද; පඤ්ඤාය, ප්‍රඥායෙන්ද; සුතෙනචාපි, ශ්‍රැතයෙන්දැයි; මමං, මාහා; සදිසො ඉති, සදෘශයයි; යථෙව, යමක්හු වනාහි; ජඤ්ඤා, දන්නේද; තෙනෙව සද්ධිං, ඔහුහා සමග; මෙත්තිං, මිත්‍රභාවයක්; කයිරාථ, කරන්නේය; කුමක් හෙයින්දයත්? සප්පුරිසෙන, කෘතඥකෘතවෙදිතාදි ගුණයෙන් යුක්තවූ පුරුෂයා හා; සඞ්ගමො, සංගමය; සුඛාවහො, සුවඵලවන්නෙයි.

## 161 ඉන්දසමානගොත්ත ජාතකයයි.

———:✱:———

173 න සන්ථවස්මා පරමත්ථි පාපියො
යො සන්ථවො කාපුරිසෙන හොති,
සන්තප්පිතො සප්පිනා පායසෙන
කිච්ඡා කතං පණ්ණකුටිං අදය්හි.

කාපුරිසෙන, කුත්සිත පුරුෂයාහා සමග; යො සන්ථවො, යම් සංස්තවයෙක්; හොති, වේද; සන්ථවස්මා, ඒ තෘෂ්ණා සංස්තවය මිත්‍ර සංස්තව යන ද්විවිධ සංස්තවයට වඩා; පරං, අධිකවූ; පාපියො, ලාමකයෙක්; න අත්ථි, නොමැති; කුමක් හෙයින්දයත්? සප්පිනා, සර්පිෂෙන්ද; පායසෙන, ක්ෂීරභක්තයෙන්ද; සන්තප්පිතො, සන්තර්පණය කරනලද වහ්නිදෙවතාවා; කිච්ඡා කතං, කෘච්ඡ්‍රයෙන් කරනලද; පණ්ණකුටිං, පර්ණකුටිය; (පනින්සෙවිහැල) අදය්හි, දැවීද එසේ හෙයිනි.

174 න සන්ථවස්මා පරමත්ථි සෙය්‍යො
යො සන්ථවො සප්පුරිසෙන හොති,
සීහස්ස ව්‍යග්ඝස්ස ච දීපිනො ච
සාමා මුඛං ලෙහති සන්ථවෙනාති.

සප්පුරිසෙන, සත්පුරුෂයා හා; යො සන්ථවො, යම් සංස්තවයෙක්; හොති, වේද; සන්ථවස්මා, ඒ මිත්‍ර සංස්තවයට වඩා; පරං, අධිකවූ; සෙය්‍යො, ශ්‍රෙෂ්ඨයෙක්; න අත්ථි, නොමැති; කුමක් හෙයින්දයත්? සාමා, සාමවූ මෘගධෙනු; සීහස්ස, සිංහයකුගේද; ව්‍යග්ඝස්ස ච, ව්‍යාඝ්‍ර යකුගේද; දීපිනො ච, දිවියකුගේද; මුඛං, මුහුණ; සන්ථවෙන, මිත්‍ර සංස්තවය හෙතුකොටගෙන; ලෙහති, ලෙහනය කරන්නී-මෙවැනි ප්‍රබල ප්‍රතිපක්ෂයෝ පොවා තමන් මුහුණ ලෝනමෘගධෙනුවට තමන් හා කළ සංස්තවය හෙතුකොටගෙන කිසිහිංසාවක් නොකෙරෙති මෙපරිද්දෙන් උත්තමයන් හා කළ මිත්‍රසංස්තවයම අත්‍යුත්තමය යනු අභිප්‍රායයි.

## 162 සන්ථව ජාතකයසිං

175 කාළා මිගා සෙතදන්තා තව ඉමෙ
පරොසතං හෙම්ජාලාභි සඤ්ඡන්නා,
තෙ තෙ දදාමීති සුසීම බ්‍රෑසි
අනුස්සරං පෙත්තිපිතාමහානං.

සෙතදන්තා, ශුභ්‍රවූ දළඇති; හෙමජාලාභි, ස්වර්ණජාලයෙන්; සඤ්ඡන්නා, ගැවසීගත්; පරොසතං, ශතයකටද අධිකවූ; තව, තාගේ; ඉමෙ, මොහු; කාළා මිගා, කෘෂ්ණමෘගයන්, තෙ එතෙ, ඒ මේ හස්තීන්; නොහොත්, තෙ, තාසන්තකවූ; එතෙ, මේ හස්තීන්; සුසීම, සුසීමය; පෙත්තිපිතාමහානං, පිතෘපිතාමහයන් සම්බන්ධව; අනුස්සරං, අනුස්මරණය කරන්නෙහි; දදාමීති, දෙමියි; බ්‍රෑසි, කීද.

176 කාළා මිගා සෙතදන්තා මම ඉමෙ
පරොසතං හෙමජාලාභි සඤ්ඡන්නා,
තෙ තෙ දදාමීති වදාමි මාණව
අනුස්සරං පෙත්තිපිතාමහානන්ති.

සෙතදන්තා, සුදුවූ දළඇති; හෙමජාලාභි, රන්දැලින්; සඤ්ඡන්නා, ප්‍රච්ඡන්නවූ; පරොසතං, ශතාධිකවූ; මම, මාගේ; ඉමෙ, මොහු; කාළා මිගා, කෘෂ්ණමෘගයෝ; මාණව, ළදරුව; තෙ එතෙ, ඒ මේ

හස්තීන්, නොහොත්; තෙ, තාගේ; එතෙ, මේහස්තීන්: පෙත්තාපිතා මහානං, පිතුපිතාමහයන් සම්බන්ධව; අනුස්සරං, ස්මරණය කරන් නෙම්; දදාමීති, දෙමියි; වදාමි, කිමි·

## 163 සුසීම ජාතකයයි.

——⁘——

177 යන්නු ගිජ්ඣෝ යොජනසතං කුණපානි අවෙක්ඛති,
කස්මා ජාලඤ්ච පාසඤ්ච ආසජ්ජාපි න බුජ්ඣසි.

යං, යන්නු නිපාතය; නු, යන්නු නාමාර්ථය; ගිජ්ඣෝ, ගිජුනම්; යොජනසතං, යොජනශතයක් අතික්‍රමණයකොට සිටියාදවූ; කුණපානි, කුණපයන්; අවෙක්ඛති, බලයි; කස්මා, කුමක්හෙයින්; ජාලඤ්ච, ජාලයටද; පාසඤ්ච, පාශයටද; ආසජ්ජාපි, පැමිණද; න බුජ්ඣසි, නොදත් සිද.

178 යදා පරාභවෝ හොති පොසො ජීවිතසඞ්ඛයෙ,
අථ ජාලඤ්ච පාසඤ්ච ආසජ්ජාපි න බුජ්ඣතීති.

ජීවිතසඞ්ඛයෙ, ජීවිතශඞ්ඛාවක් පැමිණි; යදා, යම්කලෙක්හි; පරාභවො, විනාශය; හොති, වන්නේද; අථ, එකල්හි; පොසො, සත්‍වතෙම; ජාලඤ්ච, ජාලයටද; පාසඤ්ච, පාශයටද; ආසජ්ජාපි, පැමිණද; න බුජ්ඣති, (ජීවිත විනාශ කාරණය) නොදනී.

## 164 ගිජ්ඣ ජාතකයයි.

——◎✻◎——

179 සඞ්ඛං කත්වා අමිත්තෙන අණ්ඩජෙන ජලාබුජ,
විවරිය දාඨං සයසි කුතො තං භයමාගතං.

ජලාබුජ, ජලාබුජය; අමිත්තෙන, අමිත්‍රවූ; අණ්ඩජෙන, අණ්ඩජයාහා සමග; සඞ්ඛං කත්වාන, මිත්‍රභාවයකොට; දාඨං, දළ; විවරිය, විවෘතකොට; සයසි, හෝනෙහි; තං, තට; භයං, භය; කුතො, කොයින්? ආගතං, ආද—මුගටියන් දලබුවෙන් උපදනා හෙයින් ජලාබුජයයි ආමන්ත්‍රණයකොට සර්පයන් බිජුවටින් උපදනා හෙයින් "අණ්ඩජෙන"යි කීව.

180 සංකෙථෙව අමිත්තස්මිං මිත්තස්මිම්පි න විස්සසෙ,
අභයා භයමුප්පන්නං අපි මූලානි කන්තතීති.

අමිත්තස්මිං, අමිත්‍රයා කෙරෙහිද; සංකෙථෙව, ශඞ්කා කරන්නේ මය; මිත්තස්මිම්පි, මිත්‍රයා කෙරෙහිද; න විස්සසෙ, විශ්වාසය නොකරන්නේය; කුමක් හෙයින්දයත්? අභයා, මොනුෂ්‍යකෙරෙන් භයනෙ

උපදනේයයිනිශ්චයකළමිත්‍රවූ අභයස්ථානයෙන්; උප්පන්නං, උපන්; භයං, භය; මූලානි අපි, මූලයන්ද; ඛනන්ති, කපා හෙවත් සර්වප්‍රකාරයෙන් විනාශය කරන්නේයි.

### 165 නකුල ජාතකයයි.

—*—*—*—

181 උපසාළ්හකනාමානං සහස්සානි චතුද්දස,
අස්මිං පදෙසෙ දඩ්ඪානි නත්ථි ලොකෙ අනාමතං.

උපසාළ්හකනාමානං, උපසාළ්හකනමුත්ගේ; සහස්සානි, සහස්‍රයෝ; චතුද්දස, තුදුස්දෙනෙක්; අස්මිං පදෙසෙ, මේප්‍රදේශයෙහි; දඩ්ඪානි, දවනලදහ; ලොකෙ, මෙලෙව්හි; අනාමතං, අමෘතස්ථානයෙක්; නත්ථි, නැති.

182 යම්හි සච්චඤ්ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො,
එතදරියා සෙවන්ති එතං ලොකෙ අනාමතන්ති.

යම්හි, යම්පුද්ගලයක්හු කෙරෙහි; සච්චං ච, චතුස්සත්‍යවස්තුසංඛ්‍යාත පූර්වභාගසත්‍යඥානයද; ධම්මො ච, ලොකොත්තරධර්මයද; අහිංසා, අවිහිංසාවද; සඤ්ඤමො, ශීලසංයමයද; දමො, ඉන්ද්‍රිය දමනයද යන ධර්මගුණ විශෙෂයෝ ඇද්ද; අරියා, බුද්ධප්‍රත්‍යෙකබුද්ධ බුද්ධශ්‍රාවකය යන ආර්‍ය්‍යයෝ; එතං, මේස්ථානය; සෙවන්ති, සෙවිත්ද; (එළඹෙත්ද)ලොකෙ, ලෙව්හි; එතං,මේගුණප්‍රබන්ධය; අනාමතං, අමෘතභාවය සාධකහෙයින් අමෘතස්ථානනම්,

### 166 උපසාළ්හක ජාතකයයි.

—*—*—*—

183 අභුත්වා භික්ඛසි භික්ඛු න හි භුත්වාන භික්ඛසි,
භුත්වාන භික්ඛු භික්ඛස්සු මා තං කාලො උපච්චගා.

භික්ඛු, මහණ; අභුත්වා, යෞවන අවස්ථාවෙහි කාමානුභව නොකොට; භික්ඛසි, භික්ෂාවෙහි හැසිරෙහි; භුත්වාන, කාමඅනුභවය කොට; භික්ඛසි නහි, භික්ෂාවෙහි හැසිරෙත්නොහි නොවේද කාමාස්වාදයකොට හැසිරිය යුතුයයිසේයි; භික්ඛු, මහණ; භුත්වාන, ළදරු කාලයෙහි පංචකාමඅනුභවයකොට; භික්ඛස්සු, වෘද්ධාවස්ථාවෙහි භික්ෂාවෙහි හැසිර; කාලො, පංචකාමානුභවය කරන්ට සුදුසු යෞවනකාලය; තං, තා; මා උපච්චගා, නහමක් ඉක්මෙව්වා.

184 කාලං වොහං න ජානාමි ඡන්නො කාලො න දිස්සති,
තස්මා අභුත්වා භික්ඛාමි මා මං කාලො උපච්චගාති.

චො, යනු නිපාතය; අහං, මම; කාලං, වජ්ජිතවූ ප්‍රථමාවස්ථාදීවූ කාලය; න ජානාමි, නොදනිමි; කාලො, වයඃකාලය ඍතුකාලයයි වජ්ජිතවූකාලය; ඡන්නො, සැඟවුණේ; න දිස්සති, නොදක්නාලැබෙයි; තස්මා, එසේ හෙයින්; අභුඤ්ජා, කාමානුභවය නොකොට; භික්ඛාමි, භික්ෂාටනය කෙරෙමි; මං, මා; කාලො, තපස්කාලය; මා උපච්චගා, නාහමක් ඉක්මේවා.

### 167 සම්ඞි ජාතකයයි.

---*---

185 සෙනො බලසා පතමානො ලාපං ගොචරඨායිනං,
සහසා අජ්ඣප්පත්තො මරණං තෙනුපාගමි.

බලසා, ශක්තියෙන්; පතමානො, දිවන; සෙනො, උකුසු නොහොත් ශ්‍යෙනවූල්; ගොචරඨායිනං, ගොචරයෙහි සිටියාවූ; ලාපං, කිරිල්ල කරා; අජ්ඣප්පත්තො, පැමිණියේ; තෙන, ඒ ශීඝ්‍රගමනින්; මරණං, මරණට; උපාගමි, පැමිණියේ.

186 සොහං නයෙන සම්පන්නො පෙත්තිකෙ ගොචරෙ රතො,
අපෙතසත්තු මොදාමි සම්පස්සං අත්ථමත්තනොති.

නයෙන, නීතියෙන්; සම්පන්නො, සමෘද්ධවූ; පෙත්තිකෙ, පියපරම්පරෙන් ආ; ගොචරෙ, ගොචරයෙහි; රතො, ඇලුණෙමි; අත්තනො, තමහට; අත්ථං, අර්ථයක්; සම්පස්සං, පසස්නෙමි; අපෙතසත්තු, පහවූ සතුරා ඇති; සොහං, ඒ මම; මොදාමි, සතුටුවෙමි.

### 168 සකුණග්ඝි ජාතකයයි.

---*---

187 යො වෙ මෙත්තෙන චිත්තෙන සබ්බලොකානුකම්පකො,
උද්ධං අධො ච තිරියඤ්ච අප්පමාණෙන සබ්බසො.

යො, යමෙක්; වෙ, එකාන්තයෙන්; අප්පමාණෙන, ආලම්බන විෂයම්හභාගත්වයෙන් අප්‍රමාණවූ; මෙත්තෙන, මෛත්‍රීවූ; චිත්තෙන, චිත්තයෙන්; උද්ධං, උඩින්ද; අධො, යටින්ද; තිරියඤ්ච, සරසින්දැයි; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; සබ්බලොක, සියලු ලොකයාහට; අනුකම්පකො, අනුකම්පාකෙරේද.

188 අප්පමාණං හිතං චිත්තං පරිපුණ්ණං සුභාවිතං,
යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සතීති.

අප්පමාණං, අප්‍රමාණකොට; පරිපුණ්ණං, අවිකලකොට; හිතං, හිතවූ; චිත්තං, මෛත්‍රීචිත්තය; සුභාවිතං, මනාකොට වඩනලදද;

පමාණකතං, ප්‍රමාණයෙන් කෘතවූ; යං, යම්කාමාවචර කුශලකර්ම යෙක් ඇද්ද; තං, ඒ කාමාවචර කර්මය; තත්‍ර, ඒ අර්පණ ප්‍රාප්ත මෛත්‍රී චිත්තයෙහි; නාවසිස්සති, නොමසිටින්නේයි—යමෙක් වනාහි උඩින් නෛවසංඥානාසංඥ භවය දක්වා යටින් අවීචිය හිම්කොට සරසින් අනන්ත චක්‍රවාලයම පර්‍යන්තකොට මේ දෙඅතුරෙහි සකල සත්වයන් විෂයකොට මෛත්‍රීචිත්තය වඩා අර්පණ ප්‍රාප්තකළද ඒ අර්පණප්‍රාප්ත මෛත්‍රීචිත්තය යම්පමණ කාමාවචරික පුණ්‍යරාශිය කුත් වීනම් අභිභවා විපාකවශයෙන් මහත්වන්නේය යනු අභිප්‍රායයි.

## 169 අරක ජාතකයයි.

189 නායං පුරෙ උණ්ණමති තොරණග්ගෙ කකණ්ටකො,
මහොසධ විජානාහි කෙන ථද්ධො කකණ්ටකො.

පුරෙ, පෙර; තොරණග්ගෙ, තොරණාග්‍රයෙහි; අයං, මේ; කකණ්ටකො, කකණ්ටකතෙම; න උණ්ණමති, උඩත නොවෙසි; මහොසධ, මහෞෂධය; විජානාහි, දනු; කකණ්ටකො, කකණ්ටකයා; කෙන, කුමක්හෙයින්; ථද්ධො, ස්තබ්ධද.

190 අලද්ධපුබ්බං ලද්ධාන අඩ්ඪමාසං කකණ්ටකො,
අතිමඤ්ඤති රාජානං වෙදෙහං මිථිලග්ගහන්ති.

කකණ්ටකො, කකණ්ටකතෙම; අලද්ධපුබ්බං, අලබ්ධපූර්වවූ හෙවත් පෙර නොලද්දාවූ; අඩ්ඪමාසං, අර්ධමාසයක්; ලද්ධාන, ලදින්; මිථිලග්ගහං, මිථුලුනුවර ගෙය ඇති; වෙදෙහං, වෛදෙහනම්; රාජානං, රජහු; අතිමඤ්ඤති, ඉක්මසිතා.

## 170 කකණ්ටක ජාතකයයි.

## 2 සන්ථව වග්ගයයි.

191 කල්‍යාණධම්මොති යදා ජනින්ද
ලොකෙ සමඤ්ඤං අනුපාපුණාති,
තස්මා න හියෙථ නරොසපඤ්ඤො,
හිරියාපි සන්තො ධුරමාදියන්ති.

ජනින්ද, ජනෙන්ද්‍රය; ලොකෙ, ලොව්හි; යදා, යම්කලෙක්හි; කල්‍යාණධම්මොති, කල්‍යාණධර්ම ඇත්තේයයි; සමඤ්ඤං, ප්‍රඥප්ති

තොම; අනුපාපුණාති, පැමිණීද; තස්මා, ඒ ප්‍රඥප්තියෙන්; සප
ඤ්ඤො, ප්‍රඥාසහිතවූ; නරො, නරතෙම; න හීයෙථ, නොපිරිහෙන්
නේයි; හිරියාපි, ආධ්‍යාත්මිකවූ හ්‍රීන්ද බාහ්‍යවූ අපත්‍රපායෙන්ද;
සතෙනා, සත්පුරුෂයෝ; ධුරං, ප්‍රව්‍රජ්‍යාධුරය; ආදියනායි, ගනිත්;
"හිරීයාපි" කීතැන "අපි" ශබ්දය අනුක්ත සමුච්චයෙහි වැටෙයි,
හ්‍රීන්ද අපත්‍රපායෙන්දැයි අර්ථගතයුතු.

192 සායං සමඤ්ඤා ඉධමජ්ජ පත්තා
කල්‍යාණධම්මොති ජනින්ද ලොකෙ,
තාහං සමෙක්ඛං ඉධ පබ්බජිස්සං
නහිමත්ථි ඡන්දො ඉධ කාමභොගෙහි.

ජනින්ද, ජනප්‍රධානය; ලොකෙ, ලෙව්හි; කල්‍යාණධම්මොති, කල්‍යාණධර්මයයි; (යමක් ඇත්තේද) සා අයං, හේමේ; සමඤ්ඤා, ප්‍රඥප්තිතොම; ඉධ, මෙහිලා; මෙ, මාවිසින්; අජ්ජ, අද; පත්තා, පැමිණෙනලද; තං, හේ ප්‍රඥප්තිය; අහං, මම; සමෙක්ඛං, බලන්නෙම්; ඉධ, මෙහිලා; පබ්බජිස්සං, පැවිදිවෙමි; ඉධ, මෙහිලා; කාමභොගෙ, කාමානුභවයෙහි; මෙ,මාගේ; ඡන්දො,ඡන්දයෙක්; න හි අත්ථි, නොම ඇති; නැතැයිසේයි.

### 171 කල්‍යාණධම්ම ජාතකයයි.

—*)෦(*—

193 කොනු සද්දෙන මහතා අභිනාදෙති දද්දරං,
කිංසීහා නප්පටිනදන්ති කො නාමෙසො මිගාධිභූ.

මිගාධිභූ, මෘගරාජය; දද්දරං, රජතපර්වතය; කොනු, කවරෙක්; මහතා, මහත්වූ; සද්දෙන, ශබ්දයෙන්; අභිනාදෙති, ගුගුරුවාද; සීහා; සිංහයෝ; කිං, කුමකට; නප්පටිනදන්ති; ප්‍රතිරවනොකෙරෙද්ද, එසො; මෙතෙම; කො නාම, කිනම්එකෙක්ද.

194 අධමො මිගජාතානං සිඟාලො තාත වස්සති,
ජාතිමස්ස ජිගුච්ඡන්තා තුණ්හී සීහා සමච්ඡරෙති.

තාත. පුත; මිගජාතානං, මෘගජාතීන්ට; අධමො, අධමවූ; සිඟාලො, ශෘගාලයා; වස්සති, හඬයි; අස්ස, මොහුගේ; ජාතිං, ජාතිය; ජිගුච්ඡන්තා, ජුගුප්සාකරන; සීහා, සිංහයෝ; තුණ්හී, තුෂ්ණීම්භූතව; සමච්ඡරෙ, හිඳිත්; "සං" යනු උපසර්ගය; "අච්ඡරෙ" යනු ක්‍රියාවයි.

### 172 දද්දර ජාතකයයි.

195 තාත මාණවකො එසො තාලමූලං අපස්සිතො,
අගාරකඤ්චිදං අත්ථි හන්ද දෙමස්සගාරකං.

තාත, පියාණෙනි; එසො, මේ; මාණවකො, සත්ත්වයෙක්; තාලමූලං, තාලවෘක්ෂමූලය; අපස්සිතො, ආශ්‍රයකොට සිටියේය; ඉදං, මේ; අගාරකව, ගෘහයද; අත්ථි, ඇත; හන්ද, එබැවින්; අස්ස, මෝහට; අගාරකං, අපගේ ගෙය; දෙම, දෙමු.

196 මා ඛො තං තාත පක්කොසි දූසෙය්‍ය නො අගාරකං,
නෙතාදිසං මුඛං හොති බ්‍රාහ්මණස්ස සුසීලිනොති.

තාත, පුතණුවෙනි; තං, ඔහු; මා ඛො පක්කොසි, නහමක් කැඳවා; නො, අපගේ; අගාරකං, (දුකින්කොටගත්) ගෘහය; දූසෙය්‍ය, දූෂණයකරන්නේය; (ගින්ලා හෝ වර්චස්කොට හෝ නසන්නේය) සුසීලිනො, සුසීලවූ; බ්‍රාහ්මණස්ස, බ්‍රාහ්මණයෙකුගේ; එතාදිසං, මෙබඳුවූ; මුඛං, මුහුණෙක්; න හොති, නොවන්නේයි.

**173 මක්කටක ජාතකයයි.**

197 අදම්හ තෙ වාරි පහූතරූපං
ඝම්මාභිතත්තස්ස පිපාසිතස්ස,
සොදානි පිත්වාන කිංකිං කරොසි
අසංගමො පාපජනෙන සෙය්‍යො.

ඝම්මාභිතත්තස්ස, ඝර්මයෙන් අභිතප්තවූ; පිපාසිතස්ස, පිපාසිතවූ; තෙ, තට; පහූතරූපං, බොහෝවූ; වාරි, ජලය; අදම්හ, දුනුම්හ; සො පීත්වාන, ඒ තෝ මා විසින් දුන්ජලය බී; ඉදානි, දැන්; කිංකිං කරොසි, වඳුරුමුහුණු කොටගෙන කිංකිං යන ශබ්දකෙරෙහි; පාපජනෙන, ලාමකජනයා හා හෙවත් කෙළෙහිගුණ නොදන්නා ජනයා හා; අසංගමො, එක්නොවීම; සෙය්‍යො, ශ්‍රෙෂ්ඨයි.

198 කො තෙ සුතො වා දිට්ඨො වා සීලවා නාම මක්කටො,
ඉදානිඛො හං උග්ගච්ඡං එසා අස්මාකධම්මතාති.

කොනාම, කවරනම්; මක්කටො, වානරයෙක්; සීලවා, සිල්වතැයි; තෙ, තාවිසින්; සුතො වා, අසනලද්ද; දිට්ඨො වා, දක්නාලද්ද; ඉදානිඛො, දැන් වනාහී; තං, තා; උග්ගච්ඡං, හිස වර්චස් සලාකිලුවු කෙරෙමි; අස්මාකං, අපවඳුරන්ගේ; එසා, මෝතොම; ධම්මතා, ධර්මතායි.

**174 දුබ්භියමක්කට ජාතකයයි.**

199 සබ්බෙසු කිර භූතෙසු සන්ති සීලසමාහිතා,
පස්ස සාඛාමිගං ජම්මං ආදිච්චමුපතිට්ඨති.

සබ්බෙසු, සියලු; භූතෙසු, සත්වයන් කෙරෙහි; සීලසමාහිතා, ශීලයෙන් යුක්තයෝ; සන්ති කිර, ඇත්ල නොහොත්; සීල, සිල් වත්වූ; සමාහිතා, එකඟසිත් ඇත්තෝ; සන්ති කිර, විද්‍යමානයෝල; ජම්ම, හීනවූ; සාඛාමිගං, ශාඛාමෘගයා හෙවත් වානරයා; පස්ස, බල; ආදිච්චං, සූර්‍ය්‍යයා කරා; උපතිට්ඨති, එළඹසිටී; හිරුවැඳ සිටි යෙයි සේයි.

200 නාස්ස සීලං විජානාථ අනඤ්ඤාය පසංසථ,
අග්ගිහුත්තං ච උග්ගහාතං මෙ ච භින්නා කමණ්ඩලූති.

අස්ස, මොහුගේ; සීලං, සීලයක්; නවිජානාථ, නොදන්නුව, අනඤ්ඤාය, නොදැන,පසංසථ, ප්‍රශංසාකරව; අග්ගිහුත්තං ච, වහ්නි දෙවතාවාට පූජාකරන කෙණෙස්සද; උග්ගහාතං, වර්චස්ලා කිළුටු කරනලද; මෙ ච කමණ්ඩලු, කුණ්ඩිකාවෝ දෙදෙනෙක්ද; භින්නා, තුලුවිසින් බිඳිනා ලදහු.

**175 ආදිච්චුපට්ඨාන ජාතකයයි.**

—)(—)(:)(—)(—

201 බාලො වතායං දුමසාඛගොචරො
පඤ්ඤා ජනින්ද න ඉමස්ස විජ්ජති,
කලාය මුට්ඨිං අවකිරිය කෙවලං
එකං කලායං පතිතං ගවෙසති.

ජනින්ද, ජනාධිපතිය; දුමසාඛ, වෘක්ෂශාඛාවන්; ගොචරො, ගොචරකොට ඇති නොහොත්; දුමසාඛ ගොචරො, දෘමශාඛාවන්ම සංචාරස්ථානකොටඇති; අයං, මේ වානරයා; වත, ඒකාන්තයෙන්; බාලො, අඥානය; ඉමස්ස, මොහුගේ; පඤ්ඤා, ප්‍රඥා; න විජ්ජති, නැත; කෙවලං, හුදෙක්; කලාය මුට්ඨිං, කෘෂ්ණවාස මුෂ්ටියක්; අවකිරිය, විසුරුවා; පතිතං, බිම්හුණු; එකං, එක; කලායං, කළුමැඇටක්; ගවෙසති, සොයා.

202 එවමෙව මයං රාජ යෙචඤ්ඤෙ අභිලොභිනො,
අජෙපන බහු ජීයාම කලායෙනෙව වානරොති.

එවමෙව, එපරිද්දෙන්ම; රාජ, රජ; මයං, අපිද; අභිලොභිනො, අතිලොභීවූ; යෙ ච අඤ්ඤෙ, යම් අනික් කෙනෙක්දැයි මේ සියල්ලම; කලායෙන, කලායෙන්; වානරො ඉව, වානරයාමෙන්; අජෙප්පන, මඳකින්; බහුජීයාම, බෙහෙවින් පිරිහෙමු-ලොභීන්මෙන්

එක මාෂාසැටිය නිසා මාෂාසපිමුෂ්ටියෙකින් පිරිහුණු වානරයා මෙන් මඳක් නිසා බෙහෙවින් පිරිහෙතියි යේයි.

## 176 කලායමුෂ්ටි ජාතකයයි.

———:o:———

203 ධනුහත්ථකලාපෙහි නෙත්තිංසවරධාරිහි
සමන්තා පරිකිණ්ණම්හා කථං මොක්ඛො භවිස්සති.

ධනුහත්ථකලාපෙහි, ධනුකලාපයෙන් යුක්ත අත් ඇත්තවුන් විසින්ද, හෙවත් දුනුහියවුරු ගත් ධනුර්ධරයන් විසින්ද; නෙත්තිංසවරධාරිහි, උත්තමඛඩ්ගයන් ධැරූ යොධයන් විසින්ද; සමන්තා, හාත්පසින්; පරිකිණ්ණම්හා, පිරිවරනලද්දුම්හ; කථං, කෙසේ නම්; මොක්ඛො, (මෙයින්) මොක්ෂයෙක්; භවිස්සති, වන්නේද.

204 අප්පෙව බහුකිච්චානං අත්ථො ජායෙථ කොචි නං
අත්ථි රුක්ඛස්ස අච්ඡින්නං ඛජ්ජතඤ්ඤෙව තින්දුකං.

බහුකිච්චානං, බොහෝ කෘත්‍යඇති ජනයන්ට; කොචි, කිසි; අත්ථො, අර්ථයෙක්; ජායෙථ, උපන්නේ වීනම්; අප්පෙව, යෙහෙක; රුක්ඛස්ස, තිඹිරිවෘක්ෂයාගේ; අච්ඡින්නං, ආකර්ෂණය නොට ඵලමර්දනොකළ නැත්; අත්ථි, ඇත; තින්දුකං, තිඹිරිඵල; ඛජ්ජතං එව, කනුම ලැබේවා බොහෝ කාර්‍ය්‍යයෙහි ව්‍යාපෘතජනයන්ට එක්තරා කටයුත්තෙක් ඉපිදනියනම් ඒ කටයුත්තයට දී නැඟී යම්හ තෙපි හැමදෙනම තිඹිරිඵල බලා භයනැතිව එක්වයි යනු අභිප්‍රායයි. "කොචි නං" කී තැන "නං" යනු නිපාතයි.

## 177 තින්දුක ජාතකයයි.

———o———

205 ජනිත්තමෙම භවිත්තමෙම ඉති පඞ්කෙ අවස්සයිං
තං මං පඞ්කො අජ්ඣභවි යථා දුබ්බලකං තථා.
206 තං තං වදාමි භග්ගව සුණොහි වචනං මම
ගාමෙ වා යදි වා රඤ්ඤෙ සුඛං යත්‍රාධිගච්ඡති.

මෙ, මාගේ; ජනිත්තං, ජාතස්ථානයයි කියාද; මෙ, මාගේ; භවිත්තං, වර්ධිතස්ථානයයි කියාද; ඉති, මේ කාරණයෙන්; පඞ්කෙ, කදිමයෙහි; අවස්සයිං, වැදහොත්තෙමි; මං, මා; තං, ඒ; පඞ්කො, කැඩීමය; දුබ්බලකං යථා, දුර්වලකයා යම්සේද; තථා, එසේම; අජ්ඣභවි, විනාශයට පැමිණවීය; භග්ගව, භාර්ගවය නොහොත් කුම්භකා

රය; තං, (තස්මා) එහෙයින්; තං, තට; වදාමි, කියමි; මම, මාගේ; වචනං, තෙපුල්; සුණොහි, අසා; ගාමෙ වා, ගම් වේවයි; යදි වා, නො හොත්; අරඤ්ඤෙ, වල වේවයි; යත්‍ර, යම්තැනෙක්හි; සුඛං, සුවයට; අධිගච්ඡති, පැමිණේද.

207 තං ජනිත්තං භවිත්තච පුරිසස්ස පජානතො,
යං හි ජීවෙ තං හි ගච්ඡෙ න නිකෙතහතො සියා'ති.

තං, එසේවූ ස්ථානය; පජානතො, කාරණා කාරණඥවූ; පුරිසස්ස, පුරුෂයාට; ජනිත්තං, ජන්මස්ථාන නමුදු වෙයි; භවිත්තං ච; වැඩුණුතැන් නමුදු වේ; යං හි, යම්තැනෙක්හි; ජීවෙ, ජීවත්වේද; තං හි, එතැනට; ගච්ඡෙ, යන්නේය; නිකෙතහතො, නිකෙතයෙන් හතවූයේ හෙවත් වාසස්ථානවූ නිකෙතයෙහි ආශ්‍රයබද්ධයෙන් නෂ්ටවූයේ; න සියා, නොවන්නේයි.

## 178 කච්ඡප ජාතකයයි.

——:○:——

208 තච අප්පං තච උච්ඡිට්ඨං තච කිච්ඡෙන මෙ අදා,
සොහං බ්‍රාහ්මණජාතිකො යං භුත්තං තම්පි උග්ගතං.

තච, හෙද; අප්පං, ස්වල්පය; තච, හේ මිඳබතද; උච්ඡිට්ඨං, ඉඳුල, තච, ඒමඳවූ ඉඳුල් බතද; නො, අපට; කිච්ඡෙන, කෘච්ඡ්‍රයෙන්; අදා, දින; සොහං බ්‍රාහ්මණජාතිකො, හේ මම පරිශුද්ධවූ බ්‍රාහ්මණජාති ඇත්තෙමි; යං, යම්බඳු අහරෙක්: භුත්තං,( මාවිසින් )කනලදද; තම්පි, හෙද; උග්ගතං, (රුධිරහා මිශ්‍රකොට) නැගනලදී.—යම් බතක් කැම්ද හේ ඉතා මඳ හේ මිඳවූයේද චණ්ඩාලයා ඉඳුල හේ මඳවූ ඉඳුල් බතද කෘච්ඡ්‍රයෙන් දින එසේවූ බත පරිශුද්ධ බ්‍රාහ්මණවූ මම අනුභවකොට ලේහා මිශ්‍රකොට නැහිම්සි කියා මෙසේ නොයෙක් පරිද්දෙන් ඒ බ්‍රාහ්මණ පුත්‍රයාහට පශ්චාත්තාපදුඃඛයට හෙතුවීද.

209 එවං ධම්මං නිරං කත්වා යො අධම්මෙන ජීවති
සතධම්මොව ලාභෙන ලද්ධෙනාපි න නන්දතීති.

එවං, මෙපරිද්දෙන්; ධම්මං, (ආජීව පාරිශුද්ධිශීල සංඛ්‍යාත) ධර්මය; නිරං කත්වා, දුරුකොට; අධම්මෙන, (එක්විසි අනෙෂණ සංඛ්‍යාත) අධර්මයෙන්; යො, යම් මිනිසෙක්; ජීවති, ජීවත්වේද; (හේ මහණ) සතධම්මොව, ශතධර්ම නම් බ්‍රාහ්මණ පුත්‍රයා මෙන්; ලද්ධෙනපි ලාභෙන, ලබ්ධලාභයෙන්ද; න නන්දති, තුෂ්ට නොවේ-ගර්හිත ජීවිකාවෙන් ජීවත්වෙමිසි පශ්චාත්තාපයෙන් තැවෙන්නේය යිසේයි.

## 179 සතධම්ම ජාතකයයි.

———00———

210 දුද්දදං දදමානානං දුක්කරං කම්මකුබ්බතං
අසන්තො නානුකුබ්බන්ති සතං ධම්මො දුරන්නයො.

දුද්දදං, (ලොභාදිදොෂපරවූ අඥනයන් විසින් දෙන්නට නොපිළිවන් හෙයින්) දුද්දදනම්වූ දානය; දදමානානං, දෙන්නාවූන්ගේ; දුක්කරං, දුෂ්කරවූ; කම්මං, කර්මය; කුබ්බතං, කරන්නාවූන්ගේ; අසන්තො, අසත්පුරුෂයෝ; නානුකුබ්බන්ති, අනුක්‍රියා කරන්නෝ නොවෙත් නොහොත් උන් සේ දානක්‍රියා කරන්නෝ නොවෙත්; එසේමැයි; සතං, සත්පුරුෂයන්ගේ; ධම්මො, ස්වභාවධර්මය හෙවත් දානය; දුරන්නයො,( මෙසේවූ දානයෙන් මෙසේවූ ඵලයෙක් වන්නේයයි) නොදතහැකි; නොහොත්; දුරන්නයො, පැමිණෙන්නට නොපිළිවනි- අඥනයෝ දන්දීත් හේ දානයෙහි ඵලප්‍රාප්තිය සාධාගත නොහෙන්නාහුය යිසේයි.

211 තස්මා සතඤ්ච අසතඤ්ච නානා හොති ඉතො ගති
අසන්තො නිරයං යන්ති සන්තො සග්ගපරායනාති.

තස්මා, එහෙයින්; සතඤ්ච, සත්පුරුෂයන්ගේද; අසතඤ්ච, අසත්පුරුෂයන්ගේද; ඉතො, මෙයින්; ගති, භවයෙහි ප්‍රතිසන්ධිග්‍රහණය; නානා හොති, වෙනවෙන වන්නේයි; එසේමැයි; අසන්තො, (දානශීලාදියෙහි නොහැසිරෙන)අපණ්ඩිතජනයෝ; නිරයං යන්ති, නරකයට යෙති; සන්තො, (දානශීලාදි ක්‍රියායෙහි ප්‍රයුක්ත) සත්පුරුෂයෝ; සග්ගපරායනා, ස්වර්ගපරායණකොට ඇත්තෝයි හෙවත් මහත්වූ ස්වර්ගසුඛ අනුභව කෙරෙති යි සේයි.

**180 දුද්දද ජාතකයයි.**

———oo———

**3. කල්‍යාණධර්ම වර්ගයයි.**

---

212 ධනුග්ගහො අසදිසො රාජපුත්තො මහබ්බලො
දූරෙපාතී අක්ඛණවෙධී මහාකායප්පදාලනො.

මහබ්බලො, (කායබල ඥානබල වශයෙන්) මහත්වූ බලඇති; දූරෙපාතී, (චාතුර්මහාරාජිකය ඉක්මවා ත්‍රයස්ත්‍රිංශද්භවනය දක්වා කාණ්ඩප්‍රෙරණයෙහි සාමර්ථ්‍යයෙන්) සැර දුර හෙළන්නාවූ; අක්ඛණවෙධී, ලක්ෂ්‍යය නොවරදවා විදිනාවූ; නොහොත් අක්ෂණයයි විද්‍යුත්කාන්ති එසේ හෙයින් එකවිද්‍යුත්විලාසකාලයෙහි සත් අටවාරයෙක්හි ශරප්‍රෙරණයෙහි සමර්ථහෙයින් අක්ෂණවෙධිනම්වූ; මහාකායප්පදාලනො, (චර්මකාය ලොහකාය දාරුකායාදිවූ) මහාකායයන්

විදූරණය කරන්නාවූ; අසදිසො, අසදෘශනම්වූ නොහොත් ප්‍රඥාදීන් සමයක්හු නැත්තාවූ; රාජපුත්තො, රාජපුත්‍රවූ; ධනුග්ගහො, ධනුර්ධරතෙම—

213 සබ්බාමිත්තෙ රණං කත්වා න ච කිඤ්චි විහෙඨයි
භාතරං සොත්ථිං කත්වාන සඤ්ඤමං අජ්ඣුපාගමීති.

සබ්බාමිත්තෙ, සියලු සතුරන්; රණං කත්වා, යුද්ධකොට පලවා; කිඤ්චි, කිසිවක්හු; න ච විහෙඨයි, නොපෙළීය හෙවත් ප්‍රාණඝාත නොකෙළේය. කුමක්කළද යත්? භාතරං, මලු; සොත්ථිං කත්වාන, සුවපත්කොට; සඤ්ඤමං, ශීලසංයමයට හෙවත් ප්‍රව්‍රජ්‍යාවට; අජ්ඣුපාගමී, පැමිණිය.

## 181 අසදිස ජාතකයයි.

———00———

214 සඞ්ගාමාවචරො සූරො බලවා ඉති විස්සුතො,
කින්නු තොරණමාසජ්ජ පටික්කමසි කුඤ්ජර.

සඞ්ගාමාවචරො, ආයුධ ප්‍රහාරයෙන් යුක්ත යුද්ධය මැඩහැසිරෙන හෙයින් සඞ්ග්‍රාමාවචරයයි කියාද; සූරො, යුද්ධයෙහි පසුනොබස්නා සිත්ඇති හෙයින් ශූරයයි කියාද; බලවා, එඩිඇති හෙයින් බලවතැයි කියාද; ඉති, මෙසේ; විස්සුතො, ප්‍රසිද්ධයෙහි; කුඤ්ජර, හස්තිය; තොරණං, තොරණට හෙවත් වාසල්දොරටුවට; ආසජ්ජ, පැමිණ; කින්නු, කවරකාරණයෙකින්; පටික්කමසි, පසුබසිහිද.

215 ඔමද්ද ඛිප්පං පලිඝං එසිකානි ච අබ්බහ,
තොරණානි පමද්දිත්වා ඛිප්පං පවිස කුඤ්ජරාති.

පලිඝං, නගර පලිඝය හෙවත් යතුරුඅගුල; ඛිප්පං, ශීඝ්‍රව; ඔමද්ද, මඩු; එසිකානි ච, එසිකාස්තම්භයන්ද; අබ්බහ, වහා උදුර; කුඤ්ජර, ගජරාජය; තොරණානි, වාසල්දොරබා; පමද්දිත්වා, මැඩ; ඛිප්පං, වහා; පවිස, (නගරාභ්‍යන්තරයට) ප්‍රවිෂ්ටවා.

## 182 සඞ්ගාමාවචර ජාතකයයි.

———000———

216 වාලොදකං අප්පරසං නිහීනං
පීත්වා මදො ජායති ගද්‍රභානං
ඉමඤ්ච පීත්වාන රසං පණීතං
මදො න සඤ්ජායති සින්ධවානං.

අප්පරසං, අල්පරසවූ; නිහීනං, හීනරස ඇතිහෙයින් නිහීනවූ; වාලොදකං, නියඳවල්ලෙන් පැරගු රස ජලය; පීත්වා, බී; ගද්‍රභානං,

කොටළුවන්ට; මජ්ජං, මදය; ජායති, වඩනේය; පණීතං ච, ප්‍රණීතවූ; ඉමං රසං, මේරසය; පීත්වාන, බී; සින්ධවානං, සෛන්ධවයන්ට; මජ්ජං, මදය; න සජ්ජායති, නොවඩනේය; කාරණා කිම්දැයි විචාළේය.

217 අප්පම්පි පීත්වාන නිහීනජච්චා
සො මජ්ජති තෙන ජනින්ද පුට්ඨො
ධොරය්හසීලො ච කුලම්හි ජාතො
න මජ්ජතී අග්ගරසං පිවිත්වාති.

ජනින්ද, ජනශ්‍රේෂ්ඨය; නිහීනජච්චා, ලාමකජාති ඇත්තේ; තෙන, ඒ ලාමක ජාතිත්වයෙන්; පුට්ඨො, ප්‍රෂ්ටවූ; සො, හෙතෙම; අප්පම්පි, සවල්පවූද හෙවත් රසමදවූ ජලය; පීත්වාන, බී; මජ්ජති, මත්වන්නේය; ධොරය්හසීලො, ධුරවහනස්වභාවයෙන් සම්පන්න වූ; කුලම්හි ජාතො, උත්තමකුලයෙහි ජාතවූ සෛන්ධවයා; අග්ගරසං, පළමුකොට මැඩගත් හෙයින් අග්‍රවූ මිදිරසය; පිවිත්වා, බී; න මජ්ජති, මත්නොවන්නේයයි කාරණා කිවු.

## 183 වාලොදක ජාතකය

——oo——

218 දූසිතො ගිරිදත්තෙන හයො සාමස්ස පණ්ඩවො
පොරාණං පකතිං හිත්වා තස්සෙව අනුවිධීයති.

සාමස්ස, සාමනම් රජ්ජුරුවන්ගේ; පණ්ඩවො, පණ්ඩවනම්වූ; හයො, අශ්වයා; ගිරිදත්තෙන, ගිරිදත්තනම් කොරවූ අශ්වබන්ධයා විසින්; දූසිතො, දූෂණය කරනලද්දේ; පොරාණං, පුරාතනවූ; පකතිං, ප්‍රකෘතිය; හිත්වා, හැර; තස්සෙව, හේ තමාබඳනාවූ ගිරිදත්ත නම් කොරුගේප්‍රකෘතියම;අනුවිධීයති,අනුශික්ෂණයකෙරේ-උහුගේ කොරගමන් තෙමේත් කෙරෙයි සේයි.

219 සචෙ ච තනුජො පොසො සිඛරාකාරකප්පිතො
ආනනෙ තං ගහෙත්වාන මණ්ඩලෙ පරිවත්තයෙ
ඛිප්පමෙව පහත්වාන තස්සෙව අනුවිධීයතීති.

සචෙ ච, ඉදින්; තනුජො, ඔහට; සිඛරාකාර, සුන්දරවූ ආකෘතීන්; කප්පිතො, කල්පිතවූ කෙශශ්මශ්‍රු ඇති; පොසො, පුරුෂයෙක්; තං, ඒ අශ්වයා; ආනනෙ, ආනනයෙහි හෙවත් මුඛරජ්ජුවෙහි; ගහෙත්වාන, ගෙන; මණ්ඩලෙ, අශ්වමණ්ඩලයෙහි; පරිවත්තයෙ, පරිවර්තනය කෙළේවීනම්; ඛිප්පමෙව, වහාම්; පහත්වාන, ඒඛඤ්ජභාවය හැර; තස්සෙව, ඒ අශ්වබන්ධයාගේ උත්තම ප්‍රකෘතියම්; අනුවිධීයති, අනුව

නික්ඛමෙ හෙවත් තමා පෙර නික්මුණු භාවයෙහි පිහිටන්නේයයි සේයි, "තනුජෙ" කීතැන "තස්ස අනුජො තනුජො"යි සමාසයි.

## 184 ගිරිදන්ත ජාතකයයි.

—·——oo———

220 යථොදකෙ ආවිලෙ අප්පසන්නෙ
න පස්සති සිප්පිසම්බුකං මච්ඡගුම්බං
එවං ආවිලෙහි චිත්තෙ
න පස්සති අත්තදත්ථං පරත්ථං.

යථා, යම්සේ; ආවිලෙ, කැළඹීමෙන් මිශ්‍රවූ; අප්පසන්නෙ, එහෙයින්ම අප්‍රසන්නවූ; උදකෙ, ජලයෙහි; සිප්පි, රන්වන් බෙල්ලන්ද, සම්බුකං, වටබෙල්ලන්ද; මච්ඡගුම්බං, මත්ස්‍යවර්ගයාද; න පස්සති; බලන්නේ නොදකීද; එවං, එපරිද්දෙන්; චිත්තෙ, චිත්තය; ආවිලෙ, (රාගාදීන් ) ආවිලකල්හි; අත්තදත්ථං, ආත්මාර්ථයද; පරත්ථං, පරාර්ථයද; නපස්සති, නොදකී.

221 යථොදකෙ අච්ඡෙ විප්පසන්නෙ
සො පස්සති සිප්පිච මච්ඡගුම්බං
එවං අනාවිලෙ හි චිත්තෙ
සො පස්සති අත්තදත්ථං පරත්ථන්ති.

යථා, යම්සේ; අච්ඡෙ, ස්වච්ඡවූ; විප්පසන්නෙ, මණිවණීමෙන් ප්‍රසන්නවූ; උදකෙ, ජලයෙහි; සිප්පිංච, රන්වන් බෙල්ලන්ද; මච්ඡගුම්බං, මස්ලෑනුන්ද; සො, හේබලන පුරුෂයා; පස්සති, බලාද; එවං, එපරිද්දෙන්; චිත්තෙ, චිත්තය; අනාවිලෙ, ලොභාදීන් නොඇලළුණුකල්හි; අත්තදත්ථං, ආත්මාර්ථයද; පරත්ථං, පරාර්ථයද; සො, හේරාගාදින් දුරුකොට වසන සිත්ඇති පුරුෂතෙම; පස්සති, බලා.

## 185 අනභිරති ජාතකයයි.

——oo——

222 වණ්ණගන්ධරසූපෙතො අම්බායං අහුවා පුරෙ
තමෙව පූජං ලභමානො කෙනම්බො කටුකප්ඵලො.

අයං, මේ; අම්බො, ආම්‍රවෘක්ෂය; පුරෙ, පෙර; වණ්ණ, වර්ණයෙන්ද; ගන්ධ, සුගන්ධයෙන්ද; රස, මධුරරසයෙන්ද; උපෙතො, යෙදුනේ; අහු, විය; තමෙව පූජං, හෙම පෙර කරන පූජාව, ලභමානො, ලබන්නාවූ; අම්බො, අඹරුක; කෙන, කවර හෙතුවකින්; කටුකප්ඵලො, තිත්තරස ප්‍රසවකෙරේද හෙවත් තිත්තවූ ඵල ඇත්තේවිද.

223 පුචිමන්ද පරිවාරො අම්බො තෙ දධිවාහන
මූලං මූලෙන සංසට්ඨං සාඛා සාඛා නිසෙවරෙ
අසාතං සන්නිවාසෙන තෙනම්බො කටුකප්ඵලොති.

දධිවාහන, දධිවාහන දෙවයෙනි; තෙ, තොපගේ; අම්බො, ආම්‍ර වෘක්ෂය; පුචිමන්ද පරිවාරො, කොසඹ රුක් පිරිවර කොට ඇත්තේ මහවත් කොසඹගස් වට කොට සිටියේ; මූලං, මුල; මූලෙන, මුලින්; සංසට්ඨං, සංසෘෂ්ටය හෙවත් කොසඹමුල් හා මීඅඹමුල් එක්වසිටියේය; සාඛා, ශාඛාවෝ; සාඛා, ශාඛාවන්; නිසෙවරෙ, සෙවුනාහ; තෙන, ඒ; අසාතං, අමධුරවූ පුචිමන්ද වෘක්ෂයන්ගේ; සන්නිවාසෙන, සහවාසයෙන්; අම්බො, මේ මධුරාම්‍රවෘක්ෂය; කටුකප්ඵලො, අමධුර ඵල ඇත්තේවී.

## 186 දධිවාහන ජාතකයයි.

— — —:o:— — —

224 උච්චෙ විටභිමාරුය්හ මන්තයව්හො රහොගතා
නීචෙ ඔරුය්හ මන්තව්හො මිගරාජාපි සොස්සති.

උච්චෙ, ස්වභාවයෙන් උස්වූ ගස; විටභිං, එහිදු අත්‍යුන්නත වෙළපකට; ආරුය්හ, නැඟී; රහොගතා, රහසට පැමිණ; මන්තයව්හො, මන්ත්‍රණය කරව; ඔරුය්හ, බැස; නීචෙ, නීචස්ථානයෙහි සිට; මන්තව්හො, මන්ත්‍රණය කරව්; මිගරාජාපි, මෘගරාජයාද: සොස්සති, අසා—වෘක්ෂාග්‍රයෙහි හුන් හංසයන් දෙන්නකු දැක මෘගාධම වූ ශෘගාලයා අනාත්මවේදීව මෘගරාජවූ මමද අසමින් ගසින් බැස මා සමීපයෙහි බණවයි කියා නියොගකෙළේය යනු අභිප්‍රායයි.

225 යං සුපණ්ණො සුපණ්ණෙන දෙවො දෙවෙන මන්තයෙ,
කිං තත්ථ චතුමට්ටස්ස බිලං පවිස ජම්බුකාති.

යං, (යෙන කාරණෙන) යම් කාරණයකින්; සුපණ්ණො, සුන්දර පර්ණ ඇතිහෙයින් සුපර්ණනම්වූ හංසයා; සුපණ්ණෙන, හංසයා හා; දෙවො, හෙම දෙවතානම්වූ හංසයා, දෙවෙන, දෙවතානම්වූ හංසයා හා; මන්තයෙ, මන්ත්‍රණය කෙරේද; තත්ථ, ඒ මන්ත්‍රණයෙහි; චතුමට්ටස්ස, ශරීරයෙන් ජාතියෙන් ස්වරයෙන් ගුණයෙනැයි මේ සතරින් සිලුටුවූ හෙවත් නිර්දුෂ්ටති හෙයින් මෙකියන සතර ගුණයෙන් හීනවූ තට; කිං, කවරනම් ප්‍රයොජනයෙක්ද; ජම්බුක, මෘගාධමය; බිලං, බිලයට; පවිස, ප්‍රවිෂ්ටව—බෝධිසත්වයෝ භෛරව ස්වරූප දක්වා මෙසේ නියොගකළෝ.

## 187 චතුමට්ට ජාතකයයි.

226 සීහංගුලී සීහනඛො සීහපාද පතිට්ඨිතො
සො සීහො සීහසංඝම්හි එකො නදති අඤ්ඤථා.

සීහංගුලී, සිංහයන්ට බඳුවූ ඇඟිලිඇති; සීහනඛො, සිංහයන්ට බඳුවූ නියඇති; සීහපාද, සිංහපාදයෙනි; පතිට්ඨිතො, පිහිටි හෙවත් සිංහයන්ගේ පාබඳු පා ඇති; සො සීහො, ඒ සිංහතෙම; සීහසංඝම්හි සිංහ සමූහයෙහි; එකො; අවශෙෂ සිංහයන්හා අසදෘශව; අඤ්ඤථා, අනික් පරිද්දෙකින්; නදති, ශෘගාල නාදකෙරේ —භයප්‍රාදුර්භාවය වශයෙන් සිංහාකෘති වීනමුත් නාදවූකලී ශෘගාලනාදම යයි සේයි.

227 මා ත්වං නදි රාජපුත්ත අප්පසද්දො වනෙ වස
සරෙන ඛො තං ජානෙය්‍යුං නහි තෙ පෙත්තිකො සරො.

රාජපුත්ත, සිංහරාජයාගේ පුත්‍රය; ත්වං, තෝ; මා නදි, නාදමක් නාදකර හෙවත් හෝනඩ—ශබ්දයෙන් තා කැනහිල්බව දැන ගනිති සි සේයි; අප්පසද්දො, නිශ්ශබ්දව හෙවත් නොහඬා; වනෙ, වෙනෙහි; (සිංහයන් අතුරෙහි) වස, නිවාසය කර; තං, තා; සරෙන ඛො, ස්වර යෙන් වනාහී; ජානෙය්‍යුං, දැනගන්නාහුයි; තෙ, තට; පෙත්තිකො පියාණන්ගේ; සරො: ස්වරය; නහි, නැති.

188 සීහකොත්ථුජාතකයයි.

———o———

228 එතං සීහස්ස නදිතං න ව්‍යග්ඝස්ස න දීපිනො
පාරුතො සීහචම්මෙන ජම්මො නදති ගද්‍රභො.

එතං, මේ; සීහස්ස, සිංහයෙකුගේ; නදිතං න, නාදනොවෙයි; ව්‍යග්ඝස්ස, ව්‍යාඝ්‍රයෙකුගේ; නදිතං න, නාදනොවෙයි; දීපිනො, දිවියෙකුගේ; නදිතං න, නාදනොවෙයි; සීහචම්මෙන, සිංහචර්මයෙන්; පාරුතො, පොරවනලද; ජම්මො, ලාමකවූ; ගද්‍රභො, කොටළුවා; නදති, නාදකෙරේ.

229 චිරම්පි ඛො තං ඛාදෙය්‍ය ගද්‍රභො හරිතං යවං
පාරුතො සීහචම්මෙන රවමානොව දූසයීති.

ගද්‍රභො, කොටළුවා; සීහචම්මෙන, සිංහ චර්මයෙන්; පාරුතො, පොරවනලද්දේ; හරිතං; නිල්වූ. යවං, යව; චිරම්පි ඛො, දීර්ඝකාලයක් වනාහී; ඛාදෙය්‍ය, කන්නේය; තං' යනු; නිපාතය; රවමානොවා තමාගේ ගද්‍රභරාවය කරන්නේම; දූසයි. දූෂ්‍යවි—සිංහචර්මය පොරව, හෙණ නොහඬා බොහෝ කලක් යව කා තමාගේ ගද්‍රභරාවයෙන් හඬා ජාතිප්‍රකාශනොව ප්‍රහාරාදීන් දූෂණයට පැමිණියේය යිසේයි.

189 සීහචම්ම ජාතකයයි.

———oo———

230 පඤ්ඤා සද්ධාය සීලස්ස චාගස්ස ච අයං ඵලං,
නාගො නාවාය වණ්ණෙන සද්ධං වහති උපාසකො.

පඤ්ඤා, බල; සද්ධාය, (ලෞකික ලොකොත්තර) ශ්‍රද්ධාවගේද; සීලස්ස ච, (ලෞකික ලොකොත්තර) ශීලයාගේද; චාගස්ස ච, (සදය විසතුය, ක්ලෙශය යනමේ දෙතන්හි නිස්සද්ධ) පරිත්‍යාගයාගේද; අයං, (යසි ගස්ධි, ඉදං) මේ; ඵලං, ගුණය (ආනිසංසය); පඤ්ඤා යනක්‍රියාව සාමාන්‍යකොට ගත්කල මේ අර්ථයැනොහොත් "පඤ්ඤා" යනක්‍රියාව "අයං ඵලං පඤ්ඤා" යයි කියාගෝ යොදත්; නාගො, දිව්‍යනාගයා; නාවාය වණ්ණෙන, නෞකාසංස්ථානයෙන්; සද්ධං, (රත්නත්‍රයෙහි ප්‍රතිෂ්ඨිත) ශ්‍රද්ධාඇති; උපාසකං, උපාසකයා; වහති, උසුලා.

231 සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං හි සන්නිවාසෙන සොත්ථිං ගච්ඡති නහාපිතො.

සබ්භිරෙව, ප්‍රාඥයන්හා සමග; සමාසෙථ, එක්ව වාසය කරන්නේය; සබ්භි, සත්පුරුෂයන්හා; සන්ථවං, මිත්‍රසංස්තවය; කුබ්බෙථ, කරන්නේය; (ප්‍රයොජන කිම්දයත්?) සතංහි, සත්පුරුෂයන්හා වනාහි; සන්නිවාසෙන, සහවාසයෙන්; නහාපිතො, කරනෑවැම් වූ අනජ්ජනයා පොවා; සොත්ථිං, සුවසේ; ගච්ඡති, යන්නේයි, එහෙයින් සුජනසමාගමය ඓහලෞකික පාරලෞකික අභිවෘද්ධිප්‍රසවය කරන්නේය සිසේයි.

190 සීලානිසංසජාතකයයි.

---

## (4) සතරවන අසදෘශවර්ගයයි.

---

232 අපි රුක්ඛකට්ඨානාපි ජීයා සන්ධීයතෙ පුනා,
සන්ධීයස්සු පුරාණියා මා කොධස්ස වසං ගමි.

රුක්ඛ, රුක්ඛකය; ජිනානාපි, ජිනානදවූ; ජීයා, ජ්‍යා තොමෝ; පුන, නැවත; සන්ධීයතෙ අපි, සන්ධානවන්නීද: හෙවත් සටනා වට පැමිණෙන්නීමද, (තෝද එපරිද්දෙන්) පුරාණියා, පුරාතනවූ නාං අඹුවතා; සන්ධීයස්සු, සන්ධානව; හෙවත් සම්භිවගතු; කොධස්ස, ක්‍රොධයාගේ: වසං, වසගබවට; මාගමි, නගමින් යා; ක්‍රොධ නොකර සිතස්සි.

233 විජ්ජමානාසු මරුවාසු විජ්ජමානෙසු කාරුසු,
අඤ්ඤං ජීයං කරිස්සාම අලඤ්ඤෙව පුරාණියාති.

මරුවාසු, මරුවනම්වැහැරි; (දුහුල්රැකවැහැරියයිදයෙත්) විජ්ජමානාසු, විද්‍යමානවූකල්හිද; කාරුසු, දුනුදියකරන්නාවූන්; විජ්ජමානෙසු, විද්‍යමානකල්හි; අඤ්ඤං, අනික්; ජීයං, ජ්‍යාවක්; කරිස්සාම, කොටගනුමෝද එපරිද්දෙන්; පුරාණියා, පුරාතන ප්‍රියාව; අලඤ්ඤෙව, නොකැමැත්තේමැයි.

## 191 රුහක ජාතකයයි.

234 ඉත්ථී සියා රූපවතී සාච සීලවතී සියා,
පුරිසො තං න ඉච්ඡෙය්‍ය සද්දහාසි මහොසධ.

ඉත්ථී, ස්ත්‍රී; රූපවතී, රූ ඇත්තී; සියා, වන්නීය; සාච, ඒ රූප ස්ත්‍රීද; සීලවතී, ආචාරශීල ඇත්තී; සියා, වන්නීය; පුරිසො, පුරුෂයෙක්; තං, ඇ; නඉච්ඡෙය්‍ය, නොකැමැත්තේය; මහොසධ, මහෞෂධයෙනි; සද්දහාසි, ඒ හදහව්දැයි රජ විචාළේ විචාළ රජ හට මහෞෂධ පණ්ඩිතයෝ කියත්.

235 සද්දහාමි මහාරාජ පුරිසො දුබ්භගො සියා,
සිරී ච කාලකණ්ණී ච න සමෙන්ති කුදාචනන්ති.

මහාරාජ, මහරජ; සද්දහාමි, අදහමි; පුරිසො, පුරුෂ; දුබ්භගො සියා, පින්නැත්තේ වීනම්; සිරීච, ශ්‍රීද; කාලකණ්ණීච, අශ්‍රීදයන දෙදෙන; කුදාචනං, කිසිකලෙක්හිදු හෙවත් මදකාලයකුදු; නසමෙන්ති, එක්ව නොවැසෙත්- අශ්‍රීකපුරුෂයහට ප්‍රශස්තාඞ්ගනා සඞ්ගමය ඇසිල්ලකුත් මනාප නොවෙයිසේයි.

## 192 සිරිකාලකණ්ණි ජාතකයයි.

236 අයමෙව සා අහම්පි සො අනඤ්ඤො,
අයමෙව සො හත්ථච්ඡිතො අනඤ්ඤො
යංමාහ කොමාරපතී මමන්ති
වජ්ඣිත්ථියො නත්ථි ඉත්ථීසු සච්චං.

අයමෙව සා, හෝ මෝමැය; (අනඤ්ඤා, අනිකක්නොවේ) අහම්පි, මමද; සො, හේමය; අනඤ්ඤො, අනිකෙක් නොවමි; සො හත්ථච්ඡිතො, ඒ වධයට පැමිණි නොවාද; අයං එව, මේමය; අනඤ්ඤො, අනිකෙක්නො වේ; මමං, මාගේ; කොමාරපතිඉති, කුමාර කලම

ලද ස්වාමියයි හෙවත් කුලවැස්සන්විසින් දුන් හිමිහෙමේයයි; යා, යමක්; ආහ, කීද; (ඕහතාමෙර් මැය); ඉත්ථියො, ස්ත්‍රීහුනම්; වජ්ඣා, වධ්‍යයන හෙවත් වධකරන්නට සුදුස්සහ; ඉත්ථීනං, ස්ත්‍රීන්කෙරෙහි; සංවිං, වාක්සත්‍යයෙක්; නත්ථි, නැති-යම්සේ පර දයරුවෙන් උසුලා බාහු රුධිරය පොවා පොෂණයකල එකෙක් ඇද්ද එනම් මමය බාහු රුධිරය බී විසූයමක් ඇද්ද හෝනම් මේතෙම යම්කෙනෙකු දීයෙන් යන්නගුනගා පොෂණය කෙලෙම්ද හේ දුන් මාගේ බාලභාවයෙහිවූ සමයෙහියයි කී මෝ සව්ස්ත්‍රීහුනම් වධාර්හයෝ යයි කියා ඔබ්බෙනි වධයට නියොග කරත්.

237 ඉමඤ්ච ජම්මං මුසලෙන හන්ත්වා ලුද්දං ඡවං පරදාරූපසෙවිං.
ඉමිස්සාව නං පාපපතිබ්බතාය ජීවන්තියා ඡින්දථ කණ්ණ
නාසන්ති.

ලුද්දං, රෞද්‍රවූ; ඡවං, නිර්ගුණභාවයෙන් මෘතප්‍රායවූ; පරදාර, පරදාරවත්; උපසෙවිං, සෙවූනාවූ; ජම්මං, ලාමකවූ; ඉමඤ්ච, මේ කොට්ඨද; මුසලෙන, මුසලයෙන්; හන්ත්වා, තළා (ඇටබිඳ); පාප පතිබ්බතාය, ලාමකවූ පතිව්‍රතාඇති; ජීවන්තියා, ජීවත්වන්නාවූම; ඉමිස්සාව, මැගේද; කණ්ණනාසං, කර්ණනාසිකා; ඡින්දථ, කපව්; නං, යනු නිපාතයි- මේ දුර්ජනවූ කොට්ඨද මුසල ප්‍රහාරයෙන් ඇට බිඳ මේ දුර්ජනවූ අනාචාරයෙන් යුක්තවූ ස්ත්‍රියද නොමරා කර්ණ නාසච්ඡේදකරවයි නියොග කළහ යනුඅභිප්‍රායයි.

## 193 චුල්ලපදුම ජාතකයයි

---

238 නාසන්ති දෙවා පවසන්තිනූනානහන්ත්නූන සන්තීධලොකපාලා
සහසා කාරෙන්තානං අසඤ්ඤතානං නාහනූන සන්තිපටි සෙ
ධිතාරො.

දෙවා, සිල්වතුන් (රක්ෂාකරන්නාවූ පාපනිවාරණය කරන්නාවූ) දෙවතාවෝ; නසන්තිනූන, නැතැයි හඟිමි; පවසන්තිනූන, එබඳු කෘත්‍යයෙක බැහැරටගොස් සිතමි; ඉධ, මේලොකයෙහි; ලොක පාලා, සත්පුරුෂ ලක්ෂණයෙහි නියුක්තහෙයින් ලොකපාලනම්වූ දෙවතාවෝත්; නහිසන්ති, නොමැතැයි; නූන, හඟිමි; සහසා, ලාහෙලා පරීක්ෂා නොකොට; කරෙන්තානං, දරුණුකම්කරන් නාවූ; අසඤ්ඤතානං, වාරත්‍රයෙන් අසංඥතවූ දුශ්ශීලයන්ගේ දරුණුක්‍රියාවන්, පටිසෙධිතාරො, ප්‍රතිෂෙධය කරන්නෝ හෙවත් වළකන්නෝ; නහ සන්ති, නොමැතැයි; නූන, හඟිමි.

239 අකාලෙ වස්සති තස්ස කාලෙ තස්ස න වස්සති,
සග්ගාච චවති ඨානා නනු සො තාවතා හතො.

තස්ස, ඒ අධර්මයෙන් රජකරන රජහුගේ විජිතයෙහි; අකාලෙ, අකාලයෙහි;(ගොවිතැන් පැසුණුකලය දතන්කලය මඩනාකලය යනාදි නොමේවටමනාකාලයෙහි) වස්සති, වැසි වස්සී; තස්ස, ඒ අධර්ම බහුලකොට වසන රජහුගේ රාජ්‍යයෙහි; කාලෙ, ගොයම් වඩනා කාලය බාල කාලය යනාදී දිය වුවමනා කාලයෙහි, නවස්සති, නොවස්සී; සග්ගාච ඨානා, ස්වර්ගසම්ඛ්‍යාත ස්ථානයෙන් හෙවත් ස්වර්ගලොකයෙන් (ඒ අධර්මිෂ්ඨ රජ), චවති, අදෘෂ්ටලාභ වශයෙන් චුතවන්නේය; නොහොත් ස්වර්ගයෙහි රජකරන්නේ හෝ ඒකාධිරාජ්‍යයෙන් චුත වන්නේහෝය; සො, ඒ අධර්මිෂ්ඨ රජ, තාවතා, මෙපමණකින්; හතො නනු, නෂ්ටවූයේ නොවේද නොහොත් මෙනැත්හි නනුයනු එකාන්තවාචීය, සො, ඒ අධර්මිෂ්ඨරජතෙම; තාවතා, මෙපමණින්; හතොනනු, (අවීචි මහා නරකාදි අපාය භූමියෙහිදී) එකාන්තයෙන් නෂ්ටමැයි.

### 164 මණිචොරජාතකයයි.

---

240 පබ්බතූපත්ථරෙ රම්මෙ ජාතා පොක්ඛරණී සිවා.
තං සිගාලො අපාපායි ජානං සීහෙන රක්ඛිතං.

රම්මෙ, සිත්කළුවූ; පබ්බත, හිමාලයපර්වතයට; උපත්ථරෙ, සමීපයෙහිපැතිරසිටි භූමිප්‍රදෙශයෙහි; සිවා, සීතලවාරිභරිතවූ; පොක්ඛරණී, පුෂ්කරිණියක්; ජාතා, ඇතිවූව; ගම්භාවටද පුෂ්කරිණීව්‍යවහාර කරති එසේහෙයින් මධුරශිශිරවාරිභරිත ගම්භාවක් ජාතය යන අර්ථ දක්නියත්;සීහෙන,සිංහයෙක්හුවිසින්,රක්ඛිතං,රක්ෂාකරනලද; තං, ඒවාරිපූර්ණපුෂ්කරිණිය; සිගාලො,ශෘගාලයෙක්;ජානං, සිංහ රක්ෂිත පුෂ්කරිණියයයි දත්තේ; අපාපායි,වැද නිර්භීතව පී; අපාපායි, යන්නෙහි අපයනු උපසර්ගය, අපායියනුක්‍රියාවයි.

241 පිබන්ති වෙ මහාරාජ සාපදානි මහානදිං.
න තෙන අනදී හොති ඛමස්සු යදි තෙ පියා.

මහාරාජ, මහරජ; වෙ, එකාන්තයෙන්; සාපදානි, දිවිආදිවූ සියලු චතුෂ්පාදයෝ; මහානදිං,මහාගඞ්ගාව; පිබන්ති, බොත්මය,තෙන, සතුන් පැන් අනුභවකළ පමණෙකින්; අනදී න හොති, ගඞ්ගා නොවූයේ නොවෙයි; ගඞ්ගාවම්මය; තෙ, තට; යදි, ඉදින්; පියා,නා අඹු ප්‍රියවීනම් ඒ ඇමිතිබෝහෝ උපකාරවීතම්; ඛමස්සු, ක්ෂමාකර;

විහරජ ගහපැත්බොත්ගත්නම් මේ ශෘගාල මිතු නොවෙයි ආමිශෙ ෂ දිව්ආදි චතුෂ්පාදයෝද ද්විපාදයෝද බහුප්පාදයෝද අපාදයෝ දයි සියල්ලෝම බැසැ පැත්බොත්, ආමිශයකින් හේගඩහා නො ගඩහාවූයේ නොවෙයි ඉදුල්වූයේත් නොවෙයි තෘප්තද නොවෙයි එපරිද්දෙන් මේලොකයෙහි සතුන්ජාතීන් උත්තමාධම්සර්වජනයෝ සෙවිත්මය එතකුදු වූව හෝ සතුන් ලොකපුද්ගලති දන්නෝ හර නෝ නොවෙති තෙපිදු එපරිද්දෙන් රක්‍ෂාකරවයි කියා අවවාද කළහයි සේයි.

## 195 පබ්බතූපත්ථරජාතකයයි.

---

242 යෙ න කාහන්ති ඔවාදං නරා බුද්ධෙන දෙසිතං,
ව්‍යසනං තෙ ගමිස්සන්ති රක්ඛසීහිව වාණිජා.

යෙ, යම්; නරා, නරකෙනෙක්; බුද්ධෙන, සර්වඥයන් විසින්; දෙසිතං, දෙශනාකරනලද; ඔවාදං, අවවාද; නකාහන්ති, නොකෙරෙද්ද; රක්ඛසීහි, රාක්‍ෂසීන්විසින් උපලාලනයෙන් විනාශයට පැමිණියාවූ; වාණිජා ඉව, ව්‍යාපාරයන්මෙන්; තෙ, ඔහුනුමු; ව්‍යසනං, විනාශයට; ගමිස්සන්ති, පැමිණෙත්.

243 යෙ ච කාහන්ති ඔවාදං නරා බුද්ධෙන දෙසිතං,
සොත්ථිං පාරං ගමිස්සන්ති වාලාහෙනෙව වාණිජාති.

යෙච නරා, යම්නරයෙකෙනෙක් වනාහි; බුද්ධෙන, බුදුන්විසින්; දෙසිතං, වදාරනලද; ඔවාදං, අවවාද; කාහන්ති, කෙරෙද්ද; (ඔහු) වාලාහෙන, වලාහකකුලයෙහි අශ්වරාජයා නිසා අභිලෂිතස්ථාන ප්‍රාප්තවූ; වාණිජා ඉව, ව්‍යාපාරයන්මෙන්; සොත්ථිං, සුවසේ (අනන්තරායයෙන්) පාරං, සංසාර සාගරයාගේ පාරයට හෙවත් නිර්වාණයට; ගමිස්සන්ති, පැමිණෙත්.

## 196 වලාහස්ස ජාතකයයි

---

244 න නං උම්හයතෙ දිස්වා න ච නං පටිනන්දති,
චක්ඛූනි චස්ස න දදති පටිලොමඤ්ච වත්තති.

නං, ඔහු; දිස්වා, දැක; නඋම්හායතෙ, ස්මිතය ප්‍රකාශ නොකරන්නේය; නං, හේ තමා වෙනඇති පුරුෂයාගේ වචනය; නචපටිනන්දති, පුනිනන්දනය නොකෙරෙයි හෙවත් තමා වෙෂඇති පුරුෂයාගේ ශුවණීයවූ යම්වචනයක් ඇසුව්දුයසපතා ස්නේසයි ස්විකාර

නොසකරන්නේයි; අස්ස, මේ වෛරීවූ පුරුෂයාගේ; චක්ඛූනි, නෙත්‍රයත්; නදදාති, නොදෙයිහෙවත් අභිමුඛයෙහි සෘජුව දෘෂ්ටාකාරයෙන් නොබලයි; පටිලොමඤ්ච, ප්‍රත්‍යනීකාර්ථ හෙයින් විරොධතාවයෙන්ද; වත්තති, පවත්නේයි.

245 එතෙ භවන්ති ආකාරා අමිත්තස්මිං පතිට්ඨිතා,
යෙහි අමිත්තං ජානෙය්‍ය දිස්වා සුත්වා ච පණ්ඩිතො ති.

එතෙ, මෙකියනලද; ආකාරා, ආකාරයෝ; අමිත්තස්මිං, සතුරු කෙරෙහි; පතිට්ඨිතා, ප්‍රතිෂ්ඨිතවූවාහු; භවන්ති, වෙති; පණ්ඩිතො, තත්වඥවූ ප්‍රාඥයා; යෙහි, යම්කාරණයකින්; දිස්වා, දැකද; සුත්වාච, අසාද; අමිත්තං, අමිත්‍රයා; ජානෙය්‍ය, දන්නේද හෙවත් සතුරු ඇඳින ගන්නේද ඔහුගේ මේආකාරයෝය යනු අභිප්‍රායයි.

## 197 මිත්තාමිත්ත ජාතකයයි.

246 පවාසා ආගතො තාත ඉදානි න චිරාගතො,
කච්චිනු තාත තෙ මාතා න අඤ්ඤං උපසෙවති.

තාත, පුත්‍රය; ඉදානි, දැන්; පවාසා, ප්‍රවාසයෙන්; ආගතො, ආයේ; නචිරාගතො, චිරගතයෙම් නොවෙමි; තාත, පුත; තෙ මාතා, තාගේ මව; කච්චිනු, කිමෙක්ද; අඤ්ඤං, අනිකෙකු; නඋපසෙවති, නොසෙවනය නොකෙරද- කිමෙක්ද පුත තාමව අන්‍ය පුරුෂයකු හා සමග යමක් කළාදැයි නොකළාදැයි විචාළේය යනු අභිප්‍රායයි.

247 නඛො පනෙතං සුභණං ගිරං සච්චූපසංහිතං,
සයෙථ පොට්ඨපාදොව මුම්මුරෙ උපකූසිතො ති.

සච්ච, සත්‍යයෙන්; උපසංහිතං, යුක්තවූ; එතං, මේ; ගිරං, වචනය; නඛො පනෙතං සුභණං, මනාකොට කියයුතු නොවේ හෙවත් සත්‍යවූ ප්‍රකාර නොවදරවානියත් සුදුසු නොවේදැයි යථාභූත ප්‍රකාරය ප්‍රකාශකළ එකෙක් ඇත්නම්; මුම්මුරෙ, ගිනිවුසු හළුයෙහි, උපකූසිතො, දැවෙනුවනලද; පොට්ඨපාදොඉව, පොට්ඨපාදනම්ගිරව පරිද්දෙන්; සයෙථ, හෝනේමැයි- පියාණනි අපගේ මෑණියෝ පොට්ඨපාදයෝ තමන්ට අවිවාද කළහයින්ගා කර මිරිකා හුණුහළුයෙහි ලාපියච්ච අළිදු නොපට අපමෑණියන්ගේ සවරූපය නොවරදවා කීමෝ නම් කර මැඩ මරා හුණුහළුයෙහි ලනී එසේහෙයින් අපි නොකියමුයයි යනුඅභිප්‍රායයි.

## 198 රාධ ජාතකයයි.

248 උභයං මෙ න ඛමති උභයං මෙ න රුච්චති,
යායං කොට්ඨමොතිණ්ණා නාද්දසං ඉති භාසති.

249 තං තං ගාමපතිබ්‍රෑමි කදරෙ අප්පස්මිං ජීවිතෙ,
වෙමාසෙ කාරං කත්වාන මංසං ජරග්ගවං කිසං,
අප්පත්තකාලං චොදෙසි තම්පි මය්හං න රුච්චතීති.

කොට්ඨං, කොට්ඨුවට; ඔතිණ්ණා, අවතීර්ණවූ; යායං,යම්මේ (ජම්ට්ඨනැතැත්තියක්) න දක්සං ඉති, නොදකිමියි; භාසති, කියාද; තං, තංයසීලෙස්යි; (කෙතකාරණෙකිත, ඒකාරණයෙන්); ගාමපති, ග්‍රාම්ජ්‍යෙෂ්ඨය; තං, තට; බ්‍රෑමි, කියමි; කදරෙ, කෘච්ඡතරවූ; අප්පස්මිං, පරිජතවූ; ජීවිතෙ, ජීවිතය පවත්නාකල්හි; මංසං, මාංසඅදව දෙත්ගෙන්; කිසං,ක්ෂීණවූ; ජරග්ගවං, ගොමාල්ලා; වෙමාසෙ, දෙමසක්; කාරං, පරිච්ඡෙද; කත්වාන, කොට; අප්පත්තකාලං, අප්‍රාප්ත කාලයෙහි, චොදෙසි, ඉල්වයි; තම්පි, හෙද;මය්හං,මට, නරුච්චති, රුස්සෙන් නොවෙයි; මෙ, මට; උභයං,(වීනැතිබව දැනදැන නොදකිමියි කියන ලාම්කාන්තියගේ වචනයද අප්‍රාප්තකාලයෙහි යාච්ඤාවද යනමේ)දෙක; නඛමති, ක්ෂමානොවෙයි; මෙ, මට; උභයං,(මේකි යන) දෙක, නරුච්චති, රුස්සෙන්නොවෙයි; තොපදෙන්නාගේ එවා ප්‍රයොග දනිමි යනඅභිප්‍රායයි.

## 199 ගහපති ජාතකයයි,

250 සරීරදබ්‍යං වඩ්ඪබ්‍යං සොජච්චං සාධුසීලියං,
බ්‍රාහ්මණඤ්ඤෙව පුච්ඡාම කත්නු තෙසං වණ්ණිමහසෙ.

සරීර,(එකකුගේ) ශරීරයෙහි; දබ්‍යං, අභිරූපභාවයඇත, වඩ්ඪබ්‍යං. එකකු ගෙවාඕනනය ඇත; සොජච්චං,(එකකුගේ)සුජාතභාවය. හෙවත්කුලජබවඇත; සාධුසීලියං, (එක්කුගේ) සෞශීලයය ඇත, බ්‍රාහ්මණ,බමුණ, තෙව, නාම; පුච්ඡාම, විචාරමු; තෙසං, ඒ ශරීරකාන්තතාදින් යුක්තවූ සතරදෙනාඅතුරෙන්; කත්නු,කවරක්හු; වණ්ණිම්හසෙ, කැමැතිවිමුද නොහොත්; කත්නු, කවරක්හට; වණ්ණිම්හසෙ, දෙද්ද.

251 අඤ්ඤො අඤ්ඤ සරීරස්මිං වඩ්ඪබ්‍යස්ස නාමොකරෙ,
අඤ්ඤො අයඤ්ඤ සුජාතස්මිං සීලං අස්මාකරුච්චතීති.

සරීරස්මිං, සම්ඵබවූරූපඇතිශරීරයෙහි; අඤ්ඤො, අභිවෘද්ධි; අත්ථි, ඇත්මය,වඩ්ඪබ්‍යස්ස, වෘද්ධභාවයට; නමොකරෙ,නමස්කාරකෙරෙමි;

සුජාතස්මිං, ප්‍රශස්තකුලයෙහි උපන් පුරුෂයා කෙරෙහි; අහො, වැඩි; අජී, ඇත; අස්මාකං, අපටවනාහි, සීලං, ආචාරාදිසීලය, රුච්චති, රුස්වන්නේයි: රූපවත්බවද වැඩිය විශෙෂවෑඩ භාවයද පූජායය, කුලජබවද ප්‍රශස්තය එනකුදුවූව තුන්දෙනාටවඩා ආචාරාදී සීලයෙන් යුක්තබෑම මටඅභිමතය යනු අභිප්‍රායයි.

200 සාධුසීල ජාතකයයි.

---

(5) පස්වන රූහකවග්ගයයි.

---

252 න තං දළ්හං බන්ධනමාහු ධීරා යදායසං දාරුජං බබ්බජඤ්ච,
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු පුත්තෙසු දාරෙසු ච යා
අපෙක්ඛා.

ආයසං, අයොමයවූ; ශෘඞ්ඛලයද, දාරුජං, දාරුමයවූ බන්ධනයද, බබ්බජඤ්ච, වැහැරිආදින් කළ පාසබන්ධනයද යන, යං, යම් මේ සියලු බන්ධනයෙක් ඇද්ද, තං, හේ, දළ්හං, දෘඪවූ, බන්ධනං බන්ධනයයි, ධීරා, (බුද්ධප්‍රත්‍යෙකබුද්ධශ්‍රාවකාදී) නුවණැත්තෝ, නආහු, නොකීහ; වැළිකුම්කද්දඩියයි කිවුදයත්? මණි, මැණික්හිද, කුණ්ඩලෙසු, කුණ්ඩලාභරණයෙහිද නොහොත්, මණිකුණ්ඩලෙසු, මැණික්කුණ්ඩලයෙහිද, සාරත්තරත්තා, අත්‍යන්තසංරාගයද, පුත්තෙසු, පුතුන්කෙරෙහිද, දාරෙසුච, දාරාවන්කෙරෙහිද, යා අපෙක්ඛා, යම්අපෙක්ෂාවක්ඇද්ද.

253 එතං දළ්හං බන්ධනමාහුධීරා ඔහාරිනංසිථිලං දුප්පමුඤ්චං,
එතම්පිඡෙත්වාන වජන්තිධීරා අනපෙක්ඛිනො කාමසුඛං
පහායාති.

එතං බන්ධනං, මේබන්ධනයද, දළ්හං, දෘඪයයි, ධීරා, ධීරයෝ, ආහු, කියති, ඔහාරිනං, ඔබනොබඇද අධඃපාතකොට හෙළන්නාවූ, සිථිලං, බන්ධනස්ථානයෙහි ඡවිචර්මාදීන් නොසිඳිනාවූ බද්ධභාවයද නොහැඟෙන පරිද්දෙන් සිථිලවූ, දුප්පමුඤ්චං, කුම්භීග්‍රාහයක්සේ පැහැර පියනොහැක්කාවූ යම්කෙලශ බන්ධනයෙක් ඇද්ද, එතම්පි, මේකෙලශබන්ධනයද පොවා; ඡෙත්වාන, ප්‍රඥාඛඩ්ගයෙන්සිඳ, අනපෙක්ඛිනො, වස්තුකාම කෙලශකාමයෙහි අපෙක්ෂා නැති, ධීරා, නුවණැත්තෝ, කාමසුඛං, පඤ්චකාමසුඛය, පහාය, හැර පියා, වජන්ති, තපස්වයෙන් ලොකයෙහි ශෘඞ්ඛලබන්ධනාදිය

දෘඪනම් නොවෙයි දෘඪනම් කෙලශබන්ධනය නුවණැත්තෝ ඒ කෙලශබන්ධනය පොළා ප්‍රඥාඛඩ්ගයෙන් සිඳ අයොමය දමයක් සිඳ ගත ගිය මදවාරණයකු මෙන් පජරයක් විදාරණය කොටගෙන ගිය සිංහයකු මෙන් අශුචිස්ථානයක් ප්‍රතිකූලකළ ශෘඞ්ගාරී පුරුෂයකු සෙයින් පඤ්චකාමයෙහි නිරපෙක්ෂව රම්‍යවූ තපොභූමියට ප්‍රවිෂ්ටව ධ්‍යානශ්‍රීන් දවස් යවන්නේය යනු අභිප්‍රායයි.

## 201 බන්ධනාගාර ජාතකයයි.

---

254 හංසා කොඤ්චා මයූරා ච හත්ථිනො පසදා මිගා,
සබ්බෙ සීහස්ස භායන්ති නත්ථි කායස්මිං තුල්‍යතා.

හංසා, හංසයෝද; කොඤ්චා, කොස්ලිහිණියෝද; මයූරාච, මයූරයෝද; හත්ථිනො, ඇත්හුද; පසදා, පසද මෘගයෝද හෙවත් එළුවෝද; මිගා, අවශෙෂ මෘගයෝද යනමේ; සබ්බෙ, සියල්ලෝ; සීහස්ස, සිංහයාට; භායන්ති, භයගන්නාහ; කායස්මිං, ශරීරයෙහි; තුල්‍යතා, අත්‍යුන්නතාදිසාදෘශ්‍යයෙක්; නත්ථි, නැත්.

255 එවමෙව මනුස්සෙසු දහරොචෙපි පඤ්ඤවා,
සො හි තත්ථ මහා හොති නෙව බාලො සරීරවාති.

එවමෙව, එපරිද්දෙන්ම; මනුස්සෙසු, මනුෂ්‍යයන් කෙරෙහි; චෙ, ඉදින්; දහරො අපි, වයඃ ප්‍රමාණයෙන් බාලයෙකුදු; පඤ්ඤවා, ප්‍රඥාවත්වීනම්; සො හි, හේ වනාහි; තත්ථ, එහිලා; මහා හොති, මහත් වන්නේය; සරීරවා, මහත් දෙහඇත්තාදවූ; බාලො, අඥානයා; නෙව, මහත්නාම් නොවන්නේය-යම්සේ හංසාදිවූ ශරීරයෙන් මහත්වූ සර්වප්‍රාණීහු සිංහයා ක්ෂුද්‍රදවුව ඌකෙරෙහි භය ඇත්තෝද එසේම අත්‍යුත්තමද එපරිද්දෙන් කෙනෙක් මහත් ශරීරඇති අඥානයන් අතුරෙහි වයඃ ප්‍රමාණයෙන් බාලදවූ ප්‍රඥාවත්තෙමේම උත්තමය යන අභිප්‍රායයි.

## 202 කෙළිසීල ජාතකයයි.

---

256 විරූපක්ඛෙහි මෙ මෙත්තං මෙත්තං එරාපථෙහි මෙ,
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං මෙත්තං කණ්හා
ගොතමකෙහි ච.

විරූපක්ඛෙහි, විරූපාක්ෂනම් නාගරාජකුලයහා සමඟ; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය; එරාපථෙහි, එරාපථනම් නාකුලය හා

සමඟ; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය; ඡබ්‍යාපුත්‍රයෙහි, ඡබ්‍යාපුත්‍ර නම් නාකුලය හා සමඟ; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය; කණ්හාගොතමකෙහිච, කෘෂ්ණාගොතමක නම්වූ නාගරාජකුලය හා සමඟ; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය.

257 අපාදකෙහි මෙ මෙත්තං මෙත්තං දිපාදකෙහි මෙ,
චතුප්පදෙහි මෙ මෙත්තං මෙත්තං බහුප්පදෙහි මෙ.

අපාදකෙහි, පාදරහිතයන්හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රය; දිපාදකෙහි, ද්විපාදයන්හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය; චතුප්පදෙහි, චතුෂ්පාදයන්හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය; බහුප්පදෙහි, බහුප්පාදයන්හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය.

258 මා මං අපාදකො හිංසි මා මං හිංසි දිපාදකො,
මා මං චතුප්පදො හිංසි මා මං හිංසි බහුප්පදො.

මං, මා; අපාදකො, අපාදකයෙක්; මා හිංසි, නාහමක් හිංසා කෙරේවා; මං, මා; දිපාදකො, ද්විපාදයෙක්; මා හිංසි, හිංසා නොකෙරේවා; මං, මා; චතුප්පදො, චතුෂ්පාදයෙක්; මා හිංසි, හිංසා නොකෙරේවා; මං, මා; බහුප්පදො, බහුප්පාදයෙක්; මා හිංසි, නාහමක් හිංසා කෙරේවා.

259 සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා ච කෙවලා,
සබ්බෙ භද්‍රානි පස්සන්තු මා කඤ්චි පාපමාගමා.

සබ්බෙ, සියලුම; සත්තා, (තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් පඤ්චස්කන්ධයෙහි ආසක්තයෝනුයි කියනලද) සත්වයෝද; සබ්බෙ, සියලු; පාණා, (ආශ්වාස ප්‍රශ්වාස දෙදෙනාගේ ප්‍රවර්ත්තන සංඛ්‍යාත ප්‍රාණ වශයෙන් කියනලද) ප්‍රාණීහුද; සබ්බෙ, සියලු; භූතා, (භාවිතාත්මයාගේ නිර්වර්ත්තනවශයෙන් කියනලද) භූතයෝද; කෙවලා, හුදෙක්; සබ්බෙ, සියල්ලෝ; භද්‍රානි, කල්‍යාණයන්ම; පස්සන්තු, දකිත්වා; කඤ්චි, කිසි සත්වයකු කරා; පාපං, දුඃඛයෙක්; මා අගමා, නාහමක් එේවා.

260 අප්පමාණො බුද්ධො අප්පමාණො ධම්මො
අප්පමාණො සඞ්ඝො පමාණවන්තානි සිරිංසපානි
අහිවිච්ඡිකා සතපදී උණ්ණානාභී සරබූමූසිකා

261 කතා මෙ රක්ඛා කතා මෙ පරිත්තා පටික්කමන්තු භූතානි
සොහං නමො භගවතො නමො සත්තන්නං සම්මාසම්බු
ද්ධානන්ති.

බුද්ධෝ, සර්වඥයෝ; අප්පමාණො, (ප්‍රමාණකරවූ කෙලෙශයන්ගේ අභාවයෙන් චතුර්වෛශාරද්‍යාදිවූ අනන්ත ගුණයන්ගේ ප්‍රමාණාතික්‍රාන්ත විශෙෂයන්ද) අප්‍රමාණයහ; ධම්මො, නවලොවුතුරා ධර්මයද; අප්පමාණො, (ස්වාඛ්‍යාතාදි ගුණයෙන් ප්‍රමාණ කරන්නට නොපිළිවන්නුයි) අප්‍රමාණයහ; සඞ්ඝො, අෂ්ටාර්යපුද්ගලසඞ්ඝයාද; අප්පමාණො, (සුප්‍රතිපන්නාදි ගුණයෙන් ප්‍රමාණාතික්‍රාන්තතුයි) අප්‍රමාණයහ; සිරිංසපානි, සියලු දීර්ඝජාතිසර්පයෝද; අහි, නයිද; විච්ඡිකා, ගෝනුස්සෝද; සතපදී, වාහෝද; උණ්ණානාභි මකුළුවෝද; සරබූ, සිකනලද; මූසිකා, මීයෝද; පමාණවන්තානි, (ප්‍රමාණකරකෙලෙසුන් ඇතිහෙයින්) ප්‍රමාණවත්හ; මෙ, රත්නත්‍රයෙහි ගුණසඳහන්කරන) මාවිසින්; රක්ඛා, ආරක්ෂාතොමෙ; කතා, කරනලදු; මෙ, මාවිසින්; පරිත්තා, පරිත්‍රාණද; කතා, කරනලද; භූතානි, (මට අහිතාධ්‍යාශයෙන් යුක්ත) භූතයෝ; පටික්කමන්තු, පහව්වත්වා; සොහං, (මෙසේ කළ පරිත්‍රාණ ඇති) සේ මම; භගවතො, භාග්‍යවත්වූ පියලූසර්වඥවරයන්ට; නමො, නමස්කාර කෙරෙමි; සම්මාසම්බුද්ධානං, සම්‍යක්සම්බුද්ධවූ; සත්තන්නං, විදර්ශිආදීවූ සත් දෙනහට, නමො, නමස්කාර වේවා.

203 ඛන්ධකවත්ත ජාතකයයි.

---

262 අපි වීරක පසෙසසි සකුණං මඤ්ජුභාණකං,
මයූරගීවසඞ්කාසං පතිං මය්හං සවිට්ඨකං.

වීරක, වීරකනම්තැනැත්තව; මඤ්ජුභාණකං, මියුරුකොට හඬන; මයූරගීවසඞ්කාසං, මොනරකරකට බඳුපැහැඇති; සවිට්ඨකං, සවිට්ඨකනම්වූ; මය්හං, මාගේ; පතිං, වල්ලභවූ; සකුණං, සකුණයා හෙවත් කවුඩා; අපිපස්සෙසි, දුටිද්දයි-කැවිඩි දිය කාවඋපන් බෝධිසත්වයන් විචාළ "මඤ්ජුභාණකං" යනාදි සොනුපද ප්‍රේමයෙන් කීවයි දතයුතු.

263 උදකථලචරස්ස පක්ඛිනො නිච්චං ආමකමච්ඡභොජිනො,
තස්සා න සවිට්ඨකො සෙවාලෙ පලිගුණ්ඨිතො
හොති.

උදක, දියෙහිද; ථල, ගොඩද; චරස්ස, හැසිරෙන්නාවූ; නිච්චං, නිත්‍යයෙන්; ආමක, අමු; මච්ඡ, මත්ස්‍යයන්; භොජිනො, කන;

තස්ස, හේ; පක්ඛිනො,පක්ෂිහට හෙවත් මෙසේවූමට; අනුකරං,අනුක්‍රියාකරන; සඞ්ඛකො, (නිසැමී) සඞ්ඛකනම්වූ කවුඩු; සෙවාලෙ, ශෛවාලයෙන්; පළිගුණ්ඨිතො, පරිවේෂ්ටිතවූයේ; මතො,මෙලේ-මාහා සමයේ මත්ස්‍යග්‍රහණය කෙරෙමිසි දියට වැද නිසැමියා සෙවෙලෙහි වෙළී මිය හොත්තේයයි- "සෙවාලෙ" යන තැන "සෙවාලෙන" යනුයි.

204 වීරකජාතකයයි.

---

264 සොභති මච්ඡෙ ගඞ්ගෙය්‍යො අථො සොභති යාමුනො,
චතුප්පදොයං පුරිසො නිග්‍රොධපරිමණ්ඩලො,
ඊසකායතගීවො ච සබ්බෙව අතිරොචති·

ගඞ්ගෙය්‍යො, ගඞ්ගානම් ගඟ උපන්; මච්ඡො, මත්ස්‍යද; සොභති, හොබනේය; අථො, ඉක්බිත්තෙන්; යාමුනො, යමුනා නම් ගඞ්ගායෙහි උපන් මත්ස්‍යද; සොභති, හොබනේය; නිග්‍රොධ, යහපත්ව හටගත් නුගරුකකට බඳුවූ; පරිමණ්ඩලො, වටඇති; ඊසක, රථඊෂිසක්සේ; ආයත, දික්වූ; ගීවොච, ග්‍රීවාදඇති; චතුප්පදො, චතුෂ්පදවූ; අයං පුරිසො, මේපුරුෂතෙම; සබ්බෙ, තොප දෙදෙනාම; අතිරොචති, මැඩ බබළා - මත්ස්‍යවූ තෙපි දෙදෙනා යහපත්හ තොපදෙදෙනාහට වඩා මෙනියන රූපඇති කුම්භිවූ මම අතිරූප ඇත්තෙමියි කීය, යනු අභිප්‍රායයි.

265 යං පුච්ඡිතො න තං අක්ඛා අඤ්ඤං අක්ඛාසි පුච්ඡිතො,
අත්තප්පසංසකො පොසො නායං අස්මාකරුච්චතීති.

යං, යමක්; පුච්ඡිතො, විචාරනලද්දේද්වීද; තං, ඒ; න අක්ඛා, නොකීයෙහි; පුච්ඡිතො, විචාරනලද්දෙහි; අඤ්ඤං, අනිකක්; අක්ඛාසි, කී; අත්තප්පසංසකො, ආත්මප්‍රශංසා කරන; අයං පොසො, මේපුරුෂ; අස්මාකං, අපට; නරුච්චති,නොරිසියේයි.

205 ගඞ්ගෙය්‍ය ජාතකයයි.

---

266 ඉංඝ වට්ටමයං පාසං ඡින්ද දන්තෙහි කච්ඡප,
අහං තථා කරිස්සාමි යථා නෙහිති ලුද්දකො.

කච්ඡප, ඉදිබුව; ඉංඝ, එබැවින්; වට්ටමයං, වරපටින් ඇඹරූ; පාසං, මල; දන්තෙහි, දතින්; ඡින්ද, කප; ලුද්දකො, වැදි; යථා,

යම්සේ; න එහිනි, නොඑන්නේද; තථා, එසේම; අහං, මම කරිස්සාමි, කෙරෙමි - කුම්බිය තෝ මුඛ හිඳ මෘගරාජයා බැදුණු මල දතින් කප මම තා මල දතින් කපනතුරු වැද්දාගෙනත් එන නොඈදී විළකම්හි යනු අභිප්‍රායයි.

267 කච්ඡපො පාවිසී වාරිං කුරුංගො පාවිසී වනං,
සතපත්තො දුමග්ගම්හා දූරෙ පුත්තෙ අපානයීති·

කච්ඡපො, කච්ඡපයා; වාරිං, ජලයට; පාවිසි, වන, කුරුංගො, කුරුංග මෘගයා; වනං, වලට; පාවිසි, වනෑ; සතපත්තො, ශතපත්‍ර හිණි; දුමග්ගම්හා, තමාහුත් ද්‍රුමාග්‍රයෙන්; දූරෙ, දුරට; පුත්තෙ, දරුවන්; අපානයි, ගෙනගියෙ.

206 කුරුංගමෘග ජාතකයයි.

---

268 අයමස්සකරාජෙන දෙසො විචරිතො මයා,
අනුකාමයානුකාමෙන පියෙන පතිනා සහ.

අනුකාමයා, ඔහු කැමැත්තාවූ; මයා, මාවිසින්; "අනු" යනු නිපාතයෑ; කාමෙන, කැමතිවූ; පියෙන, ප්‍රියවූ; පතිනා, සාමිවූ; අස්සකරාජෙන සහ, අශ්වකනම් රජහුහා සමග; අයං දෙසො, මේ උද්‍යානප්‍රදෙශය; විචරිතො, හැසිරෙනලද.

269 නවෙන සුඛදුක්ඛෙන පොරාණං අපිධීයති,
තස්මා අස්සකරඤ්ඤාව කීටො පියතරො මමාති.

නවෙන, නූතනවූ හෙවත් අලුත්වූ; සුඛදුක්ඛෙන, සුවදුක්දෙකින් පොරාණං, පුරාතනවූ සුවදුක්දෙක; අපිධීයති, මුවාකරනුලැබේ, තස්මා. එහෙයින්; අස්සකරඤ්ඤා, අශ්වකනම්රජුටවඩා; කීටොඑව, ගොම්පණුවාම; මම, මට; පියතරෙ, අතිශයින් ප්‍රියයි-යම්හෙයකින් අශ්වකනම් රජුහා සමග පෙර අපවූත් සුවයෙක් ඇත්නම් ඒ දූත් අපගේ දුඃඛයෙන් සැගවිණිද එසේහෙයින් පෙර සුව දුන් මේ අශ්වකනම් රජ්ජුරුවන්ට වඩා දූත් අපට සවාමිවූ ගොම්පණුවාම ප්‍රියතරය යනු අභිප්‍රායයි.

207 අශ්වකජාතකයයි.

---

270 අලමෙතෙහි අම්බෙහි ජම්බූහි පනසෙහි ච,
යානි පාරං සමුද්දස්ස වරං මය්හං උදුම්බරො.

සමුද්දස්ස, සමුද්‍රයාගේ හෙවත් ගඞ්ගාවගේ; පාරං එතර; යානි, යම් අම්‍රතාදිඵල කෙනෙක් දක්නා ලද්දාහුද; එනෙහි. ඒ තා දැක තියනලද; අම්බහි, අඹඵලයෙන්ද; ජම්බූහි, ජම්බූඵලයෙන්ද; පණසෙහිච, පණසඵලයෙන්ද හෙවත් වැල වරකායෙන්ද; අලං, පමණ; නොකැමැත්තෙම්සි සේයි, මය්හං, මාගේ; උදුම්බරෝ. උදුම්බර වෘක්ෂයම; වරං, ශ්‍රෙෂ්ඨයි.

271 මහතී වත තෙ බොන්දි නච පඤ්ඤා තදූපිකා,
සුංසුමාර වඤ්චිතො මෙසි ගච්ඡ දානි යථා සුඛන්ති.

සුංසුමාර, සුංසුමාරය; තෙ, තාගේ; බොන්දි, සරීරය; වත, එකාන්තයෙන්; මහතී, මහත; තදූපිකා, ඒ ශරීරප්‍රතිරූපකවූ; පඤ්ඤා, ප්‍රඥතොමෝ; නච, නැත; ශරීරය මහත්බව මුත් ප්‍රඥාවිශෙෂයෙක් නැතැයි සේයි; මෙ, මාවිසින්; වඤ්චිතොසි, වඤ්චාකරන ලද්දෙහි වී; ඉදානි, දැන්; යථාසුඛං, කැමැතිපරිද්දෙන්; ගච්ඡ, නැඟි යා; විශෙෂයෙන් තා වඤ්චාකොටලිම් නැඟියායි කීවී.

208 සුංසුමාර ජාතකයයි.

---

272 දිට්ඨා මයා වනෙ රුක්ඛා අස්සකණ්ණා විභීටකා,
න තානි එවං සක්කන්ති යථා ත්වං රුක්ඛ සක්කසි.

මයා, මාවිසින්; වනෙ, වෙනෙහි; අස්සකණ්ණා, අශ්වකර්ණ නම්වූද හෙවත් හෙළමුරුත නම්වූද; විභීටකා, බුළු නම්වූද; රුක්ඛා, යම් වෘක්ෂකෙනෙක්; දිට්ඨා, දක්නාලදහුද, තානි, ඒ වෘක්ෂයෝ; රුක්ඛ, වෘක්ෂය; යථා ත්වං, යම්සේ තෝ; සක්කසි, ඔබතුබ සචාරණය කෙරෙහිද; එවං, එපරිද්දෙන්; න සක්කන්ති, නොඇවිදිත්-වෙනෙහි බොහෝවූ රුකුත් දුටුවිරැහ, තාසෙ සචාරණය කරත් නෝ නොවෙතියි මෙසේ වෘක්ෂව්‍යාජයෙන් වැද්ද හා බිණූ.

273 පුරාණකක්කරෙ අයං භෙත්වා පඤ්ජරමාගතො,
කුසලො වාලපාසානං අපක්කමිතී ජානතීති.

පඤ්ජරං, මැදිරිය; භෙත්වා, බිඳගෙන; ආගතො, ආවාවූ; අයං, මේ; පුරාණ, පුරාතනවූ; කක්කරෙ, කක්කරයා; වාලපාසානං, වාලයෙන් ඇඹරූ පාසයන් සම්බන්ධව හෙවත් වාලපාසයෙන් ගැල

වීමෙහි; කුසලො, දක්‍ෂවූයේ; අපක්කාමති, සන්‍තාප්‍රාප්තනොව පලායන්නේය; භාසති, මනුෂ්‍ය භාෂාවෙන් බණන්නේයි- බැණ බැණ පලායන්නේයයි සේයි.

209 කක්කර ජාතකයයි.

274 අමෙඹා කො නාමයං රුක්ඛො සිනපත්තො සකණ්ටකො,
යත්‍ථ එකප්පහාරේණ උත්තමඞ්ගං විභාවිතං.

අමෙඹා, පින්වත; සිනපත්තො, සුනුප්‍රපත්ඇති; සකණ්ටකො, කටුසහිතවූ; අයං, මේ; කො නාම, කිනම්ලද; රුක්ඛො, වෘක්‍ෂ යෙක්ද; යත්‍ථ, යම්රුකෙක්හි; එකප්පහාරේණ, එකප්‍රහාරයෙන්, උත්තමඞ්ගං, මස්තකය; විභාවිතං, බිඳිනලදද හෙවත් එකවට හිසද තුඩද යම්ගසෙක ගැසබිඳෙනලදද ඒ කිනම් රුකෙක්දයි පළමු වෘක්‍ෂස්වරූප දන්නේද අධිමාත්‍ර වේදනාවෙන් ගසනම පොවා නොදන විචාලේයයි සේයි.

275 ආචරිතායං විතුදං වනානි කට්ඨඞ්ගරුක්ඛේසු අසාරකෙසු,
අථාසද ඛදිරං ජාතසාරං යත්‍ථබ්භිදාගරුළො උත්තමඞ්ගන්ති.

අසාරකෙසු, හරනැත්තාවූ; කට්ඨඞ්ග රුක්ඛෙසු, කාෂ්ඨඅවයව ඇති සිම්බලිපාලිභද්දාදිවූ වෘක්‍ෂයන්හි; වනානි, වනයන්, විතුදං, විදිනාවූ, අයං, මේකණ්ඩගලකයා, ආචරිතා, ඇවිදින ලද්දේය හෙවත් පුරුදුය, අථ, පසුව, යත්‍ථ, යම්රුකෙක්හි, ගරුළො, පක්‍ෂියා, උත්තමඞ්ගං, උත්තමාඞ්ගසඞ්ඛ්‍යාත මස්තකය, අබ්භිදා, පැළීද එසේවූ, ජාත, හටගත්තාවූ, සාරං, හරඇති, ඛදිරං, කිහිරි රුකට, ආසදා, පැමිණියෙ.

210 කන්‍දගල ජාතකයයි.

(6) සවන දල්හවග්ගයයි.

276 අකාසි යොගගං ධුවමප්පමත්තො
සංවච්ඡරං බීරණත්‍ථම්භකස්මිං
ව්‍යකාසි සඤ්ඤං පරිසං විගය්හ
න නිස්සමො තායති අප්පපඤ්ඤං.

බීරණත්ථම්භකස්මිං, බීරණත්ථම්භකනම් ගල්ගානයෙහිදී, සංවච්ඡරං, හවුරුද්දක්, අප්පමත්තො, අප්‍රමාදව, ධුවං, ඒකාන්තයෙන්, යොග්ගං, සරඹය, අකාසි, කෙළේයී, පරිසං, පර්ෂදට, විගය්හ, බැස ඒසංගුඋ, ව්‍යාකාසි අකාසි, විකාරකෙළෙහිය, වැරදවියයිසේසි ඒ එසේමැයි, අප්පපඤ්ඤං, ප්‍රඥනැත්තාහු, කිස්සමො, හේනා මිහත් ශුමයකුදු, න තායති, රක්ෂානොකෙරේ.

277 එවං යාචනකො තාත සොමදත්ත නිගච්ඡති,
අලාභං ධනලාභංවා එවං ධම්මා හි යාචනාති.

තාත, පුත, සොමදත්ත, සොමදත්තය, යාචනකො, ඉල්වන්නේ. අලාභං, අලාභයකට වේවයි. ධනලාභංවා, ධනලාභයකට වේවයි කියා (මෙසේවූ); එවං, දෙකකට, නිගච්ඡති, පැමිණෙන්නේය එසේමැයි, යාචනා, යාච්ඤාවෝනම්, එවංධම්මාහි, මෙබඳුසවභාව ඇත්තෝමැයි.

211 සොමදත්ත ජාතකයයි

---

278 අඤ්ඤො උපරිමො වණ්ණො අඤ්ඤො වණ්ණොව
හෙඨිමො,
බ්‍රාහ්මණි ත්වේව පුච්ඡාමි කිං හෙඨා කිංච උප්පරී.

උපරිමො, මතුවූආකාරයාගේ, වණ්ණො, ආකාරය, අඤ්ඤො' අනිකෙක්මය, හෙඨිමො, යටවූආකාරයාගේ, වණ්ණො, ආකාරය, අඤ්ඤොඑව, අනිකෙක්මය, බ්‍රාහ්මණි, බැමිණිය, (ත්වෙව) ත්වංඑව, තිම, පුච්ඡාමි, විචාරමි, හෙඨා, යට, කිං, කවරනම් බතෙක්ද, උප්පරි, මතුභාගයෙහි, කිංච, කවරනම් ආකාරයෙක්ද-අතලූ බතනම් යටහුණුව මතුභාගය සිහිල්ව තුබූමනාතැන දූන් මේ බත යට සිහිල්ව මතුභාගබත හුණුවිය මේකිනම් කාරණයෙක්ද විචාළ.

279 අහං නටොස්මි භද්දන්තෙ භික්ඛකොස්මි ඉධාගතො,
අයං හි කොට්ඨමොතිණ්ණො අයං සොයං ගවෙසසීති.

භද්දන්තෙ, තොපට වැඩෙක්වේවයි: අහං, මම, නටොඅස්මි, නටයෙක්මි, භික්ඛකො, භික්ෂාඑෂණායනයකරන්නෙමි, ඉධාගතො අස්මි, මෙයට ආයෙම්වීමි, අයංහි, තෙල ඇගේ සොරසැමියා එනාහි, කොට්ඨං, කොටුවට, ඔතිණ්ණො, බටයමෙකු, සො, හේ

හෝ, ගවේසයි, සොයයිද, අයං, මේ භෝය-කාගේ ඉඳුල්බතෙක් ද්‍යෙහෝයි යමක්හු නොපිසොයව්ද ඒ තෙල සොරසැම්වූයේ බතකමින් සිට තොප දැකලා කොටුවට වනැයි දැක්වූයයි සේයි.

## 212 උච්චිට්ඨභත්තජාතකයයි.

280 ඉසීනමන්තරං කත්වා භරුරාජාති මෙ සුතං,
උච්ඡින්නො සහ රට්ඨෙහි සරාජා විභවං ගතො.

භරුරාජා, භරුනම්රජ, ඉසීනං, තපස්වීන්ට, අන්තරං, අනතුරාය, කත්වා, කොට, සහ රට්ඨෙහි, රාජ්‍යයෙහා සමග, උච්ඡින්නො, උච්ඡින්නවූ, සරාජා, හේරජ, විභවං, විනාශයට, ගතො ඉති, ගියේයයි, මෙ, මාවිසින්, සුතං, අසනලදී.

281 තස්මා හි ඡන්දාගමනං නප්පසංසන්ති පණ්ඩිතා,
අදුට්ඨචිත්තො භාසෙය්‍ය ගිරං සච්චූපසංහිතන්ති.

තස්මා හි, එසේහෙයින්, ඡන්දාගමනං, ඡන්දාගතිය, පණ්ඩිතා, ප්‍රාඥයෝ, නප්පසංසන්ති, ප්‍රසංසා නොකරෙත්; අදුට්ඨචිත්තො, අදුෂ්ටවූ සිත්ඇත්තේ, සච්ච, සත්‍යයෙන්, උපසංහිතං, යුක්තවූ, ගිරං, තෙපුල්, භාසෙය්‍ය, බණන්නේයි.

## 213 භරුජාතකයයි.

282 පුණ්ණං නදිං යෙන ච පෙය්‍යමාහු
ජාතං යවං යෙන ච ගුය්හමාහු,
දූරං ගතං යෙන ච අව්හයන්ති
සොත්‍යාගතො හන්ද ච භුඤ්ජ බ්‍රාහ්මණ.

පුණ්ණං, පිරුනාවූ, නදිං, ගඞ්ගාව, යෙ නව, යමක්හුවිසින්, පෙය්‍යං, පියයුතුයයි, ආහු, කිව්ද, ජාතං, හටගත්, යවං, යවය, යෙ නව, යමක්හුවිසින්, ගුය්හං, සැඟවෙන්නට සුදුසුයයි, ආහු, කිව්ද, දූරං, දුරට, ගතං, ගියාහු, යෙ නව, යමක්හු කාරණකොට ගෙන, අව්හයන්ති, කියද්ද, සො, හේ, තෙ, තට, ආගතො, ආය හෙවත් ගෙනෙනලද, හන්දව, එබැවින්, බ්‍රාහ්මණ, බමුණ, භුඤ්ජ, අනුභවකර- යම්කලෙක්හි ගඞ්ගාව පිරුණේ වී නම් එකල්හි තීරයෙහි හිඳ ශ්‍රීඩාප්‍රහාරණයකොට පැන්බොන්නවද කාකයන්

වත් පිළිවිත්තුසි ගඞ්ගාවගේ පූර්ණභාවය ප්‍රකාශකරන්නේ "කාකපෙය්‍යානදී"යි ව්‍යවහාරකෙරෙති එසේහෙයින් "පුණ්ණං නදිං යේන ච පෙය්‍යමානු" යනමෙයිනුදු කාකයා දක්වූහ, "යවං" කියා දෙශනාවශයෙන් දක්වූ බව මුත් ව්‍රීහ්‍යාදිවූ සුහුඹුල්ව හටගත් යම් සස්‍යක්ෂෙත්‍රයෙක් ඇත්නම් කාකයාවිසින් නැගවෙන්නට සුදුස්සෝනුසි "ජාතං යවං යෙන ච ගුය්හමානු" යන්නෙනුදු කාකයා දක්වූහ, ඹමක්හුගේ ප්‍රවාසයට ගියකල බන්ධුමිත්‍රාදීහු කවුඩෙක් හඬයි මෙතම් අපගේ නෑයෝ එනවවනැයි කියන්නෝ ඒ කාකයා කාරණකොටගෙන කියන්නාහුනම් වේද්ද එසේහෙයින් "දූරං ගතං යෙන ච අව්හයන්ති" යනමෙයිනුදු කාකයා දක්වූහ, මෙසේ දක්වා හැමතැනම "යෙන"යි අනියම පදයෙන් දක්වූහු, තොපට ගෙනායේයයි කීමෙන් පරීක්ෂාශුන්‍යයෙක් ඇත්නම් ගෙනායේ කාකමාංශයෙකැයි මෙනිශ්‍රමයෙන් දතගන්වයි යන අභිප්‍රායයි.

283 යතො මං සරතී රාජා වායසම්පි පහෙතවෙ,
හංසා කොඤ්චා මයූරා ච අසතියෙව පාපියාති.

රාජා, රජතෙම; වායසම්පි, කාකමාංශයකුදු; පහෙතවෙ, එවනපිණිස; යතො, යම්කලෙක්හි; මං, මා; සරති, සිහිකෙරේද එහෙයින්; හංසා, හංසයෝය; කොඤ්චා, කොස්ලිහිණියෝය; මයූරාච, මොනරුය; යනමොවුන් ලදකල්හිම කුමැයි සඳහන් නොකෙරේද්ද එසේමැයි; අසතියෙව, සම්රණය නොකිරීමම; පාපියා, ලාමකයි- කාකමාංශය පොවා ලදින් සඳහන් කොලෝ හංසාදිවූ විශෙෂ මාංශයක් ලදින් සඳහන් කරන්නෝමය මෙපමණ මසකුත් එවන්නට සඳහන්කළබවම යහපතැයි සේයි.

214 පුණ්ණනදීජාතකයයි.

---

284 අවධි වත අත්තානං කච්ඡපො ව්‍යාහරං ගිරං,
සුග්ගහීතස්මිං කට්ඨස්මිං වාචාය සකියා වධි.

කච්ඡපො, කුර්මයා; ව්‍යාහරං, බණින්නේ; අත්තානං, තමන්, වත, එකාන්තයෙන්; අවධී, නැසීය; සුග්ගහීතස්මිං, මුඛයෙන් මනාකොට ගන්නාලද, කට්ඨස්මිං කාෂ්ඨයෙහි; සකියා, ස්වකීයවූ; වාචාය, තෙපුලෙන්; වධි. තෙමේම නමානැසී- සුවිසේ දණ්ඩෙහි ඩැහැ හංසයන් විසින් ගෙනයනලද වන්නේ තමාගේ මුඛර

ප්‍රකෘතිය එබඳු ස්ථානයෙහි පොවා රැක්කනොහී දණ්ඩ ඩැහැගත් කට හැරබෙණෙම්යී බිමහී විනාශයට ගියේයයි දෙසී.

285 එතම්පි දිස්වා නරවිරියසෙට්ඨ
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං
පස්සසි බහුභාණෙන, කච්ඡපං ව්‍යසනං ගතන්ති.

නරවිරියසෙට්ඨ, නරවීර්‍ය්‍යයන්කෙරෙහි ශ්‍රේෂ්ඨය; එතම්පි, මේ; දිස්වා, දැක; කුසලං, සත්‍යාදීන් ප්‍රතිසංයුක්තවූ; වාචං, තෙපුල්; පමුඤ්චෙ, හරණේය හෙවත් නිර්දෝෂ කොට බණන්නේය; අතිවෙලං, අතික්‍රාන්ත වූ වේලා ඇතිකොට, නපමුඤ්චෙ, නොබණන්නේය, කච්ඡපං, කූර්මයා; බහුභාණෙන, බොහෝකොට බිණීමෙන් ව්‍යසනං, ව්‍යසනයට හෙවත් බිමහී මියයාමට; ගතං, ගියාහු; පස්සසි, ප්‍රත්‍යක්ෂකොට දක්නෙහිද- මුඛරතාවෙහි දෝෂප්‍රත්‍යක්ෂ කොට දුටුයෙහි වේද එතෙකින් දෙඩමළුනොවයි අවවාද කළෝ.

215 කච්ඡපජාතකයයි.

---

286 නවායමග්ගී තපති න සූලො සාධු තච්ඡිතො,
යච මං මඤ්ඤති මච්ඡී අඤ්ඤං සො රතියා ගතො.

අයං, මේ; අග්ගි, ගිනි; මං, මා; න තපති, නොතවයි; සාධු, මනාකොට; තච්ඡිතො, සස්නාලද; සූලො, හුලද; නතපති, නොතවන්නේයි; යංච, යම්බඳුවූ; මං, මා; මච්ඡී, මැසිනි, සො, හේ මාගේ මත්ස්‍යයා, අඤ්ඤං, අනික් මැසින්නකසම්පයට; රතියා, කාමරතියපිණිස, ගතො,ගියේයයි; මඤ්ඤති,සිතූද-ඇගේ චින්තාව මා තවන්නේයයි දේසී.

287 සො මං ඩහති රාගග්ගි චිත්තංචූපතපෙති මං,
ජාලිනො මුචඑසිරා මං න කාමෙ හඤ්ඤතෙ ක්වචිති.

සො, හේ; රාගග්ගි, රාගගින්න; මං, මා; ඩහති, දවයි; චිත්ත ච, සිතද; මං, මා; උපතපෙති, තවන්නේය; ජාලිනො, කෙවුළෙනි; අයිරා, ස්වාමිනි; මං, මා; මුචඑ, හැරපියව්; කාමෙ, කාම යෙහිපිහිටි පුරුෂයා; ක්වචි, කිසිවෙක්; නහඤ්ඤතෙ, නොනසා නොහොත් “කාමෙ”යනු හෙතුඑයෙහි සප්තමීහෝයි; කාමෙ,

කාමයන් හෙතුකොටගෙන (මැසින්න පස්සෙ දුවින්නේ); ඛිචි, කිසි නොපසේවූවන් විසින්; නඝඤ්ඤතෙ, මිරණු නොලබන්නේයි.

## 216 මච්ඡජාතකයයි.

288 සබ්බො ලොකො අත්තමනො අහොසි
අකොවිදූ ගාමධම්මස්ස සෙග්ගු,
කොමාරිකො නාම තවජ්ජ ධම්මො
යං ත්වං ගහිතා පවනෙ පරොදසි.

සබ්බො ලොකො, සියලුසත්වලොකයා; අත්තමනො, මේකාම සෙවනය හෙතුකොටගෙන සතුටුවූයේ; අහොසි, විය, සෙග්ගු, සෙග්ගුනම් තැනැත්තිය; ගාම්ධම්මස්ස, ග්‍රාමධර්මයෙහි; අකො විදූ, අදක්‍ෂයෙහිද; කොමාරි, කුමාරිකාව; ත්වං, තෝ; යං, යම් හෙයකින්; ගහිතා, (කාමසන්ථවය පිණිස මා විසින් අත්) ගන්නා ලද්දෙහි; පවනෙ, මහවල: අජ්ජ, අද; පරොදසි, හඬන්නෙහිය; තව, තීගේ; ධම්මො, ස්වභාවය; කො නාම, කෙනම්ද.

289 යො දුක්ඛඵුට්ඨාය භවෙය්‍ය තාණං
සො මෙ පිතා දුබ්භි වනෙ කරොති,
සා කස්ස කන්දාමි වනස්ස මජ්ඣෙ
යො තායිතා සො සහසා කරොතීති.

යො, යමෙක්; දුක්ඛ, දුකින්; ඵුට්ඨාය, පහරණලද්දියට, තාණං, සරණ: භවෙය්‍ය, වේද; මෙ, මාගේ; සො පිතා, හේපියේ; වනෙ, වෙනෙහි; දුබ්භි, ද්‍රොහක්‍රියාවක්; කරොති, කෙරෙයි: සා; ගේ මම; වනස්ස, වනයාගේ; මජ්ඣෙ, මැද, කස්ස, කවරෙක්හට; කන්දාමි, හඬම්ද; යො, යමෙක්; තායිතා, රක්‍ෂාකරන්නේද; සො, හේ (රක්‍ෂාවට යොග්‍යවූ අපගේ) පියේ; සහසා, සාහසිකවූ හෙවත් දරුණුවූ ක්‍රියාවක්; කරොති, කෙරේ- දුකක්සම්භවූකල ඒ දුකින් නගාගන්නට සුදුසුවූ පියාණන් වල්මැද මේ සාහසික ද්‍රොහික්‍රියා වක් කෙරෙම්යි ප්‍රයුක්තාකල කාට කියම්දැයි හැඬු.

## 217 සෙග්ගුජාතකයයි.

290 සයස්ස සායෙය්‍යමිදං සුචින්තිතං
පච්චොඩ්ඩිතං පතිකූටස්ස කූටං,
ඵාලං චෙ අදෙය්‍යුං මූසිකා
කස්මා කුමාරෙ කුලලා නො හරෙය්‍යුං.

සඞ්ඛස්ස, ශඞ්ඛයහට; ඉදං, මේ; සාධෙය්‍යං, ශඞ්ඛාවිය; සුචින්තිතං, මනාකොට සිතනලද; කූටස්ස, කූටයහට; පතිකූටං, ප්‍රතිකූටය; පබෙබාධිතං, සුදුසුකොට කරනලද; වෙ, ඉදින්; මූසිකා, මූසිකයෝ; ඵාලං, යපළු; අදෙය්‍යුං, කෑවුනම්; කුලලා, උකුස්සෝ; කුමාරං, කුමාරයා; කස්මා, කුමක්හෙයින්; නොහරෙය්‍යුං, නොගෙනයෙද්ද- කෛරාටිකවූ උපායෙන් පරප්‍රතිබද්ධවූ වස්තුව කෑහැක්කැයි සිතාගත්තූ ශඞ්ඛයහට නැවත මූගේ ශඞ්ඛප්‍රවෘත්තියට ශඞ්ඛාවය ක්‍රමිසී සිතාගත ප්‍රතිශාධෙය්‍යය සැළසේ සුදුසුයයි කියා ප්‍රශංසාකොට මූගේ යපළු මීයන් කෑසැල තාගේ පුතු උකුස්සෝ කුමට නොගෙනයෙද්දයි කීවී.

291 කූටස්ස හි සන්ති කූටකූටා
භවතිචාපි නිකතිනො නිකතනා,
දෙහි පුත්තනට්ඨ ඵාලනට්ඨස්ස
ඵාලං මා තෙ පුත්තමහාසි ඵාලනට්ඨොති.

කූටස්ස හි, කූටයහට වනාහි; කූටකූටා, කූටාති කූටයෝ; සන්ති, ඇත; අපි, නැවත; නිකතිනො, වඤ්චාප්‍රයොග ඇත්තාහට; නිකතනා, අතික්‍රම වඤ්චාවෙන්යුක්ත පුද්ගලයෙක්; භවතිව, වන්නේමය; පුත්තනට්ඨ, පුත්‍රනෂ්ටය; ඵාලනට්ඨස්ස, යපළුනට තැනැත්තවුට; ඵාලං, යපළු; දෙහි, දේ; ඵාලනට්ඨො, යපළුනටතැනැත්තේ; තෙ, තාගේ; පුත්තං, පුත්‍රයා; මාඅහාසි, නොගෙනයේවා- මීයෝ යපළුකෑවූයයි වඤ්චාකොට පියම්සී සිතූ තාසේවූ කූටයන්ට වඩා කූටයෝ ඇත පුත්‍රයා නැෂ්ට පුරුෂය මීයෝ කා සිතා වඤ්චාකොට ගත් යපළු දිපිය හේ යපළු ලදින් තා පුතු දිපියයි එසේ තුදුන්තෙහි නම් නොදී ගෙනයෙයි කියා නිශ්චය කළෝ.

218 කූටවාණිජජාතකයයි.

292 හිරඤ්ඤං මෙ සුවණ්ණං මෙ එසා රත්තිං දිවා කථා,
දුම්මෙධානං මනුස්සානං අරියධම්මං අපස්සතං.

මෙ, මාගේ; හිරඤ්ඤං, මසුරණ; මෙ, මාගේ; සුවණ්ණං, රත්‍රනැයි; දිවා, දහවල්හිද; රත්තිං, රාත්‍රියෙහිද; දුම්මෙධානං, ප්‍රඥාරහිතවූ; අරියධම්මං, ආය්‍යීධර්මය; අපස්සතං, නොබලන්නාවූ; මනුස්සානං, මිනිසුන්ගේ; එසාකථා, මේකථායි- දෙශනා ශිෂීයෙන් රත්‍රන්මසුරන් නී බවමුත් සියලු දශවිධ රුවන් සියලු පුඞ්බීනා

අපරනාත ක්ෂෙත්‍රවස්තු ගව මහිසාදි සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තු විෂයකොට පවත්නා කථාවූත් එයින්පිටත් අනිත්‍යාදි කථා වෙක්ම හෝ අනාර්ය්‍ය ස්වරූපඇති දුර්බුද්ධිමනුෂ්‍යයන්ට නැතැයි කියා ඔබ්බෙ උන්ගේ ප්‍රවෘත්ති කියන්නේ "ගව වෙ" යනාදිනි.

293 වෙ වෙ ගහපතයො ගෙහෙ එකො තත්ථ අමස්සුකො,
ලම්බත්ථනො වෙණිකතො අථො අඞ්කිතකණ්ණකො,
කීතො ධනෙන බහුනා සො තං විතුදතෙ ජනන්ති.

ගෙහෙ, ගෙහි; ගහපතයො, ගෘහපතීහු; වෙ වේ, දෙදෙනෙක් දෙදෙනෙක; තත්ථ, උන්දෙදෙනා අතුරෙන්; එකො, එකෙක්; අමස්සුකො, දැලිනැත්තේය; ලම්බත්ථනො. එල්ලෙන තනඇත්තේය; වෙණිකතො, නානාප්‍රකාරයෙන් බඳනාලද සිළු ඇත්තේය;අථො, නැවත; අඞ්කිතකණ්ණකො, විදිනාලද කන්ඇත්තේය; බහුනා, බොහෝවූ; ධනෙන, වස්තුවෙන්; කීතො, ගෙනසනලද්දේය, සො, හේ ගෘහපතිතෙම; තංජනං, ඒ ගෘහජනයා; විතුදතෙ, මුඛ ශස්ත්‍රාදීන් විදිතේයි-ගෙයකැයි කොට ඊට දෙන්නෙක් නායකව ගෙන වෙසෙති උන්දෙන්නා කෙරෙහුත් එකෙකුගේ නිකට රෝම නැත තනදෙක එල්ලෙයි නොයෙක්ලෙසට සංස්ථාපිත සිළු ඇත්තේ එල්ලෙන කන් ඇත්තේ ඌද මව්පිය දෙදෙන නාගවා ආභරණාදීන් සදා වාහනයකට නගා බොහෝ වස්තුද ගෙනයෙති ස්ත්‍රිය පිණිස කියා ඉතිදු ගෘහනායක පුරුෂයා තැලෑමර තුළුමර යනාදීන් මුඛශස්ත්‍රයෙන් විද පාපසඤ්චය කරනබව්මුත් මෙයින් පිටත් ස්කන්ධාදි ධර්ම්මයන් උදව්‍යයවශයෙන් බලන්නෝම නැතැයි වාතර රජ වා'තරසෙනාවට මිනුෂ්‍යලොකයෙහි ප්‍රවෘත්තිනී.

## 219 ගරහිතජාතකයයි.

294 සුඛං ජීවිතරූපොසි රට්ඨා විවනමාගතො,
සො එකකො අරඤ්ඤස්මිං රුක්ඛමූලෙ කපණො විය ඣායසි.

සුඛං, සුවසේ; ජීවිත රූපොසි, ජීවත්වූ ස්වරූප ඇත්තෙහි; හෙවත් නිදුකින් වැඩිලෙස් ඇත්තෙහි;රට්ඨා,රටින්;විවනං,ජලරහිත අරණ්‍යයට; ආගතො, ආයි; සො, හේතෝ; එකකො, එකාකීව, අරඤ්ඤස්මිං, අරණ්‍යයෙහිවූ; රුක්ඛමූලෙ, වෘක්ෂමූලයෙහි; කපණො විය, කෘපණයකු මෙන්; ඣායසි, සිතයි- හේ කුමනනම් සිතිවිල්ලෙක්දැයි විචාළෝ.

295 සුඛං ජීවිතරූපොස්මි
රට්ඨා විවනමාගතො
සො එකකො අරඤ්ඤස්මිං
රුක්ඛමූලෙ කපණො විය ඣායාමි
සතං ධම්මමනුස්සරන්ති.

සුඛං, සුවසෙන්; ජීවිත, ජීවත්වූ; රූපොස්මි, සවරූප ඇත්තෙමි හෙවත්තොපනීවාසේ නිදුනිත්වැඩියෙමි;රට්ඨා,සවනීයවූ රාෂ්ට්‍රයෙන්; විවනං, ජලනැත්තාවූ වලට; ආගතො, ආයිමි; සො, ගේ ආවාවූ මම; එකකො, හුදකලාව; අරඤ්ඤස්මිං, වල්හි; රුක්ඛමූලෙ, ගස්මුල; කපණො විය, බැගෑවිත්තුමෙන්; සතං,සත්පුරුෂයන්ගේ; ධම්මං, ධර්මය; අනුස්සරං, සිහිකරන්නෙමි; ඣායාමි, සිතමි- යම් හෙයකින් බුඩාදිවූ සත්පුරුෂයෝ ලාභාලාභාදිවූ අෂ්ටලොක ධර්මයෙන් මඩනාලදුව කම්පානොවේද්ද මමද ඒසත්පුරුෂයන් ගේ ධර්ම ඇත්තෙමි සමරණය කරන්නෙමි හුන්නෙමි හැඟවූහ.

220 ධම්මද්ධජ ජාතකයයි

(7)සත්වන බීරණත්ථම්භ වර්ගයයි.

———ංඃ:ං———

296 අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති,
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

අනික්කසාවො, ප්‍රහීනනොකරනලද ලොභවෙෂාදී සඞ්ඛ්‍යාත කෂායඇති; යො, යමෙක්; කාසාවං, කාෂායරසයෙන් යුක්ත; වත්ථං, වස්ත්‍රය; පරිදහෙස්සති, හඳගේ පොරෝනේද; දම, ඉන්ද්‍රිය දමනයෙන්හා; සච්චෙන, නිර්වාණසඞ්ඛ්‍යාත පරමාර්ථ සත්‍යයෙන් නොහොත් චතුස්සත්‍යයන් විසින්; අපෙතො, දුරුකරනලදද නො හොත්;සච්චෙන,යනු පචමාර්ථයෙහි තෘතීයායි ගෙන;(දමසච්චමනා, ඉන්ද්‍රිය දමනයහා පරමාර්ථ සත්‍යයන් කෙරෙන්;) අපෙතො, පහවූ; සො, ඒපුද්ගලයා; කාසාවං, කාෂායරසපීතවස්ත්‍රයට; න අරහති, නුසුදුසුයි.

297 යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො,
උපෙතො දමසච්චෙන සවෙ කාසාවමරහතීති.

යො ච, යමෙක් වනාහි; වන්තකසාවො, වින්තනසන්තානයෙන් දුරුකරනලද ලොභාදික්ලෙශකෂාය ඇත්තේ; අස්ස,වේද; සීලෙසු,

මාර්ගශීලයෙහිද ඵලශීලයෙහිද; සුසමාහිතො, සම්‍යක්ආහිතද හෙවත් මනාකොට පිහිටියේද; දම, ඉන්‍ද්‍රියදමනයෙන් හා; සච්චෙන, නිර්‍වාණසඞ්ඛ්‍යාත පරමාර්‍ථසත්‍යයෙන් නොහොත් චතුස්සත්‍යයෙන්; උපෙතො, යුක්තද; සො, එතෙම; වෙ, ඒකාන්තයෙන්; කාසාවං, අර්හත්ධ්වජවූ කාෂාය වස්ත්‍රයට; අරහති, සුදුසුයි.

221 කාසාව ජාතකයයි.

——— 00 ———

298 ඉදං තදාචරිවචො පාරාචරියො සදබ්‍රවී,
මාසු ත්වං අකරි පාපං යං ත්වං පච්ඡා කතතාපෙ.

පාරාචරියො, පාරාචරියනම් බ්‍රාහ්මණතෙම; පාපං, පාපය; ත්වං, තෝ; මාඅකරා, නහමක්කරයි; යං, යම්බඳුපාපයක්; කතං, කරනලද්ද; ත්වං, තෝ; පච්ඡා, පසුව; තපෙ, තැවෙන්නේයකියා; යං, යම්වචනයක්; තදා, එකල්හි; අබ්‍රවී, කීද; ඉදං, මේ; ආචරිය වචො, ආචාර්‍ය්‍යයාගේ බසි- ආචාර්‍ය්‍යයා කී දෙයම මට වූයේයයි කී.

299 යානි කරෙති පුරිසො තානි පස්සති අත්තනි,
කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපකං,
යාදිසං වපතෙ බීජං තාදිසං හරතෙ ඵලන්ති.

පුරිසො, පුරුෂයා; යානි, යම් පාපකෙනකුත්; කරෙති, කෙලේද; තානි, ඒපාපයන්; අත්තනි, තමාකෙරෙහි; පස්සති, දක්නේය; කල්‍යාණකාරී, දානාදිවූ කල්‍යාණක්‍රියාකරන්නේ, කල්‍යාණං, කල්‍යාණයක්; පස්සති, දකී; පාපකාරීච, ඒපව්කරන පුරුෂයාද; පාපකං, ලාමකවූ අනිෂ්ටයක්ම; පස්සති, දකී, හේ ලොකයෙහයින්සාධ්‍යයි, යාදිසං, යම්බඳුවූ, බීජං, බිජුවටක්, වපතෙ, වපුරාද ,තාදිසං, එබඳුවූ, ඵලං, ඵලයක්, හරතෙ, ගෙනයන්නේයි- සාලිබීජරොපනය කෙලේ හේ සාලිබීජයහා සදෘශවූ සාලිඵල ප්‍රතිලාභය කෙරේද කොද්‍රවාදීන්ගේ ප්‍රතිලාභය නොකෙරේද එපරිද්දෙන් කුශල ක්‍රියාවේ ප්‍රයුක්ත සත්පුරුෂයා එයට අනුරූප ස්වර්ගාදියෙහි උත්පත්ති ප්‍රතිලාභයකොට චක්ෂුරාදිද්වාරයන්ට ඉෂ්ටවූ රූපාදි කල්‍යාණවස්තු ප්‍රතිලාභය කෙරෙයි ඉතරවූ අනිෂ්ටයෙක් නොලැබේ.

222 චුල්ලනන්දිය ජාතකයයි.

——— 0 ———

300 නමෙ නමන්තස්ස භජෙ භජන්තං
කිච්චානුකුබ්බස්ස කරෙය්‍ය කිච්චං
නානත්ථකාමස්ස කරෙය්‍ය අත්ථං
අසම්භජන්තම්පි න සම්භජෙය්‍ය.

නමන්තස්ස, නමස්කාරකරන්නාහට; නමෙ, ප්‍රතිවන්දනය කරන්නේය; භජන්තං, තමා සෙවිනාහු; භජෙ, සෙවිනේය; කිච්චං, තමාගේ උපන් කෘත්‍යයට, අනුකුබ්බස්ස, අනුකෘත්‍ය කරන්නාහට හෙවත් තමාගේ කෘත්‍යප්‍රතිපාදනයෙහි ප්‍රයුක්තයහට, කිච්චං, ප්‍රතික්‍රියා, කරෙය්‍ය, කරන්නේය, අනත්ථකාමස්ස, අනර්ථකාමීහට, අත්ථං, අර්ථයක් හෙවත් වැඩක්, න කරෙය්‍ය, නොකරන්නේය, අසම්භජන්තම්පි, තමා නොසෙවිනමුදු, න සම්භජෙය්‍ය, තෙමේද නොසෙවිනේය.

301 චජෙ චජන්තං වනථං න කයිරා
අපෙතචිත්තෙන න සම්භජෙය්‍ය
ද්විජො දුමං ඛීණඵලන්ති ඤත්වා
අඤ්ඤං සමෙක්ඛෙය්‍ය මහා හි ලොකොති.

චජන්තං, තමා හරන්නහු; චජෙ, තෙමේද හරන්නේය, වනථං, ඔහුකෙරෙහි තෘෂ්ණායයි කියනලද වනථය; න කයිරා, නොකරන්නේය; අපෙත චිත්තෙන, පහවූ චිත්තයෙන් හෙවත් විපර්‍යාස චිත්තයෙන්, න සම්භජෙය්‍ය, නොසෙවිනේය, එසේමැයි, දුමං, වෘක්ෂය, ඛීණඵලං ඉති, ක්ෂීණවූ ඵලයයි, ඤත්වා, දැන, ද්විජො, ද්විජයා, අඤ්ඤං, අනික් රුකක්, සමෙක්ඛෙය්‍ය, සොයා ගන්නේය, ලොකො, ලෝකය; මහාහි, මහත- අවශ්‍යයෙන් තොප කෙරෙහි සෙනෙහ පුරුෂයකු ලබන්නාවාදැයි කීව.

223 පුටභත්තජාතකයයි.

---

302 යස්සෙතෙ චතුරො ධම්මා වානරින්ද යථා තව,
සච්චං ධම්මො ධිති චාගො දිට්ඨං සො අතිවත්තති.

වානරින්ද, වානරේශ්වරය, සච්චං, වාක්සත්‍යයද; ධම්මො, පරීක්ෂාඥාන ධර්මයද; ධිති, අකම්ප්‍යවූ ධෛර්‍ය්‍යයද, චාගො, නිස්සඞ්ගත්‍යාගයද යන, එතෙ, මේ, චතුරො ධම්මා, ධර්මයෝ සතර දෙන, යථා තව, තට මෙන්, යස්ස, යම් පුද්ගලයක්හට විද්‍යමාන යෝද, සො, හේ පුරුෂයා, දිට්ඨං, සතුරා, අතිවත්තති, ඉක්මපවතී.

303 යස්ස එතෙ න විජ්ජන්ති ගුණා පරමභද්දකා,
සච්චං ධම්මො ධිති චාගො දිට්ඨං සො අතිවත්තති.

සච්චං, සත්‍යය; ධම්මො, ප්‍රඥාවය, ධිති, ධෛර්‍ය්‍යය, චාගො, ත්‍යාගයයත; එතෙ, මේ; පරමභද්දකා, විශෙෂයෙන් භද්‍රවූ, ගුණා, ගුණයෝ; යස්ස, යමක්හට; නවිජ්ජන්ති, නැත්තාහුද; සො, හේ කියනලද ගුණරහිත පුද්ගලයා; දිට්ඨං, සතුරා; නාතිවත්තති, ඉක්ම පැවැත්ත නොහේ.

## 224 කුම්භිලජාතකයයි.

---

304 අත්‍ථි මෙ පුරිසො දෙව සබ්බකිච්චෙසු ව්‍යාවටො,
තස්සෙකොපරාධත්‍ථි තත්‍ථ ත්‍වං කින්ති මඤ්ඤසි.

දෙව, දේවයෙනි; මෙ, මාගේ; සබ්බකිච්චෙසු, සියලුකෘත්‍යයෙහි; ව්‍යාවටො, ව්‍යාවෘතවූ; පුරිසො, පුරුෂයෙක්; අත්‍ථි, ඇත; තස්ස ච, ඔහුගේද; එකො අපරාධො, එක් අපරාධයෙක්; අත්‍ථි, ඇත; තත්‍ථ, ඒ අපරාධයෙහිලා; ත්‍වං, තෝ; කින්ති, කුමක්නම්; මඤ්ඤසි, සිතයිද= මෙසේවූ අපරාධයට මේනම් දඬයෙක් කටයුත්තේයයි සිතූද ඒ සිත උපන් දණ්ඩනය මෙහෙයාද යන අභිප්‍රායයි.

305 අම්හාකම්පත්‍ථි පුරිසො එදිසො ඉධ විජ්ජති,
දුල්ලභො අඞ්ගසම්පන්නො ඛන්තිරස්මාකරුච්චති.

අම්හාකම්පි, අපගේ පවා; එදිසො, තොප කී පරිද්දෙන් බොහෝ ප්‍රයොජන ඇති මහාදෙෂවත්වූ; පුරිසො, පුරුෂයෙක්; අත්‍ථි, ඇත; (සෙද දුරකනොවෙයි) ඉධ, මෙතැන්හිම; විජ්ජති, ඇත; මෙතනම සිටියේයයි යෙසි; අඞ්ගසම්පන්නො, සියලු ගුණාඞ්ගයෙන් අවිකලවූ පුරුෂයෝ; දුල්ලභො, දුර්ලභයහ (එසේ හෙයින් මෙබඳු සත්‍වයෙහි); අස්මාකං, අපට; ඛන්ති, ක්ෂාන්ති; රුච්චති, අභිමතයයි- ලොකයෙහි සර්වතොභද්‍ර පුරුෂයෝ අරුම්යහ එකදෙෂයක් බොහෝ ගුණයෙහි නිමග්නවන හෙයින් බොහෝ ප්‍රයොජනාපෙක්ෂාවෙන් එක අපරාධයෙක් ක්ෂමාකරම්හ රාජෛශ්‍වර්‍ය්‍යයෙහි සිටි අපවැත්තවුන් අපරාධ සඞ්ග්‍රහය කරන කල තොපසේ වුවත් අපරාධ ක්ෂමාකළ ඤනා වේදූයි හිවිය.

## 225 ඛන්තිවණ්ණජාතකයයි.

---

306 කාලෙ නික්ඛමනා සාධු නාකාලෙ සාධු නික්ඛමො,
අකාලෙන හි නික්ඛම්ම එකකම්පි බහුජ්ජනො
න කිඤ්චි අත්ථං ජොතෙති ධඞ්කසෙනාව කොසියං.

නික්ඛමනා, නිෂ්ක්‍රමනය නොහොත් පරාක්‍රමය; කාලෙ, යුක්ත ප්‍රයුක්තකාලයෙහි; සාධු, ශොභනේය; අකාලෙ, නොකල්හි; නික්ඛමො; (තමාගේ නිවාසස්ථානයෙන්) නිෂ්ක්‍රමනය නොහොත් පරාක්‍රමය; න සාධු, ප්‍රශස්ත නොවෙයි; අකාලෙන හි, නොකල්හි ව නාහි; නික්ඛම්ම, නික්ම නොහොත් වීර්‍ය්‍යකොට; කිඤ්චි, කිසි; අත්ථං, අභිවෘද්ධියක්; න ජොතෙති, බබලන්නේ නොවෙයි; (ප්‍රයොජනයක් නොවිඳුන්නේයයි සේයි) එකකම්පි, හුදකලාවූ [illegible]; බහුජ්ජනො, බොහෝ ජනයෝ; කොසියං, බකමුහුණුවා; ධඞ්කසෙනාව, කාකසෙනාව මෙන් හෙවත් අකාලයෙහි වාසස්ථානයෙන් නික්මුණු බකමුහුණුවා කාකසමූහයා වැද පිරිවරා මැරුවාක් මෙන් කල් නොහැඳින නික්මීනද වීර්‍ය්‍යකළද ඔහු බොහෝදෙනා වටකොට විනාශයට පමුණුවන්නාහුයයි සේයි.

307 ධීරො ච විධි විධානඤ්ඤූ පරෙසං විවරානුගූ,
සබ්බාමිත්තෙ වසී කත්වා කොසියොව සුඛී සියා.

විධි, (පුරාතන පණ්ඩිතවරුන් ව්‍යවස්ථාකොට තබනලද ප්‍රවේණි) විධියගේ; විධානඤ්ඤූ, විධාන දක්නාවූ නොහොත්; විධානඤ්ඤූ, සංවිධානක්‍රමය දන්නාවූ; පරෙසං, මෙරමාගේ; විවරානුගූ, විවරයන්ට අනුව යන්නාවූ නොහොත් විවරය දන්නාවූ; ධීරො ච, ප්‍රාඥවූ නාහි; සබ්බාමිත්තෙ, සියලු සතුරන්; වසී කත්වා, (තමාගේ) වසඟකොට; කොසියො ඉව, මේ බාලකොසිකයාකෙරෙන් පිටත් ප්‍රාඥකොසිකයා පරිද්දෙන්; සුඛී සියා, සුවපත්වූයේ වන්නේයි-ද්‍රක්‍ෂවිත්පුරුෂයා මේ කාලයෙහි නික්මිය යුත්තේය මේ කාලයෙහි වීර්‍ය්‍යකටයුත්තේයයි පුරාතන ව්‍යවස්ථාක්‍රමයෙහි ප්‍රවීණව ගෙන සතුරන්ගේ විනාශයට සුදුසු විවර දැන ත්‍රිසන්ධ්‍යාත කාලයෙහි නික්ම වීර්‍ය්‍යකොට කාකයන් ග්‍රීෂ්මදීනය කොට සුවසේ ගිය කොසිකයා මෙන් උපායක්‍රමය නොවරදවා තමා සතුරන් මැඩ සුවසේ වාසය කරන්නේය යන අභිප්‍රායයි.

226 කොසියජාතකයයි.

308 සූරො සූරෙන සංගාමෙ විකන්තෙන පහාරිතා
එහි නාග නිවත්තස්සු කින්නු භීතො පලායසි
පස්සන්තු අඞ්ගමගධා මම තුය්හං ච වික්කමං.

සූරෙන, ශෞර්‍ය්‍යගුණයෙන් යුක්තවූ; විකන්තෙන, වික්‍රමප්‍රකෘති ඇති; පහාරිතා, ප්‍රහාරදෘතාදෙන්නාවූ පුරුෂයා හා; සූරො, සූර පුරුෂයා; සංගාමෙ, එකස්ථානයට ප්‍රාප්තව; (අන්‍යෝන්‍ය ප්‍රහාරවිශෙෂයෙන් යුද්ධනොකොට කුමකටනම්යේද) නාග, හස්තිය; එහි, නැඟී ඒ; නිවත්තස්සු, නවතු; කින්නු, කුමටනම්; භීතො, භයප්‍රාප්තවූයෙහි; පලායසි, යෙහිද; මය්හං ච, මාගේද; තුය්හං ච, තාගේද; වික්කමං, ශෞර්‍ය්‍යය; අඞ්ග, අඞ්ගරට ඇත්තෝද; මගධා, මගධරට ඇත්තෝද; පස්සන්තු, බලත්වයි කියා- එතැන්හි වගුල රටිකක් බී මත්වූ අශුචියෙහි හොත් කුරුවැනියක් එතන යන ඇතෙකු දැක මෙසේ කියා සටන් ඉල්වූ.

309 න තං පාදා වධිස්සාමි න දන්තෙහි න සොණ්ඩියා.
මීළ්හෙන තං වධිස්සාමි පූති හඤ්ඤතු පූතිනාති,

තං, තා; පාදා, පාදයෙන්; න වධිස්සාමි, නොමරමි; දන්තෙහි, (මාගේ පවිත්‍රවූ) දළසඟලෙනුත්; න වධිස්සාමි, නොමරමි; සොණ්ඩියා, සොඬිනුත්; න වධිස්සාමි, නොමරමි; වැලිකුම්කින්දයත්? මීළ්හෙන, අශුචියෙන්ම; තං, තා; වධිස්සාමි, මරමි; පූතිනා, අශුචින්; පූති, අශුචිය; හඤ්ඤතු, නසතු ලැබේවායි- මෙසේ කියා ඌ ඇහට වචිස්පිණ්ඩයක් හෙළා මරා ඇත් නැඟී ගියේ.

227 ගූථපාණජාතකයයි.

---

310 තයො ගිරී අන්තරං කාමයාමි
පඤ්චාලා කුරුයො කෙකකෙ ච,
තතුත්තරිං බ්‍රාහ්මණ කාමයාමි
තිකිච්ඡ මං බ්‍රාහ්මණ කාමනීතං.

බ්‍රාහ්මණ,බමුණ;පඤ්චාලා,උත්තරපඤ්චාලයද;කුරුයො,කුරුරටද; කෙකකෙ ච,කෙකක නම් රටද යන;තයො ගිරී,මේ තුන්රාජ්‍යයන්ගේ; අන්තරං, රාජධානිසඞ්ඛ්‍යාත අන්තරයද; කාමයාමි, ප්‍රාර්ථනා කෙරෙමි;තතුත්තරිං,මා අනුභවකරමින් සිටි බාරාණසී රාජ්‍යයෙන් වඩා; කාමයාමි, අධිකයක් ප්‍රාර්ථනා කෙරෙමි; බ්‍රාහ්මණ, බමුණ; කාම

නීතං,කාමයෙන් විනාශයට පමුණුවනලද; මං, මා; නිකිච්ඡ, චිකිත් සාකර.

311 කණ්හාහි දට්ඨස්ස කරොන්තිහෙකෙ
අමනුස්ස වට්ටස්ස කරොන්ති පණ්ඩිතා,
න කාමනීතස්ස කරොන්ති කොචි
ඔක්කන්තසුක්කස්ස හි කා තිකිච්ඡාති.

කණ්හාහි, කෘෂ්ණසර්පයන් විසින්; දට්ඨස්ස, දෂ්ටකරන ලද්දහුට; එකෙ, සමහරකෙනෙක්; කරොන්ති හි, (මන්ත්‍රෞෂධාදීන්) චිකිත්සා කරන්නාහුමය;පණ්ඩිතා,(භූතවිකිත්සාවෙහි දක්ෂවූ) පඬිවරහු; අමනුස්ස, යක්ෂයාවිසින්; වට්ටස්ස, මඩනාලද්දහුට; කරොන්ති, (බලික්‍රියාපරිත්‍රාණසාකරණ මන්ත්‍රෞෂධාදී) චිකිත්සා කරන්නාහුය; කොචි,කිසිවෙක්; කාම, වස්තුකාමක්ලෙශකාමයෙන්; නීතස්ස, හානියට පමුණුවනලද්දහුට; නකරොන්ති, (අසාධ්‍යයෙන්) චිකිත්සාවක් නොකරන්නේය; ඒ එසේමැයි; ඔක්කන්ත සුක්කස්ස, අතික්‍රාන්තවූ ශුක්ලධර්ම ඇත්තාහට හෙවත් කුශලක්‍රියාව දුරුකොට අකුශලධර්මයෙහි පිහිටියාහට; කා තිකිච්ඡා, චිකිත්සානම් කවරේද? මන්ත්‍රෞෂධාදියෙන් යාප්‍යනොවෙයි සේයි.

228 කාමනීතජාතකයයි.

---

312 ගජග්ගමෙඝෙහි හයග්ගමාලිහි
රථූම්මිජාතෙහි සරාභිවස්සෙහි
ථරුග්ගහාවට්ටදළ්හප්පහාරිහි
පරිවාරිතා තක්කසිලා සමන්තතො.

ගජග්ග, (මදජලධාරානිසෙකයෙන් රම්‍යවූ ගම්භීරකොංචනාදසඞ්ඛ්‍යාත ගර්ජනාඇති)උත්තම හස්ති නමැති; මෙඝෙහි, මෙඝශ්‍රේණීන්ද; හයග්ගමාලිහි, අග්‍රවූ චතුරතර තුරඞ්ගමාලාවන් විසින්ද; සර, සර නමැති, අභිවස්සෙහි, වර්ෂාවන් ඇති, රථ, රථශ්‍රෙණි නමැති; ඌර්මිජාතෙහි, තරඞ්ගමාලාවන් විසින්ද; ථරුග්ගහ, කඩුමිට් ඇත්තාවූ;ආවට්ට,ඉතා පරිභ්‍රමනය කොට;දළ්හප්පහාරිහි, දෘඪප්‍රහාරදෙන යොධයන් විසින්ද; සමන්තතො, හාත්පසින්; තක්කසිලා, තක්ෂලානම් නගරීතොමෝ; පරිවාරිතා, වටකරනු ලැබෙද්ද එසේම පිරිවැරූයයි කිව්.

313 අභිධාවථා ච පතථා ච
විවිධවිනදිතා ච දන්තිභි
වත්තතජ්ජ තුමුලො ඝොසො
යථා විජ්ජුතා ජලධරස්ස ගජ්ජතොති.

විවිධ, නානාප්‍රකාරයෙන්; විනදිතා, මහානාදකරන්නාවූ තෙපි හැමදෙන; දන්තිභි, උත්තම හස්තීන් හා සමග; අභිධාවථ, දිවව්; පතථ, පනිව්; අජ්ජ, අද; තුමුලො, උද්ධතවූ; ඝොසො, ඝොෂාවෙක්; වත්තතු, පවතිවා; ගජ්ජතො, ගර්ජනාකරන්නාවූ; ජලධරස්ස, මෙඝයාගේ මුඛයෙන්; යථාවිජ්ජුතා, විද්‍යුත්සංචාරය මෙන් දිවන්නා උගානුවර වටකරවයි කිව්.

## 229 පලාසිජාතකයයි.

314 ධජමපරිමිතං අනන්තපාරං
දුප්පසහං ධංකෙහි සාගරම්ව
ගිරිම්ව අනිලෙන දුප්පසහො
දුප්පසහො අහමජ්ජතාදිසෙන.

ධජං, රථයෙහි මයුරපාදයෙහි නගතලද ධ්වජ; අපරිමිතං, සඞ්ඛ්‍යාතික්‍රාන්තය; අනන්තපාරං, මාගේ සෙනාව කියත් අන්තයක් නැත්තාවූ පාරඇත්තේ හෙවත් කෙළවර නැත්තේ; ධංකෙහි සාගරම්ව, කාකයා විසින් සාගරය මෙන් හෙවත් සමුද්‍රොල්ලඞ්ඝනයෙහි අසමර්ථකාකයා මෙන්; දුප්පසහං, දුප්පසහය හෙවත් පරසතුරන් විසින් මැඩපිය නොහැක්කේ; අනිලෙන ගිරිම්ව, මාරුතයෙන් පර්වතයක් මෙන් හෙවත් පර්වතවිලනයෙහි වාතය අයොග්‍යද එසේම, දුප්පසහො, මාගේ සෙනාව කිසිවෙක්හු විසින් විධ්වංසනය කොට නොහැක්කේය; අහං, මම; අජ්ජ, අද; තාදිසෙන, තාසේවූවන් විසින්, දුප්පසහො, මැඩපිය නොහැක්කෙම්යි බොධිසත්වයන් අවලු ගෙයි සිටියන් දූත කියා.

315 මා බාලියං විලපි නහිස්ස තාදිසො
විලය්හසෙ නහි ලභසෙ නිසෙධකං
ආසජ්ජසි ගජම්ව එකචාරිනං
සො තං පාදතලම්ව පොථයිස්සතීති.

බාලියං,(තාගේ)බාලභාවය; මා විලපි, න සමත් කිය හෙවත් අනාත්මවේදිව අහංකාර වචන ප්‍රකාශ කරන්නෙහි අඥානාව

යෙන් හඬන්නෙහියයි සේදී; තාදිසො, (අනන්‍යාබලාධිගත ඇත් තෙම් ආත්මතර්ජනය කරන්නාවූ)තාසේවූ (ආත් දේදී) පුරුෂයෝ; නැති අසස, රාජ්‍යශ්‍රීගුණයෙහි සම්පියෝ නොවේත්; විලය්හසෙ, හූ දෙක් රාග ද්වෙෂ මෝහාදි ක්ලේශ පරිදාහයෙන් දවනුලැබේ; නිසෙධකං,මා බඳුනිසෙධකයන්හු; නාගි ලභාසෙ,නොලැබෙයි හෙවත් මාවිලකන්ට සුදුස්සෝ නැතැයි සේයි; එකචාරිනං, මදගලිත එකචාරීවූ, ගජම්ව, හස්තිරාජයන්හු සමීපයට මෙන්; ආසජ්ජසි, එන්නෙහි; පාද, පාදයෙන් චූර්ණකළ; නළම්ව, හුණනලක් මෙන්; සො, තෙතෙම; තං, තා; පොථයිස්සති, පොථනය කොට චූර්ණ කෙරේ.

## 230 දුතියපලාසිජාතකයයි.

---

## (8) අමචන කාසාවවග්ගීයයි.

——— ०ः( )ः० ———

316 යථාපි කීතා පුරිසස්සුපාහනා
සුඛස්ස අත්ථාය දුඛං උදබ්බහෙ
ඝම්මාභිතත්තා තලසා පපීළිතා
තස්සෙව පාදෙ පුරිසස්ස ඛාදරේ.

පුරිසස්ස, පුරුෂයහට; සුඛස්ස අත්ථාය, සුවපිණිස; යථාපි, යම්සේ; කීතා, ගන්නාලද; උපාහනා, උපාහනයෝ; දුඛං, දුක්; උදබ්බහෙ, එළවද්ද; ඝම්ම, ඝර්මයෙන්; අභිතත්තා, විශේෂයෙන් තැවූනාවූ; තලසා, පාදයෙන්; පපීළිතා, පීඩිතවූවාහු; තස්සෙව, හෙම; පුරිසස්ස, පුරුෂයාගේ; පාදෙ, පාදයන්; ඛාදරෙ, කා චූර්ණ කරන්නාහුය.

317 එවමෙව යො දුක්කුලීනො අනරියො
තම්හාක විජ්ජං ච සුතං ච මාදිය
තමෙව සො තත්ථ සුතෙන ඛාදති
අනරියො වුච්චති පානදූපමො ති.

එවමෙව; එපරිද්දෙන්; යො, යම්; දුක්කුලීනො, හීනකුලයෙහි උපන්නාවූ; අනරියො, (ශ්‍රීආර්‍යපතුදෙකින් දුරුවූ) අනාචාරීපුද්ගලයා; තම්හාකා, ආචාර්‍යයා කෙරෙන්; විජ්ජං ච, විද්‍යාස්ථානයන්ද; සුතං ච, ශ්‍රුතයන්ද; ආදිය, ගෙන; තත්ථ, එහි; සුතෙන, ශ්‍රුතයෙන්; සො,

ගෙනෙම්; තමේව ඛාදනි, එම කන්නේය; අනරියො, අනාර්‍ය්‍යපුරුෂ යා; පානදූපමො, උපාහනූපමයයි; වුච්චති, කියනුලැබේ- "ත ඞ්ඛාක විජ්ජං ච" යනාදැත ගාථාබන්ධන සූවය පිණිස හුයඛයි.

## 231 උපාහනජාතකයයි.

318 එකචින්තිතොව අයමඤ්ඤො බාලො අපරිනායිකො,
නා හි බුජ්ජේන වාමෙන හොති සඞ්ඝන්තු මරහසි·

අයං, මේ; අඤ්ඤො, අපිය; එක, හුදකලාව; චින්තිතොව, සිතාලදද ගෙවත් මේ කුදුහා සමඟ පලාගිය මැතවැයි යනමේ අපිය තෙපිම සිතාගතුද; බාලො, මේකුද වයොවෑඩ වීනමුත් ඥාන විරහයෙත් බාලය; අපරිනායිකො, සවශක්තියෙන් යත්නට අයොගෘහෙඩින් අපරිනායකය; හොති, පින්වතිය; වාමෙත, කුණ්ඨවූ ගසනපාදයත්ඇති; බුජ්ජෙත, පිටිත්කුදුහා; සඞ්ඝත්තුං, සමාගමයට ඒළඹෙන්නට; නාහි අරහසි, සුදුස්සෙහි නොවෙයි·

319 පූරිසූසභං මඤ්ඤමානා අහං බුජ්ජ මකාමයිං,
සොයං සංකුචිතො සෙති ජිනානතන්ති යථා ටුණ්ණූති.

බුජ්ජං, කුදුපුරුෂයා; පූරිස, පුරුෂයන්ව, උසභං, වෘෂභයෙකැයි ගෙවත් උතුමෙකැයි; මඤ්ඤමානා, සිතත්තාවූ; අහං, මම; බුජ්ජං, කුදු; අකාමයිං, කැමැතිවීමි; සො අයං, හේ මා කැමැති කුදු; ජිනන, සිඳුනාලද; තන්ති, තත්තිඇති; යථාටුණ්ණ, වීණාදණ්ඩක් මෙන්; සංකුචිතො, සංකුචිතවූයේ හෙවත් ශීතයෙන් හැකුළුනේ; සෙති, හෝනාලදී.

## 232 වීණාථූන ජාතකයයි.

320 කාමං යහිං ඉච්ඡසි තෙන ගච්ඡ
විඩොසි මම්මම්හි විනිණ්ණකෙන
හතොසි භතෙනා ස වාදිතෙන
ලොලොව මච්ඡ අනුබඩ්ඪමානො.

කාමං, එකාන්තයෙන්; යහිං, යම්තැනෙක්හි; ඉච්ඡසි, කැමැත්තෙහිද; තෙත, එහෙයින්; ගච්ඡ; නැඟි යා; මම්මම්හි, මර්මස්ථානයෙහි; විනිණ්ණකෙන, මඩුවූ හා හියෙන්; විඩො, විදුනාලද්දෙහි; ආයි, වී; මච්ඡ, මත්ස්‍යයන්; අනුබඩ්ඪමානො, අනුව දිවත්තාවූ; ලො

ලොව, විනාවූ තෝ; සම්ාදිතෙන, හෙරම්ාදු සහිතවූ; හතෙනා, බත කරණකොටගෙන; හතො, නටුයෙහි; ආසී, වී.

321 එවම්පි ලොකාමිසං ඔපතන්තො
විහඤ්ඤති චිත්තවසානුවත්ති
සො හඤ්ඤති ඤාතිසඛානමජ්ඣෙ
මච්ඡානුගො සොරිව සුංසුමාරොති.

ලොකාමිසං, රූපාදියෙහි ඇල්ම හෙතුකොටගෙන ලොකාමිසයයි කියනලද පඤ්චකාමයට; ඔපතන්තො, අනුව දිවත්නාවූ; චිත්තවසානුවත්ති, චිත්තවශගව පවත්නාවූ පුද්ගලයා; එවම්පි, එපරිද්දෙන්ම; විහඤ්ඤති, නස්නේය; සො, හෙතෙම; ඤාති,නෑයෝය; සඛානං,සඛාවෝය යනමොවුන්ගේ; මජ්ඣෙ, මැද; මච්ඡානුගො, මත්ස්‍යයන් අනුවයන්නාවූ; සුංසුමාරො ඉව,සුංසුමාරකයා මෙන්; හඤ්ඤතී, විනාශයට යත්තේයි.

233 වීකණ්ණජාතකයයි.

---

322 ඉධමෙව දැනි මකරා යං කාමො ව්‍යපගමා තයි,
සොයං අප්පටිසඞ්ඛො බරා ජීනානංව රෙරුකං.

තයි, තා කෙරෙහි; යං, යම්බඳුවූ; කාමො, (මාගේ)කාමයෙක්; ව්‍යපගමා, පහවිද. හෙවත් ධ්‍යානයෙන් විෂ්කම්භිතද ඒ ගුණවිශෙෂයා; ඉදනි, දැන්; ඉධමෙව, මෙතැම; අකරා, කෙළෙහි; මා නොකැමැතිව කිත්නරාව පස්සේ දිවත්නාවූ තා විසින්ම කෙළේ; බරා, කියත්පතින්; ජීනානං, කපනලද; රෙරුකං ඉව, ඇත්දළක් මෙන්; සො අයං, හෙ මේ අපවිසින් ධ්‍යානයෙන් ඔබනලද කෙලශයන්; අප්පටිසඞ්ඛො, ප්‍රතිසංඛ්‍යාන නොකොට හැකි වී හෙවත් කෙලශයන්ගේ පුනරුත්පත්තිය නොදැන පරිද්දෙන් කෙළෙවියි කීවී.

323 අතිච්ඡා අතිලොභෙන අතිලොභමදෙන ච,
එවං හායති අත්ථම්හා අහංව අසිතා හුයාති.

අතිච්ඡා, ඒ ඒ වස්තුවෙහි ඉච්ඡාකරන නැනැත්තේ, අතිලොභෙන,අධිකලොභයෙන්ද;අතිලොභමදෙන ච,පුරුෂමද උපදවන ලොභයින් අතිලොභසඞ්ඛ්‍යාතවූ මදයෙන්ද; අසිතාභුයා, අසිතාභු

නම් රාජකන්‍යාව කෙරෙන් පිරිහුනු; අහං ඉව, මම පරිද්දෙන්; අභි මිහා, අභිලාෂිතාදීයෙන්; එවං, මේසේ; හායති, පිරිහෙන්නේයි.

## 234 අසිතාභූ ජාතකයයි.

324 සුඛා ඝරා වච්ඡනඛ සහිරඤ්ඤා සභොජනා,
යත්ථ භුත්වා ච පිත්වා ච සයෙය්‍යාථ අනුස්සුකො.

වච්ඡනඛ, වච්ඡනඛය; භුත්වා ච, මධුරආහාර අනුභවකොටද; පිත්වා ච, මධුරපානයන් බීද; යත්‍ථ, යම්අලඬකෘත ගෘහයකනොත්හි; අනුස්සුකො, උත්කණ්ඨාරහිතවූයේ; සයෙය්‍යාථ, හෝනෙහිද එසේහෙයින්; සහිරඤ්ඤා, හිරණ්‍යසහිතවූද; සභොජනා, භොජන සහිතවූද; ඝරා, ගෘහයෝ; සුඛා, සුවයයි ගෘහවර්ණනා කළෝ.

325 ඝරානානීහමානස්ස ඝරා න භණතො මුසා
ඝරා න දිනනදණ්ඩස්ස පරෙසං අනුකුබ්බතො,
එවං ඡිද්දං දුරභිභවං කො ඝරං පටිපජ්ජතිති.

අනීහමානස්ස, කෘෂිගොරක්‍ෂා ව්‍යාපාරයෙහි උත්සාහවත්නොවන්නාහට; ඝරා, ගෘහයෝද; න, නැත; (ගෘහවාශය නොපිහිටන්නේය) මුසා, මෘෂාද; භණතො, (ක්‍ෂෙත්‍රවස්තු හිරණ්‍යසුවර්ණා දීන්පිණිස) බණන්නාහට; ඝරා, ගෘහයෝ; න, නොවන්නාහ; නාදිනනදණ්ඩස්ස, නොගන්නාලද දණ්ඩඇති; පරෙසං, මෙරමාහට; අනුකුබ්බතො, ප්‍රහාරදනාදී දණ්ඩනය නොකරන්නාහට; ඝරා, ගෘහයෝ; න, නොවන්නාහුයි-යමෙක් දසකර්මකාරාදීන්ට අපරාධානුරූපව වධබන්ධන ඡේදන තාඩනවිසයෙන් පීඩාඋපහනවහෝ නම් ගෘහවාශයෙහි සත්‍යය නොඑසේවීනම් අයෝග්‍යයයි; එවං, මෙකී පරිද්දෙන්; ඡිද්දං, ඡිද්‍රකල්හි හෙවත් මෙකී ව්‍යසනවත්වීමාදිය නොනිරීමෙන් සිදුරුව පරිහානියට ගියකල්හි; දුරභිභවං, දුරාරාධවූ; ඝරං, ගිහිගෙට; කො, කවරනම් පුරුෂයෙක්; පටිපජ්ජති, පැමිණේද? නොපැමිනෙන්නේයයි සේයි.

## 235 වච්ඡනඛජාතකයයි.

326 භද්‍රකො වතයං පක්ඛී ද්විජො කුමුදසන්නිභො,
උපසන්තෙහි පකෙඛහි මන්දමින්දෙව ඣායති.

කුමුදසන්නිභො, හෙළෑඹුලපෙත්තක්වැනිවූ; ද්විජො, ද්විජසඞ්ඛ්‍යා

තාවූ; අයං පක්ඛි, මේ පක්‍ෂියා; භද්‍රකො විත, ඉතා භද්‍රය; උපසන්තෙන හි, සංයුක්තනාවූ, පක්ඛෙහි, පක්‍ෂයෙන්; මඤ්ඤමත්දෙව, මඤ්ඤමඤ්ඤයක් හුමෙන්; ඣායති, සිතයි.

327 නාස්ස සීලං විජානාථ අනඤ්ඤාය පසංසථ,
අමෙහ ඒජෝ න පාලෙති තෙන පක්ඛි න ඵන්දති.

අස්ස, මොහුගේ; සීලං, ආචාරශීලයක්; න විජානාථ, නොදනුව; අනඤ්ඤාය, නොදැන, පසංසථ, ප්‍රසංසාකරව; අමෙහ, අප හැම්දෙනා; ඒජෝ, මේ කාකකුණපක්‍ෂියා; න පාලෙති, රකිනේනොවෙයි; හෙයින් අපට උපද්‍රවයක් නොවුවමැනවැයි රකිනේ නොවෙයි අපකන්තාට රකිනේය; තෙන, එසේහෙයින්; පක්ඛි, පක්‍ෂයන්, න ඵන්දති, නොසලා.

236 බ ක ජා ත ක ය යි.

---

328 කොනුඛො භගවා හෙතු එකච්චෙව ඉධ පුග්ගලෙ,
අතිව හදයං නිබ්බාති චිත්තං චාපි පසීදති.

භගවා, භාග්‍යවත්ති; ඉධ, මේ ලොකයෙහි; එකච්චෙව පුග්ගලෙ, සමහර පුද්ගලයකුහු කෙරෙහි; හදයං, හෘදය; අතිව, අතිශයින්ම; නිබ්බායති, නිවෙන්නේය- සිසිරවාරිහරිත ඝටශතයෙන් මස්තකාභිශෙකයක් මෙන් නිර්වාපනයට යන්නේය; චිත්තංච, චිත්තයද; පසීදති, දෘෂ්ටිමාත්‍රයෙන් පහදන්නේය; ප්‍රේමවශයෙන් ඇලෙන්නේයයිසේයි, කො නුඛො හෙතු, හේ කවරනම් හෙතුවෙක් දැයි සර්වඥයන් විචාළෝ.

329 පුබ්බෙව සන්නිවාසෙන පච්චුප්පන්නහිතෙන වා,
එවං තං ජායති පෙමං උප්පලංව යථොදකෙ.

පුබ්බෙ, පූර්වජාතියෙහි, සන්නිවාසෙන වා, පුනඃපුනඃසංවාසවශයෙන් ඒ ඒ ස්ථානයෙහි සහවාසයෙන්වේවයි, පච්චුප්පන්න, වර්තමානභවයෙහි කළ; හිතෙන වා, හිතයෙන් වේවයි; උදකෙ, දියෙහි උත්පලකුමුදාරවින්දදිවූ ජලජවූ යම් කුසුමයෙක්; යථා, යම්සේද? එවං, එපරිද්දෙන්; තං, ඒ; පෙමං, ප්‍රේමය; මේදෙකාරණයෙන් සම්භව වනහෙයින්; ජායති, හටගනී- “උප්පලංව” යනතැන “උප්ප

ලංවා"යි කී තියායි, හේ වා ශබ්දය සමුච්චයෙහි වැටේ එලෙස්හෙයින් "කුමුදං වා පදුමං වා කමලං වා"යි අර්ථගතයුතු.

## 237 සාකෙතජාතකයයි.

330 ඉඞ්ඝ එකපදං තාත අනෙකත්ථපදස්සිතං,
කිඤ්චි සඞ්ගාහිකං බ්‍රූහි යෙනත්ථෙ සාධයාමසෙ.

ඉඞ්ඝ, ආරාධනා කරමි නොහොත් විචාරමි; තාත, පියාණෙනි; යෙන, යම්කිසි පදයකින්; අත්ථෙ, අභිවෘද්ධින්; සාධයාමසෙ, අපමෝද එසේ වූ; අනෙක, නොයෙක්; අත්ථපදස්සිතං, කාරණාපදශ්‍රිතවූ; සඞ්ගාහිකං, බොහෝ වූ පදයන් සඞ්ග්‍රහකොට සිටි; කිඤ්චි, කිසි; එකපදං, (කාරණොපසංහිතවූ) එක්පදයක්; බ්‍රූහි, කිය- "ඉඞ්ඝ" යන නිපාත චොදනාරාධනා දෙක්හි වැටේ.

331 දක්ඛෙය්‍යෙකපදං තාත අනෙකත්ථපදස්සිතං
තඤ්ච සීලෙන සංයුත්තං ඛන්තියා උපපාදිතං
අලං මිත්තෙ සුඛාපෙතුං අමිත්තානං දුඛායචාති.

තාත, දූතුය; දක්ඛෙය්‍යං, දක්‍ෂභාවයයි කියනලද ගෙහෙවින් අර්ථ ද්‍රව්‍යශයෙහි ප්‍රවීණයාගේ ප්‍රඥාසම්ප්‍රයුක්ත වීය්‍ර්‍යසම්බන්ධාත; එක පදං, එකපදය; අනෙක, බොහෝවූ; අත්ථපදස්සිතං, කාරණා පද ශ්‍රිතය; තඤ්ච, හෙද; සීලෙන, ශීලයෙන්; සංයුත්තං, යුක්තවූයේ; ඛන්තියා, අධිවාසනක්‍ෂාන්තින්; උපපාදිතං, සපයන ලද්දේ; මිත්තෙ, මිත්‍රයන්; සුඛාපෙතුං, සුවපත්කරන්වද; අමිත්තානං, සතුරන්; දුඛාය ච, දුක්පත්කරන්වද; අලං, පමණ වන්නේයි.

## 238 එකපදජාතකයයි.

332 ආසිවිසං මං සන්තං පවිට්ඨං කුම්භිණාමුඛං,
රුච්චතෙ හරිතා මාතා යං මං ඛාදන්ති මච්ඡකා.

හරිතා මාතා, නිලමැඩිය මව් කොට ඇත්තව; කුම්භිණාමුඛං, කෙමෙණ මුඛයට; පවිඨං, ප්‍රවිෂ්ටවූ; මං, මා; ආසිවිසං සන්තං, ආශිවිෂ සමානවූ; යං, යම්බඳුවූ; මං, මා; මච්ඡකා, මත්ස්‍යයෝ; ඛාදන්ති, කද්ද; (හේ තට) රුච්චති, අභිමතයි.

333 විලුම්පතෙව පුරිසො යාවස්ස උපකප්පති,
යදා අඤ්ඤෙ විලුම්පන්ති සො විලුත්තො විලුම්පතීති.

යාව, යම්තාක්; අස්ස, මෝහට; උපකප්පති, ඓශ්වර්‍ය්‍ය සමෘද්ධි යද එතාක්; පුරිසො, පුරුෂතෙම; විලුම්පතෙව, මෙරමා පහරන්නේම ය; යදා, යම්කලෙක්හි; අඤ්ඤෙ, සෙස්සෝ; (ඓශ්වර්‍ය්‍යයෙහි සිට) විලුම්පන්ති, පහරිද්ද; සො විලුත්තො, ඒ දුබලඅවස්ථාවෙහි සිට අනුන් පැහැර නොයෙක්පරිද්දෙන් බොහෝදෙනාට පීඩාකළ දුෂ්ටයා; විලුම්පති, පහරණ්ණාලැබේ-යමෙක් ප්‍රබලයෙම්යි බොහෝදෙනාට හිංසාකළානම් ඌ අතින් හිංසාලද බොහෝදෙනා ප්‍රබලවගෙන නැවත තමන් විෂයෙහිදී ඒ හිංසකයාට ප්‍රතිහිංසා කරන්නාහුයයි සේයි.

239 හා රි ත ජා ත ක ය යි.

---

334 සබ්බො ජනො හිංසිතො පිඞ්ගලෙන
තස්මිං මතෙ පච්චයා වෙදයන්ති
පියො නු තෙ ආසි අකණ්හනෙත්තො
කස්මා තුවං රොදසි චාරපාල.

පිඞ්ගලෙන, පිඞ්ගලනම් රජුවිසින්; සබ්බො, සියලු; ජනො, ජනතෙම, හිංසිතො; දඩගැනීම්ආදි නොයෙක් අධර්ම්ම ප්‍රවෘත්තීන් පීඩිතය; තස්මිං, ඔහු; මතෙ, මළකල්හි; පච්චයා, ප්‍රීතින්; වෙදයන්ති, විඳින් හෙවත් ඔහු මළහෙයින් බොහෝදෙන සතුටුවෙති; චාරපාල, චාරරක්‍ෂාවෙහි ප්‍රයුක්තය; අකණ්හනෙත්තො, නිල් නොවූ ඇස්ඇති හෙවත් පිඟුවූ ඇස්ඇති භේරජ; තෙ, තට; පියොනු, ප්‍රියවූයේ; ආසි, වීද; තුවං, තෝ; කස්මා, කුමක්හෙයින්නම්; රොදසි, හඬයිද.

335 න මෙ පියො ආසි අකණ්හනෙත්තො
භායාමි පච්චාගමනාය තස්ස
ඉතො ගතො හිංසෙය්‍ය මච්චුරාජං
සො හිංසිතො ආනයෙ පුන ඉධාති.

අකණ්හනෙත්තො, පිඞ්ගලාක්‍ෂියා; මෙ, මට; පියො, ප්‍රියවූයේ; න ආසි, නොවී; තස්ස, ඔහුගේ; පච්චාගමනාය, පුනා ගමනයට; භායාමි, බිමි; ඉතො, මෙසින් මිය; ගතො, ගියේ; මච්චුරාජං, මෘත්‍යු

රාජයා; හිංසෙය්‍ය, හිංසනයකෙළේවීනම්; සො, හේ මාරයා; හිංසිතො, පීඩිතවූයේ; පුන, නැවත; ඉධ, මෙහි; ආගඡෙ, එවන්නෙහි-ළාකෙරෙහි සෙනඟයකින් හඬන්නෙම් නොවෙම් මොබදී බොහෝදෙනාට හිංසාකොට පූරුදුවූයේ ඔබදී මෘතනූරාජයාට හිංසාවක් කෙළේ වීනම් හේ හිංසාව විඳපියා මී විසියදුනමනා එකෙක් නොවේසි කියා මූ මිනිස්ලොව ලාපියවයි කියා එව්නම් නැවත දුක්විඳිනා වනුම්හයි එෂ්‍යත් දුකාට හඬම්යී කී.

### 240 මහාපිඩගලජාතකයයි.

---

### (9) නවවන උපාහනවග්ගයයි.

— oo —

336 සිගාලො මානත්ථද්ධො පරිවාරෙන අත්ථිකො,
පාපුනි මහතිං භූමිං රාජාසි සබ්බදාඨිනං.

සිගාලො, ශෘගාලයා; මානත්ථද්ධො, (පරිවාරනිසා) මානයෙන් ස්තබ්ධවූයේ; පරිවාරෙන,(නවද අධික)පරිවාරයෙන්; අත්ථිකො, අර්ථිවූයේ; මහතිං, මහත්වූ; භූමිං, සම්පත්භූමියකට; පාපුණි, පැමිණියේ; සබ්බදාඨිනං, සියලු දළඇති සතුන්ට; රාජා ආසි, රජවී.

337 එවමෙවං මනුස්සෙසු යො හොති පරිවාරවා,
සො හි තත්ථ මහා හොති සිගාලො විය දාඨිනන්ති.

එවමෙවං, එපරිද්දෙන්; මනුස්සෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; යො, යමෙක්; පරිවාරවා, පරිවාර ඇත්තේ; හොති, වේද; සො හි, ඒ වනාහි; දාඨිනං, දාඨීන්ට රජවූ; සිගාලො විය, ශෘගාලයා පරිද්දෙන්; තත්ථ, එහිලා; මහා, මහත්වූයේ; හොති, වන්නේයි- යමෙක් ශෘගාලයාපරිද්දෙන් ලද පරිවාරයක් නිසාඅභිමානමංශුනාවඅධිකයට පැමිනියේවීනම් හේ විනාශයට පැමිනෙන්නේය යන අභිප්‍රායයි.

### 241 සබ්බදාඨජාතකයයි.

---

338 බාලො වතායං සුතබො යො වරත්තං න ඛාදති,
බන්ධනාව පමුඤ්චෙය්‍ය අසිතොව ඝරං වජෙ.

බාලො, බාලවූ; යො සුතබො, යම් බල්ලෙක්; අයං, මේ; වරත්තං, වරපට; වත, ඒකාන්තයෙන්; න ඛාදති, නොකසිද; බන්ධනා,

බන්ධනයෙන්; පමුචෙය්‍ය, මිදුනේද; අදිනොව, බඩපුරාකෑයේද, ඝරං, ගෙට; විජේ, යන්නේය- ඉම් සුනඛපොතකයා අසනයෙන් සන්තර්පිතවූයේද අවසාමිත බන්ධනඇත්තේද නොපලා ගෙටම නැඟී එවසිනියා තුෂ්ටවූ.

339 අජිතමෙම මනස්මිං මෙ අහො මෙ හදයෙ කතං,
කාලංච පතිකඞ්ඛාමි යාව පස්සුපතු ජනොති.

මේ, මාගේ; මනසමිං, සිත්හි; මේ, මාවිසින්; අජිතං, (තොප ගේ කථාව) තබනලද; අහො, නැවත; මෙ, මාගේ; හදයෙ, හෘද යෙහි; කතං, (තොපගේ කථාව) කරනලද; කාලච, නැඟියන්ට සුදුසුකාලයක්; පතිකඞ්ඛාමි, ප්‍රතිකාංක්‍ෂාකෙරෙමි; යාව, යම්තාක්; ජනො, ජනතෙමේ; පස්සුපතු, නිද්‍රොපගතවේවා-තොප කියනකථා සිතතබා නැඟියනකලක් සොයන්නෙම් මිනජනයා නිදනතුරු හුන්නෙම්යිනී.

242 සු ණ ඛ ජා ත ක ය යි.

---

340 සත්තතන්තිං සුමධුරං රාමණෙය්‍යං අවාචයිං,
සො මං රඞ්ගම්හි අව්හෙති සරණමෙව හොහි කොසිය.

සත්තතන්තිං, සප්තතන්ත්‍රියක්ඇති; සුමධුරං, විශෙෂයෙන් මධුරවූ; රාමණෙය්‍යං, රමණීයවූ හෙවත් ශබ්දරාශීන් විසින් අභිරමණය කරන්නට සුදුසුවූ වීණාව; අවාචයිං, මූර්ඡනාතබා ගානාප්‍රකාරය කීම් හෙවත් වීණාශිල්පය උගැන්වීමි; සො, හේ මාගේ ශිෂ්‍යයා; මං, මා; රඞ්ගම්හි, රඞ්ගයෙහි; අව්හෙති, (තමා හා වාදයට) කැඳවයි; කොසිය, කොසිය ගොත්‍රය; මේ, මට; සරණං, ප්‍රතිසරණ; හොහි, වේවා- මට මෙතැන්හි පිළිසරණවේවා.

341 අහං තං සරණං සම්ම අහමාචරිය පූජකො,
න තං ජයිස්සති සිස්සො සිස්සමාචරියජෙස්සසීති.

සම්ම, සබද; අහං, මම; සරණං, සරණව; තං, තා; (රක්‍ෂාකෙරෙම්) අහං, මම; ආචරිය, ආචාර්‍ය්‍යවරුන් කෙරෙහි; පූජකො, පූජ්‍යයෙම්[නොහොත්; ආචරියපූජකො, ආචාර්‍ය්‍යවරුන් විසින් පූජ්‍යයෙමි; එසේහෙයින්, තා දනවන ශක්තිඇතියෙම්යි සේයි; සිස්සො, ශිෂ්‍යයා; තං, තා; න ජයිස්සති, නොපරදවා; ආචරිය, ආචාර්‍ය්‍යය; සිස්සං, ශිෂ්‍යයා, ජෙස්සසි,(තොප)පරදවන්නෙහි- ආචාරීන් වීණාවාද

ඉගැන්වූ තොපගේ ශිෂ්‍යයා පරදවාගත නොහෙයි තොපි ශිෂ්‍යයා පරදවයි ශක්‍රයා ගුත්තිලගාන්ධර්වයාට කී.

## 243 ගුත්තිලජාතකයයි.

342 යං පස්සති න තං ඉච්ඡති
යඤ්ච න පස්සති තං කිර ඉච්ඡති
මඤ්ඤාමි චිරං චරිස්සති
න හි තං ලච්ඡති යං සො ඉච්ඡති.

යං, යමක්; පස්සති, දකීද; තං, ඒ; න ඉච්ඡති, නොකැමතිය; යඤ්ච, යමක්; නපස්සති, නොදකීද; තං කිර, ඒවතාහි; ඉච්ඡති, කැමතිය; චිරං, බොහෝකලක්; චරිස්සති, ඇවිදින්නේයයි; මඤ්ඤාමි, සිතමි හෙවත් ජලයෙන් විනිර්මුක්තවූ යම් ගඩගාවක් සොයන්නාවූ මේ පරිබ්‍රාජකයා බොහෝකලක් ඇවිදින්නේයයි සිතමි නොහොත් යම්සේ ජලයෙන් විනිර්මුක්තවූ ගඩගාවක් සොයා ඇවිදින්නේද එපරිද්දෙන් රූපාදිධර්ම්මයෙන් විනිර්මුක්ත ආත්මයකු දු අන්වේෂණය කරන්නේ සංසාරයෙහි පරිභ්‍රමණය කරන්නේයයි සිතමි. සො, හෙතෙම; යං, යම්ජලරහිත ගඩගාවක් කැමැතිද; තං, ඒ; න හි ලච්ඡති, නොමලබන්නේයි.

343 යං ලභති න තෙන තුස්සති
යං යං පත්ථෙති ලද්ධං හීළෙති
ඉච්ඡා හි අනන්තගොචරා
වීතිච්ඡානං නමො කරොමසෙති.

යං, යමක්; ලභති, ලැබේද; තෙන, ඒලද වස්තුයෙන්; නතුස්සති, තුෂ්ටනොවෙයි; ලද්ධං, ලබන්නට හෙවත් අලබ්ධවස්තුප්‍රතිලාභයට; පත්ථෙති, ප්‍රාර්ථනාකෙරෙයි; යං යං හීළෙති, යමක් යමක් ප්‍රාර්ථනාකොට ලදද ඒ ඒ ප්‍රාර්ථිතවස්තුද ලදිමින් කවරනම් ප්‍රයොජන යෙක්දැයි ප්‍රාප්තවස්තුවට අවඥකෙරෙයි එසේමැයි, ඉච්ඡාහි, තෘෂ්ණා නම්; අනන්තගොචරා, මර්‍යාදාතික්‍රාන්තවූ රූපාදීන් ආලම්බනය කොටඇත්තීයි; වීතිච්ඡානං, විගතවූ තෘෂ්ණාඇත්තවුන්ට හෙවත් මාර්ගඥානයෙන් ක්ෂයකරනලද තෘෂ්ණාඇති බුද්ධාදීන්ට; නමො, නමස්කාර, කරොමසෙ, කරමු.

## 244 වීතිච්ඡජාතකයයි.

344 කාලො ඝසති භූතානි සබ්බානෙව සහත්තනා
යො ච කාලඝසො භූතො සභූතපචනිං පචි.

කාලො, පූර්වාහ්න අපරාහ්නාදිකාලය; අත්තනා සහ, තමා හා සමඟ; සබ්බානි, සියලු; භූතානි, සත්වයන්; ඝසති, කන්නේය; යො ච, යම්බඳුවූ; කාලඝසො, කාලය කෑවාවූ; භූතො,සත්වයෙක් ඇද්ද, නොහොත්"කාලඝසො භූතො"යි කියනලද යම් ක්ෂීණාශ්‍රවයෙක් ඇද්ද,සො,හෙතෙම;භූතපචනිං,තෘෂ්ණාව;පචි,පිසී-මෙහිලා කාලය සත්වයාගේ මාංශලුචනය කොට නොකන්නේය ආයුවර්ණාදීන්ගේ විනාශය කොට යෞවනය මඩනහෙයින් කාලයතෙමේ සත්වයන් භක්ෂණය කරන්නේ නම් පූර්වාහ්නකාලය තෙම පෙරළි අපරාහ්නයයි කියාද අපරාහ්නයතෙම පෙරළි රාත්‍රියයිකියාද මෙසේ ව්‍යවහාරයට යනහෙයින් තෙමේ තමාකන්නානම්වූවේයි, ක්ෂීණාශ්‍රවද ආර්‍ය්‍යමාර්ගයෙන් එෂ්‍යත්කාලයෙහි ප්‍රතිසන්ධික්ෂය කොට සිටි හෙයින් කාලඝසනම්වේයි, එසේකාලඝසනම්වූ මහාක්ෂීණාශ්‍රවයා සත්වයන් අපායභූමියෙහි උපදවානුයි භූතපචනී නම්ලද තෘෂ්ණාව තමාගේ මාර්ගඥාන නමැති වහ්නියෙන් දැවීයයි යන අභිප්‍රායයි.

345 බහූනි නරසීසානි ලොමසානි බ්‍රහානි ච,
ගීවාසු පටිමුක්කානි කොචි දෙවෙත්ථ කණ්ණවා.

ලොමසානි, රෝම ඇති; බ්‍රහානි, මහත්වූ; බහූනි, බොහෝවූ; නර, මනුෂ්‍යයන්ගේ; සීසානි, ශීර්ෂයෝ දක්නාලැබෙති මිතුද; ගීවාසු, ග්‍රීවයෙහිද, පටිමුක්කානි, බඟාලනලදහුය හෙවත් කරපිට තබනලදහුය ගන්නාලද්දෝ නොවෙති අතින් ගන්නාලද තාල ඵලහා පෙපලගේ ඉසහා වෙනසක් නැතැයි සේයි; එත්ථ, මෙහිලා; කණ්ණවා, ප්‍රඥාවත්හු; කොචිදෙව, සමහරකෙනෙකි නොහොත්; කණ්ණවා, කර්ණපීඩාඇත්තෝ සමහරකෙනෙකි, සමයෙහි බවමුත් ප්‍රඥාවටයයි සේයි.

245 මූලපරියාය ජාතකයයි.

---

346 හන්ත්වා ඛාත්වා වධිත්වා ච දෙති දානං අසඤ්ඤතො,
එදිසං භත්තං භුඤ්ජමානො සපාපෙන උපලිප්පති.

අසඤ්ඤතො,(කායවාරාදීන්)සඤ්ඤතනොවූ පුරුෂයා;හන්ත්වා, ප්‍රහාරදී;ඛාත්වා,පීඩාකොට;වධිත්වා,මරා;දානං,දානය; දෙති,දේද;

එදිසං, ඒබඳුවූ; හන්ත්වා, බන; භුඤ්ජමානො, අනුභවකරන්නාවූ; සො, ඒ (ශ්‍රමණ); පාපෙන, පාපයෙන්; උපලිප්පති, සෙදේ- දුශ්ශීලයාගේ ආහාරය අනුභවකරන්නේ තෙමේද දුශ්ශීලනම්වේ.

347 පුත්තදාරම්පි චෙ හන්ත්වා දෙති දානං අසඤ්ඤතො,
භුඤ්ජමානොපි සප්පඤ්ඤො න පාපෙන උපලිප්පතීති.

අසඤ්ඤතො, දුශ්ශීලයා; චෙ, ඉදින්; පුත්තදාරම්පි, පුත්‍රදාරවන් ද; හන්ත්වා, මරා; දානං, උන්ගේ මස්; දෙති, දෙන්නේද: සප්පඤ්ඤො, අපේක්ෂා ක්ෂාන්ති මෛත්‍රී ගුණාඩගයෙන් අවිකලවූ ප්‍රාඥයා වනාහි; භුඤ්ජමානොපි, දුශ්ශීලයා දුන් යමක්ම අනුභවකරන්නේ; පාපෙන, ඒ දෞශ්ශීල්‍යයෙන් යුක්තවූ දායකයාගේ පාපයෙන්; න උපලිප්පති, මිශ්‍ර නොවේ.

246 තෙ ලො වා ද ජා ත ක ය යි.

---

348 අද්ධා පාදඤ්ජලී සබ්බෙ පඤ්ඤාය අතිරොචති,
තථා හි ඔට්ඨං භඤ්ජති උත්තරිං නූන පස්සති.

පාදඤ්ජලී, පාදඤ්ජලිනම් රාජකුමාරයා; අද්ධා, ඒකාන්තයෙන්; සබ්බෙ, සියලු අප හැමදෙනා; පඤ්ඤාය, ප්‍රඥයෙන්; අතිරොචති, අධිකව බබලයි; තථා හි, එසේමැයි; ඔට්ඨං භඤ්ජති, තොල්බිඳී; නූන, ඒකාන්තයෙන්; උත්තරිං, මත්තෙහි අන්‍යකාරණයෙක්; පස්සති, බලා.

349 නායං ධම්මං අධම්මං වා අත්ථානත්ථං ච බුජ්ඣති,
අඤ්ඤත්‍ර ඔට්ඨනිබ්භොගා නායං ජානාති කිඤ්චනන්ති.

අයං, මේ පාදඤ්ජලීනම් කුමාරයා; ධම්මං, ධර්‍මයද; අධම්මං වා, අධර්‍මයද; අත්ථං, අර්ථයද; අනත්ථං ච, අනර්ථයද; න බුජ්ඣති, නොදනී; ඔට්ඨනිබ්භොගා, තොල්බිඳුමෙන්; අඤ්ඤත්‍ර, පිටත්; කිඤ්චනං, කිසිවක්; අයං, මේ; න ජානාති, නොදනී- මූ දන්නේ ඔට්ඨභඤ්ජනය මය අනික් කිසිදෙයක් දන්නේ නොවේයි සේයි.

247 පා ද ඤ් ජ ලි ජා ත ක ය යි.

---

350 සබ්බෙහි කිංසුකො දිට්ඨො කිංවෙත්ථ විචිකිච්ඡථ,
න හි සබ්බෙසු ඨානෙසු සාරථී පරිපුච්ඡිතො.

සබ්බෙහි, තොප හැමදෙනාවිසින්; කිංසුකො, කිංසුකවෘක්ෂය; දිට්ඨො, දක්නාලද; එත්ථ, මෙහිලා; කිං, කුමකටනම්; විචිකිච්ඡථ,

ශංකාකරවිද? සබ්බෙසු ඨානෙසු, සියලු ස්ථානයෙහි; සාරථි, රථාචාය්‍ය්‍යය; තසි පරිපුච්ඡිතො, තොප විසින් නොම විචාරනලදී.

351 එවං සබ්බෙහි ඤාණෙහි යෙසං ධම්මා අජානිතා,
තෙ වෙ ධම්මෙසු කඞ්ඛන්ති කිංසුකස්මිංව භාතරො'ති.

එවං, එපරිද්දෙන්; සබ්බෙහි, සියලු; ඤාණෙහි, විදර්ශනා ඥානයෙන්; යෙසං, යම්කෙනෙකුට; ධම්මා සපර්ශායතනාදීන්ගෙ වූ ධර්මයෝ; අජානිතා, නොදන්නාලදහුද; තෙ, ඔහු; වෙ, එකාන්තයෙන්; කිංසුකස්මිං, කිංසුකවෘක්ෂයෙහි කාංක්‍ෂා උපදවූ; භාතරොව, සතරබෑයන් පරිද්දෙන්; ධම්මෙසු, එනියතලද ධර්මයන් කෙරෙහි; කඞ්ඛන්ති, කාංක්‍ෂා කෙරෙත්.

248 කිංසුකොපම ජාතකයයි.

---

352 එකපුත්තකො භවිස්සසි
ත්වඤ්ච නො හෙස්සසි ඉස්සරො කුලෙ,
ඔරොහ දුමස්මා සාලක
එහි දානි ඝරකං වජෙමසෙ.

සාලක, සාලකය; ත්වඤ්ච, තෝද; එකපුත්තකො, එකම් පුතුවූයෙහි; භවිස්සසි, වී; නො, අපගේ; කුලෙ, කුලයෙහි; ඉස්සරො, ඉසුරුවූයෙහි; හෙස්සසි, වන්නෙහි; දුමස්මා, ද්‍රැමයෙන්; ඔරොහ, බැස පියා; ඉදානි, දැන්; එහි, එව; ඝරං, ගෙට; වජෙමසෙ, යමු- අපගේ ඉසුරෙහි හිමිවන්නට සිටි එකම එකපුතණුවන්වූව උරෝපුත ගසින් බැස එන්වලා ගෙටයම්හයි වානරයා ගැන්හුන්නාහු කලවා කැඳවී.

353 නනු මං හදයෙනාම සඤ්ඤසි
යඤ්ච හනාසි මං වෙළුයට්ඨියා,
පක්කම්බවනෙ රමාමසෙ
ගච්ඡ ත්වං ඝරකං යථාසුඛන්ති.

නනු, නා විචාරමි; මං, මා; හදයෙ, හෘදයෙහියයි පෙළේත් නට සුදුසුයයි; අතිමඤ්ඤසි, සිතසිද; යඤ්ච, යම්හෙයකින්; මං, මා, වෙළුයට්ඨියං, ඌණලීයෙන්; හනාසි, පහරනෙහිද එහෙහෙයින් තා හා කැටිව නොඑම්සි යේසි; පක්කම්බවනෙ, මේරුපැසුවූ අඹවනයෙහි;

ධම්මාචරණෙ, ඇලෙම්; ධුවං, ඉතා; යථාසුඛං, සැමතිපරිද්දෙන්; ඝරකං, ගෙට; ගච්ඡ, නැඟිටා.

### 249 සාලක ජාතකය යි.

354 අයං ඉසී උපසමසංයමෙ රතො
සන්තිට්ඨති සිසිරභයෙන අට්ටිතො,
හන්ද අයං පවිසතුමං අගාරකං
විනෙතු සීතං දරථං ච කෙවලං.

උපසමසංයමෙ, රාගාදීන්කෙලෙශ ව්‍යූපසමය ශීලසංයමය යන මෙහිලා; රතො, ඇලුණාවූ; සිසිරභයෙන, වාතවෘෂ්ටීන් සංජාත ශිශිරභයින්; අට්ටිතො, පීඩිතවූ; අයං, මේ; ඉසී, තපස්වී; සන්තිට්ඨති, සිටීතේය; හන්ද, එබැවින්; අයං, මේ තපස්වියා; ඉමං, මේ; අගාරකං, ගෙට; පවිසතු, ප්‍රවිෂ්ටවේවා; (ඉමං, මේ;) කෙවලං, සියලු; සීතං, සීතද; දරථං ච, පීඩාද; විනෙතු, දුරුකෙරේවා.

355 නායං ඉසී උපසමසඤ්ඤමෙ රතො
කපීඅයං දුමවරසාඛගොචරො,
සො දූසකො රොසකොචාපි ජම්මො
සචෙ වජෙ ඉමම්පි දූසයෙ ඝරන්ති.

අයං, මේ; උපසමසඤ්ඤමෙ, කෙලශව්‍යූපසමය ශීලසංයමය යන මෙහිලා; රතො, ඇලුණාවූ; ඉසී න, ඍෂියෙක් නොවේ; වැලි කිමෙක්දයත්? අයං, මෙතෙම; දුමවර, ද්‍රැමවරයන්ගේ; සාඛ, ශාඛා; ගොචරො, ගොචරකොටඇති; දූසකො, (ගිය ගිය තැන) කලුෂකරන්නාවූද; රොසකොචාපි, රොෂකරදවූ; ජම්මො, ලාමකදවූ; කපි, වානරයෙකි; සො, හේ; සචෙ, ඉදින්; වජෙ, (මේපර්ණශාලාවට) වන්නේවීනම්; ඉමම්පි ඝරං, මේපන්සල්ගෙයද; දූසයෙ, (මූත්‍රකරීෂයෙන් හෝ ගිනිලා හෝ) දූෂ්‍යකරන්නේයි.

### 250 කපි ජාතකය යි.

(10 දසවන ශෘගාල වර්ග්ගයයි.)

### තස්ස උද්දානං.

තස්ස, ඒ වර්ග්ගයාගේ; උද්දානං, උදාන ගාථාවෙක් වන්නේය.

දළ්හවග්ගො අපරො සන්ථවං කල්‍යාණවග්ගාසදිසො,
රුහකං නතංදළ්හං යොග්ගං කසාවුපාහනං සිගාලෙනතෙදස.

දළ්හවග්ගො, ප්‍රථම්වූ දල්හවර්ගයද; අපරො, අන්‍යවූ; සන්ථවවග්ගො, දෙවැනිවූ සන්ථවවර්ගයද; කල්‍යාණවග්ගො, තුන්වන කල්‍යාණවර්ගයද; අසදිසො, සතරවන අසදෘශවර්ගයද; රුහකං, පස්වන රුහකවර්ගයද; නතංදල්හං, සවන නතංදල්හවර්ගයද; යොග්ගං, සත්වන යොග්ගවර්ගයද; කසාවං, අටවන කසාවවර්ගයද; උපාහනං, නවවන උපාහනවර්ගයද; සිගාලෙන, සිගාලවර්ගයහා; එතෙ, මොහු; දස, වර්ගයෝ දශදෙනෙකි.

## දුකනිපාතසන්නයයි.

---

356 සංකප්පරාගධොතෙන විතක්කනිසිතෙන ච,
නාලං කටකභද්දෙන නුසුකාරකතෙන ච.

සංකප්ප, කාමවිතර්කසම්ප්‍රයුක්තවූ; රාගධොතෙන, රාග නමැති ජලයෙන් දෝනාලද; විතක්ක, විතර්ක නමැති ශිලාඛණ්ඩයෙහි; නිසිතෙන, රාගනමැති ජලය වත්කොට ගගා මුවහත්තබනලද; නාලංකටකභද්දෙන, නොමඅලඞ්කාර කරනලද නොමභද්‍රවූ; නච උසුකාරකතෙන, උසුකාරයා විසින් නොමකරනලද.

357 නකණ්ණායතමුත්තෙන නපි මොරූපසෙවිනා,
තෙනම්හි හදයෙ විද්ධො සබ්බඞ්ගපරිදාහිනා.

නකණ්ණායතමුත්තෙන, කර්ණායතය දක්වා හයානොහරනලද; නපිමොරූපසෙවිනා, මයූරපත්‍රාදීන් නොසදනලද; සබ්බඞ්ග පරිදාහිනා, සර්වාඞ්ගපරිදාහය කරන්නාවූ; තෙන, ඒ කෙලෙශ නමැති කාණ්ඩයෙන්; හදයෙ, හෘදයප්‍රදෙශයෙහි; විද්ධොඅම්හි, විදිනාලද්දෙම්වීමි.

358 ආවෙධච න පස්සාමි යතො රුහිරමස්සවෙ,
යාව අයොනිසො චිත්තං සයමෙව දුක්ඛමාහතන්ති.

යතො, යම්හෙයකින්; රුහිරං, රුධිරය; අස්සවෙ, වැගේද; ආවෙධං ච න පස්සාම්, එසේ විදිතෙනකුදු නොදකිමි; යාව අයොනිසො චින්තා, දඩිකොට නුනුවණින් සිතවඩනාලදද? එසේහෙයින්;

සයං මෙ, සවනීයවූ මාවිසින්; දුක්ඛං, චෛතසිකදුඃඛය; අනුභූතං, ඒ ලබනලදී.

### 251 සංකප්ප ජාතකයයි.

---

359 අජ්ජාපි මෙ තං මනසි යං මං ත්වං තිලමුට්ඨියා,
බාහාය මං ගහෙත්වාන ලට්ඨියා අනුතාළයී.

තිලමුට්ඨියා, මිටක්පමණ තලහෙතුකොටගෙන; මං බාහාය ගහෙත්වාන, මා අතකරගන්වා; ලට්ඨියා, හුණලීයෙන්; ත්වං, තෝ; මං, මා; අනුතාළයී, ගැසීද; තං, තාදුන් ඒගෙඩිය; අජ්ජාපි, අදදක්වා; මෙ මනසි, මාගේ සිත්හිමැයි- එසේහෙයින් මා සමීපයට එන්නාවූ තා විසින් මරණගෙන ආයයි සිතමි.

360 නනු ජීවිතෙ න රමසි යෙනාසි බ්‍රාහ්මණාගතො,
යං මං බාහං ගහෙත්වාන තික්ඛත්තුං අනුතාළයී.

බ්‍රාහ්මණ, බමුණ; යං මං, යම්බඳුවූ මා; බාහං ගහෙත්වාන, අත කරගන්වා; තික්ඛත්තුං, තුන්විටෙක; අනුතාළයී, ගැස්සීද; යෙන, යම්හෙයකින්; ආගතාසි, අයි, අයිද; එසේහෙයින්; ජීවිතෙ, තාගේ ජීවිතයෙහි; න රමසි නනු, නොඇලෙයි සිතමි.

361 අරියො අනරියං කුබ්බානං යො දණ්ඩෙන නිසෙධති,
සාසනත්ථං න තං වෙරං ඉති නං පණ්ඩිතා විදූන්ති.

අනරියං කුබ්බානං, නොකටයුතු කරන්නහු; යො අරියො, යම් ආචාර්යකෙනෙක් තෙම; දණ්ඩෙන, දණ්ඩනයෙන්; නිසෙධති, වලකයි යන යමෙක ඇද්ද; පණ්ඩිතා, නුවණැත්තෝ; තං, ඒවැළැක්ම; සාසනත්ථං, හික්මවනු පිණිසය; න වෙරං ඉති, වෛරපිණිස නොවේයි කියා; විදූ, දනිත්- ප්‍රශස්තවූ ආකාරයෙන් යුක්තවූ රජ දරුවෝද ගුරුන්ද ප්‍රාණඝාතාදී දුශ්ශීලක්‍රියා කරන සේවක ශිෂ්‍යාදීන් ප්‍රහාරාදී නිග්‍රහකොට ඒ ඒ අසත්ක්‍රියාවෙන් වළකද්ද ඒ උන්ට වැඩපිණිස වෙයි එසේහෙයින් ප්‍රහාරාදිය ලත් සේවක ශිෂ්‍යාදීන් වෛරනොකොට යුත්තේයයි යනු අභිප්‍රායයි.

### 252 තිලමුට්ඨිජාතකයයි.

---

362 මමන්නපානං විපුලං උළාරං
උප්පජ්ජතිමස්ස මණිස්ස හෙතු,
තං තෙ න දස්සං අති යාචකොසි
නචාපි තෙ අස්සමං ආගමිස්සං.

ඉමිස්ස මිණිස්ස හෙතු, මේ මාණික්‍යරත්නහෙතුවෙන්; මම, මට; අන්න, යාගුභත්තාදියද; පානං, අම්බපානාදිවූ අෂ්ටවිධ පානයද; විපුලං, බොහෝව; උළාරං, ශ්‍රෙෂ්ඨව; උප්පජ්ජති, උපදනේය- මේ මැණික ආනුභාවයෙන් ප්‍රණීතවූ දිව්‍යාන්නපානාදීහු විපුලව ලැබෙන්නාහුයයි සේයි; තං, එසේ මහිම්ඇති මාණික්‍යරත්නය; තෙ, තට; න දස්සං, නොදෙමි; අතියාචකොඅසි, ඉක්මවා යාච්ඤා කොළෙහි වී; එසේහෙයින්; තෙ, තාගේ; අස්සමං, ආශ්‍රමයටද; නච ආගමිස්සං, නැවත නොඑමි.

363 සුසූ යථා සක්ඛරධොතපාණී
තාසෙසි මං සෙලං යාචමානො,
තං තෙ න දස්සං අතියාචකොසි
නචාපි තෙ අස්සමං ආගමිස්සං.

සක්ඛර, පාෂාණයෙහි; ධොත, ගාහා සෝදනලද; පාණී, අත්ත තලඇති හෙවත් තෙලපාෂාණයෙහි ගාහා මුවහත්තබනලද ඛඩ්ගයෙන් යුක්ත අත් ඇති; සුසූ යථා, බාලපුරුෂයා මෙන් හෙවත් ශබ්බවර්ණිත ඛඩ්ගයක් ගෙන කිසිවක්නොදන්නා බාලයක්හු භය ගැත්වූ පුරුෂයක්හුමෙන්; සෙලං, සෙලසංඛ්‍යාතවූ මාණික්‍යය; මං, මා, යාචමානො, යාච්ඤාකරන්නෙහි; තාසෙසි, ත්‍රාසකෙළෙහි; තෙ, තට; තං, ඒමැණික; නදස්සං, නොදෙමි; අතියාචකොසි, අධිකව යාච්ඤාකෙළෙහි වී, එහෙයින්; තෙ. තාගේ; අස්සමං අපී, ආශ්‍රමයටද; නච ආගමිස්සං, ඉතිකිත් නොඑමි.

364 න තං යාචෙ යස්ස පියං ජිගිංසෙ
දෙස්සො හොති අතියාචනාය,
නාගො මණිං යාචිතො බ්‍රාහ්මණෙන
අදස්සනංයෙව තදජ්ඣගාමාති.

යස්ස, යම්පුද්ගලයක්හට; පියං, යම්වස්තුවක් ප්‍රියයි; ජිගිංසෙ, දන්නාලදද; තං, ඒවස්තුව; න යාචෙ, යාච්ඤා නො කරන්නේය (කුමක්හෙයින්දයත්?) අතියාචනාය, ප්‍රමාණ නොදැන අතිරේක

කොට කළ යාච්ඤාව හෙතුකොටගෙන; දෙස්සො හොති, යාචකයා කෙරෙහි වෙෂවත්තේය (එසේමැයි); බ්‍රාහ්මණෙන, බමුණා විසින්; මණිං, මැණික; යාචිතො, යාච්ඤා කරනලද; නාගො, මණිකණ්ඨකනම් නාගරාජයා; අදස්සනං ගෙව, නොදක්පමම; තං, එතැත්පටන්; අජ්ඣගමා, පැමිණිය- යම්සේ මණිකණ්ඨකනම් නාගරාජයා තපස්වින් කෙරෙහි ඒසාමහත් ප්‍රේමයක් හැරදශීනය නොකැමැතිව නොඅවුත් හැරපිද මේනඝාවස්නුව යාච්ඤානම් බොහෝ දෙනා අප්‍රියවන් කටහෙතුයයමතු ලද්ව ප්‍රෙමයක්කරවා ගනුම් හයි සිනන්නවුන් විසින් යාච්ඤා නොකටයුත්තේය යනුහාවයි.

253 මණිකණ්ඨ ජාතකයයි.

---

365 භුත්වා තිණපරිඝාසං භුත්වා ආචාමකුණ්ඩකං,
එතං තෙ භොජනං ආසි කස්මා දුනි න භුජසි.

තිණපරිඝාසං, අශ්ව වංශභාදීන් විසින් කා අවශෙෂවූ උච්ජිෂ්ට වූතණ; භුත්වා, අනුභවකොට; ආචාම, ආචාමනිගවූ කුනුකැන් දිය හා; කුණ්ඩකං, කුඩු; භුත්වා, අනුභවකොට නොවැඩියෙහි එසේ හෙයින්; තෙ, තාට; එතං, මේ; භොජනං, භොජනවූයේ; ආසි, විය; කස්මා, කුමක්හෙයින්; ඉදානි, දැන්; (ආචාම දිය) න භුජසි, අනුභව නොකෙරේද?

366 යත්ථ පොසං න ජානන්ති ජාතියා විනයෙන වා,
බහු තත්ථ මහාබ්‍රහ්ම අපි ආචාමකුණ්ඩකං.

යත්ථ, යම්තැනෙක්හි; බහු, බොහෝදෙනා; පොසං, පුරුෂයා; ජාතියා සම්පනනජාති ඇත්තේයයි ජාතිය කරණකොට හෙනද; විනයෙන වා, ආචාරවිනයෙන් යුක්තයයි විනයකරණකොට ගෙන ද හෙවත් ස්වරූපවශයෙන්; නජානන්ති, නොහඳුනත්තේ; මහා බ්‍රහ්ම, මහබමුණ; මහාබ්‍රහ්මයයි ආදරයෙන් ආමන්ත්‍රණයි; තත්ථ, එතැත්හිලා; ආචාමකුණ්ඩකං අපි, උළුකැන්දිය ද කුඩු ද අනුභවකෙරේ- තමාගේ ස්වරූප දන්නවුන් නැතිතෙනදී ලදයමක් ම අනුභවකරන්තේයයි සේයි.

367 තුවං ච ඛො මං ජානාසි යාදිසො යං හයුත්තමො,
ජානන්තො ජාන මාගම්ම න තෙ භක්ඛාමි කුණ්ඩකන්ති.

අයං, මේ; හයුත්තමො; අශවයන් කෙරෙහි ශ්‍රෙෂ්ඨයා, යාදිසො, යම්බඳුද එසේවූ; මං, මා; ත්වං ච ඛො, තොපවනාහි; ජානාසි,

දත්තෙහි හෙවත් මාගේ උත්තම අශ්වභාවය වූ පරිද්දෙන් දත්තෙහි; ජානං, දන්නා තා කරා; ජානන්තො, දන්නාවූ මම; ආගම්ම, අවුදින්; තෙ, තාගේ; කුණ්ඩකං, කුඩු; න භක්ඛාමි, නොකමි- කුලප්‍රදෙශාදි හෙයින් නොදන්නාතැනදී ලදයම්දෙයක් අනුභවකළත් නොපසේවූ අනුන්ගේ ශරූපදන්නාවුන් කරා පැමිණි කල්හි හොජන අනුභවනොකරම්යි ආචාමකුණ්ඩකාදිය ප්‍රතික්ෂෙපකෙළේ.

## 254 කුණ්ඩකකුච්ඡිසින්ධවජාතකයයි.

---

368 යාව සො මත්තමඤ්ඤාසි භොජනස්මිං විහඞ්ගමො,
තාව අද්ධානමාපාදි මාතරං ච අපොසයි.

යාව, යම්තාක්; සො විහඞ්ගමො, ආකාශචාරී හෙයින් විහඞ්ගම නම්වූ ඒගිරව්; භොජනස්මිං, භොජනයෙහි; මත්තං, ප්‍රමාණ; අඤ්ඤාසි, දත්ද; තාව, ඒතාක්කල්; අද්ධානං, දීඝකාලයක්; ආපාදි, පැමිණි හෙවත් බොහෝකලක් ආයුවැළඳීය; මාතරංච, මෑණියන්ද; අපොසයි, පොෂ්‍යකළ; "මාතරංච"යි දෙශ[illegible]ාශ හෙයින් වදාළබව මුත් මෑණියන්ද පියාණන්ද දෙදෙනා රක්‍ෂාකළයි වදාළේ.

369 යතො ච ඛො බහුතරං භොජනං අජ්ඣුපාහරි,
තතො තත්ථෙව සංසීදි අමත්තඤ්ඤූ හි සො අහු.

යතො ච ඛො, යම්කලෙක්හි වනාහි; සො, ඒ ගිරේ; බහුතරං, අධික කොට; භොජනං, ආහාරය; අජ්ඣුපාහරි, කෑයේවීද; සො, ඒගිරේ; අමත්තඤ්ඤූහි, අමාත්‍රඥ; අහු, වීද; තතො, එකල්හි, තත්ථෙව, ඒ සමුද්‍රයෙහිම; සංසීදි, ගැලිණි- ගැලී සමුද්‍රයෙහි මත්‍ස්‍යයන්ට බත්වියයි සේයි.

370 තස්මා මත්තඤ්ඤුතා සාධු භොජනස්මිං අගිද්ධතා,
අමත්තඤ්ඤූ හි සීදන්ති මත්තඤ්ඤූ ච න සීදරෙති.

යස්මා, යම්හෙයකින්; අමත්තඤ්ඤූහි, ආහාරයෙහි අමාත්‍රඥයෝ; සීදන්ති, සමුද්‍රයෙහි ගැලෙත්ද; මත්තඤ්ඤූ, භොජනයෙහි මාත්‍රඥයෝ; න සීදරෙ, නොගැලෙන්නාහුද හෙවත් සමුද්‍රයෙහි ගැලීවිනාශයට නොයෙද්ද; තස්මා, එහෙයින්; භොජනස්මිං, භො

ජනයෙහි; මත්තඤ්ඤුතා, මාත්‍රඥබවද; අගිද්ධතා, ගිජුනොවනබවද, සාධු; ප්‍රශස්තයි.

### 255 සූ ක ජා ත ක ය යි.

371 ජරුදපානං ඛණමානා වාණිජා උදකත්ථිකා,
අජ්ඣගංසු අයොලොහං තිපුසීසං ච වාණිජා.

372 රජතං ජාතරූපච මුත්තා වෙළුරියා බහූ,
තෙ ච තෙන අසන්තුට්ඨා භිය්‍යො භිය්‍යො අඛාණිසුං.

ජරුදපානං, මහලුළිඳක්; ඛණමානා, කණින්නාවූ; උදකත්ථිකා, ජලාර්ථීවූ; වාණිජා, වෙළෙඳහු; අයොලොහං, කාළලොහ තාම්‍රලොහයටද; තිපු, සුදුතුඹයටද; සීසංච, කළුතුඹයටද; රජතං, රිදියටද; ජාතරූපච, සුවර්ණයටද; බහූ, බොහෝවූ; මුත්තා, මුක්තාවටද; වෙළුරියා, වෛදූර්‍ය්‍යමාණික්‍යයටද; අජ්ඣගංසු, පැමිණියහ; තෙන, ඒලබ්ධවස්තුවෙන්; අසන්තුට්ඨා, අසන්තුෂ්ටවූ; තෙ ච වාණිජා, ඒව්‍යාපාරයෝ; භිය්‍යො භිය්‍යො, වඩවඩාලා; අඛාණිසුං, කැණියහ.

373 තෙ තත්ථාසිවිසො ඝොරො තෙජස්සී තෙජසා හනි,
තස්මා ඛණෙ නාති ඛණෙ අතිඛාතං හි පාපකං,
ඛාතෙන ච ධනං ලද්ධං අතිඛාතෙන නාසිතන්ති.

තෙ, ඒ කණින්නාට පටන්ගත් ව්‍යාපාරයන්; තත්ථ, එහිලා; තෙජස්සී, තෙජස්මත්වූ; ඝොරො, දරුණුවූ; ආසිවිසො, ආශීවිෂයෙක්; තෙජසා, තමාගේ විෂතෙජසින්; හනි, පහළ; තස්මා, එහෙයින්; ඛණෙ, කණින්නේය; නාතිඛණෙ, අතිරෙකකොට නො කණින්නේය; කුමක්හෙයින්දයත්? අතිඛාතංහි, අතිශයින් ඛාතය වනාහි; පාපකං, ලාමකයි; ඛාතෙන, ප්‍රමාණාන්විතඛාතය හෙතුකොට ගෙන; ධනං, මුක්තාදී වස්තුව; ලද්ධං, ලබනලද; අතිඛාතෙන, ප්‍රමාණාතික්‍රාන්ත ඛාතය හෙතුකොටගෙන; නාසිතං, ලදවස්තුවද නසනලදී- ව්‍යාපාරයෝ පැන්පිණිස ළිත්බිඳ ඉත් වස්තුප්‍රතිලාභය කොට තවද වස්තුපිණිස භූමිඛාතය කොට නාගරාජයාගේ මස්තකයෙහි පාංශු බහා කොප කාරවා විෂාග්නීන් දග්ධව ලද

වස්තුව අනුභව කොට නොහී විනාශයට පැමිණියහ එසේහෙයින් ලද්දෙයින් තුෂ්ටනොව අධිකයට ප්‍රාර්ථනාව විනාශකරය යන අභිප්‍රායයි.

## 256 ජරූදපානජාතකයයි.

---

374 නායං ඝරානං කුසලො ලොලො අයං වලීමුඛො,
කතං කතං ඛො දූසෙය්‍ය එවං ධම්මමිදං කුලං.

අයං, මේතෙම; ඝරානං, ගෘහයන් සම්බන්ධව; කුසලො න, දක්‍ෂ නොවෙයි; ගෘහකරණයෙහිද ගෘහවිචාරණයෙහිද දක්‍ෂනොවෙයි යේයි; ලොලො, ලුබ්ධප්‍රකෘතිවූ; වලීමුඛො, රැලිහූන් මුහුණුඇති; අයං, මේතෙම; කතං කතං ඛො, කළකළදෙය වනාහි; දූසෙය්‍ය, විනාශයට පමුණුවන්නේය, එසේමැයි; ඉදං කුලං, මේ වානරකුලය; එවං ධම්මං, මෙබඳු ස්වභාව ඇත්තේයි.

375 නයිදං චිත්තවතො ලොමං නායං අස්සාසිකො මිගො,
සිට්ඨං මෙ ජනසන්ධෙන නායං කිඤ්චි විජානති.

චිත්තවතො, පරීක්‍ෂණඥානයෙන් යුක්තවූ යමක්හට; ඉදං ලොමං, මෙසේවූ රූක්‍ෂවූ ලොමය; න, නැත; ප්‍රඥාවතුන්ගේ ශරීරයෙහි ලොම් සූක්‍ෂමවනොත් මුත් මෙසේ රූක්‍ෂනොවෙයි යේයි; අයං, මේතෙම; අස්සාසිකො, මෙරම්භා අස්වසන; මිගො, මෘගයෙක්; න, නොවෙයි හෙවත් අනුන්ට අනුශාසනාකොට අස්වසන්නාට සුදුසු එකෙක්නොවෙයි; අයං, මේතෙම; කිඤ්චි, කිසිවක්; නවිජානාති, නොදන්නේයයි; මෙ, මට; ජනසන්ධෙන, ජනසන්ධරජහු විසින්; සිට්ඨං, අනුශාසනා කරනලදී- මූ කිසිවක් නොදන්නා බව මට කියන ලදූයි යේයි.

376 න මාතරං වා පිතරං වා භාතරං භගිනිං සකං,
භරෙය්‍ය තාදිසො පොසො සිට්ඨං දසරථෙන මෙති.

මාතරංවා, මෑණියන්වේවයි; පිතරංවා, පියාණන් වේවයි; භාතරං, මලනුබෑයකුවේවයි; භගිනිං, නඟක බූනකු වේවයි; සකං, මිත්‍රයකුවේවයි; තාදිසො, එබඳුවූ; පොසො, පුරුෂයෙක්; න භරෙය්‍ය, භරණය නොකරන්නේයි; මෙ, මට; දසරථෙන, දශරථනම්

රජහුවිසින්; සජ්ජං, අනුශාසනා කරනලදී හෙවත් උගන්වනලදී.

## 257 ආදාසමුඛජාතකයයි.

(ගාමණිචණ්ඩජාතකයයිද කියත්)

———o:():o———

377 යාවතා චන්දිමසුරියා පරිහරන්ති දිසා භන්ති විරෙචනා,
සබ්බෙව දාසා මන්ධාතා යෙ පා පඨවිනිස්සි ා.

චන්දිමසුරියා, චන්ද්‍රසූර්‍ය්‍යයිදෙදෙන; යාවතා, යම්පමණ ස්ථානයකින්; පරිහරන්ති, මෙරු පරිහරණය කෙරෙද්ද; හෙවත් පැදකුණු කොටයෙද්ද; යාවතා, යම්පමණවූ; දිසා, සියලු දිගුන්; භන්ති, බබුළුවද්ද; යාවතා, යම්පමණ ස්ථානයක්; විරොචනා, බබලනා ස්වභාවයෝද; ඒතාක්තැන්; පඨවිනිස්සිතා, භූමිආශ්‍රිතවූ; යෙ පාණා, යම් ප්‍රාණිකෙනෙක් ඇද්ද; තෙ සබ්බ එව, ඔහුහැම්දෙනම; මන්ධාතා, මන්ධාතුරජහුගේ; දාසා, දාසයෝය- යම්තාක්තැන්හි හිරු සඳු දෙදෙන පවතිද්ද ඒ තාක්තැන ජනයෝ මන්ධාතුනම් රජ්ජුරුවෝ අපගේ ස්වාමීයයි ස්වාමිත්වය කරණකොට ගෙන වෙසෙත්නුයි උන්ට නොගැතිවූද සත්වයෝ දාසයෝමයයි සේයි.

378 න කහාපණවස්සෙන තිත්ති කාමෙසු විජ්ජති,
අප්පස්සාද දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො.

කහාපණවස්සෙන, කාර්ෂාපණවර්ෂයෙන් හෙවත් දාසභූත සත්වයන් පිණ්ස වමත හකුළුවා දකුණතින් හස්තාස්ඵොටනය කළ කල ධාරානිපාත වර්ෂයේ වැගිරෙන කාර්ෂාපණයෙන් පොවා; කාමෙසු, වස්තුකාම ක්ලෙශකාමයෙහි; තිත්ති, තෘප්තියෙක්; නවිජ්ජති, නැති; එසේ හෙයින් තෘෂ්ණා මෙසේ දුස්පූරයයිකියාද; කාමා, කාමයෝ; අප්පස්සාද ඉති, අල්පවූආශ්වාද ඇත්තෝයයි කියාද; දුක්ඛා, කායිකචෛතසික දුඃඛයන්ට හෙතුහෙයින් දුක්ඛයයි කියාද; ඉති, මෙසේ; පණ්ඩිතො; ප්‍රාඥයා; විඤ්ඤාය, දැන-

379 අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති,
තණ්හක්ඛය රතො හොති සම්මාසම්බුද්ධ සාවකො.

සො, ඒ තත්වඥ පුරුෂයා; දිබ්බෙසු, දිව්‍යවූ; කාමෙසු අපි, කාමයෙහිදු පොවා; රතිං, ඇල්මට; නාධිගච්ඡති, නොපැමිණෙන්

ශෙත්ය; එසේ මැයි; සම්මාසම්බුද්ධ, සම්‍යක්සම්බුද්ධයන්ගේ; සාවකො, ශ්‍රාවකයා; තණ්හක්ඛය, තෘෂ්ණාවගේ ක්‍ෂයකිරීමෙහි නොහොත් නිර්වාණයට පැමිණ තෘෂ්ණාව ක්‍ෂයවනහෙයින් තණ්හක්ඛයයයි කියනලද නිර්වාණයෙහි; රතො, අභිරතවූයේ; හොති, වන්නේය- සර්වඥශාසනයෙහි ශ්‍රද්ධාවෙන් අවගාහණය කළ මහණ මනුෂ්‍යලොකයෙහි අල්පාස්වාදවූ කාමයෙහි අභිරති තබා ස්වර්ග ලොකයෙහි අග්‍රවූ කාමාස්වාදයෙහි අභිරති හැර නිර්වාණයම අභිකාංක්‍ෂාකොට මනස්කාරයෙහිම ප්‍රයුක්තවන්නේයයි යනු අභිප්‍රායයි.

258 මන්ධාතුජාතකයයි.

---

380 නයිමස්ස විජ්ජාමයමත්ථි කිඤ්චි
න බන්ධවො නො පන තෙ සහායො,
අථ කෙන වණ්ණෙන තිරීටවච්ඡො
තෙදණ්ඩිකො භුඤ්ජති අග්ගපිණ්ඩං.

ඉමස්ස, මේතපස්වියාගේ; විජ්ජාමයං, විද්‍යායෙන් නිර්මිතවූ; කිඤ්චි, කිසිප්‍රයොජනයෙක්; න අත්ථි, නැත; තෙ, තාගේ; බන්ධවො, නෑයෙකුදු; නො, නොවෙයි; තෙපන, තාගේවනාහි; සහායොනො, බාල්‍යාවස්ථාවෙහි සිට කැටිව වැඩි යහළුවෙකුත් නොවෙයි; අථ, එතකුදුවුව; කෙන වණ්ණෙන, කවරනම් කාරණයකින්; තිරීටවච්ඡො, තිරීටවච්ඡනම්ලද; තෙදණ්ඩිකො, ත්‍රිදණ්ඩඇති තැනැත්තේ; අග්ගපිණ්ඩං, අධිකවූරස ඇතිහෙයින් අග්‍රනම්වූ පිඬු පිඬුකොට කනහෙයින් පිණ්ඩයයි කියනලද මේ අග්‍රබත; භුඤ්ජති, අනුභව කෙරෙයි;එසේවූ නිෂ්ප්‍රයොජනව මෙබතකුමටකයිදැයි විචාලේ- කොණ්ඩිකාව තබනුපිණිස තිදණ්ඩක්ගෙන ඇවිදිනාහෙයින් තෙදණ්ඩිකයයි ව්‍යවහාර කෙරෙත්.

381 ආපාසු මෙ යුද්ධපරාජිතස්ස
එකස්ස කත්වා විවනස්මිං ඝොරෙ,
පසාරයී කිච්ඡගතස්ස පාණිං
තෙනුද්ධතාරිං දුඛසම්පරෙතො.

යුද්ධ, සමරභූමියෙහි; පරාජිතස්ස, පරදවනලද; කිච්ඡගතස්ස, දුඃඛයට පැමිණියාවූ; එකස්ස, අද්විතීයවූ; මෙ, මට; ආපාසු, ආපද

යෙහි; කත්වා, අනුග්‍රහ කොට; ඝොරෙ, දරුණුවූ; විවනස්මිං, ජල දුර්ගවූ අරණ්‍යයෙහි; පාණිං, ව්‍යසනයෙන් ප්‍රතිසංයුක්ත හස්තතලය; පහාරයී, දික්කෙළේ් හෙවත් යුධයෙහි පරදවනලදුව හයින් වලට වැද පැන්නොලදින් ළිදෙක හී දුක් ගන්නාවූ මට හිණික් බැඳ වීයසීකොට අත දික්කෙළේ්; තෙන, ඒකාරණයෙන්; දුඛසම්පරෙතො, දුකින්මඩනාලද්දවූ මම; උද්ධාරිං, කූපයෙන් ගොඩට නැංගෙමි.

382 එතස්ස කිච්චෙන ඉධානුපත්තො
වෙසායිනො විසයා ජීවලොකෙ,
ලාභාරහො තාත තිරීටවච්ඡො
දෙථස්ස භොගං යජතඤ්ච යඤ්ඤං.

එතස්ස, මේ තාපසයාගේ; කිච්චෙන, අනුග්‍රහයෙන් හිණිබැඳ ළිඳටබහා අතදී ගොඩටනැගූ කෘත්‍යයෙන්; ඉධ, මෙයට; අනුපත්තො, (තොමියා) පැමිණියෙමි; වෙසායිනොවිසයා, යමයාගේ විෂයෙන් හෙවත් පරලොවින්මිදී; ජීවලොකෙ, මනුෂ්‍යලොකයෙහි; (වසමි) තාත, පුත්‍රය; තිරීටවච්ඡො, තිරීටවත්සනම් තපස්වී; ලාභාරහො, ලාභයට සුදුසුය; අස්ස, මොහුට; භොගං, (අනුභොග්‍යවූ අර්ථයෙන්) භොගනම්වූ චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යයද; දෙථ, දෙව්; යජතං ච යඤ්ඤං, කියනලද ප්‍රත්‍යයෙන් අවශෙෂවූ යාගද්‍රව්‍යයද දෙව්; "මේතපස්විහු මට කළ උපකාර මේසේ මහත එසේහෙයින් චීවරාදිවූ ප්‍රත්‍යයද අවශෙෂ දන්දදෙව්"යි නියොග කොළේ.

259 තිරීටවච්ඡජාතකයි.

---

383 යස්සත්ථා දූරමායන්ති අමිත්තමපි යාචිතුං,
තස්සූදරස්සහං දූතො මා මෙ කුජ්ඣ රථෙසභ.

අමිත්තම්පි, සතුරාද; යාචිතුං, යාච්ඤාකරන්නට; යස්සත්ථා, සමක්හු පිණිස; දූරං, (මේ සත්‍වයෝ තෘෂ්ණාවසගව) දුරස්ථානය වද හෙවත් කුක්ෂිපොෂ්‍යය පිණිස සතුරෙකුදු ධනවත්වීනම් උගෙන් කිසිවක් ඉල්වාගනුම්හයි ලොභවසගව අතිදූර දෙශයට පොවා; ආයන්ති, යෙත්ද; තස්සූදරස්ස, එසේවූ උදරයාගේ; අහං, මම; දූතො, දූතයෙමි; රථෙසභ, රාජොත්තමය; මෙ, මට; මා කුජ්ඣි, නොකිප.

384 යස්ස දිවා ච රත්තො ච වසමායන්ති මානවා,
තස්සූදරස්සහං දූතො මා මෙ කුජ්ඣ රථෙසභ.

යස්ස, යම් උදරයක්හුගේ; වසං, වශගබවට; මානවා, සත්වයො; දිවා ච, දවහල්ද; රත්තො ච, රාත්‍රියෙහිද; ආයන්ති, පැමිණෙත්ද; තස්ස උදරස්ස, ඒ උදරයාගේ; අහං, මම්; දූතො, දූතයෙමි; රථෙසභ, රජඋතුම; මෙ, මට; මා කුජ්ඣි, නොකිප.

385 දදාමි තෙ බ්‍රාහ්මණ රොහිණීනං ගවං සහස්සං සහ පුඞ්ගවෙන
දූතො හි දූතස්ස කථං න දජ්ජා මයම්පි තස්සෙව භවාම දූතා.

බ්‍රාහ්මණ, බමුණ; පුංගවෙන සහ, වෘෂභරාජයක්හු හා සමග; රොහිණීනං, රැතිවූ; ගවං, ගෙරි; සහස්සං, සහස්‍රයක්; තෙ, තට; දදාමි, දෙමි; (එසේමැයි): දූතො හි, දූතයෙක් වනාහි; දූතස්ස, දූතයෙක්හට; කථං, කුමටනම්; න දජ්ජා, නොදේද; මයම්පි, මම්ද අවශෙෂවූ ජනයෝද; තස්සෙව, ඒතාකියනලද උදරයාටමැ; දූතා, දූතවූවමු; භවාම, වම්හ— "මයම්පි" කීතැන අපිශබ්ද අනුක්ත සමුච්චයාර්ථමය, එසේහෙයින් "මම්ද ජනයෝද" යි යන අර්ථයි.

260 දූ ත ජා ත ක ය යි.

---

පළමුවන සඞ්කප්පවග්ගයයි.

——— o§()§o ———

386 යථා කෙසා ච මස්සූ ච ඡින්නං ඡින්නං විරූහති,
එවං රූහතු තෙ නාසා පදුමං දෙහි යාචිතො.

යථා, යම්සේ; කෙසා, කෙශයෝද; මස්සු ච, ශ්මශ්‍රැද; ඡින්නං ඡින්නං, කැපූ කැපූසේ; විරූහති, (නැවත) හටගනීද; එවං, එපරිද්දෙන්; තෙ, තාගේ; නාසා, නාසිකාතොමෝ; රූහතු, (නැවත) හට ගනීවා; යාචිතො, (අප විසින්) ඉල්වනා ලද්දෙහි; පදුමං, පියුමක්; දෙහි, දේ.

387 යථා සාරදිකං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති,
එවං රූහතු තෙ නාසා පදුමං දෙහි යාචිතො.

යථා, යම්සේ; සාරදිකං, සරත්කලැගෙනැතුබූ; බීජං, (සරු) බීජුවට; ඛෙත්තෙ, ක්ෂෙත්‍රයෙහි; වුත්තං, වපුරනලද්දේ; විරූහති, හට

ගනීද; එවං, එපරිද්දෙන්; තෙ, තාගේ; නාසා, නාසිකාතොණ්ඩි; රුහතු, හටගනීවා; යාචිතො, යාච්ඤා කරන ලද්දෙහි; පදුමං, පද්මයක්; දෙහි, (මට) දේ.

388 උභොපි පලපන්තෙ තෙ අපි පදුමානි දස්සති,
වජ්ජු වා තෙ න වා වජ්ජු නත්ථි නාසාය රූහණා.
දෙහි සම්ම පදුමානි යාචිතො ති.

පදුමානි, පද්මයන්; දස්සති, (අපට) දෙන්නේයයි සිතා; එතෙ උභො අපි, මොහු දෙදෙන වනාහි; පලපන්ති, මිථ්‍යාප්‍රලපනය කෙරෙති හෙවත් තොපගේ නාසය හටගන්නීකියා නැළවිලි වචනයෙන් පද්මයන් දුන යෙහෙකැයි බොරු කියති; තෙ, ඔහු; වජ්ජු වා, නාසා හටගන්නී කියත්වයි; නවා වජ්ජු, නාසාහටගන්නී නො කියත්වයි; නාසාය, නාසිකාවගේ; රූහණා, හටගැන්මෙක්; නත්ථි, නැත; සම්ම, යහළු; යාචිතො, ඉල්වනලද්දෙනි; පදුමානි, පද්මයන්; දෙහි, දේ.

## 261 පදුමජාතකයයි.

---

389 පාණි චෙ මුදුකො චස්ස නාගො චස්ස සුකාරිතො,
අන්ධකාරෙ ච වස්සෙය්‍ය අථ නූන තදා සියා.

චෙ, ඉදින්; පාණිච, හස්තතලයද; මුදුකො අස්ස, මොළොක් වූයේ වීනම්; නාගොච, හස්තිද; සුකාරිතො අස්ස, මනාකොටැ හික්මවනලද්දේ වීනම්; අන්ධකාරොච, (රාත්‍රියෙහි) අන්ධකාරයෙක්ද වීනම්; වස්සෙය්‍ය, (එමැ අන්ධකාරයෙන් යුක්ත රාත්‍රියෙහි) වැසි වස්නේවීනම්; තදා, එකල්හි; අථ,† ඉක්බිත්තෙන්; නූන, ඒකාන්තයෙන්; සියා, (අපදෙදෙනාගේ අභිප්‍රායාර්ථ සිද්ධිය) වන්නේයි.

390 අනලා මුදුසම්භාසා දුප්පූරා තා නදීසමා,
සීදන්ති නං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ.

මුදු, මොළොක්වූ; සම්භාසා. සම්භාෂණයෙන් හෙවත් ප්‍රේමණීයවූ වචනයෙන්; අනලා, තමාකෙරෙහි දීර්ඝකාලයක් වසවත්නට නොපිළිවන්හයි දුටු තෙපුලෙනුදු සැහැ නොහැක්කාහයි සේයි- නොහොත්; අනලා, කෙනෙක් පුරුෂයෝත් මොවුන්ට පමණ නොවෙත්නුයි "අනලා" නම්වෙති; මුදුසම්භාසා, මෘදු (සම්භාෂණ

---

† "එසේකල්හි නොහොත්" යනු පැනේ, හේ අධිකපාඨයකැ"යි හඟිමු.

යෙන්) සම්භාෂණ ඇත්තාහ; "හෘදයකඩොරවූවද මොලොක් කොටැ බණන්නාහුයැ"යි සේයි; දුප්පූරා, දුෂ්පූරයහ හෙවත් කෙනෙක් ප්‍රවාහ අවද අධොගඞ්ගාවටමැ ප්‍රවිෂ්ටවනහෙයින් දුෂ්පූරවූ; නදීසමා, ගඞ්ගාප්‍රතිභාගයහ; ගඞ්ගාව කෙනෙක් වතුරෙකුදු පිරීමට නොයන්නාක් මෙන් කෙනෙකුදු අනුභවකළ මෛථුනයෙන් පරිතුෂ්ට නොවන්නාහ"යි සේයි; සීදන්ති, (තමන්ට වශගබවට පැමිණියවුන් අපායෙහි) ගලති; විදිත්වා, (ප්‍රෙක්ෂාපූර්වකාරී සත්පුරුෂයා ආදීනවවශයෙන් මෙසේ) දැන; ආරකා, දුරින්මැ; පරිවජ්ජයෙ,(මෛත්‍රී ගුණයෙන් යුක්ත ස්ත්‍රීන්) දුරැකරන්නේයි- මෙහි "නං" යනු නිපාතයි.

391 යං එතා උපසෙවන්ති ඡන්දසා වා ධනෙන වා,
ජාතවෙදෙව සංඨානං ඛිප්පං අනුඩහන්ති නං.

එතා, මේ ස්ත්‍රීහු තම් (පුරුෂයක්හු); ඡන්දසා වා, (තමන්ගේ)රුචිවශයෙන් වේවයි;ධනෙන වා,වස්තුප්‍රතිලාභය හෙතුකොට ගෙනැ වේවයි; යං, යම්ක්හු; උපසෙවන්ති, සෙවනය කෙරෙත් ද; සංඨානං, ස්වකීය ස්ථානය (දවන); ජාතවෙදෙ ඉව, ජාතමාත්‍රය කින් ප්‍රකාශවන හෙයින් ජාතවෙදනම්වූ වහ්නියමෙන්; ඛිප්පං, වහා; නං, ඒ (තමන් උපසෙවනයකළ) පුරුෂයාම්‍ය; අනුඩහන්ති, දවත්- "යම්සේ ගිනි ගෘහාදිවූ යම්ස්ථානයෙක්හි සමුත්පන්නවූයේ ඒස්ථානය දවා භස්මභාවයට පමුණුවාද එපරිද්දෙන් ස්ත්‍රීහු යම් පුරුෂයක්හු භජනය කෙරෙත්ද ඒ පුරුෂයා යශස් ධන ශීලප්‍රඥාදීන් විනාශයකොටැ හානියට පමුණුවති"යි සේයි.

262 මුදුපාණිජාතකයයි.

——ං:[ ]:ං——

392 අභිජ්ජමානෙ වාරිස්මිං සයං ආගම්ම ඉද්ධියා,
මිස්සීභාවිත්ථියා ගන්ත්වා සංසීදසි මහණ්ණවෙ.

වාරිස්මිං,ජලය;අභිජ්ජමානෙ,අවලකල්හි හෙවත් සාගරයෙහි තරඞ්ගභඞ්ගයෙන් අනාලොලිතවැ සත්හුන් වේලෙහි ජලයෙහි මිශ්‍රනොවැ; සයං, තෙමේමැ; ඉද්ධියා, සෘද්ධීන්; ආගම්ම, අවුත්; ඉත්ථියා, ස්ත්‍රියගා; මිස්සීභාවං, මිශ්‍රබවට; ගන්ත්වා, ගොසින්; මහණ්ණවෙ, මහාර්ණවයෙහි; සංසීදසි, ගැලෙහි.

393 ආවට්ටනී මහාමායා බ්‍රහ්මචරියවිකොපනා,
සීදන්ති නං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ.

ආවට්ටනී, (මේ ස්ත්‍රීහු නම් කාමාවර්තියෙන් ආවර්තනය කරන හෙයින්) ආවර්තනීහ; "තමා කෙරෙහි හුණුවස්තුවක් බමවා නො යා දෙන ජලාවර්තියක් මෙන් තමා කෙරෙහි සක්තපුරුෂයන් සංසාරයෙහි බමවා නිර්වාණයට නො යා දෙන්නාහුය"යි සේයි; මහාමායා, (අපයඝීනාතමායාවෙන් යුක්ත හෙයින්) මහාමායා නම් වෙති; බ්‍රහ්මචරිය, (මෛථුන විරති සංඛ්‍යාතවූ) ශ්‍රෙෂ්ඨ චය්‍ර්‍යාවන්ගේ; විකොපනා, විනාශකිරීමෙන්; සීදන්ති, (පුරුෂයන් අපායෙහි) ගල්වති; "අපායභාක් කෙරෙති"යි සේයි; විදිත්වාන, (මෙසේ ආදීනව ප්‍රකාරයෙන්) දැන; ආරකා, දුර්න්මැ; පරිවජ්ජයෙ, (නුවණැති පුරුෂයා ස්ත්‍රීන්) දුරුකරන්නේයි- මෙතැන්හිදු "නං" යනු නිපාතයි.

394 යං එතා--පෙ--අනුඩහන්ති තන්ති.

"යං එතා උපසෙවන්ති" යනාදි ගාථාවට මුදුපාණි ජාතකයෙහිමැ කියනලද අර්ථ ඇත්තේයි.

263 චුල්ලපලොභනජාතකයයි.

---

395 පණාදෙ නාම සො රාජා යස්ස යූපො සුවණ්ණයො,
තිරියං සොළසුබ්බෙධො උච්චමාහු සහස්සධා.

යස්ස, යම්රජක්හුගේ; සුවණ්ණයො, සුවර්ණමයවූ; යූපො, ප්‍රාසාදය; තිරියං, සරසින්; සොළසුබ්බෙධො, ෂොඩශ ශරප්‍රමාණවන- "සොළොස්හීසනක් පමණය"යි සේයි; උච්චං, උසින්; සහස්සධා, සහස්‍ර කාණ්ඩ ප්‍රමාණයැයි; ආහු, කිවූද; සො රාජා, ඒ රජ තෙමේ; පණාදෙ නාම, පණාද නම- ශරසහස්‍රයක් හූගේ ප්‍රමාණය නියත කොටැ "පඤ්චවිංශතියොජනප්‍රමාණයැ"යි කියති, ෂොඩශ ශරයාගේ ගති ප්‍රමාණ කොටැ "පලලින් අඩියොජන ප්‍රමාණයැ"යි කියත්.

396 සහස්සකණ්ඩො සතගෙණ්ඩු ධජාලු හරිතාමයො,
අනච්චුං තත්ථ ගන්ධබ්බා ඡ සහස්සානි සත්තධා.

සහස්සකණ්ඩං, උසින් දහසක් කාණ්ඩ ප්‍රමාණවූ හේ මාලිගාව: සතගෙණ්ඩුං, සියක්මාල් ඇත්තේ; ධජාලු, ධවජයෙන් ගැවැසිගත් තේය; හරිතාමයො, නිල්මැණිකින් පරික්ෂිප්තය, ගැවසීගත්තේය; තණ, එහිලා; ඡසහස්සානි, සදහසක්; ගන්ධබ්බා, ගන්ධර්වයෝ- නටා ගී කියන නළුවෝ; සත්තධා,සප්තප්‍රකාරවූ හෙවත් සත්මඩුල් ලක්වගෙන; අනච්චුං, නැටූ.

397 එවමෙතං තදා ආසි යථා භාසසි භද්දජි,
සක්කො අහං තදා ආසිං වෙය්‍යාවච්චකරො තව.

භද්දජි, භද්දජි නම් සථවිරයෙනි; යථා භාසසි, යම්සේ කිවුද; එතං එවං, ඒ එසේමය; තදා, එකල්හි; තාව, තට; වෙය්‍යාවච්ච කරො, වෛය්‍යාවච්චකරවූ හෙවත් විශ්වකර්මයා එවා මාලිගාව නං වා දුන්; අහං, මම; තදා, එකල්හි; සක්කො ආසිං, ශක්‍ර වීමි.

264 ම හා ප ණා ද ජා න ක ය යි.

(භද්දජිජාතකයයිද කියත්)

———oo———

398 දිස්වා ඛුරප්පෙ ධනුවෙගනුන්නෙ
ඛග්ගෙ ගහීතෙ තිඛිණෙ තෙලධොතෙ,
තස්මිං භයස්මිං මරණෙ වියූල්හෙ
කස්මානු තෙ නාහු ඡම්භිතත්තං?

ධනුවෙගනුන්නෙ, චාපවෙගයෙන් හරනාලද; ඛුරප්පෙ, මිහහිතලද; දිස්වා, දැක; තෙලධොතෙ, තෙල්සතලා සෝධන ලද; තිඛිණෙ, තීක්ෂණවූ මුවහත් ඇති; ගහිතෙ, (ඛඩ්ගමුෂ්ටියෙහි මතා කොට) ගත්නාලද; ඛග්ගෙ, ඛඩ්ගයන්; දිස්වා, දැක; මරණෙ, මරණ; වියූල්හෙ, උපස්ථිතවූ; තස්මිං භයස්මිං, ඒ භයෙහි ද; තෙ, තට; කස්මා, කුමක්හෙයින්; ඡම්භිතත්තං, ශරීරචලනය; න අහු, නොවීද?

399 දිස්වා ඛුරප්පෙ ධනුවෙගනුන්නෙ
ඛග්ගෙ ගහිතෙ තිඛිණෙ තෙලධොතෙ,
තස්මිං භයස්මිං මරණෙ වියූල්හෙ
වෙදං අලත්ථං විපුලං උළාරං.

ධනුවේග, චාපවේගයෙන්; නුනෙන, හරනාලද; ඛුරප්පෙ, භී
ය; දිස්වා, දක; තෙලධොතෙ, තෙල්සතලා ශුඩකළ; තඛිණෙ, සි
යුම් මුවහත්ඇති; ගණ්හෙ, (මුෂ්ටියෙහි) ගන්නාලද; ඛග්ගෙ, ඛඩ්ග
යන්; දිස්වා, දක; මරණෙ, මරණය; විජ්ජුල්හෙ, පැමිණි කල්හි; තස්
මිං භයස්මිං, ඒ භයෙහි; විපුලං, බොහෝවූ; උළාරං, උත්තමවූ ම;
වෙදං, තුෂ්ටියක්; අලත්ථං, ලදිමි.

400 සො වෙදජාතොජ්ඣනවිං අමිත්තෙ
පුබ්බෙව මෙ ජීවිතමාසි චත්තං,
න හි ජීවිතෙ ආලයං කුබ්බමානො
සූරො කයිරා සූරකිච්චං කදාචිති.

වෙදජාතො, (සතුරන් දුටු) සන්තුෂ්ටවූ; සො, හේ (මම); අමි
ත්තෙ, සතුරන්; අජ්ඣනවිං, අභිභවනය කෙළෙමි; පුබ්බෙව, පළමු
මැ හෙවත්: චොරකාන්තාරයෙහි එතර කෙරෙමින් තොප අතින්
වස්තු ගත්තා සමයෙහි; මෙ, මාගේ; ජීවිතං, ජීවිතය; චත්තං, හර
නා ලද්දේ; ආසි, විය; එසේමැයි: ජීවිතෙ, ජීවිතයෙහි; ආලයං, අ
පෙක්ෂා; කුබ්බමානො, කරන්නාවූ; සූරො, ශූරපුරුෂයා; කදාචි, කි
සි කලෙක්හිදු; සූරකිච්චං, ශූරකෘත්‍යය; නකයිරා, නොමැකරන්
නේයි- ජීවිතාශාව ලත් තට සත්පුරුෂයකුදු විශේෂයෙන් හිංසාදු
කෘත්‍යයෙහි නිඃශ්‍රිතප්‍රාප්තවිය නොහෙන්නේයැයි සේයි.

265 ඛු ර ප්ප ජා ත ක ය යි.

---

401 යෙනාසි කිසියා පණ්ඩු යෙන භත්තං න රුච්චති,
අයං සො ආගතො තාතො කස්මා දානි පලායසි.

යෙන, යම් කාරණයකින්; කිසියා, කෘශවූයෙහි; පණ්ඩු, පාණ්ඩු
වර්ණවූයෙහි; ආසි, විද; යෙන, යම් කුතෙරෙහි කළ ප්‍රෙම කාරණය
කින්; භත්තං, ආහාරය; නරුච්චති, කනු නොකැමැත්තෙහිද; සො,
හේ (තී ප්‍රාණිනාකරන); අයං, මේ; තාතො, පියේ; ආගතො, ආ
ය; ඉදානි, දැන්ම; කස්මා, කුමක්හෙයින්; පලායසි, පලායන්නීද?

402 *නාබො පනාදිකෙනෙව සන්ථවො නාට ජායති,
යසො භායති ඉත්ථීනං තස්මා තාත පලායහං.

ආදිකෙනෙව, පළමුකොටම; සන්ථවො නාම, මෛථුනධර්ම සං
ඛ්‍යාත සංස්තවය; නාබොපන ජායති, නොමැ හටගන්නේයි; කුමක්

---

* සංව පනාදිකෙනෙව-පොත්.

සහයීන්දයන්; ඉත්ථීනං, ස්ත්‍රීන්ගේ; යසො, ගර්විතභාවසංඛ්‍යාතය ශස; හායති, පිරිහෙන්නේය.- හෙවත්: ලොකයෙහි ස්ත්‍රීහු කෝසා ෂගොපනාගයෙනුදු ලද පූරුෂයහට තමන්කෙරෙහි ආදරකරණා ග නුම්හයි සිතා දශ්නාක්ෂණයෙහි අවකාශ නොදෙන්නාහුද; තස්මා, එසේ හෙයින්; තාත, පුත්‍රය; අහං, මම; පලායිං, පැනගියෙමි.

403 යසස්සිනං කුලෙ ජාතං ආගතං යා න ඉච්ඡති,
සොචති චිරරත්තාය වාතග්ගම්ව කුඤ්ජලීති.

යසස්සිනං, යශශ්ශ්‍රී ඇති; කුලෙ ජාතං, ප්‍රශස්තකුලයෙහි ජාත වූ; ආගතං, තමා සමීපයට ආ පූරුෂයා; යා, යම්ස්ත්‍රියක්; න ඉච්ඡති, නොකැමැත්තීද; වාතග්ගං, වාතග්‍රීනම් ලද සෛන්ධවයා නොකැමැත්තවූ; කුඤ්ජලී ඉව, කුඤ්ජලීනම් ගදීභධෙනුව ශොකකළාක් මෙන්; චිරරත්තාය, දීර්ඝකාලයක්; සොචති, ශොකකරන්නේයි.

## 266 වාතග්ගසින්ධවජාතකයයි.

---

404 සිඞ්ගී මිගො ආයතචක්ඛුනෙත්තො
අට්ඨිත්තචො වාරිසයො අලොමො,
තෙනාභිභූතො කපණං රුදාමි
මාහෙව මං පාණසමං ජහෙය්‍ය.

ආයතචක්ඛුනෙත්තො, දශ්නාර්ථයෙන් චක්ෂුස්නම්වූද නයනාර්ථයෙන් නෙත්‍රනම්වූද ආයතවූ චක්ෂුසංඛ්‍යාත නෙත්‍ර මෝහටනුයි "ආයතචක්ඛුනෙත්ත" නම්වූ; අට්ඨිත්තචො, අස්ථිම සම කොටැඇති; වාරිසයො, ජලයෙහි හෝනාවූ; අලොමො, රොමනැති; සිඞ්ගී මිගො, නළ ඇතිහෙයින් මෘගව්‍යවහාර කකුළුවන්ට කරනහෙයින් ශෘඞ්ගී මෘගනම්වූ කකුළුවෙක; තෙන, ඔහු විසින්; අභිභූතො, මඩනාලද්දෙමි; කපණො, බැගෑබවට පැමිණියෙමි; රුදාමි, හඬමි; පාණසමං,(තීගේ) ප්‍රාණයහා සම වූ; මං, මා; මාහෙව ජහෙය්‍ය, නාගමක් හැරපිය- තීගේ ප්‍රාණය හා සමවූ මා හැරැ නොපියයි ති.

405 අය්‍ය තං න ජහිස්සාමි කුඤ්ජර සට්ඨිහායන,
පඨවියා චාතුරන්තාය සුප්පියො හොසි මෙ තුවං.

සට්ඨිහායන, (සැටහවුරුද්දෙන් මද බස්නාහෙයින්) "සට්ඨිහායන"යයි කියනලද; කුඤ්ජර, පොළොව දිරවන හෙයින් කුංජරනම්

ලද; අඤ්ඤ, ස්වාමිය; තං න ජහිස්සාමි, තා(විසන්ත ප්‍රාප්තවූවිහු)නො හරිම්; කුමක්හෙයින්ද යත්? චාතුරන්තාය, සතරදිග පැතිරැ සිටි සමුද්‍රය අවසන්කොට ඇති; පථවියා, පෘථිවියෙහි; තුවං, තෝ; මේ, මාගේ; සුප්පියො, විශෙෂයෙන් ප්‍රියවූයේ; හොසි, වී– “එසේහෙයින් තානියා ප්‍රියයකු හැර නොයම් ගළුවා ගනිම්”යි අස්වැසූ.

406 යෙ කුළීරා සමුද්දස්මිං ගඞ්ගාය යමුනාය ච,
තෙසං ත්වං වාරිජො සෙට්ඨො මුඤ්ච රොදන්තියා පතිං.

සමුද්දස්මිං, සමුද්‍රයෙහිද; ගඞ්ගාය, ගඞ්ගා නම් ගඟැද; යමුනාය ච, යමුනා නම් ගඞ්ගායෙහිද; යෙ කුළීරා, යම් කකුළු කෙනෙක් ඇත්ද; තෙසං, ඔවුන්ට; වාරිජො, දියෙහි උපන්නාවූ; ත්වං, තෝ; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨයෙහි; රොදන්තියා, හඬන්නාවූ මාගේ; පතිං, ස්වාමිහු (ඈත් රජු); මුඤ්ච, හැරපිය- සියල්ලවුන්ටම සොතානුවචනය ප්‍රීතිවඞනය කරන හෙයින් සියලු කකුළුවන්ට ජ්‍යෙෂ්ඨයයි කියා සතුටු කරවා ස්වාමිහු හැරැවූ.

267 කකීමකජාතකයයි.

---

407 යො වෙ සබ්බසමෙතානං අහුවා සෙට්ඨසම්මතො,
තස්සා යං එදිසී පඤ්ඤා කිමෙව ඉතරා පජා.

යො, යමෙක්; වෙ, එකාන්තයෙන්; සබ්බසමෙතානං, සියලුරැස්වූවවුන් අතුරෙහි; සෙට්ඨසම්මතො, ශ්‍රෙෂ්ඨයයි ප්‍රසිද්ධවූයේ; අහුවා, වීද; තස්ස, ඒ සර්වජනජ්‍යෙෂ්ඨයාගේ පවා; අයං පඤ්ඤා, මේ ප්‍රඥ නොමේ; එදිසී, මෙබඳුයි; ඉතරා, මොවුන් කෙරෙන් අන්‍යවූ (ලාමකවූ) ප්‍රඥනොමේ; කිමේව, කෙබඳුදෙ? ශ්‍රෙෂ්ඨයන්ගේ ප්‍රඥ මෙසේ කල ලාමකයන්ගේ ප්‍රඥනම් කෙබඳුදෙ? හෝයි කීමෙන් ‘උන්ගේවූකලි ප්‍රඥ නැතැයි සිතම්හ’යි සේයි.

408 එව මෙවං තුවං බ්‍රහ්මෙ අනඤ්ඤාය විනින්දසි,
කථං හි මූලං අදිස්වා රුක්ඛං ජඤ්ඤා පතිට්ඨිතං?

බ්‍රහ්මෙ, බමුණ; ත්වං, තෝ; අනඤ්ඤාය, (කාරණා කාරණ) නොදැන; එවං එවං, මෙසේ මෙසේ; විනින්දසි, නින්දාකෙරෙහි; පතිට්ඨිතං, බිම්බැසැ පිහිටි; මූලං, මුල; අදිස්වා, නොදැක; රුක්ඛං, වෘක්ෂය; කථං හි, කෙසේනම්; ජඤ්ඤා, හඳුනන්නේද? බමුණාණෙනි

තොප දත්තෝ නින්දා බණනසේමය, ගස නොපුවැ මේගසමුල් දුරබට සෙසුමුල් ළඟබට පි කෙසේ දැනැගත හැකිදැයි කිවු.

409 නාහං තුමෙහ විනින්දාමි යෙ චඤ්ඤෙ වානරා වනෙ,
විස්සසෙනොව ගාරය්හො යස්සායං රුක්ඛරොපකො'ති.

අහං, මම; තුමෙහ, තොපද; වනෙ, වෙනෙහි; යෙව අඤ්ඤෙ වානරා, යම් අනික් වානර කෙනෙක් ඇද්ද ඔවුන්; න විනින්දාමි, නින්දානොකරම්; බලඑකෙක් ඇත; යස්සායං, යමෙකු පිණිස; රුක්ඛ රොපකා, තොපසේ වූවෝ වෘක්ෂරෝපකයෝද හෙවත් තොප වැන්නවුන් ආරාම රොපන ධුරයෙහි සිටිව්ද එසේවූ; විස්සසෙනො එව, විශ්වසෙන නම් රජම; ගාරයෙහා, නින්ද කටයුතුය-නින්ද ලබන්ට සුදුසුයයි සේයි.

268 ආරාම දූසක ජාතකයයි.

---

410 න හි වණ්ණෙන සම්පන්නා මඤ්ජුකා පියදස්සනා,
ඛරා වාචා පියා හොන්ති අස්මිං ලොකෙ පරම්හි'ච.

වණ්ණෙන, (ප්‍රියඞ්ගු කුසුම සමාන) වර්ණයෙන්; සම්පන්නා, සම්පූර්ණවූ; මඤ්ජුකා, ශබ්දමාධූර්‍ය්‍යයෙන් මනොඥවූ; පියදස්සනා, ප්‍රිය දර්ශන ඇත්තාවූ යමෙක්; ඛරා වාචා,යටත්පක්ෂයෙන් මව්පියදෙදෙනාට ආක්‍රොශ පරිභාෂක වශයෙන් කර්කශවූ තෙපුල් ඇත්තේද එසේවූ ඔහු; අස්මිං ලොකෙ, මෙලොවද; පරම්හිච, පරලොවද; නහි පියා හොන්ති, සියල්ලවුන්ට ප්‍රිය නොවේත්-දුටු දුටුවෝ වෛර කෙරෙති, කා පරිද්දෙන්ද යත්? මාගීානනරයෙහි කර්කශනාද පවත්වා බොහෝදෙනාට වෛර ඉපදවූ කිකිසතුණි කාව මෙනැයි ගාථායෙහි නැතද, ප්‍රසතුත කථානතරයෙන් දක්වූහ.

411 නනු පස්සසිමං කාළිං දුබ්බණ්ණං තිලකාහතං,
කොකිලං සණ්හභාණෙන බහුනනං පාණිනං පියං.

කාළිං, කෘෂ්ණවූ; දුබ්බණ්ණං, දුර්වර්ණවූ; තිලකාහතං, කෘෂ්ණතරවූ තිලකයෙන් සමන්විතවූ; ඉමං කොකිලං, මේකොකිලාව; පස්සසි නනු; දක්නෙහිවේද නොහොත් විචාරමි, සණ්හභාණෙන,

එසේවූ දුර්වර්ණාදියෙන් යුක්තවූ කෘෂ්ණ කොකිලයා පොවා මිහිරු කොට බිණීමෙන්; බහූනානං, බොහෝවූ; පාණීනං, ප්‍රාණීන්ට; පියං, ප්‍රියවූව.

412 තස්මා සඛිල වාචස්ස මන්තභාණී අනුද්ධතො,
අත්ථං ධම්මං ච දීපෙති මධුරං තස්ස භාසිතන්ති.

තස්මා, එසේහෙයින් හෙවත් යම්හෙයකින් කර්කශවාක් ඇති පුද්ගලයා මව්පියදෙදෙනාට පවා අප්‍රියවේද එසේහෙයින්; සඛිල වාචො, ශ්ලක්ෂ්ණවූ වචන ඇත්තේ; අස්ස, වන්නේය; මන්ත භාණී, ප්‍රඥාසඞ්ඛ්‍යාත මන්ත්‍රණයෙන් ප්‍රමාණකොට කථාකරන හෙයින් පරිමිතකථා ඇත්තේ; අස්ස, වන්නේය; අනුද්ධතො, ඖද්ධත්‍යය විනා ප්‍රමාණයෙන් යුක්ත කථාකරනහෙයින් අනුද්ධතවූයේ; අස්ස, වන්නේය; අත්ථං, (යමෙක්) අර්ථයද; ධම්මං ච, ධර්මයද; දීපෙති, ප්‍රකාශකොට බෙණේද; තස්ස, ඔහුගේ; භාසිතං, භාෂිතය; මධුරං, මිහුරුය- යමෙක් පාළිය හා පාළි අර්ථදෙක නොහැර කාරණයක් යුක්තකොට අනුන්ට ආක්‍රොශකොට බිණීතමුදු මධුරයයි සේයි.

269 සු ජා න ජා න ක ය යි.

---

413 සබ්බෙහි කිර ඤාතීහි කොසියො ඉස්සරෙ කතො,
සචෙ ඤාති හනුඤ්ඤාතො භණෙය්‍යාහං එකවාචියං.

සබ්බෙහි, සියලු; ඤාතීහි කිර, නෑයන්විසින්; කොසියො, කොසිකයා ;ඉස්සරො, ඊශ්වරවූයේ; කතො, කරනලද හෙවත් අපගේ මේ නෑයන් විසින් බකමූහුණුවා රජකරනලද; සචෙ, ඉදින්; ඤාතීහි, නෑයන්විසින්; අනුඤ්ඤාතො, අනුඥා කරනලද්දෙම් වීන්නම්; අහං, මම; එකවාචියං, කියයුතු එකබසක්; භණෙය්‍යං, බෙණෙම් හෙවත් අපගේ නෑයන් මට රුහැ ණීනොවතොත් බසක්කියා බලමිසි සේයි.

114 භණ සම්ම අනුඤ්ඤාතො අත්ථං ධම්මච කෙවලං,
සන්තිහි දහර පක්ඛි පඤ්ඤවන්තො ජුතින්ධර.

සම්ම, යහළු; අනුඤ්ඤාතො, (අපවිසින්) අනුඥාකරනලද්දෙහි; කෙවලං, හුදක්; අත්ථං, කාරණයද; ධම්මංච, ප්‍රවේණි ධර්මයද යන

ගම්දෙක; භණ, බෙණෙහි; මෘදුකාරණ උවෙණ් කමද යත මේදෙක මුත් අනිකක් නොබණයි සේයි, එසේමැයි; පඤ්ඤාවන්තො, ඥානවත් වූ; ප්‍රතිභාණ, ප්‍රතිභාණවූ හෙවත් ප්‍රඥානාමැති ආලොකධරවූ; දහරා, ළදරුවූ; පක්ඛි, පක්‍ෂීහු; සන්තිහි, ඇත්තෙය- බාලයන් කෙරේ හිත් නුවණැත්තෝ ඇත්මය බාලවූවත් මීට කටයුත්තක් වීනම් කියවයි අවකාශදුන්නාහ.

415 න මෙ රුච්චති භද්දං වො උලූකස්සාභිසෙචනං,
අකුද්ධස්ස මුඛං පස්ස කථං කුද්ධො කරිස්සතීති.

භද්දං වො, තොප හැම්දෙනාට භද්‍රයක් වේවයි; උලූකස්ස, කොසිකයාට; අභිසෙචනං, අභිෂෙකකිරීම; මෙ, මට; න රුච්චති, අභිමත නොවේ; කුමක්හෙයින්දයත්? අකුද්ධස්ස, නොකිපුණවුගේ පොවා; මුඛං, මුහුණ; පස්ස, බලව; කුද්ධො, කිපුණේ; කථං කරිස්සති, කුමක් කෙරේදෝ- නොකිපි මේ තියා සන්තානාන්තරප්‍රාප්ත සන්තානශඤානයෙහි පොවා ඇස රත්කොට ගෙන දුර්මුඛව ගෙන හිඳිනේ මතු අප හැමදෙනාට ස්වාමිස්ථානය නියතව ගියකල රෞ හැණිවූ තැනකදී මුහුණපෑ කෙබඳුද්දෝහෝයි කියයනු අභිප්‍රායයි.

270 උ ලූ ක ජා ත ක ය යි.

---

දෙවන කොසියවග්ගයයි.

———०ः( )ঃ०———

416 ආරඤ්ඤකස්ස ඉසිනො චිරරත්තතපස්සිනො,
කිච්ඡා කතං උදපානං කථං සම්ම අවාහසි.

ආරඤ්ඤකස්ස, අරණ්‍යයේ වසන්නාවූ; චිරරත්ත, දීර්ඝරාත්‍රියක්; තපස්සිනො, රක්‍ෂාකල තපස්ඇත්තාවූ; ඉසිනො, එෂිතගුණවත්වූ තාපසයාගේ; කිච්ඡා කතං, කෘච්ඡ්‍රායෙන් කැරූ; උදපානං, ළිඳ; සම්ම, යහළු; කථං, කුමට; අවාහසි, මූත්‍රකරීෂයෙන් වැඩියෙහිද හෙවත් දූෂ්‍ය කෙළෙහිද?

417 එසධම්මො සිගාලානං යං පීත්වා ඔහදාමසෙ,
පිතුපිතාමහං ධම්මො න තං උජ්ඣාතුමරහසි.

යං පීත්වා, යම්තැනෙක්හි ලා යම් ජලයක්බී; ඔහදාමසෙ, මූත්‍ර කරීෂබහා කිලිටුකරමෝද; සිගාලානං, ශෘගාලයන්ගේ; එසො,

ජේතොම්; ධම්මො, ප්‍රවේණි ධර්මය එසේහෙයින්; පිතුපිතාමහං; අප-
ගේ පියන්ගේ මුත්තන්ගේ; ධම්මො, ස්වභාවය; තං, ඒ ස්වභාව-
යට; උපක්ඛාතුං, නිපෙන්නට; න අරහසි, නුසුදුසුයි.

418 යෙසං වො එදිසො-ධම්මො අධම්මො පන නීදිසො,
මා වො ධම්මං අධම්මං වා අද්දසාම කුදාචනන්ති.

යෙසං වො, යම්බඳුවූ තොපගේ; ධම්මො, ධර්මය; එදිසො, මෙ-
බඳුය; අධම්මො පන, අධර්මයවනාහී; නීදිසො, කෙබඳුද? එසේහෙ-
යින්; වො, තොපගේ; ධම්මං වා, ධර්මයවේවයි; අධම්මං වා, අධර්මය
වේවයි; කුදාචනං, කිසිකලෙක්හි; මා අද්දසාම, නහමික්දකුමු-වානා-
රවූ තොපගේ කිසිකලෙක්හි ගුණයක් නුදුටුවිරුම්හයි සේයි.

## 271 උදපානදූෂජාතකයයි.

419 යෙන මිත්තෙන සංසග්ගා යොගක්ඛෙමා විහිංසති,
පුබ්බෙවජ්ඣාභවන්තස්ස රක්ඛෙ අක්ඛීව පණ්ඩිතො.

යෙන, යම්බඳුවූ; මිත්තෙන, පාපමිත්‍රයෙකු හා සමග කළ; සංසග්ගා, දර්ශනසංසර්ගය ශ්‍රවණසංසර්ගය කථාසංසර්ගය කායසංසර්ගය අනුභව සංසර්ගය යන මේ පඤ්චවිධසංසර්ගය හෙතුකොටගෙන; යොගක්ඛෙමා, කායචිත්ත දෙදෙනාගේ සුඛභාවයයි කියනලද යොගක්ෂෙමයෙන්; විහිංසති (පුරුෂයා) පිරිහෙන්නේද; තස්ස, ඒපාප මිත්‍රයා විසින් අජ්ඣාභවිං, අභිභවනාය හෙවත්, අභිභවනය කරන්නට සුදුසුවසතුව; පුබ්බෙව, පළමුකොටම; පණ්ඩිතො, පණ්ඩිත පුරුෂතෙම; අක්ඛිව, සවනීයවූ අක්ෂිදුග්ම්යමෙන්; රක්ඛෙ, රක්ෂාකරන්නේයි- හෙ පාපමිත්‍රයා විසින් අභිභවනාය කටයුතු තමාගේ ලාභය සජීවකාදීන් පළමු කොටම සානීයවූ නෙත්‍රය රක්ෂා කරන්නාක් මෙන් රක්ෂාකොට සමාතිසම්ප්‍රයුක්ත වන්නේයයි සේයි.

420 යෙන මිත්තෙන සංසග්ගා යොගක්ඛෙමො පවඩ්ඪති,
කාරෙය්‍යත්තස මං වුත්තිං සබ්බකිච්චෙසු පණ්ඩිතො.

යෙන, යම්බඳුවූ; මිත්තෙන, කල්‍යාණමිත්‍රයකු හා සමගකළ; සංසග්ගා; සංසර්ගපයිනියනලද පඤ්චවිධ සංසර්ගය කාරණකොට ගෙන; යොගක්ඛෙමො, කාය චිත්ත දෙදෙනාගේ සුඛභාවසඞ්ඛ්‍යාතවූ

යොගක්ෂෙමය; පවඩ්ඪති, ප්‍රකර්ෂයෙන් වඩනේද; පණ්ඩිතො, නුවණැති පුරුෂතෙම (සමාන මිත්‍රයාගේ සියලු කෘත්‍යයෙහි); අත්තසමං, තමා හා සම කොට; වුත්තිං, (ජීවත්වෘත්තියට) උපභොග පරිභොග වෘත්තිය; කරෙය්‍ය, කරන්නේය.

421 එථ ව්‍යග්ඝා නිවත්තව්හො පච්චුපෙථ මහාවනං,
මා වනං ඡින්දි නිබ්‍යග්ඝං ව්‍යග්ඝා මාහෙසු නිබ්බනා.

ව්‍යග්ඝා, ව්‍යාඝ්‍රයෙනි; එථ, නැඟී එව්; නිවත්තව්හො, නවතු; මහාවනං, මේ මහවනයට; පච්චුපෙථ, නැවත එලඹෙව්; නිබ්‍යග්ඝං, ව්‍යාඝ්‍රයන් රහිතවූ; වනං, වනය; මා ඡින්දි, ජනයින් කපත්වා; ව්‍යග්ඝා, ව්‍යාඝ්‍රරාජයෝ; නිබ්බනා, වනරහිතවූවාහු; මාහෙසුං, නහමින් වෙත්වා.

272 ව්‍යග්ඝජාතකයයි.

---

422 කොනු උද්ධිතභත්තොව පූරහත්ථොව බ්‍රාහ්මණො,
කහං නු භික්ඛං අචරි කං සද්ධං උපසංකමි.

උද්ධිත, පුරණලද; භත්තොව, ආහාරපාත්‍රයක් ඇත්තාක්හු මෙන් හෙවත් පූර්ණපාත්‍රයක් දෙඅතින් ගෙන ආ තපස්වියකු මෙන්; කොනු, කවරෙක්ද? පූරහත්ථො, පූර්ණවූ හස්තඇති හෙවත් කාර්ත්තිකවාරයෙහි හොම්විධි කොට ලද පූර්ණපාත්‍රයක් ඇති; බ්‍රාහ්මණොව, බමුණකු මෙන්; කොනු, කවරෙක්ද? භික්ඛං, භික්ෂා; කහංනු, කවර ප්‍රදේශයෙක්හි; අචරි, හැසිරෙයිද? කං සද්ධං, කවර නම් ශ්‍රද්ධාවන්තක්හු; උපසංකමි, එලඹෙයිද- දෙ අතින් බත්පාත්‍රයක් අල්වාගෙන ආ තපස්වියකු සේ තමා කොම්බයෙහි ඩැලෑගත් කුම්භයා ගලවාගත නොහී දෙඅතින් එලෙන කුම්භයා අල්වාගෙන වානරයෝ වෙහෙසෙත්.

423 අහං කපිස්මි දුම්මෙධො අනාමාසානි ආමසිං,
ත්වං මං මොචය භද්දන්තෙ මුත්තො ගච්ඡෙය්‍ය පබ්බතං.

අහං, මම; දුම්මෙධො, බාලසිත්ඇති; කපිඅස්මි, වානරයෙක් වීමි; අනාමාසානි, අනාපශර්ශස්ථානයන්; ආමසිං, ස්පර්ශකොළෙමි; භද්දන්තෙ, තට වැඩක්වේවයි; ත්වං, තෝ; මං, මා; මොචය, මුදනු

කර; මුඤ්චතා, ඤම් කුම්භුග්‍රහණ සංඛ්‍යාත ව්‍යසනයෙන් මිදුණෙමි; පබ්බතං, මාගේ ස්වකීයවූ පර්වතයටම; ගච්ඡෙය්‍යං, නැඟියෙමි.

424 කච්ඡපා කස්සපා හොන්ති කොණ්ඩඤ්ඤා හොන්ති මක්කටා,
මුඤ්ච කස්සප කොණ්ඩඤ්ඤං කතං මෙථුනකං තයාති.

කච්ඡපා. ඉදිබුනම්; කස්සපා, කාශ්‍යපගොත්‍රයෙහි; හොන්ති, වෙති; මක්කටා, වානරයෝනම්; කොණ්ඩඤ්ඤා, කෞණ්ඩින්‍යගොත්‍රයෙහි, හොන්ති, වෙති; කස්සප, කාශ්‍යපය; කොණ්ඩඤ්ඤං, කෞණ්ඩින්‍යයා; මුඤ්ච, හැරපිය; තයා, (කාශ්‍යපගොත්‍රයෙහි උපන්) තා හා සමඟ; මෙථුනකං, (ලොලවූ දුශ්ශීලවූ ගොත්‍රහෙයින් නොසම්වූ කෞණ්ඩින්‍යගොත්‍රයෙහි උපන් වානරයාගේ) මෛථුනකෘත්‍යයෙක්; කතං, කරනලදී- ගොත්‍රහෙයින් අසම්ජාතිවූ ගුණහෙයින් නොසමවූ තොප දෙදෙනාගේ සංසග්ගියෙක් නැත හැරපියව්යි කී.

273 කච්ඡප ජාතකයයි.

---

425 කායං බලාකා සිඛිනී චොරී ලඞ්ඝිපිතාමහා,
ඔරං බලාකෙ ආගච්ඡ චණ්ඩො මෙ වායසො සඛා.

සිඛිනී, සිඛාඇත්තාවූ; චොරී, චෞරවූ; ලඞ්ඝිපිතාමහා, මෙඝයාමුතුන්කොට ඇති, අයං බලාකා, මේ කෙකිනී; කා, කවරක්ද? බලාකෙ, පින්වත් කෙකින්න; ඔරං, මැනව; ආගච්ඡ, නැඟිඒ; මෙ, මාගේ; වායසො, තෙල පැස ගෝනා වායසවූ; සඛා, යහළුවා; චණ්ඩො, චණ්ඩය- කුඩිම්බියක් තබා සියලගපත් උදුරා ඇඹුල් මොර ශරීරයෙහි ගල්වා සුදුකොට හෙවූ කාකයා දුක වේහෙනහා පිණිස මෙසේ කියා කාකයාහා සමඟ බේණේ.

426 නාහං බලාකා සිඛිනී අහං ලොලොස්මි වායසො,
අකත්වා වචනං තුය්හං පස්ස ලූනොස්මි ආගතො.

අහං, මම; සිඛිනී, සිඛාඇත්තාවූ; බලාකාන, කෙකින්නක් නොවෙමි; අහං, මම; ලොලො, ලොලවූ; වායසො අස්මි, කවුඩු වකුවිමි; තුය්හං, තොපගේ; වචනං, තෙපුල්; අකත්වා, නොකොට; ලූනො අස්මි, පත්උදුරනලද්දෙම් වීමි; ආගතො, ගොචරභූමියෙහි

සිට ආයෙහි; පසස, මේ විප්‍රකාරයට පැමිණි මා බලදැයි කීය.

427 පුනපාපජ්ජසි සම්ම සීලං හි තව තාදිසං,
නහි මානුසකා භොගා සුභුඤ්ජා හොන්ති පක්ඛිනාති.

සම්ම, සබඳ; පුනපි, නැවතද; ආපජ්ජසි, මෙබඳු දුකකට පැමිණෙහි; තව, තාගේ; සීලංහි, ආචාරශීලයවනාහි; තාදිසං, එබඳුය; හෙවත් දුඃඛාධිගමයට සුදුසුය; මානුසකා, මනුෂ්‍යලොකයෙහි වූ; භොගා, භොගයෝ; පක්ඛිනා, තිරිසන් පක්ෂියා විසින්; නහි සුභුංජා හොන්ති, සුවසේ අනුභවකටයුත්තෝ නොවෙත්- අනුව කොට මේ ජාතියෙහි දුකට පැමිණියෙහි නැවත එම පාපයෙන් පරලොව නරකාදි දුකට පැමිණෙන්නෙහි වේදැයි අවවාද කීය.

## 274 ලො ල ජා ත ක ය යි.

---

428 කායං බලාකා රුචිරා කාකානීලස්මිං අච්ඡසි,
චණ්ඩො කාකො සඛා මය්හං තස්සචෙතං කුලාවකං.

රුචිරා, සිත්කලුවූ; අයංබලාකා, මේකෙනිති; කාකානීලස්මිං, කවුඩුකැදල්ලෙහි; අච්ඡසි, හිඳී; කො, කෝකවරක්දැ; මය්හං, මාගේ; සඛා, සබඳවූ; කාකො, කවුඩු; චණ්ඩො, චණ්ඩය; තස්ස, ඕහුගේ; එතං, මේ; කුලාවකං, නිවැසි.

429 නනු මං සම්ම ජානාසි දිජසාමාකභොජන,
අකත්වා වචනං තුය්හං පස්ස ලූනොස්මි ආගතො.

සම්ම, සබඳ; ද්විජ, විජය; සාමාකභොජන, සාමාකනම් තෘණ බීජ භොජනකොට ඇත්තව; මං, මා; ජානාසි නනු, හඳුනන්නෙහි වේද? මා හඳුනන්නාවාදැයි සේයි; තුය්හං, තොපගේ; වචනං, අවවාදතෙපුල්; අකත්වා, නොකොට; ලූනො අස්මි, පත්සිඳුනාලද්දෙම් වීම්; ආගතො, ගොචරභූමියෙන් ආයෙමි; පස්ස, බල.

430 පුනපාපජ්ජසි සම්ම සීලං හි තව තාදිසං,
නහි මානුසකා භොගා සුභුඤ්ජා හොන්ති පක්ඛිනාති.

සම්ම, යහළු; පුනපි, නැවතද; ආපජ්ජසි, දුකට පැමිණෙන්නෙහිය; තව, තාගේ; සීලං හි, ශීලයවනාහි; තාදිසං, එබඳුයි හෙවත් තාගේ ආචාරශීලය නැවත දුකටපමුණුවන සුලුයයි සේයි; මානුෂ

කා; මිනුස්සලොකයෙහි; භොගා, භොගයෝ; පත්ථිතා, පතන්නාලද්දාහු විසින්; සුලභා, අනුභව කටයුත්තෝ; තෙසි හොන්ති,නොවෙත්.

## 275 රුචිරජාතකයයි.

431 තව සද්ධං ච සීලංච විදිත්වාන ජනාධිප,
වණ්ණං අඤ්ජන වණ්ණෙන කාලිඞ්ගස්මිං විනිම්හසෙ.

ජනාධිප, ජනප්‍රධානය; තව, තාගේ; සද්ධං, කර්මඵලදෙදෙනා ගේ ඇදහිලියයි කියනලද ශ්‍රද්ධාවද, සීලං, සංවරශීලය අද්‍යතීත්‍ර්ම ශීලයයි කියනලද එව්වාශීලයද; වණ්ණං, වර්ණයද; දෙශනා ක්‍රම යෙහයින් කී බව මුත් ශියදු හිරණ්‍ය ප්‍රභාදීන්ද; විදිත්වා, දැන; වර්ණයයි ස්වර්ණයට දෙශිතාපචාරය; නොහොත්; සද්ධං, ශ්‍රද්ධාවද; සීලං, ශීලයද; වණ්ණං, ගුණයද; විදිත්වාන, දැන; අඤ්ජන වණ්ණෙන, අඤ්ජනපුඤ්ජාභිවූ තොපගේ ගජරාජයා කාරණකොට ගෙන; කාලිඞ්ගස්මිං, කලිඟුරට රජුසමීපයෙහි; විනිම්හසෙ, රජ්ජුරුවෙනි තොපට ඇතුගෙන එම්හයි ධනධාන්‍යයෙන් පරිවර්තනය කළම්හ; ගෙන කුක්ෂිපොෂණය කළම්හයි සේයි; "විනිම්හ" යනු ක්‍රියාපදය; "සෙ" යනු නිපාතයි.

432 අන්නභච්චා ච භච්චා ච යොධ උද්දිස්ස ගච්ඡති,
සබ්බෙ තෙ අප්පටික්ඛිප්පා පුබ්බාචරියවචො ඉදං.

අන්නභච්චා ච, අනුන් නිසා ආහාරාදීන් ජීවත්වන්නාහුද; අභච්චා ච, අනුන් නිසා නොව සවිජ්ජාජීවීහුද යන මේ දෙපක්ෂයෙන්; යො, යම්පුරුෂයෙක්; ඉධ, මේ සත්වලොකයෙහි; උද්දිස්ස, යමක්හු කෙරෙන් උසනුවක් ප්‍රාර්ථනාකොට; ගච්ඡති, යේද; සබ්බෙ, සියල්ලූ; එතෙ, මොහු; අප්පටික්ඛිප්පා, ප්‍රත්‍යාකරණ කටයුත්තෝ නොවෙත්; ඉදං, මේ; පුබ්බාචරිය, පූර්වාචාර්‍ය්‍යයයි කියනලද මවුපියන් ගේ; වචො, වචනයයි- "අභච්චා ච" තීතැන අකාර සංහිතා පිණිස ලොපයි.

433 දදාමි තෙ බ්‍රාහ්මණ නාගමෙතං
රාජාරහං රාජභොග්ගං යසස්සිනං,
අලඞ්කතං හෙමජාලාභිඡන්නං
සසාරථිං ගච්ඡ යෙන කාමං.

බ්‍රාහ්මණා, බමුණෙනි; තෙ, තොපට; රජාරහං, රජහිමි; රාජභොග්ගං, රජුන් විසින් මගුලැත්කොට අනුභවකරනලද; යසස්සිනං, යශස්වූ හෙවත් පරිවාරසම්පන්නවූ; අලංකතං, අලංකෘතවූ; හෙමජාලාභි, ස්වර්ණජාලයෙන්; සංඡන්නං, මුවහකරනලද; සසාරථිං, හස්ත්‍යාචාරීන් සහිතවූ; එතං, මේ; නාගං, ඇත්රජහු; දදාමි, දෙමි; යෙන කාමං, යම් මගකින් යනු කැමැත්තෝද ඒ මගින්; ගච්ඡථ, ගෙනයව්- බමුණෙනි යම්හෙයකින් තමා කරා ආ යාචක පුරුෂයා විසින් නිසජ්ජ නොවෙයි කියා පූර්වාචාර්‍ය්‍යවූ දෙවිපියෝ ඉගැන්වූද එසේහෙයින් තොපට පරිවාර ආභරණ හස්ත්‍යාචාර්‍ය්‍යයන සියල්ලහා සමග ඇත්රජු දෙමියි කියා බමුණන් පළඹුකොට සතුටු කරවූ.

## 276 කුරුධම්ම ජාතකයයි

---

434 වස්සානි පඤ්ඤාස සමාධිකානි
වසිම්හ සෙලස්ස ගුහාය රොමක,
අසඞ්කමානා අභිනිබ්බුතත්තා
හත්ථත්තමායන්ති මමණ්ඩජා පුරෙ.

රොමක, රෝමකය; සෙලස්ස, ශෛලයාගේ; ගුහාය, ලෙණෙහි; සමාධිකානි, මදක්අධිකවූ; පඤ්ඤාසවස්සානි, පනස්අවුරුද්දක්; වසිම්හ, විසුම්හ; පුරෙ, පෙර; අසඞ්කමානා, නිශ්ශඞ්කවූ; අභිනිබ්බුතත්තා, සන්හුන් චිත්තසන්තාන ඇති; අණ්ඩජා, අණ්ඩජයෝ; මම, මාගේ; හත්ථත්තං, හස්තසංඛ්‍යාවට හෙවත් හස්තප්‍රසාරණස්ථානයට; ආයන්ති, එන්නාහුයි.

435 තෙදානි වඞ්කඞ්ග කිමත්ථ උස්සුකා
භජන්ති අඤ්ඤං ගිරිකන්දරං දිජා,
නූනං න මඤ්ඤන්ති මමං යථා පුරෙ
චිරප්පවුත්ථා අථවා න තෙ ඉමෙ.

වඞ්කඞ්ග, ආකාශොත්පතනයෙහි වක්‍රවූ ග්‍රීවා ඇති හෙයින් වක්‍රාඞ්ගනම් තැනැත්තනි; තෙ ඒ පෙර විශ්වාස පක්ෂීහු; ඉදනි, දැන්; කිමත්ථං, කවරකාරණයක් පිණිස; උස්සුකා, උත්කණ්ඨප්‍රකෘති ඇති; දිජා, පක්ෂීහු; අඤ්ඤං, අනික්; ගිරි, පර්වතයකින්; කන්දරං, පර්වත කඳුරැළිස්තානට; භජන්ති, සෙව්ද; යථාපුරෙ, යම්සේ

අහර මේ පක්ෂීහු මා ගරුකොට ප්‍රියකොට සිතද්ද; තථා, එසේම; ඉමිං, මා; න මඤ්ඤන්ති, නොසිතත්හි; නූනං, ගනිම්; චිරප්පවුත්ථා, බොහෝකලක් විසෝවූ විසූහෙයින් නොහඳුනන්නේද; අථවා, නොහොත්; ඉමෙ, මොහු; තෙ න,අප හඳුනන පක්ෂීහු නොවෙද් දූයි නොයෙක්ලෙස බැණ උපහාසකරන්නට යතනකෙරේ.

436 ජානාම තං නො මයමස්ම මූළ්හා
සො යෙව ත්වං තෙ මයමස්ම නාඤ්ඤෙ,
චිත්තඤ්ච තෙ අස්මිං ජනෙ පදුට්ඨං
ආජීවක තෙන තං උත්තසාම.

ආජීවක, ආජීවකය; තං, තා; ජානාම, දනුම්හ; හෙවත් අඳුනම්හ; මයං, අපි; මූළ්හා, මුළාවූවමු; නොඅස්ම. නොවම්හ; ත්වං, තෝ; සො යෙව, හේ තාපසයෙහිමය; වයං, අපි; තෙ අස්ම, ඔහුමය; නාඤ්ඤෙ, අනික්කෙනෙකුදු නොවම්හ; තෙ, තාගේ; චිත්තඤ්ච, සිතද; අස්මිං ජනෙ,මේපක්ෂිජනයා කෙරෙහි; පදුට්ඨං, ප්‍රදුෂ්ටය; තෙන, එසේ හෙයින්; තං, තා; උත්‍රාසාම, බමු- ආජීවකයයි කුක්ෂිපොෂණය තාපසට වත්නවුන්ට ව්‍යවහාරයි.

## 277 රොමකජාතකයි

437 කමත්ථමභිසන්ධාය ලහුචිත්තස්ස දූභිනො,
සබ්බකාමදුහස්සෙව ඉමං දුක්ඛං තිතික්ඛසි,

ලහුචිත්තස්ස, ලඝුවූචිත්තප්‍රවෘත්ති ඇති; දූභිනො, මිත්‍රද්‍රොහියාගේ; ඉමං දුක්ඛං, මේ දුඃඛය; සබ්බකාම, සියලු කාමයන් හෙවත් අභිලෂිතාර්ථයන්; දුහස්සෙව, දෙන්නාහු මෙන්; කමත්ථං, කවර නම් කාරණයක්; අභිසන්ධාය, පිණිස; තිතික්ඛසි, ක්ෂමාකෙරෙහිද? ඉවසහිද?

438 සිඛග්ගෙන නිහනාහෙතං පදසා ච අඩ්ඩහ,
හිංසෙන බාලා පකුජ්ජෙයුං නොචස්සපටිසෙධකො.

එතං, මොහු; සිඛග්ගෙන, හණින්; නිහනාහි, පැහැර විනාශකර; පදසා ච, පාදයෙන් හා; අඩ්ඩහ, අඩිඝට්ටනකර හෙවත් පයින් එතෙම මැඩ හුනුවිසුනුකොටලා; පටිසෙධකො, ප්‍රතිෂෙධකයෙක්; නොචඅස්ස, නොවූසේවීනම්; හෙවත් කරන විඝනවළකන්නේ

ාැත්තනම්; බාලා, අශ්‍රුතයෝ; භීයො, වඩවඩාලා; පතුජ්ජයන්තං, ගිපෙත්තාහුයි.

439 මමෙවායං මඤ්ඤමානො අඤ්ඤෙපෙවං කරිස්සති,
තෙ තං තත්ථ වධිස්සන්ති සා මෙ මුත්ති භවිස්සතීති.

අයං, මෙ තෙම; මමෙව, මට පරිද්දෙන්; මඤ්ඤමානො, හඟනේ; අඤ්ඤම්පි, සෙස්සවුන්ට ද; එවං කරිසසති, මෙසේ කරන්නේය; තෙ, ඔහු; තත්‍ථ, එතැන්හිලා, තං, ඒ වානරයා; වධිසසන්ති, විනාශ කෙරෙත්; මෙ, මට; සා මුත්ති, ඒ පාපමුක්ති තොම; භවිසසති, වන්නීයි- මා උඟ මරන්නේ කුම්ටද? මට කොට පුරුදු වීසන අතිකෙතුට කෙරෙයි එතනදී ඒ මා සේ නොව මරාලයි එසේ වන්නා ඒ පාප මා කෙරෙන් දුරුවන්නේ යයි කිවු.

278 මහිසජාතකයයි.

440 යථා මාණවකො පන්ථෙ සිගාලිං වනගොචරිං,
අත්ථකාමං පවදන්තිං අනත්ථකාමාති මඤ්ඤති,
අනත්ථකාමං සතපත්තං අත්ථකාමොති මඤ්ඤති.

යථා, යම්සේ; පන්ථෙ, මාර්ගයෙහි; මාණවකො, ළදරුවා; වනගොචරිං, වනයම ගොචරභූමි කොට ඇති; අත්ථකාමං, අර්ථකාමිනිවූ; පවදන්තිං, කියන්නාවූ; සිගාලිං, ශෘගාලිය; අනත්ථකාමාති; අනර්ථකාමිනියයි; මඤ්ඤති, සිතාද; අනත්ථකාමං, අනර්ථකැමැති; සතපත්තං, ශතපත්‍රයා හෙවත් කෑරලා; අත්ථකාමොති, අර්ථකාමියයි; මඤ්ඤති, සිතාද.

441 එවමෙව ඉධෙකච්චො පුග්ගලො හොති තාදිසො,
හිතෙහි වචනං වුත්තො පතිගණ්හාති වාමතො.

එවමෙව, එපරිද්දෙන්; ඉධ, මෙහිලා; එකච්චො, සමහර; පුග්ගලො, පුද්ගලයෙක්; තාදිසො හොති, එබඳු වන්නේයි; හිතෙහි, හිතකැමැත්තාවූන් විසින්; වචනං, වචනය; වුත්තො, කියනලද්දේ; වාමතො, විරුඬකාරණයෙන්; පතිගණ්හාති, පිළිගනී.

442 යෙ ච ඛො නං පසංසන්ති භයා උක්කංසයන්ති ච,
තං හි සො මඤ්ඤති මිත්තං සතපත්තං ව මාණවොති.

යෙ ච ඛො, යමෙක් වනාහි; නං, ඔහු; භයා, භයින්; පසංසන්ති, ප්‍රශංසාකෙරෙද්ද; උක්කංසයන්ති ච, උත්කර්ෂා කෙරෙද්ද; තං හි, ඔවුන් වනාහි; සො, හෙතෙම; මිත්තං, මිත්‍රයයි; මඤ්ඤති, සිතත් නේයි; කා පරිද්දෙන්ද යත්? සතපත්තං, ශතපත්‍රයා; මාණවො ඉ ච, ළදරුවා මෙනි.

## 279 සතපත්තජාතකයයි

---

443 අඩා හි නූන මිගරාජා පූටකම්මස්ස කොවිදො,
තථා හි පූටං දූසෙති අඤ්ඤං නූන කරිස්සති.

අඩා හි, එකාන්තයෙන්; මිගරාජා, මෘගරාජතෙම; පූටකම්මස්ස, මල්මුළු කිරීමට; කොවිදෙ. දක්ෂයයි; නූන, හඟිමි; තථා හි, එසේමැයි; පූටං, (උඩින් හෙළු හෙළු) මුළු; දූසෙති, නසයි; අඤ්ඤං, ඊට අධිකවූ අනික් මුළක්; නූන, එකාන්තයෙන්; කරිස්සති, කරන්නේයි-මෘගරාජයයි ආදරයෙන් වානරයාට කිවුය එසේ කියනලද මෘගරාජයා මා හෙළු හෙළු මුළ විදයී මීටවඩා මල්මුළු කරන්නේ යයි සේයි.

444 න මෙ පිතා වා මාතා වා පූටකම්මස්ස කොවිදා,
කතං කතං ඛො දූසෙම එවං ධම්මමිදං කුලං.

මෙ, මා ගේ; පිතා වා, පිය වේවයි; මාතා වා, මව් වේවයි; පූටකම්මස්ස, මල්මුළු කිරීමට; න කොවිදා, දක්ෂ නොවෙත්; නොදනිති සේයි; කතං කතං ඛො, කළකළ දෙය වනාහි; දූසෙම, නසම්හ එසේමැයි; ඉදං කුලං, මේවානරකුලය; එවං, මෙබඳුවූ; ධම්මං, ස්වභාව ඇත්තේයි-අපනබා අපගේ මව්පියෝ මල්මුළු කරනසේ නොදනිති කළ කළදෙය බලා නසනසේ දනුම්හ, අපගේම්තු නොවෙයි සියලූ අපවානර කුලයාගේ ස්වභාවම්යයි කී.

445 යෙසං වො එදිසො ධම්මො අධම්මො පන කීදිසො
මා වො ධම්මං අධම්මං වා අද්දසාම කුදාචනන්ති.

යෙසං වො, තම්බඳුවූ තොපගේ; ධම්මො, ධර්මයතෙම; එදිසො,

මෙබඳුවීනම්; අධම්මො පන, අධම්මිය වනාශි; තීදිසො, කෙබඳුද?; වො, තොපගේ; ධම්මං, ධම්මිය වේවයි; අධම්මං වා, අධම්මිය වේව යි; කුදළුවනං, කිසිකලෙක්හි; මා අද්දසාම, නොදකුමු.

280 පුටදූසකජාතකයයි.

---

තුන්වන අරණ්‍යවර්ගයයි.

——:():——

446 අබ්භන්තරං නාම දුමො යස්ස දිබ්බමිදං ඵලං,
භුත්වා දෙහළිනී නාරී චක්කවත්තිං විජායති.

යස්ස, යම් ආම්‍රවෘක්ෂයක්හුගේ; ඵලං, ඵලය; දිබ්බං, දිව්‍යද හෙවත් දෙවතාවන් විසින් අනුභවකරන්ට සුදුසුද; "ඉදං" යනු නිපාතයි; අබ්භන්තරං නාම දුමො, ඒ අබ්භන්තර නම් ආම්‍රවෘක්ෂය; භුත්වා,(එයින් අඹඵල)අනුභවකොට; දෙහළිනී,දෙළත්නාවූ; නාරි, ස්ත්‍රී; චක්කවත්තිං, චක්‍රවර්ත්තියක්හු; විජායති, වදයි.

447 ත්වඤ්ච භද්දෙ මහෙසීසි සා චාසි පතිනො පියා,
ආහරිස්සති තෙ රාජා ඉදං අබ්භන්තරං ඵලං.

භද්දෙ, භද්‍රාව; ත්වඤ්ච, තෝද; මහෙසී අසි, අග්‍රබිසෝ වී; සා ච; ඒ තොද; පතිනො, ස්වාමියාහට; පියා අසි; ප්‍රිය වී; තෙ, තිට, රාජා, රජ; ඉදං, මේ; අබ්භන්තරං, අබ්භන්තර නම්වූ; ඵලං, ආම්‍ර ඵලය; ආහරිස්සති, ගෙන්වන්නේයි.

448 භත්තුරත්ථා පරක්කන්තො යං ඨානමධිගච්ඡති,
සූරො අත්තපරිච්චාගී ලභමානො භවාමහන්ති.

භත්තුරත්ථා, මාතෘ පිතෘ ස්වාමි යන ත්‍රිවිධවූ භර්තෘහට වැඩ පිණිස; පරක්කන්තො, වීර්‍ය්‍ය කරන්නාවූ; අත්තපරිච්චාගී, කාය ජීවිතයෙහි නිරපෙක්ෂවූ; සූරො, නිර්භයපුරුෂ; යං, යම්බඳුවූ; ඨානං, යශොධන සවර්ගොත්පත්ති සඞ්ඛ්‍යාතවූ සුඛකාරණයට; අධිගච්ඡති, පැමිණේද; අහං, මම්ද; ලභමානො, එතියතලද සුඛකාරණප්‍රති ලාභය කරන්නෙම්; භවාමි, වෙමි.

281 අබ්භන්තරජාතකයයි.

---

449 සෙය්‍යංසො සෙය්‍යසො හොති සො සෙය්‍යමුපසෙවති,
එකෙන සන්ධිං කත්වාන සතං වජ්ඣෙ අමොචයිං.

සෙය්‍යංසො, නිරවද්‍ය උත්තමවූ ධර්මසඞ්ඛ්‍යාතවූ ශ්‍රෙයස් කොටස් ඇති කුශලධර්මසභානිශ්‍රිතවූ (යම්) පුද්ගලයෙක්; සෙය්‍යං, නෑවත ඒ ශ්‍රෙයසට හෙතු ධර්මය හෝ කුශලයෙහි අභිරති ඇති උත්තම වූ පුද්ගලයා හෝ; උපසෙවති, සෙව්නේද; සො, එතෙම; සෙය්‍යසො හොති, විශිෂ්ටවූ ප්‍රශංසාලබන්නේ හෝය අත්‍යුත්තම වන්නේ හෝයි- එසේමැයි; එකෙන, එකකුහා සමග; සන්ධිං කත්වාන, මෛත්‍රීභාවනාව වඩා; වජ්ඣෙ, වධයට සුදුසුවූ; සතං, ශතප්‍රමාණවූ තොප; අමොචයිං, (මරණින්) මුක්ත කෙළෙම්.

450 කස්මා සබ්බෙන ලොකෙන සන්ධිං කත්වාන එකතො,
පෙච්චසග්ගං න ගච්ඡෙය්‍ය ඉදං සුණොථ කාසයො.

සබ්බෙන, සියලු; ලොකෙන, ලොකයා හා සමග; එකතො, එකත් කොට; සන්ධිං කත්වාන, මෛත්‍රීභාවනාසන්ධි කොට; කස්මා, කුමක් හෙයින්; පෙච්ච, පරලොව; සග්ගං, ස්වර්ගයට; න ගච්ඡෙය්‍ය, නො යන්නේද?; කාසයො, කාශීරටවාසීනි; ඉදං, මේ වචනය; සුණොථ, අසව්- මෛත්‍රියෙහි වනාහි උපචාරධ්‍යානය සප්තකාම ස්වර්ගයෙහි ප්‍රතිසන්ධිදායකය, අර්පණ බ්‍රහ්මලොකයෙහි ප්‍රතිසන්ධිදායකයයි මේ වචනය අසා උපචාර අර්පණ වශයෙන් මෛත්‍රීභාවනා වඩා කාමාවචරය බ්‍රහ්මලොකය යන ආකාංක්ෂිතවූ ස්ථානයෙහි උපදවයි යන අභිප්‍රායයි.

451 ඉදං වත්වා මහාරාජා කංසො බාරාණසිග්ගහො,
ධනුං තූණිංච නික්ඛිප්ප සංඤමං අජ්ඣුපාගමිති.

කංසො, කංසනම්වූ; බාරාණසිග්ගහො, බාරාණසී සඞ්ඛ්‍යාතවූ රාජධානියෙහි නිවාසගෘහ ඇති; මහාරාජා, මහරජතෙම; ඉදංවත්වා, මේවචනය කියා; ධනුං, චාපය ද; තූණිංච, හීයවුර ද; නික්ඛිප්ප, හැර; සංයමං, ශීලසංයමයට; අජ්ඣුපාගමි, පැමිණියේයි.

282 සෙය්‍යංස ජාතකයයි.

452 වරං වරං ත්වං නිහනං පුරෙ චරං
අස්මිං පදෙසෙ අභිභුය්‍ය සූකරෙ.
සොදානි එකො ව්‍යපගම්ම ඣායසි
බලන්නු තෙ ව්‍යග්ඝ න චජ්ජ විජ්ජති.

පුරෙ, පෙර; අස්මිං පදෙසෙ, මේප්‍රදෙශයෙහි; චරං, හැසිරෙන තෙහි; සූකරෙ, හූරන්; අභිභුය්‍ය, අභිභවනය කොට; වරං වරං, උතුම් උතුම්වූ හූරන්; නිහනං, මරන්නාවූ; ත්වං, තෝ; ඉදානි, දැන්; එකො, අවිතීයව; ව්‍යපගම්ම, පහව; ඣායසි, සිතයි; ව්‍යග්ඝ, ව්‍යාඝ්‍රය; තෙ, තාගේ; බලං, බලය; අජ්ජ, අද; න ච විජ්ජති නු, නැද්දෝ-මෙතෙක් දවස් සූකරාභිභවනය කොට කැමැති හූරකු මරා ප්‍රබලව ඇවිදිනෙහි අද එකාකීව චින්තාපරවශව සිටියෙහි කිම්ද තාගේ ශක්ති අද නැද්දැයි විචාළේ.

453 ඉමෙ සුදං යන්ති දිසො දිසං පුරෙ
භයද්දිතා ලෙණගවෙසිනො පුථූ,
තෙදානි සංගම්ම රසන්ති එකතො
යත්ථට්ඨිතා දුප්පසහජ්ජ මෙ මයා.

ඉමෙ, මේ සූකරයෝ; පුරෙ, පෙර; භයද්දිතා, භයින් පීඩිතවූවාහු; ලෙණගවෙසිනො, රක්ෂාස්ථානගවේසීවූවාහු; පුථූ, වෙන වෙන; දිසො දිසං, දිශාවෙන් දිශාවට අභිමුඛව; යන්ති, යෙති; ඉදානි, දැන්; සංගම්ම, එකතැනට එලඹ; එකතො. එක්වලා; රසන්ති, නාදකෙරෙති; යත්ථ, යම් තැනෙක්හි; ඨිතා, සිටියාහුවූද; ඉමෙ, මොහු; අජ්ජ, අද; මයා, මාවිසින්; දුප්පසහා, නොමැඩියහැකි යෝයි; මෙහිලා “සුදං” යනු නිපාතයි.

454 නමත්ථු සඞ්ඝානං සමාගතානං
දිස්වා සයං සඛ්‍ය වදම් අබ්භුතං,
ව්‍යග්ඝං මිගා යත්ථ ජිනිංසු දාඨිනො
සාමග්ගියා දාඨබලෙසු මුච්චරෙති.

සමාගතානං, රැස්වූවාවූ; සඞ්ඝානං, සූකරසමූහයන්ට; නමත්ථු, නමස්කාරවේවා; අබ්භුතං, පෙර නුවූවිරූ; සඛ්‍යං, සූකර සමූහයා කෙරෙහි පිහිටි මිත්‍රභාවය; සයං දිස්වා, තෙමේ ප්‍රත්‍යක්ෂයෙන් දැක;

වදුම්, නියම්; යණි, යම් තැනෙක්හිලා; දූයිනො, දළ ඇත්තාවූ; මිගා, මෘගසඞ්ඝාතවූ හූරෝ; වෘග්ඝං, ව්‍යාඝ්‍රයා; ජිනිංසු, දිනූද; දූඨාබලෙසු, දළ බල කොට ඇත්තාවූ හූරන් අතුරෙහිලා; සාමග්ගියා, යම් සාමාග්‍රියෙක්ඇද්ද ඒ සාමාග්‍රිතාව කරණකොටගෙන; මුඛ්වරෙ, සතුරා මැඩමරණින් මුසානවූ.

## 283 වඩ්ඪකිසූකරජාතකයයි.

455 යං උස්සුකා සංඝරන්ති අලක්ඛිකා බහුං ධනං,
සිප්පවන්තො අසිප්පා ච ලක්ඛිව තාණි භුජති.

සිප්පවත්තො, හස්තිශිල්පාදිවශයෙන් අභ්‍යස්තශිල්ප ඇත්තාවූද; අසිප්පා ච, අශාස්ත්‍රඥවූ ද; උස්සුකා, වස්තුරාශිකරණයෙහි මහොත්සාහ ඇති; අලක්ඛිකා, පින්නැති ජනයෝ; බහුං, බොහෝවූ; යං ධනං, යම් වස්තුවක්; සංඝරන්ති, රැස්කෙරෙද්ද; තානි, ඒ ධනයන්; ලක්ඛිව, පිනැත්තෙක්ම; භුජති, අනුභව කෙරේ.

456 සබ්බත්‍ථ කතපුඤ්ඤස්ස අතිවඤ්ඤෙව පාණිනො,
උප්පජ්ජන්ති බහූ භොගා අප්පනායතනෙසුපි.

සබ්බත්‍ථ එව, හැමතැන්හිම; කතපුඤ්ඤස්ස, කෘතපුණ්‍යයාහට; අඤ්ඤෙ, අන්‍යවූ හෙවත් අධන්‍යවූ; පාණිනො, ප්‍රාණීන්; අතිච, අභිභවා; අනායතනෙසු අපි, අනායතනවූ ස්ථානයෙහිදු; බහූ, බොහෝවූ; භොගා අපි, භොගයෝ වනාහි; උපපජ්ජනති, උපදිති-යම් කෙනෙක් කෘතපුණ්‍යවූනම් ඌ අවශෙෂ පින්නැති ජනයන් මැඩ මුක්තාමාණික්‍ය හස්ත්‍යශ්වාදීහු දුර්ගාමිණි අභයරජුට මෙන් අනාකරප්‍රදෙශයෙහිදු උපදනාහුයයි යන අභිප්‍රායයි.

457 කුක්කුටා මණයො දණ්ඩා ථියො ච පුඤ්ඤලක්ඛණා,
උප්පජ්ජනති අපාපස්ස කතපුඤ්ඤසස ජන්තුනොති.

අපාපස්ස, අලාමකවූ; කතපුඤ්ඤස්ස, කෘතපුණ්‍යවූ; ජන්තුනො, සත්‍වයන්ට; කුක්කුටා, ශ්‍රීමත්වූ කුකුළෝද; මණයො ච, ශ්‍රීමත් වූ මාණික්‍යයෝ ද; දණ්ඩා, ශ්‍රීමත්වූ ආරක්‍ෂායෂ්ටිය ද; පුඤ්ඤලක්ඛණා, කරනලද පින්හා ස්ත්‍රීලක්‍ෂණයෙන් යුක්තවූ; ථියොච, ස්ත්‍රීහු ද; උප්පජ්ජන්ති, උපදනාහුයි.

## 284 සිරිජාතකයයි.

458 දරියා සත්තවස්සානි තිංසමත්තා වසාමසෙ,
හඤ්ඤාම මණිනො ආභං ඉති නො මන්තිතං අහු.

සත්තවස්සානි, සත්හවුරුද්දක්; දරියා, මාණික්‍යගුහායෙහි; තිංසමත්තා, තිසක්පමණදෙන; වසාමසෙ, විසුම්හ; මණිනො, මාණික්‍යයාගේ; ආභං, සොභාව; හඤ්ඤාම ඉති, නසම්හ යි; නො, අප විසින්; මන්තිතං, මන්ත්‍රණය කරන ලද්දේ; අහු, වී.

459 යාව යාව නිඝංසාම භිය්‍යො වොදායතෙ මණී,
බ්‍රාහ්මණ ත්වෙව පුච්ඡාම කිං කිච්චං ඉධ මඤ්ඤසි.

මණී, මැණික; යාව යාව, යම්යම්තාක්; නිඝංසාම, ඝර්ෂණය කරමෝද; භිය්‍යො, වඩවඩාලා; වොදායතෙ, නිර්මලවෙයි; බ්‍රාහ්මණ, බමුණ; ත්වං එව, තාම; පුච්ඡාම, විචාරම්හ; ඉධ, මේ අර්ථයෙහි; කිච්චං, මේකාත්‍යය; කිං මඤ්ඤසි, කිමෙකැයි සිතයිද?

460 අයං මණී වෙළුරියො අකාමො විමලො සුභො,
නාස්ස සක්කා සිරිං හන්තුං අපක්කමථ සූකරා'ති.

අයං, මේ; මණි, මාණික්‍යය; වෙළුරියො, වෛදූර්‍ය්‍ය ජාතිය; අකාමො, කර්කශ නොවෙයි; විමලො, නිර්මලය; සුභො, ශුභය; එසේ හෙයින්; අස්ස, මේ මාණික්‍යරත්නයාගේ; සිරිං, ශ්‍රීයා; හන්තුං, නසන්නට; නසක්කා, නොපිළිවන; සූකරා, සූකරයෙනි; අපක්කමථ, පහව නැඟීයව්.

## 285 මණිසූකරජාතකයයි.

461 මා සාලූකස්ස පිහයි ආතුරන්නානි භුඤ්ජති,
අප්පොස්සුක්කො භුසං ඛාද එතං දීඝායුලක්ඛණං.

සාලූකස්ස, සාලූකනම් සූකරයාගේ භාවය; මා පිහයි, නහමක් ප්‍රාර්ථනා කර; ආතුරන්නානි, ඒ සාලූකනම් සූකරයා මරණ කාරණවූ ආහාරයන්; භුඤ්ජති, අනුභව කෙරේ; අප්පොස්සුක්කො, ඔහු කන බතට උත්සාහ නො කොට; භුසං, බොල්මිශ්‍රවූරඹු; ඛාද, අනුභව කර; එතං, මේ; දීඝායුලක්ඛණං, දීර්ඝායුෂ්කවීමට කාරණයි.

462 ඉදානි සො ඉධාගන්ත්වා අතිථී යුත්තසෙවකො,
අථ දක්ඛසි සාලූකං සයන්තං මුසලුත්තරං.

ඉඳුනි, දුන්; සො. ඒ විවාහයෙන් යුක්ත පුරුෂයා; යුත්ත සෙවකො, යුක්තවූ සෙවකයන් ඇති හෙවත් බොහෝ සෙවකයන් පිරිවරා, අජීජී, අමුතුවූයේ; ඉධ, මෙයට; ආගන්ත්වා, අවුදින් පැමිණියේය; අථ, එකල්හි; මුසලුත්තරං, මුසලයට බඳුවූ උත්තරොෂ්ඨ ඇති; සයන්තං, මරණ පිණිස හෝනාවූ; සාලූකං, සාලූකනම් සූකරයාය; දක්ඛසි, දක්නෙහියි.

463 විකන්තං සූකරං දිස්වා සයන්තං මුසලුත්තරං,
ජරග්ගවා අචින්තෙසුං වරම්හාකං භුසාමිවාති.

මුසලුත්තරං, මුසලයට බඳුවූ උත්තරොෂ්ඨ ඇති; විකන්තං, කපගලදුව; සයන්තං, හෝනාවූ; සූකරං, හූරා; දිස්වා, දැක; ජරග්ගවා, ගොන්නු; අම්හාකං, අපගේ; භුසාමිව, රඩුම්; වරං, උත්තමයයි; අචින්තෙසුං; සිතූ.

286 සාලූකජාතකයයි.

464 නානුම්මත්තො න පිසුණො න නටො න කුතූහලො,
මූළ්හෙසු ලභතෙ ලාභං එසා තෙ අනුසාසනී.

අනුම්මත්තො, උන්මත්ත නොවූයේ, න පිසුණො, ප්‍රිය ශූන්‍ය කථා නැත්තේ; න නටො, නෘත්‍ය නොකරනුයේ; න කුතූහලො, කෞතුහලනැත්තේ; මූළ්හෙසු, අඥානයා කෙරෙහි; ලාභං, ලාභය; න ලභතෙ, නො ලබන්නේයි; තෙ, තට; එසා, මේ තොමෝ; අනුසාසනී, අපගේ ලාභානුශාසනායි.

465 ධිරත්ථු තං යසලාභං ධනලාභඤ්ච බ්‍රාහ්මණ,
යා වුත්ති විනිපාතෙන අධම්මචරණෙන වා.

බ්‍රාහ්මණ, බමුණ; යසලාභං, යශලාභයටද; ධනලාභඤ්ච, ධනලාභයටද; විනිපාතෙන, ආත්මවිනාශයවන පරිද්දෙන්; අධම්මචරණෙන වා; අධර්මචරණයෙන් හෝ සම්භවන; යා වුත්ති, යම් වෘත්තියෙක් ඇද්ද; තං, ඊටද; ධිරත්ථු, නින්දාවේවා.

466 අපි චෙ පත්තමාදාය අනාගාරො පරිබ්බජෙ,
එසාව ජීවිකා සෙය්‍යා යා චාධම්මෙන එසනාති.

චෙ, ඉදින්; පත්තං අපි, පාත්‍රයකුදු; ආදාය, ගෙන; අනාගාරො, ගෘහශූන්‍යවූයේ; පරිබ්බජෙ, ප්‍රව්‍රජිතව හැසිරෙන්නේය- කාය

# මහාබොධිවංශ ග්‍රන්ථිපදවිවරණය

පුරාතන

මහපඬිවර කෙනකුන් විසින්

විරචිතයි.

විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති පූජ්‍යාචාර්‍ය්‍ය

රත්මලානේ ධර්‍මකීර්ති ශ්‍රීධර්‍මාරාමාභිධාන

කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධාන නායක ස්වාමිපාදයන්

වහන්සේ විසින්

සංශොධිතයි.

ජේද්‍රික් ප්‍රේරා වීරසිංහ අප්පුහාමි විසින්

සත්‍යසමුච්චය යන්ත්‍රාලයෙහි

මුද්‍රාපිතයි.

ශ්‍රී බු: ව: 2453.

ක්‍රි: ව: 1910.

# විඥාපනය.

මහාබොධිවංශ ග්‍රන්ථිපදවිවරණනම්වූ මේ ප්‍රකරණය "මහාබොධිවංශ"යයි ප්‍රසිද්ධවූ මාගධභාෂාමය ගද්‍යකාව්‍යස්වරූප උතුම්ධර්මප්‍රබන්ධයාගේ ගැටපදවිවරණය වේ. මහාබොධිවංශනම්වූ මූලග්‍රන්ථය වනාහි බුද්ධඝොෂ මහාස්වාමීන්ගේ අටුවා ලීමෙන් පසු ශාරිපුත්‍ර මහාස්වාමීන්ගේ ටීකාරචනායෙන් පූර්වයෙහි මධ්‍යවර්ත්තිවූ කාලයෙහි ලඞ්කාශාසනභාරධාරිව වැඩවිසූ මහාස්ථවිරවරයන් කෙරෙහි ඇතුළත් උපතිෂ්‍ය මහාස්වාමිපාදයන් විසින් කරනලද්දේය. එප වත් මේ ග්‍රන්ථිපදයාගේ ආරම්භයෙන්ද, නිකායසඞ්ග්‍රහාදියෙන්ද ප්‍රකාශ වේ.

මහාබොධිවංශය ලක්දිව ආචාර්‍ය්‍යාංවයෙහි පෙලබසින් ලියනලද ගද්‍යකාව්‍යග්‍රන්ථයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨග්‍රන්ථය වශයෙන් හඳුරවනු ලැබේ. මීට පරිවාරග්‍රන්ථයෝද බොහෝවෙති. මහාබොධිවංසටීකා, මහාබොධිවංශපරිකථා (ධර්මප්‍රදීපිකා), මහාබොධිවංශ ග්‍රන්ථිපද, සිංහල මහාබොධිවංශ, මහාබොධිවංශපදාර්ථසන්න යන මොහුයි. මෙයින් ටීකාව මෙකල ඉතා දුර්ලභය. සෙසු ග්‍රන්ථයන්ගෙනුත් මේ ග්‍රන්ථිපදය සුලභනොව පැවැත්තේය. මහාබොධිවංශය එළුබසට පෙරළීම ශ්‍රීබුද්ධවර්ෂ 1846 පමණේදී හස්තිශෛලපුරවරාධිවාසි සතර වෙනි ශ්‍රීපරාක්‍රමබාහු මහරජාණන්ගේ අයදුමෙන් කීර්ත්තිශ්‍රීමෙඝවර්ණ රාජාධිරාජකල්‍යාණිවිහාරාධිපතිවූ විල්ගම්මූල සඞ්ඝරාජමහාස්වාමීන් විසින් කරනලද්දේය. එබව එහිම-

"රචිතසුචරිතශ්‍රීශ්‍රීපරාක්‍රාන්තබාහු
ක්ෂිතිපතිලකකාංක්ෂාරාධනානන්දිතෙන
සකලගුණනිධානශ්‍රීසඞ්ඝරාජග්‍රාමමූල
ස්ථවිරයතිවරෙණෙලලාසිතො බොධිවංශඃ"

යන පද්‍යයෙන් ප්‍රකාශිතයි. මේ සිංහලසන්නය මෙම ග්‍රන්ථිපදය ඇසුරුකොට ලියනලද බැවින් මෙහි ගෞරවය එයින්ම උද්දීප්ත වේ. මේ ග්‍රන්ථිපදවිවරණය කවුරුන් විසින් කරනලදද යනු විසඳිය නොහැකිය. කිසි පොතෙකත් කර්තෘනාමසන්දර්ශනයක් නොපැනෙන හෙයිනි. ධර්මප්‍රදීපිකාකාර ආචාර්‍ය්‍ය ගුරුළුගෝමින්ට සමාන

කාලිකවූ හෝ මහපඬිවරකෙනෙකුන් විසින්ම කරනලද්දකැයි අනුමෙය වශයෙන් දතයුත්තේය. රඝුවංශ, ජානකීහරණ, කාදම්බරි * ආදි සංස්කෘත ග්‍රන්ථවලින්ද බොධිවංශටීකාවයයි සැලකියයුතු ටීකාග්‍රන්ථයකින්ද බොහෝතැන සාධකවාක්‍ය සඞ්ග්‍රහ කරන ලද්දේය. මෙහි අර්ථවර්ණනාව ග්‍රන්ථකර්තෘ ආචාර්යෝත්තමයන්ගේ පාණ්ඩිත්‍යමහිමයෙන් මනරම්ලෙස කරනලද්දීය. මහබෝසතාණන්ගේ වංශය මෙතෙක් විස්තරකළ පොතක් වෙන නොමැත්තේය. මෙය ධර්මප්‍රදීපිකාව මෙන්ම ආධුනිකයන්ට ඉවහල්ව පවත්නා ශාසනාධාර ග්‍රන්ථයක් හෙයින් බොහෝදෙනා විසින් ආරාධිතවූ අපි මේ සම්බන්ධවූ යථාවකාශසංශෝධනයෙහි ව්‍යාපෘත වීමු. ධාතුප්‍රත්‍යයනිරූපණවසරයෙහි අතිශයින් දූෂිතවූ ධාතුප්‍රත්‍යය රූපයන්ද පාණිනීයව්‍යාකරණය ඇසුරුකිරීමෙන් ප්‍රකෘතියට පැමිණ වීමු, අපගේ මේ ශ්‍රමය සාධුජනානන්දනයෙන් සඵලවේවයි සලකම්හ.

මේ බවට,

පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවේණාධිපති
රත්මලානේ **ධර්මකීර්ති ශ්‍රීධර්මාරාමාභිධාන**
කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධානනායකස්ථවිර.
*DHARMAKIRTTI SRI DHARMARAMA*
*HIGH PRIEST.*

ශ්‍රීබුද්ධවර්ෂ 2453 ක්වූ
ක්‍රි. ව. 1910 ඔක්තෝබර් මස
8 වෙනි දින කොළඹ දෙමටගොඩ
ධර්මප්‍රාසාද විහාරයෙහිදීය.

---

* 11 වෙනි පිටේ අධෝලිපියෙහි ''වාසවදත්තාකාව්‍යයයි'' යනු ප්‍රාමාදිකයි. ''කාදම්බරීකාව්‍යයයි'' යනු එහි ශුද්ධයයි.

# මහාබොධිවංශ ග්‍රන්ථිපද විවරණය.

---

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

"යස්ස මූලෙ නිසින්නොව සබ්බාරිවිජයං අකා
පත්තො සබ්බඤ්ඤුතං සත්ථා වන්දෙ තං බොධිපාදපං"

යනාදිවිසින් විරචිත මහාබොධිවංශයෙහි ග්‍රන්ථිපද විවරණ කරන මාවිසින් ආරම්භයෙහි සිට කතිපයාර්ථයෙක් වක්තව්‍ය වේ.

කිමෙස්ය යත් ?

වංශයෙහි නාමාවගති සඳහා සංඥා වක්තව්‍යයැ, කරණාවගම සඳහා නිමිත්ත වක්තව්‍යයැ, ප්‍රාමාණ්‍ය දක්වනු සඳහා කර්තෘවිශෙෂ වක්තව්‍යයැ, ග්‍රන්ථවිභාගාවගති සඳහා පරිමාණ වක්තව්‍යයැ, වංශයෙහි ප්‍රවෘත්ත්‍යඞ්ගසන්දර්ශන සඳහා ප්‍රයොජන වක්තව්‍යයැ. එබැවින් යථොද්දිෂ්ට සංඥාද්‍යර්ථපඤ්චකය යථාක්‍රමයෙන් දක්වා අනන්තරයෙහි යථාභිමත වංශව්‍යාඛ්‍යාන කර්තව්‍යයි.

මෙම කීහ ආගමව්‍යාඛ්‍යාන කරන චිරන්තනයෝ-

"සංඥාං නිමිත්තං කර්තාරම්පරිමාණම්ප්‍රයොජනම්
ප්‍රාගුක්ත්වා සර්වතන්ත්‍රාණාම්පශ්චාද්වක්තා'නුවර්ණ්ණයෙත්" යි.

සංඥය නාමය යනු තුල්‍යාර්ථයි. සංඥා ද්විප්‍රකාර වේ රූඪිසංඥය අන්වර්ථසංඥයයි.

එහි ව්‍යුත්පත්තිනිමිත්තාර්ථ පියා සඞ්කෙතමාත්‍රානුසාරයෙන් පවත්නා අශ්වකර්ණ්ණ ගිරිකර්ණ්ණ තෛලපායිකාදි සංඥ රූඪිසංඥ වෙයි. ව්‍යුත්පත්තිනිමිත්තාර්ථඅපරිත්‍යාගයෙන් පවත්නා මයූර මහිෂ සපත පර්ණ්ණාදි සංඥ අන්වර්ථසංඥ වේ.

කිසේය යත් ?

"අශ්වස්‍ය ඉව කර්ණඃ අශ්වකර්ණඃ" යි ව්‍යුත්පාදිත ශබ්ද එක් වෘක්ෂවිශේෂයෙක්හිම වැටෙයි, අශ්වකර්ණයක් වැනි වස්තුවිශේෂයෙක වැටෙන්නේ නොවෙයි. "ගිරිරිව කර්ණඃ ගිරිකර්ණඃ" යි ව්‍යුත්පාදිත ශබ්ද එක් ලතාවිශේෂයෙක්හිම වැටෙයි, ගිරිකර්ණයක් වැනි වස්තුවිශේෂයෙක්හි වැටෙන්නේ නොවෙයි. "තෛලම්පි බන්ති තෛලපායිකාඃ" යි ව්‍යුත්පාදිත ශබ්ද අතෛලප ශකුනිවිශේෂයන්කෙරෙහි වැටෙයි, තෛලප සත්වයන්කෙරෙහි වැටෙන්නේ නොවෙයි. අශ්වකර්ණාදි ශබ්දයෝ ව්‍යුත්පත්තිනිමිත්තාර්ථයන් ප්‍රත්‍යස්තමිතාවයවාර්ථ වැ රූඪිසංඥ වෙත්.

"මහාන්තං රෞතීති මයූරඃ, මහ්‍යං ශෙත ඉති මහිෂඃ, පර්ණේ පර්ණේ සප්ත පර්ණාන්‍යස්‍ය සප්තපර්ණඃ" යි ව්‍යුත්පාදිත ශබ්දයෝ ව්‍යුත්පත්තිනිමිත්තාර්ථ නොපියා මිහියැ රවණය කරන පක්ෂිවිශේෂයෙහිදු මිහිශයනය කරන චතුෂ්පදවිශේෂයෙහිදු සප්තපර්ණවත් වෘක්ෂවිශේෂයෙහිදු වැටෙනබැවින් අනුගතාවයවාර්ථ වැ අන්වර්ථසංඥ වෙත්.

මෙසේ නිර්දිෂ්ට ත්‍රිවිධ සංඥාවන්කෙරෙහි මේ මහාබොධිවංශ සංඥාද අනුගතාවයවාර්ථ වනබැවින් අන්වර්ථසංඥා වේ.

කිසේය යත් ?

මෙහි අවයව නම් වාක්‍යයෙහි පදයැ පදයෙහි ප්‍රකෘතිප්‍රත්‍යයයි. දුන් මේ වාක්‍යාත්මකසංඥා වනබැවින් තදවයවාත්මක වන මහත්-බොධි-වංශය යන පදත්‍රයාගේ අර්ථයෙන් අනුගතවනබැවින් අනුගතාවයවාර්ථ වැ අන්වර්ථසංඥා වේ.

මහච්ඡබ්දයෙන් වාච්‍ය අර්ථ දෙකෙක් වේ පූජ්‍යතාය වෛපුල්‍යයයි.

කිසේය යත් ?

මෙහි "මහාපුරුෂඃ, මහාරාජා" යනාදි විෂයෙහි පූජ්‍යතාවාචකයැ. "මහාමණි, මහාමේරුඃ" යනාදි විෂයෙහි වෛපුල්‍යවාචකයි. දුන් මෙහිදු අර්ථවයම ලැබේ තථාගතොපකාර ද්‍රැමෙන්ද්‍රවිශේෂයට වෛපුල්‍යතාද පූජ්‍යතාද සම්භවවනබැවින්. වෛපුල්‍යවිසින් මහතැ ඒ ස්ථානයද පවා අවනිතලයෙහි පටන්ගෙන බ්‍රහ්මාණ්ඩය දක්වා ස්කන්ධසඤ්චාරයට අවකාශ නොදෙන පලග ආනුභාව ඇතිවනබැවින්. පූජ්‍යතාවිසින් මහතැ බුදුන් තමන්විසින් සප්තාහයක් අනිමිෂලොචනයුගලයෙන් පුදනලදබැවින්.

"බුධ-අවගමනෙ" යන ධාතුහුකෙරෙන් ඖණාදික ඉන් ප්‍රත්‍යය කළකලැ බොධිශබ්ද සිද්ධ වේ. මෙශබ්දයෙන් වාච්‍යාර්ථ චතුර්විධ වේ ආර්‍ය්‍යමාර්ගාඞ්ගයැ නිර්වාණයැ සර්වඥඥානයැ ද්‍රැමෙන්ද්‍රයැයි.. "බොධි වුච්චති චතූසු මග්ගෙසු ඤාණං" යන විෂයෙහි ආර්‍ය්‍යමාර්ගාඞ්ගවාචකයැ "බුධ්‍යන්ත්‍යනෙන ආර්‍ය්‍යසත්‍යානි" යි. "පත්වාන බොධිං අමතං අසඞ්ඛතං" යන විෂයෙහි නිර්වාණවාචකයැ "බුධ්‍යත ඉති

බොධිඃ" යි. "පපෙපාති බොධිං වරභූරිමෙධසො" යන විෂයෙහි සර්වඥතාවාචකයැ "බුධ්‍යන්ත්‍යනෙන සර්වෙ ධර්මාඃ"යි. "බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො" යන විෂයෙහි ද්‍රැමෙන්ද්‍රවාචකයැ "බුධ්‍යතෙන 'සමින් '" යි. දැන් මෙතන මෙසතර අර්ථයෙන් ද්‍රැමෙන්ද්‍රයෙහි වර්ත්තමානවූ බොධිශබ්දයා ගෙන "මහාංශ්චාසෞ බොධිශ්ච" යි කර්මධාරයසමාස කළ "මහාබොධි" යනු සිද්ධ වෙයි. නොහොත් සනරාමරලොකගුරුවූ චූඩාමණිමරීචිමජ්ජරීපූජ්‍යපූජිතවරණාම්බුජ ඇති භගවත් තථාගත මහච්ඡබ්දයෙන් වාච්‍ය වෙයි. අපරිමෙයතාද පූජ්‍යතාද ඒ ජගද්ගුරු ධර්මරාජයා හා සමහවචනබැවින්.

අපරිමෙයතායෙන් මහතැ අකනිෂ්ඨබ්‍රහ්මලොකසථ ද්වාදශ යොජනොද්ගත ශරීර ඇති මහාබ්‍රහ්මයන් අග්‍රපාදතලයෙහුදු සිට අවනීතලසමාසීන ජිනවරයාගේ අනවලොක්‍යමූර්ධාවලොකනයට අසමර්ථ වනබැවින්. පූජ්‍යතායෙන් මහතැ රුවන්මෙරපමණ රුවන් දමෙකින් මහබඹහුදු මෙසක්වළ වටා දිවකුසුම්දමෙකින් පුදන මල්සහාදෙවියනුදු සෙසු දිව්‍යමනුෂ්‍යයනුදු උදාරතර පූජායෙනුදු පුදම්හයි තමන් තමන් සාමර්ථ්‍ය තුබූ පරිද්දෙන් පිදූබැවින්. මෙසෙයින් පූජ්‍යවෛපුල්‍යවාචක මහච්ඡබ්දයෙන් භගවත්හු වාච්‍ය පක්ෂයෙහි "මහතො ගුණෙන වා රූපෙණ වා විපුලස්‍ය ත්‍රෛධාතුක පූජ්‍යස්‍ය බුද්ධස්‍ය භගවතො බොධිඃ" යි ෂෂ්ඨීසමාස කළ "මහාබොධි" යනු වේ. මෙසේ සිද්ධවූ මහාබොධිශබ්දයා ගෙන වංශශබ්දයා හා සමාසකරනු "මහාබොධෙර්වංශො'නුක්‍රමඃ පරිපාටිස්සන්තානඃ ප්‍රබන්ධඃ පරම්පරා මහාබොධිවංශඃ" යි.

මෙසේ සිද්ධවූ ජයමහාබොධිය ඵලරුහමහාබොධිය ශාඛාමහාබොධිය යන තුන්මහාබොධියැ මුඛ්‍යයෙන් වැටෙන 'මහාබොධිවංශ' ශබ්දයෙහි ප්‍රමෙයප්‍රතිපාදකව තද්වාරයෙන් "සීතාහරණං කාව්‍යම්" යනුසේ ප්‍රතිපාදකග්‍රන්ථයෙහිදු වැටේ. මෙසේ අනුගතාවයවාර්ථවූ මහාබොධිවංශශබ්ද අන්වර්ථසංඥ වේ.

මෙතෙකින් මේවංශයෙහි නාමාවගති සඳහා සංඥ සන්දර්ශිතයි.

මෙහි නිමිත්තනම් කවරයත් ? මේ වංශකරණයට කාරණයයි, නිමිත්තය කාරණය හෙතුය යනු තුල්‍යාර්ථයි. ඒ ද්විප්‍රකාර වේ අභ්‍යන්තරකාරණය බාහ්‍යකාරණයයි. අභ්‍යන්තරකාරණ වූයේ මහාබොධිවිෂයප්‍රසාදයෙන් ප්‍රෙරිත වැ තත්ස්වරූපඅදිය පටන් ගෙන ජනයන් කිසේ දක්වියහැක්කේ හොයි උපන් චිත්තොත්පාද යැ. බාහ්‍යකාරණ වූවෝ තාදෘශ මහාකාරුණික පූජ්‍යපූජනීය සර්වජගදෙකශරණ සමස්තශාස්ත්‍රසාගරපාරගත ශීලවෘත්තෛකභාජන විඛ්‍යාතකීර්ත්තික නරපතිචූඩාමණිමරීචිරජිතපාදන්ත ඇති දංෂ්ට්‍රානාගාභිධාන මහාස්ථවිරයෝයි.

මෙතෙකින් විවිධනිමිත්ත සන්දර්ශිතයි.

කර්තෘහු කවරහු යත් ? ශෛශවාවස්ථායෙහි අනවශෙෂප්‍රවචනාධ්‍යයනය කොට යෞවනාවස්ථායෙහි ශාසනාවතීර්ණ වූ ප්‍රතිපත්තිසමාරාධිතමුනිජනමානස ඇති ප්‍රඥාකෘපාශ්‍රද්ධාවීය්‍යාදිගුණාධිවාසවූ සමස්තශාස්ත්‍රදර්ශනාද්භූත ඇති ශරච්චන්ද්‍රකරොල්ලාසිත ක්ෂීර සාගරය සෙයින් සද්ගුණරත්නයට එකාකර වූ සිටි **උපතිෂ්‍ය** ස්ථවිරයෝයි.

මෙතෙකින් කර්තෘවිශෙෂ සන්දර්ශිතයි.

මෙහි පරිමාණ කවර යත් ? ජේ ද්විප්‍රකාර වූ පරිච්ඡේද සඞ්ඛ්‍යාය ග්‍රන්ථසඞ්ඛ්‍යායයි. එහි පරිච්ඡේදසඞ්ඛ්‍යා නම්, අභිසම්බොධිකථාය, ආනන්දබොධිකථාය, දශබලපරිනිර්වාණකථාය, ප්‍රථමසඞ්ගීතිකථාය, ද්විතීයසඞ්ගීතිකථාය, තෘතීයසඞ්ගීතිකථාය, ලඞ්කාවතරණකථාය, නගරප්‍රවෙශනකථාය, මහාවිහාරප්‍රතිග්‍රහණකථාය, චෛත්‍යගිරිවිහාරප්‍රතිග්‍රහණකථාය, ධාත්වාගමනකථාය, ද්‍රුමෙන්ද්‍රාගමනකථාය, යන මේ ද්වාදශපරිච්ඡේදයයි. ග්‍රන්ථසඞ්ඛ්‍යා වනාහි සහස්‍රත්‍රයෙකින් පරිච්ඡින්නයි.

මෙසේ පරිච්ඡේදවිසින් ග්‍රන්ථවිසින් පරිමාණ සන්දර්ශිතයි.

මෙහි ප්‍රයොජන කවර යත් ? යම් ශාස්ත්‍රයෙක් ප්‍රයොජනරහිත වීනම් බලිගුග්දශනවිනිශ්චය සේ ප්‍රවෘත්ත්‍යඞ්ග නොවෙයි.

එසින් කීහ.

“ප්‍රයොජනමනුද්දිශ්‍ය න මන්දො'පි ප්‍රවර්ත්තතෙ” යි.

එබැවින් වංශය ප්‍රවෘත්ත්‍යඞ්ග සේ දක්වන්නට ප්‍රයොජන වක්තව්‍යයි. මෙහි ප්‍රයොජන ද්විප්‍රකාර වේ අව්‍යවහිතප්‍රයොජනය ව්‍යවහිතප්‍රයොජනයයි. එතවංශශ්‍රවණයෙන් උපදනා ප්‍රීතිප්‍රාමොද්‍යප්‍රසාද අව්‍යවහිතප්‍රයොජනය, තන්නිදානවූ නිර්වාණාධිගම ව්‍යවහිත ප්‍රයොජනයි.

පුනරපි ප්‍රයොජන ද්විප්‍රකාර වේ ප්‍රධානප්‍රයොජනය අප්‍රධාන ප්‍රයොජනයයි. මෙහි මහාබොධිවිෂයප්‍රසාදයෙන් ප්‍රෙරිතවූ සෙතාත්‍රමුඛයෙන් පදපඞ්ක්ති රචනා කරන ශාස්ත්‍රකර්ත්තෘහට අනන්තාපරිමාණ පුණ්‍යෞඝනිවහනිබන්ධන ලොකොත්තරපදප්‍රාප්තියද ශ්‍රොතෘජනයනට එතවංශශ්‍රවණොපජාතප්‍රසාදයෙන් ශාසනාවතීර්ණ වූ ශීලසමාධ්‍යාදිගුණගණපරිපූරණයෙන් ලබන ත්‍රිවිධබොධිද ප්‍රධාන ප්‍රයොජනයි. අප්‍රධානප්‍රයොජන නම් කවර යත් ? මොවුනටමැ පුණ්‍යප්‍රභාවයෙන් සංසාරප්‍රවෘත්ති ඇති නොයෙක්කල්හි විඳිනා භව භොගසම්පත් අප්‍රධානප්‍රයොජනයි.

මෙතෙකින් ප්‍රයොජන සන්දර්ශිතයි.

මෙතෙකින් සම්බන්ධාදිපඤ්චකය උක්තයි.

ඉක්බිති ව්‍යාඛ්‍යාතව්‍ය අභිශරීරද තව්‍යාඛ්‍යානප්‍රකාරද වක්තව්‍යයි. මෙහි ව්‍යාඛ්‍යාතව්‍ය අභිශරීර නම් අභිසම්බොධිකථා ආදි ද්වාදශ

කථායෙන් පරිවර්ජිතන ආත්මාර්ථයැ. තව්‍යාඛ්‍යානප්‍රකාර නම් "ෙකතාඬෙනා මහාබොධි" යනාදිවිසින් දක්වනලද පඨමඝාප්‍රශනා හා පඨ අභ්‍යන්තරප්‍රශ්නයට පරිහාරමුඛයෙන් ප්‍රවෘත්ත ග්‍රන්ථරචනායි.

තථාවිධ බොධිවංශ රචනා කරන ශාස්ත්‍රකාර අධ්‍යාත්මික බාහ්‍යවිඝ්නසන්දොහනිරාකරණ සඳහා ඉෂ්ටදෙවතානමස්කාර කරඥායේ බුදුන්ගේ අනෙකගුණගණාධිගමයට උපස්තම්භකවූ තමහට අධිකතරවූ දෙවතාරූපයෙන් උපස්ථිතවූ මහාබොධියට නමස්කාර කෙරෙමින් කියයි–

"යස්ස මූලෙ නිසින්නොව සබ්බාරිවිජයං අකා
පත්තො සබ්බඤ්ඤුතං සත්ථා වන්දෙ තං බොධිපාදපං" යි.

මෙහි අර්ථ දෙකෙක් වේ සමුදායාර්ථය අවයවාර්ථයයි.

මේහි සමුදායාර්ථනම් ප්‍රණන්තව්‍යවස්තුය තද්විශෙෂණය ප්‍රණාම යයි. එහි "බොධිපාදපං" යන්නෙන් ප්‍රණන්තව්‍යවස්තු නිර්දිෂ්ටයැ "වන්දෙ" යන්නෙන් ප්‍රණාම නිර්දිෂ්ටයැ අවශිෂ්ටපදවලින් යථොක්තවිශෙෂණ නිර්දිෂ්ටයැ යනු සංක්‍ෂෙපයෙන් සමුදායාර්ථයි. පිණ්ඩාර්ථ නම් හෙමැයි.

අවයවාර්ථ දෙකෙක් වේ ව්‍යුත්පත්ත්‍යර්ථය පදාර්ථයයි. එහි ව්‍යුත්පත්ති අර්ථනම් 'යස්ස' යනාදි තත්තත්පදයන්ගේ ව්‍යුත්පත්තිනිමිත්තාර්ථයි. ගේ කිසේය යත් ?

**යස්ස** යනු චතුර්විධපදයන්කෙරෙහි නාමපදයැ අවයවාවයවිභාවලක්‍ෂණසම්බන්ධයැ මූලය අවයවයැ වෘක්‍ෂය අවයවියැ ෂෂ්ඨී එහි විහිතයි.

**මූලෙ** යනු ෂට්කාරකයන්කෙරෙහි අධිකරණකාරකයැ චතුර්විධ අධිකරණයන්කෙරෙහි සාමීපිකාධිකරණයැ සප්තමී එහි විහිතයි.

**නිසින්නො** යන තන්හි නිපූර්වවූ "ශදෟ-ශාතනෙ" යන ධාතුයැ චතුරඞ්ගවීර්‍යාධිෂ්ඨාන කොට හුන්නේය යන අර්ථයි.

**එව** යන නිපාතපද අන්‍යයොගව්‍යවච්ඡෙදකයැ. යත්ශබ්දයෙන් පරකොට "යස්ස එව" යි යොදනු. යම් වෘක්‍ෂයක්හුගේම මූලයෙහි නිෂණ්ණවූයේ සර්වාරිමර්ථනය කොට සර්වඥපදප්‍රාප්ත වීද ඒ වෘක්‍ෂයට වදිමි යුසේයි. එබැවින් චාතුර්වර්ණ්‍යයන් මනුෂ්‍යත්වයෙන් සමාන වූවද ක්‍ෂත්‍රියකුලසම්භූතයන්ම ක්‍ෂත්‍රියනම්වනසෙයින් මහාබොධි ඵලයෙන් උද්භූත වෘක්‍ෂයෝම මහාබොධි වෙත් සෙසු තත්සදෘශ අශ්වත්ථවෘක්‍ෂයෝ මහාබොධි නොවෙත්.

**සබ්බාරිවිජයං** යනු ෂට්සමාසයන්කෙරෙහි කර්මධාරයගර්භ තත්පුරුෂසමාසයි. "සබ්බෙ ච තෙ අරයශ්චෙති සර්වාරයඃ තෙෂාං විජයඃ තථොක්තම්" මෙහි අරීහු නම් ක්ලේශාභිසංස්කාරදෙවපුත්‍ර

සඞ්ඛ්‍යාත ත්‍රිවිධ මාරයන, ඔවුන්කෙරෙහි කෙලශමාරයා ප්‍රහාණ වශයෙන් විජය කෙළේ, අභිසංස්කාරමාරයා සාමර්ථ්‍යවිඝාතවශ යෙන් විජය කෙළේ. දෙවපුත්‍රමාරයා විෂයාතික්‍රමණවශයෙන් විජය කෙළේ. විපූර්වවූ "ජි-ජයෙ" යන ධාතුයි—**අකා** යන තන්හි කරණක්‍රියායෙන් ව්‍යාප්‍යවනබැවින් කර්මය වෙයි, ඒතියා එහි විහිතයි.

**අකා** යනු වූකල වනබැවින් 'අකරොත්' යනු වේ. "ඩු කෘඤ්-කරණෙ" යන ධාතුයි.

**පත්තො** යන තන්හි ප්‍රපූර්වවූ "ආපෘ-ව්‍යාපෙනෘ" යන ධාතුයි. **සබ්බඤ්ඤුතං** යන තන්හි සර්ශබ්දොපපද "ඥා-අවබොධනෙ" යන ධාතුයි. "සර්වං ජානාතීති සර්වඥඃ, තස්‍ය භාවඃ සර්වඥතා".

"පත්තො සබ්බඤ්ඤුතං" යන මෙයින් කුමක් කියූ වෙති යත්? කාලත්‍රයවර්තීවූ සර්වධර්මයන් නිරවශෙෂයෙන් දන්නා ඥානයට ප්‍රාප්තයැ යුසේයි.

**සත්ථා** යන තන්හි "ශාසු-අනුශිෂ්ඨෞ" යන ධාතුයි. "සානත්‍රය මුඛෙන විනෙයජනං ශාස්ති අනුශාස්තීති ශාස්තා" යි ගත්වන බැවින් දෘෂ්ටධාර්මික සාම්පරායික පරමාර්ථයෙන් යථාර්හීවිසින් දිව්‍ය මනුෂ්‍යයනට අනුශාසනා කරනුයේයැ යන අර්ථයි.

**වන්දෙ** යන තන්හි "වදි-අභිවාදනස්තුත්‍යොඃ" යන ධාතුය. ප්‍රණාම කෙරෙමි යන අර්ථයි. ප්‍රණාම ත්‍රිවිධ වේ කායප්‍රණාමය වාක්ප්‍ර ණාමය මනඃප්‍රණාමයයි. එහි අපරිමිතාසාධාරණගුණගණවිෂකරණ ප්‍රීතිප්‍රාමොද්‍යබහුමාන මනඃප්‍රණාම නම් වේ.

හෙ මැ වාග්විඥප්ති ජනවමින් ස්තුතිවශයෙන් ප්‍රවෘත්ත වූයේ වාක්ප්‍රණාම නම් වේ. කායවිඥප්ති ජනවමින් කායාවනත කොට ප්‍රවෘත්ත වූයේ කායප්‍රණාම නම් වේ. දන් මෙහි **වන්දෙ** යනු සාමාන්‍ය නිර්දෙශ වනබැවින් ත්‍රිවිධප්‍රණාම මැ අපේක්ෂිත වේ.

**තං** යන තන්හි යත්තත්ශබ්දයන් නිත්‍යසම්බන්ධ වනබැවින් "යස්ස" යන තන්හි යත්ශබ්දයෙන් කී අර්ථ තත්ශබ්දයෙන් පරාමර්ශ කරනුලැබේ.

**බොධිපාදපං** යන මෙහි පාදශබ්දොපපදවූ "පා-පානෙ" යන ධාතුය. "පාදෙන පිබතීති පාදපඃ" යනුහෙයින් මෙයින් වෘක්ෂයෝ වාච්‍ය වෙත්.

කීයේ මැ නො-

"මහීරුහඃ කුජො වෘක්ෂො ශිඛරී පාදපො'ඞ්ඝ්‍රිපඃ
විටපො'ගො දෘමශාලො වනස්පතිරනොකහඃ" යි.

“බොධිශ්වාසෙ පාදපශෙඛති බොධිපාදපඃ”—ප්‍රණමක්‍රියායෙන් ව්‍යාප්‍යවනබැවින් කම්මණි විතියා-“බොධිපාදපං” යනු වේ.

මෙතෙකින් ව්‍යුත්පත්‍යර්ථ සන්දර්ශිතයි.

මෙහි පදාර්ථ නම් කවර යත් ?

යස්ස එව, යම් මහාබොධිවෘක්ෂයක්හුගේම; මූලෙ, මුල්සමීපයෙහි; ඡායාමණ්ඩලයෙහි; සකන්ධපර්‍ය්‍යන්තයෙහි; වජ්‍රාසනයෙහි; නිසින්නො, සම්‍යක්සම්බොධිසමධිගම කොට මිස මේ පර්‍ය්‍යඞ්කය නොබිඳිමියි චතුරඞ්ගසමන්වාගත වීර්‍ය්‍යාධිෂ්ඨාන කොට හුන්නේ; සබ්බාරිවිජයං අකා, සර්වාරිසඞ්ඛ්‍යාත ත්‍රිවිධමාරයන් පරාජය කළේද; සබ්බඤ්ඤුතං, සර්වඥතාවට; පත්තො, විශුද්ධපරම්පරායෙන් ගොස් චතුස්සත්‍යාවගම කෙරෙමින් චතුර්මාර්ගානන්තරයෙහි ප්‍රාප්ත වීද; සත්ථා, දිව්‍යමනුෂ්‍යයන්ට එකශාස්තෘවූ සම්‍යක්සම්බුද්ධ වූයේද; තං බොධිපාදපං, ඒ බොධිද්‍රුමරාජයා; වන්දෙ, මනොද්වාරවිෂයප්‍රසාදයෙන් ප්‍රෙරිතවැ වාග්ද්වාරයෙන් ස්තොත්‍ර කොට කායද්වාරයෙන් ප්‍රණත වැ අභිවාදනය කෙරෙමි; යන මේ පදාර්ථයි.

මෙහි ධර්මසංවර්ණනා කරන බුද්ධඝොෂාදි මහාපුරුෂයන් සෙයින් මොවුහුදු රත්නත්‍රයටම නමස්කාර කටයුත්තේය, එසේ නොකොට මහාබොධියට කුමට නමස්කාර කළෝද යත් ? තථාගතයහට නිෂ්පත්තිහෙතුභාවයෙන් මාතෘස්ථානයෙහි සිටි මහාබොධියට කළ පූජායෙන් බුද්ධරත්නයටද තන්මූලයෙහි සමධිගත ධර්මරත්නයටද තදුභයභූත සඞ්ඝරත්නයටද පූජා කළා නම් වන බැවින් තථාවස්තුභූත මහාබොධියටම අවශ්‍යකර්තව්‍ය සේ දැක මහාබොධියටම ප්‍රණාම කළෝ.

මෙසෙයින් චින්තාමණි භද්‍රඝට කල්පවෘක්ෂ සෙයින් අභිමතාර්ථ සම්පාදක මහාබොධියට ප්‍රණාම කොට එයින් දුනු පුණ්‍යයෙන් සර්වොපද්‍රවවිද්‍රාවණය කොට මහාබොධිවංශය කරනපරිදි දක්වනුවෝ කීහ-

“ජනිතං යං පණාමෙන ඉති බොධිමහීරුහෙ
පුඤ්ඤං තස්සානුභාවෙන හෙත්වා සබ්බෙ උපද්දවෙ” යි.

මෙහි ව්‍යුත්පත්ත්‍යර්ථ කවර යත් ? ජනිතං යන තන්හි “ජනී-ප්‍රාදුර්භාවෙ” යන ධාතුය ණ්‍යන්තයි. යං යනු නපුංසකෛකවචනයි. පුඤ්ඤං යනු හා සමානාධිකරණයි.

“භින්නනිමිත්තස්‍ය ශබ්දස්‍ය එකස්මින් අර්ථෙ ප්‍රවෘත්තිඃ සාමානාධිකරණ්‍යම්”.

**පණාමෙන** යන තන්හි “ණම-ප්‍රහ්වත්වෙ” යන ධාතුයෑ හෙත්වර්ථයෙහි තෘතීයායි. **ඉති**ශබ්ද අව්‍යයයෑ නිදර්ශනයෙහි වැටේ.

**බොධිමහීරුහෙ** යන තන්හි “රුහ-ජනමනි” යන ධාතුය— මහ්‍යාං රුහතීති මහීරුහඃ— මේ නයයෙන් තෘණලතාදීහුදු මහීරුහ වූව මැනව යත් ? රූඪිවශයෙන් ගේ සකන්ධවිටපශාඛාදිමත් වෘක්ෂවිශෙෂයෙහි මැ වැටේ. “බොධියාවාසෞ මහීරුහශ්චෙති බොධිමහීරුහඃ, තස්මින් බොධිමහීරුහෙ” යනු වෙයි විෂයසප්තමීයි.

**පුඤ්ඤං** යන තන්හි “පූඤ්-පවනෙ” යන ධාතුයි, සන්තානයෙන් පාපජහන පාපනිර්ගමන කරනබැවිනුදු පූජ්‍යවූ භවඵල නිර්වර්තනය කරන බැවිනුදු ‘පුණ්‍ය’නම් වේ—සන්තානතො පාපං පුනාති වා පූජ්ජභවං නිබ්බත්තෙතීති වා පුඤ්ඤං.

**තස්ස** යන තන්හි තත්ශබ්දයා ප්‍රකෘතප්‍රත්‍යවමර්ශීනබැවින් ප්‍රස්තුතවූ පුණ්‍යය පරාමර්ශ කරනු.

**අනුභාවෙන** යන තන්හි අනුපූර්වවූ “භූ-සත්තායාම්” යන ධාතුයෑ කරණකාරකයෙහි තෘතීයායි.

**හෙත්වා** යන තන්හි “හිද-විදූරණෙ” යන ධාතුයෑ ‘දස්සයිස්සං’ යන අපරකාලක්‍රියාවට සමානකර්තෘකවූ පූර්වකාලක්‍රියාවාචකයි.

**සබ්බෙ** යනු **උපද්දවෙ** යනු හා සමානාධිකරණයි.

**උපද්දවෙ** යන තන්හි උපපූර්වවූ “ද්‍රෑ-ගතෞ” යන ධාතුයෑ ගේ හෙදනක්‍රියායෙන් ව්‍යාප්‍යවනබැවින් කර්මණි විත්යා වෑ ‘උපද්‍රවෙ’ යනු වේ. අන්තරායපර්යායයි—“චුතිපටිසන්ධීනං අන්තරෙ වෙමජ්ඣෙ උපපීළකඋපඝාතකවසෙන ආයන්ති පවත්තන්තීති අන්තරායා, අථ වා පුරිමකම්මනිප්ඵන්නස්ස විපාකසන්තානස්ස අන්තරෙ වෙමජ්ඣෙ ආයන්ති ආපතන්තීති අන්තරායා” යි ගත්වනබැවින් අන්තරාය නම්ලද සර්ව උපද්‍රවයන සූචෙස්සි. මේ ව්‍යුත්පත්ත්‍යර්ථයෑ මෙහි පදාර්ථ වනාහි–

ඉති, මෙසේ; ප්‍රථමගාථායෙහි නිර්දිෂ්ටක්‍රමයෙන්; බොධිමහීරුහෙ, බොධිවෘක්ෂයට වූ; පණාමෙන, ප්‍රණිපාතයෙන්; අවනතීන්; වැඳීමෙන්; යං පුඤ්ඤං, පාපප්‍රහායකවූ සුඛාවහවූ යම් පින්කෑමෙක්; ජනිතං, දනවනලදද; තස්ස, ඒ පුණ්‍යකර්මයාගේ; අනුභාවෙන, තේජසින්; සබ්බෙ උපද්දවෙ, ආධ්‍යාත්මික බාහ්‍ය අන්තරාය රූපයෙන් සිටි සර්වෝපද්‍රවයන්; හෙත්වා, විදූරණය විනාශය විධ්වංසනය කොටින්; යනු පදාර්ථයි.

මෙසේ ප්‍රණාමයෙන් ලද පුණ්‍යයෙන් හතාන්තරාය වෑ තමන් විසින් අභිප්‍රෙත වංශය කරනපරිදි දක්වනුවෝ කීහ-

"දස්සයිස්සං මහාබොධිවංසං භාසාය සත්ථුනො
පුබ්බෙ සීහළභාසාය ඨිතං වුඩ්ඪජනානුගො" යි.

මෙහි ව්‍යුත්පත්ත්‍යර්ථ කවර යත් ?

**දස්සයිස්සං** යන තන්හි "දෘශිර්-ප්‍රෙක්‍ෂණෙ"යන ධාතුයැ. **මහාබොධිවංසං** යන තන්හි කර්‍මණි විභක්තියායි.

**භාසාය** යන තන්හි "භාෂ--ව්‍යක්තායාං වාචි" යන ධාතුයැ කරණසාධනයෙහි තෘතීයායි.

**සත්ථුනො** යන තන්හි ශාස්තෘහුගේ භාෂා නම් කවර යත් ? සෙසු භාෂා සෙසීත් යුගාන්තයෙහි නොනස්නා නොපෙරෙළෙන බ්‍රහ්මයන් හා ආයෂීයන්කෙරෙහි වැටෙන ස්වභාවනිරුක්තිරූපයෙන් සිටි මගධභාෂායි. පූර්‍වශබ්ද අව්‍යුත්පන්නප්‍රාතිපදිකයි.

**සීහළභාසාය ඨිතං** යන තන්හි "ෂ්ඨා-ගතිනිවෘත්තෞ" යන ධාතුයැ.

**වුඩ්ඪජනානුගො** යන තන්හි පළමු පදය "වෘධු-වෘද්ධෞ" යන ධාතුයැ දෙවන පදය අනුපූර්‍වවූ "ගම්ලෘ-සෘප්ලෘ-ගතෞ" යන ධාතුයැ. 'වෘද්ධාශ්ච තෙ ජනාශ්චෙති වෘද්ධජනාඃ, තාන් අනුගච්ඡතීති වෘද්ධජනානුගඃ"-මේ ව්‍යුත්පත්ත්‍යර්ථයැ.

මෙහි පදාර්ථ නම් කවර යත් ?

පුබ්බෙ, පූර්‍වයෙහි; සීහළභාසාය, සිංහලභාෂායෙන්; ඨිතං, ස්ථිතවූ, මහාබොධිවංසං, ද්‍රුමරාජයාගේ වංශය; සත්ථුනො, සම්‍යක්සම්බුද්ධයාගේ; භාසාය, භාෂායෙන්; වුඩ්ඪජනානුගො, පරිශුද්ධ ශීලාචාරශුචිශුභශුද්ධාජීව ඇති ශ්‍රද්ධාබුද්ධිවීර්‍ය්‍යාදිගුණරත්නයට ආකරවූ බුද්ධඝොෂාදී වෘද්ධජනයන් අනුගතවූයෙම්; දස්සයිස්සං, දක්වම්; යනු මෙහි පදාර්ථයි.

මෙහි ප්‍රථමගාථායෙන් මහාබොධිය ගුණකීර්ත්තනය කොට නමස්කාර කළහ. ද්විතීයගාථායෙන් මහාබොධිවිෂයප්‍රණාමයෙන් උපන් පුණ්‍යානුභාවයෙන් සඋපද්‍රව නිරස්ත වනපරිදි කීහ. තෘතීයගාථායෙහි "දස්සයිස්සං" යන්නෙන් චිකීර්ෂා දක්වූහ. 'මහාබොධිවංසං' යන්නෙන් චතබතසිත අර්ථශරීර දක්වූහ. "භාසාය සත්ථුනො" යන්නෙන් උපාදෙයවචන දක්වූහ. "සීහළභාසාය" යන්නෙන් හෙය වචන දක්වූහ. "වුඩ්ඪජනානුගො" යන්නෙන් සදාචාරානුවෘත්ති දක්වූහු. මෙසේ ගාථාත්‍රයෙන් අර්ථපඤ්චකයක් දක්වා දැන් පූර්‍වයෙහි සිංහලභාෂායෙන් ස්ථිතවූ මහාබොධිවංශය කාවිසින් උපස්ථිතයැ යන තත්කර්තෘස්වරූපාදි * අර්ථවිශෙෂයක් දක්වනු සඳහා "තං පනෙතථාදි " වාක්‍යයට ආරම්භ කළෝ.

* 'යන් තත්කර්තෘස්වරූපාදි'-පොත්හි.

ජිනසාසනාභරණභූතෙහි, බුදුන්ගේ ශාසනයෙහි ආභරණ ස්ථානයට ප්‍රාප්තවූ-ජිනාඃ සවාසනාඃ ක්ලේශවිකල්පාඃ අනෑතිපිකා ශත්‍රුවේඃ'තෙනෙති ජිනඃ-සාසිතබ්බපුග්ගලෙ ගනෙන යථාපරාධාදි සාසිතබ්බභාවෙන අනුසාසනං විනයනං සාසනං-"භූ-ප්‍රාප්තාවාත්මනෙපදී" යන ධාතුයි.

පුබ්බාචරියකෙසරීහි, පූර්වාචාර්‍ය නමැති කෙශරින්විසින්; වෛශාරද්‍යගුණයෙන් කෙශරසිංහයන් බඳුවූ පූර්වාචාර්‍යවරයන්විසිනැ යුසේයි. "ලඞ්කාවාසීනමත්ථාය" යන තන්හි අර්ථශබ්ද හිතයෙහි වැටේ, ලඞ්කා නම් යක්‍ෂයන්ගේ පුරයැ අවයවයන් කෙරෙහි වැටෙන ශබ්දයන් සමුදායයනුදු කෙරෙහි වැටෙනබැවින් ලඞ්කාශබ්දය සියලු ද්වීපයෙහිම වැටේ. අහං යනු ආත්මනිර්දේශයැ. ඉදානි යනු කාල සප්තමියි.

අසෙසදෙසවාසීනං, සර්වදෙශවාසීනට; සුබොධං කරොන්තො, අකෘච්ඡ්‍රොද්ගම කරනුයෙම්; සබ්බජන්තූනං, සර්වසත්වයන්ගේ; මූල භාසාය, ස්වභාවනිරුක්තීන්; මගධාභිධානාය, ඒබස් සර්වදෙශ සාධාරණ වූවද මගධදෙශයෙහිම උත්සන්න වැ වැටෙන්නෙන් මගධනම් අභිධාන ඇති; දසබලස්ස, දශවිධ ඥානබල ඇත්තා බැවින් දශබලනම්ලද සම්‍යක්සම්බුද්ධයාගේ; දෙසනා, ධර්මදෙසුන්; වචනමාලාදුකූලාය, වාග්මාලාදුකූලවූ — කථෙතබ්බානං අත්ථානං දෙසකායතොනඃ ආණාදිවිධිනා අතිසජ්ජනං පබොධනං දෙසනා—වාචාය, භාෂායෙන්; රචයිස්සන්තො, රචනා කරන්නෙම්— "රච-ප්‍රතියත්නෙ" යන ධාතුයි—'අපිනාම' යනු ප්‍රාර්ථනායෙහි නිපාතයි. 'අප්පෙවනාම' යනු හා සමානාර්ථයි.

පරිතොසෙය්‍යං, පරිතුෂ්ට කෙළෙසිම් නම් මැනැවි. මෙයින් කුමක් කියූ වෙති යත් ? මේ පරම්ගම්භීරවංශය මාගේ පුහුදුන්නුවණින් කියනුයෙම් අගාධාපාරසාගරය උඩුපයක්න්තරන පුරුෂයකු සේ අතුරෙහි නිමනන නොව රචනාපාරයට පැමිණි සාධුජනයන් සතුටු කෙළෙම් නම් මැනැවැ යුසේයි. නොහොත් ක්‍ෂුද්‍රදීපිණයෙක්හි නිරවශෙෂයෙන් පැනෙන රුවන්මැලි මහතුඹු සෙයින් සකල මහාබොධිවංශය මාගේ වචනාදර්ශයෙහි දක්වා සාධුජනයන් සොම්නස් කෙළෙම් නම් මැනැවැ යුසේයි. නොහොත් බුදුන්ගේ අටලොස්හත්බඳින් සඤ්ඡපගතියෙහි චතුර්විධ ඊර්‍යාපථ පැවැත්වූවාසෙයින් සකල මහාබොධිවංශය මාගේ වාඞ්මය රාජධානිගීයෙහි විජෘම්භනාපරිද්දෙන් සඞ්ග්‍රහ කොට දක්වා සාධුජනයන් පරිතුෂ්ට කෙළෙම් නම් මැනැවැ යුසේයි. නොහොත් සමුද්‍රය දක්කැටිසහට වෙරාතටයෙහි සිට මේ සමුද්‍රයයි එකදෙශයක් පානාසෙයින් අගාධ අපාර ජිනචරිගුණාර්ජිත වංශසාගරය එකදේශයක්කිනුදු දක්වා සාධුජනයන් සතුෂ්ට කෙළෙම් නම්

මැනැවැ යුසේයි. නොහොත් චක්‍රවර්තීහුගේ මණිරත්නයෙහි දිස්නා තුන්ලෝ සෙයින් තුන්මහාබොධීන්ගේ වංශය මාගේ වාග්මණිරත්නයෙහි දිස්නාපරිද්දෙන් සඞ්ග්‍රහ කොට දක්වා සාධුජනයන් පරිතොෂ දනැවීම් නම් මැනැවැ යුසේයි.

මෙහි සාධුශබ්දයෙන් ජනයන් කුමට වෙසෙසූහ යත්? දුර්ජනයන් පරිතුෂ්ට නොකටහැක්කෙන් කියත්. කිසේය යත්? කර්කශධ්වනි ඇති දොෂමලදූසකවූ දුර්ජනයන් බන්ධනශෘඞ්ඛල සෙයින් නොදනව්‍යථාපීඩා කෙරෙති, සාධුජනයෝ වූකල සුන්දරධ්වනීන් පෙදෙහි පෙදෙහි මණිනූපුර සෙයින් සිත් ගනිත්—එයින් කීහ.

"කටු ක්වණන්තො මලදූසකාඃ ඛලා-
ස්තුදන්ති නූනං බන්ධනශෘඞ්ඛලා ඉව
මනස්තු සාධුධ්වනිභිඃ පදෙ පදෙ
හරන්ති සන්තො මණිනූපුරා ඉව" * යි.

"ජිනසාසනාභරණභූතෙහි පුබ්බාචරියකෙසරීහි" යන මෙයින් පූර්වයෙහි සිංහලභාෂායෙන් තුබූ මහාබොධිවංශයට කර්තෘ දක්වූහ. "ලඞ්කාවාසීනමත්ථාය සීහළභාසාය ඨපිතං මහාබොධිවංසං" යන මෙයින් ඒකාලයෙහි ඒවංශය එසේ තිබීමට ප්‍රයොජන දක්වූහ. "අභිම්දූනි අසෙසදෙසවාසීනං සුබොධං කරොන්තො" යන මෙයින් සිංහලභාෂායෙන් තුබූ වංශය සර්වදෙශවාසීනට දුර්බොධයෙන් දුන් තමන් පරහිතනිරත වැ සුබොධ කොට කරන පරිදි දක්වූහ.

"සබ්බජන්තූනං මූලභාසාය මගධාභිධානාය දසබලස්ස දෙසනාවචනමාලානුකූලාය වාචාය රචයන්තො" යන මෙයින් කරණප්‍රකාර දක්වූහ. "අපි නාම සාධුජනං පරිතොසෙය්‍යං" යන මෙයින් තමන්ගේ සාධුජනාරාධනා දක්වූහ—එවඤ්ච සති, මෙසේ ඇති කල්හි; මෙසේ මහාබොධිවංශය මාවිසින් කටයුතුබැවින යුසේයි.

"කෙනඨෙන මහාබොධි" යනාදීහු පඤ්චවිධ ප්‍රශ්නයන්කෙරෙහි කවර ප්‍රශ්නයහ යත්? ශාස්ත්‍රකාරකයා සකල මහාබොධිවංශය අත්ලේ තුබූ දැරඹමිණියක් සෙයින් එකාලොක කොට දක කරුණායෙන් ප්‍රෙරිත වැ පරහිත සඳහා කියපි වැ ප්‍රශ්නකළ වනබැවින් වක්තුකාමතාප්‍රශ්න වෙත්. එබැවින් මෙහි "කෙනඨෙන මහාබොධි, සා මහාබොධි කස්ස සම්බන්ධිනී, කෙන අභිරූපිතා, කත්ථපතිට්ඨිතා ඉති එතෙ පඤ්ච මහාපඤ්හා විස්සජ්ජෙය්‍යා භවන්ති හි" යි යොදනු.

තත්‍ථාති තෙසු පඤ්චමහාපඤ්හෙසු — මහිතා, පුදනලද්දීය; බ්‍රහ්ම, සහම්පතිප්‍රභෘති බ්‍රහ්මගණයන්විසිනුදු; අමර, ශක්‍රදෙවරාජාදි අමරගණයන්විසිනුදු; අසුර, ප්‍රභාරාදාදි අසුරගණයන්විසිනුදු; නරින්ද, කොශලාදි නරෙන්ද්‍රයන්විසිනුදු; නාගින්දෙහි, මහාකාලාදි

* වාසවදත්තාකාව්‍යයි.

නාභෙතුයන්විසිනුදු—'යො' යනු අනියමනිර්දෙශයැ. සංසාරචක්‍රයෙහි පරිභ්‍රමත්වූ සත්ත්වයන්කෙරෙහි යමෙක් යුෂ්මේසි—දයා, කුළුණින්; සීතලමානසො, සිහිල් සතන් ඇතියේ; පඤ්ඤාවාසො, ප්‍රඥාවට අවස් වූයේ; ප්‍රඥාභගවතියගේ විජ්‍යමානයට ශ්‍රීනිවාස වූයේයැ යුෂ්මේසි. මෙයින් ඔහු කරුණායෙන් සත්ත්වපරිග්‍රහ කළ පරිදි හා ප්‍රඥායෙන් නිර්වාණපරිග්‍රහ කළ පරිදි කියූහ. එකශබ්ද ප්‍රධානපර්‍යායයි. කුළුණුනුවණදෙකින් තමා හා සමයන් නැත්වනබැවින් එකයැ අද්විතීයයැ අසහායයැ අසදෘශයැ යුෂ්මේසි. මහත්ශබ්ද පූජ්‍යවාචකයි. පූජ්‍යවූ උත්තමපුරුෂයෙක යුෂ්මේසි.

“ඉතො” යන තන්හි ඉදම්ශබ්දයෙන් පඤ්චම්‍යර්ථයෙහි තසිල්—අතිපූර්වවූ “ඉණ්-ගතෞ” යන ධාතුහුකෙරෙන් භූතයෙහි ක්තප්‍රත්‍යය වැ ‘අතීත’ වෙයි. ‘අතික්‍රම්‍ය ගතඃ’ යන අර්ථයි.

කප්පසතසහස්සාධිකානං, කල්පශතසහස්‍රයක් අධික කොට ඇති-මෙහි කල්පශබ්ද ත්‍රිවිධ කල්පයන්කෙරෙහි මහාකල්පයෙහි වැටේ-චතුන්නං අසංඛෙය්‍යානං මත්ථකෙ, සතරස්ථානයෙක්හි බුද්ධශූන්‍ය කල්පාසංඛ්‍යයන්ගේ මස්තකයෙහි; ලොකියලොකුත්තරසම්පදාකර, ලෞකිකලොකොත්තරසම්පත්තට ආකරවූ උත්පත්තිස්ථානවූ; බුද්ධ, සාරාසංඛ්‍ය අෂ්ටාසංඛ්‍ය සොළසාසංඛ්‍ය කල්පලක්ෂයක් පැරුම් පුරා උපදනා සම්‍යක්සම්බුද්ධයහ; පච්චෙකබුද්ධ, දෙයාසංඛ්‍ය කල්පලක්ෂයක් පැරුම් පුරා උපදනා පසේබුදුහ; සාවක, එකාසංඛ්‍ය කල්පලක්ෂයක් පැරුම් පුරා උපදනා අග්‍රශ්‍රාවකයහ කල්පලක්ෂයක් පැරුම් පුරා උපදනා මහාශ්‍රාවකයහ; චක්කවත්ති, සමුපචිතකුශලසම්භාරයෙන් උපදනා චක්‍රවර්තීන්යහ යන; නරාසභ, සත්ත්වොත්තමයනට; ආධාර, ප්‍රතිෂ්ඨාවූ.

වරජම්බුදීපෙ යන තන්හි මහාජම්බුවෘක්ෂයෙන් ප්‍රකටවූ ද්වීපය ජම්බුද්වීපනාම. බුද්ධාදි මහාපුරුෂයනට ජන්මභූමිවනබැවින් වර විය-අරමගණසදිස, දෙවියන් වැනිවූ; ජනාකිණ්ණතාය, ජනයන්විසින් ආකීර්ණ වනබැවින්-භවාදිසු ජායන්තීති ජනා-අමරවතීති, අමරවතීයයි; ලද්ධාභිධානාය, ලබ්ධවූ අභිධාන ඇති; රාජධානියා, නුවරැහි; සකලලොකපූජිතෙ, සර්වජනයන්විසින් පූජ්‍යවූ; කමලාසන, මහබඹහු; සුනුකුලෙ, පුත්‍රයන්ගේ කුලෙහි; ආත්මජයහ ක්ෂෙත්‍රජයහ දත්තයහ ශිෂ්‍යයහ යන සතර පුත්‍රයන්කෙරෙහි බ්‍රහ්මයා විසින් ප්‍රොක්ත වෙදධ්‍යයනය කරන හෙයින් බ්‍රහ්මපුත්‍රයහයි ගත් අපරිමෙය ධන ඇති බ්‍රාහ්මණමහාසාරකුලෙහිය යුෂේසි. පරමසුඛුම මෙධා, උතුම්වූ සියුම්නුවණැති; ආකාශයසේ අනන්තවූ පස්පොළෝසේ විපුලවූ දියපොළෝසේ ගැඹුරුවූ සියුම්නුවණැතියේයැ යුෂේසි. සුමෙධො නාම, සුමෙධනම්; සුකුමාරො, සියුමැලි; කුමාරො

නුඹා, කුමරුවික්නු වැ; වසනත, වසත්දෙව්පුත්හුගේ; කනති, පෑහැ; මද්දිත, මඩනාලද; විලාසො, විලස් ඇතියේ; කාමෙශ්වරයා· පරය මින් දිලියෙනු වූයේයැ යුසේයි.

වෙදසාගරපාරගො, සාගරතුල්‍යවූ වෙදයෙහි පාරයට ගියේ; මෙහි සාගරශබ්දයෙහි වචනාර්ථ කවර යත්? සුන්දරවූ රත්නයනට ආකරබැවිනුදු නිපතිතයනට ගැලුම්දෙනබැවිනුදු ලොකයා හා සසඳ වෙලෙල තොපැන සිටියාක්හු වැනිබැවිනුදු හාත්පසින් ලොකයා ප්‍රඝාතනායෙහි ගලනබැවිනුදු සාගරනම් වෙයි. ලොකයෝවනාහි සගරසුතයන්විසින් නිඛාත වනබැවින් සාගරනම් වෙයි යෙත්.

එයින් කීහ—

"සුන්දරානං රතනානං ආකරත්තා සාගරො· සාගරට්ඨෙන සාගරො නිපතිතානං අත්තනො පුථුගම්භීරභාවෙහි සඞ්ගං සජනං නිවජ්ජනං රාති දෙතීත්‍යත්ථො සඞ්ගසඤ්ඤස්ස සාගභාවො අථවා සඞ්ගරට්ඨෙන සාගරො සඞ්ගරකරණට්ඨෙන ඊතධම්මතාය අයං මරියාදං ඉමං වෙලං නාතික්කමාමීති ලොකෙන සඞ්ගරං සඞ්කෙතං කරොන්තො විය හොතීති. සඞ්ගරණං වා සාගරො· සඞ්ගරණං නාම සම්භාතො ගලනං සන්දනං උදකෙන කප්පුට්ඨානකාලෙ මහාසමුද්දෙ ඉතො චිතො ච පසාරිත්වා සකලලොකධාතුං එකොඝං කරොතීති. ලොකියා පන සගරස්ස රඤ්ඤො පුත්තෙහි නිබ්බත්තිතො ඛණිතො සාගරොති වදන්ති පුරත්ථිමසමුද්දප්පදෙසො තංසම්බන්ධතාය රුළ්හිවසෙන සබ්බොපි තථා වොහරියති" යි.

සකලකලා, ගණිතචිත්‍රකර්මාදි සියලු සූසැටකලායෙහි; ආචරිය භාවං, ආචාර්‍ය්‍යත්වයට; ගුරුචරණපරිචරියාවසානෙ, ගුරුන්ගේ පාද පරිචර්‍ය්‍යාවසානයෙහි; විවටවාරානි, භාණ්ඩාගාරිකයන්විසින් විවෘත වාරඇති—"රතනකොසසහස්සානි" යන තන්හි රතිජනනාර්ථයෙන් රතන වේ—"රතිං නයති වහති ජනයති වඩ්ඪෙතීති රතනං"—කොස ශබ්දයෙන් ගබ කියත්. අනෙකරත්නගර්භසහස්‍රයන යුසේයි. "අහො" යනු විෂාදයෙහි වැටේ. අහෝ පිරිහිණි සිසේයි—පිතු, පියේ, පිතාමහ, මුතුන්; ආදිශබ්දයෙන් මීමුතුන් ඈ කිවූහු.

**සංවෙගමුපගතො** යන තන්හි සංවෙගනම් භය චලන දෙකයි. භය නම් චිත්තොත්‍රාසයැ චලන නම් ශරීරකම්පායි. භීතද විය චලිතද විය සිසේයි. "විජී—භයචලනයොඃ" යන ධාතුයි. කුම යුතැහ යත්? සංසාරය අනවරාග්‍රය නරකදුඃඛ භයානකය මනුෂ්‍යත්වය දුර්ලභය සෙසුනැන් පුණ්‍යකර්මයට අස්ථානය මාගේ පිතෘපිතාමහාදීහු අනෙකකොටිශතධන සඞ්චය කොට තබා මිය පරලොව යන්නාහු මෙයින් එක් කාර්ෂාපණයක් නොද ගෙන ගියහ වටාගෙන මේ ධන වළඳන්නට නොද එති අහෝ පිරිහුණහ ක්ෂණසම්පත් වැරදවූහයි කරුණායෙන් කම්පිත විය යුසේයි.

ධනසාරං, ධනයාගේ පරිත්‍යාගයෙන් සිඹවන පුණ්‍යසම්භාරය; "ගහෙත්වා ගන්තුං යුත්තං" යනු දනය අනුගාමී නිධානයක් වැන් නෙන් කියත්—නගරෙ භෙරිං චරාපෙත්වා, නුවර බෙර හසුරුවා; තමන්ගේ සම්පත් පරොපකාරහෙතු වනබැවින්.

එයින් කීහ-

"පිබන්ති නද්‍යඃ ස්වයමෙව නාම්භඃ
ඛාදන්ති න ස්වාදුඵලානි වෘක්ෂාඃ
පයොමුචාං න කවචිදස්ති සස්‍යම්
පරොපකාරාය සතාං විභූතිඃ" යි.

තූරියනාද, තූර්‍යඝොෂ නමැති; ගන්ධෙන, සෞරභ්‍යයෙන්; උප ගතං, ආයාතවූ; නරභමරගණං, නරනමැති බමරගණ; රතන මකරන්දපපවාහෙන, රුවන්නමැති මුවරඳවතුරෙන්; දන, දන් නමැති; තුහින, හිමජලයන්ගේ; නිපාතෙනාපි, වැසීයෙනුදු; අකත පරික්ඛයං, නොගෙවෙනලද; රතන, රුවන්නමැති; කමලසණ්ඩං, පියුම්වන; රුවන්රැස් නොහෙවෙනසේ දැක යුසේයි.

**සබ්බස්ස සජනපරිජනස්ස රුදතො** යන තන්හි සජනයෝ නම් බන්ධූන් හා දෘශයහ, පරිජනයෝ නම් මිත්‍රසන් හා අමාත්‍යයෝයි. රුදත්ශබ්ද ශත්‍රුන්තයැ "රුදිර්-අශ්‍රුවිමොචනෙ" යන ධාතුයි—හැම ස්වජනපරිජනයන් කෙරෙහි අදර නොකොට "රුදතඃ ප්‍රාව්‍රාජීත්" යන තන්හි සෙයින් වලප්ව වලප්වා ගියබැවින් **ෂෂ්ඨී චානාදරෙ** යන සූත්‍රයෙන් අනාදරයෙහි ෂෂ්ඨී වේ—දහනපරිගතා, දහන යෙන් පරිගතවූ; 'වනගහනා' යනු හා සබඳ-"දහත්‍යනෙනෙති දහ නම්" යනු වේ ගිනි. "දහ-භස්මීකරණෙ" යන ධාතුයි.

කුඤ්ජරොති කුඤ්ජෙ ගිරිතටෙ රමති අභිරමති තත්ථ වා රමති කුමනාදං නදනෙතා විචරති කුං වා පඨවිං තවාඝාතෙන ජරයතීති කුඤ්ජරො—ගෙහා, ගෙන්; කුම යුතැන යන් ? යම්සේ කුඤ්ජර යෙක් වටා ලැව්ගිනිගත් වනගහනයෙකින් නික්මේද එසෙයින්ම ජරාමරණනමැති දහනයෙන් පරිගත වැ ගෙන් නික්මිණ යුසේයි-කෙතක, දුනුකේ; අසොක, හෝපළු; තිලක, ඇසළ, මුහුළු ස්යත් මේ. චම්පක, සපු; ආදිශබ්දයෙන් අවශිෂ්ටවූ පුෂ්පවෘක්ෂයන් කීහු.

නෙක, නොඑක්; විකච, ප්‍රබුද්ධවූ; කුසුමනිකර, පුෂ්පරාශිය, පරිමල, සෞරභ්‍ය ඇති; තරුසණ්ඩ, වෘක්ෂසමූහයෙන්; මණ්ඩිතං, භූෂිතවූ; "මඩි—භූෂණෙ" යන ධාතුයි--මිග, මෘගසහ; තුරග, අශ්වයන; නාග, හස්තිහ; විහඞ්ග, විගන; ආදිශබ්දයෙන් අවශෙෂ චතුෂ්පදවිශෙෂ කීහු. අපරිමිත, අපරිමාණවූ; චතුප්පදකදම්බක, චතුෂ්පදකදම්බයන්විසින්; අනුසචරිතං, සචාරණය කරනලද;

කුරර, වලිකුළන්, උක්සන් කියත් මේ; චකෝර, ඇටිකුළන්; මයුර, මොනොර; භිංකාර, භිංයන ශබ්ද කරනුයෙන් නම්ලද ලිහිණි සහ; ආදිශබ්දයෙන් අවශිෂ්ටපක්ෂීන් කීහු.

සකුනාන, ශකුනිගණයන්ගේ; අනානා, නොඑක්; කූජිතං, හඬඇති; "කූජ-අව්‍යක්ත ශබ්දෙ" යන ධාතුයි. දෙව, දෙවියන්; දානව, අසුරයන්; සිඬවිජ්ජාධර, සිඬපුරුෂයන් හා විද්‍යාධරපුරුෂ යන්; ආදි ශබ්දයෙන් අවශිෂ්ටවූ භූතයන් කීහු. නානා, නන්; භූත සත, යක්ෂරාක්ෂසාදි භූතශතයන්විසින්; නිසෙවිතං, සෙවුනාලද; මරකත, මරාගල; රජත, රිදීගල; කනක, රන්ගල; ඵළික, පිළිමිණිගල; ආදිශබ්දයෙන් පද්මරාගෙන්ද්‍රනීලාදි අවශිෂ්ටපර්වතයන් කීහු.

විවිධ, අනෙකප්‍රකාරවූ; සිඛරි, පර්වතයන්ගේ; සත, සියෙන්; සමුජ්ජලං, දිලියෙනුවූ; නෙක, නොඑක්; නාක, දෙව්ලොවෙහි; නායක, දෙව්රජ; නිකාය, සමූහයාගේ; කාමිනී, දෙව්බුවන්; ථන, තන නමැති; කලස, කලශයෙන්; ලුලිත, ඇලළෙනලද; වනසර සහස්ස, වනවිල්දහසින්; උපසොභිතං, හොබනාලද; හිමධරණී ධර, හිමවත්පර්වතයනට; ආභරණභූතං, පලඳනාතැන්පත්; සිසිර; සිහිල්වූ; සීකර, පොදපතර ඇති; ආසාර, වෙගවත්වූ; නිජ්ඣර, හැලි; සතසහස්ස, සියදහසින්; රමණීයං, රම්‍යවූ; අනෙකවිධ, නො එක්; රතනාකරං , රුවනට ආකරවූ; සුර, දෙවියනට; කින්නර, කිඳුරනට; නාග, නාමණිවියනට; රඞ්ගමණ්ඩලං, රඟමඬුලුවූ; හිම වනාමජ්ඣාගෙහෙනා, හිමවත්පර්වතපාදයට වැද; කප්පපාදප, කප්රුක්හි; පල්ලව, පලුපත් සෙයින්; පාටල, රත්වූ; පාදතලො, පතුල්ඇතියේ; කමල, මහනෙල්පෙති සෙයින්; කොමළ, මොලොක්වූ; කරො, අතුල් ඇතියේ; මනොසිලාපඞ්ක, රත්කලල් සෙයින්; පිඞ්ගලෙන, රන්වන්වූ; සරීරලාවණ්ණෙන, ශරීරප්‍රභායෙන්; ලිම්පෙන්තා විය, තවරන්නක්හු සෙයින්; වනගහනං, වනලැව්; විකච, උන්මීලිතවූ; නයන; නුවන්හි; අංසුජාලෙන, රශ්මිජාලයෙන්; කුමුද, ඇඹුලුමල්; කුවලය, නිල්මහනෙල්; කමල, රත්මහනෙල් ඇති; සරසහස්ස, විල්දහසෙක්; සඤ්ඡාදිතං, ගැවසිගත්, සරද සමය, සරාකල්හි; සොභං, ශොභාවක්; වනගජ, දඩැතුන්ගේ; මදජලසෙක, මදජලවර්ෂයෙන්; සංවඩ්ඪිත, වඩනලද; විකසිතදුපප, පිපිමලින්; සුරභි, සුගන්ධවූ; පාදපං, වෘක්ෂයන් ඇති; පවාලවණ්ණ වණ්දනං, පබළුවන් සෙවෙනි ඇති; මෙහි වණ්ණශබ්දය පැහැ ඇතියෙහි වැටේ. රජතජ්ජුති, රිදීය පැහැවැනි සෙයින්; සෙත හිතහිං, සුදු හිතහි ඇති; ඉන්දනීලමණි, ඉඳුනිල්මිණියෙහි; කිරණ, රසින්; විරචිතම්ව, තඹුරුකලවන්වූ; රම්ම, අභිරම්‍යවූ; භූමිං, බිම් ඇති; සුළුසසිත, සුශ්ලිෂ්ටවූ; වාතපාන, කවුළු හා; වාරං, දොරඇති; කොසිය, කෞශික නම්ලද සක්දෙව්රජහුවිසින්; දතාජ්‍යං, මිවා

දුත්; වණ්ණ, පැහැයෙන්: සාලිනිං, පළල්වූ; පණ්ණසාලං, පන්ස ලට; බන්ධුජීවක, බදුවද; කුසුමදල, මල්පෙත්තෙහි; දාමසනාහිං, දමක් බඳු; රත්ත, රත්වූ; වාකචීරං, වැහැරි හිරාගෙන ගොතා කරන බැවින් වාකචීර නම්ලද හඳනා සිවුර; අනොජපුප්ඵදාමනිබ්බිසෙසං, කටුකරඬුමල්දමක් බඳු; පුන්නාගපුප්ඵසණ්ඨරසදිසං, දෙඹ මල්ඇතිරයක් බඳු, අජිනදීපිචම්මං, අඳුන්දිවිසම්, තිවඞ්කං, තුන් වකක් ඇති; බාරිකාජං, තවුස්පිරිකරකද; කොමළ, කොමළවූ; අඞ්ගුලි, ඇඟිලිම; දලනිකරෙන, පෙතිපතර ඇති; රත්තුප්පලෙනව, රක්මහනෙල්කලඹක් බඳු; කරතලෙන, අත්ලෙන්; කත්තරදණ්ඩං, කතුරුයට; නළිනයොනිවිමානං, බඹවිමනක් සෙයින්, රමණීයාය, රම්‍යවූ; බ්‍රහ්මලීලාය, මහාබ්‍රහ්මයාගේ ලීලායෙන්-බ්‍රූහිතො තෙහි තෙහි ගුණවිසෙසෙහීති බ්‍රහ්මා, බ්‍රහ්මුනො ලීලා බ්‍රහ්මලීලා—ඊදෘ, සුඛස්පර්ශී වනබැවින් මොලොක්වූ; සිනිඬ, ඛරස්පර්ශී නොවනබැවින් සිනිඳුවූ; මට්ඨ, මටවූ, සමතල; සමතලාවූ; සෙත, සුදුවූ; විප්පකිණ්ණ, අතුරනලද; පුළිනං, වැලිතලාඇති; මහාචඞ්කමං, සැටහත් මහත් සක්මනට; චරණ, පාදතලනමැති; කමලමාලාය, රක්තපද්මපඞ්ක්තීන්; පුළින, වැලි නමැති; ජලතලං, දියපිටු; චංකමිත්වා, ‘‘පඤ්චිමෙ භික්ඛවෙ චංකමෙ ආනිසංසා කතමෙ පඤ්ච අද්ධානක්ඛමො හොති පධානක්ඛමො හොති අප්පාබාධො හොති අප්පමාදෙ හොති අසිත පීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡති චඞ්කමාධිගතො සමාධි චිරට්ඨිතිකො හොති’’යි දක්වනලද පස්අනුසස්ඇති සක්මන් කොට; අමතරසධාරාපරම්පරා, අමෘතරසධාරාපරම්පරායෙන්; අභිසිඤ්චන, පරිෂෙකකරනලද; ගත්තෙනා විය, ගාත්‍ර ඇතියක්හු සෙයින්; සඤ්ජාත පීතිපාමොජ්ජො, සඤ්ජාතප්‍රීතිප්‍රාමොද්‍ය ඇතියේ; විජම්භමානො, බැද; ‘‘ජෘභි-සකාභි-ප්‍රතිබන්ධෙ’’ යන ධාතුයි.

‘‘ඡින්නං මෙ ගිහිබන්ධනං’’ යන තන්හි ‘ගිහිබන්ධන’ නම් කලත්‍රයයි-කීයේ මැ නො ‘‘කලත්‍රලාභමයං නිගලම්’’යි.

‘‘කාමපඞ්කා’’ යන තන්හි කාම පඞ්කාපම කුමට කළහ යත් ? යම්සේ පඞ්කාවතීර්ණයෝ පඞ්කයෙහි නිමග්න වෙද්ද එසෙයින්ම කාමාවතීර්ණයෝ කාමයෙහි නිමග්න වෙත්.

එයින් වදාළහ-

‘‘පඞ්කො ච කාමා පලිපො ච කාමා
මනොහරා දුත්තරා මච්චුධෙය්‍යා
එතස්මිං පඞ්කෙ පලිපෙ ව්‍යසන්නා
හීනත්තරූපා න තරන්ති පාරං’’ යි.

‘‘සංඛිපිතං සංසාරවට්ටං’’ යන තන්හි ‘සංසාර’ නම් නිරුපධිශෙෂනිර්වාණධාතුවින් පිරිනිවීතැන් දක්වා නොසිඳ පවත්නා ස්කන්ධ පරිපාටියයි.

එයින් කීහ-

"ඛන්ධානං පටිපාටි ධාතුආයතනානං ච
අබ්බොච්ඡින්නං වත්තමානා සංසාරොති පවුච්චති" යි.

**නිප්ඵාදිතං නෙක්ඛම්මං** යන තන්හි නෛෂ්ක්‍රම්‍ය නම් සව් අකු ශල ධර්‍මයන්කෙරෙන් නිෂ්ක්‍රාන්ත චෙතනායි—"කරිස්සාමි සමණ ධම්මං" යන තන්හි ශ්‍රමණයන්විසින් පිරියයුතු ශීලාදීහු ශ්‍රමණධර්‍ම නම් වෙත්—"ලභිස්සාමි සමණඵලං" යන තන්හි 'ශ්‍රමණඵල' නම් ජාතිජරාමරණයෙන් පරිමුක්තියයි-"වන දෙවතානං" යන තන්හි දෙවතාශබ්දය දෙවියන් හා දෙව්දූන්කෙරෙහි වැටේ — මනනය නානි විලුම්පනෙනා, මනනුවන් වුලුබුණෝ; අරුණතර, ඉතා රත්වූ; ධාමධාරිනී, ප්‍රභාධරවූ; රංසිමාලින්, සූර්‍ය්‍යා; කමලිනී, විල්වම් යන්; කාමුකෙ, ස්වාමිහු; අත්‍ථමුපයාතෙ, අස්තයට ගියකල්හි; වර මාන, සචරන්වූ; සිඛවනිතා, සිඛාඞ්ගනාවන්ගේ; නූපුරරවානු සාරිනී, නූපුරරවයන් අනුගතව; මිඤ්ජං මඤ්ජං, මඳ මඳ වැ ගෙන; මඤ්ජුකිනී, මුවදෙව් නම් දහනෙලෙහි; හංසෙව, රාජහංසයක්හු සෙයින්, සසිනි, සඳහු; ගගනතලං, අහසට; සමුපගච්ඡති, නැගෙන කල්හි; නිද්දා, නිදි නමැති; රජනිකරකිරණෙන, සඳරැසින්; මුකු ළිත, මුහුළුවූ; නෙත්තා, නුවන් නමැති; පඞ්කජෝ, පද්මයන් ඇතියේ; සමාතිසම්පුඤ්ජනයෙන් යුක්තව නිද්‍රොපගත විය යුසේයි—සරීරදරථං විනොදෙත්වා, කායදරථ සන්හිඳුවා; පච්චුසෙ, අලුයම්හි—පච්ඡිම යාමාවසානං පච්චුසො-නිද්දූපගම, නිද්‍රාවිනොදන නමැති; සහස්ස රංසිනා, හිරුහුවිසින්; විකසිත, පුබුඩවූ; නයන, නුවන් නමැති; අම්බුජො, පද්මයන් ඇතියේ; දෙවියන්විසින් රක්නාලදුව සුවෙන් නිදා සුවෙන් පුබුදී යුසේයි—

වදාළේ මැ නො.

"පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා උපට්ඨිතසතිස්ස සම්පජානස්ස නිද්දං ඔක්කමතො කතමෙ පඤ්ච සුඛං සුපති සුඛං පටිබුජ්ඣති න පාප කං සුපිනං පස්සති දෙවතා රක්ඛන්ති අසුචි න මුච්චති ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආනිසංසා උපට්ඨිතසතිස්ස සම්පජානස්ස නිද්දං ඔක්ක මතො" යි.

සුවර්ණවලය, රන්වලලු; නූපුරාදි, නුරුවළාදීන්ගේ; සංඝට්ටන, ගැහැටීමෙන් නැඟි; ධනි, සඬ හා; සඤ්ජිත, මුසුවූ; මධුර, මියුරුවූ; හසිත, සිනා හා; කම්පිත, තෙපුල්ඇති; ගෙහජනරමණීයං, ගිහි ගෙවැසියන්විසින් රමණීයවූ; සර්‍වාභරණවිභූෂිත නවයෞවන විලාසයෙන් දිළියෙන නාරිසඞ්ඝයන්විසින් රම්‍ය වූයේයැ යුසේයි. උළාර, මහත්වූ; විභව, සම්පත්තීන්; භාසුරං, දිලියෙනුවූ; සුරවර, සක්දෙව් රජහුගේ; භවනාකාරං, විමන් බඳු; අගාරං, ගේ: පරිච්ච ජිත්වා, තෘෂ්ණාදයිනාව හා සමග පරිත්‍යාග නොට,

කීනු මැ තො-

ත්‍යාගාත්තෘෂ්ණධර්මං-පරිචිතමවිචින්ත්‍ය සම්පදං විහමෙ
තෘෂ්ණදයිතා න මයා-සහ මුන්වනමීහතෙ ගන්තුම්'' යි.

තපොවනං, ක්ලෙශසන්තාපනයට කාරණවූ වනයට; ධඤ්ඤවිකතිං, ධාන්‍යවිකෘතිය, ධාන්‍යයෙන් නිර්මිත භොජනයෑ යුෂේයි. පවත්තඵලභොජනො, ප්‍රවෘත්තවූ තුවැටියෙන් ගිළී ඕම්හි වගුළ ඵලයක් භොජන කොට ඇත්තේ; විතිනාමෙති, අප්‍රමත්ත වතාබැවින් චතුර්විධ සම්‍යක්ප්‍රධානයෙන් යුක්තවෑ දවස් යවයි සේයි.

වදූළේ මැ තො-

“නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ අප්පමාදො” යි.

අන්ධකාරො විය මොහො මොහන්ධකාරො, තං භින්දතීති මොහන්ධකාරභිදුරො, දීපො විය ධම්මො ධම්මදීපො, තං කරොතීති ධම්මදීපංකරො, සකලලොකස්ස සං සුඛං කරොතීති සකලලොකසඞ්කරො, නත්ථි එතස්ස උත්තරොති අනුත්තරො, සම්මා සාමඤ්ච සබ්බධම්මානං බුද්ධත්තා සම්මාසම්බුද්ධො—සුදෙවරාජකුලෙ, සුදෙව් නම් රජහුගේ කුලයෙහි; ඝනරාජිතො, මෙඝරාජීන්; සීහනාදං නදිත්වා, දිග්විලොකනය කොට උතුරුදික් අභිමුඛ කොට සප්තපදව්‍යතිහාරාවසානයෙහි සිංහනාද කොට; හංසාකොඤ්චාමයූරාභිධානෙසු, වැඩෑ වියපත්කල්හි හංසානම් කොඤ්චානම් මයූරානම් අභිධාන ඇති; උසභක්ඛන්ධාභිධානෙ, වෘෂභස්කන්ධාභිධාන ඇති; ජරාජිණ්ණ, යෞවනමදප්‍රත්පක්ෂවූ ජරාජීර්ණරූපද; ව්‍යාධි, ආරොග්‍යමදප්‍රතිපක්ෂවූ ව්‍යාධිරූපද; මත, ජීවිතමදප්‍රතිපක්ෂවූ මෘතරූපද; පබ්බජිතෙ, සර්වදුඃඛක්ෂයකාරණවූ ප්‍රව්‍රජිතරූපද; දිස්වා, දෙවියන්විසින් නිර්මිතවූ ත්‍රිමදප්‍රතිපක්ෂ චතුර්විධරූප දැක.

**අගාරමජ්ඣාවසිත්වා** යන තන්හි, “අගාරං” යනු **උපාන්වධ්‍යාඞ්වසඃ**” * යන සූත්‍රයෙන් විතීයායි.

චතුරාසීතිසහස්ස, සුවාසූදහසක්; කරිවර, ගජොත්තමයන්; ආරොහකෙන, නැගී; රාජලොකෙන, රාජපරිජනයාවිසින්; සුනන්දාජීවිකොපනීත, සුනන්ද නම් ආජීවිකයකුවිසින් එළවනලද; පිප්ඵලිරුක්ඛ, පුල්ලිරුක්; චතූහි ඛීණාසවසතසහස්සෙහි, ක්ෂීණවූ ආශ්‍රව ඇතියන් සතරලක්ෂයක් දෙනාවිසින්; ලීහි අග්ගසාවිකාහි සමධිගතසාසනො, දෙඅගසෑහැවියන්විසින් අවගමනය කරනලද ප්‍රතිවෙධශාසන ඇතියේ—ධම්මකථාති එත්ථ කථෙතබ්බස්ස සංවරාදිනො අත්ථස්ස කථනං වචනපටිබද්ධකරණං කථා, ධම්මස්ස කථා

* පාණිනි 1. 4. 48.

ධම්මකථා — විහරති, “එකපුග්ගලො භික්ඛවෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං කතමො එකපුග්ගලො තථාගතො අරහං සම්මාසම්බුද්ධො” යි වදාළබැවින් දිව්‍යමනුෂ්‍යයනට අපරිමිතසුඛ සාධමින් වෙසේ යූසේයි; තපොධනො, තපසම ධන කොට ඇති; උදිතෙ, උද්ගතකල්හි; භුවනසෙඛරෙ, මුළුලොවට කඩාමල්කඩක් බඳුවූ; උදයාචල, උදයගලට; චූළාමණීභූතෙ, සිළුමිණිතත්පත්; අරුණ, අරුණ නම්ලද; තරුණරංසි, තරුණ රශ්මි කලාපය; පුරස්සරෙ, පෙරටුවචුනු ඇති; විරොචනෙ, හිරුනු; නීලම්බරෙ, අභිනීල ගගනතලයෙහි; පීරතරවිජ්ජුලීලාය, තහවුරු විදුලියහව්යෙක්න්.

**සුදස්සනමහාවීථිං යන තන්හි සුදසුන්මහවේ නම් කවර යත් ?**

ගේ පළල සැට යොජන, දිග දහසක් යොජන, තන්හි තන්හි රන්තොරණ රිදීතොරණ වෙරළු මරා පබළු ඉඳුනිල්මිණිතොරණ, බිම සත්රුවන් වැල්ල, දෙපස්හි සත්රුවන් පහපෙළ, සියහ සත් රුවන්රස්කඳඹෙන් දිලියෙයි, තව්තිසාවැසි දෙවියන් සැණ කෙළිනා රඟබිම්—චක්කවත්තිනරපති, සක්විතිරජක්හුගේ; සවනපාස, කන්වැලින්; පරිගළිත, ගුළු; රතනකුණ්ඩලම්ව, රතනකුණ්ඩලයක් මෙන්; භගවතො ගමනං, පින්වත්හුගේ රඹගම්නුවර ගමනට; මඞ්ගලපටහෙනෙව, මඞ්ගලපටහයක්හු බඳු; සරෙන, මිහුරු ගැඹුරු හඬින්; පීති, පඤ්චප්‍රකාර ප්‍රීතීන්; පරිපුණ්ණකායො, පරිපූර්ණවූ ශරීර ඇතියේ; අහො, හහා; දුල්ලභුප්පත්ති, “එකපුග්ගලස්ස භික්ඛවෙ පාතුභාවො දුල්ලභො ලොකස්මිං කතමස්ස එකපුග්ගලස්ස තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස”යි වදාළබැවින් දුර්ලභවූ උත්පත්තිඇති; සන්තුත්තනාමස්ස, සන්තොෂිතනාමයාගේ.

**සග්ගාපවග්ගමග්ගං** යන තන්හි සග්ගීනම් සුන්දරස්ථානයි. “ෂංජ-ගතසථානයොඃ” යන ධාතුයි, සඥතන වනබැවින් අගී වෙයි, සුපූර්වනබැවින් සවගී වේ—අථ වා රූපාදීහි විසයෙහි සුඹු අගොාති සග්ගො, අපවග්ගො නිබ්බානං—තිකුජ, මහොසයෙන්; ගම්භීරං, ගැඹුරුවූ; සිසිර, සිහිල්වූ; නීර, දියෙන්; පූරිතං, පරිපූර්ණවූ—කං වුච්චති උදකං තෙන දාරිතං කන්දරං, තදෙව අන්තරං කන්දරන්තරං—මේ අන්තරශබ්දය මය්‍යාදායෙහි වැටේ. සුර, දෙවියනට; නන්දන, සොම්නස් ජනවනලද; නන්දනෙ, නඳුන්වනඋයන්හි.

එයින් කීහ—

“න තෙ සුඛං පජානන්ති යෙ න පස්සන්ති නන්දනං” යි.

පාරිජාත, පරසතු; විවිධරාග, නොඑක්පැහැ ඇති; නව, අලුත පිපි; නළින, මහනෙල්මල්හි; දල, පෙති සෙයින්; කොම්ලෙන, මොලොක්වූ.

**ලොකනාථං** යන තන්හි නාථශබ්දය සතර අර්ථයෙක්හි වැටේ යාච්ඤාය උපතාපය ඓශ්වර්‍ය්‍යය ආශිසයයි. එහි යාච්ඤායෙන් ලොකයා අසජ තමා මැවූ නිවන්පුර ගෙන වදනාබැවින් ලොකනාථ වෙයි, උපතාපයෙහි ලොකයා යසපමණින් පෙළමින් එන කෙලෙස් සතුරනට සන්තාප කරනබැවින් ලොකනාථ වෙයි, ඓශ්වර්‍ය්‍යයෙහි තමා බෝමැඩ රුවන්ආකරයෙන් ලද දහම් රුවන් ගෙන ලොකයෙහි ඉසුරු කරනබැවින් ලොකනාථ වෙයි, ආශිසයෙහි ලොකයා ශ්‍රද්ධාදිගුණධර්‍මයෙන් කෙසේ වසති හොයි ප්‍රාර්ථනා කරනබැවින් ලොකනාථ වෙයි—ලක්ඛණ, ද්වාත්‍රිංශන්මහාපුරුෂලක්‍ෂණයෙන්; අනුබ්‍යඤ්ජන, අශීත්‍යනුව්‍යඤ්ජනයෙන්; පභා, ව්‍යාමප්‍රභායෙන්; සමුපෙතං, පරිපූර්ණවූ.

**දෙවමනුස්සෙ** යන තන්හි දෙවියෝ ත්‍රිවිධ වෙත් උත්පත්තිදෙවයහ විශුද්ධිදෙවයහ සංවෘතිදෙවයහයි. එහි උත්පත්තිදෙවයෝ නම් චාතුර්මහාරාජිකාදීහුය, විශුද්ධිදෙවයෝ නම් ක්‍ෂීණාශ්‍රවයහ, සංවෘතිදෙවයෝ නම් රාජාදීහුයි, මොවුන්කෙරෙහි උත්පත්තිදෙවයෝ දිව්‍යවූ පඤ්චකාමගුණයෙන් ක්‍රීඩා කරන්නෙනුදු ප්‍රතිපක්‍ෂවිජය කරන්නට ඉච්ඡා ඇත්තෙනුදු ලොකයහට යුක්තායුක්තව්‍යවහාර කරන්නෙනුදු පරමවූ ශරීරද්‍යුතීන් දිලියෙන්නෙනුදු තද්භාවාර්පිත්විසින් ස්තුති කරන්නෙනුදු ඊප්සිතස්ථානයට අප්‍රතිහතගතීන් යන්නෙනුදු දෙව නම් වෙත්. "දිවු – ක්‍රීඩාවිජිගීෂාව්‍යවහාරද්‍යුතිස්තුතිගතිෂු" යන ධාතුයි—විශුද්ධිදෙවයෝ පරමවූ ධ්‍යානක්‍රීඩායෙනුදු ප්‍රතිපක්‍ෂවිජය කරන්නට ඉච්ඡා ඇත්තෙනුදු පරමසූක්‍ෂ්මවූ ඥානවිශෙෂවිෂයවූ අභිව්‍යවහාර කරන්නෙනුදු සර්වක්ලෙශකල්මෂාපගමයෙන් විශුද්ධවූ ඥානද්‍යුතීන් දිලියෙන්නෙනුදු විඥතස්වභාවයන් විසින් පරමනිර්මලගුණවිශෙෂයොගයෙන් ස්තුති කරන්නෙනුදු අච්‍යුත මහානිර්වාණයට අප්‍රත්‍යාගමනගතීන් යන්නෙනුදු දෙව නම් වෙත්, සංවෘතිදෙවයෝ ස්වවිෂයෙහි යථාසම්භව ක්‍රීඩාදි ඓශ්වර්‍ය්‍ය කරන්නෙන් දෙව නම් වෙත්, මනුෂ්‍යයෝ මනස උත්සන්න වන බැවින් මනුෂ්‍ය නම් වෙත්, ජම්බුද්වීපවාසීහු ශූරභාවයෙනුදු ස්මෘතිසම්පන්න වනබැවිනුදු බ්‍රහ්මචර්‍ය්‍යාවට යොග්‍යවනබැවිනුදු ගුණයෙන් මනස් උත්සන්න වනබැවිනුදු මනුෂ්‍ය වෙත්.

එයින් වදාළහ-

"තීහි භික්ඛවෙ ඨානෙහි ජම්බුදීපකා මනුස්සා උත්තරකුරුකෙ ච මනුස්සෙ අධිගණ්හන්ති දෙවෙ ච තාවතිංසෙ කතමෙහි තීහි සූරා සතිමන්තො ඉධ බ්‍රහ්මචරියවාසෙ" යි. ජම්බුද්වීපවාසීන් හා සමවන බැවින් පරිත්තද්වීපවාසීන් හා සමග ඉතර මහාද්වීපවාසීහුදු මනුෂ්‍ය වෙත් නොහොත් චතුර්ද්වීපවාසීහුම අපායමාර්ගයට පමුණුවන ලොභාදීන්විසින් මෙන් ස්වර්ගාපවර්ගයට පමුණුවන අලොභාදීන්විසිනුදු

මනස් උත්සන්න වනබැවිනුදු මනුෂ්‍ය වෙත්. නොහොත් මනු ශබ්ද යෙන් අපත්‍යාර්ථයෙන් "**මනොර්ජාතො ෂග් ෂුක් ච**" * යන සූත්‍ර යෙන් යත්ප්‍රත්‍යය හා ෂුගාගම කළ මනුෂ්‍ය වෙත් මෙ-පරම, උත්කර්ෂ ප්‍රාප්තවූ; පීතිපසාද, ප්‍රීතිප්‍රසාදයෙන්; ආපූර්ණ හදයො, පරිපූර්ණවූ හෘදය ඇතියේ; වටුමෙ, මහ-**සුගතොති** සොභනගමනත්තා සුන්දරං ගතත්තා සම්මා ගතත්තා සම්මා ච ගදත්තා සුගතො—මෙහි 'සොභනගමනත්තා' යන තන්හි ශොභනවූ කායගති හා ඥාන ගති ඇතිවනබැවින් සුගත වෙයි, 'සුන්දරං ගතත්තා' යන තන්හි සුන්දරස්ථානයට නිර්වාණයට ගනවනබැවින් සුගත වෙයි, 'සම්මා ගතත්තා' යන තන්හි ව්‍යාකරණයෙහි පටන් ගෙන බොධිපර්‍ය්‍යඞ්ක දක්වා සමත්‍රිංශත්පාරමිතා පූරමින් සකලලොකයහට හිත සුඛ සාධමින් ශාශ්වතොච්ඡෙදාන්තයට නොඑළඹ ගනවනබැවින් සුගත වෙයි, 'සම්මා ච ගදත්තා' යන තන්හි යුක්තස්ථානයෙහි යුක්ත කොට ගදනය කරනහෙයින් සුගත වේ, "ගද-ව්‍යක්තායාං වාචි" යන ධාතුයි. මෙහිරුක්ත්කවියින් දකාරයට තකාරයි—උපඵුල්ල, පිපි; කමල, මහනෙල්බඳු; ලොචනස්ස, ඇස් ඇතියහට; පකතිනිම්මලො, ප්‍රකෘතීන් නිර්මලවූයේ—**ෂහ සාවකෙහීති** එහි සුණන්ති සාවකා—ශ්‍රවණය කොට සෙස්සන් සේ නිවෘත්ත නොවැ ධර්මානුධර්මප්‍රතිපත්තිප්‍රවෘත්ත වැ මාර්ගඵලප්‍රාප්තයෝ ශ්‍රාවකයෝ නම් වෙති යුසේයි. කනකඵලක, රන්පුවරු ඇති; සෙතුං විය, හෙයක් සෙයින්; විකච, විලිකුත්; නයන, නුවන්ම; කුවලයවන, නිල්මහනෙල් වනයෙක හොයි යන; කුතූහල, කුහුලින්; ආකුල, ඇලඑණු; අළිකුල, බමරකුලත්හා; නිබ්බිසෙස, නිර්විශෙෂවූ; නීල, නිල්; කුටිල, බබුරු; කෙසෙ, කෙශයන්; ජටා, දළම්ඩුලු; අජින, අඳුන්දිවිසම්; වාකචීරානි, වල්කලාවන්; බහුවිධ, බහුප්‍රකාරවූ; සරභස, රභසසහිතවූ; දරුණුවූයේය සීසේයි. කිලෙස, ලොභවෙෂාදි කෙලශ නමැති; මකරගණ, මුවර ගණයහට; ආලයස්ස, නිවෙසනවූ; අනෙකමුඛ, නොයෙක් දොරින්; උපගත, අවුදු වදනා; සකල, සියලු; විපුල, බොහෝවූ; දුක්ඛ, දුක්නමැති; සලිලොඝ, දියවතුරෙන්; පූර්ණස්ස, පරිපූර්ණවූ, අනන්තපාරස්ස, පරතෙරනැති; සංසාරසාගරස්ස, සසර ජලනිධියට; සෙතුභූතො, හෙයක් බඳුවූයේ; සමපන්නාභිනීහාරො,

"මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති හෙතු සත්ථාරදස්සනං
පබ්බජ්ජා ගුණසම්පත්ති අධිකාරො ච ඡන්දතා"

යන අෂ්ටධර්මයෙන් පරිපූර්ණ වැ 'බුද්ධො බොධෙය්‍යං' යනාදි විසින් බුද්ධත්වවිෂයෙහි කොට පවත්නාලද චිත්තාභිනීහාර ඇතියේ; විබුද්ධ, පුබුද්ධවූ; පුණ්ඩරීක, පදම්යන් බඳු; ලොචනානි, නයනයුගලයන්; විජිත, දිනනලද; කුසුමායුධසඞ්ගාමස්ස, මාරසඞ්ග්‍රාම ඇතියහුගේ; පඤ්ඤා, ප්‍රඥනමැති; කඤ්ඤාය, පර්චිත කන්‍යාවවිසින්—

* චාන්ද්‍රසූත්‍රයි.

“සත්නුනාහං” යන තන්හි ‘නූන’ යනු පරිවිතර්කයෙහි වැටේ. ‘එවංමනො’ යන අර්ථයි. අනෙකාදීනවං, අනෙක ආදීනව ඇති; පරම සුඛං, උතුම් සුව ඇති—එයින් වදාළහ ‘නිබ්බානං පරමං සුඛං” යි. කරුණා, කුළුණුනමැති; තරුණියා, අභිනවයුවතියවිසින්; පණීතා මතපටිවෙධො, ප්‍රණීතවූ අමෘතයාගේ ප්‍රතිවෙධය—එනම් අමතං වුච්චති නිබ්බානං තං හි අජාතත්තා න ජීයති න මීයති තස්මා අමතන්ති වුච්චති—ඝනතරතිමිරගබ්භ, බහලවූ අන්ධකාර ඇති ගර්භයට; මාදිසෙ, මබඳු; සති, ස්මෘතිසම්පන්නවූ; මති, ප්‍රඥාසම්පන්නවූ; සුති, ශ්‍රැතිසම්පන්නවූ; ධිති, ධෛර්ය්‍යසම්පන්නවූ; සමාධිසම්පන්නෙන, සමාහිතචෙතසින් පරිපූර්ණවූ; වීරපුරිසෙ, පරාක්‍රමඇති පුරුෂයා; එකාකිනි, එකලා වැ; සංසාරජලනිධිනිමුග්ගං, සංසාරසාගරයෙහි නිමග්නවූ; සත්තකායං, සත්වරාශිය; පහාය, පියා; නිබ්බානථලං, නිර්වාණ නමැති ස්ථලයට; අභිරූළ්හෙ, ආරූඪවූකලැ; කො හි නාම අඤ්ඤො, අනික් කවරෙක් නම්; භවාභවෙසු, කුදුමහත්භවයෙහි; විපරිවත්තමානස්ස, පෙරළෙනලද; අසරණීභූතස්ස, අනික් සරණක් නැති; ලොකස්ස, සත්වලොකයහට; සංසාරකන්තාරා, සංසාරකාන්තාරයෙන්; නරාසභො, සභොතනම; සීහපඤ්ජරං, සීමැදුර; පබවණ්ණපසාදසම්පන්නානි, පබවර්ණවූ ප්‍රසාදයෙන් පහන් පැහැයෙන් පරිපූර්ණවූ—මෙහි සම්පන්නශබ්ද පරිපූර්ණතායෙහි වැටේ—අනාගතංසඤ්ඤාණෙන, අනාගතාංශඥානයෙන්; මත්ත, මධුයෙන් මත්; කරවීක, කුරවීකෙවිල්ලන්ගේ; රුද, හඬ සුදුසු; මඤ්ජු, මියුරුවූ; ඝොසං, හඬ—“සකලලොකධාතුසු” යන තන්හි සකලශබ්ද නිරවශෙෂතාවාචකයි. අනන්තාපරිමාණ ලොකධාතූහැ යූසෙයි—විධංසිත, විධමනලද; තමො, අඳුරුඇති; ශරීරරශ්මීන් ලොකාන්ධකාර විධමයි දෙශනාරශ්මීන් ක්ලෙශාන්ධකාර විධමයි යූසෙයි—මහාපධානං පදහිත්වා, මහත් වීර්ය්‍ය කොට; අස්සත්ථස්ස මූලෙ, ඇසතුරුක්මුල්හි; බ්‍රහ්ම, බඹහ; සුර, දෙවියහ; නර, මිනිස්හ; උරග, නාරජහ; ආදිශබ්දයෙන් ගරුඩ ගන්ධර්ව කින්නර යක්ෂ රාක්ෂසයන් කීහ—කුසුම, මල්; අම්බර උතුරුසළු; ආභරණ, පලඳනා; සෙඛර, කඩාමල්කඩ; සමධිගතාභිනීහාරො, සමධිගත අභිනීහාර ඇති.

**බුද්ධකාරකධම්මෙ** යන තන්හි බුදුකුරු ධර්මයෝ නම් දශපාරමිතාවෝයි. ඔහු තෘෂ්ණාමානාදීන් අනනුගතවූ කරුණෝපාය කෞශලපරිගෘහීතවූ දානාදිගුණයෝයි.

**දානපාරමිං** යන තන්හි කරුණෝපායකෞශලපරිගෘහීත ආත්මොපකරණ පරිත්‍යාග කරන චෙතනා දානපාරමිය-නික්කුජ්ජිත, අධොමුඛීකෘතවූ; සල්ලකුම්භං විය, උදකඝටයක් සේ; පීතිවිකසිත මුඛො, ප්‍රීතීන් ප්‍රබුද්ධ මුඛපද්ම ඇතියෙහි.

කරුණාපුරස්සරන්ති එත්ථ කිරතීති කරුණා කිණාතීති කරුණා කම්පනං කරොතීති කරුණා කං රුන්ධතීති කරුණා.

මෙහි 'කිරති' යන තන්හි "කෲ-වික්‍ෂෙපෙ" යන ධාතුයැ පරදුඃඛක්‍ෂෙප කෙරෙයි යන අර්‍ථයි. "කිණති" යන තන්හි "කෲඤ්-හිංසායාම්" යන ධාතුයැ පරදුඃඛයක් ඇතිකලැ කාරුණිකයනට හිංසනවිධානය කෙරෙයි යන අර්‍ථයි. "කම්පනං කරොති" යන තන්හි "ඩු කෘඤ්-කරණෙ" යන ධාතුයැ පරදුඃඛයක් ඇතිකලැ සාධුනට හෘදයකම්පා කෙරෙයි යන අර්‍ථයි. "කං රුඤ්ති" යන තන්හි 'කම්' යනු සුඛවාචකයැ "රුධිර්-ආවරණෙ" යන ධාතුයැ ආත්මසුඛනිරපෙක්‍ෂතායෙන් කාරුණිකයනට සියලු සුඛාවරොධ කෙරෙයි යන අර්‍ථයි.

**සීලපාරමිං** යන තන්හි කරුණෝපායකෞශලපරිගෘහීතවූ කායවාක්සුචරිතද අකර්ත්තව්‍යවිරතිකර්ත්තව්‍යකරණචෙතනාදු සීලපාරමිය—චමරි විය, සෙමෙරක මෙන් සෙයින්; වාලපාලිකා, වල් රක්නා.

**නෙක්ඛම්මපාරමිං** යන තන්හි කරුණෝපායකෞශලපරිගෘහීතවූ ආදීනවදර්‍ශනපූර්‍වඞ්ගමවූ කාමයෙන් භවයෙන් නිෂ්ක්‍රමණවිතෙනොත්පාදය නෛෂ්ක්‍රම්‍යපාරමිතායැ—අනවරත, නිරන්තරයෙන්; අරති, උත්කණ්ඨා; බහුල, බලවත්වූ; බන්ධනාගාරෙ විය, දඟගෙයක සෙයින්.

**සබ්බභවෙ අනභිරම්ඣා** යන තැන්හි කාමභව ක්‍ෂොභකර වූවද රූපභව අරූපභව ශාන්තනොවනබැවින් අනතික්‍රාන්ත ජරාමරණයි එයින් රතිහෙතු නොවෙයි.

**පඤ්ඤාපාරමිං** යන තන්හි කරුණෝපායකෞශලපරිගෘහීතවූ ධර්‍මයන්ගේ සාමාන්‍යවිශෙෂලක්‍ෂණාවබොධ ප්‍රඥාපාරමිය—පිණ්ඩගවෙසකො, අහර පිරියස්නා; සපදානචාරිකො, සපදන්සැරි; භික්ඛු විය, මහණක්හු සෙයින්.

භික්ඛූති එත්ථ භික්ඛකොති භික්ඛු භික්ඛාචරියං අජ්ඣුපගතොති භික්ඛූති ආදිනා නයෙන වචනත්ථො වෙදිතබ්බො.

උත්තමමජ්ඣිමාධමෙ, තමහට උත්තමවූ තමා හා සමවූ තමහට අධමවූ; මෙධාවිනො, නුවණැතියන්—කුසලාකුසලාදිපටිපදං පුච්ඡන්තො, "කිම්භන්තෙ කුසලං කිං අකුසලං කිං සාවජ්ජං කිං අනවජ්ජං කිං සෙවිතබ්බං කිං න සෙවිතබ්බං කිම්මෙ කයිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය අස්ස කිං වා පන මෙ කයිරමානං දීඝරත්තං හිතාය සුඛාය අස්ස" යි කුසල් අකුසල්ඈ පිළිවෙත් පුළුවුස්නේ.

**විරියපාරමිං** යන තන්හි කරුණෝපායකෞශලපරිගෘහීතවූ කායචිත්තයෙන් පරහිතාරම්භය වීය්‍ර්‍යපාරමිය — ඨානගමනාසනසයනෙසු, සඨානගමනශයනාසනලක්‍ෂණ සතර ඉය්‍ර්‍යාපථයෙහි;

සමාන, එකාකාරයෙන් පවත්නා; දළ්හවිරියො, දෘඪවීර්‍ය ඇත්තේ; සම්පපවත්ත, එකාකාරයෙන් පවත්නා; සම්මප්පධානවිරියො හුත්වා, සතර සම්‍යක්ප්‍රධානලක්‍ෂණ වීර්‍ය ඇති වැ.

**ඛන්තිපාරමිං** යන තන්හි කරුණොපායකෞශලපරිගෘහීතවූ සත්ත්ව සංස්කාරාපරාධසහනඅද්වෙෂප්‍රධානවූ තදාකාරප්‍රවෘත්ත චිත්තොත්පාදය ක්‍ෂාන්තිපාරමිය-සුචි, ගන්ධමාලාදීන්ගේ හා; අසුචි, මූත්‍ර පුරීෂාදීන්ගේ; නික්ඛෙප, ප්‍රක්‍ෂෙපයෙහි; ඛමා, ක්‍ෂාන්ති ඇති; මෙදිනී විය, පෘථිවිය සෙයින්; හිතාහිතසත්ත, ඉෂ්ටානිෂ්ට සත්ත්වයන්විසින්; දස්සිත, දක්වනලද; සම්මාන, බහුමානයෙහිද; අවමාන, අවඥයෙහිද; ඛමො හුත්වා, තිතික්‍ෂා ඇති වැ.

**සච්චපාරමිං** යන තන්හි කරුණොපායකෞශලපරිගෘහීතවූ විරතිචෙතනාදිභෙදවූ අවිසංවාද සත්‍යපාරමිය-හිමගිමහාදි, හිමවත් ගිමන්අෑ; සබ්බසමයෙසු, සර්වකාලයෙහි; ඔසධී විය, දවහත්තරුව සෙයින්; අසනිසතපාතෙපි, අශනිසතයන්ගේ පතන ඇතිවූ කල්හිදු.

**අධිට්ඨානපාරමිං** යන තන්හි කරුණොපායකෞශලපරිගෘහී අචලසමාදානාධිෂ්ඨානය තදාකාරප්‍රවෘත්තචිත්තොත්පාදය අධිෂ්ඨාන පාරමිය—සබ්බදිසාභාගොපගතෙහි, සර්වදිශාභාගයෙන් උපගතවූ; අචලො සුප්පතිට්ඨිතපබ්බතො විය, අචලවූ සුප්‍රතිෂ්ඨිතපර්වතයක් සෙයින්; අත්තාධිට්ඨානෙ, ආත්මාධිෂ්ඨානයෙහි.

**මෙත්තාපාරමිං** යන තන්හි කරුණොපායකෞශලපරිගෘහීතවූ ලොකයහට හිතසුඛොපසංහාරය අව්‍යාපාදය මෛත්‍රීපාරමිය— කල්‍යාණපාපජනස්ස, පිනැත්තනටද පවැත්තනවද; සම, උන ඉතිරි නොකොට; උතුසම්පදායකං, සෘතු දෙන.

**උපෙක්ඛාපාරමිං** යන තන්හි කරුණොපායකෞශලපරිගෘහීතවූ අනුනයප්‍රතිඝවිධ්වංසනීයවූ ඉෂ්ටානිෂ්ට සත්ත්වසංස්කාරයන්කෙරෙහි සමප්‍රවෘත්ති ඇති උපෙක්‍ෂාපාරමිය-සකලහිතාහිතසත්තානං, සියලු හිතාහිත සත්ත්වයනට; විප්පහීනානුනයප්පටිඝො, ප්‍රහීණකරනලද අනුනයප්‍රතිඝ ඇති.

**දසපාරමියො** යන තන්හි මේ දශධර්මයන් පාරමී නම්වූපරිදි කිසේද යත් ? දානශීලාදිගුණවිශෙෂයොගයෙන් සත්ත්වොත්තම වන බැවින් පරමයහ මහාබොධිසත්ත්වයෝ, ඔවුන් අයති වනබැවින් ඔවුන්ගේ භාව හෝ කර්ම හෝ පාරමී වේ, දානාදික්‍රියායි—එසින් වදාළහ—“දානසීලාදිගුණවිසෙසයොගෙන සත්තුත්තමතාය පරමා මහාසත්තා බොධිසත්තා, තෙසං භාවො කම්මං වා පාරමී දානාදික්‍රියා” යි.

සභාවසරසතො විචිනිත්වා, ලක්‍ෂණරසාදිවිසින් නිශ්චය කොට; ඉතො, මේ දශපාරමිතාවන්කෙරෙන්; උද්ධං, උත්තරයෙහි; තියද්ධගතො අඤ්ඤො බුද්ධකාරකධම්මො නාම නත්ථි, භූතභවිෂ්‍යවර්ත්තමාන ලක්‍ෂණ අද්ධත්‍රයවර්ත්තිවූ අනික් බුද්ධකාරකධර්මකෙනෙක් නම් නැති.

එයින් වදාළහ-

“දසතො පාරමී නත්ථි දසතො නත්ථි ඌනකා
අනූනා අනධිකා සබ්බා පූරිතා දසපාරමී” යි.

මේ දශපාරමිතාවෝ ‘ධර්ම’නම් කුමට වූහ යත් ? මහාපුරුෂයන් විසින් රතන සේ ධරනලද්දෙන් ධර්මනම් වෙත්—එයින් කීහ. “බුද්ධප්‍රත්‍යෙකබුද්ධශ්‍රාවකෛඃ සත්පුරුෂෛ රත්නවද්ධ්‍රියත ඉතිධර්මඃ” යි.

**අඞ්ගපරිච්චාගො පාරමී** යන තන්හි අඞ්ගපරිත්‍යාගය පාරමීය, අඞ්ගපරිත්‍යාගයට අධමවූ බාහ්‍යවස්තුපරිත්‍යාගය උපපාරමීය, අඞ්ගපරිත්‍යාගයට අධිකවූ ජීවිතපරිත්‍යාගය පරමාර්ථපාරමීය. එසේ වූව උපපාරමිතා ආදිකොට කුමට නොදක්වූහ යත් ? “නගරස්ස සමීපං උපනගරං” යන තන්හි සෙයින් පාරමීසමීපය උපපාරමීයි. පාරමී ඇතිකලැ උපපාරමී නම් දෙයක් ඇතිවූවමනාවිසින් පාරමී ආදි වෙයි උපපාරමී මධ්‍ය වෙයි පරමාර්ථපාරමී උත්තර වේ. වස්තු විසින් වූකලැ උපපාරමී ආදි වෙයි පාරමී මධ්‍ය වෙයි පරමාර්ථපාරමී උත්තර වෙයි. කිසේය යත් ? බාහ්‍යවස්තුපරිත්‍යාග කළවුන් මැ අඞ්ගපරිත්‍යාග කරන්නට නිසිවනබැවින් උපපාරමී ආදි වෙයි පාරමී මධ්‍ය වෙයි. අඞ්ගපරිත්‍යාග කළවුන් මැ ජීවිතපරිත්‍යාග කරන්නට නිසිවනබැවින් පරමාර්ථපාරමී උත්තර වේ.

**අනුලොමපටිලොමාදිනයවණ්ණනා** යන තන්හි මෙහි දක්වන අනුලොමනයයැ ප්‍රතිලොමනයයැ ආදිශබ්දයෙන් ගත් උභතොවර්ත්තනනයයැ මධ්‍යසංක්‍ෂෙපනයයැ ගතප්‍රත්‍යාගතනයයැ යන පඤ්චවිධන යයි. මෙහි දශපාරමිතාවන් ආදිය පටන්ගෙන අන්ත දක්වා ලක්‍ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථානවිසින් සම්මර්ශනා කරනු ‘අනුලොමනය’ නම් වෙයි. අන්තයෙහි පටන්ගෙන ආදිය දක්වා සම්මර්ශනා කරනු ‘ප්‍රතිලොමනය’ නම් වෙයි. මධ්‍යයෙහි පටන්ගෙන ආද්‍යන්ත දෙකෙළවර දක්වා සම්මර්ශනා කරනු ‘උභතොවර්ත්තනනය’ නම් වෙයි. ආද්‍යන්ත දෙකෙළවර පටන්ගෙන මධ්‍ය දක්වා සම්මර්ශනා කරනු ‘මධ්‍යසංක්‍ෂෙපනය’ නම් වෙයි. පළමුවන පාරමිතා සිම්ද දෙවෙනි පාරමිතාවට ගොස් එසිදු සම්මර්ශනා කොට පළමුවන පාරමිතාවට බැස මේ ක්‍රමයෙන් දසවන පාරමිතා දක්වා බැස බැස සම්මර්ශනා කරනු ‘ගතප්‍රත්‍යාගතනය’ නම් වෙයි. මෙසේ පඤ්චමහානයවිසින් මහාපුරුෂයා පාරමිතා සම්මර්ශනා කළපරිදි දක්වන්නට කීහ “අනුලොමපටිලොමාදිනයවසෙන පාරමියො සම්මසිත්වා” යි.

මත්තදන්තී, මත්තහස්තියක්හුවිසින්; අක්ඛන්තා, ආක්‍රාන්තාවූ; නළකලාපං විය, රනහුණදඬුකලඹක් සෙයින්; උදකාවත්තී, දිය පොළොව්; කුලාලචක්කං විය, කුඹල්සකක් සෙයින්; 'සුරාසුර' යනු උපලක්ෂණ වනබැවින් ගරුඬොරගාදීන් සඞ්ග්‍රහකරනු. මකුට, වොටුන්නෙහි; මණි, කිරුළුමිණ් නැමැත්; සිලාසන, සලඅස්නෙහි; දුලූලලිත, ඇවිදුනාලද; පාදපඞ්කජො, පාදපද්මයන්ගේ ඡායා ඇති යේ; පාදපඞ්කජසහචරිතවූ ඡායා උපචාරයෙන් පාදපඞ්කජශබ්ද යෙන් කියනලද්ද -- තාතො, දීපඞ්කරසම්‍යක්සම්බුද්ධයන්කෙරෙන් විවරණපතුල් ලද ඉක්බිත්තෙන් — "සො දසාසීතලමානසො" යන තන්හි යන් ශබ්දයෙන් යමෙක් කියනලද්ද "සො මහාපුරිසො" යන තත්ශබ්දයෙන් හෙම කියනුලැබේ-සකලලොක, සමස්ත ලොකයා; ආලොක, පහන්කරනුවට; එක, ප්‍රධානවූ; දීපායමානස්ස, ප්‍රදීපයක් බඳු; සුරුචිනාම බ්‍රාහ්මණො, සුරුචිනම් බ්‍රාහමණයක් වැ— බ්‍රහ්මං අණතීති බ්‍රාහ්මණො මන්තෙ සජ්ඣායතීති අත්‍ථො ඉදමෙව හි ජාතිබ්‍රාහ්මණානං නිරුත්තිවචනං අරියා පන බාහිතපාපත්තා බ්‍රාහ්මණාති වුච්චන්ති—"සුරුචි නාම බ්‍රාහමණො" යනාදි සතර අනුද්දෙශයෝ "මඞ්ගලො සුමනො" යනාදි සතර උද්දෙශයන් හා යථා සංඛ්‍යයෙන් යෙදෙති—"චක්කවත්තීති එත්‍ථ චක්කං වත්තෙතීති චක්කවත්ති"-මෙහි චක්‍රශබ්ද රුවන්සක්හි වැටේ.

**රාජා හුත්වා** යන තන්හි සතර සඞ්ග්‍රහවස්තුවිසින් ජනයන් තමාකෙරේ අනුරාග කරවන්නෙන් රාජ නම් වේ. "රජ-රාගෙ" යන ධාතුයි-චතූහි සඞ්ගහවත්‍ථූහි මහාජනං රජෙතීති රාජා.

**ඉමස්මිං පන භද්දකප්පෙ** යන තන්හි භද්‍රකල්ප නම් කවර යත් ? එක් බුදුකෙනකුන් උපදනා කප සාරකල්ප නම් වෙයි, දෙදෙනකු උපදනා කප මණ්ඩකල්ප නම් වෙයි, තුන්දෙනකු උපදනා කප වර කල්ප නම් වෙයි සතරදෙනකු උපදනා කප සාරමණ්ඩකල්ප නම් වෙයි, පස්දෙනකු උපදනා කප භද්‍රකල්ප නම් වෙයි, දැන් මෙකප උපදනා මෛත්‍රෙයතථාගතයන් ඇතුළුව පස්දෙනෙක් වෙති, එයින් මේ භද්‍රකල්ප නම් වී.

**අට්ඨාරස අභබ්බට්ඨානානි** යන තන්හි අභව්‍යස්ථාන නම් අවීචිය උත්පත්තියය ලොකාන්තරනරකයෙහිය නිධ්‍යාමතෘෂ්ණ නම් ප්‍රෙත යොනියෙ කාලකඤ්ජකඅසුරයොනියෙ විටුවනට කුඩා තිරිසන් යොනිය අසංඥතලයය ශුද්ධාවාසයෙහි උත්පත්තිය ජාත්‍යන්ධය ජාතිබධිරය ජාතිමූගතාය ස්ත්‍රීභාවය උභතොව්‍යඤ්ජනකභාවය පණ්ඩක භාවය වත්මනුයෙහි අපරියාපන්නභාවය සෝවාන් ආදිය නොවන බව යුතෙස්සි. පඤ්චානන්තරියකර්මය හැමිතන්හි අශුබ ගොචරතාය මිථ්‍යාදෘෂ්ටිය කර්මක්‍රියාවන්ගේ අදෘයීනය යන මෙයි. සසජාතකං,

චතුෂ්කනිපාතයෙහි සසජාතකය; සංඛපාල ජාතකං: චත්තාලීස නිපාතයෙහි සංඛපාලජාතකය; චූළසුතසොමජාතකං, චත්තාලීස නිපාතයෙහි චූළසුතසොමජාතකය; සත්තුභස්තජාතකං, සත්ත නිපාතයෙහි සත්තුභස්තජාතකය; මහාජනකජාතකං, මහානිපාතයෙහි මහාජනකජාතකය; ඛන්තිවාදිජාතකං, චතුෂ්කනිපාතයෙහි දෙවනවග ක්ෂාන්තිවාදිජාතකය; මහාසුතසොමජාතකං, අසීති නිපාතයෙහි මහාසුතසොමජාතකය; මූගපක්ඛජාතකං, මහානිපාතයෙහි මූගපක්ඛජාතකය; එකරාජජාතකං, චතුෂ්කනිපාතයෙහි පළමුවන වග එකරාජජාතකය; ලොමහංසජාතකං, එකනිපාතයෙහි දසවන වග ලොමහංසජාතකය.

**එවමාදිසු** යන තන්හි එවම්ශබ්ද නිදර්ශනයෙහි වැටේ—ලොකත්ථචරියා, ධජවිහෙඨජාතකාදි අනෙකජන්මකොටිශතසහස්‍රයෙහි ලොකත්ථචරියා පිරූහ; ඤාතත්ථචරියා, භද්දසාලජාතකාදි අනෙකජන්මකොටිශතසහස්‍රයෙහි ඤාතත්ථචරියා පිරූහ; බුද්ධචරියා, මහාඋම්මග්ගජාතකාදි අනෙකජන්මකොටිශතසහස්‍රයෙහි බුද්ධචරියා පිරූහ.

**ඉමා තිස්සො එසිකායො** යන තන්හිදු **ඉමෙ පඤ්ච මහාපරිච්චාගෙ** යන තන්හිදු ඉතිශබ්ද සමුච්චයාර්ථයි. අඞ්ගපරිච්චාගො, සිවිජාතකාදි අනෙකජන්මකොටිශතසහස්‍රයෙහි අඞ්ගපරිත්‍යාග කළහ; ජීවිතපරිච්චාගො, න්‍යග්‍රොධමෘගජාතක ශශජාතකාදි අනෙකජන්මකොටිශතසහස්‍රයෙහි ජීවිතපරිත්‍යාග කළහ; චරධනපරිච්චාගො, කුරුධම්මජාතකාදි අනෙකජන්මකොටිශතසහස්‍රයෙහි චරධන පරිත්‍යාග කළහ; පුත්තපරිච්චාගො, වෙස්සන්තරජාතකාදි අනෙකජන්මකොටිශතසහස්‍රයෙහි පුත්‍රපරිත්‍යාග කළහ; වසුධාතල, මහීතලය; චලනපුරස්සරං, කම්පනය පූර්වඞ්ගම කොට ඇති; සධා, සැදූහැම; අචලායං, පොළොවැ; පරිඤ්ඤාබීජෙ, “බුධො බොධෙය්‍යං” යනාදි පිළිතබිජු ඇති; පඤ්ඤා, නුවණම; අලවාලයෙ, තෝතැනි ඇති; කරුණා, කුළුණුම; ජලසෙක, උදකනිෂෙකයෙන්; සංවඩ්ඪිතෙ, වඩනාලද; මෙත්තා, මෛත්‍රීම; ඛන්ධසංරූළෙහ, කඳ ගෙන වැඩි; චරියා, ත්‍රිවිධ බොධිසත්ත්වචරියාම; සාඛාවිසාලෙ, ශාඛා වෙත් විශාලවූ; මහාපරිච්චාග, පඤ්චමහාපරිත්‍යාගම; පල්ලවෙ, පල්ලව ඇති; පාරමී, සමත්‍රිංශත් පාරමිතාම; කුසුමසම්ඵුල්ලෙ, විකසිත පුෂ්පයන් ඇති; බොධිසම්භාරකප්පතරුවරෙ, බොධිසම්භාර නමැති කල්පවෘක්ෂවරයෙහි; සබ්බඤ්ඤුතඤ්ඤාණමතඵලං, සර්වඥතාඥාන නමැති අමෘතඵල; නිබ්බත්ති, ශ්වෙතකෙතු නම් ඇති දිව්‍ය පුත්‍රයක් වැ උපන්; තත්ථ, ඒ තුෂිතපුරයෙහි; අමිත, අපමණ; අමරවධූ, දෙවඹුවන්විසින්; විධූයමාන, සලනලද; චාරු, සුන්දරවූ; චාමර, දිව්‍යචාමරයෙහි; මරීචිසඞ්ඝය, ප්‍රභාසමූහයෙන්; ධවලීකත,

ධවලකරනලද; තුසිතභවනෙ, තුෂිතභවනඇති — **සො මහාපුරි සො** යන මෙයින් **සො දසාසීතලමානසො** යන්නෙන් යමෙක් කියන ලදද හෙම කියනු ලදු වේ. බ්‍රහ්මාමරනිකරෙහි, බ්‍රහ්මසමූහයන් හා සුරසමූහයන්විසින්; මාරිස, නිදුක යුෂ්මේසි; කාල, හවුරුදුසියෙන් නොඋනු කල්හු; දීප, හැම බුදුන් උපදනා දඹදිව්ද; දෙස, සර්වබුද්ධයනට නිවාසභූතවූ මධ්‍යදේශයද; කුල, හැම රජුන් මුදුන්පත් සුදොවුන් රජහුගේ කුලද; ජනනිආයුනි, මව් මහාමායාදේවියගේ ආයුද; සබ්බබුද්ධුප්පාදධාර, සර්වබුද්ධයන්ගේ උත්පත්තියට ආධාරවූ.

වරජම්බුදීපෙ, ප්‍රවරජම්බුද්වීපයෙහි; කජඞ්ගල සලලවතී සෙතකණ්ණික ථූණෙසීරද්ධජාභිධානානං, කජඞ්ගලනම් සලළවතීනම් ශ්වෙතකණ්ණිකානම් ස්ථූණනම් උශීරධ්වජනම් අභිධානඇති; නිගමජනපදනිගමගාමපබ්බතානං මජ්ඣෙ, නිගමාදීන්ගේ මධ්‍යයෙහි—පෑදුම්දෙසෙහි කජඞ්ගලනම් නියම්ගමින් අග්නිදෙසෙහි සලලවතීනම් හොයින් දකුණුදෙසෙහි ශ්වෙතකණ්ණිකානම් නියම්ගමින් පැලදෙසෙහි ස්ථූණනම් බමුණුගමින් උතුරුදෙසෙහි උශීරධ්වජනම් පර්වතයෙන් මධ්‍යයෙහිය යුසේසි—මජ්ඣදෙසාලඞ්කාරභූතෙ, මධ්‍යදෙශයට භූෂණභූතවූ; "කපිලවත්ථුනගරෙ" යනු හා සබඳ—අතිමහතා, ඉතාමහත්වූ; තුහිනගිරි, හිමවත්පර්වතරාජයාගේ; සිඛරමාලානුකාරිනා, ශිඛරපඞ්ක්තියක බඳු; සුධා, සුනුවිමින්; ධවලෙන, සුදුවූ; පාකාරමණ්ඩලෙන, ප්‍රාකාරවලයයෙන්; පරිවුතෙ, පරික්ෂිප්තවූ; පවිකසිත, සුපුෂ්පිතවූ; කුසුමඵලපල්ලවාලඞ්කතාය, පුෂ්පයෙන් හා ඵලයෙන් හා පල්ලවයෙන් සැදුම්ලද; බහු, බොහෝවූ; විවිධ, අනෙකප්‍රකාරවූ; තරුගණනිචිතාය, ද්‍රුමගණයන්විසිනුදු ගැවසීගත්; උය්‍යානපරම්පරාය, උද්‍යානපරම්පරායෙන්; විභූසිතෙ, අලඞ්කෘතවූ; කෙලාසසිඛරි, කෛලාසශිඛරිහිගේ; සිඛරානුකාරිනා, ශිඛරසදෘශවූ; පාසාදසතෙන, ප්‍රාසාදශතයන්විසින්; අතිමනොහරෙ, පරමරමණීයවූ; මදමුදිත, මෙදෙන් මත්; හංස, හංසගණයන් හා; සාරස, "සරසි භවා සාරසා" යි ගත් විලිකුළු විල්මොතර ආදීනමැති; මෙඛලාකලාපාය, මෙවුල්කලඹඇති; නීලවනරාජිවිරාජිතාය, නිල්වනරැජින් හොබනා; තටරුහ, ගඟවැළැයෙහි නැඟි; තරු, රුකින්; විගලිත, ගුළු; කුසුමාභරණසමලඞ්කත, පුෂ්පාභරණයෙන් විභූෂිතවූ; සුචි, පිරිසුදුවූ; විමල, නිර්මලවූ; සලිලවාහිනියා, උදකප්‍රවාහ ඇති; රොහිණියා ගඞ්ගාය, රොහිණී නම් ගඞ්ගායෙන්; සනාථීකතෙ, සනාථකරනලද; විචරිත, ඇවිදුනා; බහුවිධ, අනෙකප්‍රකාරවූ; නර, පුරුෂයන් හා; නාරී, ස්ත්‍රීන් හා; ගජ, හස්තීන් හා; තුරග, අශ්වයන් හා; රථසම්බාධෙ, රථසහස්‍රයෙන් සම්බාධවූ; අසම්බාධ, මහත්; රාජමග්ගෙ, රාජවීථි ඇති; මුරජරව, මිහිඟුහඬින්; ගම්භීරගජ්ජිත, ගැඹුරුගජ්ජනා ඇති; සලිල, උදකයන්ගේ, සීකර;

පොදුඇති; ආසාර, වෙගවත් වෂී ඇති; ධාරාසාරෙසු, ධාරාගෘහ යෙනි, ආබද්ධසිඛණ්ඩමාලානං, බඳපිල්මඬුලුඇති; මත්තමෝරමණ්ඩලානං, මත්මොනරමණ්ඩලයන්ගේ; තාණ්ඩවෙන, නැටුමෙන්; ඉන්ද්‍ර චාපකලාප, දෙව්දුනුකලඹින්; විප්ඵුරිත, දීප්තවූ; ජලධරදිවසායමානෙ, වහරේදවසක් බඳු; භවන, ගෙදිග්විල් නිසා ගෙයි වසන; කාළහංසකුලකොලාහලෙ,කාලහංසකුලයන්ගේ කොලාහල ඇති; මත්තකන්තා, මතඟනන්ගේ: මණිවලය, මිණිවළල්ලෙහි; කල, මනොඥවූ; රව, හඬින්; රමණීයෙ, රම්‍යවූ; පබුද්ධ, ප්‍රබුද්ධවූ; ප්‍රමුදිත වූය යුසේසි; සම්බලොකො, සව්ජනයන් ඇති; විපුලවත්‍ථු, සප්තරත්නාදි විපුලවූ වස්තු ඇති; කපිලවත්‍ථුනගරෙ, කපිලවස්තු නම් නුවරෙහි; දිවසකර, හිරුහු; සුත්‍රමනුවංසෙ, පුත්‍රවූ මනුහුගේ වංශයෙහි; ඔහු ශ්‍රී සූයඝී දෙදෙනාගේ සඞගමයෙන් උපන්හ යනු කථායි. එයින් සූයඝීපුත්‍රනම් විය ඔහුගේ වංශය සූයඝීවංශ නම් වී ඒ වංශයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ වෛශ්‍රවණදිව්‍යරාජ-

"නෙත චාපි බුද්ධං දිස්වාන බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතොව නමස්සන්ති මහන්තං වීතසාරදං" යි.

ධම්මසඞ්ග්‍රහඝථවිරයෝද කීහු මැයි "දෙවීනාදිච්චබන්ධුනා" යි. බුදුන්විසින්ද්‍ර වදූරනලද්දේමය තමන්ගේ නම්ගොත් පුළුවුත් බිම්සර මහරජහට-

"ආදිච්චා නාම ගොත්තෙන සාකියා නාම ජාතියා"යි.
මෙසෙයින් බුදුහු සූයඝීවංශයෝ.

**මහාසම්මතාභිසම්මතෙ** යන තන්හි සූයඝීපුත්‍රවූ මනුතෙමේ මහාජනයන්විසින් සම්මතවනබැවින් මහාසම්මතනම් වැ මුළුදඹදිවට එකරජ විය ඔහුවිසින් වංශය අභිසම්මත වී. කිසේය යත්? ඔහු මියෙන් දිව්‍යමහනෙල්ගඳ වැහෙයි, ඇඟින් විදුලියකලබක් සෙයින් රශ්මි නික්මෙයි, ආකාශයෙහි බද්ධපය්‍යඞ්ක වැ නිෂණ්ණ වෙයි, සකලලොකයා පිතෘස්ථානයෙහි පරිපාලනය කොට අසඞ්ඛ්‍යයක් හවුරුදු රජ කෙළේ, එයින් ඔහුගේ වංශයද ඔහුවිසින් අභිසම්මත වී, ඒ වංශසාගරය නුවණිපසුරෙන් පිහිනා අනෙකකවිවරසහස්‍රයෝ පරතෙර නොදක්කහෙත්, කාලිදාසයෝද රඝුවංශයෙහි කීහු මැ නො-

"ක්ව සූයඝීප්‍රභවො වංශඃ ක්වචාල්පවිෂයා මතිඃ
තිතීර්ෂුර්දුස්තරං මෝහාදුඩුපෙනාස්මි සාගරම්" යි.

ඒ වංශයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ "මහාසම්මතාභිසම්මතෙ" යි.

**රොජ වරරොජ** යනාදි තන්හි ඒ වංශය රොජාදීන්ගේ පරම්පරායෙන් ආපරිදි කිසේය යත් ? මහාසම්මතයා පුත් රොජ නම් විය, රොජයා පුත් වරරොජ නම් විය, වරරොජයා පුත් කල්‍යාණ නම් විය, කල්‍යාණයා පුත් වරකල්‍යාණ නම් විය, වරකල්‍යාණයා පුත් උපොසථ නම් විය, ඔහු පුත් මන්ධාතු නම් කාමභොගීන්ට අග්‍ර රජෙක් විය, මන්ධාතු නරපතිහුගේ පුත් වර නම් විය, වරයා පුත් උපවර නම් විය, මෙබඳු රජුන්ගේ පරම්පරායෙන් ආ වංශයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ "රොජවරරොජ-පෙ-පරම්පරාගතෙ" යි.

**සගරසාගර** යනාදි තන්හි සගරාදීන්ගේ පඨ නම් අන්වයයි.

කිසේය යත් ?

අනන්තරොක්ත උපවරයා පුත් චෙතිය නම් විය, ඔහු චරිත චෙතියජාතකයෙන් දන්නේය. ඔහු පුත් මුචල නම් විය, ඔහු පුත් මුචලින්ද නම් විය ඔහු පුත් සගර නම් විය, ලොකයෝ මෙරජදරුවන් සැටදහසක් දෙනා මුහුද කැණියහ යෙත්. ඔහු පුත් සාගර නම් විය, ඔහු පුත් භරත නම් විය, ඔහු පුත් භගීරථ නම් විය, භගීරසගයි ක්සත් මැයි. ලොකයෝ මෙරජු ජපකොට අහස්ගඟ බැහූය යෙත්. සගරයා දරුවන් මුහුද කැණියහ ගඬුදු භගී රථයා අහස් ගඟ බැහූය යනුදු ආගමයෙන් පිටත් කථායි. මෙබඳු රජුන්ගේ වංශයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ "සගර සාගර භරත භගීරථපධෙ" යි.

**මහාසුදස්සනනිදස්සනෙ** යන තන්හි "නිර්දිශ්‍යතෙ'ස්මිනනීති නිද්දෙශඃ" යි සඞ්ප්‍රත්‍යද අධිකරණ කාරකයෙහි විහිත වනබැවින් මහාසුදශීනයා පැනුණු ස්ථානයෙහිය උපන් කුලයෙහිය යන අර්ථයි. අනන්තරොක්ත භගීරථයා පුත් රුචි නම් විය, ඔහු පුත් සුරුචි නම් විය, ඔහු පුත් ප්‍රතාප නම් විය, ඔහු පුත් මහාප්‍රතාප නම් විය, ඔහු පුත් පනාද නම් විය, ඔහු පුත් පස්විසියොදුන් රුවන්පායෙක්හි වුසූ මහාපනාද නම් රජෙක් විය, ඔහු පුත් සුදශීන නම් විය, ඔහු පුත් සත්රුවන්මුවා නුවරෙක්හි වුසූ මහාසුදශීන නම් රජෙක් වී. මේ රජුන්ගේ අන්වයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ "මහාසුදස්සනනිදස්සනෙ" යි.

**මඛාදෙවපුත්තනත්තුසන්තානෙ** යන තන්හි මඛාදෙව නම් කවර යත් ? අනන්තරොක්ත මහාසුදශීනයා පුත් නෙරු නම් විය, ඔහු පුත් මහානෙරු නම් විය, ඔහු පුත් අර්චිෂ්මත් නම් වී. මොහු මහාසම්මතයනු පුත්‍රපෞත්‍රයෝ අසඞ්ඛ්‍යාපුෂ්ක අටවිසිදෙන කුසාවතී රජගහා මිථුලුපුරය යන මේ තුන්නුවරැහි මුළුදඹදිවට අග රජ වැ වුසූහු.

එසින් කීහ-

"අසංඛෙය්‍යායුකා එතෙ අට්ඨවීසති භූමිපා
කුසාවතිං රාජගහං මිථිලඤ්චාපි ආවසුං" යි.

මොහු හැමදෙනහට සඟ අර්චිෂමත්රජ දරුමුනුබුරෝ අනෙක ශතසහස්‍ර නරපතිහි තන්හි තන්හි නුවර මවා මුළුදඹදිව් එකාතපත්‍ර කොට චක්‍රවර්තිරූපයෙන් සිට පරිපාටියෙන් රජ කළහ. මොවුන් හැමදෙනහට සඟ සාගර නම් රජෙක් විය, ඔහු පින් මියුලු නුවර **මඛාදෙව** නම් වී, ඔහුගේ පුත්‍රානපත්‍යප්‍රබන්ධ නම් කවර යත්? එරජ සුවාසූදහසක් හවුරුදු කුමාරක්‍රීඩා කොට සුවාසූදහසක් හවුරුදු යුවරාජක්‍රීඩා කොට සුවාසූදහසක් හවුරුදු සකල ජම්බුද්වීපයෙහි චක්‍රවර්තිලීලායෙන් ඓශ්වර්‍ය්‍ය කොට හිස නරකෙසක් දුටුකලැ දෙටුපුත්හට රජ දී අඹඋයන්හි පැවිදිවැ සුවාසූදහසක් හවුරුදු තව කොට විසී. එම නියායෙන් ඔහු දරුමුනුබුරෝ සුවාසූදහසක් රජදරුවෝ නරකෙශයක් දුටුකලැ තමන් තමන් දරුවනට රජ දී මුවදෙව්උයන් වැද තව කළෝ. මේ රජුන්ගේ වංශයෙහිය බුදුන් උපන්නේ. එසින් කීහ "මඛාදෙවපුත්තානන්තානු සන්තානෙ" යි.

**නිමිකුසපරිපාලිතෙ** යනු තත්හි ඒ වංශය නිමිරජහුවිසින් පරිපාලිතපරිදි කිසේය යත්? අනන්තාරොක්ත මඛාදෙව නම් මහරජ බ්‍රහ්මලොකයෙහි වසන්නේ තමාගේ වංශය බලනුයේ දෙදෙනකු උනුව සුවාසූදහසක් රජුන් පැවිදිවැ බඹලොව ගියවුන් දැක සනෙන්තාණව මේ නියායෙන් මත්තේ පවත්තිහොයි බලනුයේ නොපවත්නාබව් දැන මාගේ වංශය මාම පරිපාලනය කළ මැනවැයි බ්‍රහ්මලොකයෙන් චුතව මියුලුපුරයෙහි රජු දරුව ඉපද වැඩැ විය පැමිණ පියරජහු හිස නරකෙහෙයක් දැක පුත්හට රජ දී මුවදෙව් උයන් වැද පැවිදිවැ බඹලෝ ගියකල්හි පස්දන්හලක් කරවා දවස පස්ලක්‍ෂයක් ධන විසදා මහදන් දී පන්සිල් රැක පෙහෙව සසර මහාජනයහට ධර්‍මදෙශනා කොට දානාදිපුණ්‍යකර්‍මයෙහි පවත්වා වෛජයන්තරථාරූඪ වැ දිව්‍යලොක ගොස් දෙවියනට ධම් දෙසා අපරකාලයෙහි හිස නරකෙසක් දැක පුත්හට රජ දී මුවදෙව් උයන්හි වැඩහිඳ පැවිදිවැ සුවාසූදහස පුරවමින් බඹලෝ ගියෝ. ඒ වංශය මෙසේ නිමිරජුවිසින් පාරිපාලිතය.

කුසරජහුවිසින් පරිපාලිතපරිදි කිසේය යත්? කුසරජ තමාගේ ප්‍රභාවතී නම් අග්‍රමහිෂිය තමාගේ රූපමදයෙන් උඅඳැම වැ තමාගර හා කුලනුවර ගියකල්හි විසිදහසක් නුවර පිරිවර කොට ලද කුසාවතීරාජධානියැ රජ පියා කොකනදවීණව හා දෙවනු වැ සාගලනුවර ගොස් අන්‍යතරවෙශයෙකින් ප්‍රභාවතිය ආරාධනා කොට

වසතුයේ ඇය සඳහා සත්රජක්හු ඇවිත් මුළුනුවර වටාගත්කල්හි හස්තිස්කන්ධසඞ්ගත වැ ඇය ගෙන සමරභූමිප්‍රවිෂ්ට වැ **අහං කුසො** යි සිංහස්වර විහිද ආස්ඵාලනා කොට පරසේනා මැඩ ස්වවික්‍රමසඤ්ඥිතයෙන් ඇය සිත් ගෙන සියනුවර ඇරැ වෙසෙමින් පුත්‍රොත්පත්ති සංසිද්ධීන් වංශය පරිපාලනය කෙළේ. මෙසෙයින් මෙරජුන් විසින් රක්නාලද වංශයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ "නිම්කුසපරිපාලිතෙ" යි.

**රඝුඅජදසරථරාමාභිරාමෙ** යන තන්හි අභිරාමශබ්දයහට "අභිරමන්තෙත'ස්මින්" * යන වාක්‍ය වනබැවින් අප වැනි අනුභාව සම්පත්ඇති රජුන් මෙවැනි පිරිසුදු වංශය ලදසේ යහපතැයි රඝු ආදීන් එහි අභිරමණ කරන්නෙන් ඒවංශය ඔව්නට අභිරාම නම් වී.

මෙහි රඝු නම්, කවර යත් ?

අනන්තරවාක්‍යයෙහි නිර්දිෂ්ට නිමිරජුපිත් කාළරජක නම් විය, ඔහුපිත් ප්‍රෙමකර නම් විය, ඔහු පිත් අශොක නම් රජෙක් විය, ඔහු දරුමුනුබුරහු සුවාසූදහසක් දෙන බරණැස රජ කළෝ. මේ සුවාසූදහසක් දෙනා මධ්‍යයෙහි දිලීප නම් රජෙක් විය, ඔහු පිත් රඝු නම් විය, ඔහු පිත් අජ නම් විය, ඔහු පිත් දශරථ නම් විය, ඔහු පිත් රාම නම් විය. මෙහි රාමයා සොළොස්දහසක් හවුරුදු රජකළපරිදි දක්වන්නට වදාළහ බුදුහු–

"දස වස්සසහස්සානි සට්ඨිං වස්සසතානි ච
කම්බුගීවො මහාබාහු රාමො රජ්ජමකාරයී" යි.

මේ වංශයෙහි රජ්ජුරුවෝ ජන්මයෙහි පටන්ගෙන ශුද්ධයහ, ඵලනිෂ්පත්ති දක්වා පවත්නා කර්ම ඇත්තාහ, සමුද්‍රපර්‍ය්‍යන්ත පෘථිවියට ඊශ්වරයහ, දිව්‍යලොක දක්වා යවන රථමාර්ග ඇත්තාහ, ත්‍යාග සඳහා ගන්නා කරවුවර ඇත්තාහ, සත්‍ය සඳහා මඳ කොට බණනා බස් ඇත්තාහ, යස සඳහා විජය කරන ඉච්ඡා ඇත්තාහ, දරුවන් සඳහා සඞ්ග්‍රහ කරන ස්ත්‍රීන් ඇත්තාහ, ශෛශවාවස්ථායෙහි අභ්‍යාස කරන ශාස්ත්‍ර ඇත්තාහ, යෞවනාවස්ථායෙහි අනුභව කරන විෂය සුව ඇත්තාහ, වෘද්ධාවස්ථායෙහි ගන්නා ප්‍රව්‍රජ්‍යා ඇත්තාහ, පර්‍ය්‍යන්තයෙහි සමාධියෙන් හිඳ කරන කාලක්‍රියා ඇත්තාහ.

මෙම කීහ රඝුවංශයෙහි–

"සො'හමාජන්මශුද්ධානාමාඵලොදයකර්මණාම්
ආසමුද්‍රක්ෂිතීශානාමානාකරථවර්ත්මනාම්.

ත්‍යාගාය සම්භෘතාර්ථානාං සත්‍යාය මිතභාෂිණාම්
යශසෙ විජිගීෂූණාම්ප්‍රජායෛ ගෘහමෙධිනාම්.

---

* "අභිරමන්ති අස්මින්" පොත්හි.

ශෛශවෙ'භ්‍යස්තවිද්‍යානාං යෞවනෙ විෂයෛෂිණාම්
වාර්ධක්‍යෙ * මුනිවෘත්තීනාං යොගෙනාන්තෙ තනුත්‍යජාම්.
රඝූණාමන්වයං වක්ෂ්‍යෙ තනුවාග්විභවො'පි සන්
තද්ගුණෛඃ කර්ණමාගත්‍ය චාපලාය ප්‍රතාරිතඃ" යි.

මෙසෙයින් අනෙකකවිවරසහස්‍රයන්විසින් වර්ණනා කරත් නොගෙවෙන යශස්ඇති රජුන්ගේ වංශයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ "රඝුඅජදසරථරාමාභිරාමෙ" යි.

**ඔක්කාකප්පභවෙ** යන තන්හි ඉක්ෂ්වාකු නම් කවර යත්? අනන්තරොක්ත සූචාසූදගස්තට සඟ විජයරජ දරුබුනුබුරනු කුසරජහු ඇතුළුව පසළොස්දෙනෙක් වූහ, මෙ පසළොස්දෙනහට සඟ සුජාත නම් රජුපිත් ඉක්ෂ්වාකු නම් වී. ඔහුකෙරෙන් ප්‍රභවවූ වංශය ඉක්ෂ්වාකුප්‍රභව නම් වී. මෙහි මහාසම්මතයාකෙරෙන් ප්‍රභූතශබ්ද අනුරෙහි උපන් ඔක්කාරජහුකෙරෙන් ප්‍රභූතවූ නම් කිසේය යත් ? යම් සේ "කාශ්මීරෙභ්‍යො විතස්තා ප්‍රභවති" යන තන්හි යථා හිමවන්තින් බට විතස්තානදී කාශ්මීරදෙශයෙන් මුබට ආකලෑ "කාශ්මීරෙභ්‍යඃ ප්‍රභවති" යනු වීද එසෙයින්ම මහාසම්මතයාකෙරෙන් ආ වංශය ඔක්කාරජහුකෙරෙන් මොබට ආකලෑ "ඉක්ෂ්වාකුප්‍රභව" නම් වී. මෙම් ඔක්කාරජහුකෙරෙන් ප්‍රභවවූ වංශයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ "ඔක්කාකප්පභවෙ" යි. අප මහසත්හු මේවංශයෙහි මහාසම්මතනම් වැ මහාමන්ධාතුනම් වැ මහාසුදර්ශනනම් වැ මඛාදෙව නම් වැ කුසනම් වැ රාමනම් වැ රජරුස්විසින් දක්වූ රජුන්කෙරෙහි සිවි ආදි රජ වැ රජකම් කළකල්හි පමණ නැති. මහාසුදර්ශනකල් සෙයින් චක්‍රවර්ත්ති වැ මතු යමසල්උයන්තන්හි ශරීර නිඃක්ෂෙප කෙළේ සවරෙක් වී. එයින් වදාළහ පරිනිර්වාණමඤ්චකයෙහි වැඩහොත් බුදුහු "ඡක්ඛත්තුං ඛො පනාහං ආනන්ද අභිජානාමි ඉමස්මිං පදෙසෙ සරීරං නික්ඛිත්තං තඤ්ච ඛො රාජාව සමානො චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො අයං සත්තමො සරීරනික්ඛෙපො" යි.

සකලකුලතාරකානං, සියලු ක්ෂත්‍රියකුල නමැති තාරකාවන්ට; තාරාපතිභූතෙ, තාරාපතිහු බඳු; ධොතසංඛපක්ඛිත්ත, සුදු සඟොක්හි ඔත්; ඛීරසලිලනිම්මලෙ, කිරිසිලිල්බිඳක් සෙයින් නිර්මලවූ.

**සාකියකුලෙ** යන තන්හි "ශාක්‍යකුල" නම් කවර යත් ? අනන්තරොක්ත ඔක්කාරජහුගේ අගමෙහෙසිය පුත්‍රයෝ සතරදෙනෙක් වූහ දූහු පස්දෙනෙක් වූහ, ඔහු සතරබෑයෝ පියරජු කැමැත්තෙන් අනෙකසහස්‍රහස්ත්‍යශ්වරථපදාතීන් ගෙන පස් බින්නන් හා සමඟ අමාත්‍යයන් අටදෙනකුවිසින් අධිෂ්ඨිත තුන්යොදුන් පඹිදීස් උප

* "වාර්ධකෙ" යනු දෙශාන්තරපාඨයි.

ලක්‍ෂිත වැ හිමවත් අභිමුඛව ගොස් රොහිණීනදීතීරයෙහි කපිල මහර්ෂීන්විසින් නිර්දිෂ්ට ස්ථානයෙහි කපිලවස්තු නම් නුවරක් කරවා ගෙන අමාත්‍යයන්විසින් සමුත්සාහිත වැ තමනට නිසි රාජකන්‍යාවන් නැත්තෙන් දූරියනට නිසි රාජපුත්‍රයන් නැත්තෙන් කුලවංශ රක්තා සඳහා කනිෂ්ඨ භගිනීන් අග්‍රමහිෂී කොට ගෙන ජ්‍යෙෂ්ඨ භගිනිය මාතෘස්ථානයෙහි තබා තමන් සතරදෙනාකෙරෙහි මාලු උල්කාමුඛ කුමාරයා රජ කොට ගෙන වුසුහු. ඔහු බණන්නට වන් කල්හි අන්ධකාරයෙහි දිලිහෙන මිණිදඬුවැටපහන් සෙයින් මුඛයෙන් රැස් නික්මෙයි එයින් එරජ "උල්කාමුඛ" නම් වී. ඔවුන් එසේ වසනපරිදි අසා ඔක්කාරජ මා දරුවෝ කුලවංශ රක්‍ෂා කරතුවට ශක්‍යයහයි පරිතුෂ්ට වැ "සක්‍යා වත භො රාජකුමාරා පරමසක්‍යා වත භො රාජකුමාරා" යි උදන් උදන කෙළේ. එයින් ඔහු ශාක්‍ය වූහ. ඔහුගේ පුත්‍රපෞත්‍රයෝ අපත්‍යප්‍රත්‍යයවිධානසාමර්ථ්‍යයෙන් ශාක්‍ය වූහයි සාකිය වූහු. මේ විස්තර දික්සඟියැ අම්බට්ඨසූත්‍රයෙන් දන්නේය. ඔවුන්ගේ කුලයෙහිය බුදුන් උපන්නේ. එයින් කීහ "සකලකුල තාරකානං තාරාපති භූතෙ ධොතසංඛපක්ඛිත්ත ඛිර සලිලනිම්මලෙ සාකියකුලෙ" යි.

අනෙකභූමිපාල, නොයෙක් රජුන්ගේ; මොලිලාළිත, මුහුළු ලළිතලද; චරණයුගලං, පාදයුගලයක් ඇති; ධිති, ධෛර්‍ය්‍ය; මති, ප්‍රඥා; විරියාදි, පරාක්‍රමප්‍රභෘති; ගුණගණාධිවාසං, ගුණගණයනට ආවාසවූ; විමල, නිර්මලවූ; සීලාලඞ්කාර, ශීලාභරණයෙන්; සතත සමලඞ්කතං, සර්වකාලයෙහිම සැදුම්ලද; ආකරම්ව, ආකරයක් වැනිවූ; ගුණනං, ගුණරත්නයනට; නිවාසම්ව, ආවාසයක් බඳුවූ; සිරියා, ශ්‍රීදෙවතාවට; සමූහම්ව, රාශියක් බඳුවූ; සාධූනං, සජ්ජනයන්ගේ;

**සුද්ධොදනං රාජානං පටිච්ච** යන තන්හි ශුද්ධොදනනරපති ශාක්‍ය කුලයෙහි කවර රජු පිත යත් ? කපිලපුර මැවූ උල්කාමුඛනරපතිහු පිත් නිපුර නම් රජෙක් විය, ඔහු දරුමුනුබුරහු එනුවරෙහි අට රජෙක් වූහ, ඒ අටදෙනාහට සිහසුර නම් රජෙක් විය, ඔහු දරුමුනුබුරහු එම නුවර දෙඅසූදහසක් රජ වූහු, මේ දෙඅසූදහස්නට සග ජයසෙන නම් රජ පිත් සීහහනු නම් රජෙක් විය, ඔහු පිත් ශුද්ධොදන මහරජ වී, ඔහුපිණිසය බුදුන් උපන්නේ. එයින් කීහ "අනෙකභූමිපාලමොලිලාළිතචරණයුගලං – පෙ- සුද්ධොදනරාජානං පටිච්ච" යි.

පරම, උතුම්වූ; නිර්මල, පිරිසුදුවූ; සීලාලඞ්කාර, පඤ්චශීලාභරණයෙන්; සතතසමලඞ්කතාය, සර්වකාලයෙහි විභූෂිතවූ; පුබ්බජිනවර, පූර්වබුද්ධවරයන්ගේ; පරිචරියොපචිත, පරිචයසිද්ධවෙන් රැශිකෘතවූ; පුඤ්ඤාතිසය, පුණ්‍යවිශෙෂයට; භාජනීකත, ආධාර

කරනලද; සන්තානවිසෙසාය, සන්තානාතිශය ඇති; අච්ඡරානිබ්බිසෙස, දිව්‍යාප්සරාවක හා සමානවූ; රූපසොභාය, රූපසම්පත්ති ඇති; සාකියකුල, ශාක්‍යකුල නමැති; ගගන, ආකාශදෙශයට; චන්දලෙඛාය, චන්ද්‍රරෙඛාවක් බඳුවූ; සකලලොක, සර්ව ජනයාගේ; මනොහරාය, සිත් ගන්නාවූ.

**මහාමායාදෙවියා කුච්ඡියං** යන තන්හි මහාමායාදේවී කවර රජු දුව යත්? කපිලපුරෙහි රජකළ දෙඅසූදහස්නට සග ජයසෙන නම් රජු දූ සීහහනුමහරජහුගේ නග යශොධරා නම් රාජ කන්‍යාව දෙව්දහනුවර දෙවදහනම් ශාක්‍යදරු අජින නම් රජහට බිසෝ වැ මායා නම් ප්‍රජාපතී නම් දූන් දෙන්නකු හා දණ්ඩපාණි නම් සුප්‍රබුද්ධ නම් දෙපුතුන් ලදහ, අජිනශාක්‍යයන් නග කච්චානා නම් රාජ කන්‍යා කපිලපුරයෙහි සීහහනුමහරජහට අගබිසෝ වැ ශුද්ධොදන නම් ධොතොදනනම් සකලනම් ශුක්ලොදන නම් අමිතොදන නම් පස්පුතුන් හා අමිතා නම් පාලිතා * නම් දෙදූකෙනකුන් ලදහ, ඔවුන් කෙරෙහි අමිතා නම් රාජකන්‍යාව දෙව්දෑනුවර අජින ශාක්‍යයා දරු සුප්‍රබුද්ධ නම් ශාක්‍යරජහට බිසෝ වැ භද්‍රකාත්‍යායනා නම් දුවක හා දෙවදත්ත නම් පුතකු ලදහ, දෙව්දෑනගරයෙහි අජිනශාක්‍යයන් දරු මායා ප්‍රජාපතී දෙබින්න කපිලපුරයෙහි සීහහනු රජු දරු ශුද්ධොදනමහරජහට බිසෝ වූ. මොවුන් දෙබින්නන් කෙරෙහි මහාමායාදෙවීන් කුස්හිය බුදුන් උපන්නෝ. එයින් කීහ "පරමනිම්මලසීලාලඞ්කාරසතතසමලඞ්කතාය – පෙ – මහාමායා දෙවියා කුච්ඡියං" යි.

සරදරජනිකර, ශරච්චන්ද්‍රයක්හුගේ; කරනිකර, රශ්මිකදම්බයක් සෙයින්; අවදාත, ධවලවූ; වර, උතුම්වූ; වාරණවිලාසං, හස්ති වෙශයක්; අවිජහිත, අපරිත්‍යක්තවූ; සතිසම්පජඤ්ඤ, ස්මෘති සම්ප්‍රඥාන ඇතියේ; තුසිතපුරතො චවිත්වා, තුසීපුරයෙන් චුත වැ; විවිධෙසු පාටිහාරියසහස්සෙසු පවත්තමානෙසු, දශසහස්‍රලොක ධාතුකම්පාදි විවිධප්‍රාතිහාර්‍ය්‍යසහස්‍රයන් පවත්නාකල්හි; පටිසන්ධිං, පිළිසඳ-භවෙන භවං කම්මෙන වා විපාකං පටිසන්දහතීති පටිසන්ධි.

**අථාසං** යන තන්හි අථශබ්ද අනෙකාර්ථවාචක වී.

"අර්ථාත් ප්‍රකරණාල්ලිඞ්ගාදෞචිත්‍යාද්දෙශකාලතඃ
ශබ්දාර්ථාඃ ප්‍රවිභජ්‍යන්තෙ න රූපාදෙව කෙවලාත්"

යුබැවින් මෙතැනැ ආනන්තර්‍ය්‍යයෙහි වැටේ. එයින් කීහ "අථ ප්‍රක්‍රියාප්‍රශ්නානන්තර්‍ය්‍යප්‍රඥතප්‍රතිග්‍රහවාක්‍යොපාදානමඞ්ගලපූර්වවර්තිසාවශෙෂාධිකාරෙෂු" යි — **අසං** යන්නෙන් උපස්ථිත මහාපුරුෂ වාච්‍ය වේ — විහිත, සංවිධාන කරනලද; විවිධ, අනෙකප්‍රකාර; නර, මිනිසුන් හා; සුර, දෙවියන්ගේ; ආරක්ඛා, පරිරක්‍ෂා ඇතියේ;

* "පමිතා" මහාවංශ.

රත්තපදුමකණ්ණිකා, රත්පියුම්කෙමියෙක්හි; ආසීන, නිෂණ්ණවූ; සුවණ්ණරූපකො විය, රන්පිළිමයක් සෙයින්; විප්පසන්න, විශෙෂයෙන් ප්‍රසන්නවූ; මණිරතන, මිණිරුවනෙක්හි; ආවුත, අවුණනලද; සිනිඬ, සිනිඳු; විවිධ, අනෙකප්‍රකාර; රුචිර, මනොඥවූ; තරුවර, වෘක්‍ෂයන්ගේ; නිචිතෙ, නිචය ඇති; භමමාන, භ්‍රමත්වූ; භමර, බමරුන් හා; මධුකර, මීවැස්සන්ගේ; උපකූජිතෙ, නිනාද ඇති; විවිධ, අනෙකප්‍රකාරවූ; කුසුම, මල්හි; ගන්ධ, සෞගන්ධ්‍යයෙන්; අධිවාසිත, පරිවාසිතවූ; සුඛපවනෙ, යහපහස්දෙන සුළං ඇති; ජන, දුටු ජනයන්ගේ; මනනයන, මනනුවන්; විලුම්පිනි, වුළුඹුනා; ලුම්බිනිවනෙ, ලුම්බිනිවන නම් උයන්හි; විකසිත, සුපුෂ්පිතවූ; මඞ්ගලසාලමූලෙ, මඟුල්සල්මුල්හි; විචිත්‍ර; විසිතුරුවූ; වත්ථ, පිළි හා; අලඞ්කාර, පලඳනායෙන්; විභූසිතාය, සැදුම්ලද, **රාජිනියා** යනු හා සබඳ. **කදම්බකාය** යන තන්හිදු **සාඛාය** යන තන්හිදු මෙසේම සබඳ කරනු-සක,තමාගේ; සුරභි, සුවඳ; තණ්ඩුලතා, තුඩුල්යට; අනුගත, එළඹෙනලද; මත්ත, මත්වූ; මධුකර, බමරුන්ගේ; කදම්බකාය, මුළුඇතියාවූ; දක්ඛිණකර, දකුණතට; අවලම්බිත, බස්නාලද; සුඵුල්ල, සුපුෂ්පිතවූ, සාලසාඛාය, ශාලශාඛා ඇතියාවූ; පාචීන, පැදුම්දසට; අභිමුඛඨිතාය, අභිමුඛව සිටියාවූ; අධොමුඛ, සෙසුසතුන්සේක්ඛිසිනිව; අපතමානො, නොහෙනුයේ;රතනපල්ලඞ්ක, රුවන්පලගෙකින්; අවතරමාන, බස්නා; මහාධම්මකථිකො විය, මහාධර්මකථිකයක්හු සෙයින්; කමලගබ්භ, මහනෙල්ගබ; කණ්ණිකාය සයිතිවා, කෙමියෙහි ලැග; සයං, තමාවිසින්; අභිමතසමය, රිසියුණුකල්හි; සමාගත, නික්ම ආ; සුවණ්ණභමරො විය, රන්බමරක්හු සෙයින්; පසාරිත, දිගුකරනලද; කරවරණෙ, අත්පා ඇතියේ; කාසිකවත්ථ, කසීවතින්; වෙඨිත, වසා තුබූ; ජාතිරඞ්ගමණිරතනම්ව, දැරගම්ණිරුවනක් සෙයින්; කමලාසන, බඹුන් හා; අනිමිස, දෙවියන් හා; මානුසෙහි, මිනිසුන්විසින්; කනකජාල, රන්දැලින්දු; අජින, අඳුන්දිවිසම්නුදු; දුකූලෙහි, දුහුල්සුඹුළුයෙනුත්; යථායොගං, යථාක්‍රමයෙන්; යථාසඞ්ඛ්‍යයෙන යුසේයි. පටිග්ගහිතො, සම්ප්‍රතිග්‍රහණ කරනලදුයේ; කම්පමානාසු, ධර්මතාවෙන් කම්පාවනකල්හි; අන්ධකාර, අඳුරුයෙන්; නිරන්තරෙසු, අතුරුනැති; ලොකන්තරෙසුපි, හිරුදහස්සුවහසුනුදු නැඟී පහන් නොකට හැකි ලොවැදිරියදු; උළාර, මහත්වූ; විපුල, බෝහෝවූ; ඔභාසෙසු; ආලොකයන්; ඵරන්තෙසු, ප්‍රතිසන්ධිය සෙයින් පැතිරෙනකල්හි; සකලදසදිසාසු, සියලු දශදිශාවන්; විප්පසන්නාසු, රහත් මහණක්හු නුවණක් සෙයින් ප්‍රසන්නවූකල්හි; රජනිකර, චන්ද්‍රයාද; සූරිය, සූර්‍ය්‍යයාද;තාරාගණෙසු, තාරාගණයනුදු;අතිරෙකතරං,අධිකතර වැ; විරොචන්තෙසු, දිලියෙන කල්හි—තාරාගණයන්කෙරෙහි අරුන්ධතී දවහත්තරුසේ දිලියෙයි, දවහත්තරු සඳසේ දිලියෙයි, සඳ අමාරස්

විසිරෙමින් හිරුසේ දිලියෙයි, හිරු සිතිඳු මොළොක් රස් වහ
මින් දිලියෙනපරිදි කියත් ලෙව්හි ඒව උපමා නැත්—නභොභූමි
ගතරතනෙසු, ආකාශගත රතනයන් හා භූමිගත රතනයන්,
පජ්ජලන්තෙසු, ප්‍රකෂීයෙන් දිලිහෙනකල්හි; සුගන්ධ, සුවඳවූ; මුදු,
මොළොක්වූ; සීතල, සිහිල්වූ; මාරුතෙසු, මාරුතයන්;වායන්තෙසු,
හමනකල්හි; චාතුද්දීපගත, සතරමහදිවයින පැතිර සිටි; ජලධර
මාලාසු, මෙඝමාලාවන්; වස්සමානාසු, පඤ්චප්‍රකාර වර්ෂාහනරාශ විර
හිතව වස්නාකල්හි; වෙගවතී, ශීඝ්‍රශ්‍රොතස් ඇති; සලිලවාහිනීසු,
ගඞ්ගානදීසහස්‍රයන්; අසන්දමානාසු, ස්‍යන්දනය නොකරනකල්හි-
"ස්‍යන්දූ-ශ්‍රවණෙ" යන ධාතුයි. සන්න, සන්හුන්; කලෙලාල, රළ
ඇති; ජලනිධිසු, සමුද්‍රයන්; මධුර, මිහුරු; සලිල, දියෙන්; කලි
ලෙසු, මනොඥකල්හි; කාක, කවුඩුවන්හා; උලූකෙසු, බකමූහුණු
වන්; සොණ, බල්ලන් හා; හරිණෙසු, මුවන්; නවනාට්‍යරසො
පෙතං,

"ශෘඞ්ගාරවීරබීභත්සරෞද්‍රහාස්‍යභයානකාඃ
කරුණාද්භුතශාන්තාශ්ච නවනාට්‍යරසාඃ ස්මෘතාඃ" යි

කියනලද නවනාට්‍යරසයෙන් සමුපෙතවූ; සලීලං, ලීලාසහිතවූ;
පඞ්ගුලනච්චං, පිළ්න්ගේ නැටුම්; සත්තසරොපෙතං,

මධ්‍යමර්ෂභගාන්ධාරෂඩ්ජපඤ්චමධෛවතාඃ
නිෂාදඃ සප්තමොඥෙයස්තන්ත්‍රිකණ්ඨොත්ථිතාඃ ස්වරාඃ" යි.

කියනලද සප්තස්වරයෙන් සමුපෙතවූ; සගාමරාගං, ග්‍රාමරාග
සහිතවූ; මූගගීතිකං, මූගයන්ගේ ගීතිකා; සකල, සියලූ; නිබ්බුත,
නිවියාවූ; අපායදහන, නරකාග්නිඇති; නරකමණ්ඩලෙසු, නිරැ
මඬුලූවන්; මධුරජල, මිහුරුදියෙන් හා; කමලසණ්ඩ, පියුම්වෙ
ගතන්; මණ්ඩිතෙසු, සැදුම්ලදකල්හි; පෙතෙසු, ප්‍රෙතයන්; දිබ්බා
ජානිලං, දිවඹතැලි; උග්ඝිරන්තෙසු, නගනකල්හි; සකුණෙසු, ලිහි
ණියන්; ගගනගමනං, අහසින් යන ගමන්; පහාය, පියා; අවනි
තලං, පොළෝපිටුහි, අවරන්තෙසු, හැසිරෙනකල්හි; සත්තෙසු,
සත්වයන්, විගත, අපගතවූ; භය, බිය හා; රොග, ව්‍යාධි හා; සිසිර,
සිහිල් හා; පරිළාහෙසු, පරිදාහයන් ඇතිකල්හි; ජිතනාසු, කඩ
කඩව ගියකල්හි; සකලසංබලිකාසු, සර්වශෘඞ්ඛලාවන්; තිභුවන,
තුන්ලොව; භවන, විමන්හි; වාරකවාටෙසු, දොරකවුළුවන්; සයං
යෙව, තමන්ම; විවටෙසු, විවෘතකල්හි; අසෙසජන්තුසු, සර්වසත්ව
යන්; පියං වදන්තෙසු, ප්‍රිය කොට බණනකල්හි; තුරගෙසු, අශ්ව
යන්; මධුර, මිහුරුවූ; හෙසාරවං කරොන්තෙසු, හෙෂාරව කරන
කල්හි; කුඤ්ජරෙසු, හස්තීන්; අතිගජ්ජන්තෙසු, අතිශය කොට
ගර්ජනා කරනකල්හි; කෙසරීසු, කෙශරසිංහයන්; අභිනදන්තෙසු,

වෙසෙස් කොට නාදකරනකල්හි; අවාදිත, නොවයනලද; තුරියෙසු, පඤ්චාඞ්ගික තූර්‍ය්‍යයන්; සකසකනිනනාදං, තමන් තමන්ගේ හඬ; මුඤ්චන්තාසු, විහිදුනාකල්හි; අඝට්ටිත, නොසැලෙනලද; පරිරාභරණෙසු, කනකවලයරසනානූපුරාදී ශරීරාභරණයන්; මධුරරවං, මියුරු හඬ; දෙවතාසු, දෙව්නළුන්; දිබ්බසඞ්ගීතං කුරුමානාසු, දිව්‍ය නෘත්‍යගීතවාද්‍යවංශලක්‍ෂණ චතුරඞ්ගසඞ්ගීත කරනකල්හි; සුපුප්ඵෙසු, යහපත්ව පිපිකල්හි; තරුලතාගුම්බෙසු, වෘක්‍ෂලතාගුල්මයන්; ජලථලසිලාතලානි භින්දිත්වා, ජලතල මහීතල ශිලාතලද බිඳ; උපරූපරි, මතුමත්තෙහි; සත්ත සත්ත හුත්වා, සත් සත්වැ; විචිත්තපඤ්චවණ්ණෙ, විචිත්‍රවූ පඤ්චවර්ණ ඇති; පදුමෙසු, පදුමයන්; නික්ඛමන්තෙසු, නික්මෙනකල්හි; අධොමුඛ, කබ්සිනිවූ; කමලෙසු, පද්මයන් ඇතිකල්හි; පදුමවිතානෙසු, පියුම්විතානයන්; පවනපථෙ, ආකාශයෙහි; විතතෙසු, වැසීසිටිකල්හි; සමන්තතො, හාත්පස්හි දසදහසක් සක්වළ; දිබ්බපුප්ඵෙසු වස්සමානෙසු, දිව්‍ය පුෂ්පවර්ෂ කරනකල්හි; ආකාසෙ, දසදහසක් සක්වළ ආකාශයෙහි; දිබ්බතූර්‍යෙසු, දිව්‍ය තූර්‍ය්‍යයන්; වජ්ජමානෙසු, වාද්‍යමානකල්හි.

මෙහි එකපැහැර දශසහස්‍රිලොකධාතු කම්පිතවනු සර්‍වඥතාඥානප්‍රතිලාභයට පූර්‍වනිමිත්තයැ. ලොකාන්තරනරකයෙහි අන්ධකාර විධ්වංසනවනු අවිද්‍යාන්ධකාර විධමනුවට පූර්‍වනිමිත්තයැ. සියලු දශදිශා ප්‍රසන්නවනු ඥානාලොක දක්වන්නටයැ. සඳහු අතිශය වැ දිලියෙනු බොහෝ ජනයහට කාන්තවනබවටයැ. සූර්‍ය්‍යයා මඳ මෙළෙක් රස් විසිරමින් දිලියෙනු කයට සිතට සුව වනබවටයැ. තාරාගණයන් දිලියෙනු විනෙයජනයන් සොම්නස් වනබවටයැ. සුවඳමෙළෙක් සිහිල් සුළඟ හමනු ක්ලෙශපරිදාහ නිවනුවටයැ. සතරද්වීපයෙහි එකපැහැර වර්ෂ කරනු ධර්මමෙඝවර්ෂයටයැ. ගඞ්ගානදීන් ස්‍යන්දන නොකරනු චතුවෛශාරද්‍යප්‍රතිලාභයටයැ. සමුද්‍රයෙහි දිය මධුරවනු නිර්‍වාණරසයෙන් එකරස වනුවටය. විදෙශයට ගිය නෞකාවන් ස්වදෙශයට එනු සතර ප්‍රතිසංවිත්සමධිගමයටයැ. කාකොලූකාදී වෛරිසත්වයන් ඔවුනොවුන්කෙරෙහි මෛත්‍රී කරනු සතරබ්‍රහ්මවිහාරප්‍රතිලාභයටයැ. අන්ධයන් රූපදර්ශනය කරනු දිව්‍ය චක්‍ෂුඃප්‍රතිලාභයටයැ. පඞ්ගුලයන් ගමනය කරනු චතුරෘද්ධිපාදවෙගයටයැ. බධිරයන් ශබ්දශ්‍රවණය කරනු දිව්‍යශ්‍රොත්‍රප්‍රතිලාභයටයැ. මූගයන් ගායනා කරනු සද්ධර්මදෙශනාවටයැ. නරකයෙහි ගිනි නිවෙනු එකාදශකාමාග්නි නිවෙනුවටයැ. ප්‍රෙතයන් දිව්‍ය භොජනයෙන් තෘප්තයන් සෙයින් පිනායාම කායගතානුස්මෘති සංඛ්‍යාත අමෘතප්‍රතිලාභයටයැ. ශකුනීන් ආකාශගමින් පියා පොළොව්තෙලෙහි සඤ්චරණය කරනු අවවාද ලද ජනයන් ප්‍රාණයෙන් සරණ යනුවටයැ. සත්නට භය රොග ශිශිර පරිදාහ නොවනු

චතුස්සත්‍යප්‍රතිලාභයටයැ. ශෘඞ්ඛලා ඛණ්ඩිතවනු අසම්මානසමුවේජ දයටයැ. දොරකවුළු විවෘතවනු අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි දොර විවර කරනුවටයැ. හැම සතුන් ප්‍රීතිකොට බණනුද අශ්වයන් මධුර කොට හෙෂාරව කරනුද ඇතුන් ගර්ජනා කරනුද කෙශරින් සිංහ නාද කරනුද දෙවියන් දිව්‍යසඞ්ගීති කරනුද බුදුබවට පැමිණ උදන් උදනු කරනුවටයැ. නොවයන්ලද තූර්‍ය්‍යයන් ධ්වනි විහිදුනේ මහත් ධර්මභෙරිශ්‍රවණයටයැ. නොසොල්වනලද ශරීරාභරණයන් හඬනු නවානුපූර්විහාරසමාපත්තිලාභයටයැ. වෘක්ෂලතාගුල්මයන් සුපුෂ් පිතවනු විමුක්තිපුෂ්පයෙන් සුපුෂ්පිතවනබවට පූර්වනිමිත්තයැ. සෙසු ප්‍රාතිහාර්‍ය්‍යයෝ සෙසු බුද්ධගුණප්‍රතිලාභයට පූර්වනිමිත්තයෝයි.

සකලලොක, සියලුලෝවැසියන්ගේ; හදයානන්දකාරි, හෘදයට ආනන්දජනකවූයේ; සුප්පතිඨිතපාදතලෙහි, සුපිහිටිපත්ලෙන්; ධරණීතලං, මහීතලය; "ධඤ්ඤතරමකාසි" යි යොදනු. පවිත්‍ර කෙළේයැ යුසේයි.

ධරණීධර, ගිරිරාජසදෘශ; ධීර, නිර්විකාරය; වීර, පරාක්‍රම ඇති යව; වරචක්ක, උත්තමචක්‍රලක්ෂණයෙන්; විචිත්ත, විසිතුරුවූ; තෙ, තාගේ; පාදතලසම්ඵස්සං, පතුල්තලපහස්; යා ධරණී, යම් පෘථිවි යක්; අලත්‍ථ, ලද්ද; සා, හෝ; වත, ඒකාන්තයෙන්; අතිධඤ්ඤා, ඉතා පින්ැත්තී.

සො යන මෙයින් "යො දයාසීතලමානසො" යන්නෙන් යමෙක් නිර්දිෂ්ටද හෙම කියනුලැබේ—සරදකාල, සරාකල්හි; නිම්මල, නිර්මලවූ; චන්දමණ්ඩලො විය, සඳමඬලක් සෙයින්; ජන, මහාජන යාගේ; නයන, ඇසට හා; චෙතො, සිතට; රසායනො, රසයින් වූයේ; සුකතසත, ශුභකර්මශතයන්විසින්; සුවිහිත, සුසං විධානකරනලද; බහුවිධ, බහුප්‍රකාර; ලක්ඛණ, ද්වාත්‍රිංශන්මහා පුරුෂ ලක්ෂණයෙන් හා; අනුබ්‍යඤ්ජන, අශීත්‍යනුව්‍යඤ්ජනයෙන්; පති මණ්ඩිත, සැදුම්ලද; දෙහො, ශරීරසම්පත් ඇතියේ; පසාදවනත, ප්‍රසාදයෙන් අවනතවූ; අනෙකසතසහස්ස, නොයෙක් ලක්ෂ; බ්‍රහ්ම, බඹුන්ගේ; සුර, දෙවියන්ගේ; අසුර, දානවයන්ගේ; උරග, නාග යන්ගේ; කින්නර, දිව්කිඳුරන්ගේ; නර, මනුෂ්‍යයන්ගේ; මෞලි මාලා, මුහුළුපෙළින්; අලඞ්කත, සැදුම්ලද; චරණයුගලො, පාදයුගල ඇතියේයි; පසාදවිම්හය, ප්‍රසාදයෙන් හා විස්මයෙන්; අපුණ්ණ, පුරනලද; බුද්ධ, නුවණඇති; විබුධමනුජසත, දිව්‍යමනුෂ්‍යශතයන් විසින්; අභිගීයමාන, ගායනාකරනලද; ධුනිවචනො, සෙත්තුවචන ඇතියේ; සරද, සරාකල්හි; රජනිකර, සඳහටද; සහස්සරංසි, හිරු හටද; අපහාස, අපහාසඇති; කන්ති, පැහැ; තෙජො, තෙජ ඇති යේ; කුලිසසහස්සදුල්ලභසාරභාවො, මෙරුමන්දරාදීන් ක්‍ළිල්සෙයින් කඩන්නට සාමර්ථ්‍ය ඇති වජ්‍රායුධයන් කෙරෙහි මොනු හා සම ඝන

බහල මහාඅවිද්‍යාදිවස්තූන් කඩන්නට සාමර්ථ්‍ය නොවනබැවින් වජ්‍රායුධසහස්‍රයෙක්හිදු දුර්ලභවූ සාරත්‍ව ඇතියේ; ගගනතල, ආකාශදෙශයක් සෙයින්; නිබ්බිකාරො, විකාරනැතියේ; සලිලනිධි, සමුද්‍රය සෙයින්; ගම්භීරො, ගැඹුරුවූයේ; සම්පත්ත, සම්ප්‍රාප්තවූ; සකලපාරමිතා, සර්වපාරමිතා නමැති; මහණ්ණවපාරො, මහාර්ණවයෙහි පාරඇති; කාරුඤ්ඤම්ව, කරුණාරාශියක් වැන්න. දෙහබද්ධො, මූර්තිමත්; අභිනීහාරාතිසය, අභිනීහාරවිශෙෂයෙන්; පරිපාකලාභී; පරිපාකලද; කුසලසම්භාරභරිත, කුශලසම්භාරයෙන් භරිතවූ, සන්තානවිසෙසො, සන්තානවිශෙෂ ඇතියේ ආවාසොව, ආවාසයක් වැන්න; ගුණානං, ගුණයනට; නිවාසොව, නිවාසයක් වැන්න; ධම්මසරීරස්ස, ධර්මශරීරයට; දිවසකරොව, සූර්‍ය්‍යයා වැන්න; මොහන්ධකාරවිධමනස්ස, මොහනමැති අන්ධකාරයාගේ විධ්වංසනයට; චක්ඛුරිව, ඇසක් වැන්න; සබ්බලොකස්ස, සියලුලොකයහට; පවාහො, ප්‍රවාහය; කරුණාරසස්ස, කරුණාරසයාගේ; රස ශබ්දයෙන් දිය කියත්. සන්තරණසෙතු, සන්තරණයට සෙතුය; සංසාරසින්ධුස්ස, සංසාරජලනිධිහුගේ; ආධාරො, ආධාරය; කරුණාජලස්ස, කරුණාජලයහට; සාගරො, සමුද්‍රය; සන්තොසාමතස්ස, සන්තොෂසංඛ්‍යාත අමෘතයට; අමෘතශබ්දයෙන් දිය කියත්. උපදෙසකො, උපදෙශකය අඛ්‍යාතෘය; සිවමග්ගස්ස, නිර්වාණමාර්ගයට; නාභි, නාභිය; පඤ්ඤාචක්කස්ස, ප්‍රඥානමැති චක්‍රයාගේ; උස්සිතවංසො, උච්ඡිතවංශය; ධම්මද්ධජස්ස, ධර්මනමැති ධ්වජයහට; ඵරසු, පොරොව; තණ්හාලතාගහනස්ස, තෘෂ්ණානමැති ලතාගහනයහට; වළභානලො, වළභාමුඛයෙන් නැඟි ගිනිය; ලොභඅණ්ණවස්ස, ලොභනමැති අර්ණවයට; මහාමන්තො, මහමතුරු; කොධභුජඞ්ගමස්ස, ක්‍රොධනමැති නාගරාජයහට; දවානලො, ලැව්ගිනිය; රාගපල්ලවස්ස, රාගනමැති පල්ලවයට; පභවො, උත්පත්තිස්ථානය; පුඤ්ඤසමයස්ස, පුණ්‍යරාශියට; බ්‍රහ්මුනා, මහාබ්‍රහ්මයාවිසින්; සුයාමවිබුධාධිපෙන, සුයාම නම් දෙවරාජයාවිසින්; විජම්භමාන, පුබුදුවන; කමලකොස, මහනෙල්ගැබ්හි; පරිමල, සුවඳයෙන්; මනොහරෙන, මනොඥවූ; සහජ, ඉහිඳ; ආනන, මුහුණෙහි; ආමොදෙන, පියගඳින්; සකලභුවනතලං, මුළුලෙව්; පරිවාසෙන්තො, පරිවාසිතකරනුයේ; නව, අලුත්; නීර, දියෙන්; භාර, බරවූ; ගම්භීර, ගැඹුරුවූ; ජලධර, මෙඝයන්ගේ; ධනිතිහං, හඬබඳුවූ; සධීරං, අනොපෘවූ; ගිරං, තෙපුල්; තදනන්තරං, සිංහනාදකළ ඉක්බිත්තෙන්; ජලනිධිඝොස, සමුද්‍රඝොෂ බඳු; ගම්භීරං, ගැඹුරුවූ; දුන්දුභිධනි, තුන්දුභිඝොෂයෙන්; පුරස්සරෙන, පූර්වසර කොට ඇති; ප්‍රධාන කොට ඇතියේය යූෂ්යයි. මඞ්ගලපටහ, මඞ්ගලපටහයෙහි; පටු, ව්‍යක්තවූ; රව, හඬින්; සංවඩ්ඪිතෙන, සංවර්ධිතවූ; අනෙකජනසහස්ස, අනෙකජනසහස්‍රයන්ගේ; කලකලබහලෙන, කලකලයෙන් බහලවූ;

උස්සවකොලාහලෙන, උත්සවකොලාහලයෙන්; තිභුවනං, තුන්
ලොව; ආපූරයන්තො, පුරනුයේ; චරණපාත, පාදනිපතනයෙන්
හා අවපතනයෙන්; රණිත, හඬනලද; නූපුරසහස්ස, නූපුරසහස්‍ර
යන්විසින්; මුඛරිත, බණනලද; දසදිසෙන, දශදිශාඇති; සරභස
ගති, ශීඝ්‍රගමනින්; චලිත, කම්පමානවූ; ලොල, අඬනවූ; හාරලතා,
මුක්තාහාරලතායෙන්; සමප්ඵොඨිත, අස්ඵාලනා කරනලද; පහර
නාලද; කුචඵලෙන, කුචඵලඇති; සරභස, වෙලෙව්වූ; උක්ඛෙප,
උත්ක්‍ෂෙපණයෙන්; චලිත, ඇලලෙනලද; මණිවලයාවලි, මිණි
වලයමාලායෙන්; වාචාලිත, හඬනුවූ; භුජලතෙන, හස්තලතාඇති;
වීණා, වෙණෙහිද; වෙණු, වංශයෙහිද; මුරජ, මෘදඞ්ගයෙහිද; කංස
තාල, කංසතාලයෙහිද; ලයානුගතෙන, ලය අනුව යනුවූ; මධුරගීති
කා ගායමානෙන, ගායමාන මධුරගීතිකාඇති; නච්ච, නෘත්‍යයෙහි
හා, කීලා, ක්‍රීඩායෙහි; පසුතෙන, ප්‍රසෘතවූ; ප්‍රවෘත්තවූ; මායාදෙවිපරි
ජනෙන, මහාමායාදෙවීන්ගේ පරිජනයන්විසින්; අනුයාතො, අනු
ගතවූයේ; චලිත, කම්පමානවූ; මණිකුණ්ඩල, මණිමයකුණ්ඩලයන්
ඇවිසින්; ආහත, පහරනලද; කපොලතලෙන, කොපොල්තල
ඇති; භම්මාන, භ්‍රමිත්වූ; සවනුප්පලෙන, කර්ණොත්පලඇති; අංස
විගලිත, අංසවිගලිතවූ; විලොල, ලෙලදෙන; සෙඛරෙන, කඬාමල්
කඩඇති; නිද්දය, කැකුළුකොට; ආහත, පහරනාලද; මුදිඞ්ගමණ්ඩල
පටහකාහලසංඛරව, මෘදඞ්ගාදීන්ගේ රවයෙන්; ජනිතගම්නෙන,
දනවනලද ගමන්ඇති; පවත්තනච්චන, ප්‍රවෘත්තවූ නෘත්‍යඇති;
රාජලොකෙන, මහීපාලයන්විසින්; අනුගතො, අනුයාතවූ; ගායමා
නෙන, ගායන්වූ; වග්ගමානෙන, වල්ගන්වූ; නාටකගණෙන, වාර
ගණයන්විසින්; අනුගම්මමානො, අනුගමෘමානවූයේ; සසාමන්තං,
සාමන්තජනයන් සහිතවූ; සඅන්තෙපුරං, අවරොධජනයන් සහි
තවූ; සරාජපරිජනං, පෙදෙසිරජුන් සහිතවූ; සබාලවුඩ්ඪං, ළදරු
මහල්ලන් සහිතවූ; සනාගභුජගාසනං, නාගසුපර්ණයන් සහිතවූ;
සසුරාසුරං, දෙවදානවයන් සහිතවූ; සමහීසාගරං, පොළෝ මුහුදු
සහිතවූ; සමෙරුයුගන්ධරං, මෙරුයුගන්ධරසහිතවූ; ලොකං, ස්ථාවර
ජඞ්ගමලොකයා; නච්චාපෙන්තො, නෘත්‍යය කරවනුයේ; නව,
අලුත්; සුධා, සුනුවමින්; අවදාත, ධවලවූ; පාසාදසත, පහාසියෙන්;
නිරන්තරං, අතුරුනැති; මණිමය, මිණිමුවා; මඞ්ගලකලසයුගලි,
මඞ්ගලකලසයුගලයෙන්; උපසොභිත, හොබනාලද; වාරපදෙසං,
දොරසමීපඇති; විවිධ, නානාවිධවූ; නවපල්ලවනිවහ, නවපල්ලව
පරම්පරායෙන්; නිරන්තර, අතුරුනැති කොට; නිචිතං, සදනලද;
උල්ලාසිත, උද්දීපතවූ; පතාකාසහස්සං, පතාකාසහස්‍රයන්ඇති; සාමා
වසීත, සාමාවසීතවූ; යම්හි යම්හි නහවා සදා පාදා ඇර සිටුවනලද;
විවිධගජඝටා, නානාවිධහස්තිපඞ්ක්තීන්; සඞ්කටං, ගහනවූ; අනෙක
තුරගසහස්ස, නො යෙක් අශ්වසහස්‍රයන්විසින්; සම්බාධං, ඝනී

භූතවූ; අපරිමිතජනසමූහ, අපරිමාණ ජනසමූහයාගේ; සම්මද්දසඞ්කුලං, සම්මර්දයෙන් සඞ්කුලවූ; රාජකුලං, නරපතිකුලයට; සනරාමරලොකෙන, දිව්‍යමනුෂ්‍යයන් සහිතවූ ලොකයාවිසින්; අභිනීතො, ප්‍රාප්තවූයේ; අන්තෙපුරවර, අන්තඃපුරයෙහි සඤ්චාරණ කරන; වාරවිලාසිනී, වාරවිලාසිනීන්විසින්; කුරුමාන, සංවිධාන කරනලද; අවතරණමඞ්ගලො, ගෙවදනා මඟුල් ඇතියේ; මඞ්ගලප්පදීපො විය, මඞ්ගලප්‍රදීපයක් සෙයින්: අසෙසජනවන්දනීයො, සර්වජනයන් විසින් ප්‍රණම්‍යමානවූයේ; සහජභූසනෙහි විය, සහජභූෂණ බඳු; මහාපුරිසලක්ඛණෙහි උපෙතො, මහාපුරුෂලක්‍ෂණයෙන් සමුපෙතවූයේ; විජ්ජුලතාහි විය, විදුලියෙන් මෙන්; විරචිතාවයවො, විරචිතවූ අවයව ඇතියේ; පාදතලකමලයුගලෙන, පාදතල නමැති රක්තපද්මයුගලයෙන්; කාලදෙවලඉසිසිසං, කාලදෙවලනම් ඍෂීන්ගේ සිරස; අලංකරිත්වා, සදා; චරණතලපදුම්රාගරතනරංසිනා, චරණතල නමැති පද්මරාගමණිරශ්මීන්; පිතුමකුටමණිනිකරං, පියරජහුගේ චොටුනුම්ණිරුස්; ඔභාසෙත්වා, උද්දීපන කොට; මෙසින් ඍෂිහුද පියරජහුදු මහාපුරුෂයා පතුල් තමන් මුදුනේ තබා වැඳිපරිද් දැක්වූහු.

චන්දොදයෙන, සඳඋදයසින්; ජලනිධිම්ව, ඔද වඩනා මුහුද සෙසින්; කලකලම්බරං, කලකලයෙන් මුඛරිතවූ; මහන්තං උස්සවං, මහත් උත්සව; පතිදිනං, ප්‍රතිදිනයෙහි; දවස දවස; පවඩ්ඪෙන්තො, වඩනුයේ; සුක්කපක්ඛ, ශුක්ලපක්‍ෂයෙහි; පෙර අඩමස; අභිවඩ්ඪමාන, වඩනාලද; චන්දමණ්ඩලානුකාරෙන, සඳමඬලක් සෙසින්; වඩ්ඪෙන්තො, වඩනේ; සත්තවස්සිකකාලෙ, සත්හැවිරිදිකල්හි; සත්තරතනමයං, සප්තරත්නමයවූ; සහස්සවඞ්කං, දහසක් වක් ඇති; සතතිත්ථං, සියක් තොට ඇති; රතනවාලුකා, රුවන්වැල්ලෙන්; ආකිණ්ණ, ගැවසීගත්; තීරලෙඛං, තීරලෙඛාඇති; අතිමධුර, ඉතා මියුරුවූ; සීතල, සිහිල්වූ; අමල, නිර්මලවූ; ජල, දියෙන්; සම්පුණ්ණං, සම්පූර්ණවූ; සුඵුල්ල, සුපිපි; කුමුද, කුමුදුමල් හා; කුවලයං, මහනෙල්මල් ඇති; දිබ්බමයං, විශ්වකර්මනිර්මිත වනබැවින් දිව්‍යමයවූ; පොක්ඛරණිං, පුෂ්කරිණියට; අසෙස, සියලු; වසුමතීපති, නොයෙක් රජුන්ගේ; මකුටපීඨ, චොටුනුපිළිහි; පතිට්ඨිත, පිහිටි; චරණෙ, පාදතල ඇතියේ; අසදිසාභිසෙකං, අසදෘශවූ රාජාභිෂෙකයට; පාපුණි, සම්ප්‍රාප්තවී; විජිත, පරදවනලද; මකරකෙතුරූපො, මකරධ්වජයාගේ රූප ඇතියේ; පිතුනිවෙදිතං, පියරජු විසින් දත්වනලද; කුමාරො, සිද්ධාර්ථකුමාර; පරම්සුඛුමාලො, අත්‍යන්ත සුකුමාරය; රාජනිචයවචනං, රාජබන්ධුයාගේ වචන; සන්නිහිත, රැස්වනලද; මහාජනසමූහො, මහාජනකාය ඇතියේ; නෙක, නොයෙක්; නරපතිසහස්ස, රජදහසුන්ගේ; මජ්ඣවත්ති, මධ්‍යගතවූයේ; කුලාචල, කුලපර්වතයන්ගේ; මජ්ඣගතො, මධ්‍යවර්තිවූ;

**කනකසිඛරි** විය, රුවන්මෙරහු බඳුවූයේ; අනෙක, නොයෙක්; රතනාභරණ, රුවන් අබරණනි; පභාජාල, රැස්දුලින්; පරිවජ්ජිත, පිළිසන්වූ; අවයවො, අඞ්ගඇතියේ; ඉන්‍දුවූධසහස්‍ස, දෙව්දුනුදහසින්; සඤ්ජාදිත, පවජාදනා කරනලද; දසදිසො, දශදිශාඇති ජලධරසමය, විහරේකල්හි; දිවංසා ඉඃ; දවසක් බඳුවූයේ; අමල; නිම්මලවූ; මණිභූමි, මිණිවන්බිම්හි නොහොත් පිනිත් උපන් මිණ්බිම්හි; දිස්සමාන, දිස්නාලද, පටිබිම්බනාය, පිළිබිඹුඇති වන බැවින්; පතිසිනෙහෙන, ස්වාමිය යන සෙනහයෙන්; මහිස, මිනිවම්යවිසින්; හදයෙනෙව ධාරියමානො, ලෙත් උසුලනවන් වූයේ; උබ්බූයමාන, සලනලද; කනකදණ්ඩ, රුවන්දඬුඇති; චාමරකලාපො, සෙමෙරවල්කලඹ ඇතියේ; අපරිමිත, අපමණවූ; පරිජනොපි, පරිජනයන් ඇතියේද; අදුතියො, හුදකෙළේ; තමාවැනි අනිකක් නැතිවනබැවින්; අක්ඛණවෙධාදයො, අක්‍ෂණවෙධි ඈ.

ආදිශබ්දයෙන් වාලවෙධි ශබ්දවෙධි ශරවෙධිය යන තුන් ධනුර්ධරයෝ ආක්‍ෂිප්ත වෙත්. එහි අකුණුපහනැ ලක දක දුන්නෙහි ශරය හිඳුවා ඇද ඒ අලොකය තිරොහිත නොවනතුරු ඒ ලක විදිනේ 'අක්‍ෂණවෙධි' නම් වෙයි. සියක්දුනුපමණ තැන්හි සිට කරබවූපක සලකුණෙන් අස්වල් පළා විදපියනුයේ 'වාලවෙධි'නම් වෙයි. රජස් තමස් හිම ධූමයෙන් ප්‍රච්ඡන්නවද සිට ශබ්දයාගේ උත්පත්තිස්ථානයෙක්හි පුෂ්පදෙව දශරථාදීන් සෙයින් විදපියනුයේ 'ශබ්දවෙධි' නම් වෙයි. ලක්‍ෂගතශරයාගේ පූර්වයෙහි පටන්ගෙන පුඩ්ඛානුපුඩ්ඛ කොට ශරපරම්පරාවක් තමා සිටි තැන් දක්වා විද නිමාම්සැර යෙහි පුඞ්ඛය අතින් ගෙන සිටිනේ 'ශරවෙධි' නම් වෙයි—ධනුගගහෙ පකොසාපෙත්වා,

> "විවජ්ජනො විජානාති විවාංසං නෙතරෙ ජනාඃ
> නහි වන්ධ්‍යා විජානාති ගුර්විප්‍රසවවෙදනාම්"

යුබැවින් තමාගේ ධනුශ්ශිල්පයෙහි විශෙෂ දන්නා චතුර්විධ ධනුර්ධරයන් කැඳවාගෙන.

**සහස්සත්ථාමං සරාසනං** යන තන්හි සහස්‍රස්ථාමවූ දුනුනම් දහසක්දෙනා එකවටගෙන අදනෙන් කියනදෙයක් නොවෙයි එදුන්නෙහි දිය නගා මධ්‍යමපුරුෂයත් දහසක්දෙනා උසුලනපමණ සිහිවල්පලුඈ කිසි කවර භාරයක් දුනුදිය මැද බැඳ දුනුම්ට ගෙන අහසට නගනකලැ ශරයක් හිඳුවා අදනාපමණ නැමෙත් මිස එසින් වඩා නොනැමී එබර ගෙන අහසට නැගෙන දුන්න ගෙන කියේ-ශරා අස්‍යන්ත්‍යනෙනෙති ශරාසනම්. "අසු-ක්‍ෂෙපණෙ"යන ධාතුසිකප්පාසික, කපුවම් කරන ස්ත්‍රියගේ; චාප, දුන්නෙනි; ගුණංවිය, දියක් සෙයින්; මෙහි ගුණශබ්ද චාපබන්ධනයෙහි වැටේ. අසනිසහස්‍ස, සෙණදහසක්හුගේ; ඝොස, හඬ සෙයින්; ඝංසනෙන,

භයානකවූ; ජීයාරවෙන, දියඝොෂයෙන්; කම්පමානං විය කාඩ්ඩා, කම්පිතව චලිතව ඉපිර යනුවන් කොට දක්වා.

තුණ්හීරස්ස මුඛං තුණ්හීර මුඛං, ධනුස්ස ගුණං ධනුගුණං, එතෙසං අනන්තරෙ ගමනඤ්ච ආගමනඤ්ච ගමනාගමනං, සන්ධානඤ්ච මොක්ඛො ච සන්ධානමොක්ඛො, එතෙසු ඨානෙසු අවිභාවිතං කරතලං යස්ස සො අවිභාවිතතුණ්හීරමුඛධනුගුණගමනාගමනසරසන්ධානමොක්ඛ කරතලො — මෙහි අකර්ෂණ සන්ධාරණ ඇතිකල්හි මොක්ෂ ඇති බැවින් එදෙක එහිම අන්තර්භූත වේ. එබැවින් ආදානය සන්ධානය ආකර්ෂණය සන්ධාරණය මොක්ෂය යන මේ පඤ්චස්ථානයෙහි අවිභාවිතවූ අදෘශ්‍යමානවූ කරතල ඇතියේයැ යුෂේයි. මෙහි ‘ආදාන’ නම් හියවුරෙන් හී ගැන්මයැ ‘සන්ධාන’ නම් එ හීය දුනුදියෙහි සිඳුවීමයැ ‘ආකර්ෂණ’ නම් දුන්න ඇදීමයැ ‘සන්ධාරණ’ නම් දෘශ්‍යමානවූ ලක බලා හැම්මීමයැ ‘මොක්ෂ’ නම් ශරය ගැලවීමයැ මේ පඤ්චස්ථානයෙහි අවිභාවිතවූ කරතල ඇතිපරිදි දක්වන්නට කීහ “අවිභාවිත —පෙ—කරතලො”යි.

උසුවෙග, ශරවෙගයෙන් නැඟි ධවනි මැ; මෙඝනාදෙහි, මෙඝධවනි ඇති; සරතලප්පභා, ශරතලයෙහිම ප්‍රභා; විජ්ජු ජාලෙහි, විදුලිසදල් ඇති; ගගනකුහරපරිපූරිත, අහස්කුස් පුරනලද; සරවාරිධාරාසහස්සෙහි. ශර මැ ජලධාරාසහස්‍රයන් විසින්; ජලධරදිවසායමානානි, වහරේදවසක් බඳුවූ; සිඤ්ජානි යනු හා සබඳ—නභසි, අහස්හි; දස්සිතානි, දක්වනලද: උසුපදුම, ශරපද්මයෙන්; සමුජ්ජල, දිලියෙනුවූ; බාණකමලිනිහි, ශරපුෂ්ප කමලිනීන්විසින්; සරදද්වසායමානානි, සරදසමයක් බඳුවූ; අබ්භු ගතානි, ඉතා උස්වූ; සරසොපානමාලාහි, ශරමය සොපානමාලා යෙන්; සගගමගායමානානි, ස්වර්ගලොකයට යන මාර්ගබඳුවූ; සුවිභත්ත, සුප්‍රවිභක්තවූ; විවිධ, අනෙකප්‍රකාරවූ; විචිත්තෙහි, විචිත්‍රවූ; සරපාසාදමණ්ඩපෙහි, ශරප්‍රාසාදයෙන් හා මණ්ඩපයෙන්; සගගනගරායමානානි, ස්වර්ගපුරය බඳුවූ; තිභුවනවිම්හාපනීයානි. අසදෘශ නම් රජකුමරකල්හි සෙයින් ත්‍රිභුවනවිස්මාපනීයවූ; අනෙක විධසිප්පානි, ජොතිපාල නම් මණෙව්කල්හි සෙයින් අනෙකවිධ ශිල්පයන්; චතුරඞ්ගසමන්නාගත, චතුරඞ්ගයෙන් සමන්වාගතවූ; තිමිරන්කරෙ, අඳුරුරැස්හි; යොජනබහල, යොදුන්බොල්; කුලි සාවලපාරනිහිත, විදුරුගලින් එපිට තුබූ; සාසපදස්සනසම්ත්ථ, සිදුහනු දක්නට නිසි; පසාදචක්ඛුන්නා, පියවි මසැස් ඇතිවනබැවින්

එයින් කීහ නිද්දෙස් පෙළැ-

“යථා ච චතුරඞ්ගසමන්නාගතො අන්ධකාරො හොති සුරියො ච අත්ථඞ්ගතො හොති කාළපක්ඛො ච උපොසථො හොති තිබ්බො ච ඝන වනසණ්ඩො හොති මහා ච කාළමෙඝො අබ්භුට්ඨිතො හොති එවරූ

පෙපි චතුරඞ්ගසමන්නාගතෙ අන්ධකාරෙ සමන්තා යොජනං පස්සති නත්ථි සො කුඩ්ඩො වා කවාටො වා පාකාරො වා පබ්බතො වා ගච්ඡං වා ලතා වා ආවරණං රූපානං දස්සනාය" යි.

යොජනඝාතෙ ඨිත, යොදුනක් තුබූ; වාලං විජම්භිත්වා, අස්වල නොකඩකොට විද පළා; ඒකවික්කමක්කන්ත, ඒකවික්‍රමයෙන් ආක්‍රාන්තවූ; සකලභුවනතලො, සියලු භූලොක ඇතියේ; නීතානං, පමුණුවනලද; "ණීඤ්-ප්‍රාපණෙ" යන ධාතුයි. සඳදෙනලදහ යුජේයි. තමාලනීල, තමලූලීයකලප්සෙයින් නිල්වූ; සුඛුම, සියුම්වූ; සුරභි, සුගන්ධවූ; කෙසපාසානං, කෙශසමූහ ඇති; පරිපුණ්ණරජනිකර, පුන්සඳසෙයින්; සොම්මවදනානං, සොම්මුහුණු ඇති; විකසිත, සුපිපි; නීලනීරජ, නිල්මහනෙල්සෙයින්; අභිරාම, මනොහරවූ; ලොචනානං, ඇස්ඇති; ඉන්දචාපකුටිල, දෙව්දුනුසෙයින් වක්වූ; නීලභමුකානං, නිල් බැම ඇති; බන්ධුජීවකදල, බඳුවදමල්පෙති සෙයින්; පාටල, රත්වූ; දසනවසනානං, දන්තාවරණ ඇති; කනක කුණ්ඩල, රන්කොඬොලින්; මණ්ඩිත, සැදුම්ලද; ගණ්ඩානං, කොපොල්තල ඇති; කුවකනකහංස, තනරන්හසුන්ගේ; සඞ්ගමාගත, සඞ්ගම සඳහා ආගතවූ; ගගනගඞ්ගානීරධාරාවිරාජිත, ආකාශගඞ්ගාවගේ ජලධාරා සෙයින් විරාජිතවූ; රුචිරහාරානං, මනොඥවූ මුක්තාහාර ඇති; ලොම, වසාරාජි නමැති; ලතා, ලියව; ආලවාලකෙත, තෝතැන්බඳුවූ; මණිකනකමෙඛලාදාමෙන, මණිකනකමය මෙඛලාදාමයෙන්; පරිගත, වටාසිටි; විසාලඝනජඝනතටානං, මහත්බහල දුවත්තලාඇති; කරිකරසන්නිභ, ගජහස්තසෙයින් අනුපූර්වවූ; ඌරුයුගලානං, ඌරුයුගලඇති; පදෙ පදෙ, පියෙහි පියෙහි; රණිත, හඬනලද; මණිනූපුරානං, මණිමය නූපුරඇති; පිණ්ඩාලත්තක පල්ලවිත, පිණ්ඩාලක්තක මැ සජාතපල්ලව ඇති; පාදපඞ්කජානං, පාදපද්මයන් ඇති; සුරකින්නරනාරිගණාතිගානං, සුරකින්නරනාරීගණයන් ඉක්ම සිටි; සඞ්ගීතෙන, චතුරඞ්ග සඞ්ගීතින්; විජිත, දිනනලද; දෙවනාටකීනං, දිව්‍යනාටිකාවන් ඇති; චත්තාලීසසහස්ස රාජසුන්දරීනං මජ්ඣෙ, සතලිස්දහසක් රාජකන්‍යාවන්ගේ මධ්‍යයෙහි; වෙලං විය සාගරස්ස, සාගරයට වෙලෙලසෙයින්, මදලෙඛං විය ගජවරස්ස, හස්තිරාජයක්හට මදරෙඛාවක් සෙයින්; ලතං විය මහීරුහස්ස, වෘක්ෂයක්හට පුෂ්පලතාවක් සෙයින්; කුසුමසම්පදං විය මධුමාසස්ස, චෛත්‍රමාසයට කුසුමසම්පත් සෙයින්.

කියේ මැ නො-

"වසන්තශ්චෛත්‍රවෛශාඛෞ
මාසෞ තෞ මධුමාධවෞ" යි.

චන්දනවනරාජි විය මලයාචලස්ස, මලයපර්වතයට චන්දනවන රාජියක් සෙයින්; භූසාභූතමත්තනො, තමහට භූෂණභූතවූ; නිද්දං විය

නයනගාහිනිං, නිදි සෙයින් නුවන් ගන්නා; අවහසන්තොසු විය සක්කභවනානි, ශක්‍රභවනයට අපහාසකරනවත්වූ; අභිභවන්තොසු විය බ්‍රහ්මවිමානානි, බ්‍රහ්මවිමානයන් අභිභවනවත්වූ; සකලනරදෙවභවනං, සියලු දිව්‍යමනුෂ්‍යභවනයෙහි; සිරිසමයෙසු විය, ශ්‍රීශොභා අවුදු රැස්වූ තැනක් බඳුවූ; රම්මසුරම්මසුභනාමකෙසු, රම්‍ය නම් සුරම්‍ය නම් ශුභ නම්; තීසු පාසාදෙසු, තුන් ඍතුවට කරනලද තුන්පහාහි; වුඩ්ඪිමගමාසි, අට්විසිහැවිරිදිවයසට සම්ප්‍රාප්ත වී; සකලලොක, සියල්ලෝවැසියන්ගේ; නයන, ඇසට; ආනන්දජනනො, ප්‍රීති ජනවනුයේ—එකං වක්ඛුති හි සමවිසමං පාකටං කත්වා පුග්ගලං අභිරූපිතමපදෙසං නයනයි උපනයතීති නයනානි නෙත්තානීති වුච්චන්ති--ආදර, හරසරින්; අවනමිත, නමනලද, මොලි, මුහුඑහි; සිථිල, ලිහිල්වූ; මණිමකුටපසාතීහි, මිණිවොටුනුපෙල ඇති; මහිපාලචක්කෙහි, රාජමණ්ඩලයන්විසින්; පණාමියමානො, ප්‍රණාම කරනලදුයේ; දෙවනිම්මිත පුරිසං, දෙවියන්විසින් නිර්මිත පුරුෂයක්හු; ජරාගනෙනන, ජරානමැති යනුරු යෙන්; පීලෙහා විය ගහිත යොබ්බනරසං, පෙලාගත්වන් යොවුන්රස ඇති; ධවලකෙසකලාපධාරිං, සුදු කෙශකලාප ඇති; වලිපරික්ඛිණ්ණගත්තං, විලින් අවුල් සිරුරු ඇති; සබල, නොඑක්; විවණ්ණ, පැහැඇති; දුබ්බල, බලනැති; දෙහයනනං, ශරීරයනත්‍රු ඇති; පදුමසරම්ව හිමදූසිතං, හිමයෙන් දූෂිතවූ පියුම්විලක් බඳු; දිවසකරම්ව සදුද්දිනං, දුර්දිනසහිත දිවසකරයක්හු බඳු; චිත්තසාලම්ව සාරවිරහිතං, සාරවිරහිතවූ නටපැහැඇති චිත්‍රශාලාවක්හු බඳු; තරුම්ව දවග්ගිලංඝිතං, ලැව්ගින්න් වියළෙනලද රුකක්හු බඳු—"ලඝි-ශොෂණෙ" යන ධාතුයි — ජරාජජ්ජරසරීරං, ජරාවෙන් දුදුරුවූ ශරීර ඇතියාව;* භමගත්තං, වෙවුලමින්; ආගච්ඡන්තං, එන්නවූ; දිස්වා, තමන් කිඹුල්වත්සපුව පියනුවට නිමිත්තභූතවූ පළමුවන දෙවදූතයා දක; එයින් කීහ-

"ජරත්තකාතමපි විසෙසභූතං
හමෙහා තරං පස්සථ භෙරවන්තං
ජිනස්ස කාපිලවත්‍යසිරිම්පභාතුං
ස දෙවදූතො පඨමං බභූව" යි.

මිගො විය, මෘගයක්හු සෙයින්; තිගඝාතසොස, සෙණහඩින්; චකිතහදයො, භ්‍රාන්ත සිත් ඇති; සංවෙගමුපගම්ම, සංවෙගයට පැමිණ; දීඝං, දීඝිවූ; උණ්හං, උෂ්ණවූ; අභිනිස්සසන්තො, නිඃශ්වාස විහිදුනේ; නිවත්තය නිවත්තය රථං,'රථය නවත නවත යන; ආමෙඩිතවචනය භයෙහි වුයේයි. එයින් කීහ-

* "ඇතියේ"-පොත්.

"භයෙ කොධෙ පසංසායං තුරිතෙ කොතුහලච්ඡරෙ
හාසෙ සොකෙ පසාදෙ ච කරෙ ආමෙණ්ඩිතං බුධො" යි.

සාරථි, රියසැරිය; තෙන නිවත්තිතරථො, ඔහු විසින් නවතනලද රිය ඇතියේ; ජරා ජරෙති, ජරාය ජරායයි; නිරන්තරං, අනවරතයෙන්; අනුවිතක්කයන්තො, අනුවිතර්කණය කරනුයේ; මානුසිකං සම්පත්තිං, මනුෂ්‍යසැපතට; තිලකභූතෙහි, අග්‍රප්‍රාප්තවූ; අමරගණෙහිපි, දෙවගණයනුදුවිසින්; පත්ථනීයසොභෙහි, ප්‍රාර්ථනීයවූ ශොභා ඇති; කාමිස්සර, කාමෛශ්වරයාගේ; හත්ථසාරරූපෙහි, හස්තසාර රූප බඳුවූ රූප ඇති; ධිතිමතිවිරියාදි, ධෛර්‍ය්‍යප්‍රඥාවීර්‍ය්‍යාදී; ගුණගණවරරතන, ගුණගණ නමැති උත්තමරත්නයනට; පරිපුණ්ණෙහි, පිරිපුන්වූ; මානමදපමාදාදි, මාන මද පමා ආදිවූ; විවිධදොසසතසහස්ස සහායෙහි, අනෙකප්‍රකාර දොෂශතයන් දොෂසහස්‍රයන් හා සහායවූ; සාධුජන, සජ්ජනයන්ගේ; මහිමොපඝාත, මහිම නසන්නට; නිඝාතෙහි, අශනිපාත බඳුවූ; බාලජන, බාලජනයන්ගේ; සම්මොහපදට්ඨානෙහි, සම්මොහයට ආසන්නකාරණවූ; ලොකස්ස, ලොකයහට; මාරව්‍යාධ, මරනමැති වැද්දූවිසින්; සණ්ඨාපිතපාසෙහි ඉව, සම්‍යක්ස්ථාපිත පාශබඳු මලබඳු; විවිධෙහි, අනෙකප්‍රකාරවූ; කාමගුණෙහි සමප්පිතො, රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශලක්ෂණ කාමබන්ධනයෙන් සන්තර්පිතවූයේ; න තං ජරාරූපං සරිත්වා, ඒ ජරාරූපය සඳහන් නොකොට; පුනපි, වැළිදු; කාලන්තරෙන, එයින් සාරමසක් ගියකල්හි; දෙවනිම්මිතං, දෙවියන්විසින් නිර්මිතවූ; පුථුතර, ඉතා පළල්ව; උද්ධුමාත, ඉදිමෙනලද; උදර, බඩ හා; චරණයුගලං, පාදයුගලයක් ඇති; නිස්සාසකම්පිතදෙහං, නිඃශ්වාසයෙන් ප්‍රකම්පිතවූ දෙහඇති; ව්‍යාධිරිපු, රොගනමැති ශත්‍රුහුවිසින්; පරිපීළිතං, පෙළනලද; අම්ම තාතෙති, අම්ම තාත යයි; නිරන්තරං, අනවරතයෙන්; සගග්ගදං, ගද්ගදසහිත කොට කට වෙවුල්ල වෙවුල්ලා; කරුණං, කුලුණුකරන තෙපුල්; උග්ගිරන්තං, නිගරණය කරනුවූ; පුරිසං, පුරුෂයක්හු; සණිකං සණිකං, සෙමෙන් සෙමෙන්; සංවිග්ගචිත්තො, භීත චකිත සිතැතියේ; සාපත්‍රපඥන ඇතියේසැ යූසේයි; දිබ්බවිසයං අභිභවනෙන්තාහි, දිව්‍යමයවූ රූපාදිවිෂය අභිභවනුවූ; පණීත, උත්කෘෂ්ටප්‍රාප්තවූ; විවිධ, නානාප්‍රකාරවූ; විසයූපකාරෙහි, රූපාදීන්ගේ සමූහයෙන්; අපහටමානසො, අපහෘතවූ සිත් ඇතියේ; පුනපි, වැළිදු එයින් සාරමසක් ගියකලැ; අපවිද්ධකෙසෙහි, විශීර්ණවූ කෙශ ඇති.

**නරනාරිගණෙහි** යන තන්හි "නෘ-නයෙ" යන ධාතුයි. ඔහු කෙරෙන් අච් වැ **නර** වේ. පුංයොගයෙහි ඞීප් වැ **නාරී** යනු වේ.

එයින් කීහ–

"නරති නෙතීති නරො පුරිසො යථා හි පඨමපකතිභූතො සත්තො ඉතරාය පකතියා සෙට්ඨෙන පුරි උච්චෙ ඨානෙ සෙති

පවත්තතීති පුරිසොති වුච්චති, නයනමෙන නරොති වුච්චති, පුත්තභාතුභූතොපි හි පුග්ගලො මාතුජෙට්ඨභගිනීනං පිතුට්ඨානෙ තිට්ඨති පගෙව භත්තුභූතො, නරෙන යොගතො නරස්ස එසාති වා නාරි" යි.

සඤ්ජාතසංවෙගො, සඤ්ජාතවූ සංවෙග ඇතියේ; පුබ්බකම්මසම්පාදිතෙහි, පූර්වජන්මයෙහි කරනලද පුණ්‍යකර්මයෙන් සිඩවූ; එවරින් එවරට පඤ්චකාමගුණ අධික කොට එළවූසේ දක්වමින් ඈරෑ තුන් වන වරෑ එළවූ පඤ්චකාමගුණ තමන්ගේ වචනවිෂයාතික්‍රාන්තසේ දක්වනුවෝ "පුබ්බකම්මසම්පාදිතෙහි" යුහු. විෂයෙහි, රූපාදීන් විසින්-විෂිණ්වන්ති බධ්නන්ති තස්මින්නිති විෂයාඃ, * "ෂි-බන්ධනෙ" යන ධාතුයි. පුනපි, වැළිදු එසින් සාරමසක් ගියකල්හි; සුනිවත්ථසුපාරුතචීවරං, පරිමණ්ඩලකොට යහපත්කොට හන් පෙරෙව් සිවුරු ඇති; සන්තින්ද්‍රියමානසං, ශාන්තවූ පඤ්චෙන්ද්‍රියයන් හා මනස් ඇයි; අනුගතම්ව භික්ඛුසිරියා, භික්ෂුලක්ෂ්මියවිසින් අනුවයනලද වන්; අදිට්ඨපුබ්බවෙසං, අදෘෂ්ටපූර්ව වෙෂ ඇති; භික්ඛුං, මහණක්හු; සඤ්ජාතපබ්බජ්ජාභිලාසො, සඤ්ජාතවූ ප්‍රව්‍රජ්‍යාභිලාෂ ඇතියේ; කුසුමඵලපල්ලවාලඞ්කත, පුෂ්පඵලපල්ලවයෙන් සැදුම්ලද; විවිධතරුවරොපසොභිතං, අනෙකප්‍රකාර තරුවරයන්විසින් උපශොභිතවූ; සමදම්ධුකරගණෙපකූජිතං, සමද මධුකරගණයන්විසින් උපකූජිතවූ; පවත්තනච්ච, ප්‍රවෘත්තවූ නෘත්‍ය ඇති; සිඛිසොභමානං, මයූරයන්විසින් හොබනාලද; සක්‍යකුලකමලිනිරාජහංසො, ශාක්‍යකුල නමැති පියුම්විලට රාජහංසයක්හු බඳුවූයේ; විප්ඵුරන්තිහි, දිලිසෙනුවූ; දෙහප්පභාහි, ශරිරරශ්මින්; සබාලාතපම්ව, ළහිරු රැස් සියො වනයක් සෙයිනුදු; සදවානලම්ව, ලැව්ගිනි සියො වනයක් සෙයිනුදු; වනං, උයන්වල්; උපදස්සෙන්තො, දක්වනුයේ; විවිධවනලතා, නොයෙක් වනලියෙන් බස්නා; කුසුමරෙණු, මල් රොනින්; ධූසරො, දිඹිලිගත් ශරීර ඇතියේ; නන්දනවනසමජ්ඣොගාහක, නඳුන්උයන්වන්; නාකනායකො විය, දෙව්රජහු සෙයින්; වනභවනසුඛමනුභවන්තො, වනභවනසුඛය අනුභවකරනුයේ.

පුබ්බණ්හනති දිවසස්ස පුබ්බභාගසමයං — එහි හිරු නැගී තැන් පටන්ගෙන පෙරවරු දසපැයක් දක්වා පූර්වාහ්ණයැ එහි පටන්ගෙන කල් ගුළු පස්පැයක් දක්වා මේ දසපැය මධ්‍යාහ්නයැ එසින් මත්තේ හිරු හැප්සෙන තැන් දක්වා සායාහ්නයයි, මහාපුරුෂ පූර්වාහ්ණයෙහි උයන් කෙළිය. මධ්‍යාහ්නයෙහි විල් කෙළිය. සායාහ්නයෙහි දිව්‍යාභරණයෙන් සැදී නුවර වන්. දූන් පූර්වාහ්ණය උයන් කෙළියෙන් සංහාර කොට මධ්‍යාහ්නයෙහි විල් කෙළනා පරිදි කියත්.

* "වෂිසීයන්ත් බන්ධනෙන තස්මින්නිති විෂයාඃ" පොත්.

සුචි, පිරිසුදුවූ; විමල, නිර්මලවූ; සලිල, උදකයෙන්; පූරිතං, පරිපූර්ණවූ; කමල, පියුම්; කුමුද, කුමුදුමල්; උප්පල, රත්මහනෙල් මල්; කුවලයාදි, නිල්මහනෙල්මල් ආදී; කුසුමාභරණවිභූසිතං, පුෂ්පාභරණයෙන් සැදුම්ලද; පදුමමධුපානමත්තා, පියුම්මී බී මත්වූ; හංසකාමිනීකතකොලාහලං, හංසවනිතාවන්විසින් කරනලද කොලාහල ඇති; මජ්ජමාන, ගැලෙනලද; සමදසාකියවිලාසිනී, සමදවූ ශාක්‍යසීමන්තිනීන්ගේ; කුචකලසලුළිතං, තනකලශයෙන් ඇලලෙනලද; මඞ්ගලපොක්ඛරණිං, මඞ්ගලජලනිධියට; නන්දන සරසමොගාහක, නන්දනවිලට වන්; පාකසාසනො විය, සක්දෙව් රජහු සෙයින්—පචන්ත ඉති පාකඃ සස්‍යං පාකසම්පාදනාපිං පයශී න්තං ශාසතීති පාකශාසනඃ, "ශාසු-අනුශිෂ්ටෞ" යන ධාතුයි. අථ වා පචන්ත ඉති පාකඃ දූනම් පාකසම්පාදනාපීමනුශාස්තීති පාකශාසනඃ, අථ වා පචනීයා ඉති පාකාඃ දුෂ්ටසත්වාඃ තාන් ශසතීති පාකශාසනඃ. "ශසු-හිංසායාම්" – වාසරාවසානෙ, දිවසාවසානයෙහි; දිවසයාගේ තුන්වන භාගයෙහි; සායාහ්නයෙහිය යුසේයි. සහංසං සරං, හංසසහිතවූ විල්; සහ කාමිනීහි පජහිත්වා, කාමිනීන් හා සමග පරිත්‍යාග කොට; තීරෙ, විල්තෙර; පරම, උතුම්වූ; රුචිර, මනොඥවූ; දස්සනෙ, දර්ශන ඇති; සකහදයසීතලෙ, තමාගේ හෘදය සේ සිහිල්වූ; සිලාතලෙ, මඟුල්සලවටෙහි; නිසීදිත්වා,

"සුගන්ධිසෞගන්ධිකගන්ධහාරී-
සසරො'නිලඃසාරසනාදකර්ෂී
ආධූතරාජීවරජොවිතානෙන-
රඞ්ගම්පිශඞ්ගං නෘපතෙශ්චකාර" යි *

යන තන්හි සෙයින් වනවිල්සුළඟින් එළවනලද මුවරදපට පෙරෙව හිද; විස්සකම්මසුරකුමාරෙන, මඟුල්කපුවෙසින් උපස්ථිතවූ විශ්වකර්ම නම් දිව්‍යපුත්‍රයාවිසින්; අලංකතො, දහසක් දිවසළුවෙන් හිස්වෙලා වොටුනු පලඳවා සර්වාභරණයෙන් සදනලදුයේ; නානාවිරාග, නොයෙක් පැහැඇති; තනු, ශරීර ඇතියේ; නන් නන්මිණිරසින් දිලිහෙන ශරීර ඇතියේයැ යුසේයි. වර, උතුම්වූ; වසන, පිළී; නිවසනො, හන්දේ; ආමුත්ත, බහාලනලද; මුත්ත, මුතුඇති; අඞ්ගද, අඟුපලඳනා හා; කෙයූරො, කෙයූරපලඳනා ඇතියේ; වර, සහපත්වූ; පරම, උතුම්වූ; සුරභි, සුවඳවූ; කුසුම්මාලා, මල්කඩින්; සමලඞ්කත, සැදුම්ලද; සිරොරුහො, කෙහෙ ඇතියේ; රුචිර, මනොඥවූ; නව, අලුත්වූ; කනක, ගනරන්මුවාවූ; මකුට, මිණිවොටුනු හා; කුණ්ඩලො, මිණිකොඬොල් ඇතියේ; චතුහි, චතුස්සංඛ්‍යාවෙන් පරිච්ඡින්නවූ; ගරුළජව; ගරුඩයන්ගේ ජව බිඳු;

* ජානකීහරණ ප්‍රථමසර්ග 64 වෙනි ශ්ලොකයයි.

වේග, ගමන් ඇති; මිඞ්ගල, මඟුල්; සිත, ධවල; සිඬ්වෙහි, සෛ
න්ධවයන්විසින්; යුත්තං, යොදනලද; වර, උතුම්වූ; කනකරජතමණි
රතනවිරචිතං, රන්රිදීමිණිරුවනින් සැදුම්ලද; සමොසරිත, අව
ලම්බිතවූ; විවිධසුරභිකුසුමදාමං, නානාවිධ සුගන්ධපුෂ්පදාමයන්
ඇති; රථං, රථයට; අභිරුය්හ, ආරූඪ වැ; රාජසිරිනිවාස, රාජලක්ෂ්
මියගේ නිවාසයට; පුණ්ඩරීකෙතන, ශ්වේතපද්මයක් බඳු; ථූලමුත්තා
කලාපජාලකාවුතෙන, ස්ථූලවූ මුක්තාකලාපයෙන් හා මුක්තාජාල
යෙන් සමාවෘතවූ; සිතාතපත්තෙන, සේසතින්; නිවාරිතාතපො,
නිවාරිතවූ සූර්‍ය්‍යරශ්මි ඇතියේ; උධූයමාන, සලනලද; චාමරකලාප,
සෙමෙරවල්කලප්හි; පවන, සුළඟින්; ආනන්තිත, නටවනලද;
කණ්ණපල්ලවො, කණ්ණපල්ලව ඇතියේ; යුවති, ළඳුරියන්ගේ;
ගතිවසා, ගමන්වශයෙන්; අරඤ්ජිත, හඬවනලද; නූපුර, මිණිනූ
පුරයෙහිදු; පාරිහාරිය, පෙරහැරයෙහිදු; රසනා, රසන්වැලයෙහිදු;
රව, හඬින්; මුඛරෙන, මුඛරිතවූ; මධුර, මියුරුවූ; සාරණ, ගඳැවින්;
රඤ්ජිත, හඬනලද; වීණාරව, වෙණරැවින්; කොලාහලෙන, කොල
හලවූ; මඞ්ගලගීතෙන, මඞ්ගලගීතිකායෙන්; ගීයමාන, ගායනා
කරනලද; යසසන්තානො, යශඃප්‍රබන්ධ ඇතියේ; මදජලමලිත,
මදදියෙන් මලිනවූ; කපොලදෙලාගමාන, කොපොළහි ඉහිල්සේ
ඇවිදුනා; මධුකරකුලානි, මීමැසිකුලන් ඇති; කුඤ්ජරඝටානි, ගජඝට
ගහනයෙන්; ජලධරදිවසායමානාය, වහරේ දවසක් බඳුවූ; සේනාය
යනු හා සබඳ. රඤ්ජිත, හඬනලද; මධුර, මියුරුවූ; කනකඝණ්ටි
කාරව, රන්රසුහඬින්; මුඛර, ගුගුරනුවූ; කණ්ඨසි, කඳට ඇති;
මජ්ඣෙ, මදටරෙසෙන්; නොහොත් මදට සෙයින්; ලොහිත,
රත්වූ; ඛන්ධ, සකන්ධයෙහි පිටුකර; කෙසරසටා, කෙසුරුසළා හා;
වාලපල්ලවෙහි, වාලපල්ලව ඇති; වනගජ, දඩැතුන්ගේ; රුධිර,
ලෙහෙයෙන්; පාටල, රත්වූ; සටෙහි, කෙසුරුසළා ඇති; කෙසරීහි
විය, කෙශරසිංහයන් බඳු; තුරඞ්ගමෙහි, අශ්වයන්විසින්; භාසුරාය,
දිලිහෙනුවූ; අලඞ්කාර, පලන්; කායාභරණ, ශරීරාභරණයෙහි;
ජුති, පැහැයෙන්; සමුජ්ජොතෙන, දිලියෙනුවූ; සුරභි, මනොඥවූ;
කුසුම්, මලින් හා; වසන, පිළීන් හා; අභරණ, පලඳනසින්; භූසි
තෙන, සදනලද; පලයජලන්ධිජල, ප්‍රලයසාගරජලයෙහි;
කලෙලාල, තරඞ්ගයන්ගේ; සංඝාතෙන විය, සමූහයෙකින් මෙන්;
කලකලබහලෙන, කලකලයෙන් බහලවූ; අනෙකසතසහස්ස,
නොයෙක් සුවහස්; පත්තිකාජනෙන, පදඇණි ජනයන්විසින්;
සොභිතාය, හොබනාවූ; චතුරඞ්ගිනියා සෙනාය පරිවුතො, හස්ත්‍ය
ශ්වරථපත්තිලක්ෂණවූ චතුරඞ්ගිනී සෙනායෙන් පරිවෘතවූයේ;
තුරඞ්ගමයම්ව යනු කරොහෙනා යනු හා සබඳ. තුබූ පදයෝද
එසේම යෙදෙත්. තුරඞ්ගමයම්ව, තුරඞ්ගමයවන් කරන්නේ; මහීත
ලං, පොළොව්තලය; තුරඞ්ගමයන් බලනුවනට සියලු මහීතලය

තුරඞ්ගයන් ගැවසී සිටියාසේ පැනේ. කුඤ්ජරමයම්ව, කුඤ්ජරමයවන් කරනුයේ; දිසාවලයං, දික්චක්‍රය; ඇතුන් බලනුවනට සියලු දසම්බුලු හස්තිමයවන්ව පැනේ. ආතපත්තමණ්ඩලමයම්ව, ඡත්‍රමණ්ඩලමයවන් කරනුයේ; අන්තලික්ඛං, අන්තරීක්ෂය; නිරීක්ෂණය කරනුවනට සියලු අහස්පියෙස් ශ්වේතච්ඡත්‍රයෙන් ගැවසී සිටියාසේ පැනේ.

ධජමයම්ව, ධ්වජමයවන් කරනුයේ; අම්බරතලං, ගගනතලය; උබ්බලනුවනට සකලගගනතලය ඔබ්බී කොට නැඟි ධ්වජපෙළින් ගැවසී සිටියාසේ පැනේ. ගජමදගන්ධමයම්ව, හස්තීන්ගේ මද ගන්ධමයවන් කරනුයේ; ගගනං, අහස්; සමීරණං, සුළඟ; භූපාලමයම්ව, මහීපාලමයවන් කරනුයේ; පජාරාසිං, ජනකායයන්; නන්විසිතුරු පලඳනෙන් සව්සද ජනරැස් රජුන් සේ පැනේ. ආභරණරස්මිමයම්ව, භූෂණකිරණමයවන් කරනුයේ; ගගනං, අහස්; කිරීටමයම්ව, කිරීටමයවන් කරනුයේ; ආතපං, සූර්යරශ්මි; චාමරමයම්ව, චාමරමයවන් කරනුයේ; දිවසං, එදවස; ජයසද්දමයම්ව කරොන්තො, ජයශබ්දමයවන් කරනුයේ, තිභුවනං, තුන්ලෙව්; එදා ජයඝොෂයෙන් පාතාලලොකයෙහි පටන් ගෙන අකනිෂ්ඨබ්‍රහ්මලොකය දක්වා එකනින්නාද වී. නානා, නොඑක්; ජුතිවිසර, රශ්මිප්‍රභායෙන්; සමුජ්ජලෙන, දිලියෙනුවූ; වණ්ණෙන, වර්ණයෙන්; අනෙක, නොඑක්; වාතපානවිවර, කවුළුදොරින්; විනිග්ගත, නික්මෙනලද; යුවති, තරුණීන්ගේ; භූසන, පලඳනෙහි; කිරණසහස්‍ර, රශ්මිසහස්‍රයෙන්; සංකුලං, ආකුලවූ; තිභුවන, තුන්ලෝවැසියන් විසින්; විලොභනීයො, ප්‍රාර්ථනා කරනුයේ. අඞ්ගප්පභාපවාහෙන, ශරීරරශ්මිකදම්බයෙන්; නගරං, නුවර; ලාවණ්ණමයම්ව, පැහැයෙන් නිපන්නාක් වන් කොට දක්වනුයේ; ආනනමණ්ඩලෙන, මුඛමණ්ඩලයෙන්; ගගනතලං, ආකාශතලය; චන්දබිම්බමයම්ව, චන්ද්‍රබිම්බමයවන් කොට දක්වනුයේ; ආභරණරස්මිආලොකෙන, ආභරණරශ්මීන්ගේ ආලොකයෙන්; ආතපං, සූර්යරශ්මි; ඉන්දායුධමයම්ව, ඉන්ද්‍රචාපමයවන් කොට දක්වනුයේ, ලොචන, නයනයෙහි; මයූඛලෙඛාසන්තානෙන, රශ්මිරෙඛාප්‍රබන්ධයෙන්; දිවසං, එදවස; නීලුප්පලමයම්ව දස්සෙන්තො, නීලොත්පලමයවන් කොට දක්වනුයේ, පුරසුන්දරීනං, පුරවම්යන්ගේ; සාභිලාසෙහි, අභිලාෂ සහිතවූ; අනිල, සුළඟින්; චලිත, ඇලලෙනලද; කුවලයදලදාම, නිල්මහනෙල්පෙත්දම සෙයින්; දීඝෙහි, දික්වූ; තරළ, චපලවූ; තාර, පිඩගිණියෙන්; සාරෙහි, සාරවූ; දිට්ඨිපාතෙහි, බැල්මෙන්; විලුම්පියමානො විය, වොලොනාලදවන් වූයේ; මදන, කාමදෙවතාවාගේ; සරපරම්පරාහතානං, ශරපරම්පරායෙන් ආහතවූ; වනිතානං, අඟනන්ගේ; ආදාසමයානි විය, ආදර්ශමයවන්වූ; සලිලමයානි විය, සලිලමයවන්වූ; ඵලිකමයානි විය, ස්ඵටිකමණිමයවන්වූ; හදයානි,

හෘදයට; පවිසන්තො, ප්‍රවිෂ්ටවන්නුයේ; ආකාරෙන, ආකෘතීන්; තාසං, ඒපුරවැසියන්ගේ; ආපීයමානො විය, බොනවන් වූයේය; ලොචන දූතෙහි, ඇස්පෙළෙහෙන්; ආහූයමානො විය, කැඳවනවන් වූයේය; භූසාරවෙහි, භූෂණාරවයෙන්; අනුගම්මමානො විය, අනුව යනවන් වූයේ, හදයෙහි, හෘදයෙන්; නිබද්ධමානො විය, බඳනාලදවන් වූයේ; ආභරණ, පලඳණෙහි; රතනරස්මි, රුවන්රශ්මි; රජ්ජුහි, රැහැණ්වලින්; මහතා, මහත්වූ අචින්ත්‍යවූ අවාච්‍යව අතුල්‍යවූ; සිරි සමුදයෙන, ශොභාකදම්බයෙන්; ගච්ඡන්තො, වජඹමින් යන්නේ; මකරද්ධජ, මුවරදදයාගේ; ආවුධභූතො, ආයුධයක් බඳුවූයේ; රාගා සවමත්තාය, රාග නමැති ආශවයෙන් මත්වූ; කිසාගොතමියා, කෘශාගෞතමී නම්; රාජධීතරා, ශාක්‍යකන්‍යාවවිසින්; අභිගීතං, කියනලද; නිබ්බුතපදනිහිත, නිවෘතපද නිඃක්ෂෙපයෙන් යෙදුණු; ගීතං, ගාථාව; සුත්වා, අසා; "නිබ්බුතා නූන සා මාතා—පෙ—යස්සායං ඊදිසො පති" යන මේ තුන් නිවෘතපදයෙන් විචිත්‍රගාථාව අසාය යුසේයි. අයං, මේ; ඉම, මා; සුසවනං, යහපත් හසුන්; සාවෙතීති, ඇස්වූවයි; පරම, උතුම්වූ; රතිකරං, මනොඥවූ; හාරං, ලක්‍ෂවටනා මුත්හර; ඔමුඤ්චිත්වා, ගලවා; සජලජලධරමිව, නිල්වලා බඳු වූයේය; කාලාගරුධූමමණ්ඩලෙහි, කළුවැල්දුම්මණ්ඩලෙන්; සනීහාරමිව, හිම පොද හා සහිතවන් වූයේය; සාමකුජරඝටාසීකරෙහි, සාමාවසන් නවූ ගජඝටාවන්ගේ මදපොදින්; සනිසමිව, නිශාසහිතවන් වූයේය; තමාලවීථිකාඅන්ධකාරෙහි, තමලවනපෙත අඳුරුයෙන්; රාජවාර සමීපං, රාජවාරදෙශයට; උපගන්ත්වා, එළඹ; සබාලාතපමිව, ලහිරුරැස් හා සහිතවන් වූයේය; රතනාලොකෙහි, රත්නාලොක යෙන්; සතාරාගණමිව, තාරාගණයන් හා සහිතවන් වූයේය; මුත්තා කලාපෙහි, මුතුලැල්කලබින්; සවස්සසමයමිව, වර්ෂාසමයක් හා සහිතවන් වූයේය; ධාරාඝරෙහි, ධාරාගෘහයෙන්; අභිහත, අභ්‍යා හතවූ විශෙෂයෙන් පහරනාලද; මඞ්ගලතුරියරවපූරිතං, මඞ්ගල තූය්‍යීරවයෙන් පූරනලද; උපරචිත, සදනලද; විකච, සුපුෂ්පිතවූ; කමලකුසුමප්පකාරං, මහනෙල්මල්කලප් ඇති; ලළිතවනිතා, ලල්තවූ අගනන්ගේ; පාදරාග, පත්ලෙහි පැහැයෙන්; අඞ්කිතං, ගැවසීගත්: අන්තොපුරවර, ඇතුළුරජගෙහි ඇවිදුනා; ජනනූපුර, ස්ත්‍රීජනයන්ගේ නූපුරයෙහි; කිඞ්කාරමනොහරං, කිංකාරයෙන් කිඞං යන අනුකරණයෙන් මනොහරවූ; පචලිත, ප්‍රචලන්වූ; භූසන මණිරවරමණීයං, භූෂණමණිරවයෙන් රම්‍යවූ; පාසාදං, පහයට; අභිරූහිත්වා, ආරූඪ වැ; උපරචිත, යහපත් කොට බඳනාලද; සිතවි තානෙ, සුදුවියන් ඇති; ආසත්ත, සංසක්තවූ; මුත්තාගුණෙ, මුතුවැල ඇති; මණිපදීපප්පහතතිමිරෙ, මණිප්‍රදීපයෙන් අපහතවූ අඳුරු ඇති; ඉන්දුදීධිති, සඳරැස්කලම්බක් සෙයින්; ධවල, සුදුවූ; පච්ඡද පටෙ, යහපත් දෙපත්වියත්පට ඇති; කෙලාසසිලාතල, කෙලෙන්

ශලතලක් සෙයින්; විසාල, මහත්වූ; සයනතලෙ, යහන්තෙලෙහි; සුරදුව තිසදිස, සුරදුවතීන් බඳු; රූපසොභා, රූපසම්පත් ඇති, වර යුවතියො, උත්තමස්ත්‍රීහු; මධුරරවානි, මියුරුරව ඇති; තූරියානි ගහෙත්වා, පසඟතුරු ගෙන; තං මහාපුරිසං, ඒ මහාපුරුෂයා; සම්පරිවාරෙත්වා. පිරිවරාගෙන; රමයන්තියො, රති ජනවන්නුවෝ; නච්ච, නච්චනාට්‍යරසයෙන් යුත් දිව නැටුම්බඳු නැටුම්දු; ගීත, සප්තස්වරයෙන් යුත් දිව්‍යගීතිකාබඳු ගීතද; වාදිතානි, ආතතවිතතාදි දිව්‍ය වාද්‍යබඳු වාද්‍යද; පයොජයිංසු, ප්‍රයොග කොළෝ; තස්මිං සමයෙ, එකල්හි; මකරධජවිජයඝොසානුකාරිනා, මකරධ්වජයාගේ විජය ඝොෂයක් බඳුවූ; භූසානිනාදෙන සද්ධිං පවත්තනච්චං ඔලොකෙන්තා, භූෂණනින්නාද හා සමග ප්‍රවෘත්තවූ නෘත්‍ය බලනුයේ; නවජලධරඝොසගම්භීරං, නවජලධරඝොෂ සෙයින් ගම්භීරවූ; අනාගත වීණාවෙණුරවරමණීයං, අනාගත වීණාවෙණුරවයෙන් රම්‍යවූ; මුදිඞ්ගනාදං සුණන්තො, මියුඟුබෙරහඬ අසනුයේ; විකසිත, පුබුදු; නයනයුගල, ලොචනයුගලයෙන්; විනිග්ගත, නික්මෙනලද; පභාපවාහෙන, පැහැකඳෙන්; සමුබ්භාසිත, දලවනලද; වාසභවනොපනාකුස් ඇතියේ; හංසධවලෙ, හංසයක්හු සේ ධවලවූ; ගන්ධතෙලාවසෙක, ගඳතෙල්ඔත්; දීපිකා, වැටුප; ආලොකෙන, පහනින්; නිද්දූපගතං, දෙවාවතීනයෙන් නිද්‍රාවට උපගතවූ; විකට, විකෘතවූ; පාකට, ප්‍රකටවූ; බීභච්ඡ, භයානකවූ; සචෙටිකං, චෙටිකාවන් සහිතවූ; නිස්සිරිකං පස්සමානො, අශුභනිමිත්තදශීනයෙන් කාමච්ඡන්ද පැහුණුබැවින් අමුසොහොනක් සෙයින් නිශ්‍රීක කොට දක්නේ.

එයින් වදාළහ-

“නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා කාමච්ඡන්දො නුප්පජ්ජති උප්පන්නො වා කාමච්ඡන්දො පහීයති යථයිදං භික්ඛවෙ අසුභනිමිත්තං” යි.

පලයානලසිඛාකලාප, කල්පාග්නිශිඛාකලාපයෙන්; පරිගතං, වෙළඳනාලද; තිණකුටිම්ව, තණපැලක්මෙන්; තිභුවන, තුන්ලෙව්හි ඇවිලගත්; දහනං, එකොළොස්වනක් කම්ගිනි; නිබ්බානාමතරසෙන, නිවන්අමාරසෙන්; අවජානන, පෙරෙව් පිළින් නොවසනලද; සචනං, සාන් ඇති; රණමණ්ඩකං, අෂ්ටවිධ ශික්ෂාවෙහි ශික්ෂිතවනබැවින් අෂ්ටාදශවාරින් ද්වාත්‍රිංශත් ව්‍යූහයුද්ධයට සමපීවූ සාගරමථනාවට මෙරු සෙයින් රණසාගරවිලොඩනයට මණ්වූ; අබඩ, බඳනාලද; ධවල සුදුවූ, කුසුමදාමකසතං, මල්දම්සිය ඇති; පජ්ජලිත, දිලිහෙන; මඞ්ගලප්පදීපං, මඟුල් පහන් ඇති; අපරිච්චත්ත, නොපියනලද; ගබ්භරාගං, ගබ්පෙරහර ඇති; ඔණ්ඩලම්ව යන තන්හි ඉච්ශබ්ද සඞ්ඝාරං යනු හා සබඳ. තුබූ පදයෝද එසේම සඳෙත්, උදය, සූසෙඩාදයෙහි; පරිපාටල, රත්වූ; මණ්ඩලං, මඩුළු

ඇති; සවිතාරම්ව, හිරුබඳු; අපරසඞ්ඛා, අපරසඞ්ඛ්‍යායෙහි; ලො
හිත, රත්වූ; බිම්බං, ශරීර ඇති; රජනිකරම්ව, සඳහු බඳු; උජ්ජලං,
සුපුෂ්පිතවූ; රත්නාරවින්දරාසිම්ව, රත්පියුම්කලබක් බඳුවූ; පවාල
කිසලයදලෙහි විය, පබළුපලුපතින් මෙන්; බාලාතපච්ඡෙදෙහි
විය, ලහිරුරැස්කඩින් මෙන්; පදුමරාගරශ්මී විය, පියුම්රාමිණි
රැසින් මෙන්; විරචිතාවයවං, සදනලද අවයව ඇති; සුරවනිතා,
දෙවඹුවන්ගේ; කර, අතින්; පරිභඨං, ගුළු; අමරකුමාරකම්ව; දෙව්
කුමරක්හු බඳු; උත්තාන, උළුනලද; කනකසන්නිභාය, රන්
චටක් බඳු; වසීකරණමන්තං විය, වශීකරණමන්ත්‍රයක් වැන්න;
චිත්තස්ස, සිතට; ආකඩ්ඪනඅඤ්ජනං විය, ආකර්ෂණාඤ්ජනයක් වැන්න;
නෙත්තස්ස, ඇසට; සිරිසයනගතං, ශ්‍රීයහන්හි ඔත්; අත්‍රජං, පුත්‍රයා;
විගතනිමෙස, විගතවූ නිමෙෂොන්මෙෂ ඇති; නිච්චලපඛුමෙන,
නිශ්චලවූ ඇසිපිය ඇති; ආනන්දජලපටල, සතුටුකඳුළුපටලයෙන්;
පූරිත, පුරනලද; තාරකෙන, පිඩකිණි ඇති; පරහිතරතභාවෙන,
පරහිතයෙහි රත වනබැවින්; ජනෙනාපනීතං, ජනනයාවිසින් උප
නීතවූ; **භයරතනං** යනු හා සබඳ. කනකපත්ත, රන්පත; ලතා,
ලියෙන්; පතාතෙන, පළල්වූ; පදෙ පදෙ, පියෙහි පියෙහි; රඤ්ජිත,
හඩනලද; රතනමාලෙන, රත්නමාලා ඇති; ථූලමුත්තාඵලබහ
ලෙන, සථූලවූ මුක්තාඵලයෙන් බහලවූ; තාරාගණාලඞ්කත, තරුගණ
යන්විසින් ගැවසීගත්; සඞ්ඛාරාගෙනෙව, සඳපැහැබඳු; අස්සාලඞ්කා
රෙන, අශ්වාලඞ්කාරයෙන් අශ්වාභරණයෙන්; සමලඞ්කතං, සදන
ලද; පතත, හිමෙන් හා; අවපතන, නැඟිමෙන් හා; ජනිත, උපන්;
ඛුරරවෙහි; කුරරැව් ඇති; ජජ්ජරිත, දූදුරුකරනලද; වසුන්ධරෙහි,
පොළෝ ඇති; ඛුරපුටෙහි, ඛුරපුටයෙන්; සාමිනො, හිමියහට; මුර
ජවාදපූජං විය කුරුමානං, මුරජවාදයෙන් පූජාකරන වන්වූ; පූරිත,
පූරනලද; භුවනොදරවිවරෙන, භුවනයාගේ උදරකුහර ඇති; හෙ
සාරවෙන, හෙෂාරවයෙන්; කොචමානං, කුල්නාවූ; වෙගසංඝාත
මිව, ජවසමූහයක් බඳු වූයේය. දෙහවන්තං, මූර්තිමත්; කිංසෙය්‍ය
යන් ? නැමෙමින් තුබූ සක්නැඹක් සෙයින් සක්වළගල්මුදුනෙහි
ගෙන සියලු සක්වළගල් වටාලා එමවේලේ ඇවිද සිටිනාපමණ ජව
ඇතියේයි. සූරියොදයම්ව, සූර්‍ය්‍යයාගේ උද්ගමනයක් සෙයින්;
සකලභුවනපූජාරහං, සියලු ලොකයාවිසින් පුදන්නට නිසිවූ;
අසෙසලක්ඛණූපපන්නං, සර්වලක්ෂණසම්පන්නවූ; කෙලාසධවලං;
කෛලාසශිඛරයක් සෙයින් ධවලවූ; හයරතනං, අශ්වරත්නයා;
සමාගත, සමායාතවූ; අනෙකලොකධාතුවාසී, දසදහසක් ලෝධා
වැසි-එකො න භවතීත්‍යනෙකාඃ-පියූසපෙහි, දෙවියන්විසින්; ගන්ධ,
දිවගඳ; මාල, දිවමල්දිවකුසුම්දම්; අම්බර, දිවසළු; ආභරණ, දිව
අබරණ; දීප, දිවපහන්; ධූප, දිවදුම්; චන්දනචුණ්ණවුට්ඨිහි, දිවසඳුන්
සුනුවර්ෂයෙන්; පලයජලනිධි, යුගාන්ත සාගරයාගේ; නාදෙනෙව,

ඝොෂාවක් බඳුවූ දිව්‍යසඞ්ගීතනිර්ඝොෂයෙන්; රජ්ජත්තයං, කිඹුල් වත් කෝළිය දෙව්දහ යන තුන් රජය; අභිසෙක, සනාහන්නට; අවතිණ්ණෙ, බැස්සාලද; ජනපදවධූ, ජනපදවාසී ස්ත්‍රීන්ගේ; කුච, ස්තනයෙහි; චන්දනධූළි, සඳුන්සුණුනෙහි; ධවලිත, සුදුවූ; තරඞ්ග මාලං, රළපෙළ ඇති; සිත, සුදු; සුඛුම, සියුම්, පුළිනතලෙ, වැලිපිට; තරුණතර, අතිතරුණවූ; කපි. වඳුරක්හුගේ; ලපන, මුඛයක් දී සෙයින්; ලොහිතෙ, රත්වූ; තිමිර; අන්ධකාරයන්ගේ; නිකර, රැස්; නිධනකරෙ, අවසානකරවූ; සහස්සකිරණෙ, සහස්‍රරශ්මිහි; පාරිජාත, පරසතු; මන්දාර, මඳාරා; මකරන්දබින්දු, මුවරදබිඳෙන්; සින්දූරිත, රත්වූ; අඞ්ග, ඇඟ ඇති; මඞ්ගලතුරඞ්ගමං, මඟුල්අස්හු; සජල, ජලසහිතවූ; ජලධරප්පභා, වලාපැහැ සෙයින්; භාසුරෙන, දිලියෙනුවූ; නිසිත, සියුම්කැපුම් ඇති: විමල, නිර්මලවූ; ඛග්ගෙන, ඛඩ්ගරත්නයෙන්; සුපුප්ඵිත, සුපිපි; කණිකාරතරු, කිණිහිරිරුකක්හුගේ; සිඛර, මස්තකයට; සමුග්ගත, නැඟී; භමරාවළි, බමරවැළන්ගේ; ලීලානුකාරිනං, ලීලාවක් සුදුසු; සකෙස, කෙස්ද සහිත; මකුටං, මුහුළු; පවුජ්ඣිත්වා, විසඟී කොට; "උජ්ඣ-උත්සර්ගේ" යන ධාතුයි.

අරහද්ධජං, සිවුරු; අනුපියං නාම අම්බවනං, මල්ලරජුන්ගේ අනුපියනම් අඹඋයනට; සුරභි, සුවඳ; කුසුම, මල්හි; ගන්ධ, ගඳින්; අවබද්ධ, බඳනාලද; හදයාභි, සිත් ඇති; ගුම්ගුමායමානෙ, ගුම් ගුම් යන ශබ්ද ජනමින් ඇවිදිනා කල්හි; ඵලරස, අමෘතඵලරසයෙන්; පමුදිත, පරිතුෂ්ටවූ; හදයාභි, සිත් ඇති; මධුරවිරුතාභි, මියුරුහඬ ඇති; කොකිලවනිතාහි, කොවුලිරුම්යන්විසින්; උපගීයමානෙ, ගායනාකරනකල්හි; පබ්බජ්ජාසුඛෙන, ප්‍රව්‍රජ්‍යාසම්පාදනයෙන් උපන් ප්‍රීතිසුඛයෙන්; සත්තාහං, සතියක්; වීතිනාමෙසි, වනභවනයෙහි දවස් යැවී; සකලලොක, සියල්ලොවට; එකපජ්ජොතො, එකවූ ප්‍රධානවූ අසහායවූ ප්‍රද්‍යොතයක්වැනිවූයේ; ජලධරසමයො විය, වහරේකලක් සෙයින්; පසමිතරජො, සන්හුන්රජස් ඇතියේ; වහරේකල්වසින් සන්හිඳුවන රජස් ධූලියැ මොහුවිසින් සන්හිඳුවන රජස් රාගාදි කෙලශයි; එයින් වදාළග-

"රාගො රජො නච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජොති
එතං රජං විප්පජහිත්වා භික්ඛවො
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ"

යනාදි; අලඞ්කාරො විය, භූෂණයක් වැන්න; බ්‍රහ්මචරියස්ස, උත්තමවයස්ථාවට; යොබ්බනො විය, යෞවනයක් වැන්න; ධම්මස්ස, මාර්ගඵලනිර්වාණපර්‍යාප්තිසඞ්ඛ්‍යාත ධර්මයාගේ; සඤ්ඣාඝන, සැඳෑවෙලෙ[illegible]න්; අනුරඤ්ජිතං, උද්දීපිතවූ; සරදසමය, ශරත්කාලයෙහි; රජනිකරො විය, සඳහුසේ; කාසාවචීවර, කාෂායවරයෙන්; සංවුතො, ප්‍රාවෘතවූයේ; අනෙකජනපරිවුතො විය සොභමානො, අනුභාවසම්පත්තීන් අනෙකජනයන්විසින් පරිවෘතයක්හු සෙයින්

හොබනේ; නැවතවාසි, ඒවනයෙහි වාස ඇති; මිගපක්ඛිනං, මෘගයන් හා පක්ෂීන්ගේ; නයන, ඇසට; අමතපානම්ව කරොන්තා, අමා පැනක් දෙන්නක්හු සෙයින්; මත්ත, මත්වූ; මාතඞ්ග, ඇතක්හුගේ; විලාස, විලසින්; ගාමී, යනුයේ; උත්තුඞ්ග, හිඳියාවූ; තරඞ්ග, ඊචීන්ගේ; භඞ්ග, භේදයෙන්; අභිරාමං, මනොඥවූ; ගඞ්ගං නදිං, ගඞ්ගා නම් නදිය; වරරාජගහං, මඞ්ගාතු මහාගොවිඤ්ඤදී වරරාජයන්විසින් ගෘහීතවූ; මොචිතට ගෘහවූ; රාජගහං නාම, රජගහානම් ඇති; අතිමනොහරං, ඉතාමනොහරවූ; නගරං, නුවරට; ඉස්සරියමදමත්තං ජනං, ඓශ්වර්යමදයෙන් මත් ජනයාහට; පරිහාසෙන්තො විය, මෙවෙනි සියුමැලිවන් එවැනි රජසපුවක් පියා පැවිදිවත් සෙස් සත් ඉසුරුමෙදෙන් මත්වනු වියරුයයි පරිහාස කරන්නක්හු සෙයින්; උබ්බත්තවෙසස්ස ජනස්ස, නොසන්හුන් පියෝ ඇති ජනයාහට; ලජ්ජමුප්පාදයමානො විය, තමාගේ ශාන්ත පියොවින් ලජ්ජා ජනපනවන් වූයේ; විය, නවයෞවනයෙහි; කනකි; කාධනිසඣිත; සන්නිභි, උපශමයෙන්; පිණ්ඩාය චරිත්වා, පිඬුසඳහා හැසිර; සජාතකුතුහලං, උපන් කුහුල් ඇති; නාගරං, නුවර වැසියන්; මෙරුමණ්ඩ, මෙරමුන් කොට; අභිහත, අලලනලද; සාගරම්ව, මුහුදක් සෙයින්; අකුලං කත්වා, උලෙලඹ කොට; පණ්ඩවාචල, පාණ්ඩව නම් පර්වතයාගේ; විකච, සුපිපි; වනලතා, වනලියන්ගේ; සුරභි, මනොඥවූ; කුසුම, මලින්; පරිමලෙ, සුවඳවූ; බිම්බිසාරනරාධිපෙන, බිම්බිසාර නම් එනමැති නරපතිහිවිසින්; උපගන්ත්වා, උපගත වැ; නාමගොත්තං පුච්ඡිත්වා, නම්ගොත් පිළිවිස: ආගතො, ආයේ; මෙ, මාගේ සහායො, සබඳ; සක්‍යවංස, ශාක්‍යවංශ නමැති වොටුන්නට; සිඛාමණිභූතො, සිළුමිණිතත්පත්; චක්කවත්තිවිභූතිසාපි, චක්‍රවර්ති සම්පත්තියෙනුදු; රජ්ජං පටික්ඛිපිත්වා, රාජ්‍යප්‍රතික්ෂෙප කොට; ආළාරතාපසෙන, සප්තසමාපත්තිලාභි ආළාරතාපසයාවිසින්; මහායසෙන, මහත් පිරිවර ඇති; උද්දකතාපසෙන, අෂ්ටසමාපත්තිලාභි උද්දක නම් තාපසයාවිසින්; නිරාමිසෙන, පරිත්‍යක්තලොකාමිෂ ඇති; ගණවරියඨානෙන, ඍෂිගණයන්ට ගුරුව සිටි තමන් තමන්ගේ ආචාර්යස්ථානයෙන්; කීළමාන, කෙළනාලද; සමද, මදසහිතවූ; මගධසුන්දරි, මගදරටවැසි අඟනන්ගේ; කෙසපාස, කෙශසමූහයෙහි; අගරුධූම, කළුවැල් දුමින් හා; කුසුම, මලින්; සුරභි, වාසිතවූ; සලිලාය, දිය ඇති—නෙරඤ්ජරාය නදියා තීරෙති එළු තෙල ජලත්තා නෙරඤ්ජරා, නදති ගච්ඡන්ති නදී—තුඬ, තුඬවූ; හඬ, හෑඬවූ; පරපුට්, කෙවිල්ලන්විසින්; සුඬෙ, සොභණය කරනලද; විසාල, මහත්වූ; සාලවනෙ, සල්වෙනෙහි; මහාපධානං, මහත් වීර්යය; ප්‍රපූර්වූ "ඩු ධාඤ්" වීර්යයෙහි වැටේ.

කීයේ මැ නො-

"ධාත්වර්ථං බාධතෙ කශ්චිත්කශ්චිත්තමනුවර්තතෙ
තමෙව විශිනෂ්ට්‍යන්‍යො උපසර්ගගතිස්ත්‍රිධා" යි.

**කාමසුඛල්ලිකානුයොගෙන** යන තැන්හි කාම නම් රූපාදි විෂයයෝ, සුඛ නාම ඒ විෂයෙහි ආස්වාදයෝ. අල්ලික නම් එහි සිත් ආසක්තියෝ. අනුයොග නම් එහි කයින් යෙදුණුබැව් — දිනකර, හිරුහුගේ; වටුමෙ, මාර්ගයෙහි; ආකාශයෙහිය යුසේයි, මෙදිනී මණ්ඩලං, පොළෝමඩුලු—**අත්තකිලමථානුයොගෙන** යන තැන්හි අත්ත නම් ශරීරයෝ. කිලමථ නම් පීඩායෝ. අනුයොග නම් එහි නියුක්තියෝ — **මජ්ඣිමාය පටිපදාය** යන තැන්හි මධ්‍යමප්‍රතිපත්ති නම් ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයෝ. විසාඛ, වෙසක්මස; පුණ්ණමදිවසෙ, පුර්ණවූ මා ඇති චන්ද්‍රමණ්ඩලය ඇති දිවසයෙහි; එයින් කීහ—"මා ඉති චන්ද්‍රො වුච්චති සො එත්ථ පුණ්ණොති පුණ්ණමා" යි. උදයගිර සිඛර, උදයගල්මුදුනට; සිඛාමණීභූතෙ, සිළුමිණි වන්පත්; කමල වන, පියුම්වනයන්; විකසනකරෙ, විකාශකරනුවූ; අසිසිරකිරණෙ, උෂ්ණරශ්මිහි; ගනනීවා, පඞ්චමහාස්වප්නව්‍යාකරණ කොට් හොත්; ඝනච්ඡවරගත, මෙඝච්ඡවරයට සම්ප්‍රාප්තවූ; උරුවෙලායං, මහත්වැලි රැසෙකින් උරුවෙලා නම් ලද ජනපදයෙහි.

**සෙනානිනිගමෙ** යන තැන්හි මහමඬුරජුන්ගේ සෙනාපති සෙනානී නම් විය "සෙනාං නයතීති සෙනානීඃ" යි. එරජ දිව්‍යලොක ගොස් රජකරනකල්හි ඔහුගේ සෙනානීහි වුසූ ඒ ස්ථානය උපචාරයෙන් සෙනානී නම් විය. එයට සර්වදිශාභාගයෙන් ජනයා එළඹෙන්නෙන් නිගම නම් වී. "නිගච්ඡන්ති තස්මින්ති නිගමඃ"යි-**සෙනානිකුටුම්බිකස්ස** යන තන්හි යම්සේ පඞ්චාලජනපදයෙහි නායක රජ පඞ්චාල නම් වීද එසෙයින්ම සෙනානී නම් නියම්ගම්හි නායක කුටුම්බික සෙනානී නම් වී — "කුටුම්බමස්‍යාසතීති කුටුම්බිකඃ" — පරිපුණ්ණ සඞ්කප්පා, පරිපූර්ණ මනොරථ ඇත්තී—"පයසා සංසක්‍ත නම් පායසම්" — අනායාසං, ආයාසරහිත; පරමමධුරං, එදා දසදහස් ලෝධාවැසි දෙවියන් දෙව්ලොව්හිදු මිනිස්ලොව්හිදු ඇතිතාක් ඔජස් තමන්ගේ අනුභාවයෙන් දඬුවෙල්බැමීයක් සෙයින් පෙළා එහි ඇර ඔත්වනබැවින් පරමමධුරවූ; සුරභි, මනොඥවූ; කුසුම, මලින් හා; වසන, පිළින් හා; ආභරණ, පලඳනායෙන් හා; භූසිතා, සැදුම්ලද්දී.

සුනිල් සිනිදු බමරවැළ පැරයූ කෙහෙකලඹ ඇතිවනබැවින් "සන්නිහිතබාලන්ධකාරා" යනුදු වූව දිලිහෙන තුනුසපුව ඇතිවන බැවින් "භාසමානතනුසම්පදා" යනුදු වූ. නවපුබුදු පියුමක් බඳු සොම් මුහුණ ඇතිවනබැවින් "පුණ්ඩරීකමුඛී" යනුදු වූව මිපුලැයි වනබැවින් "හරිණලොචනා" යනුදු වූ. ලහිරුරස්කලඹක් බඳු පැහැ ඇතිවනබැවින් "බාලාතපප්පභාධරා" යනුදු වූව කුමුදුසුදු

දසනයින් සිනා ඇතිවනබැවින් "කුමුදභාසිනී" යනුදු වූ. සරාවිලව පැමිණ හසුන්ගේ රැත බඳු මියුරුහඬ ඇතිවනබැවින් "මධුරහංස නාදා" යනුදු වූව මනනතු පියවුරු ඇතිවනබැවින් "සමුණ්ණත පයොධරා" යනුදු වූ. කමලදලකොමළ අත් ඇතිවනබැවින් "කමල කොමලකරා" යනුදු වූව විසල් දුවත්පියෙස් ඇතිවනබැවින් "පුථු සිලානිතම්බා" යනුදු වූ. අනුපූර්ව ඌරු ඇතිවනබැවින් "කරභොරූ" යනුදු වූව මඳලසගමන් ඇතිවනබැවින් "විලම්බිතගාමිනී" යනුදු වූ.

කුලදෙවතා විය රජනිකරස්ස, ඇස්කෙරේන් සොම්පැහැ ගෙන පැහැපත්වූවාක් වනබැවින් සඳහට කුලදෙවතාවක් වැන්න; වෙලා විය රාගසාගරස්ස, ඇය ඉක්ම රාග නොපවත්නාබැවින් අඳු රාගසාගරයට වෙලාවක් වැන්න; ජොතිමාලා විය නවයොබ්බන චන්දස්ස, නවයොවුන්පුන්සඳඋදයහට රශ්මිමාලාවක් වැන්න; මහානදී විය රතිරසාමතස්ස, සුරතරස නමැති අමෘතයට මහ හොයක් වැන්න; පුඤ්ඤකම්මපරිණාමපරම්පරා විය ලොකස්ස, ලොකයාගේ පුණ්‍යකර්මපරිණාමපරම්පරාවක් වැන්න; විවිධ,අනෙක ප්‍රකාරවූ; අලංකාර, භූෂණයෙනුදු; වසන, විචිත්‍ර වස්ත්‍රයෙනුදු; කුසුමදාම, මල්දම්නුදු; අනුලෙපන, සුගන්ධාඞ්ගරාගයෙනුදු; උපෙත, යුක්තවූ; ලලිත, හාවභාව ඇති; යුවති, තරුණස්ත්‍රීන්විසින්; පරිවුතා, පිරිවරනලද්දී; පටු, ව්‍යක්තවූ; පටහනිනාදානුප්පබන්ධෙන, පටහධ්වනිප්‍රබන්ධයෙන්; පුඤ්ඤසඤ්චයම්ව රූපවන්තං නිසිනනං, සම්භාරාතිශයානුභාවයෙන් නිපන්වනබැවින් රූපවත් පුණ්‍යමූර්ති යක් සෙයින් හුන්නහු; අභිනවභානුබිම්බනිභං, ළහිරුබිඹක් බඳු; රත්තකුවලය, රත්මහනෙල් සෙයින්; කොමළ, කොමලවූ; පාණි තලෙ, අත්ලෙහි; මහී, දොළොවැ; සන්නිහිත, තබනලද; තලාට, නලල්නැමැති; චන්දසකලා, සඳකඩ ඇත්තී — **එවං වොපි** යන තන්හි අපි ශබ්දයෙන් **මනොරථො** යනු ආකෘෂ්ට වේ—ගීරං, නෙ පුල්; උදීරයිත්වා, බැණ; පමොදමානා, ප්‍රමුදිත වෙමින්; ගතා, ගියා—ලොකං සග්ගමොක්ඛාභිමුඛං නයන්ති ලොකනායකො-නට, හො වැලයෙහි; තරු, රුක්හ; පරිගළිත, වගුළ; කුසුම්රෙණු, මල්රො නින්;පිඤ්ජරං, රත්වන්වූ;සුප්පතිඨිතාභිභිත, සුප්‍රතිෂ්ඨිතයස් භාෂිතවූ; තිරෙ, තොවැ; ඛීරසාගර, කිරිමුදහි; තරඞ්ග, රළසෙයින්; පණ්ඩ රෙ, ධවලවූ; පුලිනතලෙ, වැල්පිටුහි; අපරජලනිධිං, අපරසාගර යට; රංසිමාලී විය, හිරුහු සෙයින්;! සලිලවාහිනිං, හොයට; භුවි, පොළොවැ; නපතිතම්ව ගගනතලං, බැස්හුබූ ගගනතලයක් බඳුවූ; ජලතලං, ජලතලයට; ඉන්දධනුසහස්සෙනෙව, ඉන්ද්‍රචාපසහස්‍රයෙන් මෙන්; නදීවාරවිලාසිනි, නදීගත උදකපරම්පරා මැ වාරවිලාසි නින්ගේ; තරඞ්ග, රළනමැති; කරසහස්ස, අත්දහසින්; පරිමට්ඨ, පිරිමදිනාලද; සරීරො, ශරීර ඇතියේ.

**නහාතො** යන තන්හි "ෂ්ණා-ශෞචෙ" යන ධාතුයි--පුබ්බජල නිධිතව, පූර්වසාගරතාවයෙන්; සමුග්ගත, නැඟෙන; පතඞ්ගොව, සූර්‍ය්‍යයා සෙයින්; නදීරොධසි, හොවැළසෙහි.

**අසනං කත්වා** යන තන්හි "අස-භොජනෙ" යන ධාතුයි-සුරභි කුසුම, සුගන්ධපුෂ්පයෙන්; සමලඞ්කතෙ, සැදුම්ලද; සුවණ්ණ, සුවර්‍ණ ඇති; සුරභිගන්ධ, මනොඥගන්ධ ඇති; කුසුමෙසු, පුෂ්පයන්; ඉන්දීවර, නිල්මහනෙල්; අරවින්ද, පියුම්; මන්දාරාදි, මඳාරා ආ; සුරකින්නරසුන්දරීසු, සුරසුඳැරීන් හා කින්නරසුඳැරීන්; සුරභි, සුගන්ධවූ; චන්දනචුණ්ණ, සඳුන්සුන්නෙන්; සමාකුලාසු, සමාකුල්තවූ; කුසුම, පුෂ්පයෙන් හා; කුංකුම, කොකුම්කෙසුරෙන් හා; ධූප, සුගන්ධධූපයෙන් හා; සුවාසිනීසු, සුවඳවූ — මෙහි ධූපශබ්ද සුගන්ධධූපයෙහි වැටේ. විවිධ, විචිත්‍රවූ; චාරු, සුන්දරවූ; මහද්ධජමාලිනීසු, විසල් ධජපඞ්ක්ති ඇති; ලුලිත, ඇලලෙනලද; කමල, මහනෙල්වන හා; කුමුදවනෙ, කුමුදවන ඇති; මකරන්ද, කුසුමරෙණුයෙහි; මධුබින්දුසන්දොහවහෙ, මධුබින්දුසන්දොහ වහනුවූ; කුසුමාමොද, පුෂ්පසුගන්ධයෙන්; තප්පිත, සන්තර්පණය කරනලද; අලිජාලෙ, බමරවැල ඇති; ගන්ධවහෙ, සුළඟනු; මන්දං මන්දං, මඳ මඳවැ; වහති; හමනකල්හි; දෙවගණාලඞ්කත, දෙවිගණන්විසින් සදන ලද; මග්ගෙන, අටඉස්බක් පමණ පළල්වූ මඟින්; මත්ත, මදමත්; ඉභකුම්භ, ඇත්කුඹු; නිබ්භෙදය, බිඳිනව; සොත්ථියබ්‍රාහ්මණ, සොත්ථිය නම් බමුණක්හුවිසින්; උපනීත, එළවනලද; කුසමුට්ඨියො, තණමිටු; සුපරිසුද්ධ, පපරිකාරහිත වනබැවින් සුපිරිසුදුවූ; සිනිද්ධ, කාන්තිමත් වනබැවින් සිනිඳුවූ; සුවට්ට, සුවෘත්තවූ; උජුක්ඛන්ධං, ඉදිකඳ ඇති, ඝනබද්ධ, ඝන කොට බඳ; මොරපිඤ්ඡකලාප, මොනරපිල්කලඹක්හු ගේ; මණ්ඩලසණ්ඨානං, මඩලක් බඳු; මන්දානිල, මන්දමාරුතයෙන්; චලිත, කම්පිතවූ; සාඛාහි, ශාඛායෙන්; ධරණිතලතිලකභූතං, ධරණිතලයට තිලකභූතවූ; සහජාතං, තමා හා සහජාතවූ; තමන් උපන්දවස්හි උපන්; ජයභූමිජං, හැම්බුදුන්ගේ ජයභූමියැ ජාතවූ; විජයපාදපං, විජයවෘක්ෂවූ; නිජ, තමාගේ; හදයම්ව, හෘදය සෙයින්; සීතලං, සිහිල්වූ; සීතලච්ඡායං, සිහිල්සෙවණ ඇති; අස්සත්ථබොධිං, ඇසතුමහබොධියට; තූලිකග්ග, තෙල්අගින්; පරිච්ඡින්නමිව ජාතං, පරිච්ඡින්නාදින්ව නිපන්; නිග්ඝාතසහස්සෙසු, සෙණෑදහසුන්; දසසතනයනො, සක්දෙව්රජ; භුවනවිවර, භුවනොදරයෙහි; ව්‍යාපිතාදං, ව්‍යාපකවනලද ධවනිඇති; තිගාවුතායතං, තුන්ගව්දිග; සරදසමය, සරත්කල්හි; රජනිකර, සඳහුගේ; කරනිකර, රස්කලඹක් සෙයින්; සස්සිරිකං, සශ්‍රීකවූ; සහම්පති මහාබ්‍රහ්මා, සහකනම්ලද ලොකධාතුවට පතිවනබැවින් සහම්පතිනම්ලද මහාබ්‍රහ්ම; දිබ්බපුප්ඵසම්පුණ්ණ, දිව්‍යපුෂ්පයෙන් සම්පූර්ණවූ; විවිධ, නානාප්‍රකාරවූ;

රතනමඤ්ජූසා, රුවන්සුමුඟු; සමුස්සිත, බ්‍රහ්මලොක දක්වා නඟනලද්ද; ධජ, දද හා; පටාක, පතාක හා; කදලි, කෙසෙල් හා; තොරණ, තොරණ ඇතිසව්හු; කුසුමදාමහත්ථා, මල්දම්ගත් අත්ඇතිසව්හු; ගහිත, ගත්තාලද; පුණ්ණකලස, පුන්කලස හා; ධූමකටච්ඡු, දුම්ලොසු හා; මණිදණ්ඩදීපා, මිණිදඬුවැට ඇතිසව්හු; ධාරිත, ධරනලද; අට්ඨමඞ්ගල, රුවන්මුවා සිරිවසපෙළ වල්විදුනාපෙළ ඈ අෂ්ටමඞ්ගලපඞ්ක්ති හා; රතනාදාසපන්තියො, රුවන්මුවා කැටපත් පඞ්ක්ති ඇතිසව්හු; තස්මිං සමයෙ, එකල්හි; සකලලොක, සියලු පුහුදුන් ලොකයා; වසවත්ති, තමාවිසිය වටනුවූ, වසවත්තිමාරො, වශවර්ත්තිදිව්‍යලොකයෙහි මාරනම් දිව්‍යපුත්‍ර; කුමාරොයං, මේ සිදුහත් නම් කුමර; කාමං, එකාන්තයෙන්; සිද්ධත්ථං, සිද්ධාර්ථයා; අසිද්ධත්ථං කරිස්සාමීති, අසිද්ධාර්ථ කෙරෙමියි; අසිද්ධත්ථං යනු නඤ්සමාසයි. ජලමාන, දිලිහෙනලද; අනලමයානි, අග්නිමයවූ; විවිධායුධානි, විවිධවූ ආයුධයන්; දියඩ්ඪයොජනසතිකං, යෙළසියයක් යොදුන්; ගිරිමේඛලාභිධානං, ගිරිමෙඛලානම් ඇති; භීම, භයානකවූ; බීභච්ඡ, බවනුවූ; සාහසාය, ප්‍රචණ්ඩවූ; විරූප, විකෘතිරූප ඇති; අප්පමෙය්‍යාය, ප්‍රමාණරහිතවූ; සරභස, වෙගවත්වූ; මාරසෙනාය පරිවුතො, මහත් කදුළුකැකුළුබඳු තියුණු දළඇති කළාරමුඛ ඇති පෑදුලලාටතට ශපිත විකට භ්‍රැකුටි ඇති ආදීපිත භෛරව දෘෂ්ටි ඇති ප්‍රදීප්ත ඌර්ධ්වකෙශඇති රක්තලොමමාලාකුලප්‍රභෙද ඇති විචිත්‍රවස්ත්‍රනිවසිතවූ සගර්වවූ සරොෂවූ කල්පානලසන්නිභ මාරසෙනායෙන් පරිවෘතවූයේ; ගජ්ජමාන, ගර්ජනා කරනලද; පලය, ප්‍රලයකාලයෙහි; ඝනඝටා, මෙඝමාලාවන්ගේ; සංඝට්ට, සංඝට්ටනයෙන්; සඤ්ජාත, උපන්; චණ්ඩ, ප්‍රචණ්ඩවූ; අසනිසද්දස, සෙණදහසුන්ගේ; සම්පාත, හෙනකලක් සෙයින්; දාරුණෙන, දරුණුවූ; ඝොර, ඝොරබිරම්, නිඝොසෙන, හඬින්; යුගන්ත, ප්‍රලයකාලයෙහි; වාත, වායුවෙගයෙන්; යාත, යනලද; පිචුලවම්ව; පුලුන්සිතෙළි සෙයින්; පලාපෙනෙනා, ප්‍රලයකරනුයේ; ධරාධරඝටා විය, පර්වතඝටා සෙයින්; අජ්ඣොත්ථරිතො, අධ්‍යවස්තරිත වැ-"ස්තෘඤ්-ආච්ඡාදනෙ"යන ධාතුයි. අභිනවප්‍රාග්වර්ෂායෙහි; ජලධරම්ව, මෙඝයක්හු සෙයින්; භිංසනං, භීෂණවූ; චණ්ඩාරම්භං, ප්‍රචණ්ඩවූ ආරම්භ ඇති; සමීරණසාරං, වායුවෙගයක්; කන්දප්පදප්ප, කන්දර්පයාගේ දර්පය; අපනුදිතො, හරනාවූ; තස්ස, ඒ මහාපුරුෂයාගේ; සංවට්ට, සංවර්ත්තකාලයෙහි; වුට්ඨි, වර්ෂාවන්ගේ; වෙගං, ගතිඇති; තුහිනලවප්පමාණම්පි, පිනිබිඳකුඩු පමණ; වසන්තං, මාරයාගේ; කෙතු, ඔඩ; නිපාතිතො, හෙළනුවූ; තස්ස, ඔහුගේ; සම්පමපි, වැළතවද; තෙන්නං, පමුණුවන්නට; පරියන්ත, හාත්පසින්; නිග්ගත, නික්මෙනලද; සිඛාසත, වන්නිශිඛාශතසහස්‍රයෙන්; විජ්ජුලිඞ්ගමාලාකුල, ගිනිපුපුරු පඞ්ක්තීන් අවුල්වූ; ජාලාවලිල්හං, ජ්වාලයෙන් වළඳනාලද; පාසාණවස්සං, පාෂාණවර්ෂා;

පහරණවස්සං, ආයුධවර්ෂා; අඞ්ගාරවස්සං, අඞ්ගාරවර්ෂා; කුක්කුලවස්සං, භස්මවර්ෂා; වාලුකාවස්සං, වැලිවර්ෂා; කලලවස්සං, මඩවර්ෂා; තං සබ්බං; එහැම යථාක්‍රමයෙන්; මාලාගුල, මල්වැට; කුසුමදාම, මල්දම්; පුප්ඵවුට්ඨි, මල්වැසි; චන්දනචුණ්ණ, සඳුන්සුණු; කුසුමරේණු, මල්රොන්, දිබ්බගන්ධභාවං, දිව්‍යගන්ධවිලවුන්බවට; ලොකන්තරික, ලොවැදිරියෙහි අඳුරුසෙයින්; ඝොරං, ඝොරබිරම්; දිනකරසහස්ස, හිරුදහසක්හුගේ; උග්ගමනම්ව, උද්ගමනයක් සෙයින්; කොපොපරත්ත, ක්‍රොධයෙන් රත්වූ; මුඛමණ්ඩල, වක්ත්‍රමණ්ඩලයෙහි; විජම්භිත, විජම්භනාලද; භුකුටි, භ්‍රූභෙදයෙන්; භිංසන, භයානකවූ; වෙසධාරී, වෙෂධාරී වූයේ; මෙරුමන්දරමපි, මෙරමඳුරුගල් පවා; වෙළුකළීරමිව, හුණකිළිල් සෙයින්; ඛණ්ඩයන්තං, කඩනුවූ; අතිතිඛිණං, ඉතා තීක්ෂ්ණවූ; දිබ්බානුභාවොපෙතං, දිව්‍යානුභාවයෙන් සමුපෙතවූ; ඛුරධාරං, ක්ෂුරධාරා ඇති; මාරානුභාවොපෙතානි, මාරානුභාවයෙන් උපෙතවූ; සඤ්ජාතසොකො, උපන්නාවූ ශොක ඇතියේ; දුබ්බාරිතයසවිසරං, නොවැළැක්වියහැකි යශොරාශි ඇති; තං, එව්හු කරා; අජෙය්‍ය, නොදිනියහැකි; වික්කමෙන, පරාක්‍රම ඇති; තෙන, ඒමහාපුරුෂයාවිසින්; පලයජලනිධි, ප්‍රලයසාගරයෙහි; නිග්ඝොස, හඬ; අභිභවන්තියෙන, පරදවනුවූ; තුමුල, මහත්වූ; ඝොර, ඝොරබිරම්; ඝොසෙන, හඬින්; අසම, අසාධාරණවූ; පරක්කමෙන, පරාක්‍රම ඇති; තෙන, ඒමහාපුරුෂයාවිසින්; රත්තජලධරගබ්භතො, රත්වලාගබකින්; නික්ඛන්ත, නිර්ගතවූ; කචනවිජ්ජුම්ව, රන්විදුලියක් සෙයින්; වසවත්තී, පෙරඅනුන් තමාවිසියැ වටනුවූයේ; අවසවත්තීභූතා, දූත්තෙමේ තමාවිසියැ වැටෙන්නට නොපොහොසත් වූයේ; යාව චක්කවාලාවලං, සක්වළගල් දක්වා; මාරසෙනා, මාරසෙනා නමැති; තූල, පුලුනට; පලයාතිලො, ප්‍රලයානිලවූයේ; අභෙජ්ජවීරජයවරමඞ්ගලපල්ලඞ්කා, අභෙද්‍යපර්‍ය්‍යඞ්කය වීරපර්‍ය්‍යඞ්කය ජයපර්‍ය්‍යඞ්කය වරපර්‍ය්‍යඞ්කය මඞ්ගලපර්‍ය්‍යඞ්කයයි කියනලද මහාබොධිපර්‍ය්‍යඞ්කයෙහි; සුරාසුරභුජගභුජගාසනාදීහි, දෙවදානවොරගගරුඩාදීන්විසින්; ගන්ධබ්බදිබ්බකුසුමදාමාදීහි, ගන්ධපූජායෙන් හා දිව්‍ය කුසුමදාමාදීන්විසින්; බහලධූපපරිමලං, බහලවූ ගන්ධධූපයෙන් සුගන්ධකොට, **කාරෙත්වා** යනු හා සබඳ. ගන්ධචුණ්ණ, ගඳසුන්නෙතන්; රෙණු, කුසුමරොනිනුදු; පරිවාසිතං, පරිවාසිත කොට; එකසිරිසම්පජ්ජලං, එකශොභායෙන් සම්ප්‍රජ්වලිතකොට; එකවණ්ණං, එකොත්සව කොට; එකනින්නාදම් කාරෙත්වා, එකකොලාහල කොට; කරවාය යන් යෙදේමැයි. පුබ්බෙනිවුත්ථ, පූර්වොෂිතවූ; ඛන්ධසන්තානං, ස්කන්ධපරම්පරා; අනුස්සරන්තො, අතීතාංශඥානයෙන් බලනුයේ; ඔලොකෙන්තො, ඒ දිව්‍යචක්ෂුස්හුගේ පරිභාණ්ඩඥාන සංයොග අනාගතාංශඥානයෙන් බලනුයේ; පටිච්චසමුප්පාදසාගර, අගාධවූ අපාරවූ ප්‍රතීත්‍යසමුත්පාද නමැති මහාසමුද්‍රයෙහි; ඤාණමෙරුමන්ථං, මහාවිජ්ඥාන නමැති මේරුමන්ථය.

**වට්ටවිවට්ටානුලොමපටිලොමාදිනයවසෙන සම්මසනතො** යත්
තන්හි "අවිජ්ජාපච්චයා සංඛාරා" යනාදීන් නැඟි ජරාමරණ පර්යන්-
තවූ ද්වාදශාඞ්ග වෘත්තයැ. "අවිජ්ජානිරොධා සංඛාරනිරොධො"
යනාදීන් නැඟි ද්වාදශාඞ්ග විවර්ත්තයැ. අනුලොමපටිලොමාදිනය නම්
ප්‍රථමධ්‍යානයැ; එහි විභාග පාරමිතාසම්භරණයෙහි කීපරිද්දෙන්
දන්නේය. **දසබලචතුවෙසාරජ්ජාදි** යන තන්හි **දශබල** නම් දශ
ස්ථානයෙක්හි අකම්ප්‍යවූ ඥානබලයැ. **චතුවෛශාරද්‍ය** නම් සතර
ස්ථානයෙක්හි විශාරදබවයැ. සබ්බඤ්ඤුතඤ්ඤාණමතං, සර්වඥතාඥාන
නමැති අමෘතය; යම්සේ පූර්වදෙවයෝ මෙරුමන්ථයෙන් සමුද්‍රමථ-
නය කොට අනෙකරත්නයෙන් පරිවෘත අමෘතය නඟා ගත්හුද
එසෙයින්ම මහාපුරුෂ ප්‍රතීත්‍යසමුත්පාදසාගරය ඥානමේරුමන්ථ-
යෙන් අලලා දශබලචතුවෛශාරද්‍යාදිගුණරත්නයෙන් පිරිවරන
ලද සර්වඥතාඥාන නමැති අමෘතය නඟා ගත යුසේසි. සවාසන, වාස-
නා හා සමග; ආසවෙ, චතුර්විධ ආශ්‍රවයන්; කාලත්තයවත්තිනං,
භූතභවිෂ්‍යද්වර්ත්තමානය යන කාලත්‍රයවර්තීවූ; සබ්බවත්ථුං, සංස්කාර
විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්තිය යන ද්‍රව්‍යප්‍රභෙදවූ සර්වවස්තු; කර-
තල, අත්ලේ තුබූ; ආමලකම්ව, මිණියක් සෙයින්; එයින් කීහ—
"අමලමෙව අමලකං මණිරතනං" යි—පරිපුණ්ණසංකප්පා, පරි-
පූර්ණවූ සර්වමනොරථ ඇතියේ; උදානං උදානෙසි, උදන් උදන-
කෙලේ—මෙහි **උදාන** නම් කළක් තෙල් තැළියෙක ඔතාකල්හි
තැළියේ ගන්නා ගෙනැ නොගන්නා ඉතිර වැම්මෙන සෙයින්
ලෙහි උපන් ප්‍රීති කොහැම්මියහී කරන වාග්ව්‍යවහාරයි.

භගවතො, භගවත්වූ; අරහතො, අර්හත්වූ; සම්මාසම්බුද්ධස්ස,
සම්‍යක්සම්බුද්ධයා; මෙසෙයින් දීපඞ්කරපාදමූලයෙහි කෘතාභිනිර්හාර
වැ සමත්‍රිංශත්පාරමිතා පුරා බොධිමණ්ඩාරූඪ වැ සම්‍යක්සම්බොධි
සමධිගම කළ ඒභගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයා සම්බන්ධයැ මහා
බොධිය යන මෙයින් "**කස්ස සම්බන්ධිනී**" යන ප්‍රශ්නය පරිගෘහීතයි.

සො, යමෙක්; ඉති, මෙසේ උක්තක්‍රමයෙන්; විපුලදයො, මහත්
කරුණා ඇතියේ; ලොකනිත්ථරණත්ථං, ලොකයා සංසාරයෙන්
නිස්තරණය කරනසඳහා; පවිසිය භවදුග්ගං, සංසාරදුර්ගයට
වැද; පාරමී පූරයිත්වා, පැරුම් පුරා; හතසකලකිලෙසො, හතවූ සර්ව-
ක්ලෙශයන් ඇතියේ; පත්තසබ්බඤ්ඤුභාවො, ප්‍රාප්තවූ සර්වඥභාව
ඇතියේ; පරහිතනිරතො, පරහිතයෙහි නිරත විද; අස්ස, මේ;
තස්ස බුද්ධස්ස, ඒ සම්‍යක්සම්බුද්ධයාගේ; බොධි, බොධියයි.

අභිසම්බොධිකථා.

---

## අනඤබොධිකථා.

අභිඤ්ඤා යන තන්හි "ඤපුද්-සතුතෙඹ" යන ධාතුයි. සංවට්ට කප්පෙ, නස්නා කප්හි; විවට්ටකප්පෙ, හටගන්නා කප්හි; තස්මිංයෙව කප්පෙ, එම විවර්තකල්පයෙහි; විවට්ටට්ඨායිකප්පෙ, එම හට ගෙන සිටි කප්හි; සමණපරික්ඛාරං දෙති, ශ්‍රමණයනට අලඞ්කාර රූපයෙන් සිටි පාත්‍රචීවරාදි පරිෂ්කාරයද්ද.

නු ලඞ්ඝනීයං යන තන්හි "ලඝි-ගත්‍යාම්" යන ධාතුයි. මගධෙසු, "මගධා නාම ජානපදිනො රාජකුමාරා තෙසං නිවාසො එකොපි ජනපදො රුළ්හිවසෙන මගධාති වුච්චති තස්මිං මගධෙසු ජනපදෙසු" යි ගත්වනබැවින් ජනපදක්‍ෂත්‍රියනාමයෙන් මගධ නම් ලද ජනපදයෙහි; මහීවරවධූ, පොළෝරූඳුරියගේ; හදයඨානීයෙ, අදවතය යන්නට නිසිතන්හි; ඵලරුහමහාබොධි, ඵලයෙන් දුනු මහාබොධියෙක්; අථ, සම්‍යක්සම්බොධිසමධිගම කළ ඉක්බිත්තෙන්; අනෙක, නොයෙක්; ගුණගණාභරණ, ගුණගණනමැති ආභරණයෙන්; භූසිතො, අලඞ්කෘත වූයේ; අපරිමිතසමය, අනන්තාපරිමාණකාලයෙහි; සමුපචිත, රැස්කරනලද; පාරමිතා, බොධි සම්භාරයන්ගේ; ඵලාධිගමඨානං, පල ලද තැන්; පභප්පභා, පභප්‍රභා වන්ගේ; සමුදය, උද්ගමයෙන්; සමුජ්ජලෙන, දිලියෙනුවූ; පීතිවික සිතෙන, ප්‍රීතීන් විකසිතවූ; අනිමිසෙන, නොහෙළනලද ඇසිපිය ඇති; පෙම්භර, ප්‍රෙමයෙන් නොහැම්මියහැකිවූ, නයනයුගලෙන, යුවලනුවනින්; තංඑ, යේ අනිමිෂචෛත්‍යස්ථානයෙහි; රජනිකර, සඳහු සෙයින්; සොම්මගතෙනා, සෞම්‍යගාත්‍ර ඇතියේ; පභනෙතෙනා, පසැස් ඇතියේ; රතනචඞ්කමෙ, රුවන්සක්මන්හි; යේ බොධිපයඞ්කය හා අනිමිෂ හා දෙඅතුරේ පූර්වපශ්චිමායාත වූයේ. රතනඝරෙ, රුවන්ගෙහි; යේ බෝමඬට පැළදෙසැ වූයේ. අජපාල මූලෙ, අජපල්නුගමුල්හි; යේ බෝමඬට පැදුම්දෙසෙහි වූයේ. මාර විලාසිනී, මාරකන්‍යාවන්ගේ; මුඛකමලවනං, මුවන්පියුම්වනය; මිලාපෙනෙනා, මලානික කරනුයේ; දුටුකල වුවන්පියුම් හැකිළෙනු විස්මයෙක් නොවෙයි. එයින් කීහ-*

"පුබ්බාචදනවරිතෙෂු සුදුසතරෙෂු
ගිතෙෂු යස්‍ය සුරකින්නරසුන්දරීභිඃ
අද්‍යාපි චන්ද්‍රකිරණෛරිව සඞ්කුචන්ති
මාරාඞ්ගනාවදනපඞ්කජකානනානි" යි.

---

* ආචාර්‍ය්‍ය චන්ද්‍රගොමිපාදයෝ.

මුචලින්දමූලෙ, මිදෙල්දුවිල්තෙර මිදෙල්රුක්මුල්හි; හේ බෝමඩට අග්නිදෙසෙහි වූයේ. මනකුමුදවනං, මනනැමැති කුමුදවනය; රාජායතනමූලෙ, කිරිපලුරුක්මුල්හි; හේ බෝමඩට දකුණුදෙසෙහි වූයේ. සත්ත සත්තාහානි වීතිනාමෙත්වා, සත්සති ගලවා — "සක්කෙනාති එත්ථ වීසු දෙවලොකෙසු උප්පන්නානං අධිකරණං විනිච්ඡිනුං සක්කොතීති සක්කො, සක්කච්චං දානං අදාසීති වා සක්කො"— අගදහරීටකං, අමාඅරළු; නාගලතාදන්තකට්ඨං, නාලියදඬුදැහැටි; වාණිජමෙසං, තපස්සු භල්ලිකය යන වෙළඳුන් දෙදෙනාවිසින්; උපනීත, එළවනලද; මහාරාජූපනීතෙ, වරම් මහරජුන් සතරදෙනාවිසින් උපනීතවූ.

**අධිගතො ඛො මයායං ධම්මො** යන තන්හි ධම්මශබ්ද නිර්වාණයෙහි වැටේ-පඨවිසන්ධාරකඋදකක්ඛන්ධො විය, පොළෝ ධරා සිටි දියකඳ සෙයින්; පස්පොළෝ යට දියපොළෝ සෙයින යුසේයි. සාදුරස, මීහුරුරස ඇති; භොජනම්ව, භොජනයක් සෙයින්.

"පණ්ඩිතවෙදනීයොති එත්ථ පණ්ඩිච්චෙන සමන්නාගතො පණ්ඩිතො, අථ වා ධාතුකුසලො ආයතනකුසලො පච්චයාකාරකුසලො කාරණාකාරණකුසලොති ඉමෙහි චතූහි කාරණෙහි පණ්ඩිතොති වෙදිතබ්බො".

**කුලවංස** යන තන්හි කුලශබ්ද තත්කාලවර්තීන් කෙරෙහි වැටේ. වංශශබ්ද ප්‍රබන්ධයෙහි වැටේ. එසින් කීහ-

"විද්‍යයා ජන්මනා වා'පි ප්‍රාණිනාමෙකලක්ෂණඃ
තත්කාලවර්තී සන්තානො වංශ ඉත්‍යභිධීයතෙ" යි.

දීපකං, ප්‍රදීපායමානවූ නොහොත් ප්‍රතිෂ්ඨාපකවූ—"භරියනති එත්ථ භත්තවත්ථාදීහි භරිතබ්බතාය භින්නසංවරතාය ලොකධම්මෙහි භරිතබ්බත්තා වා භරියා"—සීලවීතික්කමං පඨවිමුබ්බත්තානමිව මඤ්ඤමානෙන, ශීලව්‍යතික්‍රමය පොළෝ පෙරළන්නක්හු සෙයින් භගවත්නහුවිසින්. එම වදාළහ-

"සකජීවිතපරිච්චාගො තිණතො ලහුකො මම
සීලවීතික්කමො මය්හං පඨවිඋබ්බත්තනං විය" යි.

වාසරසඞ්ඛියා, සවස්හි; අගදණ්ඩකෙන, ලෝදඬුයෙකින්; අකොටිත, පහරනාලද; කංසතාලං විය,*කස්තලක් සෙයින්; වාතාහතෙ, වායුවිසින් ආහතවූ; කජ්ජපුණ්ණ, කළකැඳින් පුරනලද; ලාබු විය, ලබුපකක් සෙයින්; තක්කභරිත, පූතිතක්‍රයෙන් භරිතවූ; චාටි විය, සැළක් සෙයින්; වසාතෙලපීත, වශාතෛලයෙන් පරිපීතවූ, පිලොතිකා විය, පිළොතිකා සෙයින්; අජනමක්ඛිත්ත, අජනයෙන්

* කංසථාලං—පෙළපොත්හි.

භූෂිතවූ; හතො විය, ගසතයක් සෙයින්; කිලෙසහරිතා, ක්ලේශයෙන් හරිතයහ; අත්‍තසංකිලිට්ඨා, ඉතා සංකලිෂ්ටයහ; රාගරත්තා, රාගයෙන් රක්තයහ; දොසදුට්ඨා, ද්වෙෂයෙන් දුෂ්ටයහ; මොහමූළ්හා, මොහයෙන් මූඪයහ; අවිජ්ජාරාසිනා අජ්ඣොත්‍ථටා, "අට්ඨසු ඨානෙසු අන්‍ධකාරභූතා ඝනබහලමහාඅවිජ්ජා" යි ගත්වනබැවින් අවිද්‍යාරාශීන් අධ්‍යවස්තෘතයහ; ඇඩ මිරිකා පියතලද්දහ; සඤ්ජාතනිරුස්සාහො, සඤ්ජාතවූ නිරුත්සාහ ඇතියේ.

**ආදිනා නයෙන** යන තන්හි ආදිශබ්දයෙන් "විනස්සති විත භො ලොකො යත්‍ර හි නාම තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනාය" යනු ආක්ෂිප්ත වේ.—මහන්තානං සද්දං නිච්ඡාරෙත්වා, දශසහස්‍රලොකධාතු එකනිනාද කොට මහත් ශබ්දයක් විනිද; දසහි බ්‍රහ්මසහස්සෙහි සද්ධිං, දසදහසක් මහාබ්‍රහ්මයන් හා සමග; භගවතො පුරතො පාතුභවිත්වා, බුදුන් පෙරට ප්‍රාදුර්භූත වැ; යම්සේ "රාජා ගච්ඡති" යන තන්හි ප්‍රධාන රජහුගේ ගමනින් අප්‍රධාන අමාත්‍යාදීන්ගේ ගමන් සූචිත වේද එසෙයින්ම ප්‍රධාන මහාබ්‍රහ්මරාජයාගේ ගමනින් අප්‍රධාන දෙවරාජාදීන්ගේ ගමන් සූචිත වේ. එදා සහම්පතිමහාබ්‍රහ්ම දශසහස්‍ර ලොකධාතුවෙහි සපරිවාරවූ දසදහසක් මහාබ්‍රහ්මයන් හා එසෙයින්ම සපරිවාරවූ දසදහසක් පරනිර්මිතදෙවරාජයන් හා දසදහසක් සුනිර්මිතදෙවරාජයන් හා දසදහසක් තුෂිතදෙවරාජයන් හා දසදහසක් සුයාමදෙවරාජයන් හා දසදහසක් ශක්‍රදෙවරාජයන් හා සතලිස්දහසක් චරම්මහරජදරුවන් හා සමග බුදුන් පෙරට වැ පහළ විය යූසේයි.

**ආදිනා නයෙන** යන තන්හි ආදිශබ්දයෙන් "දෙසෙතු සුගතො ධම්මං සන්ති සත්තා අප්පරජක්ඛජාතිකා අස්සවනතා ධම්මස්ස පරිහායිස්සන්ති භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො" යනු ආක්ෂිප්තයි.

"අප්පරජක්ඛාති පඤ්ඤාමයෙ අක්ඛිම්හි අප්පං පරිත්තං රාගදොසමොහරජං එතෙසන්ති අප්පරජක්ඛා, මහන්තං රාගදොසමොහරජං එතෙසං පඤ්ඤාමයෙ අක්ඛිම්හීති මහාරජක්ඛා"

අභබ්බපුග්ගලෙ පහාය, ෂොඩශාකාරයෙන් ආශයානුශයාදි බැලූකලැ විනෙය වන්නට නොනිසි අභව්‍යපුද්ගලයන් පියා; වචනාමිතරංසියො, වචන නමැති අමෘතරශ්මීන්; මෙසෙයින් මේ වාක්‍යයෙහි ආදියැ **රජනිකරසොම්මගත්තො** යනු **මාරවිලාසිනිමුඛකමලවනං මිලාපෙන්තො** යන තන්හිදු **නාගරාජස්ස මනකුමුදවනං ඕබොධෙන්තො** යනු **බ්‍රහ්මානං වචනාමතරංසියො විස්සජ්ජෙසි** යන තන්හිදු ප්‍රත්‍යන්තයෙන් යොදනු-අජපාල, අජපල් නම් නුග

නමැති; උදයසෙල, උදාගලින්; සමුට්ඨිතො, නැඟී; ජිනවරසුරියො, බුදුසූර්‍යයා; උපකාදයො පරිතොසෙන්තො, උපකාදීන් පරිතුෂ්ටකො රෙමින්; ආදිශබ්දයෙන් දිව්‍යමනුෂ්‍යාදීන් කියනු. කුසුම, මල්හි; ආමොද, පියහඳින් උපන්; මදමොදමාන, මදයෙන් මුදිතවූ; භමර, භෘඞ්ගගන; මධුකර, බමරුන් ඇති; සාඛාපාදපං, ශාඛායෙන් වජ ඹනා පාදපයන් ඇති; මත්ත, මත්වූ; මොර, මොනරුන් හා; කොකිල, කෙවිල්ලන්විසින්, විරුතං, කූල්නාලද; ඉසිපතනං නාම මිගදායං, සෘෂීන්ගේ පතනයෙන් හා උත්පතනයෙන් ඉසිපතන නම්ලද මිගදායයට; කින්නර, කිඳුරන් හා; කරවීක, කුරවීකෙවිල්ලන්ගේ; රුතසදිසෙන, හඬබඳු; සරෙන, මියුරු ගැඹුරුහඬින්; පඤ්චවග්ගියෙ භික්ඛූ, අනුප්‍රව්‍රජිතභික්ෂූන් පස්දෙනා; ධම්මචක්කප්පවත්තනසුත්තං, ත්‍රිපරිවෘත්තකවූ ද්වාදශාකාරවූ අනුත්තර ධර්මචක්‍රය පවත්වනුයේ; දෙසනාරංසිනා, ධර්මදෙසුන් නැමැති රශ්මීන්; මොහන්ධකාරනිකරං භින්දිත්වා, අවිද්‍යානමැති අන්ධකාරරාශිය විධ්වංසනය කොට; සකලලොකෙ, සර්වලොකයෙහි; ධම්මාලොකං දස්සෙත්වා, ධර්ම නමැති ආලොක දක්වා; වෙනෙය්‍යජනකමලවනවිකාසං අකාසි, විනේජන නමැති කුමුදුවන පිබිදිවී. මේ වාක්‍යයෙහි ආදිය 'ජිනවර සුරියො' යනු 'දෙසනාරංසිනා' යන තන්හිදු 'මොහන්ධකාරං භින්දිත්වා' යන තන්හිදු 'ධම්මාලොකං දස්සෙත්වා' යන තන්හිදු වෙනෙය්‍යජන කමලවනවිකාසං අකාසි' යන තන්හිදු ප්‍රත්‍යකයෙන් යොදනු.

මිගවනරණභූමියං, මෘගදාය නැමැති සඞ්ග්‍රාමභූමියෙහි; පඤ්ඤාහෙතිනා, ප්‍රඥානමැති හේතියෙන්; දෙසනාඛග්ගං, දෙශනා නමැති ඛඩ්ගය; වෙනෙය්‍යසහායජන, වෛනෙයජනනමැති සබඳනට; පරිපීළක, පීඩා කරනුවූ ; කිලෙසරිපුසීසානි, කෙලෙස්නමැති සතුරන්හිස්; සද්ධම්මජයභෙරිං, සද්ධර්ම නමැති ජයබෙර; සද්ධම්මජයකෙතුං, සද්ධර්ම නමැති ජයකෙතුව; සද්ධම්මජයථූණං, සද්ධර්ම නමැති ජයටැඹ; සබ්බලොකෙකරාජා හුත්වා, සියලුලොවට එකරජ වැ; භවබන්ධනා, සංසාරබන්ධනයෙන්; නිබ්බානඅභයපුරං, නිර්වාණ නමැති ක්ෂෙමනගරයට; උරුවෙලගාමිනං මග්ගං පටිපජ්ජිත්වා, උරුවෙලගාමිමාර්ගයට පිළිපැද; භද්දවග්ගියරාජකුමාරෙ, "රූපෙන ච චිත්තෙන ච භද්දකා වග්ගබන්ධෙන ච විචරන්ති තස්මා භද්දවග්ගියාති වුච්චන්ති" යි ගත් භද්‍රවර්ග නම් රාජපුත්‍රයන්; මඟගතායාමතරසං පායෙත්වා, කප්පාසිකවනයෙහි දක මාර්ගත්‍රයාමෘතරස වළඳවා; පබ්බජ්ජං දත්වා, එහිභික්ෂුභාවයෙන් පැවිදි දී; උය්‍යොජෙත්වා, ජනපදචාරිකාවට මෙහෙයා; එව්හු එද ගියාහු නොයෙක් මහජනා අරිබිම්හි පිහිටුවමින් ගොස් බුදුන් දෙව්රම්හි වැඩවසනකල්හි එබුදුන් සරා එළඹැ අනමතග්ග දෙශනා අසා රහත්වූහු. ජටිලානං,

ජටා ඇතිබැවින් ජටිලයන යන නම් ලද තාපසසහස්‍රයන්ගේ; අන්තොජටා ච බහිජටා ච, වේණුගුල්මාදීන්ගේ ජටාසඞ්ඛ්‍යාත ශාඛාජාලාසෙයින් අවුල් වූ ස්වපරිෂ්කාරපරපරිෂ්කාරයෙහිදු ස්වාත්මභාවපරාත්මභාවයෙහිදු ආධ්‍යාත්මිකායතනබාහ්‍යායතනයෙහිත් වටවටාලා උඩුයටියාව උපන්නෙන් අන්තර්ජටා බහිර්ජටා නම් ලද තෘෂ්ණාවන්; විජටෙත්වා, අනෙකප්‍රාතිහාර්‍ය්‍යසහස්‍රයෙන් හා ධර්මදෙශනායෙන් විජටන විධ්වංසනය කොට-“අරහත්තමග්ගන්ති එත්ථ අරහතො භාවො අරහත්තං, තස්ස මග්ගො අරහත්තමග්ගො, තං අරහත්තමග්ගං”-තාරාගණපරිවුතො, තාරාගණයන්විසින් පරිවෘතවූ; සරදසමය, සරාකල්හි; රජනිකරො විය, සඳහු සේ; තරුණ, නුමුහු කළ; තරුසණ්ඩසමලංකතං, රුක්සියෙන් ගැවසීගත්; පල්ලව, පළුපත්හි; රාග, පැහැයෙන්; අරුණං, රත්වූ; අනවරත, එක්වන්; පතිත, බස්නාලද; කුසුමරෙණු, මල්රොනින් රජිතං; පැහැපත්වූ; ලතාමණ්ඩප, ලියමණ්ඩපයන්ගේ; තලගත, මළුවට ගියාවූ; සිඛණ්ඩිමණ්ඩල, මොනරමණ්ඩලයන්විසින්; ආරද්ධනච්චං, ආරම්භකරනලද නැටුම ඇති; වාදසනවුත, දෙලොස් ඳුහුවක්; බ්‍රාහ්මණගහපතිපරිවුතං, බ්‍රාහ්මණගෘහපතීන්විසින් පරිවෘතවූ; වසුධාතල, පොළෝතෙලෙහි; නිහිතනලාටං, තබනලද නළල් ඇති; පසගපිහිටුවා වඳනාලද; පරිපාචිතකුසලමූලං, පූර්වබුද්ධයන් ශාසනයෙහි දානශීලාදිවිසින් සිඛ කොට පරිපාකයට පමුණුවනලද කුශලමූලයන් ඇති; ධම්මකථාමතරසෙන, ධර්මකථා නමැති අමෘත රසයෙන්; දෙවදානවොරගරාජපරිවුතො, දෙවරාජාදීන්විසින් පරිවෘත වූයේ; ගීයමානගුණසොභො, ගායනාකරනලද ගුණශොභා ඇතියේ; ජිනාසභො, ජිනවර; අපරිමිතසමය, අනන්තාපරිමාණ කාලයෙහි; සමුපචිත, රැස්කරනලද; කුසලබලජනිත, පුණ්‍යබලයෙන් නිපන්; අනොපමාය, නිරුපම්වූ; රාජගහනගරං, රජගහා නුවරට; සලිලාවලාවසානං, දියපොළොව පර්‍ය්‍යන්තකොට ඇති; වෙළුවන, අටලොස්හත් මහපවුරෙන් පිටත වට මහත් ඝන හුණවනයෙන් සඤ්ජාදිත වනබැවින් වෙළුවන නම්ලද; ආරාමං, ගෘහස්ථයනුදු ප්‍රව්‍රජිතයනුදු එහි රමණය අභිරමණය කරන්නෙන් ආරාම නම්ලද උයන; කුසුම්භාර, පුෂ්පභාරයෙන්; අවනත, නතුවූ; තරුවර, රුක්රජුන්විසින්; නිචිතෙ, ගැවසීගත්; පවිකසිත, යහපතව පිපි; කමල, රත්මහනෙලින් හා; කුවලය, නිල්මහනෙලින් අලඞ්කෘත, සැදුම්ලද; ජලාසයෙ, පිරුණුපොකුණු ඇති; මුදු, මොලොක්වූ; සුරභි, සුවඳවූ, සිසිර, සිහිල්වූ; සුච, යහපහස් දෙනුවූ; පවනෙ, සුළඟ ඇති; සීලකබ්බස්ඛාවාරං, සිල්නමැති කඳවුර; සමාධිකුන්තං, සමාධි නමැති කුන්තය; සබ්බඤ්ඤුතඤාණසරං, සර්වඥතාඥාන නමැති ශරය; ධම්මරාජා යන තැනට මේ වාක්‍යයෙන්

ආදිය 'රාජා විය මහානුභාවො' යනු ඈර යොජනා කරනු. යථාරුචි තෙන විහාරෙන, චතුර්විධ විහාරයන් කෙරෙහි යථාභිමත විහාරයෙකින්; විහරති, පස්බුදුකිස සමපාදනයකොරෙමින් වෙසේ; පවත්ත වරධම්මචක්කො, පවත්වනලද උතුම් ධම්සක් ඇතියේ; වෙළුවනෙ විහරතීති සුත්‍රා, සත්වැඩ සාකමින් වෙළුවනඋයන්හි වෙසෙයි යනු අසා; බුද්ධභූතං, බුද්ධත්වයට ප්‍රාප්තවූ; තෙසු එකම්පි අපස්සන්තො, ගියගිය අමාත්‍යයන් පිරිස් පයඪිනනායෙහි සිට ධම්දෙසුන් අසා සහ පිරිවරින් රහත් වැ එහිභික්‍ෂුභාවයෙන් පැවිදි වැ බුදුන්කෙරෙහිම වුසුවනබැවින් ඔවුන්කෙරෙහි එකක්හුද නොදක්නේ; බුද්ධවල්ලභං, ජලක්‍රීඩායෙහි පටන්ගෙන පුරුදු වැ ආ වනබැවින් බුදුන් කෙරෙහි වල්ලභවූ;'සහජාතං, ලුම්බිනී වේනෙහි බුදුන් උපන් දවස් උපන්නාවූ; මධුරභාසිතං, මිහිරු තෙපුල් ඇති–"කාළුදායීනම් එසා සකලනගරස්ස උදගචිත්තදිවසෙ ජාතොති උදායි නාම ජාතො ථොකං කාළුධාතුකත්තා පන කාළුදායී"–දසබලධම්මදෙසනං සුත්‍රා, බණ්සන තුන්පුග්ගලන් කෙරෙහි තුන්වන පුද්ගල වැ බුදුන්ගේ ධම්දෙසුන් අසා; වසන්තකාල, කුසුමාගමයාවිසින්; ජනිත, දනවනලද; අධික, බොහෝවූ; කිසලය, පලුපතින්; විලසිතානි, පැහැපත්වූ; 'වනගහනානි' යනු හා සබඳ. සුනීල, අභිනීලවූ:දල, පතින්; විපුල, ගහනවූ; සාඛාසහස්සානි, ශාඛාසහස්‍රයන් ඇතියවුහු; සුගන්ධ, සුරභි ගන්ධවූ; විවිධ, නොඑක් සංස්ථාන ඇති; විචිත්ත, නොඑක් පැහැ ඇති; කුසුම, මල්සියෝ; 'දුම, වෘක්‍ෂයන්ගේ; සමූහානි, සමූහ වූහ; මධුර, මිහිරුවූ; මයූර, මොනරුන්ගේ; විරුතානි, හඬ ඇතියවිහ; මද, මෙදෙන්; මුදිත, මත්වූ; විවිධ, නොයෙක්ප්‍රකාර ඇති; විහග, සිහිරු කිඳුරු කුරවී ඈ ලිහිණියන්විසින්; බහුවිධ, නොයෙක් ලීලායෙන්; නදිතානි, කුල්නාලද; වනානි, වනයෝ; විමල, පහන්වූ; අභිනීල, සුනිල්වූ; විපුල, බොහෝවූ; සලිල, දියෙන්; පූරිතානි, පුරනලද වූහ; ( පඤ්ජනන, පුදපුම්නයාවිසින්; * ) උජ්ජ්වල, සුපිපි; කල්හාර, හෙල්මැලි; කුමුද, කුමුදු; රත්මහනෙල්; කුවලයානි, නිල්මහනෙල් ඇතියවිහ; අභිනදිත, තරකොට හඬනලද; සමද, මදසියෝ; කාදම්බ, කලහසුන්ගේ; කදම්බකානි, මුළුඇතියවිහ, තීරන්ත, විල්වැලයෙහි, ජාත, දුනු; දුම, වෘක්‍ෂයන්ගෙ; කුසුම, මලින්; සමාකිණ්ණානි, සැදියවිහ; කෙතකීධූලි, දුනුකේහළුයෙන්; ධූසර, දිඹිලිහුන්; කූල, සලිලාන්තයෙහි; පුළිනානි, වැලිඇතියවිහ; සලිලාසයසහස්සානි, විල්දහස්හු–"සලිලානාමාශයඃ සල්ලාශයඃ"–සුගන්ධ, සුවඳවූ, මුදු, මොළොක්වූ; සීතල, සිහිල්වූ; අනිල, මාරුතයන්විසින්; පරිගතානි, ඇවිදුනාලදුවවිහ; භුවනන්තරාන්, ගගනකුහරයෝ; වෙළුරියකඤ්චුක, වෙරළුමිණිකසු; අවගුණ්ඨිතානි විය, පෙරෙවියන් වැනියවිහ; සඳලුදල, හීනණපනින්; හරිතානි, නිල්වූ; ධරණීමණ්ඩලානි,

* මෙය පෙළ පොත්හි නොපැනේ.

**ඡම්මණ්ඩලයෝ** — ධම්මස්ස ඉස්සරෝ ධම්මිස්සරෝ තස්ස ධම්මිස්සරස්ස ධම්මසාමිනො දසබලස්ස, ඉදානි අධුනා කුලනගරගමනසමයොති දඨබ්බො — ගමනවණ්ණනං, ගමන්සඳහා වර්ණනා; බ්‍රහ්ම, බඹුන්ගේ; සුර, දෙවියන්ගේ; අසුර, දානවයන්ගේ; උරග, නාරජුන්ගේ; මකුට, වොටුන්නෙහි; මණිහමර, සිළුමිණි නමැති බමරුන්විසින්; පරිචුම්බිත, සෙවුනාලද; චරණ, පතුල්නමැති; කමලයුගලො, පියුම්යුවළ ඇතියේ; ජඞ්ගමො යන තන්හි "ගමු-සෘ-පෘ ගතෞ" යන ධාතුයි. ඔහු කෙරෙන් පරව පුනඃ"පුනර්ගච්ඡති භෘශං වා ගච්ඡති"යන වාක්‍යයෙහි යඞ්ප්‍රත්‍යය කොට යඞ්හට ලුක් කොට යඞ්ලුගන්තයෙන් අච්කලකලැ ජඞ්ගමශබ්දය සිඬවේ. **කනකගිරිවරො** යන තන්හි කනකපර්වතයනට වර වූයේ මෙරුපර්වතයයි. රත්පවුල් පෙරෙව බුදුන් පිරිවැරූ සඟහු රත්පලස් පිරිබෙව් වැනි වූහ-එසඟුන් මැද වඩනා බුදුහු ජඞ්ගම රුවන් මෙරක් වැනි වූහ යුෂේයි. සරීරරස්මීහි, දෙහප්‍රභායෙන්; වනනාතරං, වනඅතුරෑ; ඉන්‍ද්‍රධනු, දෙව්දුනු; විජ්ජු, විදුලිය; තාරාගණ, තාරාවලීන් සේ; පභාවිසර, ප්‍රභාප්‍රවාහයෙහි; විප්ඵුරිත, දීප්තින්; විරචිතම්ව, සැදුම්ලදුවන්, කුරුමාණො, කරනුයේ; කපිලාභිධානං, කපිල නම් අභිධාන ඇති; විවිධ, නොඑක්; කුසුම, මල්හි; දල, පෙත්නෙත් හා; රජ, මුවරදින්; අලඞ්කත, සැදුම්ලද; පුළිනතල, වැලිතෙලෙන්; අභිරාමෙ, අභිරම්‍යවූ; නිග්‍රොධාරාමෙ, නිග්‍රොධ නම් ශාක්‍යනරපතීහු කරවූ උයන්හි; ඤාති, නෑයන්ගේ; මද, ජාතිමදගොත්‍රමදාදි මදයනුදු; මාන, ලදරුවා නොවඳුම්හ යන අභිමානද; මද්දනං, මිරිකනුවූ; සුර, දෙවියන් හා; නර, මිනිසුන්ගේ;නයන, ඇසට; රසායනං, රසයින්වූ;යමක, යුවළ යුවළ වැ සිය සිරුරින් වැහෙන දියකඳ ගිනිකඳ සුවහස් ඇති; පාටිහාරියං, පෙළහර; දෙවින්‍දවන්දිතං, දෙව්රජුන්විසින් වඳනාලද; පාදාරවින්‍දං, පාපියුම්; පොක්ඛරවස්සාවසානෙ, පුෂ්කලාවර්තක නම් මෙඝය නැඟීමට ඉක්බිත්තෙන්; ධම්මවස්සං වස්සාපෙත්වා, දහම්නමැති අම්වැසි වස්වා; ජන, මහාජනයන්ගේ; මන, සිත් නැමති; අවනි, පොළොවින්; සමුග්ගත, නැගෙනලද; කිලෙසධූලිනිකරං, කෙලෙස් නමැති රජස්සලා; නෙකසත, නොයෙක් සිය; යුවති, තරුණීන් විසින්; පරිවුතා, පිරිවරනලද්දී; මරකත, මරාමිණිමුවා; වාතපාන විවර, කවුළුදොරින්; විනිග්ගත, පිටත්වූ; මුඛමණ්ඩලා, මුවන්මඬුලු ඇත්තී; විකච, සුපිපි; කමලකොසපුටා, මල්ගැබ්ඇති; අම්බරතලගත, ආකාශතලගතවූ; කමලිනී විය; මහනෙල්විලක් සෙයින්; විරාජමානං, දිලියෙනුවනු—"රාජෘ-දීප්තෞ" යන ධාතුයි. රජනිකරොදය, සඳඋදයින්; විබුජ්ඣමාන, පුබුදිනා, කුමුදිනී විය; කුමුදුවනයක් මෙන්; විකසිතහදයා, ප්‍රබුඬවූ හෘදය ඇත්තී; ආනන්‍දජල, සතුටුකඳුළෙන්;පුළිත, ඇළලෙනලද;ලොචනා,ඇස්ඇත්තී; භුසත

මණි, පලඳනාමිණියෙහි, කිරණ, රශ්මියෙන්; භාසුරං, දිලිහෙන; ජඞගම, යතුරුගත්; රතනමෙරුගිරිසිරියා, රුවන්මෙරගිරිපියොවෙකින්; කපිලපුර, කිඹුල්වත්පුරනමැති; ජලනිධිමජ්ඣෙ, මුහුදුමැඳෙහි; විවිධ, නානාවණීණවූ; රස්මිමාලාකුලසරීරො, රශ්මිමාලායෙන් ආකුලවූ ශරීර ඇතියේ; සකලභුවන, සියල්ලෝවැස්සන් විසින්; වන්‍දනීයො, වඳනාලද්දේ; විකසිත, පුබුදු; දලසතං, පෙතිසියක් ඇති; අලොලං, මඳ මඳ වැ ලෙලෙන; කෙසරසහස්ස, කෙසුරු දහසින්; ජටිලං, අවුල්වූ; මකරන්‍දමධුසීකරවස්සිනං, මුවරඳමීපොද වස්නා; නීල, නිල්වූ; පීත, රන්වන්වූ; ලොහිත, රත්වූ; අවදාතං, සුදුවූ; පටිපදං, පියෙහි පියෙහි; උග්ගතං, නැඟි; පදුමං, පියුම්; අක්කමන්තො, මඩනේ.

**දෙව නව පුනෙතා** යන තන්හි දෙවශබ්දය සංවෘතිදෙවියන් කෙරෙහි වැටේ-අමරවරසෙනාය විය, සක්දෙව්රජහුගේ පිරිසක් බඳු; පරම, උතුම්වූ; රුචිර, මනොඥවූ; දස්සනාය, දර්ශනඇති; අසෙස නරපතිතිලකභූතො, හැමරජුන් මුදුන්පත්; මුනිවරජනකරාජා, බුදුරජහු පියේ සුදොවුන්රජ; '**න නෙ**' යන තැන්හි පෙදෙන් පර නෙ ශබ්ද සාමීප්‍යයෙහි වැටේ; "**න චර න චර**" යන ආම්‍රෙඩිතවචනය තුරිත වූයේයි. සක්‍යපුඞ්ගව, ශාක්‍යයන් කෙරෙහි ප්‍රධානය; ඛත්තිය සතසහස්සෙසු, යන තන්හි "ක්ෂතාත් ත්‍රායත ඉති ක්ෂත්‍රඃ"යි ගත්වන බැවින් ආදිරාජ ක්ෂතවූ උපහතවූ සත්වයන්ට ත්‍රාණය පරිපාලනය කරනුයෙන් ක්ෂත්‍රනම් විය ඔහු දරුමුනුබුරෝ ක්ෂත්‍රිය නම් වූහු. පුණ්ණචන්‍දොදයං, පුන්සඳහුගේ උදය ඇති; මුදු, මොළොක්වූ; කරසහස්ස, රස්දහසින්, සංවඩ්ඪිත, වඩනලද; රතනාලයම්ව, මුහුදක් සෙයින්; මුදු, මොළොක්වූ; නොකැකුළු කොට ඩැමින් සෙමින් ගත්තාවූ; කරසහස්ස, කරවුවර දහසින්; සංවඩ්ඪිත, වඩනාලද; රතනාලයං, රුවන්කොටාර ඇති; සුරගජම්ව, දිව්‍යහස්තියක්හු සෙයින්; අවිවජිතන, නොසුන්; මහාදානසන්තානං, මහත්දානසන්තාන ඇති; මෙහි දානශබ්දය සුරගජයා කියන පක්ෂයෙහි මද කියයි, රාජභවන කියන පක්ෂයෙහි දන් කියා. විමල, නිර්මලවූ; විපුල, බොහෝවූ; මධුර, මිහුරුවූ; ඔදනෙන, බතින්; චලිත, චලත්වූ; චූළාමණි, සිළුමිණියෙහි; මරීචිමඤ්ජරී, රස්කැනින්; පිඤ්ජර, පිංවූ; අඤ්ජලීහි, ඇඳිලි ඇති; මකරකෙතු, මුවරදදගේ; පතාකා, ඔඩි බඳු; රඤ්ඤො, සුදොවුන්මහරජහුවිසින්; පීතිවිසාල, ප්‍රීතින් විශාලවූ; ලොචනා, ඇස් ඇතියවුනු; පසාදවනතා, ප්‍රසාදවිනතවූවාහු; චුළුලජනනියා, සුළුමව; මහාපජාපතියා, මහත්වූ උදාරවූ ප්‍රජාවන්ගේ ජනනයෙන් හා පාලනයෙන් මහාප්‍රජාපතී නම්ලද; ගොතමියා සහ, ගොත්‍රයෙන් ගොතමී නම්ලද දෙවිය හා සමග; නිජ, තමාගේ; රාජකුල, රාජකුලනමැති; කුමුදසණ්ඩ, කුමුදවනයට; චන්‍දමණ්ඩලො, චන්‍ද්‍රමණ්ඩලයක් වැනිවූයේ; රූපකායදස්සනා, රූපකායදර්ශනයෙන්; චිත්තාවට,

ව්‍යාවෘතවූ; "වෘඤ්-සමභකෙතෞ" යන ධාතුසි. ජනනයන, ජනයන්ගේ නයනයට: පසාදජනනසමත්ථාය, ප්‍රසාදයන් ජනවන්නට සමර්ථවූ; සබ්බාකාරපරිපූරාය, සර්වාකාරයෙන් පරිපූර්ණවූ; දෙතිස් මහපුරිස්ලකුණෙන් සැදුම්ලද; සබ්බඞ්ගපච්චඞ්ගසිරියා, සර්වාඞ්ග ප්‍රත්‍යඞ්ගශොභායෙන් අශීත්‍යනුව්‍යඤ්ජනයෙන්; සුවණ්ණකිංකිණිකං, රන්රසුකලම්; ආසාපරිපාලිතං, ආශායෙන් පරිපාලිතවූ-"නබ දයනාති නස්සා හදයං-" තවවයගත, තවවයට උපගතවූ; දෙමැද බිතට ලඟවූ; රවිරජනිකරො, රිවිසඳ ඇති; ජඞ්ගමො, ගමන්ගත්; ගිරිවරො විය; ගිරිරජහු සෙයින්; බිම්බාය භවනං, බිම්බා දේවියගේ භවනයට; භුවනවිජයා, භුවනරූපයෙන් විජයකෙළේ; අභිනව, අලුත්; දලිත, සුන්කරනලද; මනොසිලාචුණ්ණවණ්ණාන, රක්සුනු පැහැබඳු; අඞ්ග, ඇඟින් න්ක්මෙනලද; ලාවණ්ණ, යහපත්වූ; පභා පවාහෙන, පැහැවතුරෙන්; අමතරසනදීපූරෙනෙව, අමාරස වතුරකින් මෙන්; අස්සුබින්දුපාත, හෙනකඳුලුබිඳින්; අලලදුකූලා, නෙත් දුහුල් ඇත්තී; වාමකරතල, වමත්ලෙයෙන්; නිහිත, තුබූ; මුඛකමලා, මුවත්පියුම් ඇතිව; නීසිනනා, හුන්නී; අනිලබල, වායුවෙගයෙන්; විලුලිත, කම්පිතවූ; කඹනලතා විය, රන්ලියක් සෙයින්; රතනාවලස්ස, රන්ගලක්හුගේ; 'පාදමූලෙ' යනු හා සබඳ--ජිනවරස්ස, ජිනවරයාගේ; පාදමූලෙ, පාමුල්හි; පඹපපභා, නීලපීත ලොහිතාදි පස්පැහැයන්; සමුදය, නැඟීමෙන්; සමුජ්ජල, දිලියෙනුවූ; විසාල, මහත්වූ; නයන, නුවන් නමැති; කුසුමෙහි, මලින්; අස්සු, කඳුලුනමැති; මධුබින්දුහි, මීබිඳුන්; විකිණ්ණ, විසිරගියාවූ; නීල, නිල්වූ; කුටිල, බඹුරුවූ; ධම්මිල්ල, කෙශයන්ගේ; මොලි, මුහුළුම; මධුපාවලි, බමරවැල ඇත්ති; මුදු, මෙළෙක්වූ; මධුර, මියුරුවූ; ගිර, තෙපුල්ම; භමරානුරාවා, බමරපියරුවි ඇත්තී; සුරතන, සුශ්ධුරකතවූ; කොමල, මොළොක්වූ; කරතල, අතුල්ම; පල්ලවෙන, පලුපතින්; කරිකර, ඇත්අතක් සෙයින්; පීවරාසු, පිරුණුවූ; චාමීකරජ්ජුති විසර, රන්වන්රස් විරෙන; ජංඝාසු, යුගදඟයෙහි; සොකසිනෙහ, ශොක හා සනා මැ; අනිලවෙග, වායුවේගයෙන්; විලුලිතා, ඇලළෙලන ලද්දී; බහුප්පකාරං පරිදෙවිත්වා, අනෙකප්‍රකාරයෙන් වැලප; දස්සන, යහදස්නෙන්; සවන, යහහස්නෙන්; සම්ඵස්සෙන, යහපහසින්; චකිත, භ්‍රාන්තවූ; හරිණී විය, මෘගියක සෙයින්; සුතවර, පුත්උතුම්; අයං, මේ; යසොධරා, යශස් ධැරූයෙන් යශොධරා නම්ලද්දු බත් කසයින්; තව විරහාතුරා, තාගේ විරහයෙන් ආතුර වී; රතත, රත්වූ; අරවින්දකොසෙසු, පියුම්ගැබ්හි; බාලාතපං විය, ළහිරුරස් බඳු; අලත්තකරසං, ලතුපත්රස; චරණතලෙසු, පත්ලෙහි; න ලිම්පයන්, නොඹිනී; කුසුමසර, මලවියාගේ; සරස්ස, විලවට; කාළහංසකං, කළුහසුන් බඳු; මණිනූපුරං, මණිනූපුරයන්; පාදපඞ්කජ, පාපියුම්හි;

සම්ඵසෙසන, සහපහසින්; නානුගණ්හනතී, අනුග්‍රහ නොකෑ
රන්නී; නොගන්නීය යූසේයි. අපගත, විගතවූ; මෙබලා, මිණි
මෙවුල්දම්හි; ආලාප, හඬින්; මූක, නිශ්ශබ්දවූ; මජ්ඣභාගා, හිණු
පියෙස් ඇත්තී; කාළාගරුපඞ්ක, කළුවැල්කල්කයෙන්; පත්තභඞ්ගං,
පත්‍රභඞ්ගය; පයොධරභාරෙ, පියවුරුබරෙහි; න ලෙබයනතී, නො
ඇඳවන්නී; අනුපරචිත, නොබඳනාලද; රෙචනාබින්දු, ගොරදබිඳින්;
තිලකං, තලාවික් ඇති; සාළකං, ස්වභාවසිඩවූ ක්‍යඹුසියෝ; නලාට
ලෙබං, නළල්රෙබා; ධාරයනතී, උසුලන්නී; අපනීත, ගලවනලද;
හාර, මුත්හර; සිරොධරාභරණ, ගලබරණ; කණ්ණපූරා, කණ්ණා
භරණ ඇත්තී; දිවසකර, හිරින්; චන්ද, සඳින්; තාරකාසමූහ, තරු
මුලින්; සුඤ්ඤ, සිස්වූ; ගගනසන්නිභා, ආකාශයක් බඳු වී; ස්ත්‍රීනට
පුරුෂයන් සූසාණාදීන් සේ සිටිවනබැවින් කීහු. රණරණක, කනස්සල්
ලෙන්; බිජ්ජමාන, බිනනවූ; මානසා, සිත් ඇත්තී– “බිද-දෛශනෘ”
යන ධාතුයි—කුසුමධවලාභි, කුසුමධවලවූ; වනලතාභි, වනලියන්
විසින්; අනාළිතාපි, නොපහරනාලද්දීද; දර්ශනමාත්‍රයෙන යන අභි
ප්‍රායයි. වෙදනාපරිපීළිතා, වෙදනායෙන් පරිපීඩිත වී; මන්දමාරුත,
මන්දමාරුතයෙන්; විධූතෙහි, විසිරගියාවූ; කුසුමරජෙහි, මල්රෙ
නින්; අඝට්ටිත, නොපහරනාලද–“රුඨ-ලුඨ-ප්‍රතිඝාතෙ” යන ධාතුයි.
ලොචනාපි, ඇස් ඇත්තීද; අස්සුජලං, කඳුළු; මුඤ්චමානා, විහිදුනී;
මෙයට විනා එරජගෙහි අශ්‍රුජලකාරණ නැති යන අභිප්‍රායයි; හං
ස, එව්ලින් එවිලට යන හසුන්ගේ; පක්ඛවාත, පියාවයින්; විහතෙහි,
ඉසිගියාවූ; උපවනසර, ගෙදිග්නීවිල්හි; සීකරෙහි, පොදින්; අනා
සිත්තාපි, නොතෙත් වීද; අල්ල, ආර්ද්‍රවූ; තනුලතා, තුනුලිය ඇත්තී;
මෙයින් ඇය ධවවියොගසන්තාපජනිත ස්වෙදජලකණිකායෙන්
ආර්ද්‍ර සේ කියූහ. හංසීව, හසක සෙයින්; භවනකමලිනී, ගෙදිග්
නීවිල්හි; කලෙලාලදෛලං, රළජිලට; මෙතැන්හි “ආරූළ්හා” යන්
නක් අධ්‍යාහාර කරනු, අනාරූළ්හාපි, ඇය සෙයින් නොනැඟිදු;
පකම්පිත, සැලෙනලද : ගත්තා, ශරීර ඇත්තී ; කුසුමධූලී,
මල්රෙනින්; ධූසරෙහි, දිඹුළිහුන්; මධුකරකුලෙහි, බමරකුලන්
විසින්; අදඩ්ඪාපි, නොඩහනලද්දීදු; සඤ්ජාතසන්තාසා, සඤ්ජාතසන්
ත්‍රාස ඇත්තී; තව වතං සමාදි යිත්වා, තොපගේ ව්‍රත සමාදන කොට;
එකාකිනී, එකලා; චක්කවාකී විය ච හුත්වා, සක්වාවක වැනි වීද ; විම
ල, නිර්මලවූ; කමල, මහනෙල්හි; සිරිහර, ශොභා ගත්; නයනො,
ඇස් ඇත්තේ; චන්දකින්නරාපදානදෙසනා, පකිණ්ණකනිපාත
යෙහි චන්දකින්නරවත්ථුදෙශනා නැමති; සලිලසෙකෙන, උදක
පරිෂෙකයෙන්; විරහදහනං, විරහ නමැති ගිනි–“සචායන්ති සමෙ
අසං, නන්දකුමාරෙති එත්ථ සකලකපිලපුරං නන්දයන්තො තොසෙ
න්තො ජාතොති නන්දො”—යේ මහාප්‍රජාපතිගොතමින් කුස හොත්
තේය. සුදෙවුන්රජාණන්ට දයේය. මහාපුරුෂලක්ෂණයෙන්

සැදුම්ලද රූපකාය ඇතියේය. බුදුනට සතරඟුලකට ඌන චක්‍රවර්ති වන්නට නිසි භාග්‍ය ඇතියේයි-පඤ්චකල්‍යාණෝපෙතාය, පඤ්චකල්‍යාණයෙන් සමුපෙත; ඝනතර, සුවිශේෂවූ; තිමිරසඞ්ඝාතෙපි, අන්ධකාරනිකරයෙහිදු; උස්සාකාරෙන, මිණිදඬුවැටපහන් සෙයින්; විප්ඵුරිත, දිලිසෙන; දෙහප්පභාය, ශරීරරශ්මි ඇති; චතුරඞ්ගසඞ්ගීතෙසු, නෘත්‍ය ගීත වාද්‍ය වංශය යන චතුරඞ්ගසඞ්ගීතයෙහි; සාකියකුලභූසාය, ශාක්‍යකුලයට භූෂණයක් බඳු; ජනපදකල්‍යාණියා, වියපත්කල්හි උත්තමරූපභාවයෙන් ජනපදවාසීනට කල්‍යාණ වන බැවින් එනම්ලද අභිරූපතනූවගේ; සරීරසම්ඵස්සංලභෙය්‍ය, ඔවුන් දෙබිහිනිද වුව මෑට නිසි ස්වාමියෙකු වත් මොහු වුව මැනව මොහට නිසි භාර්‍ය්‍යාවක වත් මැය වුව මැනව හෝ චක්‍රවර්ති වෙයි හෝ ස්ත්‍රී රත්න වෙයි නැසක් බැඳගෙන සැරහෙන්නට නිසියගේ ශරීර ස්පර්ශ ලද්දේවීනම්; පබ්බාජෙත්වා, පැවිදිකරවා; කුමාරාභරණභූසිතං, කුමාරාභරණයෙන් භූෂිතවූවනු-"දසජ්ජ තාති දනබ්බබෙන ආදතබ්බබෙන ච දසාදං වත්‍ථු තදෙව දසජ්ජං"-නිරුත්තරං ධම්මරතනදසජ්ජං, නිරුත්තරවූ දහම් නමැති භොගය-එයින් වඩලභ.

"ද්වෙමෙ භික්ඛවෙ භොගා කතමෙ ද්වෙ ආමිසභොගො ච ධම්මභොගො ච ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ භොගා, එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං භොගානං යදිදං ධම්මභොගො"යි—"අරියගණපරිවුතොති එත්ථ අරියාති ආරකත්තා කිලෙසෙහි අනයෙ න ඉරියනතො අයෙ ඉරියනතො සදෙවකෙන ච ලොකෙන අරණීයතො බුද්ධා ච පච්චෙකබුද්ධා ච බුද්ධසාවකා ච වුච්චන්ති ඉධ පන සාවකා එව අරියා"-පවුනර, ප්‍රභාස්වරවූ; කිරණමාලී, රශ්මිමාලා ඇති; අංසුමාලීවිය, සූර්‍ය්‍යයා සෙයින්; පරිපාචිත, පරිපාකගතවූ; චිත්ත, සිත් ඇති; ජන්තාවො, සත්වයන්; මධුර, මිහිරුවූ; මධුකරවිරුත, බමරරැව්; ගීත, ගීතිකා; ගීයමාන, ගායනාකරනලද; සකුසුම, මල්සියෝ; පල්ලවභාරභරිත, පල්ලවයන්ගේ භාරයෙන් බරවූ; නානා, නොයෙක්; ලතාවනිතා, ලියවැම්යන්විසින්; අවලම්බිත, වෙළෙප්මහදත්තිහි වැතිරෙනලද; තරුපතිවරෙහි, තුරුපියන්විසින්; සමුපගූහිත, හොබනාලද; සීතවනෙ, එනම් වනයෙහි--"පියසහායකෙනාති එත්ථ චතුසු ඉරියාපථෙසු සහ අයනතො සහායො"-භගිනීපතිනා යනු අනේපිඬුසිටුහු බුහුන් රජගහාසිටුහුකෙරේ වන්නෙන් කියත්. රජගහාසිටුබුහුන් අනේපිඬුසිටුහුකෙරේ වේ. දෙවතානුභාවෙන, දෙවියන්ගේ ආනුභාවයෙන්-"පච්චූසෙති එත්ථ පච්ඡිමයාමාවසානං පච්චූසො"-දීපරුක්ඛම්ව, පහන්රුකක් සේ; අබ්භ, වලාය; මහිකා, හිමය; ධූම, දුම; රජ, ධූලිය; රාහු, අසුරිඳුය යන; පඤ්ච, පස්අගින්; විනිම්මුත්තං, විප්‍රමුක්තවූ; අභිනවොදිත, අභිනවොද්ගතවූ; පරිපුණ්ණ, ෂොඩශකලායෙන් පරිපූර්ණවූ; සරදසමිය, සරත්කල්හි;

චන්දමණ්ඩලං විය ච, සඳමඬලක් සෙයිනුදු; නයන, ඇසට; ආනන්දක රං, පරිතොෂජනකවූවහු; පාද, පත්ලෙන් නික්මෙත; රාගං, රශ්මි; අජරං, අවිද්‍යමානවූ ජරාඇතිවනබැවින් අජරවූ; හේ නිර්වාණයි, අජරශබ්දයෙන් නිර්වාණ කියත් මිස දෙශනාධර්ම නොකිය හැකි නො යත්? යම්සේ සීතාහරණං කාව්‍යම් යන තන්හි උපචාරයෙන් තදභිධායිකකෙරෙහි තද්ව්‍යපදෙශ කරනලදද එසෙයින්ම නිර්වාණවාචක අජරශබ්දයෙන් තත්ප්‍රකාශකවූ දෙශනාධර්මද උපචාරයෙන් කියනලැබේ. නොහොත් "ආයුඝෘතම්" යන තන්හි ආයුර්නිමිත්තවූ ඝෘතය ආයුශ්ශබ්දයෙන් කියනලදද එසෙයින්ම ගතුවනට අජරත්වනිමිත්ත වනබැවින් දෙශනාධර්මද අජරශබ්දයෙන් කියනුලැබේ. අමරාදිශබ්දයෝද එසෙයින්ම නිර්වාණ කියනුවූවහු තත්ප්‍රකාශක වනබැවින් තදුපචාරයෙන් හෝ තන්නිමිත්තයෙන් හෝ දෙශනාධර්ම කියනුලැබෙත්. අමරං යනාදි තන්හි අවිද්‍යමානවූ මරණ ඇතිවනබැවින් අමර වෙයි. මලරහිත වනබැවින් අමල වෙයි. අසම වනබැවින් අතුල වෙයි. අවිනාශි වනබැවින් අමෘත වෙයි. අමර අමෘත ශබ්දයන්ගේ කවර විශෙෂ යත්? අමරශබ්දයෙන් ක්ෂණිකමරණ කියනු අමෘතශබ්දයෙන් සන්තතිමරණ කියනු. නිර්වාණ ක්ෂණිකමරණඇතියන්ගේ නොද ඇති. සන්තතිවිච්ඡෙද ඇතියන්ගේ නොද ඇති. හේ මෙසෙයින් නිර්වාණයට ක්ෂණිකමරණ හෝ ප්‍රබන්ධවිච්ඡෙද හෝ නැතිවනබැවින් තත්ප්‍රකාශකවූ ධර්මයහට නොද ඇති-සන්තං, සර්වපරිදාහයන් නැතිවනබැවින් ශාන්තය; අභයං, දණ්ඩදුර්ගතිආදි භය නැතිවනබැවින් අභයය; අසංඛතං, ප්‍රත්‍යයොත්පන්න නොවනබැවින් අසංස්කෘතය; සියුම් වනබැවින් නිපුණය; ප්‍රධානභාවයට පමුණුවනබැවින් ප්‍රණීතය; දිය පොළෝ සේ ගැඹුරු වනබැවින් ගම්භීරය; පර්වතයෙකින් පිහිතව තුබූ දෑරගම්ණියක් සෙයින් දක්නට නොපිළිවන් වනබැවින් දුර්දෘශ්‍යයි; ධම්මං සුත්වා, පස්අනුසස් ඇති ධර්මය අසා; එහි පස්අනුසස් නම් කවර යත්? වදාළේ මැ නො–

"පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා ධම්මසවනෙ කතමෙ පඤ්ච අස්සුතං සුණාති සුතං පරියොදපෙති කංඛං විතරති දිට්ඨිං උජුං කරොති චිත්තමස්ස පසීදති ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චානිසංසා ධම්මසවනෙ"යි.

නයසහස්සපතිමණ්ඩිතං, නයසහස්‍රයෙන් භූෂිතවූ; සත්තභව, මිනිස්ලෙව්හි සත්ජන්මයක්; අලඞ්ඝනීයං, පැන නොයනුවූ; එයින් වදාළහ "න තෙ භවං අට්ඨමං ආදියන්ති"යි-"සසඞ්ඝනාහි එපළ සඞ්ඝෙන සහ පවත්තන්තීති සසඞ්ඝා"-අනඝං, අඝරහිතවූ; පව් [illegible]නිව්‍ය; අමොඝවාදිනං, අමොඝවාදිවූ; නොසිස්තෙපුල් ඇති; ධම්මොඝවාහිනං, දහම් නම්වූ වතුරු පවත්වනුවූ; නානාවිධබජ්ජකාදිසමලඞ්කතං, නානාප්‍රකාර බාදුවිශෙෂාදීන් ගැවැසීගත්; වණ්ණගන්ධ

රසසම්පන්නානං, වර්ණයෙන් ගන්ධයෙන් රසයෙන් සම්පූර්ණවූ;
සුඛනිද්‍රානං, ලෞකික ලොකොත්තර සුඛයට නිදානවූ-"යස්මා තං
ඵලං නිද්දෙති ඉදං ගණ්ඨිඵ ඉති ආලපති විය තස්මා නිදානං"-සුඤ්ඤ
ගාරෙ, ජනයන්විසින් ශූන්‍යවූ සිස්වූ අගාරයෙහි ගෘහයෙහි; තථා
ගතා, තථාගතයෝ; පරම, උතුම්වූ; රමණීයං, රම්‍යවූ; සකීයං,
තමාගේ; යතිජන, තපස්විජනයාවිසින්; නිය්‍යානං, පැමිණෙන්නට
නිසිවූ; "යා-ප්‍රාපණෙ" යන ධාතුයි. ඡායූදකසම්පන්නානං, ඡායායෙන්
හා උදකයෙන් සම්පන්නවූ; රමණීයං, අභිරම්‍යවූ; යොගානුකූලං,
සමාධියට අනුකූලවූ; "යුජ-සමාධෞ" යන ධාතුයි. කහාපණ, මසු
රන්; කොටිසන්ථරෙන, කෙළින් සිටුවා මස්සෙන් මිස්සෙහි සටා
අතුට; කිණිත්වා, විකිණීකොට ගෙන; ජලධර, මේවලෙහි; පරි
චුම්බිත, පැහැරසිටි; සිඛරමාලෙන, ශිඛරමාලා ඇති: කෙලාසගිරි
වරෙනෙව, කෙලෙස්ගල් සෙයින්; සුධා, සුනුවමින්; ධවලෙන,
සුදුවූ; වෛජයන්තම්ව, සක්දෙව්රජහුගේ වෛජයන්තමහපාය සෙ
යින්; සමුජ්ජලිත, දිලියෙන; නෙකභූමක, නොඑක්බුමු; චාරකො
ඨකං, දොරටු ඇති; සුරචාප, දෙව්දුනු සෙයින්; චාරු, සිත්ගත්;
තොරණ, තොරණින්; රමණීයෙහි, රම්‍යවූ; විවිධ, නොයෙක් වැදෑ
රුම්වූ; විචිත්‍ර, විසිතුරුවූ; රුචිර, සිත්ගන්නාවූ; පාසාදෙහි, පහපෙ
ළින්; මනනයනානි, මනනුවන්; විලුම්පන්තං, වොලොගන්නා;
එයින් කියා එක්සමයෙක්හි තුෂිතපුරයෙහි එක්දිව්‍යපුත්‍රයෙක්
මධ්‍යමයාමයෙහි ශරීරප්‍රභායෙන් දශදිශා දල්වමින් බැස බුදුන්
කරා එළඹ එවෙහෙර තමහට ප්‍රීති ජනවන පරිදි දක්වනුයේ-

"ඉදං හි තං ජෙතවනං ඉසිසඞ්ඝනිසෙවිතං
ආවුත්ථං ධම්මරාජෙන පීතිසඤ්ජනනං මම" යි.

කෙලාසධරාධර, කෙලෙස්ගල් සෙයින්; සරදම්බුද, සරාවලා සෙ
යින්; හිමකර, සඳහුගේ; කරනිකර, රස්කලඹක් සෙයින්; ධවල,
සුදුවූ; සිනිඬ, සිනිඳුවූ; ඝන, නිකසළවූ; මුදු, මොළෙක්වූ; පුලිනතල,
වැලිතෙලෙන්; අභිරාමං, රමණීයවූ; මාධවී; යොහොඹු; මධුගන්ධි
කාදිසු, මීසිඳුවර ඈ, කුසුමසණ්ඩ, මල්රැසින්; මණ්ඩිත, සැදුම්ලද;
ලතාමණ්ඩපෙසු, ලියමඬුයෙහි; සිත,සුදුවූ; සීතල, සිහිල්වූ;සිලාතලෙ
හි, සලවටිනෙන්; සුඵුල්ල, සුපිපි; කමල, මහනෙල්ඈ මලින්; සම
ලඞ්කත, සැදුම්ලද; සිසිර, සිහිල්වූ; මධුර, මියුරුවූ; සලිලාසය, සලි
ලයනට ආශයවූ පිරිපොකුණෙන්; විභූසිත, සැදුම්ලද; පජ්ජලිත,
දිලියෙන; ගන්ධකුටියා, ගඳකිළින්; සිඛාපපන්නානං, මස්තකප්‍රාප්තවූ;
විහාරං කාරාපෙත්වා, වෙහෙර කරවා; සුර, දෙවියන්විසින්; අසුර
දානවයන්විසින්; මුනි, තපස්විජනයන්විසින්; මනුජ, මිනිසුන්
විසින්; වන්‍දනීයො, වඳනාලදුයේ; අමර, දෙවියන් හා; නර, මිනි
සුන්විසින්; පරිවුතො, පිරිවරනලදුයේ; සාවත්ථිං පත්වා යන තන්හි

එනුවර ශ්‍රාවස්තිනම් කුමට විය යත්? ශ්‍රවස්ත නම් සෘෂිහිගේ නිවාස භූමි වනබැවිනුදු ශ්‍රවිෂ්ඨානක්ෂත්‍රයෙන් * භූමිපරිග්‍රහකළ වනබැවිනුදු නුවර පිහිටුවනකලැ සවසති උක්තවන බැවිනුදු මනුෂ්‍යයනට උපභොග පරිභොග සර්වස්තු එහි ඇත්වනබැවිනුදු ශ්‍රාවස්ති නම් වී. එයින් කීහ-

“භූමෙ † සබ්බූපකරණං සාවත්ථියං සමොහිතං
තස්මා සබ්බමුපාදාය සාවත්ථීති පවුච්චති.
කොසලානං පුරං රම්මං දස්සනීයං මනොරමං
දසහි සද්දෙහි අවිවිත්තං අන්නපානසමායුතං.
වුඩ්ඪිං වෙපුල්ලතං පත්තං ඉද්ධං ඵීතං මනොරමං
ආළකමන්දාව දෙවානං සාවත්ථිපුරමුත්තමං” යි.

එනුවර අසූදහසක් නියම්ගම් පිරිවරනලද්දේය. තුන්සිය තුන්සිය යොදුන් කසීකොසොල්දෙරට ආයමුඛවාරයි—විමල, නිර්මලවූ; විපුල, බොහෝවූ, ධවල, සුදුවූ; පුලින, වැලි; අත්ථතං, අතුරනලද; නානා, නොයෙක්; සුරභි, සුගන්ධවූ; කුසුමප්පකාර, මල්රැසින්; අභිකිණ්ණං, සැදුම්ලද; සෙත, සුදුවූ; රත්ත, රත්වූ; නීල, නිල්වූ; කමල, මහනෙල්; ආරොපිතානි, හිඳුවනලද; මරකත, මරම්ණිමුවා; රජත, රිදීමුවා; කනක, රන්මුවා; ඵලිකාදි, පළිමුණිමුවා ඈ; පුණ්ණ, මිණිවන් දියෙන් පුරනලද; කලසමාලාහි, කලස්පෙළින්; උපරචිත, සදනලද; වීථිභාගං, වීථිපාශ්ව ඇති; සමුස්සිත, නගනලද; විවිධ, නොයෙක් නවාම් ඇති; විචිත්ත, විසිතුරුවූ; නෙකසහස්ස, නොයෙක් දහස්; ධජපටාකං, ධ්වජපතාකා ඇති; ධූප, ගඳදුමින්; අන්ධකාරං, අඳුරුවූ; අමරපුරසදිසසොභං, දෙව්නුවර හා සමාන ශොභා ඇති; පුරවාසීහි පූජියමානො, පුරවාසීන්විසින් පුදනලදුයේ; අභිනන්දියමානො, පසස්නාලදුයේ; සුවණ්ණරසසෙකපිඤ්ජරං විය; කනකරසනිෂෙකයෙන් මෙන් රන්වන්වූ; සුරභි, සුගන්ධවූ; කුසුම, මල්ඇති; තරුවර, ද්‍රැමරාජයන්විසින්; නිරන්තරං, අතුරුනැති; කුරඞ්ගසාරඞ්ගාදි යන තන්ෂි ආදිශබ්දයෙන් ශරභමෘගයන් රුරුමෘගයන් චමරමෘගයන් රොහන්තාමෘගයන් වාතමෘගයන්, කදලිමෘගයන් චිත්‍රමෘගයන් කියනු. තරුණ, ළද; හරිණ, මුවන්ගේ; සඤ්චාරං, හසර ඇති; මත්ත, මත්වූ; මොරසත, මොනරසියන්ගේ; සම්පඝොසං, හඬ ඇති; අලිකුල, බමරකුලන්ගේ; ඣඞ්කාර, ඣංයන හඬින්; ධ්වනීන්; මුඛර; බණිනවන්වූ, සහකාරං, මීඅඹරුක් ඇති; සමද, මදසහිතවූ; කොකිලකුල, කෙවිලිකුලසියන්ගේ; කල, මනොඥවූ; ආලාප, බිණීමෙන්; කොලාහලං, එකනිනනාදවූ; උප්ඵුල්ල, පිපි; කුසුමමඤ්ජරි; මල්කැන්සි, රේණු, මුවරදින්; පිඤ්ජරං, රත්වන්වූ;

* “ක්ෂිතිනක්ෂත්‍රයෙන්”-පොත්. † “සබ්බද”-ග්‍රන්ථාන්තරයෙහි,

අනෙක, නොයෙක්; කුසුම්, මලින්; පරිමල, සුවඳ; වාසිතං, වැහෙනුවූ. **ජෙතවනං** යන තන්හි ජෙතයාගේ වනය ජෙතවන නම් වේ: හේ ජෙතවන නම් කුමට විය යත්? තමහට ප්‍රතිපක්‍ෂ ජනයන් ජිත වනබැවින් ජෙත නම් විය, පියරජහු ශත්‍රුවිජය කළ දවස් ජාතයෙන් ජෙත නම් විය, මඞ්ගලකාම්‍යතායෙන් ජෙතනම් කෙළෝමය, ඒවනය ජෙතරාජකුමාරයාවිසින් රොපිතයැ සංවර්ධිතයැ පරිපාලිතයි. හේ වනයට ස්වාමිය. එයින් උයන ජෙතවන නම් වී.

අනිල, සුළඟින්; අවනත, නතුවූ; සිඛා, මුදුන් ඇති; ලතාවනිතාහි, ලියකතුන්විසින්; අනවරත, අවරතනොව සියඟ; මුත්ත, විසිදිනා; කුසුමෙහි, මලින්; ආබද්ධ, එක්වූ; පල්ලව, පළුපත්ම; අඤ්ජලීනි, ඇඳිලි ඇති; පාදපෙහි, තරුවරයන්විසින්; නානාමණි, නන්විසිතුරු ඉඳුනිල් වෙරළු මරා පියුම්රාමිණීආදීන්ගේ; පභාවිසර, ප්‍රභාප්‍රවාහ; විජ්ජුරිත, දීප්තීන්; විරචිත, තවරනලද; වර, උතුම්වූ; රුචිර, මනොඥවූ; ගන්ධකුටි, ගඳකිළියැ; සිරිං, ශොභා; ශරීරසිරියා, ශරීරශොභායෙන්; අභිමද්දනෙනා, මඩිමින්; විහරති, පඤ්චවිධබුද්ධකෘත්‍ය සම්පාදන කෙරෙමින් චතුර්විධ විහාරයෙන් වේසේ.

මෙතෙකින් බුදුන් අවිජහිතස්ථානයට පැමිණ එහි වැඩවසන පරිදි දක්වා උත්තරයෙහි අනෙකාකාරයෙන් බුදුන්ගේ ගුණ වැනියවුවැ **විහරන්තො ච පන** යනාදි ග්‍රන්ථාවතාර කෙළෝ. අහඤ්චම්හි තිණ්ණො, මම වනාහි භවසාගරයෙන් උත්තීර්ණයෙමි; මුත්තො, භවබන්ධනයෙන් මුක්තයෙමි; දන්තො, ෂට්ප්‍රකාර ඉන්ද්‍රියදමනයෙන් දාන්තයෙමි; සන්තො, ක්ලෙශක්ෂොභොපශමනවශයෙන් ශාන්තයෙමි; අස්සත්ථො, නිර්වාණපුරප්‍රවිෂ්ටවනබැවින් ආශ්වස්තයෙමි; පරිනිබ්බුතො, ක්ලෙශාග්නිපරිනිර්වාණයෙන් පරිනිර්වෘතයෙමි; ලොකො ච, සත්ත්වලොක වනාහි; අතිණ්ණො, සංසාරවෘත්තයෙහි නිමග්න වනබැවින් භවසාගරයෙන් අතීර්ණය; අමුත්තො, සංසාරබන්ධනයේ බද්ධ වනබැවින් භවබන්ධනයෙන් අමුක්තය; අදන්තො, විෂයප්‍රසක්තනා ඉන්ද්‍රියහයගමනනිවාරණයට අසමර්ථ වනබැවින් අදාන්තය; අසන්තො, ක්ලෙශක්ෂොභයෙන් ක්‍ෂුභිත වනබැවින් අශාන්තය; අනස්සත්ථො, නිර්වාණමාර්ගදර්ශන නොලද වනබැවින් අනාශ්වස්තය; අපරිනිබ්බුතො, ක්ලෙශදහනයෙන් දහ්‍යමාන වනබැවින් අපරිනිර්වෘතය; පහොමි චාහං, මම වනාහි ප්‍රභූම් පොහොසත්මි; ලොකං තාරෙතුං, සත්ත්වලොකයා සසරසයුරෙන් නගන්නට; මොචෙතුං, සසරමලින් මුදන්නට; දමෙතුං, ඉන්ද්‍රියදමනයෙන් දමන්නට; සමෙතුං, ක්ලෙශක්ෂොභය සන්හිඳුවන්නට; අස්සාසෙතුං, නිර්වාණමාර්ගොපදෙශයෙන් අස්වසන්නට; පරිනිබ්බාපෙතුං, ක්ලෙශපරිදාහ නිවන්නට; තස්ස නත්ථඤ්ඤො කොචි තාරෙතා, ඒසත්ත්වලොකයාහට අන්කිසි තාරයිතෘවෙක් නැති; සසරකතරින් තරවනුයෙක් නැතැයි සේයි—

මොචෙතා, මොචයිතෘවෙක්; සසරදැහින් මුදනුයෙක් නැතැයි සේයි; දමෙතා, දමයිතෘවෙක්; අනික් නරදම්සැරියෙක් නැතැයි සේයි. සමෙතා, ශමයිතෘවෙක්; කෙලශරොගොපපලුව සත්හිඳුවන් නෙක් නැතැයි සේයි. අස්සාසෙතා, ආශ්වාසයිතෘවෙක්; වධ්‍යභූමි ප්‍රාප්තයන් සෙයින් සංසාරභයින් උත්‍රස්ත සත්වයන් අස්වසනුයෙක් නැතැයි සේයි. පරිනිබ්බාපෙතා, පරිනිර්වාපයිතෘවෙක්; කෙලශ දහනසකාඩ නිවනුයෙක් නැතැයි සේයි. අඤ්ඤදත්‍ථු මයාති, මා විනා යයි; යම්සේ නාසිකාග්‍ර දක්වා ගම්භීර කර්දමයෙහි නිමග්නපුරුෂයෙක් අනික් එසෙයින්ම නිමග්නපුරුෂයකු අත හෝ ඉස හෝ ගෙන නගන්නට අසමර්ථවේද එසෙයින්ම යමෙක් පඤ්චකාමගුණ නමැති කර්දමයෙහි නිමග්නවූයේ අනික් එසෙයින්ම නිමග්න පුරුෂයකු නගන්නට අසමර්ථ වෙයි. බුදුහුවූ කල තමන් උත්තීර්ණ බැවින් සමර්ථ වෙත්. එයින් කිහ-

"බුද්ධො සො භගවා බොධාය ධම්මං දෙසෙති තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති. මුත්තො සො භගවා මොචාය ධම්මං දෙසෙති දන්තො සො භගවා දමථාය ධම්මං දෙසෙති සන්තො සො භගවා සමථාය ධම්මං දෙසෙති අස්සත්‍ථො සො භගවා අස්සාසාය ධම්මං දෙසෙති පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති" යි.

**තිණ්ණො** යන තන්හි "තෘ-ප්ලවනතරණයොඃ" යන ධාතුයි, **මුත්තො** යන තන්හි "මුචෟ-මොක්ෂණෙ" යන ධාතුයි, **දන්තො** යන තන්හි "දමු-උපශමෙ" යන ධාතුයි, **සන්තො** යන තන්හි "ශමු-උපශමෙ" යන ධාතුයි, **අස්සත්‍ථො** යන තන්හි "ශ්වස-ප්‍රාණනෙ" යන ධාතුයි, **පරිනිබ්බුතො** යන තන්හි "වෘඤ්-වරණෙ" යන ධාතුයි. මෙහි පළමුවනවරද දෙවනවරදක්තප්‍රත්‍යයයැ තුන්වනවර තුමුන්ප්‍රත්‍යයයැ සතරවනවර තෘච්ප්‍රත්‍යයයි.

"උප්පලවණ්ණෙ වාති එත්‍ථ උප්පලානං වණ්ණං උප්පලවණ්ණං සෙස පදද්වයෙපි එසෙව නයො. එත්‍ථ ච සෙතරත්තනීලෙසු යං කිඤ්චි උප්පලං උප්පලමෙව සතපත්තං පදුමං ඌනකසතපත්තං පුණ්ඩරිකං පත්තනියමං විනාපි සෙතං පදුමං රත්තං පුණ්ඩරිකන්ති අයමෙත්‍ථ විනිච්ඡයො"--කාව්‍යයෙහි වූකල පුණ්ඩරීකශබ්දයෙන් හෙළපියුම් කියත්—උදකා නිග්ගන්තානීති උදකතො නිග්ගන්තානි අන්තොනිමුග්ගපොසිනීති උදකතලස්ස අන්තො නිමුග්ගායෙව හුත්වා පුසන්ති වඩ්ඪන්තීති අත්‍ථො.

**පොසිනී** යන තන්හි "පුෂ-පුෂ්ටෞ" යන ධාතුයි. ණිනිප්‍රත්‍යය නපුංසකබහුවචනයි. **දසසහස්සිලොකධාතුං** යනු අධිගමයට නිසි සත්වයන් ඇතිතැන් ගෙන කීහු. එහි සඬියන් අතුරෙහි ජම්බුද්වීප

ශෙෂ මනුෂ්‍යයනට හා දසසහස්‍රලොකධාතුවැ දිව්‍යබ්‍රහ්මයනට අධිගම ඇති. **ඉන්ද්‍රියපරොපරියත්තිඤාණෙන** යන තන්හි ඉන්ද්‍රියපරොපරියත්තිඥාන නම් ඉඳුරන්ගේ මුහුකල නොමුහුකලබැව් දන්නා නුවණයි. **අනාවරණඤාණෙන** යන තන්හි අනාවරණඥාන නම් ජීර්ණපත්‍රපුටයෙහි තපනනාරාච සෙයින් සම් නොනෙක ආවරණ නැතිව අසංශයගතින් පවත්නා නුවණයි. **උග්ඝටිතඤ්ඤූ** යනාදි තන්හි උද්ඝටිතය දන්නේ උග්ඝටිතඤ්ඤූ නම් වෙයි. "ඝට-චෙෂ්ටායාම්" යනධාතුයි. විපචිතය දන්නේ විපචිතඤ්ඤූ නම් වේ. "පචි-ව්‍යක්තීකරණෙ" යන ධාතුයි. නීතය දන්නේ නෙය්‍ය වෙයි. "ණීඤ්-ප්‍රාපණෙ" යන ධාතුයි. එහි උද්දෙශවිසින් වදාළ දෙශනා අසා අධිගම කරනුයේ උද්ඝටිතඥ නම් වෙයි. නිර්දෙශවිසින් වදාළ දෙශනා අසා අධිගම කරනුයේ විපචිතඥ නම් වෙයි. ප්‍රතිනිර්දෙශවිසින් වදාළ දෙශනා අසා අධිගම කරනුයේ නෙය නම් වෙයි. එයින් වදාළහ-

"කතමො ච පුග්ගලො උග්ඝටිතඤ්ඤූ යස්ස පුග්ගලස්ස සහ උදාහටවෙලාය ධම්මාභිසමයො හොති අයං වුච්චති පුග්ගලො උග්ඝටිතඤ්ඤූ. කතමො ච පුග්ගලො විපඤ්චිතඤ්ඤූ යස්ස පුග්ගලස්ස විත්ථාරෙන අත්ථෙ විභජියමානෙ ධම්මාභිසමයො හොති අයං වුච්චති පුග්ගලො විපඤ්චිතඤ්ඤූ. කතමො ච පුග්ගලො නෙය්‍යො යස්ස පුග්ගලස්ස උද්දිසතො පරිපුච්ඡතො යොනිසො මනසිකරොතො කල්‍යාණමිත්තෙ සෙවතො භජතො පයිරුපාසතො අනුපුබ්බෙන ධම්මාභිසමයො හොති අයං වුච්චති පුග්ගලො නෙය්‍යො. කතමො ච පුග්ගලො පදපරමො යස්ස පුග්ගලස්ස බහුම්පි සුණතො බහුම්පි උග්ගණ්හතො බහුම්පි ධාරයතො බහුම්පි වාචයතො න තාය ජාතියා ධම්මාභිසමයො හොති අයං වුච්චති පුග්ගලො පදපරමො"යි.

මෙහි පදපරමයා අධිගමභාග් නොවන්නෙන් නොගත්හු. තයො වෙනෙය්‍යපුග්ගලෙ, තුන්වෙනෙය පුද්ගලයන්; ජලමානනාලක්ඛණ්ඩ විය පඤ්ඤායන්තෙ, දිල්හෙන ගිනිකඳක් සේ පෙනෙනුවන් ඇසට; ආසය, නෛෂ්ක්‍රම්‍යාශයාදි ආශයද; අනුසය, කාමරාගානුශය ප්‍රතිඝානුශයාදි අනුශයද; චරිත, රාගචරිත ද්වෙෂචරිතාදි චරිතද; අධිමුත්තියො, හීනාධිමුක්තිය ප්‍රණීතාධිමුක්තිය යන අධිමුක්තිද; "යොජනසහස්සෙපි" යන තන්හි අපිශබ්දය සමුච්චයාර්ථයි. එයින් යොජනශතසහස්‍රයෙහිද සත්වයන්ට ධර්මදෙශනා කරන පරිදි සූචිත වේ. සමීපවත්තී විය, සමීපවර්තියක්හු සෙයින්; ඔභාසං ඵරිත්වා, ශරීරරශ්මිස්ඵරණය කොට; ඔවුන් තමා දක්නාසේ රශ්මිද මනොනුකූල වයසානුකූල කොට සොඳුන්පමණ පස්රුස් ගත් රත්රන්පිළිමක්හු සෙයින් නොඑක්දෑ කෙලසුවහස්නි සත්වයා කලදුසිරිඅතුරෙන් ලද කුසල්වියට ගෙන **රජොහරණං** යනාදීවිසින් සෑදෑ තුඹුපරිද්දෙන් මනොනුකූල කොටිත ශූසේයි. අවිජ්ජණ්ඩකා

රං, අවිද්‍යා නමැති අන්ධකාරය; ධම්මාලොකං, දහම් නමැති ආලොකය; තණ්හාසංඝාටං, භව නමැති ගෘහයෙහි තෘෂ්ණා නමැති සගළ; තණ්හාජාලං, තෘෂ්ණා නමැති දැල්; තණ්හාසොතං, තෘෂ්ණා නමැති ශ්‍රොතස්; තණ්හාපිපාසං, තෘෂ්ණා නමැති පිපාසා; පාතුම්වණ්‍ණා පිපාසා. තණ්හාපරිළාහං, තෘෂ්ණා නමැති පරිදාහ; තණ්හාසන්තාපං, තෘෂ්ණා නමැති සන්තාප; සං තප්පතීති සන්තාපො. ක්ලෙසජටං, ක්ලෙශ නමැති ජටා; රාගදොසමොහගගයො, රාග ද්වෙෂ මොහ නමැති ගිනි; සංසාරසම්බාධා, සංසාර නමැති සම්බාධස්ථානයෙන්—සම්මා බජ්ඣන්ති එත්ථාති සම්බාධො—ධම්මොකාසං, දහම් නමැති අවකාශ; සංසාරවිපථා, සංසාර නමැති විපථයෙන්—විරුද්ධො පථො විපථො—අරියමග්ගපථෙ, ආර්‍ය්‍යමාර්ග නමැති සත්පථයෙහි; සංසාරසාගරා, සංසාර නමැති සාගරයෙන්; නිබ්බානපථෙ, නිර්වාණ නමැති පථයෙහි; සංසාරකන්තාරා, සංසාරනමැති කාන්තාරයෙන්; නිබ්බානඛෙමභූමිං, නිර්වාණ නමැති ක්ෂෙමවූ නිර්භයවූ භූමියට; සංසාරබන්ධනා, සංසාර නමැති බන්ධනයෙන් - බජ්ඣන්ති එත්ථාති බන්ධනං—සංසාරපපාතා; සංසාර නමැති ප්‍රපාතයෙන්; සංසාරපල්ලා, සංසාර නමැති මහාකර්දමයෙන්; සංසාරවිදුග්ගා, සංසාර නමැති විදුර්ගයෙන්—විසෙසෙන දුග්ගා විදුග්ගා—සංසාරපඞ්කා, සංසාර නමැති තෘණශෛවාලනලකුමුදගහනයෙන්. සීහො යන තන්හි සාමාන්‍යයෙන් “තිණසීහො පණ්ඩුසීහො කාළසීහො සුරත්තහත්ථපාදො කෙසරසීහො” යන සතර ජාතිය සිංහයන් කෙරෙහි මිගරාජ ශබ්දයෙන් විශිෂ්ටවතබැවින් කෙශරසිංහ මැ ගත්නාලැබේ. ලාඛාපරිකම්මකතෙහි විය, ලාරසෙන් තැවරූ බඳු; මුඛ, මුහුණු; අග්ගවාලධි, අක්වල්; පාදපරියන්තෙහි, පාපිරියත්; මත්ථකතො, මුදුන්—ලාඛාරසපරිපීතතුල්කා ලාඛාතුල්කා—සඤ්ඤිතා, කළවෙළක; ඛන්ධෙ, ස්කන්ධයෙහි; කඳට; සතසහස්සග්ඝනක, ලක්‍ෂවටනා; කම්බලපරික්ඛෙපෙන විය, රක්තකම්බලයක්හුගේ පරික්‍ෂෙපයක් බඳු; අතිධවල, ඉතා සුදුවූ; සංඛචුණ්ණපිණ්ඩවණ්ණෙන, සක්සුනුපිඩක් බඳු; සුවණ්ණගුහතො වා, රන්ගුහායෙන්; රජත, රිදීගුහා; මණි, වෙරළුමිණි ඉඳුනිල්මිණි පියුම්රාමිණි; ඵලික, පිළිමිණිගුහා; තෙසං යෙව ඵලෙ, එම රත්රිදීමිණිතලායෙහි හෝ රක්තලායෙහි හෝ, රජං, ධූලි; අසනිසද්දං, අසනිඝොෂා; අලාතචක්කං, ගිනියෙල්සක්; සන්තාසං, චිත්තොත්‍රාස හා ශරීරකම්පා; අක්ඛණ, ගැවැසීගත්; වරලක්ඛණෙ, මහාපුරුෂලක්‍ෂණයන් ඇතියේ; අනුබ්‍යඤ්ජනපතිමණ්ඩිතො, අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් භූෂිතවූයේ; ගන්ධකුටිසුවණ්ණගුහතො, ගඳකිළි නමැති රන්ගුහායෙන්; ගන්ධමණ්ඩලමාලං, මහාධම්ම සභාමණ්ඩලය; රතනථලසන්නිභං, රුවන්ගිරිතලා සෙයින්—කත්වාති දසෙසරිය—ජ අසාධාරණඤාණ, ඉන්ද්‍රියපරාපරියත්තඤාණය ආශයානුශයඤාණය යමකප්‍රාතිහාර්‍ය්‍යඤාණය සර්වඥතාඥානය අනාවරණඥානය

* යන ෂඩ්විධ අසාධාරණඥාන නමැති; කෙසරභාරං, කෙසුරුභාරය; බ්‍රහ්මස්සරෙන; අෂ්ටාඞ්ගසමන්වාගතවූ බ්‍රහ්මඝොෂයෙන්; අට්ඨපරිසාසු, "ඛත්තියපරිසා බ්‍රාහ්මණපරිසා ගහපතිපරිසා සමණපරිසා චාතුම්මහාරාජිකපරිසා තාවතිංසපරිසා මාරපරිසා බ්‍රහ්මපරිසා" යන අෂ්ටවිධ පර්ෂද්; ඤාණසන්තාසං ජනයන්තො, ඥානයට විත්‍රාසයට සන්ත්‍රාස ජනවනුයේ; නානාවිධ, නානාප්‍රකාරවූ; දෙසනාවිලාසසම්පන්නං, දෙශනාවිලාසයෙන් පරිපූර්ණ; සීහනාදං නදති, සිංහනාද කෙරේ- පියංවදතීති පියං වදෙ- කරවීකසකුණෙ, කුරවීකෙවිල්ලක්; මධුරරසං, මියුරු රසඇති; සහකාරඵලං, මීඅඹඵල; ජනකායං යන තන්හි සතන් සත්වකායයෙන් එක්කෙනකුවිසින් එකවචනයි. මත්තං විය, මීමෙදෙන් මත් හැඞගසන් සෙයින්; ලළිතං කරොන්තො ලලනය කරනුයේ; මඤ්ජුස්සරෙන, ලළිත සරයෙන්; මණිවංසං, මිණිවස්දඬු; මධුරස්සරේන, මියුරුසරයෙන්; අප්පොස්සුක්කො හුත්වා, නිරුත්සාහ කොට; අනුප්පත්තධම්මරජ්ජො, අනුප්‍රාප්තවූ ධර්මරාජ්‍ය ඇතියේ; ලොකෙන, සත්වලොකයාවිසින්.

කල්‍යාණධම්මොති එත්ථ කල්‍යාණං සුඛං අණති ආණයතීති කල්‍යාණං කුසලං තං ධම්මො සභාවො යෙසං තෙ කල්‍යාණධම්මා-ඨානන්තරෙසු ඨපෙති, "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං රත්තඤ්ඤූනං යදිදං අඤ්ඤාකොණ්ඩඤ්ඤො" යනාදික්‍රමයෙන් ස්ථානවිශෙෂයෙහි පිහිටුවත්; තෙන තෙන සද්ධිං සල්ලපන්තො විය හොති, ඔවුනොවුන් හා වෙනවෙනම කථාසල්ලාප කරනුවන් වැනි වෙත්.

වදුලේ මැ නො-

"අභිජානාමි ඛො පනාහං අග්ගිවෙස්සන අනෙකසතාය පරිසාය ධම්මං දෙසිතා අපිස්සු මං එකමෙකො එවං මඤ්ඤති මමෙව ආරබ්භ සමණො ගොතමො ධම්මං දෙසෙති" යි.

ඛත්තියපණ්ඩිතා, අභයරාජකුමාරාදි ක්‍ෂත්‍රිය පණ්ඩිතයෝද; බ්‍රාහ්මණපණ්ඩිතා, චඞ්කීබ්‍රාහ්මණාදි බ්‍රාහ්මණපණ්ඩිතයෝද; ගහපතිපණ්ඩිතා, උපාලිගෘහපතිප්‍රභෘති ගෘහපතිපණ්ඩිතයෝද; සමණපණ්ඩිතා, සභියපරිව්‍රාජකාදි ශ්‍රමණපණ්ඩිතයෝද; නිපුණ, සියුම් නුවණැතියවුහු; කතපරප්පවාද, කරනලද පරවාදඇතියවුහු; පරයන් හා කරනලද වාද ඇතියවුහ යුසේයි. වාලවෙධිරූපා, වල් පලා විදුනන් බඳු වූවාහු; වල් පලා විදුනන් සෙයින් ප්‍රඥායෙන් දෘෂ්ටි භෙදකරන්නාහ යුසේයි.

---

* 80 වෙනි පිටේ අග පෙළේ "සර්වඥතාඥානය" යන්නට මුලින් "මහාකරුණාසමාපත්තිඥානය" යනු යොදා දතයුතුයි. පොත්හි ලිපිකර ප්‍රමාදයෙන් එය අඩුවී තිබේ.

වොශ්‍රිඥන්තා යන තන්හි ව් අව පූර්වවූ "භිදිර්-විදාරණෙ"යන ධාතුයි. පඤ්ඤාගතෙන දිඪිගතානි, ප්‍රඥායෙන් දෘෂ්ටි; ගතශබ්ද වාක්‍යාලඞ්කාරයි-පඤ්හනති ඤාතුං පුච්ඡිතුං යුත්තමත්ථං-යං, යමක්හු කරු; යමෙක් අතාක්දෙනාගේ කාඞ්ක්‍ෂාවිනොදනය කෙරේද ඔහු කරායෑ යුෂේයි. උපසංකම්ත්වා පුච්ඡන්ති, එකචර සිංහරාජයක්හු ගන්ට අත දික් කරනුවත් සෙයින් ප්‍රභිනන වරවාරණයක්හු සොඬ පිරිමදන වූත් සෙයින් උග්‍රතෙජස් ඇති ආශීවිෂයක්හු ග්‍රීවායෙහි වැළඳගන්නවුන් සෙයින් ප්‍රජ්වලිත වහ්තිස්කන්ධයක් වැළඳගන්නවුන් සෙයින් එළැඹැ පැන පිළිවිසිත්; ගුල්හානි ච, සංවෘතයනුදු; "ගුහ්-සංවරණෙ" යන ධාතුයි. පටිච්ඡනතානි ච, ප්‍රච්ඡන්නයනුදු; "ඡද-අපවාරණෙ"යන ධාතුයි. සුනිසිතසථෙන, සුධෞතශස්ත්‍රයෙකින්; කුමුදනළකලාපං විය, මහනෙල්දඬුකලඹක් සෙයින්-"දිබ්බාගදෙන සප්පවියාති දිබ්බාසධෙන සප්ප අභිභවන්තො විය-තෙ, ඒක්‍ෂත්‍රියපණ්ඩිතාදීහු තෙජස් මදනැතිවැ නිපතිතමානධ්වජවැ අප්‍රතිභානවූවාහු; භාසුර, දීප්තවූ; විලම්බ, ප්‍රලම්බවූ; කෙසරසටා, ලාකෙසුරුසළාරැසින්; සොභිතක්ඛන්ධස්ස, හොබනා සකන්ධඇති; බායන්ති, වටහත්; ඔවුන් හැමදෙනාවිසින් අභිසඞ්ඛතවූ ප්‍රශ්නයෝ වෙරළට පත් මුහුදුරළ සෙයින් අවුදු බුදුන්කරා එළැඹැ බිඳෙත්. එයින් කීහ-

"එවං සඞ්කාසමාවට්ටා සඞ්කාවීචියො තීරං පත්වා මහාසමුද්දස්ස ඌමියො විය භගවන්තං පත්වා භිජ්ජන්ති"යි.

ඉද්ධිවිධෙන, සෘද්ධිවිධඥනයෙන්; නානාවිධවිකුබ්බනං දස්සෙන්තා, "අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති. එකොපි හුත්වා බහුධා හොති" යනාදි ක්‍රමයෙන් අනෙකප්‍රකාර සෘද්ධි දක්වනුයේ; දෙවමනුස්සානං සද්දං සුණන්තො, "දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච දූරෙච සන්තිකෙ ච" යනාදි ක්‍රමයෙන් දිව්‍යමනුෂ්‍යයන්ගේ ශබ්දයන් අසනුයේ; පරෙසං සොළසවිධං චිත්තං ජානන්තො, "පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං වා චිත්තං-පෙ-සදොසං වා චිත්තං වීතදොසං වා චිත්තං සමොහං වා චිත්තං වීතමොහං වා චිත්තං සංඛිත්තං වා චිත්තං අසංඛිත්තං වා චිත්තං මහග්ගතං වා චිත්තං අමහග්ගතං වා චිත්තං සඋත්තරං වා චිත්තං අනුත්තරං වා චිත්තං සමාහිතං වා චිත්තං අසමාහිතං වා චිත්තං විමුත්තං වා චිත්තං අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති"යි ගත් ෂොඩශාකාරයෙන් දන්නේ; ඉච්ඡිතිච්ඡිතට්ඨානං සමනුස්සරන්තො, "අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථිදං එකම්පි ජාතිං ද්වෙපි ජාතියො" යනාදි ක්‍රමයෙන් ඊප්සිත ඊප්සිත ස්ථාන ස්මරණ කරනුයේ; ඉච්ඡිතිච්ඡිතං රූපං පස්සන්තො, ඊප්සිත ඊප්සිත රූපයන් දක්නේ; අතිපණීතානි, අශ්වාසවාරයෙහිදු සමවදනාබැවින් අතිප්‍රණීතවූ; ලොකුත්තරඵලසුඛානි, 'ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව

ධම්මං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති” යනාදි ක්‍රම
යෙන් ලොකොත්තරඵලසුඛයන්; අනුභවනෙතා, ධම්දෙසමින් හිඳ
පළිඳ සාධුකාර දෙන ක්‍ෂණයෙහි පූර්‍වභාගයෙත් පිරිසිඳ ඵලසමා
පත්ති සමවැද සාධුකාරශබ්දයාගේ නිර්ඝොෂවර්ජිත නොවනතුරු
සමාපත්තීන් නැඟී සිටිතැන් පටන්ගෙන ධර්‍මදෙශනා වනබැවින්
නිරන්තරයෙන් අනුභවකරනුයේ; කරුණාභගවතී, කුලුණු නමැති
මහපිනැතියවිසින්; චොදිතහදයො, චොදනාකරනලද හෘදය ඇති
යේ; මණිදීපරස්මි, මිණිපහන්රැසින්; හතතිමිර, නටඅඳුරුඇති;
ගන්ධකුටියා, ගඳකිළිය; සලිලධරපටලජනිත, මෙඝපටලයෙන්
දනවනලද; බහලන්ධකාරරත්තියා, බහලවූ අන්ධකාර ඇති රාත්‍රියෑ;
හිමසමාකුලා, හිමපොදින් අවුල්වූ; බලවානිල, බලවත්වූ සුළඟින්;
විලුළිත, ඇලලෙනලද; සකණ්ටක, කටුසහිතවූ; ව්‍යග්ඝනාගචරිත;
ව්‍යාඝ්‍රයන් හා වනගජයන්විසින් හැසිරෙනලද; විසමතල, විෂමවූ
භූමිඇති; නොහොත් හූරුවසුරුකසළනෙන් ගහනවූ ගිනිහල්
කම්හල් ඈ විෂමභූමිතලඇති; දෙසං, දෙශයෙහි; අධිවසති,
සුවෙන් වෙසේ; මෙතෙන අධියොගයෙහි කර්‍මසංඥයි. සුප්පාර
කො විය, එකාදසනිපාතයෙහි සුප්පාරකජාතකයෙහි දක්වනලද
සුප්පාරකනම් පණ්ඩිතයා සෙයින්; තණ්හානිලවෙගෙන, තෘෂ්ණා
නමැති වායුවෙගයෙන්; සංසාරමහණ්ණවෙ, සංසාර නමැති මහා
ර්ණවයෙහි; අපායවළභාමුඛං, නරක නමැති වළබාමුවට; පජානා
වං, ප්‍රජා නමැති නෞකා–ප්‍රකර්ෂේණ ජායත ඉති ප්‍රජා, සත්වානනය
ත්ති නෞඃ-දෙසනාසච්චකරණෙන, ධම්දෙසුන් නමැති සත්‍යක්‍රියා
යෙන්: සද්ධම්මරතනපූරිතං කත්වා, සද්ධර්‍ම නමැති රත්නයෙන් පරි
පූර්ණ කොට; නිබ්බානඵලං, නිර්වාණ නමැති සඵලයට; මහොස
ධො විය, මහෞෂධ නම් පණ්ඩිතයා සෙයින්; සංසාරඋපකාරිපුරාව
රුඩං, සංසාර නමැති උපකාරිපුරයෙහි අවරුඩවූ; “රුධිර්-ආවරණෙ”
යන ධාතුයි. ජාතිජරාමරණරිපුගණපරිබ්බූල්හං, ජාතිජරාමරණ
නමැති රිපුගණයන්විසින් පරිබ්බූල්හවූ; සමන්තාද්දූඪවූ; “වහ-
ප්‍රාපණෙ” යන ධාතුයි. කාමකොධරිපුකම්මකම්පමානං, කාමක්‍රොධ
නමැති රිපුජනයන්ගේ කර්‍මයෙන් කම්පමානවූ; කොණ්ඩඤ්ඤ
විදෙහනරපතිපමුඛං, කෞණ්ඩන්‍යස්ථවිර නමැති විදෙහනරපතිහු
ප්‍රමුඛ කොට ඇති; වෙනෙය්‍යජනසමූහං, වෛනෙයපුද්ගල
නමැති ජනසමූහයා; අට්ඨඞ්ගමග්ගඋම්මග්ගතො, අෂ්ටාඞ්ගමාර්ගී
නමැති උමඟින්; විපස්සනානාවාහි, විදර්ශනා නමැති නැවින්; තණ්හා
ගඞ්ගාපවාහතො, තෘෂ්ණා නමැති ගඞ්ගාප්‍රවාහයෙන්—ගායන්ති
ගච්ඡන්තීති ගඞ්ගා—සමාපත්තිවාහනං, සමාපත්ති නමැති වාහන
යට—වහන්ති පවත්තෙන්ති ගච්ඡන්ති ඉච්ඡිතං දෙසං එතෙහීති වාහ
නානි—නිබ්බානමිථිලායං, නිර්වාණ නමැති මිථිලානම් නුවර; සුත

සොමො විය, අසීතිනිපාතයෙහි සුතසොමජාතකයෙහි දක්වන ලද සුතසුම් නම් රජහු සෙයින්; කිලෙසපොරිසාදවසගතං, ක්ලෙශ නමැති පොරිසාදයා හස්තප්‍රාප්තවූ-පුරිසස්ස ඉදං පොරිසං බලං ථාමං තං අදති භක්ඛති නාසෙතීති පොරිසාදො-තිවට්ට, කාමා වර්ත්ත ක්ලෙශාවර්ත්ත විපාකාවර්ත්ත නමැති; වටසාඛාබද්ධං, න්‍යග්‍රොධ ශාඛායෙහි බඳනාලද; වෙනෙය්‍යජනරාජරාසිං, විනෙයජන නමැති රජරැස්; දෙසනාසිනා, ධම්දෙසුන් නමැති කඩුවෙන්; පටිසන්ධිබන්ධනං, ප්‍රතිසන්ධි නමැති බන්ධනය; ධම්මරසයාගුපානෙන, ධර්මරස නමැති යාගුපානයෙන්; අරියභූමිසකරජ්ජෙ, ආර්‍ය්‍යභූමි නමැති ස්වකීය රාජ්‍යයෙහි; සරභඞ්ගො විය, චත්තාලීසනිපාතයෙහි දක්වනලද සරභඞ්ග නම් ශාස්තෘහු සෙයින්-සරං ඛිපිත්වා ආකාසෙ සරපාසාදදීනි කත්වා පුන එකෙන සරෙන තෙ සරෙ පාතෙනෙනා භඞ්ගවිභඞ්ගෙ අකාසීති සරභඞ්ගො-වෙනෙය්‍යසරාජකලොකං, වෛනෙයජන නමැති සරාජලොකයා; සංසාරඝරාවාසතො, සංසාර නමැති අගාරයෙන්; අරියමග්ගවට්ටුමෙන, ආර්‍ය්‍යමාර්ග නමැති රාජපථයෙන්; තණ්හාගොදාවරිපවාහතො, තෘෂ්ණා නමැති ගොදාවරීනදීශ්‍රොතසින්; නිබ්බානඅස්සමපදං, නිර්වාණ නමැති ආශ්‍රම පදයට; කුසරාජා විය, සත්තතිනිපාතයෙහි කුසජාතකයෙහි දක්වනලද කුසනම් රජහු සෙයින්; කරුණාපභාවතී, කරුණා නමැති ප්‍රභාවතී නම් දෙවියවිසින්; අනාවරණඤාණගජරතනං, අනාවරණඥාන නමැති හස්තිරත්නයට; බුද්ධචක්ඛුමහාවාරං, බුද්ධචක්ෂුස් නමැති මහාවාරය; පරපරිසසමරභූමිං, ප්‍රතිපක්ෂපක්ෂීන් නමැති සඞ්ග්‍රාමභූමියට; පඤ්හපරිහාරවචනෙන, ප්‍රශ්නවිසර්ජනයෙන්; අපොඵාටෙත්වා, ආස්ඵාලනා කොට අපොළා; දෙසනාසීහනාදෙන, උත්තම දෙශනා නමැති සිංහනාදයෙන්; කිලෙසරිපුසෙනං, ක්ලෙශශත්‍රැසෙනා; ඔපාතෙත්වා, අවපාතනය කොට; වෙනෙය්‍යජනසාගලෙ, වෛනෙයජන නමැති සාගලපුරවාසීන්; මන්ධාතා විය, තිකනිපාතයෙහි පළමුවනවග මන්ධාතු ජාතකයෙහි දක්වනලද මන්ධාතු නම් නරපතිහු සෙයින්; ධම්මරතනවස්සං, ධර්ම නමැති රත්නවර්ෂී; අලද්ධසද්ධම්මධන, පූර්වයෙහි අලබ්ධවූ සද්ධර්ම නමැති ධනහෙයින්; දුග්ගතානං, දුර්ගතවූ දුඃඛප්‍රාප්තවූ සත්ත්වයනට; අසමසුඛං, අසදෘශවූ නිර්වාණසැප; ජලධරො විය, දිව්‍යමෙඝයක්හු සෙයින්; ලොකාකාසෙ, ලොක නමැති ආකාශයෙහි; ඛ්‍යාමප්පභා, වටාසිටි රශ්මිමණ්ඩලමැ; භාසුර, දිලියෙන; සුරචාපං, දෙව්දුනු; දයාසීතලං, කරුණායෙන් සිහිල්වූ; ධම්මාමතවුට්ඨිධාරං, ධර්ම නමැති අමෘතවෘෂ්ටිධාරා; වස්සාපෙත්වා, නිරවධි කොට වස්වා; කිලෙසපරිළාහං, ක්ලෙශ නමැති පරිදාහ; කප්පතරුවරො විය, දිව්‍යකල්පවෘක්ෂයක්හු සෙයින්; සීලමූලො, චතුර්විධ පාරිශුද්ධිශීලමැ මහමුල් ඇති; සමාධික්ඛන්ධො,

සමාධිමැ ඝනසාරසකන්ධ ඇති; පඤ්ඤාශාඛො, ප්‍රඥාසාඛා ඇති; අභි
ඤ්ඤාපුප්ඵො, ෂඩ්අභිඥා නමැති පුෂ්පඇති; විමුත්තිඵලො, පඤ්චවිධ
විමුක්ති නමැති ඵල ඇති; කරුණාසීතලච්ඡායො, මහකුලුණුමැ සිහිල්
සෙවණ ඇති; වෙනෙය්‍යජන, වෛනෙයජන නමැති; භමරසකුණ
ගණවිවජ්ජිතනසඤ්චාරො, බමරලිහිණිගණන්විසින් නොසුන් හසර
ඇතියේ; ජාතිකන්තාරපටිපන්නං, ජාති නමැති කාන්තාරයට ප්‍රති
පන්නවූ; ජරාමරණඝම්මපරිපීළිතං, ජරාමරණ නමැති ග්‍රීෂ්මපරිපීඩි
තවූ; සංසාරිකපථිකජනසමූහං, සාංසාරික නමැති අඩිකජනසමූ
හයා; සංසාරයෙන් අපරිමුක්ත සාංසාරික නම් වෙයි. පථයෙහි නියු
ක්ත පථික නම් වෙයි. ජනයන්ගේ සමූහ ජනසමූහ නම් වෙයි. දීපං
කරමහෙසිනො, දීපඞ්කර නමැති මහර්ෂිහුගේ; පසාදෙන,

"පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ බුද්ධො ලොකෙ භවිස්සති"

යනාදී ක්‍රමයෙන් වදාරනලද ප්‍රසාදයෙන්; පාරමිතාසිනා, පාර
මිතා නමැති ඛඩ්ගයෙන්; භවවනගහනං, භවනමැති වනගහනය;
'පදාලෙත්වා' යනු "දල-විදාරණෙ" යන ධාතුයි. අනුක්කමෙන, අනු
ක්‍රමයෙන්; සාරාසැකිකප්සුවහසිනැ යුසේයි. බොධිඅඞ්ගණං, බොධි
නමැති අඞ්ගණයට; රුවන්වැලිරැසින් ගැවසීගත් අවකාශයට; පුබ්බ
ජිනජනානුයාතං, පූර්වජින නමැති ජනයන්විසින් අනුයාතවූ; විප
ස්සනාමග්ගං, විදර්ශනා නමැති මාර්ගය; විමල, ප්‍රභාස්වරවූ; සීල,
චතුඃපාරිශුද්ධිශීලමැ; අමල, දිල්හෙන; රතනවාලුකාකිරන්විතං,
රුවන්වැලිරැසින් ගැවසීගත්; චරණ, පඤ්චදශචරණ ධර්මමැ; මණි
තොරණරමණීයං, තන්හි තන්හි දිලිහෙන මිණිතොරණින් රම්‍ය
වූ; මෙහි පඤ්චදශචරණ ධර්මනම් "සීලෙසු පරිපූරකාරිතා ඉන්ද්‍රියෙසු
ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සත්ත
ධම්මා චත්තාරි රූපාවචරජ්ඣානානි" යන මේයි. ඉද්ධිපාද, සතර
සෘද්ධිපාදධර්ම මැ; කප්පපාදපොපෙතං, කල්පපාදපයෙන් සමුපෙ
තවූ; බ්‍රහ්මවිහාර, සතරබ්‍රහ්මවිහාරධර්මම; කමලාකරාභිරාමං,
කමලාකරයෙන් පියුම්විලින් අභිරම්‍යවූ; සතිපට්ඨාන, සතර සිවටන්
ධර්ම මැ; රතනභවනභාසුරං, රුවන්විමනින් දිලියෙනුවූ; ඉන්දු, සඳ
රැස් සෙයින්; කුන්දදල, කොඳමල් පෙති සෙයින්; ධවල, සුදුවූ;
කිත්ති, යශෝරාශි මැ; කෙතුසතසොභිතං, පතාකාශතයෙන් ශොභි
තවූ; සමාපත්ති, සමවත්මැ; පාකාරපරිගතං, ප්‍රකාරපරිඛායෙන් පිරි
බෙවූනාලද; කිලෙසරිපු, කෙලෙස්සතුරු නමැති; තුහින, පිනි
බිඳට; දිනකරං, සහස්‍රරශ්මිහු වූ; අපනීත, අපගතවූ; භවභයං, සං
සාරභය ඇති; අවිපරිණාම, විපරිණාමයට නොයන නොදිරන
නොපෙරෙළෙන; අසමසුඛං, නිර්වාණසුඛ ඇති; දසසහස්සචක්ක

චාල, දශසහස්‍රලොකධාතුන්විසින්; විඤ්ඤෙය්‍යං, පරිඥතවූ; සකල ලොකධාතුයා, අනන්තාපරිමාණ ලොකධාතුවට; අග්ගං, ශ්‍රෙෂ්ඨවූ; නිබ්බානනගරං, නිර්වාණනමැති පුරයට; චතුබ්බිධමග්ගවාරෙන, චතුර්විධ මාර්ගඥාන නමැති දොරින්; ධම්මරතනරාසියො, දහම් නමැති රුවන්රැස්; වවත්ථපෙත්වා, ව්‍යවස්ථා කොට; අග්ගඵලසමාපත්ති, අර්හත්ඵලසමාපත්ති නමැති; මහාපාසාදං, මහාප්‍රාසාදයට; චක්කවත්ති විය, චක්‍රවර්තියක්නු සෙයින් සද්ධර්මවරචක්‍රවර්ති තෙමේ; මහාකරුණාසීහපඤ්ජරෙ, මහකුලුණුනමැති සිවුමැදුරෙහි; බුද්ධචක්ඛුනයනානි, බුද්ධචක්ෂුස් නමැති නයනයන්; කොණ්ඩඤ්ඤ මහාකුටුම්බිකං, කෞණ්ඩින්‍ය මහාස්ථවිර නමැති මහාකුටුම්බිකයා; "අට්ඨාරසකොටිපුරිසෙ" යනු ධම්සක් පවත්නෙහි රාත්බඹුන් ගෙන කියත්. "අපරානි පඤ්චපණ්ණාස කුලානි" යනු යසකුලපුත්‍රාදී පස්පනස්සිටුදරුවන්ගෙන කියත්. "අපරානි තිංසකුලානි" යනු භද්‍රවර්ගීයන් තිස්දෙනා ගෙන කියත්. "අපරං කුලසහස්සං" යනු උරුවෙලකාශ්‍යපාදී ජටිලසහස්‍රයන් ගෙන කියත්. "අපරානි එකාදසනවුතකුලානි" යනුලට්ඨිවනයෙහි අධිගම කළ බිම්සරරජහු ඈ එකොළොස් නවුතයක් ජනයන්ගෙන කියත්. "අපරානි චතුරාසීති කුලසහස්සානි" යනු තිරොකුඩ්ඩසූත්‍රදෙස්නෙහි අධිගම කළ සුවාසූදහසක් ජනයන් ගෙන කියත්. "අතිමහන්තං මම නගරං" යනාදිවිසින් සද්ධර්මවරචක්‍රවර්තීන්හුගේ විනතාප්‍රකාර දක්වන්නට කියත්. "මාසස්ස අඩ්ඪුදිවසෙසු" යනු දෙසනා දෙපොහෝ දෙපැළවි දෙඅටවක් ගෙන කියත්. අනුලොමපටිපදං පටිපන්නානං, "ඉධ භික්ඛවෙ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො" යනාදී ක්‍රමයෙන් බුද්ධොත්පාදයෙහි පටන්ගෙන "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති" යි දක්වනලද අර්හත්ඵලපර්‍ය්‍යන්තකොට අනුලොමපිළිවෙතට පිළිපදනා; අපරිමාණානං කුලපුත්තානං, අනන්තාපරිමාණකුලපුත්‍රයන්; කිං බහුනා භාසිතෙන, බොහෝ කීමෙන් කිම; කුම යුතැන යත්? සර්වගුණසඞ්ග්‍රාහික සර්වඥතා මහාකරුණාගුණ හා දෙගුණය කියයුතුවනබැවින් බොහෝ කීමෙන් කිම යූසේයි. අත්ථානත්ථං, හිතාහිත; භවසාගරපාරගො, සසරසයුරෙහි පරතෙරට ගියේ; තිලොකරථසාරථි, තුන්ලෙව් නමැති රථයට සාරථි වූයේ; තිත්ථියමත, තීර්ථකදර්ශනයට; අන්තකො, විනාශකරනුයේ; දුද්දන්තදමකො, දුර්දාන්ත සත්වයන් දමනය කරනුයේ; ධම්මාමතමබුවස්සකො, ධර්මනමැති අමාවැසි වස්වනුයේ; ලොකාලොකකරො, ධර්මාලොකයෙන්ලොව එකාලොක කරනුයේ; ජගදානන්දලොචනො, ජගත්හට ආනන්දයට උත්සවයට ලොචනයක් බඳුවූයේ; තිලොකතිලකො, ලොකත්‍රයට තිලකයක් බඳුවූයේ; ගුණසෙඛරො, විද්‍යාචරණාදි ගුණ මැ කඩාමල් කඩකොට ඇතියේ; භව

වනගහන, භවනමැති වනගහනයට; දවානලො, ලැව්ගින්නක් බඳුවූයේ; ධම්මලොචනො, ධර්ම මැ නෙත්‍ර කොට ඇතියේ; ඤාණසාගරො, නුවණ මැ මුහුදු කොට ඇතියේ; අප්පමාණගුණො, අනන්ත පරිමාණ ගුණ ඇතියේ; ඉරියාපථවිහාරො, ස්ථානගමනාදි ඊර්‍යාපථ විහාරය; දිබ්බවිහාරො, කිසුණුඈ අරමුණු දුනු රූපාවචරධ්‍යානාදි දිව්‍යවිහාරය; බ්‍රහ්මවිහාරො, මෛත්‍ර්‍යාදි බ්‍රහ්මවිහාරය; අරියවිහාරොති, ඵලසමාපත්ති ආර්‍ය්‍යවිහාරය යන; සාසනමහීරුහං, සසුන් නමැති තප්රුක; "කාසාවපජ්ජෝතං" යන තන්හි-භික්ඛූනං භික්ඛුනීනඤ්ච නිවත්ථපාරුතකාසාවානං පභාහි එකොභාසං-"ඉසිවාතපරිවාතං" යන තන්හි-ගෙහං පවිසන්තානඤ්ච නික්ඛමන්තානඤ්ච භික්ඛුභික්ඛුනීසංඛාතානං ඉසීනං චීවරවාතෙන ච තෙසංයෙව සම්මිඤ්ජනපසාරණාදිජනිතසරීරවාතෙන ච පරිවාතං ඉසිවාතපරිවාතං-නිසුත් මැ විය. ගණ්ඩම්බරුක්ඛමූලෙ, ගණ්ඩනම් උයන්පල්ලාවිසින් රොපිතවූ අඹරුක්මුල්හි; ද්වාදසයොජනිකෙ රතනමණ්ඩපෙ, සක්දෙව්රජහුවිසින් මවනලද දොළොස්යොදුන් රුවන්මඬුයෙහි; යොජනප්පමාණෙ පල්ලඞ්කෙ, යොදුන්පමණ පලඟ මතුයෙහි; තිසීදිත්වා, වැඩහිඳ, ද්වාදසයොජනවිත්ථතාය, එකිඑකී දිශායෙන් දොළොස් දොළොස් යොදුන් විතරවිසින් සූවිසියොදුන් පරික්ෂෙපවිසින් දෙසැත්තෑයොදුන් මහපිරිස; අත්තාදෘතපරිදීපනං, ආත්මශුද්ධි දක්වනුවූ; "දෛප්-ශොධනෙ" යන ධාතුයි. තිත්ථියපරිමද්දනං, තීර්ථකයන් අභිමර්දනය කරනුවූ; **යමකපාටිහාරියං** යන තන්හි බුදුන්ගේ සාඞ්විධඥනයෙන් මැවූතාක් වස්තු ප්‍රතිපක්ෂහරණයෙනුදු ප්‍රාතිහාර්‍ය්‍ය නම්වෙයි. හෙමැ යුවල යුවල කොට දක්වනුයේ යමක නම් වී.

එයින් කීහ-

"පටිපක්ඛහරණතො වා පටිහරති සත්තානං දිට්ඨිමානොපගතානං චිත්තානීති වා අප්පසන්නානං චිත්තානං පසාදං පටිහරතීති වා පාටිහාරියං, යමකඤ්ච තං පාටිහාරියඤ්චාති යමකපාටිහාරියං"යි.

පුබ්බාපරචක්කවාළමුඛවට්ටිනිහිතං, පැඳුම්සක්වළ මුවවිට හා පැළසක්වළ මුවවිට තබනලද; පරම, නිරුත්තරවූ; රමණීයං, රම්‍යවූ; මරියාදෘභූමිං, රන්බිම හා මිණිබිම අතුරෙහි නන් රුවන්මුවා අවධිභූමි ඇතියේ; මණිමුත්තාවාලුකාකිණ්ණං, මිණිවැල්ලෙන් හා මුතුවැල්ලෙන් ගැවසීගත්; සහස්සරංසිම්ව, සහස්‍රරශ්මිහු සෙයින්; අභිඤ්ඤාපාදකං චතුත්ථජ්ඣානං සමාපජ්ජිත්වා, අපි අපි සෑබි ප්‍රාතිහාර්‍ය්‍ය දක්වම්හයි ආතාක් ශ්‍රාවකයන් වළකා අභිඥාවට පාදකවූ චතුර්ථධ්‍යානසමාපත්තියට සමවැද; **උපරිමකායතො** යනාදි තන්හි නාභියෙන්,මත්ත උපරිමකාය නම් වෙයි පාත අධඃකාය නම් වෙයි. පවත්තයමානො, ගිනිකඳ හා දියකඳ පවත්වනුයේ; විස්සජ්ජෙන්තො, රැස්විහිදුනේ; ධම්මං දෙසෙන්තො, ධම් දෙසනුයේ; එකොපි

හුත්වා, තුමු එකාකී වූවාහුදු; බහුධා හොති, බොහොම වෙත්; බහුධාපි හුත්වා, බොහොම වූවද; එකො හොති, එක්කෙනෙක් වෙත්; ආවිභාවං, ආවිර්භූත වෙත් අප්‍රච්ඡන්න වෙත් ප්‍රකට වෙත්; තිරොභාවං, තිරොභූත වෙත් ප්‍රච්ඡන්න වෙත් අන්තර්හිත වෙත්; තිරොකුඩ්ඩං, කුඩ්ඩයෙන් පාරයට; තිරොපාකාරං, ප්‍රාකාරයෙන් පාරයට; තිරොපබ්බතං, පර්වතයෙන් පාරයට, අසජ්ජමානො ගච්ඡති, නො පැහැර යෙත්; සෙය්‍යථාපි ආකාසෙ, අහස්හි සෙයින්; පඨවියාපි, පොළොවද; උම්මුජ්ජනිමුජ්ජං කරොති, උන්මජ්ජනනිමජ්ජන කෙරෙත්; නැගෙති ගැලෙතියි සේයි. සෙය්‍යථාපි උදකෙ, දියෙහි සෙයින්; උදකෙපි අභිජ්ජමානො ගච්ඡති, අභිද්‍යමානවූයේ දියෙහිදු යෙත්; සෙය්‍යථාපි පඨවියං, පොළොව්හි සෙයින්; ආකාසෙපි, අහස්හිදු; පල්ලඞ්කෙන, පර්‍ය්‍යඞ්කයෙන්; කමති, සඞ්ක්‍රමණය කෙරෙත්; සෙය්‍යථාපි පක්ඛිසකුණෙ, පක්‍ෂිශකුනින් සෙයින්; ඉමෙපි චන්දිමසුරියෙ, මෙම චන්ද්‍ර සූර්‍ය්‍යයන්හුදු; එවං මහිද්ධිකෙ, එකපැහැර තුන්මහදිවෙක්හි පැනෙනබැවින් මෙසේ මහත් සෘද්ධි ඇතියවුන්; එවං මහානුභාවෙ, එකෙක් දිශාවෙන් නව නව යොදුන් සුවහස්හි අඳුරු විධමා ආලොක දක්වනබැවින් මෙසේ මහත් අනුභාව ඇතියවුන්; පාණිනා, අත්ලෙන්; පරිමසති, පරාමර්‍ශ කෙරෙත්; පරිමජ්ජති, පිරිමදිත්; යාව බ්‍රහ්මලොකාපි, බඹලොව දක්වා; කායෙන, ශරීරයෙන්; වසං වත්තෙති, තමන් විසිය පවත්වත්; තදා, මෙසේ බුදුන් යමක ප්‍රාතිහාර්‍ය්‍ය දක්වනකල්හි; උම්මාපුප්ඵදාමාවෙළා විය, දියමෙරළිමල්දම්හි පෙරළියක් සෙයින්; කණිකාරකුසුමදාමාවෙළා විය, කිණිහිරිමල්දම්හි පෙරළියක් සෙයින්; බන්ධුජීවකපුප්ඵදාමාවෙළා විය, බඳුවදමල්දම්හි පෙරළියක් සෙයින්; සුමනකුසුමදාමාවෙළා විය, සමන්මල්දම්හි පෙරළියක් සෙයින්; මඤ්ජෙට්ඨදාමාවෙළා විය; මඳටදම්හි පෙරළියක් සෙයින්; මඤ්ජෙට්ඨරස්මියො, මඳට සේ රත් රස්හුදු-පභස්සරරස්මියොති එත්ථ පභා රංසියො සරන්ති සරීරතො ගච්ඡන්තීති පභස්සරා-අත්තනො, තමන්; ජාතිභූමිං, උපන්තැන්; බුදුසිරුරු යූතැන්; තාලක්ඛන්ධ, තල්කඳපමණව; රථචක්ක, රිය සක්මඬුලුපමණ වැ; සකටචක්ක, ගැල්සක්මඬුලුපමණ වැ; කූටාගාරාදිමත්තා හුත්වා, එක්කැණිමඬුලු ගන්වා කළ ගෙ පමණ වැ; චක්කවාළගිරිං, චක්කවාළනගං, සක්වලගල්. “චතුනවුතාධිකච්ඡයොජන සතසහස්සබහලං” යන තන්හි නවුතශබ්දයෙන් දසදහස කියත්. නිබන්ත, උද්දීපනවූ; “ඣදි ඉන්ධී-දීප්තිදෙවනයොඃ”යන ධාතුයි. ඡද්දන්තගජඝටා විය, සදන් ඇත්කැල සෙයින්; වලාහකතුරඞ්ගමාලා විය, වලාහක ඇත්පෙළක් සෙයින්; චිත්තකූටහංසරාසියො විය, චිත්‍රකූටපර්වතවාසී ස්වර්ණහංසරාශි සේ; පභාරහිතානං, ප්‍රභාරහිතවූ; නිසාකර, සඳහුගේද; සුරිය, සූර්‍ය්‍යයාගේද; තාරාගණ, තාරකා

ගණයන්ගේද; දෙවතා, දෙවියන්ගේද; උය්‍යාන, දිව්‍යෝද්‍යානයන්ගේද; විමාන, දිව්‍යවිමානයන්ගේද; කප්පපාදප, කල්පවෘක්‍ෂයන්ගේද; සරීර, දොළොස්යොදනක් තන්හි පැතිර සිටිනා ප්‍රභාඇති දිව්‍යශරීරයන්ගේද; ආභරණානං, එසෙසින්ම විහිදිනා රස්ඇති දිව්‍යාභරණයන්ගේද; පරිච්ඡෙදමත්තාමෙව පඤ්ඤායිංසු, චිත්‍රකර්‍මයෙහි රූපසෙයින් පරිච්ඡෙදමාත්‍රම පෙනිණි; බජ්ජොතකො විය, කදෝපැණියක සෙයින්; අජ්ඣොත්ථටං, අධ්‍යවස්තෘත වී; මැඩපියනලද යුසේයි; නීලමණි, ඉඳුනිල්මිණිපටිඳුදු; සුවණ්ණ, රන්පටිනුදු; පවාළ, පබළුපටිනුදු; රජතපට්ට, රිදීපටිනුදු; අවනද්ධා විය, ගැවසීගත්වන්සෙයින්; ඉන්දධනු, දේදුනුත්තෙනුදු; විජ්ජු, විදුලියෙනුදු; සඤ්ඣාඝන, සැඳෑවලාසෙනුදු; අභිරඤ්ජිතා විය, අභිරඤ්ජිතයන් සෙයින්; රතනාවෙළ, රතනාවෙළසෙනුදු; රතනදාම, රුවන්දම්නුදු; රතනචුණ්ණ, රුවන්සුන්නෙනුදු; විප්පකිණ්ණා විය, විප්‍රකීර්ණයන් සෙසින්; පමුදිතහදයා, ප්‍රමුදිතවූ හෘදය ඇතියව්හු; සඤ්ජාත, උපන්; පීතිසොමනස්සා, ප්‍රීතිසොම්නස් ඇතියව්හු; පරිදහිත, අඳනාලද; පරිසුද්ධ, පිරිසිදු; පණ්ඩරවත්ථා, ශ්වෙතවස්ත්‍ර ඇතියව්හු; කමලමකුළසදිස, මහනෙල් කැකුළු බඳු; අඤ්ජලිං, ඇඳිලි; අහො, යහහා; ලොකහිතො, ලොකයහට බොහෝදෙනහට වැඩ සඳහා නිපන්හ යුසේයි; වදාළේ මැනො "අහං හි බ්‍රාහ්මණ බහුජනහිතාය පටිපන්නො බහුජනසුඛාය බහුව මෙ ජනතා අරියෙ ඤායෙ පතිට්ඨාපිතා යදිදං කල්‍යාණධම්මතාය කුසලධම්මතායාති" උග්ගිරන්තා, උද්ගිරණයකරන්නාහු; චන්දනචුණ්ණමිස්සිතානි, චන්දනචූර්ණයෙන් මිශ්‍රවූ; පඤ්චවණ්ණානි දිබ්බපුප්ඵානි, පඤ්චවර්ණවූ දිව්‍යපුෂ්පයන්; අවකිරන්තා, ඉස්වන්නාහු; චෙලානි දිව්‍යසාටකයන්; භමයන්තා, බමවන්නාහු; දෙවතාවකසංගීතියො, පවත්තෙන්තා, දෙවතාලන් ලවා නැවුම්ගඳැව් කරවන්නාහු; ධම්මරතනමඤ්ජුසො, ධර්‍මනමැති රත්නයට මැදිරිරූපසෙන් සිටියේ; නිබ්බානාමතරසං පායෙසි, නිවන්අමාරස වැළඳවී; තතො, එයින් උත්තරයෙහි; යමාමහපෙළහර දුටු ජනයන් බුදුන් දැක මිස නොයම්හයි කඳවුරු බඳ තැතින් මත්තේය යුසේයි; නෙකමණිනිකර, අනෙකමණි සමූහයන්ගේ; කිරණභාසුර, රශ්මියෙන් දිලිහෙන; විවිධවීථි, සුදසුන්මහවේ ඈ නොයෙක් වීථිඇති; වන, කල්පපාදපාදි දිව්‍යවෘක්‍ෂසහස්‍රයෙන් ප්‍රතිමණ්ඩිත නඳුන්උයන් ඈ නොයෙක් උයන් ඇති; විමානෙ, දදඅගින් දසදහසක් යොදුන් විජයොත්මහපා ඈ නොයෙක් විමන් ඇති; දසයොජනසහස්සවිත්ථතායනෙ, දසයොදුන් දහස් අයම් විතර ඇති; වාරසහස්සපජ්ජලිතෙ, දහස් රුවන් දොරවූවෙන් දිලිහෙන; පඤ්චසයොජනායාම, පනස්යොදුන් ආයාම ඇති; ඛන්ධසාඛාවිභූසිතෙ; සකන්ධයෙන් හා පඤ්චමහාශාඛායෙන් විභූෂිතවූ; යොජනසතවිත්ථතායතෙ, යොදුන් සියක් පමණ විතර අයම්ඇති;

තිියොජනසතිකා, තුන්සියක් යොදුන්ඇති; සාඛාවලයාලංකතො, ශාඛාමණ්ඩලයෙන් සැදුම්ලද; යොජනපඤ්ඤාසගාමි; යොදුන් පනස් යන සුලූ; කුසුමප්පභා, මල්පැහැයෙන්; භාසුරෙ; දිලියෙනුවූ; යොජනසතවහන, යොදුන්සියක් පැමිණෙනා; සුරභි, මනොඥවූ; කුසුමගන්ධපරිමලෙ, මල්ගඳින් සුවඳවූ; සකල පාලිච්ඡුලෙල, සියලු පරිච්ඡුලවූ ; සකලශබ්දය සර්වශබ්දපර්‍ය්‍යායපරමවූකල පරිපූර්‍ණවූ ; ච්ඡුල-විකසනෙ යන ධාතුයි. පාරිජාතකතරුවරමූලෙ, පරසතුරුක් රජහුගේ මුල්හි; පඤ්චදසයොජනුබ්බෙධෙ, පසළොස් යොදුන් උස ඇති; පඤ්ඤාසයොජනවිත්ථතෙ, පනස්යොදුන් විතරඇති; සට්ඨියොජනායතෙ, සැටයොදුන් ආයාමඇති; ජයසුමනදල, බඳුවදමල් පෙත්සෙයින්; අලත්තකපටල, ලාරසෙහි රැඳූ පුලුන්පෙදක් සෙයින්; පාවලෙ, රත්වූ; හංසලූනු, හසුජ්තිලිසෙයින්; මුදුකෙ, මොළොක්වූ; මනොනුකූල, මනොඥවූ; උතුඵසකෙ, සෑහ දෙනුවූ; දෙවින්ඳුකුසලඵලභූතෙ, දෙව්රජහුගේ කුශලකර්මයෙහි ඵලයෙන් නිපන්; පණ්ඩුකම්බලසිලාතලෙ; රත්පලස්හි පැහැ බඳු පැහැඇති වනබැවින් පණ්ඩුකම්බල නම් ලද සලතෙලෙහි; බුද්ධකපිටෙ නිසීදනෙනා විය, කුඩු පුටුයෙක්හි හිඳිනා මහාපාංශකූලිකයක්හු සෙයින්; තිම්මිතසුබුම්මතාභාවානං, නිර්මිතවූ සියුම් අත්බැව් ඇති; ඉදිඅක් පමණ තැන්හි සැත්තෑ අසූබැගින් සියුම් කොට මවාගෙන සිටි අත්බැව් ඇතියවුන යුෂේසි. පූරිතචක්කවාලගබ්භානං, පරිපූර්‍ණවූ චක්‍රවාලගර්භඇති; බ්‍රහ්මසුරගණානං මජ්ඣෙ, බ්‍රහ්මයන් හා සුරගණයන් මධ්‍යයෙහි; සුරලොකං ඔභාසෙනෙනා නිසීදිත්වා, සුරලෝ බබුළුවමින් හිඳ—එයින් කීහ.

"තාවතිංසෙ යදා බුද්ධො සිලායං පණ්ඩුකම්බලෙ
පාරිච්ඡත්තකමූලම්හි විහාසි පුරිසුත්තමො
දසසු ලොකධාතුසු සන්නිපතිත්වාන දෙවතා
පයිරුපාසන්ති සම්බුද්ධං වසන්තං නගමුද්ධනි
න කොචි දෙවො වණ්ණෙන සම්බුද්ධංච විරොචති
සබ්බෙ දෙවෙ අධිගගය්හ සම්බුද්ධොව විරොචති"—යි.

මාතුදෙවපුත්තමාරබ්භ, තුෂිතවිමානයෙන් නික්ම සඟ පිරිවරින් අවුදු වැඳ එකත්පස්ව හුන් මව්දෙව්පුත්හු අරභයා; සත්තප්පකරණං, ධම්මසංග්‍රාහකප්‍රකරණය විභඞ්ගප්‍රකරණය ධාතුකථාප්‍රකරණය පුද්ගලප්‍රඥප්තිප්‍රකරණය කථාවස්තුප්‍රකරණය යමකප්‍රකරණය ප්‍රස්ථානප්‍රකරණය යන සප්තප්‍රකරණාත්මකවූ; අභිධම්මං දෙසෙන්තො, "කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා" යනාදි

විසින් තුන්මසක් දවස් නිරන්තරයේ ආකාශගඞ්ගාප්‍රවාහ සෙයින්
අභිධර්මපිටක දෙශනා කරනුයේ; අසීතිදෙවකොටීනං, අසූකෙළක්
දෙවියන්ට; ධම්මාභිසමයං අකාසි, මහර්ඝිකවූ ධර්මාභිසමය කෙ
ළේයි — මෙහි සමයශබ්ද මාර්ගඵලප්‍රතිවෙධයෙහි වැටේ— උට්ඨායා
සනා, සතිස්යොදුන් පිරිස්වැසියන් ගොස් සකස්නුවරෙහි මුළුදූන්
කල්හි හුනස්නෙන් නැඟී; සඞ්කස්සොතරන්ත, මහරජ මිනිස්ලෝ
යම්හසී වදළකල්හි ධම්දෙසුන්පුදන කළමැනවැයි සක්දෙව්රජහු
විසින් ඇණවනලද; විස්සකම්මදෙවපුත්තෙන, සබ්බකම්මයෙහි (දක්ෂ
හෙයින්) විශ්වකර්ම නම් ලද දිව්‍යපුත්‍රයා විසින්; එකතො, එක්පාශ්ව
යෙක්හි; සප්තමය්‍යපීශයෙහි තුසිල් - ගණිතවිචිත්‍රපූජාවස්තූන්, ගන්නා
ලද විසිතුරු කුසුම්දම් ආදී පූජාවස්තුඇති; සකලචක්කවාළගබ්භ
පූරිතදෙවසඞ්ඝෙන; සියලු සක්වළගබ් පිරුණු දිව්‍යසමූහයාවිසින්;
පරිවාරිතො, සහ පිරිවරින් පුෂ්පවිතානපූජා කරන මල්සහා දෙව්
පුත්නු හා සමඟ පිරිවරනලදුයේ; පඤ්චසිඛාභිධානෙන, පඤ්ච ශිඛාවන්
ඇත්වනබැවින් පඤ්චශිඛනම් අභිධානඇති; තිගාවුතායතං, තුන්ගව්
ප්‍රමාණ දිගු; බෙලුවපණ්ඩුවීණං, බෙලුවපණ්ඩුනම් වීණාව; සම්පණ්
ණසාය මුච්ඡනාහි මුච්ඡිත්වා, සම්පතැස් මූර්ච්ඡනා නම් වහාහෙයින්
වෙණමුසන් ගන්වා; වාදියන්තෙන, වයනුවහුවිසින්; ගීයමාන,
කියනලද; ථුතිවචනො, ස්තුතිවචනඇතියේ; දසසහස්සපූරිඤ්ඤදපරිවා
රෙන, දසදහසක් පුරිඤ්ඤද නම් ලද සක්දෙව්රජහුගේ පරිවාරඇති;
"සකෙකන"යි යොදනු — චත්තාලිසසහස්සදෙවරාජෙහි, දසදහ
සක් සක්වළ සතලිස්දහස් වරම් මහරජුන්විසින්; පුරතො, පෙරට;
පසාරිතපාදසාටකො, අතුරනලද පියවිලි ඇතියේ; ගහිත, ගන්නා
ලද; විචිත්‍ර, විසිතුරුවූ; කනකරජතධජෙ, රන්ධජ හා රිදීධජ ඇති
යේ; වීජමාන, සලනලද; සරදචන්දජ්ජුති, සරාසඳරැස් සේ; පභස්ස
ර, රැස් විහිදිනා; දිබ්බචාමරනිකරො, දිව්‍යචාමරමාලා ඇතියේ; මණි
මයතාලවණ්ටමාලාහි, මිණිමුවා වටාපත්පෙළ සෙයින්; සමාරිය
මාන, හසුරුවනලද; මුදු, මොළොක්වූ; සීතල, සිහිල්වූ; මන්ද
නිලො, මන්දමාරුත ඇතියේ; වීසතිසහස්සාධිකතිංසසහස්සදෙව
කුමාරිකාහි, එක්සක්වළෙක දෙතිස්දෙනකුබැවින් දසදහසක්
සක්වළ තුන්ලක්ෂ විසිදහසක් දෙව්කුමරියන්විසින්; උප්පලකලා
පාලඞ්කත, දිව්‍යමහනෙල්කලඹින් සැදුම්ලද; කනකරජතමණිමය,
රන්රිදීමිණිමුවා; පුණ්ණකලසමාලා ගහෙත්වා, පුන්කලසපෙළ
ගෙන; ගීයමාන, ගායනාකරනලද; මධුර, මියුරුවූ; මඞ්ගලවච
නො, මඞ්ගලහඬ ඇතියේ; මහාබ්‍රහ්මුනා, දෙලොස්යොදුන් මහ
බඹහුවිසින්; ධාරිත, ධරනලද; සරදපරිපුණ්ණචන්දමණ්ඩලනිබ්බි
සෙස, ශරත්කාලයෙහි පරිපූර්ණ චන්ද්‍රමණ්ඩලයක් සෙයින් දිලි
හෙන; සෙතච්ඡත්තෙන, තුන්යොදුන් පමණ සේසත් ඇතියේ;

සකලලෝකං මහාජනස්ස නයනවිසයං කාරෙන්තො, සකලලෝකය මහාජනයා ඇසට විෂය කරනුයේ; කෙසේද යත්? බුදුහු එදා මහමෙර මුදුනෙහි සිට සැවැත්නුවර දොර දක්වූ යමාමහපෙළහර නිසාගෙන් යමාමහපෙළහර විස්මයක් දක්වමින් සිට උඩ බැලූහ. භවඅග දක්වා එක්හෙළි විය. බිම බැලූහ. අවීචිය දක්වා එකඞ්ගණ විය. දිශාවිදිශා බැලූහ. අනන්තාපරිමාණ ලෝකධාතු එකාලෝක විය. දෙවියෝ මිනසුන් දුටහ. මිනිස්සු දෙවියන් දුටහ. බුදුන් දුටු කෙණෙහි දෙව්මිනිස්සු උපැ රළ ගල මහමුහුද සෙයින් ගුගුළහ. සතිස්යොදුන්පිරිස්වැසියන්කෙරෙහි බුදුබවට නොපැතුවාහු නැති.

රජතකනකසොපානාවතරමාන, රිදීහිණින් හා රන්හිණින් බස්නා; මහානුභාව, මහත් අනුභාවඇති; දෙවබ්‍රහ්මගණනිකර පරිවාරෙන, දිව්‍යගණයන් හා බ්‍රහ්මනිකරයන්ගේ පරිවාරයෙන් සංකස්සනගරවාරෙ ඔතරිත්වා, සකස්නුවරදොර බැස— කෙසේද යත්? මහානුභාව දෙවියෝ විසිතුරු පුදා ගෙනැ දකුණත්පසැ දිලිහෙන රන්හිණින් බසිති; එසෙසින්ම බඹහු වමත්පස රස් විහිදුනා රිදීහිණින් බසිති, බුදුහු රස්කලඹෙන් වොරජමින් මැදහිණින් බසිති, තෙසු දෙවියෝ තුඹිත්හි සිත්නම් සෙයින් දදපෙළ සෙමෙර සේසත් රුවන්දම් මල්දම් ගඳදුම් නැටුම් ගඳෙව් ගෙන සක්වළගැබ්හි පිරි බසිති. පීතිවිකසිතනයනාය, ප්‍රීතියෙන් විකසිත නෙත්‍රඇති; ඡත්තිංසයොජනපරික්ඛෙපාය, සතිස්යොදුන් පිරිබෙව් ඇති; චතුවීසතිඅසඞ්ඛෙය්‍යදෙවමනුස්සෙ අමතපානං පායෙන්තො, සූවිසි අසඞ්ඛ්‍යයක් දිව්‍යමනුෂ්‍යයන් අමෘතපාන පොවනුයේ; බහුස්සුතානං, බහුශ්‍රැත සෙසු ස්ථවිරයන් ඇතද භාණ්ඩාගාරිකපයිවාප්තිය සිට ධර්ම ගත්වනබැවින් බහුශ්‍රැත භික්ෂූන්ට අග්‍රවූ; සතිමන්තානං, බුද්ධවචනය ගෙන ධරන ස්මෘතිමත් වනබැවින් ස්මෘතිමත්නට අග්‍රවූ; ගතිමන්තානං, එකපදයෙහි සිට සැටදහසක් පද බුදුන් වදාළ නියායෙන් නොපිරිහෙළා ගත්වනබැවින් ගතිමත්නට අග්‍රවූ; ධිතිමන්තානං, බුද්ධවචනග්‍රහණවීර්‍ය්‍යයිද අධ්‍යනවීර්‍ය්‍යයිද බුද්ධොපස්ථානවීර්‍ය්‍යයිද අනන්‍යසාධාරණ වනබැවින් ධෘතිමත්නට අග්‍රවූ; බුද්ධුපට්ඨාකානං, සෙසු ස්ථවිරයන්සේ අන්තරිත නොකොට උපස්ථායකස්ථාන ලද දවස් පටන්ගෙන ආරබ්ධවීර්‍ය්‍යයට බුදුන් සිත්ගෙන මෙහෙ කරන බැවින් බුද්ධොපස්ථායක භික්ෂූන්ට අග්‍රවූ; අග්ගො යනතැන්හි අග්‍ර ශබ්දය කොටියැද ශ්‍රෙෂ්ඨයෙහිද වැටෙනබැවින් මේ පචස්ථානයෙහිම කොටිප්‍රාප්තයහ ශ්‍රෙෂ්ඨභූතයහ යන අර්ථයි— ධම්මභණ්ඩාගාරිකො, බුදුන් වදාළ සුවාසූදහසක් ධර්මස්කන්ධ නිධාන කළ භාණ්ඩාගාරයක් වැනිබැවින් ධර්මභාණ්ඩාගාරික නම්වූ; ආයස්මා, බුදුන් කෙරෙන් අවවරයක් ලදින් අමොඝපන්තිවිසින් ආගමනවිසින්

චිණ්ණවසිතායෙන් ගුණාධිකත්වයෙන් පඤ්චස්ථානයෙක්හි අග්‍රස්ථාන යට පැමිණි ආගමසම්පත් අධිගමසම්පත් පූර්වහෙතුසම්පත් තිත්ථවාසසම්පත් යොනිසොමනසිකාරසම්පත් බුද්ධොපනිශ්‍රයසම්පත් යන සප්තසම්පත්තීන් සමුපෙත වැ සතර ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයෙන් සමන්විතව අග්‍රපදප්‍රාප්ත වනබැවින් ආනන්ද 'ආයස්මා'යන ආදර වචනයෙන් ව්‍යවහාරකරනලද; ආනන්දස්ථවිරෝ, බුදුන් සිළුපිය අමිතොදන ශාක්‍යයන් දරුව හැම ජනයනට ආනන්ද ජනවනබැවින්ද තැයන් ආනන්දප්‍රමුදිත කෙරෙමින් උපන්වනබැවින්ද ආනන්ද නම් ලද මහතෙරහු; අනාථපිණ්ඩිකෙන, සර්වකාමසමෘද්ධතායෙනුදු විගතමත්සරතායෙනුදු කරුණාදිගුණසමන්විතායෙනුදු නිත්‍යකාල යෙහි අනාථයන්ට සර්වත්‍රාභිවර්ෂී වැ පිඬු දෙන්නෙන් අනාථපිණ්ඩික නම් ලද සුදත්තගෘහපතිහුවිසින්.

නිප්පච්චයොති එත්ථ යස්මා නං පටිච්ච නිස්සාය පුඤ්ඤකාමිනො අයන්ති ගච්ඡන්ති පවත්තන්තීති තස්මා පච්චයොති වුච්චති,නත්ථි පච්චයො එතස්මින්ති නිප්පච්චයො–"සාධු භන්තෙ"යන තැන්හි සාධුශබ්දය ආරාධනායෙහි වැවේ;"සාධූති ගන්ත්වා"යන තැන්හි සම්ප්‍රතිග්‍රහණ යෙහි වැවේ; තථාගතං පූජෙ, තමන් විශාරද වනබැවින් බුදුන් පුළුවුත්හු; සාරීරිකං යන තන්හි ශරීරධාතු ශාරීරිකනම් වෙයි; පරිභුක්ත වස්තු පාරිභොගිකනම් වෙයි; බුදුන් උදෙසා ගුණ සඳහන් කොට කරන සත්කාරයට හෙතුවූ ප්‍රතිමා උද්දෙසිකනම් වෙයි;"ජෙත වනෙ මම නිබ්බුතස්සාපි අයං පටිමා විය භවිස්සති"යි මහබෝ තමන් හා සම කොට බුදුන් වදාළබැවින් බුදුන් සෙයින්ම මහබෝ පිදියයුතු. එයින් කීහ—"චෙතියං වන්දිත්වා බොධිඅඞ්ගණං පත්තෙනාපි බුද්ධස්ස භගවතො සම්මුඛා විය නිපච්චාකාරං දස්සෙත්වා බොධි වන්දිතබ්බා"යි—

මහතා බලකායෙන පරිවුතොති එත්ථ මහතා රාජානුභාවෙන ධරණිතලං භින්දන්තො විය සාගරං පරිවත්තෙන්තො විය විචිත්‍ර වෙසසොභෙන මහතා බලකායෙනාති අත්ථො—සබ්බාලඞ්කාර පතිමණ්ඩිතො, සර්වාභරණයෙන් විභූෂිතවූ; පුණ්ණකලස, රන් කලස රිදීකලස ඈ පුන්කලසද; ආදාස, රන්කැටපත් රිදීකැටපත් ඈ කැටපත්ද; කුසුමසමුග්ග, රන්සුමුඟු රිදීසුමුඟු ඈ සුමුඟුදු; ධජ, රන්ධජ රිදීධජ ඈ ධජපෙළද; කදලි, රන්කේල් රිදීකේල් ඈ කේල්ද; තොරණ, රන්තොරණ රිදීතොරණ ඈ තොරණද; ධර, ගෘහීතවූ; අලඞ්කත, සර්වාභරණ විභූෂිතවූ; නාරීගණපරිවුතො, නාරී ගණයාවිසින් පරිවෘතවූයේ; සන්නිපතිංසු, එ දවස් ඔවුන්කෙරෙහි

විශාඛා මේලපලඳනෙන් සැදී උපගත වූව; ඒ ඒ විශාරද උපාසක
වරනු සර්‍වාභරණ විභූෂිතවූ තව්තිසැවැසි දෙවියන් සෙයින් ගඳමල්
ගෙන අවුදු රුස්වූහු; "නයෙථ නො න සබ්බඤ්ඤු රජ්ජං තිඨති" යනු ඇප
කෙරේ කවර වෛරි රජෙක් වීනම් අප කළ දෑ වරදැයි යුෂ්ස්සි;
හරිතපත්ත, හරිතවර්‍ණවූ පත් හා; රතනඞ්කුරො, රත්අංකුරු
ඇතියේ; පවාලලතාකුලිතං, පබළුලියෙන් වළඳනාලද; මරකත
සාගරො විය, මරාමුහුදක් සෙයින්; සබ්බසත්තහිතෙ රතො, සර්‍වසත්
යන්ට හිතයෙහි රතවූයේ; පාරාපතචරණ, පරෙවියන් පාසෙයින්;
පාටලරාගෙ, රත්පෑඇති; අසිසිරකිරණේ, හිරුහු; අත්ථගිරිසමීපං,
අස්තගිර්සමීපයට; අපරසාගරතටසමුග්ගත, අවරමුහුදින් නැගී;
පවාලලතාකලාපෙ විය, පබළුලියකලඹක් සෙයින්; සඤ්ඣාරා
ගෙ, සැඳෑපැහැ; රවිපියවිරහෙ, හිරුනමැති ප්‍රියහුගේ විරහයෙහි;
සොකවිධුරාය, ශොකයෙන් විධුරවූ; විගතධුරවූ; කමලිනිකාමිනියා,
විල්වමියක්විසින්; භමරාවළිමණිවලයං, බමරවැල නමැති මිණි
වළා, අවහරිතුම්ව, ගළවන්නට සෙයින්; කමලකරතලෙ, පියුම්
නමැති අත්; සංකොචියමානෙ, හකුළුවනකල්හි; සුරාසුර, දෙවියන්
හා අසුරයන්ගේ; චූලාමණි, සිළුමිණියෙහි; මරීචිසමය, රස්කඳ
ඹෙන්; පරිචුම්බිත, සෙවුනාලද; චරණනඛමයූඛො, සරණ නිය
රුස් ඇතියේ; සුවණ්ණ, ශොභණවූ වර්‍ණඇති; සුරභි, මනොඥවූ;
සුගන්ධ, සුවඳවූ; පුප්ඵූපහාරසමලඞ්කත, පුෂ්පපූජායෙන් සැදුම්ලද;
භූමිභාගාය, භූමිභාගඇති; චතුකුඞ්ඩකෙ, සතරභිත්තියක්ඇති; ගෙ
හෙ, සර්‍වජනනගෘහයෙක්හි; පරිනිබ්බුතස්සාපි, පිරිනිවියහුගේද;
යා දෙසනා, යම්දෙශනාවක් ඇද්ද; පඤ්ච වස්සසහස්සානි, පස්වා
දහසක්; සා, ඒ දෙශනා; සත්තානං, සත්නට; අමතමහානිබ්බාන
සම්පාපිකා භවිස්සතීති, අමාමහනිවන් පමුණුවනුයයි; චින්තෙත්වා,
සිතා; අභිනවසම්ඵුල්ල. අලුතපිපි; රත්තකොවිළාරකුසුමදාමවණ්ණං,
රත්කොබලිලමල්දමක් බඳු; සුරත්තදුපට්ටං, සුරක්තවූ දෙපටසිවුර;
තිමණ්ඩලං, දෙදණ මුඞුලු නැඹමඩුලු; සුවණ්ණපාමඞෙගන, රත්
පමුදමෙකින්; පවාලකලාපං, පබළුලියකලඹක්; නිග්‍රොධඵලසමාන
වණ්ණං, නුගපල හා සමවූ පැහැඇති, න්කෙතම්ව, වසනතැනක්
වැන්න; එකනිපාතනිහම්ව, එකපැස්තොටක් වැත්න; දෙවමනු
ස්සනයනවිහඟානං, දෙව්මිනිසුන්ගේ නුවන් නමැති ලිහිණිගණ
යාට; විහා වුච්චති ආකාසො තෙන ගච්ඡන්තීති විහඟා—ආවෙළ ආවෙ
ළා, සරල් සරල්ව; පසාරිත, පහරනාලද; රතනවිචිත්ත, රුවනින්
විසිතුරුවූ; කඤ්චනපට්ටා විය, කසුන්පට සෙයින්; රත්තසුවණ්ණරස,
රත්රන්රසයෙන්, නිසිඤ්චමානා විය, පරිෂෙක කරනුවන්සෙයින්;
උක්කාසතනිපාත, උල්කාශතයන්ගේ නිපාතයෙන් සමාගමයෙන්;
උල්කානම් මිණිදඬුවැටහත්. සමාකුලා විය, සමාකුලිතයන්

මෙන්; නිරන්තරවිප්පකිණ්ණ, අතුරු නැතිව වනලද; කණිකාර පුප්ඵා විය, කිණිහිරිමල් ඇතියවුන් සෙයින්; වායුවෙගක්ඛිත්තා, වායුවෙගයෙන් විසිරගිය; චීනපිට්ඨචුණ්ණපුණ්ණා විය, සිඳුරචුණ්ණයෙන් පරිපූර්ණසන් සෙයින්; නානාවිධ, නොයෙක් වැදෑරුම්; රතනාලඞ්කාර, රුවන්පලඳනාවෙන්; උජ්ජලා විය, දිලියෙනුවන් සෙයින්; තාවදෙව, එම විගස.

සතනිඵතිංසුති අනෙකෙහි කප්පකොටිසතසහස්සෙහි දුල්ලභදස්සනානං ව්‍යාමප්පභාපරික්ඛෙපානං අසීතිඅනුබ්‍යඤ්ජනපතිමණ්ඩිතෙහි ද්වත්තිංසමහාපුරිසලක්ඛණවරෙහි සමාකිණ්ණමනොහරමායතනසරීරානං අනප්පදස්සනානං අතිමධුරධම්මනිඝොසානං යථාභූතගුණාධිගමෙන ලොකෙ අරහන්තොති ලද්ධසච්චාභිධානං අරහතං පසාදසොම්මානි අක්ඛීනි උම්මීලෙත්වා දස්සනමත්තම්පි සාධු සුන්දරං අත්ථාවහං සුඛාවහං හොති සචෙ පන අට්ඨඞ්ගසමන්නාගතෙන බ්‍රහ්මස්සරෙන ධම්මං දෙසෙන්තස්ස එකපදම්පි සොතුං ලභිස්සාම සාධුතරංයෙව භවිස්සතීති එවං අජ්ඣාසයං කත්වා සබ්බකිච්චානි පහාය තුට්ඨමානසා අගමංසු.

විමලජ්ජුතිං, නිර්මලවූ ප්‍රභා ඇතියවුනු—තථාගී—බුදුන්ගේ අඟුණියි කොට බඳනට නිවටුන් දුන් අත්ලස් ගත් කිවියෙක් බුදුන්ගේ ශරීරයෙහි ලිහිඩිල්ලක පමණ අයුණක් නොදුටු ගුණම වැනීය, මෙසේ බුදුන්ගේ ශරීරයෙහි නිර්මලවූයෙන් දුහි විමල වී—සකපරහිතසමත්ථා, ස්වහිතපරහිත සමර්ථවූ; සමණගණා, ශමිතපාපිවූ ගණයෝ: අප්පිච්ඡා, ශුතුගුණෙන් අල්පෙච්ඡයහ; සන්තුට්ඨා, චතුර්විධ සන්තොෂයෙන් සන්තුෂ්ටයහ; පවිවිත්තා, ත්‍රිවිධ විවෙකයෙන් විවිත්තවනබැවින් ප්‍රවිවික්තයහ; අසංසට්ඨා, කුලයන් හා සංසෘෂ්ට නොවනබැවින් අසංසෘෂ්ටයහ; චොදකා, කාලෙන වක්ඛාමි නො අකාලෙන භූතෙන වක්ඛාමි නො අභූතෙන සණ්හෙන වක්ඛාමි නො ඵරුසෙන අත්ථසංහිතෙන වක්ඛාමි නො අනත්ථසංහිතෙන මෙත්තචිත්තෙන වක්ඛාමි නො දොසන්තරෙන" යන පඤ්චචොදක ධර්මයෙන් යුක්තවනබැවින් චොදකයහ; පාපගරහිනො, පාපපුද්ගලයන් ගරහනුවහ; ආරද්ධවිරියා, චතුර්විධ සම්‍යක්ප්‍රධානලක්ෂණ වීර්යයෙන් යුක්තවනබැවින් ආරබ්ධවීර්යයහ; වත්තාරො, සර්වඥකල්පයෙන් ධර්මදෙශනා කරනහෙයින් වක්තෘහ; වචනක්ඛමා, සඞ්ග්‍රාමයෙහි ශරශක්තිතොමරප්‍රහාරයෙන් අකම්ප්‍ය හස්තියක්හු සෙයින් දුර්ජනපාපලොකයෙහි පරුෂවචනයෙන් අකම්ප්‍යවන බැවින් වචනක්ෂමයෝ; එසින් වදාළහ.

"තුදන්ති වාචාහි ජනා අසඤ්ඤතා සරෙහි සඞ්ගාමගතංව කුඤ්ජරං සුත්වාන වාක්‍යං ඵරුසං උදීරිතං අධිවාසයෙ භික්ඛු අදුට්ඨචිත්තො"යි.

සීලසම්පන්නා, චතුර්විධ පාරිශුද්ධිශීලසමුපෙත වනබැවින් සීලසම්පන්නයහ; "සමාධි පඤ්ඤා විමුත්ති විමුත්තිඤාණදස්සන සම්පන්නා" යන්නෙහි සම්පන්නශබ්දය සමාධ්‍යාදීන් හා ප්‍රත්‍යෙකාභිසම්බන්ධයි. විමුත්තිසම්පන්නා, පඤ්චවිධවිමුක්තීන් සමුපෙතවන බැවින් විමුක්තිසම්පන්නයහ; විමුත්තිඤාණදස්සනසම්පන්නා, අසීත් ඵලඥානයෙන් සමුපෙත වනබැවින් විමුක්තිඥානදර්ශනසම්පන්න යහ; වන්තදොසා, වාන්තදොෂ ඇතියහු; වම-උද්ගිරණෙ යන ධාතුයි; භින්නකිලෙසා, භින්නක්ලෙශයන් ඇතියහු; භිද-විදාරණෙ යන ධාතුයි; විජටිතජටා, විජටින විධ්වංසනය කරනලද තෘෂ්ණාජටා ඇතියව්හ; ඡින්නබන්ධනා, සිඳුනාලද සංසාරබන්ධන ඇතියව්හ; ඡිදිර්-ද්වෛධීකරණෙ යන ධාතුයි; ඔහු හැමදෙනම සතරාමරලොකය හට අග්‍රදක්ෂිණීය වනබැවින් අනුත්තරපුණ්‍යක්ෂෙත්‍රයෝයි; රත්ත කම්බල, රත්පලස්ජවනිකායෙන්; පවාළවෙදිකා, පබළුමුවාවෙදිකා වළලුයෙන්; අපරිමිතකාල, අනන්තාපරිමාණකාලයෙහි; සඤ්චිත, රැස් කරනලද; පුඤ්ඤබලනිබ්බත්තාය, පුණ්‍යබලයෙන් නිපන්; ජාතිසුමනා, දැසමන්; චම්පක, සපු; නවමාලිකා, සීනිද්ද; රත්තුප්පල, රත් මහනෙල්; නීලුප්පල, නිල්මහනෙල්; වකුළ, මුහුණු; සින්දුවාර, සිඳු වර; නීලපීතවණ්ණානි පුප්ඵානි පි යොදනු; චාතුද්දීපිකමහාමෙඝා, සතරමහදිව එකපැහැර වස්නා මෙඝයෙන්; විස්සට්ඨඋදකවුට්ඨියො විය, වුහුටු උදක වෂ්ඨා සෙයින්; පවස්සිංසු, පුදවිසින් දෙව්මිනිසුන් ඉස්නා අහසින් බස්නා ගඳ සුනු හා දිවකුසුම් වෂ්ඨාවෝ වටහු,

පඤ්චඞ්ගිකතූරියඝොසානි, නළුගණයාවිසින් අවාදිතව විහිදුනා පසඟතුරුගොස්හුදු; ථුතිඝොසානි, ච, ඒ විස්මය දුටු දෙව්මිනිසුන් ගේ "නිස්සංසයං සො භගවා අරහං සම්මාසම්බුද්ධො නිස්සංසයං සො ධම්මො ස්වාක්ඛාතො නිස්සංසයං සො සඞ්ඝො සුපටිපන්නො" යනාදීන් පවත්නා ස්තුතිඝොෂාද; දසදිසා පූරයිංසු, දශදිශා පිරූහු; නිම්මලප්පභො, නිර්මලවූ ප්‍රභා ඇතියේ; නයන, නුවන්හි; අංසුජාල, රස්දැල්ම; පුඤ්ඤ, පවිත්‍රවූ; සලිලෙන, උදකයෙන්; කරචරණචලනමත්තං වා, අතක් පයක් සොල්ලන මාත්‍රයක් හෝ; අස්සාසපස්සාසසද්දො වා, එන යන නාසාශ්වාසයෙහි ශබ්දයෙක් හෝ; අනුකප්පම්පි, අනුපමණිනුත්; පඨමං කථං සමුට්ඨාපෙතා න සක්කොන්ති, බුදුන් කෙරේ ගෞරවයෙන් නොකියත්; බුදුහු එකචර කෙශර සිංහයක්හු සෙයින් ප්‍රභින්න ගජරාජයක්හු සෙයින් ඵණකෘත අශිවිෂයකු සෙයින් ප්‍රජ්වලිත අග්නිස්කන්ධයක්හු සෙයින් දුරාසදයෝයි.

එයින් කීහ.

"ආසීවිසො යථා ඝොරො මිගරාජාව කෙසරී
නාගොව කුඤ්ජරො දන්තො එවං බුද්ධා දුරාසදා"යි.

නිරන්තරපවත්තිත, නිරන්තරයෙන් පවත්වනලද; වචීසුචරිතානුභාවෙන, වාක්සුචරිතානුභාවයෙන්; දිබ්බගන්ධගන්ධිතං, දිව්‍ය ගන්ධයෙන් පරිභාවිතවූ; නානාවිධගන්ධපූරිතං, නානාප්‍රකාර ගන්ධ ද්‍රව්‍යයෙන් පූරනලද; පාරමිතාසලිලසම්භූතං, පාරමිතා නමැති උදකයෙන් සම්භූතවූ; සබ්බඤ්ඤුතඤ්ඤාණරවිකිරණවිකසිතං, සර්වඥතාඥාන නමැති සූර්‍ය්‍යරශ්මීන් ප්‍රබුද්ධවූ; මුදු, මොලොක්වූ; තනු, තුනීවූ; පුථුල, පලල්වූ; ජිව්හා, දිව්ම; කණ්ණිකං, පියුම්කෙමිඇති; පරම, උතුම්වූ: සම, සමවූ; සුබ, පිරිසුදුවූ; අවිවර, අච්ඡිද්‍රවූ; දන්තපන්තිවය කෙසරං, දන්තපඞ්ක්තිවය මැ පියුම්කෙසුරුඇති; සුරත්ත, සුෂ්ඨු රක්තවූ; දන්තාවරණවය, ඔෂ්ඨවය මැ; පත්තපරිවාරං, පත්පෙල පිරිවර කොට ඇති; ධම්මමධුබින්දුවාහිනං, දහම්මීපොද වැහෙන; සස්සිරීක, ශොභායෙන් පරිපූර්ණවූ; මුඛපදුමං, මුවපියුම්; මධුමද, මීමෙමදෙන්; උදිත, උද්ගතවූ; මකාර ආගමයි. ලළිත, ලීලාඇති; චතුර, මුදුපටුතර ගුණඇති; ගැඹුරු දික්හඬ ඇතියැ යුසේසි. රතිකර, රති ජනවනු වූ; මනොහර, සිත් ගන්නා; කුරවීකනාදසදිසං, කුරවීරාවිසුදුසු; මධුරස්සරං, මිහුරු අඬ "සරෙන දසසහස්සී ලොකධාතුං පච්චජාදෙනෙනා" යනු එදවස් දෙශනා ගෙන කීයේ සි. බුදුහු වනාහි හුන් අස්නෙහි ම හිඳ ත්‍රිසහස්‍රි මහාසහස්‍රි ලොකධාතු වැ සත්නට ධම් දෙසත්.

" කාය නුත්ථ භික්ඛවෙ " යන තන්හි මෙසු දිව්‍යමනුෂ්‍යයනුත් විද්‍යමානවූව කවර හෙතුවෙන් භික්ෂුන්ම ආමන්ත්‍රණය කළහ යත්? ඔවුන් ජ්‍යෙෂ්ඨයෙනුත් ශ්‍රෙෂ්ඨයෙනුත් සදාසන්නිහිතයෙනුත් ආමන්ත්‍රණය කොළෙෝ. ඔහු ප්‍රථමොත්පන්න වනබැවින් ජ්‍යෙෂ්ඨයහ. සකලශාසනප්‍රතිග්‍රාහක වනබැවින් ශ්‍රෙෂ්ඨයහ. තථාගතසමීප වර්ත්‍තී වනබැවින් සදාසන්නිහිතයෝ. ඒ හෙතුවෙන් "භික්ඛවෙ"යි කරුණාවිස්ඵාරසෞම්‍යහෘදයසන්නිපාතපූර්වඞ්ගම වචනයෙන් සඟුන් ගේම ආමන්ත්‍රණය කොළෙෝ ~ භික්ඛවෙ, මහණෙනි; එත රහි, දැන්; එත්ථ, මෙහි; කාය නු කථාය, කවර කථායෙන් උපලක්ෂිතව; සන්නිසින්නා, හුන්නාද; වො, තොපවිසින්; අන්තරා, අතුරෙහි; විප්පකතා, අඩාලා කරනලද්දී; කා ච පන කථා, කවර කථාය; කා යනු පෘච්ඡායැ, මට කියග යුසේසි. නොහොත් 'ත්ථ' යනු 'එත්ථ'යි නොගෙන "නිසින්නා අත්ථ"යි යොදනු.

සබ්බඤ්ඤුපවාරණං පවාරෙසි, ශ්‍රාවක ප්‍රත්‍යෙකබුද්ධයන් හා අසාධාරණවූ සර්වඥප්‍රවාරණයෙන් පැවරූහු; අත්තමනා, ප්‍රීතිසෞමනස්‍යයන්විසින් ආත්මගෘහීතමනස් ඇතියවූහු—එහෙයින් කීහ.

“අත්තමනා තුට්ඨමනා පීතිසොමනස්සෙහි ගහිතමනා පීතිසොමනස්සසහිතං චිත්තං දොමනස්සස්ස අනොකාසතො තෙහි සකකඩා ගහිතං විය හොති, අත්තමනාති සකමනා අනවජ්ජපීතිසොමනස්සසම්පයුත්තං හි චිත්තං සම්පති ආයතිඤ්ච තංසමඞ්ගිනො සුඛාවහතො සකන්ති වත්තබ්බං”—

තිරච්ඡානකථා නම් ස්වර්ගමොක්ෂයට සරස්ව සිටි කථායි-එකාලොකඤ්ඤුණෙ, එකාලොකඥාන ඇතියේ; තදච්ඡරියසවන, ඒ ආශ්චර්‍ය්‍යයාගේ ශ්‍රවණයෙහි; කුතුහල, ඇවිටින්; ආකුලිතහදයෙහි, චලිත සිත්ඇති; සවනාභිලාසං, දෙශනාවගේ ආදිමධ්‍යාවසානය අනුභව කටැවිරිසියෙන් ශ්‍රවණයෙහි අභිලාෂ ඇති;අජිතං, අජිතවස්තු; අඤිත, අධ්‍යයන කරතලද; සබ්බගන්ථො, අශෙෂග්‍රන්ථ ඇතියේ; සමධිගත, සම්ප්‍රාප්තවූ; සකලකලාපො, සර්වකලාපයන් ඇතියේ; සබ්බජන, අශෙෂජනයන්ගේ; මනොහර, සිත් ගන්නා; පරමරූපො, උත්තම රූප ඇතියේ; අන්තපුරෙ රාජා හුත්වා, අන්තඃපුරයෙහි රජව; නව යොබ්බනලළිතාන්, නවයෞවනයෙන් ලලිතවූ; මිත්තාමච්චපරිවුතො, මිත්‍රයන් හා අමාත්‍යයන්විසින් පරිවෘත වූයේ; අසෙසගන්ථකලාපාධිගාහ, සර්වග්‍රන්ථයටද කලාපයටද විනිවිද සිටි; ගම්භීරඤාණෙ, ගැඹුරු නුවණ ඇතියේ; විකසිතපඤ්ඤො, විකසිතප්‍රඥ ඇතියේ; දස චක්කවත්තිවත්තානි, දස සක්විතිවත්.

“උපොසථදිවසෙ” යන තන්හි උපොසථශබ්දය උපවසිතව්‍ය වාසරයෙහි වැටේ —දානාදිමයන්ති දානදමසඤ්ඤමමයං—වුත්තප්පකාර පුඤ්ඤකම්මප්පච්චය, උක්තප්‍රකාරවූ පුණ්‍යකර්මය ප්‍රත්‍යය කොට ඇති; උතුසමුට්ඨානං, ඍතුවෙන් සමුත්ථිතවූ; ‘චක්කරතනං’යි යොදනු. නීලමණිසඞ්ඝාතසදිසං, ඉන්ද්‍රනීලමාණික්‍යසමූහයක් බඳුවූ; පාචීනසමුද්දජලතලං, ප්‍රාචීනසමුද්‍රයාගේ ජලතලය; සහස්සාරං, දහසක් දැවි ඇත්; සනෙමිකං, නෙමිසහිතවූ. සනාභිකං, නැබ සහිතවූ; පණාළි, සිදුරු; රත්තජම්බුනදපට්ටාවට්ටපරිච්ඡෙදලෙඛා, රක්තජම්බුනදපට්ටයන්ගේ ආවෘත්තිතයෙන් පරිච්ඡෙදඇති රෙඛාවෝ-මෙහි ‘ජම්බුනද’නම් ජම්බුනදියෑ උපන් රනි. කිසේයැ යත් ? මහ දඹරුක්හි එක් එකි ශාඛා පනස් පනස් යොදුන් වැඩියේ ශාඛායට මහත්වූ නදී වූහ. ජම්බු මින් සෙති. ඒ නදින්ගේ උභයතීරයෙහි ජම්බුඵලයන් වගුලතැන ස්වර්ණාඞ්කුරයෝ උද්ගත වෙති. ඒ රන් අකුර නදීජලයෙන් ගොස් අනුක්‍රමයෙන් මහාසමුද්‍රප්‍රවිෂ්ට වෙයි.

ගේ ජම්බුනද නම්. නදීය, නදය යනු පයඨායයි. ඉඥමණ්ඩලිකවිචිත්තො, ඉන්ද්‍රමණ්ඩලයෙන් විචිත්‍රවූ; සුකුසල, ඇතම් චතුර පුරුෂයක්හුවිසින්; සම්නාහතස්ස, වයනලද; පඤ්චඞ්ගිකතූරියස්ස විය, පඤ්චාඞ්ගිකතූර්‍යයක්හුගේ ශබ්දයක් බඳු—රජනීයොති රඤ්ජේතුං සමත්ථො, කමනීයොති දිවසම්පි සුය්‍යමානො ඛමතෙව න නිග්ගච්ඡති,මදනීයොති මානමදපුරිසමදජනකො— සමොසරිත කුසුමදාමා, ප්‍රලම්බපුෂ්පදාමයක් ඇති; වෙ සන්තියොති, අඩයටි දෙකෙක්දැයි; එවං, මෙසේ; සමොසරිත කුසුමදාම, ප්‍රලම්බපුෂ්පදාමයන් ඇති; සත්තසතවයපරිවාර, දෙසියයක් අඩසට් සැදුම්ලද; සෙතච්ඡත්තසතධාරණ, සේසත් සියයක් ධරාසිටි; පවාළදණ්ඩසෙතන, පබළුදඬුසියෙන්; සමුපසොභිත, හොබනාලද; නෙමිපරික්ඛෙපස්ස, නෙම්පරික්ෂෙප ඇති; චිනනම්පි නාභිපනාළිනං අනෙනා, නාභිච්ඡිද්‍රයක් දෙදෙනාගේ ඇතුළත; සෙහි, යම් සිංහමුඛයෙකින්; තාලක්ඛන්ධප්පමාණ, තල්කඳක් පමණ; පුණ්ණචන්ද, පුන්සඳහුගේ; කිරණකලාපසස්සිරිකා, රස්කලඹක් බඳු; තරුණරවිසමාන, ළහිරුබිඹසුදුසු; රත්තකම්බලගෙණ්ඩුකපරියන්තා, රක්තකම්බලගෙණ්ඩුකයන් පයඞ්ගනකොට; ආකාසගඞ්ගාගතිසොභං, ආකාශගඞ්ගාවගේ ගතියැ ශොභාව; අභිභවමානා විය, අභිභවන වන්වූ; පවත්තකථාසල්ලාපෙසු. ප්‍රවෘත්ත කථාසංලාපඇති; වනසණ්ඩමත්ථකාසන්නෙන, වනෂණ්ඩයන්ගේ මස්තකයට ආසන්නවූ; නානාපභාසමුදය, නානාප්‍රභාසමූහයෙන්; සමුජ්ජලෙන, දීලිහෙනුවූ; ආවජ්ජිතහදයානං, ආවර්ජිතාකරනලද හෘදයඇති; රාජහංසමිථුනම්ව, රාජහංස යුගලයක් බඳු; පුණ්ණචන්දමිථුනං, පූර්ණචන්ද්‍රයුගලය; තපනීයරසධාරාපිඤ්ජරකිරණෙණ, සවර්ණරසධාරායෙන් තවරනලද රශ්මිඇති; අඩා, එකානතායෙන්; අනෙකරතනප්පභාසමුදයසමුජ්ජලං, අනෙක රත්නකදම්බයෙන් දීලිහෙන; අක්ඛාහතං විය, අකුරක ගැසූ සකක් මෙන්; පියවචනපාභතෙන, ප්‍රියවචන නමැති පඬුරෙන්; බලවපීතිපාමොජ්ජඵුටසරීරො, බලවත් ප්‍රීතිප්‍රමොදයෙන් සඵුටශරීර ඇතියේ.

"තදහුපොසථෙ පන්නරසෙති එත්ථ තදහූති තස්මිං දිවසෙති අත්ථො; උපවසන්ති එත්ථාති උපොසථො, උපවසන්තීති සීලෙන වා අනසනෙන වා උපෙතා හුත්වා වසන්තීති අත්ථො. සො පන උපොසථදිවසො අට්ඨමිචාතුද්දසීපන්නරසීභෙදෙන තිවිධො, තස්මා සෙසද්වයනිවාරණත්ථං පන්නරසෙති වුත්තං"—

උපොසථිකස්ස, පෙහෙවස් ඇතියවූට; අස්සං නු ඛො, වෙම්හෝ; "චක්කවත්ති"යන නත්හි රත්නචක්‍රයෙන් පවත්වන්නෙනිදු චතුස්සම්පත් චක්‍රයෙන් පවත්වන්නෙනිදු පරහිත සඳහා පවත්වනලද ඊර්‍යාපථචක්‍ර ඇතියෙනිදු චක්‍රසංඛ්‍යාත සතර ආඥාධම්යෙන්

හා සතරසඞ්ගහවත්ථුවින් සමන්නාගත වනබැවින්ද අනුන්විසින් අනභිභවනීයව පවත්නා ආඥාචක්‍ර ඇතිවන බැවිනුදු චක්‍රවර්තිනම් වේ—හත්ථිසොණ්ඩසදිසපණාලිං, ඇත්සොඬක් බඳු නාළිකාඇති; සුවණ්ණභිඞ්කාරං, ස්වර්ණභෘඞ්ගාරය; ඡත්තචාමරාදිභණ්ඩො, ඡත්‍ර චාමරාදිභාණ්ඩඇති; නානප්පකාරකඤ්චුකකවචාදිසන්නාහවිභූසිතෙන, නානාප්‍රකාරවූ කඤ්චුක කවචාදිසන්නාහයෙන් විභූෂිතවූ; විවිධාභරණප්පභාසමුදයසමුජ්ජලෙන, විවිධවූ ආභරණයෙහි ප්‍රභාසමූහයෙන් දිලිසෙනුවූ; සමුස්සිතධජපටාකපතිමණ්ඩිතෙන, සමුද්ගතවූ ධ්වජපතාකායෙන් විභූෂිතවූ — රාජයුත්තකාති රාජානුවත්තකා— සන්නිවෙසක්ඛමො, සන්නිවේශක්ෂමවූ; සුලභාහාරූපකරණො, සුලභවූ ආහාරඋපකරණඇති; ඡායූදකසම්පන්නො, ඡායායෙන් හා උදකයෙන් සම්පන්නවූ; සුවිසමතලො, ගුවිවූ සම භූමිභාග ඇති; පරචක්කං, පරසේනා; අරි, සතුරෝ—අරිං දමෙතීති අරින්දමො—පාගතං, පඬුරු; පණතසිරා, ප්‍රණතවූ අවනතවූ ශිරස් ඇතියවුහු.

“ස්වාගතන්ති සුඛු ආගතං, සකං තෙජි සකසන්තකං, කිඞ්කාර පටිස්සාවිනොති තං තං ආනාපෙහි රඤ්ඤො කාතබ්බං කිච්චං කිං කරොමාති පුච්ඡනකි කත්තබ්බනාය කිංකාරිතං පටිසාවෙන්තීති කිඞ්කාරපටිස්සාවිනො තෙසං භාවො කිඞ්කාරපටිස්සාවිතා, උප කප්පෙථාති උපරූපරි කප්පෙථ සංවිදහථ උපනෙථාති අත්ථො”——

පාණාතිපාතො නාමෙස, මේ ප්‍රාණඝාත නම්; පාණො න හන්තබ්බො, ප්‍රාණවධ නොකටයුත්තේය; අදින්නං නාදාතබ්බං, අදත්ත වස්තුහුගේ ග්‍රහණය නොකට යුත්තේය; කාමෙසු මිච්ඡා න චරිතබ්බා, කාමවිෂයෙහි මිථ්‍යාචරණය නොකටයුත්තේය; මුසා න භණිතබ්බා, මෘෂාභාෂණය නොකටයුත්තේය; මජ්ජං න පාතබ්බං, මද්‍යපාන නොකටයුත්තේය; යථාභුත්තඤ්ච භුඤ්ජථාති, තොප තොපගේ භුක්තිය ඉක්ම නොවළඳවයි; ඔවාදං දෙති, අවවාද කෙරේ.

එසින් වදාළහ.

“ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං, කතමෙ ද්වෙ, තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො රාජා ච චක්කවත්තී”——යි.

භුවං භූමිං භුඤ්ජති පාලයතීති භූභුක් මහීපාලඃ, භුජ–පාලනාභ්‍යවහරණයොඃ යන ධාතුයි—විභාවෙන්ති පඤ්ඤාය අත්ථං විභූතං කරොන්තීති විභාවිනො පඤ්ඤාවන්තො, අනුයුත්තාති අනුප්පවත්තකා—ප්‍රාතර් අශ්නාතීති ප්‍රාතරාසම් පූර්වාහ්ණභොජනම්—අගද

ගන්ධං, ඕඝාධගන්ධ; සංඛිත්තඵෙණ, හකුළුවනලද පෙණඇති; සංඛිත්ත උම්මිවිප්ඵාරං හුත්වා, හකුළුවනලද රළපතර ඇතිව; ඔගච්ඡමානං, අවගමන කරනුවූ; මහාසමුද්දසලිලං, මහමුහුදුදිය; වෙළුරියභිත්ති විය, වෙරළුමිණි භිත්ති සෙයින්; නරාසභොපි, සම්බොධන මද; අභිලංඝිත්වා, තුන්සියක් යොදුන් තැනට නැඟී; ඔලොකෙත්වා, චක්‍රරත්නානුභාවයෙන් මෙරුයුගන්ධරාදීන්විසින් ආවරණනැති සපරිවාර සතර මහදිව් බලා; විචිත්තවණ්ණ, විසිතුරු පැහැඇති; සුරභිකුසුමසමොකිණ්ණං, සුගන්ධපුෂ්පයෙන් අභිකීර්ණකොට; සමොසරිත, අවලම්බිතවූ; මනුඤ්ඤකුසුමදාම, මනොඥවූ කුසුමදාමයෙන්; පතිමණ්ඩිතවිතානං, සැදුම්ලද වියන්ඇති; සීලානි සමාදාය, සීලයන් සමාදානය කොට; තරුණරවිමණ්ඩලාභිරත්ත, ළහිරු මඬලක් සෙයින් අභිරක්තවූ; චරණ, සතරපාදයෙන් හා; ගීවා, ග්‍රීවායෙන් හා; මුඛ, මුහුණින් හා; පතිමණ්ඩිත, සැදුම්ලද; විසුද්ධ පිරිසුදුවූ; සරීරො, ශරීරඇතියේ; සත්තප්පතිට්ඨො, සප්තප්‍රතිෂ්ඨා ඇතියේ; සුසංහත, සුෂ්ඨුසංහතවූ; වටමට පිරිපුන්වූ; අඞ්ගපච්චඞ්ගසන්නිවෙසො, අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ සන්නිවේශ ඇතියේ; වීකසිත රත්තපදුම, පිපි රත්පියුමක් බඳු; චාරු, මනොඥවූ; පොක්ඛරො, අක්පොකුරු ඇතියේ; ඉද්ධිමා, සෘද්ධි ඇති; යොගී ඉව, මහණෙක්හු සෙයින්; මනොසිලාචුණ්ණරජිතපරියන්තො, මනශ්ශිලාචූර්ණයෙන් රජිතවූ පර්‍ය්‍යන්තඇති; රජතපබ්බතො විය, රිදීගලක් බඳුවූයේ; නරපතිස්ස, රජහට; සොවණ්ණධජ, ස්වර්ණධ්වජයෙන් හා; සොවණ්ණාලඞ්කාර, ස්වර්ණාලඞ්කාරයෙන් හා; හෙමජාල, රන් දැලින්; පටිච්ඡන්නං කත්වා, ප්‍රච්ඡන්න කොට; ඉන්දනීලමණිප්පභාජාලනීලං, ඉන්ද්‍රනීලමාණික්‍යප්‍රභාජාල සෙයින් නිල්වූ; කාලිඞ්ගා චනිසාමිනොපි, කාලිඞ්ගනම් පෘථිවීස්වාමිහටද; කතදානමානසක්කාරො, කරනලද දාන හා පූජාසත්කාර ඇතියේ; සමාදිණ්ණසීලබ්බතො, සමාදාන කරනලද ශීලව්‍රත ඇතියේ — පුඤ්ඤසමුදයනන්ති දානාදිමයං—විජ්ජුල්ලතාවනද්ධ, විදුලියෙන් වළඳනාලද; සරදකාල, සරාකල්හි; සෙතවලාහකරාසිසස්සිරිකො, සුදුවලාකලඹක් බඳු; රත්තපාදො, රත්පා ඇති; රත්තතුණ්ඩො, රත්තුඩු ඇති; චන්දප්පභාපුඤ්ජසදිස, සඳරැස්කලඹක් බඳු; සුසිනිද්ධ, සුසිනිඳු; ඝනසංඝාතසරීරො, ඝන වට මට ශරීර ඇතියේ; මුදුකෙසො, මුදු තෘණයන් බඳු කෙශ ඇතියේ.

"සණ්ඨානපාරිපූරියා අධිකං රූපමස්සාති අභිරූපා, දිස්සමානාව චක්ඛූනි පීණයන්ති තස්මා අඤ්ඤකිච්චවික්ඛෙපං හිත්වා දට්ඨබ්බාති දස්සනීයා, දිස්සමානාව සොමනස්සවසෙන චිත්තං පසාදෙන්තීති පාසාදිකා, පරමායාති එවං පසාදවහත්තා උත්තමාය-සමන්නාගතාති උපෙතා"

සප්පිමණ්ඩ, පගඝරිතතල; සතවිහතස්ස, සියක්වට පොළනලද; තූලපිචුනො වා, හිඹුල්පුලුන්හුගේ හෝ; කප්පාසපිචුනො වා, කපුපුලුන්හුගේ හෝ; සම්ඵස්සවිසෙසො හොති, ස්පර්ශවිශෙෂ වේ; ගත්තානි, ගාත්‍රයෝ; සුපිංසිතස්ස, මනාකොට විටනලද—පිස-සඤ්චුණ්ණනෙ යන ධාතුයි. අභිනවස්ස, අලුත්; චතුජාතිසමයොජිතස්ස, "තමාලතගරතුරුක්ඛයවනපුප්ඵානි" යන සිව්දෑගඳින් යොදනලද; හරිචන්දනස්ස ගන්ධො, දිව්‍යචන්දනයාගේ ගඳ; රූපසම්පන්න ගන්ධසම්පන්නයුත්තාපි, රූපසම්පත්තීන් ස්පර්ශසම්පත්තීන් ගන්ධසම්පත්තීන් යුක්ත වීද; කන්දප්පරූපස්ස, මකරධ්වජයාට බඳුවූ රූප ඇතියහට.

ව්‍යත්තොති වෙය්‍යත්තියෙන සමන්නාගතො, විද-ඤාණෙ. මෙධාවීති ඨානුප්පත්තිකපඤ්ඤාසඞ්ඛාතාය මෙධාය සමන්නාගතො, යානි යානි සුඛානි යථා සුඛං—

සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො, සර්වාභරණයෙන් විභූෂිත වූයේ; මාලාවිලෙපනධරො, මල්කඩපලන්හෝගඳවිලවුන් ගත්තේ; රාජමණ්ඩල, රාජචක්‍රයාගේ; කිරීටමකුටමණි, කිරුළුකුළුමිණි නමැති; මධුකර, බමරුන්විසින්; පරිචුම්බිත, සෙවුනාලද; පාදපඞ්කජො, පාපියුම්ඇති; පුථ්විචක්ක, පොළොවේ නැමැත් සක්හි; නාභිභූතස්ස, නැබතන්පත්; නාගො, ඇත්; චොදිතො, තුද කරනලද්දුයේ; තුද-ව්‍යථනෙ යන ධාතුයි. පුථවිනාභි, පෘථිවියගේ නාභිරූපයෙන් සිටි; රාජකරීසමත්තෙ ඨානෙ, රාජමානයෙන් කිරියක් පමණ තන්හි; සසකමසසුමත්තං, සාදළියක් පමණ; සබ්බබුද්ධවණ්ණිතො, හැම බුදුන්විසින් වනනලද්දුයේය; විද්ධංසිත, විධමනලද; සකලක්ලෙසඞ්කාරා, සියලු කෙලෙස් අඳුරු ඇති; සබ්බදසබලා, හැම බුදුහු; ආසීනා, යන තන්හි "ආස-උපවෙසනෙ" යන ධාතුයි. අචලාය, පොළොවැ; මෙදිනියා, පොළොවැ — සක්කාරභාති එහා සුන්දරො කාරො සක්කාරො—"යදි වා සච්චං" යන තන්හි වාශබ්ද සංශයෙහි වැවේ; පටිරවභරිත, ප්‍රතිරවයෙන් භරිතවූ; දසදිසාකුහරං, දශදිශාරන්ධ්‍ර ඇති; පටිසක්කිත්වා, පසුපස්සෙන් බැස; කෙසරීනඛපඤ්ජරෙත විය, කෙශරසිංහයන් නියපඤ්ජරෙන් මෙන්; කොඤ්චසකුණෙ විය, කොස්ලිහිණියකු සෙයින්: සුතබුද්ධා නාම, සර්වඥබුද්ධයන ප්‍රත්‍යෙකබුද්ධයන චතුස්සත්‍යබුද්ධයන ශ්‍රැතබුද්ධයන යන චතුර්විධබුද්ධයන් කෙරෙහි අපි ශ්‍රැතබුද්ධසම්හ; එහි සමතිස් පැරුම්පුරා සම්‍යක්සම්බොධියට ප්‍රාප්තවූවාහු සර්වඥබුද්ධයන, එයින් උනුකොට පුරා ස්වයම්භූභාවයට පත්තාහු ප්‍රත්‍යෙකබුද්ධයහ. එයිනුදු උනුකොට පුරා ක්ෂීණාශ්‍රවභාවයට පැමිණියාහු චතුස්සත්‍යබුද්ධයහ. බහුශ්‍රැතයෝ ශ්‍රැතබුද්ධයෝයි—විචිත්තවත්ථ, විසිතුරුපිළී; ආභරණ, පලඳනා; ගන්ධ, සිව්දෑගඳ; කුසුමදාම, මල්දම්; ධජපතාකං, "මූලෙ බද්ධිත්වා විස්සජ්ජො

ධජො තිරියං සබ්බා අප්පිතා පතාකා”යි ගත් ධජපතාකා ඇති; වස්සමාන, වස්නාලද; චන්දනචුණ්ණං, සඳුන්සුණු ඇති; වීණං,, වෙණ; වේණු, වංශය; මුරජනාද, මිහිඟුහඬින්; මනොහරං, අති මනොහරවූ; නච්චමාන, නටනලද; ලලිතයුවති, ලලිතවනිතාවන් විසින්; රමණීයං, රම්‍යවූ; මන්දරගිරිම්ව, මඳුරුගල් සෙයින්; විරොචමානං, දිලිහෙන; වෙදිකං, වේදිකාවලය; ඉන්දචාපකලාපකප්පං, දෙව්දුනුකලඹක් බඳු; සට්ඨි වාහසහස්සානි, සැටදහසක් වාහයන්;

එයින් වදාළහ-

“සට්ඨි වාහසහස්සානි පුප්ඵානං සන්නිපාතයි
පූජෙසි රාජා කාලිඞ්ගො බොධිමණ්ඩවරුත්තමෙ”—යි.

විමලලොචනො, නිර්මලවූ ලොචන යුගළවත් ඇතියේ, තිවිධ මහාවාරෙහි, එකි එකි සත්‍යයෙහි සත්‍යඥාන කෘත්‍යඥාන කෘතඥාන විසින් නැඟෙන තුන්තුන් මහාවාරයෙනුදු; පඤ්චදසකොට්ඨාසෙහි, සච්චාදි*සභාගවිසභාගපය්‍යීනතවූ පසළොස් කොටසිනිදු; සට්ඨියා ච නයසහස්සෙහි, විජම්අටුවාවෙහි දක්වනලද සැටදහසක් නයිනුදු; දුද්දසත්තා ගම්භීරානි, දුඃඛසමුදය දෙසත්‍යයෝ උත්පත්තිවිසින් ප්‍රකට වූවද ලක්ෂණප්‍රතිවෙධවිසින් දුර්දෘශ්‍ය වනබැවින් ගම්භීරයහ; ගම්භීරත්තා දුද්දසානි, නිරොධමාර්ගදෙසත්‍යයෝ භවාග්‍රග්‍රහණයට හස්තප්‍රසාරණ සෙයින් අවීචිපෘෂ්ඨියට පාදප්‍රසාරණ සෙයින් ස්වභාවයෙන් ගම්භිර වනබැවින් දුර්දෘශ්‍යයෝයි.

“පකාසෙත්වා කරවීකරුදමඤ්ජුනා කණ්ණසුඛෙන පණ්ඩිතජනහදයානං අමතාභිසෙකසදිසෙන බ්‍රහ්මස්සරෙන පකාසෙත්වා”,—

සුරනර, දෙව්මිනිසුන්ට; විම්භාපනීයං, විස්මය ජනවනු වූ; සබ්බඤ්ඤු, සතරාම්රලොකයෙහි; කූටං, මඩුළු—

ඉති මෙසේ උක්තප්‍රකාරයෙන්; වරධී, උතුම් නුවණ ඇති; මහිතො, තුන්ලෝවැසියන්විසින් පුදනලද; මුනිරාජසුතො, මුනිරජහු පුත්; ඵලසම්භව, ඵලයෙන් උද්භූතවූ; බොධිවරං, මහබොයක්; ජෙතවනෙ, දෙව්රම්වෙහෙර; සුනිධාය, මනාකොට පිහිටුවා; මහං, පුද; විධාය, කරවා; මුනිනා, බුදුරජහුවිසින්; කතලොකහිතොති, කරනලද ලෝවැඩ ඇතියේයයි; ථුතො, සතුත වී; වනනලද ගුණ ඇතියේයැ යුසේයි.

ආ න න් ද බො ධි ක ථා.

—+—

* “පච්චාදි”

# දසබලපරිනිබ්බානකථා.

චතුසු වෙසාරජ්ජෙසු විසාරදො චතුවෙසාරජ්ජවිසාරදො, දස බලානි ධාරෙතීති දසබලධරො, ආසභණ්ඨානං නාම සෙට්ඨානං උත්තමට්ඨානං තස්මිං තිට්ඨතීති ආසභණ්ඨානට්ඨායී, සීහනාදං සෙට්ඨනාදං අභීතනාදං අප්පටිනාදං නදතීති සීහනාදනාදී, සබ්බෙ ච තෙ සත්තා චෙති සබ්බසත්තා තෙසං උත්තමො සබ්බසත්තුත්තමො, තෙනාහ භගවා. එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අදුතියො අසහායො අප්පටිමො අප්පටිසමො අප්පටිභාගො අප්පටිපුග්ගලො අසමො අසමසමො දිපදානං අග්ගො කතමො එකපුග්ගලො තථාගතො අරහං සම්මාසම්බුද්ධොති— ධම්මස්මිං ඉස්සරො ධම්මිස්සරො, ධම්මෙ රාජා ධම්මරාජා, ධම්මස්ස අධිපති ධම්මාධිපති, ධම්මො එව දීපො ධම්මදීපො—

නීලපීතලොහිතාදි, නීලපීතලොහිතාවදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වරය යන; විචිත්තවණ්ණ, විසිතුරුවර්ණ ඇති; ව්‍යාමප්පභාපරික්ඛිත්ත විලාසො, අනාභොගවාහිවූ ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් පරික්ෂිප්තවූ විලාස ඇතියේ; අත්තනොසිරිවිභවෙන, තමාගේ ශොභාවිභූතීන්— එත්ථ සිරීති බුද්ධිපඤ්ඤානං අධිවචනං, අථවා පුඤ්ඤනිබ්බත්තා සරීර සොභග්ගාදිසම්පත්ති කතපුඤ්ඤානං නිස්සයාති කතපුඤ්ඤෙහි වා නිස්සීයතීති සිරීති වුච්චති—“ශ්‍රිඤ් සෙවායාම්”යන ධාතුයි. ලොකං එකාලොකං කුරුමානො, අවකාශලොකය රශ්මිකදම්බයෙන් හා සත්වලොකය ධර්මප්‍රදීපයෙන් එකාලොක කරමුයේ; මහාකස්සපාදීනමත්ථාය, කස්සපසංයුත්තයෙහිද එතදග්‍රපාලිවර්ණනායෙහිද දක්වනලද මහසුප්වහතෙරුන් ආදි කොට ඇති විනෙයජනයන් සඳහා; අඞ්ගුලිමාලාලවකාදීනමත්ථාය, මැදුම්සඟියෑ අඞ්ගුලිමාලසූත්‍රයෙහි දක්වනලද අඟුල්මල් මහතෙරුන් හා යක්‍ෂසංයුක්තයෙහිද සූත්‍ර නිපාතයෙහිද දක්වනලද අළව්යක්ආදීන් සඳහා; පුක්කුසාතිප්පභුතීනමත්ථාය,මැදුම්සඟියෑ ධාතුවිභඞ්ගසූත්‍රයෙහි දක්වනලද පුක්කුසාති රාජාදීන් සඳහා; මහාකප්පිනප්පභුතීනමත්ථාය, ධම්මපදයෑ සවන වගදඑතදග්‍රපාලිවර්ණනායෙහිදු දක්වනලද මහාකප්පින රාජාදීන් සඳහා; ධනියාදීනමත්ථාය, සූත්‍රනිපාතයෙහි දක්වනලද ධනිය ගොපාලකාදීන් සඳහා; චූලොදරාදීනමත්ථාය, මහාවංශයෙහි දක්වනලද චූලොදරාදි නාගරාජයන් සඳහා; මාතලිදෙවපුත්තාදීනමත්ථාය, ධම්මපදයෙහි තුදුස්වන වග දක්වනලද මාතලිදිව්‍යපුත්‍රාදීන් සඳහා; බකබ්‍රහ්මාදීනමත්ථාය, බ්‍රහ්මසංයුක්තයෙහි දක්වනලද බක

බ්‍රහ්මාදීන් සඳහා; නිබඩං, හැමවේලෙහි; තුරිතචාරිකං, ශීඝ්‍රවූ චාරිකා; 'කදාචි'යනු 'අතුරිතචාරිකං' යනු හා සබඳ—සාරිපුත්ත මොග්ගල්ලානාදීනි, සැරියුත් මහමුගලන් මහසුප් අනුරුද් ආදී, ඡළභිඤ්ඤෙහි, ලෞකිකපඤ්චාභිඤ්ඤා ආශ්‍රවක්ෂයඥානය යන ෂඩභිඥාඇති; මහිද්ධිකෙහි, "මහන්තා ඉද්ධියො යෙසං තෙ මහිද්ධිකා"යි ගත් මහත් සෘද්ධිඇති; මහාසාවකෙහි, කප් ලක්ෂයක් පිරූ පැරුම්ඇති බුදුන් විසින් වදාරනලද තනතුරු ඇති පන්සිය පන්සිය භික්ෂුපරිවාරඇති අසීති මහාශ්‍රාවකයන්විසින්; මහාසාවකෙහි යනු සාමාන්‍යනිර්දේශවතබැවින් ගුණයෙන් මහත් සෙසු ශ්‍රාවකයනුදු කියනු.

සුපණ්ණරාජා, ශොභනවූ පර්ණයන්ඇතිවතබැවින් සුපර්ණනම්ලද ගුරුළු රජහුවිසින්; දණ්ඩදීපන්කර, මිණිදඬුවැට රැසක් හුගේ; මජ්ඣගතො, මධ්‍යවර්තිවූ; පජ්ජලිතදීපරුක්ඛො විය, දිලිහෙන පහන්රුකක්හු සෙයින්; තිසත, තුන්සියයක් යොදුන්; ජසත, සත්සියයක් යොදුන්; නවසසතයොජන, නවසියයක් යොදුන්; ආවට්ටෙසු, අවෘත්තඇති වටඇති; අනොනමජ්ඣිමමහාමණ්ඩලෙසු, අනොනාමණ්ඩලයෙහිද මධ්‍යමමණ්ඩලයෙහිද මහාමණ්ඩලයෙහිද; යථාසඞ්ඛ්‍යයෙන් යොදනු.

අතුරිතචාරිකා, චරන්තො, ගමනාගමනයට අසමර්ථවූ ජීර්ණාතුරයන්කෙරෙහි අනුකම්පායෙන් අතුරිතචාරිකා කරනුයේ; වෙනෙය්‍යබන්ධවානං, විනෙයජනනම්වූ වන්ධබන්ධුනට; උද්ඝටිතඥාදිත්‍රිවිධපුද්ගලයනටයැ යුසේයි; පදපරමානං, පදප්‍රධානයනට; ඒ ජන්මයෙහි අධිගම නැතියනටයැ යූසේයි; චතුසච්චපානං, සිව්සස් නම්වූ අමාපැන්; එයින් කීහ.

"චතුසච්චකථා පණ්ඩිතානං පියො හොති විස්සසතම්පි සුණන්තානං තිත්තිං න ගච්ඡති"යි.

තොසෙන්තො, තුස්වනුයේ; එයින් කීහ.

"හදයානි යථා ලොකෙ-සඩාතං බුඩරූපකායෙන

තප්පෙනති පණ්ඩිතානං-තථෙනාඩිකං ධම්මකායෙන"යි.

රූපප්පසන්නානං, රූපයෙන් ප්‍රසන්නවූ; රූපප්පමාණානං, රූපය ප්‍රමාණ කොටඇති ජනයන්; වණ්ණසිරියා, ලක්ෂණයෙන් බබිතවූ අනුව්‍යඤ්ජනයෙන් විචිත්‍රවූ සමුජ්ජ්වලිත කෙතුමාලාඇති ව්‍යාමප්‍රභායෙන් පරික්ෂිප්තවූ ලොකයහට අලඞ්කාරයක් සෙයින් උපන් වර්ණශොභායෙන්; සන්තාපෙන්තො යනු හා සබඳ-ඝොසප්පසන්නා ඝොෂයෙන් ප්‍රසන්නවූ; ඝොසප්පමාණානං, ඝොෂ ප්‍රමාණකොට ඇති ජනයන්; සද්දසිරියා, අෂ්ටාඞ්ගසමන්විතවූ කරවීකමධුර

නිඝෝෂ ඇති බ්‍රහ්මස්වරයෙන්; ලූඛප්පසන්නානං, රූක්ෂප්‍රතිපත්ති ප්‍රසන්නවූ; ලූඛප්පමාණානං, රූක්ෂප්‍රතිපත්ති ප්‍රමාණ කොටඇති ජන සත්; අලජ්ජිකාදි තපසිරියා, පාත්‍රරූක්ෂතා චීවරරූක්ෂතා දුෂ්කර ක්‍රියාරූක්ෂතා අල්පේච්ඡතාදි තපශ්ශෝභාවෙන්; ධම්මප්පසන්නානං, ධර්මයෙන් ප්‍රසන්නවූ; ධම්මප්පමාණානං, ධර්මය ප්‍රමාණ කොටඇති ජන යන්; මහාවජිරඤාණාදී ගුණසිරියා, මහාවජ්‍රඥානාදි ගුණවිභූතීන්; සත්තතිංසවිධ, “චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො”යන සත්තිස්වැදෑරුම් ඇති; බොධිපක්ඛිය රතනවස්සං, බෝපැක්දම් නමැති රුවන්වැසි; අනඤ්ඤසාධාරණං, අනුන් හා අසාධාරණවූ; පරිපක්කඤාණේ, පරිපක්වවූ ඥානඇති; තික්ඛින්ද්‍රියෙ, තීක්ෂණවූ ඉන්ද්‍රියයන්ඇති; අපරිපක්කඤාණානං, අපරිපක්වවූ ඥානඇති; මුදින්ද්‍රියානං, මෘදුවූ ඉන්ද්‍රියයන්ඇති; අවිදිතසච්චානං, අවිදිතවූ චතුස්සත්‍යයන් ඇති සත්වයන්ට; මොහන්ධකාර, අවිද්‍යා නමැති අන්ධකාරය; විධමනාය, විධ්වංසනය කරන්නට; ධම්මප්පදීපං, දහම් නමැති වැටුප්; පජ්ජාලෙත්වා යනු හා සබ්ද—කුසලධම්මවදනෙ, කුසල්ධර්මනමැති මුවවන්හි; අකුසලතිලකං, අකුසල්නමැති ලප්; සොධනාය, සෝධනයසඳහා; ධම්මාදාසං, ධර්මනමැති ආදර්ශතලය; යම්සේ නගරවාරයෙහි තුබූ සර්වකායික ආදර්ශතලයෙහි චාතුර්වර්ණයෝම තමන් ඡායා දැක අවද්‍ය පියා නිර්දෝෂ වෙද්ද එසෙසිත්ම ශික්ෂාකාමී කුලපුත්‍රයෝ කුශලභූෂණයෙන් භූෂිත වියපිවූවාහු සර්වකායික ආදර්ශතලයක් බඳු ධර්මදෙශනා දැක හේයාප්‍රතිපත්ති වර්ජිතකොට උපාදෙයප්‍රතිපත්ති පුරා ජාතිජරාමරණයෙන් මිදෙත්,

කිලෙසව්‍යාධි, කෙලෙස් නමැති රොග; විධංසනාය, නසන්නට; විවිධං දුක්ඛං අදධාතීති ව්‍යාධි-ධම්මොසධිච, දහම්නමැති ඖෂධය; අනාගතානං, අසම්ප්‍රාප්තවූ; සත්තානං, සතුන් සඳහා; කරං, අත්ලෙලකුදු; චරණ, පත්ලෙලකුදු; සරීර, දේහයෙකුදු; සම්මුඛං, පහරතාලද; සාඛාපාසාණපලාලමත්තම්පි, ශාඛාමාත්‍රයකුදු පාෂාණමාත්‍රයකුදු පලාලමාත්‍රයකුදු; යථාසඞ්ඛ්‍යයෙන් යොදනු.

සබ්බබුද්ධකිච්චං නිට්ඨාපෙත්වා, හවුරුදු ලක්ෂයක්ට අනු ඇතිකල උපන් බුදුන් දෙසනතාක් දහම් හැම දෙසා විනෙය කළ තාක් සතන් හැම විනය කොට සර්වබුද්ධකෘත්‍ය නිමවා; සකලලොකගතා; සකලලොකයෙහි පැතිර සිටි; තිමිරනිකරං, අඳුරුරැස්; අනාගාරෙ යමකසාලානං, සුවලසල්රුක් අතුරෙහි: එක්සල්රුකකට ඉස ලා එක්සල් රුකකට පා ලා පෑනවූ සිරියහන් මතුයෙහි.

මෙතෙක් සලකුණු කුමට කීහ යත් ?

ඒ සථානය සැදහැඇති කුලපුත්‍රයන්විසින් දක්නාදුතුබැවින්ද සංවෙග කටයුතුබැව්දදු කීහු—අනුපාදිසෙසාය නිබ්බාන ධාතුයා පරිනිබ්බායි, සොපධිශෙෂ නිරුපධිශෙෂ ලක්‍ෂණ ද්විවිධ නිර්‍වාණ ධාතූන්කෙරෙහි නිරුපධිශෙෂ නිර්‍වාණ ධාතුවිසින් පිරිනිවියෝ.

කුම යුතැත යත් ? පන්සාලිස් හවුරුද්දෙහි යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වූ බුදුන්ගේ ඥානමහිමයද දෙවාවතරණාදිකාලයෙහි පැවති යසශ්‍රීමයද පාදතලයෙහි චක්‍රරත්නාදි රූපකායශෝභාද අන්තර්හිත විය යුසේයි.

එයින් කීහ.

"සා ච ඉද්ධි සො ච යසො-තානි ච පාදෙසු චක්කරතනානි
සබ්බං සමන්තරහිතං-නනු රිත්තා සබ්බසංඛාරා"යි.

ඉති, මෙසේ උක්තක්‍රමයෙන්; විහිත, විධානකරනලද; විචිත්‍රා, අනෙකප්‍රකාරවූ; අසෙසලොකසඤ්චාරො, නිශ්ශෙෂ ලොකාධිපත්‍යා ඇති; තිභව, තුන්ලොවට; පති, ස්වාමිවූ; මහිද්ධි, මහත්වූ සෘද්ධි ඇති; ධම්මරාජ, ධර්මස්වාමිවූ; මුනින්දො, බුදුරජ; රවිසත, සූර්ය්‍යශත යන් සූර්ය්‍යසහස්‍රයන්ගේ; ජුති, රශ්මියට වැඩි; සොභො, බැබලීම් ඇතියේ; සොපි, හෙද; විනාසං, විනාශයට; යාතො, ගියේ; අකරුණං, කරුණා නැති; තං මරණං, ඒ මරණ; ලොකෙ, ත්‍රිභුවනයෙහි; කං හි, කා නම්; ජහෙය්‍ය, පියනුය.

## දසබලපරිනිබ්බානකථා.

මගධාධිපස්ස, මගධදෙශවාසීනට අධිපතිවූ; අජාතසත්තුනරින්දස්ස, මච්ඡිසොවට උපන් දෙළින් අජාතකාලයෙහිම පියරජහුට ශත්‍රු වීහුයි අජාතශත්‍රු නම් ලද නරපතිහුගේ; ඨානං, හැරුණු; පාවචනං, ප්‍රවචන ධර්මවිනය; අධන්යං අස්ස, අධ්‍රැවතිය වේද; විරස්ථායි වේද යුසේයි.

නිබ්බසනානීති නිග්ගතවසනකිච්චානි පරිභොගජිණ්ණානීති වුත්තං හොති — පඨමජ්ඣානනනි එනි ආරම්මණවිජානනලෙන නීවරණපච්චත්ථිකානං ඣාපනට්ඨෙන ඣානං-මෙධ්‍ය-චින්තායාම්, දහ-භස්මීකරණෙ යන ධාතුයි—නවානුපුබ්බවිහාර නම් රූපාරූප අෂ්ටසමාපත්තිය සංඥවෙදයිතනිරොධයි. චන්දූපමපටිපදාය පසංසිතො, "චන්දූපමො භික්ඛවෙ කස්සපො කුලානි උපසංකමති" යනාදීන් බුදුන්විසින් ප්‍රශස්තයෙම්—ආනණ්‍යං, අනෘණභාවයෙන්; නිදරදි බැවෙක යුසේයි.

සක, තමාගේ; කච්ච, කච්ච හා; ඉස්සරියානුප්පදානෙන, ඓශ්වර්‍ය්‍යදානයෙන්; මඤ්ඤෙ, දනිමි; මන-ඤාණෙ යන ධාතුයි. දිප්පති, දීප්ත වේ; දීප-දිත්තියං යන ධාතුයි. අධම්මවාදිනො, අධර්‍මය ධර්‍මයයි දක්වීමෙන්ද ධර්‍මය අධර්‍මයයි දක්වීමෙන්ද අධර්‍මවාදි වූවාහු; ධම්මවාදිනො, ධර්‍මය ධර්‍මයයි දක්වීමෙන්ද අධර්‍මය අධර්‍මයයි දක්වීමෙන්ද ධර්‍මවාදිවූවාහු; "අවිනයවාදිනො විනයවාදිනො" යනුද එසේමැයි-- "උච්චිනතු"යන තන්හි චි-චයෙ යන ධාතුයි. සුතෙතනා * යනු සොපසර්‍ගැ කර්තෘයෙහි වැටේ. අසම්මුඛා පටිග්ගහීතං නාම නත්‍ථි, බුදුන් බුදුවූවිගස බෝමැඩ හිඳ ප්‍රීතිවේගයෙන් භාෂිත උදාන ගාථාවන් ගෙන දෙව්ලෙව්හි මිනිස්ලෙව්හි වැඩහිඳ දෙවියනට බඹනට මිනිස්නට දෙසූතාක් දහම් හැම ඔව්නට දෙසූවනබැවින් ශ්‍රාවකභාෂිත උදානගාථාවන් ගෙන සූත්‍රයෙහි ධර්‍මසඞ්ඛ්‍යා දෙදහස විනා අසම්මුඛයෙහි පිළිගත් දෙයෙක් නම් නැත්. විස්සජ්ජෙථ, ප්‍රධානපුත්‍රය බුදුනට කළ මෛත්‍රෙය මුනු කරන්නේය මොහුවිසින් මම දෘෂ්ටධර්‍මසුඛානුභවයට අවසර ලදිම්යි බලවත් විශ්වාස් කළ වනබැවින් විශ්‍රබ්ධයෙමි; අසෙඛපටිසම්භිදප්පත්තෙන, රහත් පිළිසිඹියාපත්; සෙඛපටිසම්භිදප්පත්තා, සෝවාන්මග සිට පිළිසිඹියාපත්; පරියත්තා, පර්‍ය්‍යාප්තයැ ධරනලද; අනුසාවෙන්තා, අප කරන තනවූරැකමට සිසී පිළිපන් පුහුලෙක් සහ මැද වැද උතෙකාවනා කරනුයේ වීනම් නොසෙදෙයි යන සිතින් සෙස්සන් එනුවර වශෝපගමන නොකරන්නේයයි තුන්යශ්‍රන් අප්වා—අනිච්චතාපටිසංයුත්තායාති එහි අනිච්චතාති කථාය ආදීනතනාය අනිච්චං තස්ස භාවො අනිච්චතා- අසුසුම්බොධපකාර, අනෙකානෙක උපකාරයෙන්; සජ්ජිත, දනවනලද; චිත්තාමණ්ඩෙවා, හෘදයමාර්දව ඇතියේ; සීහසෙය්‍යං කප්පසකාලො, සිංහරාජයක්නු සෙයින් දක්ෂිණ පාර්ශ්වයෙන් ශය්‍යාව කරතකලැ; සංවෙජිතො, සංවෙග ජනවනලදුයේ; සන්නිහිත්ඩා, භචි-ප්‍රතිබන්ධෙ යන ධාතුයි-ඛණ්ඩ, කැඩුණු නැනව; ඵුල්ල, පැළුණු තැනව; පටිසඞ්ඛරණං, සංස්කාරය; උපකඩ්ඪාය, උපකෘෂ්ටවූ; ආසන්නවූ; කෘෂ-ආකර්ෂණෙ † යන ධාතුයි — වස්සූපනායිකාය, වර්ෂෝපගමනයෙහි; භික්ඛුසඞ්ඝං, තමන් පිරිවර පන්සියක් සඟුන්; තිත්ථියවාදපරිමොචනත්ථං, ශ්‍රමණගෞතමයාගේ ශ්‍රාවකයෝ ඔහු ඇතිකලැ ප්‍රතිපත් කළහ දැන් හලහ යන තීර්ථකයන්ගේ අපවාද පරිමොචනය කරනු සඳහා; ඡඩ්ඩිත, පියනලද; පතිත; වැම්ගෙනලද; උක්කලාපං, කසල මිසුවූ; වෙභාරපබ්බතපස්සෙ. වෙභාර නම් පර්‍වතයාගේ පාර්ශ්වයෙහි; තයොද නම් ගුදයට ළුදුරු හැත්හි; සත්තපණ්ණිගුහාවාරෙ, ලෙනදොර සිවි රුක්හත්තන රුකකින් සප්තපර්ණී නම් ලද ගුහාවාරයෙහි; සුවිභත්තභිත්තිත්‍ථම්භසොපා

* "සුතනා"යනු පෙළපොතී. † "ආබඩ්ඪෙ" පොත්.

නං, සුවිභක්තවූ භිත්ති හා ස්තම්භ හා සොපාන ඇති; නානාවිධ මාලාකම්මලතාකම්මවිචිත්තං, නානාප්‍රකාරවූ මාලාකර්‍මයෙන් හා ලතාකර්‍මයෙන් විසිතුරුවූ; ලොකරාමණෙය්‍යකම්ව සම්පිණ්ඩිතං, ලොකයෙහිරම්‍යවස්තු තාක් රැස්වූ තැනක් බඳු; දඪ්ඪසාරමණ්ඩං, දශීනීයවූ සාරභූෂණ ඇති; මණ්ඩ-භූෂණෙ යන ධාතුයි.

විවිධ, නොයෙක්; කුසුමදාමඔලම්බිනක, පුෂ්පදාමාවලම්බිත; විතිශ්ශිලනන, නිශිරණය කරනවන්වූ; චාරු, මනොඥවූ; විතානං වියන් ඇතිකොට; රතනවිචිත්ත, රුවනින් විසිතුරුවූ; මණිකොට්ටිම තලම්ව ච; මිණිපිලක් සෙයින්ද; තං, ඒ මණ්ඩපය; නානාපුප්ඵොපහාරවිචිත්ත, නානාප්‍රකාරවූ පුෂ්පජාතියෙන් විසිතුරුවූ; සුපරිනිට්ඨිතභූමිකම්මං, සුපරිනිෂ්ඨිත භූමික්‍රියා ඇතිකොට; තෙන, ඒ හෙතුවින්; තෙ, තට; න යුත්තං, යුක්ත නොවේ; ආසවෙහි චිත්තං විමුත්තං, ආශ්‍රවයන් කෙරෙන් චිත්තය විමුක්ත වී; කාගියාසීත්.

එසින් වදළහ.

“එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො මහතො සංවෙගාය සංවත්තති මහතො අත්ථාය සංවත්තති මහතො යොගක්ඛෙමාය සංවත්තති ඤාණදස්සනපටිලාභාය සංවත්තති දිට්ඨධම්මසුඛවිහාරාය සංවත්තති විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති, කතමො එකධම්මො කායගතා සති”යි — සඤ්ඣාඝනප්පභං, සැඳෑවලාපැහැ ඇති; මණිවම්මවම්මිත, මණිවර්මයෙන් වර්මිතවූ; මණිකච්ච පෙරෙව්; මහානාගා විය, ගජෙන්ද්‍රයන් සෙයින්; යථාබුඩ්ඪං, මහලු පිළිවෙල නොඉක්ම; බාලාතපසම්ඵස්ස, බාලාතපස්පර්ශයෙන්; විකසිත, පුබුදු; රෙණු, මුවරඳින්; පිඤ්ජරගබ්භ, රන්වන් ගබ්ඇති; පදුමං විය, පියුමක් සෙයින්—“කං ධුරං කත්වා” යන තන්හි ධුර නම් ප්‍රධානකෘත්‍යයි. කා ප්‍රධාන කොට්න යුසේසි—නිදානම්පීති එත්ථ නිදෙතීති නිදානං කිං දෙසකදෙසනාපටිගාහකං—අම්බලට්ඨිකායං, අඹයට්යෙන්හි; තන්තිං, පාළි; සුඛුමඤාණගොචරං, සියුම් ඥානට විෂයවූ; සජ්ඣායමකංසු, ස්වාධ්‍යාය කොළෝ; සුෂ්ඨු අධ්‍යයන කළහ; මනාකොට ධරාගත්හ යුසේසි.

පෙය්‍යාලසඞ්ගහාදීනි එත්ථ පාතුමලං පෙය්‍යාලං පාතුං රක්ඛිතුං අලං සමත්ථනානි අණ්ණො-කුම සූතැන යත්? ආද්‍යන්ත දක්වා මනා කොට ස්‍යතලද ග්‍රන්ථ රක්නට සමර්ථවූයේය යුසේසි.

“සඞ්ගහප්පභෙදම වචනපෙත්වා” යන තන්හි වශබ්දයෙන් ත්‍රිවිධ පය්‍යාප්තිද ව්‍යවස්ථා කළ පරිදි සූචිතයි.

සජාතප්පමොදා, සජාතවූ පරිතොෂ ඇත්තී; උදකාවනිපරියන්තං කත්වා, දියපොළොව පය්‍යන්ත කොට —

පඨමසඞ්ගීතිකථා.

වජ්ජීනං පටිබාහනත්ථාය, වැදිරට වැසි රජනට ප්‍රතිබාහනය කරනු සඳහා; ගඞ්ගාය නදියා, ගඞ්ගා යමුනා සරභූ අචිරවතී මහී යන මේ පඤ්ච මහාගඞ්ගාවන් කෙරෙහි ප්‍රධානවූ ගඞ්ගානම් නදියගේ; සොතම්හිපට්ඨාවිදූරෙ, සොතාව නම් තීර්ථයට නුදුරුතැන්හි; උත්තම්භං, උතුම්බූ; තත්‍ථ වුත්තො අජාතසත්තුරාජා, බුදුන් පිරිනිවිසලූ මහාධාතුනිධාන කළ ඉක්බිත්තෙන් රජගහානුවර වැස පිළිගොස් එනුවර වසන අජාසත් රජ්ජුරුවෝ; තස්ස, ඒ රජහුගේ අපර භාගයෙහි; උදායිභද්දෙ, පැළලුප්නුවර රජවූ උදයභද්‍ර රජ්ජුරුවෝ; වජ්ජිපුත්තකා, වැදිරටවැසි මහණසන් දරුවෝ; පුච්ඡාපෙත්වා, “කප්පති සිඞ්ගිලොණකප්පො”යනාදීන් පුළුවුස්වා; විස්සජ්ජාපෙත්වා, “න කප්පති ආවුසො සිඞ්ගිලොණකප්පො”යනාදීන් විසර්ජනය කරවා; දසසහස්සමත්තා පාපභික්ඛූ, දසදහසක් මත් පාපභික්ෂූහු; අපහවාපහව, හලුහලු; වන්දකා විය, පිළිල්සෙයින් නිහටනිහටා, තෙළු තෙළු; අනලකලාපා විය, ගිනිකලඹ සෙයින්; තතො පරං, එයින් මත්තෙහි; ධම්සෝරජයේදැ ධූජේසි.

ගහිතභික්ඛුවෙසා, ගන්නාලද මහණ වෙස්ඇති—පාරං ගච්ඡන්තීති පාරගා, වෙදෙසු පාරගා වෙදපාරගා—අඤ්ඤතිත්ථියා, සස්නෙහි පිහිට නොලදින් ගිය අන්‍යතීර්ථකයෝ—“පුථුජ්ජනාලොකාතාති එත්ථ පුථූනං නානාප්පකාරකිලෙසානං ජනනාදීහි කාරණෙහි පුථුජ්ජනා, පුථූනං වා ගණනපථමතීතානං අරියධම්මපරම්මුඛානං නීචධම්මසමාචාරානං ජනානං අන්තොගධත්තාපි පුථුජ්ජනා, පුථු වා අයං විසුංයෙව සඞ්ඛංගතො විසංසට්ඨො සීලසුතාදිගුණයුත්තෙහි අරියෙහි ජනෙහීතිපි පුථුජ්ජනො—සහකාර ඵලාකාරං, මීඅඹපකක් බඳුවූ; කිම්පක්කමිව, කිම්පකක් සෙයින්; අධම්මං ධම්මලෙසෙන දස්සෙත්වා, අධර්මය ධර්මලෙශයෙන් දක්වා—“එතෙ ජ ආචරියවාදෙ සමුට්ඨාපෙසුං”යනු වෛතුල්‍යකයන් අන්ධකයන් අන්‍ය මහාසඞ්ඝිකයන් යන මේනුන් ආචාර්‍යකුලයන්ගේ මතාදීන් කෙරෙහිම අන්තර්භූතයෙන් කියත්.

ගගනගඞ්ගාජලප්පවාහො විය, ආකාශගඞ්ගාජලප්‍රවාහ සෙයින්; නිම්මලො, අකලුෂ වූයේ; ජාතිරඞ්ගමණී විය, දැරඟ මිණියක් සෙයින්; විසුද්ධො, පිරිසුදු වූයේ; පදුමදලෙහි, පද්මපත්‍ර හා; ජලබින්දු විය, ජලකණිකාවක් සෙයින්; නිකායන්තරෙහි, නිකායාන්තර වාසීන්ගේ දහම් හා; අසම්මිස්සො හුත්වා, අසම්මිශ්‍ර වැ; අමතරසප්පවාහී, අමෘතරසප්‍රවාහ ඇති; පුණ්ණචන්දො විය, පුන්සඳක්හු සෙයින්; එතාවතා, මෙතෙකින්; ‘දසසිතා’ යනු හා සබඳ.

දසසහස්සා, දසදහසක් මත්; සපාපභික්ඛූ, පාප සහිත භික්ෂූන්, නිබ්බුය, තෙරැ; බුත්දසවත්ථුමලා, නිර්බුතවූ දශවස්තුමල ඇති; තෙ, ඒ ඛීණාශ්‍රවයෝ; උජ්ඣිතමලා, උත්සෘෂ්ටවූ කෙලශමල ඇත්තාවූ; උජ්ඣ-උත්සර්ගේ යන ධාතුයි. සුනිම්මලයසො ත, නිර්මලවූ යශස් ඇති; සමෙත සඞ්ඝං, එස මහතෙරුන් හා සමඟ; සඞ්ගීතිං, ධර්මසඞ්ගායනා; අකංසු, කළහ. සා අපි, ඒ සඞ්ගීතිද; දස්සිතා, මාවිසින් දක්වන ලද.

## දුතියසඞ්ගීතිකථා.

---

කාලාසොකනරපති, කාලාශොකනම් නරපතිහුගේ; පුත්තාවො, පුත්‍රයෝ—පුබ්බෙ චොරා ගය තෙ චොරපුබ්බා—විඩූඩභසඞ්ගාමෙ, ධර්මපදයෙහි සතරවන වග දක්වනලද විඩූඩභනම් රජහුගේ සඞ්ග්‍රාමයෙහි; හරින්දකුලසම්භවො, රජකුලෙහි උපන්; චාණක්කවිප්පන, චාණක්කනම් බ්‍රාහමණයාවිසින්; සමුස්සාහිතො, ජනවනලද උත්සාහ ඇත්තේ; එකන්තපුත්තකානං, එකාන්තභූ අධිකවූ සියක් පුත්‍රයට; ජනකො අහොසි, පිය වී; අසොකතිස්සාභිධානානං, අසොකනම් තිස්සනම් අභිධාන ඇති; අවන්තිරට්ඨං, ප්‍රත්‍යන්ත දෙශයෙන් අවන්ත්ජනපදය; විඩූඩභභයාගතානං, විඩූඩභ භයින් ආගතවූ; සුරජ්ජුවත්තිබ්බිසෙසා, සුරවතිනාතිර්විශෙෂවූ; උජ්ජෙනි රාජධානියා, උදේනීනම් නුවර; මහින්දාභිධානං, මිහිඳුනම් අභිධාන ඇති; සකලලොකසිවංකරං, සකලලොකයහට ශාන්තකරවූ; සඞ්ඝමිත්තාභිධානං, සඞ්ඝමිත්‍රානම් අභිධාන ඇති; ලොකානන්දකරං, ලොකයහට ආනන්දකරවූ; මුඛපද්මවන, මූහුණු නමැති පියුම්වනය; අවලොකනසුඛං, අවලොකනයෙන් උපදනා සුඛය; පිතු, පිය රජහුගේ; චරණපරිචරියං, පාදපරිචයඝී; සුමිනාභිධානො, සුමනනම් අභිධාන ඇතියේ; අඩ්ඪනවුතිභාතිකා, අටානූ සහ බෑයනම; කෙසරිකිසොරනිකරපරිවුතො, කෙශරිකිශොරනිකරයන් පරිවෘත වූයේ; බඩවලාහකාදි, බඩවලාහයනම් මහායොධයා ආදි කොටැත්; සීහසමානපරක්කමො, සිංහයන් හා සමානවූ පරාක්‍රමඇති; රවිකිරණපරාමාස, රිවිරැස්පහසින්; විජ්ජුරිත, දිලිසෙන; විමලතලෙන, නිර්මලතලඇති; උදංගත, උඩිවිමුඛවූ; කුන්තලතාවතෙන, කුන්තානමැති ලතාවගයෙන්; සමුග්ගත, නැඟී; නීලුප්පලමුකුලවනගහනං, නිල්මහනෙල් කැකුළුවෙනෙන් ගහනවූ; මහාසරං විය, මහවිලක් බඳු; ගගනතලං, අහස්පියෙස්; කුරුමානාය, කරනුවූ; පාසීනවණ්ණෙහි, පෙපියන් හා සමාන වර්ණඇති, සුනිසිත බග්ගපට්ටෙහි, සුශ්‍රු නිශිත ඛඩ්ගපට්ටයන්විසින්; සිතමජ්ඣනාභික දිවසකරෙහි විය, මුදුනතාභි සිටි දිවසකරයහුයන් සෙයින්;

විජ්ජොතමානාය, දිලිසෙනුවූ; අච්චිමාලිනී, රැස් ඇති; සන්නිපතන්ති හි, අඩසවි පෙළෙන්; ඔසධීතාරාවලීහි විය, ඖෂධතාරුපෙළ සෙයින් - උස්සන්නප්පභා එතාය ධීයතීති ඔසධී, ඔසධානං වා අනුබලප්පදායිකත්තා ඔසධීති ලද්ධනාමා තාරකා යථා සමන්තතො ආලොකං කුරුමානා තිට්ඨති එවමෙවන්ති අත්ථො — (උස්සන්නප්පභා, අළුයම් පැහැ;) අපරිමිත, අපරිමාණවූ; ගජතුරගරථාය, ඇත් අස් රිය ඇති; චතුරඞ්ගිනියා, ගජාශ්වරථපදාතිලක්‍ෂණ චතුරඞ්ගනීසෙනායෙන්; අඤ්ඤමඤ්ඤසීහනාද, ඔවුනොවුන්ගේ සිංහනාදම්; සිංහනාදනම් අභිනන්දී. ඝනගජ්ජිතානි, මෙඝගර්ජිතාඇති; විවිධ, අනෙකප්‍රකාරවූ; පහරණප්පහාර, ආයුධයන්ගේ පහරින්; ගජකච්ච ජලිත, ඇත් කවචින් දුලූ; දහන, ගිනිම; විජ්ජුච්ඡටා, විදුලිය සළාසෙයින්; භාසුරානි, දිලිහෙන; ගම්භීරත්ථනිත, ගැඹුරු හඬ ඇති; චාපජලධරත්ථනිත, දුනුවෙලෙහෙන් බස්නා; සරධාරාසහස්සානි, ශරධාරාසහස්‍රයන්; කිංකිණිකජාල, රසුදැල්හි; ඣංකාරවිරාවිතා, ඣංකාරයෙන් විරාවනය කරනුවූ; මහාමෙඝාවරොධමුත්ත, මහාමෙඝයන්ගේ අවරොධයෙන් ආවරණයෙන් මුත්; නභතල නිම්මලං, ගගනතලයක් සෙයින්; නිර්මලවූ; නිසිතමුඛං, සුනිශිතශස්ත්‍රධාරාඇති; විවිධ රතනප්පභාභාසුර, අනෙකරත්නප්‍රභායෙන් දිලිහෙන; සීසකටිකං, ශීර්ෂකටිකාඇති; භිංසනරමණීයදස්සනං, භයානකදර්ශන හා රම්‍යදර්ශන ඇති; සත්තිවස්සව, අඩසවි වශීද; සංවට්ටසාගරජල, ප්‍රලයසාගරජලයෙහි; තරඞ්ගසඞ්ඝාතො විය, රළ රැසක් සෙයින්; අජ්ඣොත්ථරන්තො, අධ්‍යවස්තරණය කරනුයේ; උපගඤ්ඡි, උපගත වී; උජ්ජෙනිරාජා, අශොක මහරජ; සමරමහාඋස්සව, සඞ්ග්‍රාම නමැති මහාඋත්සවයෙහි; පමොද, පරිතොෂයෙන්; නිබ්භරො, නොහැම්තිහැකි වූයේ; යොධවික්කමදස්සන, යොධයන්ගේ වික්‍රමදර්ශනයෙහි; ලාලසො, බලවත් අභිලාෂ ඇතියේ; "ලාලසො" යන තැන්හි, ලෂ-කාන්තෞ යන ධාතුයි. සඞ්ඝුගනතායි — රිපුබල, සතුරුසෙනඟ නමැත්; ජලන්ධිමජ්ඣ, මුහුදුමැද; ඛගජාලාවලීල්හ, කඩු නමැති දළසිළින් අම්යතලද; වළභානලසදිසො, වඩවාමුඛයෙහි ගිනිබඳු වූයේ; අරාතිමථනං කත්වා, ශත්‍රුමථනය කොට; ජලමාතඞ්ගවසකෙරා විය, දිලියෙන කිරුළු සෙයින්; අත්ථංගතෙ, අස්තයට විනාශයට ගියකල්හි; යුවරාජරජනිකරෙ, යුවරද නමැති සඳුනු; රාජදූරක, රජකුමරු නමැති; තාරකානිකරං, තරුරැස්; අනන්තරධාපෙත්වා, අතුරුධන් කොට; කුසුමපුර, පුෂ්පපුර නමැති; සරසි, විල්හි;—කුසුමපුරය, පුෂ්පපුරය, යනු පාටලිපුත්‍රපුරයට නාමාන්තරයි— සුජනකමලවනං, සජ්ජන නමැති පද්මවනය; ගගන, අහස්හිඳු; මෙදිනී, පොළොවිහිදු; යොජන, යොදනක් තැනට; උග්ගත, නැඟෙනලද;

අවගත, බස්නාලද; තෙජදඝනසඤ්චයො, තෙජස් නමැති හිරුරැස් ඇතියේ; දෙවතානි, හිමවත් වැසි දෙවියන්විසින්; සවිදිනං, දවස දවස; උපණ්ඨමාන, එළවනලද; සොළසකලස, සොළොස්කළක්; අනොතත්තසලිල, අනොතත් පැන් හා; නාගලතාකලාපො, නාලිය දැහැටු කලඹ ඇතියේ; තථා, එසෙයින්; හිමවත්වැසි දෙවියන් විසින යුතේයි. ආනීත, එළවනලද; අගදාමලක, අමාඇඹුලු; හරීට ක, අමාඅරළු; සහකාරඵල, අමාඅඹ: විච්ඡරාග, නොයෙක් පැ ඇති; සාටක, කප්රුකින් උපන් සළු; කරපරාමසන, අත්පුස්නා; පීතවත්ථ, රත්වත් පිළි; ඡද්දන්තදහපානො, සදත්දහතළාපැන් ඇතියේ; නාගොපනීයමාන, නයින්විසින් එළවනලද; දිබ්බකුව ලය, දිව්මහනෙල්; විලෙපන, දිව්ගඳ; අඤ්ජන, දිව්අඳුන්; සුමන කුසුම්පටො, නුහුයා ගෙතූ සමන්මල්පට ඇතියේ; සුකාභිනීයමාන, ගිරවුන්විසින් එළවනලද; නවුතිවාහසහස්ස, අනූදහසක් වාහ; දහසර, දහතළාවිල; සයං, තමාවිසින්; ජාත, උපන්; සාලිමඤ්ජරී නිවහො, හැල්කරල් නිවහයන් ඇතියේ; උන්දූර, මීයන්විසින්; කත, කරනලද; නිත්තුස, තෝ නැති; අඛණ්ඩ, නොකඩවූ; තණ්ඩු ලො, සියලුරජකුලෙහි බතට සෑහෙන හැල්සාල් ඇතියේ; ගන්ධමක රන්දසීධු, ගත් කුසුම්මුවරඳ හා මල්මීඇති; මධුකරකුලකත, බමර කැල සියන්විසින් අවුදු ඕනාලද; මධුන්වහ, මීහිවදබමර; මහාන සො, මුළුතැන් ඇතියේ; අවජගණ, වලස්ගණයන්විසින්; පතන කූට, ගසනකුළුඇති; කම්මාරසාලො, කඹුරුහල් ඇතියේ; මධුර ප්‍රණීතවූ; මනොහර, සිත්ගන්නා; කරවීකසකුණරවපූරිත, කුරවී කෙවිල්ලන් හඬින් පුරනලද; අනෙතපුරො, අන්තඃපුර ඇතියේ; උපරතව්‍යාපාරතාය, නිවෘත්තව්‍යාපාර වනබැවින්; සමණබ්‍රාහ්මණ පයිරුපාසනං, ශ්‍රමණබ්‍රාහ්මණයන්ට පරිචයෂිා; නානාපාසණ්ඩවාසි නො, නන් නන් පාෂණ්ඩවාසීන්-පාසං ඔඩ්ඩෙතත්ති පාසණ්ඩා, සත්තානං චිතෙනසු දිඨිපාසං ඩ්පනත්ති අයෙථා.——සඞ්ගහාය, ගයි සඞිතවූ; යුවරාජභරියාය, සුමන නම් යුවරාජයාගේ භාර්‍යාවවිසින්; පාචීනවාරාවිදූරෙ, පාටලිපුත්‍රයෙහි ප්‍රාචීනවාරයට නුදුරුතැන්හි; සංසාරපරියනෙත, සංසාරයාගේ පර්‍යන්තයෙහි; පාචීනදිසාවිලා සිනී, පැදුම්දිග් නමැති විලාසිනියගේ; උදයාචලසිරසි, උදයගල් නමැති මුදුනෙහි; රත්තුප්පලසෙඛරෙ විය, රත්මහනෙල් කඩක් සෙයින්; අඩ්ඪදිවසකරෙ, අඞ්සූර්‍යයා; විරොචමානෙ, දිලිසෙනා කල්හි.

අභිවාදෙත්වාති දසනඛසමොධානසමුජ්ජලඤ්ජලිවිභූසිතෙන සිරසා සකතවචං වඤ්චිත්වා අභිවාදෙත්වා සුඛී භවාති එවං වචීභෙදං කාරෙත්වා——භාර, මූත්ගරින්; සිසිර, සිහිල්වූ; සරීරොපි, ශරීර

ඇතියේද; රිපුජන, සතුරුජනයන්ට; සන්තාපකාරී, සන්තාප කරනුයේ; නිම්මලප්පභොපි, නිර්මලවූ ශරීරපභා ඇතියේද; මලිනීකත, මලින කරනලද; අරාතිවණිතා, රිපුකාමිනීන්ගේ; මුඛකමලසොභා, මුඛපද්මශොභා ඇතියේ; නාගරජනනයනානි, නාගරජනයන්ගේ නයනයන්; දීඝ, දිග්වූ; පුථුල, පළල්වූ; නිච්චල, නිශ්චලවූ; නයනප්පභානං, නුවනමිණිකැල්මෙන්; ධුගඹතනං, වියදඬු පමිණික් පැප්; ධජයනං, බබුළුවනුවනු; දීඝා, පූර්වජන්මයෙහි සමව කළ පින්කමින් දක—යම් කෙනෙක් සමවූ ශ්‍රද්ධා හා සමවූ ශීල හා සමවූ ත්‍යාග හා සමවූ ප්‍රඥා ඇතියව්හුද ඔහු මෙලෙව්හිද පරලෙව්හිදු ඔවුනොවුන් දකිත්. එසින් වදාළහ නකුලයා මව්පියනට—

"අකඞ්ඛෙය්‍යුංචෙ ගහපතයො දිට්ඨෙව ධම්මෙ අඤ්ඤමඤ්ඤං පස්සිතුං අභිසම්පරායඤ්ච අඤ්ඤමඤ්ඤං පස්සිතුං උභොව අස්සු සමසද්ධා සමසීලා සමචාගා සමපඤ්ඤා"—යි.

සඤ්ජාතපෙමො, උපන් ප්‍රෙම ඇතියේ; වචනාදසෙ, වචන නමැති ආදර්ශතලයෙහි; මනොජලනධි, සිත් නමැති මහමුහුදුහි; සංවඩ්ඪිත, වඩනලද; සඬොසන්වහො, සැදහැ නමැති උදවහ ඇතියේ; පුබ්බභොජනානි, පූර්වයෙහි රජගෙයි කරනලද භොජන ඇති; තිත්ථියසට්ඨිසහස්සානි, තීර්ථකයන් සැටදහසක් දෙනා; භික්ඛුසට්ඨිසහස්සානං; භික්ෂූන් සැටදහසක් දෙනාට; සුවාහට, ශිරවුන් අළ; සාලිසම්පාදිතං; හැලින් සම්පාදනය කරනලද; දෙවතොපනීතං, දෙවියන්විසින් එළවනලද; භික්ඛුපරිවෙසං කාරෙන්තො, ශ්‍රද්ධායෙන් භික්ෂූන්ට පරිවෙෂ කරනුයේ.

එසින් වදාළහ—

"තීහි භික්ඛවෙ ඨානෙහි සද්ධො පසන්නො වෙදිතබ්බො කතමෙහි තීහි සීලවන්තානං දස්සනකාමො හොති සද්ධම්මං සොතුකාමො හොති විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති"—යි.

කප්පායුකං; කපකට ආයු ඇති, සමුස්සිතසෙතච්ඡත්තො, සමුත්සිතවූ ඡේසත් ඇති; සබ්බාලඞ්කාර, සර්වාභරණයෙන්; පතිමණ්ඩිතෙහි, විභූෂිතවූ; අනන්තඤාණස්ස, අනන්තවූ නුවණ ඇති; මහාපුරිසලක්ඛණානුබ්‍යඤ්ජනොපෙතං; මහාපුරුෂලක්ෂණයෙන් හා අනුව්‍යඤ්ජනයෙන් උපෙතවූ; නානාවිරාග, නොයෙක් පැහැඇති; විමල; නිර්මලවූ; රස්මිමාලා සමුජ්ජලං, රශ්මිමාලායෙන් දිලිහෙන; පීතිසුඛසමප්පිතො, පාළිටු පටන්ගෙන මුදුන් දක්වා මුදුනෙහි පටන්ගෙන පාළිටු දක්වා දෙපාශ්වයෙන් මධ්‍ය දක්වා මධ්‍යයෙන් දෙපාශ්ව දක්වා නිරන්තරයෙන් උපදනා ප්‍රීතිසුඛයෙන් සප්තාහයක් සන්තර්පිත වූයේ; අක්ඛපූජං කත්වා, ප්‍රීතිවිකසිත ලොචනයෙන් පූජාකොට; චෙතියපතිමණ්ඩිතානි, චෛත්‍යයෙන් විභූ

ෂිතවූ; සබ්බාලඞ්කාරභූසිතාය, සර්වාභරණයෙන් විභූෂිතවූ; සහොරොධාය, අවරොධයන් ඇතොවුරන් සහිතවූ-අවරුද්ධන ඉත්‍යවරොධඃ — ලොකප්පවරණපාටිහීරානුභාවෙන, ආලොකකසිණසමාපත්ති සමවැද රජ දක්වයි ඉටනලද ප්‍රාතිහාර්‍ය්‍යයාගේ ආනුභාවයෙන්; ජලනිධිපරියන්තං; සමුද්‍රය පර්‍ය්‍යන්ත කොටඇති; උළාරපීතිපාමොජ්ජෙන සමන්නාගතො, සංස්කාරවූ තීක්‍ෂණවූ විදර්ශනා හා පවත්නාකල සංස්කාරයන්ගේ භෙද දක්නා යොගාවචරයහට උපදනා සොම්නස් සෙයින් උදාර ප්‍රීතිප්‍රමොදයෙන් සමුපෙතවූයේ.

එයින් කීහ-

"සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො
අමානුසී රතී හොති සම්මා ධම්මං විපස්සතො—

යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං
ලභති පීතිපාමොජ්ජං අමතං තං විජානතං"—යි.

සාසනදායාදභාවං, ශාසනයෙහි දායාදභාගීබව; අග්ගිබ්‍රහ්මරාජකුමාරස්ස, අග්ගිබ්‍රහ්ම නම් රජකුමරහු; අනාගාරාභිරතං, අනාගාරයෙහි අභිරතවූ; අගාර නම් ගිහිගෙයයි. අනාගාර නම් ප්‍රව්‍රජ්‍යායි. නිග්‍රොධත්ථෙරස්ස දෙවසිකං සතසහස්සං, නිග්‍රොධ මහතෙරනට දවස්පතා ලක්‍ෂයක්; "විස්සජ්ජෙත්වා"යනු හා සබ්බ—භෙසජ්ජත්ථාය; 'සප්පි නවනීතං තෙලං මධුඵාණිතං' යනාදි බෙහෙත් සඳහා—

ඉති, මෙසෙයින්; අනප්පං, බොහෝවූ; විභවං, සම්පත්; සාධුපඤ්ඤා, සුන්දරවූ නුවණ ඇතියවුන්; ලභිත්වා, ලදින්; විගත. අපගතවූ; මදපමාදා, මද හා ප්‍රමාද දොෂ ඇතියවුන්; චත්තකාමප්පසඞ්ගා, පරිත්‍යක්තවූ කාමරාග ඇලුම් ඇතියවුන්; පුඤ්ඤකම්මාභිරාමා, පුණ්‍යකර්මයෙහි අභිරතවූවාහු; ජනඛෙදං, ජනයහට දුක්; අකරිය, නොකොට; විපුල, බොහෝවූ; විවිධ, නානාප්‍රකාරවූ; පුඤ්ඤං, පින්කම්; සුප්පසන්නා. රත්නත්‍රයෙහිදු කර්මඵලසම්බන්ධයෙහිදු පහන්සිත් ඇතියවුන්; කරොන්ති කෙරෙත්.

එයින් වදාළහ.

"තිණ්ණං භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති, කතමෙසං තිණ්ණං, සද්ධාය භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති, දෙය්‍යධම්මස්ස භික්ඛවෙ සම්මුඛීභාවා-පෙ-දක්ඛිණෙය්‍යානං භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති"—යි.

රාජානුගතජම්බුදීපවාසීහි, රජහු අනුගතවූ දඹදිව් වැසියන් විසින්; පරිත්තායුකො, පරිත්තවූ අත්‍යල්පවූ ආයුෂ ඇත්තේ; ‍හො, තොපට; පීතිසාගරෙ, ප්‍රීති නමැති මහාසමුද්‍රයෙහි; රසාතලං' රසාතලයට; සුජාතං, ශොභනවූ ජන්ම ඇති; මහද්ධනං, මහාධන ඇති; අපරිමිතයසොපෙතං, අපරිමාණ යශස් ඇති; සකල ලොක, මුළුලෙව්වැසියන්විසින්; පඤ්ඤාතං, ප්‍රකෂියෙන් ඥතවූ; මොග්ගලිකමලයොනිසුනු, මොග්ගලිනම් බ්‍රාහ්මණයා; කුලසීල රූපසම්පන්නාය, කුලයෙන් හා අචාරයෙන් හා රූපයෙන් පරිපූර්ණවූ; වෙදත්තයපාරගො, ත්‍රිවෙදයෙහි පාරයට ගියේ; මධුරෙ දුරවචනලාවණ්ණයුත්තො, මධුරවූ උදුරවූ වාග්ලාවණ්‍යයෙන් යුක්තවූයේ; කවිජනමනකමලවන, කවිජනයන්ගේ මන නමැති කමලවනය; විකසනකරො, ප්‍රබොධ කරනුවූ—

කවිහු සතරදෙනෙක් වෙත්. කිසේය යත්?

වදූලේ මැ නො.

"චත්තාරොමෙ භික්ඛවෙ කවී කතමෙ චත්තාරො චින්තාකවී සුතකවී අත්ථකවී පටිභානකවී ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො කවී"—යි.

වදතං වරො, වක්තෘජනයනට උතුම් වූයේ; තිසු වෙදෙසු, ඍග්වෙදය යජුර්වේදය සාමවෙදය යන වෙදත්‍රයෙහි—සහ නිඝණ්ඩු නා ච කෙටුභෙන ච සනිඝණ්ඩුකෙටුභා—එහි 'නිඝණ්ඩු'නම් නාම නිඝණ්ටුයෑ හෙද ත්‍රිකාණ්ඩ උත්පලිනී අමරමාලා සෙයින් වෘක්ෂාදීන්ගේ පර්‍ය්‍යායවචනප්‍රකාශක ශාස්ත්‍රයි–'කෙටුභ'නම් ක්‍රියාකල්ප විකල්පයෑ හේ දූත් ජයදෙව දණ්ඩි සෙයින් කවීත්වට උපකාරවූ ඡන්දොලක්ෂණ ජාතිලක්ෂණ වෘත්තලක්ෂණ වෛදර්භීමාර්ගී ගෞඩමාර්ගී ප්‍රකාශක ශාස්ත්‍රයි–සහ අක්ඛරප්පභෙදෙන සාක්ඛරප්පභෙදා—එහි අක්ෂරභෙදනම් ශික්ෂා හා නිරුක්තයි.

ඉතිහාසො පඤ්චමො එතෙසන්ති ඉතිහාසපඤ්චමා-එහි ඉතිහාස නම් අථර්වන්වෙදය සතරවනු කොටඇති "ඉතිහ ආස ඉතිහ ආස" යි සම්භවවචනයෙන් යුක්ත පුරාණ කථාය ක්‍ෂත්‍රියවිද්‍යායි.

යස්ස, යම් ක්ෂීණාශ්‍රවයක්හුගේ; චිත්තං, සිත්; උප්පජ්ජති, උත්පත්තික්ෂණයෙහි උපදිද්ද; න නිරුජ්ඣති, නිරොධක්ෂණයට නොගියේද; තස්ස චිත්තං, ඔහුගේ සිත්; නිරුජ්ඣිස්සති, භඞ්ගක්ෂණයෙහි නිරුද්ධවත්; නුප්පජ්ජිස්සති, චුතිත් උත්තරයෙහි නොඋපදිද; යස්ස වා පන චිත්තං, එම ක්ෂීණාශ්‍රවයාගේ චුති සිත; නිරුජ්ඣිස්සති, භඞ්ගක්ෂණයට පැමිණෙනලද; නුප්පජ්ජිස්සති, උත්පත්තික්ෂණ ඉකුම් වන

බැවින් වුතින් උත්තරයෙහි නුපදිද; තස්ස චිත්තං, ඔහු සිත්; උපප ජ්ජති, උත්පත්තික්ෂණයෙහි උපද්දි; න නිරුජ්ඣති, තත්ක්ෂණයෙහි නිරොධ නැතිවනබැවින් නිරොධ නොවේ; ඉති, මෙසෙයින්; පුච්ඡිත, පුළුවුස්නාලදද; චිත්තයමකපඤ්හො, චිත්තයමකයෙහි පැන ඇතියේ; තො, අපගේ-

සාඞ්කථාති එඤ අතෙථා කථියති එතායාති අඞ්කථා— උගගණ්හිත්වා, සකස්කොට ඉගෙන. එයින් වදාළහ-

"ඉධ භික්ඛවෙ භික්ඛු සක්කච්චං ධම්මං සුණාති සක්කච්චං ධම්මං පරියාපුණාති සක්කච්චං ධම්මං ධාරෙති සක්කච්චං ධතානං ධම්මානං අත්ථං උපපරික්ඛති සක්කච්චං අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජති ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මොසාය අනන්තරධානාය සංවත්තන්ති"ති.

දුතියසඞ්ගීතිකාරකාරොපිත, දෙවන ධම්සඟා කළ රාහත්විසින් සමාරොපිතවූ—කම්මට්ඨානං වඤ්ඤත්වා:ති එඤ මනොභූතො මම්ම ට්ඨානං කම්මට්ඨානං

පඤ්චවිමුත්ති, තදඞ්ග වික්ඛම්භන සමුච්ඡෙද පස්සද්ධි නිස්සරණ යන පඤ්චවිධ විමුක්තිම; පදුමසඤ්ඡනනං, උත්පල පද්ම පුණ්ඩරීක රාජීව ශතපත්‍රය යන පඤ්චපද්මයෙන් සඤ්ඡනනවූ; විපස්සනාතීර ලෙඛං, විදශීනා නමැති තීරලෙඛා ඇති; විපස්සක, ශුෂ්කවිදශීකයන අභිඥප්‍රාප්තයන ප්‍රකෘතිශ්‍රාවකයන මහාශ්‍රාවකයන ප්‍රත්‍යෙකබුද්ධයන සම්‍යක්සම්බුද්ධයන යන ෂඩ්විධ විදශීකයන්ම; හංසසංසෙවිතං, කෘෂ්ණහංසයන පාණ්ඩුහංසයන මනොශිලාවර්ණහංසයන ශ්වෙතහංසයන පාකහංසයන ධෘතරාෂ්ට්‍රහංසයන යන ෂට්ප්‍රකාර හංසයන්විසින් සංසෙවිතවූ.

මෙහි ශුෂ්කවිදශීකයනට ඔවුනොවුන්ගේ සම්භාරානුරූප වනබැවින් විදශීනාප්‍රකාර ඛද්‍යොතප්‍රභාසාදෘශ්‍ය වැ උපස්ථිත වෙයි. අභිඥප්‍රාප්තවූ ප්‍රකෘති ශ්‍රාවකයනට ප්‍රදීපප්‍රභාසාදෘශ්‍ය වැ උපස්ථිත වෙයි මහාශ්‍රාවකයනට උල්කාප්‍රභාසාදෘශ්‍ය වැ උපස්ථිත වෙයි. අග්‍ර ශ්‍රාවකයනට ඖෂධීතාරකාප්‍රභාසාදෘශ්‍ය වැ උපස්ථිත වෙයි. ප්‍රත්‍යෙක බුද්ධයනට චන්ද්‍රප්‍රභාසාදෘශ්‍ය වැ උපස්ථිත වෙයි. සම්‍යක්සම්බුද්ධයනට සහස්‍රරශ්මිප්‍රතිමණ්ඩිත ශරත්සූර්‍ය්‍යමණ්ඩලසාදෘශ්‍ය වැ උපස්ථිත වේ·

අඞ්අරියමග්ගහ, අට අරිමඟම්; සලිලසම්පුණ්ණං, වාරිධාරා යෙන් පරිපූර්ණවූ; නිබ්බානමහාසරං, නිවන් නමැති මහවිලට; කිලෙසමලචමලං, කෙලෙස් ලව නමැති මල; සරදසමය, සරා

කල්හි; පූර්ණචන්ද්‍ර විය, පුන්සඳහු සෙයින්; ජිනසාසනාකාසං, බුදුසසුන් නමැති ආකාශතලය; සුර, දෙවියන් විසිනුදු; අසුර, දානවයන් විසිනුදු; ගරුළ, සුපර්ණයන් විසිනුදු; විජ්ජාධර, සිද්ධපුරුෂයන් විසිනුදු; කින්නර, කිම්පුරුෂයන් විසිනුදු; නර, මනුෂ්‍යයන් විසිනුදු; උරග, නාගයන් විසිනුදු; බ්‍රහ්ම, පිතාමහබ්‍රහ්මයන් විසිනුදු; වන්දිත, වඳනාලද; පාදාරවින්දෙ, පාදපද්මයන් ඇතියේ; තිත්ථියගණකිණ්ණෙසු, තීර්ථකගණයන්විසින් ආකීර්ණකල්හි; තරුමූල, රුක්මුලෙහි; සමාසීනං, ප්‍රතිසංලයනයෙහි හුන්නාහු—

මෙහි 'ප්‍රතිසංලයන' නම් කවර යත්? කීයේ මැනො.

"නානාරම්මණතො පටිසංහරිත්වා කම්මට්ඨානභූතෙ එකස්මිංයෙව ආරම්මණෙ චිත්තස්ස සම්මදෙව ලයනං පටිසල්ලානං"—යි.

සමද, මදසහිතවූ; වනගජෙන, ඇඩැතක්හුවිසින්; සකුසුම, මල්සිය; සාලසාඛාය, සල්අත්තෙකින්; විකසිතපදුමානනෙසු, පිපි පියුම් නමැති මුහුණෙහි; කෙසරදසනෙහි, කෙසුරු නමැති දත්පෙතින්; හසනසරසිරිං, හඳුන්විල් සමුවට; උළාරවිභවෙන, උදාර සම්පත් ඇති; සසොකො, ශොකසහිතවූ; ධම්මාසොකො,

"චණ්ඩාසොකොති ඤායිත්ථ පුරෙ පාපෙන කම්මුනා
ධම්මාසොකොති ඤායිත්ථ පච්ඡා පුඤ්ඤෙන කම්මුනා"—යි

කියනලද ධර්මාශොක රජ—නත්ථි තෙ තත්ථ තං පාපං තෙ ත්‍යහං නත්ථි—භික්ඛූපදෙසෙන, භික්ෂූන්ගේ උපදෙශයෙන්; නො, අපට; මෙ, මට; වය්හං වා, අතවැටුනැලට හෝ; සිවිකං වා, සිවිගෙට හෝ; බ්‍රහ්මවිමානනිබ්බිසෙසාය, බඹවිමනක් බඳු; ගන්ධදාම, ගඳදමුදු; මාලාදාම, මල්දමුදු; මුත්තාලම්බිකං, මුතුලැලුදු; විනග්ගිලන්තාමිව, නිගරණය කරනලදවන්; සුවණ්ණ, රන්තරුයෙනුදු; මණි, මිණිතරුයෙනුදු; රජතතාරක, රිදීතරුයෙනුදු; ඛචිත, සමන්විතවූ; විතානං, වියන්; නානාපභාසමුදය, නන් නන් පැහැ විහිදුමෙන්; සමුජ්ජලිත, දිලිසෙන; සාණිපාකාරං, ජවනිකා; ඉඳු, මොළොක්වූ; සුඛුම, සියුම්වූ; වසන, පිළිඇති; ආසනෙ, අස්නෙහි; පසන්න, ප්‍රසන්නවූ; ගන්ධාගන්ධනාය, ගන්ධා නමැති අඞ්ගනාවන්විසින්; තරඞ්ග කරෙහි; රළ නමැති අතින්; ඵෙණවලිකුසුමෙහි, පෙණපෙළ නමැති මලින්; පූජ්‍යමානො විය, යි යොජනා. විත්ථාරක්ඛාය, සංවිධාන කරනලද රක්ෂාඇති; වසුධාධිපස්ස, මහීපතිහුගේ; "පටිබලො නු බො" යන තැන්හි නු යනු පරිවිතක්කයෙහි වැටේ.

එත්, මේ දෙපෙළහරයන් කෙරෙහි; කංසපාතියා, රන්පයෂ; උදකපුණ්ණාය, උදකයෙන් පරිපූර්ණවූ; තමෙතං, එම කාරණය: ධම්මරාජවචනෙන, ධර්මස්වාමිහුගේ වචනයෙන්; තිත්තිරජාතකච, චතුෂ්ක නිපාතයෙහි තිත්තිරජාතකයද; කම්මං, විභජ්ජා, කර්ම විභාග කොට; නීලාදිපඤ්චවණ්ණං, නීලාදිපඤ්චවර්ණ ඇති; කුසුම්පතිමණ්ඩිතෙ, පුෂ්පයෙන් විභූෂිතවූ; කුසුමගන්ධසුගන්ධෙ, පුෂ්පගන්ධයෙන් සුගන්ධවූ; ඨානවරෙන, උපස්ථානයට අයසුත් දෙදෙනකු ලදා; සභාසීනො; එකත්පස්ව හුන්නේ; සස්සතවාදිනො, ආත්මය නිත්‍යයයි සිතන්නාහු; සස්සතවාදීති ආහංසු, බුදුහු ශාශ්වතවාදීහයි කීහු; එකච්චසස්සතිකා, ඇතම්කෙනෙක් නිත්‍යයහ ඇතම්කෙනෙක් අනිත්‍යයහයි ගත්තාහු; අන්තානන්තිකා, ආත්ම අනන්ත ඇත්තේයයි නැත්තේයයි ගත්තාහු; අමරාවික්ඛෙපිකා; දිසෙහිදී අතින් නොහතහැකි අමරායයි කියනලද අඳන් සෙයින් තමන්ගේ ලබ්ධි පුළුවුත්කල අතික්දෙයක් කියා නොතිරවන්නාහු; අධිච්චසමුප්පන්නිකා, සියල්ලෝ කුශලාදි හෙතු නිසා නොඋපන්නෝයයි ගත්තාහු; සඤ්ඤීවාද, ආත්මය සංඥ ඇත්තෙයයි ගත්තාහු; අසඤ්ඤීවාද, ආත්මය සංඥ නැත්තේයයි ගත්තාහු; නෙවසඤ්ඤී නාසඤ්ඤීවාද, ආත්මය සංඥ ඇත්තෙයයිදු නැත්තේයයිදු ගත්තාහු; උච්ඡෙදවාද; මරණින් මතුයෙහි ආත්ම උච්ඡින්නවෙයි ගත්තාහු; දිට්ඨධම්මනිබ්බානවාද, ආකණ්ඨ දක්වා රුධිරපාන කලකලැ නිවෘත්තවන ජලූකයන් සෙයින් පඤ්චකාමගුණ අනුභව කලකලැ තෘෂ්ණා නිවෘත්ත වෙයි හෙම නිර්වාණයයි ගත්තාහු; දිට්ඨධම්මනිබ්බානවාදීති ආහංසු, බුදුහු දෘෂ්ටධර්මනිර්වාණවාදීහයි කීහු; උප්පබ්බාජෙත්වා, ගිහි කරවා; විභජ්ජවාදී, හැමධර්මයන් විභාග කොට කියන්නෙන් බුදුහු විභජ්ජවාදීනම් වෙත්; උපොසථං කත්වා, සමගපොහෝ කොට; පරප්පවාදං මද්දන්තො, පරයන්ගේ වාද මඩනේ; කථාවත්ථුප්පකරණං, බුදුන්විසින් දෙසනලද මාතෘකා ඇති කථාවස්තුප්‍රකරණය; භාසිත්වා, විස්තරකොට දක්වා.

සා, යම්සඞ්ගීතියක්; සට්ඨිභික්ඛුසහස්ස, සැටදහසක් තීවික නමැත්; නිසාගතන්තං, රාත්‍රිය සන්නිවිෂ්ටවූ; දුල්ලබිං, දුලබ නමැති; ඝොර,බහලවූ; තිමිරං, අඳුරු;සමං, මනාකොට; විනිහච්ච, විධමා; තිස්සත්ථෙරරචිතා, තිස්ස මහතෙර නමැති දිවසකරයාවිසින්; සඞ්ගීති, ධම්සභා නමැති; චාරු, මිනොඥවූ; නළිනී, විල්; විකාසං, ප්‍රබොධයට; ගමිතා. පමුණුවනලදද; සා අපි, ඒ සඞ්ගීතිදු; මෙ, මා විසින්; දස්සිතා, දක්වනලදු.

## තතියසඞ්ගීතිකථා.

---

ජනභමරගණස්ස, ජන නමැති බමරගණයහට; වසන්තවන සන්නිභෙ, වසත් උයන් බඳු; ලඞ්කාරට්ඨෙ, ලක්රට; නරනාරි, ස්ත්‍රී

පුරුෂ නමැති; හංසසමයස්ස, හංසරාශියට; කමලසරසජ්ජෙන, පියුම්විලක් බඳු; සීහපුරෙ; සිංහපුරයෙහි; සීහස්ස, සිංහයා; ලාත තතා; ආදෘත කලබැවින්; ගත් බැවින යුසේයි. ලා ආදානෙ යන ධාතුයි. ලබාභිධානස්ස, ලද නම් ඇති; කාලිඞ්ගචක්කවත්තිවංසජස්ස, කාලිඞ්ගචක්‍රවර්තිහුගේ වංශයෙහි ජාතවූ; සීහබාහුනරින්දස්ස, සිංහ බාහුනම් නරපතිහුගේ; විජයකුමාරො, විජයනම් කුමර; කෙසරි කිසොරකො විය, කෙශරසිංහපොතකයක්හු සෙයින්; වික්කමෙක රසො; වික්‍රම මැ එකරසකොට ප්‍රධානකොට ඇතියේ; සොධසත්ත සතපරිවාරො, සොධයත් සත්සියක්දෙනාගේ පිරිවර ඇතියේ; මුනිවරපරිනිබ්බානවාසරෙ, බුදුන්ගේ පරිනිර්වාණ දිවසයෙහි; උපප ලදත්ත, උපුල්දත් දෙව්රජහුවිසින්, දත්ත, දෙනලද; පරිත්ත සුත්තාභිසෙකතොය, පිරිත්හු හා අභිෂෙකතොය ඇති; පිරිත් දිය ඇති; පරිජනො, පරිජනයන් ඇති; සාරමෙයවෙසී, බැලිවෙස් ගත්; සිංසපානුගමනෙන, සිංසපානම් යකින්නියගේ අනුගමන යෙන්; ඇය අනුව ගිය ගමනින්; තම්බපණ්ණිසරසමොක්ඛණ, තම්බෙන්විලට බට; සොධසත්තසතං, සොධයත් සත්සියක්දෙනා; කුවෙණිභිධානං, කුවෙණිනම් අභිධානඇති; තරුමූලසමාසීනං, රුක්මුලෙක හින්නිය; සනනධපඤ්චායුධො, සන්නඩවූ පඤ්චායුධ ඇති යේ; ගම්භීරං, ගැඹුරු; අභිනව, අලුත්; ජලධරත්වහ; මෙඝමාලා වත්ගේ; නිනනාදං, හඬඇති; චාපඝොසං, ජීයාඝොෂා; යුගන්ත මෙඝවිගළිත, යුගත්වෙලෙහෙයෙන් ගුළු; නිඝාතපාතම්ව, අශනිපාතයක් සෙයින්; යුගත්වෙලෙහෙයෙන් ගිළිහුණු සෙණක් සෙ යිත යුසේයි.

ගීවාය පරිගත, ග්‍රීවායෙහි පැලඳගත්; නාරාචවලයෙන, අයො මයවූ නාරාචවලයයෙන්; ධවලජවනිකාවිතාන; ධවලවූ ජවනිකා විතානඇති; සයනෙ, යහන්හි, සිරීසවත්ථුනාම; ලෙකළතන්හි වූ සිරීෂවස්තුනම්; තත්‍ර ජෙඨයක්ඛස්ස, එහි මහාකාළසෙනනම් දෙට යක්‍ෂයහට; ලඞ්කාපුරාගීත, මෙලාඩුරෙහි ලක්දිව් නුවරින් අළ; යුවති, යක්‍ෂකන්‍යාවගේ; මඞ්ගලත්ථාය, විවාමගුල් සඳහා; සනනි පතිත, රැස්වූ; අසෙසයක්ඛරාසයො, සර්වයක්‍ෂසමූහයන්; ජලනිධි වෙලාපරියන්තං, මුහුදුවෙරළ පයර්‍යන්ත කොටඇති; ලඞ්කාතලං, ලක්දිව්තල; තම්බපණ්ණිනගරං, තම්බෙන් නුවර; සාගරගතික්ල න්ත, සාගරගතියෙන් කලානතාවූ; සොධසත්තසතෙහි, සොධයත් සත්සියක්දෙනාවිසින්, වසුධා, පෙළෙව්; අලම්බිත, එල්බතලද; පාණිතල, අතුල්ඇතිවූ; සමාසීනෙහි, හුන්නවුන්විසින්; තම්බභූමි, තඹබිම; රජසමාකිණ්ණ, රජසින් සමාකීර්ණවූ; පාණිං, අතුල්; තම්බපණ්ණීති, තාම්‍රපර්ණීයයි; ලඞ්දුතියාභිධානෙ, ලබ්ධවූ විතීය නාමඇති; අමිතතෙජා හුත්වා, අපරිමිත තෙජස් ඇතිවූ; රජ්ජ මකාසි, අටතිස් අවුරුද්දක් රජ කෙළේ.

භද්දකච්චානාභිධානිං, බද්දකසයින් අභිධාන ඇති; සාකියවිලාසිනිං, ශාක්‍යකන්‍යාව; ගහිතලඞ්කාභිසෙකො, ගත් ලඞ්කාභිෂෙක ඇති; සීහපුරාගතො, සිංහපුරයෙන් අල; සීහලවංසජො, සිංහල වංශයෙහි උපන්; විජයභාතු, විජයරජහුගේ මල්; සුමිත්තාතරිඥ, සුමිත්‍රරජහුගේ; වරමහෙසී, අගමෙහෙස්න; මද්දරාජධීතුපුත්තො, මද්‍රරජහු දුව පිත්; පණ්ඩුවාසදෙවරාජා, පඬුවස්දෙව්නුවර තිස්අවුරුද්දක් රජකම් කළ පඬුවස්දෙව් මහරජහු; අභයරාජා, විසිඅවුරුදු රජකළ අභාරජහුද; ගණිතිස්සරාජා, සතලොස් අවුරුදු රජකළ ගණිතිස්රජද; දීඝගාමණී, දිග්ගැමුණු නම්; සක්‍යපුත්තසම්භවො, ශාක්‍ය පුත්‍රයාට උපන්; සාධුජනාකර, සාධුජනයන්ට ආකරවූ; අනුරාධපුරමාපකො, අනුරාධපුර මැවූ; පණ්ඩුකාභයරාජා, සැත්තෑ අවුරුදු රජ කළ පඬුඅභාරජද; තස්සගගවිලාසිනී, ඔහුගේ අග මෙහෙස්න; සුවණ්ණපාලිසම්භූතො, රන්පෙල්ල දරුව උපන්; මහාමේඝවනුය්‍යානමාපකො, මහමෙවුනා උයන් මැවූ; මුටසිවරාජා, සැට අවුරුදු රජකළ මුටසිවරජද; ලඞ්කාධිපානං, ලඞ්කෙශ්වරයන්ගේ; අසම්භින්නඛත්තියවංසජො, අසම්භින්නවූ ක්ෂත්‍රියවංශයෙහි උපන්; පඨවීතලසම්භූත, පොළොවතෙලෙහි නැඟි; විවිධරතන, නාන්විසිතුරු මිණිරුවන් හා; අනෙකනිධිනිවහො, නොයෙක් නිධිකුම්භිඇති; වෙලාතටසමුග්ගත, වෙරළෙහි නැඟී; බහුවිධ. අනෙකප්‍රකාරවූ: ජලනිධිරතනො, මුහුදුරුවන් ඇතියේ; ඡාතපබ්බතපාදම්හි, තුරුපුරට අන්දෙසෙහි සොජනෙක්හි මතුයෙහි සැපව්වෙනෙහි; වෙළුගුම්බසඤ්ජාත, හුණගැබෙක්හි උපන්; රථපතොදප්පමාණ; රිය කෙවෙටු පමණ; පභස්සර, පැහැ විහිදුනා; රුචිර, සිත් ගන්නා ; විවිධ, නොයෙක් ප්‍රකාරවූ; ලතා කුසුම සකුණ, ලිය හා කුසුම් හා ලිහිණියන් ඇති; යට්ඨියො, තුන්සටක් ඇතියේ.

එහි එකෙක් ලියසටෙක එකෙක් මල්යටෙක එකෙක් ලිහිණියටෙකි- ලියයට ලතාවෝ ගතරන්මුවා වනබැවින් රන්වන්හ. ලෙලදිදී අතිමනොහර පැහැ දිසෙති. මල්යට දියෙහි ගොඩ පුප්නා නොයෙක් සටහන්ඇති නොයෙක් පැහැඇති කුසුම්හු කෙසුරු මුවරදින් හොබවමින් එවිගස පිපියවුන් සෙයින් දිසෙති. ලිහිණියට නන්විසිතුරු මුවන් හා ලිහිණියෝ දිවිඇතියවුන් සෙයින් දිසෙති. එයින් කීහ—

“තාසු එකා ලතායට්ඨි රජතාභා තහිං ලතා
සුවණ්ණවණ්ණා රුචිරා දිස්සන්තෙතිමනොරමා.
එකා කුසුමයට්ඨි තු කුසුමානි තහිං පන
නානාසණ්ඨානවණ්ණානි දිස්සන්තිඵුටානි ච.

එකා සකුණසඞ්ඝා තු තහිං පක්ඛිමිගා බහූ
නානා ච නානාවණ්ණා ච සජීවා විය දිස්සරෙ"—යි.

සාගරන්තවසමුග්ගත, සාගරන්තයෙන් නැඟි; වෙලෙළම්ඝර වැටි සෙසින් සිටි; ගජ, ඇතුන් වැනි; තුරඟ, අසුන් වැනි; රථ, රිය වැනි; ආමලක, ඇඹුලුපත් වැනි; කකුධඵල, කුඹුක්පත් වැනි; විළය, වළලු වැනි; අඞ්ගුලිවෙඨකාකාර, ඇඟිලිමුදු වැනි; මුත්තාඵලො, විය වී මුතු හා සමඟ අෂ්ටවිධ මුක්තාඵලයන් ඇතියේ.

නාමඞ්කිතන, නැමින්ම බිඳුනාලද; රිපුජනහදයො, රුපුජනයන්ගේ හෘදය ඇතියේ; භත්තිවච්ඡලාවනත, භක්තින් වත්සල වූ අවනතවූ; සදෙසපරදෙස, ස්වදෙශයෙහිදු පරදෙශයෙහිදු; අසෙස ජනසමූහො, නරවංශෙෂජනසමූහයන් ඇතියේ; අසොකරාජ, මුඹින් ඉඳුනීල් පියුම්රා වෙරළුම්ණි හා ලියකුසුම් ලිහිණිසව් ගෙන ගිය ඇඹැස්රුවන් රිවිකුමරනු මුළුදඹදිව අනාසෙනෙ විතතින් පිදූ ධම්මසෝරජනුවිසින්; දූජිත, අශෙෂරාජාභරණ හා අභිෂෙකොප කරණාදි ඇම්සිසන් යවා සක්විතිපෙරහරින් දෙවනලද; දුතියාභිසෙකො, විතීය රාජාභිෂෙක ඇතියේ; අපගතභයසොකසඞ්කං, අපගතවූ භය හා ශොක හා ශඞ්කා ඇති; අකලඞ්කං, කැලැල් නොවූ.

එරදු දවස සත්නට භය නොදෙති ශොක නොදෙති ශඞ්කා නොදෙති. එසින් ඒ ලඞ්කා අපගත භය ශොක ශඞ්කා වූව. සිංහල වංශ සම්භූතරජනට නිවාස වනබැවින් අකලඞ්කවූ; පරිපාලෙති, ඒ සත්පුරුෂ සර්වසස්‍යසම්පාදනය කරන මහාමෙඝයක් සෙයින් සත්නට වැඩ සඳහා රජකුලෙහි ඉපැද යථොක්තක්‍රමයෙන් ලඞ්කා පරිපාලනය කෙරේ.

එයින් වදාළහ.

"සෙය්‍යථාපි භික්ඛවෙ මහාමෙඝො සබ්බසස්සානි සම්පාදෙන්තො බහුනො ජනස්ස අත්ථාය හිතාය හොති එවමෙව ඛො භික්ඛවෙ සප්පුරිසො කුලෙ ජායමානො බහුනො ජනස්ස අත්ථාය හිතාය හොති මාතාපිතුන්නං -පෙ- පුත්තදාරදාසකම්මකරපොරිසස්ස මිත්තාමච්චානං සමණබ්‍රාහ්මණානං අත්ථාය හිතාය හොති"යි නිර්දිෂ්ට සත්පුරුෂයාසේ; දිස්වා, අනාගතාංශඥානයෙන් දැක; මජ්ඣන්තිකත්ථෙරං, මජ්ඣන්තික නම් රූක්ෂචීවරධර මහතෙරුන්; යොනකලොකං, යොනකදෙශවාසී ජනයන් කරා; අත්තපඤ්චමා, ප්‍රත්‍යන්තජනපදයෙහි උපසම්පත්කර්මයට පස්දෙනෙක් මැ පමණකයි. අත්මපඤ්චම වූවාහු.

උස්සාවසඞ්ඛාතො හිමො අස්ස අත්ථීති හිමවා තස්මිං හිමවති—අරවාලදහෙ, අරවාල නම් මහවිල්හි—කොසනති කො අසං—නො, අපගේ; කොධාභිභූතං, ක්‍රොධයෙන් අභිභූතවූ; හිංසනකානි, විහිංසිකාවන්; පහරණවුඩ්ඪියො, ආයුධවෂීාවන්; ඵරුසවචනෙහි තජ්ජනානං, පරුෂවචනයෙන් තර්ජනය කරනුවනුගේ පරුෂ වචන තබා අශනිඝොෂයෙහුදු ඔව්නට භය නැත්.

ඵසින් වදළහ:

“ද්වෙමෙ භික්ඛවෙ අසනියා ඵලන්තියා න සන්තසන්ති කතමෙ ද්වෙ භික්ඛු ච ඛීණාසවො සීහො ච මිගරාජා”—යි.

තං, ඒ නාරජනු; පණ්ඩකම්පි යක්ඛං, පණ්ඩකනම් යක්ෂයාද; හාරිතියා ච යක්ඛිනියා, හාරිතීනම් යක්ෂිණිය හා ද; ආසිවිසොපමසුත්තන්තං, සංයුත්සඟියැ සළසින්වග අසිවිසළුවම් සුතත්; දෙවදූතසුත්තන්තං, මැදුම්සඟියැ උපරිපනස දෙව්දූසුතත්; ධම්මචක්කං, “ධෙඨාම්ගතතානයෙ ඤාණං ධම්මචක්කන්ති” යුබැවින් තුන්මග තුන්පල; අනමතග්ගපරියායකථාය, සංයුත්සඟියැ අනමතගග සංයුත් දෙශනායෙන්; අග්ගික්ඛන්ධොපමසුත්තන්තකථාය, අඟුත්තර සඟියැ සත්තකනිපාතයෙහි ගිනිකඳඋවම්සුත් දෙස්නෙන්; මහානාරදකස්සපජාතකකථාය, මහනිපායෙහි මහානාරද කසුප්ජා දෙස්නෙන්; කාලකාරාමසුත්තන්තකථාය, කාලකාඅරම්සුත් දෙස්නෙන්; බ්‍රහ්මජාලසුත්තන්තකථාය, දික්සඟියැ සිල්කඳුවග බ්‍රහ්මජාල සුත්දෙස්නෙන්; අඩ්ඪතෙය්‍යානි සහස්සානි, අඩුසාර දහසුන්; තුන්දහස් පන්සියන් යුසේය. දියඩ්ඪසහස්සානි, අඩුදෙදහසුන්; යෙළ දහසුන් යුසේයි.

මහාදයස්ස, මහාකරුණාඇති; ජිනස්සාපි, බුදුහුදු, කඩ්ඪිතං, ආකර්ෂණවූ; පත්තං, පැමිණෙනලද; අමතං සුඛම්පි, නිවන්සුවද; විනාය, පියා; තෙ, එව්හු; ඒ ස්ථවිරයෝ; තහිං තහිං, තත්තදේශයෙහි; ලොකස්ස, ලොකයහට; හිතං, වැඩ; කරිංසු; කලහ; කො, කවරෙක්නම්; ලොකහිතෙ, ලොවැඩ; පමාදවා, ප්‍රමාද ඇතියේ; භවෙය්‍ය, වන්නේද.

අජ්ඣිට්ඨො, අධ්‍යෂණය කරනලදුයේ; මෙ. මට; කත්තිකමාසෙ, ඉල්මස; සඞ්ඝමිත්තාපුත්තා, සංමිත් තෙරණියන් පුතාණුවන්; පත්තඡළභිඤ්ඤ, පැමිණෙනලද ෂඩභිඥ ඇති; සුමනසාමණෙරෙනච, සමන්හෙරණපාණන් හා; රාජගහනගරපරිවත්තකෙ, රජගහා නුවරු අබියෙස්හි; දක්ඛිණාගිරිජනපදෙ, දකුණුගිරිනම් ජනපදයෙහි—රාජගහං පරිවාරෙත්වා ඨිතස්ස ගිරිනො දක්ඛිණදිසාභාගෙ ජනපදෙ අත්ථි තස්මිං—

වෙධිසනගරං, විදිසපුරයට; අත්තනො ජනෙත්තිං, තමන් මෑණියන්; වෙධිසම්හාදෙවිං, වෙදිස්දෙවි බිසවුන්; ජෙට්ඨමූලෙ, පොසොන්මස; පුණ්ණමදිවසෙ, පෞර්ණමාසිදිනයෙහි; භණ්ඩුකාභිධානෙන, භණ්ඩුකනම් අභිධානඇති; පබ්බජ්ජාභිලාසිනා, ප්‍රව්‍රජ්‍යායෙහි අභිලාෂඇති; වෙධිසම්හාදෙවී, වෙදෙස්දෙවි බිසවුන්; භගිනිධීතු, නගාදූවූ; සුනුනා, පුතු හා; අත්තසත්තමො, තමන් සත් වනුකොට ඇතිඋවිහු; සත්තමෙ මාසෙ, පළමු උඳුවප ද්‍රවිසෙස් නිසගත් අභිෂෙකයෙන්; අනුරොධිජනපූරිතස්ස, අනුරොධ ඇති ජනයන්විසින් පුණිණවූ—'අනුරොධ-කාරක'' යන ධාතුයි.

මිස්සකාභිධානෙ, එකල්හි මිශ්‍රකනම් අභිධානඇති; නීලවන සණ්ඩමණ්ඩිතෙ, නිල්වනලැහැබින් සැදුම්ලද; සීතලඝනච්ඡායා, සිනිල් ඝන සෙවණ හා; සීතල, සිහිල්වූ; ජල. දියෙන් යුත්; ජලාසයෙ, සලිලාශය ඇති; පදලඤ්ඡනපවිත්තිතෙ, පදලාඤ්ඡනයෙන් පවිත්‍රවූ; අම්බත්ථලෙ, අඹතෙලෙහි.

අනෙන, පරිනිර්වාණමඤ්චකයෙහි; සයිතෙන, වැදහොත්; මුනිනා, බුදුන්විසින්; ලඞ්කාහිතාය, ලඞ්කාවාසීන්ට හිත සඳහා; ලඞ්කාපසාදනගුණෙන, මාගේ අපරභාගයෙහි ලඞ්කාවාසීන්ට ප්‍රසාද කරන්නට සමර්ථයයි; ව්‍යාකතො, දෙවසමාගමයෙහි නිර්දිෂ්ටවූයේ; ලඞ්කාය, ලක්දිවට; සම්බුද්ධිසො, බුදුන් බඳු වූයේ; තස්සා, ඒ ලඞ්කාවට; හිතහෙතු, වැඩ සඳහා; ලඞ්කාමරූහි, ලක්දිව්වැසි දෙවියන්විසින්; මහිතො, පුදනලදුයේ; සො, ඒ; මහාථෙරහ පුබැව්; තත්ථ, එහි; අම්බතෙලෙහිය සුබැව්; අභිනිසීදි, සමාධි සුඛ අනුභවකෙරෙමින් හුන්නේයි.

## ලංකාවතරණකථා.

——:+:——

නරාවරාවිදූරෙ, නරපතිහුගේ අවිදූරයෙහි; බුද්ධඤ්ච, "යං පන කිඤ්චි ඤෙය්‍යධම්මං නාම අත්ථි තස්ස සබ්බස්ස බුද්ධත්තා සබ්බඤ්ඤුතඤාණාදීහි සබ්බෙහි බුද්ධගුණෙහියෙව නිප්ඵන්නානං අරහත්තඵල සඞ්ඛාතවිමොක්ඛන්තිකඤාණපසෙන බුද්ධො"යි ගත් සර්වඥ දත් බුදුන්ද; ධම්මඤ්ච, "අධිගතමග්ගෙ සච්ඡිකතනිරොධෙ යථානුසිට්ඨං පටිපජ්ජමානෙ චතූසු අපායෙසු අපතමානෙ (කත්වා) ධාරෙතීති ධම්මො"යි ගත් නවලෝකොත්තරධර්මයද; සඞ්ඝඤ්ච, "සීලදිට්ඨිසඞ්ඝාතෙන සංහතො හොති සඞ්ඝො"යි ගත් ආර්‍යසඞ්ඝයාද; සරණං ගතො, සරණ ගියෙමි; උපාසකත්තං දෙසෙසිං, උපාසකභාවය දැන්වීමි; තම්පි, තොපද; ඉමානි රතනානි, මේ රත්නයන්; චිත්තං පසාදයිත්වාන, සිත පහදවා; තෙවිජ්ජා, පූර්වෙනිවාසානුස්මෘතිඥානය දිව්‍යචක්ෂුරභිඥානය ආශ්‍රවක්ෂයකරඥානය යන ත්‍රිවිධ විද්‍යාඇතියවුහු; ඉද්ධිපත්තා ච,

"එකොපි හුත්වා බහුධා හොති" යනාදිවිසින් නිර්දිෂ්ට ඍද්ධියට සම්ප්‍රාප්තවූවාහුද; චෙතොපරියකොවිද, "එවම්පි තෙ මනො ඉතිපි තෙ මනො ඉත්ථම්පි තෙ මනො"යනාදීන් නිර්දිෂ්ටවූ පර චිත්තපරිඥානයෙහි දක්‍ෂවූ; දිබ්බසොතා ච, දිව්‍යශ්‍රොත්‍ර ඇතිවූවාහුද; පණ්ඩිතො රාජා, රජ නුවණැත්තේය යනු ඔහු හා කළ සාකච්ඡා යෙන් කීත්. එයින් වදාළහ-"සාකච්ඡාය ඛො මහාරාජ පඤ්ඤා වෙදිතබ්බා"යි.

චූළහත්ථිපදොපමසුත්තන්තං, මැදුම්සඟියෑ සුළුහැත්පියසතත්; හත්ථාභිසාරං, බිහ අළපරදී; විකාලභොජනොපරතභාවං, විකාලභොජනයෙන් උපරත බව; ජානන්තොපි, සුළුහැත්පිය සුතත් "එකභත්තිකො හොති රත්තුපරතො විරතො විකාලභොජනා"යන පෙළ ඇසූබැවින් දන්නේද; සදාචාර, සුඳුරවූ ආචාර; අනන්තඵලො, සැපත් අනගැම්පල ඇතියේ; සරූපං, නම්ගොත්; සකසභාසක, තමා හා සබඳ; අසොකනරපතිපුත්තභාවං, ධම්සෝරජ දරුබව.

"අසංඛෙය්‍යානං දෙවතානං ධම්මාභිසමයං කත්වා"යන තැන්හි බුදුන් දවස අනෙක සඞ්ඛ්‍යා දෙවියන් අධිගම කළ දැන් ඔහු කෙසේ වූන යත ? බුදුන් ලොකයෙහි උපන්තැන් පටන්ගෙන සදෙව් ලෝ තුඹුරිවිට පිරූ නළක් සෙයින් දෙවියන්විසින් පරිපූර්ණ විය සරවන නලවන සෙයින් ගහනවී.

එයින් කීහ සඟි අටුවායෙහි-

"අම්හාකං සත්ථරි ලොකෙ උප්පන්නකාලතො පඨාය ඡ දෙව ලොකා තිපුදීඪං ශකොට්ඨකා පූරිතනාළි විය සරවනනළවනං විය ච නිරන්තරා ජාතා"යි.

අම්බර, අහස් නමැති; මහ සර, මහවිලට; එක, ප්‍රධානවූ; සහස්සපත්තා, දහසක් පෙති පිපුම්නු බඳුවූ; දිසාවධූ දිගඟනගේ; මුඛමණ්ඩන, මුහුණ සදන්නාට; කුඞ්කුමවිශෙසයෙ, කුඞ්කුමතිලක යක් බඳුවූ; සකලභුවන, සියලු භුවන නමැති; භවන, ගෙට; පදීපකෙ, ප්‍රශස්තදීපයක් බඳු: දිවසකරමණ්ඩලෙ. සූර්‍ය්‍යබිම්බය; අනවරත, නියත: මජ්ජමාන, ගිලෙන; සමද, මදෙද්දුම්වූ; ලඞ්කා විලාසිනී, ලඞ්කාඞ්ගනාවන්ගේ; කුචකලශ, ස්තනකලශයෙන්; ලුළිත, ඇලලෙනලද; කල්ලොලමාලාය, රළපෙළ ඇති; සමද, මෙදෙන් උදම්; කලහංසකුල, මනොඥහංසකුලයාගේ; කලහ මුඛරිත, කලහයෙන් ගුගුම්ගත්; කූලාය, දෙතෙරඇති; කදම්බ නදියා, මහකොලොම්හොය; පඨමකචෙතියඨානෙ; පළමුම්හසෑ තැන්හි; සිවුරුබන් දගබ පිහිටි පියෙස්හි; අන්තොපුර, අන්තඃපුර යෙහි; නාරීජන, රාජවනිතාවන්ගේ; මනොරථසම්පාදනාය,

මනොරථ සංසිද්ධිකට; ගන්ධදාම, ගඳදම්; මාලාදාම, මල්දම්; මුත්තා
ලම්බකං, මුතුලල්; විනිග්ගිලන්තමිව, නිගරණ කරනවත්; සුවණ්ණ,
රන්තරුයෙන්; මණි, මිණිතරුයෙන්; රජතතාරකා, රිදීතරු
යෙන්; ඛචිත, සමුපෙතවූ; විතානං; වියන්ඇති; අනෙකවිධ,
අනෙකප්‍රකාරවූ; සුරභි, සුගන්ධවූ; කුසුමප්පකර, පුෂ්පප්‍රකරයෙන්;
අභිකිණ්ණා, ගැවසීගත්; නානාරතන, නන්රුවන්හි; ප්‍රභා, පැහැ
යෙසින්; විරාජිතානි, දිලියෙනුවූ; විචිත්‍ර, විසිතුරුවූ; අභරණ,
ආභරණ; අප්පිතානි, අතුරකලද්දවූ; පහට්ඨහදයො හුට්ඨා, ප්‍රහෘෂ්ට
වූ හෘදය ඇතිව; සබ්බාභරණ විභූසිතො, සර්වාභරණයෙන් භූෂිතවූ
යේ; අලඞ්කතානෙකාමච්චසතපරිවුතො, අලඞ්කෘතවූ අනෙක අමා
ත්‍යශතයන්විසින් පරිවෘතවූයේ; විචිත්තපුප්ඵධජපතාකාදීහි, විචිත්‍ර
වූ පුෂ්පයෙන් හා විචිත්‍රවූ ධ්වජපතාකාදීන්; විධියමානපූජො, විධාන
කරනලද පූජාඇති; අභිනවසුධාධවලා, අලුත්සුනුවම්යා සුදු; විවිධ,
නොයෙක් වැදෑරුම්; පාසාදෙහි, පහායෙන්; කෙලාසසිඛර, කෛ
ලාස ශිඛරයන්ගේ; නිකරාකාරං, රාශියක් බඳු; චන්දන, සඳුන්;
අගරු, කළුවැල්; දෙවදාරු, දේවදුරු; කප්පූරාදි, කපුරුආ; ගන්ධා
පණෙහි, ගඳපණෙන්; "ආපණ"නම් ව්‍යවහාර කරන ස්ථානයි.
"පණ-ව්‍යවහාරෙ"යන ධාතුයි. ගන්ධමාදනපබ්බත, ගඳමදන්පව්හු
ගේ; නීතම්බසන්නිභං, බෑයදන් බඳු—පවිට්ඨපවිට්ඨජනෙ මූලසාර
තචපත්තපුප්ඵඵලගන්ධෙහි මදයති උම්මාදං කරොතීති ගන්ධමාද
නො—කුවලය, මහනෙල්මල්; මල්ලිකා, ඉද්දමල්; චම්පකාදි, සපු
මල්ආ; පුප්ඵාපණෙහි, පුෂ්පාපණයෙන්; සබ්බදා, හැමකල්හි; වසන්ත
සමයොපමං, වසන්තසමයක් බඳුවූ; චීන, චීනදෙශයෙහි උපන්
පිළී; කොසෙය්‍යාදි, තිහිරිපිළිආ; දුස්සාපණෙහි, වස්ත්‍රාපණයෙන්;
කප්පද්දුමසමානං, කල්පවෘක්ෂසමානවූ; රතනාකරසමානං, රත්නා
කරබඳු; ගජතුරඞ්ගයොධනරචාරී, ගජතුරඞ්ගයොධනරවිලාසින්
ගේ; නිච්චසඤ්චාරං, අවිච්ඡින්නසඤ්චාරඇති; පුණ්ණජල, පූර්ණසලිල
යෙන්; ධොත, ප්‍රක්ෂාලනාකරනලද; පාපමල, පාපලක්ෂණ මල
ඇති; සුද්ධසන්තානජනසෙවිතං, පිරිසුදු සිත්සතන්ඇති ජනයන්
විසින් සෙවුනාලද; විචිත්තතොරණධජකදලිකලසමාලාලඞ්කත,
විසිතුරු තොරණ දද කෙසෙල් කලස පෙළින් සැදුම්ලද; නිම්මල,
නිර්මලවූ; පභස්සර, රශ්මිනිඳුනා; වාලුකා, වැල්ලෙන්, පණ්ඩර, ධවල
වූ; විවිධවීථි, අනෙකවීථියෙන්; පතිමණ්ඩිතං, සැදුම්ලද; මහාති
හත, ගෙරුවලයෙන් අභිහතවූ මහීතලවූ; ඛීරසාගරමිව, කිරිමුහුදක්
සෙයින්; ආකුලීභූතං, දිදක්ඛු ජනයන්විසින් ආකුලවූ; සබ්බාභරණ
පතිමණ්ඩිත, සියලු අබරණින් සැදුම්ලද; භාවභාවලීලාචාතුරිය
සමන්නාගත, භාවයෙන් හා භාවයෙන් ලීලායෙන් චාතුර්යයෙන්
සමුපෙතවූ; සුරකඤ්ඤූපටිභාග, දිව්‍යකන්‍යාවන් බඳුවූ; රාජකඤ්ඤ

නුසඤ්චරිතං, රාජකන්‍යාවන්විසින් අනුසඤ්චරිතවූ; නානාපරිහාරූප සොභිතං, නන් නන් පරිහාරයෙන් හොබනා; කඤ්චනමාලාලඞ්කත, කාඤ්චනමාලාසෙන් අලඞ්කෘතවූ; සෙතච්ඡත්ත, සේසත්ඇති; අමච්චගණපරිවුතො, අමාත්‍යගණයාවිසින් පරිවෘතවූයේ; මහානාගාභිධානස්ස, මහානාගනම් අභිධානඇති; ජායා, භාය්‍යා; රඤ්ඤානුඤ්ඤාතා, රජහුවිසින් අනුඥාතවී—අලඞ්කරිතබ්බට්ඨානං සබ්බං අලඞ්කාරානන්ති සබ්බාලඞ්කාරා නෙහි පතිමණ්ඩිතා භූසිතා සබ්බාලඞ්කාරපතිමණ්ඩිතා—සරදනිසාකර, සරාසඳක් සෙයින්; රුචිර, සිත් ගන්නා; වරවදනා, සොමි මුවින් ඇත්තී; විකසිත ඉන්දීවර, පිපි නිල් මහනෙල් සෙයින්; නීලලොචනා, නිල්නුවන් ඇත්තී; බිම්බඵල; කෙම්පල සෙයින්; පාටල, රත්වූ; දසනවසනා, දන්තාවරණ ඇත්තී; මණිකුණ්ඩල, මිණිකොඬොලෙහි; මකරපත්තභඞ්ගශොභාවී, මකරපත්‍රභඞ්ගයන්ගේ කෙළවර; කිරණ, රැසින්; පහත, පහරනාලද; කපොලතායෙ, කොපොල් ඇතිවනබැවින්; සකණ්ණපල්ලවමිව, කණ්ණපල්ලවසහිතවූවාක් බඳුවූ; මුඛං, මුහුණ; උබ්භාසති, උඥුලවූවී; සුවණ්ණවණ්ණා, රන්වන්වී; සුරත්ත, සුරක්තවූ; කරචරණතලා, කර හා චරණතලඇත්තී.

"කාන්තිප්‍රකර්ෂං දශනච්ඡදෙන
සන්ධ්‍යාඝනෙ බද්ධපදං හරන්ත්‍යාඃ
තස්‍යා ගෘහොද්‍යානසරොගතස්‍ය
හස්තස්ථ එවාම්බුරුහස්‍ය රාගඃ" *

ඝන තන්හි සෙයින් රත්තෙළ්ඹුපෙති බඳුවූ අතුල්පතුල් ඇත්තීය සීසේයි. පීන, පරිපූර්ණවූ; සම, තුල්‍යවූ; සංහත, හැසුණාවූ; නිරන්තර, මස්තකප්‍රාප්තවූ; ථනයුගලා, පයොධරයුග්ම ඇත්තී.

"නායං ශශී තත්ප්‍රතිතුල්‍යමන්‍යත්
තස්මාන්නවිශෙෂයති වයං නෞ
ඉති ස්ම තර්කාදිව පශ්‍යතස්තෞ
තස්‍යා මුඛෙන්දුං කුචචක්‍රවාකෞ." †

ඝන තන්හි සෙයින් වූවන්සඳ නහමනලද සක්වා යුගලක් බඳු තනයුගල ඇත්තීය සීසේයි. තනුතර, සිහින්වූ; තනුමජ්ඣා, තුනුමැද ඇත්තී.

"තන්වී ශ්‍යාමා ශිඛරිදශනා පක්වබිම්බාධරොෂ්ඨී
මධ්‍යෙ ක්ෂාමා චකිතහරිණීප්‍රෙක්ෂිතා නිම්නනාභිඃ
ශ්‍රොණීභාරාදලසගමනා ස්තොකනම්‍රා ස්තනාභ්‍යාං
යා තත්‍ර ස්‍යාද්‍යුවතිවිෂයෙ සෘෂ්ටිරාද්‍යෙව ධාතුඃ." ‡

---

* ජානකීහරණ ප්‍රථමසර්ග 30 වෙනි පද්‍යයයි.
† ජානකීහරණ ප්‍රථමසර්ග 34 වෙනි පද්‍යයයි.
‡ මේඝදූත උත්තරමෙඝ 21 වෙනි පද්‍යයයි.

යන තන්හි සෙයින් සිඟුවලන ඇත්තීය සිංස්සී; විප්පුරිත, දිලිසෙන; හාරලතා, මුක්තාහාරලතාවගේ; රස්මිජාල, රස්දැල්හි; නිමුග්ග. ගැලුණු; සරීරතාය, කායඇතිවනබැවින්; ඛීරසාගර, කිරි මුහුද; නිමුග්ග, ගැලුණු; වදනා, මුහුණුඇති; සිරිදෙවතා විය, සිරි දෙව්දුවක බඳු වී; මහාරහ, අනගිවූ; මෙඛලාලාප, මෙවුල්හඬින්; කලිත, මනොඥවූ; විසාල, මහත්වූ; ජඝනතලා, දුවන්තල ඇත්තී; විචිත්ත, විසිතුරුවූ; වත්ථ, පිළී; නිවත්ථා, හඳනී; ගජ, ඇතක්හුගේ; භුජ, අතක් බඳු; සම, තුල්‍යවූ; සහිත, සහගවූ; ඌරුකා, කලවා ඇත්තී. රණිත, හඬන; මණිනූපුර. මිණිනූපුරයෙන්; ආකුලිත, සජ්ජාතාකුලවූ; චරණයුගලා. සරණයුවල ඇත්තී; දීපසිඛා විය, ප්‍රදීපශිඛාවක් සෙයින්; භාසමානා, දිලිසෙන්නී; සාළවනලෙඛා විය, නවශලාදුළු ඒනරාජියක් සෙයින්; කිසේය යත්; නවවනලෙඛා; කොමල, කොමලවූ; තනුලතා, තුනීල්‍ය ඇත්තී; මෝ වූකල; කොම ළ, කොමලවූ; තනුලතා. තුනුලිය ඇත්තී; මෙරුවනලතා විය, මෙ රුවනයෙහි ලතා සෙයින්; කිංසේය යත්; රත්මෙරළපවනයෙහි ලතා; කනකපත්ත, රන්වන්පතින්; අලඞ්කතා, සැදුම්ලද්දී; මෝ වූකල; කනකපත්ත, රන්පතින්; අලඞ්කතා, සැදුම්ලද්දී; වණ්ණිතා, පසඟපිහිටුවා වැඳ; පූජෙත්වා, ගඳින් මලින් පුදා; සපරිජනස්ස, පරි ජනයන් සහිතවූ; ධම්මරතනවස්සං, දහම්නමැති රුවන් වැසි; පෙතවත්ථුං, ක්ෂෙත්‍රොපමාදි ප්‍රෙතවස්තුද; විමානවත්ථුං, පීඨවිමානාදි විමන්වතුද; සච්චසංයුත්තඤ්ච, සංයුත්සඟියෑ සත්‍යසංයුක්තද; සොතා පත්තිඵලාලඞ්කාරෙන, ශ්‍රොතාපත්තිඵල නමැති අලඞ්කාරයෙන්; ථෙරදස්සනං. ස්ථවිරයන්ගේ දැකීම; මඞ්ගලගජවරධානෙ, මඟුල් ගජරජහුගේ ස්ථානයෙහි.

සො ථෙරො, ඒ ස්ථවිර; දීපදීපො, ද්වීපයට ප්‍රදීපයක් බඳු වී; සත්ථුකප්පො. බුදුකල්පවූයේ; අකප්පො, ප්‍රහීණවූ කාමාදිසඞ්කල්ප ඇතියේ; ලඞ්කාධිට්ඨානෙ, ලඞ්කාපුරයට අධිෂ්ඨානස්ථානවූ; ලඞ්කා දීපෙ, ලක්දිව; චීසු ඨානෙසු, චිස්ථානයෙක්හි; දීපභාසාය, සිංහල භාෂායෙන්; ධම්මං භාසිත්වා; ධර්මව්‍යාඛ්‍යාන කොට; එවං, මේ ක්‍රම යෙන්; සද්ධම්මොතාරං කාරයී, සද්ධර්මයට ජනයන්ගේ අවතාරය කැරවී.

## නගරප්පවෙසනකථා.

——:!——

සංවට්ටජලනිධි; ප්‍රලයසාගරයෙහි; විච්සු විය, චඩනා රළ පෙල සෙයින්; පුප්ඵඵලභරිත, මල්පල්බෙලෙන් බරවූ; තරුගණකර, වෘක්ෂරාශීන්; පතිමණ්ඩිතෙ, සැදුම්ලද; කුසුමොදයනෙන, කුසුම් නමැති දසකින්; අදිතනන්දන, දෙවියන්ට නන්දනකවූ; නන්දනාම්

සප්‍රීතිනැඤ්ඤාසි. නන්දනවනං. නඳුන්උයනට; අපහසිත්වා, අපහාස කොට; පල්ලවපාණිනා, පලුපත් නමැති අතින්; මයා සමෙතුං, මා. හා සමවන්නට; තවායාසෙන, තාගේ ආයාසයෙන්; අලංනායි, ප්‍රයොජන නැතැයි; විහග, ලිහිණියන් හා; මධුකර, බමරුන්ගේ; ආරාවෙන, හඬින්, ගජ්ජමානෙ ඉව,ගර්ජනා කරනවින්; නන්දනාභිධාන, නන්දනනම් අභිධානඇති;උපවනෙ, ආසන්නවනයෙහි;බාලපණ්ඩිතසුත්තන්තං, මැදුම්සඟියැ උපරිපන්නස බාලපණ්ඩිත සූත්‍රය; සොතාපත්තිඵලවරරතනං, ශ්‍රොතආපත්තිඵල නමැති උත්තම රත්නය; නගරාසන්නං, නුවරට ආසන්නය; මම පිතු, මා පියරජහු විසින්; තරුවරනිච්චිනං, තරුවරයන්විසින් ගැවසීගත්; මදමුදිත, මෙදෙත් උදම්; විවිධ, නොයෙක්; මධුකර, මීමැස්සන්විසින්; උපකූජිතං, කුල්නාලද—

> "අමී ශීතෛරභ්‍රෛර්මුඛරිතලතාමණ්ඩපභුවඃ
> පරාගෛඃ පුෂ්පාණාංප්‍රකටපටවාසව්‍යතිකරාඃ
> පිබන්තඃ පයශ්ශාපතාස්සහ සහචරීභිර්මධුරසං
> වසන්තාදෘපානොත්සවමනුභවන්තීව මධුපාඃ"

යන තන්හි සෙයින් බමරහු බමරඟනන් හා සමඟ බොනපමණ මල්මීබී මුවරදපට පෙරෙව බමරපියරුවින් ගඟා අවන්වැද කෙළිනවුන් වැනියෝ.සුචි, පිරිසුදු; විමල,ප්‍රසන්න; සීතල,සිහිල්; සලිල, උදකයහට; ආසය, ආධාරවූ; (තිසෑවැව ජලයෙයින්,) සනාපිතතං,සනාථ කරනලද; යොගානුකූලං, සමාධියට අනුකූලවූ; "යුජ–සමාධෞ" යන ධාතුයි. දිබ්බභවනසන්නිභෙ, දිව්‍යවිමානයක් බඳු; රාජභවනෙ, රජගෙයි; සුරසයනනිබ්බිසෙසෙ, දිව්‍යශයනයක්බඳු; සයනාසනෙ, ශයන හා ආසනයෙහි-සයළු යතළු සෙති විහාරෙ වා අඩ්ඪයොගාදිම්හි වා තං සයනං, යතළු යතළු ආසති නිසීදති තං ආසනං, සයනඤ්ච ආසනඤ්ච සයනාසනං-සාමිනීපරියනෙනා, රාත්‍රිපර්යෂිනායෙහි; සමණසාරුප්පන්ති,ශ්‍රමණයන්ට උචිතයයි;පරම.උත්කෘෂ්ඨප්‍රාප්තවූ;පීතිපසාද.ප්‍රීතිප්‍රසාදයෙන්; ආපුණ්ණහදයෙන, ආපූර්ණහෘදයඇති;සුවණ්ණභිංකාරං,රන්කොතුරු;"සංඝස්සදම්මි"යනතැන්හි තොපවහන්සේට; දෙම්යිනොකියා සඟනට දෙම්යි සහඳුත් දන්හි ඵල විපුලයෙන්කියා. වසුධාතලං,පොළොවතල; ලංකාදීපප්පදීපො, ලඞකාවීපයට ප්‍රදීපවූ;තුහිනජලකණික,පිනිසිල්ලිල්බිඳිහි;සිසිර සිහිල්වූ;සමීරණ,සුළඟින්; චුත, ගුළු; කුසුමප්පකර, මල්රැසින්; විරචිතං, ගැවසීගත්; අභිනව විකසිත, අලුත පිපි; කුසුමනිකර, මල්රැස්හි; බහලපරිමලං, බොල් පියගඳඇත්; විභාතකාලෙ, පහන්වූ වේලායෙහි; රමණීයං, රම්‍යවූ; රාජඝරස්ස, රජගෙට;මහබොසින් පැළදෙස්දෙරටුවෙහ් පිටත්තැන් පැදිදෙරිබැව්යෙහි; පිචුදුම්මූලං, පුලිලරුක්මුලට; ගේ දූත් මහ බොසින් අග්නිදෙස මුළුවස. එතැන කළ මණ්ඩපය වගුළුකල්හි

පැදුම්කුළුමුළුදුන්ගු; ජාතිකුසුමමුඛීහි, දෑසමන්මල් මිටින්; පමපදුම්
සඤ්ජනනං,පස්පියුමින් ගැවසීගත්; මධුරොදකසම්පුණ්ණං, මියුරු
පැන් පිරුණු; සරං, විලට; ජනතාසරපොක්ඛරණී, ගිනිහල්පොකු
ණු;හැස්වා එතන පිරිවෙනක් කළහ දූන් එතන හෙළිගල්පොකුණු
වී. ධරණීතලං, පොළෝතලය; ධරණීමණ්ඩලං,පොළොව්මඩලය;
සුමනකුසුමඡලිහි, සුමනකුසුමයන්ගේ මල්ඇදිලින්; මන්‍දමාරුත,
මඳමරුයෙන්; චලිතෙහි, කම්පිතවූ; තරුණ;ළද; රත්ත, රත්; කොම
ල, කොමල; පල්ලව, පලුම; හත්‍ථෙහි, අතින්; සිලීමුඛරවෙහි, බම
ර රැවින්; නො, අපගේ; ලතාකන්තාහි, ලතා නමැති කාන්තාවන්
විසින්; මහාමුචලමාළකං, මහම්දෙල්මළුවට; භූරවං, මහීනාද,
පඤ්හම්බමාලකඨානං, පැනඹමළුතැනට; රාජොපනීතං, රජහු
විසින් එළවනලද;වණ්ණගන්‍ධරස සම්පන්නං, වණ්ණයෙන්ගන්‍ධයෙන්
රසයෙන් සම්පන්නවූ; නික්ඛන්තඅම්බංකුරං, නික්මෙනලද අඹ
අකුරු ඇති; විසාඛ, විහිදිනාලද; විටපසාඛාපලාසං, විටප හා ශාඛා
හා පණීයන් ඇති; අවහරිත, අවලම්බිතවූ; කුසුමඵලනිකරං,
මල්රුස් හා එලරුස් ඇති; උපගත, එළඹෙනලද; මධුලිහ, බමරු
න් හා; කොකිල, කොවුල්ලන් හා; කලභකං, ලෙහෙණුන් ඇති;
සහකාරතරුවරං, මීඅඹරුක් රජහු; සලාකගහසස, පිරිත්ලාගේ
හුගේ; වසුමතිගජ්ජනං, මහාපෘථිවියගේ ගර්ජනා; ඵලපාදපගණ,
ඵලවෘක්ෂගණයන් විසින්; ආකිණ්ණං, ගැවසීගත්; චතුස්සාලඨානං,
සියුසල්තැන්; මහීනාදං, භූරව; සුනිම්මල, සුප්‍රසන්නවූ; සීතල,
සිහිල්වූ; සලිල, දියෙන්; අභිපූණ්ණාය, පරිපූර්ණවූ; කමල, හෙළ
පියුම් රත් පියුම්; උප්පලකුවලයාදි, රන් මහනෙල් නිල් මහනෙල්
ඈ; විවිධකුසුමාභරණ, නොඑක් පුෂ්පාභරණයෙන්;සමලඞ්කතාය,
සැදුම්ලද; ජලදෙවතා, ජලාශ්‍රිත දෙවතාවන්ගේ;නූපුරරවානුකාරි,
නුපුරුවලාරැව්බඳු; කලහංස, කලහසුන්ගේ; රසිතාය, හඬ ඇති;
බහුවිධ, අනෙකප්‍රකාරවූ; විහඞ්ගගණ, ලිහිණිගණයහට; අධිවාස
භූතාය, ආවාසවූ; සරද, සරාකල්හි; සර, විල්හුගේ; සිරියා, ශොභා
වෙන්; අබ්‍භුද්දිකාය, නොකුදු නොඋනුවූ; බුද්දිකාය, කුඩාවූ; කකු
ධාභිධානාය, කුඹුක්නම් අභිධානඇති; වාපියා, වැවින්; උපරී,
මත්තෙහි; ජලසමීපෙ, දියකෙළවර; මහාථූපඨානං, රුවන්මැලි
මහතුපුතැනට; මෙදිනීතලං, පොළොව්තල; චම්පකපුප්ඵඡලීහි,
චම්පකපුෂ්පයන්ගේ ඇදිලින්; පිලයකුවො, පිලාකුළු: අඹතෙලයි.
පජ්ජරක, ප්‍රබලජ්වරයෙන් හුණීන්; "ජ්වර-රොගෙ" යනධාතුයි.
විගතපජ්ජරකා, අපගතජ්වරවූවාහු; එත්‍ථ, මේ මහමෙවුනාඋයන්
තන්හි; අකාලපුප්ඵාලඞ්කතං, අකාලයෙහි පිපි මලින් සැදුම්ලද;
සිරීසමහාබොධිතො, මහසිරිමහබොසින්; බේමවතිරාජධානියා, බෙ
මවතීනම් නුවර; බෙමරාජානං, බෙමනම්රජාහු; මනොසිලා, රක්
කලලින්; රෙඛං, හිරක්; සුවණ්ණකටාහෙ, රන්තෙලෙහි; පමසත

භික්ඛුනීහි, පන්සියයක් භික්ෂුණීන් හා සමඟ; සිරීසමාළකං, මහරි
මළුවට; හේ දූන් ලෝවාමහපාතැනි. ථූපාරාමඨානං, තුඹරුප්තැන
ට; ධම්මකරකං, ඩබරාව; රතනමාළකෙ, රුවන්මළුයෙහි; හේ දූන්
සතරබුදුන් පදලසපැදුම්දෙසේ මහසෑතැන්හි. දුබ්බුඞිපරිපීළිතෙ,
දුර්භිෂායෙන් පරිපීඩිතවූ; අකාලකුසුමසොභමානං, අකාලයෙහි පිපි
මලින් හොබනාලද; පුබ්බබොධිපතිඨිතඨානං, පූර්වයෙහි මහබෝ
පිහිටිතැනට; උදුම්බරමහාබොධිතො, දුඹුල්මහාබොධියෙන්; සුරා
සුරපරිවුතා, දෙවදානවයන් විසින් පරිවෘතව; නාගමාළකං, නා
මළුවට; හේ දූන් ලෝවාමහපාතැන්හි. කාසබන්ධනං, පට්ය; සුදස්ස
නමාළකෙ, සුදසුන්මළුයෙහි; හේ දූන් පදලස්පැදුම්දෙසෙන් දෙව
න මහසෑතැන්; රාජුපරාජයුධෙන, රජ යුවරජ දෙන්නාගේ යු
ඛයෙන්; වීසතිසහස්ස, විසිදහසක්; අනුබුධපරිවුතො, මහාක්ෂීණා
ශ්‍රවයන්විසින් පරිවෘතවූයේ; යුධං, සංග්‍රාමය; උජ්ඣිත්වා, පියා; "උජ්ඣ-
උත්සර්ගෙ" යන ධාතුයි. මණ්ඩිත, විභූෂිතවූ; වරමණ්ඩපෙ, ප්‍රවරවූ
මණ්ඩපයෙහි; අකාල, අකාලයෙහි වූහුටු; කිසලය, පලුපතින් හා;
කුසුම, මලින්; සමාකුලං, සමවුල්වූ; නිග්‍රොධමහාබොධිතො, නුග
මහබොයින්; අසොකමාළකං, හොපලුමළුවට; හේ දූන් ලෝවාමහ
පාවූතැන්. ජලසාටිකං, දියසළු; සොමනස්සමාළකෙ, සොම්නස්
මළුයෙහි; හේ දූන් පදලස පැදුම්දෙසෙන් තුන්වන මහසෑතැන්.
ඵුස්ස, දුරුතුමස; පුණ්ණමදිවසෙ, පූර්ණමාදිනයෙහි; යක්ඛපුණ්ණං,
යක්ෂයන්විසින් පරිපූර්ණවූ; තියොජනායතෙ, තුන්යොදුන් ආයාම
ඇති; යොජනවිත්ථතෙ, යොදුන් විස්තාරඇති; මහායක්ඛසමාගමෙ,
මහත් යක්ෂසන්නිපාතයෙහි; රවිපථෙ, ආකාශයෙහි; කප්පුඨානසම
ය, කල්පවිනාශකාලයෙහි; සමුඨිත, උද්භූතවූ; වුඨිවාතනිබ්බිසෙස,
වැසි සුළං හා නිර්විශෙෂවූ; වස්සවායුනාව, වර්ෂායෙන් හා සුළඟිනුදු;
ලොකන්තරිකඝොර, ලොවැදිරිය අඳුරුසෙයින් ඝොරවූ, තිමිරනික
රෙනව, අන්ධකාරරාශිනුදු; සීතනරකබහල, ශීතනරකයෙහි ඇල්
සෙයින් බහලවූ; සීතලෙනව, සිහිලෙනුදු; සංවට්ටකාලජාත, ප්‍රලය
කාලයෙහි උපන්; වාතසංඛුභිත, වායුවෙගයෙන් ක්ෂුභිතවූ; පචණ්ඩ,
ප්‍රකර්ෂයෙන් චණ්ඩවූ; ඝනගජ්ජනාසදිසෙන, මෙඝගර්ජනා හා සමා
නවූ; ගගන, අහස්හිදු; මෙදිනී, පොළොව්හිදු; නාදෙන, හඬින්:
යාචිතාභයො, අයදනාලද අභයඇති; මෙ, මට; තෙ, තට; නො,
අපට; යක්ඛදත්තභූමියං, යකුන්විසින් දෙනලද බිමැ; ආදිත්තං, දිලි
යෙනුවූ ආදීප්තවූ; කප්පානලකලාපසදිස, යුගන්ගිනිකලඹක් සුදු
සු; දහනාභිභූතානං, ගිනින් අභිභූතවූ; ජලනිධි, සමුද්‍රයෙහි; සලිල,
දියෙන්; භීතානං, උත්‍රස්තවූ; ගිරිදීපං දසෙත්වා, ගිරිදිව් හැර දක්වා;
සුමනකූටවාසිනා, සමනොළවැසි; සුමනදෙවරාජෙන, සමන් නම්
දිව්‍යරාජයා විසින්; සමධිගතසොතාපත්තිඵලෙන, සමධිගතවූ
සෝවාන්ඵලඇති; යාචිත, අයදනාලද; පූජියො, පූජ්‍යවස්තු ඇතියේ;

පාණිමත්තො, මිටක් පමණ; නීල, නිල්වූ; අමල, නිර්මලවූ; සිරොරුහෙ, කෙස්දා; චිත්තමාසස්ස, බක්මස්හුගේ; කාළපක්ඛ, කෘෂ්ණපක්ෂයෙහි; උපොසථදිවසෙ, පොහෝදවස්; සම්ඛිසුමන; සම්ඛිසුමන නම්; දුමදෙවෙන, රුක්දෙවියා විසින්; ඡත්තිකත, ඡත්‍රකෘතවූ ආතපත්‍ර කරනලද; රාජායතනො, කිරිපලුරුකක් ඇතියේ; නාගදීපං, නාදිවට; උරගවයපූජිතො, නාගරාජයන් දෙදෙනා විසින් පූදන ලද; වසුමතීගත, පොළෝපිටතුබූ; මණිපල්ලඞ්කෙ, මිණිපලඟ මතුයෙහි; දිබ්බනනපානං, දිව්‍යවූ අනනපාන; ජලථලනිවාසිනො, දියෙහි ගොඩෙහි නිවාසඇති; මහොදරමාතුලෙන, මහොදරයා මයිල්; මණිඅක්ඛිකනාගරාජෙන, මිණිඇස්නම් නාගරාජයා විසින්; විසාඛෙ, වෙසක්මස; පුණ්ණමදිවසෙ, පූර්ණිමාදිවසයෙහි; පඤ්චභික්ඛුසතපරිවුතො, පන්සියයක් භික්ෂූන් විසින් පරිවෘතවූයේ; කල්‍යාණිදෙසෙ, කැලෑණිදෙශයෙහි; මාපිත, නාගරාජයා විසින් මවනලද; රුචිර, සිත්ගන්නා; රතනමණ්ඩපෙ, රුවන්මඩුයෙහි; මනොහර, මනොඥවූ; වර, ශ්‍රෙෂ්ඨවූ; පල්ලඞ්කෙ, පර්‍ය්‍යඞ්කයෙහි; නාගමාණවිනිකර, නාගකන්‍යාසමූහයෙන්; පරිවුතෙන, පිරිවරන ලද; දිබ්බකුවලය, දිව්‍යමානෙලින්; විලෙපන, දිව්‍යසඳින්; ආදිශබ්දයෙන් ගත් ගන්ධව් පූජායෙන්; සුමනකූටෙ, සමනොළ; දීඝවාපිචෙතියඨානෙ ච, දිගාවැසැතැන්හිද; මහාබොධිඨානෙච, මහමෙවුනාඋයන්හි මහබෝ පිහිටියමනා තන්හිදු; සිලාචෙතියඨානෙ, සලසෑතැන්හිදු; ගේ පදලස සතරවන කුඩාදාගබයි; රතනමාලිකචෙතියො නාම, රුවන්මැලි මහසෑනම්; අසදිසො, පත්සාලිය් හවුරුද්දක් සිට අධිෂ්ඨා කොට සැතපෙන්ට වැදහොත් බුදුන්බඳු ධාතුශරිරයෙන් භූෂිතවනබැවින් අසදෘශවූ; මහාථූපො භවිස්සති, රන්හෙරණපැවිද්දන් දෙදෙනක්හු උතුරුදිවින් අළ සමඅසූරිසත් සල පහණතලායෙන් දශදිශායෙහි පිහිතවූ දහගබ්කුස් ඇති මහාථූපයෙක් වෙයි; භාතිකස්ස තෙ, තමලු; මහානාගස්ස, මහනාකුමරනු; යට්ඨාලතිස්සො නාම, යටාලතිස්සනම්; අත්‍රජො, පුතු; ගොඨාභයො නාම, ගොළුඅභානම්; තතයො, පුත; කාකවණ්ණතිස්සො නාම, කාවන්තිස්ස නම්; දුට්ඨගාමණී අභයො නාම, දුටුගැමුණුඅභානම්; දස මහායොධපරිවුතො,

"නන්දිමිත්තො සුරනිමිලො මහාසොණො ගොඨයිම්බරො
ථෙරපුත්තාභයො භරණො වෙළුසුමනො තථෙව ච
ඛඤ්ජදෙවො ඵුස්සදෙවො ලභියවසභොපි ච
එතෙ දස මහායොධා තස්සා හෙසුං මහබ්බලා"යි

කියනලද දශමහායොධයන් විසින් පරිවෘතවූයේ; කණ්ඩුලාභිධානං, කඩොල්නම් අභිධානඇති; මහායොධගජරාජං,

"බලලක්ඛණරූපෙහි තෙජොජවගුණෙහි ච
අග්ගො අහු මහාකායො සො ච කණ්ඩුලවාරණො"ති

කියනලද මහාසොධවූ ගජරාජයා: එළාරදමිළරාජෙන, එළාර නම් දෙමළරජු හා; විජිතසඞ්ගාමො, දීඝජන්තු එළාර භල්ලූකාදී මහායොධයන් අභිභවා අටළොස්කඳවුරෙක්හි දෙමළුන් මිරිකා දෙතිස් තැනෙක්හි සේසත් ගෙන විජයකරනලද සඞ්ග්‍රාමඇතියේ; සමරජලනිධි. සඞ්ග්‍රාමසාගරයෙහි; විලොළිතමන්ථො, අළලන්නට මතක් වැනිවූයේ; ගජිත, ගත් නාලද; සකලමහිමණ්ඩලො, සියලු මිහිමඬුලු ඇතියේ; මහබ්බලො, මහාබල හා පදෘතිබල ඇතිවන බැවින් මහාබල ඇතියේ; ජලනිධිවෙලාමෙඛලො, මුහුදුවෙරළම මෙවුල්දම් ඇතියේ; භූමිභත්තා, භූමියට ස්වාමිවූයේ; නත්තා නෙ, නා මුණුබුරෙක්; එත්ථ, මෙතැන්හි; ථූපං, කාරෙස්සති; අප සම්‍යක්සම්බුද්ධයාට ථූපයක් කරවා.

ඔවුන් ඒ ථූපයට අර්හපරිදි කියේයයත්? වදාළේමැනො- "චත්තාරොමෙ භික්ඛවෙ ථූපාරහා කතමෙ චත්තාරො තථාගතො අරහං සම්මාසම්බුද්ධො ථූපාරහො, පච්චෙකබුද්ධො ථූපාරහො, තථාගතසාවකො ථූපාරහො, රාජා චක්කවත්ති ථූපාරහො, ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො ථූපාරහා"යි.

සපරිවාරො, සපිරිවරින්; රාත්සදෙනා හා සමඟ; නගරං පවිසිත්වා, කුලයක් පමසථානයෙක්හි පුණ්‍යභාග්‍යනු සඳහා නුවර වැද; අග්ගික්ඛන්ධොපමං, වග්නිස්කන්ධොපමවූ; දසබලධම්මදෙසනං, බුදුන්ගේ දහම්දෙසුන්; ආසීවිසොපමං, ආශීවිෂොපමවූ; "දසබල ධම්මදෙසනං" යනු වැටේ. "අනමතග්ගියං" යනුදු වැටේ. විහාර මග්ගනගරාන්, වෙහෙරද මගද නුවරද; සබ්බාලඞ්කාරභූසිතො, සර්වාලඞ්කාරයෙන් භූෂිතවූයේ; අලඞ්කතනාරිගණපරිවුතො, අලඞ්කෘතවූ නාරිගණයන් විසින් පරිවෘතවූයේ; දෙවරාජලීලාය; දෙව් රජහුගේ ලීලායෙන්; කදම්බනදියා, මහකොළොම්හොය; පාසාණතිත්ථං, සිසමතොටින් මත්තෙහි පහණ්තොට; කුන්තමාලකං, කොත් මළුයෙහි; මඞ්ගලනාගපුඞ්ගොපෙතං, මඞ්ගලහස්තිපුඞ්ගලයකුත් උපෙතවූ; හෙමනඞ්ගලං, රන් නඟුලක්; සීතං, හීව්ටක්; අඩ්ඪකථායං, මිහිඳුමහතෙරුන් මෙරට වැඩකල තත්කාලවර්ත්තනට අවබොධවනු සඳහා සිංහලභාෂායෙන් තුබූ අටුවාතුයෙහි; චතුරඞ්ගමහාසෙනො, හස්ත්‍යශ්වරථපදාතිලක්ෂණ චතුරඞ්ගයෙන් යුත් මහසෙනඟ ඇත්තේ; සීමන්තිනීහි, ඇතොවුරන් විසින්; නානාතුරියසංඝුට්ඨො, නානා

තූර්‍යඝොෂයෙන් ඝොෂාකරනලද—පුරිසපරක්කමසංඛාතබලයොගතො බලං පුරිසසමුහො යථා නීලගුණයොගතො නීලං, ඔඝා විය අජ්ඣොත්ථරන්තානි බලානි බලොඝා තෙහි පරිවාරිතො, බලොඝපරිවාරිතො-ථුති, යසසිත්ථ: මඞ්ගලගීතෙහි, මඟුල්ගීන්; පාසාණතිත්ථෙ, පහණතොට; කුඩ්ඩාවාටකපාසාණතො, කොඩවළපහණින්; කුම්භකාරආවාටකං අගමාසි, කුඹල්බොහොරුවට ගියේ; හේ මහලෑණින් වතු තැනි. තතො මහානීපපාදපං, එයින් මහානීපරුකට ගියේ; හේ කොළඹිඑ මහපියත්ගල්තොටතැන්. තතො කකුධපාළිං, එයින් කුඹුක්පෙළට ගියේ;හේ මූලවසාවෙහෙර දකුණුදෙසේ පවුරුතැනි. තතො මහනතාංඅඞ්ගණරුක්ඛං,එයින් මහඅඟුණට ගියේ;හේ පැසුළු දකුණු උතිවෙහෙර කළකල්හි මහබත්ගෙයි දකුණු දෙසෙයි යන තැන් ව්‍යවස්ථිතවී. තතො බුජ්ජමාතුලං,එයින්කොරමයිල්ලට ගියේ; හේ දකුණු උතිවෙහෙර මහසෑතැන්.තතො මරුත්තපොක්ඛරණිං, එයින් මුරුතපොකුණට ගියේ; හේ පැසුළු මෙත්ගිරිවෙහෙරට පොකුණු විය ඉක්බිති රන්මසුළුසඟ පැදුම්දෙසේ රත්දෙරටුයෙන් මධ්‍යම දෙරටුවට වදනා අත දකුණත්වී. තතො විජයාරාමඋය්‍යානෙ උත්තරද්වාරකොට්ඨකං, එයින් විදෑරම්උයන්උතුරුදෙසේ දෙරටුවට ගියේ. පැසුළු එහි කෙවිල්ලවෙහෙර නම්විය. කෙවිල්ලපහාගොස්; තතො ගජකුම්භකපාසාණං, එයින් ගජකුම්භපහණට ගියේ; හේ පහණගැසූතැන්හි පොකුණුවලෙක්. තතො ථූසවට්ටිමජ්ඣං,එයින් තෝව්ටමැදට ගියේ; හේ දූන් පුත්මාවෙහෙරපැළදෙසේ මහපවුර් පිටුපස්තැන්. තතො අභයවාපියා බලාකපාසාණං, එයින් බයා වැව කොක්ගලට ගියේ; තතො මහාසුසානමජ්ඣං, එයින් මහ සෝන්මැදට ගියේ; තතො දීඝපාසාණං, එයින් දිගුහල්විලට ගියේ; තතො, එයින්; චණ්ඩාලගාමං, ගැලෑළිනම් සැඬොල්ගම්; වාමෙන පරිහරිත්වා, වමින් පිරිරා; ඒ ගම්නැලෑළියට මියරතැන්· කම්මාරදෙවස්ස, කඹුරුදෙවියා; වාමපස්සෙ, වමත්පස්හි; කඹුරුදෙවියා විමන් මහපාණන් වතුතැන්. නීචසුසානං, සැඬොල්සොහොනට ගියේ; වවුල්පොකුණුතැන් මස්තොටපොකුණැයි කියත් මෙ. තතො සීමාන්ග්‍රොධං, එයින් සීමානුගයට ගියේ;හේ අභයගිරිවෙහෙර මස්තොට පිරිවෙන්තැන්. තතො බෙලුවඩගණං, එයින් බෙල්අඟණට ගියේ;හේ එම වෙහෙර පස්බුදුන් ලහගත් තැන්.තතො, එයින්; ජොතියගිරි කුම්භණ්ඩාභිධානානං, ජොතියනම් ගිරිනම් කුම්භාණ්ඩනම් අභිධාන ඇති; තිණ්ණං නිගණ්ඨානං අස්සමපදනි අනෙතා කත්වා, තිණීතුඹුරුප් යනතැන්හි ජොතියනම් නිවටහුගේ වාසයද තලඝම්නාවඩුන්නාතන්හි ගිරිනම් නිවටහුගේ වාසයද වඩමන් මහමෙලාගේතැන්හි කුම්භාණ්ඩනම් නිවටහුගේ වාසයද ඇතුළත්කොට; අනෙකෙසං පරිබ්බාජකානං ආරාමං වාමෙන පරිහරිත්වා,

"පරං ජෝතියගෙහම්හා ඔරං ගාමණිවාපියා
සො පරිබ්බාජකාරාමං නිගණ්ඨාරාමමෙව ච—
ආජීවිකානං ගෙහඤ්ච බ්‍රාහ්මණවාටමෙව ච
සිවිකාසොත්ථිසාලා ච අකාරෙසි තහිං තහිං"—

යනාදි ක්‍රමයෙන් ජෝතියනම් නිවටහුගේ වාසයෙන් ගැමිණි වැව් දක්වා මිථ්‍යාදෘෂ්ටිගත් අනෙකපරිව්‍රාජකයන්ට නුවරමැවූ පඬු අභාරජහු විසින් කරවනලද ආරාම වමින් පිරිරා; හියගලලසමීපෙ, හියගලුඅබියෙස්හි; දීයවාසබ්‍රහමණස්ස, දීයවස්බමුණගේ; දෙවගෙහං, දෙවොලට ගියේ; හියගලු අභයතුරා මහසෑතැන දෙවොල් අග්නිකොන ඇත්පවුරුතැන්. තතො තෙලුමපාළිං, එයින් තෙල් පෙළට ගියේ; ඉන් වාදුයෙන් දකුණුදෙසේ කුඩපිඩවාවිය දකුණු පවුරුතැන්. තතො තාලචතුක්කං, එයින් තාලචතුෂ්කයට ගියේ; සතරතල්රුකක් සිටි ස්ථානය කදාමහරම්පිරිවෙන්තැන්. තතො, එයින්; අස්සමණ්ඩලං වාමෙන පරිහරිත්වා, අස්මඬුලු වමින් පිරිරා; ගේ කළසකළාගල්විවුවනතැන්.තතො මරුම්බතිත්ථමගමාසි,එයින් මහකොළඹහොය දිය ඇත්තෙන් දිවිඇත්නම් විය. මහකොළඹහොයදිය නැත්තෙන් මළහෝනම් වී. තතො පඨාය, කළසකළාහොය පටන්ගෙන; සීමාමගෙගා, සීමාමාර්ගය; නදීතටාකෙන, හෝවැළයෙන්; උඩං, මතුයෙහි; සීහසිනානතිත්ථං ගන්ත්වා, සීමස් තොටට ගොස්; තීරතො ගච්ඡන්තො, තීරයෙන් යනුයේ; පාසාණතිත්ථං, පහණතොට; කුඩ්ඩවාටකපාසාණමුපගන්ත්වා, කොඩලපහණට ගොස්; තත්ථ අඨාසි,එහි සපිතව සථිත වී; තත්ථෙව, එම අටුවායෙහි; දෙවොකං, දෙව්ගෙට; වජං, යනුයේ; ඉසී, මහතෙරහු; සීරසීතාය, හීවිටඇති; වසුධාධනිං, මහීනාද; ඛජ්ජනියපරියායං, ඛජ්ජනියපර්‍යායසුතත්; ගොමයපිණ්ඩියං, ගොමපිඩුසුතත්; අඩ්ඪනවමං පාණසහස්සං, අඩුනවදහසක් ජනයන්; අටදහස් පන්සිය යූසේයි;මහාමෙඝවනෙ විහාසි, මනුෂ්‍යයන් පුණ්‍යප්‍රසව කරමින් මහමෙවුනා උයන්හි වුසූහු; එයින් වදාළහ—

"යං භික්ඛවෙ සීලවන්තො පබ්බජිතා ගාමං වා නිගමං වා උපනිස්සාය විහරන්ති තත්ථ මනුස්සා තීහි ඨානෙහි බහුං පුඤ්ඤං පසවන්ති කතමෙහි තීහි කායෙන වාචාය මනසා"යි.

වාලධිකොටි, වල්පත්කෙළවරින්; පරිචුම්බිතඨානෙ, පහරනට නිසි ස්ථානයෙහි; බොධිඝරං, මහබෝගේ; මහාපාසාදෙ, මහපා; සන්නිපාතඝරං, පිරිත්ලහගේ; ධාතුඝරං, දාගේ; රාසිමාලකො,රැස් මළු; භත්තඝරං, බත්ගේ; මහාථූපො, මහතුඹරුප්; කණ්ටකථූපො, කැටිපොකුණු; මූතිඝරං, මහපිළිමගේ; මහනතානං, ආදි පන්සියයක් මහරහතන් පිරිවරා අවුත් තත්තත්ස්ථානයෙහි නිරොධසමා

පසනී සමවැද පදලස් දක්වා එපිසෙස් දැකලහ බෙදු බුදුහ පැසුළු රාතන්සඟුන් ගෙන අවුදු පොළෝගුගුරුවා උසන්පිළිගත් මහමිහිඳුම හතෙර යන මහතුන්ගේ; කාලපාසාදං, කළුගේපහා; එයට පරිවාර ගේකලතැන සිට කලපිරිවෙන් නම්වී; සුනහාතපරිවෙණං, සුනහා පිරිවෙන්; දීඝචංකමනපරිවෙණං, දික්සක්මන්පිරිවෙන්; ඵලග්ග පරිවෙණං, ඵලග්ගුපිරිවෙන්; ථෙරවස්සපරිවෙණං, තෙරවස් පිරි වෙන්; මරුගණපරිවෙණං, මුරුගණපිරිවෙන්; දීඝසන්දසෙනාප ඩිස්ස පරිවෙණං, දික්සඳසෙනෙවියා පිරිවෙන්—පරිවෙණ දළසෙන වෙණයති දස්සයතීති පරිවෙණං විහාරෙ භික්ඛූනං තංතංඋසනඩා නං-"වෙණෘ-ගතිඥනචින්තානිශාමනවාදිත්‍රග්‍රහණෙෂු" යනධාතුයි-රත්ථානදිවාඨානචංකමනපොක්ඛරණීපතිමණ්ඩිතං කත්වා, රාත්‍රි ස්ථානයෙනුදු දිවාස්ථානයෙනුදු චඞ්ක්‍රමණයෙනුදු පුෂ්කරිණියෙනුදු භූෂිතකොට.

දෙවානංපියවචනා, දෙවනුපෑරජයන වචනයෙන්; උපගුල්හ නාමො; මුවහවූනම්ඇති; සො රාජා, එරජ; සුමති, සුන්දරවූ මති ඇතියේ; එත්‍ථ ලඞ්කායං, මේ ලක්දිව; අමලමතිං, නිර්මලවූ නුවණ ඇති; මහාමහින්දථෙරං, මහමිහිඳුමහතෙරුන්; ආගම්ම, පිණිස; පඨමං, පළමු; ඉමං මහාවිහාරං, මේ මහවෙහෙර; කාරයිත්‍ථ, කරවී.

## මහාවිහාරපටිග්ගහණකථා.

—ෙ(ඃ)ඃ—

මහාඅප්පමාදසුත්තන්තං, අඞ්ගුත්තරසඟියෑ එකාදසනිපාතයෙහි මහාඅප්පමාදසුතත්; කථනචෙතියඞ්ගණං, කථනචෛත්‍යය වූවමනා අඞ්ගණය; අරියමග්ගපොක්ඛරණියං, ආර්‍ය්‍යමාර්ග නමැති පොකු ණෙහි; අවගාහිත්වා, ගැලී; මග්ගඤාණෙදකෙන, මඟනුවණනමැති දියෙන්; කිලෙසමලං, කෙලෙස්නමැතිමල; හිරිඔත්තප්පසාටකෙ, හිරිඔතප්නමැතිසළු; සීලවිලෙපනෙන, සිල්නමැතිවිලවුනෙන්; අරහත්තමණ්ඩනෙන, රහත්බැව්නැමැති පලඳනෙන්; විමුත්ති පුප්ඵදාමං, පඬවිමුක්තිනමැතිමල්දම්; ඉද්ධිපාදපාදුකා, චතුරිද්ධිපාද නමැති පාදුකාවට; නිබ්බානනගරං, නිවන්නමැතිනුවරට; ධම්මපා සාදං, දහම්නමැති පහයට; නිබ්බානමහාතලෙ, නිවන්නමැති මහ තලෙහි; එකග්ගසුඛසමප්පිතො, සමාපත්තිසුවයෙන් සමර්පිත වූයේ; දිනනවිහාරා, දෙනලද විහාරඇතියහු; නරාමරසඞ්ගහං, නරාමරයන්ට සංග්‍රහ; දෙවමනුස්සගණා, දිව්‍යමනුෂ්‍යගණයෝ; තං ගණිනං, ඒ ආර්‍ය්‍යගණයන්ඇති මහතෙරුනුදු; තඤ්ගණං, ඔවුන් පිරිවරා ආ ආර්‍ය්‍යගණයනුදු; ගුණවිත්ථතකිත්තිං, ගුණයෙන් දසදෙ සෙහි පතළ යසස්ඇතියවුන්; යාතං, චතුර්විධප්‍රත්‍යය සඳහා තමන් කරා ආයාතයනුදු; උපෙච්ච, තමන්විසින් මෙ ආර්‍ය්‍යගණයන්කරා එළඹෙනුදු; මානයමානා, පුදනුවෝ; විපුලං, බොහෝවූ; පුඤ්ඤ චයං, කුසල්රැස්; අකරිංසු, කළෝ.

## චෙතියගිරිවිහාරපටිග්ගහණකථා.

දසභාතිකසමාකුලං, දසබෑයන්විසින් සමාකුලවූ; අස්සයුජ පුණ්ණමදිවසෙ, වප පුණුපොහෝද; අබ්භ, වෙලහෙනුදු; මහිකා, හිමයෙනුදු; ධූම, දුම්නුදු; රජ, ධූලියෙනුදු; රාහු, රාහුකෙරෙනුදු විප්පමුත්තං, විප්‍රමුක්තවූ; බුද්ධුප්පාදපටිමණ්ඩිතස්ස, බුද්ධොත්පාදයෙන් ප්‍රතිමණ්ඩිතවූ; ලොකස්ස, ලොකයාගේ; රමණීයකදස්සනත්ථං, රම්‍යභාවය තමන් දක්නාසඳහා; උක්ඛිත්තං, උපුල්වනලද; රජතමයං, රිදීමුවා; මහාආදාසමණ්ඩලං විය, මහා ආදාසමණ්ඩලයක් සෙයින්; නෙමිවට්ටියං, නිම්වළල්ලෙහි; විපරිවත්තියමාන, පෙරළෙනලද; රජතචක්කසස්සිරිකං, රිදීසකක් බඳු: පුණ්ණචන්දමණ්ඩලං, පුණ්ණචන්දමණ්ඩලය; රජතසට, රිදීතෙළින්; විනිග්ගතාහි, නික්මෙනලද; රජතවිමාන, රිදීවිමනින්; විප්පමුත්තෙතාහි, විප්‍රමුක්තවූ; මුත්තාවළි, මුතුවැළ; සුමනකුසුමදාම, සමන්මල්දම්; සෙතදුකූල, සුදුදුහුල්; කුමුදවිසරෙහි, කුමුදුමල්පතරින්; සම්පරිකිණ්ණාය විය, ගැවසීගත්වන්වූ; චතුරූපක්කිලෙසවිප්පමුත්ත, සතරඋපක්ලෙශයන් විසින් විප්‍රමුක්තවූ; පුණ්ණචන්ද, පුන්සඳහුගේ; පභාසමුදය, රශ්මිකදම්බයෙන්; ඔභාසිතාය, උද්දීපතවූ; තාය රත්තියා, ඒ රාත්‍රියෑ; කත්තිකපුණ්ණමදිවසෙ, කිලපුණුපොහෝදවස්; අනොවාසං, නිවහලුවිසීම්; සබ්බතාලාවචරෙ, හැමවාරණගණයන්; මඞ්ගලවරවාරණං, මඟුල්ඇතු—සො පච්චත්තිකවාරණතො ගමනපරික්ක්ලෙසවාරණතො වා වාරණෙ—මහානාගවනුයානාභිමුඛො, මහනාඋයන්අභිමුඛව;යේ දූත් නාවින්තැන්; අඩා,එකාන්තයෙන්; අයාසං, මුත්නා; පාචීනමහාසාලමූලෙ, පැදුම්මහසල්මුල්හි; ලංකාණීයමානං, ලංකාවට ආනීයමානවූ; මහාබොධිං, දක්ෂිණශාඛාමහාබොධිය; කත්තිකජණ්ණපූජාහි; කැතිසැණමහමහය සමඟ පවත්නාලද පූදයෙන්; ආභිණ්ඩසි යන තැනැ“භිඩි–ගත්‍යම්”යන ධාතුයි.දක්ඛිණක්ඛකං,දකුණු දසරුව; වඩ්ඪමානකච්ඡායායං, වඩනා සෙවණෙහි; මහපස්වරුයෑ යුසේසී; මඞ්ගලදන්තිමත්ථකෙ, මඟුල්ඇතුගේ මස්තකයෙහි; මඞ්ගලමාතඞ්ගො, මඟුල්ඇත්; ඉභකුම්භ, ඇත්කුඹු; නාගො, ඇත්; අනෙකතාලාවචරපරිවුතො, අනෙකවාරණයන්විසින් පරිවෘතවූයේ; අපසක්කනෙතා, අපසඞ්ක්‍රමණය කරනුයේ; පසුපස්සෙන් බස්නේය යුසේසී; කණ්ටකසමාකිණ්ණසාඛාහි, කණ්ටකයෙන් සමාකීර්ණවූ ශාඛාඇති; කදම්බපුප්ඵිකාදීහි, සිඟුරුඇ; විදිත, දන්නාලද; ගජවරාධිප්පායො, ගජවරයා අභිප්‍රායඇතියේ; කරිවරකුම්භප්පමාණං, ගජවරයාගේ කුඹ හා සමානවූ; චත්‍රං කත්වා, අධිෂ්ඨානකොට; ඉසීකාපි, උළුදු; සුරභි, සුගන්ධවූ; කුසුම, මලින්; සමලංකතෙ, සැදුම්ලද; විරදින්ද, ඇත්රජහුගේ; කුම්භතො, කුඹින්; විම්භයකරං, විස්මය ජනවනුවූ.

සකධාතුසරීරකෙනපි, තමාගේ ධාතුශරීරයෙනුදු; පරිනිබ්බානගතොපි, නිරුපධිශෙෂනිර්‍වාණධාතුවින් පිරිනිවියාද වූ; ලොකනාථො, තථාගත; ජනතාය, මහාජනයහට; හිතං සුඛඤ්ච, මෙලොව් වැඩද පරලොවවැඩද; සම්මා, මනාකොට; බහුධා, අනෙකප්‍රකාරයෙන්; අකාසි, කෙළේ; ඨිතෙ එව, බුදුන් දිවමනුකල්හිම්; කා කථා, කවර කථායෑ; කියනුම කිම නැත යුසේයි.

## ධාත්වාගමනකථා.

—ඃ(ඃ)ඃ—

නො, අපට; සරස, ස්වරසයෙන් ස්වකෘත්‍යයෙන්; රංසිජාල, රශ්මිජාලයන්; විස්සජ්ජෙන්ත, විහිදුනා; සාසනං, සසුන්; ජම්බුකොලපට්ටනං, නාදිව දඹුල්තොටට; ථෙරාධිට්ඨානවසෙන, මහතෙරුන්ගේ අධිෂ්ඨානවශයෙන්; පඤ්චහි අන්තෙපුරිකාසතෙහි, රාජාවරොධජනයන් පන්සියක් දෙනා හා සමඟ—අන්තෙපුරිකා, රාජාවරොධා—පඤ්චහි ච පුරවිලාසිනීසතෙහි සද්ධිං, පුරවමියන් පන්සියක් දෙනා හාද සමඟ; භාතුජායා, මලුගේ භාර්‍ය්‍යා; ගහිතබ්බතා, ගෘහිත ව්‍රතඇත්තී; තෙ, ඔවුන්; සුතවිරහ, පුත්‍රවියොග; සොකසාගර, ශොකනමැති සමුද්‍රයෙහි; නිමුජ්ජාපෙන්තී, ගැලෙන්නීහු; නරවීරවචනං, නරවීරයාගේ වචන; අනුලාඛත්තියා, අනුලානම්ක්ෂත්‍රිය කන්‍යාද; කප්පානලො, කප්ගිනි; අසන්නිපාතාරහං, * සැත පහරවන්නට නොනිසිවූ; පඤ්චනෙත්තස්ස, පස්ඇස්ඇති; මහාචෙතියෙ, රුවන්මැල්මහසෑයෙහි; සඤ්ජාතපීතිපාමොජ්ජෝ, සඤ්ජාතවූ ප්‍රීතිප්‍රමොදඇත්තේ; තත්‍ර, ඒ මහබෝ වඩා ගෙන එන මඟ; ධවල, සුදුවූ; විපුල, බොහෝවූ; වාලුකං, වැලි; ලාජපඤ්චමකුසුමානි, හිතණ සමන්කැකුළු සිදුහත විලඳ(සුන්සහල්)යන ලදපස්මල්; විවිධපුප්ඵවිසර, නොඑක් පැහැ විහිදුණු; ධජපතාක, ධජපතාකයන්ගේ; අනෙකසහස්සං, නොඑක්දහස්; අජසං, මහ; සුවණ්ණකටාහන්ථාය, රන්කටාහයක් සඳහා; නවහත්ථපරික්ඛෙපං, නවරියනක් පරික්ෂෙපඇති; පඤ්චහත්ථුබ්බෙධං, පස්රියනක් උසඇති; තිහත්ථවිත්ථම්භං, තුන්රියනක් පළලඇති; අට්ඨඞ්ගුලබහලං, අටඟලක් බොලඇති; යුවකුඤ්ජර, නහඹඇතක්හුගේ; සොණ්ඩප්පමාණමුඛවට්ටිකං, සොඬක් පමණ මුවවිටිඇති; බාලසූරියමණ්ඩලසන්නිභං, ළහිරුබිඹක් බඳු; සබ්බාභරණභූසිතො, සර්‍වාභරණයෙන් භූෂිතවූයේ; මඞ්ගලමාතඞ්ගං, මඟුලහස්තිහු; පාකට, ප්‍රකටවූ; සිරීට, සිරුළම්ණින්; සංවඩ්ඪ, මනොඥවූ; සීසෙන, සිරස්ඇති; මුද්ධාභිසිත්ත, මූර්‍ධාභිෂික්තවූ; ඛත්තියසහස්සෙන, දහසක්රජුන්විසින්; ගළමාන, වැහෙන; මදගන්ධ, මදයෙන් ගඳවූ; ගන්ධකුඤ්ජර, ගඳැතුන්විසින්; අන්ධකාරය, අඳුරුවූ; චටුල, වල්ගත්; තුරඞ්ගනිකර, අශ්වබෘන්දයන්ගේ; ඛුරමුඛරව, මුඛරිතවූ

* "අසන්නිපාතාරහං" සිද පාඨයි.

මුඛරවයෙන්; බධිරිකතදසදිසාය, බධිරිකෘතවූ දශදිශාඇති; පදාතිබලං, යොධබලයන්ගේ; බහලකලකලරව, බහලවූ කලකලවූ රවයෙන්; ඵාළිත; පළනලද; සොතවිවරය, කන්සිදුරුඇති; නිද්දය, දයානැතිව භයානකකොට; අභත, පහරනාලද; මුදිඞ්ගමද්දලපටහකාහලසංඛරව, මෘදඞ්ගාදීන්ගේ රවයෙන්; බොධිතාය, දන්වනලද; ධවල, සුදු; චාමරසහස්සාය, චාමරසහස්‍රයක්ඇති; කනකදණ්ඩ, රන්දඬුඇති; ආතපත්ත, ඡේසතින්; සඞ්ඝට්ට, සංඝට්ටනාඇති; ගගනාය, අකාශදෙශඇති; සත්තයොජනායාමාය, සත්යොදුන්දික්ඇති; තියොජනවිත්ථතාය, තුන්යොදුන්පළල්ඇති; සෙනාය, චතුරඞ්ගිනීසෙනාවෙන්; සමුස්සිතධජපටාකං, සමුච්ඡ්‍රිතධ්වජපතාකාඇති; නානාරතනවිචිත්තං; නානාරත්නයෙන් විචිත්‍රවූ; අනෙකාලඞ්කාරපතිමණ්ඩිතං, අනෙකාලඞ්කාරයෙන් භූෂිතවූ; විවිධකුසුමසමාකිණ්ණං, විවිධකුසුමයෙන් සමාකීර්ණවූ; අනෙකතුරියසංඝුට්ඨං, අනෙකතුර්‍ය්‍යයන්විසින් ඝොෂණය කරනලද; සාණියා, ජවනිකායෙන්; සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො, සර්‍වාභරණයෙන් විභූෂිතවූ; අලඞ්කතරාජසහස්සපරිවුතො, අලඞ්කෘතවූ රාජසහස්‍රයෙන් පරිවෘතවූයේ; සුවණ්ණතුලිකං, රන්තෙල්ලක්; මනොසිලාය, රක්කලලින්; ගවක්ඛජාලසදිසං, ගෝඇස්ජාලාවක්සෙයින්; අනුසිබ්බන්තා, හිවමින්; නික්ඛන්තා, නික්මුණුවූ; නවුති, අනුමුල්හු; සලිලාවලාවසානො, දියපොළොව් අවසන්කොටඇති; මහාභූමිචාලො, මහාභූමිකම්පා; දෙවදුන්දුභියො, දෙව්බෙරහු; හිංකාරෙයි, හිංයන ධ්වනියෙන්; වුතිජපෙපති, සෙතාත්‍රවචනයෙන්-"ජල්ප-ව්‍යක්තවාචි" යන ධාතුයි—අප්පොඨෙන්ති, අස්ඵාලනයෙන්; ගජ්ජිතෙති, ගැජුම්න්; රවෙති, නාදයෙන්; චීරුතෙති, හඬින්; සබ්බතාලාවචරානං, සර්‍වාරණයන්ගේ; සකසකපටිභානෙහි, තමතමන්ගේ දැනුම්විශෙෂයෙන්—යෙ අයුනා ච පඤ්ඤාය ච අකනිඨා ජෙඨකා සබ්බදෙවෙහි පණීතතරා දෙවා තෙ අකනිඨා—රතනගොපානසී, රුවන්ගොවනැසින්; විතඩං විය කුරුමානා, වළඳනාලදුවන් කරනුවෝ; ආවත්තිත්වා, ආවෘත්තව අවුත් පැදකුණුකොට; විගතහිමවලාහකෙ, විගතවූ හිම හා වලාඇති; විප්පසන්නචක්කවාළගබ්භෙ, විප්‍රසන්නවූ චක්‍රවාලගර්භයෙහි; පරිපුණ්ණ, පරිපූර්ණවූ; චන්දගුත්තරාජකුමාරෙන, වෙටස්දෙව්බිසවුන් කුසෙහි හොත් රජකුමරුවන් අටදෙනාකෙරෙහි සඳගුත්රජකුමරහුවිසින්; කෙසරිවම්මාවනද්ධාය, කෙශරසිංහසමින් සදනලද; විම්භාපයන්තී, විස්මය කරනුවී; ජනතං, සමූහයා; සඤ්ජාතපීතිවෙගො, සඤ්ජාතප්‍රීතිවෙගඇතියේ; සොළසමහාදෙසාලංකතෙන, අභුමගදාදි සොළොස්රට්න් සැදුම්ලද; මණිකනකකිරීටසහසෙන, මිණිරන්වොටුනුදහසින්; සෙතතුරඞ්ග; සුදුඅසුන්විසින්; භාසුරෙ, දිලිහෙන; සමුස්සිත, නුසුවනලද; සිතාතපත්තෙ, ඡේසත්ඇති; ජුණ්හපක්ඛස්ස, ජ්‍යොත්සනාපක්ෂයාගේ; ජ්‍යොත්සනා නම් සඳරැසි.

ඉති, මේසේ; සරෙ, විලක්සේ පරිපූර්ණවූ; කුසුමපුරෙ, පාට
ලිපුත්‍රනම්නුවර; සරංසා,ප්‍රාත්‍ථායඤ්විසින් නික්මෙන රස් හා සහිත
වූ; බහුවිධ, නානාප්‍රකාරවූ වර්ණසංස්ථානඇති; චාරු, මනොඥවූ;
ධජාකුලා, ධ්වජපතාකායෙන් සංකීර්ණවූ;විසාලා,විස්තීර්ණවූ;සුරුචිර,
සාධුසුන්දරවූ;පවර, ශ්‍රෙෂ්ඨවූ; උරුබොධිපූජා, මහබෝපුදා; මරුනර,
දිව්‍යමනුෂ්‍යයුත්; විත්තවිකාසිනී, මනඃප්‍රබොධනී; අහොසි, වූ.

"එවං ධම්මාසොකනරින්දෙන ගහිතා"යනු ප්‍රශ්නය කළපරිදි දක්
වනුසඳහා කීහු. පත්තාජලභිඤ්ඤං,ප්‍රාප්තවූ ෂඩභිඥාඇති;විධුරින්දනාග
රාජං, විදුරිඳුනම් නාරජහු;අට්ඨාරස දෙවතාකුලානි, අටළොස්කුලෙක
දෙවියන්; තරච්ඡ, සරස්; කුලිඞ්ග, ක්ලිඟු; කපප, කපු; බලත්ථ,
බලත්; පෙසකාර, පෙහෙර; කුම්භකාර, කුඹල්; මාලාකාර, මල්
කරු; ගන්ධකාර, ඔසදවටු; * සිබ්බකාර, තුනා; සූද, භක්තකාර;
කම්මාර, කඹුරු; ලොහකාර, ලෝකරු; සුවණ්ණකාර, තරහල්;
වඩ්ඪකී, වඩු; චිත්තකාර, සිත්කරු; ආතොජ්ජවාදක, ගඳවි; ඡත්ත
කාර, සත්කරු; උය්‍යානපාල, උයන්පලු; දිවසකරවංසජාතං, සූර්‍ය
වංශසම්භූතවූ; වෙට්ටිසදෙවියා, වෙටස්දෙව්බිසවුන් හා; සහොදරා
නං, එකකුස හොත්; සුමිත්තබොධිගුත්තාභිධානං, සුමිත්තනම්
බොධිගුත්තනම් අභිධානඇති; අත්තනා සමඤාතෙ ඨපෙත්වා, තමා
පළඳනාතාක් පලඳනා පලඳවා තමහට කරනතාක් පෙරහර කරවා
තමා හා සමතන්හි තබ්බවා;පරිහාරදෙවියො, පෙරහරදූත්; ගඞ්ගා
ය, ගඞ්ගානම්නදිය; සඑකාදසභික්ඛුනිං, මහගම්සඟුන් එකොළො
ස්දෙනකු හා සමඟ; නාවෙව, එම නැවෑ; පුබ්බාපරසමුද්‍ද, පූර්‍ව
සමුද්‍රය හා අපරසමුද්‍රයාගේ; වෙලා, වෙලෙළ; අවලඞ්ඝං, නැවැති;
විඤ්ඣාටවිං, විඤ්ඣනම් අටවිය; තාම්ලිත්තිතිත්ථං, තාමලිත්තොටට;
දෙවනාගමනුස්සා, දිව්‍යයන් හා නාගයන් හා මනුෂ්‍යයෝ;ගන්ධමාල,
ගඳමල්නුදු; අම්බර, විචිත්‍රවස්ත්‍රයෙනුදු; ආභරණ, රත්නාභරණ
යෙනුදු; චන්දනචුණ්ණවකරන්දවසෙන, සඳුන්සුනුවර්ෂායෙන්හා මුව
රඳවර්ෂායෙනුදු; අනිලබලවෙග, අනිලබලවෙගයෙන්; විලුළිත,
ඇළලෙනලද; ජලනිධි, සමුද්‍රයාගේ; වෙලාතටෙ, වෙලෙළෑ; අභි
සෙකං දත්වා, අගරජනට සෙසින් බිසෝ දෙවා; මගසිරමාසෙ,
උඳුවප; සොළසජාතිසම්පන්නකුලෙහි; අටකැත්කුල හා සොළොස්
ජාතිසම්පන්නකුල හා සමඟ; ජලනිධි, සමුද්‍රයෙහි; සලිලං, දියට;
"ගවජජ් වතරෙ"යන තැන්හි අරෙ යනු අව්‍යයය; කන්දිත්වා, කන්ද
නය කොට; "කදි-ක්‍රදි-කලදි-අව්හානෙ"යන ධාතුසි-"ස්කන්දිර්-
ගතිශොෂණයොඃ" † යනධාතුසි-තාඑ,ඒ මහමුහුදෑ:ජළුනාතදශං ද
ෂ්සසනතාවිය,සඳත්දහතලා දක්වනුවන් බඳු;දෙවිඥරඩගමණ්ඩලං,

* "ඔස්තාවටු"

† "පක්ඛනතා" යනු සඳහා මේ ධාතුනිර්දෙශයි.

සක්දෙව්රජහුගේ රඟමඬලය; විකුබ්බනමකංසු, වාතවස්සාන්ධකාරාදි ක්ෂොභ දක්වමින් සැඩි කොළෝ; සුපණ්ණරූපං, ගුරුළුවෙස්; කප්පාන ලක්ඛන්ධ, කප්ගිනිකඳක් සෙයින්; භිංසනෙන, භයානකවූ; රවිතුර ඝපථං, අහස්කුස්; සිඛා, ඉඳුනීලමණිවණීවූ මස්තකයෙහි; මරීචිජා ලෙන, රස්දැලින්; ගගනං, අහස්; පක්ඛානිලවෙගෙන, පක්ෂවාත වෙගයෙන්; ජලනිධිපාතාලං, සමුද්‍රයාගේ රසාතලය; යුගන්ත, යුගයාගේ අන්තයෙහි; දිනකරාකාරෙන, දිවසකරයන් බඳු; භිංස නක, භයානකවූ; නයනයුගලෙන, ලොචනයුගලයෙන්; භුජඞ්ග හදයානි, නාගයන්ගේ හෘදයයන්; සංවට්ටජලනිධිනාදවිසදෙන, ප්‍රලය සාගරඝොෂාසෙයින් විශදවූ; සමුත්‍රසතරූපා, සම්‍යක්උත්‍රස්තවූ භීත වූ චලිතවූ ප්‍රකම්පිතවූ ස්වභාව ඇතිසව්හු; තං විභූතිං, ඒ ඓශ්වය්‍යී; මුච ලින්දඋරගින්දස්ස, මුචලිඳුනාරජහුගේ; භොගාවළිං, දරණවැළ; උච්චි ඨපත්තං, ඉදුල්පා; විසධූමදහනං, විෂධූම හා විෂානල; සරණසිලා භරණං, සරණසිල්නමැති පලඳනා; නන්දොපනන්දනාගරාජස්ස, නන්දොපනන්දනම්නාරජහුගේ; විසසාගරං, විෂසමුද්‍රය; යුගන්ත දිවසකරො විය, යුගන්තහිරක්හු සෙයින්; නො, අපගේ; නාගලො කස්ස, පාතාලලොකයහට; සග්ගාපවග්ගං, ස්වර්ග හා අපවර්ග; සඞ්ගී තිං, නැටුම්ගැනුම්; නාගරජ්ජෙන, නාගලොකයෙහි රාජ්‍යයෙන්; “එවං සංඝමිත්තත්ථෙරියා ආනීතා” යනු “කථං සංඝමිත්තත්ථෙරියා ආනීතා” යන ප්‍රශ්නයට විසජ්ජනා කළපරිදි දක්වනුසඳහා කීහු.

සුමනසාමණෙරස්ස, ධාතුවට ගිය සුමනනම්හෙරණපාණන්ගේ; වචනෙන, මහබෝ පැළ දුප්නුවර පැදුම්මහසල්මුලට වැඩුහ යන වච නයෙන්; විමල, නිර්මලවූ; විපුල, බොහෝවූ; වාලුකං, වැලි; සමුද්ද සාලවත්ථුස්මිං, සමුද්‍රශාලා වූවම්නාතන්හි; ආකාසෙ, අහස්හි; “ආග තො වනරෙ” යන තන්හි ‘අරෙ’ යනු යහනා යන අර්ථයි. ජලනිධි, සමුද්‍රයාගේ; වෙලාතටෙ, වෙරළෙ; දෙවාරිකට්ඨානෙ, වාරපාලස්ථා නයෙහි; පාචීනතිස්සවිහාරට්ඨානං, බුදුන්වැඩහුන් කිරිපලුරුක්පිහිටි පැදුම්පස්වෙහෙරතැනට; පාතරාසං, පෙරවරුබත්- “ප්‍රාත අශෘත ඉති ප්‍රාතරාශඃ”-සස්කෘණං, සලකුණු; තවක්කබ්‍රාහ්මණස්ස ගාමද්වා රෙ, තවක්බමුණු ගම්දොරැ; දූත් තවක්ගම්දොරතන්හි; අතන්ද්‍රිතො, අතන්ද්‍ර අප්‍රමත්ත වූයේ; මුත්තාඵලධවල, මුක්තාඵලසෙයින් ධවලවූ; ධජතරුවන, ධජනමැති තරුවනයෙන්; තාදිනො, තාදෘශ්‍ය-ලාභා ලාභයසායසනින්දාපසංසාසුඛදුක්ඛෙසු සමප්පවත්තවිධානතාය තාදි නො, අථවා ඉට්ඨානිට්ඨෙපි තාදීති ආදිනා වුත්තනයෙන ඉට්ඨානිට්ඨෙසු තාදිසායෙවාති තාදිනො—වදතංවරස්ස (වදන්තානං වරස්ස), වක්තෲ ජනයනට උත්තමවූවනුගේ; තිලකභූතෙ, තිලකස්ථානයට පත්; පරිකම්මසංඛතෙ, පරිකර්මයෙන් සංස්කෘතවූ; අනුපුබ්බවිපස්සනං, සංස්කාරපරිග්‍රහයෙහි පටන්ගෙන ගොත්‍රභූඥාන දක්වා අනුපූර්

යෙන් වඩනලද විදර්ශිතා; පට්ඨපෙත්වා, ප්‍රස්ථාපනකොට; උදකාවිනි පරියන්තං කත්වා. දියපොලොව පර්‍යන්තකොට; භින්දන්තා, වලඳ නාහු, ගහිත, ගන්නාලද; මකරන්ද, මුවරඳඇති; මන්දමාරුතා, මඳ මරුවෝ; ඝන, බහලවූ; සීතල, සිහිල්වූ; හිමවලාහකා, හිමවලාහ කයෝ; විගතහිමවලාහකෙ, අපගතවූ හිමවලාහකඇති; නිම්මලා කාසෙ, නිර්මලවූ ආකාශයෙහි; කාජරගාමෙ, රුහුණුකදරගම්හි; චන්දනගාමෙ, එහිම සඳුන්ගම්හි; විජම්භිතපාටිහාරියාය, විජෘම්භ ණය කරනලද ප්‍රාතිහාර්‍යයඇති; පාචීනමහාසාඛතො, පැදුම්දෙසෙ හි මහාශාඛායෙන්; මහාආසනට්ඨානෙ, පැදුම්දෙසෙහි මහඅසුන් තන්හි; ඉස්සරසමණාරාමෙ, ඉසුරුමුණුවෙහෙර; හේ දූන් කසුන්ගිරි වෙහෙරතැන් වී–හිතාය, මෙලෝවැඩසඳහා; සුඛාය, පරලෝවැඩ සඳහා; “එවං රක්ඛන්තු දෙවානංපියතිස්සෙන පත්ථාපිතා” යනු ප්‍රශ්න යට විසර්ජනය කළ පරිදි දක්වනුසඳහා කීහු.

අපරිමිතසමය, අනන්තාපරිමාණකාලයෙහි; සමුපචිත, රැස්කරන ලද; කුසලබලනිබ්බත්තෙන, පාරමිතාබලයෙන් නිපන්; සනරාමරා අරියපරිසමජ්ඣෙ, මිනිසුන්හා දෙවියන්හා ආර්‍යයන් සියෝ පිරිස මැද; සාවෙත්වා; සත්යලක් අස්වා; සුරනර, දෙවිමිනිසුන්ගේ; නයන මනොහරං, නුවන්මන හදනා; ඉන්දචාපකලාපොවිය, දෙව්දුනුකලඹ බඳු, විවිධරාග, නොඑක් පැහැඇති; මහාධජමාලිනී, විශාලධ්වජමාලා ඇති; සුරපති, සක්දෙව්රජහුගේ; සමජ්ජමණ්ඩලංවිය, නැටුම්මඬලයක් සෙයින්; විකච, පිපි; පඤ්චවණ්ණ, පස්පැහැඇති; කුසුමනයනානි, කුසුම් නමැති නුවන්; විවිධවිහඞ්ගරව, නොයෙක්ලිහිණිහඬම; තූරියඝොසං, තූර්‍යඝොෂා; මධුරමධුකරනාදෙන, මියුරුබමරහඬින්; ගායිත්වා, ගායනාකොට; ලලමාන, ලලත්වූ; පල්ලවකරතලං, පල්ලවකරත ලය; බොධිහාරකෙහි, බොධිආහරණ කළ මහබෝ වඩා අළ; ධම්මා සොකනරින්දසන්දෙසං, ධර්මාශොකනරපතිහුගේ හසුන්; සුහදය, සුන්දරවූ හෘදයඇති; පරම, විශිෂ්ටවූ; බන්ධුවග්ගෙ, බන්ධුවර්ගයන් මමත්තවසෙන බජ්ඣන්ති සම්බජ්ඣන්තීති බන්ධූ ඤාතී සාලොහි තා ච—අදිනනං, නුදුන්දෙයක්; තෙන, ඔහුවිසින්; මෙ, මට; අත්ත මත්තමෙව, අත්මමාත්‍රයෙක්මය; තෙමේ තමා නොදින්මත්තැ යූ සේයි; අමච්චෙහි සද්ධිං මන්තෙත්වා, ඇමතියන් හා සම්ගහෙන; ජග ති, දියෙහි; ලොකයෙහිය යූසේයි; ‘මහනත්තං’ යන තැන්හි “මහ-පූජායාම්” යන ධාතුයි..එම දක්වන්නට කීහ ‘පූජිතං’ යනු, පූජ්‍යවූ; බොධිරුක්ඛං, ද්‍රුමරජහු; ‘ලාති’ යනු “ලා-ආදානෙ” යන ධාතුයි. අද දූති පරිපාලෙති යනු එයට පර්‍යායයි; මහාලානට්ඨානං, මහාලාන ස්ථාන; මහලේතැන යූසේයි. ජගත්හි පූජ්‍යවූ මහබෝරුක්ස්ථානය පරිපාලනය කරනුවන්ගේ තැනයූසේයි. මොරපාසාදෙ පධානඝරං, මොරවාපියන්ගලට; අත්තනො කරණීයං, තමහට කටයුතු; සකල

මඞ්ගලං; සියලුපහසිත්මඟුල්; පරිහාරං, පෙරහර; මඞ්ගලදිවසෙ, තකතුරුමඟුල්දවස්; දසනවසනයුගං, දහවලුසඟළක්; සබ්බෙසං, මහබෝ වැඩා අා හැමදෙනහට; මඞ්ගලවත්ථානි, මඟුල්පිළී; පිචුවමාලකෙ,අග්ගිකතෑ පුලිලමළුයෙහි; සන්නිපාතෙත්වා, රැස්කරවාගෙන, තස්ස ඨානන්තරං විනිවෙදිත්වා, ඔහට තනතුරු දෙවනපරිදි දක්වා; මහාචාරං විචරාපෙත්වා, මහදෙ‍ෘර හරවා; සුමිත්තෙන, මලු සුමිත්ත නම්කුමරහු ලවා; ලංකාජගතිමහාලානො, ලක්දිවිමහලේ; තික්ඛත්තුං වාචාපෙත්වා, තුන්යලක් කියවා; වෙඨිතමත්තලංකතං සීසං දිස්වා, නොසැදුණුතැනෙක් කිමහෝයි බලනුයේ මහබඹහු සේ සෙවලබඳ හිස් දැක; කිරීටං තස්ස මත්ථකෙ පතිඨාපෙත්වා, තම වොවුනු ඔහුගේ මුදුනෙහි පිහිටුවා; මෙඝනාදසනනීහෙහි, මෙඝධ්වනිබඳු; මඞ්ගලතූරියනාදෙහි, මඞ්ගලතූයඝොෂායෙන්; සරමයුරෙ, ගෙමොතරුන්; සුමිත්තාසාපි, සුමිත්තනම් රජකුමරහටද; ජගතීමහාලානො, දියමහලේ; සීහාසන, සීහස්නෙහි; ආසිනො, හුන්නේ; සීහපඤ්ජරං, සිවුම්දුරට; ආරුය්හ, ආරුඪවැ; පුරවනිතා, පුරකත්නමැති; කමලිනී, මහනෙලියන්ගේ; නෙත්ත, ඇස්නමැති; උප්පලසහස්සෙහි, මහනෙල්දහසින්; මලයරාජඨානං, මලයරජතැන්ඃ වීරබාහුජනපදං, විජයරජහට දෑ කෙවින්නම් යක්ෂිනි බඩහොත් විරබාහුකුමර විසුයෙත් වීරබාහුනම්ජනපද;හේ පැසුළු විල්බාජනපදනම්වී. අදාසි, ඔහුගේ වංශ නැවැතිතැන සිට මලුහට පරපුරුකොටින් දිනි; දෙවගුත්තො, දෙව්ගුත්කුමර; පරිතොදකං, පිරිත්දිය; මඞ්ගලදන්තිමත්ථකෙ, මඟුල්ඇතුගේ මස්තකයෙහි;ලංකාමහාරක්ඛකඨානං, ලක්මහරැව්තැන්; චතුරස්සියභූමිං, සතරැසිබිම්; ධම්මගුත්තො, ධම්ගුත්කුමර; මොරියසෙඨිඨානං, මොරියසිටුතැන්; මොරියජනපදං, මුවරද‍ෘනම්වූ;හේමොරියවංසජවූ ධම්ගුත්කුමරහට දුන්නෙන් මොරියජනපද නම් වී. සුරියගුත්තො, හිරුගුත්කුමර; භිංකාරගාහකඨානං,කොතුරුගානාතැන්; ගොතමො, ගොයුම්කුමර; රත්පැහැඇති මල් බොහෝ ඇතද එකමලක් රත්මල් නම්වනසෙයින් මල්බැයන් ගොත්‍රයෙන් ගොතම වූවද ඔවුන් කෙරෙහිම ගොතමනම් වී. ඡත්තගාහකඨානං, සැත්ගන්නාතැන්; ජුතින්ධරො, ජුතින්ධරකුමර; ආරක්ඛපාරිචරියඨානං, අරක්මේනාතැන්; තෙසු,ඔවුන්කෙරෙහි;සෙඨිකුලජෙඨස්ස,දළ්හනෙමිනම්සක්විත්තාගේ ගැහැවිරුවන්හු පරපුරෙන් බට සිටුකුලෙහි දෙටුවහට; අසිගාහකඨානං,දවරැ අසිපත් ගෙන මහබෝරක්නාකොට තුබූවන් ඝානදෙටු වරදෙටු මල්බෑකොට මහබොයට ඇරදක්වාදින්;බ්‍රාහ්මණකුලජෙඨස්ස, බමුණුකුලදෙටුවහට; බ්‍රාහ්මණරාජඨානං, තමා පිරිවර බමුණන්ගෙන දවසඅවුත් මහබොයට ශාන්තිකරනුකොටනතැන් දින; කුටුම්බියකුලජෙඨස්ස, කෙළෙඹිකුලෙයි දෙටුවහට; උත්තරාපථනායකඨානං,තමා පිරිවර කෙළෙඹියන් ගෙන මහබෝමඟුලෙහි

රන්දිදීඇදද කහතුකොට උතුරුපස්නාතැන්දින;වාණිජකුලජෙඨස්ස, වෙළඳකුලෙහි දෙටුවහට;මහාවාණිජනායකඨානං,තමාපිරිවර වෙළඳගණින් ගෙන සිඩතුපා එලවනු කොට මහවෙළඳනාතැන් දින; ධනුග්ගහකුලජෙඨස්ස, දුනුවාකුලදෙටුවහට; මහාබොධිආරක්ඛඨානං, තමා පිරිවර දුනුවාවන් ගෙන දුනුන්පෑ මහබොයට කැදවූවන් නොබැස්සදෙනුකොට මහබෝඅරක්නානන් දින; පැසුළු ඹුනු කොඩහරරවින් කොටසරෙහි කොප්පරුන් දුනුවාවන්විසින් ඔවුන් හා එක්හු; තරවඡකුලජෙඨස්ස, සරස්කුලෙහි දෙටුවහට; තරච්ඡනායකඨානං, තමා පිරිවර සරසුන් ගෙන සේසත් වඩනු කොට සරස්නා තැන් දිනඃ කුලිඞගකුලජෙඨස්ස, ක්ලිඟුකුලදෙටුවහට; කුලිඞගනායකඨානං, තමා පිරිවර ක්ලිඟුන් ගෙන මහබොයට කවමල් හැරදී මෙහෙ කරනු කොට ක්ලිඟුනාතැන් දින; කප්පකුලජෙඨස්ස, කපුකුලෙහි දෙටුවහට; කප්පනායකඨානං, තමා පිරිවර කපුවන් ගෙන මහබොයට ළදපස්මල්ආහාරාදි මෙහෙ බලනුකොට කපුනාතැන් දින; බලත්ථකුලජෙඨස්ස, බලත්වැදෑරුම්කුලපුත්හට මහබෝගෙදොර රැකවල්ගත්නාකොට;වාරනායකඨානං,දොරනාතැන් දින; පෙසකාරකුලජෙඨස්ස, පෙහෙරකරුකුලදෙටුවහට; පෙසකාරනායකඨානං,මහබෝවඩන දිය පෙරහන පෙරහන්හා ගෙදනු කොට පෙහෙරකරුනාතැන් දින; කුම්භකාරකුලජෙඨස්ස, කුඹුකරුකුලදෙටුවහට; කුම්භකාරනායකඨානං, තමා පිරිවර කුඹලුන් ගෙන මහබොය බත්පුදන්නට බදුන්විල්මලා කරවා දෙනු කොට කුඹුකරුනාතැන් දින; මාලාකාරකුලජෙඨස්ස, මල්කරුකුලදෙටුවහට; මාලාකාරනායකඨානං, තමා පිරිවර මාලාකාරයන් ගෙන මහබොය පලඳවන මලදම් මල්කඩ ගොතා දෙනු කොට මල්කරුනාතැන් දින; ගන්ධකාරකුලජෙඨස්ස, ගඳකරුකුලදෙටුවහට; ගන්ධකාරනායකඨානං, තමා පිරිවර ගඳකරුවන් ගෙන මහබොය පුද වඩනුකොට ගඳකරුනාතැන් දින; සිබ්බකාරකුලජෙඨස්ස, තුනහකුලදෙටුවහට; මහාසිබ්බකනායකඨානං, තමා පිරිවර තුනහසින් ගෙන මහබෝමඩු සදන දදවියන්ජවනිකා විදිකොට මහසීනාතැන් දින-"ශිවු-තනාතුසනනාගෙන" යන ධාතුසි-සූදකුලජෙඨස්ස, අරක්කැමි කුලදෙටුවහට;මහානසරක්ඛිකනායකඨානං,තමාපිරිවරඅරක්කැමියන්ගෙන මුළුතැන්වැද සකස්කොට පුදබත් පිසවාදෙනුකොට මුළුරැකිනාතැන් දින;රැකිය රැකියයනු පයෂීයයි ;කම්මාරකුලජෙඨස්ස, කඹුරුකුලදෙටුවහට; කම්මාරනායකඨානං, තමා පිරිවර සියලු කඹුරන් ගෙන මහබොය කෙහෙ බහන කර කතුරු කියත් කරවා දෙනුකොට කඹුරුනාතැන් දින; ලොහකාරකුලජෙඨස්ස, ලෝකරුකුලදෙටුවහට; ලොහකාරනායකඨානං, තමා පිරිවර ලෝකරුවන් ගෙන මහබෝවගුලට රන්රිදීකැටපත් කරවා දෙනු කොට ලෝ

කරුනාතැන් දීන; සුවණ්ණකාරකුලජෙට්ඨස්ස, රන්කරුකුලදෙටුව හට; අට්ඨතුලකනායකට්ඨානං, තමා පිරිවර තරළුන් ගෙන රන්පිදී වැටඅෑ මඟුල්මලන් කරවා දෙනුකොට අටතෙලිනාතැන් දීන; අට්ඨං අට්ඨං තුලයතීති අට්ඨතුලකො—වඩ්ඪකිකුලජෙට්ඨස්ස, වඩුකුලදෙටුවහට; ලංකාමහාආචරියට්ඨානං, තමා පිරිවර වඩුවන් ගෙන මහබොසමහු ලෙහි මහවියත්මඬුලු හා මහබෝපුදමෙහි මහමඬුලු කරවා දෙනු කොට ලංකාමහඇදුරුතැන් දීන; චිත්තකාරකුලජෙට්ඨස්ස, සිත්තර කුලෙහි දෙටුවහට; චිත්තකාරනායකට්ඨානං, තමා පිරිවර සිත්තරුන් ගෙන මහබෝමුදුනෙහි පුදන ශේසත් තවරනුකොට තවරුනා තැන් දීන; ආතොජ්ජවාදකුලජෙට්ඨස්ස, අතුස්වාකුලදෙටුවහට; පටහ වාදකට්ඨානං, පළවාතැන් දීන; අවුස්වාවැදෑරුම්හට මහබොය තුන් වේලෙහි ගඳව් කරනුකොට මහපළනාතැන් දීන; ඡත්තකාරකුල ජෙට්ඨස්ස, සැත්කරුකුලෙහි දෙටුවහට; ඡත්තකාරනායකට්ඨානං, තමා පිරිවර සත්කරුවන් ගෙන මහබොය පුදන සත් කරවා දෙනු කොට සත්කරුනා තැන් දීන; උය්‍යානපාලකුලජෙට්ඨස්ස, උයන් පලුකුලෙහි දෙටුවහට; උය්‍යානගොපකවිධානට්ඨානං, තමා පිරි වර උයන්ගොවුවන් ගෙන මහබෝපුදන මල්රුක් රෝප ණය කරවා දෙනුකොට උයන්වැදෑරුම් නායකතැන් දීන; "එවමාදිකානං" යන තැන්හි අදිශබ්දයෙන් දුම්ඹියන් දුම් අදීන්ගේ තනතුරු කියත්; සුමිත්තානුමතෙ ඨිතො, සුමිත් කුමරහු කැමැතිපරිද්දෙන් සිට; ගාමවරෙහි සත්තපෙප්ඵසි, නාවින් හෙළා මේරුරුක් මහපලා සරස්නා ඇත්නාගම් ඈ ගම්වරයෙන් සැතපී; පරිහාරාභිසෙකං නාම ඨානන්තරං, පෙරහරබිසෙව් නම් තනතුරක්; හත්ථාල්හකං නාම, උතුළුනම්; ජිනසාසනං සංවඩ්ඪෙසි, නොඑක්දහස් මහගමුන් හෙරණ්සික්මත් මහළුපැවිදි දී ත්‍රිවිධශික්‍ෂා යෙහි හික්මවා බුදුසසුන් පලල්කළෝ; ලංකාසරෙ, ලක්දිව්නමැති විල්හි; ජනකුමුදවනං, ජනනමැති කුමුදුවන; මහාමහින්දචන්දෙන, මහමිහිඳුනමැති පුන්සඳහු විසින්; භාසමානං, දිලිහෙනලද; ගගනසන්නිභං, අකාශතලයක් බඳු- අසොති, කුලස්ස—පුත්ත නත්තාරෙහි සද්ධිං, දරුමුනුබුරන් හා සමඟ; මහාබොධිපරිහාරං, මහබෝපෙරහර, මහාලානවකං, දෙමහලේයන්; බොධිමිත්තාථෙ රීයා, * බෝමිත්තෙරින්; නන්‍දසාමණෙරිං, නන්‍දහෙරණිය; ධවළ

* "බොධිගුත්තාථෙරියා"–බොධිවංස.

වාසසා, ශ්වෙතවස්ත්‍රයෙන්; මාතුනත්තාරං, මෑණියන් මිනිබිරිය; තමා යෙහෙළිය; මහින්දො, මිහිඳුනම්; විධුරින්දො, විදුරිඳුනම්; කස්සපො, කසුප්නම්; සංඝමිත්තො, සංමිත්නම්; ඔහට දුමින්නමුදු කියත්. චුල්ලජයමහාලාඛඩානං, සුත්ලියම්හලේතැන්; පරිහාර මහාසෙඛීඩානං, පෙරහර මහසිටුතැන්; ලංකාපරිසුඩනායකඛීඩානං, ලක්පිරිසිදුනාතැන්; චුල්ලසෙඛීඩානං, සුත්සිටුතැන්; ඉදං, මේ සිරිත්, අනුසංවච්ඡරං; අවුරුදු පතා; පාරිහාරිකජනං, පෙරහර යුක්ත ජනයා; යථාරජ්ජං, රජපමණින්; මහබොධියං අභිසෙකං දපෙසී බුදුනට සෙසින් යෙත් සත්කාර කොට මහබෝයට බිසෙව් දෙදා; සමනන්තා, හාත්පස්හි; විත්ථත, පළල්වූ; ආයත, දික්වූ; නිම්මල, නිම්මලවූ; ජලනිධි, මහමුහුදුම; වසනාය, හන්වස්ත්‍රඇති; මණිගණ, මණිරත්නදීප්තීන්ගේ; ජුතිනිකර, රශ්මිකදම්බයෙන්; සමුජ්ජල, දිලියෙන; රත්නාකර, රුවන්ආකරම; මෙඛලාය, පලන්මෙවුල් ඇති; අමරමිථුන, දිව්‍යමිථුනයන්ගේ; නයනමනොහර, නුවන් මන ගන්නා; ධරණීධර, පර්වතම; පයොධරාය; පින්පියවුරුඇති; වනවසුන්ධරා, වනභූමීන්ගේ; පුළින, වැලිපිට; නිපතිත, වගුළ; කුසුමරජ, මල්රොන්ම; අඞ්ගරාගාය, ගත්තවරඇති: පාටල, රත්වූ; පූගඵල, පුවක්ම; තරළමණිරමණීය, මධ්‍යමමණීන් රම්‍යවූ; සත රඞ්ග, රළසියෝ; ගඞ්ගා, මහගඟම; හාරාය, මුත්හරඇති; සකුසුම, මල්සහිත; පල්ලවභාර, පල්ලවබරින්; හරිත, අවනතවූ; මලයවන ගහන, මලයදෙශයෙහි වනගහනම; ධම්මිල්ලකලාපාය, කෙහෙ කලඹඇති; සුගත, බුදුරජහුගේ; ධාතුපූජා, දළපුදයෙන්; විභූසිත, සැදුම්ලද; අනුරාධපුර, අනුරාපුරම; චන්දනරජනිකරාය, චුවන්සඳ ඇති; දිනකරවංස, සූර්‍ය්‍යවංශයෙහි; සම්භූත, ජාතවූ; මහීපාල, රජ නට; අලංකාරභූතාය, පලඳනාවූ; ලඞ්කාමහෙසියා, ලඞ්කානමැති අග්‍රමහිෂියගේ; මහාවිහාර, මහවෙහෙරනමැති; රත්නමකුට මත්ථකෙ; රුවන්වොටුනුමස්තකයෙහි; මරකතමණිභූතා, මරමිණි තන්පත්; සග්ග, සුගතියට හා; අපවග්ග, නිවනට; මග්ගා, මගවූ; ජන, හුදීජනයන්ගේ; නයනමනොරසායිනී, නුවන්මනසට රස යින්වූ; නමිත, වඳනාලද; අමරනර, දෙව්මිනිසුන්ගේ; මොලිමාලිනී, මෞලිමාලාඇති; මුහුළුපතරඇති; මුනින්ද, බුදුරජහුගේ; නයන, නුවන්නමැති; ඉන්දනීලමණිකලස, ඉන්ද්‍රනීලමණිකලශයෙන්; විනිග්ගත, නික්මෙනලද; අංසුජාල, රස්දැල්නමැති; සලිලාභිසෙක,

සලිලයන්ගේ අභිෂෙකයෙන්; අභිසෙකිනී, අභිෂෙක ඇත්තාවූ; මහාබොධි, මහබෝ; අබ්භන්තරපඤ්ඤා, අභ්‍යන්තර ප්‍රඥ්තයෝ.

එවං, මෙසේ; ලඞ්කාලොකහිතං, ලඞ්කාවාසී ජනයනට හිතද; සාසනවුඩ්ඪිං, සස්නට අභිවෘද්ධිසද; සංසාධෙන්තා, සාධමින්; එස, මේ; මහාබොධිදුමින්දො, මහබෝදුමරජ: ලඞ්කාදීපෙ, ලක්දිව; රම්මෙ, අභිරම්‍යවූ; මහාමෙඝවනස්මිං, මහමෙවුනා උයන්හි; අනෙකබ්භුතයුත්තො, අනෙක අද්භුතයෙන් ආශ්චර්‍ය්‍යයෙන් යුක්තව; දීඝං කාලං, දීර්ඝකාලයෙහි; අට්ඨා, අට්ඨාසි පතිට්ඨාසීති.

## දුමින්දාගමනකථා.

---

"තිසහස්සෙහි" යනතැන්හි තිශබ්දයෙන් පර හිශබ්දයහට ඡන්දොභඞ්ග නොවනුසඳහා ලොප් කෙළේයි; කීයේමැනො—

"ගාථාවජ්ජන්දමභෙදත්ථං සුඛුච්චාරණතාය ච
හොති අක්ඛරලොපොපි අප්පානං බහුතාපි ච" යි.

විභක්තිනිමිත්තයෙන් වූ දීර්ඝයද "නිමිත්තාභාවෙ නෛමිත්තිකස්සාප්‍යභාවඃ" යි නිවෘත්ත වැ "තිසහස්සෙනි" යනු වී.

ගන්ථෙහි තිසහස්සෙහි, තුන්දහසක් ග්‍රන්ථයෙන්; උපෙතං, සමුපෙතවූ; හදයඞ්ගමං, හෘදයහාරිවූ; සුන්දරං, යහපත්වූ; මධුරං, මිහිරුවූ; සුද්ධං, පිරිසුදුවූ, සුභං, ඉෂ්ටවූ; සොතරසායනං, කනට රසයින්වූ—

මහාබොධිවංසං, මහබෝවස්; සුගතොදයෙ, සුගත්හට උදයවූ; නොහොත් උත්පත්තිස්ථානවූ; දුමින්දෙ, දෑමරජයාකෙරෙහි; පසාදෙන, ප්‍රසාදයෙන්; රචයතා, රචනාකරන; මයා, මාවිසින්; යං කුසලං, යම් කුශලධර්මයෙක්; චිතං, උපචිතද; රැස්කරනලදද—

තෙන, ඒ කුශලයෙන්; චිරං තිට්ඨතු සද්ධම්මො, බුදුන්ගේ ධර්මප්‍රදීපය ක්ලෙශාන්ධකාර විධ්වංසනය කෙරෙමින් දීර්ඝකාලයෙහි සිටීවයි; දෙවො සම්මා පවස්සතු, මෙඝයතෙම අවර්ෂ නොකොට අතිවර්ෂ නොකොට අනුප්‍රවාහයෙන් අනුසන්තානයෙන් සම්‍යග්වර්ෂණය කෙරේවයි; රාජානො, රජදරුවෝ; ලොකං රක්ඛන්තු, පරචක්‍රප්‍රවේශයට අවකාශ නොදී තමන්ගේ විෂයෙහි සත්වයන් ධර්මයෙන්

රක්ඛිත්වෙයි; පජ්ජ පදෙපානතු නිබ්බුතිං, සත්‍වයෝ තමන්ගේ අවි මුක්ති තුම්බූපරිද්දෙත් සසරදුක්සපුව නසා ශාන්තද්‍රණීතවූ අමාමහ නිවනට පැමිණෙත්වයි.

අහං තු, මම වනාහි; පරමං බොධිං, උතුම් සම්‍යක්සම්බොධියට; පත්වා, පැමිණ; අනුත්තරං, නිරුත්තරවූ; ධම්මං, දහම්; දෙසෙත්වා, දෙසා; පාණිනො සබ්බෙ, සව්සත්‍වයන්; භවබන්ධනා, සංසාර බන්ධනයෙන්; මොචෙස්සං, මුදම්වා.

යථා, යම්සේ; අංසුමාලිනො, හිරුහට; අස්මිං ලොකෙ, මේ ලොකයෙහි; තමං, අන්ධකාරය; විධංසිතුං, විධමන්නට; ආලොකං කාතුං, ආලොක කරන්නට; එකකාලං, එකවට; සමත්ථතා හොති, සාමර්ථ්‍ය ඇතිවේද.

තථා, එසේම; සංසාරෙ, අපරිඤ්ඤතපූර්වකොටිඇති සංසාරයෙහි; සරතො, සංචරණය කරන්නාවූ; සතො, විද්‍යමානවූ; ලොකස්ස, සත්‍වලොකයාහට; දුක්ඛං නාසෙතුං, දුක් නසන්නටද; සුඛං කාතුං, සැප කරන්නටද; මම, මාගේ; සමත්ථතා, සමර්ථබැව්තොම; සදා, හැමකල්හි; හොතු, වේවා.

සත්තානං, සියලු සත්‍වයන්ට; කප්පරුක්ඛාසමානස්ස, කල්පද්‍රැම යක් බඳුවූ; භවෙ, භවයෙහි; වසතො, වාසය කරන්නාවූ; මය්හං, මාගේ; පඤ්ඤාභගවතී, ප්‍රඥලක්ෂ්මිතොම; සබ්බදා, හැමකල්හි; වුඩ්ඪිං ගච්ඡතු, වැඩියට වැඩීමට යේවා.

මහාබොධිවංශ ග්‍රන්ථිපදය නිමි.

—( සි ද්ධි ර ස්තු )—

# ධම්මප්‍රදීපිකා

## ගැටපද විවරණය.

1 පිට.

,, දිවකුරු බුදුන් හමුවෑ = දීපඞ්කර සර්‍වඥයන්වහන්සේ අභිමුඛවෑ.

,, දස දහස් ලෝදැහි = දස දහස් ලොකධාතුවෙහි.

,, අයජමෙන් = අයදීමෙන්, ආයාචනාවෙන්.

,, පූර්‍වොත්තරදිශාභාගයෙහි= ඊසාන දෙසෙහි.

,, සප්තාහයක් = සත්දවසක්.

,, අනිමිසලොචන යුගලයෙන් = නොපියනලද ඇස් දෙකෙන්.

,, තත්ප්‍රභවවූ ඵලරුහ මහා බොධිය = එම බොධීන්වහන්සේගේඇටයෙන් උපන් බොධිය.

,, තදවයවවූ ශාඛා මහා බොධිය = එහිම කොටසක්වූ අත්තකින් උපන් මහා බොධිය.

,, සහශ්‍ර රශ්මීන් විභක්‍ත = දෙළොසින් බෙදූ, සූර්‍ය්‍යාද්වාදශාත් මක බැවින් තත්පර්‍ය්‍යාය ශබ්ද දෙළසට ගණු ලැබෙත්.

,, පරිකථානුකූල = පිරිවර (විස්තර) කථාවන්ට එකඟ ලෙස.

,, සර්‍වප්‍රාණීයන් නමත්නෙත්= සකලප්‍රාණීයන් තමන් අතට නමන හෙයින්.

,, අයෝග ව්‍යවච්ඡෙදකය= විශෙෂණයා කෙරෙන් පරකොට යොදනලද "එව" යන්න.

2 පිට.

,, අන්‍යයොග ව්‍යවච්ඡෙදකය= විශෙෂ්‍යයා කෙරෙන් පරකොට යොදනලද "එව" යන්න.

,, අත්‍යන්තායොග ව්‍යවච්ඡෙදකය = ක්‍රියාවෙන් පරකොට යොදනලද "එව" යන්න.

,, ව්‍යවච්ඡෙද ඵල = වෙන්කිරීමෙහි ප්‍රයොජනය.

,, විවක්‍ෂා වශයෙන් = කියන්නාගේ කැමැත්ත වශයෙන්,

,, ප්‍රතීත වේමැයි = ප්‍රකාශවේමැයි, හැඟේමැයි.

**3 පිට.**

,, අචින්ත්‍යයහ = චින්තනය නොකළ හැක්කේය.
,, අවාච්‍යයහ = නොකිය හැක්කාහ.
,, අතුල්‍යයහ = සමනොවන්නාහ.
,, අවෙද්‍යයෝයි = දැනගත නොහැක්කෝයි.
,, සිදුහතුළුදු = (සිදුහත් × උළු) අඹ පියල්ලද
,, කළුදු = කළුගෙඩියද
,, සැළුදු = සැළියද
,, ගන්ති = ගතිති
,, පුහුදුන්වැ = පෘථග්ජනව.
,, පිනාගැඹිළිදළින් = උනහපුළු දත්වලින්, නොහොත් ගස් ගොළුබෙලි අගින්.
,, උකුල්දෙනුවක් = ඉස්සීමක්, ආධාරදීමක්.
,, ප්‍රසාද පරවශවැ = පැහැදීමට යටත්ව.
,, ප්‍රවචන = ශ්‍රෙෂ්ඨ වචන, බුදුන්ගේ වචන.
,, ද්වාත්‍රිංසත් මහා පුරුෂ ලක්ෂණ = දෙතිස් මහ පුරිස් ලකුණු.

**4 පිට.**

,, අග්‍ර පාදතලය = පතුල් කොණ, පතුල් අග.
,, පාෂ්ණිය = විලුඹ.
,, භූමිස්පර්ශ = පොළව වැළඳ ගැණීම.
,, සුවර්ණපාදුකා = රත්රන් සෙරෙප්පු.
,, අනෙකශත පෞරුෂ = නොයෙක් සියගණන් පුරුෂ ප්‍රමාණ (බඹයක් පමණ) × ගැඹුර.
,, ඇක්මෙමියි = ආක්‍රමණය කෙරෙමියි, පාගමියි.
,, භස්ත්‍රාසෙයින් = සුලං පිරවූ සම් පසුම් මෙන්
,, භෙරිතලසෙයින් = බෙරඇසමෙන්.
,, උපගතවේ = සමීපවෙයි.

**5 පිට.**

,, ද්වීපිවිය = ගරුදිවිය.
,, හෙම්දුවිය = නිම්වලළු (වංගුවක් අතු) විය.
,, ජාඝිදුවී = බෝස්ගෙඩිද වී.
,, නෙමිමණි = නිම් වළළුවල මැණික්.
,, ප්‍රතිෂ්ඨිත = (මනාකොට) පිහිටි
,, හිදීඅගින් = (නූල් කපින) ඉද්ද අගින්
,, රක්තකම්බල ගෙණ්ඩුකයක් = රතු ලොම් නූල් පන්දුවක්

6 පිට.

| | | |
|---|---|---|
| ,, | තියසිංස තෙලයෙන් හනා. | = ලාටු සහිත තෙලෙන් අනා |
| ,, | ජාතමාත්‍ර කුමාරයක් හුගේ | = එවලේම උපන් ලදරුවකුගේ. |
| ,, | පැණි අත් පැණි පාවෙයි | = පෙණිවැනි අත් හා පෙණිවැනි පා ඇතිවේ. |
| ,, | ජාලකවුළුවක් | = දැල් කවුළුවක්, දැලෙහිමෙන් හිල් ජනේලයක් ඇති. |
| ,, | බොලට | = ඇස්වටය, ගොප් ඇටය. |
| ,, | ඇණපට සෙසින් | = ඇණගැසූ වස්ත්‍රයක්මෙන් |
| ,, | ගුලඵයෝ | = ගොප් ඇට. |
| ,, | අධඃකාය | = ශරීරයේ පහළ කොටස. |
| ,, | හැල් ගැබ් | = ඇල් (ගොයම්) බණ්ඩි. |
| ,, | කුබ්ජ | = කුදු. |

7 පිට.

| | | |
|---|---|---|
| ,, | අපරිපූර්ණ | = පරිපූර්ණනොවූ, අසම්පූර්ණ. |
| ,, | වාමනයන්ගේ | = කුරු (මිට්ට) න්ගේ. |
| ,, | අවහිතවූ | = පිහිටියාවූ. |
| ,, | වස්ත්‍රගුහ්‍ය | = වස්ත්‍රයෙන් වැසියයුතු අවයව. |
| ,, | කාඤ්චන සන්නිභ ඡවක් පරිදි | = රන්වන් සිවියක් ඇති ආකාර. |
| ,, | දූහිගුලෙන් | = ජාතිහිංගුලයෙන්. |
| ,, | ගෛරිකපරිකර්මකොට | = සිවංගුරුවලින් ආලේපකොට. |
| ,, | කනුත් කඳක් | = කාඤ්චන සකන්ධයක්, රන් කඳක්. |
| ,, | උදකබින්දු | = ජලබින්දු. |
| ,, | විවර්තන | = පෙරළීම, නොඇලීම. |
| ,, | ඍතු ග්‍රහණ | = (ශීත උෂ්ණාදී) ඍතු ගැණීම. |
| ,, | වෘත්තශීර්ෂයෙන් | = වත ප්‍රධානකොටගෙණ. |
| ,, | ආවර්තන පයර්‍යවසාන යෙහි | = කරකැවුන කෙළවරදී. |
| ,, | ජාණුමණ්ඩල | = දණමඩල. |
| ,, | කටිප්‍රදෙශයෙන් | = ඉඟටියෙන්. |

8 පිට.

| | | |
|---|---|---|
| ,, | අල්පමාංස රුධිර | = මඳවූ මස් ලේ ඇති. |
| ,, | ශූල සදෘශවූ | = උල්සමානව. |
| ,, | ශිරාජාල | = සිත් නහර සමූහය. |
| ,, | අංසකූටයෙහිදු | = උරහිස් හිදු. |
| ,, | මාංසොත්සද | = මාංසයාගේ උස්බව. |

8 පිට.

| | |
|---|---|
| ,, පූර්වාභිකාය | - පෙරකය, ශරීරයේ ඉස්සරහ කොටස |
| ,, අපරිපූර්ණ | - පරිපූර්ණනොවූ, නොපිරුණු. |
| ,, විනතොන්නතාදි විසින් | - පහත්, උස් ආදීන් විසින්. |
| ,, දුස්සංස්ථිත | - අයහපත්ව පිහිටි. |
| ,, විසංස්ථිත | - විකාරව පිහිටි. |
| ,, වෛචිත්‍ර්‍යයෙන් | - විසිතුරුභාවයෙන්. |
| ,, ප්‍රතිරූපයක් | - සමාන රූපයක්, පිළිරුවක්. |

9 පිට.

| | |
|---|---|
| ,, විතවූ | - වැඩුනාවූ. |
| ,, අන්තරංස | - අංශදෙකටමැද. |
| ,, නිමනවෙයි | - වලවෙයි. |
| ,, විස්තාරයෙනුදු | - පළලෙනුදු. |
| ,, ව්‍යාමයෙනුදු | - හස්තවලයේ දිගිනුදු, බඹයෙනුදු. |
| ,, නිර්ගත | - නික්මීම, පිටවීම. |
| ,, සුවෘත්තවූ | - මනාසේ වටවූ. |
| ,, ග්‍රාසය | - පිඩුකොට අනුභවය, "කුක්කුටාණ්ඩ ප්‍රමාණංවා යථා ප්‍රවිශෙත්මුඛං එතත් ග්‍රාසං විජානීයාත්" කී හෙයින් මුඛපූරවාගත් ආහාරය. |
| ,, රසග්‍රාසාග්‍ර | - රස නහරවලැ අග්‍රය. |
| ,, රසහරණීහු | - රස නහර. |
| ,, ප්‍රතිමුක්තයහ | - බැඳී පවත්නාහ. |
| ,, තිලබීජයක් | - තලඇටයක් |
| ,, අනුස්ඵරණය | - පැතිරීම. |
| ,, පධන් භූමියැ | - වීර්‍ය්‍යකරණ ස්ථානය, දුෂ්කර ක්‍රියා සමයෙහි. |
| ,, එකතණ්ඩුලාදීනුදු | - එක සහල් ඇටයකිනුත්. |
| ,, ශරීරයාපනා | - සිරුර යැපීම, ශරීර පොෂ්‍යය. |
| ,, ඔජස්ඵරණය | - ඔජ පැතිරීම. |
| ,, බහවාබාධ | - බොහෝ ආබාධ. |
| ,, අල්පාබාධතා | - ස්වල්පආබාධ ඇතිබව, නිරෝගිබව, |
| ,, නිශ්‍යන්දඵලවශයෙන් | - ආනිසංස ඵල වශයෙන්. |

10 පිට.

| | |
|---|---|
| ,, අධස්තාත් හනුව | - යටහනුව. |
| ,, උපරිෂ්ඨාත් හනුව | - උඩුහනුව, උඩුතල්ල. |
| ,, සපිරිවනකල | - සම්පූර්ණවනවිට. |
| ,, චත්වාරිං ශද්දන්ත | - සතලිස් දත්. |

10 පිට.

,, කුම්භිරයන් – කිඹුලන්.
,, විරලවෙයි – තුනීවෙයි.
,, පබළ පත්‍රි – ප්‍රවාල පත්‍රයෙක්.
,, පරිච්ඡේද බඳු – පරිහිඳීම් වැනි.
,, පූතිදන්තයෝ – කුණුවූ දත්.
,, කෘෂ්ණ – කළු.
,, සුශුද්ධ ශුක්ල – ඉතාම සුදු, බොහෝ සුදු.
,, සම්භෝගතය – යුක්තය.
,, ප්‍රභූත ජිහ්වා – මහත් හෝ පළල් දිව
,, බද්දිව – බැඳුනාවූ දිව.
,, විෂමදිව – අසමාන දිව, සමනොවූ දිව.
,, කාඩ්ක්ෂා – සැක, අනුමාන.
,, දෙනාසිකාච්ඡිද්‍ර – දෙනාස් සිදුරු.

11 පිට.

,, පයෝවසාන – කෙළවර.
,, කාඩ්ක්ෂාවිනොදනය – සැකදුරුකිරීම.
,, ජිහ්නස්වර – සිදුනු, (කඩවූ) හඬ.
,, පිත්තශ්ලෙෂ්මාදීන් – පිත් සෙම් ආදීන්.
,, අපරිරූඪවන බැවින් – නොවැසෙන බැවින්, නොවලක් වන බැවින්.
,, සමුත්පිතවන – ජනිතවන, උපදින.
,, ආම්‍රඵල – අඹගෙඩි.
,, පක්ෂතාලදී – පියාපත් ගසා.
,, මධුමද මුදිතයන් – මීපැණි බී මත්වී සතුටුවූවන්.
,, ලලිතාරම්භ කෙරෙත් – වංචලවීමට පටන් ගණිත්.
,, ව්‍යාපෘතවූ – යෙදුනාවූ.
,, පක්ෂප්‍රසාරණ – පියාපත් දිගහැරීම.
,, අභිනීලනෙත්‍ර – ඉතා නිල්වන්වූ නෙත් ඇති.

12 පිට.

,, අක්ෂිගුලය – ඇස්ගුලිය.
,, බහල ධාතුක – ඝන සවභාව ඇති.
,, මණිගුලිකා – මැණික් බෝල.
,, ගොපක්ෂම – රතුවස්සෙකුගේ ඇස්ගුල වැනි ඇස් සිදුර ඇති.
,, ආවර්ත්තිතවූ – කරකැවී.
,, සවර්ණඵලකමධ්‍යයෙහි – රත්රන් පුවරුවක් මැද.
,, රජත බුද්බුදයක් – රිදීබුබුලක්.

**12 පිට.**

,, අරුණප්‍රභාරඤ්ජිත – අරුණාලෝකයෙන් රැඳුනු.
,, පශ්චිම භවික – අන්තිම භවයෙහි උපන්.
,, කල්‍පශිඛී – අඹශිඛී.
,, එලශිඛී – එලයක්වැනි හිස්.
,, අස්ථිශිඛී – ඇටවලින් ගැවසීගත් හිස්.
,, කුම්භශිඛී – කළගෙඩිවැනි හිස්.
,, ප්‍රාග්භාරශිඛී – ඉදිරියට නැමුණු හිස්.
,, හිදි අගින් – ඉදිකටු අගින්.
,, පරිමණ්ඩලශිඛී – වටවූ හිස්.

**13 පිට.**

,, ශොභාගෙන් – ලක්ෂණයෙන්; දීප්තියෙන්.
,, මණිගණප්‍රභාසමුජ්ජවලිත– මැණික් සමූහයාගේ ආලෝකයෙන් බබලන.
,, ශ්‍රී විභූති – උතුම් සැපත්.
,, අභිභවමින් – යටත්කරමින්.
,, ප්‍රජ්වලිත – උසස්ව බබලන.
,, තුනුසපුව – ශරීර ලක්ෂණ සම්පත්තිය.
,, සුව්‍යක්ත – අතිශයින් ප්‍රකට.
,, විඥපතය – ඇඟවීම, දැන්වීම.
,, ශරීරාවභාස – ශරීරාලෝකය.
,, විහතාන්ධකාරකොට – අඳුරනසා, කළුවර නැතිකොට.
,, ප්‍රදෙශිකඥතයෙහි – අසජීඥ x ඤූතයෙහි.

**15 පිට.**

,, නියසිළින් – නබ සිඛාගෙන්, නියගින්.
,, පස්බිඳක් – පස්පිඩක්, පස්බින්දුවක්.
,, තුෂ්ණීම්භූත – නිශ්ශබ්දවීම, කථානොකර සිටීම.
,, සියොතක් – පක්ෂියෙක්.
,, සත්දහතළා – එනම් විල ඡද්දන්තවිල.
,, ඛද්‍යොතප්‍රභා – කණාමැදිරියාගේ බැබලීම.
,, කුඤ්චිකාවිච්ද්‍රයක් – යතුරු කපලු සිදුරක්.
,, චූලනීය ලොකධාතු – එනම් ලොකධාතුව, (දහසක් සක්වළට නම.)
,, උපෙතයෙන් – යුක්තවූ හෙයින්.

**16 පිට.**

,, ක්ෂුද්‍රක – කුඩා.
,, සහස්‍රභාගයෙන් ගණිත ලද්දේ – දහසෙන් වැඩිකරණ ලද්දේ.

**16 පිට.**

,, බ්‍රහ්මාණ්ඩය දක්වා – බ්‍රහ්මලෝකය දක්වා.
,, ප්‍රක්ෂේප කෙරෙමින් – දමමින්
,, පරික්ෂයට – හානියට, විනාශයට.
,, අවිෂය – විසයනොවූ, ගෝචරනුවූ.
,, විෂමය – නොසමය, ඒකාකාරනොවේය.
,, මධ්‍යගතවෙයි – මධ්‍යාහ්න කාලයට පැමිණෙයි.
,, ව්‍යාපෘතයහ – යෙදීසිටින්නෝය.
,, වික්ෂිප්තද – එකඟබව නැත්තෝද?
,, ප්‍රමත්තද – ප්‍රමාදබැව් ඇත්තෝද?
,, විලුප්තය – දූන්වීම.

**17 පිට.**

,, නාගාවතීය – නාගයන්ගේ කරකැවීම නොහොත් සිතීම.
,, භූතාවතීය – අමනුෂ්‍යයන්ගේ කරකැවීම ,,
,, යක්ෂාවතීය – යක්ෂයන්ගේ කරකැවීම ,,
,, දේවතාවතීය – දේවතාවන්ගේ කරකැවීම ,,
,, අන්‍යතරයෙක හෝ – එක්තරා එකක් හෝ
,, පිරික්සනකල්හි – පරීක්ෂාකරණකල්හි.
,, නීලකෘත්ස්න සමාපත්ති – නීල කසිණසමාපත්ති,
,, සන්ත්‍රාස – තැතිගැණීම.
,, ජනවනු – උපදවනු සඳහා.
,, අවභාසකෘත්ස්න සමාපත්ති – ඕදාත කසිණ සමාපත්තිය.
,, පාණ්ඩරසන බුඩරශ්මි – සතවූ සුදුපැහැයෙන් යුත් බුදුරැස්.
,, රශ්මි විසගී කෙරෙත් – රැස් විහිදුවත්.
,, වැටූප්මලා – පහන් තැටිල්ලක්
,, චත්තිකාකොට – පහන් තිරයකොට.
,, විසෘට – හරණලද්ද, විහිදුවනලද්ද.
,, අඤ්ජලිප්‍රග්‍රහකොට – ඇඳිලි බැඳීම.
,, ආකොටනයකරන්නේ – ගසන්නේ.

**18 පිට.**

,, ප්‍රසාදපරවශවැ – බලවත් පැහැදීමෙන් යුක්තව.
,, රසාතලයෙහි – පාතාලලෝකයෙහි.
,, විනයප්‍රඥප්තිය – විනය පැණවීම.
,, භූම්‍යන්තරය – අතික් ප්‍රදේශයක, එනම් සාධාරණ නොවන කරුණකට.
,, ප්‍රත්‍යයාකාරය – පටිච්චසමුප්පාද දේශනාව.
,, සමයාන්තරය – අන්‍යදෘෂ්ටි පිළිබඳ දේශනාව.

**18 පිට.**

,, ආපත්ති – වැරදි, දොෂ.

,, සචිකිත්ස්‍යය – පිළියම් කට හැක්කේය.

,, ඡේද්‍යගාමිණීය – සියලු සිල් බිඳයන සුළුය

,, ව්‍යුත්ථානගාමිණීය – දඬුවම්විඳ නිදහස්වියහැකි ඒවාය.

,, දෙශනාගාමිණීය – එනම් ඇවැත්ය, දෙසීමෙන් ශුද්ධ වන ඒවාය.

,, ලොකාවද්‍යය – ලොකයා අතර වරද වශයෙන් ව්‍යවහාරදේ.

,, ප්‍රඥප්තවද්‍යය – පණවනලද වැරදි.

,, අවතීර්ණ වස්තුව – බැසගත් (පැමිණි) කරුණෙහි.

**19 පිට.**

,, ස්මෘත්‍යුපස්ථානයන – සිහිය පිහිටුවියයුතු කරුණුය.

,, සම්‍යක්ප්‍රධානයන – යහපත් වීර්‍ය්‍යයෝය.

,, ඍද්ධිපාදයන – ඍද්ධිය පිහිටුවන කරුණුය.

,, අපර්‍ය්‍යාපන්නයන – කිසිදේකටඇතුළත් නැත්තෝය.

,, චතුර්විංශතිප්‍රත්‍යය – සූවිසි ප්‍රත්‍යය.

,, අවිද්‍යා – මෝහය, චතුරාර්‍ය්‍ය සත්‍යාදිය නොදැනීම.

,, එකත්‍ය ශාශ්වතිකය – සමහරක් සදාකාලිකයයිගත් දෘෂ්ටිය.

,, නොඑරියහැකි – බැසගත නොහැකිවූ.

,, පරමගම්භීර – ඉතා ගැඹුරු, අතිශයින් ගැඹුරු.

,, භුක්තානුමෝදනා – දන් වැළඳුවාට පසු කියන බණ.

,, පස්බත – සවස් කාලයෙහි.

**20 පිට.**

,, සංක්‍රමණ – මාරුවීම.

,, තල්සෙයක් – තල්ගසේ සෙවනැල්ලක්.

,, මතිස්මෘතිධෘතිසම්පන්න – නුවණ, සිහිය, ධාරණ ප්‍රඥව යන මෙයින් යුක්ත.

,, සතරසිවටන්හි – සතර සති පට්ඨානයෙහි.

,, සත්තිස්බොධිපාක්ෂිකධර්ම – තිස්හතක් බොධිපාක්ෂික ධර්ම.

,, නිෂ්පර්‍ය්‍යායයෙන් – පරමාර්ථ ධර්මයෙන්.

,, ග්ලාන දුර්වලවූහුනම් – ගිලන්වීමෙන් දුර්වලවූහුනම්.

,, මවාරොපනයකොට – යහනාවකට නංවා ගෙන.

,, පරිහරණය කෙරෙත්නම් – ගෙනයත් නම්.

**21 පිට.**

,, අවශිෂ්ට කලමැ – ඉතුරු කාලයේදීම.

**21 පිට.**

,, ඛණ්ඩිත්‍යාදීන් = දත් වැටීම් ආදීන්.
,, අනභිභූතවූවාහු = නොමඩනා ලද්දාහු.
,, චෛවර්ණ්‍ය = වෙනස් වර්ණයෙන් යුත්.
,, ප්‍රත්‍යුත්පන්නයෙහිදු = වර්තමාන කාලයේ වූවත්.
,, ජීර්ණපත්‍ර පුටයෙහි = දිරූ පරණලා පතෙක්හි.
,, තප්තනාරාච = රත්වූ යකඩ නාරාසනය.
,, ඥෙයපර්‍ය්‍යන්තයෙහි = දතයුත්තසම්බන්ධ අවසානයෙහි.
,, ආවර්ජනා ප්‍රතිබද්ධ වෙයි = කල්පනාකිරීම පිළිබඳ වෙයි.
,, මනසිකාර ප්‍රතිබද්ධවෙයි = මෙනෙහිකිරීම පිළිබඳ වෙයි.
,, ගොත්‍රභූ = එනම් චිත්තය, පෘථග්ජන ගො
ත්‍රය අනුභවකරණ සිත.
,, භවාඞ්ග අනන්තකොට = භවයට අඞ්ගවූ අර්ථයෙන් එනම්වූ
හිත අවශානකොට.
,, පශ්චිමොත්තර = වයඹකොණ.
,, ධර්ම සම්මර්ශනා = ධර්මය කල්පනාකිරීම.
,, ශීල සන්දීපකවූ = ශීලය පෙන්වන්නාවූ
,, සමාධි සන්දීපකවූ = සමාධිය පෙන්වන්නාවූ.
,, ප්‍රතිමණ්ඩිත = ගැවසුනු; යුක්ත.
,, සමන්ත ප්‍රස්ථාන = පට්ඨාන ප්‍රකරණය.
,, අප්‍රතිඝතවූ = නොහැපෙන්නාවූ.
,, විජෘම්භනයට = වැජඹීමට.
,, ශ්ලක්ෂ්ණවූ = සිනිඳුවූ
,, ප්‍රීති සම්භවයෙන් = ප්‍රීතිය පහළවීමෙන්.
,, ලොහිත ප්‍රසන්නවිය = ලේ පැහැදුනේය.
,, ආවර්ජනාදීන් = මෙනෙහි කිරීම් ආදියෙන්.
,, උෂ්ණලොම්දසින් = උෂ්ණීරෝම ධාතුවෙන්.
,, දලවමින් = බබුළුවමින්, ආලෝක කරවමින්

**23 පිට.**

,, තෙජඃකෘත්ස්නසමාපත්ති= තෙජෝ කසිණ සමාපත්තිය.
,, අප්කෘත්ස්න සමාපත්ති = අපොකසිණ සමාපත්තිය.
,, අනුත්පන්න මාර්ගයහට උත්පාදකයහු = නූපන් මාර්ගයාගේ
ඉපදීම කරන්නාහු.
,, අසඤ්ජාත මාර්ගය = හටනොගත් මාර්ගය.
,, අනාඛ්‍යාත මාර්ගයට = නොකියනලද මාර්ගයාගේ.

**24 පිට.**

,, ආපාථ ගතවෙත් = හමුවෙත්, සම්මුඛවෙත්.
,, ඥෙය අර්ථයෙක් = දතයුතු කාරණයෙක්.

**24 පිට.**

,, අනන්ත බුද්ධඥානයෙහි = බුදුනැණ ඇතුළත.
,, අප්‍රතිහතවූ = පැකිළීමක් නොමැතිව.
,, අන්‍යෝන්‍ය පය්‍ර්‍යන්තස්ථායී = අන්‍යෝන්‍යය (එකිනෙකෝ) කෙළවර සිටිනාහ.

**25 පිට.**

,, සුස්පෘෂ්ට = මනාසේ වැහෙන, එකිනෙක හේත්තුවෙන.
,, අන්‍යෝන්‍යපය්‍ර්‍යන්තස්ථායී= ඔවුනොවුන්ගේ කෙළවර සිටිනාවූ.
,, ආවජ්ජනා ප්‍රතිබද්ධවෙත් = කල්පනාවට බැඳී පවතිත්.
,, ආශයානුශයචරිතාධිමුක්ති = දෘෂ්ටිය, චිරප්‍රවෘත්තක්ලේශය, චරිතය අදහස.

**26 පිට.**

,, පිල්වැටි = පෙළ, පිල්.
,, ප්‍රඥාස්ඵරණ = ප්‍රඥාවගේ පැතිරීම, ප්‍රඥාබලය.
,, අභිසංස්කාරකොටගෙන = සකස්කරගෙන, ගොතාගෙන.
,, ප්‍රභින්නවරවාරණයක්හු = මත්තහස්තියෙක්.
,, සුනිසිත ශස්ත්‍රයෙන් = මනාකොට මුවහත්වූ ආයුධයෙන්.
,, කුමුදුනාළකලාප්සෙයින් = කුමුදුමල් නටු මිටියක්මෙන්.
,, දිව්‍යාගදයෙන් = දිව්‍යඖෂධයෙන්.
,, නිපතිතමානධ්වජ = පහත හෙළනලද මාන නමැති ධ්වජ ඇතිව.
,, දියරට හස් රජක්හු = ධෘතරාෂ්ට්‍රහංස රාජයක්හු.

**27 පිට.**

,, අවෛද්‍යයෝ = නොදත හැක්කෝ.
,, ධර්මකාය = ගුණ සමූහය
,, හිතසුඛාභිනිර්වර්ත්තක = හිතට සැප උපදවන්නාවූ.
,, පාරප්‍රාප්තවූ = පරතෙරට පැමිණියාවූ.
,, මතුප්කොට = එනම්තද්ධිත තු ප්‍රත්‍යයකොට.
,, නෛරුක්ති = නිරුක්ති, ශබ්දශාස්ත්‍රයාගේ මූලස්වභාව නිරුක්ති නම්වේ.
,, දීපිතයැ = දක්වනලදී.
,, රූපකායාතිශයෙහි = අධික රූපකාය සම්පත්තියෙහි.
,, අතුල්‍යඥාන සම්භාරයෙහි = අසමාන ඥානරාශියෙහි.
,, සාතිශයපුණ්‍යසම්භාරයෙහි= අධික පින් රාශියෙහි.
,, නිරුත්තර වීය්‍ර්‍යයෙහි = උතුම් වීය්‍ර්‍යයෙහි.

**28 පිට.**

,, භූතභෞතික විසින් = පෘථිවිය ආදි සතරමහාභූතයන් හා උපාදාය රූපයන්ගේ වශයෙන්.

,, සභාගවිසභාග විසින් = නාමරූප වශයෙන්

,, සනිදර්ශන සප්‍රතිඝ විසින් = නිදර්ශන සහිතව ප්‍රතිඝ සහිතව පවත්නාවුන්ගේ වශයෙන්.

,, අව්‍යාකෘත විසින් = [illegible] සිත් විසින්, කුසල් අකුසල් නොවන සිත් වශයෙන්.

,, හේතුසම්ප්‍රයුක්ත = හේතු හා යෙදුන; හේතුනම්, ලෝභ, ද්වේෂ, මෝහ, අලෝභ, අද්වේෂ, අමෝහ, යෝයි.

,, හේතුවිප්‍රයුක්ත = හේතු රහිත.

,, චිත්තචෛතසික = සිතහා සිතෙහි උපන්නාවූ සිති විලි

,, ප්‍රත්‍යය ප්‍රත්‍යයීභාවයෙන් = හේතුව හේතුවෙන් උපදින්නා යන ස්වභාවයෙන්.

,, උදයව්‍යය = උත්පත්තිය හා නැසීම.

,, අවශවර්තීවන බැවින් = තමහට යටත් කරගත නොහැකි නිසා.

,, කායචිත්තොපධි විවේක = කාය, චිත්ත, උපධි, යන විවේක, විවේක නම් වෙන්වීමයි.

**29 පිට.**

,, හනන්තීහු = හිංසාර්ථයෙහිවූ "හන" ධාතුව.

,, පඨිත = කියූ.

,, ආරාද්ගතය = දුරට ගිය.

,, සපිතය = සිටීම.

,, සවාසනා කෙලශයන් = වාසනා සහිත කෙලෙසුන්; වාසනානම් අනාදිමත් සසර ආ පුරුද්දයි.

,, ඝාතයහ = නසනු ලැබූහ.

,, විධ්වස්තයහ = විශේෂයෙන් නසනලදහ.

**30 පිට.**

,, භවතෘෂ්ණා = භවයෙහි ආශාව.

,, අභිසංස්කාරමය = කළාවූ කුසලාකුසලා නමැති.

,, ආශ්‍රව සමුදමය = ආශ්‍රවයන්ගේ උත්පත්ති නමැති.

,, අනාදිකාල ප්‍රවෘත්තවූ = මුලක් නැති කලෙක්හි පැවැත්තාවූ.

**30 පිට.**

,, අරයෝ – ගරුදි.
,, පරගුව – පොරොව.
,, හතකරණලදහ – නැසීම කරණලදහ.
,, අනවරාග්‍ර සංසාරවෘත්තයම – අගකොණ නැත්තාවූ සංසාර චක්‍රය.
,, මධ්‍යවර්ත්තිවත බැවින් – මැද පවත්නා බැවින්.
,, නිර්වේදජනවා – කලකිරීම උපදවා.
,, අග්‍රදක්ෂිණෙය වන බැවින් – දන්දීමට සුදුසු උත්තමයෙක් වන බැවින්.

**31 පිට.**

,, ස්වයම්භුඥානයෙන් – තමාගේම නුවණින්.
,, අවගමනකළ – අවබොධකළ.

**32 පිට.**

,, ප්‍රාතිමොක්ෂ සංවරශීල – එනම් ශීලය, ප්‍රාතිමොක්ෂයට ඇතුලත් ශික්ෂාපද රැකීමවූ ශීලය.
,, අකම්පාවූ – කම්පා නොවන්නාවූ, නො සෙලවෙන්නාවූ.

**33 පිට.**

,, තිර්යග්ගතියන් – තිරිසනුන්.
,, ගෘහීතවේ – ගන්නාලද්දේවේ.
,, ස්ථානාස්ථාන – කරුණු, නොකරුණු.
,, කර්මසමාදාන – කර්ම පිළිගැණීම.
,, යථාභූත විපාක – වියයුතු පරිද්දෙන් වන්නාවූ විපාක.
,, සර්වත්‍රගාමිණීවූ – සියලු තන්හි යන්නාවූ.
,, නානාධිමුක්තිකත්ව – නොයෙක් නොයෙක් අදහස් ඇතිබැව්.
,, ඉන්ද්‍රියපරාවරතා – ඉන්ද්‍රියන්ගේ උත්තම අධම භාවය.
,, සංක්ලේශ – ධ්‍යානාදිස කිළිටු කරණ.
,, ව්‍යවදාන – පිරිසිදු කරණ.
,, ව්‍යුත්ථාන – නැඟිටින.
,, පූර්වේනිවාස – පෙර වාසස්ථාන.
,, ආශ්‍රවක්ෂය – කෙලශයන් ක්ෂයකිරීම.

**83 පිට.**

„ පඤ්චානන්තර්‍ය කර්‍මය – දෙවන ආත්මයෙහි විපාක දෙන පාපකර්‍ම පඤ්චකය, එනම්, මාතෘඝාතක, පිතෘඝාතක, අර්‍හන්තඝාතක, ලෝහිතුප්පාදක, සංඝභෙදක යනුයි.

„ සමඞ්ගිවූවාහු – යුක්තවූවාහු.

„ අහෙතුක – හෙතු රහිතයක.

„ අප්‍රත්‍යයක – ප්‍රත්‍යය රහිතයක.

**84 පිට**

„ උදෙසන්නටද – අදහන්නටද.

„ ගතිසම්පත්තීන් – ඉපදීම හෙවත් උපන්තැන යහපත්වීමෙන්

„ බාධිතවැ – වැලකී.

„ උපධිවිපත්ති – රූපලක්‍ෂණය විකාරවීම, අවලක්‍ෂණවීම.

„ විවස්ථාපරිදි – විපාකදෙන අයුරු.

„ සර්‍වත්‍රගාමිනී – සියළු ආත්මවල උපදින.

„ ආයතනයන්ගේ – දෙලොස් ආයතනවල.

„ නානාත්ව – වෙනස්බව.

„ හීනාධිමුක්තික – නීච අදහස් ඇති.

„ ප්‍රණීතාධිමුක්තික – උතුම් අදහස් ඇති.

„ පර්‍යුපාසනය – සමීපයෙහි වාසිවීඉඳීම, ඇලීබැඳී සෙවනය.

**85 පිට.**

„ පරිවර්‍ජන – දුරුකිරීම.

„ ප්‍රතීත්‍යසමුත්පන්නයක – ප්‍රත්‍යයෙන් උපන්නාහුය.

„ අනුලෝමික ක්‍ෂාන්තිය – අනුලෝමිකවූ ඉවසීම.

„ යථාභූතඥානය – තත්වූ පරිදි දැනගතහැකි නුවණ.

„ කාමරාගානුශය – චිරප්‍රවෘත්තියෙන් තදබවට පැමිණි කාමරාගය.

„ ප්‍රතිඝානුශය – චිරප්‍රවෘත්තියෙන් තදබවට පැමිණි ක්‍රොධය.

„ මානානුශය – චිරප්‍රවෘත්තියෙන් තදබවට පැමිණි චිත්තොන්නතිය.

„ දෘෂ්ට්‍යනුශය – චිරප්‍රවෘත්තියෙන් තදබවට පැමිණි මිථ්‍යාදෘෂ්ටිය.

35 පිට.

,, විචිකිත්සානුශය – චිරප්‍රවෘත්තියෙන් තදබවට පැමිණි සැකය.

,, භවරාගානුශය – චිරප්‍රවෘත්තියෙන් තදබවට පැමිණි භවාසාව.

,, අවිද්‍යානුශය – චිරප්‍රවෘත්තියෙන් තදබවට පැමිණි මුළාව.

,, අනුශය – ඒ ඒ කෙලෙශයෙන් ඉතිරිව පවත්නා තද කොටස.

,, පුණ්‍යාභිසංස්කාර – කුසල් සිත් තෙළෙස.

,, අපුණ්‍යාභිසංස්කාර – අකුසල් සිත් දොළොස.

,, ආනඤ්ජාභිසංස්කාර – අරූපාවචර සිත් සතර.

,, ස්ත්‍යාන – ථීනය, නිදිමතට ආසන්නවූ සිතේ අලසකම.

,, ඖද්ධත්‍ය – උඩගුකම.

,, අහ්‍රීක – ලජ්ජා නැතිකම.

,, අනපත්‍රපා – පාපයට භයනැතිකම.

,, මහාරජස්කවූ – අධික කෙළෙස් ඇති,

,, අනාසෙවිත – සේවනය නොකළ.

,, අබහුලීකෘත – නැවත නැවත සේවනය නොකරණලද.

,, අනුත්සාදකෘත – උත්සාහ වශයෙන් නොකළ.

,, අධිමුක්ති – අදහස්.

,, දුර්විඥාප්‍යසත්වයනුදු – දුකසේ අවබෝධකර විය හැකි සත්වයනුදු.

,, ස්වාකාර සත්වයනුදු – හොඳකාර ඇති සත්වයන්

,, සුවිඥාප්‍යසත්වයනුදු – පහසුවෙන් අවබෝධකර වියහැකි සත්වයනුදු.

,, අහෙතුක ප්‍රතිසන්ධි – කුසල හේතුන් නැති උත් පත්තිය.

,, නීවරණ – කාමච්ඡන්දාදි අකුසල් පස.

,, අභව්‍ය සත්වයන් – නිවන් දක්නට නොහැකි සත්වයන්.

36 පිට.

,, ඉන්ද්‍රියපරාවරත්‍යාඥානබලයයි – එනම් ඥාන බලයයි.

,, භාජනභාගීයවූ – පිරිහෙනකොටසටඅයත්වූ

,, සංක්ලෙශයන් – කිළිටිවීම්.

**36 පිට.**

,, ව්‍යවදාත ධර්මයන් – පිරිසිදුකරණ ධර්මයන්.
,, ව්‍යුත්ථාන – නැගිටීම.
,, කාබුන් – කයබිඳීම.
,, උපවාද – නින්ද
,, ක්ෂීණාශ්‍රවයෙමි – ක්ෂයකළ කෙලෙශයන් ඇත්තෙක්මි.

**37 පිට.**

,, නෛර්‍ය්‍යාණික – නිවණට පමුණුවන.
,, ප්‍රත්‍යවේක්ෂා කරණ – කල්පනා කරණ
,, සෞම්නස්‍යමය ඥානය – සොම්නසෙන්ම උපත් නුවන.
,, දියමෙරලිය මල් – එනම් මල්.

**38 පිට.**

,, රතිඳුගොව් – පොළොවයට සිටින පණු වර්ගයක්.
,, ව්‍යවමාන – මැරෙන්නාවූ
,, උත්පාද්‍යමානාදී – උපදින්නාවූන් ආදීවූ.

**39 පිට.**

,, ස්වර්ගගත – ස්වර්ගයට පත්.

**40 පිට**

,, අල්පරජස්කාදී සත්වයන් – ස්වල්ප කෙළෙස්ඇති සත්වයන්.
,, ප්‍රකර්ෂ පර්‍ය්‍යන්තප්‍රාප්තවූ – අතිශයින් කෙළවරට පැමිණියාවූ.
,, අත්‍යන්තරසේ – ඉක්මගිය සීමා ඇතිබව, තමන් අසමත්වූ ආකාරය.

**41 පිට**

,, හරිසඳුන් – සුදුහඳුන්.
,, ප්‍රාපිතය – පත්කරණ ලද්දේය.
,, පරිතෘප්ත – තෘප්තියට පැමිණි
,, බුභුක්ෂා පිපාසා පරිපීඩිත – ක්ෂුධා පිපාසා දෙකින් පීඩිතවූ

**42 පිට.**

,, හරිචන්දන ඝටිකාව – කහලසඳුන් ගැටය
,, ලෝහිතචන්දන ඝටිකාව – රත්සඳුන් ගැටය.
,, සුරභිගන්ධයෙන් – මනා සුවඳින්
,, ප්‍රමුදිතවේද – සතුටුවේද
,, භිෂග්වරයක්හු – වෙදෙක්හු.
,, ඝර්මාභිතප්ත – ඝර්මයෙන්පීඩිතාවූ, ග්‍රීෂ්මයෙන් පීඩිතවූ.

**42 පිට.**

,, සඞ්දරථකලමථපරිදහයන් – සියලු පීඩා කලාන්ත, දූවිලි.
,, පිඞ්යානීහු – එනම් බමුණෙක්.
,, අනින්ද්‍රියබද්ධවූ. – ඉන්ද්‍රිය ප්‍රතිබද්ධනොවූ ජීවිතය නැති.

**43 පිට.**

,, උපස්ථානකොට – සඞ්ග්‍රහකොට, උවටැන්කොට
,, විනිර්මුක්ත – වෙන්වූ, මිදුනු
,, අනාගාරිකරත්නය – ගිහිගෙයි වසන ගෘහස්ථ රත්නය.
,, ශෛක්ෂරත්නය – අර්හත්ඵලයෙහි පිහිටි පුද්ගලයා හැර ඉතිරි ආර්ය්‍ය පුද්ගලයෝ සත්දෙන.
,, අශෛක්ෂරත්නය – අර්හත්ඵලයෙහි පිහිටි පුද්ගලයා.
,, සමථයානික රත්නය – රහත් සෘද්ධිප්‍රාතිහාර්ය්‍ය පෙන්විය හැකි උත්තමයෝ.
,, කදලිවන – කෙසෙල්වන, රඹවන.
,, විශෙෂභාග්වන බැවින් – විශෙෂ කොටස් ඇත්තෙක් වන බැවින්.
,, ප්‍රතිවෙධකළ – අවබොධකළාවූ.

**44 පිට**

,, විවික්තාසනයෙහි – විවෙක ස්ථානයෙක්හිවූ ආසනයෙහි.
,, භික්ෂාචාරවේලා – පිණ්ඩපාත වේලා.
,, ලාරසෙන් – ලාක්ෂාරසයෙන්, ලාකඩ වතුරෙන්.
,, රත්පමුදමෙකින් – රත්රන් සවඩියකින්.
,, කඤ්චුකයකින් – සැට්ටයකින්.
,, ප්‍රාදුර්භූතවූ – පහලවූ.
,, පාත්‍රස්ථවිකායෙන් – පාත්‍ර පසුම්බියෙන්.
,, ජාලාවනද්ධකරතලයෙහි – ජාල ලක්ෂණයෙන් යුත් අත්ලෙහි.
,, යුවලකින් ගෙන – දෙඅතින් ගෙන.
,, ගන්ධකුටියෙන් – ගඳකිළියෙන්
,, නිර්ගත – නික්මුනු
,, සංශොධනය – ශුද්ධකිරීම.
,, ආතපනිවාරණය – අව්ව වැළැක්වීම.

**44 පිට.**

,, උත්තතස්ථාන – උස්තැන්.
,, හස්ත්‍රාසෙයින් – (සුලංපිරවූ) සම්පසුම්බිමෙන්
,, ඇක්මෙනකල – පැමෙගන කල්හි.
,, පුලිනතලා – වැලිතලා.
,, සින්දූරසුනු – එනම් රක්තවර්ණ චූර්ණය.
,, යන්ත්‍රනාලිකායෙන් – යන්ත්‍රනළයෙන්.
,, එපියෙස් – ඒ ප්‍රදෙශය, ඒ පලාත.
,, රවනය – රාවය, ශබ්දය.

**45 පිට.**

,, පරිතුෂ්ටවැ – සන්තොෂව, සතුටුව.
,, සුවර්ණපටප්‍රාවරණ – සුවර්ණමයවූ වස්ත්‍රයකින් පෙරවීම.
,, චරණනඛමයූඛයෙහි – පා නිය (පාදනඛ)රශ්මියෙහි
,, නිගරණය – වැගිරීම.
,, ජවනිකා – තිර.
,, විවිධද්‍යුතිනිකර – අනෙකවර්ණ කාන්ති සමූහය.
,, උත්ථිතවැ – නැඟිට.
,, ප්‍රඥප්ත බුද්ධාසනයෙහි – පනවනලද බුද්ධාසනයෙහි.
,, මණිවර්මවර්මිත – මැණික් සන්නාහයෙන් සැරසූ මැණික් සැට්ට පෙරවූ.
,, යථාවාදීතථාකාරී – කියන්නේ යම්සේද, එසේම කරන්නා.
,, යථාකාරීතථාවාදී – කරන්නේ යම්සේද, එසේම කියන්නා.
,, රජොජල්ලිකා – රජස්දැලි.
,, මණිසොපානඵලකයෙහි – මැණික්ගලින් සැදූ ඉනිමං පෝරුවෙක.
,, අප්‍රමත්ත – ප්‍රමාදනොවී.
,, පහසින් සොඬපුරුෂයෙක් – සුවඳ ආලෙපයෙහි ලොල්වූ මිනිහෙක්.
,, ශිරඃස්නාත – ඉසේ නෑම.

**46 පිට.**

,, සොහොඹුමල් – මාධවීමල්.
,, පලාලපුඤ්ජපරියන්ත – පිදුරුගොඩ කෙළවර
,, සුරභිගන්ධ – මනාසුවඳ.

46 පිට.

,, පුෂ්පෝපහාර – මල්පිදීම.
,, රිසිපුතෝවීතම් – රිසිවීතම.
,, සමෘති සමප්‍රඥානයෙන් – සිහියෙන් හා මනාදැනී
මෙන්.
,, මුහුර්තයෙක්හි – මොහොතෙක්හි, දෙපැයක්
පමණ කාලයෙහි
,, සත්‍රාය ස්ථානයෙහි – සැපවූ ස්ථානයක.
,, විතර්කයක් – කල්පනාවක්.
,, නුවණ පද වික්‍රම – ඥානගතිය.
,, සන්නිපතිත – රැස්වූ.
,, සමුත්පාන – උපන්නාවූ.
,, ප්‍රතිවෙධගම්භීරවූ – දැනගැන්මට ගැඹුරුවූ

47 පිට.

,, දශනඛ සමවධානයෙන් – නියපොතු දහය එකතු
කිරීමෙන්
,, සුසම්මෘෂ්ටවූ – මනාව මට්ටම්වූ,
බොහෝසේ මට්ටම්වූ
,, මුක්තා ජාලා – මුතුදැල්,
,, සින්දුවාර සංස්තර – නිකමල් ඇතිරියක් වැනි.
,, ජලශාටිකා – දිය සළු.
,, සුනිවස්තව, – මනාකොටහැඳගෙන
,, සුප්‍රාවෘතව, – යහපත්සේ පොරවාගෙන
,, මුහුර්තයක් – දෙපැයහමාරක කාලයක්.
,, අභිෂික්ත ගාත්‍ර – තෙමනලද ශරීර.
,, මකුට මණිරශ්මීන් – ඔටුන්නෙහි මාණික්‍ය
රශ්මීන්.
,, යථාභිසංස්කෘතවූ – යෝජනාකරගත්තාවූ,
සකස්කරගත්තාලද
,, සමෘති සම්ප්‍රඥාන – සිහිය හා නුවණ.

48 පිට.

,, කෘතත්‍යාධිකාරවූ – පෙර කරණලද පින්
ඇත්තාවූ.
,, පරිපාකය – පැසීම, මිරිකීම.
,, අවක්‍රාන්ත – බැසනාලද, පැමිණීම.
,, තියමුර – තුන්යම් රාත්‍රියෙහි.
,, අත්‍යවිහිත – අනිත් අරමුනකයෙදූ,

**48 පිට**

,, සපථකලේ - දිවුලේ.

,, සූවිපාශයෙන් - ඉදිකටුමලින්.

**49 පිට.**

,, ප්‍රසාදනුරූප - පැහැදීමට සුදුසුවූ.

,, අචින්ත්‍යවූ - චින්තනය නොකළහැක්කාවූ, සිතියනොහැක්කාවූ.

,, සල අස්න - ගල්ආසනය.

,, පාදපීඨ ශයනාසනාදි - පාපුටු සැතපෙන ආසනාදී.

**60 පිට.**

,, එක කර්මොපබාහිත - සමාන කර්මයෙන් රැස්කළ.

,, තත් තත් ස්ථානයෙහි - ඒ ඒ තැන.

**60 පිට.**

,, අප්‍රධාන්‍ය - අප්‍රධාන.

,, මහේශාක්‍ය - ප්‍රධාන.

,, සමුජ්වීත - නැගී.

,, තල්පත්බොලට - තල්කොළේ ගතකමට.

,, මොනරගකුරට - මොනරුගිලිනගල්කැටයට

**61 පිට.**

,, සාජීවාහක - ගැල්පදවන්නා.

,, යුබැවින් - කියනලදහෙයින්.

,, අන්වයෙහි - වංශයෙහි, පරම්පරාවෙහි.

,, ලාභය - ග්‍රහණය, ගැණීම.

,, මට්ටයකොට - කළඹා.

,, මණ්ඩුසථවූ - ඇඳේ පිහිටියාවූ, උන්නාවූ.

**62 පිට.**

,, පර්‍යායයි - සමානාර්ථයි.

,, අභිධෙය - නාමය.

,, නිවෘත්තියැ - වැළකීමෙහි.

**63 පිට.**

,, සංවර්තයෙක් - අනන්තකල්පවිස්සක්.

,, ජවාලොපච්ඡෙද - ගිනිනිවීයාම, ද අවසන්වීම.

**64 පිට.**

,, සිදුහතු රැසක් - අබගොඩක්.

,, කල්පාන්තයකට - කල්පයෙන් කොටසකට.

,, කල්පිත වන බැවින් - කල්පනා කරණලද බැවින්.

,, විස්තාර - පළල.

,, භවෘ - භාවනාකොට.

**46 පිට.**

,, අගනීන් දග්ධවේ – ගින්නෙන් දැවේ, ගින්නෙන් නැතිවේ.

,, ප්‍රණීත – උතුම්, ශ්‍රෙෂ්ඨ.

,, විලීනවේ – දියවේ.

**55 පිට.**

,, ප්‍රණීත විසින් – උත්කෘෂ්ට වශයෙන්.

,, අධොදෙශය – පහළ කොටස.

,, විධ්වස්තවේ – නැතිවේ.

,, පුනරුත්පත්තිය – නැවත උත්පත්තිය.

,, ජාත වාතයෙන් – හටගත් සුළඟින්.

,, උදකස්කන්ධය – ලොකය නැතිවූපසු ගලන ජලකඳ.

,, සංස්ථිත – පිහිටීම.

,, නිර්බීජවායුහුගේ – උත්පත්ති හේතුවක් නැත්තාවූ වාතයාගේ.

,, ආධිපත්‍යයෙන් – අධිපතිභාවයෙන්, ප්‍රධානත්වයෙන්.

,, උද්භූත – ඉපදීම, හටගැනීම,

**56 පිට.**

,, චක්‍රවාලාන්තරය – අනික් සක්වළක්.

,, ප්‍රතික්ෂෙපකෙරේ – බහාලීම කරත්, දමත්.

,, වෘත්තයෙහි – රවූමෙහි.

**57 පිට.**

,, උෂ්ණයෙහි – උෂින්.

,, බොල – ගනකම්.

,, අඛාඞියෙන් උනුවැ – භාගයෙන් භාගයක් අඩුව.

**58 පිට.**

,, ආදර්ශතලය – කැඩපත

,, ශකට පඤ්ජරය – කරත්ත තට්ටුවක්.

,, මහරීරුක – එනම් ගහ, මාරුගහ.

,, අන්තර්භූතවූ – ඇතුළත්වූ.

,, සිත්පළොල් – එනම් රුක, චිත්‍රපාටලී.

,, කල්පස්ථායී – කල්පයක් සිටින්නාවූ.

,, ගෘහපති මහාසාරකුලය – මහාධන සම්භාරයක්ඇති ගොවිකුලය.

**59 පිට.**

,, පශ්චිමාන්තයෙන් – අන්තිම කෙළවරින්.

59 පිට.

,, ශරීර සම්බාහනා = ශරීරයේ අත්පාමැඩීම, හෝ මිරිකීම.

,, විභවානුරූපකොට = පොහොසත්කමේ හැටියට.

,, උවත්තනාදී = ඇඟඉලීම් ආදි.

,, සාමථ්‍ය = සමර්ථකමේ හැටියට, පුළුවන්කමේ හැටියට.

,, සඤ්චයකිරීම = රැස්කිරීම්.

,, ආහුනෙය්‍ය වන බැවින් = පූජාලැබීමට සුදුසු වන නිසා.

60 පිට.

,, අවිජහිත = අත්නොහරිනලද.

,, මුදිතා = සතුටුබව.

,, කලත්‍රපරිග්‍රහ = භාර්‍ය්‍යාවන් ගැණීම

61 පිට.

,, උපෙක්ෂා = මධ්‍යස්ථවීම.

,, ශික්ෂණ = උද්ග්‍රහණ ඉගණීම.

,, අභිසංස්කෘත = හොඳකාර සකස්කොට.

,, ප්‍රතිග්‍රහණයට = පිළිගැණීමට.

,, අභී වන බැවින් = සුදුසු වන බැවින්.

,, අපෙක්ෂාකළ = බලාපොරොත්තු.

,, පරිහරණය = ඒ මේඅත ගෙනයාය, පොෂ්‍ය කිරීම.

,, අඞ්ගසම්බාහනයෙනුදු = අතපය ආදිය මැඩීමෙනුදු.

62 පිට.

,, හිනු පමණ = ඉණ ප්‍රමාණ, උකුල් උසට.

,, ආපාදකයන = වඩනයකළ ඇත්තෝය.

,, ප්‍රතිපාදකයන = නැවත නැවතත් වඩනය කළ අය.

,, ප්‍රවර්තකයන = ජීවිතය පැවැත්වූ ඇත්තෝය.

62 පිට.

,, සන්තෘපනකොට = තෘප්තියට පමුණුවා.

,, පුස්නේ = පොෂණය කරන්නේ.

,, මත්සරයන් = මසුරුවූවන්.

63 පිට.

,, පුණ්‍ය ප්‍රසව = පින්රැස්කිරීම.

,, මිථ්‍යා ප්‍රතිපන්න = වරදවා පිළිපන්.

59 පිට.

,, අනවරාග්‍ර = අවරකොන නැති, අග කොන නැති.

64 පිට.

,, සමශකොට = රාශිභූතකොට, රැස්කොට.

,, අනාවරණඥානයෙන් = එනම් ඥානයෙන්, ආවරණයක් නැති ඥානයෙන්.

,, අනුගමනකොට = අවබොධකොට.

,, අමතවූ = නොදන්නාලද.

,, අඥාතවූ = නොදන්නාවූ.

,, පරිදෙවනා = හැඬීම.

,, රොගග්‍රස්තකල = රෝග ගවගත් කල්හි.

65 පිට.

,, ප්‍රාචීන පාශ්චිය = නැගෙණහිරපැත්ත.

,, සඵටික = පළිඟු.

,, පලඟ = පලගැටියෝ.

,, දූරිළු = ජතිවල දරිකව.

,, පූර්වාපරකොටිඇති = පූර්වකෙලවර හා අවර කෙළවර ඇති.

,, පිරිවැටෙන = පරිවර්තනය වන්නාවූ.

66 පිට.

,, තිරෙළුවැ උපන්කලැ = එළුව උපන් කාලයෙහි.

,, පලෙළුවැ = බැටළුව.

,, සොරහයි = සොරායයි.

,, කාම්පලාසොරහයි = මංපැහැරූ සොරායයි.

,, කෘපණවූ = දිළිඳුවූ.

,, දුස්සංස්ථාන හස්තපාද = අවලක්ෂණ අතපය.

,, සන්නිෂ්ඨාන = සනිටුහන්, නිශ්චය.

,, හස්තිස්කන්ධවරගතවූ = ඇත්කඳපිටට නැගුනාවූ.

,, කර්මානිලවෙගයෙන් = කුසල අකුසල කර් නැමැති වාතවෙගයෙන්.

67 පිට.

,, විෂයොපභොගයෙන් = පඤ්චකාමසෙවනයෙ.

,, ජලනිධියෙහි = සමුද්‍රයෙහි, මුහුදෙහි.

68 පිට.

,, ප්‍රජ්වලිත = ගින්නෙන් බබලන.

,, පරශුවින් = පොරවෙන්.

,, අසනිඝොෂ = හෙනහඬ.

68 පිට.

| | |
|---|---|
| ,, උක්දඹු කලඹක් | = උක්ලි මිටියක්. |
| ,, ක්‍ෂාර ධූමයෙන් | = කාරම් සහිතවූ දුමෙන්. |
| ,, රක්තලොහිතජ්වාලායෙන් | = රතු ලේ දැල්ලෙන්. |
| ,, අභිභූත | = මැඩුනාවූ, මිරිකුනාවූ, |
| ,, ප්‍රකර්ෂයෙන් | = බොහෝසෙයින්. |
| ,, භෛරවරූප | = භයානකරූප, භය උපදවන රූප. |
| ,, ආදීප්ත | = ගිනිගෙන දිලියෙන්නාවූ. |
| ,, ක්‍ෂාරවාත | = කාරම්වාතය. |
| ,, අයශ්ශූල | = යකඩඋල්. |

69 පිට

| | |
|---|---|
| ,, ජ්වාලායෙනුදු | = ගිනිදැල්වලිනුත්. |
| ,, වීචි නැති | = අතරක් නැති. |
| ,, අනන්තරපර්යාය | = අනන්තර සහ අවීචි. |
| ,, තුඹුපිපිසෙයින් | = ඒයම් කුඹුමෙන්. |
| ,, සඋපෙක්‍ෂා සහගත චිත්තයෝ | = දුක්සැපදෙකට මිශ්‍රවූ සිත්. |
| ,, සමවූ බිඳුවක් | = මිපැනි සහිත බිඳුවක්. |
| ,, අනුද්ඝාතය | = දූවීම. |
| ,, උත්සාද්නරකය | = එනම් නරකය, ඔසුපත් නරකය. |

70 පිට.

| | |
|---|---|
| ,, සච්මහාරජයෙහි | = චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි. |
| ,, පූර්වොක්තක්‍රමයෙන් | = පෙරකියනලද ආකාරයෙන්. |

71 පිට

| | |
|---|---|
| ,, තුල්‍යවූ | = සමවූ, සමානවූ. |
| ,, අවයවභූතවූ | = කොටස්නුවූ, කොටස්වූ. |
| ,, මගධනැළියෙන් | = මගධරටේ නැළියෙන් (මගධනැළියනම් පලම් දෙළහහමාරකි, මගධනැළි එකහමාරක් ලංකාවේ නැළියකි. |
| ,, විසිකොටසකින්වැඩි | = විස්සෙන් වැඩිකල ගණන. |

72 පිට.

| | |
|---|---|
| ,, ආතිස්වරයෙන් | = බැගෑපත් හඬින්. |
| ,, කම්පමානවූවනු | = සෙලවෙන නැනැත්තෝ. |

**72 පිට.**

,, ප්‍රකම්පිතව – අතිශයෙන් වෙව්ලා.
,, කර්මාරහසත්‍රාවක් – මයිනහමක්.
,, ආදිප්ත = ගිනිගෙන දිළිසෙන්නාවූ.
,, පාපක්ෂය = පව්ගෙවීම.
,, එක්පලයක් – එක පියස්සක්.

**73 පිට.**

,, කුඨාරයෙන් – කෙටේරියෙන්.
,, ලෝහිත නදීවෑ – ලේ ගඞ්ගාවක්ව.
,, සූත්‍රාහතකොට – නූල්ගසතලද්දක්කොට.

**74 පිට.**

,, චක්‍ර, කූබර, ප්‍රතොද – රෝද, අලවංගු, කෙවිටි.
,, මහාමුද්ගරයෙන් – මහාමුගුරකින්.
,, ප්‍රක්ෂෙප කෙරෙත්. – දමත්, හෙලත්.
,, ලොහකුම්භිය – ලොහකුඹුනරකය
,, තීව්‍රවූ – තියුණුවූ.

**75 පිට.**

,, නෙරයිකතුන් – නිරයේ උපන් සත්වයන්.
,, චතුෂ්කර්ණ – කොන් හතරක්ඇත්තේය.
,, අයෝමයවිභ්දන – යකඩමවූ පියස්සක් ඇත්තේය.
,, සඳල – ඉඩ්ජාලා, ගිනිදල් සය
,, මූළුළුවෙ – සියල්ලම් අළුවේ.

**76 පිට.**

,, සුවිමුඛවූ – සියුම් මූන ඇත්තාවූ, ඉඳිකටුමූනමෙන් තුඩුඇති.
,, කූටාගාරමාත්‍ර – කූළුගෙයක් පමණ.
,, ආදිප්ත හස්මයෙන් – ගිනිඇවිලෙන අළුවලින්.
,, කොද්‍රවරාශිය – අමුනම් ධාන්‍යරාශිය.
,, සිවැල් පලුසෙයින් – හිවල්නම් සතඩ පොදු මෙන්,

**77 පිට.**

,, ශාල්මලිවනය – ඉඹුල්වනය.
,, කණ්ටකය – කටුඇත්තේය.
,, ආදිප්තයෑ – ගිනිඇවිලගන්නාලද්දේය.
,, සජෝතීභූතයෑ – ගිනිදල් සහිතය.
,, වෑම්හෙන පත්‍රයෝ – වෑටෙනකොල.
,, එලකමශයහි – ලීකඳක් මතුයෙහි.

**76 පිට.**

,, කරවැල් = එනම් කටු සහිත වැල් වර්ගයක්.

**77 පිට.**

,, වෙත්‍රලතා = වේවැල්.

,, ආවර්තයෙහි ගැලී = (දිය) සළාවේ ගැලී.

,, ක්ෂාරෝදිකා වෛතරණී නදිය = කාරම් වතුර ඇත්තාවූ එනම් අපාය.

,, කුමක් රුස්වහි = කුමක් කැමැත්තෙහිදැයි.

,, ලෝහොපැසින් ලඟ කෙරෙත් = අයෝමය පච්ජියෙන් (යකඩින් කල පැසින්) ලංකරත්.

,, උත්‍රසතවූ = තැතිගැනී.

**78 පිට.**

,, ලෝහොඩුවින් = ලෝහමයවූ කිණිස්සෙන්.

,, සණ්ඩාසෙන් = අඬුවෙන්.

,, ප්‍රක්වථිත = පැහුනු, තකියන ලද.

,, අනුලෝමයෙන් = පිළිවෙළින්, අනුක්‍රමයෙන්.

,, ප්‍රතිලෝමයෙන් = පිළිවෙළට විරුඩ ක්‍රමයෙන්, අගපටන් මුල දක්වා.

,, අපරික්ෂීණකලැ = (කර්මය) නොගෙවුනකලැ.

,, සඝොතසද = ඔසුපත් තරක සහිතවූ.

,, සැමි සුහුරු හුස්නට අවඥා කලාහු = ස්වාමියාටද, මාමාටද නැන්දටද, නින්ද කලාහු.

,, සනතර්ජිත කලාහු = භයගැන්වීම කල අය.

,, අභ්‍යාඛ්‍යාන = අහේතුක දෝෂාරෝපණය.

**79 පිට.**

,, ඇක්මෙමින් = පැගෙමින්.

,, ශකතිශූල ඇති = අඩයටි හා උල් ඇති.

,, අඞ්ගාරකර්ෂූයෙහි = අඟුරු වළෙහි.

,, දුස්සහවූ ආතපයෙන් = ඉවසිය නොහැකි අව්වෙන්.

,, බින්නදෙහ = පිඩිත ශරීර.

,, ඝනනීලදල = ඝනවූ, නිල්වූ පත්‍ර.

,, පත්‍රශස්ත්‍රශතපාතයෙන් = පත්‍ර නැමති ආයුධ සිය ගණන් වැටීමෙන්.

,, විභින්නදෙහ = විශෙෂයෙන් බිඳුන ශරීර.

,, අග්නිභූෂණයෙන් = ගිනි අලංකාරයෙන්, ගිනි ඇඳුමෙන්.

,, විභූෂිතවූ = සැරසුනාවූ.

,, ප්‍රෙමාධික ප්‍රණයෙන් = ප්‍රෙමයෙන් අධිකවූ ප්‍රීතියෙන්,

**79 පිට.**

" කෘපානැති = කරුණා නැති.
" භීෂණ, විෂම පර්වතොපම = භයානක විෂමවූ, පර්වත වැනිවූ.
" එඑ යුගලයන්ගේ = එඑවන් දෙන්නෙකුගේ.
" සඞ්ඝට්ටනයෙන් = හැපීමෙන්, හැපීමෙන්.
" මූළුලුව = ඉතා මොළොක් ශරීර ඇතිව
" පූන පූනා = නැවත නැවත.

**80 පිට.**

" කාගවිසණ = කහවේන්නු.
" උත්‍රාසිත = තැතිගන්වන ලදුව.
" ක්‍රකචකණ්ටක සන්දොහයෙන් = කියත්කටු සමූහයෙන්.
" ගාඪශල්‍ය = (යටට ඇනුනාවූ හෝ) දැඩි උල්.
" කාලපාශබද්ධ = මාරයාගේ මළපුඩු වැනි.
" වජ්‍රාග්‍රබද්ධ = වජ්‍රායුධ කෙළවරවැනි.
" ආර්තස්වරයෙන් = බැගෑපත් හඬින්.
" ඌර්ධ්වමුඛකණ්ටකයෙන් = උඩුකුරුවූ මුඛ ඇති කටුවෙන්.
" නෂ්ටචෙතසින් = නැසුනාවූ සිහිවිලිවලින් යුක්තව.
" අවරොහණය = බැසීම.
" විෂමතටයෙහි = විෂමවූ ප්‍රපාතයෙහි.

**81 පිට.**

" ජර්ජරීකෘත = දැදුරුකරණලද, සිදුරු කළ.
" ප්‍රක්ෂෙප = හෙලීම.
" එක්යලක් = එක්වරක්.
" දීර්ඝකාලාපගමයෙන් = බොහෝ කලක් ගතවීමෙන්.
" ප්‍රබලවාතයෙන් = මහත් බලසම්පන්න වාතයෙන්
" උද්ධතවීචිමාලා ඇති = උඩට නැගුනු තරංගපඞ්ක්ති ඇති.

**82 පිට.**

" ආතුර විරූපව = ලෙඩින් විකාරවූ රූප ඇතිව.
" ක්‍ෂුත් පිපාසායෙන් = සාපිපාසා දෙකින්.
" මහත් භාරයෙහි බැඳ = මහත් බර ඉසිලීමට බැඳ.
" ප්‍රතොදකණ්ටකයෙන් විද = කෙවිටේ අගින් විද.

**83 පිට.**

" ගලබිලයට = ග්‍රීවාබිලයට, උගුරට.
" වඩබානලප්‍රාප්ත = වඩබාගින්නට පැමිණි.
" සූචිමුඛ ඇති = ඉඳිකටුමුණත වැනි මුඛ ඇති.

88 පිට.

„ බහලාභිකාරවූ = ඝනාභිකාරවූ.
„ පටුපිඬුසෙහින් = ප්‍රතිගුලිමෙන්,
„ විරේණකල - දියවෙනකල.
„ අශක්‍යයි - නොහැකියි.
„ ප්‍රත්‍යයසමවායසුලභාවයෙන් - හේතුන් හා එක්වීම ඉතා බහුල බැවින්.
„ උදකාවගාහය - දියට බැසීම, වතුරේ ගිලීම.
„ සමඞ්ගතා - යුක්තබව.
„ සුබොපබෘංහණය - සැපසේ වැඞීම.
„ ලබ්ධාපතිශ්‍රය - ලබනලද හේතු ඇතිව.
„ මහාද්‍යුතික - මහත් බැබලීම ඇත්තේ.
„ මහාවිස්තාර - මහත් පැතිරීම් ඇත්තේ.
„ ප්‍රතිපක්ෂව්ච්ඡේදක - විරුද්ධ පක්ෂයෙහි වූවන්නැසීම.
„ මනුෂ්‍යතාරක්ක - මනුෂ්‍ය තිරිසනෙක්.
„ අශනවසනමාත්‍රයකුදු - ආහාර වස්ත්‍ර පමණකුත්
„ පරාධීනවෘත්තිවැ - අනුන්ට යටත් පැවතීම්ඇතිව.
„ භාරොද්වහන - බරඉසිලීම.
„ හිතකම්ය්‍යසීමාදවැ - බිඳිනලද සීමා ඇතිව.
„ ගහනාශ්‍රිතවැ - වනලැහැබ් ආශ්‍රය කරගෙන,

84 පිට.

„ ත්‍රප්‍යපත්‍රපා සමපත්‍න - ලජ්ජා භය දෙකින් යුක්තව.
„ පරිවර්ජන - දුරුකිරීම.

85 පිට.

„ අකපෙත - වෙත්නොවූයේ; අහක් නොවූයේ.
„ ආගාමීඵලයෙහි - මතු ලැබෙන විපාකයෙහි.
„ දෙයධර්මයෙහි - දියයුතු දන වස්තූනවහි.
„ අනාදිමත් සංසාරයෙහි = අක්මුල් නැති සංසාරයෙහි.

86 පිට.

„ මාත්සර්‍ය්‍යයෙන් - මසුරුකමින්.
„ අපරිගෘහීතචිත්තවැ - අල්වා නොගත් සිත් ඇතිවැ.
„ උපඝාත - හිංසා පීඩා.
„ විධෙයදවෙති - කීකරුදවෙති.
„ යුක්තප්‍රාප්තකාලයෙහි - යෝග්‍යවූ (සුදුසු) පැමිණි කාලයෙහි.

87 පිට.

„ අපරිභොග - ප්‍රයෝජන නොගැණීමටද.
„ දුෂ්පරිභොග - අයහපත් අඳමින් ප්‍රයෝජන ගැණීමටද.

87 පිට.

,, අසථානනියොජන – නුසුදුසු තැන යෙදීමටද.
,, විනිපාතන – විනාශකිරීමටද.
,, ආධිපත්‍යයෙන් – අධිපතිභාවයෙන්.

88 පිට.

,, බදිරවන – කිහිරිවනය.
,, ආලොපයකුදු – පිඩක්පවා.

89 පිට.

,, දිග්විජයකොට – දිශාවන් ජයගෙන.
,, බින්හැඹුවට – සහෝදරිට, නැගණියට, නංගියට.
,, සුක්වත් – අයබදු.
,, දසහෝ නොදසහෝ – දසයෙක්ද නැද්ද.
,, ධෙනූපමන්‍යායයෙන් – එලදෙනක් උපමාකොට ඇති න්‍යායයෙන්.
,, තුණකම් – රෙදි (වියන) කම්ම, පෙශකාර්‍ය.

90 පිට.

,, තන්කොට එවයි – සලකුණක්කර එවයි.
,, ශාඛාවිටපසම්පන්න – අතුවෙළෙප්වලින් යුක්තවූ.
,, සාන්‍ද්‍රච්ඡායවූ – ඝනවූ සෙවන ඇති.
,, ශත්තෙම්ය – සිනාගත්තෙම්ය.

91 පිට.

,, තුණදරුවක් – රෙදි වියන දරුවක්.
,, සර්වකාමදද්විය – සියළු කැමති දෙය දෙන්නේවිය.
,, අනෙකානෘශංස – නොයෙක් අනුසස්.
,, ගවරවල – ගම්දොර තිබෙන කුණුවල.

92 පිට.

,, සංක්ෂොභකොට – කළඹා.
,, දුර්ගීතපුරුෂයක්වැ – දුප්පත් මිනිසෙක්ව.
,, භික්‍ෂා සඳහා – ආහාර පිණිස.
,, පරිතොෂ – සන්තොෂ, සතුට.

93 පිට.

,, බත්කෙණෙසස – බත්හැන්ද.
,, ප්‍රතිච්ඡිතවැ – පිහිටා.
,, නිමන්ත්‍රණයකොට – ආරාධනයකොට.
,, අනොතාතිවෙසනයෙහි – ඇතුළුගෙහි.

**93 පිට.**

,, සඤ්චිත – රැස්කරණලද, එකතු කරණලද.
,, ආයව්‍යය චින්තාකොට – අය වැය කල්පනාකොට
,, ඝෘත, ගුඩ, මධු, ශර්කරා – ගිතෙල්, උක්සකුරු, මීපැණි, සීනි.

**94 පිට.**

,, තණ්ඩුල – සහල්, හාල්,
,, කොෂ්ඨාගාර, – කොට්ඨගවල්, ගබඩාගෙවල්
,, කම්සත්ථව – කර්මසංඥාකොට, කර්මාන්ත නියමකොට.
,, සර්වාභරණ විභූෂිතවූ – සියලු ආභරණයෙන් සැරසී.
,, සුවර්ණභාණ්ඩාගාරයක් – රත්රන් කොණ්ඩියක්.
,, විප්‍රතිසාර – කලකිරීම.
,, නිශිත – තීක්ෂ්ණ.
,, ස්ඵටිකමණිවත්තියක් – පළිඟු ගල්වට්ටියක්.
,, දනගට – දන්හලට.
,, ඒදනගෑ – ඒදන් ශාලාවෙහි.
,, රිදීකැට – රිදීගුළි.
,, රිදීපලු – රිදීපත්‍ර (හෝ රිදී පොලු.)
,, රිදීමසු – රිදීකාසි.
,, පරිෂ්කෘත – වටකලාවූ.

**95 පිට.**

,, රන්කොසුකම් – සුවර්ණමය කොෂකම්, රත් රන් කොපු දැමීම.
,, මණිනූපුර – මිණිබැඳි පාවලලු.
,, වරදුහුල් – උතුම් වස්ත්‍ර.
,, සුවර්ණඝණ්ටා – රත්රන් මිණිගෙඩි
,, ක්ෂෞමකෞශෙයාදි – කොමුපිළි, කෞශෙය්‍ය වස්ත්‍ර ආදී.
,, කිරිය – වී අමුණු හතරක වපසරිය.
,, පයමුහුළු – පාත්‍රයේ අඩිය, පාත්‍රාධාරය.
,, මුවවිට – (පාත්‍රයේ) ගැටිය.
,, මස්වලුමෙහෙ – රැව්ලෙහි කටයුතුදේ.
,, හිරණ්‍ය සුවර්ණ – අමුරන්, හා රත්රන්.

**96 පිට.**

,, දශපඞ්ක්තියෙක් – දශපේළියක්.
,, අඩුතුන් පඞ්ක්තියෙක් – පේළි දෙකහමාරක්.

**96 පිට.**

,, අවසෙක – ආවාසයක.

,, කිරිසිඳක් – කිරිබින්දුවක්.

,, මනසකාරය – මෙනෙහි කිරීම.

**97 පිට.**

,, පිරිතැස්ලි – චිත්තසන්තාප, සිතැවුල්, විඩාව.

,, පුහුදුන් – පෘථග්ජන.

,, විදශීක – ක්‍ෂය අනිත්‍යාදි වශයෙන් බලමින් භාවනාකරණ.

ආරබ්ධවිදශීක – පටන්ගත් විදශීනා භාවනා ඇති.

,, කලව්පිමඩලෙක් – කමන්මණ්ඩලයක්, මණ්ඩලාකාර කමතක්.

**98 පිට.**

,, ශක්‍යද – හැකිද.

,, පිරිපස්නා – පොෂණය කරණ, උපස්ථාන කරණ.

,, වත්සපන් – වත්තසම්පන්නවූ.

,, සඟැදෙමිසි – සඞ්ඝයා වහන්සේට දෙමියි කියා.

,, දක්ෂිණා සඞ්ඝගත නොවේ – දක්ෂිණාව සාංඝික නොවේ.

,, මලෝලඹු – එල්බෙන මල්.

,, වැටසිරිපහසා – වෘතශීෂීයෙන් හැමද.

**99 පිට.**

,, පසිත්පැව – කකුලෙන් වීසිකෙළේය.

,, කියන්නටඅම්න – කියනොහැකිය.

,, ගොත්‍රභූවූ – ගොත්‍රයෙන් ඇතිවූන.

,, වත්මපාක්ෂික – සංසාර පක්ෂයෙහිවූ

,, විවත්මපාක්ෂික – නිර්වාණ පක්ෂයෙහිවූ.

,, ප්‍රතිභාන – වැටහෙන ප්‍රඥාව.

**100 පිට.**

,, ත්‍රිවිධපයතිපත්ති – අලගද්ද, නිශ්ශරණ, භාණ්ඩාගාරික, යන මේ තුන් පයතිපත්ති.

**100 පිට.**

,, අලගද්දූපර්‍යාපතියෙන් – සර්පයෙකු ඇල්වීම නොදන්නා මිනිහෙක් නයෙකු නගුට ආදී තැනකින් වරදවා අල්ලන්නාක්මෙන් ලාභාදිය සඳහා බුද්ධධර්මය ඉගෙණිම.

,, ග්‍රහණ, ධාරණ, ප්‍රතිපාදනා – ඉගෙණිම, දැරීම, පිළිපැදීම.

,, විදර්ශනා – ශරීරය අනිත්‍ය ලක්‍ෂණාදි වශයෙන් නුවනින් බැලීම.

,, ඵල සාක්‍ෂාත් කොරෙමි – ඵලය ප්‍රත්‍යක්‍ෂ කරමි.

,, අපරිඥතවූ – නොදත්තාවූ

,, අප්‍රහීණවූ – ප්‍රහීණනොවූ

,, අසාක්‍ෂාත්කෘතවූ – ප්‍රත්‍යක්‍ෂ නොකරණලද.

,, පරිඥතස්කන්ධය – හාත්පසින් දැනගත්තාලද ස්කන්ධ ඇත්තේය.

,, ප්‍රහීණකෙලශ – ප්‍රහාකරණලද කෙලෙස් ඇත්තේය.

,, භාවිතමාර්ගය – වඩනලද මාර්ග ඇත්තේය.

,, නිර්දිෂ්ට – දක්වනලද.

**101 පිට.**

,, ජීවනහේතු – ජීවත්වීමට කාරණයක්.

,, ත්‍රිසරණාධ්‍යාශයෙන් – නිර්වාණය ලබන අදහසින්.

**102 පිට.**

,, සර්පිෂාදී භෛෂජ්‍යදෘතය – ගිතෙල්ආදී බෙහෙත්දෘතය.

,, සේනාසුන්දානට – සෙනාසන දානයට

,, සිව්පැදිගයෙකින් – සතරපද ගාථාවකින්.

,, එවක් පමණ හමුදු – හැන්දක් පමණ කැඳ විතුරද.

,, සමාධිපදස්ථාන – සිත එකඟවීමට ආසන්න කාරණය.

**103 පිට.**

,, ක්‍ෂත්‍රිය මහාසාරකුලයෙහි – ධනයෙන් ඉතා ආඪ්‍යවූ රාජකුලයෙහි.

,, ත්‍රයස්ත්‍රිංශත් – තව්තිසා දෙව්ලොව.

,, ආලොකස්ඵරණයට – ආලොක පැතිරීමට

**104 පිට.**

,, ආභාස්වරයන් – ආභාස්වර බඹලෝවැසියන්

,, ශුභකෘත්ස්නයන් – සුභකිණ්හ බඹලෝ වැසියන්.

**104** පිට.

,, බෘහත්ඵලයන් – වෙහප්ඵල බඹලෝ වැසියන්.

,, උපහතවෙයි – පීඩිතවෙයි, නසනලද්දේ වෙයි.

,, විභූති – සම්පත්, සැපත්.

,, අභිරූප – විශිෂ්ටරූප.

**105** පිට.

,, අන්තරීක්ෂයෙහිදු – ආකාශයෙහිද.

,, සතින්හල – සුමානයකින් මුදුහැරියාවූ.

,, ජාතිස්මරණඥානය – පෙරජාතිය සිහිකරණ නුවන.

**106** පිට.

,, පිහිතකොට – වැසීමකොට.

,, සර්වස්ව – (ඔහු අයිති) සියළුම ධනය.

,, පරස්වහරණයෙන් – අන්සතුවස්තු පැහැර ගැණීමෙන්

,, කාෂ්ඨකලතාභිඝාතාදි – කටුවලින් සහ වැල්වලින් තැලීම් ආදී පීඩා.

**107** පිට.

,, ජන්මාන්තරයට – අනිස්ජාතියට.

,, අනර්ථව්‍යසනයට – අක්‍රමවිනාශයට, විපත්තියට

,, යදිවූ – යාචකයෙක්ව.

,, කෘපණවූ – දුප්පත්ව, දිළිඳුව.

,, වලප්ඇතිව – විලාප ඇතිව.

,, විවර්ණවූ – විරූපව.

,, මනුෂ්‍ය දුර්භග – අවාසනාවන්ත මිනිහෙක්.

**108** පිට.

,, ඔග්දණ්ඩයෙන් – තියුණු නැමැති දඬුවමින්.

,, ධනදණ්ඩයෙන් – ධනය පැහැර ගැණීම නැමැති දඬුවමින්.

,, වධදණ්ඩයෙන් – වධ නැමැති දඬුවමින්.

,, අභිභූතව – පීඩිතව, මඩනාලදව.

,, අණ්ඩච්ඡේද – අණ්ඩච්ඡේදය කිරීම, කපපාදුකිරීම.

,, ජීවිතපර්‍යවසානයෙහි – ජීවිත කෙළවරෙදී

,, පිළිසැළුනාලූ – කර ඇඹූකලූ

,, සූදපතිහු – සමූහයේ ප්‍රධානයා විසින්.

,, දන්තඵලය උපුටා – දත්තයෙන් හපා බීජ කොෂය උගුල්වා.

,, තගඹුකල්හි – තාම්බාකාලයේ.

**108 පිට.**

,, උඩාතළල වූහු – උපුටා පියනලද අණ්ඩ ඇතිවූහ.

**109 පිට.**

,, සමුද්ගග – කරඬුව.
,, අභිරූපව – සහපත් රූපයක් ඇතිව.
,, සුමුගක් – කරඬුවක්.
,, මහෙශාක්‍ය – මහානුභාවසමපනන.
,, අඹුන් මිනිස් පිළිසඳින් – මනුෂ්‍යස්ත්‍රී ප්‍රතිසන්ධියෙන්.
,, පතිකුලයට – ස්වාමිකුලයට.
,, වෛෂ්‍යවැ – ක්‍රොධකරණු ලැබ
,, ඞාකිනීන් – යකිනියන්.

**110 පිට.**

,, මූවවීටට – මෛව්විටට, ගැවියට.
,, නෙරිසත් – නරකයෙහි උපන් සත්ත්ව යන්.
,, පරිපූර්ණකොට – සම්පූර්ණකොට.
,, අනෙකවර්ෂකොටි සහශ්‍රයෙහි පැසී – නොයෙක් හවුරුදු කෙළ දහස් ගණන් පැසී.

**111 පිට.**

,, හැකුළුම් – හැකිළීමක්,ලජ්ජාගතියක්.
,, ගුණලව නැති – සවල්ප ගුණයකුත් නැත.
,, මහාදෙෂාවහවූ – මහත් දෙෂ ගෙන දෙන්නාවූ.
,, අභූතයෙන් – බොරුවෙන්, මූසාවාද යෙන්.
,, අභ්‍යාඛ්‍යාන – නින්ද, අපහාස.
,, දීනවෙයි – දිළිඳුවෙයි, බැගෑපත්වෙයි.
,, මූකවෙයි – ගොළුවෙයි.
,, මීනයන්සේ. – මත්ස්‍යයන් මෙන්.
,, අන්තර්හිත – අතුරුදහන්.

**112 පිට.**

,, සුභාෂිත – මනාකොට කියනලද, යහපත් වචන.
,, දුර්භාෂිත – නපුරු වචන, නපුරු කොට කියන ලද්ද.
,, පරිමිතභාෂායෙහි – ප්‍රමාණවත් කථාවෙහි.
,, හලාහලවිෂ – දැඩිවිෂ, දරුණුවිෂ.

**113 පිට.**

,, රාගාදීනට ප්‍රභවය – රාගාදින්ට උත්පත්ති ස්ථානය.

**113 පිට.**

,, තුන්භවයට – කාම, රූප, අරූප, යන භවත්‍රයට.

,, තන්නිදානවූ – ඒ හේතුවෙන්වූ.

,, නුවණ තුරඟසියෝ – ඥාන නැමැති අශ්වයන්ගෙන් යුක්තවූ.

**114 පිට.**

,, ස්වතන්ත්‍රවූ – ස්වාධීනව, තමන්ට කැමැතිසේ.

,, ප්‍රපතනය – වැටීම

,, භක්ෂ්‍යාභක්ෂ්‍ය විචාරණය – කෑයුතුද, නොකෑයුතුද කියා තෝරා ගැණීම

,, තත්තත් ආස්වාදනය – ඒ ඒදේ රස විඳීම, අනුභවය.

,, ස්වචිත්තයෙහි – තමාගේ සිත්හි.

,, මුඛපටහයෙහි – මූඛ නැමැති උඩැක්කියෙහි.

,, නර්තනය – නැටීම.

,, පෞරජනාකුල මාර්ගය – නගරවාසීන්ගෙන් ආකූලවූ මාර්ගය.

,, පරිමුෂිතමති – මුළාවූ නුවණ ඇති.

,, නිරවධිවූ – සීමාවක් නැතිව, මායිමක් නැතිව.

,, අපහෘත – බැහැර කරණ ලදුව, ඉවත්කරණ ලදුව.

,, තිර්‍යක් ප්‍රෙත ගතියට – තිරිසන් ගතියට හා ප්‍රෙතගතියට.

,, ද්‍රෂ්ටව්‍ය – දක්කයුතු.

**115 පිට.**

,, දෙලෙන් අවුල් – (ගිනි) දැල්වලින් ආකූලවූ.

,, ඇවිදු මඬලෙහි – අවීචි මණ්ඩලයෙහි.

,, ඝර – ගැරඬි.

,, බරණ – දියබරි.

,, පලඟ – පලඟැටි.

,, පුන පුනා – නැවත නැවත.

,, අසුරකාහි – අසුරනිකායෙහි.

,, සංකලිෂ්ට – කිලිටි.

,, නිරස්තකෙරෙයි – නැතිකෙරෙයි.

116 පිට.

„ අඞ්ගාරකර්ෂුවක් – අඟුරු වලක්.

„ පරිවර්ජිත – දුරුකිරීම.

„ විරතියැ – වැළැක්මය.

„ සම්බාධනොප ධාරණයෙන් – නොවිසිරීමෙන් හා දරාගැණීමෙන්.

„ අවිප්‍රකීර්ණතායෙන් – විසිරීමක් නැති බැවින්.

„ ශිරොඞ්ගීයෙන් – ශිරස් (හිස) යන අඞ්ගීයෙන්.

„ ශලනාඞ්ගීයෙන් – චලනය, සංවරණය කරණ අඞ්ගීයෙන්.

117 පිට.

„ ගුණසිරස් – ගුණ නැමැති හිස.

„ නෛරුක්තිකවිධින් – නිරුක්ති ක්‍රමයෙන්.

„ ශලනාඞ්ගීයෙන් – චලනය, ආවරණය කරණ අඞ්ගීයෙන්.

„ රූ තවරණ වණවැටිය – රූප චිත්‍ර කරන්නාවූ තෙලිකූර.

„ හැම සැපත් සැදවන අත්සන – සකල සම්පත්තියට අඩ ගසන ගසන සංඥාවකි.

„ මරණ නොබන පුරිසරු – මරණ භය නැති උත්තම නගරයකි.

„ දස්කළපත් කරණ – දුසභාවය පිණිස කරණ ලද පත්‍ර (සංඥ) කරණයකි. (ඔප්පුවකි.)

„ සතුන් සිරිරු පහයන රසසිත – සත්ත්ව ශරීර ප්‍රසන්නකරවන රසායන බෙහෙතකි.

„ හැදහැවිලි හස්මුළු සරණ – ශ්‍රද්ධා නැමැති හංස සමූහය හැසිරෙණ.

„ මෙත් උපුල් සිලියෙන වසාවට – මෛත්‍රී නැමැති වැගිරෙණ උල්පතට, ගඞ්ගාවර්තයකි.

117 පිට.

„ රජමුළු කිරුළුකුළු මිණිරැස් තිඳේ පාපිළි – රජ සමූහයාගේ කිරීටමස්තකයන්හි මාණික්‍ය රශ්මියෙන් ධොවනය කරණලද පාපුඩුවකි.

„ සිව් අවයට මහ හගුල – සතර අපායට (යන මං දොර අවුරණ) මහ අගුලක්.

**117 පිට.**

,, අට අකාණ අදුරු දූරුකරණ සරුහිර - අෂ්ටඅක්ෂණ නැමැති අදුරු දූරුකරණ ශරත් සූර්‍ය්‍යයාය.

,, අට අරී කෙළෙඹියන් අත්සරිය - අෂ්ටාය්‍යීය(පුද්ගල)නැමැති කුටුම්බිකයන්ගේ හසත සාර වස්තුවය.

,, අග්වලැ පොපි දූස - වල්ගා කෙළවර සෙල්වීම දූක.

කෙකින්න - කෙකිනී, කොක්දෙන.

,, දම්ගෙඩියෙහි - මස්ලොඹුවෙහි, කැපීමට ගිය තබන කොට කැල්ලෙහි.

,, තිස්රජු - තිසස රජ.

**118 පිට.**

,, අප්‍රමත්තවැ - ප්‍රමාදනොව.

,, විශාරදවැ - නිර්භීතව, භය නැතිව.

,, අසම්මූඪවැ - මුළානොවී.

,, ප්‍රසකන්නවූහ - ප්‍රවිෂ්ටවූහ, බැසගත්හ

,, උත්පාතයෙක් - උපද්‍රවයෙක්.

,, ආවර්ජිතා කරණුයේ - කල්පනා කරණුයේ,

,, අන්නට වපිද්ද - අන්‍යයන්ට වටනේද.

,, ගොප්මස - ඇස්වටය.

,, ඝොෂණය කලේ - ශබ්ද කෙලේය.

,, දෙවතා සංයුක්තකයෙහි - සංයුත්සඟියේ එනම් ධර්ම කාණ්ඩයෙහි.

**119 පිට.**

,, ගහනයක් - වනලැහැබක්.

,, වැළත - සමීපයෙහි.

,, පරවෙෂ - අනුන්ට කිපීම.

,, ගුණුකලැ - ගිණුකල්හි හෙවත්, ඉක්ම ගියකල්හි.

,, ගර්හිත - ගර්හාකරණලද, නින්‍දා කරණලද.

**120 පිට.**

ලෞකික - ලොකය සම්බන්ධවූ.

ලොකොත්තර - ලොකය ඉක්ම සිටියාවූ.

,, ඓහලෞකික - මේ ලොකයෙහිවූ, මේ ආත්මභාවයෙහිවූ.

**120 පිට.**

| | |
|---|---|
| ,, පාරලෞකික | - පරලොව්හි ලැබෙන්නාවූ. |
| ,, ජනමලාභ | - උත්පත්තිය ලැබීම. |
| ,, අනෙකානෘශංසලාභී | - නොයෙක් ආනිසංස ලැබීම ඇත්තෙක්. |

**121 පිට.**

| | |
|---|---|
| ,, අච්ඡිද්‍රය | - මැදින් සිදුරුවූ රෙද්දක් මෙන් මැද සිකපද නොබිඳීමෙන් සිදුරු නැත්තේය. |
| ,, අශබලය | - දෙනකගේ ඇගේ තැනී තිබෙන සුදු කලු පුල්ලි මෙන් පිළිවෙළට සික පද කීපයක් බිඳීම් වශයෙන් කැලල් නැත්තේය. |
| ,, අකල්මාෂය | - අතරතුර සිකපද බිඳීම් වශයෙන් කබර ගති යක් නැත. |
| ,, භුජිෂ්‍යය | - නිදහස්ය. |
| ,, විඤ්ඤු ප්‍රශස්තය | - පණ්ඩිතයන් විසින් පසස්නා ලදී. |
| ,, අපරාමෘෂ්ටය | - තෘෂ්ණා දෘෂ්ටීන් විසින් නොඅල්ලා ගන්නාලද. |
| ,, සමාධිසංවර්තිකය | - සමාධිය පිණිස පවත්නේය. |
| ,, ප්‍රව්‍රජ්‍යාශීල | - පැවිදි සීලය හෙවත් දශශීලය. |
| ,, ප්‍රාතිමොක්ෂ සංවරශීල | - උපසපන් සීලය. |
| ,, ඉන්ද්‍රිය සංවරශීල | - ඉන්ද්‍රියයන් ආවරණය කිරීමෙන් රකිණ සීලය. |
| ,, ආජීවපාරිශුද්ධිශීල | - පිරිසිදු (නිදොෂ) වූ ජීවිකාවෙන් රකිණ සීලය. |
| ,, ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීල | - (නුවණින් සලකා) සිව් පසය වැළඳීමෙන් රකිණ සීලය. |
| ,, යාවජ්ජීවයෙන් | - ජීවිතාන්තය දක්වා. |

**121 පිට.**

„ පිපීලිකාව – කූහුඹුවා.

„ සබ්බසත්ත්ව හිතානුකම්පිතව – සියලු සත්ත්වයන් කෙරෙහි හිතවූ අනුකම්පා ඇතිව.

**122 පිට.**

„ අදත්තාදාන පරිත්‍යාග කොට – සොරකම් අත්හැරීමෙන්.

„ අස්තෙය චිත්තයෙන් – නොසොරසිතින්, සොර හිතක් නැතිව.

„ සමන්වාගතවේද – යුක්තවේද.

„ එකභක්තිකව – එක්වේලේ වළඳන ආහාර ඇතිව.

„ කිලිටි කැටපත – කිලුටු කැඩපත, කන්නාඩිය.

**123 පිට.**

„ වාග්භෙද කොට – වචනයෙන් ප්‍රකාශ කොට.

„ පෞෂතාඞ්ග – අෂ්ටාඞ්ග උපොසථ ශීලය.

„ බුද්ධ ප්‍රඥප්ත – බුදුන් විසින් පණවනලද.

„ ආය ව්‍යය – අය සහ වැය.

„ නිත්‍යභක්තික – නිති බත් ඇති, හෙවත් නිති දන් වළඳන.

„ මනසකාර – මෙනෙහි කිරීම

„ අහො රාත්‍රියෙහි – රෑ දවල් දෙක්හි

„ පරිත්ත – ස්වල්ප, ටික

**124 පිට.**

„ අෂ්ටමිය – අටවක් පොහෝ දින.

„ බ්‍රහ්මචරවස් – බ්‍රහ්මචර්‍ය්‍ය වාසය,

„ පෙසෙමනුවන් – අෂ්ටාඞ්ග උපොසථ ශීලය රකින්නවුන්.

„ චාතුද්දසිය – තුදුස්වක, පෝය දින.

„ පණ්ණරසිය – පසළොස්වක් පොහෝ දින.

**125 පිට.**

„ මනාපකාය – එනම් දෙවියෝ.

„ මහතෙරුන් ඇර – මහතෙරුන්වහන්සේ

„ නත්තය – නැටීම. [වැඩමවාගණ

**126 පිට.**

,, රජනීයවිය – සිත් ඇලවීමට කරුණු විය.

,, කමනීයවිය – කැමතිවිය යුතුවිය.

,, මදනීයවී – මත්වීමට කරුණක්වී.

,, අසාරූප්‍යයයි – සුදුසු නොවේයයි.

,, අනන්තර්හිත – අන්තර්ධාන, නොපෙනී යාම.

,, ශය්‍යාසනාන්තයෙන් – සයනය කරණ තැනින්

,, සායාහ්නයෙහි – සවස් කාලයෙහි.

,, වූපාගත – ශාලාට පැමිණි.

,, ගොගණයන් – ගව සමූහයන්.

,, සමත්වා – එක්රැස් කරවා.

,, වාරකොෂ්ඨාදිය – දොරකොටු ආදිය.

,, කෙසිඹුදු – යතුරුමුදු.

,, අගුප්තභාණ්ඩගොපනකොට – අරක්ෂිත භාණ්ඩ රක්ෂාකර.

,, සූත්‍රකර්තනාදී – නූල් කැටීම් ආදී.

**127 පිට.**

,, ප්‍රතිෂ්ඨිතද – පිහිටියේනම්.

,, අභිරූපවෙති – විශිෂ්ට රූප ඇතිවෙති.

,, පරලාභ සත්කාරයෙහි – අනුන්ට ලැබෙන ලාභ හා සත්කාරයෙහි.

,, පූර්වජන්මයෙහි – පෙර උත්පත්තියෙහි.

**128 පිට**

,, නොකල බත්දෙමි – නොකල තැනැත්ති යක් වැන්නෙමි.

,, ගෘහපති කන්‍යාවන් – ගොවි වංශයෙහිවූ තරුණ ස්ත්‍රීන්ගේ.

,, ඓශ්වර්‍ය්‍යාධිපත්‍ය – ඉසුරෙන් අධිපති බව.

,, පිළිය හෝ හිස – වස්ත්‍රය හෝ හිසකෙස්.

**129 පිට.**

,, ආයාම වසින් – දිගින්, (දිගවශයෙන්.)

,, විස්තාර වසින් – පුළුලින් (පළල වශයෙන්.)

,, යෙළ සිය යොදුන් – එකසිය පණස් යොදුන්

,, ආවතී ගඞ්ගාදි – එනම් ගඞ්ගාව ආදිකොට.

129 පිට.

,, උක්තානුක්ත වර්ණනාවෙන් = කී නොකී වර්ණනා වෙන්.

,, සංස්ථානයෙහි – සටහනෙහි, ලකුණෙහි.

130 පිට.

,, ජීවලෝකයහට – සත්ත්වලෝකයට.

,, මාරපාශ ද – මාරයාගේ මඩුද.

,, ක්ලෙශ භක්ෂ්‍යයන් – ක්ලෙසුන්ට ගොදුරු.

131 පිට.

,, මෞලි බැඳ – හිසකේ බැඳගෙණ.

,, අටවියෙහි – වනයෙහි.

,, විලුම්පනය – පැහැර ගැණීම.

,, විෂදිග්ධ – විෂ පෙවූ.

,, අසද්ගුණ – අයහපත් ස්වභාව.

,, විපරිවෘත්තයක – ආපසු කරකැවූ තෝය.

,, ඕනා බැවින් – හෙළන බැවින්.

,, දුෂ්පූරයක – සම්පූර්ණ නොකළ හැකිය.

,, දුස්තොෂ රාක්ෂසීන් – සතුටු නොකළ හැකි රකුසියන්.

,, සර්වාණී – සියලුදෙය ගෙනයන

,, පිරිරණු නැතියච්ඡ – රැකවල් නැත්ති යෝය.

,, රන්ගල් සැපත් – ස්වර්ණ පර්වතයකට පැමිණි.

,, රක්තායන් විනාශභාග් කරණ බැවින් – ඇළුතවුන් විනාශ කරණ නිසා.

,, නිත්‍ය ඵලිතයෝ – නිතර ඵල දරන් තියෝය.

,, වුලුම්බුනා – පැහැර ගත්තාවූ.

,, ලෝකාමිෂයට – මෛථුනයට.

,, අතෘපතවැ – තෘපතියට නොපැමිණ.

,, කුබ්ජයා – කුදා.

,, ගලලොහිතයෙන් – ග්‍රීවා (බෙල්ලේ) ලෙහින්.

,, පාදප්‍රක්ෂාලනය = පා සේදීම.

132 පිට.

,, පරිත්‍යක්තය = පරිත්‍යාග කරණ ලද්දේය, හරින ලද්දේය.

,, ශ්වභ්‍රයක් = සිදුරක්.

,, දුෂ්පූරයහ = නොපිරවිය හැක් කාහ.

,, දුෂ්තොෂකයහ = සතුටු නොකට හැක්කාහ.

,, සර්වභක්ෂයහ = සියල්ලත් අනුභව කරන්නියෝය.

,, පිළු = කොරු, පිළසප්පි.

,, පස්වචන = උපසථාන කරන් නාවූ.

133 පිට.

,, නිවුටුකළද = නිම්සිකල්හිද, නිමි සිම් කළ කල්හිද.

,, තමා අත්පා, ගිනි මඩනට = තමන්ගේ අත් පෙන් නා, ගිනි මැඩීමට, ගිනි පෑගීමට.

,, අත් අත පහළියෙන් = (අනිකෙකු) අතින් අත ගැසූ කෙසින්.

,, අන්ධකාර වර්ෂායෙහි = අඳුරෙන් යුත් වැසි වේලාවෙහි.

,, ඝාතකාවන්වැ = ඝාතනය කරන්නී යක මෙන් වී

,, නැව්බිඳුනුව ගිය = බිඳීගිය නැව් ඇති.

,, සුමුගට = පෙට්ටියට.

,, පැළමුහුණ = පශ්චිමවාරයෙහි, පසුදෙරකඩ.

,, ජවනිකාවෙන් = තිරයෙන්.

,, උතුරැමුහුණ = වම්පාශ්වයෙහි උත්තරවාරයෙහි.

134 පිට.

,, චාතුර්වර්ණ්‍යයත් = ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, යන සතර ජාතිකයන්.

,, ජනපථක් – මහපාරක්.

,, පානාගාරයෙහි – සුරාමඩමෙහි.

134 පිට.

,, කාෂ්ඨමය – දරවලින් තනනලද, දඬුමුවා.

,, අවුණුදෙරක් – ආපණ ශාලාවක්, සල්පිලක්.

,, පුස්සැඩිවන් – මලකුණු හා පරමල් බැහැර කරන්නවුන්.

135 පිට.

,, හැපෙන හැපෙන තැන් – සිතෙන සිතෙන ස්ථාන.

,, අධ්‍යාශය – අදහස.

,, ආපද්ගතකල ද – විපත්තියට පැමිණි කල්හිද.

,, අවඥාව – නින්දාව, පරිභවය.

,, අසජ්ජනයන් – අසාධුජනයන්.

136 පිට.

,, මරීචි – මිරිඟු.

,, බරවූ නිතම්බබිම්බ – භාරවූ විලංගු (මාංචු) බැමි.

,, හැලිසිවි – හැඟවී සිටියාවූ.

,, පුහුදුනන් – පෘථග්ජනයන්.

,, වඳුරන් බඳන ලහා – වඳුරන් බඳින ලාවූ.

,, බුභුක්ෂිත රාක්ෂසයන් – කනු කැමතිවූ රකුසන්.

,, විරිණවූ – පැසුනාවූ, (උණුවූ) දියවූ.

137 පිට

,, රහස්දෙයස් – රහස් ප්‍රදෙශ, වැසිය යුතු තැන්.

,, ප්‍රව්‍රජිතකාවයුතුවෙන් – දුරුකාවයුතුවෙන්

,, හරිතාවුස්දයෙහි – හරි තාපස ජාතකයෙහි

,, මුදුලක්ඛණ්දයෙහි – මුදුලක්ඛණජාතකයෙහි

,, සකප්දයෙහි . – සංඛපාලජාතකයෙහි.

,, නිර්ගුණ – ගුණ නැති.

,, ප්‍රමුක්තයෝ – මුක්තතැනැත්තෝ, මිදුනතැනැත්තෝ.

138 පිට.

,, කඩපලා සොරුන් – මංපහරණ සොරයන්.

,, කාෂ්ඨරාශියක් – දරරැසක්.

,, උම්මදන්තිදයෙහි – උම්මදන්ති ජාතකයෙහි

,, උදකාවතීයෙහි ශලා – දියසලාවක සිල්වා

,, නිබුහුරුකරණුවන් – නිඃශ්වාසමාරුතය (හුස්ම ඇදීම) පමුණුවන්නවුන්.

138 පිට.

„ ප්‍රමථනය - කැළඹීම.

„ ශල්මලිවනයෙහි - ඉඹුල් වනයෙහි

„ තිශ්‍රීගකතියෑ - තිරිසන් යෝනියෙහි.

139 පිට.

„ සභීරුවූ - භය සහිතවූ

„ සඤ්ඡිභයවූ - ප්‍රති භය සහිතවූ, පෙරළා එන භය ඇති.

„ අනතික්‍රාන්තවන බැවින් - ඉක්මවූවන් නොවන බැවින්.

„ නාසාපිරුණු මුකුණුය - නාසය පිරුණු හොටුය

„ මුව පිරුණු ලාලාය - කටපිරුණු කෙළය.

„ මූත්‍ර පුරීෂය - මුත්‍ර හා මල.

140 පිට.

„ තමා කෙරෙහි රක්තවූ - තමා වෙත ඇලුනාවූ.

„ වීසගිකරණ - පහකරණ.

„ මැනැවක් - සුභයක් (මනොඥවූ යක්.)

„ ඇසිවසගොත් - සපියන් වසන.

„ ඵග්ගොත් ලැගැප් - ව්‍යාඝ්‍රයන් වසන වනලැහැබවල්.

„ සහලගුරු පිරුණු - ගිනි අගුරු පිරුණාවූ.

„ සොරුන් සිටි කඩසෙයින් - සොරුන් සිටි පෙදෙසක්මෙන්, (ප්‍රදේශ ඛණ්ඩයක්.)

„ රකුස්පිරිගාවිල් - රාක්ෂස පරිග්‍රහිත තටාක.

141 පිට.

„ සංසක්තයනට - බැඳුනාවුන්ට, ඇලුනවුන්ට.

„ ආවර්තයහ - (දිය) සළාවක් වැනි යහ, දිය සුළියක් වැනියහ.

„ ආස්පදයහ අසංවරයට - ඉන්ද්‍රිය අදමනයට ප්‍රතිෂ්ඨා ස්ථානයහ.

„ සාහසයන්ට පත්තනයහ - කෲර ක්‍රියාවන් කරන්නන්ට පටුනක් වැනියහ, නුවරක් වැනියහ.

„ දෙෂයනට සන්නිපාතයහ - දෙෂයන්ට සන්නිපාත යක්,(තුන්දොස් එක් වීමක්) වැනියහ.

**141 පිට.**

„ කපටමූර්තීහ – එකඑකාවෙන් නිර්මිත ශරීර ඇතියෝය.

„ ශඨමූර්තීන – කෛරාටික කමින් සෑදුනු ශරීර ඇත්තවුයෝය.

„ දීනතාවට් සොමුඛයෙහ – බැගෑපත් බව (ඉපදීම) ට කෙතක් වැතයහ.

„ සර්වවඤ්චනාවට සමුද්ගකයහ – සියලු රැවටිලිවලට කරඬුවක් වැන්නියෝය.

„ පඞ්කාශයෙනි ජාතවූ – මඩෙනි හටගත්තාවූ.

„ සංසාරජලනිධියෑ – සංසාර නැමැති මුහුදෙහි.

„ මහාකර්දමයෙනි – මහාමඩෙනි

„ කාමපලිපයෙනි – කාම නැමැති මහා මඩෙනි.

„ සුසන්නාහවූ – මනාව සන්නාහ කළාවූ.

„ සුවිලිප්තාලංකෘත – සුවඳ ආලේප කර ගැණීමෙන් සැරසුනාවූ.

„ කාමරජසින් – කාම නැමති ධූලියෙන්.

**142 පිට.**

„ කාමනිබන්ධන – කාමය පත්තුකොට ගෙණ.

„ උච්චතරයි – අතිශයින් උසයි.

„ අණුතරය – අතිශයින් පිකය.

„ සම්බාධය – උපද්‍රව සහිතය, ගැහැවෙක

„ පරිත්තසුඛවත බැවින්— – ස්වල්ප සැපයක් ඇතිවන බැවින්.

„ අල්පාස්වාදය – මඳ රසවිඳ ගැණීම් ඇත්තේය.

„ දෘෂ්ට ධර්මයෙහිදු – ඉහාත්ම භාවයෙහිදු.

„ සම්පරාය භවයෙහිදු – පරලොවෙහිදු.

„ උපක්ලේශසාධක – කෙලෙසුන්ට සිද්ධකාරණ.

„ බහුපායාසයෑ – බොහෝ ආයාස වෙහෙස ඇත්තේය.

„ දෘෂ්ට ධාර්මික සම්පරායික – ඉහලෝක පරලෝක දෙක්හිවූ.

„ උපද්‍රවාධිෂ්ඨාන – උපද්‍රවයන්ට පිහිටි ස්ථානය.

**142 පිට.**

,, බහ්වාදීනවයෑ — බොහෝ දොෂ ඇත්තේය.

,, අට්ඨිකඞ්කාලයක් — ඇටසැකිල්ලක්.

,, මාංසපේශියක් — මස් වෑදැල්ලක්.

,, දහනකෘත්‍ය සම්පාදක — දැවීම සිඛකරණ.

,, තෘණෝල්කාවක් — තණහුලක්.

,, මහාභිතාප කරවන — මහත් ලෙස තැවීම කරවන.

,, අඞ්ගාර කර්ෂූවක් — අඟුරු වළක්.

,, ඉත්වරවෑ ප්‍රත්‍යුපස්ථිත — ටික වේලාවක් එළඹ සිටි.

,, පිරුළුඅළුදෑයක් — සිඟාගෙණආ දෙයක්.

,, 'භඤ්ජනය — බිඳීම.

,, අතිකුට්ටනාසියෙන් — උඩ තබා කපන අසියෙන්.

,, අසිසූනා වෑත්ත — (මස් කපන) පිහිය හා (යටින් තැබූ) මස් ලොඹුව කොලොම්බුව වෑත්ත.

,, විනිවෙධනාසියෙන් — විනිවිදින අසියෙන්.

**146 පිට.**

,, පිපාසාතුරවෑ — පිපාසයෙන් පීඩිතවෑ

,, පානාගාරයට — සුරාසැලට.

,, දෘෂ්ටධර්මයෙහිම — ඉහාත්මයෙහිම, මේ භවයෙහිම.

,, අනය ව්‍යසනයට — අනභිවෘද්ධියට හා විනාශයට.

,, මනාතගමා — නොබලා.

,, බුභුක්ෂායෙන් — කනු කැමැත්තෙන්.

,, ක්ෂුරධාරායෙහි — දැලිපිහියා මුවගතෙහි

,, සුනිශිත — මනාකොට මුවහත් කළ.

,, සුපාශීත නිස්ත්‍රිංශයටද — යහපත්මෙස් වෂ පොවනලද කඩුවටද.

,, ප්‍රක්ෂිප්ත ශක්තියටද — දමා ගැසූ අඩයටියටද.

,, අඞ්කුශසඞ්ඝාටයටද = හෙණ්ඩ කඳටද.

,, ප්‍රජ්වලිත = හොඳට කැකෑරුණ, හොඳට ඝාකියනලද.

144 පිට.
" මායාමරීචි ජලචන්ද්‍ර = ඇස් බැන්දුම්, මිරිඟු දිය, චන්ද්‍ර.
" ආසක්ති ඇති = ඇලීම් ඇත්තාවූ.
" වීණා හා විෂය හා = වීණද, කාමයද.
" ජන්මාන්තරයෙහිදු = අතීත් ජාතියෙහිද.
" ඒකම්කූපකට සමීපයෙහි = තමමතාවූ (තපුරු) ලිංඉවුරක් සමීපයෙහි.

145 පිට.
" නිල්වෙලෙනෙත් = නීලවර්ණ වලාකුළෙන්.
" දසමඬුලු = දිශාමණ්ඩල.
" සුබලවයෙහිනොඇවිල = සුවලපවූ සැපයෙහි නොඇලී.
" වනවිලින්ගැවීල = වන තඩාගයෙන් නික්මී.
" තැඟී යන හසුන් = ඉගිල යන හංසයන්.
" වෛපුල්‍යයට = මහත්බවට.
" අනුසොතගාමී = වතුර යටදෙයට යන, යටිගංබලා යන.
" පටිසොතගාමී = සැඩපහරට විරුඩව යන, හොය ඉහල යන, උඩුගංබලායන.
" කාමය පිවාහු = කාමය අත්හැරියාහු
" ආදීප්තවූ = ඇවිලගත්තාවූ.

147 පිට.
" ව්‍යාපත්තද = විපත්තිද.
" විප්‍රසන්නවූවාහට = වෙන්වූවන්ට, මිදුනවුන්ට.
" ප්‍රතිෂ්ඨා නොලබත් = පිහිට නොලබත්.
" පූතිබීජ = ඇහවූ බිත්තර, කුණුවූ බිජ.
" ප්‍රතිරූපවෙත් = මැබෙත්, වඩිතය වෙත්.
" ගෙහාශ්‍රිත = ගෘහය ඇසුරු කල.
" විතර්කයක් = කල්පනාවක්.
" විතර්ක ප්‍රශමනයෙහි = විතර්කයන් සංසිඳවීමෙහි.

148 පිට.
" සංසාරාතික්‍රමණයට = සසර ඉකුත්කිරීමට.
" හ්‍රීඅපත්‍රපා = (පාපයෙහි)ලජ්ජාභය.

**148 පිට.**

,, උඩිත චපල මහණ = උඩඟුවූ චපලවූ ශ්‍රමණතෙමේ

,, පංසුකුල් = පාංශුකූල චීවරය

,, සංයමඇති = ඉඳුරන්සංසිඳීම් ඇති, සංවරගුණය ඇති.

,, ගිරිගහවරයෙහි = ගිරිගුහාවෙහි, ගල්ලෙණෙහි.

,, පරිලිප්ත = හාත්පසින් තැවරුණ.

,, ප්‍රගල්භවූයේද = බුහුටිවූයේද, දක්‍ෂවූයේද.

,, ජුගුප්සිත = හවගත් පිළිකුල් ඇත්තෙක්, (ප්‍රතිකූල ඇති )

**149 පිට.**

, ප්‍රහිණතාවේ = පහනුවූයේ වේ, දුරු නුවූයේ වේ.

,, උපඝාතනද = සත්සිඳුමෝද.

,, උපරතද = ප්‍රතිපත්තියෙහි ඇළුණෝද.

,, පරිමිත වචනද = ප්‍රමාණවත් වචන ඇත්තෝද.

,, ප්‍රලය කෙරේ = විනාශ කෙරේ

,, සමාහිතචේතසින් = එකඟවූ සිතින්.

,, කථිතව්‍ය = කියයුතු

,, ගර්භාවක්‍රාන්තිමූලකදුඃඛ = පිළිසිඳ ගැනීම් මුල් කොට ඇති දුක.

,, ගර්භපරිහරණමූලකදුඃඛ = ගැබ පෝෂණයකර ගැණීම් මුල්කොට ඇති දුක.

,, ගර්භවිපත්තිමූලකදුඃඛ - ගැබ විපතට පැමිණීම මුල්කොට ඇති දුක.

,, විජායනමූලකදුඃඛ - වැදීම මුල්කොට ඇති දුක.

,, බහිර්නිෂ්ක්‍රමණ - පිටතට නික්මවීම. ගැබින් නිකුත්වීම.

,, ආත්මෝපක්‍රම - සවකීය උපක්‍රම, තමා විසින් කරනයේ උපක්‍රම.

140 පිට.

,, පරොපක්‍රම - අන්‍යයන් කළ උපක්‍රම.

,, එවමාදී - මේ ආදීවූ

,, පුණ්ඩරීකාදියෑ - හෙළපියුම් ආදියෙහි

,, පක්වාශයෙන් - පැසුන ආහාර තිබෙන තැනින්.

,, පෘෂ්ඨකණ්ටක - පිටකටුව.

,, පරමසම්බාධවූ - අතිශයින් ගැහැට, පීඩා සහිතවූ.

,, තීව්‍රාන්ධකාරවූ - තියුණු අන්ධකාර ඇත්තාවූ.

,, නානාකුණප ගන්ධපරිභාවිත - නොයෙක් කුණු ගඳ ගන්වනලද.

150 පිට

,, පරම දුර්ගන්ධ පවන විචරිතවූ - අතිශය දුර්ගන්ධ වාතය හැසිරුණු.

,, අධිමාත්‍ර ජුගුප්සා ඇති - ඉතා පිළිකුල් ඇත්තාවූ.

,, පූතිමත්ස්‍ය, පූතිකුල්මාෂ, චන්දනිකායෙහි - කුණු මාංසයෙහිද, කුණු ආහාරයෙහිද, කුණු වලෙහිද, (උපදින පණුවෙකු මෙන්.)

,, පූතිපාකය - කඩපිම්මේ තැම්බීම, උණුඅලුපල්ලේ තැම්බීම.

,, සිඳෙන්නේ - ඉඳෙන්නේ, පැහෙන්නේ.

,, ආකුඤ්චනප්‍රසාරණාදි රහිතවූයේ - අත්පා හැකිලීම්, දිගහැරීම් ආදිය නොමැතිව.

,, අධිමාත්‍ර දුඃඛානුභව - බොහෝ දුක්, දුඛ් දුක් විඳීම.

,, මාතෘව් සාහසවෑ - මව් ඉක්මන්ව.

,, උපස්ඛලන - පැකිලීම, හැපීම.

,, නිෂීදන - ඉඳීම.

,, වුට්ඨාන = නැගිටීම

,, අවධූනන, නිර්ධූනන = යටිකුරුව සෙල්ලීම උඩුකුරුව සෙලවීම.

150 පිට.

,, උෂ්ණාහාරාභ්‍යවහරණ කාලයෙහි = උණුආහාර වළඳන කාලයෙහි.

,, අඞ්ගාරවෘෂ්ටිසම්පරිකීර්ණයක්වූ = ගිනි අඟුරු වැස්ස කට අසුවූවෙකු.

,, ක්ෂාරපතච්ඡිකාදි කර්මකරණ = කාරම්දිය ඉසීමාදි කම්කටුලු.

,, අදර්ශනාහීවූ = දකින්ට නුසුදුසු.

,, ඡේදනඵාලනාදී = කැපීම්, පැළීම්ආදී.

,, ප්‍රතිපාද්‍යමාන – පමුණුවනු ලබන.

,, විචූර්ණ්‍යමාන = සුණුකරණු ලබන්නාවූ

,, ස්නාපන, ධාවන, වොලපරිමාජිනාදී = නෑවීම්, සේදීම්, වස්ත්‍රයෙන් පිසදැමීම් ආදි.

,, අචේලක = නිගණ්ඨ, (නිවිස්ත්‍ර තාපස කොටසක්.

,, ආතාපනපරිතාපනානුයොගයෙහි = තැවීම්, හාත්පසින් තැවීම්, වනෙහි අනුව යෙදීමෙහි.

,, අභුඤ්ජමානයහට = නොවළඳන්නාහට.

,, රජ්ජුවින් = රැහැනකින්.

,, උද්බද්ධ්‍යමානයහට = උඩ එල්ලෙන්නාහට, බෙල්ලේ වැළලා එල්ලෙන්නා හට.

151 පිට.

,, දුඃඛ දුඃඛ = කායික චෛත සික දුක.

,, විපරිණාම දුඃඛ = සැපය පෙරළී මෙන් ඇතිවන දුක

,, ප්‍රච්ඡන්න දුඃඛ = දත් කැක්කුම්ආදී අප්‍රකට දුක.

,, පර්‍ය්‍යාය දුඃඛ = ඒ ඒ දුකට වස්තු වූ ජාති ආදිය.

152 පිට.

,, නිර්දිෂ්ටවූ = දක්වන ලද්දවූ.

,, ඛණ්ඩාදිභාව දර්ශනහෙයින් –(දත්) වැටීම් ආදිය පෙනෙන නිසා,

**152 පිට.**

,, මන්දදශකාදිය – ළදරුකාලැ දශ වර්ෂාදිය.

,, දුර්විඥෙය – දැනගත නො හැකි.

,, ස්ථානගමනාසන – සිටීම්, යාම්, ඉඳීම්.

,, දහරකාලයෙහි – කුඩා කාලයෙහි, ළදරුකාලයෙහි.

,, ස්වවිෂය – තමාට ගොචරවූ (රූපාදිය.)

,, පරිපක්ව – මුහුකුරායාම= මේරීම.

,, ආලුලිත – කැළඹුන.

,, අවිශදවූයේ – ප්‍රකට නුවූයේ, නිර්මලනුවූයේ.

,, ඖදාරික – මහත්, සියුම් නොවන.

,, ස්මෘතිමතිවිප්‍රවාස – සිහිනුවණින් වෙන්ව විසීම.

,, අනෙකප්‍රත්‍යයවූ – නොයෙක්දේ හේතුකොට ඇත්තාවූ.

,, තිෂ්‍යමාතෘයෑ – "තිෂ්‍ය" නම් තැනැත්තේ මලේය.

,, පුෂ්‍යමාතෘයෑ – "පුෂ්‍ය" නම් තැනැත්තා මලේය

,, එකභවපර්‍යාපන්න – එක භවයකට ඇතුලත්වූ.

,, විච්ඡේද සඞ්ඛ්‍යාත – කැඩීමයයි කියනලද.

,, සංවෘතිමරණ – ලොක ව්‍යවහාර මරණය.

**163 පිට.**

,, අභිවජ්ත්‍රමුකුලය – නසිහතු කැකුල.

,, නිර්වෘත්තවෙත් – උපන්නෝවෙත්.

,, උත්පත්ති සමනන්තරයෙහි – උපන් අනතුරුව= උපන් ඇසිල්ලෙහි,

,, පරිගලිතශිලා – ගිලිහී වැටුන ගලක්.

**153 පිට.**

" සම්ප්‍රයුක්ත - තමා හා එක්ව යෙදුන.
" ආගත - ආශේය.
" ඉහාභිප්‍රේතවූ - මෙහි අදහස් කළාවූ.
" අස්තාභිමුඛවූයේ - බැසයාමට හැරුණේ,
" පාර්වතෙයවූ - පර්වතයකින් උපන්නාවූ.
" ශීඝ්‍රශ්‍රොතස් - ඉක්මනින් ගලා බසින සැඩ දිය පහර.
" භාරහාරිණීනදී - (රොඩු තණපත් ආදී) හළයුතු දෙය හැරගෙන යන ගඟක්.
" ස්‍යන්දන - ගලායාම, වැගිරීම.
" ප්‍රභාතවෙලායෙහි - අලුයම් වේලෙහි.
" ආපොරසානුගත බන්ධන - තෙත්ගතිය අනුව පැවති බැඳීම.
" ද්‍රුමඵලයන්ගේ - ගස්ගෙඩිවල.
" පතනයක් - වැටීමක්.
" මුද්ගරාභිතාඩිත - මුගුරුවලින් තළතලද.
" මෘද්භාජනයන්ගේ - මැටිබඳුන්වල.
" ස්පෘෂ්ටවූ - ගැහුනාවූ= වැදුනාවූ.
" අවශ්‍යායබින්දූන් - පිනිබිඳු.
" ප්‍රතිවාතයෙහි - උඩු සුළඟෙහි.
" තෘණෝල්කා - තණහුළු=ගිනි හුළු,
" වටහනකලැ - හැඟෙන කාල යෙහි.

**154 පිට.**

" ප්‍රවෘත්තියැ - පවත්නා කාලයේදී.
" සමුච්ඡෙද මරණ - නැවත නූපදින සේ මැරීම.
" අස්ථානයෙහි - නිකරුණේ= කාරණා නැතිව.

**154 පිට.**

, කාලසිංහ – වලසා.

,, හාසවිසින් – සිනා වසයෙන්= කවටකම් වසයෙන්.

,, ප්‍රසන්නවූපරිදි – බැයගත්පරිදි.

,, සථාමසම්පන්නවූ – ශක්තියෙන් යුක්තවූ.

**155 පිට.**

,, හැරබැ – ක්‍රොධකොට.

,, උච්ඡින්නමූල – සිදිනලද මුල් ඇති.

,, සම්මූඪවෙයි – ඉතා මුළාවෙයි.

,, අවරොධජනයනට – අන්තඃපුර ජනයන්ට.

,, කටුම්තිගායෙන් – කටුසැම්පිලියෙන්= කටුපොල්ලෙන්.

,, හිඟුල්හැලි – සාදිලිංගම් ජල ධාරාවක්.

,, දහවුත් – කුපිතවෙතොත්.

,, කිලිල්කඩ – (ඉඳිආදි) බඩ කැබලි, හුණු ගොබ

**156 පිට.**

,, නිගන්පාවකලැ – නිග්‍රහකිරීමට (නික්මවීමට) කාලයයි.

,, හිඟ එවගෙණ – ඔඬොක්කුවෙහි තබාගෙණ.

,, සමසිත්වායි – සමාන සිත් ඇතිවෙවයි.

,, කැත් – ඉවසීම=ක්ෂාන්තිය.

,, සහේපිළිසිඳ – සහෙතුක ප්‍රතිසන්ධිඇතිව.

,, අහේපිළිසිඳ – අහෙතුක ප්‍රතිසන්ධිකව.

,, සදත්ඇත්වැ – ෂද්දන්ත කුලයෙහි හස්තියෙක්ව.

,, වසපූ හීයෙන් – විෂ පොවනලද ඊයෙන්.

,, ගම්නා ගෙන – දරුගෙණ= අල්වාගෙන.

**157 පිට.**

,, දහනකලැ = වෙෂකරණකල්හි.
,, දුසැවිය මනාබැවින් = ක්‍රොධ කළයුතු බැවින්.
,, මුඛ්‍යරූපයෙන් = ප්‍රධාන සවරූපයෙන්.
,, තත්ප්‍රෙරක = ඒ මෙහෙයන්නාවූ.
,, කෙළ මුකුණු ඈ = කෙළ සොටු ආදී.
,, මුක්ෂිතස්ථාන = ගැවුනතැන්= තැවරුණ ස්ථාන.
,, භූයොභාවයෙන් = බොහෝ සෙයින්.
,, ඝැවූවාහු හවනුයේ = ක්‍රොධකළාහට ක්‍රොධකරන්නේ.
,, විප්‍රසන්නොදකයෙන් = ඉතා පැහැදුන ජලයෙන්.

**158 පිට.**

,, කාෂ්ඨමථනයෙන් = වියළිදඬු දෙකක් එකට ගෑමෙන්.
,, සංරම්භයෙන් = කොපයෙන්, ආක්‍රොශයෙන්.
,, ඉඬතරඝිත = දරනැත්තාවූ.
,, පුළුබෝ් තවුස්කල්හි = චූලලබොධි තාපස කාලයෙහි.
,, ගූථකූපයක් = අසුචිවළක්.

**159 පිට.**

,, ත්‍රයස්ත්‍රිංශත් = තිස්තුන් (දෙනෙක්.)
,, පාදවන්තකළහ = පාමුලට නැම්ම වූහ=පාවැන්ද වූහ.
,, සාමාවතී ප්‍රමුඛ = "සාමාවතී" නම් ස්ත්‍රිය ප්‍රධාන කොට ඇති.
,, උදයනාය = උදේනිරජ.
,, සහස්‍රස්ථාමයෙන් = දහස්දෙනෙකු ගේ වීර්‍ය්‍යයෙන්.
,, අසිදගෙණි = උදුරුගෙණ.
,, වග්දෙන්නු = ව්‍යාඝ්‍රධෙනුහු.
,, බඩසාමුවපොල්ලන් = බඩගිනි ඇති මෘගපොතකයන්.

159 පිට.

„ ආතපයෙන් = අව්වෙන්.
„ මූෂිකාවෝ = මීයෝ.

160 පිට.

„ භාවකයනට = භාවනා කරන්නානට.
„ කොණෙසි අහර = හැන්දක් පමණ ආහාර.
„ දෙයධර්ම = දනවස්තු.
„ අර්පිණෝපචාර = එනම් සමාධි දෙක (අර්පිණා x උපචාර.)
„ හිතඵරණ චිත්තය = හිත වශයෙන් පතුරුවන චිත්තය.
„ අපරිත්‍යක්තධ්‍යාන = අත්නොහරිණ ලද ධ්‍යාන ඇති.
„ ශෛක්ෂයා = නිවන් ලැබීමට හික්මෙන පුද්ගලයා.

161 පිට.

„ පහන් පැහැ = ප්‍රසන්න වර්ණ ඇත්තේ.
„ සංවර්තකල්පයෙක්හි = විනාශ වෙගෙණ යන කල්පයෙහි.
„ විවර්තකල්පයෙක්හි = හැදීගෙණ එන කල්පයෙක්හි.
„ ප්‍රාදුර්භූතවෙති = පහළවෙති.

162 පිට.

„ අභිභවා = යටත්කර- මැඩගෙණ.
„ උපධිනිබන්ධන = පස්කම් සැප යට හේතුවන්නාවූ.
„ භවසුඛ සම්පාදක = සසර සැප සිඬ කරණ.

163 පිට.

„ මෘතරූප සන්දර්ශනයෙන් = මළමිනී දැකීමෙන්.
„ අශ්‍රැතවත් = බණදහම් ඇසීමක් නැති= ආගම-අධිගම, දෙකින් තොරවූ.

**163 පිට.**

„ අභිභූතවන = මඩිනු ලබන= පෙළනු ලබන.

„ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානකොට = උපසම්පද ශීලය ප්‍රතික්ෂේප කොට.

**164 පිට.**

„ චිත්‍රීකෘතවනබැවිනුදු = ගෞරව කටයුතු වන බැවිනුත්, සිත් ඇලවිය යුතු බැවින්.

„ අතුල්‍යවන බැවිනුදු = තුල්‍ය නොවන නිසාත්=සමාන නොවන නිසාත්.

„ යක්ෂස්ථාන = යක්ෂයන් වසන තැන්.

„ භූතස්ථාන = අමනුෂ්‍යයන් වසන ස්ථාන.

„ අචිත්‍රවූ ලෝකයා = විසිතුරු නොවූ ලෝවැස්සා.

„ ආත්මනිර්‍ය්‍යාතනාදි = ආත්මය=ශරීරය පාවාදීම් ආදි

**165 පිට.**

„ භයසන්ත්‍රාස = භය හා තැති ගැණීම.

„ හිංසනය = පීඩනය..

„ හනනය = නැසීම.

„ දෘෂ්ටසත්‍යයනට = චතුරාර්‍යසත්‍යය දුටු සත්ත්වයන්ට දක්නාලද සත්‍ය ඇත්තන්ට.

„ සමුච්ඡේදවන බැවින් = මුලින්ම සිඳෙන බැවින්.

„ නිර්වාණාලම්බනවූ = නිවන් අරමුණුව.

„ අවෙත්‍ය ප්‍රසාද - ගුණ දැන පැහැදීම=අචලවූ පැහැදීම.

„ නිර්‍ය්‍යාතන = පාවාදීම,

„ පරායණයෙමි = පිහිටකොට ඇත්තේවෙමි

„ අභිවාදන = වැඳීම.

**165 පිට.**

,, ප්‍රත්‍යුත්ථාන = හුනස්නෙන් නැඟිටීම.

,, පරමනිපත්‍යාකාර - අතිශයින් යටත්වන ආකාර.

**166 පිට.**

,, වෛදිතව්‍යයි = දතයුතුයි.

,, ද්‍රෂ්ටව්‍යයි = දැක්ක යුතුයි.

,, ගෘහීත = ගත්තාලද.

**167 පිට.**

,, ආනෘශංස = ආනිසංස

,, සතර ශ්‍රාමණ්‍ය ඵලය = සොවාන් ඵලය ආදි ඵල සතර.

,, නිත්‍යාදි විසින් = සදාකාලිකය යනාදි වශයෙන්

**168 පිට.**

,, අඥානයෙන් = නොදැනීමෙන්.

,, සංශයෙන් = සැකයෙන්.

,, මහාද්‍යුතික = මහත් (විපාක) ආලෝක ඇති.

,, මහාවිසඵාර = මහත් (විපාක) පැතිරීම ඇති

**169 පිට.**

,, සාවද්‍ය = වරද සහිත.

,, අනවද්‍ය - = නිවරදය= නිර්දෝෂ.

,, ආත්මනිර්‍යාතනාදීන් = ජීවිතය පාවාදීම් ආදියෙන්.

,, උත්තරෝත්තර ජන්මය = මතුමත්තෙහි ඉපදීම.

,, විශෙෂභාග් = විශෙෂවූ (සම්පත්) භජනය කරන්නෝ

,, ප්‍රණාම = වැඳීම්.

,, පඤ්චමිථ්‍යාවණික්කම් = පස්වැදෑරුම් වැරදි වෙළඳාම්

**170 පිට.**

,, විකොපනය = නැසීම, බිඳීම.

,, චණ්ඩාල = සැඩොල්.

,, මලවේද = කිලිටිවේද.

,, නිකෘෂ්ටතර = අතිශයින්නීච.

**171 පිට.**

| | |
|---|---|
| ,, ශ්‍රද්ධාවිරහාදි | = ශ්‍රද්ධාවෙන් වෙන්වීම් ආදී. |
| ,, රත්නභවාදිකරපඤ්චධර්ම | = රත්නභාවාදියකරණ ශ්‍රද්ධාදි පඤ්චධර්මය. |
| ,, උරසිවක්‍රයෙහි | = උරවක්‍රමාලාවෙහි. |
| ,, ප්‍රහරණ චක්‍රයෙහි | = අවිවලල්ලෙහි. |
| ,, අශනි මණ්ඩලයෙහි | = හෙනමැඩිල්ලේ=පිපිරීමෙන් වූ කවාකාරහෙනයෙහි. |
| ,, දුරැවක්‍රයෙහි | = ලීයෙන්කළ රියසකෙහි= , කරත්තරෝදයෙහි. |
| ,, අප දූතයෙන් | = චරිතයෙන්. |
| ,, ත්‍රිශූලා යුධයක් | = උල් තුනක්ඇති ආයුධයක්. |

**172 පිට.**

| | |
|---|---|
| ,, තුවටු උඩුබලා | = තැටි උඩබලා. |
| ,, උසායෙහි | = උසින්. |
| ,, රුවන් පලග | = රත්නපර්‍ය්‍යඞ්ක=මිණිමුවාපුටු |

**173 පිට.**

| | |
|---|---|
| ,, පරිවෘතතවැ | = පිරිවරණ ලදුව. |
| ,, විධෙය | = කීකරු. |
| ,, ආස්තරණ ප්‍රාවරණ | = ඇතිරිලි හා පොරවනවස්ත්‍ර |

**174 පිට.**

| | |
|---|---|
| ,, හිවියස | = උස්වූ කීර්තිය. |
| ,, අභෙද්‍ය | = භෙද්‍යනුවූ=නොබිඳියහැකි. |
| ,, පරිදාහ | = දැවීම. |
| ,, උපසපුයෙන් | = උපසම්පදාවෙන්. |

**175 පිට.**

| | |
|---|---|
| ,, කුලගෙට | = කුල ගෘහයට=ඇතුල්ගමට. |
| ,, ගමන් වල්දක්වා | = ගම්සමීප වනය දක්වා. |
| ,, වෙහෙරත් වල් | = වෙහෙරට සමීප වනය. |

**176 පිට.**

| | |
|---|---|
| ,, විදුලිය කලඹක් | = විද්‍යුල්ලතා සමූහයක්. |
| ,, පුළුවුත්හු | = විචාළෝය. |
| ,, සවරමාත්‍රයෙහි | = ශබ්දය කෙරෙහි පමණක්. |
| ,, යථාබලයෙන් | = ශක්තිවූ පරිද්දෙන්. |

**177 පිට.**

| | |
|---|---|
| ,, පහන් සිතින් | = ප්‍රසන්න චිත්තයෙන්. |
| ,, අස්වලෙක | = අශ්වවාලධියෙක්හි=අස්වලිගයෙක්හි. |

177 පිට.

„ අග්‍රඵල = අභීත්ඵලය.

178 පිට.

„ අභිනීහාර = බුද්ධත්වයපිණිස කරණ ප්‍රථම ප්‍රාර්ථනාව.

„ අවෛවර්තික = නොපෙරළෙන; වෙනස් නොවන.

„ පුණ්‍යාපචය = කුසල් රැස්කිරීම.

179 පිට.

„ විෂලිප්තශරයෙක් = විෂපොවනලද ඊයක්.

„ ක්‍ෂිප්තවූයේ = දමනලද්දේ - බහා තබන ලද්දේ.

„ විෂදිග්ධ = විෂපෙවූ.

„ උපලිප්ත = ආලෙපකළ=තැවරුණු.

„ තුවරලඝ = තුවරලානම් සුගන්ධ වර්ගය.

„ පලාශපත්‍ර පුටයෙන් = කොළගොට්ටුවෙන් = කොළ එතීමෙන්.

„ තගරගන්ධ පරිමල = තුවරලානම් සුවඳින් සුවඳ වත්වූ.

„ පරිපාක = විපාක.

180 පිට.

„ යෙමින් = කියමින්.

„ නළපැලෙකින් = බටකොළ සෙවෙතිකළ කුඩාගෙයකින්

„ සුපිහිතවාර වාතපානඇති = මනාකොට වසනලද දොර වල් හා වාතවුළු (ජනේල) ඇති.

181 පිට.

„ සංසාරසප්වනු = සසර සිටි තැනැත්තෙකු වීමු.

„ කැරුණෝයයි = කෙරුණෝයයි.

„ සවර්ණසෙතු = රන් ඒදණ්ඩ=රන්හෙය.

„ කල්‍යාණාධ්‍යාශය = (කල්‍යාණ x අධ්‍යාශය) යහ පත් අදහස.

182 පිට

„ ගුථ (තෙමේ) = අශුචි.

„ පූති මූත්‍ර = දුර්ගන්ධවූ හෝ අපවිත්‍රවූ මූත්‍ර නොහොත් ගෝමූත්‍ර.

„ සංසක්තවෙත් = ඇලුනෝවෙත්,

182 පිට.

| | |
|---|---|
| ,, පූයා (තෙමේ) | = සැරව |
| ,, සර්පිෂ (තෙමේ) | = ගිතෙල්. |
| ,, විරත | = වෙන්වූ. |

183 පිට.

| | |
|---|---|
| ,, අකුශලකර්මපථසමාපන්න | = අකුසල ක්‍රියා මාර්ගයට පැමිණි. |
| ,, ව්‍යාල කාන්තාරය | = චණ්ඩ මෘගයන්ගෙන් භය ඇති මග. |
| ,, නිරුදකකාන්තාරය | = (නිර් x උදක) ජලය නැති කාන්තාරය. |
| ,, අල්පභක්ෂ්‍යකාන්තාරය | = කෑමට තිසි දෙයක් නැති මාර්ගය. |

184 පිට.

| | |
|---|---|
| ,, කන්දමූලඵලපර්ණමාත්‍රයකුදු | = අල, මුල්, ගෙඩි, කොල පමණවත්. |
| ,, ආස්වාදනය | = රසවිඳගැණීම. |
| ,, අභිනන්දය | - සතුටින් පිළිගැණීම. |
| ,, ගොත්‍රභූඥාන | - සෝවාන්වීමට ඉතා ආසන්නයේදී ලැබෙන ඥානය, පෘථග්ජනගොත්‍රය ඉක්මවමින් ආර්‍ය්‍ය ගොත්‍රයට ඇතුළත්වෙමින් උපදිනඥානය. |
| ,, ව්‍යාපනවැ | - පැතිරී=විහිදී. |
| ,, ශ්‍රවත් වන බැවින් | - රැස්වනහෙයින් = පවතින තිසා. |

185 පිට.

| | |
|---|---|
| ,, මුහුළුමිණියෙහි | - මුහුළු නම් කොණ්ඩයයි. එහි පැළඳි මැණිකෙහි= සිළුමිණෙහි. |
| ,, ජායා උපචාරයෙන් | = ජායාව වෙනස්නොකොට සැලකීමෙන්. |
| ,, අතථාභූත වස්තුහු | = එසේනොවන වස්තු. |
| ,, තථාභූතඥානවිශෙෂයයි | = එසේවීය යන දැනුම් වෙසෙසයි. |
| ,, මධ්‍යවස්ථජනයෝ | = ඇදේ සිටි ජනයෝ. |
| ,, ශිරිස්ථදගනය | = පර්‍ය්‍යඞ්කයළඟ සිටියහුද්‍ය්‍යවීම. |

**185 පිට.**

„ ගොධර්මවාභීත = ගොසවභාව ඇති එනම් ජාති විශෙෂය.

„ සවභාව පර්‍ය්‍යායයි = සවභාව ශබ්දය හා සමානාර්ථයි.

„ යෂ්ටි සහචරිත = සැරයටිගෙණ හැසිරෙණ.

**186 පිට.**

„ කුන්ත සහචරිත = කුන්තනම් ආයුධ අතින් ගෙණ හැසිරෙණ.

„ ඝොෂාධාරදෙශය = ගොපලුගම පිහිටි පෙදෙස.

„ කූපසමීපවර්ත්තිවූ = ළිඳ සමීපයෙහි පවත්නාවූ.

„ ගඞ්ගාකූලනිවාසදෙශය = ගඞ්ගාකූලවතුත් වසන පෙදෙස.

„ විතර්කයෙහි විවිධ කල්පනාවෙහි.

**187 පිට.**

„ සමන්තභාවයෙහි = හාත්පසැ (යන අර්ථයෙහි)

„ විනියොගයෙහි = විශෙෂයෙන් යෙදීමෙහි

„ විනය ක්‍රියායෙහි = විනය කර්මයෙහි.

„ අනුරාගකරවනුයේ = ඇල්මකරවන්නේ.

„ අර්ථචර්‍ය්‍යායෑ = වැඩ පිණිස හැසිරීමය.

„ සමානාත්මතායෑ = අනුත් හා සමාන් ආත්ම ඇතිබව.

„ ප්‍රියංවදවෑ = ප්‍රියවචන කියන්නෙක්ව.

„ උපස්ථිතවූකල = එළඹසිටි කල්හි.

„ එකාසනනිෂද්‍යාදීන් = එක් ආසනයෙක්හි හිඳීම් ආදියෙන්.

„ තාලවෘන්තව්‍යවහාර = තල්අත්තෙන් කළ පවන් = අත්ත තාලවෘන්තනම්, තල් නොවන අත්තකින් කළ පවන් අත්තවත් තාලවෘන්තයයි කරණ ව්‍යවහාරය.

**188 පිට**

„ අනන්තර්හිතවූ කල්හි = නොපෙණීගියකල = අතුරුදහන් වූකල.

„ මෘගසංවර්ත්තනය = ඔවුනොවුන් මෘගයන්මෙන් පෙණී ඔවුනොවුන් මරු ගැන්මෙන්වන විනාශය.

**188 පිට.**

,, පරික්ෂිප්ත = වටකරණලද.
,, ගහනනිඃශ්‍රිතවැ = වනලැහැබ් ආශ්‍රයකොට.
,, අත්‍යන්තසුඛසමර්පිත = අපමණ සැපයෙන් යුක්තවූ.
,, කළුවනා ශරවන = බට වන සහ ශරනම්තෘණ වලින්යුත්වන.
,, වෛරළුම්ණිපළග = වෛදූර්‍ය මාණික්‍යමයපුටු= ආසන.

**189 පිට.**

,, පදන්හි යොගකොට = දුෂ්කරක්‍රියායෙහි යෙදී වීර්‍ය කොට
,, විජගණයෝ = පක්ෂිසමූහයෝ.
,, ශාඛාවිටප පතතුරෙහි = අතුවෙළෙප්කොල අතුරෙහි
,, ධර්මාභිසමය = මාර්ගඵල අවබොධය.
,, අනවලෝමුදුන්දක්වා = කෙතුමාලාග්‍රය දක්වා.

**190 පිට.**

,, සම්ප්‍රහර්ෂණයෙහි = මනාපැහැදීමෙහි.
,, සම්ප්‍රතිග්‍රහණයෙහි = මනාව පිළිගැණීමෙහි.
,, අවධාරණයෙහි = නිශ්චයෙහි= නියමකිරීමෙහි.
,, ඉදමර්ථයෙහි = මේය යන අර්ථයෙහි.
,, ආත්මභාවීනට = ආත්මභාවය ඇත්තවුන්ට.

**191 පිට**

,, අපොළා = ආස්ඵොටනයකොට = අත්පොළසන්කොට,
,, ප්‍රලයකරණ = විනාශකරණ; (ප්‍රලය.) ක්‍රියාක්ෂය; නැතිගැන්වීම.
,, ආධිපත්‍ය = අධිපතිබව.
,, පරාඞ්මුඛ = පිටිපෑම.
,, භූමිපරිග්‍රහ = ගෙබිම් පරීක්ෂණය=ගේතට සුදුසු බිමක් වෙන්කර ගැණීම.

**192 පිට.**

,, මාලාගන්ධවිලෙපන = මල්, සුවඳ, විලවුන්.
,, හර්ෂ නිමිත්ත = සන්තොෂයට හෙතු.
,, සූත්‍රගුලය = නූල්බෝලය=නූල්ගුළිය.
,, ගැත්තේයි = අයිති එකකි.
,, අධිෂ්ඨිත = අධිපතිව සිටියාවූ = අරක් ගෙණ සිටියාවූ.

192 පිට.

,, පුෂ්පපට = මල්රේද්ද.
,, භස්මභාවයට = අලුබවට.
,, උදකාසෙක = වතුර ඉසීම.
,, වැම්භ ගියහ = වැතිරගියහ=පෙරළීගියහ.
,, දිඹුල්පා = දිඹුල් කණු.
,, සත් ඇතවසෙක්හි = වස්සාන සෘතුහතකදී=වස් විසුම්සතකැ.

193 පිට.

,, අභිරම්‍ය = සිත් ඇලවියයුතු=සිත්කලු.
,, හිරණ්‍ය = අමුරන්=ශුඩනොකළරන්.
,, සජිත = සමෘඬ=සම්පූර්ණ
,, සුවර්ණ = රත්රන්.
,, සුඛිත මුදිත = සුවපත්වූ, සතුටුවූ.
,, එෂිකාස්තම්භ = එළිපත් කදන්.

194 පිට,

,, පජීයෙක් - පුරුෂක්.
,, පියගැටවෙහෙළි - පඩිපන්තියේ වේළි; හෙවත් දෙපසබැමි.
,, වෙදිකාව - පිළ.
,, කමල - පියුම්.
,, කුමුද = කෙරව=හෙල් මැලි.
,, උත්පල = මහනෙල්.
,, කුවලය - සුදු=නිල්උපුල්.
,, සර්වසෘතුයෙහි - සියලු සෘතු කාලයෙහි.

195 පිට.

,, සන්තෘප්ත - මනාව තෘප්තියට පැමිණිය වුන්=පිණාගියවුන්.
,, ස්ත්‍රීන් සඳ එළවති - ස්ත්‍රීන් සරහා ලංකෙරෙති.
,, ඇත, තබායෙති - ඇත්තම් තබලායෙති.
,, සකල - සඩසාව=දූවවළල්ල.
,, දන්තමය - ඇත්දත්වලින් කළ.
,, රක්ත චන්දනමය - රත්සඳුනෙන් කළ.
,, මෘදඞ්ගධ්වනි - මිහිඟු බෙරහඬ.
,, ලලිත - ලීලොපෙතවූ.

196 පිට.

,, විලුලිතවූ - විශෙෂයෙන් කම්පිත-කැළඹුනු.

196 පිට.

,, රඞගජන - නටන අය.
,, ගැහැවියක්වැ - ගොවියෙක්ව = ගෘහපති යෙක්ව.
,, පසිලි කෙනකුන් - තාපසයෙකු.
,, තල්ගස්බුදක් - තල්ගස්පීකක්.
,, මහාබ්‍යූහ - එනම් කුළුගෙය.
,, පෞෂධහස්තිරතනප්‍රමුඛ - උපොසථකුලයෙහි උතුම් ඇතෙකු ප්‍රධානකොටඇති
,, දිව්‍යාප්සරසමාන - දෙවඟනන් හා සමානවූ.
,, මෙහෙස්නෝ - මහෙසිකාවෝ.
,, ක්ෂෞම - කොමුපිළී-පට්ටාවලින් වියූ වස්ත්‍ර.
,, කෞශෙය - කොෂෙය්‍ය-සිනිඳු පට වස්ත්‍ර.

197 පිට.

,, නිපන්නේය - නිෂ්පන්නවූයේය = උපන්නේය.
,, තලු - ථාලක=තලි.
,, කුඹු - කළගෙඩි.
,, නියසැත් - නඛච්ඡේදන ශස්ත්‍ර = නිය පොතු කපන පිහියා
,, කෙසි - යතුරු.
,, මලහරණී - කන්හැඳි.
,, පත්ලේ - පත්කිත්.
,, ගනතළළු - නස්න කිරීමට ගන්නා හැඳි.
,, කතුරුයට - හැරම්පි.
,, අපරිහීණධ්‍යානවැ - නොපිරිහුනු ධ්‍යානඇතිව.
,, මල්මලයි - මල් මලානිකවෙයි=මල් පරවෙයි.
,, කක්ෂයෙන්සෙවද සිලියෙයි - කිහිල්ලෙන් දඩිය වැගිරෙයි.
,, උත්කණ්ඨා - කලකිරීම්.

198 පිට.

,, විජෘම්භිත - කය හිරිඇරීම් ඇති=(ඇඟ) මැලි හැරීම ඇති.
,, අභිරමණය - සිත්ඇලවීම
,, උල්කාපාත - තාරකා කඩා වැටීම
,, භූමිචාල - භූමිකම්පා,
,, චන්ද්‍රග්‍රහ - චන්ද්‍රග්‍රහණ.

198 පිට.

„ අපරිමෙය වන බැවින් – ප්‍රමාණ නොකළහැකි බැවින්
„ උපරිදිව්‍යලොකයෙහි – මතුදිව්‍යලොකයෙහි.
„ සුලබ්ධලාභ – මනාකොට ලබනලද ලාභය.
„ සුප්‍රතිෂ්ඨිත – මනාකොට පිහිටි.
„ වර්‍ෂාන්තරාය විරහිත – වැසි බාධ නැතිව.

199 පිට.

„ ප්‍රවෘත්ත – පැවැත්තාහු.
„ ප්‍රවර්‍තනය – පැවතීම.
„ ප්‍රකුපිත – අතිශයින් කිපුනාවූ
„ සම්‍යග්ධාරායෙන් – මනාව වැලනොකැඩී පොද වැගිරීමෙන්.

200 පිට.

„ විෂමපාකී – විෂමවපැසෙන සුලු.
„ බහවාබාධ – බොහෝ ආබාධ = බොහෝ රොග.
„ උපසෙවන – ආහාර හා අනුව ඇසුරු කරණදෙය=ව්‍යඤ්ජන.
„ සන්ගැන්විය – (පොකුණු කරවීමට සුදුසු තැන්) ලකුණුකරවිය.

201 පිට.

„ පබලමුවා – ප්‍රවාලමයවූ=පබලුයෙන්කළ.
„ කුඩුනැව් – කුඩානැව්.
„ මුවරදරෙන් – මල්රෙන්=මකරන්දරේණු.
„ උපකූජිත – නාදකළ.
„ තුෂ්ටරවයෙන් – සතුටුහඬින්.
„ අනෘශංසයෙහි – අනුසස්හි.

202 පිට.

„ සම්භාරභූමියෑ – බොධිසම්භාරපූරණ කාල යෙහි.
„ දිසාපාමොක්ඇජරු – දිශාවකට ප්‍රධාන ආචාර්‍ය්‍ය වරයා.
„ සන්ධියුක්ත – සන්ධිවලින් යුක්තවූ = සන්ධි ඇති.
„ කඩතුරාවක් – තිරයක්.
„ සන්නාහකස්ස – යුධඇඳුම=සන්නාහකවච.
„ මකුටයක්සේ – ඔටුන්නක්මෙන්.
„ මැඩහගුදුන්න – එළු අඟින් කළ දුන්න.
„ මණෙව්වක්හු – මාණවකයෙකු = තරුණ යෙකු.

**202 පිට.**

| | |
|---|---|
| ,, අක්ෂණවෙධී | – විදුලි එළියෙන් විදිනසුලු. |
| ,, වාලවෙධී | – අස්ලොම් පළාගතසේ විදින සුලු. |
| ,, ශබ්දවෙධී | – ශබ්දය අනුව විදිත සුලු. |
| ,, ශරවෙධී | – ඊයෙන් ඊයට විදින සුලු. |
| ,, දුනුවාවන් | – ධනුර්ධරයන්. |
| ,, වජ්‍රාග්‍රකාරාවය | – විදුරක්හෙවත් දියමන්තියක් මෙන් තියුණු අග ඇති යකඩ උල. |
| ,, තෙලෙසේ කිබැවින් | – එපරිද්දෙන් කීනිසා. |

**203 පිට.**

| | |
|---|---|
| ,, ශරප්‍රතිබාධක | – ඊතලපහර වළකන |
| ,, අනෙකක් හා පාවයි | – අනික් ධනුශිල්පයක්ද පෙන්වයි. |
| ,, සූත්‍රයෙන් පරික්ෂිප්තවූ | – නූලෙන් වටකරණලදුව. |
| ,, චක්‍රවෙධ | – චක්‍රාකාරයෙන් විදීම. |
| ,, ලකවිද | – ඉලක්කයට විදලා. |
| ,, ශරයෂ්ටි=ඊතලයටය | – යටයක්සේ ඊතල විදීම. |
| ,, ශරරජ්ජු=ඊතලරැහැණ | – රැහැණක්සේ ඊතල විදීම. |
| ,, ශරවෙණී=ඊතලවෙණිය | – වෙණියක්සේ ඊතල විදීම. |
| ,, ශරප්‍රාසාද=ඊතලපහය | – පහයක්සේ ඊතල විදීම. |
| ,, ශරමණ්ඩප=ඊතලමඩුව | – මණ්ඩපයක්සේ ඊතල විදීම. |
| ,, ශරසොපාන=ඊතලහිත | – හිනිමගක්සේ ඊතල විදීම. |
| ,, ශරප්‍රාකාර=ඊතලපවුර | – ප්‍රාකාරයක්සේ ඊතල විදීම. |
| ,, ශරපුෂ්කරිණී=ඊතලපොකුණ | – පොකුණක්සේ ඊතල විදීම. |
| ,, ශරපද්ම=ඊතලපියුම | – පියුමක්සේ ඊතල විදීම. |
| ,, ශරවර්ෂ=ඊතල වැස්ස | – වැස්සක්සේ ඊතල විදීම. |
| ,, සපතමහාකායප්‍රදලනාතෙලේ | – මහා ශරීර හතක් පැළවේය. |

**204 පිට.**

| | |
|---|---|
| ,, දුඹුල්පුවරුව | – දිඹුල් ලෑල්ල. |
| ,, පියාපුවරුව | – පියාරුක් ලෑල්ල. |
| ,, වල්පලාවිද්ද | – අස්ලෝමය දෙකට පලා විද්දේය. |
| ,, මස්වලු මෙහෙ නිමවා | – රැවුල සම්බන්ධ කටයුතු නිමවා (අන්දම් තබා රැවුල කපා.) |

204 පිට..

„ එමහජනා – ඒ මහාජනයා විසින්.
„ නිෂ්පත්තිප්‍රාප්තවූ – කෙළවරට පැමිණීයෙක්ව.
„ අඹමලියෙක්හි – අඹගසක්මුල
„ පැරැ ගීං හිඳුවාගෙන – ඉදිරියෙහි ඒතලය තබාගෙන.

205 පිට.

„ තොප වුහුවමැනවැයි – තුඹවහන්සේ ඉඳිනුමැනවි.
„ තුවටුමැද – නැට්ට මැද.
„ කැප්මෙහිම හී=කැපුනානැනම – කැපුන සිදුරෙහිම පතිතව.
„ ත්‍රිභුවනවිසමාපතීයවූ – තුන්ලෝවැස්සන් පුදමයට පමුණුවන්නාවූ.

206 පිට.

„ පියදස්සෙනන් – ප්‍රියදශීනය කරණකොට ගෙන.
„ දූ රුවනුන් – දූහිතෘ රතනයන්.
„ සම්බාධකොට – හාත්පසැ අහුරා.
„ සුසපෘෂවමාරවාතපානයැ – හොඳින් වසනලද දොර ජනෙල් ඇත්තේය.
„ නිවාසන, ප්‍රාවරණ, වෙෂ්ටන – අඳින, පොරවන, හිසේ බඳින වස්ත්‍ර.
„ වාරවාතපානයෝ – දොර ජනෙල්
„ අසපෘෂවාරවාතපානයැ – නොවස තලද දොර, ජනෙල් ඇත්තේය
„ සජාලයැ – දූල් සහිතය.
„ ප්‍රාවරණ, වෙෂ්ටන – පොරවන, හිසේබඳින වස්ත්‍ර.
„ දුකූලමයැ – දුහුල් පිළියෙන් කළ
„ ප්‍රතිබාධනය – වැළකීම.
„ දිවාපිහිත – දවල් වසනලද.
„ නාතිවිශාල = ඉතා විශාල නොවූ.

207 පිට.

„ ව්‍යතිමිශ්‍රයන = එකිනෙකට මිශ්‍රවෙත්.
„ ඇතොවුරන් = අන්තඃපුර ස්ත්‍රීන්=රාජ ස්ත්‍රීන්
„ කිඟුමුමන = හෑඬගනාද=මිමැසි හඬ.
„ වෙනෙල් මීසුල්කැල කෙළියෙහි= මුවන් හා මුවදෙනුන් සමූහයාගේ ක්‍රීඩායෙහි.
„ ධරුග්‍රෙයහි = පඊතාග්‍රයෙහි.

197 පිට.

„ විතිගීත = තික්මුනාවූ

„ සපු සලල මළුලියගෙ සලවටගි = සපු, හොර, (රුක්සට) කිඹුගිවූ පුෂ්පලතා ශාඛ ඇති ගල්තලාවෙහි.

„ නුවන් මහනෙල් වහරෙයින් = නෙත්‍ර නැමැති මහනෙල් මල්වැස්සෙන්.

„ තුනුරුක්හි = ශරීර නැමැති වෘක්ෂයෙහි.

„ ලොමුදහඅකුරුසලවමින් = රෝමෝද්ගම නැමැති අඞ්කුර සොලවමින්.

„ ලිදිරෙන = බබලන.

„ කිඹිතිරෙණ = කම්පාවත්නාවූ.

„ මිහිකිරෙණ = මෝරණ

„ රන්ලියඉලතට = සුවර්ණලතාවනයකට.

198 පිට.

„ කිව්දලදල = උස්වූ මහත්වූ දුයා.

„ මෙ ගැජුම් වැනි = මෙඝගර්ජිතාවක් සමාන.

„ බමන වලාතල = භ්‍රමණයකරණ මෙඝමාරු තය.

„ බලමුහුදු මැදහි = සෙනා නැමැති සමුද්‍ර මධ්‍යයෙහි.

„ මදුරුමත් පහර = මධුර මථන ප්‍රහාරය.

„ දෙහොපස්හි = දෙපැත්තෙහි.

„ නිවීඃතපදතිඃක්ෂිපත ගාථාව = නිබ්බුතාපදය ඇතුලත් කල ගාථාව. “නිබ්බුතා නූන සා මාතා නිබ්බුතො නූන සො පිතා, නිබ්බුතා නූන සා නාරී යස්සායං ඊදිසො පති”.

„ සව්සැජවැ = සර්වසජ්ජිතවැ=සියල්ලෙන් සැරහී.

„ හපුස්වමින් = හර්ෂිත,සපශී-කරවමින්.

„ විහිරමින් = විකිදුවමින්.

„ අඹමුඛුළු = අඹයක් ගැකුළුනු.

„ මුවරදමුඩු = මකරන්දයන්උඩ (හෝ සමූහය.)

„ මුඩුමාලලා = මුදුන්මල් එඩමදමා.

„ මිසිඳුවරින් = මීමල් හා නිකමල්වලින්.

„ ලතු අලුත් පතුල් තඹුරෙහි = ලාකඩ දිය ආලෙප කල පතුල් නැමැති පියුමෙහි.

**209 පිට.**

,, රවවමින් = ශබ්ද කරවමින්.

,, වාතය = තෘෂ්ණාව=තණ්හාව

,, නිෂ්පාදනයෙහි - නිපදවීමෙහි.

,, නිර්හරණයෙහි = නික්ත්කිරීමෙහි=බැහැර කිරීමෙහි.

,, ෂට්ත්‍රිංශත්පරමාණුයෙක් = තිස්හයක් පරමාණු, පරමාණු නම්—පියස්සේ සිදුරකින් ගේතුලට වැටෙන සූර්‍ය රශ්මිය දණ්ඩක්සේ පෙණෙන විට එහිතුළ ලෙලදෙන සියුම්වූ ධූලියක 30 වැනි කොටස.

,, සළුලදළරුක්කදමැ = මහත්වූ හොරගහේ කදම

,, රන් රිදී මිණිසත්වූ = සවර්ණ රජත මාණික්‍ය මය ඡත්‍රවූහ.

,, වැලිපිළුමැ * = වාලුකාපීඨයමැ=වැලිතලාවම.

,, නලලොල් උක්මැල් = සුළඟින් කම්පිත වනුක් මල්.

,, සියුරුරැව් = රුසිහඬ.

,, මල්දෙලෙන් = මල්පෙතිවලින්=මල් සමූහයෙන්.

,, නනනමල්ලිය = කම්පිතවන පුෂ්පලතා.

,, පර්‍යාප්ති = ත්‍රිපිටක බුඩවචනය.

,, ප්‍රතිපත්ති = පිළිපැදීම==බුඩනියමය ලෙස පැවතීම.

,, බ්‍රහ්මචර්‍ය්‍යාව =(බුඩශාසනයෙහි) උතුම් හැසිරීම=ශීලාදි ගුණ ධර්‍ම පිරීම.

,, ශාසන බ්‍රහ්මචර්‍ය්‍යා = ත්‍රිපිටක ධර්‍මය හා ප්‍රතිපත්තිය.

,, ප්‍රතිවෙධ ශාසන = සතරමග-සතරඵල-නිවණ.

**210 පිට.**

,, පරිචර්‍ය්‍යා = උපස්ථානය=සෙවනය

,, බ්‍රහ්මවිහාර = මෛත්‍රී, කරුණා, මුදිතා උපෙක්ෂා, යන සතර.

,, මෛථුනවිරති = මෙවුන්දම් සෙවුමින් වෙන්වීම.

---

* "වැලිපෙලම"-ඈතැම. "වාලුකාපඩිසාතියම"-අපිඨ,

**210 පිට.**

„ සවදුරසන්තෝෂ = සවකීය භාර්යාව සමගම සතුටුවීම.

„ ශික්ෂාත්‍රය = අධිසීල, අධිචිත්ත, අධිප්‍රඥා, යන ශික්ෂා තුන.

**211 පිට.**

„ සවදුර = සවකීය භාර්යාව.

„ ආත්මදමන වශයෙන් = තමන්ගේ සිත හික්මවීම් වශයෙන්.

„ අෂ්ටාඞ්ගෝපෝෂථ = අඞ්ග අටකින්යුත් උපෝසථ සීලය=අෂ්ටාඞ්ග ශීලය.

**212 පිට.**

„ දදගළ = ධවජ ගලපත (බඳින) ලද.

„ කුළුතා = (හෙසාරව) නාදකරණ

„ පෙදෙසිමුළින් = ප්‍රදේශිත ජන සමූහයාගෙන්.

„ අපොළන = අත්පොළසන් දෙන= ආස්ඵොටන කරණ.

„ ලලනදෙදෙන් = ලීලෝපෙත=ලෙලදෙන ධවජ (සමූහ) යෙන්.

„ මත්වලුන් = මත්වූ සවභාව. ඇත්තවුන්.

„ රවතරත්රස්තෙන් = නදදෙන රත්රන් රහු ගෙඩිවලින්

„ සව්සැජවන = සියල්ලෙන් සජ්ජවූ (සර්වසජ්ජිත.)

„ සරුප් = සාරුපප=සුදුසු.

„ බඹදුතිපවුල් = මහාබ්‍රහමයා විසින් දෙනලද පාංශුකූල චීවරය.

„ මනවුලුඹුනට - සිත් පැහැර ගැණීමට= සිත් පොලඹවීමට.

„ අගනිදගඩයැ = ගින්නෙන් දනලදී.

„ සොමිපහන්බැහැවී = සොම් පැහැයෙන් පහව=සෞම්‍ය ප්‍රභාවෙන් බාහ්‍යව.

„ සකලැඹිකයැ = කැලල් සහිතය.

„ අකලඹිකයැ = කැලල් නැත්තේය.

„ සවජ්‍රය - වජ්‍රායුධය සහිතය.

212 පිට.

,, ඓරාවතයෑ — ඓරාවණ හස්තිරාජයා සහිතය.

,, ආරෝහපරිණාහසම්පත් — උස මහත දෙකින් සමෘඩිය

,, ශාන්තපිශොව — සංසිඳුනාවූ ප්‍රකෘතිය.

213 පිට.

,, චතුර්මුඛය — සතරමුහුණක් ඇත්තේය.

,, සමන්තමුඛයෑ — වටවූ මුහුණක් ඇත්තේය.

,, උලෙල — ප්‍රීතිඋත්සව, කැලඹීම= ආකූල.

,, උපගතවූ — එලඹියේය=ළඟට පැමිණියේය.

,, භික්ෂාටන — පිඩුසිඟා ඇවිදින.

,, ජඞ්ගමරුවන්මෙරක් — ඇවිදින ස්වර්ණමේරුවක්.

,, නිමන්ත්‍රණ — පැවරීම=ආරාධනාව

214 පිට.

,, බඹරමූමනක් — භ්‍රමරඝොෂණයක්=මීමැසි නඩක්.

,, අධිමුක්තිදූන — අදහස් දූනගෙණ.

,, විභාතකාල — එළිවුන කාලය= පහන්වූ කාලය.

,, කන්වයින් — කොට්ට=හිසෙබා හන.

,, අවගිත — තබනලද

,, ප්‍රතිවෙධකොට — අවබොධකොට.

,, ක්‍රිමිකුලයෝ — පණු සමූහයෝ.

,, ප්‍රච්ඡාදනාකලහ — වසාගත්ත.

,, ප්‍රාණයෙන් සරණගත — දිවිහිම්කොට සරණ ගත.

,, චාතුර්වර්ණ්‍යයන් — සිවුකුලෙහි වූවන්.

,, අනුපලිප්තව — උපලිප්තනොවී= නොතැවරුණෙක්ව.

215 පිට.

,, සන්නිපතිතවෑ — එකතුව=රැස්ව.

චොදකයක්හු — චොදනා කරන්නෙකු=පැමිණිලි කරන්නෙකු.

**215 පිට.**

„ පත්‍රපුටයෙකින් – කොළගොට්ටුවකින්

„ වැලිපලහක් – වැලිගොට්ටුවක්.

„ ඔවීවසි – දමවසි.

„ ඡේම – එයම.

„ අපරකාලභාවීහු – මෑතකාලයෙහිවූ ජනයෝ.

„ සන්නිහිතබාලාන්ධකාර – යහපත්සේපිහිටුවන ලද හිසකේවලින් අන්ධකාර ඇති.

„ භාස්වත්තනුසම්පත් – බබලන්නාවූ ශරීර සම්පත් ඇති.

„ තනු සම්පත් – ශරීර සම්පත්තිය

„ හරිණලෝචන – මුවදෙනුන්ගේ මෙන් ඇස් ඇති.

„ පුණ්ඩරීකමුඛී – පියුමක් බඳු මුහුණ ඇති

„ බාලාතප ප්‍රභාධර – තරුණ සූර්‍ය්‍යරශ්මියට බඳු ශරීර ප්‍රභාව දරන්නාවූ.

„ කුමුදහාසිනී – කුමුදු මල් සෙයින් සුදුපැහැයුත් සිනා ඇති.

**216 පිට.**

„ සමුන්නත පයෝධර – අතිශයින් උස්වූ ස්තන ඇති.

„ කමලකෝමලකර – පද්මයක්මෙන් මොලොක්වූ අත්ඇති.

„ පෘථුශිලාතිතම්බ – මහත් ගල්තලාවක් වැනි පුළුල් උකුල ඇති.

„ කරභෝරූ – ඔටුවන්ගේ මෙන් ක්‍රමයෙන් සිහින්වූ කලවා ඇති.

„ විලම්බිතගාමිනී – ප්‍රමාද (ලැසි) ගමන් යන සුලුවූ

„ උෂ්ට්‍රයෝ – ඔටුවෝ.

„ පයඃපාවක – දිය හා ගිනි.

„ විතර්කයෙහි – කල්පනා කිරීමෙහි.

„ තද්සමාසය – (තත්පුරුෂ සමාසයට අයත්) තකාරාන්ත සමාසය.

217 පිට.

,, ප්‍රසජ්‍ය ප්‍රතිෂේධය‍ - අගපදයේඅර්ථය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීම

,, පර්‍යුදාසය - උත්තරපදාර්ථයට වෙනස්වූ පැවැත්ම=තත්සදෘශාදි අර්ථ.

,, සර්වථාභාවය - සර්වප්‍රකාරයෙන් නොවීම.

,, අබ්‍රාහ්මණමාත්‍රය - බ්‍රාහ්මණ සදෘශයෙකු ගෙණඑව.

,, කාර්‍ය්‍ය ප්‍රතිපාදනා - කටයුතු සම්පාදනය.

,, සිඛාප්‍රාප්තනොවියදී - අප්‍රාප්ත සිඛවිය නොදී.

,, සැහැසුණුවන බැවින් - කෝපවූ,සාහසික-බැවින්.

218 පිට.

,, පරිෂ්කාර = පිරිකර.

,, සම්භාරයෙහි = සමූහයෙහි

,, රත්නසාරයන් = සාරවූ රත්නයන්.

,, ප්‍රත්‍යවෙක්‍ෂණ = නුවණින් කල්පනා කිරීම.

,, ඥෙය්‍යපථයෙහි. = දතයුතු (ධර්ම)මාර්ගයෙහි.

,, ආපත්තියැ = ඇවැතෙහි.

219 පිට.

,, පර්‍ය්‍යාප්ති ධර්මයෙහි = ත්‍රිපිටක ධර්මයෙහි.

,, නිස්සත්ත්ව ධර්මයෙහි = සත්ත්ව පුද්ගල ප්‍රකාශ නොවූ ධර්මයෙහි.

,, සලගලක් = ශෛලමය පර්වතයක්.

,, අස්දම්සැරියෙක් = අස්සදම්ම සාරථියෙක්=අශ්වන්හික්මවන්නෙක්=කුදිරකාරයෙක්.

,, කෙසිය = එනම් රියදුර

,, ශ්ලක්ෂණයෙනුදු = මෘදුගුණයෙන්ද

,, පරුෂයෙනුදු = සැරකමිනුත්.

220 පිට.

,, ව්‍යතිමිශ්‍රදේශනායි = අන්‍යොන්‍ය මිශ්‍ර දේශනාවයි.

**220 පිට.**

,, අනුශාසය = අනුශාසනා කටයුතු
,, අභව්‍ය = පින් නැති-අසමර්ථ-
නුසුදුසු.
,, පරිත්‍යක්ත = හරණලද.
,, දිගම්බරයක්හට = නිර්වස්ත්‍ර නිගණ්ඨයෙකුට.
,, විප්‍රසන්නයෑ = විශේෂයෙන් ප්‍රසන්නය.
,, දහම්රුස්වයි? = ධර්මයට රුචිද?
,, පරිඥතකළ = පිරිසිඳ දැනගත්.

**221 පිට.**

,, අනන්තජිනයෙහි = අනන්ත ජිනනම්වෙහිය.
,, වැදිදුවක වටා වසනුයේ = වැදිදූවක් පොෂණය කර
මින් වාසයකරන්නේ.
,, නිර්වේදයෙකින් = කලකිරීමකින්.
,, අන්තර්භූත වී = ඇතුළත් වූයේය
,, පතනයෙන් = බසිනහෙයින්=බසිනනිසා.
,, උත්පතනයෙන් =, නඟින හෙයින්.

**222 පිට.**

,, ත්‍රිපරිවර්ත්ත = සත්‍යඥානාදීන් පෙරලීම් තුනක් ඇති.
සමුදය ප්‍රහෙයය = දුක්උපදින හේතුව නැති
කළ යුතුය.
,, සාක්ෂාත්කර්තව්‍ය = ප්‍රත්‍යක්ෂකටයුතුය.
,, භාවිතව්‍යය = වැඩියයුතු-වඩිනය කටයුතුය.
,, වර්ෂෝපගම = වස්විසීම=වස්එළඹීම.
,, අග්‍රධර්මප්‍රතිවෙධය =අර්හත් ඵලය දැනගැණීම.
,, එතදග්‍රපාඨසංවර්ණනාවෙන් = ඒතදග්‍රපාලියේ අටුවා
වෙන්.
,, අග දෙසුන් = ප්‍රථම දෙශනාව.

**223 පිට.**

,, අපත්‍රපා = (පවට)භය.
,, සදක් දහනලා පියෙසෑ = ඡද්දන්ත තඩාග ප්‍රදෙශ
යෙහි.
,, වඩ්ඩ්ස සංයුක්තයෙන් = සංයුත්සඟියේ එනම්
කොටසින්.
,, යාවජ්ජීවයෙන් = දිවිහිම්කොට.

223 පිට.

„ භද්‍ර = යහපත්.
„ සරාසිරින් = ශරද්ඍතුවෙහි ශොභා මෙන්.
„ අන්තජටා ද බහිජටා ද = ඇතුළත (තමන් අයත් දෙයෙහි පැවති) තෘෂ්ණා අවුලද, පිටත(අනුන්අයත් දෙයෙහි පැවතිතෘෂ්ණා අවුලද.
„ විජටන = ගැටලෙහීම=අවුල්හැරීම.
„ අධිෂ්ඨිත = අධිෂ්ඨානකළ-අධිපතිව විසූ.

224 පිට.

„ රස් විරමින් = රශ්මීන් විහිදුවමින්.
„ ගිනිදෙවොල = ගිනිදෙවියාපුදන දේවාලය.
„ අරණීමථනයෙන් නැඟි = ගිනිගානාදණ්ඩ ගැටීමෙන් උද්ගතවූ.
„ ඉන්ධන = දර
„ දුමන්නේ = දුම් දමන්නේ.
„ තෙද කසිණු = තෙජොකසිණ සමාපත්තිය.
„ පුවපාකයෙක්හි සේ හිඳී = පියන වැසූ භාජනයක තැවෙන්නෙකුමෙන් තැවී
„ නොසැහැ දිලි නැංග = ඉවසියනොහී දිලිහී නැංගේය.
„ මහපැරක්මා විසින් = මහාපරාක්‍රම ඇත්තාවිසින්
„ සන්තප්ත = ඉතාතැවුනු, රත්වූන.
„ වීෂවෙගානලජ්වාලයෙන් = විෂවේගනැමැති ගිනි දැලින්.
„ විගතවූ = දුරුවූ-පහවූ.
„ කෂ්ටයෑ = තපුරුය=දුෂ්කරය.
„ සම්ප්‍රදලිත මාරබලඇති = වනාකොට සිඳිනලද මාරබලයඇති.

225 පිට.

„ ක්ෂාන්ති = ඉවසීම.
„ පරමෙශ්වරභාව = අතිශයින් ප්‍රධාන බව
„ ඉතා තීව්‍රවූ = අතිශයින් තියුණුවූ.
„ උදභාසිය = උබගුවූ=උස්ව නැංගාවූ

225 පිට.

„ විරලභාවයට = තුනීබවට=අඩුබවට.
„ මාණවක රූපයෙන් = තරුණයකුගේවේශයෙන්.
„ රජ්ජුකුණ්ඩලයක් = අකුළනලද ලනුවක්.
„ දුම්සිළු = ධූමශිඛා.

226. පිට.

„ රුහැණීව = කෝපව
„ යුගන්ගිනි = යුගාන්ත වහ්නිය.
„ භස්මීභූත = අළුවූ.
„ චුහුචුහු = නික්මවූහ.
„ එලවූ නාදුත්තෙන් = නගනලද නාගදන්තයෙන්.
„ අත්ලේ අවුදු තුබූ = අතටගෙණ තිබූනාවූ.
„ පයෑ බහාලා = පාත්‍රයේ දමා

227 පිට.

„ නිර්විෂ = විෂනැති.
„ මනා රුත්ම තනැයි = රහත්නුවූවෙකැයි.
„ මියෙන් ගුළු = මූඛයෙන් වැගුරුණාවූ.
„ අගදයෙන් = ඖෂධයෙන්.
„ අසපුවට = ආශ්‍රමයට=පන්සලට.
„ සලඅවුණුව = ගල්පෝරුව=ගල්ඔරුව.
„ ශක්‍රදත්ත = ශක්‍රයාවිසින් දෙනලද.
„ අග්නිපරිචර්‍ය්‍යාව = ගිනිදෙවියා පිදීම.
„ පැළෙල්වයි = දෙපළුවේවයි.

228 පිට.

„ රජමුසුබිමැ = රජස් (දූවිලි) මිශ්‍රභූමියෙහි.
„ ජටිලසහස්‍රයන් විනයකොටැ = ජටායුක්ත තවුසන් දහ
= ස හික්මවා.
„ කෙලශජටාවන් විජටන = කෙලෙස් නැමති අවුල් නිරවුල්කිරීම.
„ පලුදල = පල්ලවපත්‍ර.
„ ගනගැජුම් = මෙඝගර්ජිතා.

229 පිට.

„ වසන්ත වනයක් = වසන්ත සෘතුවෙහි වනයක්.
„ ආරමණය = ඒඒතැනින්අවුත් සිත්ඇලීම.
„ අභිරමණය = සියසතන්තුළඑළවා සිත්ඇලීම.

230 පිට.

,, හිග එවගෙන = ඇකයෙහි තබාගෙන= උකුලෙහි තබාගෙන.
,, වැම්හයන කනදූසෙසින් = විසිරීයන කනදෙයක්මෙන්
,, සංවෘතිදෙවයන් = රජවරුආදි සම්මුතිදෙවියන්.
,, උපපත්තිදෙවයන් = දෙවයෝනියෙහි උපන් දෙවියන්.
,, විශුද්ධිදෙවයන් = බුදු, රහත් ආදි දෙවියන්
,, ස්වාම්‍යර්ථයෙහි = සම්බන්ධ විභක්ති අර්ථයෙහි.

231 පිට.

,, ජනනද පාලනද = ඉපදවීමත්, ආරක්ෂාකිරීමත්.
,, ගෞතමී = එනම් ගෞත්‍රඇතිදේවිය
,, පරිදෙවනා = හැඬීම
,, මහාමිත්දීවිමැණ = මහාප්‍රඥතැමති මණි ප්‍රදීපය.
,, ශතධෞත = සියක් වරක් ශෝදූ (ගිතෙල්.)
,, පරිදහ = හාත්පස දැවිල්ල.

232 පිට.

,, තප්තඵාලප්‍රවේශ = රත්වූ හීවැලක් ඇතුල් කිරීම,
,, විලිනතාම්‍රලෝහොදකයෙන් = උණුවීමෙන් දියවගිය ලෝදියෙන්.
,, ආසික්ත = වත්කරණ ලද.
,, අපනමයෙහි = පහවීමෙහි
,, සාතාසාත ප්‍රතික්ෂෙප විසින්=සැපදුක්දුරුකිරීම්වශයෙන්.
,, ශොකතානව = ශොක තුනීවීම.
,, සමුච්ඡෙද = සහමුලින්සිඳීම.
,, අභිඥයෙහි චීර්ණවශිතා = ෂඩ් අභිඥයෙහි පුරුදු කළ වසීතාඇතිබව.
,, එකාවර්ජනයෙන් = එක්වරක් මෙනෙහි කිරීමෙන්.
,, බිම්බීඵල = බිඹුපල, කෝවක්කා ගෙඩි.
,, කැළියට = කළුසත්‍රියට
,, ඕවිපැහැ = ඡවිවර්ණය.

233 පිට.

„ ජනව් කැලුණු = ජනපද කල්‍යාණී.
, රූමෙදෙන් මත්වැ = රූපමදයෙන් මත්වී.
„ නය = ක්‍රම.

234 පිට.

„ විත්ථතපර්‍ය්‍යන්ත = විත්ථතයනපදය කෙලවර කොට ඇති.
„ බුද්ධවර්‍ය්‍යා = ප්‍රඥාවමෝරවනුපිණිසහැසිරීම.
„ භවා = භාවනා කොට.
„ ආගත ආවාවූ=පැමිණියාවූ.

235 පිට.

„ පූර්‍ව බුද්ධයෝ = පෙර බුදුවරයෝ.
„ සපත්ථදව්‍යතීහාර = සත්පියවරක් ඉක්මවීම.
„ නෛෂ්ක්‍රම්‍යාදි = පැවිදිවීම් ආදී.
„ කාමච්ඡන්දාදී = කාමතෘෂ්ණාආදී.
„ උන්මූල = ඉදිරුණු මුල්ඇති.
„ කාසීක්‍යාදි = කදබැව් ආදී.
තථධර්‍මය = සත්‍ය ධර්‍මය.

236 පිට.

„ අපර්‍ය්‍යන්ත ලෝකධාතුවැ = පර්‍ය්‍යන්තනොවූ (කෙලවරක් නැති) ලෝකධාතුව.
„ තථස්වභාව = ඇතිසැටිය.
„ පිරිනිවන්හි පහරවා = පරිනිර්‍වාණය දක්වා.
„ හැමසඳදු පෙරළම් මුදු = සියළුකල්හිදු විපර්‍ය්‍යාස නැර.
„ නෛරුක්තිකවිධීන් = නිරුක්තිවිධියෙන්=ව්‍යාකරණ ක්‍රමයෙන්.

237 පිට.

„ අභිභවන අගද = යටපත්කරණ බෙහෙත.
„ පඤ්චනවතිපාෂණ්ඩමණ්ඩල = අනූපස්ආකාරයක මිථ්‍යා දෘෂ්ටි.
„ ප්‍රතාප = තේජස.
„ පහායකිවැත්ත = ප්‍රාසාදයනම් කෙබඳුද.

238 පිට

„ සාලකල්‍යාණීරුක් = උතුම් සල්ගස්.
„ ගතරන් සඟලනගා = සතරුවන්මුවා දුවනගා.
„ කොසම්බක ගන්ධකුටිය = එනම් ගඳකිළිය.

**238 පිට.**

,, සල්කලණ දූවයෙන් = සාලකල්‍යාණ ලීවලින්.
,, කරේරි ගන්ධකුටිය = කරේරිනම් ගඳකිළිය.
,, සලලාගාර ගන්ධකුටිය = ගිම්හල්පිණිසවූ එනම් ගඳකිළිය.
,, කොවෙයින් = කුඹාවීපීයෙන්.
,, ගඳෙවමූවා = නෘත්‍යගීතයෙන් තිමියාක් මෙන්.
,, බල්පුහුදුනෝ = බාල පෘථග්ජනයෝ.
,, රසාල් = පාතාලලෝකය.

**239 පිට.**

,, අභ්‍යවකාශ = අවකාශතැන-එලිමහන.
,, ලක්‍ෂණානු ව්‍යඤ්ජනයෙන් = දෙතිස්මහා පුරුෂලක්‍ෂණ අසූ අනුව්‍යඤ්ජනවලින්.
,, ප්‍රසාදයෙන් බැලූහ = සතුටෙන් අවලෝකනය කළහ.
,, කෙදාරාදි = කුඹුරුආදිය.
,, උපචිත කුශලකර්ම = රැස්කරණලද කුසල්.
,, සංවෘති දෙශනා = සම්මුති දෙශනා.
,, පරමාර්ථ දෙශනා = අභිධර්ම දෙශනා.

**240 පිට.**

,, එවමාදි = මෙආදීවූ.
,, කර්මස්වකතා = කර්මය ස්වකීය කොට ඇති බව.
,, පෘථක්පුරුෂකාර = වෙන්වශයෙන් පුරුෂයෙකුගේ ක්‍රියා
,, දක්‍ෂිණාවිශුද්ධි = දානය ශුද්ධවන ක්‍රම.
,, ලොකසංවෘති = ලොකසම්මුතිය.
,, සම්මූඪ = ඉතාමුළාවූ.
,, කාරාපිතයහ = කරවනලදහ.
,, රුධිරොත්පාද කර්ම = ලේ සෙලවීම් ක්‍රියාව.

**241 පිට.**

,, දානප්‍රතිග්‍රහණය = දන් පිළිගැණීම.
,, සම්මොහ = අතිශය මුළාව
,, පරාම්මුඛ - පිටිපෑම-අහකබලාගැණීම.
,, විමුඛ = අහකබැල්ම-නොසලකා හැරීම.

**241 පිට.**

" ලෝකසංවෘත්තියෙ = ලෝකසම්මුතියෙහි.
" ලෝකනිරුක්තියෙ = ලෝකයාගේ කථාවෙහි.
" ලෝකාභිලාපයෙහි = ලෝකයාගේ කථාවෙහි= ලෝකව්‍යවහාරයෙහි.
" ශාශ්වත දෘෂ්ටි = සදාකාලිකයයන දෘෂ්ටිය
" විධාභින්න = දෙකට බෙදූ.
" ඥානසන්ත්‍රාස = නුවණින් තැතිගැණීම.

**242 පිට.**

" සංඥාවිපර්‍ය්‍යස්ත = සංඥාව පෙරළුනු
" වාරණාදි = හස්තිආදි.
" ඝනනයෙන් = නැසීමෙන්
" අවඥ සහනයෙන් = අවමන් (අපහාස) ඉවසීමෙන්.
" සන්ත්‍රාස ජනක = භය උපදවන

**243 පිට.**

" පුද්ගලස්තව = පුද්ගලයාට ස්තුතිකිරීම.
" ධර්මස්තව = ධර්මයට ස්තුතිකිරීම.
" ධර්මප්‍රතිග්‍රාහක භික්ෂු = ධර්මය පිළිගත් භික්ෂු.
" සුස්ථාපිතයෙ = මනාකොට ස්ථාපනලදී.
" මයිදු කියත් = මා කියන කල්හිදු.
" ඒකාධ්‍යාශය = එකම අදහස.
" චතුරෞඝ නිස්තරණයට = කාමාදි චතුර්විධ සැඩපාරෙන් එගොඩවීම.
" නිඃක්ෂිප්ත = බහාතබනලද, ප්‍රකාශකළ.
" බලවත්තර = ඉතා බලසම්පන්න.

**244 පිට.**

" අන්තරහිතව = අතුරුදහන්ව.
" චිත්තගතීන් = සිත්ගමනින්=සැඩිගමනින්.
" කායගතීන් = ශරීර ගතියෙන් =පාගමනින්.

244 පිට.

,, පුනසසනනිපාතය = නැවත රැස්වීම.

,, දුක්ඛිට =දුෂ්කර=නොගැලපියහැකි.

245 පිට.

,, නනනද්දශීනභෙද = ඒ ඒ දෘෂ්ටි බිඳීම.

,, ගුඪප්‍රශනයෙග් = ගැඹුරුප්‍රශ්න=තේරීමට දුෂ්කරපැන.

,, අභිසංසකාර = සකස්කිරීම=සුදුනම්කිරීම.

,, ප්‍රභින්නවර වාරණ = මත්තහස්තියෙක්.

,, ප්‍රමුදිත = ඉතාසතුටුවූ.

,, සුප්‍රිත = අතිශයින් ප්‍රීතවූ=බොහෝ සේ පිණාගිය.

246 පිට.

,, සලිලධරපටලජනිත = වැසි වලාකුලෙන් හටගත්.

,, බහලාන්ධකාර - දූඩීඅඳුරුඇති.

,, අනිල විදුලිත = වාතයෙන් සෙලවුන =හුලඟින් චචලවූ.

;, ව්‍යාඝ්‍ර නාග විචරිත = ව්‍යාඝ්‍රයන් හා නාගයන් හැසුරුණු.

;; ගහනදෙශයෙහිද = වනලැහැබ්ඇති ප්‍රදෙශ යෙහිද.

;, ගොමගගශිංශපා වනයෙහි = ගවයන්යන මාගීයෙහි ඇටවෙරිය කැලයක.

,, දිවගබ් සුදුසු දිව්‍යවිමානයකට සමානවූ.

247 පිට.

,, දෙශනාධම් ලක්‍ෂණ = දෙශනාධම්යයි කියනලද.

;, ලෞකික ලොකොත්තරධන = සසර සැපදෙන ශ්‍රද්ධාආදි ධනහා=මාගී, ඵල, නිර්වාණ, යන, ධන.

249 පිට.
" ආයාතවූ - ආවාවූ.
" යත්‍රාත් කුල ප්‍රසූතද්වූව - යම් ඒ කුලයක උපන් නමුත්.

250 පිට.
" මගපදලස් දක්වා - මාර්ගයෙහි පාදලාඤ්ඡනය දක්වා.
" ආමුක්තගන්ධ සූත්‍රව - පැළඳගත් පූනනූලක් ඇතිව
" රත්වර වසන් තැගී - රක්තවර්ණ උතුම් වසන් සඟළට තැගී.
" පදලස් - පාදලාඤ්ඡනය, පියලකුණ.
" පදනුපදිකවූ ගොස් - පාදයෙන් පාදය අනුව ගොස්, පියවර අනුසාරයෙන් ගොස්
" අප්‍රකීර්ණයෙන් - පහනොකළ හෙයින්
" අනුල්පනවූ - ඇලුනෙක්ම.

251 පිට.
" පුනර්භවොත්පත්ති - නැවත සංසාරයේ ඉපදීම.
" හෙයොපාදෙයතත්ත්වසම්මූඪ - හළයුතු ගතයුතු දෙක සම්බන්ධ තත්ත්වයෙහි මුලාවූ.
" තත්තත් ප්‍රකාශන වශයෙන් - ඒ ඒ දේ පැහැදීම වශයෙන්.
" තිමිර මථනවූකල - තිමිරයත් මැඩපැවැත්වීම වනාහි
" උපුරුවාපිකල්හි - උගුල්ලා දැමූකල්හි.

252 පිට.
" අහරකිසසාහමින් - ආහාර කෘත්‍යය සිඩසරමින්.
" සැපූකල්හි - ආක්‍රොශ කළ කල්හි.
" උත්කාර භූමියට - අසුචි පතකරණ භූමියට, කසලගොඩට.
" පචනය කළ කල්හි - රත්කළ කල්හි.
" ප්‍රක්ෂරත් ශරීරයෙහි - බහදිය වැගිරෙන්නාවූ ශරීරයෙහි.
" වල්මීක නිකරයක් මදු - තුඹස් සමූහයක් හා සමාවූ
" අවපාතකොට - හෙලීමකොට, හෙලා.
" කබරගොණාකාර - ලප ඇති (කබර ඇති) ගොනුන් සමූහයක් මදුවූ.
" අක්දෙරීයෙහි - අග්‍රචාරයෙහි, ප්‍රධාන දොරවූවෙහි.
" උදකශකුණිකය - දියකිරිල්ලියක්.
" පුෂ්පපුටය - මල්ගොටුවය

253 පිට.
" බ්‍රහ්මාසඵාලනාකොට - බ්‍රහ්මයා කම්පාකොට.
" සතුක්සේ - ඡත්‍රයක් (කුඩයක්) මෙන්.
" අසම්මිශ්‍රවූ - එකිනෙක මිශ්‍රනොවී (එක්නොවී)
" රත්කෙලෙන් - සුවණ්ණවෙයෙන්, රත්කලයෙන්.

254 පිට.

,, නිරුච්ඡවාසනොකොට – හුස්ම නොහෙලිය හැක්කත් නොකොට, (හුස්මහෙලිය හැක්කත් කොට)

,, ආශ්වාසවාරදෙත් – හුස්මගැණීමට වාරයක් (ඉඩක්) දෙත්.

,, සිත්හසර – චිත්තාචාරය, සිතේ පැවැත්ම (අදහස).

,, මහාධර්මාභිසමයවී – මහත් වූ මාර්ගඵලාවබොධවීය.

,, පාදක ධ්‍යාන සමවැද – මාර්ගඵල උපදවන්නාවූ බොහෝ දෙනෙක් ප්‍රථමාදී ධ්‍යානයන් උපදවා ඒට සමවැද එයින්නැගී අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කොට මාර්ගඵල උපදවත්. ඒ මාර්ගය ඒ ධ්‍යානයෙහි ඇති අඞ්ගයන්ට සමාන අඞ්ග ඇතුව උපදී. ඒට පාදකධ්‍යාන යයි කියනු ලැබේ,

255 පිට.

,, සරස්නඹෙන් – ෂඩ්වර්ණ රශ්මිකදම්බයෙන්.

,, යමාමහපෙළහර – යමක මහාප්‍රාතිහාර්‍ය්‍යය.

,, එකීභූත – එක්වීම.

256 පිට.

,, කුඩ්‍යාදීන් – භිත්ති ආදීන්.

,, උන්මජ්ජන නිමජ්ජන – මතුවීම හා ගිලීම

,, අභිද්‍යමානවූ පොළොවැ – නොබිඳිය හැකිවූ පෘථිවිය.

,, පක්ෂිශකුනීන් – පියාපත් ඇති පක්ෂීන්.

,, අන්තරීක්ෂයෙහි – අහසෙහි.

,, හුන්නාහු එවි – උන්නාහු හෝ.

,, අත්පස්වූවන් – එක්රියන් සමාරකට ලංවූවන්.

,, ආමර්ශ පරාමර්ශ පරිමාර්ජන – ස්පර්ශ කිරීමද, ඔබමොබ අත ගැමද, හාත්පසින් අතගෑමද.

257 පිට.

,, යාවත් බඹලෙව්හි දක්වා – බඹලොව යම්තාක්ද, ඒතාක්.

,, විසිය පවත්වන පරිදි – වශ්‍යයෙහි පවත්වන ආකාරය.

,, බඹලෙව් යාවිවුහුතම් – බඹලොවට යනු කැමතිවුහුතම්

,, චිත්තපරි නාමණාකොට – සිත නැමීමකොට

258 පිට.

,, සාත්‍රුකතාවී ප්‍රමෙය – නොකියතලද අපි ඇත් තහුගේ ප්‍රමාණය

,, අතීතාංශඥානයෙන් – අතීත කොටස බලන නුවණින්.

,, සම්බුකොට – අවසර ඇතිකොට, භාරකොට

,, දලසෝනෙලෙන් – දැඩි ශොක නැමැති ගින්නෙන්.

259 පිට.

,, මැසෙති – මැසිවිලි කියති.

,, ධීරපුරුෂයෝ – වීර්‍ය්‍ය සම්පන්න පුරුෂයෝ,

,, වහස්මින් – හඬමින්.

259 පිට.
„ සිහිල්හුණු මැසිමදුරු පිරිපත් – සිතල, උෂ්ණ, මැසි, මදුරු උපද්‍රව.
„ හසුත්කත් විදහා – පය දිගහැර.
„ ඇක්මුනහසි – පා තැබූහයි.
„ හාසුරවූ – බබලන්නාවූ.
„ සම්පාරිපුලලවූ – සියල්ල පිපියාවූ.

260 පිට.
„ ගපුප්තෙලි සෙසින් – පුළුන් පෙඳක් මෙන්.
„ සෑතු දෙනුවූ – සෑතුගුණය දෙන්නාවූ.
„ භික්‍ෂාචාර වෙලායෙහි – පිඩු සිහා හැසිරෙන කාලයෙහි.
„ වපපුණු පොහොයට – වප්මස පසළොස්වක පෝයට.

261 පිට.
„ තුෂ්ටරුවයෙන් – සතුටු හඬින්.
„ ගෙඹදුර වෙහෙරක – ගෘහසමීප විහාරයෙක්හි.
„ මූර්ජනා – ගායනාඞ්ග විශෙෂ.

262 පිට.
„ චන්‍ද්‍රාකාර ව්‍යවස්ථා = චන්‍ද්‍රානම් ගැඹුරු හඬ නගන ආකාර ව්‍යවස්ථා.
„ ශ්‍රැතිභෙදයෝ = නාදයන්ගේ කොටස්.
„ ඊප්සිතයෝසි = කැමතිවන ලද්දේසි.
„ පත්තලද = පිහාටුවල තටුද.

263 පිට.
„ මහම්ඩියේ = මහාමණ්ඩපයෙහි.
„ හැවක් වෙහෙර = එනම් විහාරය.

264 පිට.
„ අලෙපවජ්නායෙන් = මදදෙයකින් සතුටුවන බවය කියනලද ගුණයෙන්.
„ සඞගෘහිතවේ = සංග්‍රහකරණ ලද්දේවේ.
„ අභිකුණපාදී = සභිකුණප ආදී (මළ සපුන්ගේ සිරුරු)
„ ප්‍රක්ෂිපත කාංස පාත්‍රයෙහින් = බහාලනලද ලෝහැටියක් මෙන්.
„ ජුගුප්සනිය = පිළිකුල් කටයුතු.

265 පිට.
„ සූපව්‍යඤ්ජන = බත් බුදීමට උපකරණවූ -මුංඇට ආදියෙන් කළ සුපාදිය (දියාරු ව්‍යඤ්ජන) හා අවශෙෂ ව්‍යඤ්ජනයයි.

165 පිට.

" ශාලිමාංසෞදන ප්‍රතිපන්න = ඇල්හාලේ බොජුන් බහාලූ.
" රූක්ෂප්‍රණීතවූ = රළුවූ හා උතුම්වූ

166 පිට.

" ප්‍රවිවේක = ප්‍රකර්ෂ (උත්තම) විවේකය.
" ව්‍යපකෘෂ්ටකායතායෙන් = වෙන්වූ කය ඇති බැවින්.
" නීවරණ = සවර්ගමෝක්ෂ මාර්ගයන් වසන කාමච්ඡන්දාදිය.
" ගණසංගනිකා විනෝදනය = සමූහයා කෙරෙහි ඇලුම් දුරුකිරීම
" සංස්කාර සංගනිකා විනෝදනය = සංස්කාරයන්හි ඇලුම් දුරුකිරීම
" ඡවාලාතෝපමයෙන් = දෙකොණ ගිනිගත් මැද අසූචි තැවරුණාවූ සොහොන් ගිනිපෙනෙල්ලේ උපමාවෙන්

167 පිට.

" පාපගර්හී වන බැවින් = පාපයන්ට ගර්හා කරන්නෙක් වන බැවින්.
" අනුත්පාද = නොඉපදීම.
" පාරිපූර්ණ = සම්පූර්ණබව.

168 පිට.

" අනේෂණයෙන් විප්‍රමුක්ත = නුසුදුසුවිධියෙන් උපයා ගැණීමෙන් වෙන්වූ.
" ප්‍රත්‍යවේක්ෂායෙන් සම්ප්‍රයුක්ත = නියමිත පරිද්දෙන් කල් පතාවෙන් යුක්තව වැළඳීම් ආදිය කිරීමෙන් යුක්තවූ
" ශික්ෂාපද ව්‍යතික්‍රම = සිකපදයන් ඉක්මවීම

169 පිට.

" විමුක්ති = මිදීම.
" ප්‍රත්‍යනීකාඞ්ගවශයෙන් = විරුද්ධවූ අඞ්ග වශයෙන්.
" පරිත්‍යක්ත = හරණලද්දවූ.
" විෂ්කම්භිත = මැඩපවත්වනලද.
" සමුච්ඡින්න = සිඳිනාලද.
" ශ්‍රාමණ්‍යඵලයෝ = සෝවාන් ආදී ඵලයෝ.
" ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යන්තයෙහි = සන්සිඳීමේ කෙළවරෙහි.
" නිස්සරණවන බැවින් = නික්මෙන ලද්දක්වන නිසා.
" සර්වඥ ප්‍රවාරණයෙන් = සර්වඥයන්ගේ පැවරීමෙන්.

170 පිට.

" කෘතාවකාශවූවාහු = කරණලද අවකාශ ඇතිවූවාහු.

270 පිට.
,, වැලිවෙය = වැලි සහිත වීථියෙහි
,, හස්මුත්දද = සලකුණු ඔබනලද මුද්‍රවද (පේරුස් මුද්ද)
,, නගරුවතද = බඩගරත්තයද.
271 පිට.
,, තසමිමින් = බලමින්.
,, සඳකත් ගලුල් උපල් = චන්ද්‍රකාන්ත පාෂාණ නැමැති නිර්ඣර උල්පත්.
,, කොළොම්බුවැද = කොළොම් වනයටවැදී.
,, යතාගතැපිවැ = උත්සාහයෙන් ගනු කැමතිව.
,, පිහිතකොට = වසා.
,, දහති = ක්‍රෝධවෙති.
,, පලපිලි = පලවැල.
,, යුවරජසිරිවියෝ මහසිමිත්කුළුකල = උප රාජ්‍යශ්‍රීයෙන් වෙන්වීම නමැති මහා ග්‍රීෂ්ම යෙ න් දුඃඛිත කලාවූ.
,, කල්වියෝ = භාර්‍යාවන්ගෙන් වෙන්වූ.
,, මරාසලවව = මරකත මැණික් ගල්තලාව.
,, නවසඳල ගැවසි = අලුත වර්ෂාකල ජල යෙන් යුක්ත.
,, සැසැසෙමින් = විරුඩවෙමින්.
272 පිට.
,, වනසෝකල් බොල්විය = විරහශෝකය බහල විය හෙවත් ඝනවිය.
,, නුඹුහුරනල = ප්‍රශ්වාස වාතය.
,, වැදලිසත්තැත්ම = වදුලවූතැන්ම, සෙවනවූ තැන්ම.
,, දමනැත්යේ = දනලද ස්‍රොතයක්මෙන්.
,, මිණිදූදිරිපත් පෙළින් = පිපීමෙන් දදුරුවූ හෙවත් සියල්ල පිපුණාවූ පත්‍ර පඞක්තියෙන්.
,, වෙලෙප්මසදත්හි = ගස් දෙබල හා මහඅතුවල.
,, තත්කුසුම්රෙජෙත් = නානා පුෂ්පරේණු වෙත්.
,, වෙගෙල්මිසුල්ගණා = මෘගමාගී සමූහයා (මුව සමූහයා)
,, වනයාකරවමින් = වියෝ දුකට පමුණුවමින්.
,, වනයා කලනල්හි = වනයට ගියකල්හි.

**273 පිට.**

කුසුම්අසුරෙත්ඹනා = මල්මීවිවලින් දමන්නාවූ හෙවත් පුෂ්පාශ්‍රයෙන් වැසෙන්නාවූ.

" සුසුම්ගඳින් = සුසුම්ලීමෙහි ගන්ධය කරණකොටගෙන.

" හොවැලලයෙහි හුණුපෙළක්සේ = ඕවිල්ලෙහි ඉණිමං පඩකතියක්මෙන්

" ගණීයෙන්උකතණීවැ = සතුටෙන් උත්සන්නව.

ලෙළලියගලහොයළහි = ලීලොපෙත ලතාවන්ගෙන් ගැවසී ගත් වැලිතලායෙහි.

" හාවභාවයෙන් = ස්ත්‍රීන්ගේ ශෘඞ්ගාරාභිප්‍රායයෙන් උපන් විලාසාදි ක්‍රියාවෙන් හා ලෙහි ඇතිවූ අදහස් වලින්.

" රොස්මුඩු = රේනුයෙන් ගහණවූ හෙවත් ගැවසීගත්.

" යහදෙත = සැපදායීවූ.

" සවීයෙන් = සවභාවයෙන්.

" සපුපැහැසිවිය = බඹරකුගේ මෙන් ඇස් ඇත්තේවිය, හෙවත් ඇස් උඩ ඉන්ද්‍රනෙත් විය.

**274 පිට.**

" රතත්පල්එලහි = රක්තවර්ණ හස්ත නැමැති පත්‍රයෙහි.

" තුන්කැලැතිමැ = ත්‍රිරෙඛා නැමැති.

" අවිදග්ධසනාහරසෙන් = ග්‍රාම්‍යවූ සෙනහ රසයෙන්.

" නුවන් (සොසුලු) සොමිඋවන් = (සුසුම්ලන) සෞම්‍ය මුහුණු.

" විදැමිණිඋෂල් = වජ්‍රමාණික්‍ය උල්පත.

" වීමනායා = විමනාදනයකොට, දුරැකොට.

**275 පිට.**

" ගරසරින් = ගෞරවයෙන්, ආදරයෙන්.

" සියුම්වරලින් = සිනිදු කෙශකලාපයෙන්.

" තමල්ලිය = තමාලලතා, කොල්ලන් වැල්.

" මියෙන්තඹුරු = මුඛයෙන් තාමරසයන්ද.

" සහදප් = දපී සහිතවූ.

" තිඹුහුරු කෙරෙමින් = යටිකුරු කෙරෙමින්.

" වැලෑත = සමීපයෙහි.

**276 පිට.**

" පින්මුවාඉදුහයෙන් = පූර්ණමය සාඩියෙන්.

" සේ දුහුල් = ශවෙත වස්ත්‍ර.

" දළමුත්හර = මහත්වූ මුක්තාහරය.

276 පිට.

,, පලසුදුමලෝලම්බ = (ව්‍යක්ත ශුභ්‍රවර්ණවත් හෙවත් මනා සුදුපැහැ ඇති) එල්ලෙන මල්මාලා.

,, මඟුල් අවුස්වබාපහගෙනලූහ = මඞ්ගල ආශීර්වාද වචා පහන් (සතුටු) කළහ.

,, පළුතුරින් = ප්‍රකාශවූ තූර්‍ය්‍යයෙන්.

,, ගුප්තවෙශ්ම සම්පාදනාදීන් = ආරක්‍ෂා ඇති ගෙවල් සම්පාදනයකිරීම් ආදියෙන්.

277 පිට.

,, රක්‍ෂාවරණ ගුප්තිසංවිධාන = රැකීම, උවදුරු වැලකීම, පාලනය යන මොවුන් පිළියෙල කිරීම

,, භද්‍රතුරංග = හොඳ අශ්වයන්

,, භක්තවේතන දානාදීන් = බත් වැටුප් දීම් ආදීයෙන්)

,, භක්තබීජලාංගලබලිවර්දාදී = බත් බිජුවට (බිත්තර වී. නගුල්, ගොනුන්, ආදීන්.

,, ශමිතපාපවූ = සන්සිඳුවනලද පව් ඇති.

,, බහිෂ්කෘතපාපවූ = බැහැර කරණලද පව් ඇත්තාවූ.

278 පිට.

,, උපවසිතව්‍යදිවසයෙහි = සිල් රක්‍ෂා කටයුතු දවසෙහි.

,, සංශයෙහි = සැකයෙහි.

,, සමුච්චයෙහි = රැස්කිරීමෙහි.

,, ව්‍යවසර්ගයෙහි = වෙන්කිරීමෙහි.

279 පිට.

,, චාරකයෙහි = බන්ධනයෙහි හෙවත් හිරගෙහි.

,, තදභිමුඛීභූත වන බැවින් = ඒව හෝ ඔහුව අභිමුඛවන හෙයින්.

,, භවසුඛාස්වාදග්‍රථිත = සංසාර සැප විඳීමෙහි බැඳුනාවූ.

,, අභිභූත = මඩනාලද.

,, සංවිග්නමානසයනාට = කලකිරුණු හෝ සංවේගයට පැමිණි සිත් ඇතියවුන්ට.

,, ද්‍රෂ්ටව්‍යයි = දැක්ක යුතුයි.

,, භාෂිතයහ = කියනලද්දේය.

,, නිර්වචන විසින් = නිරුක්ති හෙයින්, නිඃශේෂකොට හෙවත් අර්ථය ඇතිසැටි පැහැදිලි කොට කියනලද වචන වශයෙන්.

,, අත්ථොද්ධාර විසින් = අර්ථය ඉදිරීම හෙවත් ඉලිපීම් වශයෙන්.

,, අනූනාධික විසින් = අඩුවැඩි නොවීම් වශයෙන්

,, චතුෂ්ක විසින් = හතර හතර වශයෙන්.

සභාගවිසභාග විසින් = සමාන අසමානකම් වශයෙන්.

280 පිට.

,, භූමිදේවියෝ = පෘථිවි නිශ්‍රිත දෙවියෝ.

280 පිට.

,, නිලීයනස්ථාන = සැඟවෙන ඉඩම්.

,, ලලිතජනයනට = ලීලෝපෙත හෙවත් කාමයෙන් තලවන ජනයන්ට.

,, හවනිකාන්ති = හවතෘෂ්ණාව.

281 පිට.

,, දෙපුතක් = පුත්‍ර දෙකක්.

,, මෛත්‍රී විහාරීන් කෙරෙහි = මෛත්‍රී විහරණය ඇත්තාවුන් කෙරෙහි.

282 පිට.

,, ප්‍රවාරණ සංග්‍රහකොට = වස්පවාරණයෙන් සංග්‍රහකොට

,, සිලපුණු පොහෝ දවස් = ඉල්මස පසළොස්වක දින.

,, ඇකුත්තැන = පාතැබූ තැන්හි

,, වාතජව ඇති = වාතයට බඳු වේග ඇති.

,, ආක්‍රාන්ත මාත්‍රයක් මැවේද = පය තැබූ පමණක්ම වේද, පියවර සටහන් තැනැම් සූසේයි.

,, විච්ඡේදවෙයි = කඩවෙයි.

,, සම්පිණ්ඩිතයන් = එකතුකරණ ලද්දවුන්.

283 පිට.

,, බුඩපර්‍යෙෂණ = බුදුන් සෙවීම

,, ශකටශතයෙනුදු = ගැල් සියයකිනුත්.

,, පරමාර්ථ සත්‍යයෙහි = වෙනස් නොවන සත්‍යයෙහි

284 පිට.

,, ඝොෂ ප්‍රමාණවෙති = ශබ්දය ප්‍රමාණකොට පහදින්නෝ වෙති.

,, ලෝකසන්නිවාසයෙහි = සත්වලෝකයෙහි.

,, අධිගම = මාර්ගඵල ලැබීම.

285 පිට.

,, ආලාහනයට = සොහොනට.

,, තිරෝකුඩ්ඩපෙවත් = තිරෝකුඩ්ඩ නම් ප්‍රෙත වස්තුවෙහි.

286 පිට.

,, සොපධිශෙෂය = උපාදානස්කන්ධ ශෙෂ සහිත (ක්ලේශ පරිනිර්වාණය)

,, නිරුපධිශෙෂය = ස්කන්ධයන්ගේ ඉතිරියක් නැති. (ස්කන්ධයන්ගේ පරිනිර්වාණය)

,, පුනර්භවයෙහි අප්‍රවෘත්තිය = දෙවන භවයෙහි නොපැවැත්ම

287 පිට

,, මෞනෙය ධම්මයෙන් = නිශ්ශබ්ද භාවයෙන්.

,, සුගෘහීතග්‍රාහී = මොනවට ගන්නා ලද්දක්ම ගන්නෙක්

288 පිට.

„ ප්‍රවචනභාවයෙන් = බුඬවචන භාවයෙන්
„ වපනයෙහි වැවෙයි = වැපිරීම් අඪියෙහි පවතී.
„ නොබැඳීබද්ධව = බැඳීමක් නැතිවම බැඳුනෙක් වූවාහුය.

289 පිට.

„ වලුකුළුකල්හි = වැලිකුකුළුව උපන් කල්හි.
„ ගෙලෙන්ගලනොදුරුකොට = ග්‍රීවයෙන්ග්‍රීවය දුරනොකොට
„ ලකඬීවගසිත් = විලාප කියා හඬත් හෙවත් ළය තළා හඬත්.
„ සංස්කෘත ලක්‍ෂණයෙහි = සකස් කළ ලක්‍ෂණයෙහි.
„ උත්තානමවැ = උඩුකුරුව.
„ භූයොභාවයෙන් = බොහෝ සෙයින්.

290 පිට.

„ උත්‍රාසනොවැ = තැති ගැණීමක් නැතිව.
„ ස්මෘතිසම්ප්‍රජන්‍ය = සිහිනුවණ
„ තරණපලවන = එතරවීමද, පිහිණීමද.
„ උන්මජ්ජන නිමජ්ජන = ඉල්පෙන, ගිලෙන.

291 පිට.

„ හ්‍රදයට = විලට.
„ නිර්‍ගතවූ = නික්මුණාවූ
„ ක්‍ෂපිත = කැකෑරෙණලද්දේ.
„ වජ්ජීහු = වැදෑරජවරු.

292 පිට.

„ අඩතෙලෙස්යල්සියක් = එක්දහස් දෙසිය පණසක්.
„ සන්තර්පිතවැ = සතප්පවනලදුව, වළඳවනලදුව.
„ අනුමොදනාකොට = අනුමෙවෙනි ධම්දෙශනා කොට
„ උත්තීර්ණවීද = එතරවීද.

293 පිට.

„ හගැළුවගෙනැ = ගෙරිඅඟක්තුල දමාගෙන.
„ යවකැලිවත් = ඛාද්‍යභොජ්‍යාදි යාවකාලික (එදින ප්‍රයො ජන ගතයුතු දේවල්)
„ අයිරිත් කැප නොකළද = අනතිරිත්ත භොජනය කැප නොකළත්.
„ මහසිමින් = මහා සීමාවෙන්.
„ පැසුළුරිසිගනුත් = පසුව කැමැත්ත ගත්තත්.
„ අමත්දිහි = මථනොකළ දීකිරි (හෙවත් කිරි බැවින් වෙන්වූ දීබවට නොපැමිණි කිරි
„ නොලානුමුනුකළ මිණිඤෙරරුවරරග = ලපවිත් නොවන මූකලෙක් නැති තරුණ සුරා.
„ දගනොලානිසදුන්සිවුරු = දවටු නොදමූ ඉදගත්තා සිවුරු

294 පිට.

,, ප්‍රදේශසර්වයෙහි = කොටසකින් සියල්ලෙහි.

,, සත්කායසර්වයෙහි = සත්කාය දෘෂ්ටිය සම්බන්ධ සියල්ලෙහි.

,, නිකායාන්තර ප්‍රසවකළ = අන්‍ය නිකායවල් ඉපදවූ.

,, විෂමනිඃශ්‍රිතවෙයි = විෂමස්ථානය ආශ්‍රය කරන්නේ වෙයි.

,, ගහනනිඃශ්‍රිතවෙයි = පර්වත වනාන්තරාදී ගහනස්ථාන ආශ්‍රය කරගෙන සිටින්නේ වෙයි.

,, බලවන්නිඃශ්‍රිතවෙයි = බලවන්තයන් ආශ්‍රය කරගෙන සිටින්නේ වෙයි.

,, ලබ්ධිගහනනිපතිතවූයේ = මිථ්‍යාදෘෂ්ටි නැමැති වනලැහැබේ වැටුනේ.

295 පිට.

,, ක්‍ෂුද්‍ර ශාඛාපලාශයෙන් = කුඩා අතු හා කොළවලින්

,, ත්වක්ප්‍රපටිකායෙන් = පොතුවලින් හා පතුරුවලින්.

,, ඵල්ගුසාරයෙන් = එලයෙන් හා හරයෙන්.

296 පිට.

,, සුමුගුමල් = පෙට්ටිවල ලූමල්.

,, කෙශරසටා = කෙසුරු සටා හෙවත් සිංහයාගේ කඳෙහි පිහිටි එකටඑක එකතුවූ කෙස්.

,, වලාහක් අස්රජ් = වලාහක අශ්වරාජයා.

,, උෂ්ට්‍රකුලයෙහි = ඔටුකුලයෙහි.

,, කිඹුල්දහතලාවනයෙහි = ඉඹුල්විල් වනයෙහි.

297 පිට.

,, ආර්යමාර්ගපරිෂ්කෘත = ආර්ය මාර්ගයෙන් අලංකෘතවූ.

,, සෞත්‍රාන්තිකපර්යායෙන් = සූත්‍රපිටකයේ ක්‍රමයෙන්.

,, ලෝමහාලා = ගිල්වාදමා.

,, විපාකවාරප්‍රතිලාභයෑ = විපාකවාරයාගේ ලැබීම.

298 පිට.

,, සාරමෙයව්‍යාධොපමාවෙන් = බලුවැද්දාගේ උපමාවෙන්.

,, ඩංශෙයි = දෂ්ටකරයි

,, ලබ්ධාසෙවනවිසින් = ලබනලද දීර්ඝකාල සෙවනයාගේ වශයෙන්.

,, ඉතරයා = අනිකා.

,, සන්තාපන වශයෙන් = පසුතැවිලි වශයෙන්.

,, ගොගණපරිපූර්ණවූ = ගවසමූහයාගෙන් පිරුණාවූ.

,, ව්‍රජයෙහි = ගරක් ගාලෙහි

299 පිට.

,, ක්‍ෂිප්තකාණ්ඩය = විදිනලද ඊතලය.

,, පිළිජගීද = පොෂ්‍ය කෙරේද

,, දුර්ගතිභවයෙහි = අපාය භූමියෙහි.

,, විපච්චනාකාලෑ = විපාක දෙන කාලයෙහි.

300 පිට.
,, උපඝාතකොට = විනාශකරදමා, නසා.
,, පිළිබහා = අහක්කරදමා, ප්‍රතිබාහණය කොට.
,, උච්ඡින්නකෙරෙයි = උදුරාදමයි.
,, ගතිසම්පත්තින්බාධිතවූ = උත්පත්තියේ යහපත් කමින් වැළකී.
,, උපධිසම්පත්තීන් = රූපසෞන්දර්‍ය්‍යයෙන්, රූපසම්පත්තියෙන්.
,, අනිෂ්ටාලම්බනානුභවයට = අනිෂ්ටවූ අරමුණු අනුභව කිරීමට.
,, ආත්මභාවසමෘද්ධිය = රූපසම්පන්න භාවය.
301 පිට.
,, උපසංක්‍රමණයට = ළඟට පැමිණීමට.
,, ප්‍රතික්‍රමණයට තිසි කල්හි = අහක්වීමට සුදුසු කල්හි, නික්මයාමට සුදුසු වෙලාවට.
,, ලඤ්ජනයට = අත්ලස් දීමට.
,, දුස්සංස්ථාන = නපුරු සටහන්, අවලක්ෂණ අවයව.
,, බෙලුමාලා = පඬික්කම්.
,, භක්තමාෂාදීන් = බත් උඳු ආදීන්.
,, ජුගුප්සිත = පිළිකුල් කටයුතු.
,, පක්ෂහත = අංසබාග රෝගය.
,, අනුචිතයහයි = සුදුසු නොවේයයි.
302 පිට.
,, ආත්මභාවසමෘද්ධියැ = ආත්මභාවයාගේ සම්පූර්ණත්වය.
,, ස්ථානාන්තරයන් = තනතුරු.
,, කල්‍යාණකර්මය = කුශලකර්මය, යහපත් කර්මය
,, ප්‍රතිසංවිත්මාර්ගපර්‍ය්‍යායෙන් = ප්‍රතිසම්භිදා මාර්ග පිළිවෙළින්.
,, වෘහිතවූයේ = රැස්කරණලද්දේ.
303 පිට.
,, සර්වසමය = සකල ආගම්.
,, නිපැද = (බුද්ධත්වය) නිෂ්පාදනයකොට.
,, තරවමින් = එතරකරවමින්.
,, සද්ධර්මප්‍රතිරූපක = සද්ධර්මයාගේ ආකාරය බොරුවට අඟවන.
304 පිට.
,, සමක්ෂශ්‍රාවකයන් = (ඉදිරිපිට සිටි) ශ්‍රාවකයන්.
,, අයෝනිශෝමනස්කාරයෙන් = නුනුවණින් කල්පනා කිරීමෙන්.
,, උද්භාවනා = හටගැණීම.
,, සර්වදර්ශීඥානානු ප්‍රවේශයෙන් = සර්වඥීය දෘෂ්ටියට ඇතුළත් වීමෙන්.

304 පිට.

,, වණීපිටකාදී = එනම් පිටක ආදී.
,, ප්‍රභවරූපයෙන් = මූලස්වරූපයෙන්, ප්‍රකෘති ආකාරයෙන්.
,, අභ්‍රමහිකාධූම රජෝරාහු = වලාකුල්, මීදුම්, දුම්, රජස්, රාහු ග්‍රහයා.
,, වශිතාතිශය – වසඟ භාවයාගේ අතිශයින්.
,, {එකකල්පාවධිකපූර්වෝෂිත ජන්මපරම්පරා ස්මරණ ප්‍රවණවූ} = එක කල්පයක් කාලයතුළ පෙර විසූ ජාති සිහිකිරීමට ප්‍රගුණව.
,, චිත්තචෛතසිකගත = චිත්තචෛතසිකයන් පිළිබඳවූ.
,, ක්ෂණභඞ්ගාදර්ශණයෙන් = ඇසිල්ලක් පාසා බිඳීම නොදක් මෙන්.
,, දෘෂ්ට්‍යභිනිවිෂ්ට = දෘෂ්ටියෙහි ඇතුළත්වූ.
,, දශමහාකල්පස්මරණෝද්භූත මිථ්‍යාවිකල්පග්‍රාහිඑකෙකු } = මහාකල්ප දශයක් සිහිකිරීමෙන් හටගත් වරදවාගත් කල්පනා ඇති එකෙක
,, චත්වාරිංශත්සඞ්ඛ්‍යා මහාකල්ප ස්මරණ වශයෙන් සමුපජාත මිථ්‍යාග්‍රාහග්‍රස්ත එකෙකු } = මහාකල්ප 40 ක් සිහිකිරීම් වශයෙන් උපන් වරදවා ගැණීම් වලට ගොදුරුවූ හෙවත් මිථ්‍යා ඥාන නැමැති කිඹුලා විසින් ගිලිනලද පුද්ගලයෙක,
,, ශුෂ්කතාර්කිකදෘෂ්ටිගතිඑකෙකු = හිස්තර්කයෙන් දෘෂ්ටිගත් තාවූ එකෙක.
,, කෙවලශාශ්වතිකයෝ = සියල්ල සදකාලිකයයි ගත් දෘෂ්ටි ඇත්තෝ.

305 පිට.

,, එකත්‍යශාශ්වතිකභෙදවිභාගයෙහි = කොටසක් ශාශ්වත වශයෙන්ද කොටසක් අශාශ්වත වශයෙන්ද බෙදා සිතීමෙහි.
,, උපරිතනබ්‍රහ්මලෝකයෙන් = ඉහළ පිහිටි බ්‍රහ්මලෝකයෙන්
,, එකාකීවාසයෙන්සංජනිතා තක්ෂණසීවූආත්මවිතීය සත්වෝ තපතත්‍ය භිලාෂ සමනන්තර } = තනිව වාසයෙන් හටගත් කලකිරීම් ඇතිව තමන්ට දෙවැනිවූ සත්වයෙකුත් මෙහි උපන්නොත් හොඳය යන කල්පනාවට පසුව.
,, කාකතාලීයන්‍යායයෙන් සංවර්තිණි අපරසත්වයා කෙරෙහි } = කපුටා ඉගිල්ලෙන කල තල්ගෙඩියවැටී මේ ක්‍රමයෙන් බැසගත්තාවූ අන්‍යක් සත්වයා කෙරෙහි තමන් තර්කණය නොකළදේ සිදුවීම. (මෙහි කපුටාගේ ඉගිල්ම විනා තල්ගෙඩිය වැටීම තර්කණය නොකළේයි. එය අනියමින් සිදුවූ දෙයකි. එබඳුදේ සිදුවීම කාකතාලීය න්‍යාය නම්වේ)
,, ආත්මනිර්මිතත්වපරිකල්පවශයෙන් – තමන් විසින්ම මවන ලද්දකැයි යන කල්පනා වශයෙන්.

305 පිට.

„ එකත්‍යශාශ්වතග්‍රාහග්‍රස්ත - එක කොටසක් ශාශ්වතය යන දෘෂ්ටිග්‍රහණයෙන් ගන්නාලද.

„ ක්‍රීඩාප්‍රදූෂකදෙවනිකායෙන් - එනම් දෙව සමාගමෙන්.

„ ස්වයමනිත්‍යභාව - තමාගේ අනිත්‍ය භාවය.

„ පුනරෙකත්‍යශාශ්වතික දෘෂ්ට්‍යභිනිවිෂ්ට - නැවත කොටසක් ශාශ්වතය යන දෘෂ්ටියට ඇතුලත්වූ.

„ ස්වපරිකල්පමාත්‍රශරණවූ - තමන්ගේ කල්පනා මාත්‍රය පිහිටකොටගෙන.

„ ශුෂ්කතාර්කික - හිස් තර්ක ඇති.

„ අන්තානන්තිකවිභාගයෙහි - එනම් දෘෂ්ටි විභාගයෙහි.

„ තත්‍රාර්පිතචිත්තචෛතන්‍යයන් - ඒ ධ්‍යානයෙහි පිහිටි චිත්ත චෛතසිකයන්.

„ ආත්මත්වයෙන්පරිකල්ප්‍ය - ආත්මවශයෙන් කල්පනාකොට

„ ආත්ම අනන්තයයි විප්‍රතිපන්න දුර්මති එකෙකු } - ආත්මභාවය කෙළවරක් නැතැයි නොමගට පිළිපන් අඥාන එකෙක.

„ තිර්යක්සංවර්ධිතකෘත්ස්නමණ්ඩලයෙහි - හරස් අතට (කොටසක්) වර්ධනය කළ කසින මණ්ඩලයෙහි.

„ අන්තානන්තොභයාංශපරාමර්ශී රූපයෙන් මිථ්‍යාභිනිවේශපරවශඑකෙකු } - කෙළවර ඇතනැත යන දෙකොටසම ග්‍රහණය කිරීම් ස්වභාවයෙන් අසත්‍යයට ඇතුලත් වීමෙන් යටත්වූ එක දෘෂ්ටියක.

„ අවර්ධිතකෘත්ස්නමණ්ඩලයෙහි = නොවඩනාලද කසින මණ්ඩලයෙහි.

„ ආත්මගතඅනන්තවත්තාප්‍රකල්පනයෙන් - ආත්මයට ඇතුලත් වූ කෙළවරක් ඇතිබව කල්පනා කිරීමෙන්.

„ කුමාර්ගාවතීර්ණ - නොමගට බැසගත්.

„ අන්තානන්තොභයාංශරහිත - අන්තය අනන්තය යන දෙකොටස නොමැති.

„ ප්‍රතිෂ්ඨාවිරහයෙන් - පිහිටීමට තැනක් නැති සෙයින්.

„ ඡන්දදෘඪෝපාදාන - ඡන්දාදියෙන් දෘඪකොට ගැණීම.

„ වාග්වික්ෂෙපාපන්න - වචනයෙන් දුරුකිරීමට පැමිණියාවූ.

„ පර්‍යනුයොගභීතීන් - ප්‍රශ්නකිරීමට භයින්.

„ අමරාවික්ෂේපපක්ෂනිඃක්ෂිප්ත - අමරාවික්ෂේප නම් දෘෂ්ටිපක්ෂයෙහි බහාලූ.

306 පිට.

„ අධීත්‍යසමුත්පන්නික - සියල්ල අහේතුකව (නිකරුණේ) උපන්නේය යන දෘෂ්ටිය හෝ එබඳු දෘෂ්ටි ඇත්තා.

„ අසංඥභවය - අසංඥතලය=රූපය පමණක් පහළව පවත්නා ලොකය.

306 පිට.

| | | |
|---|---|---|
| ,, | පඤ්චශතකල්පව්‍යවහිත | පන්සියයක් කල්පවලින් වැසුනාවූ. |
| ,, | පූර්වභවස්කන්ධසන්දර්ශිතයෙහි | පූර්වජාතිවල උපන් ස්කන්ධයන් දකීමෙහි. |
| ,, | අහමිදානීම්පූර්වොත්පන්නඃ | මම දුන් මෙහි ප්‍රථමකොට උපන් තැනැත්තාය. |
| ,, | තස්මාත්සර්වමිදංජගද්යද්වශකම් | ඒ නිසා මේ සියලු ලෝකය සිය කැමැත්තේ හැටියට පවතී. |
| ,, | නභසෝදරකුහර | ආකාශ කුක්ෂියතුළ. |
| ,, | මත්ස්‍යාදිපදාර්ථසංදර්ශිතයෙන් | මත්ස්‍ය ආදි (සජීව අජීව සකල) වස්තූන් දකීමෙන්. |
| ,, | ආකස්මික | අහෙතුකව හෝ නිකරුණේ උපන්- ඉබේම සැදුනු. |
| ,, | තද්විෂයධ්‍යානසංඥා | ඒ ගොචරකොට ඇති ධ්‍යාන සංඥාවෝ |
| ,, | ආත්මරූපිදු | ආත්මය රූප ඇත්තේද. |
| ,, | සංඥිදු | සංඥාව ඇත්තේද. |
| ,, | තදුභයපරාමර්ශවශයෙන් | ඒ දෙකම ග්‍රහණය කිරීම වශයෙන්. |
| ,, | රූප්‍යරූපිස්වභාවද්වයරහිතවැ එකාන්තසංඥී | රූපය ඇත්තේය නැත්තේය යන ස්වභාව දෙකෙන්ම තොරව එකාන්තයෙන්ම සංඥාව පමණක් ඇත්තේය |
| ,, | විප්‍රතිපන්න | වරදවා පිළිපන්. |
| ,, | ශුෂ්කතාර්කික | හිස්තර්ක ඇති. |
| ,, | අවස්ථා වශයෙන් | කාලයාගේ වශයෙන්. |
| ,, | එකත්වසංඥී | එකක් බවය යන සංඥා ඇති. |
| ,, | පරාවෘත්ත | පෙරළාගත්, |
| ,, | අවර්ධිතාලම්බනයෙහි | නොවඩනලද අරමුණෙහි. |
| ,, | ලබ්ධධ්‍යාන | ලබනලද ධ්‍යානයන්. |
| ,, | ආත්මපරිත්තසංඥීය | ආත්මය ස්වල්ප සංඥාවක් ඇති එකෙක. |
| ,, | ත්‍රිකචතුෂ්කධ්‍යාන භූමිය | තුන්වෙනි හතරවෙනි ධ්‍යානයන්ගෙන් උපදින බ්‍රහ්මලෝකය. |
| ,, | සත්ත්වනිර්වෘත්තිසන්දර්ශිතයෙන් | සත්ත්වයන්ගේ ඉපදීම පෙණීමෙන්. |
| ,, | බහුදුඃඛාලයනිරයාන්තඃපාතිසත්ත්වසන්දර්ශිතයෙන් | බොහෝ දුක්වලට ගෙයක් වැනිවූ නිරය ඇතුළට වැටෙන සත්වයන් දකීමෙන්. |
| ,, | ප්‍රතිපන්න | පැමිණි හෙවත් පිළිගත්. |
| ,, | මනුෂ්‍යත්වභාවනිර්වෘත්තිදර්ශිතයෙන් | මිනිසත්බැව්හි ඉපදීම දකීමෙන්. |

306 පිට.

,, ප්‍රවෘත්තව්‍යතිමිශ්‍රවාද – පැවැත්තාවූ මිශ්‍රවාදයද (මරණින් මතු ආත්මය සුවදුක් දෙකින් මිශ්‍රය යන වාදය.)

,, අදුක්ඛාසුඛසමංගීය – (ආත්මය) අදුක්ඛ=අසුඛ (නොදුක් -නොසුව) යන ස්වභාවයෙන් යුක්තය.

307 පිට.

,, විපර්‍ය්‍යස්තමතික = වෙනස්වූ මත ඇති-විපර්‍ය්‍යාසවූ කල්පනා ඇති.

,, තද්වාදප්‍රතිෂෙධකොට = ඉහතකීවාද වලක්වා.

,, දිව්‍යභාවප්‍රාප්තවූ = දෙවියෙක් බවට පැමිණ.

,, කබලීකාරාහාරභක්ෂවූ = කබලූකොට (පිඩුකොට) ගන්නා ආහාර අනුභව කරන්නෙක්ව.

,, උච්ඡින්න = සම්පූර්ණයෙන් නැසුනු-මුල්සුන්

,, මනොමයවූ = චිත්තයෙන්ම හටගත් එකක්ව

,, අහීනෙන්ද්‍රියවූ = පිරිහුණු ඉන්ද්‍රියයන් නැතිව.

,, නිරාකරණ = පහකිරීම-අත්හැරීම

,, ආත්මොච්ඡෙදවාද = ආත්මය සම්පූර්ණයෙන් වැනසේයයි සලකන ලබ්ධිය.

,, දෘෂ්ටධර්මනිර්වාණවාදී = මෙලොවදී ලැබූ නිවනයන ලබ්ධිය ඇති.

,, ධ්‍යානව්‍යාප්තිමාත්‍රයෙන් = ධ්‍යානය පැතුරුණු පමණකින්

,, නිර්වාණසාක්ෂාත්කරණාභිධායී = නිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂකිරීමවේයයි කියන සුළු.

,, ආයාත = ආවාවූ.

,, ආගාමිභවාපෙක්ෂායෙන් = මතු පැමිණෙන භවයක් බලාපොරොත්තුවෙන්.

,, විපරීතාභිනිවෙශ = විපර්‍ය්‍යාසයට ඇතුළත්වීම.

,, අනන්තවයානන්තඃපාතිදෘෂ්ටි = අනන්තවයට ඇතුළත්වූ මිථ්‍යාදෘෂ්ටිය.

,, ප්‍රපඤ්චසංකල්පනාවශයෙන් = විස්තර කල්පනා කිරීමෙන්.

,, උච්ඡෙදපක්ෂනික්ෂිප්ත = උච්ඡෙද පක්ෂයෙහි වැටුනු.

308 පිට.

,, පෙසල = ප්‍රියශීලී=යහපත් ස්වභාව ඇති.

,, රූක්ෂචීවරධර = රළු සිවුරු දරණ.

,, වෙහෙරඹහ = විහාරමහ=විහාරපූජා.

,, සඝතෙරහ = සඞ්ඝස්ථවිර=සඞ්ඝයාගේ ප්‍රධාන ස්ථවිර.

,, රූක්ෂතම = ඉතා රළු, දූර්ණී

309 පිට.

,, ප්‍රෙරිතලෙඛය = යැවූ ලියුම.

309 පිට.

,, ලේඛවාචක = ලියුම් කියවන්නා.
,, ශාරීපුත්‍රප්‍රභෘති = සැරියුත් හිමි ආදි
,, ශැත්තේයෑ = අසිතිය.
,, අභිසමයප්‍රාප්ත = (මාර්ගඵල) අවබෝධයට පැමිණි.
,, අද්භූතාශ්චර්‍යසමානචෙතසින් = අද්භූත ආශ්චර්‍ය භාවයීව · භා සමාන සිතින්

310 පිට.

,, සුප්‍රඥප්ත ආසන = මනාකොට පනවනලද ආසන

311 පිට.

,, කොද්දෑ = කොඳුපලස්.
,, සුදුපුප්අතුරෑ = ශ්වෙත පුෂ්ප (සුදුමල්) ඇති ඇතිරිලි.
,, තිල්ලෑ = පුලුන් දමා කළ "තූලික" නම් ඇතිරිලි වෙසෙස.
,, රත්කොසුකම්කළ = රත්රන් නූල්වලින් කර්මාන්ත කළ.
,, තිහිරිමුවාපසතුරණු = පට්ටාවලින් වියූ පච්චත්ථරණ(=ඇතිරිලි )
,, කැටිතිහිරිහුයින් = කැටිකළද පට්ටා නූල්වලින්.
,, අවන්මහඅතුරැයෑ = ආපත නම් මහ ඇතිරිලිය.
,, කේල්මුවසමින් = කෙසෙල් (කදලි) මුවන්ගේ සම්වලින්.
,, රත්කන්වයින් = රතුකොට්ට
,, අචතුරචිත්‍රකාරයා = අදක්ෂ සිතියම්කරුවා.
,, සමුත්ථාපිතරූප = තනනලද රූප.
,, ඥානවිප්‍රයුක්ත = ඥානයෙන් වෙන්වූ.
,, දුස්සංස්ථාන = නපුරු සටහන් ඇති.
,, පැහුදුක්ඇති = පහකළ දුක් ඇති.

312 පිට.

,, ශ්‍රොතආපන්නයා=සෝතාපත්තිමාර්ගයට පැමිණි තැනැත්තා.
,, සෙල්වියන් = වෙලවිතාන-රෙදිවලින් බැඳි වියන්.
,, වෙදිකා = පිළ.
,, මල්පියවසාගෙන් = මල්පේසාවෙන්.
,, පාදපීඨිකාගෙන් = පාපුටුවලින්.
,, මහසුනු = මහත් ආසන.

313 පිට.

,, පියන්උගුළුවා - පියනහැර.
,, මනම්ණීසේ - චින්තාමාණික්‍යයක්මෙන්.
,, අභික්‍රියා - අභිවෘද්ධි ක්‍රියා=හිතවැඩ.
,, ප්‍රවෘත්තගීතයැ - පැවැත්තාවූ ගීතිකා.
,, මාඅලිගේයෑ - මාවිසින් ගෙනඑන ලද්දේය.
,, නාගලුලිදින්නැගි - නාගලෝකයේ පටන් ඇති ලිඳෙන් නැගී=නාගලොකයෙන් නයි මතුඑ ගිලුනු ස්ථානය හෙයින් "නාගුලුලිඳ" යයි ව්‍යවහෘතවූ ලිඳෙන් (මෙය රුවන්වැලිසෑයලඟ අදත් ඒ නමින් තිබේ.)

314 පිට.

" ප්‍රතිසංවිත - ප්‍රතිසම්භිදා=සිව්පිළිසිඹියා.
" ශුෂ්කවිදර්ශක - සිව්පිළිසිඹියා නැති රහත්, විදසුන් වඩා රහත්වූ තැනැත්තා.
" අනතර්හිත-අතතර්ධාන නවීම, අතුරුදහන්වීව, නොපෙණීයාම
" අ යඝිධර්ම්‍රතිවෙධ - සොතාපත්තිමග්ගාදි උත්තම මාර්ග ඵල අවබොධ කිරීම.
" වෑ යවිනිදෑකෞසීද්‍යබහුලවෑ-වීර්‍ය්‍ය අත්හැර කුසීතබව-(කම්මැලිකම) බහුලව.
" චොදනාසාරණා - නඩුපැවරීම හා වරද සිහිකරදීම.
" කු ‍න්කුදු - (ක්‍ෂුද්‍ර-අනුක්‍ෂුද්‍ර) කුඩා හා ඉතාම කුඩා=දුක්කට දුබ්භාසිත යන ඇවැත් දෙක.
" ප්‍රායශ්චිත්තස්ථුලාත්‍යයටඅවජති = පචිති ඇවතටද ථුලසි ඇවතටද පැමිණෙති.
" ගරුකාපත්තිඅවජති - ගරු ඇවැත් (සඞඝාදිසෙස) වලට පැමිණෙති.

315 පිට.

" යාවත් - යම්තාක්.
" ලජ්ජිහු - පාපයට ලජ්ජා ඇත්තෝ.
" ලාභකාමයෝ - ලාභයට කැමැත්තෝ.
" භික්‍ෂුවිභඞ්ගදක්වා - විනය පිටකයෙහි "භික්‍ෂුවිභඞ්ග" නම් කාණ්ඩය දක්වා.
" තිදශනොද්දෙශමාත්‍රයෙහි - ප්‍රාතිමොක්‍ෂයෙහි "තිදශ නොද්දෙශ" නම් පරිච්ඡේදය පමණෙක්හි.

316 පිට.

" ආකුඤ්චිත - අකුළුවා ගැණීම.
" ප්‍රසාරණ - (අතපය) දිගුකිරීම.
" ආලොකිත - ඉදිරිපිට බැලීම
" විලොකිත - වටපිට බැලීම=විදිශාවලොකනය.
" ප්‍රාසාදික - සිත්පහදවන.
" අලාබුපාත්‍ර - ලබුකබල.
" රජත්සරුප්තොතකාව - පඬුපෙවීම සුදුසුසේ-(යහපත්සේ) මනාකර.
" ඔටඝීවණීණ - ඔටු ඇට පැහැයට ඇති.
" දහසිද - දුවලුකපා.
" ඔවැටිවිද - කඩකපා.
" දුරහරණ - අඹුදරුවන් පොෂණය.
" සැහැවපුට - කුඹුරු කොටා වපුරලා.
" නෛපථ්‍යය - වෙශය-ස්වභාවය.

317 පිට.

" කාරුණ්‍යයෙන් වහස්ති - කරුණා ලීලාවෙන් (හෝ දීන ස්වභාවයෙන්) අඬති.
" ජ්වාල - ගිනිදැල්.
" උච්ජිත්තවෙයි - භිංදයි=සම්පූර්ණයෙන් නැතිවෙයි.

318 පිට.

" චතුර්වණීයන් – ක්‍ෂත්‍රිය, බ්‍රාහමණ, වෛශ්‍ය, ශූද්‍ර යන සතරවංශිකයන්.

" සම්භවවේ – සම්බවේ=ලැබේ.

" සම්ප්‍රතිග්‍රහණයෙහි – පිළිගැණීමෙහි.

319 පිට.

" සම්ප්‍රහර්ෂණයෙහි – ඉතා සතුටුවීමෙහි.

" අධ්‍යුපෙක්‍ෂණීය – උපෙක්‍ෂා කටයුතු=මධ්‍යස්ථ වියයුතු, බලාපොරොත්තු වියයුතු.

" සැත්පහරවන්නට – ආයුධ ප්‍රහාර වදින්ට

" දූහැව – කුපිතව

" එවරද – එකල්හිත්.

320 පිට.

" කරකම්භා – ඉසරවුන් කැප්පවීමින්.

" කොටුකරයෙන් (දවදවා) – ඩැවුනාවූ දලිපිහියෙන් (දිනපතා)

" නැවියහට සතුටුවිහිනම් – නාපිතයාට–හිසරවූ ක්‍ෂනපන්නාට සතුටු වූයෙහි නම්.

" සඟරාදෙහි – සඹ්‍ර්‍යඥනය කෙරෙහිය.

" පංගුලයන් – කොරුන්, පිලුන්.

" වෙත්‍රලතාදීන් – වේවැල් ආදියෙන්.

" උපරචිත – කරණලද.

" දියදෙස්මුත් – (දියසෙවෙල් ආදී) ජලදෝෂයෙන් මිදුනාවූ.

321 පිට.

" සමවායෙහි – රැස්වීමෙහි

" ප්‍රතිලාභයෙහි – ලබාගැණීමෙහි.

" ප්‍රතිවෙධයෙහි – අවබොධයෙහි.

" බොධිගුප්තාදීන් – "බොධිගුප්ත" නම් පුරුෂාදීන්

322 පිට.

" මහලේවිදුරිදුනාවෝ = මහාලේඛක (මහලේකම්) ධුරන්ධර වත්‍රීහටවයන්ගේ ප්‍රධානියා.

" අඹමළුයෙහි = "අම්බමාලක" යෙහි.

" කාලොද්ඝොෂණය = කල්දන්වන ශබ්දය.

" නාවන්කළද = මහලේ විදුරිදු නාවන් විසින් කලදෙය

" මිමෙදෙන් උදම්වැ = මධුමදයෙන් උද්ධමයට (වණ්ඩබවට) පැමිණ.

322 පිට

" පිළිවිදු දහම් තිසා = ප්‍රතිවෙධකළ ධර්මය ඇසුරුකොට.

" පරිවිතර්කය = කල්පනාව.

" වච්දුණීව = අවකාශවජාණුකව=බිම එබූ දණ ඇතිව

නිමි

සද්ධර්මාලංකාරාභිධාන ග්‍රන්ථ ශබ්දාර්ථ විවරණය නිමි.

Presented by the Author to the Editor of Sandaresa

# නිකාය සංග්‍රහ ගැටපද විවරණය.

## නමොතස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

### 1 වෙනි පිට.

නිකාය—(නි+කාය) මනාවූ සමූහය හෝ වර්ගය; සමාන පැවතුම් ඇත්තවුන්ගේ රැස.

සංග්‍රහය—රැස්කරණලද්ද; මනාසේ ගන්නාලද්ද.

නිකායසංග්‍රහය—සමාන පැවතුම් ඇත්තවුන්ගේ සමූහය, පිළිබඳ රැස්කරණලද්ද.

ස්වස්ති—සැපවේවා; සැපඇති; ප්‍රත්‍යවනතවූ.

ප්‍රශස්ත—පසස්නාලද; ප්‍රශංසා කළයුතු.

ශ්‍රීඝන—සම්බුදුරජාණන්වහන්සේ; ශ්‍රීයෙන් පූර්ණවූ; සම්පත්තීයෙන් පිරුණු

සකලශාසන—පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවෙධ; යන සියලු සසුන.

සකලශාසන ශ්‍රීභාරධාරී—සියලු සසුන් සැපදරණ; සකල ශාසන සම්පත්ති භාරය දරියයුතු.

ශ්‍රීලඞ්කාද්වීප ප්‍රදීපායමාන — සිරිලකට පහනක් වැනි.

ලොක ශාසනානු රක්ෂණයෙහි—(ලොක + ශාසන + අනුරක්ෂණයෙහි) ලෝසසුන් දෙකටඑකඟව රක්ෂාකිරීමෙහි, ලෝසසුන්පිළිවෙළින් රැකීමෙහි;

දක්ෂ—සමර්ථ;

ගුණ නීතිමාර්ගානුවර්තක—(ගුණ + නීති + මාර්ග + අනුවර්තක) ගුණයටහා නීතිමාර්ගයට එකඟව පවත්නා.

මධ්‍යස්ථාභිජාත—(මධ්‍යස්ථ + අභිජාත) මැදහත් බවෙන් මනාසේ උපන්.

කීර්ත්තිප්‍රබන්ධ—යශොඝොෂාවෙන් බැඳුනු,

ශුද්ධ බෞද්ධ—පිරිසුදු බුද්ධභක්තික.

ශ්‍රද්ධාවනත—සැදැහැවත්.
රාජ රාජ මහාමාත්‍යාදීන්—රජ, යුවරජ, මහා ඇමති ආදීන්.
ආයුරාරෝග්‍යාදි—[ආයුඃ + ආරෝග්‍ය + ආදි] ආයුෂය නිරෝගිභාවය ආදි.
සකලාභිවෘද්ධි වර්ධනය පිණිස—සියලු දියුණුවෙහි වැඩීමට, සියලු යස ඉසුරු වැඩීමට.
සාදරාර්ජිත—සාදරයෙන් සැදූම්ලද, ආදර සහිතභාවයෙන් යුක්ත
පුණ්‍යසම්භාරප්‍රදත්ත—පින්සමූහය දෙන.
පූර්වාඞ්ගමව—පෙරටුව, පළමුව.
අනුනය ප්‍රතිඝ—ප්‍රලෝභ හෙවත් පෙළඹවීමේ ක්‍රෝධය.
පරිත්‍යක්ත—හාත්පසින් හරණලද, සහමුලින් දුරුකළ.
මහාසථවිර—මහලුම්ගතෙරුන්
පූර්වලිඛිතයද—පෙරලියනලද්දද; පූර්වවිස්තරයද.
ඇසුදුටු—අසනලද දකිනලද.
ප්‍රත්‍යක්ෂකාර්‍ය්‍ය මාර්ගය—පැහැදිලි සත්‍යවූ කටයුතු පිළිවෙළ, ඇස්හමුවෙහි සිදුවූ ක්‍රියා පටිපාටිය.
ආශ්‍රකොට—ඇසුරුකොට.
ජිනවර පරිනිර්වාණයෙහිපටන්—ජිනේන්ද්‍රයාණන් වහන්සේගේ පිරිනිවීමෙහි පටන්, බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමෙහි පටන්
පසළොස්වනුමෙවක් පෙරවැ—පහළොස්වනමේවර්ෂයෙන් පූර්වයෙහි
ශාසනප්‍රවෘත්තිය—බුද්ධශාසනය පැවතීමේ විස්තරය.
සැකෙවින්—ලුහුඬින්; සාංක්ෂිප්ත වශයෙන්.
දෙවරක්ඛිතසථවිරාභිධාන—"දෙවරක්ඛිත සථවිර" යන;
පූර්වනාම ප්‍රකාශිත—පූර්වනාමයෙන් ප්‍රකාශකරණලද;
ශාසනාවතාරචරිතයක්—සසුනට බැසගැණීමේ සිරිතක්; ශාසනය පිළිබඳ ප්‍රවෘත්තියක්;
ධර්මානුගත—ධර්මයට එකඟ.
කථාප්‍රබන්ධයෙක්—කථා විස්තරයෙක්,
සිතහෙලා—සිත් අවනත කොට, සිත් යොමු කොට.
කරුණාපුරස්සර—කරුණාපෙරටුව ඇති.
ප්‍රඥගති—ඥනවිශෙෂය
මහතවුසක්ව—මහා තාපසයෙක්ව
දිවකුරු බුදුන් හමුව—දීපඞ්කර බුදුරජාණන් (සම්මුඛව) ඉදිරියේ.
සැසානතවු—අතටපත්,
හිතපිණිස—වැඩසඳහා.

බුදුබැව්පතා—සර්වඥපද ප්‍රාර්ථනා කොට.
විවරණ—මෙතෙක් කලකින් මෙසේ බුදුවන්නේයයි
බුදුකෙනෙකුන් වහන්සේගෙන් ලබන නියමය,
බුද්ධකාරක ධර්මයන්=බුදුබැව් සිඩකරදෙන දහම්,
පූරණ අභිප්‍රායෙන්—සම්පූර්ණ කරණ අදහසින්.
මෑතභාගයෙහිදු—(දීපඞ්කර බුදුරජාණන් වහන්සේගෙන්) පසුකාලයෙහිදු.
විවරණ ශ්‍රී=විවරණ සම්පත්.
සාරඅසඞ්ඛ්‍ය කල්පලක්ෂයක්=(සාර + අසංඛ්‍ය+ කල්ප + ලක්ෂයක්) අසඞ්ඛ්‍ය කල්ප ලක්ෂ හතරක්.

කල්පයෝවූකලි අන්තඃකල්පය අසඞ්ඛ්‍ය කල්පය, මහාකල්පයයි ත්‍රිවිධ වෙත්. අන්තඃකල්ප 20 ක් එක් අසංඛ්‍ය කල්පයෙක් වෙයි. අසංඛ්‍යකල්ප හතරෙක් මහාකල්පයෙක් වෙයි. අන්තඃකල්පයෙක්නම් මනුෂ්‍යායුෂය දශ වර්ෂයේ පටන් ආරම්භව ක්‍රමයෙන් අසංඛ්‍යායුෂය දක්වා නැගී ගොස් නැවත අනුක්‍රමයෙන් පහතබැසීමෙන් දශවර්ෂය දක්වා අඩුවීමට ගතවන කාලයයි. අන්තඃකල්ප විස්සක් අසංඛ්‍ය කල්පයක් වෙයි. මෙහි වර්ෂප්‍රමාණය එකය. දශය, ශතය, සහස්‍රය යනාදීන් ගණන ඉක්මා සිටි හෙයින් අසංඛ්‍යකල්ප නම්වේ. සංවර්තය, සංවර්ත ස්ථායිය, විවර්තය, විවර්ත ස්ථායිය යන අසංඛ්‍ය කල්පසතරක් එක්වූ කල්හි මහා කල්පයෙක් වෙයි.

නිරතුරුව—අතුරක් (අන්තරයක්) නොමැතිව, නිතර,
දශප්‍රකාර පාරමී ධර්මයන්—දශවැදෑරුම් පෙරුම්දම්, දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්ෂා යන මොහු දශ පාරමී ධර්ම නම්වෙත්.
මුහුකුරුවා—මෝරවා.
දෙව් බඹුන්ගේ අයැදුමෙන්—දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආයාචනාවෙන්; ආරාධනාවෙන්.
පස්මහ බැලුම්—පඤ්චමහා විලෝකන, කාල, දේශ, කුල, දීප, මවු යන පසකෙරෙහි මනාසේ කරණ බැලීම.

1. මනුෂ්‍යයන්ගේ ඉතා හීන නොවූද ඉතා අධික නොවූද මධ්‍යම ප්‍රමාණ ආයුෂ ඇති කාලය වෙසෙසා බැලීම කාලවිලෝකනයයි.
2. ප්‍රත්‍යන්තදේශ නොවූද සකල බුදුවරයන්ගේ උත්පත්තිස්ථානවූද සම්‍යක්දෘෂ්ටිය පැවතීමට නිවාසවූද මධ්‍ය මණ්ඩලය වෙසෙසා බැලීම දේශවිලෝකනයයි.

3. පූර්වබෝධිසත්ත්වවරයන්ගේනිත්‍යඋත්පත්තියට ආධාරවපැවති ජම්බුද්වීපය කෙරෙහි වෙසෙසා බැලීම දීප විලෝකනයයි.
4. බෝධිසත්ත්වවරයකුගේ උත්පත්තිය සිද්ධවීමට සුදුසු කාලයෙහි සුදුසු දේශයෙහි කවරකුලයෙක් උසස්වපවතීදැයි වෙසෙසා බැලීම කුල විලෝකනයයි.
5, බෝධිසත්ත්වවරයකුගේ පිළිසිඳ ගැණීම ලැබීමට ප්‍රාර්ථනා බලූ ඇති මැතිකෙනෙකුන් කෙරෙහි වෙසෙසා බැලීම මාතෘ විලෝකනයයි

ප්‍රථම කල්පාත්භූත—කල්පයෙහි ප්‍රථමයෙන් හටගත්.
මහා සම්මත—මහාජන සම්මත, ප්‍රථම කල්පයෙහිදී මහාජනයාගේ සමාන මතයෙන් තෝරා රජතනතුරෙහි තබාගත්උතුමා
අසම්භින්නව—නොබිඳී; අතුරක් නොමැතිව.

---

## 2 වෙනි පිට.

ඒකවංශප්‍රසූත—එකම වංශයෙහි උපන්, එකකුල හටගත්.
සතානූවක්—අනූසතක්.
අභිෂේකප්‍රාප්ත—ඔටුනු පැළඳ හිසදියමන් කරණු ලැබූ.
සූතිස් දහස්—තිස්හතර දහස්
හිරුගොත්—සූර්‍ය්‍යවංශ
උභයකුල පරිශුද්ධ—මවුපිය දෙවංශයෙන් පිරිසිදු
නරපතිනු තිසා—රජ්‍යකරණකොට
පිළිසිඳ—ප්‍රතිසන්ධිග්‍රහණයකොට; කුසැපිළිසිඳී
දශමාසාවසානයෙහි—දසමස් ඇවෑමෙහි; දසමසක් කෙළවරෙහි
වෙසගපුණුපොහෝලද—වෛශාඛපෞර්ණමී පොහොයලද; වෙසක් පුරපසළොස්වකලත්
විසානකතින්—වෛශාඛ නක්ෂත්‍රයෙන්; නකත් 27 න් 16 වන නකතින්
මගුලූයන්හි—(මගුල්+උයන්හි) මංගලෝද්‍යානයෙහි
අනුක්‍රමයෙන්—පිළිවෙළින්
යෞවනප්‍රාප්තව—යොවුන්බවට (තරුණවියට) පැමිණ
ප්‍රමුඛ—ප්‍රධාන
පුරඹගනාවන්—පුරස්ත්‍රීන්
තුන්පායෙහි— තුන් ඍතුවෙහි සැප විහරණයට සුදුසු රම්මය, සුරම්මය, සුභයයි යන ප්‍රාසාද තුනෙහි
ශක්‍රදේවේන්ද්‍රලීලාවෙන්—සක්දෙව්රජකුගේ ආකාරයෙන්

සතර පුව්නිමිති—පෙරනිමිති සතර; සිද්ධාර්ථ කුමාරයාණන් උයන් කෙළිසෙයි වඩින දින තමන්වහන්සේ ඉදිරියෙහි දෙවියන් විසින් මවාලූ ජරාරූපය, ව්‍යාධිරූපය, මෘතරූපය, මහණ රූව යන චතුෂ්ප්‍රකාර පෙරනිමිති

මහබිනික්මන් නික්ම—මහාභිනිෂ්ක්‍රමණයට පිටත්ව; මහණවීමට පිටත්ව

එකුන්තිස්—එකොනත්‍රිංශත්; එකක් අඩුතිසක්

මහාවීර්‍ය්‍යය—අධිකවීර්‍ය්‍යය (සාවුරුද්දක් මුළුල්ලෙහි කළ දුෂ්කර ක්‍රියාව)

දිවාවිහාරකොට—දවල් වාසයකොට

කුසතණ—කුසතෘණ (එනම් තණවර්ගය)

තුදුස් රියන් විදුරසුන්—රියන් දහහතරක් උස අනඝාසනය; දහහතරරියන් වජ්‍රාසනය

චතුරඞ්ගවීර්‍ය්‍යාධිෂ්ඨානයෙන්=(චතුර්+අඞ්ග+වීර්‍ය්‍ය+අධිෂ්ඨානයෙන්) සම්මස්, ඇට, නහර, ලේ යන මොවුන් සුනුවිසුනුවයතත් බුදුවම්ස මෙතැනින් නොනැඟිටිමියි කරණලද බලවත් ඉටාගැණීමෙන්

පළක්බැඳ වැඩහිඳ—පර්‍ය්‍යඞ්කාබද්ධව (එරම්ණියා ගොතා) වැඩහිඳ

සපරිවාරමාර—[දසබිම්බරක්] පිරිවර සහිත මාරයා

මගධෙශ්වරවූ—මගධරටට (අධිපති) ප්‍රධානවූ

බිම්සර රජහට—බිම්බිසාර රජ්ජුරුවන්ට

සඹුදු පදප්‍රාප්තව—බුදුබවට පැමිණ

සත්සතිගෙවා—සප්තසතිකයක් ගතකොට; සති 7 ක් පසුකොට

පඨමං බොධි පල්ලඞ්කං-දුතියඤ්ච අනිමිසං
තතියඤ්චඞ්කමණං සෙට්ඨං-චතුත්ථං රතනාඝරං
පඤ්චමං අජපාලඤ්ච-මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජායතනං-එවං තත්‍ර ජිනො වසි.

යනාදීන් දක්වනලද පරිදි පළමුසතිය බෝමැඩද, දෙවනසතිය අනිමිෂලොචන පූජාවෙන්ද තුන්වන සතිය රුවන්සක්මණෙහිද සිවුවනසතිය රුවන්ගෙහිද පස්වනසතිය අජපාල් නුගරුක මුලෙහිද, සවනසතිය මුචලින්ද නම් නාගරාජයාගේ දරණවැලතුළද, සත්වනසතිය කිරිපලුරුකමුලෙහිද ගතකෙළේය.

බ්‍රහ්මාරාධනා පිළිගෙණ—සහම්පතී මහාබ්‍රහ්මයා ඇතුළුවූ සමූහයාගේ ආරාධනා ඉවසා

ඉසිපතන උයන්හි=සෘෂීන්ගේ බැසීම, නැගීම දෙකට හේතුවූ ඉසිපතන නම් උයන්හි.

දම්සක් පවත්වා—ධර්මචක්‍ර සූත්‍රදෙශනාව පවත්වා බුද්ධත්වයට පැමිණ සත්සතිගෙවා ඉසිපතනාරාමයට වැඩ අඤ්ඤාකොණ්ඩඤ්ඤාදි පස්වග භික්ෂූන් ඇතුළු දිව්‍යබ්‍රහ්ම සමූහයාට දෙශනාකොට වදාළ සත්‍යඥාන, කෘත්‍යඥාන, කෘතඥාන යන පෙරළුම්තුණක් ඇති ආකාරවශයෙන් දොළොස්වැදෑරුම්වූ දුක්ඛ,සමුදය, නිරොධ,මාර්ග, සංඛ්‍යාත චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයෙන් ප්‍රතිමණ්ඩිතවූ සියලු ධර්මයන් හකුළුවා සාංක්ෂෙපික වශයෙන් ඇතුළත්කළ උත්තමවූ සූත්‍රාන්තධර්මයයි.

පන්සාළිස්—සතළිස්පස්

ලෝවැඩවඩා—ලොකාභිවෘද්ධි වර්ධනයකොට

අජාසත්රජ—බිම්බිසාර රජුගේ පුත්‍රවූ අජාතශත්‍රුරජ, (මේතෙම දෙවදත්ත තෙරහුගේ බසින් පියාමැරවී)

මල්ලරජුන්ගේ=මල්ලවරට රජුන්ගේ

සාලවනොද්‍යානයෙහි—සල්වන උයන්හි

යුග්මශාලාභ්‍යන්තරයෙහි=සල්ගස්දෙක අතර

වැඩහෙව—සැතපී වැඩහිඳ

නිරුපධිශෙෂ—(නිඃ+උපධි+ශෙෂ) නැවත භවගැණීමෙන් තොරවූ ඉපදීමෙන් තුරන්වූ.

නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන්=උපධිශෙෂයෙන් නිඃශෙෂවූ නිර්වාණධාතුවෙන්; ඉපදීම කෙළවරකළාවූ සැතපීම් ස්වභාවයෙන්

නිර්වාණධාතුවවනාහි සොපධිශෙෂ හෙවත් ක්ලෙශපරිනිර්වාණය, නිරුපධිශෙෂ හෙවත් ස්කන්ධපරිනිර්වාණයයි ද්විධාකාරයි. බුදුරජාණන් වහන්සේ වනාහි ඉපදීම් නසනලද ස්කන්ධයාගේ පිරිනිවීම් ස්වභාවයෙන් නිවන්පුර වන්හ.

නිවන්පුර පරායණවූ=නිර්වාණපුරය පිහිටකොට ඇත්තාවූ

ශොකයෙන් වකස්නා=ශොවින් විහෙසවන; කණගාටුවෙන් වෙහෙ සටපත්

අධුනක්මහණගණයා—ආධුනික ශ්‍රමණ සමූහයා: රහත්නොවූ පැවිදි පිරිස

අභද්‍ර මහණෙක්—අයහපත්වූ ශ්‍රමණයෙක්; පාපතර පැවිජියෙක්

මහත්වූ සන්තොෂය—මහත්වූ සතුටු

ඇවැත්නි—ආයුෂ්මතුනි; භවත්නි.

මහමහණු—මහා ශ්‍රමණයා; තථාගතයන්වහන්සේ

සොම්නස්—සෞමනස්ස; සතුටු

දොම්නස්—දෞමනස්ස; අසතුටු

තෘතීය මහාශ්‍රාවක—තුන්වන මහසව් අසූවක් මහාශ්‍රාවකයන්වහන්සේලාගෙන් තෙවන මහාකාශ්‍යප මහස්ථවිරයන්වහන්සේ
මහසුප්=මහා කාශ්‍යප
අවසරනොවනසේ—අවකාශ [ඉඩ] නොලැබෙන පරිදි.

---

## 3 වෙනි පිට

ධර්මසංගායනා=මහරහතුන් එක් දහම් මඩුවකට රැස්ව ප්‍රශ්න විසඳීම්වශයෙන් ධර්මය මනාසේ හැදෑරීම හෙවත් ප්‍රකාශකිරීම
මහාක්ෂීණාශ්‍රවයන්වහන්සේ—මහරහතන්වහන්සේ; කාමාදි චතුරාශ්‍රවයන් ක්ෂයකළතැනන්වහන්සේ
වෛහාරපර්වත ප්‍රාන්තයෙහි—එනම් පර්වතය අසල
අනෙක ප්‍රකාර—නොයෙක් අන්දමේ
විචිත්‍ර චිත්‍රකර්මාන්ත විශෙෂයෙන්—විසිතුරු සිතියම් වෙසෙසින්
සාදෘශ්‍යවූ—සමානවූ
මණ්ඩපයක්—මඩුවක්; ශාලාවක්
නානාවිධ පුෂ්පොපහාර—නන්වැදෑරුම් පුෂ්පපූජා; නොයෙක්මල් පිදවිලි
සමලඞ්කෘත—මනාසේ අලඞ්කාරකරණලද
භූමිභාග—බිම්පෙදෙස්
කණකරජත මණිතාරකාදීන්—රන්, රිදී, මැණික් වලින් කළ තාරුකාදියෙන්
ශෙවතවිතාන—සුදුවියන්
ධවලාතපත්‍රයෙන්—(ධවල+ආතපත්‍රයෙන්) ශ්වෙතච්ඡත්‍රයෙන්; සුදු කුඩෙන්; සුදුපාට අව්අන්නෙන්
විරාජමානවූ—බබලන්නාවූ
ධර්මාසනය—දහම් අසුන; ධර්මදෙශනාකිරීමෙහිදී හිඳින ආසනය
නායකවසිටි-ප්‍රධානව සිටි; මූලිකව සිටි
ත්‍රිපිටක—බුද්ධධර්මය සම්පූර්ණයෙන් අඩංගුවූ තුන්ප්‍රකාර විභාගය; සූත්‍ර, අභිධර්ම, විනය යන පිටකතුණ
පර්‍යාප්ති—පෙළ; තුන්පිටකයෙහි අඩංගු සියලු ධර්මය
ප්‍රභෙදධර—වෙනස්ඇති
ත්‍රිවිද්‍යා—තුන්ප්‍රකාරවූ වෙසෙසැදැනීම; පූර්වනිවාසානුස්මෘතිඥානය නම්වූ පෙරවිසූ කඳපිළිවෙළදන්නා නුවණ, 2 දිව්‍යචක්ෂුරභිඥානයනම්වූදිවැසින් දක්නා නුවණ, ආශ්‍රවක්ෂයකරඥාන නම්වූ කෙලෙසුන් නැසීමෙන් ඇතිවන නුවණ යනතුණ

අෂ්ටවිද්‍යා—අටවැදෑරුම් වෙසෙසා දැනීම්; විදර්ශනාය, මනෝමය ඍද්ධිය, ඍද්ධිප්‍රභේදය, දිව්‍යශ්‍රෝත්‍රය,, පරසිත් දැන්මය, පූර්වේනිවාසය, දිව්‍යචක්‍ෂුසය, ආශ්‍රවක්‍ෂය යන අෂ්ටප්‍රකාර යෙහි පවත්නා විශේෂඥතාය

කෙළ පැමිණි—කොට්ප්‍රාප්ත; කෙළවරට ගිය

සිව්පිළි සිඹියාපත්—චතුපටිසම්භිදාපප්පත්ත; අර්ථධර්ම නිරුක්ති, ප්‍රතිභාණ යන සතරාකාරවූ මනාදැනීමට පැමිණි අර්ථය දැනීමේනුවණ, හේතුවදැනීමේ නුවණ, ව්‍යාකරණ නිශ්චයදැනීමේ නුවණ, තීරණයකිරීමේ නුවණ යන චතුර්ප්‍රතිභිධඥාන ප්‍රාප්ත;

හස්ත්‍යශ්වරථපත්ති සංඛ්‍යාත—(හස්ති+අශ්ව+රථ+පත්ති+සංඛ්‍යාත) ඇත්, අස්, රිය, පාබලයයි කියනලද

චතුරඞ්ගිනීසේනාව=(චතුර්+අඞ්ගිනී+සේනාව) අඞ්ග සතරකින්යුත් සෙනඟ

අතුරුනොහැරසිරා—අතරක් නොතබා වටකොට

රැකවල්ලවා—රක්‍ෂාස්ථානකොට; මුරතබා

ජීවමානකාලයෙහි=දිවිමින්කලැ; ජීවත්ව සිටින කාලයෙහි

ව්‍යතික්‍රම විස්තුතපත්ති-ඉක්මවියයුතු වස්තු සම්බන්ධ ඉපදීම; දුරු කළයුතුවත් ඉපැද්ම

නිමිත්තකොට—හේතුකොට

පණවනලද —නියමකරණ; ප්‍රඥප්තිකරණලද

ශාසනස්ථිතිය—සසුන් පැවැත්ම

පන්සියපස්විස්සක්—පන්සියවිසිපහක්

ශික්‍ෂාපදයන්—හික්මීම පැවැත්වියයුතු ක්‍රම පිළිබඳ විස්තර දක්වන පදයන්ගෙන්

ප්‍රතිමණ්ඩිතවූ - යුක්තවූ

පරිජි=ආපත්ති විශේෂයන් සඳහන්වූ විනයපිටකයට අයත් පාරාජිකා පොත්වහන්සේ

පචිති=ආපත්ති විභාගයන් සඳහන් විනයපිටකයට ඇතුළත් පාචිත්‍ය පොත්වහන්සේ

මහාවගය<br>සුලුවගය<br>පරිවාරය } විනය කර්ම සම්බන්ධ විස්තර විභාග වදාළ විනයපිටකයට අයත් ධර්මපුස්තක

දම්සඟුණුය=ධම්මසඞ්ගණීය; අභිධර්මපිටකයෙහිවූ කුශලාකුශල ධර්ම විස්තරය අඩංගු ධර්ම පුස්තකය

විභංගපවුරුණුය—විභඞ්ගප්‍රකරණය; අභිධර්මපිටකයෙහිවූ ස්කන්ධාදි පරම්පරාවපිළිබඳකොටස් බෙදනලද විස්තර ධර්මපුස්තකය

පුග්ගලපඤ්ඤත්තිය—පුද්ගලප්‍රඥප්තිය; අභිධර්ම පිටකයෙහිවූ පුද්ගලයන්ගේ විශෙෂවිභාග හඳුන්වන පොත්වහන්සේ
ධාතුකථාය—අභිධර්ම පිටකයට අයත්වූ කායස්පර්ශාදි ධාතුප්‍රභෙද සම්බන්ධ විභාග විස්තර දෙශනාව අඩංගු පොත්වහන්සේ
ඉන්ද්‍රිය යමකය—අභිධර්මපිටකයට අයත් ඉන්ද්‍රිය විභාගවිස්තර දෙශනාව අඩංගු ධර්මපුස්තකය
මූලයමකය—ඉන්ද්‍රියයමකය නම්වූ ධර්මපුස්තකයෙහි කොටසක්
විකපට්ඨානය ⎫ අභිධර්මපිටකයට අයත් සත්වයාගේ චිත්තය පිළිබඳ
තික ,, ⎬ විස්තර විභාග දෙශනාකොට වදාළ ධර්මය අඩංගු
විකතික ,, ⎭ පුස්තක කොටස් තුණ
දීඝනිකාය—සූත්‍රපිටකයට අයත් දික්සූත්‍රධර්ම සමූහය අඩංගු පොත්වහන්සේ
මජ්ඣිමනිකාය—එනිමවූමධ්‍යමප්‍රමාණසූත්‍රසමූහය අඩංගුධර්මපුස්තකය
සංයුත්තනිකාය—සංයොජිත (මනාසේ යෙදූ) සූත්‍රකොට්ඨාශ ඇතුළත් ධර්මපුස්තකය
අඞ්ගුත්තර නිකාය—(අඞ්ග+උත්තර+නිකාය) අරමුණු විස්තරයෙන් ප්‍රකාශකොට වදාළ සූත්‍ර සමූහය අඩංගුව ධර්ම පුස්තකය.
ඛුද්දක නිකායෙහි—ඛුද්දකපාඨ, ධම්මපදය, උදානයආදි කුඩාපොත් කීපයක් එකතුවූ සූත්‍රපිටකයට ඇතුළත් පොතකි,
ප්‍රකරණ විභාගයන්=පොත් සම්බන්ධ විස්තරයන්.
ග්‍රන්ථ සංඛ්‍යාවක්=නාථා ගණනක්, පොත් ගණනක්.
සුවාසූ දහසක්—අසූහාර දහසක්.
ධර්මස්කන්ධයන්—දහම් සමූහයන්
විනයාභිධර්ම සූත්‍ර සංඛ්‍යාත—(විනය+අභිධර්ම+සූත්‍ර+සංඛ්‍යාත) විනය, අභිධර්මය, සූත්‍රයයි කියනලද
විනය—භික්මවීමෙ ශික්ෂාපද ධර්ම දෙශනාව අඩංගු පිටකයයි.
අභිධර්ම—රූපවෙදනාදි ස්කන්ධ ධර්මයන්ද චක්ෂු ශ්‍රොත්‍රාදි ආයතන ධර්මයන්ද කාය ස්පර්ශාදි ධාතු ධර්ම කොට්ඨාශයන්ද යනාදින් ප්‍රකාශිත විශිෂ්ට ධර්මයෙන් යුත් ධම්ම සංගණිය ආදි පොත් අඩංගුවූ දෙවියන් විෂයෙන් දෙශනාකොට වදාළ ධර්ම පිටකය
සූත්‍ර—සම්මුති වශයෙන් දෙශනාකරවදාළ දීඝනිකායාදි සූත්‍රදෙශනා අඩංගු ධර්ම පිටකය
පිටකත්‍රයෙහි=පිටක තුනෙහි, කොට්ඨාස තුණෙහි
දිව්‍ය සුවඳ වර්ෂා වස්වමින්=දිව්‍යමය සුගන්ධ වර්ෂා නොයෙක් සුවඳ වගනය වන පරෑතු ආදි දිව්‍යමල් වැසි වස්වමින්

ගුගුරුවමින්—ඝෝෂා කරවමින්, කම්පාකරවමින්
සත්කුල පර්=කුලාකාරවූ මහා පර්වත හත; යුගන්ධර, ඊශධර, කරවීක, සුදර්ශන, නෙමින්ධර, විනතක, අශ්වකර්ණ යන සප්ත කූට පර්වත.
බමවමින්=භ්‍රමණය කරවමින්, කරකවමින්,
ලෝකොත්සව—ලෝකයා විසින් පවත්වනලද පූජා පෙළහර
ධර්මසංගායනාවසාන=ධර්මය මනාව ප්‍රකාශ කිරීමේ කෙළවරදී
ශාරිපුත්‍ර=සැරියුත්, සැරියුත් මහාස්වාමි
මෞද්ගල්‍යායන—මුගලන් මහාස්වාමි
මහා කාශ්‍යප=මහ කසුප් මහාස්වාමි
මහා ස්ථවිර—මහලු මහ තෙරුන් (උපසම්පදාව ලබා දශ වර්ෂයේ පටන් ස්ථවිර භාවය ලැබේ.)
පරම්පරාවෙන්=නොකැඩී පවත්නා පෙළපතින්
අසම්භින්නව—නොබිඳී

( 4 වන පිට )

ථෙරිය නිකාය—තෙරුන් පිළිබඳ සමූහය; සංඝ පරම්පරාව; බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි ඇතිවූ මහ රහතුන්ගෙන් පැවති නිකාය.
මහා භික්ෂු සන්තතිය—මහසඟ පෙළපත; සැරියුත්, මහ මුගලන්ආදි මහරහතන් පරම්පරාව
පස්වා දහසක්—(පස්+වා+දහසක්) වර්ෂ පන්දහසක්
නොපිරිහී—පිරිහීමක් නැතිව
තන්පත් කරවූහ—ස්ථාපිත කරවූහ, තැබබවූහ.
ගාථාව—සාසනඤ්ඤිති කාරණං, ශාසනය පිහිටීමේ කරුණ හේතුකොට ගෙණ; සඞ්ගීති පරියොසානෙ, සඞ්ගායනා පර්යාවසානයෙහි හෙවත් කෙළවර; මහා මහි, මහා පෘථිවි තොමෝ; සාධුකාරං දදන්තී ඉව, සාධුකාර දෙන්නාක්මෙන්; අකම්පිත්ථ, කම්පාවිය.
මගධ රජුන්—මගධ රට රජකළ රජුන්
ඇවෑමෙන්—මරණින් පසු
පැළලුප් නුවර—පාටලිපුත්‍ර නගරය, දැනට පැට්නා නමින් ප්‍රකට ඉන්දියාවේ නගරය
පිරිනිවී=පරිනිර්වාණයව්; නිවී සැනසී
මහවන විහාරයෙහි—කැලෑබද ප්‍රදෙශයෙහි භික්ෂූන්ට කැප සරුප් පරිද්දෙන් කරවනලද එනම් වෙහෙරෙහි
වජ්ජි-වැදූරටවාසී භික්ෂූන්; ඉන්දියාවේ එනම් ප්‍රදෙශස්ථ භික්ෂූන්.

කප්පති සිඞ්ගිලොණකප්පො—හරි අඟෙහි බහා තබා ගන්නා ලද ලුණු ප්‍රයොජනය ගැණීමකැපයි

කප්පති ද්වඞ්ගුල කප්පො—හිර දෙඅඟුලක් අවරට ගිය කල්හිත් දන් පිළිගැණීම කැපයි

කප්පති ආචිණ්ණ කප්පො—ආචාර්‍ය්‍යයන් විසින් පුරුදුකර ගෙණ එන චාරිත්‍ර එපමණකින් පිළිගැණීම කැපයි

කප්පති ජාතරූප රජතං—රන් රිදී පිළිගැණීම කැපයි

අභූත පුබ්බ—පෙරනොවූ, අසත්‍ය මුල්කොට ඇති

අභිප්‍රායානුකූල—අදහසට (කැමැත්තට) එකඟවූ

දශවස්තුවක්—අලජ්ජීවූ ශාසනතාශක භික්ෂූන් විසින් ඇතිකරගත් වත්දහයක් එනම්:-

1. "කප්පති සිඞ්ගිලොණකප්පො" යනුවෙන් ප්‍රකාශිත ගරක් අඟෙහිදමා ප්‍රයොජන ගන්නා ලුණු ආහාර සමග වැළඳීම කැපය යනු දක්වීම එක්වතකි·

2. "කප්පති ද්වංගුල කප්පො" යනුවෙන් හිර අවරට ගොස් අඟල් දෙකක් සෙවන වැටෙන තුරුත් ආහාර වැළිඳීම කැපය යනු දක්වීම එක් වතකි.

3. "කප්පති ගාමන්තර කප්පො." යනුවෙන් තුරන් කිරීමෙන් වෙන්වූ අකැප බොජුන් ගමින් පිට ගමකටයනු කැමතිකල්හි වැළඳීමකැපයි යනු දක්වීම එක්වතකි.

4. "කප්පති ආවාසකප්පො" යනුවෙන් එක්මහාශීමාවක් ඇතුළතම වෙන් වෙන්වූ ආවාසවල වෙන් වෙන්ව පොහෝ පවුරුණු ආදි සංඝ කර්‍ම කිරීම කැපය යනු දක්වීම එක්වතකි.

5. "කප්පති අනුමති කප්පො" යනුවෙන් ශිමාවතුළහුන් සම හර සංඝයාගේ කැමැත්ත නොවිමසා වගීව සංඝකර්‍මකොට පසුව කැමැත්ත ගැණීම කැපය යනු දක්වීම එක් වතකි.

6, "කප්පත ආචිණ්ණකප්පො" යනුවෙන් ප්‍රකාශිත "ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් විසින් පුරුදුකරගෙණ එන චාරිත්‍ර එපමණකින් පිළිගත යුතුය යනු" එක් වතකි.

7. "කප්පති අමතිතකප්පො" යනුවෙන් ප්‍රකාශිත "අහක්කිරි මෙන් කැපනැති ආහාර ඇතිකල්හි කිරි අවස්ථාව පසුව දීකිරි අවස්ථාවටත් නොපැමිණි කිරි වැළඳීම කැපය යනු" එක් වතකි.

8. "කප්පති ජළොගි පාතුං" යනුවෙන් ප්‍රකාශිත "ලපටිනොවූ නොපැසුනාවූ සුරාබීම කැපය යනු" එක් වතකි.

9. "කප්පති අදසකං නිසීදනං" යනුවෙන් ප්‍රකාශිත තමාගේ ණිකම නැතිවූ සිවුරු, දවලු නැතිනම් කැපය යනු එක් වතකි.

10. කප්පති ජාතරූප රජතං යනුවෙන් ප්‍රකාශිත “රන්රිදී මසුරන් ආදිය පිළිගැනීම කැපය යනු” එක් වතකි.

විසජ්ජනය—විසඳීම; විභාග කිරීම
විනයානුවිත—විනයට එකඟ; විනය කර්මයට ඇතුළත්
අධම්මවාදීන්—ධර්ම නොවූවක් ධර්මයයි කියන්නන්
මදීනය කරවා—මැඩපවත්වා, යටත්කොට
අලජ්ජීවූ—ලජ්ජා නැත්තාවූ
විහාරය නිසා—විහාරය ආශ්‍රයකොට
සුශීල දුශ්ශීලයන්ගේ—සුපිරිසිදු සිල්වතුන්ගේ හා අපිරිසිදු සිල්
වතුන්ගේ
සම්මාචාර විභාග—මනා හැසිරීමේ විස්තර
මැසිවිලි මුසු අදෝනා—දුකින් කෙඳිරිම් දැමීත කණගාටුබස්
ශිවිස—විශ්වාසකොට, අසා දැනගෙණ, පොරොත්තුවී
මගණ ගණයා—ශ්‍රමණ සමූහයා
මගේ විජිතයට—මගේ රටට
මංමැරද—පාර වැරදී; මංමුළාවී
බව නොදෙවයි—බසිනු නොදේවයි
විධානකොට—නියමකොට
දෙවතානුභාවයෙන්—දෙවි පිහිටෙන්
ලෝකුඹු නරකයක—ලොහකුම්භී නම් අපායක
පහත්කොට—එළිකරවා
ජේෂ්ඨභගිනී—වැඩිමහල් නැගනිය
රහත් මෙහෙණින්නත්—අහීන්වූ භික්ෂුණීයන්
ගාථාව—අලජ්ජීනං, ලජ්ජා නැත්තාවූ භික්ෂූන්ට; බලංදත්වා, බලයදී, මම, මාගේ; විනයං, ධර්මවිනය සඛ්‍යාත ශාසනය; නාසෙපති, විනාශකරවයි; ගම්භීරා, ගැඹුරුවූ; ලොහකුම්භියා, ලෝකුඹු නරකයෙහි; ජීවතෙනාඑව, ජීවත්ව සිටද්දීම; ජාතො අසි, උපන්නේ වෙහිය.

( 5 වන පිට )

ගෘහස්ථ ප්‍රව්‍රජිතාදිවූ—ගිහි පැවිදි ආදිවූ
පාපි මහනුන්ට—පාපතර භික්ෂූන්ට
බලයලා—අවකාශදී, බලපවරා;
අපායෙහිම—සැපනැගත් පහවූ ස්ථානයෙහිම; නරකයෙහිම
ලොහොදියෙන්—ලොහ උණුවූ ජලයෙන්
අතිගම්භීර—ඉතා ගැඹුරු
ලජ්ජීන් වහන්සේට—බුදුරජාණන් වහන්සේ විසින් දෙශනාකරණ

ලද විනය ධර්මය ඒවූපරිද්දෙන් පිළිපදින ශික්ෂාකාමී භික්ෂූත්ව
පිරිවහල්ව—පිහිටව; ආධාරව
කල්පයක් දවස්=කල්පයකට අයත් දින ගණන
දිව්‍ය මනුෂ්‍ය සම්පත්—දෙව් මිනිස් දෙලොව සැප,
සස්නෙන් පිටත්කරවා=ශාසනයෙන් බැහැර කරවා
සබ්බකාමි ස්ථවිර—සියල්ලන් විසින් කැමතිවනු ලබයි යන අන්වර්ථ නාමයෙන් යුත් තෙරුන්
ස්ථවිර වාද—මහරහතුන් විසින් ප්‍රකාශ කරණලද සම්බුද්ධ ධර්මය.
ධර්ම විනයදෙක—සූත්‍ර අභිධර්ම යන පිටක දෙක හා විනය පිටකය යන දෙක
පිටක නිකායාදි—කොටස් පොත් ආදි
ගාථාව—දසසහස්සසු, දසදහසක්පමණවූ; පාපභික්ඛු, පව්වූමහණුන් එතනාවතා, මෙතෙකින්; නිද්ධුය, පලවාහැර; ධුත, කම්පා කොට හරණලද; දසවත්ථු මලා, දසවස්තු සංඛ්‍යාත කිළු වූ ඇත්තාහු; අකංසු, කළාහුය. තෙ, ඒ භික්ෂූහු; සුනිම්මල යසෙන, මනාව නිර්මලවූ කීර්තිඇති; යසෙන සඞ්ං, යශ ස්ථවිරයන් සමග; යං සංගීතිං, යම් සංගායනාවක්; සාඋජ්ඣිතමලා, ඒ උදුරාහරණලද කිළුටුමල ඇත්තක්කොට; දස්සිතා අපි, දක්වන ලද්දීද
සංඝායනාකාරක=සංගායනාකරණ; මනාසේ හැදූරුම්කරු
ශාසනප්‍රතිෂ්ඨා=සස්නට පිහිට; ශාසනයට උපකාර
පක්ෂබල—පාර්ශ්වබල
ප්‍රත්‍යන්ත දෙශයකට—පිටිසර පළාතකට
ධර්මා ධර්ම විචාරයට—ධර්ම අධර්මදෙක තෝරානැණීමට
මණ්ඩලික රජක්හු=ප්‍රදෙශ රජෙක්; ජනපදාධිපතියෙක්
මන්ත්‍රණයකොට—කථාබස්කොට; රහසින් කථාකොට
අභූත පූර්වවූ අපූර්වපාඨ—පෙරනොවූ පුදුමපද
පූර්වාපර විරොධ—පෙර අපර විරුඬ, මුල අග අසම්බන්ධ
අර්ථකථා—අටුවාපොත්, විස්තරකථා
මහාසංඝික—මහා සංඝයාට අයිති; මහා සමූහයෙන් යුක්ත.
ආචාර්‍ය්‍ය නිකායක්ව—ඇදුරු පරපුරක්ව
මහා සංඝික ආචාර්‍ය්‍ය නිකායක්-විතීය සංගායනා කාරක මහා සංඝයා විසින් නෙරපාහරණලද අලජ්ජී භික්ෂූන් විසින් ඇති කරගත් ශික්ෂාකාමී නොවූ මහා සමූහයාගෙන් යුත් පරම්පරාව
ලහුවූ කැටියක්සේ—ලාටුකැටියක්සේ

## ( 6 වන පිට )

සකලලෝක නිකායයක්=මහා සඞ්ඝික ආචාර්ය නිකාය පිළිබඳ ප්‍රභෙද දහඅතත්; මහාසඞ්ඝිකය, ගොකුලිකය,එකබ්බෝ හාරිකය ප්‍රඥප්තිවාදීය, බාහුලිකය; චෛතුල්‍යවාදීය, මහිංසාසකය; වජ්ජිපුත්තකය, ධම්මධාරිකය, භද්‍රයානිකාය, ඡණ්ණාගාරිකය සම්මිතියකය, සර්වාස්තිවාදීය, ධම්ගුත්තිකය; කාශ්‍යපීය, සංක්‍රාන්තිකය, සූත්‍රවාදිය යන 17 ත් නිකායයක්

එක්සිය අටලොස් හවුරුද්දක්=118 වර්ෂයක්

නිම්ලව=මලරහිතව, පිරිසිදුව

දසබෑ රජුන්—දශභ්‍රාතෘ රාජයන්; සහෝදරවූ දසරජුන්

නවනඳරජුන්—දසබෑරජුන්ගෙන් පසු පැළලුප්නුවර රජපැමිණි "නන්ද" යනු අගට යෙදුනු නාමයෙන් යුත් රජ දරුවන් නවදෙනා.

එක්විසි රජුන්—දසබෑරජුන් හා නවනඳ රජුන් ඇතුලුවූ වඳගු පන, බිඹුසාර යන රජුන් විසිඑක්දෙනා

කුසලබල වික්‍රම—පින්බල විකුම් ඇති

ආඥාචක්‍රවර්තිවූ—අණසක පවත්වන්නාවූ

සිතුමිණි රුවනක්—චින්තාමාණික්‍ය රත්නයක්; සිතූ පැතූදය සාදදෙන උතුම් මැණිකක්

පැහැතෑගී=උද්ගතව

එකච්ඡත්‍රනංචා—එකඡෙස්සතක් ඔසවා, එකම ආඥාචක්‍රයකට යටත් කොට

රාජ්‍යාභිෂෙක ප්‍රාප්තව—රජකමට පැමිණ හිසදිය වත්කොට

යොත්තෙක—යොජනයෙක, යොදුනෙක

සාගරපර්යන්තව—මුහුදු අවසන්කොට; සයුරු කෙළවරකොට

යශස් තේජස්—කීර්ති රස්මිය; කීර්තිය හා තෙජස

අමරගණාදුබඩ—දෙව සමූහයා විසින් පිරිවරණලද

දෙවෙන්ද්‍රවිභ්‍රමයෙන්—ශක්‍රවිලාසයෙන්

රාජ්‍යශ්‍රීන්—රජ ඉසුරු, රාජ සම්පත්

චෛත්‍යඞ්ගන—සෑමිදුලු

බොධ්‍යඞ්ගන—බෝමලු

ප්‍රතිමාගෘහ—පිළිම ගෙවල්

ධර්මශාලා—දහම්සල්

ප්‍රාසාද=මහල්ගෙවල්, තොල්දර ගෙවල්

චංක්‍රමණ=සක්මන්මළු

ප්‍රාකාර—පවුරු, තාප්ප

ගෝපුර=ගේට්ටු, දොරටු, නගරවාර
පුෂ්කරණී-පොකුණු
පුෂ්පාරාම=මල් අරම්, මල්වතු
ඵලාරාම—පල අරම්; ඵලදරණ වෘක්ෂ ඇතිවතු
ප්‍රතිමණ්ඩිත=නැවසීගත්
රජමහවිහාර—රජුන්විසින් කරවූ ධාතුගර්භ සහිත මහා විහාර
ධාතුකොත්-නිධාන වස්තු හා ක්තු
අශෝකාරාමය-ධර්මාශෝකරජුන් විසින් තම නමින් කරවූ ආරාමය
ක්ෂීණාශ්‍රවයන්-කාමාදි ආශ්‍රවයන් ප්‍රහීණකළ රහත් භික්ෂූන්
ලෝක විවරණ-ලෝකයා හමුවෙහි පතළ කරණලද
මහාප්‍රාතිහාර්යානුභාවයෙන්-මහ පෙළහරෙහි අනුසසින්
අයත්නයෙන්=නොඋත්සාහයෙන්, මෙහෙයීමක් නැතිව
උදාරතරවූ—අතිශයින් මහත්වූ, ඉතා උත්තමවූ
පූජා සත්කාර—පිදීම් හා සඟපත් ක්‍රියා; පූදසංග්‍රහ
ප්‍රීතිප්‍රමෝද—සතුටින් කෙළපැමිණී; ප්‍රීතියෙන් ප්‍රමුදිත
රසාස්වාදකොට=රසවිඳ
ශාසනදායාද—සස්නට තෑගි
ලාභසත්කාර—අයපුගති
තිර්ථකයෝ—මිථ්‍යා ලබ්ධිකයෝ
ධර්මවිනය—ධර්මය හා විනය
පොහෝපවුරුණු—එනම් විනයකර්ම; පසළොස් දිනකට වරක් සීමා
වක්තුළට රැස්වූ භික්ෂූන් විසින් කළයුතු විනය කර්මය උ
පොසථ කර්මනම්. වස්පවාරණ දිනයෙහි හෙවත් අවසාන
දිනයෙහි කරණ පවාරණ විනය කර්මය පවුරුණු නම්.

( 7 වන පිට )

දුල්ලබ්ධි=අසත්‍ය (නින්දිත) ඇදහීම්
උද්භාවනා—උසස්ව වැඩීම
සංඝ සාමග්‍රී විශුද්ධියට=සංඝයාගේසමගියෙන්ලබන පිරිසිදුභාවයට
පසුබස්නට=පිරිහෙන්නට
බ්‍රහ්මලෝකාගත=බඹලොවින් පැමිණි
සමයාන්තර—ආගම් භෙද
සමාන ලබ්ධිකයන්=සමවූ වැළඳගැණීම් ඇත්තන්
ලබ්ධිභෙද විචාරා=ඇදහීම් විශේෂ අසා
ශාස්වතවාදය—"සියල්ලසදා කාලිකය"යි ගන්නාලද ශාශ්වතදෘෂ්ටිය
පිළිබඳ කථාව
ඒකච්චශාස්වතවාදය—"ඇතැම්දේ සදාකාලිකය"යි ගන්නාලද ඒක
ච්චශාශ්වත දෘෂ්ටිය පිළිබඳ කථාව

අනන්තානන්තිකය—"අවසානය ඇත නැත" යනුවෙන් ගන්නාලද දෘෂ්ටිය
අමරාවික්ඛෙපිකය—ඇසූදෙය තබා අනිකක් ප්‍රකාශකිරීමේ දෘෂ්ටිය
අධිච්චසමුප්පන්නිකය—සියල්ල ඉබේ පහළවීයයි ගන්නාලද දෘෂ්ටිය
සඤ්ඤීවාදය—"නිත්‍ය වශයෙන් සංඥාවක් ඇත" කියා ගන්නා දෘෂ්ටිය
අසඤ්ඤීවාදය—"නිත්‍යවශයෙන් සංඥාවක්නොමැත්තේය"යි ගන්නාලද දෘෂ්ටිය
නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදය—සංඥාවක් නැතකියාද සංඥාවක් නැත්තේ නොවේයයි කියාද ගන්නාලද දෘෂ්ටිය පිළිබඳ කථාව
උච්ඡේදවාදය—මරණින් මතු නැවත ඉපදීමක් නැත කියාගන්නාලද දෘෂ්ටිය පිළිබඳ කථාව
දිට්ඨධම්ම නිබ්බාණවාදය—ඉහාත්මයෙහි හෙවත් ලැබූ ආත්මයෙහි දීම සියළු දුක් නිවේයයි ගන්නාලද දෘෂ්ටිය
ශඨකූටකෛරාටික—වංචා හොර ප්‍රයොග
ලුබ්ධ—ලොභ
මායාවී—මායා ඇති; දඟ ඇති
විභජ්ජවාදීව—විභාගවාද ඇති, එක් එක් කොටසාශ පිළිබඳ වාද උපද වන්නෙක්ව
ලජ්ජිබලය—ශික්ෂාකාමී භික්ෂූන්ගේ බලය
ගාථාව:—යා, යම්බඳුවූ; සට්ඨිතිජ්ජිය ගහස්ස තිස්සායතං, සැටදහසක් පමණ තීර්ථක නමැති රාත්‍රියෙන් ආගමනය හෙවත් පැමිණීම ඇති; තංදුල්ලඩ්ඩ ඝොරතිමිරං, ඒ දුලීඩ්ඩ නමැති ඝොරවූ අන්ධකාරය; සමාඵීනිගච්ච, මොනවටපහකොට; තිස්සථෙර රවිනා; මොග්ගලි පුත්තතිස්ස ස්ථවිර නමැති සූර්යයා විසින්; විකාසඩිගම්තා, ප්‍රබෝධවීමට ගියාවූ; සාසනිධිනිවාරුතලිනී අපි; ඒ මනොඥවූ සඬසායතා නමැති විල්පොහොමෝදු; මෙ, මා විසින්; දස්සිතා, දක්වන ලද්දීය.
ක්‍රෝධයෙන් දිලිගී කොපයෙන් ඇවිලී
සාසනාවගාහ—සසුනට සංග්‍රහ කිරීම; සසුනට බැසගැන්ම
ශාක්‍ය භික්ෂූන්ගේ—ශාක්‍යවංශවත් සර්වඥයන් වහන්සේගේ ශිෂ්‍ය පිරිසගේ හෙවත් ආයශී සඞ්ඝයාගේ
සමයභෙද=නිකාය භෙද; ලබ්ධිභෙද

( 8 වන පිට

පෙරලා අවුත්—ආපසුවිත්
එයින්හළ—ඉත් බැහැරකළ

අසාපිරිවා—ශ්‍රවණය කිරීමෙන් පාඩම්කොට

( 9 වන පිට )

විපරියාසකොට—වෙනස්කොට; විපර්‍යාසකොට

බැණගෙණ—එකතුවී කථාබස්කරගෙණ

සරළසක්ව— ෂඩ්රාශියක්ව; කොටස් හයක්ව

සතෙතක—ස්ථාන හයක

නවනිකාය—දෙවන සඞ්ගායනාවෙන් බැහැරකළ අලජ්ජි භික්ෂූන් නැවත අංයකී භික්ෂූන් මධ්‍යයෙහි මහණව ත්‍රිපිටක ධර්‍මය ඉගෙණ පසුව ධර්‍මය විපර්‍යාසකොට ඇතිකරගත් නිකාය නවය

සද්ධර්‍මප්‍රතිරූපකොට—සද්ධර්‍මයට සමානකොට

වණ්ණිපිටකය—නවනිකායෙහි ප්‍රථමවූ හෙමවත නිකාය විසින් සද්ධර්‍ම විපර්‍යාසකොට "වණ්ණි" යන නාමයෙන් ඇතිකරගත් පිටකය

අඞ්ගුලිමාලි පිටකය—නවනිකායෙහි විතීයවූ රාජගිරිකනිකායවාසින් විසින් ඇතිකරගත් ධර්‍මය

ගූඪවෙස්සන්තරය—තෘතීය නිකායවූ සිද්ධාර්ථකයන් විසින් ඇතිකර ගත් ධර්‍ම පිටකය

රට්ඨපාල ගර්ජිතය—සතර වන පූර්වශෛලීය නිකාය විසින් ඇති කරගත් ධර්‍මය

ආලවක ගර්ජිතය—පස්වන අපර ශෛලීය නිකාය විසින් ඇතිකර ගත් පිටකය

ගූඪවිනය—සවන නිකායවූ වජ්‍ර පර්වත වාසීන් විසින් ඇතිකරගත් ධර්‍මය

තන්ත්‍ර=ග්‍රන්ථ; සිද්ධාන්ත; ශාස්ත්‍ර

කල්ප—වෙදඞ්ගශාස්ත්‍ර; න්‍යායශාස්ත්‍ර

වෛතුල්‍ය පිටකය=හත්වන නිකායවූ වෛතුල්‍යවාදීන් විසින්ධර්‍මය අධර්‍මයකොට නිපදවූ පිටකය

රත්නකූටාදී ශාස්ත්‍රාන්තර-රත්න කූටාදි නාමයන්ගෙන්යුත් නොයෙක් ආකාර ප්‍රභේදවත් කොට ධර්‍මය අධර්‍මයකොට සාද ගත් අටවන නිකායවූ අන්ධකයන්ගේ ධර්‍ම ශාස්ත්‍ර

අක්ෂර සාරියාදිවූ සූත්‍රාන්ත=නවනිකායෙහි අවශානවූ අන්‍ය මහාසඞ්ඝික නම් නිකායස්ථයන් විසින් නිපදවා ගත් සූත්‍ර ප්‍රබන්ධ ධර්‍ම

වෙන වෙන දක්වත්=වෙන් වෙන්ව පෙන්වත් හොත්

භික්ෂු ප්‍රතිරූපක=භික්ෂුවිලාසය ගත්; භික්ෂූන්ට සමාන රූඇති

සද්ධර්ම ප්‍රතිරූපයන්—සද්ධර්මයට සමාන ස්වභාව ඇතිකොට නිපදවා ගත් ධර්මයන්
ජම්බුද්වීපයෙහිම—දඹදිවෙහිම
නිවර්තීවිය—නැවතීම වූයේය.
උපගතවිය—පැමිණියේය.
ශ්‍රී ලඞ්කාද්වීපයට=උතුම් ලක්දිවට
මැදි පොහෝදවස්—(මාසයේ) මධ්‍යම පොහොයදින; පස්ළොස්වක් පුර පොහෝ දින
මූල නැකතින්—මූල නක්ෂත්‍රයෙන්; නැකත් 27 න් 19 වන මූලේ නැකතින්
අශ්ශරියෝය—අශ්වාරූඪයෝය; සේන ගුත්තිකයන අශ්වගාවූ දෙමළ රජ දෙදෙනා
පඤ්චද්‍රාවිඩය=පුලහත්, බාහිය, පණයමාර, පිළයමාර, දාඨික යන දෙමළ රජුන් පස්දෙන;
සෙබළ දෙමළුන්—සෙමා භටද්‍රවිඩයන්; දෙමළ යුද්ධභටයන්
ප්‍රීති වේගයෙන්—ප්‍රීතියෙන් උපන් උසස් බවෙන්
උදන් අනා—ප්‍රීති ප්‍රකාශ කොට; උදානගා
**අනෙක ජාති සංසාරං**—නොයෙක් ඉපදීම්ඇති සසර; බුදුව පළමු වෙන් මෙනෙහි කොට වදාළ ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මාව සානයෙහිදී ප්‍රීති වාක්‍ය වශයෙන් ප්‍රකාශකළ ගාථා දේශනාවේ ආරම්භය
ආදිකොට=ප්‍රථමකොට

භික්ඛවෙ, මහණෙනි; සඞ්ඛාරා, සියලු සංස්කාරයෝ; වය ධම්මා, ව්‍යයස්වභාවයි හෙවත් විනාශවීම ධර්මතාකොට ඇත්තාහ. අප්පමාදෙන, (කුසල ධර්මයෙහි) පමා නොවීමෙන්; සම්පාදෙථ, සම්පාදනය කරව් හෙවත් භාවනා කරව්.

පච්ඡිමබුද්ධවචනය=බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පානා අවස්ථාවෙහි "වය ධම්මා භික්ඛවෙ" යනුවෙන් වදාළ අවසාන දේශනාව
දෙඅතුර—බුද්ධත්වයට පැමිණිතැන් සිට පිරිණිවන් පානා අවස්ථාව දක්වා අතර
දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ—දෙව්, බඹ, නා, ගුරුළු
මනුෂ්‍ය යක්ෂරාක්ෂ—මිනිස්, යක්, රකුසු
සිද්ධ—බෙහෙත් බලයෙන් අහසින් ගමන් කරණ දිව්‍යකොට්ඨාශයක්
විද්‍යාධර—ශාස්ත්‍රබලයෙන් අහසින් ගමන්කරණ දෙවකොට්ඨාසයක්
අනුශාසනා පිණිස=වරද දුටු හෝ නොදුටු කරණ දැනම්තිකම් සඳහා

අක්ෂර වශයෙන්=අකුරු ගණනින්
ග්‍රන්ථ වශයෙන්—ගාථා ප්‍රමාණයෙන්
භාණවාර වශයෙන්—බණවර වශයෙන්
පරිවජ්ජිතන සඞ්ඛ්‍යා—මෙපමණයයි කොළවරක් ඇති ගණින්
අනූනව—ඌන නොවී; අඩු නොවී
අනධිකව—අධික නොවී; වැඩි නොවී
සර්ව දුර්ලබ්ධීන—සියලු මිථ්‍යා ඇදහීම්
අසම්මිශ්‍රව—සම්මිශ්‍ර නොවී; කොහෙත්ම කවලම් නොවී
ත්‍රිවිධ සංගායනා රූඪව—තුන්ආකාර සංගායනාවට ඇතුළත්ව;

1. අජාසත්රජකලැ රජගහනුවර ධර්මමණ්ඩපයෙහිදී මහා සුප්මහ තෙරුන් ප්‍රමුඛ 500 ක් රහතන් විසින්ද, 2. කාලාශෝක රජකලැ විශාලා මහනුවර වාලුකාරාමයෙහිදී යශ සථවිරයන් ප්‍රමුඛ 700 ක් රහතන් විසින්ද, 3. ධර්මාශෝක රජකලැ පැලලුප් නුවර අශෝකාරාමයෙහිදී මොග්ගලීපුත්ත තිස්ස සථවිරයන් ප්‍රමුඛ 1000 ක්රහතන් විසින්ද, කරණලද තුන්වැදෑරුම් සංගායනාවට නගා

ගගනගංගා ප්‍රවාහයක් සේ=අහස් ගඟ සැඩ පහරක්මෙන්
සුපරිශුද්ධව—ඉතා පිරිසිදුව; සුපිරිසුදුව
දැරගම්ණිරුවණක්—ජාතිරත්නමාණික්‍ය රත්නයක්; උත්පත්තියෙන්ම බැබලීම් සහිත උතුම් මැණිකක්
අමෘතමහා මේඝයක් සේ—අමාමහ වැස්සක් මෙන්
සනහමින්—සනසමින්; නලවමින්
ත්‍රිවිධ බෝධි—බුදු, පසේබුදු, මහ රහතන් යන තුන්ප්‍රකාර අවබෝධය
ඍජුරාජ පථයක්—ඇද නැති රජමහ වීථියක්
සකල ජනකාමිනී—සියලුදෙනා කැමතිවනු ලබන
සර්වසම්පත්ති ලාභයට—(දෙව්, මිනිස්, නිවන් යන) සියලු සැපලැබීමට
මුඛපාලි වශයෙන්—කටපාඩමෙන්
ජනපදාධිපයක්හුගේ—දේශාධිපතියක්හුගේ
මාතුල දනව්වෙහි=මාතලේ ජනපදයෙහි

( 10 වනපිට )

අලුලෙන—ආලෝක ගුහාව; අලුවිහාරය
තුදුස් අවුරුදු—දහහතර අවුරුදු
ගිරිනම් නිවටකු—"ගිරි" නම්වූ (නිඝණ්ඨයකු) නිර්වස්ත්‍ර තපසෙකු
තීර්ථකාරාමයක්—මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ වාසස්ථානයක්

විධම්‍ය—විනාශ කොට
පූර්වෝපකාරීවූ—පෙරදී උදව්වූ
අතික්‍රාන්තවිය—ඉකුත්විය
හගිරි වෙහෙර—අභයගිරි විහාරයෙහි
පබ්බාජනීයකර්මය—ගිහියන් සමග සමාගම් පැවැත්වීම, එක්ව කට යුතු කිරීම, කුල දූෂණ කිරීම ආදි වරද සම්බන්ධව රටින් නෙරපිය යුතු පුද්ගලයාට කළයුතු විනයකර්මය
කුලසංසට්ඨව වෙසෙති=ගිහියන් හා නිතර එකතුව වාසය කෙරෙති
උත්ක්ෂේපණීය කර්මය—අශුද්ධ ක්‍රියාවලින් යුක්තව පැවතීමේ වරදින් ශාසනයෙන් ඔසවා දැමියයුතු පුද්ගලයාට කළයුතු විනය කර්මය
අශුද්ධානුවර්තීකයයි—අශුද්ධ ක්‍රියා අනුව පවතින්නේයයි.
භේදකොට—වෙන්කොට; විරුද්ධකොට
ධර්මරුචිනිකාය—එනම් තෙරුන්ගේ නිකාය; මහ වෙහෙර වැසි ශික්ෂාකාමී සුශීලවූ ථෙරියනිකාය මහාසංඝයා විසින් උත් ක්ෂේපණීය කර්මයෙන් දෝෂාරෝපණය කොට අභයගිරි විහාරය පිළිගත් තිස්සමහතෙරුන් ශාසනයෙන් බැහැර කළ කල්හි, මහදැලියාතිස්ස නම් ශිෂ්‍යයා සහ 500 නමක් ඉන් භේදකොට අභයගිරිවෙහෙරට ගෙණගොස්, දඹදිව වජ්ජිපුත්‍ර නිකායෙහි ධර්මරුචි නම් ආචාර්යයන්ගේ ශිෂ්‍ය යකු විසින් ලක්දිවට ගෙණෙනුලැබූ මිථ්‍යා සමය පිළිගැණි මින් ඇතිකරගත් නිකාය.
ව්‍යාපන්නවිය—පැතිරීගියේය,
ධර්ම ව්‍යවහාරයෙහි—දහම් භාවිතාකිරීමෙහි
අධර්මවාදයයි=ධර්මයනොවූ බස්යයි

## 21 වන පිට.

සසඳබලා—සංසන්දනය (සමාන)කොට බලා
විනිශ්චයට=තීරණයට
තීලිය පුරෝහිතය—තීලියනම් පුරෝහිත බ්‍රාහමණයා;
අමණ්ඩගාමිණි—අඩගැමුණුරජ; මෙතෙම ක්‍රි: ව: 21 දී අනුරාපුර රජවිය.
වැහැප්රජ—ක්‍රි: ව: 66 දී රජපැමිණි වසභරජ
වක්නැහැතිස්ස—වඞ්කනාසිකතිස්සරජ
බුද්ධභාෂිත—සම්බුද්ධදේශනාව; බුදුරජාණන්වහන්සේ විසින් දෙශනා කරණ ලද්ද
නිග්‍රහකොට— නින්දාකොට, අවනම්බුකොට

පර්‍යාප්තිශාසනය—පිටකත්‍රයෙහි සියළු බුද්ධ වචනය
ගාථාව:- වෙතුල්ලවාදං, වෛතුල්‍යවාදීන්ගේධර්‍ම, මද්දිත්වා,මැඩලා;
පාපනිග්ගහං, පාපීභික්ෂූන්ට නිග්‍රහ; කාරෙත්වා, කරවා;
කපිලෙන අමච්චෙන, කපිලනම් ඇමතියාලවා; ඉධ, මෙහි
සාසනං, බුදුසස්න; ජෝතයී, බැබලවිය.
ව්‍යවහාරතිස්සරජු—වොහාරතිස්සරජු
සපරම්පරාවක්—පෙළපත්සයක්
නිල්ලජ්ජී—ලජ්ජානැති
විචාරවත්—බුද්ධිමත්
ආගමව්‍යාඛ්‍යානකළහ—ධර්‍මයවිස්තරකළහ.
සාගලිය—එනම් නිකාය; ගොඨාභයරජු දවස වෛතුල්‍යවාදගත්
ධර්‍මරුචි නිකායෙන් වෙන්ව දකුණුගිරි වෙහෙරටපැමිණි
**උස්සිලියාතිස්ස** මහතෙරුන් ප්‍රමුඛ සඟ පිරිසෙහිහුන් සා
ගල නම් තෙරහුගේ නාමයෙන් ඇතිකරගත් නිකාය.
සඤ්ජාතවිය—හටගත්තේය.
පඤ්චමහා ආවාසයෙහි—මහවිහාර පසෙහි
වෙරලකුණුබබවා—(දඬුවම් වශයෙන්) ශරීරයෙහි ලකුණුතබා.
දේශත්‍යාගකරවා—රටින් පිටව[illegible]කොට
කාවීරපට්ටන—කාවේරිපට්ටනම
නිර්ජිත මාණවකයෙක්—මිථ්‍යාදෘෂ්ටි තරුණයෙක්

## 12 වනපිට

දේශාන්තරයෙහි—අන්‍යදේශයෙක්හි
උපචාර—පූජා
ඔවුන් කෙරෙහි—ඔවුන් සමීපයෙහි
වත් තෙරුන්—වතින් සම්පූර්ණ ස්ථවිරවරුන්
පැන් සනහන්ට බටදී—ජලස්නානය කරන්ට බසිද්දී
නොකළමනාදෙයක්—නොකළයුතු දෙයක්
මුලිනුදුරුවා—(මුලින්+උදුරුවා) මූලොත්පාටනය කරවා
නස්වාපියම්—නැතිකරවා ලවමි
සැහැසිව—සාහසිකව; දරුණුව,
නවම නවම දන්නා—අලුත් අලුත් කර්මාන්ත දන්නා
දැහැමෙන්—ධර්මයෙන්
ජන්මාන්තරගතවිය—කාලක්‍රියාකෙළේය
සිතට තංවා—සිතටඑළවා
ලෝවාමහපායට—ලෝහමය මහ ප්‍රාසාදයට
සයින්වීනමුත්—සාදුකින්වූයේ නමුත්

අපායගතවෙති—නිරයට පැමිණීම වෙති
සාපරාධ—(ස+අපරාධ) අපරාධ සහිත
බ්‍රහ්මචර්‍ය්‍යාන්තරාය—උතුම් හැසිරීමට අන්තුර
රුහුණු ජනපදයට—රුහුණු රටට
මලයප්‍රදෙශයට—කඳුකර රටට.
පාපමිත්‍රවූ—පාපිෂ්ඨ (පාපතර) මිතුරුවූ
උපස්තම්භකරවා—උදවු (ආධාර) කරවා
මහපා—මහාප්‍රාසාද

13 වනපිට

මූලිනුපුරුවා—(මූලින්+උපුරුවා) මුලින් සිඳවා
විහාරභූමියසාවා—විහාර පිහිටි බිම සීසා
ගාථාව:—පාපෙන, ලාමකවූ; මහාසෙනෙන, මහසෙන් රජු විසින්; මහාවිහාරෙ, මහාවිහාර; නාසිතෙ, විනාශකරවූ කල්හි; ධම්මරුචිකා භික්ඛූ, ධර්මරුචි නිකායවාසි භික්ෂූහු; චෙතිය පබ්බතෙ, සෑගිරියෙහි; වසිංසු; වාසයකළාහුය.
කල්‍යාණ මිත්‍ර—කලණ මිතුරු; මෙලෝ පරලෝ වැඩ සාදාදෙන මිත්‍රයා
සත්පුරුෂ සමාගමයෙන්—සජ්ජනයන්ගේ එක්ව විසීමෙන්
සිවුපසයෙන්—චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානප්‍රත්‍ය යන සතරාකාර ප්‍රත්‍යයෙන්

උපස්ථාන—උවටැන්; සංග්‍රහ
රාජවල්ලභ ලම්බකණ්ණදුවක් } රජමෙහෙසිවූ ලම්බකණ්ණ ගොත්‍රයෙහි කුමාරියක්
උලතබවා—උලහිඳුවා;
දවාපුව—ගිනිතැබ්බවී
ඔහුමැඩ—ඔහුට (තළා) ගසා
පාපමිත්‍ර සංසර්ගය—පවිටු මිතුරන්ගේ ආශ්‍රය
වඞ්ක සිත්ඇති—(වංචාවෙන්) ඇදවූසිත්ඇති
භක්ති—සේවනය; ආදරය; ඇදහීම;
මහවෙහෙර සිමින්—මහාවිහාර සීමාවෙන්
ඇතුළුසිමැ—ඇතුල් සීමාවෙහි; සීමාවෙහි ඇතුළ
නානාසංවාසකයන්ට—නොයෙක් නිකායවාසීන්ට
වළක්වාදීත්—වළක්වාලත්දීත්
නියොගකළ කල්හි—නියමකළ කල්හි
ශාසනාන්තය—සසුන් කෙළවර
අභිඥලාභීවූ—මහාදූනීම ලැබූ; අභිඥපසකි

එනම්:— ඍද්ධිවිධඥානය, දිව්‍යශ්‍රොත්‍ර ඥානය, පරචිත්ත විජානන ඥානය, දිව්‍යචක්ෂුරභිඥානය, පූර්වනිවාසානුස්මෘතිඥානය යනමොහුයි.
ෂහරණ දෙනෙකුන්—සාමණේර දෙනෙකුන්
රාක්ෂසවේශයෙන්—රකුසුවෙසින්
යගදුවක්—යකඩ සැරයටියක්
අමෝරා—ඔසවා; උලුක්කර
ලුහුබඳවා—පසුපස්සේ එළවා
අතුරුදන්ව—අන්තර්ධානව; නොපෙණී

(14 වන පිට)

අන්තිම විස්තුවෙන්—කෙළවරවසින්
චොදනා—වරදින්යුත් දෝෂාරොපණය
අධිකරණ අමාත්‍යයෙක්—විනිශ්චයකාර ඇමතියෙක්
විද්‍යමාන චොදනාවන් හෙයින්—ඇත්ව පවත්නා දෝෂාරොපණ වතානිසා
ගාථාව:—විහාරනාගිස්ස, දෙනාවෙහෙර පිළිහත්තාවූ; ඇසස තිස්ස තෙර්‍රස්ස, ඒකොභොනතිස්ස තෙරුන්වහන්සේට; අනතිමච්ඡන්තා, අනතිම වස්තුකවූ; භූතත්ථා, සිද්ධවූ; සබ්බම ජඤ්ඤා, සබ්බමධ්‍යගතවූ; චොදනා, දෝෂාරොපණය; ආසි, වූයේය. රාජිනො, රජහුගේ; ධම්මිකසම්මතො, ධාර්මිකයයි ප්‍රසිද්ධවූ; මහාමච්චො, මහාමාත්‍යතෙම; අනිච්ඡාය, රජහු නොකමැතිවම; තං, ඒ තිස්සතෙරුන්; ධම්මෙන, දූහැමින්ම; උප්පබ්බාජෙසි, සිවුරුහැරවීය.
විශුද්ධි—විශේෂයෙන් ශුද්ධ; සුපිරිසිදු
බුද්ධීන් ප්‍රසිද්ධවූ—ඥානයෙන් පසිද්ධවූ, නුවණින් පතළ
බුද්ධඝොෂනම්—බුදුරජාණන් වහන්සේ මෙන් පතළ යසස් ඝොෂාවෙන් යුක්තවූයේය යන අන්වර්ථ නාමයෙන් යුත්
අටුවාකතෘන්—අර්ථකථාකළ තැනැත්තා
ෂඩ්ද්‍රාවිඩය—මිත්තසේනරජුදවස ලක්දිව්බැස ක්‍රි: ව: 484 රේ පටන් රජකළ පණ්ඩුය, පාරින්දය, ඛුද්දපාරින්දය, තිරීතරය, දාඨිය, පීඨිය යන දෙමළ සදෙන
දසෙන්කෑලිය—මෞර්‍ය්‍යවංශයෙන් පැවත ආවාවූද, දෙමළ රජුන් නෙරපා පසුව ක්‍රි: ව: 461 දී රජපැමිණියාවූද ධාතුසෙනරජ
මැදිසිවරජ—කීර්තිසෙන රජුමරා ක්‍රි: ව: 525 හේදී අනුරාධපුර රජ පැමිණ දින 25 ක් රජකළ සිවරජ.
ලැමැණිඋපතිස්ස—සිවරජුමරා රජපැමිණි ලම්බකර්ණ උපතිස්සරජ

විතීය වර්ෂ සහස්‍රයෙහි—දෙවන අවුරුදු දහසෙහි; වර්ෂ 1000 පටන් 2000 ක දක්වා කාලයෙහි

අඹගෙරණ සලමෙවන්—උපතිස්සරජුගෙන් පසු ලක්දිව්රජපත් දඹදිව බෝමැඩ වෙහෙර **අඹගෙරණ** නාමයෙන් මහණව සිටි ශිලාමෙඝවණ්ණකුමරු

කසීරට—බරනැස; කාශිදෙශය,
වෙළඳ පුත්‍රයෙක්—වෙළෙන්දෙක්.
එක්වැනි—එකසමාන ·

( 15 වනපිට )

මන්දොත්සාහි—(මන්ද+උත්සාහි) මඳඋත්සාහ ඇති

අධමයන්—නීචයන්

නිශ්ශොභාකෙළේය—බැබලීම් නැතිකෙළේය,

චූලවංශයෙහි—මහවංශයෙහි අපරභාගයවූ සුලු වංශයෙහි; (සිරිමෙවන් රජුකලැ පටන් ii පරාක්‍රමබාහු රජුකල දක්වා ලංකා කථාව මෙහි අන්තර්ගතයි)

ගාථාව:—තද, එකල්හි; ජොතිපාලසනාමකො, ජොතිපාල යන නාම සහිත; එකො මහා ථෙරො, එක් මහා ස්ථවිරයෙකෙක් තෙම; දීපෙ, ලක්දිවිහි; විවාදෙන, විරුඬවාද කිරීමෙන්; වෙතුල්‍යවාදිනො, වෛතුල්‍යවාද ඇත්තවුන්; පරාජෙසි, පරාජය කෙළේය.

නිකායමය—ධර්මරුචි නිකාය සාගලිය නිකාය

සිත්ගෙන—සිත්සතුටුකරවා; සිත කැමතිකරවා.

විශත්සාන තනතුරු—පණ්ඩිත නායක තනතුරු

නිහතමානීව—මනාව නසනලද මාන ඇතිව; උඩඟු භාවයෙන් තොරව.

පරමබෞඬ—උතුම් බුඬභක්තික

අවනතව—නැමී; නමස්කාරකොට; යටත් පහත්ව

ව්‍යවහිතවූයේ—ප්‍රත්‍යක්ෂ සම්බන්ධයෙන් තොරවූයේ

සෙනෙවිමහනාරජ—කීර්තිශ්‍රීමෙඝවණ්ණරජු මරා ක්‍රි: ව: 561 දී අනුරාධපුර රජපැමිණි රුහුණුරට විසූ මෞර්ය්‍ය වංශික සෙනාධිපති මහනාගරජ.

දෙමළාස්වහසවිනු—අග්‍රබොධි රජුදවස ලක්දිව විසූ සක්දමලාය, අසක්දමලය ආදි මහා පණ්ඩිත දෙමළාස්දෙනා.

අසිගාහක—කඩුගන්නා නිලමේ; එනම් රජ;

සිරිසඟබෝ—අසිග්‍රාහකරජුගේ පුත්‍ර iii අග්බෝරජ.

ලැමැණිතවුසරය—ලැමැණිකුලදෙවුතිස්රජ

දළුපතිස්ස—දාඨොපතිස්ස; මෙනම ක්‍රි: ව: 640 දී රජපැමිණියේය,
දපුලුරජ—i දප්පුලරජ.

( 16 වනපිට )

ලමැණි දළුපතිස්ස—ලමැණිකුල i දාඨොපතිස්ස රජුගේ පුත්‍ර හත්ථදාඨරජු;

පැසුළුදළුපතිස්ස—හත්ථදාඨ රජුගේසහෝදර පැසුළු සිරිසඟබෝරජ

වල්පිටිවසුදත්තය—වල්පිටි නම් ප්‍රදේශයෙහි විසූ ක්‍රි: ව: 679 යේදී අනුරාධපුර රජපැමිණි දත්තරජු.

හුණන්නරු රියන්දළ—හුණන්නරු නම් ප්‍රදේශයෙහි උපන් හත්ථදාඨ යන නාමයෙන් රජවූ කුමාරයා.

මහලැපාණෝ—මාණවම්ම යන නාමයෙන් ක්‍රි: ව: 691 කේදී අනුරාධපුර රජපැමිණි ii කාශ්‍යපරජුගේපුත්‍ර උතුරුපළාවත් සැඟවීසිටි මහලු ආදිපාදයාණෝ

මත්වලසෙන්—පොළොන්නරුවෙහි රජ පැමිණි i සේන

වියතුන්නොහසල—ව්‍යක්තයන් (පණ්ඩිතයන්) ඇසුරුනොකළ

ගිරිවසැසෙන් නම්—ගිරිවංශයෙහි උපන් සේනනම්

අරක්කැමියක්හට—ආහාරපිසන්නෙක් හට

ගිනිවදනා—ගින්නට පතිනා

පළගක්හු—පළගැටියක්හු

කෙළසුවහස්—කෝටිශතසහස්‍ර

රතනසූත්‍රාදි—(විශාලාමහනුවර රෝගභය දුරුකිරීමෙහි පවාහේතුවූ මහාබල සම්පන්න) රතනසූත්‍රය ආදී

අධර්ම සංඥාය—ධර්මනොවූ දෙය පිළිනැණීම

රත්නකූටාදී ශාස්ත්‍ර—දඹදිව තීර්ථකයන්විසින් තිපදවූ එනම්ශාස්ත්‍ර

මුගයින්සෙන්—කාශ්‍යපආදිපාදයන්ගේ වැඩිමහල්පුත්‍ර ii සේනරජ

පාණ්ඩිරජය පැහැර—පාණ්ඩිරජුගේ රාජ්‍යය අල්වාගෙණ

කටුකොටෙහාල්පෙරළා කරවා—කැඩුම් බිඳුම් නැවත සාදවා

සුන්බුන්කරවා—සිඳුනු බිඳුනුතැන් සාදවා

කරයවටා—මුහුදවටේ; (ලක්දිව) වෙරළවටේ

පරිහරණකොට—ප්‍රයෝජනකොට; භාවිතාකොට

ගාථාව:—ලොකෙ, ලෙව්හි; සද්ධම්මපතිරූපානං, සද්ධර්මප්‍රතිරූපකයන්ගේ; පවත්තනං, ප්‍රවර්තනය (පැවතීම); දිස්වා, දැක; සමන්තතො, හාත්පස්හි; නාගරණෙන; සපුරුකෙළවර; තථා, එසේම; රක්ඛංගණ්හාපෙසි, රැකවල්නැත්වූහ හෙවත් මුරතැබ්බවූහ.

ලාමකවූ අඥනයෙක්—නින්දිතවූ නුවනමද අයෙක්

නීලපටදර්ශනය—නීලවර්ණ වස්ත්‍රයෙන් බැබලීම

දක්ෂිණ මධුරාවෙහි—දකුණුදිග මදුරාපුරයෙහි

සැදැහැ නැති— අශ්‍රද්ධාවත්
දුෂ්ට මහණෙක්—නපුරු ශ්‍රමණයෙක්
ශවශ්‍යාවාසයකට—ඉවසාගෙයකට
පහන්වගියකල—හිරළදුවූකල
අනුසස්—ආනිශංස; විපාක.
විදග්ධ--අඥාන, මෝඩ
වෛශ්‍යාඞ්ගනාවන්--වෙසං ස්ත්‍රීන්
අනවස්ථිත==(න+අවස්ථිත) එක් අරමුණක නොපිහිටි
කාමදෙවයා--අනඞ්ගයා; කාමසැපෙහි ප්‍රධානයා
භුවනත්‍රය==භුවනතුන; ලෝකතුන; කාම, රූප, අරූප යන තුන් ලෝකය; ස්වර්ග, මර්ත්‍ය,පාතාල එක්හෝ දිව්‍ය, මනුෂ්‍ය, නාග, යන ත්‍රිලෝකය; සත්ව, සංස්කාර, අවකාශ යන ත්‍රිවිධාකාර ලෝකය;
අසාධාරණ රත්නයකි--අසමාන රත්නයකි; උතුම් රුවනැකි
කඳුපහණ--කඳුමැටි; වීදුරු; කඳුමිණිනම් ගල්
නිසරුකොට--නිස්සාරකොට; අගය නැතිකොට
ග්‍රන්ථරචනාවක්==ප්‍රබන්ධයක්; පොතක්

( 17 වනපිටු )

ගාථාව:==වේශ්‍යාරත්නං, වෛශ්‍යාස්ත්‍රීරත්නයද; සුරාරත්නං, සුරාරත්නයද; දෙවෝමනෝභවඃරත්නං, කාම්දෙව රත්නයද යන; එතත්‍රත්නත්‍රයං,මේ රත්නතුණ; වන්දෙ, වදිම්. අන්‍යත්, අන්‍යවූවෙය්; කාචමණීත්‍රයම්, කඳුමිණිතුනෙකි.
අව්‍යවස්ථිත==(න+ව්‍යවස්ථිත) ව්‍යවස්ථා නැති; කටයුතුය නොකටයුතුය යන නියමයක්නැති; ශාස්ත්‍රයට විරුද්ධනීති ඇති
ශ්‍රී හර්ෂදෙවයෝ==ශ්‍රී හර්ෂනම්වූ දඹදිව රජෙක්,
ගාථාව:—දුර්මේධ, දුෂ්ප්‍රාඥය! කිං, කිම; න පිබසි, සුරානොබොත් නෙහි; නරකං ගන්තුං, නිරයටයන්ට; ඉච්ඡසි; කැමැත් තෙහිද? ලවණෝදක සංයුක්තාඃ, ලුණුදිය මිශ්‍රවූ; සුරාඃ, රා; ස්වර්ගේඅපි,දෙව්ලොවැපවා; දුර්ලභාඃ, ල බීමටදුෂ්කරවෙත්.
ශාසන භේදයකැයි—සසුන් බිඳීමකැයි
ආඥාචක්‍රවර්තීයන්හු—රජක්හු; අණසක පවත්වන්නෙක්;
උදාසීන—මධ්‍යස්ථ; උපෙක්ෂා; නිසොල්මන්
බොහෝසත්හු—බොහෝ සත්වයෝ
නීලපට්ධරයන්—නිල්වස්ත්‍ර දරන්නන්; නීලපට්ධරනම් නිකාය වැළඳගත්තවුන්.
අග්නිපූජාකලහ—ගිනිනැබ්බවී; ගින්නට පිදුම.

වැරදගිය ශේෂය==වැරදීගිය ඉතුරුකොටස; අග්නිපූජාවට ඇතු
ළත්නොවී බැහැරගිය කොටස;

මුල්නුසුන්ව්‍යාධියක්==මුලොච්ඡේදනය නොකළ රෝගයක්; මුළින්
සුන් නොකළ ලෙඩක්,

නියම්ගම්--නිගමගාම; භොග හා මිනිසුන් කරණකොට ප්‍රසිද්ධනම

රාජධානී==රජුන්වසන නගර

( 18 වනපිට )

සාධා==විනාශකොට

මලුකම්==උපසම්පද කර්මය

ගණපුරකැටි--සඞ්ඝයා (ගණය) පිරවීමට; යම් යම් විනයකර්ම කිරී
මට සම්පූර්ණවියයුතු උපසම්පන්න භික්ෂූන්ගේ නියම
ගණන පිරවීමට; නියමගණන පුරවන්නාට;

කලකිරුණාවූ--දුකට පත්වූ; තැවුනාවූ; පසුතැවිලිවූ

මුතුමැණික්—මුක්තාමාණික්‍යයන්.

අරමණරට--රාමඤ්ඤරට; රාමණ්‍යරට

ස්ථවිරපදප්‍රාප්ත==ස්ථවිර භාවයට පැමිණි,

පත්පොත්--පත්‍ර පුස්තකයන්; සන්නස් පත්‍ර හා පොත්;

මහාසම්මත පරම්පරානුයාත==මහාසම්මත පෙළපතින් (පෙළපතට
අනුව) පැවතෙන

රාජවංශොද්භූත--රාජවංශයෙහි හටගත්; රජකුලෙහිඋපන්

රාජාධිරාජ-=(රාජ+අධිරාජ) රජුන්ට අග්‍රරාජවූ

නෙකදිගන්තව්‍යාප්ත==(න+එක+දිග්+අන්ත+ව්‍යාප්ත) නොයෙක්
දිගුන්කෙළවරකොට පැතුරුණු;

යශොමරීචි මාලාවෙන්=කීර්තිරශ්මි මාලාවෙන්; කිත්රැස් වලල්
ලෙන්

ශ්‍රීසඞ්ඝබොධි==උතුම්වූ ආර්‍ය සඞ්ඝයා හා ජයමහබොධිය පිහිටකො
ට ඇත්තේ යන අර්ථවත් නමින් යුත් එනම් රජ,

ශ්‍රීපරාක්‍රමබාහු—අනුන් මැඩලීමෙහි සමර්ථ උතුම්වූ භාග්‍යයක්
නොහොත් බාහුවක් ඇත්තේ යන අන්වර්ථ නාමයෙන්
යුත් එනම් රජ

වන්නිපත්තුසාධා—වන්නිපළාත් යටත්කොට

ඒපචක්‍රවර්තීව—ඒපචක්‍රය පවත්වන්නෙක්ව; මුලුලක්දිවට අධිපති
රජව;

අන්‍යොන්‍ය විවාදයෙන්—ඔවුනොවුන්ගේ විරුද්ධ කථාවෙන්

ඇතිවිවර—ඇතිතාක්; ඇතිපමණ;

රන්සිරිබත්—රන්කනබැදි; රන්කඩුබැදි

අනම්දඹිසෙනගට--වැටුප් සඳහා වැඩකරණ සෙනගට

ජයවිරුදුලාසිටින--ජයප්‍රකාශ සතුටිපායි ලැබසිටින; ජයගැනීමේ හෙතුවින් නම්බු නාම ලැබ සිටින
නැවැණි==(නැව්+ඇණි) නාවික හටසේනා, (නව+ඇණි) අභිනව කඳවුරු
සමගකරවා==සමගිකරවා; එකතුකරවා
දෙබිල මහ සෙනග--විවිධාකාර මහභටසේනාව
සවදෙශ දෙශාන්තර==සියරට හා පිටරට
එකපැහැර--එකවිට
බහුනායකත්වය--බොහෝදෙනකුගේ ප්‍රධාන බව
රාජ්‍යසූත්‍රය==රාජාඥව, රාජ්‍යපාලනය
අධිකාර==මහනිලමේ; ක්‍රියාකරවන ප්‍රධාන ඇමති තනතුර.
සෙනෙවිරත්--සෙනාධිපති තනතුර; යුධහමුදාවේ ප්‍රධානියා
ඈපා--ආදිපාද; රජකම බලාපොරොත්තු උප ආණ්ඩුකාරයා; මහ රජානන්ගේ ඇමතිතුමා.
මාපා--මහාදිපාද; උපඅමාත්‍යන තනතුර
මහලැන--මහාලෙඛනායක තනතුර; මහලේකම්;
මහරැටිනා==මහාරාෂ්ට්‍රනායක; සියරට භාර මහ ඇමතිතුමා
අනුනා--අනුනායකයා; සියරට කටයුතු භාර උප ඇමතිතුමා;
සභාපතිනා--සභාපති නායකයා; දෙශයෙහිවූ සමාගම්හි සභාපති නායකයා; දෙශික සමිතිවලැ ප්‍රධාන සභාපති.
සිටුනා--ශ්‍රෙෂ්ඨිනායකයා; වෙළඳ මන්ත්‍රී
සිරිත්ලේනා--චාරිත්‍රලෙඛනායකයා; නීතිඥධිපති, ඇටෝර්නි ජනරාල්තුමා
දුලේනා==විලෙඛනායකයා, උපලේකම්තුමා
වියත්නා--ව්‍යක්ත නායකයා; අග්‍ර පඬිතුමා (පුරොහිත)
මහ වෙදනා=-මහා වෛද්‍ය නායකයා; අග්‍ර වෛද්‍යාචාර්යතුමා
මහ නැකතිනා==මහා නක්ෂත්‍ර නායකයා; අග්‍ර දෛවඥ තුමා
දහම්පසක්නා==ධර්ම ප්‍රත්‍යක්ෂනායකයා; ප්‍රසිද්ධාධ්‍යාපනාධ්‍යක්ෂතුමා ඩිරෙක්ටර්තුමා
ප්‍රධාන ප්‍රවෘත්ති--මූලික තනතුරු
වියත් පත් අටගණය--ව්‍යක්ත ප්‍රාප්ත අෂ්ටගණය; පණ්ඩිත තනතුරු අට කොටස
සතර මුදලද-=රන්, රිදී; මසු; කහවණු ආදි සතරාකාර මුදල් වර්ගයද
අවකුරුම--අලුත්කුරුම, පරණකුරුම ආදි නමින්යුත් ප්‍රදෙශ අට
දෙනව දහසක් ගන්නර ඉවරද=-දහ අට දහසක් දෙමළ ගම්වරද

අඛණ්ඩව=නොකැඩී; කඩනොවී

ගාථාව:-සොත්ථිපපසන්නජනතා, සුවපත්වූ ප්‍රසන්නජනසමූහයා ඇති; ජනතානභූතභූපා, ජනයන්ට පිහිටවූ පෘථිවීශ්වරයන් ඇති; සලීලරමණී, ලීලාසහිත කාන්තාවන්වැතිවූ; රමණීයරූපා, එහෙයින්ම සිත්කලූ ස්වභාවයක් ඇත්තාවූ; පුරාණං පවරා, පුරයන්අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ; පුලත්ථිනගරී, පුලස්ති රාජධානිතොමෝ; ඊනානගරී ඉති, සමෘද්ධවූ නගරිය කැයි සිතා; මහාධි පවරා, මහා ශ්‍රෙෂ්ඨයෝතුමූ; තුඞ්ගගෙහං, යම්පුරයෙක්හි උස්වූ මාලිගා ඇත්තෝවූහුද

වර්ණනීයවූ—වර්ණනා කටයුතු; විස්තර කළයුතු

පූර්වාරාමය=නැගෙණහිරින්වූ ආවාසය

පශ්චිමාරාමය—බටහිරින්වූ අරම

උත්තරාරාමය=උතුරු දිගින්වූ විහාරය

( 19 වන පිට )

ශත්‍රුරාජචොළ කුලාන්තක=සතුරු රජුන් නමැති සොළිකුලයට යමයාවැනි

උද්ධතරාජ නිර්මූල=උඩඟු රජුන් මුල්නොතැබූ; මුල්සුන් කරණලද උඩඟු රජුන් ඇති

දුර්බුද්ධිමථන—මිථ්‍යාදෘෂ්ටි මර්දනය කරන්නාවූ

දුර්නීතිවාරණ=දුෂ්ට නීති වළහන්නාවූ

ප්‍රකෘතඥ—ප්‍රස්තුත කාර්‍ය්‍යය (ප්‍රස්තාවට සුදුසු කටයුතු) දන්නාවූ

සකල දිග්විජය=සියලු දිගුන් සම්බන්ධ දිනාගැනුම් ඇති

සරණාගත වජ්‍රපඤ්ජර—පිහිටසඳහා නමාකරා පැමිණියවුන්ට දියමන්ති කූඩුවක් වැනි

අන්තශ්චරශත්‍රුවිජය=ඇතුළුනුවරහැසිරෙණ සතුරන්ජයගන්නා; යුද්ධාන්තරයට (යුද පිණිස) පැමිණි සතුරන් ජයගන්නා

පරමන්ත්‍ර භෙද වික්‍රම ප්‍රතාප=සතුරන්ගේ මන්ත්‍රණ බිඳහැරීමෙහි වික්‍රම හා තේජස් ඇති

අකලඞ්ක—කලඞ්ක (කැලල්) නැති; කිලුටු නැති

සර්ව ශත්‍රු ශිරොමණී=සියලු සතුරන් හිසටපත් මැණිකක් වැනි

ප්‍රකෘත්‍යනුකෘත්‍ය නිශ්චය=(ප්‍රකෘති+අනුකෘත්‍ය+නිශ්චය) ප්‍රජාවන්ට අනුගත ක්‍රියායෙහි නිශ්චය ඇති; යටත්වැසියන් ගේසිතට අනුව කටයුතු කිරීමෙහි නිශ්චය ඇති

පරරාජගොධූර්ජටි=අන්‍යරජුන් නමැති වෘෂභයන්ට ප්‍රධානවූ; අන් රජුන් නමැති ගොනුන්ට මෙහෙසුරු වැනි

නෘහරිකෛරව රාජහංස=නරශ්‍රෙෂ්ඨ නමැති කෛරවයන්ට රාජ හංසයෙක්වූ; රජුන් විසින් පමුණුවනු ලබන සාරධනය ලබන්නාවූ

පරනාරී සහෝදර=අන්‍ය ස්ත්‍රීන්ට සහොයුරුවූ; අන් අඹුවන් ස හෝදරියන් මෙන් සලකන්නාවූ

අරිරාජ වෛශ්‍යා භුජඞ්ග=සතුරු රජුන්ගේ වෙසඟනන්ට සර්පයෙක් වැනිවූ; හැමියන්මැරීමෙන් ශත්‍රුකාන්තාවන්ට විෂයකින් මෙන් පීඩා ඇතිකරන්නාවූ

අභිනව වීර විරිදු=අලුත්වූ වික්‍රම ප්‍රකාශ සතුති පාඨ; අභිනව සම ජී භාව සඳහන් ගරු නම්බු නාම

සවසප්තයෙන්—සැපතින්; යසසින්

පූර්වොක්ත ක්‍රමයෙන්==පෙර කියනලද පරිද්දෙන්

නින්දිතව==නින්දා කරණු ලැබ

තමන්ගේ සතරවන්නට--තමන් රජකමට පැමිණි සතරවන අවුරුද්දට

භින්න නිකායවූ==නිකාය භෙදව

ප්‍රඥා පුරස්සර--නුවණ පෙරටුව

සංචොදිත==මනාකොට දොෂාරොපණය කරණු ලැබූ

ත්‍රිවිධ ශාසනය==පර්‍ය්‍යාප්ති, ප්‍රතිවෙධ, ප්‍රතිපත්ති යන තුන් සසුන

බුදුරජාණන් වහන්සේ විසින් දෙශිත ත්‍රිපිටකධර්මය ඒවූ පරිද් දෙන් නොනැසී පැවැත්ම පර්‍ය්‍යාප්ති ශාසනයයි.

එකී ත්‍රිපිටක ධර්මය දත ඒවූ පරිද්දෙන් ශීල සමාධි විදර්ශනාදි යෙහි පැවැත්ම ප්‍රතිපත්ති ශාසනයයි,

නවලොකොත්තර ඵලසාධකවූ සොවාන් ආදි සතරමග ඵලා දියද ත්‍රිවිද්‍යා අභිඥාදි ධර්මයන්ද අවබොධය ප්‍රතිවෙධ ශාසන යයි.

අඛණ්ඩාවච්ඡින්නතාදි--(අඛණ්ඩ+අවච්ඡින්නතා+ආදි) නොකැඩුණු, නොසි ඳුරුබැව් ආදී

විවිධ--නානාප්‍රකාර

ගුණ ගණොපලක්ෂිත==(ගුණ+ගණ+උප ලක්ෂිත) ගුණ සමූහයෙන් බබලන

ඖදුම්බරගිරි අරණ්‍යවාසී==දිඹුලාගල වනවාසී

මහා කාශ්‍යපස්ථවිර ප්‍රමුඛ==කසුප් මහ තෙරුන් ප්‍රධානකොට ඇති

දුෂ්ප්‍රතිපත්තින්--නොමනා පිළිවෙත් වලින්

කෙලෙසන--කිළුටුකරණ

ලතා මණ්ඩපයක්හි==ලිය මඩුල්ලෙක; වැල්ගාලක

සනාථිත කරවා--මනාසේ සිඳුවා

තුන්යම් රාත්‍රියයි--පෙරයම, මැදියම, අලුයම යන කාලසීමාතුන
කින් යුත් රාත්‍රියයි
සුවර්ණගිරි ශිඛරයක==රන් පැහැයෙන් බබලන පර්වත මස්තකයක
කල්පස්ථායීවූ==කල්පයක් පවත්නා ආයු ඇති
ශාසන ශුද්ධිය==සසුන්හි පිරිසිදු බව
ස්වර්ගීයවූ සංවත්සරයෙහි--දෙව්ලෝගිය අවුරුද්දෙහි

( 20 වන පිට )

පූර්වාභිධාන--පෙරනම; මුල්නම්
පූර්වභාග ප්‍රවෘත්ත==මුල් භාගයෙහි පැවති
පුලස්තිපුර=පොළොන්නරු නගරය
පිරිකර==පරිෂ්කාර; සංඝයාට කැපසරුප් වස්තු
ශරණාගවේෂීව==පිහිට සොයමින්
මායාරජයට==මායාරටට
චීවරාදි චතුර්විධ ප්‍රත්‍යය ප්‍රදානයෙන්==සිවුරු ආදී සතරාකාර කැපස
රුප් දෙය දෙමින්
තත්කාල ශාසනානුශාසන==එකල බුද්ධශාසනයෙහි අනුශාසන ධූර
ධර
ජම්බුද්‍රෝණී==දඹදෙණි
පුරවරාසන්නයෙහි==උතුම් නගරය අසල
කතිකාවතකුදු--සංඝයා මෙම මේ ආකාරයෙන් ක්‍රියාකළ යුතුයයි
නියමයන් සටහන්කරගත් පොතකුදු
අතිජාත පුත්‍ර=පියාට වඩා උසස්ව ක්‍රියා කරණ පුත්‍රයා
ශත්‍රුපක්ෂ විශෝෂණ==සතුරන් නමැති මඩ වියළවන
ශරත්මාහීනචණ්ඩමණ්ඩලායමාන=සරත්කාලයෙහි බබලන සූර්යම
ණ්ඩලය වැනි
කලිකාල සාහිත්‍ය සර්වඥ=පෙරදිග රාජ්‍යයන්හි පැවති භාෂා ශාස්ත්‍ර
සියල්ල දත්
අධිකතර=ඉතා වැඩි
රාජාභිමාන==රජබවෙන් හටගත් උඩඟුකම
කඳවුරු බැඳ=තාවකාලික වශයෙන් යුධහමුදා නවත්වා; අතරමග
දී යුදසෙන් නවතා
සකල ලංකා තලය==මුලු ලක්දිව
හස්තගතකොට==අතට පමුණුවා ගෙණ
ප්‍රමාද විහාරීව==භාවනාභි යෝගාදීන්ගෙහි ප්‍රමාදයෙන් යුත් (වාසය
කරන්නන්ව) විහරණ ඇතිව
චීවර==සිවුරු

පිණ්ඩපාත=පිඬුහළිම; භික්ෂාවතය; ආහාරදන

ශයනාසන--සෙනසුන්; සිදීම; සැතපීම ආදියෙහි ප්‍රයෝජනවූ ඇඳපුටු ආදි වස්තු

ගිලානප්‍රත්‍යය==ගිලන්පස; ගිලනුන්ට කැපවූදෙය; විකාලභෝජන යෙන් තොරවීමෙන් හටගත් පිඩාවට කැප පාන වර්ගාදිය

ශ්‍රද්ධාවත්--භක්තිවත්; සැදැහැ ඇති

ශාසනාවචර==සසුනට බැසගත්; සසුන් වැද හැසිරෙණ

ශාසන පරිහානිකරවූ==සසුන (පිරිහන්නාවූ) පිරිහීමට හේතුවූ

පූර්වරාජෝත්තමයන්==පෙර රජතුමන්

මනෝත්සාහයෙන්--(මන +උත්සාහයෙන්) දැඩිතර වීර්‍ය්‍යයෙන්

සමෙහිතබාලූ==ශාන්තව තැබුවාවූ

අනුචිත--නොසුදුසු; අයෝග්‍ය

ආරණ්‍යක මෙධඞ්කර==අරන්හි වැසි එනම් සවාමීන්; වන සෙනසු න්හි වැසි මෙධඞ්කර ස්ථවිරයන්

උභයවාසයෙහි==දෙනිකායෙහි; විහාර දෙක්හි

ශාන්ත ස්වරූප—සසුනෙහි ඇතිතතු

ශීලවිපන්නයන්--ශීලවිපත්තියට පැමිණියවුන්; නොමඟ ගිය සිල්ව තුන්

ග්‍රන්ථධුර==ත්‍රිපිටක ධාරිව හෝ පිටක එකක් දෙකක් වශයෙන් හෝ කාණ්ඩයක් වශයෙන් හෝ ඉගෙණ දැරීම, අනුන්ට කිය වීම, දෙශනා කිරීමයි

විදර්ශනාධුර--අෂ්ටාදශවිදර්ශනාදි ධර්මයන් පූරණයෙන් දැරීමයි. එන සෙනාසනයක්හි වසමින් අනිත්‍ය, දුඃඛ, අනාත්මසංඛ්‍යා ත ත්‍රිලක්ෂණානුසාරයෙන්, සකල සංස්කාර ධර්මයන්ගේ බවුන් පිරීමෙන් රහත්භාවය සිඬකරනැණීමේ ධුරය.

කතිකා කරවා--සම්මත කරවා, නියමකරවා

පුටභත්ත සෝමාභිධාන--පලංබින්නල නම්

බ්‍රහ්මවිමානොපමවූ--(බ්‍රහ්ම+විමාන+උපමවූ) බඹ විමන්වැනිවූ

රූක්ෂප්‍රතිපත්ති පූරණයට==කටුකපැවතුම් පිරීමට; දුක්සහගත පිළි වෙත් පිරීමට

( 21 වන පිට )

ආත්මක්ෂම්වූ==ආත්මය ඉවසන සුලුවූ; ආත්මයට හිතවූ

අල්පෙච්ඡතාදි==(අල්ප+ඉච්ඡතා+ආදි) සැහැල්ලු (ස්වල්ප) වූ ආශා බැඳි ආදි

ප්‍රතිපත්තිසාර--පිළිවෙත් සරු

උපසම්පන්න කරවා=නැවත සජ්ජීත කරවා; සාමණේර නමක් යොග්‍ය ගුණයෙන්යුත් කල්හි විනයානුකූල පරිදි අධිශීල යෙහි පිහිටුවීම (උපසම්පදා) කරවා

අසනතැන්—නැවලුතැන්; ප්‍රශ්න කටයුතු ස්ථාන
අටුවාචාර්ය—අර්ථ [විස්තර] කථා ලියූ ඇදුරු
එකශ්‍රැතින් —එක්විටක් පමණක් ඇසීමෙන්
අනේකසහස්‍රග්‍රන්ථ ධාරණයට—නොයෙක් දහස්ගණන් ගාථාසිත්හි දරාගැනීමට
වජ්‍රඥානඇති—විදුරු නැණැති, විනිවිද යන නුවණැති
ටීකාර්ථකථා – ටීකා හා අර්ථකථා; අටුවා හා එහි විස්තර කථා
තත්ප්‍රවේශෝපායවූ—ඊට බැසගැනීමේ මාර්ගවූ
ධර්මප්‍රබන්ධ—ධර්මයට එකඟ කථා ප්‍රවෘත්ති; ධර්මපුස්තක
සන්න=[අර්ථාවබෝධය] ලිහිල්බසින් ලියූ පොත්
ගැටපද—ගැටලු සහිත පදයන්ගේ අර්ථ දක්වන පොත්
පිටපත්—භාෂාවකින් අන්‍යභාෂාවකට පෙරළාලියනලද පොත්
ධර්මානුගත=ධර්මයට එකඟ
ගෘහස්ථ පණ්ඩිතයෝ—ගිහි පඬිවරු

අග්බෝ රජුදවස ශූරපාදය, ධර්මකීර්ත්‍යාදය, ධීරනාග පාලය රාජමුරාරිය, කවිරාජ ශේඛරය, ගුරුළු දූමිය, ආගම චක්‍රවර්තිය පරාක්‍රම පණ්ඩිතය, අග්‍රපණ්ඩිතය, යන නව මහ ගිහිපණ්ඩිතවරු විසූහ.

විචිත්‍රාර්ථ ප්‍රකාශවූ—විසිතුරු අර්ථ (පැහැදිලිවූ) පැවසූ
ධර්මව්‍යාඛ්‍යාන—දම්වියකන; ධර්මයෙහි අවබෝධයට දුෂ්කර ස්ථාන සම්බන්ධ විස්තරකථා
ප්‍රාඥවරයෝ—මහා නුවණැත්තෝ; පණ්ඩිතයෝ
මහවැලිගං අස—මහවැලි ගඟබඩ
ගඞ්ගාසිරිපුර—ගම්පල

( 22 වන පිට )

හස්තිශෛලපුර—ඇත්ගල් නුවර; කුරුණෑගල
මෙණවර වංශාභිජාත—මෙහෙණවර වංශයෙහි උපන්
කාඤ්චිපුරයෙහි – කාඤ්චිනම් නගරයෙහි
සල පිළිමගෙයක්—ගල්පිළිම ගෙයක්
දෙව්නුවර—දෙවුන්දර
සිටිපිළිම ගෙයක්=සිටගත සිටින ප්‍රතිමාවකින් යුත් ගෙයක්
අග්බෝ වෙහෙර—අග්‍රබෝධි විහාරය
ජන්මප්‍රවේණි—ජන්මයෙන් උරුම
පර්ණශෛල—එනම් කන්ද
කෛලාස පර්වතය—අහස් ගඟ පටින්ගන්නා ඉතා සුදු පැහැයෙන් බබලන පිරිසිදු භාවයෙන් යුත් ඊශ්වරයා නිවාසකොට ඇති පර්වතය

තෙසුර්=තවත්; සෙසුත්; පසුවත්

රාජබලය පෙරදුරිකරවාගෙණ—රජ බලය (රජඅණ) පෙරටුකොට ගෙණ

ගිරිවංශාභිජාත=ගිරිවංශයෙහි උපන්

තෙජොබල වික්‍රමයෙන්—තෙදබල විකුමෙන්

ලොකපූජිත—ලෝවැස්සන් විසින් පුදනු ලැබූ

චක්‍රවාල පර්‍වතොපම=සක්වළගල වැනිවූ

මහා ප්‍රාකාර පන්තීන්—මහා පවුරු පෙළින්

පරික්ෂිප්ත—හාත්පසින් වටකරණු ලැබූ

භූමික—බිම් (මහල්) ඇති

එකභූමික=එක් මහල්

ත්‍රිභූමික—තුන් මහල්

පඤ්චභූමික—පස්මහල්

මන්ත්‍රීශ්වරයාණ කෙණෙක්=උතුම් මැතියෙක්

ගාථාව:-පාසාද, ප්‍රාසාදය; බොධි, බොධිවෘක්ෂය;වරචඞ්කම, උතුම්වූ සක්මන්මළුය; මණ්ඩපෙහි, මණ්ඩපය යන මෙයින්ද; පාකාර, ප්‍රාකාරය; සාල, ශාලාය; පටිමාලය, ප්‍රතිමා ගෘහය; චෙතියෙහි, චෛත්‍යය යන මෙයින්ද; රුචිර, සිත්කලුවූ; ආපණෙහි, සල්පිළින්ද; චාරුතර, අතිශයින් මනොඥවූ; ගොපුර තොරණෙහි, නගරවාරය, තොරන්ය යන මෙයින්ද; කල්‍යාණී නාම නගරී, කැළණිපුරිතොමෝ; රාජෙසි, බබලයි.

අලඞ්කෝතාර—අලකපුර ප්‍රධාන

නිකතියනාම්භ—නිකති හා වෘතාකාර කුළුණු

සොපානමාලාවෙන්—හිණිමත් පෙළින්; තරප්පු පේළියෙන්; පඩි පෙළින්

සමලඞ්කෘත=මොනවට අලංකාරකළ

සුධාධවල=සුදුහුණින් සුදුකරණලද

කෛලාසකූට ප්‍රතිභාග—කෛලෙස් කුළවසම

ප්‍රාසාද පන්තින්—මාලිගා පෙළවලින්

විශාලශාල—මහත් (විසුම්) සල්

ගොපුරශ්‍රේණීන්—නගරවාර පන්තීන්

විහාරෝපශෝභිතවූ=විහාරයෙන් බබලන

විවිධන්‍යාසයෙන්—විදි විභාගයෙන් (පිළිවෙළින්)

සම්පන්න—යුක්ත

උභයවීථිගත—වීථි දෙපසෑ පිහිටි

නානාප්‍රදෙශවාසී=නොයෙක් ප්‍රදෙශයන් වාසයකොට ඇති
ජනසමූහ සංකීර්ණ—මනුෂ්‍ය සමූහයෙන් මනාව ගැවසීගත්
සර්වසම්පත්ති සමෘද්ධ සම්පන්න—සියලු සැප විඳිනයෙන් යුත්
කල්‍යාණී පුරප්‍රවරාදි=කැලණිය නම්වූ උතුම් පුරය ආදි
සිද්ධස්ථාන—සිද්ධවූ ස්ථාන; සර්වඥධාතු නිධානාදීයෙන් පිරිසිදු බවට
පත් ප්‍රසිද්ධතැන්
විලොපකාරිවූ—විනාශකරවූ; නසන්නාවූ
පරශත්‍රුප්‍රතිබාහණය—පරසතුරන් මැඩපැවැත්වීම (වැලැක්වීම්)
ස්වාර්ථපරාර්ථ ප්‍රතිබද්ධ—තමන්ගේ හා අනුන්ගේ හිතවැඩ පිළිබඳ
චිත්තප්‍රවෘත්ති ඇති—සිත් පැවැත්ම (සිතිවිලි) ඇති
ශ්‍රද්ධාභක්ති පුරස්සර—සැදැහැයෙන් යුත් වැළඳගැනීම පෙරටුවූ
සකලාභිමතාර්ථ—සියලුම කැමතිවන ලද අදහස්
සාධාදීමෙහි—ජයගැනීමෙහි (ඉෂ්ටකරදීමෙහි)
ස්ථානොචිත—[ස්ථාන+උචිත] තැනට සුදුසු
කාර්‍ය්‍යාකාර්‍ය්‍ය විජානනයෙහි දක්ෂ—කටයුතු නොකටයුතු දැනීමෙහි
සමත්
විචක්ෂණ ගුණී—පණ්ඩිතගුණයෙන් යුත්
සුවච—මනාව හික්මුණු; යහපත් වචන කියනසුලු
කිංකරු—කීදෙය කරණ; (යටත් පහත්)
සෙවක මණ්ඩලිකයන්—සෙවය කරණ ප්‍රදෙශ රජුන්
කොලම්බාභිධාන—කොළඹ නම්

( 23 වන පිː )

ද්‍රොණිමුඛාසන්නයෙහි—තොටලඟ
සුරක්ෂිතව—මොනවට රක්ෂාකරණලැබ
වටාසිටි—වටවසිටි
තඩාගමධ්‍යයෙහි—විල්මැද
දුරුග්‍රාමය—දරමාගම; එනම් ගම
ගම්භීරතර—ඉතා ගැඹුරු
පර්වතප්‍රාන්තයක්—කඳුපාමුලක්
ප්‍රඵල—පලල
මහ අගල බිඳුවා=මහ අගල හාරවා (කැණ)
ස්ථිරත්වය සඳහා=තරබවට; ශක්තිය සඳහා
සර්ව ශෛලමය—සියල්ල ගලින් කරණලද
අතුරතුර=අනන්තරාන්තරයෙහි; මුදුන්මස්තකයෙහි
විශ්වකර්ම නිර්මාණයක්මෙන්=විස්කම් නිමහනෙව්; විස්කම් දෙව්හු
විසින් මවනලද්දක් මෙන්
ශුඩඩගණී=බලකොටුවලට ඇතුල්වීම් ආදියට භූමියට ආසන්නව
තනාතිබෙනදොරටු; කුරුබිලි

භූමිසංතච්චු=බොරුවලවල්
පුලිමුඛම්—සුණුපිරියමින් කරණලද කොපි මුහුණු
අට්ටාල—මුරගෙවල්; මැසි
වට්ටවට්ටවිත්=වෘතාකාරයෙන් කළ වෙළුකමින්; වැට්ට කරණලද සුණුපිරියමින්; වළේගැසූ ලැලිවලින්
"අභිනව ජයවර්ධන"—කෝට්ටය නුවර
කෝට්ටයක්—බලකොටුවක්
මහත් ජනගහණකරවා=බොහෝ සමූහජනයන්ගේ ගැවසීම ඇති කරවා
ඒසියක් රජුන්—එක්සියයක්රජුන්; චූලනීබ්‍රහ්ම දත්තරජුන් විසින් ප්‍රයොගයෙන් අල්වාගත් ඒ සියක් රජුන්
අටලොස් අක්ෂෞහිණියක්—අක්ෂෞහිණී දහඅටක්
අක්ෂෞහිණී නම්—21870 ක් ඇත්සෙනගද 21870 ක් රථ සෙනගද 65610 ක් අශ්වසෙනගද 109350 ක් පාබල සෙනගද යන 218700 ක්වූ සිවුරඟ සෙනගයි.
ජනහිත නිරතවූ—වැසියාගේ අභිවෘද්ධියෙහි ඇලීමසත
ශ්‍රී මහා බොධිසත්වවත්—උතුම් මහබෝසතුන්; බුදුබව ලැබීමට බුද්ධ කාරක ධර්මයන් පුරණ උතුමා
භය චකිත—භය හා කැළඹීම්
දෘෂ්ටාන්ත—උදාහරණ
චන්ද්‍රචක්‍රාදී—අර්ධකවාකාරවූ හා චක්‍රාකාරවූ ආයුධ විශෙෂ
දුදුරුකර—ජර්ජරකොට; පලා
පුරා—පිරී
විරූපවෙසධාරී—විකාර වෙස්දරූ
නානාවර්ණ සන්නාහ බහා—නන්වන් යුද ඇඳුම් ඇඳ
ආයුධ සන්නද්ධව—ආයුධයෙන් සැරසී
විස—වත්කෙණෙහි ජීවිතක්ෂයට පමුණුවන විෂයොජිත ආයුධ විශෙෂයක්
පැලලී—දඬුඅග සවිකළ අතිනායුධ විශෙෂයක්
තඬසාල—ආයුධ විශෙෂයක්
මාරාසී=අතේ සවිකොට අනින සිවුරැස් ආයුධ
යුද්ධසජ්ජිතව—යුද සැරසී
දුෂ්ටග්‍රාමණී ප්‍රමුඛ—දුටුගැමුණු ප්‍රධාන
දිගුණුකර—දෙගුණකොට
නානායම්—බලකොටු; හැවතුම් පලවල්
දශදිගන්තයෙහි—දසදිග්කෙළවරෙහි; උතුර, ඊශාන, නැගෙණහිර ගිනිකොණ, දකුණ, නිරිත, බටහිර, වයඹ, උඩ, යට යන දශදිශා කෙළවර

ගාථාව:—නත, පතළාවූ; අනන්ත, කෙළවරක් නැත්තාවූ; කන්ත බබ, කන්තිවර්‍ෂයන්ට; සුධාරභූතො, අභිශයෙන් ආධාරවූ; උළාරෑ, මහත්වූ; අලංකාර, අලංකාරයෙන් යුක්තවූ; ලංකා සුවණ්ණද්දීපාසො, ලංකානමැති සුවණ්ණ පර්වතය තිබෙන සකොට ඇති; සපතන, ශත්‍රූජන නමැති; ඉභකුම්භ, ගස් ති කුම්භස්ථලයන්; බිංභෙදෙ, බිඳීමෙහි; පවීණ, ප්‍රවීණ (සමර්ථ)වූ; වීර, වීරවූ; අලකාධිසසීහො, (අලකපුරාධිවාසි වෛශ්‍රවණ දිව්‍යරාජයා වැනිවූයේනුයි) අලකෙශ්වර නමැති සිංහතෙම; විරාජෙති, බබලයි.

සිරිලක් අරක්ගත්—ශ්‍රී ලඞ්කාවීපයට රැකවල් ගත්

කිහිරැලි උපුල්වන්—ඛදිරදෙහලි උත්පලවණ්ණ; විෂ්ණුදෙවියන්; දෙවුන්දර දෙවොලැ කිහිරිකඩින් විෂ්ණුරුව තැනුතැන් පවත් (ඛදිර දෙහලී) කිහිරැලියයිද සවාභාවයෙන්ම උත් පල වණ්ණමයවූ නිල්පන් ශරීරයක් ඇත්තෙන් උත්පල වණ්ණ) උපුල්වන්යයිද ව්‍යවහාරවනු ලබයි.

සමන්බොක්සැල්—සමන්දෙවිඳු; සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රී පාදය පිහිටි සමන්තකූට පර්වතයට අධිෂ්ඨිත දෙවිඳු

විභීෂණ=වෙසවුණු දෙවියන්

සකන්දකුමාර—කඳකුමරු; කතරගම දෙවියන්

සතරවරම් මහ රජුන්—සතරදිග අරක්ගත් දෙවිමහරජුන්

දෙවස්ථාන—දෙවාල

භෙරිතූර්‍ය—බෙර දවුල් ආදි තූර්‍ය විශෙෂ

නෘත්‍යගීත වාද්‍ය දී=නැටුම්, ගීකීම්, වීණාවැයීම් ආදි

පූජෝත්සව—පුදසත්කාර සහිත සතුටු උපදවන ක්‍රීඩා

( 24 වන පිට )

කවිවරයන්=පණ්ඩිතයන්; කාව්‍ය කර්‍තෘන්

විපාධිරාජය—වීපයකට අධිපති අග්‍රරජ

මණ්ඩලික රාජය—මණ්ඩලයකට අධිපති රජ

ප්‍රදෙශ රාජය—පෙදෙසකට (පළාතකට) අධිපතිරජ

අන්තරභොගික රාජය—ප්‍රදෙශාන්තරයන් අනුභව කරන්නාවූ රජ

අනුශාසක රාජය—වැඩ අවැඩදෙක පිළිබඳව මෙසේ මෙසේ කට යුතුයයි අවවාද දෙන යුවරජ

පඤ්චප්‍රකාර—පස් ආකාර

දාන=දීම; සුදුසුඅවස්ථාවන්හිදී ත්‍යාගදීමාදියෙන් වැසියන්කෙරෙහි සැලකීම

ප්‍රියවචන—සතුටුවචන

අභිවෘද්ධි—තමහට හිතපක්ෂ අමාත්‍යාදීන් වැඩෙහි යෙදවීම
සමානාත්මතා—තමසේවක වැසියන්ගේ දුක් සනසන අවස්ථාවන්
හිදී තමා සමානකොට සිතීම
චතුස්සංග්‍රහවස්තුවෙන්—සිව්සඟරා වතින්
ජනරඤ්ජනය—ජනයා රැකීම
පරලෝකප්‍රතිෂ්ඨාව—පරලෝ පිහිට
අනෙක සහස්‍රවස්තු පරිත්‍යාග—නොයෙක් දහස්ගණින් ධනයදීම
ආරාම වින්‍යාසයෙන්—අරම් පිළිවෙළින්
කාඤ්චිපුර පුරන්දර—කාංචිපුරයට ශක්‍රයා වැනි
හිරිවංශශේඛර—හිරිවංශයට මුදුන්මල්කඩක් වැනි
නිශ්ශඞ්ක අලංකේශ්වර—සැකරහිත භාවය හේතුකොටගෙණ වෛ
ශ්‍රවණයා වැනිවූ
වංශානුගත—වංශයට එකඟ
ගෝත්‍රවිදුරු නාමයෙන්—කුලපරම්පරා නම්බු නාමයෙන්
පිරිවෙන් ව්‍යවස්ථාකරවා—පිරිවෙන් නියමකරවා (සාදවා)
නිඛිලජන ප්‍රාර්ථනීයවූ—සියලුදෙනා විසින් පැතියයුතුවූ
නගරාඞ්ග සම්පත්තීන්—නගරාවයව සැපතින්
රාජග්‍රාම පුරප්‍රවරාසන්නයෙහි—රාජග්‍රාමයනම් උතුම්නගරය අසල
(රත්ගම)
ග්‍රාමාරණ්‍යවාසී—ගමේ හා වනෙහි වසන
අමරගිරිවංශ—අමරගිරි වංශයෙහි
ස්වච්ඡන්දිකව—ස්වමතිකව; සිය කැමති ඇත්තෝව
තදුපාය—(තත්+උපාය) ඊට ප්‍රයෝගය
සස්‍යජාතාන්තරයෙහි—කොයම්පැල අතර; සස්‍යකරල් හටගන්නා
අතරකාලයෙහි
තණලවන්—තෘණලාවණ්‍යයන්; තණපැල
ඇල්ගොවියන්සේ—ශාලිගොපකාවන් මෙන්; ඇල්කෙත් රකින්
ආද්‍යන්ත ප්‍රවෘත්ති—මුලඅග තොරතුරු (නන් මෙන්
රක්ෂිත—රක්ෂාකරණලද
පෝෂිත—පෝෂණය කරණලද
ශීලස්කන්ධාදි—සිල් සමූහ ආදි
අනෙකගුණ ගණානුභාවොත්පන්න—නොයෙක් ගුණ සමූහයෙහි
අනුහසින් උපන්
තේජස්කීර්ති ශ්‍රී—තෙද කිත්සිරි
කල්‍යාණාභ්‍යාශයෙන්—යහපත් අදහසින්
දුශ්ශීල ගණනක්දෙනා—දූෂිත සිල්ඇති ගණසමූහයා
සුහුරුබඩු—මිසසියා

ප්‍රතාප—අනුන් මැඩලන ගුණය
රූපසම්පත්‍යාදි—රූප සම්පත් ආදි
සාතිශය විශෙෂානුගත—ඉතා මහත් ප්‍රභෙදයන් අනුව ගිය
පුරුෂබල පරාක්‍රමයෙන්—පුරුෂබල වික්‍රමයෙන්
මලලයොධකාදි—මලල යොධක ආදි

(25 වන පිට)

පූර්වොපචිත—පෙර රැස්කරනලද
අපවත් නොකළමැනවැයි—විනාශ නොකරණු යෙහෙකැයි
පසසලස්වා—ප්‍රත්‍යන සම්පාදනය කරවා (නියමකරවා)
ගම්බිම්=නින්දගම් හා වතු
ක්ෂෙත්‍රවස්තු—කෙත් හා රන්රිදී ආදි වස්තු
ධනධාන්‍ය—මිල මුදල් හා සස්‍යජාති
වස්ත්‍රාභරණ=වරදිපිළි හා අබරණ
වන්දිභට්ටයන්—රජුගේ ස්තුති පාඨකයන්
දාසිදස්—දාස, ස්ත්‍රීන් හා පුරුෂයන්
ගවමහිසාදි—එළහරක් මීහරක් ආදී
අශ්වදාන=අසුන්දීම
ගොදාන—ගවයන්දීම
අවශෙෂ යාචකයන්ට—සෙසු යදියන්ට
අන්නපාන වස්ත්‍රාදීයෙන්=කෑම්බීම් ඇඳුම් ආදියෙන්
උභයලොකාර්ථ සංසිද්ධියට—දෙලොවැඩ සිදුවීමට
ඒකාන්ත කාරනවූ—නිශ්චය හෙතුවූ

ගාථාව:—රුචිරගුනමණීනං, සිත්කලුවූ ගුන නමැති මාණික්‍යයන් ගේ; ආකරො, උත්පත්තිස්ථානවූ; මෙරු සාරො, සර්වරත්න යෙන් මහමෙරසම්බන්ධ සාරත්වය ඇති; විජනමදගජානං, විරුද්ධජන නමැති මත්තහස්තීන්ට; දප්පිතනා, හටගත්තාවූ ගෙවීඇති; කෙසරින්ද්‍ර, කෙසරසිංහ රාජයෙක්වූ; කවිජන කමලානං, පණ්ඩිතජන නමැති පද්මයන්ට; භානුභූතො, සූර්යයෂ්‍යාවූ; උරුතෙජො, මහත්වූ තෙජො ගුණ ඇති; වීරබාහ්වාදිපාදො, වීරබාහු ඇපාණෙතෙම; සකල ලඞ්කා, මුළු ලක්දිව; ජයති, දිනයි.

ගාථාව:—විමල විපුල සද්ධො, නිර්මලවූ මහත් ශ්‍රද්ධා ඇති; සාරදත්තාභි රතො, සාරවස්තුන්දීමෙහි වෙසෙසින් ඇලුනාවූ; විදිත සමය තන්තො, දත්තාලද ආගම ශාස්ත්‍ර ඇති; දයා උදාර චිත්තො, දයාවෙන් උදාරවූ සිත් ඇති; සො, හෙතෙම;

ජිනතනුජ, සම්බුදු පුත්‍රයෝය; දිජාතං, බ්‍රාහ්මණයෝය යන මොවුන්ටද; අසෙසසත්තානං වන්දිතං, සියලු වන්දිජන යන්ටද; පවරගාමෙ, උතුම්වූ ග්‍රාමයන්ද; ගො, ගවයෝය; ගජ, හස්තීනුය; අස්ස, අශ්වයෝය; ඉත්ථී, ස්ත්‍රීනුය; දාසි, දාසයෝය යන මොවුන්; අදදි, දුන්නේය.

ගුණඅතොසිතුත්—ගුණ ඇතිගෙසිනුත්

ගාථාව:—අනඤ්ඤරාජඤ්ඤ සමානමානො, අනඤ්ඤක්ෂත්‍රියයන්ට සමාන පූජා නැත්තාවූ හෙවත් අන් රජුන්ට සාධාරණනොවූ පූජා ඇත්තාවූ; මහප්පදානෙ, මහත්වූ වස්තුදීමෙහි; ධනදෙපමානො, ධනදයා හෙවත් වෛශ්‍රවණයා උපමාන කොට ඇති; පජාරඤ්ජනලද්ධවණ්ණො, ප්‍රජාවන් සිත්ඇලවීමෙන් ලැබූගුණවර්ණනා ඇති; රාජා, රජතෙම; ධුතවෙරිං, කම්පාකොට හරණලද වෛරීජනයා ඇති; තිසීහලං, ත්‍රිසිංහලය; සාසති, අනුශාසනාවිධියෙන් රක්.

ගාථාව:—නිරන්තරං, නිරතුරුව; මත්තමතංගජෙ ඉව, මත්වූ හස්තියකු කෙරෙහිමෙන්; සමාගතා, රුස්වූ; යාචකභිංග මාලා, යාචකජන නමැති භෘංග සමූහයා; සො, ඒ රජ තෙම; දානරසෙන, මදදියෙන් දේහෝ නොහොත් දාන රසයෙන්; සම්මා, මනාකොට; පීණෙති, පිණවයි. සයංච, තෙමේද; තෙසං, ඒ යාදියන්ගේ; තුට්ඨිගීතිකාහි, සතුටිගීති කාවලින්; (පීණෙති) පිනායෙයි

සඤ්ජාතවූ--හටගත්තාවූ

සාභිමානා චිත්තොත්සාහ--උඩගුබව සහිතව සිතහටගත් උත්සාහය

ත්‍රිරත්නානුගත—බුද්ධ, ධර්ම, සඞ්ඝ යන තුනුරුවන් අනුව ගිය

චිත්තප්‍රසාදයෙන්—සිත් පැහැදීමෙන්

නවරත්නයන්—මුතු, මැණික්, වෛරෙළිමිණි, ගෝමේද, දියමන්ති, පද්මරාග, මරකත, නිල්මිණි, පබළු යන නවරත්නයන්

( 26 වනපිට )

ශෞර්‍ය්‍යවීර්‍ය්‍යාන්විත--සූරබැව් හා වීරබැව් ඇති

තරම්පඩි--සුදුසු වැටුප්

බඩ්ඩගකුන්ත--කඩු හා හෙල්ල

පණ්ඩරඞ්ගාදිපාෂණ්ඩයන්—සුදුරෙදි පෙරවනපරිව්‍රාජකාදි තීර්ථක යන්

මහණ මහලු පැවිදි--පැවිදි කිරීම හා මහණ උපසම්පදා

අගතැන්මහපදවි--අගනතුරු හා නායක පදවි

යුක්තප්‍රාප්තකාලයෙහි--සුදුසු බැව් පැමිණිකල්හි

සංඝදර්ශන ප්‍රභව } සංඝයා දැකීමෙන් හටගත්
ප්‍රීතිප්‍රාමොද්‍යරසාස්වාද } අධික ප්‍රීතිරස විඳගැනීම

ශාසනසාත්කරවා—සසුනට ඇතුළත්කරවා

අනුජාත ශිෂ්‍ය පුත්‍රවූ—ගුරුවරයා හා සමානව ඇදුරු පරපුරෙහි තබාය ඒවූ පරිද්දෙන් පවත්වාගණ යන ගොලහාවයෙන් පුත්‍රයෙකු වැනිවූ

ශාසන පවිත්‍ර චාරිත්‍රය—සස්නෙහි පිරිසිදු සිරිත

ගාථාව:—උදාර, මහත්වූ; චාරු, මනොඥවූ; මතිමා, ප්‍රඥාඇති; යො, යමෙක් තෙම; ජිනසාසනම්හි, සර්වඥශාසනයෙහි; සඤ්ජාත, හටගත්තාවූ; සාසනමලං, සසුන්මල; යදිසොධයෙථ, ඉදින් ශුද්ධකලේනම්; තෙනපුඤ්ඤෙන, ඒ පිනින්; තිදිවෙසු, දිව්‍යපුරයන්හි; චිරං, බොහෝකලක්; චරිත්වා, හැසිර; තෙන එව, ඒ පිණින්ම; සුරම්මං, ඉතා රම්‍යවූ; වරසන්ති පුරං, උතුම්වූ ශාන්තිපුරයට හෙවත් නිවණට; යාති, යෙයි;

භඤ්ජකවූ—බිඳින්නාවූ; වනසන්නාවූ

දූජින—ජනයන් දූෂ්‍යකරන්නාවූ

අසාදූනලාභෙළා—ශ්‍රවණයකොට දූත සිතනබාහෙගණ

නිඤ්ඤතොබැණ—අවනම්බු නොකොට

ධර්මාන්විතව විචාරා—ධර්මයට එකඟව අසා

( 27 වන පිට )

වස්තුලෙස පිළිපැද—සංග්‍රහවස්තූන්හි කියනලද ක්‍රමයෙන් පැවත

සාධුසම්මත—සත්පුරුෂයන් විසින් පිළිගත්

ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන්—මැරීම් ඉපදීම් වශයෙන්

සදෙව්ලොව=චාතුර්මහාරාජිකය, තාවතිංශය, යාමය, තුසිතය, නිර්මාණරතිය, පරනිර්මිතවශවර්තිය යන දෙව්ලෝ සය;

සැරිසරා—ඉපදීම්වශයෙන් හැසිර

නිවන්පුර—සංසාරොත්පත්ති සාධක දශසංයොජනාදි ධර්මයන් අවිජ්ජාශ්‍රවාදි ආශ්‍රවධර්මයන්ගෙන් බැඳීම් සඞ්ඛ්‍යාත ප්‍රකෘති ගුණයෙන් මිදීම් සඞ්ඛ්‍යාත විකෘති ස්වභාවයට පමුණුවන හෙයින් නිර්වාණයයි නම්වූ සැපවත්භාවය.

තත්කාලොචිත—එකලට සුදුසු

ආඥාපුරස්සර—අණසකපෙරටුකොට ඇති

අවධියට—කාලයට

ජනිතවූ—උපන්නාවූ; හටගත්තාවූ

ශුභවිපාකයෙන්—යහපත් ඵලයෙන්

ගාථාව 1:—අම්හෙහි, අප විසින්; ඉතො, මෙයින්; අසුතං, නොඅසන ලද්දාවූ; අඤාතං, නොදන්නාලද්දාවූ; කිංඅත්ථි, කුමක්නම් ඇද්ද?; සබ්බ, (ඒ) සියල්ල; ජානාම ඉතිව, ( අපි ) දනිමු යයිද; එත්ථ, මෙහිලා; නචින්තනීයං, නොසිතියයුතුයි; තස්මා, එහෙයින්; මම, මාගේ; ඉදං වචනං, මේබස; ජෝතිසහිතෙ, ආලෝකසහිතවූ; දීපම්හි, ප්‍රදීපයෙක්හි; පූත තෙලසෙක සාදිස්සකංහි, නැවත තෙල්වත්කිරීමක්මෙනි.

2. නිච්චං, නිරන්තරයෙන්; නෙකදිගන්ත, අනෙකදිශාන්තයන්හි; පත්ථට, පතළාවූ; මහා තෙජො සහස්සංසුනා, මහත්වූ තෙජස් නමැති සූර්ය්‍ය රශ්මියෙන්; දුජ්ජන, දුර්ජන නමැති; සබ්බඝොර තිමිරං, සියලු ඝොරවූ අන්ධකාරය; නිස්සෙසතො, නිරවශෙෂයෙන්; හෙත්වා, බිඳහැර; සජ්ජනාලිහංස සහිතං, සජ්ජන නමැති භෘඞ්ගයන් හා හංසයන් සහිතවූ සොභාත් සජ්ජන සමූහ නමැති හාසයන් සහිතවූ; සන්තතං, ශාන්තබැව් ඇති; සජ්ජාර විඤුකරං, සජ්ජ නමැති පද්මාකාරය; තොසෙත්වා, තුටුකර; පවරා, උත්තමවූ; රාජාදිරංසිස්සරා; රාජාදිවූ සූර්ය්‍යයොතුමූ; ලඞ්කාකෙ, ලංකා නමැති අහස්හි; සුචිරං, බොහෝකලක්; රමන්තු, රමණය කෙරෙත්වා.

3. මුනිස්සරස්ස, මුනීශ්වරයන්ගේ; ධම්මො, ධර්මයතෙම; චිරාය, බොහෝකලක්; පවත්තතු, පවතීවා; වසුමති පතයො, පෘථිවිපතීහුතුමූ, ධම්මයිනා භවන්තු, ධර්මයෙහි පිහිටියාහු වෙත්වා; ඝනො, මේඝය තෙම; කාලෙ, සුදුසුකල්හි; පවස්සතු, වසීවා. නිඛිලාපජාපි, සකලසත්ත්වයෝ; අඤ්ඤඤ්ඤ මෙත්ථ පටිලාභ සුඛං, ඔවුනොවුන් කෙරෙහි මෙත් පිළිලැබීමෙන්වූ සැපය; ලභන්තු, ලබත්වා.

ශ්‍රද්ධාබුද්ධි සම්පන්න=සැදැහැයෙන් හා නුවණින් යුත්

විචාරක්ෂම=විචාර බැව්හි දක්ෂ

ශාසනාවතාර චරිතය—සසුනට බැසගැණීම පිළිබඳ සිරිත

ගාථා—1. පුරෙ, පෙර; රම්මෙ, සිත්කලුවූ; ගඞ්ගාසිරි පුරෙ, ගඟසිරි පුරයෙහි (ගම්පල); භුවනෙකභුජෙ, බුවනෙකබාරජු; රජ්ජංකාරයමානෙ, රජයකරවන කල්හි; යො ධම්මකිත්තිය නිස්සරො, යම් ධර්මකීර්ති නම් යතීශ්වරයෙක් තෙම; ගඩලාදෙණි ගාමම්හි, ගඩලාදෙණි නමෙහි; සද්ධම්මතිලක විහයං, සද්ධම්මතිලකනම්වූ; විහාරං කාරයිත්වාන, විහාරයක් කරවාගෙණ; තහිං, ඒවෙහෙරෙහි; සුචිරං, බොහෝ කලක්; වසයී, විසීද;

2. තස්ස, උන්වහන්සේගේ; සිස්සපුත්තො, ශිෂ්‍ය පුත්‍රවූ; ධීරො, ප්‍රාඥවූ; දෙවරක්ඛිත නාමකො, දෙවරක්ෂිත යන නමක් ඇති; ජයබාහු ඉති නාමෙන, ජයබාහු යන නමකින්; විස්සුතො, ප්‍රසිද්ධවූ; ලොකපූජිතො, ලොකයා විසින් පුදන ලද්දවූ; ධම්මකිත්ති මහාථෙරො ඉති, ධර්මකීර්ති මහා ස්ථවිරයයි; තන්නාමවිභූසිතො, ඒ ආචාර්‍ය්‍යයන්ගේ නමින් හෙබියාවූ; සො, යමෙක් තෙම; සඞ්ඝරාජත්තං, සඞ්ඝරාජ බවට; පත්තො, පැමිණ; ජිනසාසනං, සර්වඥශාසනය; සොභෙසි, හෙබවී;

(28 වන පිට)

3. සො, හෙතෙම; සදා, හැමකල්හි; සත්ථුසාසනස්ස, සර්වඥශාසනයාගේ; අභිවුද්ධියා, අභිවෘද්ධියපිණිස; එතං නිකාය සංගහං, මේ නිකාය සංග්‍රහ [නම් ප්‍රකරණ] ය; සභාසාය, ස්වකීය (සිංහල) භාෂාවෙන්; සමාසතො, සැකෙවින්; අකාසි, කෙළේයි.

———(ං)———

ගාථාව:—1. චක්ඛුභූතං, චක්ෂුර්භූතවූ (ඇසක්වැනිවූ); හිතං, හිත කරවූ; ඉදං ගන්ථජාතං, මේ ග්‍රන්ථ සමූහය; කරොන්තෙන, කරන්නාවූ; මයා, මාවිසින්; යං පුඤ්ඤං, යම් පිණක්; පත්තං, පැමිණෙනලද්ද; තෙන, ඒ පිනින්; ඉමෙ සත්තා, මේ සත්වයෝ; මුනින්දෙනයාතං, මුනීන්ද්‍රයන් වහන්සේ විසින් පැමිණ වදාරණලද; සිවං පදං, නිර්වාණ පදයට; වීතසොකා, පහවගිය සොක ඇත්තාහු; පාපුණන්තු, පැමිණෙත්වා.

2. සුරා, දෙවියෝ; දෙවලොකෙ, දිව්‍ය ලොකයෙහි; අච්ඡරානං ගණාදීහිසද්ධිං, අප්සරාවන් සමූහාදීන් සමග; චිරං, බොහෝකලක්; සුඛං අනුභොන්තු, දිව්‍යසැප අනුභව කරත්වා; ලොකෙ, ලෙව්හි; ජිනින්දස්ස, ජිනෙන්ද්‍රයාණන් වහන්සේගේ; ධම්මො, ධර්මය තෙම; චිරං, බොහෝ කලක්; ඨාතු, පවතීවා; ලොකපාලා, ලොකපාලයෝතුමූ; සුඛං, සැපසේ මහිං, පෘථිවිය; පාලයන්තු, පාලනය කරත්වා.

නිමි.

This was given to
Bhikkhu B. Sarana Gavesi
by Kirivattuduwe Vihare

# අ ඞ්ගු ත්ත ර නි කා ය

## ගා ථා ස න් න ය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

---

1 සෙඛො අසෙඛො ච ඉමස්මිං ලොකෙ
ආහුනෙය්‍යා යජමානානං හොන්ති,
තෙ උජ්ජුභූතා කායෙන වාචාය උදචෙතසා
ඛෙත්තං තං යජමානානං එත්ථ දින්නං
මහප්ඵලන්ති. 2.

1 ඉමස්මිං ලොකෙ, මේ ලොකයෙහි; සෙඛො (ච), ශෛක්ෂ පුද්ගලතෙමේද; අසෙඛො ච, අශෛක්ෂ පුද්ගලතෙමේද (යන දෙදෙන); යජමානානං, දන්දෙන්නවුන්ගේ; ආහුනෙය්‍යා හොන්ති, දුරින්ගෙණහැරදියයුතු දන්පිළිගැන්මට සුදුස්සෝ වෙති; තෙ, ඒ පුද්ගලයෝ; කායෙන, කයින්ද; වාචාය, වචනයෙන්ද; උද, යලිත්; චෙතසා, සිතින්ද; උජ්ජුභූතා, සෘජුවූවාහුය; තං, ඒ දෙවැදෑරුම් පුද්ගලවර්ගයා; යජමානානං, දන් දෙන්නවුන්ට; ඛෙත්තං, කෙතෙකි; එත්ථ, මේ දෙවැදෑරුම් පුද්ගලවර්ගයාහට; දින්නං, දෙනලද්ද; මහප්ඵලං ඉති, මහත්ඵල ඇති වන්නේයයි (වදාළසේක).

සතරවන වර්ගයෙහි චතුර්ථ සූත්‍ර ගාථාර්ථ විවරණයයි.

**ඒකනිපාත ගාථාර්ථ සංවර්ණනාව**
**සමාප්තයි.**

---

2 නිහීයති පුරිසො නිහීනසෙවී
න ච හායෙථ කදාචි තුල්‍යසෙවී,
සෙට්ඨමුපනමං උදෙති ඛිප්පං
තස්මා අත්තනො උත්තරිං භජෙථාති. 3.

2 නිහීනසෙවී, (තමාටවඩා ගුණයෙන්) හීනපුද්ගලයෙක් සෙවනයකරන්නාවූ; පුරිසො, පුරුෂතෙමේ; නිහීයති, (ගුණයෙන්) පිරිහේ; තුල්‍යසෙවී, (සීලාදිගුණයෙන් තමාහා) සමාන

B. Sarana Gavesi
Bhikkhu

පුද්ගලයෙක් සෙවනයකරන පුද්ගල තෙමේ; කදාචි, කිසිකලෙක; නච භායෙථ, නොපිරිහෙන්නේය; සෙට්ඨං, (තමාටවඩා) ශ්‍රෙෂ්ඨපුද්ගලයෙකුකරා; උපනමං, නැමෙන්නාතෙම්; ඛිප්පං, වහා (ම); උදෙති, වැඩෙයි; තස්මා, එහෙයින්; අත්තනො, තමහට; උත්තරිං, (ගුණාදියෙන්) වැඩියක්හු (හෙවත්) වැඩි පුද්ගලයෙකු; භජෙථ ඉති, සෙවනය කරන්නේයයි(වදාළසේක).

## කුත්ථක විගීශෙයි සෙවනා සූත්‍ර ගාථාර්ථවිවරණයයි.

—⟡—

3 නචෙව භොගා තථාරූපා නචපුඤ්ඤානි කුබ්බති,
උභයත්ථ කලිග්ගාහො අන්ධස්ස හතචක්ඛුනො. ෂ.

3 හතචක්ඛුනො, නැසුනුඇස් ඇත්තාවූ; (හෙවත්) නාසවූ නුවණැස් ඇති; අන්ධස්ස, අන්ධයා හට; තථාරූපා, එබඳුවූ; (නොහොත්) එසේ නුවණැසින් වැඩිකරන්නාවූ; භොගාච, භොගයෝද; න එව, නොවෙත්මය; පුඤ්ඤානිච, පින්ද; නකුබ්බති, (හෙතෙම) නොකෙරෙයි; උභයත්ථ, මෙලෝ පරලෝ දෙක්හි; කලිග්ගාහො, අපරාධගැණීම වේ; (නොහොත්) පරාජයගැන්ම වේ.

4 අථාපරායං අක්ඛාතො එකචක්ඛුච පුග්ගලො,
ධම්මාධම්මෙන සංසට්ඨො භොගානි පරියෙසති. ෂ.

4 අථ, ඉක්බිත්තෙන්; අක්ඛාතො, කියනලද; අපරො, අන්‍යවූ; අයං එකචක්ඛුපුග්ගලොච, මේ එකැස් ඇති පුද්ගලතෙමේද; ධම්මාධම්මෙන, ධම්මා ධම්මයෙන්; (හෙවත්) දශකුශල කර්ම්මපථසංඛ්‍යාත ධර්ම්මයෙන් හා දශ අකුශල කර්ම්මපථසංඛ්‍යාත අධර්ම්මයෙන්; සංසට්ඨො, මිශ්‍රවූයේ; (හෙවත්) හැනුනේ; භොගානි, භොගයන්; පරියෙසති, සොයයි; (කෙසේදයත්)

5 ථෙය්‍යෙන කූටකම්මෙන මුසාවාදෙන චූභයං,
කුසලො හොති සංඝාතුං කාමභොගීච මානවො,
ඉතො සො නිරයං ගන්ත්වා එකචක්ඛු විහඤ්ඤති. ෂ.

5 ථෙය්‍යෙන, සොරකම්න්ද; කූටකම්මෙන, වංචාවෙන්ද; මුසාවාදෙනච, බොරුකීමෙන්ද(යන මොවුන්අතුරෙන්); උභයං, දෙකකින්; (නොහොත්) ථෙය්‍යෙන කූටකම්මෙන මුසාවාදෙනච; සොරකම්න්හා වංචාවෙන්ද, සොරකම්න්හා බොරුකීමෙන්ද,

වචාවෙත්තා බොරුකීමෙන්ද යන; උභයං,* දෙකින්; සංඝාතුං, (භොග) රැස්කරන්ට; කුසලො හොති, දක්ෂ වේ; කාම භොගීමානවොච, කාමභොගීමනුෂ්‍යයෙක්ද වෙයි; සො එකචක්ඛු, ඒ එකැස් ඇති පුද්ගලතෙම; ඉතො, මෙයින්; නිරයං; නාරකයට; ගන්ත්වා, ගොස්; විහඤ්ඤති, පෙළේ.

6 ද්විචක්ඛු පන අක්ඛාතො සෙට්ඨො පුරිස පුග්ගලො,
ධම්මලද්ධෙහි භොගෙහි උට්ඨානාධිගතං ධනං.

7 දදාති සෙට්ඨසංකප්පො අව්‍යග්ගමනො නරො,
උපෙති භද්දකං ඨානං යත්ථගන්ත්වා නසොචති. 3.

6—7 අක්ඛාතො, කියනලද; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨවූ; ද්විචක්ඛු පුරිස පුග්ගලො පන, දෑස්ඇති පුරුෂපුද්ගලතෙමේ වනාහි; ධම්මලද්ධෙහි, දැහැමින්ලබනලද; භොගෙහි, භොගයන් කරණකොටගෙණ; උට්ඨානාධිගතං, වීර්‍ය්‍යයෙන් පැමිණියාවූ; ධනං, ධනය;—දදාති, දෙයි; සෙට්ඨසංකප්පො, ශ්‍රෙෂ්ඨවූ සංකල්පනා ඇති; අව්‍යග්ගමනසො, විචිකිත්සාරහිතවූ සිත්ඇති; නරො, (ඒ) මනුෂ්‍යතෙම; යත්ථ, යම්තැනකදී; ගන්ත්වා, ගොස්; නසොචති, ශොක නොකෙරේද (එබඳුවූ); භද්දකංඨානං, ශ්‍රෙෂ්ඨවූ (දෙව) ස්ථානයට; උපෙති, පැමිණේ.

8 අන්ධඤ්ච එකචක්ඛුඤ්ච ආරකා පරිවජ්ජයෙ,
ද්විචක්ඛුං පන සෙවෙථ සෙට්ඨං පුරිසපුග්ගලන්ති. 3.

8 අන්ධඤ්ච, අන්ධයාද; එකචක්ඛුඤ්ච, එකැස්ඇති තැනැත්තාද; ආරකා, දුරින්; පරිවජ්ජයෙ, දුරුකරන්නේය; ද්විචක්ඛුං, දෑස් ඇත්තාවූ; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨවූ; පුරිසපුග්ගලං පන, පුරුෂපුද්ගලයා වනාහි; සෙවෙථ ඉති, සෙවනයකරන්නේයයි (වදාළසේක).

## තුන්වන වර්ගයෙහි නවවන සූත්‍ර ගාථාර්ථ විවරණයයි.

——o:(o):o——

9 අවකුජ්ජපඤ්ඤො පුරිසො දුම්මෙධො අවිචක්ඛණො,
අභික්ඛණම්පි චෙ හොති ගන්තා භික්ඛූන සන්තිකෙ. 3.

9 දුම්මෙධො, ප්‍රඥාවිරහිතවූ; අවිචක්ඛණො, අපණ්ඩිතවූ; අවකුජ්ජපඤ්ඤො, යටිකුරුවූප්‍රඥා ඇති; පුරිසො, පුරුෂ තෙම; චෙ,

* "උභයං" යනු මෙහි තෘතීයාර්ථයෙහි ද්විතීයා විභක්තියි.

ඉදින්; අභික්ඛණං අපි, නිරතුරුවද; භික්ඛූනං සන්තිකෙ,භික්ෂූන් ගේ සමීපයට; ගන්තා හොති, (ධර්මශ්‍රවණයපිණිස) යන්නේ වේද.

10 ආදිං කථාය මජ්ඣඤ්ච පරියොසානඤ්ච තාදිසො,
උග්ගහෙතුං නසක්කොති පඤ්ඤාභිස්ස නවිජ්ජති. 3.

10 තාදිසො, එබඳුපුරුෂතෙම; කථාය, (ධර්ම) කථාවගේ; ආදිං ච, ආදිය (මුල)ද; මජ්ඣංච, මධ්‍යය (මැද)ද; පරියොසානංච, අවසානය (කෙළවර)ද; උග්ගහෙතුං, ඉගෙණගන්ට; නසක්කොති, නොහැකිවෙයි; අස්ස, ඔහට; පඤ්ඤාභි, (ධාරණ) ප්‍රඥතොමෝචනාභි; නවිජ්ජති, නැත්තීය.

11 උච්ඡඞ්ගපඤ්ඤො පුරිසො සෙය්‍යො එතෙන වුච්චති,
අභික්ඛණම්පි චෙ හොති ගන්තා භික්ඛූන සන්තිකෙ. 3.

11 උච්ඡඞ්ගපඤ්ඤො, ඔඩොක්කුවකටබඳුප්‍රඥඇති; පුරිසො, පුරුෂතෙම; එතෙන, මොහු කෙරෙන්; සෙය්‍යො, ශ්‍රෙෂ්ඨයයි; වුච්චති, කියනුලැබේ; චෙ, ඉදින්; අභික්ඛණං අපි, නිරතුරුවද; භික්ඛූනං සන්තිකෙ, භික්ෂූන්ගේ සමීපයට; ගන්තා හොති, (ධර්ම ශ්‍රවණය පිණිස) යන්නේ වේද.

12 ආදිං කථාය මජ්ඣඤ්ච පරියොසානඤ්ච තාදිසො,
නිසින්නො ආසනෙ තස්මිං උග්ගහෙත්වාන බ්‍යඤ්ජනං,
වුට්ඨිතො නප්පජානාති ගහිතම්පි ස්ස මුස්සති. 3.

12 තාදිසො, එබඳුපුරුෂතෙම; කථාය, (ධර්ම) කථාවගේ; ආදිං ච, ආදියද; මජ්ඣංච, මධ්‍යයද; පරියොසානංච, අවසානයද; තස්මිං ආසනෙ, ඒ ආසනයෙහි; නිසින්නො, හුන්නේ; බ්‍යඤ්ජනං, බ්‍යඤ්ජනවශයෙන්; උග්ගහෙත්වාන, ඉගෙණගෙණ; උට්ඨිතො, නැගිසිටියේ; නප්පජානාති, නොදනී; අස්ස, ඔහුවිසින්; ගහිතං අපි, ඉගෙණගන්නාලද්දද; මුස්සති, නැසේ (මුළාවේ).

13 පුථුපඤ්ඤො ච පුරිසො සෙය්‍යො එතෙහි වුච්චති,
අභික්ඛණම්පි චෙ හොති ගන්තා භික්ඛූන සන්තිකෙ. 3.

13 පුථුපඤ්ඤො, පැතුරුණුවූ ප්‍රඥඇති; පුරිසොච, පුරුෂතෙම වනාහි;එතෙහි, මොවුන් කෙරෙන්;සෙය්‍යො,ශ්‍රෙෂ්ඨයයි; වුච්චති, කියනුලැබේ;චෙ, ඉදින්,අභික්ඛණං අපි, නිරතුරුවද; භික්ඛූනං, භික්ෂූන්ගේ; සන්තිකෙ, සමීපයට; ගන්තා හොති, (ධර්මශ්‍රවණය පිණිස) යන්නේ වේද.

14 ආදිං කථාය මජ්ඣඤ්ච පරියොසානඤ්ච තාදිසො,
නිසින්නොආසනෙතස්මිං උග්ගහෙත්වාන බ්‍යඤ්ජනං.

15 ධාරෙති සෙට්ඨසඞ්කප්පො අව්‍යග්ගමන සො නරො,
ධම්මානුධම්මපටිපන්නො දුක්ඛස්ස න්තකරොසියාති. 3.

14—15 තාදිසො, එබඳුතැනැත්තේ; කථාය, (ධර්ම) කථාවගේ; ආදිංච, ආදියද; මජ්ඣංච, මධ්‍යයද; පරියොසානංච, අවසානයද; තස්මිං ආසනෙ, ඒ ආසනයෙහි; නිසින්නො, හුන්නේ; බ්‍යජනං, බ්‍යජනවශයෙන්; උග්ගහෙත්වාන, ඉගෙණ ගෙණ;—ධාරෙති, දරයි; සෙට්ඨසඞ්කප්පො, ශ්‍රෙෂ්ඨවූ සංකල්පනා ඇති; අව්‍යග්ගමනසො, විචිකිත්සාරහිතවූ සිත්ඇති; නරො, (ඒ) මනුෂ්‍ය තෙම; ධම්මානුධම්මපටිපන්නො, ධර්මානුධර්ම ප්‍රතිපත්තියට පිළිපන්නේ; දුක්ඛස්ස, සංසාර දුඃඛයාගේ; අන්තකරො සියා ඉති, කෙළවරකරන්නේ වන්නේයයි (වදාළසේක).

**තුන්වන වර්ගයෙහි දසවන සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

16 බ්‍රහ්මාතිමාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ,
ආහුනෙය්‍යාච පුත්තානං පජාය අනුකම්පකා,
තස්මාහිනෙනමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො. 3.

16 පජාය, පුත්‍රප්‍රජාවට; (නොහොත්) දරුමුණුබුරු පරම්පරාවට; අනුකම්පකා, අනුකම්පා ඇත්තාවූ; මාතාපිතරො, මව්පියෝ; බ්‍රහ්මාති, බ්‍රාහ්මයෝයයිද; පුබ්බාචරියාති, පූර්වාචාර්‍යයෝයයිද; පුත්තානං, පුත්‍රයන්ට; ආහුනෙය්‍යාච, ආහුනාහර්‍යයෝයයිද; (නොහොත්) පුත්තානං, පුත්‍රයන්ගේ; ආහුනෙය්‍යාච, සත්කාරයට සුදුස්සෝයයිද; වුච්චරෙ, කියනුලැබෙත්; තස්මාහි, එහෙයින්වනාහි; පණ්ඩිතො, පණ්ඩිත පුත්‍රතෙම; නෙ, ඒ මවුපියන්; නමස්සෙය්‍ය, නමස්කාර කරන්නේය; අථ, වැලිදු; සක්කරෙය්‍ය, සත්කාර කරන්නේය; (කුමකින්දයත්).

17 අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච,
උච්ඡාදනෙන න්හාපනෙන* පාදානං ධොවනෙන ච. 3.

17 අන්නෙන, අහරින්ද; "අථ" යනු පදපූරණයෙහි නිපාතයි; පානෙන, පැනින්ද; වත්ථෙන, හඳනා පොරෝනාවතින්ද; සය

* "උච්ඡාදනෙ නහාපනෙ" අඩුපොත්හි.
"උච්ඡාදනෙන නහාපනෙන" ලියාදූපොත්හි.

නෙ නව, ඇඳ පුටු ආදී සෙනසුනෙන්ද; උච්ඡාදනෙන, සුවඳගැල් වීමෙන්ද; න්හාපනෙන, නෑහැවීමෙන්ද; පාදානං ධොවනෙන ච, පාදෙවීමෙන්ද; (යන මෙයින් සත්කාර කරන්නේය).

18 තාය නං පරිචරියාය මාතාපිතුසු පණ්ඩිතා,
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදතී'ති. ඉ.

18 මාතාපිතුසු, මව්පියන්කෙරෙහි (කරනලද); තායපරිචරියාය, ඒ සත්කාරක්‍රියාව කාරණකොටගෙණ; පණ්ඩිතා, පණ්ඩිතයෝ (නුවණැති මනුෂ්‍යයෝ); ඉධ එව, මේ ලොකයෙහිම; නං, ඔහුට (ඒ සත්කාරකරන පුරුෂයාට); පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; පෙච්ච, පරලොව; සග්ගෙ ච, ස්වර්ගයෙහිද; මොදති ඉති, සතුටුවේයයි (වදාළසේක).

**සතරවන වග්ගයෙහි ප්‍රථම සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

19 සඞ්ඛාය ලොකස්මිං පරොවරානි
යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ,
සන්තො විධූමො අනීඝො නිරාසො
අතාරි සො ජාතිජරන්ති බ්‍රෑමී'ති. ඉ.

19 ලොකස්මිං, ලොකයෙහි; පරොවරානි, පරාත්මභාව ස්වාත්මභාවාදීන්; (හෙවත්) බාහිරවූද අධ්‍යාත්මිකවූද ආත්මභාවාදීන්; සඞ්ඛාය, නුවණින් දැන; යස්ස, යමෙක්හට; ලොකෙ, ලොකයෙහි; කුහිඤ්චි, කිසිතැනෙක්හි; ඉඤ්ජිතං, රාග ද්වෙෂ මොහාදි චලනයෙක්; නත්ථි, නැත්තේද; සන්තො, කෙලෙස් සන්සිඳුනාවූ; විධූමො, කායදුශ්චරිතාදි දුම්රහිතවූ; අනීඝො, රාගාදි කෙලෙස් දුක්නැත්තාවූ; නිරාසො, ආසාරහිතවූ; සො, ඒ (ක්ෂයකරනලද ආශ්‍රවයන් ඇති) අර්හත් පුද්ගලතෙම; ජාතිජරං, ජාතියහා ජරාව; (හෙවත්) ජාතිජරාව්‍යාධිමරණ දුඃඛය;) අතාරි ඉති, එතරකෙළේයයි; බ්‍රෑමි, කියමි.

**සතරවන වග්ගයෙහි ද්විතීය සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

20 පහානං කාමසඤ්ඤානං දොමනස්සාන චූභයං,
ථිනස්ස ච පනූදනං කුක්කුච්චානං නිවාරණං.
21 උපෙක්ඛාසති සංසුද්ධං ධම්මතක්කපුරෙජවං,
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රෑමි අවිජ්ජාය පභෙදනං'ති. ඉ.

20—21 කාමච්ඡන්දං, කාමය අරමුණුකොට උපන්(හෙවත්, අටවැදෑරුම්වූ ලොභසහගත චිත්තයහා එක්ව උපන්) සංඥාවන්ගේද; දොමනස්සානච, චෛතසික (හෙවත්, විප්ඛවූ ප්‍රතිඝ සම්ප්‍රයුක්තචිත්තයහා එක්ව උපන්) දෞර්මනස්‍යයන්ගේද යන; උභයං, දෙදෙනාගේ; පහානං, නැතිකිරීමද; පීනස්ස, පීනම්ද්ධ නීවරණයාගේ; (හෙවත්) ථිනකාය දෙදෙනාගේ මැලිබවගේ; පණුදනංච,දුරලීමද; කුක්කුච්චානං, හිතගව්ගත්නා කුකුස්සවන නාවන්ගේ; නිවාරණං, වැළැක්වීමද; උපෙක්ඛාසති සංසුද්ධං, උපෙක්ෂාසම්‍යතිදෙදෙනාගේ පිරිසිදුබවද; අඤ්ඤාය, අදිද්ධ්‍යවගේ; පභෙදනං, බිඳීමද (කරන්නාවූ); ධම්මතක්ක, සම්‍යක්සංකල්ප නාව; පුරෙජවං, ඉදිරියෙහි ගමන්කිරීම ඇති (අර්හත් ඵලය); අඤ්ඤාවිමොක්ඛං, අඥෙන්ද්‍රිය පයඞ්වසානයෙහි උපන් විමොක්ෂයයි; (හෙවත්,) ප්‍රඥාවිමුක්තියයි; පබ්‍රෑමි, කියමි.

## සහරවන වර්ගයෙහි තෘතීය සූත්‍ර ගාථාර්ථ විවරණයයි.

—०ः(ॐ)ः०—

22 ලොභජං දොසජංචෙව මොහජංචාප විද්දසු,
යං තෙන පකතං කම්මං අප්පංවා යදිවා බහුං,
ඉධෙව තං වෙදනීයං වත්ථුං අඤ්ඤං නවිජ්ජති. 3.

22 අවිද්දසු, අඥානපුද්ගලතෙම; ලොභජං, ලොභයෙන් උපන්නාවූද; දොසජංච, ද්වේෂයෙන් උපන්නාවූද; අපි. වැලිදු; මොහජංච, මොහයෙන් උපන්නාවූද (කර්මකෙරේ); තෙන, ඔහුවිසින්; පකතං, කරනලද; අප්පංවා, ස්වල්පවූහෝ; යදි, ඉදින්; බහුංවා, බොහෝවූහෝ; යං කම්මං, යම් කර්මයක් වේද; තං, ඒ (කර්මය); ඉධ එව, ස්වකීය ආත්මභාවයෙහිම; වෙදනීයං, විඳියයුතුවේ; අඤ්ඤං වත්ථුං, (ඒකර්මය විපාකදීමපිණිස) අනික් වස්තුවෙක්; (හෙවත්) අන්‍ය ආත්මභාවයෙක්; නවිජ්ජති, නැත්තේය.

23 තස්මා ලොභච දොසච මොහජචාපි විද්දසු,
විජ්ජං උප්පාදයං භික්ඛු සබ්බාදුග්ගතියො ජහෙ'ති. 3.

23 තස්මා, එහෙයින්; විද්දසු, ප්‍රඥාවන්තපුරුෂතෙම; ලොභංච, ලොභයෙන් උපන්නාවූද; දොසංච, ද්වේෂයෙන් උපන්නාවූද; අපි, වැලිදු; මොහජංච, මොහයෙන් උපන්නාවූද (කර්මයකෙරේ); භික්ඛු, (යොගාවචර) ඒ භික්ෂුතෙම; විජ්ජං, අර්හත්මාර්ග

විද්‍යුව; උප්පාදයං, උපදවන්නේ; සබ්බාදුක්ඛගතියො, සියළු දුර්ගතීන්; ජහෙ ඉති, හරින්නේයි.

### සතරවන වග්ගයෙහි චතුත්ථ සූත්‍ර ගාථාර්ථ විවරණයයි.

—०ঃ◯ঃ०—

24 සබ්බදා වෙ සුඛං සෙති බ්‍රාහ්මණො පරිනිබ්බුතො,
යො න ලිම්පති* කාමෙසු සීතිභූතො නිරූපධි.

25 සබ්බා ආසත්තියො ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං,
උපසන්තො සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසො'ති-3.

24—25 පරිනිබ්බුතො, ක්ලේශ පරිනිර්වාණයකළාවූ; (හෙවත්) ක්ලේශයන්ගෙන් නිවුනාවූ; බ්‍රාහ්මණො, ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙම; සබ්බදා, හැමකල්හි; වෙ, ඒකාන්තයෙන්; සුඛං සෙති, සුවසේ සයනයකෙරෙයි; යො, යමෙක් තෙම; කාමෙසු, වස්තුකාම ක්ලේශකාමදෙක්හි; න ලිම්පති, (තෘෂ්ණාදෘෂ්ටිලෙපයෙන්) නොගැල්වේද; සීතිභූතො, (චිත්තාභ්‍යන්තරය තවනලද ක්ලේශයන්ගේ අභාවයෙන්) සිහිල්වූයේද; නිරූපධි, ක්ලේශොපධි රහිතවූයේද (හෙතෙම); සබ්බා ආසත්තියො, සියළුතෘෂ්ණාවන්; ඡෙත්වා, සිඳ; හදයෙ දරං, හෘදය දරථය; විනෙය්‍ය, පහකොට; උපසන්තො, සන්සිඳුනේ; චෙතසො, චිත්තයාගේ; සන්තිං පප්පුය්‍ය, ශාන්තියට පැමිණ; සුඛං සෙති, සුවසේ සයනයකෙරෙයි.

### සතරවන වග්ගයෙහි පචම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.

—०ঃ◯ঃ०—

26 චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසොමිතො,
අයොපාකාර පරියන්තො අයසා පටිකුජ්ජිතො.

27 තස්ස අයො මයා භූමි ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා. 8.

26—27 චතුක්කණ්ණො සිව්කොණක් ඇත්තේය; චතුද්වාරො, සිව්දොරක් ඇත්තේය; විභත්තො, (එසේම) බෙදනලද්දේය; භාගසො, කොටස්වශයෙන්; මිතො, ප්‍රමාණකරන ලද්දේය; අයොපාකාර, අයොමය ප්‍රාකාරයකින්; පරියන්තො, වටකරනලද්දේය; අයසා, යකඩලකින්; පටිකුජ්ජිතො, වසනලද්දේය;—තස්ස,

* න ලිප්පති යිද පාඨයි.

ඒනිරයසම්බන්ධිවූ; අයොමයා, යකඩමයවූ; භූමි, පෘථිවියනාමෝ; ජලිතා, දිලිසෙන්නීය; තෙජසායුතා, ගින්නෙන්යුතුවීය; සබ්බදා, සියළුකල්හි; සමන්තා, හාත්පසින්; යොජනසතං, යොදුන්සියයක්; ඵරිත්වා, පැතිරගෙණ; තිට්ඨති, සිටී.

28 චොදිතා දෙවදූතෙහි යෙපමජ්ජන්ති මාණවා,
තෙදීඝරත්තං සොචන්ති හීනකායූපගානරා. 3.

28 යෙමාණවා, යම්කිසිමනුෂ්‍යකෙනෙක්; දෙවදූතෙහි, දෙවදූතයන්විසින්; චොදිතා, චොදනාකරණලද්දාහු; පමජ්ජන්ති, ප්‍රමාදයට පැමිණෙද්ද; හීනකායූපගා, ලාමකවූ සිරුරු බවට පැමිණියාවූ; තෙ නරා, ඒ මනුෂ්‍යයෝ; දීඝරත්තං, දීර්ඝකාලයක් මුළුල්ලෙහි; සොචන්ති, සොකකෙරෙත්.

29 යෙච ඛො දෙවදූතෙහි සන්තො සප්පුරිසා ඉධ,
චොදිතා නප්පමජ්ජන්ති අරියධම්මෙ කුදාචනං. 3.

29 ඉධ, මේලොකයෙහි; දෙවදූතෙහි, දෙවදූතයන් විසින්; චොදිතා, චොදනාකරණලද්දාවූ; සන්තො, වාරත්‍රය සන්සිඳුනාවූ; යෙචසප්පුරිසාඛො, යම්බඳුසත්පුරුෂකෙනෙක්වනාහි; කුදාචනං, කිසිකලෙකත්; අරියධම්මෙ, ආර්‍ය්‍යධර්මයෙහි; නප්පමජ්ජන්ති, ප්‍රමාදනොවෙද්ද (ඔවුහු).

30 උපාදානෙ භයං දිස්වා ජාතිමරණ සම්භවෙ,
අනුපාදාවිමුච්චන්ති ජාතිමරණ සඞ්ඛයෙ. 3.

30 ජාතිමරණසම්භවෙ, ජාතියටද මරණයටද කාරණවූ; උපාදානෙ, තෘෂ්ණාදෘෂ්ටින්ග්‍රහණයකිරීමෙහි; භයං දිස්වා, බිය දැක; ජාතිමරණසඞ්ඛයෙ, ජාතිමරණ දෙකක්ෂයකොට සිටියාවූ නිර්වාණයෙහි; අනුපාදා, කාමූපාදානාදිවශයෙන් ග්‍රහණයනොකොට; විමුච්චන්ති, මිදෙත්.

31 තෙඛොප්පමත්තා සුඛිතා දිට්ඨධම්මාභිනිබ්බුතා,
සබ්බවෙරභයාතීතා සබ්බදුක්ඛං උපච්චගුන්ති. 3.

31 අප්පමත්තා, අප්‍රමාදවිහරණයෙන් යුක්තවූ; සුඛිතා, සුවපත්වූ; දිට්ඨධම්මාභිනිබ්බුතා, මෙම අත්බැව්හි සකලක්ලෙශයන්න් මුවාවූ; සබ්බවෙරභයාතීතා, සියළු වෛරීභය ඉක්මවූවාවූ; තෙ ඛො, ඒසත්පුරුෂයෝවනාහි; සබ්බදුක්ඛං, සියළුසංසාරදුක; උපච්චගුං ඉති, ඉක්මෙවූවාහුයයි (වදාළසේක).

සතරවන වග්ගෙහි සයවන සූත්‍ර
ගාථාර්ථ විවරණයයි.

32 චාතුද්දසිං පඤ්චදසිං යාවපක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරිය පක්ඛඤ්ච අට්ඨඞ්ග සුසමාගතං,
උපොසථං උපවසෙය්‍ය යොපස්ස මාදි
සො නරොති.

32 යොපිනරො, යම්මනුෂ්‍යයෙක්තෙම; මාදිසොඅස්ස, මාමෙන්(ශක්‍රදෙවෙන්ද්‍රයෙකු)වනුකැමැත්තෙහිනම්(හෙතෙමේද); පක්ඛස්ස, පක්ෂයසම්බන්ධිවූ; යාව, යම්තාක්ඇති; චාතුද්දසිං, තුදුස්වක්පොහෝදිනයෙහිද; පඤ්චදසිං, පසලොස්වක්පොහෝදිනයෙහිද; අට්ඨමිං, අටවක්පොහෝදිනයෙහිද; පාටිහාරියපක්ඛඤ්ච, ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහිද; අට්ඨඞ්ග සුසමාගතං, ගුණාඞ්ග අටින්සමන්විතවූ; උපොසථං උපවසෙය්‍ය ඉති, පෙහෙවස්වසන්නේයි.

33 චාතුද්දසිං පඤ්චදසිං යාවපක්ඛස්සඅට්ඨමිං,
පාටිහාරිය පක්ඛඤ්ච අට්ඨඞ්ග සුසමාගතං,
උපොසථං උපවසෙය්‍ය යොපස්ස මාදි
සො නරො'ති. 3.

33 යොපිනරො, යම්මනුෂ්‍යයෙක්තෙම; මාදිසොඅස්ස, මාමෙන් (ක්ෂීණාශ්‍රවයෙකු) වනුකැමැත්තෙහිනම් (හෙතෙමේද); පක්ඛස්ස, පක්ෂයසම්බන්ධිවූ—පෙ—උපොසථං උපවසෙය්‍ය ඉති, පෙහෙවස්වසන්නේයි.

**සතරවන් වර්ගයෙහි සත්වන සූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

---

34 ව්‍යාධිධම්මා ජරාධම්මා අථොමරණධම්මිනො,
යථා ධම්මා තථා සත්තා* ජිගුච්ඡන්ති පුථුජ්ජනා.

34 සත්තා, සත්වයෝ; ව්‍යාධිධම්මා, ව්‍යාධියස්වභාවකොටඇත්තාහ; ජරාධම්මා, ජරාස්වභාවකොටඇත්තාහ; අථො, නැවත; මරණධම්මිනො, මරණයස්වභාවකොටඇත්තාහ; යථාධම්මා, (ව්‍යාධිආදීන්) යම්ස්වභාවයක්ඇත්තාහුද; තථා, එබඳුස්වභාව ඇත්තාවූ; පුථුජ්ජනා, පෘථග්ජනයෝ; ජිගුච්ඡන්ති, (පරණට)පිළිකුල්කෙරෙත්.

35 අහං චෙතං ජිගුච්ඡෙය්‍යං එවං ධම්මෙසු පාණිසු,
නමෙතං පතිරූපස්ස මම එවං විහාරිනො. 3.

35 එවං ධම්මෙසු, මේ ස්වභාවඇත්තාවූ; පාණිසු, ප්‍රාණීන්අතුරෙන් (කෙනෙක්වූ); අහං, මම්ද; එතං, මේජනයා; ජිගුච්ඡෙය්‍යං, පිළිකුල්කෙළෙම්නම්; එවං විහාරිනො, මෙසේපිළිකුල්විහරණයෙන්වසන්නාවූ; මම, මාගේ; තං, එපිළිකුල්කිරීම; මෙ, මට; නපතිරූපංඅස්ස, සුදුසුනොවන්නේය.

* "තථාසන්තා" යීද කිසිත්.

36 සොහංඑවං විහරන්තො ඤත්වාධම්මං නිරූපධිං,
ආරොග්‍යෙ යොබ්බනස්මිඤ්ච ජීවිතස්මිඤ්චයෙමදා. 3.

37 සබ්බෙමදෙඅභිභොස්මි නෙක්ඛම්මං දට්ඨුඛෙමතො,
තස්සමෙඅහු උස්සාහො නිබ්බාණං අභිපස්සතො.3.

36—37 සොඅහං, ඒමම; එවංවිහරන්තො, මෙසේවාසයකරන්නේ; නිරූපධිං, සියලුඋපධීන්ගෙන්තොරවූ; ධම්මං, නිර්වාණධර්මය; ඤත්වා, දැන; ආරොග්‍යෙ, නිරෝගිබැව්හිද; යොබ්බනස්මිඤ්ච, යෞවනබැව්හිද; ජීවිතස්මිඤ්ච, ජීවිතයෙහිද; යෙමදා, යම්මදකෙනෙක්වෙද්ද;—සබ්බෙමදෙ, (ඒ) සියළුමදයන්; නෙක්ඛම්මං, නෛෂ්ක්‍රම්‍යසංඛ්‍යාතනිර්වාණය; ඛෙමතොදට්ඨුං, නිර්භයවශයෙන්දැක; අභිභොස්මි, අභිභවනයකෙළෙමි; නිබ්බාණං, නිර්වාණය; අභිපස්සතො, මනාවදක්නාවූ; තස්සමෙ, ඒමට; උස්සාහොඅහු, වීර්‍ය්‍යයවූයේය.

38 නාහං භබ්බො එතරහි කාමානි පටිසෙවිතුං,
අනිවත්තිභවිස්සාමි බ්‍රහ්මචරියපරායනො'ති. 3.

38 අහං, මම; එතරහි, දැන්; කාමානි, (විප්‍රකාරවූම) කාමයන්; පටිසෙවිතුං, සෙවනයකරන්ට; නභබ්බො, භව්‍යනොවෙමි; බ්‍රහ්මචරියපරායනො, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවිප්‍රතිෂ්ඨාකොටඇත්තේ; අනිවත්තිභවිස්සාමිඉති, (ප්‍රව්‍රජ්‍යාවෙන්හාසවිගෘහාශ්‍රමයෙහි) නොනවත්නෙක්වන්නෙමි; (නොහොත්මතුමෙතැන්)නූපදින්නෙක්වන්නෙමියි (වදාළසේක).

**සතරවන වර්ගයෙහි නවවන සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

---

39 නත්ථිලොකෙ රහොනාම පාපකම්මං පකුබ්බතො,
අත්තා තෙ පුරිස ජානාති සච්චං වා යදිවාමුසා. 3.

39 ලොකෙ,(සත්ව)ලෝකයෙහි; පාපකම්මං, පව්කම්; පකුබ්බතො, කරන්නාහට; රහොනාම, රහසෙක්නම්; නත්ථි, නැත්තේය; පුරිස, (එම්බා)පුරුෂය; තෙ, තාගේ; අත්තා, ආත්මයතෙම; (හෙවත්)සිත; යදි. ඉදින්; සච්චංවා, සත්‍යයහෝ;මුසාවා, බොරුවහෝ; ජානාති, දනී.

40 කල්‍යාණං වත භො සක්ඛි අත්තානං අතිමඤ්ඤසි,
යොසන්තං අත්තනිපාපං අත්තානං පරිගූහසි. 3.

40 භො, පින්වතැ; වත, ඒකාන්තයෙන්; කල්‍යාණං, යහපත්කර්මය; සක්ඛි, ශක්‍යවී; අත්තානං, තමා; අතිමඤ්ඤසි, ඉක්මහගනෙහිද; යො, යමෙක්තෙම; අත්තනි, තමාකෙරෙහි; සන්තංපාපං, විද්‍යමානවූපාපය; අත්තානං, තමා; පරිගූහසි, සඟවන්නෙහිද (එහෙයින්).

41 පස්සන්තිදෙවාචතථාගතාච ලොකස්මිං බාලංවිසමංචරන්තං,
තස්මාහි අත්තාධිපකො සතොචරෙ ලොකාධිපොච නිප කොචඣායී
ධම්මාධිපොචඅනුධම්මචාරී නහීයතිසච්චපරක්කමොමුනි.

41 ලොකස්මිං, (සත්ව) ලොකයෙහි; විසමංචරන්තං, විෂමව හැසිරෙන්නාවූ; (හෙවත්) විෂමවූකායවාක්සමාචාරයෙන්යුක්ත වූ; බාලං, අඥනයා; දෙවාච, දෙවියෝද; තථාගතාච, (පරසිත් දන්නා)සත්වයෝද; පස්සන්ති, දකිත්; තස්මාහි, එහෙයින්වනාහි; මුනි, තවුස්තෙම; අත්තාධිපකො, තමාඅධිපතිකොටඇත්තේ(ද); ලොකාධිපොච, ලොකයාඅධිපතිකොටඇත්තේද; නිපකොච, ප්‍රඥාවෙන්යුක්තවූයෙද; ඣායී, ධ්‍යානකරණසුළුවූයේ(ද); ධම්මාධි පොච,ධර්මයඅධිපතිකොටඇත්තේද;අනුධම්මචාරි,ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි හැසිරෙණසුළුවූයේ(ද); සච්චපරක්කමො, සථිරවූ වීර්‍ය්‍යඇත්තේද, සතො,සිහියෙන්යුක්තව; චරෙ,හැසිරෙන්නේය.

42 පසය්හමාරංඅභිභුය්‍ය අන්තකංයොචඵුසීජාතික්ඛයං පධානවා,
සතාදිසොලොකවිදූ සුමෙධොසබ්බෙසුධම්මෙසු අතම්ම යොමුනී'ති. 3.

42 පධානවා, වීර්‍ය්‍යවත්තාවූ; යොච, යම්තවුසෙක්තෙමේ; මාරං, මාරයා; පසය්හ, ජයගෙණ; අන්තකං, වසවර්තියා; අභිභුය්‍ය, මැඩපවත්වා; ජාතික්ඛයං, අර්හත්ඵලය; ඵුසී, ස්පර්ශකෙළේද; තාදි සො, එබඳුවූ; ලොකවිදූ, තුන්ලෝදත්තාවූ; සුමෙධො, මනාප්‍රඥ ඇත්තාවූ; සබ්බෙසුධම්මෙසු, සියළුත්‍රෛභූමකධර්මයන්හි; අත ම්මයො, තෘෂ්ණාවිරහිතවූ; සොමුනි, ඒ (ක්ෂීණාශ්‍රව) තවුස්තෙම, නාහියතිඉති, නොපිරිහෙන්නේයයි (වදාළසේක).

**සතරවනවර්ගයෙහි දසවන සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

# සතරවන වර්ගය සමාප්තයි.

43 දස්සනකාමොසීලවතං සද්ධම්මංසොතුමිච්ඡති,
විනෙය්‍යමච්ඡෙරමලං සවෙසද්ධොතිවුච්චතීති. 3.

43 (යො, යමෙක්තෙම;) සීලවතං, සිල්වතුන්; දස්සනකාමො, දකිනුකැමත්තේද; සද්ධම්මං, සදහම්; සොතුං, අසන්ට; ඉච්ඡති, කැමතිවේද; මච්ඡෙරමලං, මාත්සර්‍ය්‍යමලය; විනෙය්‍ය, පහ

කොට (සිටියේවේද); සො, ගෙතෙම; එව, ඒකාන්තයෙන්; සබ්බොඉති, ශුබාවනන්නයායයි; වුච්චතිඉති, කියනුලැබේයයි (වදාළසේක).

**පස්වන වර්ගයෙහි දෙවන සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

---

44 සබ්බිදානං උපඤ්ඤාතං අහිංසාසඤ්ඤමොදමො,
මාතාපිතුඋපට්ඨානං සන්තානං බ්‍රහ්මචාරිනං. 3.

44 දානං, දන්දීමද; අහිංසා, කරුණාවහාකරුණාපූර්වභාගචෙතනාවද; සංයමො, සීලසංයමයද; දමො, ඉන්ද්‍රියදමනයද; සන්තානං, සන්සුන්වූ; බ්‍රහ්මචාරිනං, ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාවෙන්යුක්තවූවන්ගේ; මාතාපිතුඋපට්ඨානං, මවුපියන්ටඋපස්ථානකිරීමද; සබ්හි, සත්පුරුෂයන්විසින්; උපඤ්ඤාතං, පසස්නාලද්දේය.

45 සතංඑතානිඨානානි යානිසෙවෙථපණ්ඩිතො,
අරියොදස්සනසම්පන්නො සලොකංභජතෙසිවංති. 3.

45 සතං, සත්පුරුෂයන්ගේ; යානිඑතානිඨානානි, යම්මේකාරණයන්, පණ්ඩිතො, පණ්ඩිතපුරුෂතෙම; සෙවෙථ, සෙවනයකරන්නේද; අරියො, ආර්‍ය්‍යවූ; දස්සනසම්පන්නො, උත්තමදර්ශනයෙන්යුක්තවූ; සො, ගෙතෙම; සිවංලොකං, නිරුපද්‍රවවූදිව්‍යලොකය; භජතෙඉති, සෙවනයකෙරේයයි(වදාළසේක).

**පස්වන වර්ගයෙහි පස්වන සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

---

46 යථාපිපබ්බතොසෙලො අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
තං රුක්ඛාඋපනිස්සාය වඩ්ඪන්තෙ තෙවනස්පතී. 3.

46 යථාපි, යම්සේ; අරඤ්ඤස්මිං, අග්‍රාමකස්ථානයෙහිවූ; බ්‍රහාවනෙ, මහවෙනෙහි (පිහිටි); සෙලොපබ්බතො, ශෛලමයපර්වතයක්වේද; තං, ඒපර්වතය; උපනිස්සාය, ඇසුරුකොට; තෙවනස්පතිරුක්ඛා, ඒවනදෙවුවෘක්ෂයෝ; වඩ්ඪන්තෙ, වැඩෙද්ද.

47 තථෙව සීලසම්පන්නං සද්ධං කුලපතිංඉධ,
උපනිස්සාය වඩ්ඪන්ති පුත්තදාරාච බන්ධවා. 3.

47 තථාඑව, එපරිද්දෙන්ම; ඉධ, මේලොකයෙහි; සීලසම්පන්නං, සීලයෙන්සමන්විතවූ; සද්ධං, සැදැහැවත්; කුලපතිං, කුලගිමියා; උපනිස්සාය, ඇසුරුකොට; පුත්තදාරාච, අඹුදරුවෝද; බන්ධවා, බන්ධුජනයෝද;—අනතුරුගාථාවහාසම්බන්ධයි.

48 අමච්චාඤාතිසඞ්ඝාච යෙචස්සඅනුජීවිනො,
තස්සසීලවතො සීලං චාගංසුචරිතානිච,
පසංසමානානුකුබ්බන්ති යෙභවන්තිවිචක්ඛණා. 3.

48 අමච්චා, අමාත්‍යයෝ(ද); ඤාතිසඞ්ඝාච, නෑසමූහයාද; අස්ස, ඔහුගේ; යෙඅනුජීවිනො, යම්සේවකකෙනෙක්වෙද්ද; තෙච, ඔව්හුද; වඩ්ඪන්ති, වැඩෙත්; සීලවතො, සිල්වත්වූ; අස්ස, ඔහුගේ, සීලං, සීලය(ද); චාගං, ත්‍යාගය(ද); සුචරිතානිච, සුචරිතයන්ද; පසංසමානා, බලත්නාහු; අනුකුබ්බන්ති, අනුවකෙරෙත්; යෙ, යමෙක්;විචක්ඛණාභවන්ති, නුවණැත්තාහුවෙද්ද (ඔවුහු).

49 ඉධධම්මංචරිත්වාන මග්ගංසුගතිගාමිනං,
නන්දිනොදෙවලොකස්මිංමොදන්තිකාමකාමිනො'ති. 3.

49 ඉධ, මේලොකයෙහි; සුගතිගාමිනංමග්ගං, සුගතියටයන්නාවූමාර්ගයයිකියනලද; ධම්මං, ධර්මයෙහි; චරිත්වාන, හැසිර; දෙවලොකස්මිං, දිව්‍යලොකයෙහි; නන්දිනො, සතුටුවන්නාහු; කාමකාමිනො, කාමයන්කැමතිවෙමින්; මොදන්තිඉති, සතුටුවෙත්යයි(වදාළසේක).

පස්වන වර්ගයෙහි නවවන සූත්‍ර
ගාථාර්ථ විවරණයයි

# ප්‍රථම පණ්ණාසකය නිමි.

50 උපනීයතිජීවිතමප්පමායුං * ජරූපනීතස්සනසන්තිතාණා
එතංභයංමරණෙ පෙක්ඛමානො පුඤ්ඤානිකයිරාථසුඛාවහානි. 3.

50 ජීවිතං, ජීවිතෙන්ද්‍රියය; උපනීයති, (ජරාව විසින් මරණය සමීපයට) පමුණුවනු ලැබේ; ආයුං, (සත්වයාගේ)ආයුෂය; අප්පං, ස්වල්පය; ජරූපනීතස්ස, ජරාවවිසින් (මරණයසමීපයට) පමුණුවනලද්දහුට; තාණා, රක්ෂාස්ථානයෝ; නසන්ති, නැත්තාහ; මරණෙ, මරණයෙහිලා; එතංභයං, මේත්‍රිවිධභය; පෙක්ඛමානො, බලනනැනැත්තේ; සුඛාවහානි, සැපඑලවත්නාවූ; පුඤ්ඤානි, කුසලයන්; කයිරාථ, කරන්නේය.

51 යොධකායෙන සඤ්ඤමො වාචායඋදචෙතසා,
තංතස්සපෙතස්සසුඛායහොතියංජීවමානොපකරොති පුඤ්ඤානි. 3.

* 'ජීවිතමප්පමායු' කිසිතැනක.

51 ඉධ, මේලොකයෙහි; කායෙන, කායමාරයෙහිද; වාචාය, වාක්මාරයෙහිද; උද, යලිත්; චෙතසා, මනොමාරයෙහිද(වූ); යොසංයමො, යම්සංවරයක්වේද; ජීවමානො, ජීවත්වනුලබන්නේ; යංපුඤ්ඤං, යම්පිණක්; පකරොති, කෙරේද; තං, ඒපිණ; පෙතස්ස, පරලොවගියාවූ; තස්ස,ඔහට; සුඛාය, සැපපිණිස; හොතිඉති, වේයයි(විදාළ)ස්කා)

පුථම වගීයෙහි පුථම සූත්‍ර
ගාථාණී විවරණයයි·

---

52 ආදිත්තස්මිංඅගාරස්මිං යංනීහරතිභාජනං,
තංතස්සහොතිඅත්ථාය නොචයංතත්ඩය්හති. 3.

52 අගාරස්මිං, ගෘහය; ආදිත්තස්මිං, ගින්ගත්කල්හි; යංභාජනං, යම්කිසිභාණ්ඩයක්; නීහරති, බැහැරකෙරේද; තං, ඒභාණ්ඩය; තස්ස. ඒගෘහස්වාමියාට; අත්ථාය, වැඩපිණිස; හොති, වේ; යං, යම්භාණ්ඩයක්; නොච, බැහැරනොකෙරේද (එය); තත්‍ර, එහි, ඩය්හති, දනුලැබේ.

53 එවමාදිපිතො ලොකො ජරායමරණෙනච,
නීහරෙථෙව දානෙන දින්නං හොතිසුනි † හතං. 3.

53 එවං, එසේ; ලොකො, ලෝවැසිජනතෙම; ජරාය, ජරාවෙන්(ද); මරණෙනච, මරණයෙන්ද; ආදිපිතො, දැල්වනලද්දේය; දානෙන, (නම්සතුදෙය) දීමෙන්; නීහරෙථඑව, (ඈත චෙතනාව) බැහැරකරන්නේමැ; දින්නං, දෙනලද්ද; සුනීහතංහොති, මනාවබැහැරකරණලද්දේවේ;

54 යොධකායෙන සඤ්ඤමෙවාචායඋදචෙතසා,
තංතස්සපෙතස්සසුඛායහොති යං ජීවමානො පකරොති පුඤ්ඤානි. 3.

54 ඉධ, මේලොකයෙහි, කායෙන, කායමාරයෙහිද; වාචාය, වාක්මාරයෙහිද; උද, යලිත්; චෙතසා, මනොමාරයෙහිද(වූ); යොසංයමො, යමසංවරයක්වේද; ජීවමානො, ජීවත්වනුලබන්නේ; යංපුඤ්ඤං, යම්පිණක්; පකරොති, කෙරේද; තං, ඒපිණ, පෙතස්ස, පරලොවගියාවූ; තස්ස, ඔහට; සුඛාය, සැපපිණිස; හොතිඉති, වේයයි (විදාළ)ස්කා).

පුථම වගීයෙහි විතීය සූත්‍ර
ගාථාණී විවරණයයි.

---

† සුනිහතං, ඊද පාඨයි.

55 ඉතීකණ්හාසුසෙතාසු රොහිණීසුහරීසුවා,
කම්මාසාසු සරූපාසු ගොසුපාරෙවතාසුව 3.

56 යාසුකාසුච එතාසුදන්තොජායතිපුඞ්ගවො,
ධොරය්හොබලසම්පන්නො කල්‍යාණජවනික්කමො. 3.

55—56 කණ්හාසු, කෘෂ්ණවර්ණවූහෝ; සෙතාසු, ශ්වෙත
වර්ණවූහෝ; රොහිණීසු, රක්තවර්ණවූහෝ; හරීසුවා, පලා
ශවර්ණවූහෝ; කම්මාසාසු, ශබලවර්ණවූහෝ; සරූපාසු, (තම
න්වත්සන්හා) සමානවර්ණවූහෝ; පාරෙවතාසුවා, කපොතවර්ණ
වූහෝ; ඉති, මෙසේකියනලද්දාවූ; එතාසුගොසු, මේදෙනුන්
අතුරෙන්; යාසුකාසුච, යම්කිසිදෙනෙකුන්කෙරෙහි;—ධොරය්
හො, බරඋසුලනසුළුවූ; බලසම්පන්නො, ශක්තිසම්පන්නවූ; කල්‍යා
ණජවනික්කමො, ඍජුවූවේගයෙන්ගමන්කරන්නාවූ; දන්තො,
හික්මුනාවූ; පුඞ්ගවො, වෘෂභයෙක්තෙම; ජායති, උපදී;

57 තමෙවභාරෙයුඤ්ජන්ති නාස්සවණ්ණං පරික්ඛරෙ,
එවමෙවමනුස්සෙසු යස්මිංකස්මිඤ්චිජාතියෙ. 3.

57 තමෙව, ඔහුම; භාරෙ, බරෙහි; යුඤ්ජන්ති, යොදත්; අස්ස,
ඔහුගේ; වණ්ණං, ශරීරවර්ණය; නපරික්ඛරෙ, පරීක්ෂානොකෙ
රෙත්; එවංඑව, එපරිද්දෙන්ම; මනුස්සෙසු, මනුෂ්‍යයන්අතුරෙ
න්; යස්මිංකස්මිඤ්චිජාතියෙ, යම්කිසිකුලසමූහයෙක්හි;

58 ඛත්තියෙබ්‍රාහ්මණෙවෙස්සෙ සුද්දෙචණ්ඩාලපුක්කුසෙ,
යාසුකාසුචඑතාසු දන්තොජායතිසුබ්බතො. 3.

59 ධම්මට්ඨොසීලසම්පන්නො සච්චවාදී හිරීමතො,
පහීණජාතිමරණො බ්‍රහ්මචරියස්සකෙවලී. 3.

60 පන්නභාරොවිසංයුත්තො කතකිච්චොඅනාසවො,
පාරගූසබ්බධම්මානං අනුපාදායනිබ්බුතො. 3.

5ඉ—59—60 ඛත්තියෙ, ක්ෂත්‍රියකුලයෙහිහෝ; බ්‍රාහ්මණෙ, බමු
ණුකුලයෙහිහෝ; වෙස්සෙ, වෛශ්‍යකුලයෙහිහෝ; සුද්දෙ,
ක්ෂුද්‍රකුලයෙහිහෝ; චණ්ඩාලෙ, සැඬොල්කුලයෙහිහෝ; පුක්කු
සෙ, බඹුරුකුලයෙහිහෝ; එතාසු, මේක්ෂත්‍රියාදිප්‍රභෙදවූ; යාසු
කාසුච, යම්කිසිජාතියෙක්හි;—ධම්මට්ඨො, ධර්මයෙහිපිහිටියාවූ;
සීලසම්පන්නො, සීලයෙන්යුක්තවූ; සච්චවාදී, සැබෑකියනසුළුවූ;
හිරීමතො, පාපයට්ලජ්ජාඇත්තාවූ; පහීණජාතිමරණො, ප්‍රහීණ
කරණලද ජාතිසහා මරණයඇති, බ්‍රහ්මචරියස්ස, ශ්‍රෙෂ්ඨචය්‍යා
වගේ; කෙවලී, සියල්ලෙන්සම්පූර්ණවූ;—පන්නභාරො, බහාතබ
නලද ස්කන්ධාදිබරඇති; විසංයුත්තො, තෘෂ්ණාදෘෂ්ටීන්වියුක්තවූ;

කතකිච්චො, සතරමාර්ගයෙන්කරණලදකෘත්‍යඇති; අනාසවො, කාමාදිආශ්‍රවරහිතවූ; සබ්බධම්මානං, (පඤ්චස්කන්ධාදී) සියළුධර්ම යන්ගේ; පාරගූ, පරතෙරටපැමිණියාවූ; අනුපාදාය, තෘෂ්ණා දිවශයෙන්නොගෙණ; නිබ්බුතො, ක්ලෙශපරිනිර්වාණයෙන්නි වුනාවූ; දන්තො, ඉන්ද්‍රියදමනයකළාවූ; සුඛිතො, සුවවයෙක් තෙම, ජායති, උපදී.

61 තස්මිංචෙ විරජෙ ඛෙත්තෙ විපුලාහොතිදක්ඛිණා,
බාලාචඅවිජානන්තා දුම්මෙධා අස්සුතාවිනො. 3.

62 බහිද්ධාදදන්තිදානානි නහිසන්තෙ උපාසරෙ,
යෙචසන්තෙ උපාසෙන්ති සප්පඤ්ඤෙධීරසම්මතෙ. 3.

63 සද්ධාචතෙසංසුගතෙ මූලජාතා පතිට්ඨිතා,
දෙවලොකඤ්චතෙයන්ති කුලෙවාඉධජායරෙ,
අනුපුබ්බෙනනිබ්බාණං අධිගච්ඡන්තිපණ්ඩිතා'ති. 3.

61—62—63--විරජෙ, රාගද්වෙෂමොහරජස්රහිතවූ; තස්මිංයෙ වඛෙත්ත, එමක්ෂෙත්‍රයෙහි (දෙනලද); දක්ඛිණා, දක්ෂිණාතො මෝ; විපුලාහොති, මහත්ඵලවත්නීය; අවිජානන්තා, ක්ෂෙත්‍ර නොදන්නාවූ; දුම්මෙධා, දුෂ්ප්‍රාඥවූ; අස්සුතාවිනො, ඇසූපිරූ තැන්නැත්තාවූ; බාලාච, අඥානයෝවනාහි;—බහිද්ධා, මේශා සනයෙන්පිටත්තන්හි; දානානි, දෙය්‍යධර්මදානයන්; දදන්ති, දෙත්,සන්තෙ,(බුද්ධප්‍රත්‍යෙකබුද්ධක්ෂීණාශ්‍රවසංඛ්‍යාත)සත්පුරුෂයන් කරා; නහි උපාසරෙ, නො එළඹෙත්; යෙච, යම්කෙනෙක්වනාහි;ස ප්පඤ්ඤෙ, ප්‍රඥාසහිතවූ; ධීරසම්මතෙ, පණ්ඩිතයයි සම්මතකර ණලද; (නොහොත්) පණ්ඩිතයන්විසින්සම්භාවනාකරණලද; සන්තෙ, සත්පුරුෂයන්කරා; උපාසෙන්ති, එළඹෙත්ද;—තෙසං, ඔවුන්ගේ; සද්ධාච, ශ්‍රද්ධාතොමෝද; සුගතෙ, බුදුන්කෙරෙහි; මූලජාතා, මුල්හටගන්නාලද්දී; පතිට්ඨිතා, පිහිටියාවන්නීද;තෙ පණ්ඩිතා,ඒපණ්ඩිතයෝ; දෙවලොකඤ්ච, දිව්‍යලොකයටද; යන්ති, යෙත්; ඉධ, මේමනුෂ්‍යලොකයෙහි; කුලෙවා, උත්තම්කුලයෙක් හිහෝ; ජායරෙ, උපදිත්; අනුපුබ්බෙන, ක්‍රමයෙන්; නිබ්බාණං, නිර්වාණයට (ද); අධිගච්ඡන්ති ඉති, පැමිණෙත්යයි(වදාළසේක).

**ප්‍රථමවර්ගයෙහි සපනම සූත්‍ර ගාථාර්ථවිවරණයයි.**

---

64 අනුච්චාවචසීලස්ස නිපකස්ස ච ඣායිනො,
චිත්තං යස්ස වසීභූතං එකග්ගං සුසමාහිතං. 3.

65 තං වෙ තමොනුදං ධීරං * තෙවිජ්ජං මච්චුහායිනං,
හිතං දෙවමනුස්සානං ආහු සබ්බප්පහායිනං. 3.

* "වීරං" මුද්‍රිත පෙළේ.

64—65— අනුච්චාවචසීලස්ස, කලින් කල වැඩීම් පිරිහීම් රහිත සිල්ඇති; නිපකස්ස, ප්‍රඥාවෙන් යුක්තවූ; ("ච" යනු පදපූරණයෙහි නිපාතයි; ඣායිනො, ධ්‍යාන කරණ සුලුවූ; යස්ස, යම් ක්ෂීණාශ්‍රවයෙකුගේ; චිත්තං, සිත; වසීභූතං වසඟබවට පැමිණියේවේද; එකග්ගං, එකඟවූයේවේද; සුසමාහිතං, (අරමුණෙහි) මොනවට තබනලද්දේවේද;—තමොනුදං, කෙලශාන්ධකාරය නැසූවාවූ: ධීරං, ධෛර්‍ය්‍යවන්තවූ; තෙවිජ්ජං, ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූ; මච්චුහායිනං, මාරයා පහකොට සිටියාවූ; දෙවමනුස්සානං, දෙවිමිනිසුන්ට; හිතං, හිතවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයන්වහන්සේ; වෙ, ඒකාන්තයෙන්, සබ්බප්පහායිනං, සියළු පාපධර්මයන් දුරුකොට සිටියේය (යි); ආහු, කියත්.

66 තිහි විජ්ජාහි සම්පන්නං අසම්මූළ්හවිහාරිනං,
බුද්ධං අන්තිමසාරීරං තං නමස්සන්ති ගොතමං. 3.

66 තිහි විජ්ජාහි, ත්‍රිවිද්‍යාවෙන්; සම්පන්නං, යුක්තවූ; අසම්මූළ්හවිහාරිනං, නුමුළාව වාසය කරන්නාවූ; බුද්ධං, චතුස්සත්‍යය අවබොධකළාවූ; අන්තිමසාරීරං, පශ්චිම ශරීරයක් දරන්නාවූ; ගොතමං, ගෞතම ගොත්‍රවූ; තං, ඒ බුදුන්; නමස්සන්ති, (සව්වෝ)නමදිත්;(නොහොත්)ගොතමං, ගෞතම ශ්‍රාවකවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; නමස්සන්ති (දිව්‍යමනුෂ්‍යයෝ) නමස්කාර කෙරෙත්.

67 පුබ්බෙනිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි. 3.

68 එතාහි තිහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො,
තමහං වදාමි තෙවිජ්ජං නාඤ්ඤං ලපිතලාපනන්ති. 3.

67—68 යො මුනි, යම් (ක්ෂීණාශ්‍රව) තවුසෙක් තෙම; පුබ්බෙනිවාසං,පෙරවිසූ කඳපිළිවෙළ; වෙදී, දත්තේද; සග්ගාපායඤ්ච, (ෂට් කාමාවචර නවබ්‍රහ්මලොකසංඛ්‍යාත) ස්වර්ගය හා සතර අපාය ද; පස්සති, දකීද, අථො, යලිත්; අභිඤ්ඤා, දැන; වොසිතො, (කෘත්‍යාවසානයෙන්) නිමාවට ගියේ; ජාතික්ඛයං, අර්හත් ඵලයට; පත්තො, පැමිණියේවේද;—එතාහි තිහි විජ්ජාහි, මේ (යථොක්ත පූර්වේනිවාසා නුස්මෘතිඥානාදි)ත්‍රිවිද්‍යාවෙන්; බ්‍රාහ්මණො,බ්‍රාහ්මණ තෙම; තෙවිජ්ජොහොති, ත්‍රෛවිද්‍යක වේ; තං, ඔහු; අහං, මම; තෙවිජ්ජං, ත්‍රෛවිද්‍යකය(යි); වදාමි, කියමි; ලපිතලාපනං, අන්‍යයන් විසින් කියනලද වචන මාත්‍රයක්ම ඇති; අඤ්ඤං, අනිකෙකු; නඉති, ත්‍රෛවිද්‍යකයයි නොකියම්යි (වදාළසේක).

**ප්‍රථම වර්ගයෙහි අෂ්ටම සූත්‍ර**
**ගාථාර්‍ථ විවරණයයි.**

69 යො සීලබ්බතසම්පන්නො පහිතත්තො සමාහිතො,
චිත්තං යස්ස වසීභූතං එකග්ගං සුසමාහිතං.

70 පුබ්බෙනිවාසං යො වෙදි සග්ගාපායෙච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනි.

71 එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො,
තමහං වදාමි තෙවිජ්ජං නාඤ්ඤං ලපිතලාපනන්ති. 3.

69 යො, යමෙක් තෙම; සීලබ්බතසම්පන්නො, සීල ව්‍රත දෙකින් සම්පූර්ණවූයේ වේද;පහිතත්තො, නිවණ්පිණිස මෙහෙයනලද සිත් ඇත්තේ වේද; සමාහිතො. (අර්පණොපචාර සමාධියෙන්) සන්සිඳුනේ වේද, යස්ස, යමෙකුගේ; චිත්තං සිත, වසීභූතං, වසඟබවට පැමිණියේ වේද, එකග්ගං, එකඟ වූයේවේද;සුසමාහිතං, (අරමුණෙහි) මොනවට තබනලද්දේවේද.

70—71 මේ සංඛ්‍යාදෙක්හි පෙණෙන ගාථාදෙකේ අර්ථය යට 67 වන 68 වන ගාථාවයට කියනලද නයින් දතයුතු—

**ප්‍රථමවර්ගයෙහි නවම සූත්‍ර ගාථාර්ථවිවරණයයි.**

---

**ප්‍රථමවර්ගී ගාථාර්ථ සංවර්ණනාව**
**සමාප්තයි.**

---

72 යෙ විරුද්ධා සල්ලපන්ති විනිවිට්ඨා සමුස්සිතා,
අනරියගුණ මාසජ්ජ අඤ්ඤමඤ්ඤ විවරෙසිනො. 3.

72 විරුද්ධා, (විරොධසංඛ්‍යාත කොපයෙන්) විරුද්ධවූ; විනිවිට්ඨා, අභිනිවේශ ඇත්තාවූ; සමුස්සිතා, (මානයෙන්) ඔසවනලද්දාවූ; යෙ, යමෙක්හු; ආසජ්ජ, (ගුණය) ගටා, අනරියගුණං, අනාර්‍ය්‍ය ගුණකථාව; සල්ලපන්ති, කථාකෙරෙද්ද (ඔවූහු); අඤ්ඤමඤ්ඤ විවරෙසිනො, ඔවුනොවුන්ගේ සිදුරු සොයන්නාහු.

73 දුබ්භාසිතං වික්ඛලිතං සම්පමොහං පරාජයං,
අඤ්ඤමඤ්ඤස්සාභිනන්දන්ති තදරියො කථනාචරෙ. 3.

73 අඤ්ඤමඤ්ඤස්ස, ඔවුනොවුන්ගේ; දුබ්භාසිතං, දුර්භාෂිත(වචන) යටද; වික්ඛලිතං, පැකුලුම්ද ශයටද, සම්පමොහං, මුළාවටද; පරාජයං, පැරදීමටද; අභිනන්දන්ති, සතුටුවෙත්; අරියො, ආර්‍ය්‍යතෙම; තං කථං, ඒ කථාව; නාචරෙ, නොකියන්නේය.

74 සචෙ විඤ්ඤූ කථාකාලෙ කාලමඤ්ඤාය පණ්ඩිතො,
ධම්මට්ඨ පටිසංයුත්තා යාරියචරිතා කථා. * 3.

---

* "යාඅරියචරිතා කථා,,—පොත්.

74 සචෙච, ඉදින්හු; පණ්ඩිතො, පණ්ඩිතපුරුෂතෙම; කාලං අඤ්ඤාය, කල්දැන; කථාකාමො අස්ස, කථාකරණුකැමතිවේද; අරියචරිතා, ආර්‍ය්‍යයන්විසින් කියනලද:ධම්මට්ඨපටිසංයුත්තං, ධර්මයෙහි පිහිටියාවූද ධර්මයෙන් ප්‍රතිසංයුක්තවූද; යාකථා, යම් කථා වක්වීද.

75 තං කථං කථයෙ ධීරො අවිරුද්ධො අනුස්සිතො,
අනුපාදිණ්ණෙන මනසා අපලාසො අසාහසො. 3.

75 අවිරුද්ධො,(විරොධසඞ්ඛාත කොපයෙන්)විරුද්ධනොවූ; අනුස්සිතො, (මානයෙන්) නොඔස වනලද්දාවූ; අපලාසො, යුගග්‍රාහ රහිතවූ; අසාහසො, (රාග ද්වෙෂ මොහ සාහසිකයින්ගේ වශයෙන්) අසාහසිකවූ; ධීරො, ප්‍රාඥතෙම; අනුපාදිණ්ණෙන මනසා, නොඋඩඟු සිතින්; තං කථං, ඒ කථාව; කථයෙ, කියන්නේය.

76 අනුද්ධයතයමානො සො සම්මදඤ්ඤාය භාසති,
සුභාසිතං අනුමොදෙය්‍ය දුබ්භට්ඨෙ නාවසාදයෙ. 3.

76 අනුද්ධයතයමානො, ඊර්ෂ්‍යා නොකරන්නාවූ; සො, හෙතෙම; සම්මදඤ්ඤාය, මනාකොට දැන; භාසති, කියයි; සුභාසිතං, යහපත් වචනය; අනුමොදෙය්‍ය, අනුමොදන් වන්නේය; දුබ්භට්ඨෙ, නපුරු වචනයෙහි; නාවසාදයෙ, නොගැලෙන්නේය,

77 උපාරම්භං න සික්ඛෙය්‍ය ඛලිතඤ්ච න ගාහයෙ,
නාභිහරෙ නාභිමද්දෙ න වාචං පයුතං භණෙ. 3.

77 උපාරම්භං, දෝෂාරොපනය; නසික්ඛෙය්‍ය, ඉගෙණ නොගන්නේය; ඛලිතඤ්ච, (වචන) පැකිලීමද; නගාහයෙ, (මෙය නොපගේ දෝෂයයි) ග්‍රහණය නොකරන්නේය; නාභිහරෙ, යටපත් නොකරන්නේය; නාභිමද්දෙ, නොමඩින්නේය; පයුතං, සැබෑ බොරු දෙකින් යුක්තවූ; වාචං, වචනය; නභණෙ, නොකියන්නේය.

78 අඤ්ඤාතත්ථං පසාදත්ථං සතං වෙ හොති මන්තනා,
එවං ඛො අරියා මන්තෙන්ති එසා අරියානමන්තනා,
එතදඤ්ඤාය මෙධාවී න සමුස්සෙය්‍ය මන්තයෙ. 3.

78 වෙ, ඒ කාරණයෙන්; සතං, සත්පුරුෂයන්ගේ; මන්තනා, කථාතොමෝ; අඤ්ඤාතත්ථං, දැනගැණීම පිණිසද, පසාදත්ථං, ප්‍රසාදඉපදීම පිණිසද; හොති, වේ; එවංඛො, මෙසේවනාහී; අරියා, ආර්‍ය්‍යයෝ; මන්තෙන්ති, කථාකෙරෙත්; එසා, මේතොමෝ;

අරියානං, ආර්‍යයන්ගේ; මන්තනා, කථාව වන්නීය; මේධාවී, ප්‍රඥාවන්තතෙම; එතං, මෙය; අඤ්ඤාය, දැන; නසමුස්සෙය්‍ය, (මානයෙන්) නොනගින්නේය; මන්තයෙඉති, (මානයෙන්නොනැග) කථා කරන්නේයයි (වදාළසේක).

චිතීය වර්ගයෙහි සප්තම සූත්‍ර
ගාථාර්ථ විවරණයයි.

---

79 පාණං න හානෙ * නචදින්නමාදියෙ
මුසා න භාසෙ නච මජ්ජපො සියා,
අබ්‍රහ්මචරියාවිරමෙය්‍ය මෙථුනා
රත්තිං නභුඤ්ජෙය්‍ය විකාලභොජනං. 3.

79 පාණං, ප්‍රාණය, නහානෙ, නොනසන්නේය; අදින්නං, (හිමියන් විසින්) නුදුන්දෙය, නච ආදියෙ, ග්‍රහණය නොකරන්නේය; මුසා, බොරුබස්; නභාසෙ, නොකියන්නේය; මජ්ජපො නච සියා, මත්පැන් පානයකරන්නෙක් නොවන්නේය; අබ්‍රහ්මචරියා, අශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාවවූ; මෙථුනා, (ද්වයංද්වය සමාපත්ති සඞ්ඛ්‍යාත) මෛථුනයෙන්; විරමෙය්‍ය, වලකින්නේය; රත්තිං, රාත්‍රි භොජනයද; විකාලභොජනං, දවල් කාලාතික්‍රාන්ත භොජනයද; නභුඤ්ජෙය්‍ය, අනුභවනොකරන්නේය.

80 මාලං න ධාරෙ නච ගන්ධමාචරෙ
මඤ්චෙ ඡමායං ච සයෙථ සන්ථතෙ,
එතං හි අට්ඨඞ්ගිකමාහු පොසථං
බුද්ධෙන දුක්ඛන්තගුණා පකාසිතං 3.

80 මාලං, මල්; නධාරෙ, නොදරන්නේය; ගන්ධං, සුගන්ධාදිය; නච ආචරෙ, ඇඟ නොගල්වන්නේය, මඤ්චෙ, (මිට්ටියන් පාඇති කැප) ඇඳෙහි (හෝ); ඡමායං වා (සුණුආදියෙන් පිරියම්කරණලද)බිමෙහිහෝ; සන්ථතෙ, (තෘණපර්ණාදිය අතුට කරණලද)ඇතිරියෙහි (හෝ); සයෙථ, සයනය කරන්නේය; එතං හි, මේවනාහි; අට්ඨඞ්ගිකං, අෂ්ටාඞ්ගයෙන් සමන්විතවූ; උපොසථං, උපොසථය; දුක්ඛන්තගුණා, සංසාරදුඃඛයාගේ කෙලවරට පැමිණියාවූ; බුද්ධෙන, බුදුන්විසින්; පකාසිතං, ප්‍රකාශ කරණලද්දේය(යි); ආහු (ආර්‍යයෝ) කියත්.

81 චන්දො ච සූරියො ච උභො සුදස්සනා
ඔභාසයං අනු පරියන්ති යාවතා,
තමොනුදා තෙ පන අන්තලික්ඛගා
නභෙ පභාසන්ති † දිසා විරොචනා. 3.

---

* නහඤ්ඤෙ—කිසිත්. † “පභා සෙනා”, කිසිත්.

81 සුදස්සනා, සොඳුරුදර්ශනයඇති; චන්දිච, චන්‍ද්‍රතෙමේද; සුරියොච, සූර්‍ය්‍යතෙමේද (යන); උභො, දෙදෙන; යාවතා, යම් පමණතැන; ඔභාසයං, ආලෝක කරමින්; අනුපරියන්ති, ඔබ මොබයෙද්ද; තමොනුදා, අන්ධකාරය පහකරන්නාවූ; අන්තලික්ඛගා, අහසෙහි ගමන්කරන්නාවූ; තෙ පන, ඔවුහුවනාහි; දිසා විරොචනා,සියළුදිග්හෙළිකරමින්; නභෙ, අහසෙහි; පභාසන්ති, බබලද්ද.

82 එතස්මිං * යං විජ්ජති අන්තරෙ ධනං
මුත්තා මණී වෙළුරියඤ්ච භද්දකං,
සිඞ්ගීසුවණ්ණං අථවාපි කඤ්චනං
යං ජාතරූපං හටකන්ති වුච්චති. 8.

83 අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස
කලම්පි තෙ නානුභවන්ති සොළසිං,
චන්දප්පභා තාරගණාව සබ්බෙ. 8

82—83 එතස්මිං අන්තරෙ, මේ අතරෙහි; මුත්තා, මුතුද; මණී, මැණික්ද; වෙළුරියඤ්ච, වෛඩූර්‍ය්‍යද; භද්දකං, යහපත්වූ; සිඞ්ගීසුවණ්ණං, (ගොශෘඞ්ග සදෘශව උපන් බැවින්) ශෘඞ්ගීසුවර්ණනම්වූ රත්රන්ද; අථවාපි, වැලිදු; කඤ්චනං, (පර්වතයෙහි උපන්) රත්රන්ද; ජාතරූපං, ශාස්තෘවර්ණ රත්රන්ද; යං, යම්රත්රනක්; හටකං ඉති, කුහුඹුවන් විසින් ගෙණ එන ලද් දේයයි; වුච්චති, කියනුලැබේද; (එයද යන මොවුන් අතුරෙන්); යං ධනං, යම්වස්තුවක්; විජ්ජති, විද්‍යමානවේද;—තෙ, ඒ (සියළු) වස්තූහු; සබ්බෙ තාරගණා, සියළු තාරකා සමූහයෝ; චන්දප්පභා ඉව, චන්ද්‍රරශ්මියගේ (සොළොස්වන කලාවට) මෙන්; අට්ඨඞ්ගු පෙතස්ස, ගුණාඞ්ගඅටින් සමන්විතවූ; උපොසථස්ස, උපොසථයාගේ; සොළසිං කලං අපි, සොළොස්වන කලාව විද; නානුභවන්ති, නොපැමිණෙත්.

84 තස්මා හි නාරී ච නරො ච සීලවා
අට්ඨඞ්ගුපෙතං උපවස්සු පොසථං,
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති 8.

84 තස්මාහි, එහෙයින් වනාහි; සීලවා, සිල්වත්වූ; නරොච, පුරුෂතෙමේද; නාරිච, ස්ත්‍රීතොමෝද; අට්ඨඞ්ගුපෙතං, ගුණාඞ්ගඅටින් සමන්විතවූ; උපොසථං, පෙහෙවස්; උපවස්ස, වැස; සුඛුද්‍රයානි, සැප විඳුවන්නාවූ; පුඤ්ඤානි, කුසලයන්; කත්වාන, කොට; අනින්දිතා, නින්දා නොකරණ ලද්දාහු; සග්ගං ඨානං,

* "එතස්මිංයා,, පොත්.

(සැපයෙන් අග්‍රහෙයින්) ස්වර්ගසඞ්ඛ්‍යාතවූ ස්ථානයට; උපෙනති ඉති, පැමිණෙත්යයි (වදාළසේක).

**ද්විතීය වර්ගයෙහි දශම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

---

**ද්විතීයවර්ග ගාථාර්ථ සංවර්ණනාව**
**ස මා ප්ත යි.**

---

85 න පුප්ඵගන්ධො පටිවාතමෙති
න චන්දනං තගරමල්ලිකාවං,
සතච ගන්ධො පටිවාතමෙති
සබ්බා දිසා සප්පුරිසො පවාතීති. 8.

85 පුප්ඵගන්ධො, (දසමන්ආදී) පුෂ්පයන්ගේ සුගන්ධයතෙම; පටිවාතං, උඩුසුලඟට; නඑති, නොපැමිණෙන්නේය; චන්දනං; සඳුනෙහිද; තගර, තුවරලා යෙහිද; මල්ලිකාවා, බොලිද්දයෙහිද (සුගන්ධයතෙම්); න, උඩුසුලඟට නොයන්නේය, සතංච, සත්පුරුෂයන්ගේ වනාහි; ගන්ධො, සීලාදි ගුණසුගන්ධයතෙම; පටිවාතං, උඩුසුලඟට; එති, පැමිණෙන්නේය, (කුමක්හෙයිනැයත්); සප්පුරිසො, සත්පුරුෂතෙම; සබ්බා දිසා, සියළු දිශාවන්; පවාති ඉති, (සීලාදී ගුණගන්ධයෙන්) යටපත්කෙරේ (එහෙයිනි යිවදාළසේක).

**තෘතීය වර්ගයෙහි නවම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

---

**තෘතීය වර්ග ගාථාර්ථ සංවර්ණනාව**
**ස මා ප්ත යි.**

---

86 සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො,
ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා. 8.

86 උජුමග්ගානුසාරිනො, ආර්‍ය්‍යමාර්ගය අනුස්මරණය කරන්නාවූ, (හෙවත්) ආර්‍ය්‍යමාර්ගයට පිළිපන්නාවූ; සික්ඛමානස්ස, හික්මෙනු ලබන්නාවූ, සෙඛස්ස, ශෛක්‍ෂපුද්ගලයාගේ; පඨමං, පළමුකොට; ඛයස්මිං ඤාණං, මාර්ගඥානය (උපදී); තතො අනන්තරා, ඒ අර්හත්මාර්ගඥානයට අනතුරුව; අඤ්ඤා, අර්හත්ඵලය (උපදී).

87 තතො අඤ්ඤාවිමුත්තස්ස ඤාණං වෙ හොති තාදිනො,
අකුප්පා මෙ විමුත්තීති භවසඤ්ඤෝජනක්ඛයෙති. 3.

87 තතො, නැවත, තාදිනො, (ලාභාලාභාදියෙහි කම්පා නොවීමයයි කියනලද) තාදිගුණයෙන් යුක්තවූ, අඤ්ඤවිමුත්තස්ස, අර්හත්ඵලවිමුක්තියෙන් මිදුනහුගේ, වෙ, ඒකාන්තයෙන්, මෙ, මාගේ; විමුත්ති, අර්හත්ඵලවිමුක්තිතොමෝ; අකුප්පාඉති, අකොප්‍යයයි, භවසඤ්ඤොජනක්ඛයෙ, භවසංයොජනයන්ගේ ක්ෂයකිරීමෙහි, ඤාණං, ප්‍රත්‍යවෙක්ෂාඥානය, හොතිඉති, වන්නේයයි (වදාළසේක).

**චතුර්ථ වර්ගයෙහි පචම සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

---

88 අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤං ච වීරියවා,
ථාමවා ධිතිමා ඣායී සතො ගුත්තින්ද්‍රියො චරෙ. 3.

88 ථාමවා, පුරුෂශක්තියෙන් යුක්තවූ; ධිතිමා, ධෛර්‍ය්‍යමත්වූ; ඣායී, ධ්‍යානකරණසුළුවූ; වීරියවා, වීර්‍ය්‍යඇති පුද්ගලතෙම; අධිසීලං, අධිශීල ශික්ෂාවට(ද); අධිචිත්තං, අධිචිත්ත ශික්ෂාවට (ද) අධිපඤ්ඤංච, අධිප්‍රඥ ශික්ෂාවටද (පැමිණ); සතො, සිහියෙන් යුක්තව; ගුත්තින්ද්‍රියො, ගොපනය කරනලද ඉඳුරන්ඇත්තේ; චරෙ, හැසිරෙන්නේය.

89 යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො. 3.

90 යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා,
අභිභුය්‍ය දිසා සබ්බා අප්පමාණසමාධිනා. 3.

89—90 අප්පමාණසමාධිනා, අර්හත්මාර්ගසමාධියෙන්; සබ්බා දිසා, සියළු දිශාවන්; අභිභුය්‍ය, (අරමුණෙහි) මැඩ; යථා, යම්සේ; පුරෙ, පළමුකොට (ත්‍රිවිධශික්ෂාවන්හි හික්මෙන්නේද); පච්ඡා, පසුවද; තථා, එසේම; (හික්මෙන්නේය) යථා, යම්සේ; පච්ඡා, පසුව (ත්‍රිවිධශික්ෂාවන්හි හික්මෙන්නේද); පුරෙ, පළමුවද; තථා, එසේම (හික්මෙන්නේය); යථා, යම්සේ; අධො, යටකය (අශුභවශයෙන් දක්නේද); උද්ධං, උඩකයද; තථා, එසේම (දක්නේය); යථා, යම්සේ; උද්ධං, උඩකය (අශුභවශයෙන් දක්නේද); අධො, යටකයද; තථා, එසේම (දක්නේය); යථා, යම්සේ; දිවා, දවල්හි (ත්‍රිවිධශික්ෂාවන් හික්මේද); රත්තිං, රාත්‍රියෙහිද; තථා, එසේම (හික්මෙන්නේය); යථා, යම්සේ; රත්තිං, රාත්‍රියෙහි (ත්‍රිවිධශික්ෂාවන් හික්මේද); දිවා, දවල්හිද; තථා, එසේම (හික්මෙන්නේය).

91 තමාහු සෙක්ඛං පටිපදං අථො සංසුද්ධචාරණං,
තමාහු ලොකෙ සම්බුද්ධං වීරං * පටිපදන්තගුං. 3.

91 තං, ඔහු; සෙක්ඛං පටිපදං, ශෛක්ෂප්‍රතිපදාව පිළිපන්නෙකැයි; ආහු, කියත්; අථො, නැවත; සංසුද්ධචාරණං, පිරිසිදු වූසිල්ඇති; වීරං, ස්කන්ධවිශෂ ධාතුවිශෂ ආයතනවිශෂිතා වශයෙන් විශෂවත්වූ; පටිපදන්තගුං, ප්‍රතිපත්තියෙහි කෙලවරට පැමිණියාවූ; තං, ඔහු; ලොකෙ, ලොකයෙහි; සම්බුද්ධං, චතුස්සත්‍යබුද්ධය(යි); ආහු, කියත්.

92 විඤ්ඤාණස්ස නිරොධෙන තණ්හාක්ඛය විමුත්තිනො,
පජ්ජොතස්සෙව නිබ්බාණං විමොක්ඛො හොති චෙතසොති. 3.

92 විඤ්ඤාණස්ස, චරිමක විඥානයාගේ; නිරොධෙන, නැතිවීමෙන්; තණ්හාක්ඛයවිමුත්තිනො, තෘෂ්ණාක්ෂයවිමුක්තිසඞ්ඛ්‍යාතවූ අර්හත්ඵලවිමුක්තියෙන් යුක්තවූවහුගේ; (හෙවත්) ක්ෂීණාශ්‍රවයාගේ; පජ්ජොතස්ස, ප්‍රදීපයාගේ; නිබ්බාණං ඉව, නිවීමමෙන්; චෙතසො, චිත්තයාගේ; විමොක්ඛො හොති ඉති, විමුක්තිය වන්නේයයි (වදාළසේක).

**චතුර්ථ වර්ගයෙහි දශම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

---

**චතුර්ථ වර්ග ගාථාර්ථ සංවර්ණනාව**

**සමාප්තයි.**

---

# ද්විතීය පණ්ණාසක ගාථාර්ථ

**විවරණය නිමි.**

93 කායසුචිං වචීසුචිං† චෙතොසුචිමනාසවං,
සුචිං සොචෙය්‍යසම්පන්නං ආහු නින්හාතපාපකන්ති. 3.

93 කායසුචිං, කායද්වාරයෙහි පවිත්‍රයද; වචීසුචිං, වාග්ද්වාරයෙහි පවිත්‍රයද; චෙතොසුචිං, මනොද්වාරයෙහි පවිත්‍රයද (ඇති); (නොහොත්) කායසුචිං, කයින් පිරිසිදුවූ; වචීසුචිං, වචනයෙන් පිරිසිදුවූ; චෙතොසුචිං, සිතින් පිරිසිදුවූ; අනාසවං, (කාමාදි) ආශ්‍රවරහිතවූ; සුචිං, (ද්වාරත්‍රය) පිරිසිදුවූ; සොචෙය්‍යසම්පන්නං, සුචිභාවයෙන් යුක්තවූ (ක්ෂීණාශ්‍රවයා); නින්හාතපාපකං, (අශේෂ

* "ධීරං,, අච්චු. † "වාචාසුචිං,, කිසිතැනක.

මාර්ගජලයෙන්) ධොවනය කරණලද සියළු පාපධර්මයන් ඇත්තේය (යි); ආහුඉති, කියත්පි (වදාළසේක).

**ඕතීය වර්ගයෙහි නවම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

---

94 කායමුනිං වචීමුනිං * චෙතොමුනිං මනාසවං,
මුනිං මොනෙය්‍ය සම්පන්නං ආහු සබ්බපහායිනා'න්ති. 3

94 කායමුනිං, කායද්වාරයෙහි යහපත්ද, වචීමුනිං, වාග්ද්වාරයෙහි යහපත්ද; චෙතොමුනිං, මනොද්වාරයෙහි යහපත්ද (ඇති); (නොහොත්) කායමුනිං, කයින් යහපත්වූ; වචීමුනිං, වචනයෙන් යහපත්වූ; චෙතොනිමුං, සිතින් යහපත්වූ; අනාසවං, (කාමාදි) ආශ්‍රවරහිතවූ; මුනිං, (මාරත්‍රය) යහපත්වූ; මොනෙය්‍ය සම්පන්නං, මොනධර්මයෙන් යුක්තවූ (ක්ෂීණාශ්‍රවයා); සබ්බපහායිනං, සියළු පාපධර්මයන් දුරුකොට සිටියේය (යි); ආහු ඉති, කියත් පි (වදාළසේක).

**විතීය වර්ගයෙහි දශම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

---

**විතීයවර්ග ගාථාර්ථ සංවර්ණනාව**

**සමාප්ත යි.**

---

95 නාහං භවතො † දස්සනස්ස තිත්තිං මජ්ඣගා කුදාචනං,
සඞ්ඝස්ස උපට්ඨානස්ස සද්ධම්ම සවණස්ස ච. 3.

95 අහං, මම; භවතො, පින්වතුන් වහන්සේගේ; දස්සනස්ස, (චක්ෂුර්විඥානයෙන්) දැකීමගේද; සඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාහට; උපට්ඨානස්ස, (සිව්පසයෙන්) උපස්ථාන කිරීමගේද; සද්ධම්ම සවණස්ස ච, (ශ්‍රොත්‍රවිඥානයෙන්) සදහම් ඇසීමගේද; තිත්තිං, තෘප්තියකට; කුදාචනං, කිසිකලෙකත්; න අජ්ඣගා, නො පැමිණියෙමි.

96 අධිසීලෙ සික්ඛමානො සද්ධම්ම සවණෙ රතො,
තිණ්ණං ධම්මානමිත්තෙනා හත්කො අච්හං ගතො'ති.3.

96 අධිසීලෙ, දශසීලයෙහි; සික්ඛමානො, හික්මෙන්නාවූ; සද්ධම්මසවණේ, සදහම් ඇසීමෙහි; රතො, ඇළුනාවූ; තිණ්ණං

---

* "වාචාමුනිං,, කිසිතැනක. † "නාහං භගවතො,, පොත්.

ධම්මානං, (බුද්ධදර්ශන ධර්මශ්‍රවණ සඞ්ඝෝපස්ථාන සංඛ්‍යාත) ත්‍රිවිධ ධර්මයන්ගේ; අතිත්තතා, තෘප්තියකට නොපැමිණියාවූ; හත්ථකො, හත්ථකනම්වූ (මම); අවිහං, අවිහ බ්‍රහ්මලොකයට; ගතො ඉති, (උත්පත්ති වශයෙන්) ගියෙමියි (දැක්වූසේක).

## තෘතීය වර්ගයෙහි පඤ්චම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.

---

97 අගුත්තං චක්ඛුසොතස්මිං ඉන්ද්‍රියෙසු අසංවුතං,
මක්ඛිකා අනු පතිසන්ති සඞ්කප්පා රාගනිස්සිතා. 3.

97 චක්ඛු සොතස්මිං, චක්ෂු ශ්‍රොතස් දෙක්හි; අගුත්තං, ගොපාය නොකරණ ලද්දාවූ; ඉන්ද්‍රියෙසු, (මනඃ ෂෂ්ඨ) ඉන්ද්‍රියයන්හි; අසංවුතං, සංවරනැත්තාවූ (පුද්ගලයා); රාගනිස්සිතා, රාගය ඇසුරු කළාවූ; සඞ්කප්පා, (කාමවිතර්කාදි) සංකල්පනායයි කියන ලද; මක්ඛිකා, කෙලෙස් මැස්සෝ; අනු පතිසන්ති, අනුබඳිත්.

98 කටුවියකතො භික්ඛු ආමගන්ධෙ අවස්සුතො,
ආරකා හොති නිබ්බාණා විඝාතස්සෙව භාගවා. 3.

98 ආමගන්ධෙ, (ක්‍රොධ සංඛ්‍යාත) විශ්වගන්ධයෙහි; අවස්සුතො, ගැළුනාවූ; කටුවියකතො, (කෙලෙසයන් විසින්) ඉඳුල්කරණ ලද්දාවූ; භික්ඛු, මහණතෙම; විඝාතස්ස එව, දුකටම; භාගවා, අයිතිවූයේ; නිබ්බාණා, නිර්වාණයෙන්; ආරකා හොති, දුරස්තරවේ.

99 ගාමෙ වා යදි වා රඤ්ඤෙ අලද්ධා සම මත්තනො,
පරෙති බාලො දුම්මෙධො මක්ඛිකාහි පුරක්ඛතො 3.

99 ගාමෙ වා, ගමෙහි හෝ; යදි, ඉදින්; අරඤ්ඤෙ වා, වෙනෙහි හෝ; අත්තනො, තමනට; සමං, නිෂ්ප්‍රස්බලතාවක්; අලද්ධා, නොලැබ; මක්ඛිකාහි; කෙලෙස් මැස්සන්විසින්; පුරක්ඛතො, පෙරටුකරණ ලද්දේ; දුම්මෙධො, දුෂ්ප්‍රාඥවූ; බාලො, ජඩපුද්ගලතෙම; පරෙති, යෙයි.

100 යෙ ච සීලෙන සම්පන්නා පඤ්ඤායූපසමෙ රතා,
උපසන්තා සුඛං සෙන්ති නාසයිත්වාන මක්ඛිකා'ති. 3.

100 යෙ ච, යමෙක්හු වනාහි; සීලෙන සම්පන්නා, සීලයෙන් යුක්තවූවාහුද; පඤ්ඤාය, විදර්ශනායෙහිද; උපසමෙ, සමාධියෙහිද; රතා, ඇළුනාහුද (ඔවුහු); මක්ඛිකා, කෙලෙස් මැස්සන්;

නාසයිත්වාන, නසෑ; උපසන්තා; ශාන්තවූවාහු; සුඛං, සැපසේ; සෙන්ති ඉති, හොවිත්යයි (වදාළසේක).

**තෘතීය වර්ගයෙහි ෂඞ්සූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

**තෘතීය වර්ග ගාථාර්ථ සංවර්ණනාව**
**සමාප්තයි.**

101 සුනක්ඛත්තං සුමඞ්ගලං සුප්පභාතං සුවුට්ඨිතං,
සුඛණො සුමුහුත්තො ච සුයිට්ඨං බ්‍රහ්මචාරිසු. 3.

101 සුනක්ඛත්තං, (යම් දවසෙක්හි යමෙකුන් විසින් ත්‍රිවිධ සුචරිත ධර්මයෝ පූරණලද්දාහු වෙද්ද එදවස ඔවුන්ට) මනා නක්ෂත්‍ර යොගයෙක්ද; සුමඞ්ගලං, මනා මඞ්ගල්‍යයෙක්ද; සුප්පභාතං, (එදවස් එලිවීම) මනා එලිවීමෙක්ද; සුවුට්ඨිතං, (එදවස් සයනයෙන් නැග්වීම) මනා නැගිටීමෙක්ද; සුඛණො, (එදවස් ක්‍ෂණකාලය)මනා ක්‍ෂණකාලයෙක්ද; සුමුහුත්තොච, (එදවස් මුහුර්තය)මනා මුහුර්තයෙක්ද; බ්‍රහ්මචාරිසු, (එදවස්ඔවුන් විසින්) ශ්‍රෙෂ්ඨචාරීන් කෙරෙහි (දෙනලද දානය); සුයිට්ඨං, මනාව දෙනලද්දක්ද (වේ).

102 පදක්ඛිණං කායකම්මං වාචාකම්මං පදක්ඛිණං,
පදක්ඛිණං මනොකම්මං පණිධියෙ පදක්ඛිණා. 3.

102 කායකම්මං, (යම් දවසෙක්හි යමෙකුන් විසින් ත්‍රිවිධ සුචරිත ධර්මයෝ පූරණලද්දාහු වෙද්ද එදවස් ඔවුන් විසින් කරණලද) කායකර්මය; පදක්ඛිණං, වෘද්ධි කායකර්මයෙක් (වේ); වාචාකම්මං, (එදවස් ඔවුන් විසින් කරණලද) වාග්කර්මය; පදක්ඛිණං, වෘද්ධි වාග්කර්මයෙක්(වේ); මනොකම්මං, (එදවස් ඔවුන් විසින් කරණලද) මනඃකර්මය, පදක්ඛිණං, වෘද්ධි මනඃ කර්මයෙක් (වේ); යෙ පණිධී, (එදවස් ඔවුන් විසින් කරණලද) යම් ප්‍රාර්ථනා කෙනෙක් වෙද්ද (ඒ ප්‍රාර්ථනාවෝ); පදක්ඛිණා, වෘද්ධි ප්‍රාර්ථනාවෝ (වෙත්).

103 පදක්ඛිණානි කත්වාන ලභන්තත්ථෙ * පදක්ඛිණෙ,
තෙ අත්ථලද්ධා සුඛිතා විරූළ්හා බුද්ධසාසනෙ,

අරොගා සුඛිතා හොථ † සහ සබ්බෙහි ඤාතිභී'ති. 3.

103 පදක්ඛිණානි, වෘද්ධියුක්ත කායකර්මාදිය; කත්වාන, කොට; පදක්ඛිණෙ අත්ථෙ, වෘද්ධි අර්ථයන්; ලභන්ති, ලබත්; අත්ථලද්ධා, වෘද්ධි අර්ථයන් ලද්දාවූ; සුඛිතා, සුවපත්වූ, බුද්ධසාසනෙ, බුද්ධසස්

* "ලභන්ථත්ථෙ,, අචිචු. ,,ලභන්තත්ථෙ,, ලියාපු පොත්.
† "සුඛිතා හොථ,, පොත්.

නෙහි, විරූළ්හා, රූඪන්නයවූ; තෙ, ඔව්හු; සබ්බිහි ඤාතීහි සහ, සියළු නෑයන් සමඟ; අරොගා, නිරොගී වූවාහු; සුඛිතා හොන්ති ඉති, සුවයෙන් සුවයට පැමිණෙත්යයි (වඩුලසේක).

පඤ්චම වග්ගයෙහි දශම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.

---

තෘතීය පණ්ණාසක ගාථාර්ථ
විවරණය නිමි.

# ත්‍රිකනිපාත ගාථාර්ථ සංවර්ණනාව සමාප්තයි.

---

104 අඞ්ගුත්තරනිකායවරෙ සබ්බඤ්ඤුනා පරමවිසුද්ධදස්සිනා,
නිපාතා එකාදසෙව පවත්තිතා උද්දානතො තෙ
නිසාමෙථ ආදිතො. 1.

104 පරමවිසුද්ධදස්සිනා, ප්‍රවරනිර්මල දර්ශනයක් ඇත්තාවූ; සබ්බඤ්ඤුනා, සර්වඥයන් වහන්සේ විසින්; අඞ්ගුත්තරනිකායවරෙ, අඞ්ගෝත්තර නිකායෝත්තමයෙහි; නිපාතා, (එකකාදි) නිපාතයෝ; එකාදස එව, එකොළොසක්ම; පවත්තිතා, ප්‍රවර්තනය කරණලද්දාහු; තෙ, ඒ නිපාතයෝ; ආදිතො, මූලපටන්; උද්දානතො, ගාථාබන්ධ වශයෙන්; නිසාමෙථ, ශ්‍රවණය කරව්.

105 ඉත්ථිරූපං පුරිසරූපං පඤ්ච නීවරණානි මෙ
අකම්මනීයා ද්විකං පඤ්ච පඤ්ච ද්විකං අදන්තතො. 2.

105 ඉත්ථිරූපං, ස්ත්‍රීරූපය (ආදිකොටඇති චිත්තපර්‍ය්‍යාදාන සූත්‍ර පඤ්චකය); පුරිසරූපං, පුරුෂරූපය (ආදිකොටඇති චිත්තපර්‍ය්‍යාදාන සූත්‍ර පඤ්චකය); නීවරණානි, (කාමච්ඡන්දාදි) නීවරණ සූත්‍රයෝ; මෙ පඤ්ච, දෙපසය; අකම්මනීයා, අකර්මනීය (සූත්‍රය ආදිකොටඇති) සූත්‍රයෝ; පඤ්ච ද්විකං, දෙපසය; අදන්තතො, අදන්තසූත්‍රය පටන් කොට ඇති සූත්‍රයෝ; පඤ්චද්විකං, දෙපසය.

106 සූකා පදුට්ඨා රහදා එකධම්මෙනා ලහු පභස්සරා,
ආසෙවභාවමනසා භාගීගී අපරෙ දුවෙ. 3.

106 සූකා, සූකොපම සූත්‍රවශයෙ; පදුට්ඨා ප්‍රදුෂ්‍ය ප්‍රසන්න සූත්‍රවශයෙ; රහදා, රහද සූත්‍රවශයෙ; එකධම්මෙනා, එකධම්ම සූත්‍රය; ලහු, ලඝුපරිවර්ත සූත්‍රය; පභස්සරා, ප්‍රභාස්වර සූත්‍ර චතුෂ්කය; ආසෙවභාවමනසා, ආසෙවන භාවන මනසිකාර යන සූත්‍රත්‍රයය; භාගීගී, අකුසලභාගිය කුසලභාගිය වශයෙන්; අපරෙ, අන්‍යවූ; දුවෙ, සූත්‍රවශයෙ.

107 උප්පජ්ජන්ති පරිහාණි අනත්ථායඅසම්මුසා,
චතුකොටිමුඛා එතෙ චතුරො සබ්බාවත්තිනො. 4.

107 උප්පජ්ජන්ති, උප්පජ්ජන්ති යන පදය අනාගතන කොට ඇති (ප්‍රමාද සූත්‍රාදි) සූත්‍ර විංශතිය; පරිහාණි, ඤාතිපරිහාණි සූත්‍රය ආදිකොටඇති සූත්‍ර ෂට්කය; අනත්ථාය, අනත්ථාය සංවත්තන්ති යනාදින් දෙසිත (ප්‍රමාද සූත්‍රාදි) සූත්‍ර සතිසය; අසම්මුසා, සම්මොසාය අසම්මොසාය යන පදමයෙන් යුක්ත(ප්‍රමාදසූත්‍රාදි)සූත්‍ර අටළොසය; එතෙ චතුරො,(උප්පජ්ජන්ති යනාදින් දෙසිත ඒ ඒ සූත්‍රකොටස්හි පර්‍යවසානයෙහි දක්වනලද "අකුසලානුයොග කුසලානනුයොග කුසලානුයොග අකුසලානනුයොග" යන) මේ චතුස් ධර්මයෝ; සබ්බාවත්තිනො, සියළුතැන ආවර්තනයවූ; චතුකොටිමුඛා, චතුෂ්කොණ මාරඇත්තාහ.

108 අධම්මා විනයා භාසිතා චිණ්ණා පඤ්ඤත්තිපඤ්චමා,
ආපත්ති ලහු දුට්ඨුල්ලං සාවසෙස කම්මෙන ච. 5.

108 පඤ්ඤත්තිපඤ්චමා, ප්‍රඥප්තිපදය පස්වැනි කොටඇති; අධම්මාවිනයාභාසිතාචිණ්ණා, අධර්ම අවිනය අභාෂිත අචීර්ණ පදයන්ගෙන් යුක්තවූ සූත්‍ර සමසැටය; ආපත්ති, ආපත්තිපදය මුල් කොටඇති සූත්‍ර ද්වාදශකය; ලහු, ලහුකපදය මුල්කොටඇති සූත්‍ර ද්වාදශකය; දුට්ඨුල්ලං, දුට්ඨුල්ලපදය මුල්කොටඇති සූත්‍ර ද්වාදශකය; සාවසෙස, සාවසෙසපදය මුල්කොටඇති සූත්‍ර ද්වාදශකය; කම්මෙන ච,ප්‍රතිකර්ම පදයෙන් යුක්ත සූත්‍ර ද්වාදශකය.

109 පුග්ගලා සාරිපුත්තො ච එතදග්ගා තථෙව ච,
අට්ඨානා නිබ්බිද ඉද්ධි තථාදිට්ඨිපවඩ්ඪනා. 6.

109 පුග්ගලා, එකපුද්ගල සූත්‍ර පස්විස්සය; සාරිපුත්තො ච, ශාරීපුත්‍ර සූත්‍රය; තථෙව ච, එසේම, එතදග්ගා, එතදග්‍ර සූත්‍ර අසූවය; අට්ඨානා, අස්ථාන සූත්‍ර අටවිස්සය; නිබ්බිද, නිර්වෙද සූත්‍ර දශකය; ඉද්ධි, මිථ්‍යාදෘෂ්ටික සම්‍යක්දෘෂ්ටික සූත්‍ර චතුෂ්කය; තථං, එසේම; දිට්ඨිපවඩ්ඪනා, දිට්ඨිපවඩ්ඪන සූත්‍රවයය.

110 යෙනෙවමාදි සමන්තා සද්ධම්මට්ඨාපනෙන ච
අපරෙ සාවජ්ජ ඛිපං දුරක්ඛාතෙනහි නපසංසං. 7.

110 යෙනෙවංආදි,යෙනෙවං යනාදි(නිරයොපපත්ති සුගතොපපත්ති) සූත්‍ර ද්විකය; සමන්තා, සමන්ත සූත්‍ර තුදුසය; සද්ධම්මට්ඨාපනෙන ච, සද්ධම්මට්ඨාපන අසද්ධම්මට්ඨාපන සූත්‍ර ම්‍ගය; අපරෙ, අන්‍යවූ; සාවජ්ජ, (මහා)සාවද්‍ය සූත්‍රය; ඛිපං, ඛිප සූත්‍රය;දුරක්ඛාතෙහි, දුරක්ඛාත සූත්‍ර අෂ්ටකාහා; නපසංසං, නප්‍රශංසං සූත්‍ර පඤ්චකය.

111 ඵලජමනුස්සමජ්ඣිමා පඤ්ඤාතරියෙන චක්ඛුනා,
දස්සනසවණධාරණා උපපරික්ඛන පටිපදාය දස. 8.

111 ඵලජමනුස්සමජ්ඣිමා, ඵලජසූත්‍රය මනුෂ්‍යසූත්‍රය මධ්‍යදේශසූත්‍රය යන සූත්‍රත්‍රිකය; පඤ්ඤා, ප්‍රඥාව ාන සූත්‍රය; අරියෙනචක්ඛුනා, ආර්‍ය්‍යචක්ෂුස්සූත්‍රය; දස්සනසවණධාරණා, දර්ශනසූත්‍රය ශ්‍රවණසූත්‍රය ධාරණසූත්‍රය යන සූත්‍රත්‍රිකය; උපපරික්ඛනා, අර්ථොපපරීක්ෂා සූත්‍රය; පටිපදාය, ප්‍රතිපදා සූත්‍රයහා; දස, (ඵලජාදි මේ සූත්‍ර)දශකය.

112 සංවිගෙගාසං පදහනෙන වවස්සගා රම්මණෙනච,
අනෙනානච යෙවුත්තා යෙයෙඅත්ථරසෙනච. 9.

112 සංවිගෙගා, සංවෙජනීය සූත්‍රය; සංපදහනෙන, සම්‍යක් ප්‍රධාන සූත්‍රයහා; වවස්සගා රම්මණෙනච, වවස්සගාරම්මණ සූත්‍රයෙන්ද යුක්තාය; යෙ ච, යම්මක්නු වනාණ්; අනෙනානා, අග්‍රත්; (හෙවත් අනනාග්‍ර රසාග්‍රයන්ගේ ලාභීහුයයි); වුත්තා, වදාරණලද්දාහුද (ඔවුන් ප්‍රකාශක අනනාග්‍ර රසාග්‍ර සූත්‍රය); යෙ යෙ, යමෙක් යමෙක්හු, අත්ථරසෙනච, අර්ථරසයෙන් (හෙවත් අර්ථරස ධර්මරසවිමුක්තිරස යන්ගේ ලාභීහුයයි); වුත්තා, වදාරණලද්දාහුද (ඔවුන ප්‍රකාශක අර්ථරස සූත්‍රය).

113 මෙ මනුස්සා දුවෙ දෙවා නිරයා අපරෙ දුවෙ,
මෙ තිරච්ඡානයොනියා මෙපෙත්තිවිසයාචෙති
ජම්බුදීපෙපෙ යොජයෙ. 10

113 මනුස්සා, මනුෂ්‍යයන්ගෙන්; මෙ, සූත්‍ර දෙකෙක්ද; දෙවා; දෙවියන්ගෙන්; දුවෙ, සූත්‍ර දෙකෙක්ද; නිරයා, නරකයින්ගෙන්; අපරෙ, අන්‍යවූ; දුවෙ, සූත්‍ර දෙකෙක්ද; තිරච්ඡානයොනියා, තිර්‍ය්‍යග් යොනීන්ගෙන්; මෙ, සූත්‍ර දෙකෙක්ද; පෙත්තිවිසයා, ප්‍රෙත වෛෂයිකයින්ගෙන්; මෙච ඉති, සූත්‍ර දෙකෙක්දැයි (මෙසේ දිව්‍ය මනුෂ්‍ය නරක තිර්‍ය්‍යග් ප්‍රෙත යන පස්කොටසගේ වශයෙන් එක්කොටසකින් දෙකෙක් දෙකෙක් කොට මනුෂ්‍යයන්ගෙන් නිරයසූත්‍ර දෙකෙක තිරශ්චීන සූත්‍රදෙකෙක ප්‍රෙත විෂයසූත්‍ර දෙකෙකැයි එක්තැණ්හි සයෙක් සයෙක් බැගින් පස්තැණ්හි සම්ත්‍රිංශත් සූත්‍රකෙනෙක්); ජම්බුදීපෙන්, ජම්බුදීප පෙයාලයන්හා; යොජයෙ, යොදන්නේය.

114 ආරඤ්ඤකං පිණ්ඩපාතං පංසුකූලං තිචීවරං,
ධම්මකථිකවිනයෙන බාහුසච්චථාවරෙය්‍යකා. 11.

114 ආරඤ්ඤකං, ආරන්‍යක සූත්‍රය; පිණ්ඩපාතං, පිණ්ඩපාතික සූත්‍රය; පංසුකූලං, පාංසුකූලික සූත්‍රය; තිචීවරං, තෛචීවරික සූත්‍රය; ධම්මකථිකා, ධර්මකථික සූත්‍රය; විනයෙන, විනයධර සූත්‍රයහා; බාහුසච්චථාවරෙය්‍යකා, බාහුසච්ච ථාවිරෙය්‍ය සූත්‍රයෝය.

115 සම්පදා චෙව පරිවාරං කොලපුත්ති මථාපරං,
වණ්ණපොක්ඛරකල්‍යාණ අප්පිච්ඡං අප්පබාධතා. 12

115 සම්පදා, ආත්මසම්පදා පරිවාරසම්පදා යන; චෙව, සූත්‍රද්වයය; පරිවාරං, මහාපරිවාර සූත්‍රය; අථ, වැලි; අපරං, අන්‍යවූ; කොලපුත්ති, කොලපුත්ති සූත්‍රය; වණ්ණපොක්ඛරකල්‍යාණ, වණ්ණපොක්ඛර සූත්‍රයහා කල්‍යාණවාක්කරණ සූත්‍රය යන දෙකය; අප්පිච්ඡං, අල්පේච්ඡ සූත්‍රය; අප්පබාධතා, අල්පාබාධ සූත්‍රය.

116 ඣානා මෙත්තූපට්ඨානා පධානිද්ධිපාදඉන්ද්‍රියබලබොජ්ඣඞ්ගා
මග්ගා අභිභායතනං විමොක්ඛකසිණෙන වීසතත්තරි. 13.

116 ඣානා, (ප්‍රථමධ්‍යානාදි) ධ්‍යාන සූත්‍ර චතුෂ්කය; මෙත්ති, මෛත්‍ර්‍යාදි චෙතොවිමුක්ති සූත්‍ර චතුෂ්කය; උපට්ඨානා, (කායානුපස්සනාදි) ස්මෘතිප්‍රස්ථාන සූත්‍ර චතුෂ්කය; පධාන, සම්‍යක් ප්‍රධාන සූත්‍ර චතුෂ්කය; ඉද්ධිපාද,(ඡන්දිද්ධිපාදාදි)ඍද්ධිපාද සූත්‍ර චතුෂ්කය; ඉන්ද්‍රිය, (ශ්‍රද්ධෙන්ද්‍රියාදි)ඉන්ද්‍රිය සූත්‍ර පඤ්චකය; බල, (ශ්‍රද්ධාබලාදි)බල සූත්‍ර පඤ්චකය; බොජ්ඣඞ්ගා,(ස්මෘතිසම්බොධ්‍යඞ්ගාදි)බොධ්‍යඞ්ග සූත්‍ර සප්තකය; මග්ගා, සම්‍යක්දෘෂ්ටි ආදි) මාර්ග සූත්‍ර අෂ්ටකය; අභිභායතනං, අභිභායතන සූත්‍ර අෂ්ටකය; විමොක්ඛ, විමොක්ෂ සූත්‍ර අෂ්ටකය හා; කසිණෙන, (පෘථිවි කෘත්ස්නාදි) කෘත්ස්න සූත්‍ර ඒකාදශකයෙන් යුක්තවූ; වීසතත්තරි,(මේ) විසප්තති සූත්‍රයෝය.

117 සඤ්ඤා අනුස්සතිජ්ඣාන සහගතෙහි යොජයෙ,
ජුමටා සංවෙගා පස්සද්ධි අකුසලං කුසලෙනච. 14:

117 සඤ්ඤා,(අශුභ සංඥාදි)සංඥා සූත්‍ර විංශතිය; අනුස්සති,(බුද්ධානුස්මෘති ආදි) අනුස්මෘති සූත්‍ර දශකය; ඣානසහගතෙහි, ධ්‍යාන සහගතයන්ගෙන්; (හෙවත්)ප්‍රථමධ්‍යානාදිය සහගතවූ ඉන්ද්‍රියපඤ්චක බලපඤ්චක යන්ගෙන් (සමයිති සූත්‍රකොතෙක යනමේ සූත්‍රයෝ); යොජයෙ, ("අච්ඡරාසඞ්ඝාත මත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු පඨමජ්ඣාන සහගතං සද්ධින්ද්‍රියං භාවෙති" යනාදීන්) යොදන්නේය; ජුටො, ජුට සූත්‍රය; සංවෙගා, සංවෙග සූත්‍රය ආදි කොටඇති සූත්‍රසප්තකය; පස්සද්ධි, ප්‍රශ්‍රබ්ධි සූත්‍ර චතුෂ්කය; අකුසලං, අකුසල සූත්‍රය; කුසලෙනච, කුසල සූත්‍ර යෙන් යුක්තය.

118 අවිජ්ජා පඤ්ඤාපභෙදො ච පටිවෙධො පටිසම්භිදා,
චතුරො ඵලෙන පටිලාභො වුද්ධිවෙපුල්ලතා මහා. 15.

118 අවිජ්ජා, අවිද්‍යාප්‍රහීණාදි සූත්‍ර පඤ්චකය; පඤ්ඤාපභෙදො ච; ප්‍රඥාප්‍රභෙද අනුප්පාදපරිනිර්වාණ යන සූත්‍රද්වයය; පටිවෙධො, අනෙකධාතු නානාධාතු ප්‍රතිවෙධ සූත්‍රද්වයය; පටිසම්භිදා, ප්‍රතිසංවිත් සූත්‍රය; ඵලෙන, ශ්‍රොතාපත්ති ආදි චතුර්මාර්ගඵලයෙන් යුක්තවූ;

චතුරො, සූත්‍රචතුෂ්කය; පටිලාභො; ප්‍රඥප්‍රතිලාභ සූත්‍රය; වුඩ්ඪි, ප්‍රඥ වෘද්ධි සූත්‍රය; වෙපුල්ලතා, ප්‍රඥ වෛපුල්‍ය සූත්‍රය; මහා, මහා ප්‍රඥ සූත්‍රය.

119 පුථු විපුලඤ්ච ගම්භීරං අසාමන්තඤ්ච භූරිච,
බාහුල්ල සීඝ ලහු හාසු ජවන තික්ඛ නිබ්බෙධිකං. 16.

119 පුථු, පෘථුප්‍රඥසූත්‍රය; විපුලං, විපුලප්‍රඥසූත්‍රය; ගම්භීරං, ගම්භීර ප්‍රඥසූත්‍රය; අසාමන්තං, අශ්‍රාමන්තප්‍රඥසූත්‍රය; භූරි, භූරිප්‍රඥසූත්‍රය; බාහු, ප්‍රඥබාහුල්‍ය සූත්‍රය; සීඝ, සීඝ්‍රප්‍රඥ සූත්‍රය; ලහු, ලඝුප්‍රඥ සූත්‍රය; හාසු, හාශුප්‍රඥ සූත්‍රය; ජවන, ජවන ප්‍රඥ සූත්‍රය; තික්ඛ, තීක්ෂ්ණ ප්‍රඥ සූත්‍රය; නිබ්බෙධිකං, නිර්වේධිකප්‍රඥ සූත්‍රය.

120 භුජන්තිච පරිභුත්තා පරිජිත විරද්ධපමාද පම්මුට්ඨා,
සෙවනභාවනබහුලා අභිඤ්ඤපරිඤ්ඤච අථො
සච්ඡිකිරියායා'ති. 17.

**එකක නිපාතුද්දානං සමත්තං**

---

120 භුජන්ති, අපරිභුඤ්ජ පරිභුඤ්ජ සූත්‍රමයය; පරිභුත්තා, අපරිභුත්ත, පරිභුත්ත සූත්‍රමයය; පරිජිත, පරජිත අපරිජිත සූත්‍රමයය; විරද්ධ, විරද්ධ ආරද්ධ සූත්‍රමයය; පමාද, ප්‍රමාද අප්‍රමාද සූත්‍රමයය; පම්මුට්ඨා, පම්මුට්ඨ අපම්මුට්ඨ සූත්‍රමයය; සෙවන, අනාසෙවිත ආසෙවිත සූත්‍රමයය; භාවන, අභාවිතභාවිත සූත්‍රමයය; බහුලා, අබහුලීකෘත බහුලීකෘත සූත්‍රමයය; අභිඤ්ඤ, අනභිඥාත අභිඥාත සූත්‍රමයය; පරිඤ්ඤ, අපරිඥාත පරිඥාත සූත්‍රමයය, අථො, වැලි; සච්ඡිකිරියාය, අසාක්ෂාත්කෘත සාක්ෂාත්කෘත සූත්‍රමයය; ඉති, යන මෙකීසූත්‍රයෝ (එකකනිපාතයෙහි වෙත්).

# එකක නිපාත උද්දාන ගාථාර්ථ විවරණයයි.

---

121 වජ්ජපධානා තපනීයා උපඤ්ඤතෙන පඤ්චමං,
සඞ්ඤජනං කණ්හසුක්කං පාලං වස්සූපනායිකං. 18.

121 වජ්ජ, ("ද්වෙමානි භික්ඛවෙ වජ්ජානි" යනාදීන් වදාළ) වද්‍ය සූත්‍රය; පධානා, ("ද්වෙමානි භික්ඛවෙ පධානානි" යනාදීන් වදාළ) ප්‍රධාන සූත්‍රය; තපනීයා, තපනීය අතපනීය සූත්‍රමයය; උපඤ්ඤතෙන, උපඤ්ඤත පදයෙන් උපලක්ෂිතවූ, පඤ්චමං, පස්වැනි සූත්‍රය; (නොහොත්) උපඤ්ඤතෙන පඤ්චමා, පස්

වැනිවූ උපක්ඛුත සූත්‍රයහා; සංඛෙඛ්‍යජනං, සංයොජනීය සූත්‍රය; තණ්හාසුත්තං, තෘෂ්ණ ශුකල සූත්‍රවයය; පාලං. ලොකපාල සූත්‍රය;චක්ඛුපතාධිකං, චක්ඛුපතාධිකා සූත්‍රය.

122 බලබොජ්ඣඞ්ගඣානෙන දෙසනාධිකරණෙන ච,
අධම්මචරියා අකතතාතා එකංසං අකුසලං සමෙම්මාසා.19.

122 බල, බල සූත්‍රය; බොජ්ඣඞ්ග, බොධ්‍යඞ්ග සූත්‍රය;ඣානෙන, ධ්‍යාන සූත්‍රය යන මෙසින්හා; දෙසනා, ධර්ම්මදෙශනා සූත්‍රය; අධිකරණෙනච, අධිකරණ සූත්‍රයෙන්ද (යුක්තාග); අධම්මචරියා, අධර්ම්මචය්‍ය්‍යා සූත්‍රය; අකතඤ්ඤුතා, අකෘතඥ සූත්‍රය; එකංසං, එකාන්ත සූත්‍රය; අකුසලං, අකුශල සූත්‍රය; සමෙම්මාසා, සමෙම්මාස අසමෙම්මාස සූත්‍රවයය.

123 බාලො දුට්ඨො භාසිතක්ඛ නෙයාත්‍ථා පටිවජ්ජනාකො,
දිට්ඨි සීලෙන අරඤ්ඤ ඵ විජ්ජාභාගියෙන ච. 20.

123 බාලො, බාල සූත්‍රය; දුට්ඨො, දුෂ්ට සූත්‍රය; භාසිතක්ඛ, භාෂිත සූත්‍රය; නෙයාත්‍ථා, නෙයාර්ථ නීතාර්ථ සූත්‍රවයය; පටිවජ්ජනාකො, ප්‍රතිච්ඡන්නකම්‍ාන්ත සූත්‍රය, දිට්ඨි, දෘෂ්ටි සූත්‍රය; සීලෙන, ශීලසූත්‍රයහා; අරඤ්ඤ, අරණ්‍යසූත්‍රය; ඵ, වැලි; විජ්ජාභාගියෙනච, විද්‍යාභාගිය සූත්‍රයෙන්ද (යුක්තාය).

124 භූමි දුප්පතිකාරො කිංවාදි දක්ඛිණෙය්‍යසමචිත්තා,
වරණ මධුරකචොරා පටිපත්ති බ්‍යඤ්ජනපතිරූපා. 21.

124 භූමි, (සත්පුරුෂා සත්පුරුෂ භූමිවය ප්‍රකාශක) භූමිසූත්‍රය, දුප්පතිකාරො, දුෂ්ප්‍රතිකාර සූත්‍රය; කිංවාදි, කිංවාදි සූත්‍රය; දක්ඛිණෙය්‍ය සමචිත්තා, දක්ෂිණෙය සූත්‍රයගා සමචිත්ත සූත්‍රය යන දෙකය; වරණ, වරණ සූත්‍රය; මධුරකචොරා, මධුර සූත්‍රයහා චෞරසූත්‍රය යන දෙකය; පටිපත්ති; ප්‍රතිපත්ති සූත්‍රය; බ්‍යඤ්ජන පතිරූපා, ව්‍යඤ්ජනප්‍රතිරූපක සූත්‍රය.

125 උත්තානා වග්ගා අග්ගවතී අරියා කසටෙන පඤ්චමං;
උක්කාචිතආමිසගරු විසමාධම්මිකාධම්මවාදින්. 22.

125 උත්තානා, උත්තානපරිස සූත්‍රය; වග්ගා, වර්ග්‍ගපරිස සූත්‍රය; අග්ගවතී, අග්‍රවතී පරිස සූත්‍රය; අරියා, ආය්‍ය්‍යපරිස සූත්‍රය; කසටෙන, කසට පදයෙන් උපලක්ෂිතවූ; පඤ්චමං, පස්වැනි සූත්‍රය; (නොහොත්) කසටෙන පඤ්චමං, පස්වැනිවූ පරිසකසට සූත්‍රයහා; උක්කාචිත, උක්කාචනවිනීත සූත්‍රය; ආමිසගරු, ආමිස ගරුසූත්‍රය; විසමා, විෂමපරිස සූත්‍රය; අධම්මිකා, අධාර්ම්මික සූත්‍රය; අධම්මවාදිනි, අධර්ම්මවාදිනි සූත්‍රය.

126 ඝිතඅවෙජ්රකාණුතපපඨූපාරගා අථොපි වෙබුඛා,
අසනි තයො කිම්පුරිසා විජයනාථ සන්නිවාස }
සංසාරෙනා ච. 23. }

126 ඝිත, ජනඝිත සූත්‍රය; අවෙජ්රක, ආශ්චර්‍ය්‍ය සූත්‍රය; අනුතපප, අනුතපප සූත්‍රය; ථූපාරහා, ස්තූපාර්හ සූත්‍රය; අථොපි, වැලිදු; වෙබුඛා, විබුඛ සූත්‍රය; අසනිතයො, අසනි සූත්‍රත්‍රයය; කිම්පුරිසා, කිම්පුරුෂ සූත්‍රය; විජයනා, විජයන සූත්‍රය; අථ, යලි; සන්නිවාස, සන්නිවාස සූත්‍රයහා; සංසාරෙනාච, දාග්සංසාර සූත්‍රයෙන්ද (පූකතය).

127 ගිහී ච කාමඋපධි සාසවං සාමිසං තථා,
රිය කායපීතිසාත සම්බාධාරම්මණානිච. 24.

127 ගිහීච, ගිහීසුඛ සූත්‍රය; කාම, කාමසුඛ සූත්‍රය; උපධි, උපධිසුඛ සූත්‍රය; සාසවං, සාසවසුඛ සූත්‍රය; තථා, එසේම; සාමිසං, සාමිසසුඛ සූත්‍රය; අරිය, ආර්‍ය්‍යසුඛ සූත්‍රය; කාය, කායිකසුඛ සූත්‍රය; පීති, ප්‍රීතිසුඛ සූත්‍රය; සාත, සාතසුඛ සූත්‍රය; සමාධි, සමාධිසුඛ සූත්‍රය; ආරම්මණානිච, ආරම්මණ සූත්‍රත්‍රයය.

128 නිමිත්තඤ්ච නිදානඤ්ච හෙතු සඞ්ඛාරපච්චයා,
රූපං වෙදයිතං සඤ්ඤං විඤ්ඤාණංයඤ්ච සඞ්ඛතං. 25.

128 නිමිත්තඤ්ච, නිමිත්ත සූත්‍රය; නිදානඤ්ච, නිදාන සූත්‍රය; හෙතු, හෙතු සූත්‍රය; සඞ්ඛාර, සංස්කාර සූත්‍රය; පච්චයා, ප්‍රත්‍යය සූත්‍රය; රූපං, රූප සූත්‍රය; වෙදයිතං, වෙදනා සූත්‍රය; සඤ්ඤං, සංඥා සූත්‍රය; විඤ්ඤාණං, විඥානසූත්‍රය; යඤ්ච සඞ්ඛතං, යම් සංස්කෘත සූත්‍රයක් වේද (එයය).

129 විමුත්ති පග්ගහො නාමං විජ්ජා භවෙසුදිට්ඨි ච,
අත්රි හිරි දොවචස්සා ධාතු ආපත්තිකුසලතා, 26.

129 විමුත්ති, විමුක්ති සූත්‍රය; පග්ගහො, ප්‍රග්‍රාහ සූත්‍රය; නාමං, නාමරූප සූත්‍රය; විජ්ජා, විද්‍යා සූත්‍රය; භවෙසුදිට්ඨිච, භවදෘෂ්ටි සූත්‍රය; අහිරි, අහිරික සූත්‍රය; හිරි, හ්‍රී සූත්‍රය; දොවචස්සා, දෞර්වචස්‍ය සෞවචස්‍ය සූත්‍රවයය; ධාතු, ධාතු (කෞශල්‍ය) සූත්‍රය; ආපත්තිකුසලතා, ආපත්තිකෞශල්‍ය සූත්‍රය.

130 බාලාච කප්පියාපත්ති අධම්මොවිනයෙන ච,
කුක්කුච්ච කප්පියාපත්ති අධම්මො විනයෙන ච. 27.

130 බාලාච, බාල පණ්ඩිත සූත්‍රවයය; කප්පියා, කප්පිය අකප්පිය සූත්‍රවයය; ආපත්ති, ආපත්ති අනාපත්ති සූත්‍රවයය; අධම්මො, ධම්ම අධම්ම සූත්‍රවයය; අවිනයෙනච, විනය අවිනය සූත්‍රවය

හා; කුක්කුච්ච, කුක්කුච්ච න කුක්කුච්ච සූත්‍රද්වයය; කප්පියා, කප්පිය අකප්පිය සූත්‍රද්වයය; ආපත්ති, ආපත්ති අනාපත්ති සූත්‍රද්වයය; අධම්මා, ධම්ම අධම්ම සූත්‍රද්වයය; අවිනයෙනච, විනය අවිනය සූත්‍රද්වයෙන්ද (ද්වාදසය).

131 ආසා ච දුල්ලභා ආරිචි | තිත්තො දුත්තප්පසුතප්පයා,
සුභනිමිත්තඤ්ච පටිඝ නිමිත්තඤ්ච තථාපරං,
පරතොඝොසා ච ලඞ්ඝුකං දුටඨුල්ලං සාවසෙසකං. 28.

131 ආසාච, ආශා සූත්‍රය, දුල්ලභකාරීච, දුල්ලභකාරී සූත්‍රය; තිත්තො, තෘප්ත සූත්‍රය; දුත්තප්පසුතප්පයා, දුතර්පය සුතර්පය යන සූත්‍රද්වයය; සුභනිමිත්තඤ්ච, ශුභනිමිත්තසූත්‍රය; තථා, එසේම; අපරං, අන්‍යවූ; පටිඝනිමිත්තඤ්ච, ප්‍රතිඝනිමිත්ත සූත්‍රය; පරතොඝොසාච, පරතොඝොස සූත්‍රද්වයය; ලඞ්ඝුකං, ලඞ්ඝුකාපත්තිසූත්‍රය; දුට්ඨුල්ලා, දුට්ඨුල්ලාපත්ති සූත්‍රය; සාවසෙසකං, සාවසෙසාපත්ති සූත්‍රය.

132 අයාචනා ච චත්තාරො ඛන්ති ච තදුපරි,
චතුසි චිත්තචොදනං කොධා තදවිනයෙනච. 29.

132 චත්තාරො අයාචනාච, අයාචනා සූත්‍ර සතරය; තදුපරි, ඉන් මත්තෙහිවූ; චතුසි ඛන්තිච, ක්ෂාන්ති සූත්‍රසතරහා; චිත්තචොදනං, සචිත්තචොදනා සූත්‍රය; කොධං, ක්‍රොධසූත්‍රය; තදවිනයෙනච, ක්‍රොධවිනය සූත්‍රයෙන්ද (ද්වාදසය).

133 දානං යාගං චාගං පරිච්චාගඤ්ච භොග සම්භොගා,
සංවිභාගඤ්චසංගහ මනුග්ගහ මථොපිඅනුකම්පනච. 30.

133 දානං, දාන සූත්‍රය; යාගං, යාග සූත්‍රය, චාගං, ත්‍යාග සූත්‍රය; පරිච්චාගං, පරිත්‍යාග සූත්‍රය; භොග, භොග සූත්‍රය; සම්භොගා, සම්භොග සූත්‍රය; සංවිභාගං, සංවිභාග සූත්‍රය; සඞ්ගහං, සංග්‍රහසූත්‍රය; අනුග්ගහං, අනුග්‍රහ සූත්‍රය; අථොපි, වැලිදු; අනුකම්පනච, අනුකම්පා සූත්‍රයෙන්ද (ද්වාදසය).

134 සන්ථාරො පටිසන්ථාරො එසනා පරියෙසනා,
පරියෙට්ඨි පූජා අතිථෙය්‍යං ඉද්ධිවුඩ්ඪිරතනසන්නිචය
වෙපුල්ලා. 31.

134 සන්ථාරො, සන්ථාර සූත්‍රය; පටිසන්ථාරො, ප්‍රතිසන්ථාර සූත්‍රය; එසනා, එෂණා සූත්‍රය: පරියෙසනා, පර්‍ය්‍යෙෂණා සූත්‍රය; පරියෙට්ඨි, පරියෙට්ඨි සූත්‍රය; පූජා, පූජා සූත්‍රය; අතිථෙය්‍යං, අතිථෙය්‍ය සූත්‍රය; ඉද්ධි, සෘද්ධි සූත්‍රය; වුඩ්ඪි, වෘද්ධි සූත්‍රය; රතන, රත්න සූත්‍රය; සන්නිචය, සන්නිචය සූත්‍රය; වෙපුල්ලා, වෛපුල්‍ය සූත්‍රය.

135 සමාපත්ති අජ්ජවඤ්ච ඛන්ති සාඛල්‍යං අවිහිංසා,
වෙ ඉන්ද්‍රියා පටිසඞ්ඛානං සති සමථො විපත්ති සම්පදා,
විසුද්ධි දිට්ඨි අසන්තුට්ඨි මුට්ඨසච්චෙන සතියා ච. 32.

135 සමාපත්ති, සමාපත්ති සූත්‍රය; අජ්ජවං, අජ්ජව සූත්‍රය; ඛන්ති, ක්ෂාන්ති සූත්‍රය, සාඛල්‍යං, සාඛල්‍ය සූත්‍රය; අවිහිංසා, අවිහිංසා සූත්‍රය; වෙ ඉන්ද්‍රියා, ඉන්ද්‍රිය සූත්‍රවයය; පටිසඞ්ඛානං, ප්‍රතිසංඛාන සූත්‍රය; සති, ස්මෘතිබල සූත්‍රය; සමථො, සමථ සූත්‍රය; විපත්ති, විපත්ති සූත්‍රය; සම්පදා, සම්පදා සූත්‍රය; විසුද්ධි, විශුද්ධි සූත්‍රය; දිට්ඨි, දෘෂ්ටි සූත්‍රය, අසන්තුට්ඨි, අසන්තුෂ්ටිතා සූත්‍රය; මුට්ඨසච්චෙන, මුට්ඨස්මෘති සූත්‍රයහා; සතියාච, ස්මෘති සූත්‍රයෙන්ද (යුක්තය).

136 ධම්මා දුක්ඛසුඛා සෙඛා නිබ්බත්තෙකච්ච අකුසලා,
වජ්ජුද්‍රයං විපාකඤ්ච ව්‍යාපෙජ්ඣන සත්තං භවෙ. 33.

136 ධම්මා, ධම්ම සූත්‍ර දශකය; දුක්ඛ සුඛා, දුඃඛසුඛ සූත්‍ර දශකය; සෙඛා, ශෛක්ෂ සූත්‍ර දශකය, නිබ්බත්ත, නිෂ්පන්න සූත්‍ර දශකය; එකච්ච, එකච්ච සූත්‍ර දශකය; අකුසලා, කුශලා කුශල සූත්‍ර දශකය; වජ්ජ, සාවද්‍යානවද්‍ය සූත්‍ර දශකය; උද්‍රයං, දුක්ඛුද්‍රය සුඛුද්‍රය සූත්‍ර දශකය, විපාකං, දුඃඛවිපාක සුඛවිපාක සූත්‍ර දශකය; ව්‍යාපෙජ්ඣන, සව්‍යාපජ්ඣ අව්‍යාපජ්ඣ සූත්‍ර දශකයහා; සත්තංභ වෙ, (ක්‍රොධ වර්ගයෙහි සූත්‍ර) සියයෙක් වේ.

137 සික්ඛාපදා දස තයො පාතිමොක්ඛා වෙ පවාරණා,
තජ්ජනීයං නියස්සඤ්ච පබ්බාජනියඤ්ච සාරණීං. 34.

137 සික්ඛාපදා, ශික්ෂාපද සූත්‍රයෝ; දස, දසදෙනය; පාතිමොක්ඛා, ප්‍රාතිමොක්ෂ සූත්‍රයෝ; තයො, ත්‍රි දශකය; පවාරණා, පවාරණා සූත්‍රයෝ; වෙ, වි දශකය; තජ්ජනීයං, තජ්ජනීය සූත්‍ර දශකය; නියස්සං, නියස්ස සූත්‍ර දශකය; පබ්බාජනීයං, පබ්බාජනීය සූත්‍ර දශකය; සාරණීං, ප්‍රතිසාරණීය සූත්‍ර දශකය.

138 උක්ඛෙපො පරිවාසො ච මූල මානත්ත අබ්භානං,
සාරණා වෙ ච උපසම්පන්ති තිස්සො චඤත්තියො. 35.

138 උක්ඛෙපො, උක්ෂෙපනීය සූත්‍ර දශකය; පරිවාසොච, පරිවාසදාන සූත්‍ර දශකය; මූල, මූලායප්‍රතිකර්ෂණ සූත්‍ර දශකය; මානත්ත, මානත්තදාන සූත්‍ර දශකය, අබ්භානං, අබ්භාන සූත්‍ර දශකය; සාරණා, ඔසාරණීය නිස්සාරණීය සූත්‍රයෝ; වෙච, වි දශකය; උපසම්පන්ති, උපසම්පදා සූත්‍ර දශකය; ඤත්තියො, ඥප්ති සූත්‍රයෝ; තිස්සොච, ත්‍රි දශකය.

139 පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති සම්මුඛාවිනයො පි ච,
සති අමූළ්හවිනයා පටිඤ්ඤාතකරණං තථා,
යෙභුය්‍ය පාපිය්‍යසිකා තිණවත්ථාරකෙන චා'ති. 36.

**දුකනිපාතුද්දානං සමත්තං.**

139 පඤ්ඤත්ති, ප්‍රඥප්ති සූත්‍ර දශකය; අනුපඤ්ඤත්ති, අනුප්‍රඥප්ති සූත්‍රදශකය; අපිච, වැලිදු; සම්මුඛාවිනයො, සම්මුඛාවිනය සූත්‍ර දශකය; සති අමූළ්හවිනයා, ස්මෘතිවිනය සූත්‍ර දශකයහා අමූළ්හවිනය සූත්‍ර දශකය; තථා, එසේම; පටිඤ්ඤාතකරණං, ප්‍රතිඥාතකරණ සූත්‍ර දශකය; යෙභුය්‍ය පාපිය්‍යසිකා, යෙභුය්‍යසිකා සූත්‍ර දශකයහා තස්ස පාපිය්‍යසිකා සූත්‍ර දශකය; තිණවත්ථාරකෙන ච, තෘණවස්තාරක සූත්‍ර දශකයහා; ඉති, මෙසේ මේ සූත්‍රයෝ (ඒක නිපාතයෙහි වෙත්).

# ඒකනිපාත උද්දාන ගාථාර්ථ විවරණයයි.

140 භය ලක්ඛණ චින්තා ච අච්චයං ච අයොනිසො,
අකුසලඤ්ච සාවජ්ජං සව්‍යාපජ්ඣං ඛතං මලං. 37.

140 භය, ("යානි කානිචි භික්ඛවෙ භයානි උප්පජ්ජන්ති, යනාදීන් වදාළ) භය සූත්‍රය; ලක්ඛණ, ("කම්මලක්ඛණො භික්ඛවෙ බාලො,, යනාදීන් වදාළ) කර්මලක්ෂණ සූත්‍රය; චින්තාච, චින්තා සූත්‍රය; අච්චයංච, අච්චය සූත්‍රය; අයොනිසො, අයොනිශො ප්‍රශ්න සූත්‍රය; අකුසලංච, අකුශල සූත්‍රය; සාවජ්ජං, සාවද්‍ය සූත්‍රය; සව්‍යාපජ්ඣං, සව්‍යාපජ්ඣ සූත්‍රය; ඛතං, ක්ෂත සූත්‍රය; මලං, මල සූත්‍රය.

141 ඤාතකො සරණීයො නිරාසො චක්කවත්ති පචෙතනො,
අපණ්ණකත්තා දෙවො ච දුවෙ පාපණිකා පරෙ. 38.

141 ඤාතකො, ඥාතක සූත්‍රය; සරණීයො, සරණීය සූත්‍රය; නිරාසො, නිරාශා සූත්‍රය; චක්කවත්ති, චක්‍රවර්ති සූත්‍රය; පචෙතනො, පචෙතන සූත්‍රය; අපණ්ණකො, අපණ්ණකප්‍රතිපදා සූත්‍රය; අත්තා, අත්තව්‍යාබාධ සූත්‍රය; දෙවොච, දෙවලොකූපපත්ති සූත්‍රය; අපරෙ, අන්‍යවූ; දුවෙ පාපණිකා, පාපණික සූත්‍ර ද්වය.

142 කායසක්ඛි ගිලානො සංඛාරෙ බහුකාරෙ අරුකූපමො,
අසෙවිතබ්බො ජෙගුච්ඡි පූපථභාණී අන්ධො අව
කුජ්ජෙන ච. 39.

142 කායසක්ඛි, කායසාක්ෂි සූත්‍රය; ගිලානො, ගිලාන සූත්‍රය; සංඛාරෙ, සංස්කාර සූත්‍රය; බහුකාරෙ, බහුකාර සූත්‍රය; අරුකූපමො, අරුකූපම සූත්‍රය; අසෙවිතබ්බො, අසෙවිතව්‍ය සූත්‍රය; ජෙගුච්ඡි, ජුගුප්සිතව්‍ය සූත්‍රය; පූපථභාණී, දූෂ්පභාණී සූත්‍රය; අන්ධො, අන්ධ සූත්‍රය; අවකුජ්ජෙනච, අවකුජ්ජප්‍රඥ සූත්‍රයෙන්ද (සූකතය).

143 සබ්‍රහ්මකානනුසාරිපුත්ත නිදානා හත්ථාලවකෙන ච,
දෙවදූතො මෙ විචාරා සුබ්‍රහ්මාලාධි පතෙය්‍යකා. 40.

143 සබ්‍රහ්මකානනු සාරිපුත්ත නිදානා, සබ්‍රහ්මක සූත්‍රය ආනන්ද සූත්‍රය ශාරිපුත්‍ර සූත්‍රය කර්මනිදාන සූත්‍රය (යන සූත්‍ර චතුෂ්කය); හත්ථාලවකෙනච, හස්තාලවක සූත්‍රයහා; දෙවදූතො, දෙවදූත සූත්‍රය; මෙ විචාරා, ලොකානු විචරණ සූත්‍රද්වයය; සුබ්‍රහ්මාල ආධිපතෙය්‍යකා, සුබ්‍රහ්මාල සූත්‍රය ආධිපතෙය්‍ය සූත්‍රය (යන සූත්‍රද්වයය).

144 සම්මුඛිට්ඨාන පර පවත්තනී පණ්ඩිතසීලවා,
සඞ්ඛතං පබ්බතාතප්පං මහාචොරෙන තෙ දස. 41.

144 සම්මුඛී, සම්මුඛීභාව සූත්‍රය; ඨාන, ස්ථාන සූත්‍රය; පර, පරධර්මදෙශනා සූත්‍රය; පවත්තනී, කථාප්‍රවර්තිනී සූත්‍රය; පණ්ඩිතසීලවා, පණ්ඩිතප්‍රඥප්ත සූත්‍රයහා ශීලවන්ත සූත්‍රය (යන දෙකය); සංඛතං, සංස්කෘත ලක්ෂණ සූත්‍රය; පබ්බතං, පර්වතරාජ සූත්‍රය; ආතප්පං, ආතප්ප සූත්‍රය; මහාචොරෙන, මහා චෞර සූත්‍රයහා; තෙ, ඒ (චූල වර්ගයෙහි) සූත්‍රයෝ; දස, දශකයෙක් වෙති.

145 වෙජිණ්ණාබ්‍රාහ්මණපරිබ්බාජකා නිබ්බාණමහාසාලෙනච,
වච්ඡගොත්තකඩ්ඪ තිකණ්ණා ජානුස්සොණී සඞ්ගා
රවො. 42.

145 වේජිණ්ණා, ජිණ්ණබ්‍රාහ්මණ සූත්‍රද්වයය; බ්‍රාහ්මණ පරිබ්බාජකා, අන්‍යතරබ්‍රාහ්මණ සූත්‍රය බ්‍රාහ්මණපරිව්‍රාජක සූත්‍රය (යන දෙකය); නිබ්බාණ, නිර්වාණ සූත්‍රය; මහාසාලෙනච, මහාසාර සූත්‍රයහා; වච්ඡගොත්තකඩ්ඪ, වත්සගොත්‍ර සූත්‍රය; තිකණ්ණා, ත්‍රිකර්ණ සූත්‍රය; ජානුස්සොණී, ජානුශ්‍රොණී සූත්‍රය; සඞ්ගාරවො, සඞ්ගාරව සූත්‍රය.

146 තිත්ථං භයඤ්ච වෙනාගො සරභො කෙසපුත්තියො,
සාළ්හා ච කථාවත්ථු අඤ්ඤතිත්ථියා කුසලමූලා
පොසථඞ්ගන තෙ දස 43.

146 තිත්ථං, තිත්ථායතන සූත්‍රය; භයඤ්ච, අමාතා පුත්තිකභය සූත්‍රය; වෙනාගො, වේනාගපුරික සූත්‍රය; සරභො, සරභ සූත්‍රය; කෙසපුත්තියො, කෙසපුත්තිය සූත්‍රය; සාළ්හාච, සාළ්හ සූත්‍රය; කථාවත්ථු, කථාවත්ථු සූත්‍රය; අඤ්ඤතිත්ථියා, අඤ්ඤතිත්ථික සූත්‍රය; අකුසලමූලා, අකුශලමූල සූත්‍රය; උපොසථඞ්ගන, අෂ්ට උපොසථාඞ්ගයන් ගෙන් (යුක්තවූ ඒසාඛුපොසථ සූත්‍රයහා); තෙ, ඒ (මහාවර්ගයෙහි) සූත්‍රයෝ; දස, දශයෙක් වෙත්.

147 ඡන්නොආජීවකොසක්කොනිගණ්ඨාසමාදපෙතබ්බා,
භව චෙතනුපට්ඨාන ගන්ධ අභිභූනා සහ. 44.

147 ඡන්නො, ඡන්න සූත්‍රය; ආජීවකො, ආජීවක සූත්‍රය; සක්කො, මහානාමසාක්‍ය සූත්‍රය; නිගණ්ඨො, නිගණ්ඨනාථපුත්‍ර සූත්‍රය; සමාදපෙතබ්බා, සමාදපෙතව්‍ය සූත්‍රය; භව, භව සූත්‍රය; චෙතනා, චෙතනා සූත්‍රය; උපට්ඨාන, උපස්ථානසාර සූත්‍රය; ගන්ධ, ගන්ධජාත සූත්‍රය; අභිභූනාසහ, අභිභූ සූත්‍රයහා සමගය.

148 සමාදානං ගද්‍රභං ඛෙත්තං වජ්ජිපුත්තං සෙඛ පඤ්චමං;
සාධිකාතයො ච සික්ඛා අථපඞ්කධා යෙනච. 45.

148 සමාදානං, සමාදාන සූත්‍රය; ගද්‍රභං, ගද්‍රභූපම සූත්‍රය; ඛෙත්තං, ඛෙත්තූපම සූත්‍රය; වජ්ජිපුත්තං, වජ්ජිපුත්තක සූත්‍රය; සෙඛපඤ්චමං, පස්වැනිවූ ශෛක්‍ෂ සූත්‍රය; තයොසාධිකා, සාධික සූත්‍රත්‍රයය; සික්ඛා, ශික්‍ෂා සූත්‍රද්වයය; අථ, වැලි; පඞ්කධා යෙනච, පඞ්කධාය සූත්‍රයෙන්ද (යුක්තය).

149 අච්චායිකඤ්ච පවිවෙකං අරියං පරිසෙනච,
තයොආජානීයා වුත්තා අථපොත්ථකලොණ ඵලෙන
පංසුධොවක සුවණ්ණ කාරෙනච. 46.

149 අච්චායිකං, අත්‍යයික සූත්‍රය; පවිවෙකං, ප්‍රවිවෙක සූත්‍රය; අරියං, ආර්‍යශ්‍රාවක සූත්‍රය; පරිසෙන, පරිෂ සූත්‍රයහා; වුත්තා, වදාරණ ලද්දාවූ, තයොආජානීයා, ආජානීය සූත්‍රත්‍රයය; අථ, වැලි; පොත්ථකලොණ ඵලෙන, පොත්ථකූපම ලොණඵලූපම සූත්‍රව යෙන්හා; පංසුධොවක සුවණ්ණකාරෙනච, පංසුධොවකූපමසුවණ්ණකාරූපම සූත්‍රවයෙන්ද (යුක්තය).

150 පුබ්බපරියෙසනා අස්සාදෙ, සාමඤ්ඤං රුණ්ණපඤ්චමං,
අතිත්තිචෙව ද්වෙ කූටා නිදානානි අපරෙ දුවෙ. 47.

150 පුබ්බපරියෙසනා, පූර්වසංකල්පනාසූත්‍රය ආස්වාදපර්යෙෂණසූත්‍රය (යනදෙකය); අස්සාදෙ, ආස්වාදසාරදසූත්‍රය; සාමඤ්ඤං, ශ්‍රාමණ්‍යපීසූත්‍රය; රුණ්ණපඤ්චමං, පස්වැනිවූ රුණ්ණසූත්‍රය; අතිත්ති, අතෘප්තිසූත්‍රය; ද්වෙකූටා, කූටාගාරූපමසූත්‍රද්වයය; අපරෙ, අන්‍යවූ; දුවෙනිදානානි, කර්මනිදානසූත්‍රද්වයය.

151 ආපායිකො දුල්ලභො අප්පමෙය්‍යො
ආනඤ්ජායතනව් පත්තියො,
අපණ්ණකො කම්මන්තං ච
සොචෙය්‍ය මොනෙය්‍යනච. 48.

151 ආපායිකො, ආපායිකසූත්‍රය; දුල්ලභො, දුර්ලභප්‍රාදුර්භූතසූත්‍රය; අප්පමෙය්‍යො, අප්‍රමෙයසූත්‍රය; ආනඤ්ජායතනව්පත්තියො, ආකාශානඤ්චායතනසූත්‍රය ව්‍යපත්තිසූත්‍රය (යනදෙකය); අපණ්ණකො, අපණ්ණකමණිසූත්‍රය; කම්මන්තං, කර්මාන්තව්‍යපත්තිසූත්‍රය; චසොචෙය්‍ය, සෞචෙය්‍යසූත්‍රද්වයය; මොනෙය්‍යනච, මෞනෙය්‍යසූත්‍රයෙන්දසූත්‍රයය.

152 කුසිනාරං භණ්ඩනං ගොතමකං භරණ්ඩු හත්ථකෙනච,
කටුවියං ද්වෙ අනුරුද්ධා පටිච්ඡන්නපාසාණලෙඛූපමා. 49.

152 කුසිනාරං, කුසිනාරසූත්‍රය; භණ්ඩනා, භණ්ඩනසූත්‍රය; ගොතමකං, ගෞතමකසූත්‍රය; භරණ්ඩු, භරණ්ඩුකාලාමසූත්‍රය; හත්ථකෙනච, හත්ථකසූත්‍රයහා; කටුවියං, කටුවියසූත්‍රය; ද්වෙඅනුරුද්ධා, අනුරුද්ධසූත්‍රද්වයය; පටිච්ඡන්නපාසාණලෙඛූපමා, ප්‍රතිච්ඡන්නසූත්‍රය පාසාණලෙඛූපමසූත්‍රය (යනදෙකය).

153 යොධාජීවපරිසම්මිත්තා උප්පාදකෙසකම්බලසම්පදාවුඩ්ඪි,
තයොච අස්සඛලුඞ්කා තයොචාපරෙ මොරනිවාපා. 50.

153 යොධාජීවපරිසම්මිත්තා, යොධාජීවසූත්‍රය පරිෂත්සූත්‍රය මිත්‍රසූත්‍රය (යනතුණය); උප්පාද, උත්පාදසූත්‍රය; කෙසකම්බල, කෙශකම්බලොපමසූත්‍රය; සම්පදා, සම්පදාසූත්‍රය; වුඩ්ඪි, වෘද්ධිසූත්‍රය; තයොච අස්සඛලුඞ්කා, අශ්වඛලුඞ්ක-අශ්වසදෘශ-අශ්වාජානීය (යන) සූත්‍රත්‍රයය; අපරෙ, අන්‍යවූ; තයොච මොරනිවාපා, මොරනිවාපසූත්‍රත්‍රයය.

154 අකුසලඤ්ච සාවජ්ජං විසමං අසුචිනා සහ,
ඛතාච ගොනන්ති චත්තාරි වන්දනා සුතුබ්බෙණිහනවා'ති. 51

තිකනිපාතුද්දානං සමත්තං.

154 අකුසලන්ති,අකුශලසූත්‍රය; සාවජ්ජං, සාවද්‍යසූත්‍රය; විසමං, විෂමසූත්‍රය; අසුචිනාසහ, අශුචිසූත්‍රයහාසමග; චතතාරිබතාච, ක්‍ෂතසූත්‍රසතරය; වන්දනා, වන්දනාසූත්‍රය; සුපුබ්බණ්හනව, සුපු ර්වාහ්ණ සූත්‍රයෙන්ද යුක්තාය; ඉති, මෙසේ (මේසූත්‍රයෝ); හො නති, (ත්‍රිකනිපාතයෙහි) වෙත්.

**ත්‍රිකනිපාත උද්දාන ගාථාර්ථ විවරණයයි.**

---

**එකකනිපාත විකනිපාත ත්‍රිකනිපාතොද්දානාර්ථ සංවර්ණනාව සමාපතයි.**

---

# චතුෂ්ක නිපාතය.

155 සීලං සමාධි පඤ්ඤාච විමුත්තිච අනුත්තරා,
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා. 4.

155 යසස්සිනා, පරිවාරසම්පත්තියෙන් යුක්තවූ; ගොතමෙන, (ගෞතමගොත්‍රයෙහි උපන්හෙයින්) ගෞතමනම්වූ තථාගත යන්වහන්සේවිසින්; සීලං, (මාර්ගඵලසම්ප්‍රයුක්ත) ශීලයද; සමා ධි, (චිත්තෛකාග්‍රතා සංඛ්‍යාත) සමාධියද; පඤ්ඤාච, විදර්ශනාප්‍රඥා වද; විමුත්තිච, අර්හත්ඵලවිමුක්තියද (යන); අනුත්තරා, ලෝකො ත්තරවූ; ඉමෙධම්මා, මේධර්මයෝ; අනුබුද්ධා, අවබොධකරණ ලද්දාහ.

156 ඉතිබුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං,
දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතො'ති. 4.

156 බුද්ධො, සියල්ලදත්තාවූ සර්වඥයන්වහන්සේ; ඉති, මේප්‍ර කාරප්‍රකාරයෙන්; අභිඤ්ඤාය, විශිෂ්ටවූ ආයෂ්මාගීඥනයෙන් දැන; භික්ඛූනං, භික්‍ෂූන්ට; ධම්මං, චතුසසත්‍යධර්මය; අක්ඛාසි, දෙශ නාංකළේය; දුක්ඛස්ස, සංසාරදුඃඛයාතනා; අන්තකරො, කෙළ වරකළාවූ;චක්ඛුමා,පසැස්ඇත්තාවූ; සත්ථා, ශාස්තෲන්වහන්සේ; පරිනිබ්බුතො ඉති, කෙලශපරිනිර්වාණයෙන් පිරිනිවියේයයි (ව දාළසේක).

**පුර්වර්ගීයයහි පුර්වසූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

---

157 වුතා පතනයි පතිතා ගිද්ධාච පුනරාගතා,
කතකිච්චං රතං රම්මං සුඛෙනාන්වාගතං සුඛ'න්ති. 4.

157 චුතා, (ආයුෂ්මංගේ ශීලසමාධිප්‍රඥාදීමුනිත්ගෙන්) ගිලිහුණාහු; පතන්ති, (ධම්මවිනයසංඛ්‍යාත ශාසනයෙන්) වැටෙත්; පතිතා,(ශාසනයෙන්) වැටුනාහුද; ගිද්ධාච, (වස්තුකාමසංඛ්‍යාත රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය-යන පඤ්චකාමයෙහි ක්ලේශකාම සංඛ්‍යාතරාගයෙන්) ඇලුනාහුද; පුනරාගතා, නැවත (ජාතිජරාව්‍යාධිමරණයන්කරා) එළඹියානුවෙති; කතකිච්චං, (චතුසමාගීයෙන්) කරණලදකෘත්‍යයැති; රම්මං, * ඇලියයුතුවූ ශීලාදිගුණසමූහයෙහි; රතං, ඇලුනුනැතැත්තේ; සුඛෙනසුඛං, සැපයෙන් සැපයට; (හෙවත්) මනුෂ්‍යසැපයෙන් දිව්‍යසැපයට ධ්‍යානසැපයෙන් විදර්ශනාසැපයට විදර්ශනාසැපයෙන් මාර්ගසැපයට මාර්ගසැපයෙන් ඵලසැපයට ඵලසැපයෙන් නිර්වාණසැපයට; අන්වායතං ඉති, අනුක්‍රමයෙන් පැමිණියේවේයයි (වදාළසේක).

**ප්‍රථමවර්ගයෙහි විතිංසුත්‍ර ගාථාවී**
**විවරණයයි.**

---

158 යො නින්දියං පසංසති තංවා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං නවින්දති. 4·

158 යො, යම් අඥානපුද්ගලයෙක් තෙම; නින්දියං, ගර්හාකට සුදුසුවූ දුශ්ශීලපුද්ගලයෙකුට; පසංසති, (ගරුතැන්හිතබා මොහු සුශීලයායයනාදීන්) ප්‍රශංසාකෙරේද; පසංසියො, ප්‍රසංසාකට සුදුසුවූ; යො, යම් (ආයුෂ්) පුද්ගලයෙක්වේද; තංවා, ඕහටහෝ; නින්දති,(අගරුතැන්හිතබා මොහු දුශ්ශීලයාය යනාදීන්) ගර්හාකෙරේද; සො, හෙතෙම; මුඛෙන, (සිය) මුවකරණකොටගෙණ; කලිං, අපරාධය; විචිනාති, රැස්කෙරේ; තෙන කලිනා, (රැස්කරණලද) ඒඅපරාධය හෙතුකොටගෙණ; සුඛං, සැපතක්; නවින්දති, නොලබයි (නින්ද්‍යප්‍රශංසාප්‍රශංස්‍ය නින්දාදෙක්හි සමාන දුඃඛ විපාකබැවින් දුකක්ම විඳිනේයයිසේසි).

159 අප්පමත්තො අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො කලි } 4.
යො සුගතෙසු මනං පදොසයෙ. }

159 සබ්බස්සාපි, සියලු (තමාපිළිබඳ) දෙයද; අත්තනාපි සහ, තමාදහාසමග; අක්ඛෙසු, (ද්‍යූතක්‍රීඩා) පාසකැටිහි; යො ධනපරාජයො, (යමෙකුගේ) යම් (මුක්තාමාණික්‍යාදි) වස්තුපැරදීමෙක්වේද; අයං, මේපැරදීමතෙම; අප්පමත්තො, සවල්පමාත්‍රවූ;

---

* "රම්මං" යනු "තහියාසහානමීනඤ්ච" යන සූත්‍රයෙන් අදර අරුතැ කම්ජබත් වූතැනි.

කලි, අපරාධයෙක; යො, යමෙක්තෙම; සුගතෙසු, සම්‍යක් ප්‍රතිපන්නගත (බුද්ධාදිආර්‍යයන්) පුද්ගලයන් කෙරෙහි; මනං පදොසයෙ, චිත්තප්‍රදූෂ්‍යය කරන්නේද; අයං එව, මේචිත්තප්‍රදොෂයම; මහන්තතරො, (යථොක්ත අපරාධයටවඩා) අතිශයින් මහත්වූ; කලි, අපරාධයෙක්වේ.

160 සතං සහස්සානං නිරබ්බුදානං ඡත්තිංසති පඤ්චච අබ්බුදානි,
යමරියගරහී නිරයං උපෙති වාචං මනඤ්ච පණිධාය පාප)4.
කා'නති.)

160 අරියගරහී, ආර්‍යයන්ට ගර්හාකරණලද පුද්ගලතෙම; වාචං, වචනයද, මනඤ්ච, සිතද, පාපකං, ලාමකවශයෙන්; පණිධාය, පිහිටුවා; යං නිරයං, යම් නිරකයකට; උපෙති, පැමිණේද (එහි), නිරබ්බුදානං, නිරබ්බුදයන්සම්බන්ධවූ, (හෙවත්) නිරබ්බුදගණිතින්; සහස්සානං සතං, (හවුරුදු) ලක්ෂයක්ද; ඡත්තිංසති, සතිස්නිරබ්බුදයෙක්ද; පඤ්චච අබ්බුදානි, අබ්බුදපසෙක්ද; (නොහොත්) අබ්බුදානි, අබ්බුදගණිතින්; පඤ්චච ඉති, පස්අබ්බුදයෙක්ද (ආයුඃප්‍රමාණය) වේයයි (වදාළසේක).

**ප්‍රථම වර්ගයෙහි තෘතීය සූත්‍ර**
**ගාථාර්ථ විවරණයයි.**

---

161 මාතරි පිතරිචාපි * යො මිච්ඡා පටිපජ්ජති,
තථාගතෙවා සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ,
බහුඤ්ච සො පසවති අපුඤ්ඤං තාදිසො නරො. 4.

161 යො, යම් මනුෂ්‍යයෙක්තෙම; මාතරි, මව කෙරෙහිද; පිතරිච අපි, පියා කෙරෙහිද; සම්බුද්ධෙ, සම්‍යක්සම්බුද්ධවූ; තථාගතෙවා, තථාගතයන්වහන්සේ කෙරෙහිද; අථවා, වැලිත්; තස්ස, උන්වහන්සේගේ; සාවකෙ, ශ්‍රාවකයෙක් කෙරෙහිද; මිච්ඡා පටිපජ්ජති, වරදවා පිළිපදීද; තාදිසො, එබඳුවූ; සො නරො, ඒමනුෂ්‍යතෙම; බහුඤ්ච අපුඤ්ඤං, බොහෝවූම අකුසල්; පසවති, රැස්කෙරේ.

162 තාය අධම්මචරියාය මාතාපිතූසු පණ්ඩිතා,
ඉධෙවච † නං ගරහන්ති පෙච්චාපායඤ්ච ගච්ඡති. 4.

162 මාතාපිතූසු, මව්පිය (බුද්ධ බුද්ධශ්‍රාවකය)න් කෙරෙහි (හැසිරෙණලද); තාය අධම්මචරියාය, ඒ(මිථ්‍යාප්‍රතිපත්තිසංඛ්‍යාත) අධර්ම

---

* "මතරි පිතරී" යන මෙහි ඡන්දස් නොපිරිනීම පිණිස ඉකාර දික්සි. † "ඉධෙව" කිසි තැනක.

චර්‍යාව කාරණකොටගෙණ; පණ්ඩිතා, පණ්ඩිතයෝ; තං, ඕහට; ඉධචෙව, මෙලොව්හිදීමද; ගරහන්ති, ගර්හාකෙරෙත්; පෙච්ච, පරලොව්හි; අපායඤ්ච, නරකාදිචතුරපායෙන් එක්තරා එකකටද; ගච්ඡන්ති, (හෙතෙම) යේ.

163 මාතරි පිතරිචාපි යො සම්මා පටිපජ්ජති,
තථාගතෙවා සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ;
බහුඤ්ච සො පසවති පුඤ්ඤං තාදිසකො නරො. 4.

163 යො, යම් මනුෂ්‍යයෙක්තෙම; මාතරි, මවකෙරෙහිද; පිතරිච අපි, පියාකෙරෙහිද; සම්බුද්ධෙ, සම්‍යක්සම්බුද්ධවූ; තථාගතෙවා, තථාගතයන්වහන්සේකෙරෙහිද; අථවා, වැලිත්; තස්ස, උන්වහන්සේගේ; සාවකෙ, ශ්‍රාවකයෙක්කෙරෙහිද; සම්මා, මනාකොට; පටිපජ්ජති, පිළිපදිද; තාදිසකො, එබඳුවූ; සො නරො, ඒ මනුෂ්‍යතෙම; බහුඤ්ච පුඤ්ඤං, බොහෝවූම කුසල්; පසවති, රැස්කෙරේ.

164 තායනං ධම්මචරියාය මාතාපිතුසු පණ්ඩිතා,
ඉධෙචව පසංසන්ති පෙච්ච සග්ගෙච මොදතී'ති—4.

164 මාතාපිතුසු, මව්පිය (බුද්ධ බුද්ධශ්‍රාවකයන්) කෙරෙහි (හැසිරෙණලද) ; තාය ධම්මචරියාය, ඒ (සම්‍යක්ප්‍රතිපත්තිසංඛ්‍යාත) ධර්‍මචර්‍යාව කාරණකොටගෙණ; පණ්ඩිතා, පණ්ඩිතයෝ; නං, ඕහට; ඉධඑවච, මෙලොවදීමද; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; පෙච්ච, පරලොවගොස්; සග්ගෙච, ස්වර්ගයෙහිද; මොදති ඉති, සතුටුවේයයි (වදාළසේක).

## ප්‍රථම වර්ගයෙහි චතුර්ථ සූත්‍ර ගාථාර්ථවිවරණයයි.

---

165 යෙ කෙචි කාමෙසු අසඤ්ඤතා ජනා
අවීතරාගා ඉධ කාමභොගිනො,
පුනප්පුනං ජාතිජරූපගා හි තෙ
තණ්හාධිපන්නා අනුසොතගාමිනො. 4.

165 ඉධ, මේලොකයෙහි; යෙකෙචි ජනා, යම්කිසි සත්වකෙනෙක්; කාමෙසු, වස්තුකාම ක්ලෙශකාමයන්හි; අසඤ්ඤතා, සංයම රහිතවූවාහු වෙද්ද; අවීතරාගා, පහනොකරණලද රාගය ඇත්තාහු වෙද්ද; කාමභොගිනො, පස්කම්රස විඳින්නාහු වෙද්ද; පුනප්පුනං, නැවත නැවත; ජාතිජරූපගා, ජාතිජරාදෙකට පැමිණෙන්නාවූ (මෙහි ජාතිජරාග්‍රහණයෙන් ව්‍යාධිමරණම

යද ගෘනීතයි) ; තණ්හාධිපන්නා, තෘෂ්ණාවෙන් යටපත්වූ; (නොහොත්) තෘෂ්ණාවෙහි ගැළුනාවූ; තෙහි, ඒසත්වයෝ වනාහි; අනුසොතගාමිනො, අනුස්‍රොතගාමීහු (කෙලශස්‍රොතස පසුපස්සෙ යන්නාහු) නම්වෙති.

166 යස්මාහි ධීරො * ඉධූපට්ඨිතාසති
කාමෙච පාපෙච අසෙවමානො,
සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ
පටිසොතගාමී 'ති තමාහු පුග්ගලං. 4.

166 යස්මාහි, යම්හෙයකින් වනාහි; ඉධ, මේලොකයෙහි; උපට්ඨිතාසති, (අභික්‍රම ප්‍රතික්‍රමාදී ඒ ඒ ක්‍රියායෙහි) එළැඹිසිටි ස්මෘතිඇති; ධීරො, ප්‍රඥාවන්තපුද්ගලතෙම; කාමෙච, වස්තුකාම යන්ද; පාපෙච, ප්‍රාණඝාතාදී පඤ්චදුශ්චරිතයන්ද; අසෙවමානො, සෙවනයනොකරන්නේ; දුක්ඛෙන සහ අපි, (කෙලශ පයර්‍යුස්ථානයෙන් උපන්) දුකහාසම්ගම; කාමෙ, විවිධකාමයන්; ජහෙය්‍ය, දුරුකරන්නේද, තං පුග්ගලං, ඒ පුද්ගලයා; පටිසොතගාමී ඉති, ප්‍රතිස්‍රොතගාමියා (කෙලශස්‍රොතසට උඩුකුරුව යනතැනැත්තා) යයි; ආහු, කියත්.

167 යො ච කිලෙසානිසයං පහාය †
පරිපුණ්ණසෙඛො අපහානධම්මො,
චෙතොවසිප්පතෙතා සමාහිතින්ද්‍රියො
සවෙ ඨිතතෙතා 'ති නරො පවුච්චති. 4.

167 යො, යම් පුද්ගලයෙක් තෙම; වෙ, එකාන්තයෙන්; කිලෙසානිසයං, කෙලශයන්ගේ අධික ප්‍රවෘත්තිය; පහාය, දුරුකොට; පරිපුණ්ණසෙඛො, ශික්ෂාපාරිපූර්ණත්වයෙහි සිටියේ වේද; අපහානධම්මො, නොපිරිහෙන ස්වභාව ඇත්තේ වේද, චෙතොවසිප්පතෙතා, චිත්තයාගේ වසගබවට පැමිණියේ වේද; සමාහිතින්ද්‍රියො, මොනවට තබනලද ඉන්ද්‍රියයන් ඇත්තේ වේද; සො, ඒ අනාගාමිපුද්ගලතෙම; වෙ, එකාන්තයෙන්; ඨිතතෙතා නරො ඉති, සිටිස්වභාවඇති පුද්ගලයායයි; පවුච්චති, කියනුලැබේ.

168 පරොවරා යස්ස සමෙච්ච ධම්මා
විධූපිතා අත්ථගතා නසන්ති,
සවෙදගු වුසිත ‡ බ්‍රහ්මචරියො
ලොකන්තගු පාරගතො 'ති වුච්චති 'ති. 4.

---

* "තස්මාහිධීරෙ" පොත්. † "යොචකිලෙසානි පහායපඤ්ච" කිසිත්. ‡ "වූසිත" පොත්.

168 යස්ස, යම්පුද්ගලයෙකුගේ; පරොවරා, උත්තමාධමවූ; ධම්මා, කුශලාකුශලචේතනා ධර්මයෝ; සමෙච්ච, (ආශ්‍රවක්ෂය කරඥානයෙහා) එක්ව; විධූපිතා, විධ්වංසනයකරණලද්දාහු; අත්ථ ගතා, අස්තඞ්ගතවූවාහු; නසන්ති, විද්‍යමානනොවේද්ද; වේදගූ, විශේෂයෙන් දන්නාසුලුවූ, වොසිතබ්‍රහ්මචර්‍ය්‍යෙය, වැසනිමවන ලද මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තාවූ; ලොකන්තගූ, (සත්වසංස්කාර අවකාශසංඛ්‍යාත) ත්‍රිවිධලොකයාගේ කෙළවරට පැමිණියාවූ; සො, ඒ ක්ෂීණාශ්‍රවපුද්ගලතෙම; පාරගතො ඉති, (අභිඥා—පරිඥා—භාවනා ..ප්‍රහාන—සාක්ෂාත්ක්‍රියා—සමාපත්ති යන මේ ෂඩාකාරයෙන්) සියලු ධර්මයන්ගේ පරතෙරට පැමිණියේයයි; වුච්චති ඉති, කියනුලැබේයයි (වදාළසේක).

## ප්‍රථම වර්ගයෙහි පඤ්චම සූත්‍ර ගාථාර්ථ විවරණයයි.

---

169 අප්පස්සුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො,
උභයෙන නං ගරහන්ති සීලතො ච සුතෙන ච. 4.

169 චෙ, ඉදින්; අප්පස්සුතො අපි, (සූත්‍රගෙයාදි ආගමධර්මයෙහි ස්වල්පයක් ඇසූපිරූනැත් ඇතිහෙයින්) අල්පශ්‍රැතවූද පුද්ගලතෙමේ; සීලෙසු, (ප්‍රාතිමොක්ෂසංවරාදි) ශීලකොට්ඨාසයන්හි; අසමාහිතො හොති, නොපිහිටියේ වේද, නං, ඔහට; සීලතොච, ශීලකොට්ඨාසයෙන්ද; සුතෙනච, ශ්‍රැතකොට්ඨාසයෙන්ද (යන); උභයෙන, දෙකොටසින්ම; ගරහන්ති, (මේතෙමේ දුශ්ශීලය අල්පශ්‍රැතයයි පණ්ඩිතයෝ) නින්දාකෙරෙත්.

170 අප්පස්සුතොපි චෙ හොති සීලෙසු සුසමාහිතො;
සීලතො නං පසංසන්ති තස්ස සම්පජ්ජතෙ සුතං. 4.

170 චෙ, ඉදින්; අප්පස්සුතො අපි, (සූත්‍රගෙයාදියෙහි) අල්පශ්‍රැතවූයේනමුදු; සීලෙසු, ශීලකොට්ඨාසයන්හි; සුසමාහිතො හොති, මනාව පිහිටියේ වේද; නං, ඔහට; සීලතො, ශීලකොට්ඨාසයෙන්; පසංසන්ති, (පණ්ඩිතයෝ) ප්‍රසංශාකෙරෙත්; තස්ස, ඔහුගේ; සුතං, (අල්පවූද) ශ්‍රැතයතෙම්; සම්පජ්ජතෙ, (ඔහුවිසින් ශ්‍රැතයෙන් ශ්‍රැතකෘත්‍යය කළහෙයින්) සම්බන්ධවේ (තමාටද අනුන්ටද සම්පත්පිණිස වන්නේය යි සේයි).

171 බහුස්සුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො,
සීලතො නං ගරහන්ති නාස්ස සම්පජ්ජතෙ සුතං. 4

171 චෙ, ඉදින්; බහුස්සුතො අපි, (සූත්‍රගෙයාදියෙහි බොහොමයක් ඇසූපිරූනැත් ඇතිහෙයින්) බහුශ්‍රැතවූයේනමුදු;

සීලෙසු, ශීලකොට්ඨාසයන්හි; අසමාහිතො හොති, නොහික්මුණේ වේද; තං, ඕහට; සීලතො, ශීලකොට්ඨාසයෙන්; ගරහන්ති, (පණ්ඩිතයෝ) නින්දාකෙරෙත්; අස්ස, ඔහුගේ; සුතං, (බොහෝවූද) ශ්‍රැතයතෙමේ; න සම්පජ්ජති, (ශ්‍රැතකෘත්‍යය නොකළහෙයින්) සමෘද්ධ නොවේ (දුශ්ශීලබැවින් තමාටද දුශ්ශීලයායයි අන්‍යයන් නොඑළඹෙනබැවින් අනුන්ටද සම්පත් පිණිස නොවන්නේය යි සේයි).

172 බහුස්සුතො පි චෙ හොති සීලෙසු සුසමාහිතො,
උභයෙන නං පසංසන්ති සීලතො ච සුතෙන ච. 4.

172 චෙ, ඉදින්; බහුස්සුතො අපි, (සූත්‍රගෙයාදියෙහි) බහුශ්‍රැතවූද පුද්ගලතෙමේ; සීලෙසු, ශීලකොට්ඨාසයන්හි; සුසමාහිතො හොති, මනාව හික්මුණේ වේද; තං, ඕහට; සීලතො ච, ශීලකොට්ඨාසයෙන්ද, සුතෙන ච, ශ්‍රැතකොට්ඨාස යෙන්ද (යන); උභයෙන, දෙකොටසින්ම; පසංසන්ති, (මේතෙමේ ශීලවන්තය බහුශ්‍රැතයයි පණ්ඩිතයෝ) ප්‍රශංසා කෙරෙත්.

173 බහුස්සුතං ධම්මධරං සප්පඤ්ඤං බුද්ධසාවකං,
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතු මරහති,
දෙවා පි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො ’ති. 4.

173 බහුස්සුතං, බහුශ්‍රැතවූ (බොහෝ ඇසූපිරූතැන් ඇත්තාවූ); ධම්මධරං, ධර්මධරවූ (ඇසූධර්මයන් දරන්නාවූ) සප්පඤ්ඤං, ප්‍රඥාවෙන්යුක්තවූ; බුද්ධසාවකං, සර්වඥබුද්ධශ්‍රාවකවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; ජම්බොනදස්ස නෙක්ඛං ඉව, ජම්බූනදනම් ජාතිස්වර්ණ සට්ටිකාවක් මෙන්; කො, කවරෙක්; නින්දිතුං, නින්දාකරන්නට; අරහති; සුදුසුවේද (නොවේමැයි); තං, ඕහට; දෙවාපි, දෙවියෝද; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; බ්‍රහ්මුනාපි, මහබඹවිසිනුදු; පසංසිතො ඉති, (හෙතෙම) ප්‍රශංසාකරණලද්දේයයි (වදාළසේක).

**ප්‍රථම වර්ගයෙහි ෂඩ්සූත්‍ර ගාථාර්ථ විවරණයයි.**

---

174 යො හොති ව්‍යත්තො ච විසාරදො ච
බහුස්සුතො ධම්මධරො ච හොති,
ධම්මස්ස හොති අනුධම්මචාරී
ස තාදිසො වුච්චති සඞ්ඝසොභනො. 4.

174 යො, යම් පුද්ගලයෙක්තෙම, ව්‍යත්තො ච හොති, ප්‍රඥාව්‍යක්තියෙන් (හෙවත් ධාරණශක්තියකියනලද ප්‍රඥාපටුත්වයෙන්)

# විඥාපනය.

—×○×—

## තේලකටාහගාථා.

---

මේ වනාහි මාගධීපද්‍යයෙන් විරචිතවූ ධර්මානුගතමනොහර ප්‍රකරණයෙකි. මෙහි නානාවිධ ධර්මොපදෙශරත්න රාශියක් අන්තර්ගතව තිබේ. ඒ මේ ධර්මොපදෙශ බොහෝ ධර්මපුස්තක පරිශීලනයෙන්ද ලැබිය නොහැකිතරම් වේ. එසේහෙයින් මේ ප්‍රකරණය විරචිතකාලයේ පටන්ගෙනම තමහට වැඩකැමැති ගිහිපැවිදි සජ්ජනයන්විසින් සමාදරයෙන් පරිශීලනය කරගෙන එනුලැබේ. යමෙක් මේ ප්‍රකරණය උද්ග්‍රහණධාරණවශයෙන් පරිචය කරන්නේ නම් ඔහු නොබොහෝකලකින්ම ධර්මයෙහි විශාරදබුද්ධිමතෙක් වනු නිසැක වේ. එබැවින් ධර්මයෙහි නිරායාසපටුත්වය පතනහැම්දෙනා විසින්ම මේ ප්‍රකරණය සතතයෙන් භාවිතා කිරීම යොග්‍යවේ. මේ ප්‍රකරණයෙහි ඒ ඒ ගාථාවන්ගෙන් ප්‍රකාශිතධර්මොපදෙශයන් දැනගනුකැමැත්තවුන්ගේ ප්‍රයොජනය පිණිස අඞ්කපරිපාටියෙන් මෙහි සඳහන් කරනු ලැබේ. 1 වැන්නෙන් රාජාශීර්වාදයද, 2 වැන්නෙන් බුදුරුවන් වැඳීමද, 3 වැන්නෙන් දමුරුවන් වැඳීමද, 4 වැන්නෙන් සඟුරුවන් වැඳීමද, 5 වැන්නෙන් තුනුරුවන් අනුසස්ද, 6 වැන්න පටන් 28 වැන්න දක්වා මරණානුස්මෘතියද, 29 වැන්නපටන් 48 වැන්න දක්වා අනිත්‍යලක්ෂණද, 49 වැන්නපටන් 55 වැන්න දක්වා දුඃඛලක්ෂණයද, 56 වැන්නපටන් 63 වැන්න දක්වා අනාත්මලක්ෂණයද, 64 වැන්නපටන් 77 වැන්න දක්වා අශුභලක්ෂණයද, 78 වැන්නපටන් 88 වැන්න දක්වා ප්‍රාණඝාතාදි දුශ්චරිතාදීනවද, 84 වැන්නපටන් 83 වැන්න දක්වා චතුර්විධ ආරක්ෂාවද, 89 වැන්නපටන් 92 වැන්න දක්වා ,, ප්‍රතීත්‍යසමුත්පාදධර්මයද, 93 වැන්නපටන් අවසානය දක්වා නානාවිධ අවවාදද ප්‍රකාශිත වේ.

මෙහි පද්‍යරචනාවද කර්ණරසායනවූ වෘත්තයන්ගෙන් ශ්ලිෂ්ට පදයුක්තවැ සුගමරීතිසමාශ්‍රිතව තිබේ. එසේහෙයින් මාගධීපද්‍යරචනායෙහි නියැලි පින්වතුන්විසින් ද මෙය ඒ (පද්‍යරචනාව) සඳහා ගුරුකොට ගතයුතු වේ. මේ ප්‍රශස්තධර්මප්‍රකරණය මුද්‍රණාකොට

වදාරනලද්දේ පුරාතන කාලයෙහි මෙම ලක්දිව කැලණිපුර විසූ මහාක්ෂීණාශ්‍රවවූ කල්‍යාණියනම් මහාස්ථවිරයන් වහන්සේ කෙනෙකුන් විසිනැයි ඓතිහාසික ප්‍රවෘත්තිවශයෙන් සලකනු ලැබේ. ඒ පිළිබඳවූ කථාප්‍රවෘත්තිය රසවාහිනීනම් ප්‍රකරණයෙන් ගෙන මෙහි මතුදක්වනු ලැබේ. එයින් මේ ප්‍රකරණයාගේ දෙශනාකිරීම් පිණිසවූ හෙතුව හා කාල ආදියද ප්‍රකාශවනහෙයින් ඒ පිළිබඳ විස්තරය මෙහි වුවමනා නොවේ.

මෙසේ දෙශකාදීන්ගේ වශයෙන්ද අතිශයසම්භාව්‍යවූ මේ ප්‍රකරණය මීට පෙර මාගධී ව්‍යාකරණෝද්ග්‍රහණාභිලාශීන්ගේ ප්‍රයොජනය සඳහා පදසම්බන්ධ නිර්වචනාදියෙන් හා ව්‍යාඛ්‍යානයකින්ද සමලඞ්කෘත කොට මුද්‍රණයට පමුණුවන ලදී. එය දැනට ඉවරවූබැවින් එම ව්‍යාඛ්‍යානය මේ වරත් සකස්කොට, **ඇන්. ජේ. කූරේ, ඩබ්ලිව්. කොර්නේලිස් පෙරේරා, ඇල්. ඇෆ්. පෙරේරා, ඇන්. ඞී. කූරේ,** යන මහතුන්ට මේ වර මුද්‍රණයකරවා ගැණිමට බලය දුනිමි.

මෙසේ මේ ව්‍යාඛ්‍යාන සහිතවූ ධර්මප්‍රකරණය සියලු බෞද්ධ පින්වතුන් විසින්ද, විශෙෂවශයෙන් පාලිභාෂාමය ප්‍රකරණෝච්චාරණයෙහි පටුන්වය කැමැති බෞද්ධ පාඨශාලාවන්හි ශිෂ්‍යයන් විසින්ද සාදරයෙන් ගෙන එහි ප්‍රකාශිත මනොහර ධර්මොපදෙශයන් ඉගෙන ඒ අනුව පිළිපැදීමෙන් සකලසාංසාරික දුඃඛයෙන් විනිර්මුක්තවූ අමාමහනිවන් සැප සාධාගතයුතුය.

**ශූ. පී. ඒකනායක.**

25-8-1908.

# කැලණිතිස්ස රජහුගේ කථාවස්තුව.

ලක්දිව කැලණි නුවර **කැලණිතිස්ස** නම් රජෙක් විය. ඒ රජහුගේ යුවරජතනතුරෙහි පිහිටි **උතතිය** නම් මලනුකෙණෙක්ද ඇතිවිය. ඒ කුමරු තෙම කැලණිවෙහෙර වසන **කැලණිතෙරුන්** වහන්සේ වෙත අකුරු කොට ශිල්ප උගත්තේය. ඉක්බිති ඒ රජකුමරු වැඩිවිය පැමිණ යුවරජතැන්පත්විය. කැලණිතිස්ස රජහුගේ අගමෙහෙසුන් බිසව සමග විශ්වාසව වෙසෙයි. රජ්ජුරුවෝ එපවත් දැන ඔහු අල්වා දඟගෙයි ලව්යි ඇමතියන්ට නියම කළහ. ඒ කුමර එපවත් අසා බියෙන් පලාගොස් පසල්දනව්වෙක වසනුයේ දවසක් බිසවුන් සිහිකොට එක් ලදරුපුරෂයෙකු කැඳවා සිවුරු පොරවා ඔහුට පතක් ලියාදී මේ ගෙන ගොස් කිසිවකුට නොහඟවා බිසව්අතට දීපියවයි යැවීය. ඔහුද යහපතැයි ගිවිස ගෙනගොස් රජගෙට සිහාවන් තමක් මෙන් මාලිගාදොරකඩ සිටියේ කැලණිතෙරුන් වහන්සේ රජගෙට වඩිනා දැක තෙමේද උන්වහන්සේ කැටුව රජගෙට වන. ඔහු දැක තෙරුන්වහන්සේ මේ තෙම රජ්ජුරුවන්ගේ කුලූපග මහණෙකැයි සිතූසේක. රාජපුරුෂයෝද තෙරුන්වහන්සේගේ අනවැසිනමකැයි සිතූහ. ඉක්බිති රජ්ජුරුවන් හා රාජමහෙසිකාවද යන දෙදෙනා සවහසනයෙන් වළඳවා පසු ගමන් කොට වැඳ අවසර ගෙන නික්මුණාහුය. එකල පත ගෙණගිය දූත මහණතෙමේ ඒ පත පස්සෙහි යන බිසවුන්ට පෙණෙන පරිද්දෙන් බිම හෙළිය. රජ්ජුරුවෝ පත හුනුශබ්දය අසා පෙරලා බලා පත ගෙන බලන්නාහු තෙරුන් අත අකුරු හා එක් වැනිහෙයින් තම මලනුවන් අත අකුරු දැනගතනොහී එකාන්තයෙන් තෙරුන්වහන්සේ ලිවූ පතයයි සිතා කොපයෙන් දිලිහී මොහු අල්වා ගෙනගොස් තෙල්කඹාරයෙහි ලා ගිනිගසා මරවයි විධාන කළහ. ඉක්බිති රාජපුරුෂයෝ මහත්වූ තෙල්කටාරයක් උදුනෙහි තබා පෙන නැගිනැගී තෙල්කැකෑරුන කල්හි තෙරුන්වහන්සේ තෙල්කටාරය සමීපයම ගෙණගියහ. තෙරුන් වහන්සේ වනාහි පෘථජනමයෙහි නිවන් පතා කරනලද කුසල් ඇතිහෙයින් එකෙණෙහි විදර්ශනා වඩා රහත්ව කකියන තෙල්කටාරයට බැස ඉඳු නිල්මිණි අතලෙක බැස හුන් රාජහංසයකු මෙන් වැඩඋන්සේක. ගිනිගත් ලොහොදියසේ කකියන එබඳු තෙල්පවා තෙරුන් වහන්සේගේ රෝමකූපමාත්‍රයකුදු හුණුකොට ගතනොහැකිවූයේමය. එකල තෙරුන්වහන්සේ තෙල්කටාරයේම වැඩහිඳ

"ලබ්ධිස්සරො ජන්තු වාරණරාජගාමී
භොගින්ද භොග රුචිරායතපීණ බාහු,
සාධූපචාරනිරතො ගුණසන්නිවාසො
ධම්මෙ ඨිතො විගතකොධමදාවලෙපො."

යනාදින් ධර්‍මගාථා සියයක්පමණ වදාරා මේ කෙසේවූ අකුසල කර්‍මවිපාකයෙක් දෝහෝයි දිවසින් බලනසේක් යටගියදවස තමන් වහන්සේ ගොපලුදරුවෙක්ව උපන් කාලයෙහි කකියන හුණු කිරෙහි මැස්සකු ලා කකාරා මැරූ අකුසල විපාකය බැව් දැක මේ නොනැවත්වියහැකි කර්‍මවිපාකයකැයි සිතා තෙල්කටාරයෙහි වැඩ උන්සේක්ම නිරුපධිශෙෂනිර්‍වාණධාතුවෙන් පිරිනිවී සේක.

මෙසේ රජ්ජුරුවෝ තෙරුන්වහන්සේද පතගෙනා පුරුෂයාද මරවා මුහුදට දැම්මවූහ. ඉක්බිති ඇමතිවරු එක්ව අහෝ අප රජහු විසින් නොකළමනාහැකි ඉතා පාපයක් කරනලදැයි මහත් බියට පැමිණ රජගෙට ගොස් රජහට කියන්නාහු:—

"නිසම්ම ඛත්තියො කයිරා නානිසම්ම දිසම්පති,
නිසම්ම කාරිනො රඤ්ඤො යසො කිත්තිච වඩ්ඪති.
අනිසාමෙත්වාන යො දෙසං යස්ස කුබ්බති නිග්ගහං,
මෙජ්ඣරඤ්ඤොව භූපාල සරට්ඨො ස විනස්සති.
අග්ගිහීමං වාතිමුද්ධං දීනංච දීඝසොත්තියං,
වීසසෙසු නිරතං ලොකෙ රාජානම්'වමඤ්ඤති.
තික්ඛං ඛරං අදුතාරං පමත්තං ගබ්බිතං සඨං,
කුසීතං ව්‍යසනෙ හීරුං රාජානම්'වමඤ්ඤති.
ධූමකෙතුව සප්පොව රක්ඛසො විය යො ජනො,
සංකුචෙති යසසා තස්ස ඝනබ්භුම්'වාම්භසි.
රාජධම්මො පජා රක්ඛා වුද්ධපඤ්ඤූපසෙවනං,
ලොකවොහාරවිඤ්ඤත්ති අත්තනො පරිපාලනං.
ධම්මෙන පාලනං රට්ඨං සුභදෙසු අපීළනං,
බමාච සමණො සාධු රඤ්ඤො එතෙ විභූසනා.
අමිත්තානම්පිච යො දීනං අත්තනො සරණං ගතං,
ව්‍යසනෙස්වනුගණ්හාති සචෙ භූපති භූපති.
පජානං පාලනෙ සම්මා ධම්මිකො හරණෙනච,
දීනානං විත්තදානෙන රාජානො තිදිවං ගතා.
රාගො 'රගො මහාරාජ' එරුසො ලොකධරක්ඛසො,
හදයෙ ච සමුට්ඨාති ඛනාතිම්මනොතං ව්‍යාපිසා"ති.

දිසානායකවූ දෙවියන්වහන්ස! රජදරුවන් විසින් යම්සේ කටයුත්ත පරීක්‍ෂාකාරිව කටයුතුය. අපරීක්‍ෂාකාරී නොවියයුතුය. තමතමන් විසින් කළමනා කටයුතු නුවණින් සලකා කරන්නාවූ රජුන්ගේ යශොකීර්ත්ති දෙක පූරසඳමඬලමෙන් නිරන්තරයෙන් දසදිග පැතිර වඩනාහුය. ඉදින් දෙවියන්වහන්ස! යම්කිසි රජෙක් පරීක්‍ෂා නොකොට යමෙකුට නිග්‍රහ කෙරේද ඒ රජතෙම කිසවච්ඡනම් තාපසයන්ට ගැහැට කරවා රාජ්‍යයහා සමග විනාශයට පැමිණි මෙජ්ඣනම් රජුමෙන් රාජ්‍යය හා සමග විනාශයට පැමිණෙන්නේය. තවද ලොකයෙහි මිනිමස්කන රකුසෙකුමෙන් ඉතා භය එළවන්නාවූද ඉතා මොලොක්වූද ධනධාන්‍ය නැතුව දිළිඳුවූද කළමනා කටයුත්තෙහි මන්‍දොත්සාහිව කල්යවන්නාවූද කාමයෙහි ඉතා ගිජුවූද යනාමේ දොෂයෙන් යුක්ත රජදරුවන්ට හැමදෙනාම නින්‍දාකරන්නාහ. තවද යම්කිසිරජෙක් තියුණුවූවහන්ඇති කැතෙකින් මර්ම්මස්ථානයක ඇනලන්නාසේ ඉතා තියුණු බස්කියාද කියනකින් දළකපන්නාසේ ඉතා ක්‍රූරනෙපුල් බෙණේද. අනුන්ට කිසිවක් නොදේද; කටයුත්ත පැමිණිකල්හි ප්‍රමාදවේද ඉතා ගර්හිතව වෙසේද සියල් සිරුර වසා කොලඅතුබැඳි ගසක්මෙන් සිට සත්‍වයන් අල්වා මරණ වැද්දෙකුමෙන් වසවා දනිද ඒ ඒ කාලයෙහි කළමනාකටයුතු ආදි රාජක්‍රියාවෙහි කුසීත වේද. යම්කිසි භයක් පැමිණි කල්හි කිසිරාජධෛර්ය්‍යයක් නැතුව බියපත් වේද එබඳු රජහට සියලු සත්‍වයෝම නින්‍දා බනන්නාහ. තවද දේවයන්වහන්ස! යම්කිසි රජෙක් ගිනිකඳසේද සර්පරාජයෙකුසේද රකුසෙකුසේද තමා මුහුනදැකීම් මාත්‍රයකින්ම මහජනයා බිය ගන්වා අකුළුවාද එබඳු රජහුගේ යශොතෙජස් දෙක දියපිට තෙල්බිඳුමෙන් විසිර නස්නේය. එසේ හෙයින් මහරජ රාජධර්ම්මයනම් සියලු සතුන් රැකීමය. ඥානවෘද්ධ වයොවෘද්ධයන් භජනය කිරීමය ලොකචාරිත්‍රදැනීමය. මෙලෝ පරලෝ දෙකින් වන අපවාදයෙන් ගැලවී දවස්යැවීමය, තමාරැකීමය දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කිරීමය මිත්‍රයන්කෙරෙහි නොබිඳෙනබවය සත්පුරුෂ ශ්‍රමණ බ්‍රාහ්මණයන්කෙරෙහි ක්‍ෂමාපරවීමය යනාමේ රජදරුවන්ට ආභරණ නම් වෙයි. තවද යම්කිසිරජෙක් අසරණව තමා සරණගියාවූ සතුරෙකුට වුවත් ව්‍යසනයක් පැමිණිකල්හි හෙවත් බොහෝ අනැඩ කළ සතුරෙකු වුවත් දුප්පත්ව තමාවෙත පැමිණිකල්හි ඔහුකෙරෙහි අනුකම්පා උපදවා සැපත්දී අනුග්‍රහ කෙරේද එසේවූ රජතෙම ඒකාන්තයෙන් රජනම් වෙයි.

තවද පෙර රජදරුවෝ දැහැමින් ප්‍රජාපාලනය කිරීමය ධාර්මිකශ්‍රමණබ්‍රාහ්මණයන්ට රක්‍ෂාසංවිධානකිරීමය දුගීමගී දිළිඳු යාචකයන්ට කැමතිකැමති වස්තුදීමය. යනාදීවූ සුචරිතධර්මයන් පූර්‍ණ

දෙව්ලොව ගියේහ. එසේහෙයින් මහරජ රාගනාමැති සර්පයා හා ක්‍රොධනාමැති රාක්ෂසයාද යනාදෙදෙන යම්දවසක තුඹවහන්සේ ගේ සිත්නමැති වෙනෙහි උපන්නාහු නම් සියලුඅනර්ථයට මුල්ව සිටි ඔවුන් දෙදෙන ක්ෂාන්තිනමැති මන්ත්‍රයෙන් වලකා වදාළමැනවි වැයි යනාදීන් අවවාදකළහ.

මෙසේ අවවාද කරන්නාවූ වැඩ පසස්නාවූ ඇමතියන්ගේ නෝපුල් අසාද ඒරජ මදකුත් සතුටුනොවීය. ඉක්බිති තෙරුන්වහන්සේ කෙරෙහි ශොකයෙන් දෙවතාවෝ කිපි මේ රජහු සමග මොහුගේ රාජ්‍යය නසම්හයි සමුද්‍රය උත්පාතික කොට දිය උතුරුවන්ට පටන් ගන්නාහ. එකල ලක්දිවට පිරිවරවූ කුඩා දිවයින් නවයක්හා සතරක් උතුරුකොට ඇති පන්ලක්ෂදහස් පන්සියයක්පමණ මහපටුනු ගම් වැව් අමුණු කෙත්වත් ආදිවූ සියල්ලම මුහුද ගිලූයේය. එකල්හි කැළණියට මුහුදසත්ගව්වෙක, එයින් ගව්වක් තබා සියල්ලම වසා ගෙණ මුහුදුදිය එන්ම වත්කල්හි එපවත් කැළණිතිස්සරජහට කීහ. එබස් අසා රජ්ජුරුවෝ භයින් චකිතව ඉදිරිපසුබලා අන්උපදෙසක් නොදැක තමාගේ දෙලොස් හැවිරිදි "දේවී"නම්වූ දුව සර්වාභරණයෙන් දෙවඟනකමෙන් සරසා මහසැළක් ගෙන්වා බත්පැන් පිළි ආදි උපකරණද ඒඅයත් සැළතුලෙහි ලා කැළණිතිස්ස රජහුගේ "දියනියෝයයි" රන්පත ලියවා එම සැළෙහි බහා අස්බා මේ සමුද්‍රදේවතාවන්ට බලිකර්මයයි කියා සමුද්‍රයට හැරියේය.

එකල දේවතාවෝ මුහුද උත්පාතික් නොකළහ. ඉක්බිති ඒසැළ ලක්දිව් වමත්කරමින් දෙවතානුභාවයෙන් ගොස් රුහුනු ජනපද **"තොටලුනොට"** වෙරළසමිපව සිටගත. එකල්හි එම තොටලුගම වසන කෙවුලෝ දැක එපවත් කාවන්තිස්සරජහට කීහ. එකල රජ්ජු සපිරිවරින් අවුත් බිසවුන් දැක රන්පත අකුරු කියවා කැළණිතිස්ස රජහුගේ දියනියන් බව දැන ගොඩට බාවා රුවන්රුසක් මත්තෙහි සිටුවා අගමෙහෙසුන්කොට ඔවුන් බට "තොටලුනොට" විහාරයක් කරවා ඒ කාරණය මුල්කොට ගෙණ **"විහාරමහාදේවී"**යයි ඔවුන්ට නම්තැබීය. එතැන් පටන් **කාවන්තිස්සරජ** විහාරමහදේවින් සමග ප්‍රියසංවාසයෙන් වසන්නේ ගැමුනුකුමාරය තිස්සකුමාරයයි දරුදෙදෙනෙකු ලැබ ඔවුන්ට දසමහායොධයන් පාවාදී නමන් කළමනා සියලුකටයුතු නිමවා **තිස්සමහාවෙහෙර** සටාලමහවෙහෙර සඳගිරි වෙහෙර ආදිවූ සූසැටක් මහවෙහෙර කරවා උපමානොකොටහැකි අනෙකප්‍රකාර කුසල් කොට සූසැටහවුරුද්දක් දැහැමෙන් රාජ්‍යය කරවා තුසිත්භවනයෙහි උපන. ඒ කාවන්තිස්සරජ්ජුරුවෝ වනාහි මතුබුදුවන **මෛත්‍රෙයබුදුන්ට** පියවන්නාහ. ඒ විහාරමහදේවි එම බුදුන්ට මවුවන්නාහ.

# තෙලකටාහ ගාථා.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

1 ලඞ්කිස්සරො ජයතු වාරණරාජගාමී
භොගින්ද භොග රුචිරා යත පීණ බාහු,
සාධූප චාර නිරතො ගුණ සන්නිවාසො
ධම්මෙ ඨිතො විගත කොධමදාවලෙපො.

1 වාරණ රාජගාමී, හස්ති රාජයෙකුසේ (ලීලොපෙතව) යන්නාවූ; (නොහොත්) හස්තිරාජයෙකුම බඳු ගමන් ඇති; (භොගින්ද භොග රුචිරා යත පීණ බාහු) භොගින්ද, නාගරාජයෙකුගේ; භොග, (දරණයක්) භොගාවලියක්සේ; රුචිර, සිත්කළුවූ; ආයත, දික්වූ; පීණ, පිරුණාවූ; බාහු, හස්ත යුගලයක් ඇති; සාධූපචාරනිරතො, සත්පුරුෂයන්ට (කරණලද දානමානාදි) සත්ක්‍රියා විධියෙහි ඇලුණාවූ; ගුණ සන්නිවාසො (ක්ෂාන්ති ක්ෂමොපසමථාදි) ගුණයන්ට වාසස්ථානවූ; ධම්මෙ, දසවිධ රාජධර්මයෙහි; ඨිතො, පිහිටියාවූ; (විගතකොධ මදාවලෙපො) විගත කොධ, පහවූ ද්වේෂභා; මද, (ඉශ්වරිය) මදද; අවලෙපො, දර්පද ඇති; (හෙවත්) ක්‍රෝධමද දර්ප නැත්තාවූ; ලඞ්කිස්සරො, ලඞ්කෙශ්වර (රජ) තෙම; (අරයො) ජයතු, (සතුරන්) ජයගනීවා; (නොහොත්) ශත්‍රු මර්දනය කෙරේවා.

2 යො සබ්බලොකමහිතො කරුණාධිවාසො
මොක්ඛාකරො රවිකුලම්බර පුණ්ණචන්දො,
ඤෙය්‍යොදධිං සුවිපුලං සකලං විබුද්ධො
ලොකුත්තමං නමථ තං සිරසා මුනින්දං.

2. යො, යම්මුනීන්ද්‍රයෙක්තෙම; සබ්බලොකමහිතො, සියලු ලෙව්වැස්සන් විසින් පුදනලද්දේද; කරුණාධිවාසො, කරුණාවට වාසස්ථානද; මොක්ඛාකරො, මොක්ෂයට උත්පත්තිස්ථානද; (රවිකුලම්බර පුණ්ණචන්දො) රවිකුල, සූර්‍ය්‍යවංශ නමැති, අම්බර, ආකාශයට; පුණ්ණචන්දො, පුන්සඳක් බඳුවේද; සුවිපුලං, අතිශයින් මහත්වූ; සකලං ඤෙය්‍යොදධිං, සමස්තඥෙය සාගරය; විබුද්ධො, විශෙෂයෙන් අවබොධ කෙළේද; ලොකුත්තමං, ලොක නායකවූ; තං මුනින්දං, ඒ මුනිරාජන්වූ සර්වඥයන්වහන්සේ; සිරසා, (භක්තිප්‍රේමාතිභාරාවනත) උත්තමාඞ්ගයෙන්; නමථ, නමස්කාර කරව්.

3 සොපානමාලමමලං තිදසාලයස්ස
සංසාරසාගර සමුත්තරණාය සෙතුං,
සබ්බාගතී භය විවජ්ජිත ඛෙම්මග්ගං
ධම්මං නමස්සථ සදා මුනිනා පණීතං.

3. තිදසාලයස්ස, දිව්‍යලොකයට; සොපාන මාලං, හිණිපෙති පෙළක් බඳුවූ; අමලං, නිර්මලවූ; සංසාරසාගර සමුත්තරණාය, සංසාර නමැති සාගරයෙන් එතරවන්නට; සෙතුං, හෙයක් බඳුවූ; (සබ්බාගතී භය විවජ්ජිත ඛෙම්මග්ගං) සබ්බාගතී භය, සියලු අපාය භයින්; විවජ්ජිත, පහවූ; ඛෙම, ක්ෂෙමවූ (හෙවත්) නිර්භයවූ; මග්ගං, මාර්ගයක් බඳුවූ; මුනිනා, සර්වඥයන්වහන්සේ විසින්; පණීතං, දේශනාකරණලද; ධම්මං, (සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර) ශ්‍රීසද්ධර්මය; සදා, හැම කල්හි; නමස්සථ, (භය ලොභාදීන් විරහිතව සකසා) වඳිව්.

4 දෙය්‍යං තදප්පමපි යත්‍ථ පසන්නචිත්තා
දත්වා නරා ඵලමුළාරතරං ලභන්ති,
තං සබ්බදා දසබලෙනපි සුප්පසත්‍ථං
සඞ්ඝං නමස්සථ සදාමිතපුඤ්ඤඛෙත්තං.

4. යත්‍ථ, යම්සඞ්ඝරත්නයක් විෂයෙහි; පසන්නචිත්තා, පහන් සිත්ඇති; නරා, මනුෂ්‍යයෝ; (හෙවත්) සත්වයෝ; තදප්පමපිදෙය්‍යං, ඒ ස්වල්පවූද (අන්නපානාදි) දෙය්‍යවස්තුවක්; දත්වා, දී; උළාරතරං, අතිශයින් මහත්වූ; ඵලං, විපාකය; ලභන්ති, ලබන්ද; දසබලෙන අපි, දසබලධාරීන්වහන්සේ විසිනුදු; සුප්පසත්‍ථං, අතිශයින් ප්‍රසංසා කරණලද්දාවූ; අමිතපුඤ්ඤඛෙත්තං, (දායකයන්ට මහත් විපාක දෙන හෙයින්) අප්‍රමාණපුණ්‍යක්ෂෙත්‍රවූ; තං සඞ්ඝං, ඒ (අෂ්ටාර්‍ය්‍ය පුද්ගලවූ) සඞ්ඝයා; නමස්සථ, (කායාදිවාරත්‍රයෙන් සකසා) වඳිව්.

5 තෙජොබලෙන මහතා රතනත්තයස්ස
ලොකත්තයං සමධිගච්ඡති යෙන මොක්ඛං,
රක්ඛා න චත්‍ථි ච සමා රතනත්තයස්ස
තස්මා සදා භජථ තං රතනත්තයං භො.

5. භො, භවන්ති! යෙන, යම්හෙයකින්; රතනත්තයස්ස, රත්නත්‍රයසම්බන්ධිවූ; මහතා, පූජ්‍යවූ; තෙජොබලෙන, තෙජො ශක්තිය හේතුකොටගෙණ; ලොකත්තයං, තුන්ලොව; (තුන්ලෙව් වැසි සත්වතෙම) මොක්ඛං, (සංසාර) මුක්තිය (නිවණ) ට, සමධිගච්ඡති, මනාකොට පැමිණේද; රතනත්තයස්ස සමා, රත්නත්‍රය

හා සමවූ; රක්ඛා, (සත්වයන්ට අනන්‍යවූ) රක්ෂාවක්; නච අත්ථි, නොම ඇද්ද; තස්මා, එහෙයින්; තං රතනත්තයං, ඒ රත්නත්‍රය; සදා, හැම කල්හි; භජථ, සේවනය කරව්.

6 ලඞ්කිස්සරො පරහිතෙකරතො නිරාසො
රත්තිම්පි ජාගරරතො කරුණාධිවාසො,
ලොකං විබොධයති ලොකහිතාය කාමං
ධම්මං සමාචරථ ජාගරිකානුයුත්තා.

6. පරහිතෙකරතො, පරවැඩ කිරීමෙහි අසහාය ඇලීම්ඇති; (නොහොත්) පරහිතකිරීම අසහාය කෘත්‍යකොට ඇති; නිරාසො, ආසාරහිතවූ; රත්තිං අපි, රාත්‍රියෙහිද; ජාගරරතො, නිදිවර්ජිතකිරීමෙහි ඇලුනාවූ; කරුණාධිවාසො, කරුණාවට ආධාරවූ; ලඞ්කිස්සරො, ලඞ්කෙශ්වර (රජ) තෙම; ලොකහිතාය, ලොකයාට හිත (වැඩ) පිණිස; කාමං, එකාන්තයෙන්; ලොකං, සත්වලොකයා; විබොධයති, (කුසලාකුසලසංඛ්‍යාතසත්ප්‍රතිපත්ති ප්‍රකාශකිරීමෙන්) ප්‍රබොධකෙරේ; (භවයි) ජාගරිකානුයුත්තා, නිදිවර්ජිත කිරීමෙහි යුක්තවූ; (තොපි) ධම්මං, (දානසීලාදී) කුශලධර්මවිෂයෙහි; සමාචරථ, මනාකොට හැසිරෙව්.

7 සත්තොපකාරනිරතා කුසලෙ සහායා
හො දුල්ලභා භුවි නරා විගතප්පමාදා,
ලඞ්කාධිපං ගුණධනං කුසලෙ සහායං
ආගම්ම සංචරථ ධම්මමලං පමාදං.

7. හො, භවත්නි ! භුවි, පෘථිවියෙහි; සත්තොපකාරනිරතා සත්වයන්ට උපකාරකිරීමෙහි ඇලුනාවූ; කුසලෙ, කුසල්කිරීමෙහි; සහායා, යහළුවූ; (නොහොත්) කල්‍යාණමිත්‍රවූ; විගතප්පමාදා, පහවූ ප්‍රමාද ඇති; (හෙවත්) ප්‍රමාදනැත්තාවූ; නරා, මනුෂ්‍යයෝ (නොහොත්) සත්වයෝ; දුල්ලභා, සුලභ නොවෙත්; (එහෙයින්) ගුණධනං, ගුණම ධනකොටඇති; කුසලෙසහායං, කල්‍යාණමිත්‍රවූ; ලඞ්කාධිපං, ලඞ්කාධිපතිවූ රජවෙත; ආගම්ම, පැමිණ; අලංපමාදං, ප්‍රමාදයක් නැතිව; ධම්මං, කුසල ධර්මයෙහි; සංචරථ, හැසිරෙව්; (නොහොත් දසපින් කිරයවත් සපයව්)

8 ධම්මො තිලොක සරණො පරමො රසානං
ධම්මො මහග්ඝරතනො රතනෙසු ලොකෙ,
ධම්මො භවෙ තිභවදුක්ඛ විනාස හෙතු
ධම්මං සමාචරථ ජාගරිකානු යුත්තා.

8. ධම්මො, ධර්මයතෙම; තිලොකසරණො, තුන්ලෙව් වැස් සන්ට පිහිටවේ; හෙවත් පරම ප්‍රතිෂ්ඨාකොට ඇත්තේවේ; (ධම්මො, ධර්මයතෙම) රසානං, (මූලරසාදිවූ) රසයන් අතුරෙන්; පරමො (රසො) උත්තම රසයෙක; ධම්මො, ධර්මයතෙම; ලොකෙ, ලොකයෙහි; රතනෙසු, (මුක්තාමාණික්‍යාදි) රත්නයන් අතුරෙන්; මහග්ඝරතනො, මාහැඟි රත්නයක; ධම්මො, ධර්මයතෙම; හවෙ, එකාන්තයෙන්; තිභවදුක්ඛ විනාසහෙතු, භවත්‍රයෙහි දුක්ඛ විනාසයට කාරණයෙක; (එහෙයින්) ජාගරිකානුයුත්තා, නිදිවර්ජිත කිරීමෙහි යුක්තවූවාහු; ධම්මං සමාචරථ, (දානාදි කුසල) ධර්මවිෂයෙහි හැසිරෙව්; (නොහොත් දසපින්කිරියවත්හි පවතිව්;)

9 නිද්දං විනොදයථ භාවයථප්පමෙය්‍යං
දුක්ඛං අනිච්චමපි චෙහ අනත්තතං ච,
දෙහෙ රතිං ජහථ ජජ්ජරභාජනාභෙ
ධම්මං සමාචරථ ජාගරිකානුයුත්තා.

9. නිද්දං, නිදි; විනොදයථ, දුරුකරව්; ඉහ, මේ (පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාතවූ) ශරීරයෙහි; දුක්ඛං ච, දුඃඛ (ලක්ෂණ) යද; අනිච්චං අපි, අනිත්‍ය (ලක්ෂණ) යද; අනත්තතං ච, අනාත්ම (ලක්ෂණ) යද; අප්පමෙය්‍යං, ප්‍රමාණ රහිතකොට; (අප්‍රමාණ භාවයෙන් බහුලකොට) භාවයථ, භාවනාකරව්; (හෙවත්) සතතයෙන් අනිත්‍යාදි ලක්ෂණ ත්‍රය සිත්හි ලා වඩව්;) ජජ්ජරභාජනාභෙ, ජීර්ණ භාජනයක් හා සමවූ; දෙහෙ, (උපචයනාශියෙන් දෙහ නම්වූ) ශරීරයෙහි; රතිං, අභිරතිය; (ඇල්ම) ජහථ, දුරුකරව්; ජාගරිකානුයුත්තා, නිදි දුරුකිරීමෙහි යුක්තවූවාහු; ධම්මං සමාචරථ, (කුසල) ධර්මවිෂයෙහි හැසිරෙව්.

10 ඔකාස මජ්ජ මම නත්ථි සුවෙ කරිස්සං
ධම්මං ඉතිහ'ලසතා කුසලප්පයොගෙ,
නාලං තියද්ධසු තථා භුවනත්තයෙ ච
කාමං නචත්ථි මනුජො මරණා පමුත්තො.

10. මම, මට; අජ්ජ, අද; ඔකාසං නත්ථි, (කුසල් කරන්ට) අවකාශයක් නැත; ධම්මං, (දානාදි කුසල) ධර්මය; සුවෙ කරිස්සං ඉති, සෙට කරන්නෙමියි; ඉහ කුසලප්පයොගෙ, මේ කුසලප්‍රයොගයෙහි; (හෙවත් කුසල් කිරීමේහි) අලසතා, මැලිබව්; නාලං, සුදුසු නොවෙයි; තියද්ධසු, (අතීතානාගතවර්තමානයන) කාලත්‍රයෙහිද; තථා, එසේම; භුවනත්තයෙච, (කාමලොකාදි) තුන්ලෙව්හිද; මරණා, මරණින්; පමුත්තො, මිදුනු; මනුජො, සත්වයෙක්; කාමං, එකාන්තයෙන්; නචත්ථි, නොමැති; (සියල්ලෝම මරණපරායනහයි සේයි.)

11 ඛිත්තො යථා නභසි කෙනචි දෙව ලෙඩ්ඩු
භූමිං සමාපතති භාරතයා ඛණෙන,
ජාතන්තමෙව බලු කාරණ මෙකමෙව
ලොකං සදා නනු ධුවං මරණාය ගන්තුං.

11. යථා, යම්සේ; කෙනචි එව, කිසිසත්ත්වයෙකුවිසින්ම; නභසි, ආකාසයෙහි; ඛිත්තො, දමනලද්දාවූ; ලෙඩ්ඩු, කැටක්; භාරතයා, බර බව හේතුකොටගෙණ; ඛණෙන, ක්ෂණයකින්; භූමිං සමාපතති, බිම හේද; තථා, එපරිද්දෙන්; ලොකං, සත්ත්වයා; මරණාය, මරණයට; ගන්තුං, යනු පිණිස; ජාතන්තං එව, (කර්ම භවාදීන්ගේ ලැබීමෙන් සසර) උපන් බවම; බලු, එකාන්තයෙන්; ධුවං, නියතවූ; එකං, අසහායවූ; කාරණමෙව් නනු, හේතුම නොවේද? (උපන් බවම මරණයට හුදෙක් නිශ්චය වෙයි සේයි.)

12 කාමං නරස්ස පතතො ගිරිමුද්ධනාතො
මජ්ඣෙ න කිඤ්චි භයනිස්සරණාය හෙතු,
කාමං වජන්ති මරණං තිභවෙසු සත්තා
භොගෙ රතිං පජහථාපිච ජීවිතෙ ච.

12. ගිරිමුද්ධනාතො, පර්වතමස්තකයකින්; (හෙවත් ගල් මුදුනකින්) පතතො, හෙන්නාවූ; නරස්ස, මනුෂ්‍යයාට; (නොහොත් සත්ත්වයා හට) මජ්ඣෙ, මධ්‍යයෙහි; භයනිස්සරණාය, භයින් මිදෙන්ට; කිඤ්චිහෙතු, කිසි හෙතුවක්; (හෙවත් කිසි ප්‍රතිෂ්ඨාවක්) කාමං, එකාන්තයෙන්; න, නොවෙයි; තිභවෙසු, (කාමරූප අරූප යන) භවත්‍රයෙහි; සත්තා, සත්ත්වයෝ; කාමං, එකාන්තයෙන්; මරණං, මරණයට; වජන්ති, පැමිණෙති; (එහෙයින්) භොගෙ අපිච, භොග (සම්පත්ති) යෙහිද; ජීවිතෙච, ජීවිතයෙහිද; රතිං, ආලය; පජහථ, ප්‍රකාර්ෂයෙන් දුරුකරව්; (කාය ජීවිතාදියෙහි ඡන්දරාගප්‍රහාණවශයෙන් නිරපෙක්ෂකව විදර්ශනා භාවනා කරව් යනු ආයොගාර්ථයි.)

13 කාමං පතන්ති මහියා බලු වස්සධාරා
විජ්ජුල්ලතා විතතමෙඝමුඛා පමුත්තා,
එවං නරා මරණභීමපපාත මජ්ඣෙ
කාමං පතන්ති නහි කොචි භවෙසු නිච්චො.

13. (විජ්ජුල්ලතා විතතමෙඝමුඛා) විජ්ජුල්ලතා, විදුලියෙන්; විතත, පතුරුවනලද; (නොහොත් ගැවසීගත්තාවූ) මෙඝමුඛා, මෙඝමුඛයෙන්; (හෙවත් වලාකුළින්) විජ්ජු—පෙ—මුඛා, විදුලිය නමැති පතළාවූ මෙඝමුඛයෙන්; පමුත්තා, ප්‍රමුක්තවූ; (හෙවත් මිදුනාවූ) වස්සධාරා; වර්ෂා ධාරාවෝ; මහියා, පෘථිවියෙහි; කාමං, එකාන්ත

යෙන්; පතනනි බලු, (යම්සේ) වැටෙත්ද; එවං, එපරිද්දෙන්; නරා, මනුෂ්‍යයෝ; (නොහොත්) සත්‍වයෝ; (මරණඝිමපාපත මජ්ඣෙ) මරණ, මරණ නමැති; භීම, භයානකවූ; පපාතමජ්ඣෙ, ප්‍රපාත මධ්‍ය යෙහි; කාමං, එකාන්තයෙන්; පතනනි, වැටෙති; භවෙසු, (කාමාදි) භවයන්හි; නිච්චා, නිත්‍යවූ; කොචි, කිසිවෙක්; නහි (හොති) නොවේමැයි.

14 වෙලානවෙ පවුතරොරු තරඞ්ගමාලා
නාසං වජනනි සතතං සලිලාලයස්ස,
නාසං තථා සමුපයනනි නරාමරානං
පාණානි දරුණතරෙ මරණොදධිම්හි.

14. සලිලාලයස්ස, සාගරයාගේ; (පවුතරොරුතරඞ්ගමාලා) පවු තර, අතිශයින් ස්ථිරවූ; උරු, මහත්වූ; තරඞ්ගමාලා, රළපඞ්ක්තිහු; වෙලානවෙ, වෙරළ කෙණ; සතතං; අනවරතයෙන්; (නිතර) නාසං, නැසීමට; වජනනි, (යම්සේ) පැමිණෙත්ද; තථා, එපරිද් දෙන්; නරාමරානං, මනුෂ්‍යයන් හා දෙවියන්ගේ; පාණානි, ප්‍රාණයෝ; දරුණතරෙ, අතිසයින් දරුණුවූ; මරණොදධිම්හි, මරණ නමැති සාගරයෙහි; නාසං, නැසීමට; සමුපයනනි, පැමිණෙත්. (තරඞ්ගමාලා සෙයින් භවානතර පරිවර්තී සත්‍ව තෙමේ මරණානත යට පැමිණෙයි, යනු නිස්කෘෂටාර්‍ථයි.)

15 රුඬ්ඩොපි සො රථවරස්සගජාධිපෙහි
යොධෙහි චාපි සබලෙහි ච සායුධෙහි,
ලොකං විචච්ය සද මරණුසහො සො
කාමං නිහනනි භුවනතතය සාලිසණ්ඩං.

15. සො මරණුසහො, ඒ මරණනමැති ව්‍යාඝ්‍රහතෙම; (රථවර ස්සගජාධිපෙහි) රථවර, උත්තම රථද; අස්ස, අස්හුද; ගජාධිපෙහි, ගජෙන්ද්‍රය (යන මොවු) න් විසින්ද; සබලෙහි, බල සහිතවූ; (හෙවත් ශක්තිඇති) සායුධෙහි, ආයුධ සහිතවූ; යොධෙහි ච අපි, යොධයන් විසින්ද; රුඬ්ඩො අපි, වලක්වනලද්දේ නමුදු; ලොකං, (සත්‍ව) ලොකයා; විචච්ය, විශෙෂයෙන් වචාකොට; (නොහොත් මුලා කොට) (භුවනත්තයසාලිසණ්ඩං) භුවනත්තය, භවත්‍රය (වාසීජන) නමැති; සාලිසණ්ඩං, හැල් (වනය) කෙත; සද, හැමකල්හි; කාමං, එකාන්තයෙන්; නිහනනි, (අනුභවකොට) නසයි; (නොහොත් ගොචරස්ථානය කෙරෙයි) (මරණ නමැති ව්‍යාඝ්‍රරාජ තෙම භුව නත්‍රය වාසී සත්‍ව නමැති සාලිසෙෂත්‍රයෙහි පරමාධිප්‍රත්‍යය කෙරෙ මින් නිරවශෙෂ කොට වනසාලයි, යනු භාවාර්‍ථයි.)

16 හො මාරුතෙන මහතා විහතො පදීපො
ඛිප්පං විනාසමුඛමෙති මහප්පභොපි,
ලොකෙ තථා මරණචණ්ඩසමීරණෙන
ඛිප්පං විනස්සති නරායු මහාපදීපො.

16. හො, භවත්නි! මහතා මාරුතෙන, මහත්වූ පවනින්; විහතො, පහරණලද; මහප්පභොපි, මහත් ආලොකඇත්තාවූද; පදීපො, ප්‍රදීපයතෙම; ඛිප්පං, වහා; විනාසමුඛං එති, (යම්සේ) විනාසමුඛයට පැමිණේද; තථා, එපරිද්දෙන්ම; ලොකෙ, (සත්ව) ලොකයෙහි; (මරණචණ්ඩසමීරණෙන) මරණ, මරණනැමති; චණ්ඩසමීරණෙන, සැඩපවන් කරණකොටගෙණ; (නරායුමහාපදීපො), නරායු, මිනිසුන්ගේ ආයුනමැති; මහාපදීපො, මහත් ප්‍රදීපය (පහන) තෙම; ඛිප්පං, වහා; විනස්සති, විශෙෂයෙන්ම නස්නේය. (චණ්ඩමාරුතයෙන් මහත් ප්‍රදීපසෙයින් මනුෂ්‍යායුප්‍රදීපයතෙම මරණනාමැති මාරුතයෙන් වැනසෙයි සේයි.)

17 රාමජ්ජුනප්පභුති භූපතිපුඞ්ගවාච
සූරා පුරෙ රණමුඛෙ විජිතාරි සඞ්ඝා,
තෙ පීහ චණ්ඩමරණොඝ නිමුග්ගදෙහා
නාසං ගතා ජගති කෙ මරණා පමුත්තා.

17. පුරෙ, පූර්වකාලයෙහි; සූරා, සූරවූ (හෙවත්) දක්‍ෂවූ; රණමුඛෙ, යුධමඬලයෙහි; විජිතාරිසඞ්ඝා, දිනනලද ශත්‍රුසමූහයා ඇති; (රාමජ්ජුනප්පභුති භූපති පුඞ්ගවාච) රාම, රාම (රජ) ය; අජ්ජුන, අර්ජුන (රජ) ය; පභුති, (යන මොවුන්) ප්‍රභෘතිකොට ඇත්තාවූ; භූපති පුඞ්ගවාච, (යම්) පෘථිවීශ්වරයෝ වූවාහුද; (හෙවත්) නරපතීන් හා පුරුෂශ්‍රෙෂ්ඨයෝ වූවාහුද; තෙ අපි, ඒ පෘථිවීශ්වරයෝ පවා; ඉහ, මේ ලෙව්හි; (චණ්ඩමරණොඝ නිමුග්ගදෙහා) චණ්ඩ, සැඩවූ; මරණොඝ, මරණ නමැති ඕඝයෙහි; (හෙවත්) චණ්ඩශ්‍රොතයෙහි; නිමුග්ගදෙහා, ගිලුනු ශරීර ඇත්තාහු; නාසං ගතා, නැසීමට (මරණයට) පැමිණියාහුය; ජගති, ලොකයෙහි; කෙ, කවරහු; මරණා, මරණින්; පමුත්තා, මිදුනාහු වෙත්ද; (සියල්ලෝම මරණපරායනහයි සේයි.)

18 ලක්ඛී ච සාගරපථා සධරා ධරා ච
සම්පත්තියො ච විවිධා අපි රූපසොභා,
සබ්බා ච තා අපිච මිත්ත සුතා ච දාරා
කෙ වාපි කං අනුගතා මරණං වජන්තං.

18. ලක්ඛිච, ඓශ්වය්‍ය්‍යයද; සාගරපටා, සාගරයම වස්ත්‍රකොට ඇති; සධරා, පර්‍වත සහිතවූ; ධරාච, පෘථිවි තොමෝද; විවිධා, අනෙකප්‍රකාරවූ; සම්පත්තියොච, සම්පත්තීහුද; (යන) තා සබ්බා, ඒ සියලූ; (අවිඥානක) වස්තූහුද; අපි, යලිත්; රූපසොභා, රූපසෞන්‍දය්‍ය්‍ය ඇත්තාවූ; මිත්තපුත්තාච, මිත්‍රයන් හා පුත්‍රයෝද; දාරාඅපිච, ස්ත්‍රීහු (භායර්‍යාවෝ) ද; (යන සවිඥානක වස්තූහුද) කෙවාපි, කවුරුහුනම්; මරණං වජ්ජන්තං, මරණයට පැමිණෙන්නාවූ; කං, කවරපුද්ගලයෙකු; අනුගතා, අනුවගමනය කළෝද; (හුදෙක්ම භවාන්තරගාමී හෙයින් කිසිවෙක් නොමැතිමැයි සේයි.

19 බ්‍රහ්මාසුරා සුරගණා ච මහානුභාවා
ගන්ධබ්බකින්නරමහොරග රක්ඛසා ච,
තෙවාපරෙ ච මරණග්ගිසිඛාය සබ්බෙ
අන්තෙ පතන්ති සලභා ඉව ඛීණ පුඤ්ඤා.

19. මහානුභාවා, මහත් ආනුභාව ඇති; බ්‍රහ්මාසුරා, බ්‍රහ්මයන් හා අසුරයෝද; සුරගණාච, දිව්‍යසමූහයෝද; (ගන්ධබ්බකින්නරමහොරගරක්ඛසාච) ගන්ධබ්බ, ගන්ධර්‍වයෝද; කින්නර, කිංපුරුෂයෝද; මහොරග, (පඨවිඨක කුඩලාදී) මහත් උරග (ජාතිහුද; (නොහොත් චූලොදර මහොදරාදි) මහානාගරාජයෝද; රක්ඛසාච, (රාත්‍රිඤ්චර අඝුරාදි) රාක්‍ෂසයෝද; (යන) තෙච,ඔවුහුද: අපරෙ සබ්බෙච, අන්‍ය (සුපර්ණාදි) සියල්ලෝද; ඛීණපුඤ්ඤා, ක්‍ෂයවූ පින් ඇත්තාහු; සලභාඉව, පලගැටියන්මෙන්; අන්තෙ, (කර්මජතෙජොධාතු යයි කියනලද ආයුෂයාගේ) කෙළවර; මරණග්ගිසිඛාය, මරණ නමැති වහ්නිසිඛාවෙහි; (අනුප්‍රාන්ත ඉන්ද්‍රිය භෙදයෙන්) පතන්ති, වැටෙත්; (මරණ පරායනහ යනුයි.)

20 යෙ සාරිපුත්ත පමුඛා මුනිසාවකා ච
සුද්ධා සදා සවනුද පරමිද්ධිපත්තා,
තෙ චාපි මච්චුවළභාමුඛසන්තිමුඛගා
දීපානි වානිලහතා ඛයතා මුපෙතා.

20. සදා, හැමකල්හි; සුද්ධා, පරිසුද්ධවූ; (නිර්මලවූ) ආසවනුදා, (කාමාදි චතුර්විධ) ආශ්‍රවයන් පහකළාවූ; (නොහොත්) නැසුවාවූ: පරමිද්ධිපත්තා, උත්තම ආනුභාව සමෘද්ධියට පැමිණියාවූ; සාරිපුත්ත පමුඛා, ශාරීපුත්‍ර (ස්ථවිර) ප්‍රමුඛකොට ඇත්තාවූ; යෙ මුනිසාවකාච, යම් සර්‍වඥශ්‍රාවකයෝත් වූවාහුද; තෙචඅපි, උන්වහන්සේලා පවා ත්; (මච්චුවළභාමුඛසන්නිමුඛගා) මච්ච, මරණ නමැති, වළභාමුඛ, වඩබාමුඛයෙහි; සන්නිමුඛගා, මෙසෙසින් ගිලූනාවූ;

අනිලහතා, සුළඟින් නසනලද්දාවූ; දීපාහි ඉව, ප්‍රදීපයන්මෙන්; ඛයතං, ක්‍ෂයභාවයට: උපෙතා, පැමිණියෝ වූහ; (නිකෙලශී මහරහතන්වහන්සේලා පවාත් මරණපරායනවූහයි අනුසන්ධාන කට යුතුයි.)

21 බුද්ධාපි බුද්ධ කමලාමලචාරුනෙත්තා
බත්තිංසලක්ඛණවිරාජිතරූපසොභා,
සබ්බාසවක්ඛයකරාපිච ලොකනාථා
සම්මද්දිතා මරණමත්තමහාගජෙන.

21. (බුද්ධකමලාමල චාරුනෙත්තා) බුද්ධ, ප්‍රබුද්ධවූ; (නොහොත්) පිපියාවූ; කමල, පියුම්සේ; අමල, නිර්මලවූ; චාරුනෙත්තා, මනොඥවූ(පඤ්චවර්ණප්‍රසාද)නෙත්‍ර ඇති; (බත්තිංසලක්ඛණ විරාජිත රූපසොභා) බත්තිංසලක්ඛණ, ද්වාත්‍රිංශද්වර(මහාපුරුෂ)ලක්ෂණයෙන්; විරාජිත, වෙසෙසින් බබලනලද; රූපසොභා, රූපසෞන්දර්‍ය්‍ය ඇති; සබ්බාසවක්ඛයකරා අපිච, සියලු(කාමාදි)ආශ්‍රවයන් ක්‍ෂයකළාවූම; ලොකනාථා, ලොකස්වාමිවූ; බුද්ධා අපි, සම්‍යක්සම්බුද්ධයන්වහන්සේලාපවා; (මරණමත්තමහාගජෙන)මරණ, (පඤ්ච) මාර නමැති; මත්ත, මත්වූ; මහාගජෙන, මහත්වූ හස්ති(රාජ)යා විසින්; සමමර්ද්දිතා, අත්‍යර්ථයෙන් මර්දනා ලද්දෝ වූහ.

22 රොගාතුරෙසු කරුණා න ජරාතුරෙසු
ඛිඩ්ඩාපරෙසු සුකුමාරකුමාරකෙසු,
ලොකං සදා හනති මච්චුමහාගජින්දො
දවානලො වනමිවාවිරතො අසෙසං.

22. රොගාතුරෙසු, රොගයෙන් පීඩිතයන් කෙරෙහිද; ජරාතුරෙසු, ජරාවෙන් පීඩිතයන් කෙරෙහිද; (හෙවත්) වයොවෘද්ධයන් කෙරෙහිද; ඛිඩ්ඩාපරෙසු, ක්‍රීඩායෙහි අභිරති ඇත්තාවූ; සුකුමාරකුමාරකෙසු, සිව්මැලි කුමරුවන් කෙරෙහිද; නකරුණා, කරුණාවක් නොවෙයි; වනං, වනයක්; අවිරතො, (දැවීමෙහි) තෘප්තියක් නැත්තාවූ; දවානලො ඉව, ලැව්ගින්නක් මෙන්; මච්චුමහාගජින්දො, මරණ නමැති මහා ගජෙන්ද්‍රතෙම; අසෙසං ලොකං, සමස්ත ලොකයා; (නොහොත්) ලොකං, ලෙව්වැසි ජනයා; අසෙසං, නිරවශෙෂකොට; සදා, හැමකල්හි; හනති, නසයි.

(වෘද්ධ බාලාදි කිසිවෙක් ශෙෂනොකොට සමස්තජනතාව වනසාලයි යනු භාවයි.)

23 ආපූණ්ණතා න සලිලෙන ජලාලයස්ස
කට්ඨස්ස චාපි බහුතා න හුතාසනස්ස,
භුඤ්ජාන් සො තිභුවනම්පි තථා අසෙසං
භො නිද්දයො න ඛලු පීතිමුපෙති මච්චු.

23. භො, භවන්නි! ජලාලයස්ස, සාගරයසම්බන්ධව; සලිලෙන, (නානාස්ථානයෙන්පැමිණෙනගඞ්ගාතඩාගාදීන්ගේ) ජලය කරණකොටගෙණ; ආපූණ්ණතා, හාත්පසපිරිම්බවක්; න, නොවේද; හුතාසනස්ස, වහ්නියසම්බන්ධව; කට්ඨස්සච අපි, කාෂ්ඨයාගේත්; බහුතා, බොහෝබවක්; න, නොවේද; තථා, එපරිද්දෙන්ම; නිද්දයො, කරුණාරහිතවූ, සො මච්චු, ඒ මෘත්‍යුතෙම; අසෙසං තිභුවනං, නිරවශෙෂ භුවනත්‍රය වාසීජනසමූහයා; (සියලු තුන්ලොව්) භුඤ්ජාන් අපි, අනුභවකොටත්; ඛලු, එකාන්තයෙන්; පීතිං, ප්‍රීතියකට; (ඇතැයි යන තෘප්තියකට) න උපෙති, නොපැමිණේ.

24 භො මොහමොහිතනයා විවසො අධඤ්ඤො
ලොකො පතත්‍යපිහි මච්චුමුඛෙ සුභීමෙ,
භොගෙ රතිං සමුපයාති විහීනපඤ්ඤො
දොලාතරඞ්ගචපලෙ සුපිනොපමෙය්‍යෙ.

24. භො, භවන්නි; විවසො, වසහරිතවූ; අධඤ්ඤො, පින්නැත්තාවූ; විහීනපඤ්ඤො, විශෙෂයෙන් හීනප්‍රඥාඇත්තාවූ, (නොහොත්) අන්‍යවියෙන් ලාමකවූ; ලොකො, ලෝවැසිතෙම; සුභීමෙ, අතිශයින් භයානකවූ; මච්චුමුඛෙ, මරුමුවෙහි; පතතිහි, වැටේමය; අපි, නමුත්; මොහමොහිතනයා, මොහයෙන් මූඪවන බැව් හෙතුකොටගෙණ, (දොලාතරඞ්ගචපලෙ) දොලා, හෝ විළිහා; තරඞ්ග, රළපතරමෙන්ද; චපලෙ, චඤ්චලවූ; (හෙවත්) අස්ථිරවූ; සුපිනොපමෙය්‍ය, ස්වප්නයක් හා උපමා කටයුතුවූ; (නොහොත්) ස්වප්නයකටබඳු උපමාඇති; භොගෙ, භොගයෙහි; (නොහොත්) පස්කම්සැපයෙහි; රතිං, අභිරතියට; සමුපයාති, මොනවට පැමිණේ; (භවමොහයෙන් විකලවූ සත්වතෙම ඡන්දරාගවශයෙන් පඤ්චකාම සුඛාස්වාදරතියෙන් ග්‍රථිත වෙයි යනු අවබොධකටයුතුයි.)

25 එකොපි මච්චුරභිහන්තුමලං තිලොකං
කිං නිද්දයා අපි ජරාමරණානුයායී,
කො වා කරෙය්‍ය විභවෙසු ච ජීවිතාසං
ජාතො නරො සුපිනසඞ්ගමසන්නිභෙසු.

25\. එකොපි, හුදකලාවූද; මච්චු, මෘත්‍යුතෙම; තිලොකං, තුන් ලොව; අභිහන්තුං, වනසන්නට; අලං, සමර්ථවෙයි; නිද්දයා, නිදි මෙන්; කිං, කවර ප්‍රයෝජනද; ජරාමරණානුයායී අපි, ජරාව හා මරණය අනුව යන සුලුවූම; ජාතො, උපන්නාවූ; කොවා නරො, කවරනම් මනුෂ්‍යයෙක් (සත්‍වයෙක්) තෙම; සුපිනසඞ්ගමසන්නි භෙසු, ස්වප්නයෙන් වන සඞ්ගමයක් (එකතුවීමක්) හා සමානවූ; විභවෙසුච, සම්පත්තියෙහිද; ජීවිතෙ, ජීවිතයෙහිද; ආසං, ආලය; කරෙය්‍ය, කරන්නේද.

> 26 නිච්චාතුරං ජගදිදං සභයං සසොකං
> දිස්වා ච කොධමදමොහජරාභිභූතං,
> උබ්බෙගමත්තමපි යස්ස න විජ්ජතී වෙ
> සො දාරුණො න මරණො වත තං ධිරත්ථු.

26\. නිච්චාතුරං, සතතයෙන් (චක්ෂුරාදි රොගයන්ගෙන්) ආතු රවූ; සභයං, භයසහිතවූ; සසොකං, සෝක සහිතවූ; (කොධමද මො හජරාභිභූතං) කොධ, (නවාඝාතවස්තුකවූ) ක්‍රොධයද; මද, (රාගාදි) මදද; මොහ, (මුග්ධහාලක්ෂණවූ) මෝහයද; ජරා, (පරිපාක ලක්ෂණවූ) ජරාවද; (යන මෙයින්) අභිභූතං, මඩනාලද්දාවූ; (හෙවත්) යටකරණ ලද්දාවූ; ඉදං ජගදං, මේ ලෝකය; දිස්වා ච, දුකද; යස්ස, යමෙකුට; උබ්බෙගමත්තං අපි, උවෙග මාත්‍රයකුදු: (හෙවත්) සසර කලකිරීම් පමණකුදු; න විජ්ජති වෙ, ඉදින් නොවන්නේනම්; සො, ඒ (සත්‍ව) තෙම, දාරුණො, දරුණුවෙයි: මරණො, මරණයතෙම, න, (දරුණු) නොවෙයි, වත, එකාන්තයෙන්; තං, ඒ (කලනොකිරෙන්නාවූ) පුහුලා හට; ධී අත්ථු, නිඥුවේවා.

> 27 භො භො න පස්සථ ජරාසිධරං හි මච්චු-
> මාහන්ඤ්ඤමානමඛිලං සතතං තිලොකං,
> කිං නිද්දයා නයථ විතභයා තියාමං
> ධම්මං සදා සවනුදං චරථප්පමත්තා.

27\. භො භො, භවත්නි ! භවත්නි ! හි, සම්හෙයයින්; ජරාසි ධරං, ජරානමැති ඛඩ්ගයදරන්නාවූ; අඛිලං, සියලු; තිලොකං, තුන් ලෙව් වැසි ජනයා; සතතං, සතතයෙන්; ආහඤ්ඤමානං, හාත් පසින් නසන්නාවූ; මච්චුං, මරුවා; නපස්සථ, (තෙපි) නොදක්න හුද; (එහෙයින්) විතභයා, පහවූ බියඇත්තෝව; (හෙවත්) භය නැත්තෝව; නිද්දයා, නිදිමෙන්; තියාමං, තුන්යම්රාත්‍රිය; කිං නයථ, කෙසේනම් යවවද; (හෙවත්) ඉක්මවච්ද; ආසවනුදං, ආශ්‍රවයන් නසන්නාවූ; ධම්මං, (දසවිධකුසල) ධර්මයෙහි; සදා, සැමකල්හි; අප්පමත්තා, ප්‍රමාදරහිතවූ; (තෙපි) චරථ, හැසිරෙව්.

28 භාවෙථ භො මරණමාරවිවජ්ජනාය
ලොකෙ සදා මරණසඤ්ඤමිමං යතන්තා,
එවංහි භාවනරතස්ස නරස්ස තස්ස
තණ්හා පහීයති සරීරගතා අසෙසා.

28. භො, භවත්නි; (මරණමාරවිවජ්ජනාය) මරණමාර, මෘත්‍යු මාරයාගේ; විවජ්ජනාය, විශෙෂයෙන් හැරීමපිණිස, ලොකෙ, ලොකයෙහි; ඉමං මරණසඤ්ඤං, මේ මරණ සංඥව; (හෙවත්) මරණානුස්මෘතිය; යතන්තා, යත්නභාව ඇත්තාහු; (නොහොත්) එකඟසිතැත්තාවූ; (තෙපි) සදා, සැමකල්හී; භාවෙථ, වඩව්; (හෙවත්) මෙනෙහි කරව්; එවංහි, මෙසේම; භාවනරතස්ස, (මරණසී) භාවනාවෙහි ඇළුනාවූ; තස්ස නරස්ස, ඒ මනුෂ්‍යයා සම්බන්ධිවූ; සරීරගතා, ශරීරයවිෂය කොට පවත්නාවූ; අසෙසා තණ්හා, සියලු තෘෂ්ණාතොමෝ පහීයති, ප්‍රහීණවේ.

29 රූපං ජරා පියතරං මලිනීකරොති
සබ්බං බලං හරති අත්තනි ඝොරරොගො,
නානූපභොගපරිරක්ඛිතමත්තභාවං
භො මච්චු සංහරති කිං ඵලමත්තභාවෙ.

29. ජරා, (ජීර්ණලක්ෂණවූ) ජරාතොමෝ; පියතරං, අතිශයින් ප්‍රියවූ; රූපං, (සීතොෂ්ණාදියෙන් රූපනලක්ෂණවූ) රූපය; (හෙවත් අටවිසිවැදෑරුම්වූ රූපස්කන්ධය) මලිනීකරොති, කිලුටුකෙරෙයි; ඝොරරොගො, භයානකවූ රොගයතෙම; (නොහොත්) (නානාවිධ දරුණුවූ කාශශ්වාෂාදි ව්‍යාධිතෙම) අත්තනි, තමාකෙරෙහි; (වූ) සබ්බං බලං, සියලු බලය; (ශක්තිය) හරති, හැරගණියි; භො, භවත් නි; මච්චු, මෘත්‍යුතෙම; නානූපභොගපරිරක්ඛිතං, නොයෙක් උප භොග (පරිභොග)යෙන් රක්නලද; අත්තභාවං, ආත්මභාවය; (හෙවත්) ජීවිතය; සංහරති, මනාව හැරගණියි; (එහෙයින්) අත්තභාවෙ, ආත්මභාවයෙහි; කිං ඵලං, කවරප්‍රයොජනයක්වේද (නැත්තේමය.)

30 කම්මානිලාපහත රොගතරඞ්ගභඞ්ග
සංසාරසාගරමුඛෙ විතතෙ විපන්නා,
මාමා පමාද මකරිත්ථ කරොථ මොක්ඛං
දුක්ඛොදයං නනු පමාදමයං පරානං.

30. (කම්මානිලාපහත රොගතරඞ්ගභඞ්ග) කම්ම, කර්මනමැති; අනිල, පවනින්; අපහත, නසනලද; රොග, රොග නමැති; තරඞ්ග භඞ්ග, රැළබිඳීම් ඇති; විතතෙ; විශෙෂයෙන් පතළාවූ (හෙවත්) මහත්වූ; (සංසාරසාගරමුඛෙ) සංසාර, (ස්කන්ධාදීන්ගේ අවිච්ඡින්න

ද්‍රව්‍යාන්තිස ඛ්‍යාත)සසරනමැති; සාගරමුඛෙ, සයුරුමුවෙහි; විපජ්ජනා, විශෙෂයෙන් ගමන්කරන්නාහු; (නොහොත්) ගිලෙනාහු; පමාදං, (කුසල්කිරීමෙහි) පමාවක්; මාමා අකරිත්ථ, නොකරව; මොක්ඛං, මොක්ෂය; (හෙවත්) සසරින් මිදීම; කරොථ, කරව; නරානං, මිනිසුන්ගේ; (නොහොත් සත්වයන්ගේ) දුක්ඛොදයං, දුඃඛොත්පත්තිය; (නොහොත්) දුඃඛයාගේ සම්භවය; පමාදමයංනනු, ප්‍රමාදයෙන් නිපදවනලද්දක් නොවේද; (ප්‍රමාදයම දුඃඛොත්පත්තියට හේතුවෙයි සේයි.)

31 භොගා ච මිත්තසුතපොරිසබන්ධවා ච
නාරී ච ජීවිතසමා අපි ඛෙත්තවත්ථු,
සබ්බානි තානි පරලොකමිතො වජන්තං
නානුබ්බජන්ති කුසලාකුසලංව ලොකෙ.

31. භොගාච, සම්පත්තීහුද; (මිත්ත–බන්ධවාච) මිත්ත, මිත්‍රයෝද; සුත, දරුවෝද; පොරිස, පිරිවරජනයෝද; (නොහොත්) පුරුෂයාපිළිබඳවූදේද; බන්ධවාච, බන්‍ධුහුද; ජීවිතසමා, ජීවිතය හා සමවූ; නාරිච, (සිය) බිරින්දද; ඛෙත්තවත්ථු අපි, කෙත්වත්ද; (යන) තානි සබ්බානි, ඒ සියල්ලෝ; ඉතො, මෙලොවින්; පරලොකං, පරලොවට; වජන්තං, යන්නහු කරා; න අනුබ්බජන්ති, අනුව නොයෙත්; (හෙවත්) පසුපස්සෙහි නොයෙත්; ලොකෙ, ලොකයෙහි; කුසලාකුසලං එව, කුසලාකුසල(කර්‍ම)යම (මෙලොවින් පරලොවයන්නහු කරා) (අනුබ්බජති) පසුපස්සේ යයි; (භවාන්තරගාමී සත්වයෝ කර්‍මයම ස්වකීය කොට ඇත්තෝහ යනුයි.)

32 භො විජ්ජුචඤ්චලතරෙ භවසාගරම්හි
ඛිත්තා පුරා කතමහාපවනෙන තෙන,
කාමං විභිජ්ජති ඛ්‍ණෙන සරීරනාවා
භණ්ඩං කරොථ පරමං ගුණභණ්ඩසාරං.

32. භො, භවත්නි; විජ්ජුචංචලතරෙ, විදුලියක් මෙන් අතිශයින් සැලෙන්නාවූ; භවසාගරම්හි, භව නමැති සයුරෙහි; තෙන, ඒ; (පුරාකතමහාපවනෙන) පුරාකත, පූර්‍වයෙහි කරණලද (කුසලාකුසල කර්‍ම) නමැති; මහාපවනෙන, මහත් පවනින්; (සැඩසුලඟින්) ඛිත්තා, ප්‍රේරණය කරණලද්දවූ; සරීරනාවා, ශරීර නමැති නාවුකාතොමෝ; ඛණෙන, ක්‍ෂණයකින්; කාමං, එකාන්තයෙන්; විභිජ්ජති, බිඳෙනු ලැබේ; (එහෙයින්) පරමං, උතුම්වූ; ගුණභණ්ඩසාරං, ගුණ නමැති භාණ්ඩසාරය; (නොහොත්) මෛත්‍රීක්‍ෂමෝපේක්‍ෂාදිගුණ නමැති සාර ධනය; භණ්ඩං, අතෙහි; කරොථ, කරව; (ගුණ ධර්‍මය අත්පත් කරව.)

33 නිච්චං විභිජ්ජතිහ ආමකභාජනංව
සංරක්ඛිතොපි බහුධා ඉහ අත්තභාවො,
ධම්මං සමාචරථ සග්ගගතිප්පතිට්ඨං
ධම්මං සුචින්නමිහමෙව ඵලං දදාති.

33. ඉහ, මේ සත්වලෝකයෙහි; බහුධා, බොහෝ ප්‍රකාරයෙන්; සංරක්ඛිතොපි, මොනවට රකිණලද්දවූද; අත්තභාවො, ආත්මභාව (ශරීර)ය තෙම; ඉහ, මෙහිදීවූ; ආමකභාජනං ඉව, අමුබඳුනක්මෙන්; නිච්චං, සතතයෙන්; විභිජ්ජති, විශෙෂයෙන් බිඳේ, (එහෙයින්) සග්ගගතිප්පතිට්ඨං, ස්වර්ග ගමනට පිහිටවූ; ධම්මං, කුසලධර්මයෙහි; සමාචරථ, මනාකොට හැසිරෙව්; (නොහොත්) ධම්මං, කුසලධර්මය; සංආචරථ, මනාකොට කරව්; සුචින්නං, මනාකොට රැස්කරණලද්දවූ; ධම්මං, කුසලධර්මය; ඉහඑව, මෙලොවදීම; ඵලං, ප්‍රයොජනය (විපාකය) දදාති, දෙයි.

34 රන්ත්වා සදා පියතරෙ දිවි දෙවරජ්ජෙ
තම්හා චවන්ති විබුධා අපි ඛීණපුඤ්ඤා,
සබ්බං සුඛං දිවි භුවීහ වියොගනිට්ඨං
කො පඤ්ඤවා භවසුඛෙසු රතිං කරෙය්‍ය.

34. දිවි, දිව්‍යලොකයෙහි; සදා, හැමකල්හි; පියතරෙ, අතිශයින් ප්‍රියවූ; දෙවරජ්ජෙ, දිව්‍යරාජ්‍යයෙහි; රන්ත්වා, අභිරමනයකොට; ඛීණපුඤ්ඤා, ක්‍ෂයවූ පින්ඇති; විබුධා අපි, දෙවියෝද; තම්හා, ඒ (දෙව්) ලොවින්; චවන්ති, චුතවෙත්; දිවි, දිව්‍යලොකයෙහිද; ඉහ භුවි, මේ පෘථිවියෙහිද; සබ්බං සුඛං, සියලු සැපය; වියොගනිට්ඨං, වෙන්වීම කෙළවරකොට ඇත්තේය; පඤ්ඤවා, ප්‍රඥාඇත්තාවූ; කො, කවරෙක්; භවසුඛෙසු, භවසම්පත්තීන්හි; රතිං, අභිරමනය; කරෙය්‍ය, කරන්නේද; (භවපර්‍යාපන්නවූ සියලු සම්පත්තිය ස්ථිරනොවන හෙයින් එබන්දෙහි අනභිරතිය ඉපදවියයුතු.)

35 බුද්ධො සසාවකගණො ජගදෙකනාථො
තාරාවලී පරිවුතොපිව පුණ්ණචන්දො,
ඉන්දොප්‍ය දෙවමකුටඝට්ටිතපාදකඤ්ජා
කො වෙ අපිණ්ඩනසමො තිභවෙසු ජාතො.

35. ජගදෙකනාථො, ලොකයාහට අසහායස්වාමිවූ; සසාවකගණො, ශ්‍රාවක සමූහයා සහිතවූ; බුද්ධො, සම්‍යක්සම්බුද්ධ තෙමේද; තාරාවලීපරිවුතො, තරුවැලින් පිරිවරණලද; පුණ්ණචන්දො අපිව, පුර්ණසඳ තෙමේද; (දෙවමකුටඝට්ටිතපාදකඤ්ජා) දෙව, දෙවියන්ගේ;

මකුට, ඔටුන්නෙත්; අඞ්ගිත, ලකුණුකරණලද; (නොහොත් සපගි කරණලද; පාදකඤ්ජා, පාදපද්ම ඇති; ඉන්ද්‍රොපි, ශක්‍රතෙමේද; තිභවෙසු, භවත්‍රයෙහි; ජාතො, උපන්නාවූ; කො, කවරෙක්තෙම; ඵෙනපිණ්ඩසමො, පෙනපිඩක් හා සමනොවේද; (සියල්ලෝම ඵෙනපිඩු සමානවෙත්ය යනුයි.)

36 ලීලාවතංසමපි යොබ්බනරූපසොභං
අත්තූපමං පියජනෙනව සම්පයොගං,
දිස්වාව විජ්ජුචපලං කුරුතෙ පමාදං
භො මොහමොහිතජනො භවරාගරත්තො.

36. භො, භවත්නි; ලීලාවතංසං අපි, ලීලාවට අවතංසයක්වූ (නොහොත්) විලාසයට පලන්මල්කඩක් වැනිවූ; (යොබ්බනරූපසොභං) යොබ්බන, යෞවනභාවයෙන් යුක්තවූ; රූපසොභං, රූපසොභා ඇත්තහුද; අත්තූපමං, ආත්මය හා සමානවූ; පියජනෙන, ප්‍රියජනයා හා (නොහොත්) මිත්‍රයා හා; සම්පයොගංච, එක්වීමද; විජ්ජුචපලං, විදුලියක්සේ අස්ථිරවූවා; දිස්වාව, දැකද; භවරාගරත්තො, භවයෙහි ඡන්දරාගයෙන් රත්වූ; මොහමොහිතජනො, මොහයෙන් මුලාවූ ජනතෙම; පමාදං, ප්‍රමාදය; කුරුතෙ, කෙරෙයි; (මොහයෙන් මුලාවූ සත්‍වතෙමේධර්මානුධර්මප්‍රතිපත්තියෙහිප්‍රමාදවෙයි සේයි.)

37 පුත්තො පිතා භවති මාතුපතීහ පුත්තො
නාරී කදාචි ජනනීච පිතාච පුත්තො,
එවං සදා විපරිවත්තති ජීවලොකො
චිත්තෙ සදාතිචපලෙ බහු ජාතිරඞ්ගෙ.

37. ඉහ, මේ කාලයෙහි(වූ); පුත්තො, පුත්‍රතෙම; කදාචි, කිසි (යම්) කලෙක; පිතා භවති, පියවන්නේය; (මෙහිදීවූ) මාතුපති, මාතෘස්වාමි (පිය) තෙම; (කිසිකලෙක) පුත්තො (භවති) පුත්‍රයෙක් (වන්නේය); නාරී, ස්ත්‍රීතොම; (කිසිකලෙක) ජනනීච, මවුද; පිතාච, පියෙක්ද; පුත්තො, පුත්‍රයෙක්ද (වන්නේය) එවං, මෙසේ; ජීවලොකො, සත්‍වලොකයතෙම; සදා, හැමකල්හි; අති චපලෙ, අතිශයින් චචලවූ; (නොහෙත්) අස්ථිරවූ; චිත්තෙ, විචිත්‍රවූ; ජාතිරඞ්ගෙ, ජාතිනමැති නාට්‍යමණ්ඩලයෙහි; බහු,එකාන්තයෙන්; සදා,හැමකල්හි;විපරිවත්තති, විශෙෂයෙන් පරිවර්තනය වෙයි (හෙවත්) පෙරලෙයි.

38 රජ්ජන්ති පුරෙ විවිධඵුල්ල ලතාකුලෙහි
දෙවාපි නන්දනවනෙ සුරසුන්දරීහි,
තෙ වෙ කදා විතතකණ්ටක සඞ්කටෙසු
හො කොට්සිම්බලිවනෙසු ඵුසන්ති දුක්ඛං.

38. හො, භවත්නි! පුරෙ; පූර්ව(භව)යෙහි; (විවිධ-කුලෙ) විවිධ, නානාප්‍රකාරවූ; ඵුල්ල, පිපියාවූ; ලතාකුලෙ, ලියෙන් ගැවසිගත්තාවූ; නන්දනවනෙ, නන්දුන්වනයෙහි; සුරසුන්දරීහි, දිව්‍යකාන්තාවන්සමග; රජ්ජන්ති, අභිරමනයකොට; තෙ දෙවා අපි, ඒ දෙවියෝ පවා; (විතත-ටෙසු) විතත, විසානණිවූම; කණ්ටක, (සොළොස් අඟුල් පමණ) කටු යෙන්; සඞ්කටෙසු, ගැවසිගත්තාවූ; කොට්සිම්බලිවනෙසු, කොළඹ ඹුල්වනයන්හි; එකදා, ඇතම් කලෙක; වෙ, එකාන්තයෙන්; දුක්ඛං, දුක; ඵුසන්ති, ස්පර්ශකෙරෙත්; හි, ඒ එසේමැයි; (සංසාරගතම් සත්ව යන්ගේ පැවැත්ම අස්ථිර බැවිනැයි සැලකියයුතු)

39 භුත්වා සුධන්නමපි කඤ්චන භාජනෙසු
සග්ගෙ පුරෙ සුරවරා පරමිද්ධිපත්තා,
තෙ වාපි පජ්ජලිතලොහගුලං ගිලන්ති
කාමං කදාචි නරකාලයවාසභූතා.

39. (යෙ, සම්කෙනෙක්) සග්ගෙ පුරෙ, ස්වර්ගපුරයෙහි; කඤ්චන භාජනෙසු, කසුන්බඳුන්හි; සුධන්නං, සුධාභොජනය; භුත්වා, අනුභව කොට; පරමිද්ධිපත්තා, උත්තම සමෘද්ධියට පැමිණියාහුද; තෙ සුරවරා අපිච, ඒ දෙවොත්තමයෝ පවාත්; කදාචි, කිසි (යම්) කලෙක; නරකාලයවාසභූතා, නිරයෙහි වාසයඇත්තෝ; (නොහොත්) නිරය වැස්වූවෝ; කාමං, එකාන්තයෙන්; (පජ්ජලිතලොහගුලං) පජ්ජලිත, දිලියෙන්නාවූ; ලොහගුලං, ලොහගුලි; ගිලන්ති, ගිලිත්; (නොහොත්) අනුභව කරත්.

40 භුත්වා නරිස්සරවරා ච මහිං අසෙසං
දෙවාධිපා ච දිවි දිබ්බසුඛං සුරම්මං
වාසං කදාචි බ්‍රුරසඤ්චිත භූතලෙසු
තෙ වා මහාරථගණානුගතා දිවහ.

40. ඉහවා, මේ මනුෂ්‍යලෙකයෙහි හෝ; දිවිවා, දිව්‍යලොක යෙහි හෝ; මහාරථගණානුගතා, මහත් රථසමූහයෙන් (ඔබ්බොබ) අනුව යනලද්දවූ; තෙ, ඒ; නරිස්සරවරා, නරෙන්ද්‍රොත්තමයෝ තුමූ; අසෙසං, නිරවශෙෂකොට (නොහොත්) සියලු; මහිං, පෘථිවිය; භුඤ්ජාව, අනුභවකොටද; (නොහොත් ධනාංසලාභාදියෙන් සමෘද්ධ

ධරණියෙහි එකාධිප්‍රත්‍යය කොටද) දෙවාධිපා, දිව්‍යශ්‍රෙෂ්ඨයෝ තුමූ; දිවි, දිව්‍යලොකයෙහි; සුරම්මං, අතිශයින් රම්‍යවූ; දිබ්බං සුඛං, දිව්‍ය සම්පත්තිය; (භුඤ්ජාච) අනුභවකොටද; කදාචි, කිසි(යම්) කලෙක්හි; (ඛුර–තෙලෙසු)ඛුරසඤ්චිත,ක්ෂුර(ධාරා)හසුරුවනලද හෝ ගැවසීගත් නාලද; භූතලෙසු, පෘථිවීතලයන්හි; වාසං, විසීමට; (පපොපාන්ති) පැමිණෙත්.

(භවසම්පත්තීන්ගේ විපරිනාමස්වභාව හෙයිනැයි දතයුතුයි.)

41 දෙවඞ්ගනා ලලිතභින්නතරඞ්ගමාලෙ
ගඞ්ගෙ මහිස්සරජටාමකුටානුයාතෙ,
රන්ත්වා පුරෙ සුරවරා පමදා සහායා
තෙචාපි ඝොරතරවෙතරණිං පතන්ති.

41. පුරෙ, පූර්ව(භව)යෙහි; (පමදාසහායා)පමදා, ප්‍රමදාවෝ(හෙවත්) දිව්‍යකාන්තාවෝ; සහායා, සහායකොට ඇති; තෙ සුරවරාච අපි, ඒ සුරෙන්ද්‍රයෝ පවා (දෙවඞ්ගනා–මාලෙ) දෙවඞ්ගනා, දෙවඟනන්විසින්; ලලිත, ලෙලවනලද; භින්න, බිඳිනාලද; තරඞ්ගමාලෙ, රළමාලා ඇති; (මහිස්සර–යාතෙ) මහිස්සර, මෙහෙසුරුහුගේ; ජටාමකුට,ජටා නමැති කිරීටයෙන්; අනුයාතෙ, අනුව යනලද්දාවූ; ගඞ්ගෙ, ගඞ්ගා නදීප්‍රවාහයෙහි; (හෙවත්) අහස්ගඟ; රන්ත්වා, අභිරමනය කොට; (ඝොර–රණිං) ඝොරතර, අතිශයින් භයානකවූ; වෙතරණිං, වෙතරණීනම් (ඔසුපත්) නරකයෙහි; පතන්ති, වැටෙත්.

42 ඵුල්ලානි පල්ලවලතාඵලසඞ්කුලානි
රම්මානි නන්දනවනානි මනොරමානි,
දිබ්බච්ඡරා ලලිතපුණ්ණදරීමුඛානි
කෙලාසමෙරුසිඛරානි ච යන්ති නාසං.

42 ඵුල්ලානි, පුෂ්පිතවූ; (හෙවත්) පිපියාවූ;(පල්ලව–සඞ්කුලානි) පල්ලව, පලුපත්ය; ලතා, ලියය; ඵල, ඵලය; (යන මෙයින්) සංකුලානි, ගැවසීගත්තාවූ; රම්මානි, රම්‍යවූ; (නොහොත්) නෙත් පිනවන්නාවූ; මනොරමානි, මනරම්වූ; (නොහොත්) සිත් පිනවන්නාවූ; නන්දනවනානි, නඳුන්වනයෝ(ද);(දිබ්බ–මුඛානි)දිබ්බච්ඡරා, දෙවඟනන් විසින්; ලලිත, විලාසකරණලද; පුණ්ණ, පිරුණාවූ; දරීමුඛානි, ගුහාද්වාර ඇති; කෙලාසමෙරු සිඛරානිච, කෛලාස (පර්වත) මෙරු (පර්වත) මස්තකයෝද (යන මොව්හු;) නාසං, නැසීමට; යන්ති, පැමිණෙත්.

43 දෙලානලානිලතරඞ්ගසමා හි භොගා
විජ්ජුප්පභානිචපලානි ච ජීවිතානි,
මායාමරීචිජලසොමසමං සරීරං
කො ජීවිතෙ ච විභවෙ ච කරෙය්‍ය රාගං.

43 හි, යම්හෙයකින්; භොගා, (උපභොග පරිභොග) සම්පත්තීහු; (දෙලා-සමා) දෙලා, හෝඩිලිය; අනල, ගිනිය; අනිල, මාරුතය; තරඞ්ග, රළය (යන මොවුන්හා) සමා, සමානවෙත්ද; ජීවිතානි, ජීවිතයෝ (නොහොත්) ජීවිතෙන්ද්‍රිය ප්‍රතිබද්ධ සත්ත්වයෝ; විජ්ජුප්පභානි චපලානිච, විද්‍යුත්ප්‍රභාවයක් මෙන් අතිශයින් අස්ථිරවූවෝත් වෙත්ද; සරීරං, ශරීරය තෙම; (මායා-සමං) මායා, මායාවය (හෙවත්) ඉන්ද්‍රජාලය; මරීචි, මිරිඟුය; ජලසොම, ජලයෙහි (දෘශ්‍යමාන) චන්ද්‍රයාය; (යන මොවුන් හා)සමං, සම(වේද); (එහෙයින්) කො, කවරෙක්තෙම; ජීවිතෙච, ජීවිතයෙහිද; විභවෙච, සම්පත්තියෙහිද; රාගං, (රඤ්ජන සංඛ්‍යාත) ඇල්ම; කරෙය්‍ය, කරන්නේද.

44 කිං දුක්ඛමත්ථි න භවෙසු ච දාරුණෙසු
සත්තොපි තස්ස විවිධස්ස න භාජනො කො,
ජාතො යථා මරණරොගජරාභිභූතො
කො සජ්ජනො භවරතිං පිහයෙය්‍ය බාලො.

44. දාරුණෙසු, දරුණුවූ; භවෙසු, (කාමාදි) භවයන්හි; කිංච, කුමක්නම්; දුක්ඛං, දුකක්; න අත්ථි, නැත්තේද (හෙවත්) කුමක් නම් දුක්නොවේද; විවිධස්ස, නානාවිධවූ; තස්ස, ඒ දුඃඛයට; කො, කවරනම්; සත්තො අපි, සත්ත්වයෙකුත්; භාජනො, බඳුනක්; න, නොවේද; (හෙවත්) පිහිට නොවේද; යථා, යම්සේ: ජාතො, උපන්නාවූ; (මරණ-භූතො) මරණ, මරණය; රොග, (චක්ෂුරාදි නානාවිධ) රෝගය; ජරා, (පරිපාකලක්ෂණ) ජරාවය; (යන මෙයින්) අභිභූතො, මඩනාලද්දාවූ (නොහොත්) යටකරණලද්දාවූ; අබාලො, බාලනුවූ; (නොහොත්) උභයාර්ථභඤ්ජන ලක්ෂණ) බාලභාව රහිතවූ; කො, කවරනම්; සජ්ජනො, යහපත් (සත්පුරුෂ) ජනයෙක් තෙම; භවරතිං, භවයෙහි ඇල්ම (නොහොතේ) භවසම්පත්තිය; පිහයෙය්‍ය, කැමතිවන්නේද; (සත්පුරුෂතෙම භවසුඛාස්වාදනයෙන් ග්‍රථිතනොවෙයි සේයි.

45 කො වාපි පජ්ජලිතලොහගුළං ගහෙතුං
සක්කො කථඤ්චිදපි පාණිතලෙන භීමං,
දුක්ඛොදයං අසුචි නිස්සවණං අනත්තං
කො කාමයෙථ බහු දෙහමිමං අබාලො.

45. කොචාං, කවරෙක්නම්; භීමං අපි, බිහිසුනාවූම; පජ්ජලිත ලොහගුලං, ප්‍රකෂීයෙන් දිලියෙනලොහගුලියක්; පාණිතලෙන, හැනතලයෙන්; ගහෙතුං, ගන්නට; කථං, කෙසේනම්; සක්කා අපි, හැකිවන්නේද? අබාලො, බාලනුවූ (හෙවත්) පණ්ඩිතවූ; කො, කවරෙක් තෙම; බලු, එකාන්තයෙන්; දුක්ඛාදයං, දුඃඛොත්පත්ති යට කාරණාවූ; අසුචි නිස්සවණං, අසුචි වැහෙන්නාවූ; අනත්තං, ආත්මභාව රහිතවූ; (නොහොත්) වසඟනොවූ; ඉමං දෙහං, මේ ශරීරයඃ කාමයෙඵ, කැමතිවන්නේද? (නොවන්නේමය.)

46 ලොකෙ න මච්චුසමමත්ථි භයං නරානං
න ව්‍යාධිදුක්ඛසමමත්ථි ච කිඤ්චි දුක්ඛං,
එවං විරූපකරණං න ජරාසමානං
මොහෙන භො රතිමුපෙති තථාපි දෙහෙ.

46. භො, භවත්නි! ලොකෙ, (සත්ව) ලොකයෙහි; නරානං, මිනිසුන්ට (නොහොත්) සත්වයින්ට; මච්චුසමං, මරුවා හා සමවූ; භයං, බියක්; නඅත්ථි, නැත්තේය; ව්‍යාධිදුක්ඛසමං, රොග දුඃඛය හා සමානවූ; (හෙවත් ලෙඩදුක් හා සමවූ;) කිඤ්චි දුක්ඛංච, කිසි දුක්කුත්; න අත්ථි, නැත්තේය; එවං, මෙසේම; ජරාසමානං, ජරාව හා සමවූ; විරූපකරණං, විරූපයට කාරණයක්; න (අත්ථි) නැත්තේය; තථාපි, එසේදවුවත්; මොහෙන, මොහයකරණකොටගෙණ; දෙහෙ, සිරුරෙහි; රතිං, ඇල්මට; උපෙති, (සත්වතෙම) පැමිණෙයි; (අවිද්‍යාහෙතුවෙන් පඤ්චස්කන්ධයෙහි ඡන්දරාගය උපදවයි.)

47 නිස්සාරතො නළනලිකදලිසමානං
අත්තානමෙව පරිභඤ්ඤති අත්තහෙතො,
සම්පොසිතොපි කුසහාය ඉවාකතඤ්ඤු
කායො න යස්ස අනුගච්ඡති කාලකෙරා.

47. කායො, ශරීරය තෙම; නිස්සාරතො, අසාරහෙයින්; (නළනලි කදලිසමානං) නළ, කුළල්බටය; නලී; හුණය; කදලී, කෙසෙල්ය; (යන මොවුන් හා) සමානං, සමවේ; අත්තානං එව, තමාම; අත්තහෙතො, ආත්මයපිණිස; පරිභඤ්ඤති, හාත්පසින්පෙළෙන්නේය;(හෙවත් ආත්මයෙක් ඇතැයි යන මිථ්‍යාකල්පනාවෙන් තමාට දුක්දෙන්නේය) කායො, ශරීරය තෙම; සම්පොසිතො අපි, (අන්නපානාදියෙන්) මනාකොට පොෂණය කරණලද්දේ නමුත්; අකතඤ්ඤු, කෘතඥනොවූ; කුසහායො ඉව, ලාමක මිත්‍රයෙක් පරිද්දෙන්; යස්ස, යමෙකුගේ; කාලකෙරා, කාලක්‍රියාවෙන් ඔබ්බෙහි; නඅනුගච්ඡති, කැටිව නොයේද.

48 තං ඵෙනපිණ්ඩසදිසං විසසූල කප්පං
තොයානලානිලමහී උරගාධිවාසං,
ජිණ්ණාලයංව පරිදුබ්බලමත්තභාවං
දිස්වා නරො කථමුපෙති රතිං සපඤ්ඤො.

48. සපඤ්ඤො, ප්‍රාඥ (පණ්ඩිත)වූ; නරො, මනුෂ්‍ය තෙම; ඵෙනපිණ්ඩසදිසං, (අසාරහෙයින්;) පෙනපිඩක් හා සමවූ; විසසූලකප්පං, විෂපෙවූ; (විෂ කවනලද) හුලක් හා සමානවූ; (තොයා—වාසං) තොය, ජලයද; (නොහොත්) ආපො (ධාතුවද) අනල, (වහ්නියද; (නොහොත්) තෙජොධාතුවද; අනිල, මාරුතය; (නොහොත්) වායොධාතුවද; මහී, පොළවය; (නොහොත්) පෘථිවීධාතුවද; (යන සතරමහා භූත) නමැති; උරගාධිවාසං, නාගයින්ට නිවාසස්ථානවූ; ජිණ්ණාලයං ඉව, දිරූගෙයක් මෙන්; පරිදුබ්බලං, හාත්පසින් දුර්වලවූ; තං අත්තභාවං, ඒ ආත්මභාවය; දිස්වා, (අසරු හෙයින් නුවණින්) දැක; රතිං, (කාමසම්පත්තියෙහි) අභිරමනයට; කථං, කෙසේ; උපෙති, පැමිණෙන්නේද? (නුවනැත්තේ ශරීරයෙහි ආලය කිරීමට නොපැමිණෙන්නේය යනුයි.)

49 ආයුක්ඛයං සමුපයාති ඛණෙ ඛණෙපි
අන්වෙති මච්චු හනනාය ජරාසිපාණී,
කාලං තථා න පරිවත්තති තං අතීතං
දුක්ඛං ඉදං නනු භවෙසු විචින්තනීයං.

49. ආයු, (සත්වයාගේ) ආයුෂය තෙම; ඛණෙ ඛණෙ අපි, ක්ෂණක්ෂණයෙහිද; ඛයං, ක්ෂයවීමට; සමුපයාති, අතිශයින් පැමිණේ; ජරාසිපාණී, ජරානැමතිකඩුව (ගත්) අත්ඇති; මච්චු, මෘත්‍යු (මරණය) තෙම; හනනාය, (ආයු) නසනු පිණිස; අනුඑති, අනුව (පසුපස්සේ) එයි; තථා, එසේම; අතීතං, ඉක්මගියාවූ; තං කාලං, ඒ කාලය) න පරිවත්තති, පෙරළානොයෙයි (හෙවත්) නැවත නොපැමිණෙයි; භවෙසු, (කාමාදි) භවයන්හි; ඉදං දුක්ඛං, මේ දුක; විචින්තනීයං නනු, විශෙෂයෙන්; සිතියයුතු නොවේද?
(පණ්ඩිතයන් විසින් මේ දුඃඛය එක්වින් සැලකිය යුතු වේමය)

50 අප්පායුකස්ස මරණං සුලභං භවෙසු
දීඝායුකස්ස ච ජරා ව්‍යසනාඤ්චනෙකං,
එවං භවෙ උභයතොපිච දුක්ඛමෙව
ධම්මං සමාචරථ දුක්ඛවිනාසනාය.

50. අප්පායුකස්ස, අල්පායුෂ්කයාහට (හෙවත්) මඳ ආයුඇත්තාහට; භවෙසු, භවයන්හි; මරණං, මරණයතෙම; සුලභං, බොහෝ

ලැබෙයි; දීඝායුකස්සච, දීර්ඝායුෂ්කයාහටද (නොහොත්) බොහෝ ආයුඇත්තාහටද; ජරා, ජරාවද; අනෙකං, නොයෙක්; ව්‍යසනංච, (රොගව්‍යසන භොගව්‍යසන ඥාතිව්‍යසනාදි) ව්‍යසන (පීඩා) දැ; සුලභං, සුලභවෙයි; එවං, මෙසේ; (අල්පායුෂ්කවීමෙන්හා දීර්ඝායුෂ්කවීමෙන්) භවෙ, භවයෙහි; උභයතො අපිච, දෙපරිද්දෙන්ම; දුක්ඛං එව, දුකම; (සුලභවෙයි) දුක්ඛවිනාසනාය, (ඒ මේ සාංසාරික) දුක් වනසනු පිණිස; ධම්මං, (කුසල) ධර්‍මයෙහි; සමාචරථ, මනාකොට හැසිරෙව්.

51 දුක්ඛග්ගිනා සුමහතා පරිපීළිතෙසු
ලොකත්තයස්ස වසතො භවචාරකෙසු,
සබ්බත්තනා සුචරිතස්ස පමාදකාලො
භො භො න හොති පරමං කුසලං චිණාථ.

51. භො භො, භවක්නි භවත්නි! සුමහතා, අතිශයින්; මහත්වූ; දුක්ඛග්ගිනා, (අනෙකවිධ) දුක්නැමැතිගින්නෙන්; පරිපීළිතෙසු, භාත්පසින් පෙළෙනලද්දාවූ: භවචාරකෙසු, භවනමැති බන්ධනාගාරයන් (සිරගෙවල්)හි; වසතො, වාසයකරන්නාවූ; ලොකත්තයස්ස, තුන්ලෙව් (වැසිජනයා) හට; සුචරිතස්ස, සුචරිතය සම්බන්ධව; පමාද කාලො, ප්‍රමාදකාලයක්; න හොති, නොවෙයි; පරමං, උතුම්වූ; (නොහොත්) අත්‍යර්ථයෙන්; සබ්බත්තනා, සියල්ල තමතමන්ගේ වසයෙන්; කුසලං, කුසලය; චිණාථ, රැස්කරව්.

52 අප්පං සුඛං ජලලවං විය භො තිණග්ගෙ
දුක්ඛන්තු සාගරජලං විය සබ්බලොකෙ,
සංකප්පනා තදපි හොති සභාවතො හි
සබ්බං තිලොකමපි කෙවල දුක්ඛමෙව.

52. භො, භවත්නි! සබ්බලොකෙ, සියලු ලෙව්හි; සුඛං, සැපයතෙම; තිණග්ගෙ, තණපත්අග; ජලලවං විය, ජලලෙසය (දියබින්දුව)ක් මෙන්; අප්පං, ස්වල්පවේ; දුක්ඛං තු, දුක්වූකලී; සාගරජලං විය, සයුරු ජලයමෙන් (මහත්වෙයි) තං අපි, ඒ (ස්වල්පවූ) සැපයත්; සංකප්පනා හි, සංකල්පනාවෙන්ම(හෙවත්)මේ අපට සැපයෙක යන විතර්කකිරීමෙන්ම; හොති, වෙයි; සභාවතො හි, ස්වභාවයෙන්ම; සබ්බං, සියලු; තිලොකං අපි, තුන්ලොවම; කෙවලදුක්ඛං එව, අමිශ්‍ර දුඃඛයම (වෙයි) (හෙවත්) හුදෙක් දුක්මැයි.

53 කායො න යස්ස අනුගච්ඡති කායහෙතො
බාලො අනෙකවිධමාචරතීහ දුක්ඛං,
කායො සදා කලිමලාකලිලං හි ලොකෙ
කායෙ රතො අවිරතං ව්‍යසනං පරෙති.

53. යස්ස, යමෙකුගේ; කායො, ශරීරයතෙම්; න අනුගච්ඡති, අනුව (පසුපස්සේ) නොයේද; ඉහ ලොකෙ, මේ ලොකයෙහි; බාලො, අඥනතෙම; කායහෙතො, ශරීරහෙතුවෙන්; අනෙකවිධං, අනෙක ප්‍රකාරවූ; දුක්ඛං, දුඃඛය; (නොහොත්) (දුකට කරුණුවූ ප්‍රාණවධාදි) පාපය; ආචරති, කෙරෙයි; සදා, හැමකල්හි, කායො, ශරීරයතෙම; (කලි-ලං) කලි, පාපයද: මල, අසුචිද; (යන මෙයින්) ආකලිලං, හාත් පසින් ගැවසීගත්තේය; හි, ඒ එසේමය; කායෙ, (මෙබදු) ශරීරයෙහි; රතො, ඇලුනේ; අවිරතං, නිරන්තරයෙන්; ව්‍යසනං, විනාසයට; පරෙති, (හාත්පසින්) පැමිණේ.

54 මිළ්හාලයං කලිමලාකරමාමගන්ධං
සුලාසිසල්ලවිසපන්නගරොගභූතං,
දෙහං ඉිපස්සථ ජරාමරණාධිවාසං
තුච්ඡං සදා විගතසාරම්මං විනින්දං.

54. මිළ්හාලයං, අසුචියට ගෘහය (භාජනය)ක් වැනිවූ; කලිම ලාකරං, පාපහා මලයන්ට ආකර (උත්පත්තිස්ථාන)යක්වූ; ආමගන්ධං, දුගන්ධවූ; (සුලාසි-භූතං) සුල, හුල්ද; අසි, කඩුද; සල්ල, ශරද; විස, විෂද; පන්නග, සර්පයෝද; රොගභූතං, රොගද (යන මොවුන්මෙන්) විද්‍යමානවූ; ජරාමරණාධිවාසං, ජරාමරණවයට වාසස්ථානවූ; තුච්ඡං, හිස්වූ; විගතසාරං, පහවූසරුඇති; විනින්දං, විශෙෂයෙන් නින්දකටයුතුවූ; ඉමං දෙහං, මේ ශරීරය; සදා, හැමකල්හි; විපස්සථ, (අනිත්‍යාද වශයෙන්) බලව්.

55 දුක්ඛං අනිච්චමසුභං වත අත්තභාවං
මා සඞ්කිලෙසය න විජ්ජති ජාතු නිච්චො,
අම්භො න විජ්ජති හි අප්පමපිහ සාරං
සාරං සමාචරථ ධම්මමලං පමාදං.

55. දුක්ඛං, දුක්වූ; අනිච්චං, නිත්‍යනොවූ; අසුභං, සුභනොවූ; අත්තභාවං, (පඤ්චස්කන්ධසඞ්ඛ්‍යාත) ආත්මභාවය; වත, එකාන්ත යෙන්; මා සඞ්කිලෙසය, (කාමවිතර්කාදියෙන්) කිලිෂ්ට නොකරව; ජාතු, එකාන්තයෙන්; නිච්චො, නිත්‍යවූවෙක් (නොහොත්) සර්වකා ලික වස්තුවක්; න විජ්ජති, නැත්තේය; අම්භො, භවත්නි! හි, යම් හෙයකින්; ඉහ, මේ ආත්මභාවයෙහි; අප්පං අපි, ස්වල්පවූද; සාරං, සාරයක්; න විජ්ජති, නැත්තේද; (එහෙයින්) අලං පමාදං, ප්‍රමාදයක් නොකොට; සාරං, සාරවූ; ධම්මං, (කුසල) ධර්මය; සංආචරථ, මනා කොට කරව; (නොහොත්) කුසලධර්මයෙහි පවතිව්.

56 මායාමරීචිකදලීනලඵෙණ පුඤ්ජ-
ගඞ්ගාතරඞ්ගජලබුබ්බුල සන්නිභෙසු,
ඛන්ධෙසු පඤ්චසු ඡළායතනෙසු තෙසු
අත්තා න විජ්ජති හි කෝ නවදෙය්‍ය බාලො.

56. (මායාමරීචි-සන්නිභෙසු) මායා, මායා (ඉන්ද්‍රජාලා)ද; මරීචි මිරිඟු (ජලය)ද; කදලී, කෙසෙල්රුක්ද; අනල, වහ්නිද; ඵෙන, පුඤ්ජ, පෙනපිඩුද; ගඞ්ගාතරඞ්ග, ගඞ්ගානදියෙහි රළද; ජලබුබ්බුල, දියබුබුල්ද (යන මොවුන්) හා; සන්නිභෙසු, සමවූ; පඤ්චසු ඛන්ධෙසු, (රූපාදි) පඤ්චස්කන්ධයන්හිද; තෙසු ඡළායතනෙසු, ඒ (චක්ෂුරාදි) ෂඩායතනයන්හිද; අත්තා, ආත්මයක්; නවිජ්ජතිහි, විද්‍යමානනොවේමය; කො, කවරනම්; අබාලො, පණ්ඩිතයෙක්තෙම; නවදෙය්‍ය, (මෙය) නොකියන්නේද?(සතරමහාභූතයන්ගෙන් යුත් ඒ මේ පඤ්චස්කන්ධය ආත්මයයි පණ්ඩිතයා නොකියන්නේමය යනුයි.)

57 වඤ්ඣාසුතො සසවිසාණමයෙ රථෙ තු
ධාවෙය්‍ය චෙ චිරතරං සධුරං ගහෙත්වා,
දීපච්චිමාලමිව තං ඛණභඞ්ගභූතං
අත්තාති දුබ්බලතරන්තු වදෙය්‍ය දෙහං.

57. වඤ්ඣාසුතො, වඳ ස්ත්‍රියකගේ පුත්‍රයෙක්; සසවිසාණමයෙ, සා අඟින් කළාවූ; රථෙතු, රථයෙක්හිවූකලි; සධුරං, වියදණ්ඩසහිතව (නොහොත්) රථහිස; ගහෙත්වා, අල්වාගෙණ; චිරතරං, ඉතා බොහෝ කලක්; ධාවෙය්‍ය චෙ, ධාවනයක්රන්නේනම්; දීපච්චිමාලං ඉව, පහන්සිලුමාලාවක් මෙන්; ඛණභඞ්ගභූතං, සැණෙකින් බිඳෙන්නාවූ; දුබ්බලතරං තු, අතිශයින් දුර්වලවූම; තං දෙහං, ඒ ශරීරය; අත්තා ඉති; ආත්මයයි; වදෙය්‍ය, කියන්නේය; (යම්සේ වඳ ගැහැණියෙකුගේ පුතෙක් සා අඟින් කළාවූ රියක එල්බගෙණ දිවීම නොවේද එසේම මේ සිරුරෙහි ආත්මයකුදු නොවෙයි සේයි.)

58 බාලො යථා සලිලබුබ්බුලභාජනෙන
ආකණ්ඨතො වත පිවෙය්‍ය මරීචිතොයං,
අත්තාති සාරරහිතං කදලීසමානං
මොහා භණෙය්‍ය ඛලු දෙහමිමං අනත්තං.

58. බාලො, අඥානතෙම; සලිලබුබ්බුලභාජනෙන, දියබුබුලු බඳුනකින්; ආකණ්ඨතො, කණ්ඨප්‍රමාණ (පිරීම ඇති) කොට; මරීචිතොයං, මිරිඟුදිය; වත, එකාන්තයෙන්; යථා, යම්සේ; පිවෙය්‍ය, පානයකරන්නේද; (එසේම) සාරරහිතං, අසාරවූ (හෙවත්) අස්ථිරවූ;

කදලිසමානං, කදලිවෘක්ෂයක් සමානවූ: අනත්තං, අනාතමවූ; (හෙවත්) වසඟනුවූ; ඉමං දෙහං, මේ ශරීරය; අත්තාඉති, ආතමයයි; මොහා, මුළාවෙන්; භණෙය්‍ය බලූ, කියන්නේමය; (දියබුබුලුබඳුන කින් මිරිඟු පැන් බොන්නෙක් අවිද්‍යමාන සේම පස්කඳ විනා මෙහි ආතමයක් නැත්තේයයි සැලකියයුතු)

59 යොදුම්බරස්ස කුසුමෙන මරීචිතොයං
වාසං යදිච්ඡති ස බෙදමුපෙති බාලො,
අත්තානමෙව පරිභඤ්ඤති අත්තහෙතො
අත්තා න විජ්ජති කදාචිදපිහ දෙහෙ.

59. යො බාලො, යම් අඥනයෙක්තෙම; උදුම්බරස්ස, දිඹුල්රුක් හුගේ; කුසුමෙන, මලින්: වාසං, සුවඳවූ; මරීචිතොයං, මිරිඟුදිය; යදි, ඉදින්; ඉච්ඡති, කැමතිවේද; සො, ඒ (අඥන) තෙම; බෙදං, ඛේදයට; (හෙවත්) බැගෑපත්බවට; උපෙති, පැමිණේ; අත්තහෙතො, ආත්මය පිණිස; අත්තානං එව, තමාම; පරිභඤ්ඤති, (මිථ්‍යාග්‍රහණ යෙන්) වැනසෙයි; (හෙවත්) පෙළෙයි; ඉහ දෙහෙ, මේ සිරුරෙහි; අත්තා, ආතමයෙක්; කදාචි අපි, කිසිකලෙකත්; නවිජ්ජති, විද්‍යමාන නොවේ; (ලොව කිසිකලෙකත් නැති දිඹුල්මලින් සුවඳවූ මිරිඟුජලය සිතනතැනැත්තේ ඉච්ඡාවිඝාතදුඃඛයෙන් ඛෙදයට පැමිණෙන්නාක් මෙන් ශරීරයෙහි ආතමයක් ඇතැයි වරදවා සිතීමෙන් තෙමේම අප මණ්ඩුකට පැමිණෙයි යනු භාවයි.)

60 පොසො යථාහි කදලීසු විනිබ්භුජන්තො
සාරං තදප්පමපි නොපලභෙය්‍ය කාමං,
ඛන්ධෙසු පඤ්චසු ඡළායතනෙසු තෙසු
සුඤ්ඤෙසු කිඤ්චිදපි නොපලභෙය්‍ය සාරං.

60. පොසො, පුරුෂයෙක් තෙම්; යථා, යම්සේ; කදලීසු, කෙසෙල් (කඳන්) විනිබ්භුජන්තො, විනිභෝග කරන්නේ; (හෙවත්) (පතුරු) වෙන්කරන්නේ; තදප්පං අපි, එයින් ස්වල්පවූත්; සාරං, හරයක්; කාමං හි,එකාන්තයෙන්ම; න උපලභෙය්‍ය, නොලබන්නේද;(එසේම) සුඤ්ඤෙසු, (ආතමයෙන්) හිස්වූ; පඤ්චසු ඛන්ධෙසු, (රූආදී) පස්කඳෙ හිද; තෙසු ඡළායතනෙසු, ඒ (චක්‍ෂුරාදී) ෂඩායතනයන්හිද; කිඤ්චි අපි, කිසිම; සාරං, (නිත්‍යසුභසුඛාතමලක්‍ෂණවූ) සාරයක්; නඋපල භෙය්‍ය, නොලබන්නේය; (කෙසෙල්කඳ පතුරු වෙන්කරණ තැනැත්තේ හරයක් නොදක්නාසේ මේ පස්කඳ නුවණ මෙහෙයා බලනතැනැත්තේ නිත්‍යාදිවූ කිසිම සාරයක් නොදක්නේමයයනු භාවයි.)

61 සුත්තං විනා න පටභාවමිහත්ථි කිඤ්චි
දෙහං විනා න ඛලු කොචි මිහත්ථි සත්තො,
දෙහං සභාවරහිතං ඛණභඞ්ගයුත්තං
කො අත්තහෙතු අපරො භුවි විජ්ජතීහ.

61. සුත්තං විනා, හුහැර; ඉහ, මෙහි; කිඤ්චිපටභාවං, කිසිත් පට (වස්ත්‍ර) බවක්; නඅත්ථි, නැත්තේය; දෙහංවිනා, (එසේම පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත) ශරීරය හැර; ඉහ, මෙහි; කොචි සත්තො, කිසි සත්වයෙක්; ඛලු, එකාන්තයෙන්; නඅත්ථි, නැත්තේය; සභාවරහිතං, ස්වභාවරහිතවූ; (නොහොත්) (නිත්‍යාදි) ආත්මස්වභාව නැත්තාවූ; ඛණභඞ්ගයුත්තං, ක්ෂණභඞ්ගුරයෙන් යුක්තවූ; (හෙවත්) සැණෙකින් බිඳීම්ඇති; දෙහං, (විනා) ශරීරය (හැර) ඉහ භුවි, මේ පෘථිවියෙහි; අපරො, අන්‍ය වූ; කො, කවරනම්; අත්තහෙතු, ආත්මග්‍රහණයට හෙතුවෙන්; (නොහොත්) ආත්මය ප්‍රයොජනකොට ඇත්තෙක්; විජ්ජති, ඇත්තේද; (නැත්තේමය.)

62 දිස්වා මරීචිසලිලං හි සුදූරතො භො
බාලො මිගො සමුපධාවති තොයසඤ්ඤී,
එවං සභාවරහිතෙ විපරීතසිද්ධෙ
දෙහෙ පරෙති පරිකප්පනයා හි රාගං.

62 භො, භවත්නි! හි, යම්හෙයකින්; බාලො, අඥානවූ; මිගො, මෘගතෙම; මරීචිසලිලං, මිරිඟුජලය, සුදූරතො, ඉතාදුරදී; දිස්වා, දැක; තොයසඤ්ඤී, ජලය (යන) සංඥා ඇත්තේ; සමුපධාවති, ඕහා ළහට දුවයිද; එවං, මෙසේම; සභාවරහිතෙ, (නිත්‍යාදී) ස්වභාව නැත්තාවූ; විපරීතසිද්ධෙ, විපරීතඥනයෙන් සිද්ධවූ; (හෙවත්) වරදවා ගැණීමෙන් සිදුවූ; දෙහෙ, ශරීරයෙහි; පරිකප්පනාය, පරිකල්පනාවෙන්; (හෙවත්) අඞ්ගසුභාදි විතර්කනහෙතුවෙන්; රාගං, රැඳිමට; පරෙති, පැමිණෙයි; හි, ඒ එසේමය.

63 දෙහෙ සභාවරහිතෙ පරිකප්පසිද්ධෙ
අත්තා න විජ්ජතිහි විජ්ජුමිවන්තලික්ඛෙ,
භාවෙථ භාවනරතා විගතප්පමාදා
සබ්බාසවප්පහණනාය අනත්තසඤ්ඤං.

63. සභාවරහිතෙ, ආත්මස්වභා නැත්තාවූ; පරිකප්පසිද්ධෙ, විතර්කනයෙන් සිද්ධවූ; දෙහෙ, ශරීරයෙහි; අන්තලික්ඛෙ, අහසෙහි; විජ්ජුඉව, විදුලියක්මෙන්; අත්තා, ආත්මයක්; නවිජ්ජති, නැත්තේමය; භාවනරතා, (අනිත්‍යාදී) භාවනාවන්හි ඇලුනාවූ; (තොපි)

විගතප්පමාදා, පහවූ ප්‍රමාද ඇත්තෝව; සබ්බාසවප්පහාණාය, සියලු (කාමාදි) ආශ්‍රවයන්ගේ ප්‍රහාණය පිණිස; අනත්තසඤ්ඤං, අනාත්ම සංඥව; භාවෙථ, වඩව්.

64 ලාලාකරීසරුධිරස්සුවසානුලිත්තං
දෙහං ඉමං කලිමලා කලිලං අසාරං,
සත්තා සදා පරිහරන්ති ජිගුච්ඡනීයං
නානාසුචීහි පරිපුණ්ණඝටං යථෙව.

64. (ලාලා-ලිත්තං) ලාලා, කෙළද; කරීස, අසුචිද; රුධිර, ලේද; අස්සු, කඳුලුද; වසා, වුරුණුතෙල්ද; අනුලිත්තං, (යනමෙයින්) ආලෙපකරණ (ගල්වන) ලද්දාවූ; කලිමලාකලිලං, අසුචි හා මලයෙන් ගැවසිගත්තාවූ; අසාරං, සාරයක් නැත්තාවූ; ජිගුච්ඡනීයං, පිළිකුල්කටයුතුවූ; නානාසුචීහි, නොයෙක් අසුචියෙන්; පරිපුණ්ණඝටං යථා එව, පරිපූර්ණඝටයක් වැනිවූම; ඉමං දෙහං, මේ ශරීරය; සත්තා, සත්වයෝ; සදා, හැමකල්හි; පරිහරන්ති, පරිහරණය කරත්; (හෙවත්) (අන්නපානාදියෙන්) පොෂණය කෙරෙත්;

65 ණහාත්වා ජලං හි සකලං චතුසාගරස්ස
මෙරුප්පමාණමපි ගන්ධමනුත්තරඤ්ච,
පප්පොති නෙව මනුජො හි සුචිං කදාචි
කිමෙත්ථ විපස්සථ ගුණං කිමු අත්තභාවෙ.

65. භො,භවන්ති! මනුජො හි, මනුෂ්‍යතෙම ණහාති; චතුසාගරස්ස, සිව්සයුර සම්බන්ධිවූ; සකලංහි, සියලුම; ජලං, ජලය; ණහාත්වාච, නාද; අනුත්තරං, නිරුත්තරවූ; මෙරුප්පමාණං, (මහ) මෙරපමණවූ; ගන්ධං අපි, සුවඳ (පිඩ) කුත්; (ඇඟගා) කදාචි, කිසිකලෙකත්; සුචිං, පිවිතුරට; නඑව පප්පොති, නොපැමිණේමය; කිමු, කිමෙක; අත්තභාවෙ, ආත්මභාවයෙහි; කිං ගුණං, කවරගුණ (ආනිසංස) යක්; විපස්සථ, දක්නහුද.

66 දෙහන්තදෙව විවිධාසුචිසන්නිධානං
දෙහන්තදෙව වධබන්ධනරොගභූතං,
දෙහන්තදෙව නවධා පරිභින්නගණ්ඩං
දෙහං විනා භයකරං න සුසානමත්ථි.

66. තං දෙහං එව, ඒ ශරීරයම; (විවිධාසුචිසන්නිධානං) විවිධ, නානාප්‍රකාරවූ; අසුචි, (මූත්‍රකරීෂාදි) අමෙධ්‍යය, සන්නිධානං, සන්නිධි (උත්පත්තිස්ථාන) කොට ඇත්තේවේ; තං දෙහං එව, ඒ ශරීරයම; (වධ-රොගභූතං)වධ, (නානාවිධ) හිංසාද; බන්ධන, බැඳුන්ද; රොග

භූතං, (නොයෙක්) රොගද ඇත්තේවේ; තංඑව දෙහං, ඒශරීරයම; නවධං, නවපරිද්දෙඝින්; පරිභිනනාගණ්ඩං, පිරිබුන්ගඩඇත්තේවේ; දෙහං විනා, ශරීරයහැර; භයකරං, භයඞ්කාරවූ; සුසානං, සොහොනක්; නඅඤ්ඤි, නැත්තේය.

67 අනෙනාගතං යදිච මුතනකරීසභාගං
දෙහා බහිං අතිචරෙය්‍ය විනික්ඛමිත්වා,
මාතාපිතා විකරුණා ච විනට්ඨපෙමා
කාමං භවෙය්‍යු කිමු බන්ධු සුතා ච දාරා.

67. අනෙනාගතං, (ශරීර) අභ්‍යනතරයට පැමිණියාවූ; මුතනකරීසභාගං, මූත්‍රවර්චස් සම්බන්ධ (මාත්‍රංශත්) කොඨාසය; දෙහා, ශරීරයෙන්; විනික්ඛමිත්වා, විශෙෂයෙන් නික්ම; බහිච, පිටතත්; යදි අතිචරෙය්‍ය, ඉදින් හැසිරෙන්නේනම්; මාතාපිතා, මව්පියෝ; විකරුණා, කරුණාරහිතවූවෝ; විනට්ඨපෙමාච,විනාශවප්‍රෙම ඇත්තෝත්; කාමං, එකාන්තයෙන්; භවෙය්‍යුං, වන්නාහුය, බන්ධු, නෑයෝද; සුතාච, දරුවෝද; දාරාච, භාය්‍යාවෝද; කිමු, (ප්‍රෙමරහිත වෙත්ය යනු) කියනුම කවරේද?

68 දෙහං යථා නවමුඛං කිමිසඞ්ඝගෙහං
මංසට්ඨිසෙදරුධිරා කලිලං විගන්ධං,
පොසෙන්ති යෙ විවිධපාපමිහාචරිත්වා
තෙ මොහිතා මරණධම්මමහො වතෙවං.

68. යෙ, යමෙක්තුමූ; ඉහ, මේලොකයෙහි; විවිධපාපං, නානාප්‍රකාරවූ (ප්‍රාණඝාතාදි) පාපය; ආචරිත්වා, කොට; (නොහොත්) විවිධපාපං, නන්වැදෑරුම් පවෙහි; ආචරිත්වා, හැසිර; නවමුඛං, (චක්ඛුරාදි) නව්වාරයක් ඇති; කිමිසඞ්ඝගෙහං, (අශීතිසහශ්‍රකුලික) කෘමිසමූහයාට ගෘහවූ; (මංසට්ඨි–ආකලිලං) මංස, (නවසියයක්) මස්පිඩුද; අට්ඨි, (තුන්සියයක්) ඇටද; සෙද, ඛහදියද; රුධිර, ලේද (යනමෙයින්) ආකලිලං, වෙසෙසින් ගැවසීගත්තාවූ; විගන්ධං, දුගඳ ඇත්තාවූ; මරණධම්මං, මරණයම ස්වභාවකොට ඇත්තාවූ; දෙහං, ශරීරය; යථා, යම්සේ; පොසෙන්ති, පොෂණය කෙරෙත්ද; එවං, එසේ; (ශරීරපොෂණයෙන්) තෙ, ඔහුතුමූ; වත,එකාන්තයෙන්; මොහිතා, මුළාවූවෝ වෙත්; අහෝ, විස්මයක! (මූඪවූවෝ ප්‍රාණඝාතාදි පව්කම්කොට දෙතිස්ඝුණපයෙන් යුත් මේ සිරුර රැකීම විස්මයට කාරණය යනුයි.)

69 ගණ්ඩූපමෙ විවිධරොගනිවාසභූතෙ
කායෙ සදා රුධිරමුත්තකරීස පුණ්ණෙ,
යො එත්ථ නන්දති නරො සසිගාලභක්ඛෙ
කාමං හි සොචති පරත්ථ සබාලබුද්ධි.

69. යො නරො, යම් මනුෂ්‍යයෙක්තෙම; සදා, හැමකල්හි; ගණ්ඩූපමෙ, (දුඃඛදායකහෙයින්) ගඬක් හා උපමාඇති; (නොහොත්) ගඬක් උපමාකොට ඇති; (විවිධ–භූතෙ) විවිධ, නානාප්‍රකාරවූ; රොග, (කාසශ්වාසාදි) රොගයන්ට; නිවාසභූතෙ, වාසස්ථානවූ; (රුධිර—පුණ්ණෙ) රුධිර, ලේද; මුත්ත, මූත්‍රද; කරීස, මලද; (යන මෙයින්) පුණ්ණෙ, පිරුණාවූ; සසිගාලභක්ඛෙ, බලුසිවලුන්ට ආහාරවූ; (නොහොත්) බලුසිවලුන් විසින් අනුභවකරණුලබන්නාවූ; එත්ථ කායෙ, මේ කයෙහි; (හෙවත්) කය පිළිබඳ වණ්ණසණ්ඨානාදිය සඳහා; නන්දති, සතුටුවේද; සො බාලබුද්ධි, ඒ (උභයාර්ථභඤ්ජක) මූළ්හබුද්ධි ඇත්තේ; (හෙවත්) අඥානතෙම; පරත්ථ, පරලෙව්හිදී; කාමං, ඒකාන්තයෙන්; සොචති, සොකකෙරෙයි; හි, ඒ එසේමය; (මොහී පුද්ගලතෙම පස්කම්සැප විඳිනුවස් මෙබඳු අසරු කයෙහි ලොල්කොට පරලොව දුක්ලැබීමෙන් පසුතැවිලිවේමය.)

70 භො ඵෙනපිණ්ඩසදිසො විය සාරහීනො
මීළ්හාලයො විය සදා පටිකූලගන්ධො,
ආසීවිසාලයනිභො සභයො සදුක්ඛො
දෙහො සදා සවති ලොණඝටොව භින්නො.

70. භො, භවත්නි! ඵෙනපිණ්ඩසදිසො විය, පෙනපිඩක් හා සමානවූම (නොහොත්) පෙණපිඩක් පරිද්දෙන්; සාරහීනො, නිස්සාරවූ; (හෙවත්) සරුබැවින් තොරවූ; මීළ්හාලයො විය, වැසිකිළියක්මෙන්; සදා, හැමකල්හි; පටිකූලගන්ධො, පිළිකුල් ගඳ ඇති; ආසීවිසාලයනිභො, සර්පගෘහයක් සමානවූ; (හෙවත්) තුඹසක් වැනිවූ; සභයො, භයසහිතවූ; සදුක්ඛො, දුක් සහිතවූ; දෙහො, ශරීරයතෙම; භින්නො, බිඳුනාවූ; ලොණඝටො ඉව, ලුණුකලයක්මෙන්; සදා, හැමකල්හි; සවති, (අසුචි) ප්‍රසව කෙරෙයි (හෙවත්) වැගිරෙයි.

71 ජාතං යථා න කමලං භුවි නින්දනීයං
පඞ්කෙසු භො අසුචිතොය සමාකුලෙසු,
ජාතං තථා පරහිතම්පි ච දෙහභූතා
තන්නින්දනීයම්හ ජාතු න හොන්ති ලොකෙ.

71. භො, භවත්නි! භුවි, පෘථිවියෙහි; අසුචිතොය සමාකුලෙසු; අපවිත්‍ර ජලයෙන් ගැවසීගත්තාවූ; පඞ්කෙසු, කදීමයන්හි; ජාතං, උපන්නාවූ; කමලං, පියුමක්; යථා යම්සේ; න නින්දනීයං, නින්දකට සුතුනොවේද; තථා, එසේම; දෙහභූතා, ශරීරහෙතුවෙන්; ජාතං, හටගත්තාවූ; තං පරහිතං අපි, ඒ පරාර්ථයද; ඉහලොකෙච, මේ ලෙව්හිද; ජාතු, කිසිකලෙකත්; නින්දනීයං, නින්දකටයුත්තක්; නහොති, නොවේ; (අපවිත්‍ර ජලමිශ්‍ර පඞ්කයෙහි ජාතපද්මය තෙම ප්‍රශංසාහීවූ වාක්මෙන් මේ අසුභ ශරීරහෙතුවෙන් සිඩවූ පරාර්ථයද පැසසියයුතු වේමය යනු භාවයි.)

72 චත්තිංසභාගපරිපූරතරො විසෙසො
කායො යථා හි නරනාරි ගණස්ස ලොකෙ,
කායෙසු කිං ඵලමිහත්ථි ච පණ්ඩිතානං
කාමං තදෙව නනු හොති පරොපකාරං.

72. යථා, යම්සේ; ලොකෙ, සත්ත්වලොකයෙහි; නරනාරිගණස්ස, පුරුෂස්ත්‍රීසමූහයාගේ; චත්තිංසභාගපරිපූරතරො, දෙතිස්කුණු කොටසින් අතිශයින් පිරුණාවූ; කායො, ශරීරයතෙම; අවිසෙසොහි, (මුක්තාමාණික්‍යාදිවස්තු) විශෙෂයක් නැත්තේමවේද; ඉහ, මේ ලොකයෙහි; කායෙසු, ශරීරවිෂයන්හි; (හෙවත්) ආත්මභාව නිමිතිකොට ගෙණ; පණ්ඩිතානං, පණ්ඩිතයන්ට; කිංඵලං, කිනම් ඵලයක්, අත්ථි ච, ඇත්තේද; තං එව, ඒ (ශරීරය)ම; කාමං, එකාන්තයෙන්; පරොපකාරං, අනුන්ට (කළ) උපකාරයක්; නනුහොති, නොවේද? (ශරීරයනම් චාත්‍රිංශත් කුණපකොට්ඨාසයෙක, තත්ඵලනම් පරොපකාරයවූ සංග්‍රහයමවේ.)

73 පොසෙන පණ්ඩිතතරෙන තථාපි දෙහං
සබ්බත්තනා චිරතරම්පරිපාලනීයං,
ධම්මං චරෙය්‍ය සුචිරං ඛලු ජීවමානො
ධම්මො හවෙ මණිවරො ඉව කාමදෙ භො.

73. තථාපි, එතකුදුවුවත්; පණ්ඩිතතරෙන, අතිශයින් ප්‍රාඥවූ; පොසෙන, පුරුෂයා විසින්; දෙහං, ශරීරය; චිරතරං, ඉතා බොහෝ කලක්; සබ්බත්තනා, සර්වප්‍රකාරයෙන්; (හෙවත්) සියල්ල තමතමන්ගේ වශයෙන්; පරිපාලනීයං, රක්ෂාකටයුත්තේය; සුචිරං, ඉතා බොහෝකලක්; ජීවමානො, ජීවත්වන්නේ; ඛලු, එකාන්තයෙන්; ධම්මං, (දශවිධ) කුසලධර්මයෙහි; චරෙය්‍ය, හැසිරෙන්නේය; භො, පින්වත්නි! ධම්මො, කුසලධර්මයතෙම; මණිවරො ඉව, උත්තමමාණික්‍යයක් මෙන්; හවෙ, එකාන්තයෙන්; කාමදෙ, (හොති) ඉෂ්ටාර්ථප්‍රසවය කරන්නේ වේ; (හෙවත්) කැමති කැමති සම්පත් සිදුකරන්නේය.

74 ඛීරෙ යථා සුපරිභාවිත වොසධම්හි
සෙනහෙන ඔසධබලං පරිභාසතෙව,
ධම්මං තථා ඉහ සමාචරිතං හි ලොකෙ
ඡායාව යාති පරලොකමිතො වජන්තං.

74. යථා, යම්සේ; සුපරිභාවිතඔසධම්හි, මනාකොට වඩනා (බහාලන)ලද ඖෂධ ඇති; ඛීරෙ, කිරෙහි; සෙනහෙන, සෙනහයහා; (හෙවත්) තෙලහා; ඔසධබලං, ඖෂධශක්තිය; පරිභාසතෙව, වෙසෙසින්ම බබලාද (හෙවත්) මිශ්‍රවේද; තථා, එසේම; ඉහ ලොකෙ, මේ ලොකයෙහි; සමාචරිතං, මනාකොට පුරුදුකරණලද (නොහොත්) රැස්කරණලද; ධම්මං, (දශකුශල කර්මපථ) ධර්මය; ඉතො, මෙලොවින්; පරලොකං, පරලොවට; වජන්තං, යන්නහුකරා; ඡායා ඉව, සෙවනැල්ලමෙන්; යාති, පැමිණේ; හි, ඒ එසේමැයි; (කිරිහාමිශ්‍රවූ ඖෂධගුණය තෙලට පැමිණෙන්නාක්මෙන් මෙලොවදී රැස්කරණලද කුසලකර්මය ඡායාවක්මෙන් ඔහු අනුව පරලොවට යන්නේයි.)

75 කායස්ස හො විරචිතස්ස යථානුකූලං
ඡායා විභාති රුචිරාමලදප්පණෙ තු,
කත්වා තථෙව පරමං කුසලං පරත්‍ථ
සම්භූසිතා ඉව භවන්ති ඵලෙන තෙන.

75. හො, භවත්නි! විරචිතස්ස, (ආභරණයෙන් සැරසීම)කරණලද; කායස්ස, ශරීරය සම්බන්ධවූ; ඡායා, ඡායානොමෝ; (රුචිරාමලදප්පණෙ තු)රුචිර, සිත්කලුවූ; අමල, නිර්මලවූ; දප්පණෙතු, දර්පණතලයෙහි වනාහි; අනුකූලං, අනුකූලකොට; (හෙවත්) සුදුසු පරිද්දෙන්; යථා, යම්සේ; විභාති, බබලාද; තථා එව, එපරිද්දෙන්ම; පරමං, උතුම්වූ; කුසලං, (දානාදි) කුසලය; කත්වා, කොට; තෙන ඵලෙන, ඒ විපාකයෙන්; පරත්‍ථ, පරලෙව්හිදී; සම්භූසිතා ඉව, මනාකොට අලංකාරක්රණලද්දවුන්මෙන්; භවන්ති, වෙත්; (දර්පණතලයෙහි ශරීර ප්‍රතිබිම්බය අලංකෘතව පෙණෙන්නාක්මෙන් කුසලකර්මවිපාකයෙන් පරලො සැපතින් සැරසුනු ආත්මභාව ඇත්තෝ වන්නාහුය යනුයි.)

76 දෙහෙ තථා විවිධදුක්ඛනිවාසභූතෙ
මොහා පමාදවසගා සුඛසඤ්ඤමූළ්හා,
තික්ඛෙ යථා ඛුරමුඛෙ මධුලෙහමානො
බාළ්හඤ්ච දුක්ඛමධිගච්ඡති හීනපඤ්ඤො.

76. හීනපඤ්ඤො, ලාමක ප්‍රඥාඇත්තෝ (හෙවත්) අඥානතැනැත්තේ; තික්ඛෙ, තීක්ෂණවූ; ඛුරමුඛෙ, ක්ෂුරධාරාවෙහි; (හෙවත්)

කාරමුවහෙයි; මධුලෙහමානො, මීලෙවීන්නේ; බාළ්හංව, බහුලවූම; (හෙවත්) දැඩිවූම; දුක්ඛං, දුකට; යථා, යම්සේ; අධිගච්ඡති, පැමිණේද? තථා, එසේම; (විවිධ–භූතෙ) විවිධ, අනෙකප්‍රකාරවූ; දුක්ඛ, (ජාත්‍යාදි) දුඃඛයන්ට; නිවාසභූතෙ, නිවාසස්ථානවූ; දෙහෙ, ශරීරයෙහි; සුඛසඤ්ඤමූළ්හා, සැපය යන සංඥාවෙන් මූළාවූ; පමාදවසගා, ප්‍රමාද වසගවූවෝ; මොහා, මූළාවෙන්; (දුක්ඛං අධිගච්ඡන්ති) (යථොක්ත) දුඃඛයට පැමිණෙත්.

77 සංකප්පරාගවිහතෙ නිරන්තනානාවෙ
දුක්ඛං සදා සමධිගච්ඡති අප්පපඤ්ඤා,
මූළ්හාසස්සමෙව සුඛසඤ්ඤමිහත්ථි ලොකෙ
කිං පක්කමෙව නනු හොති විචාරමානෙ.

77. සංකප්පරාගවිහතෙ, සංකල්පනාවෙන් (ජාත) රාගයෙන් වෙසෙසින් නසනලද්දාවූ; (හෙවත්) නිරන්තර විතර්කනයෙන් උපන් ඡන්දරාගයෙන් මඩනාලද්දාවූ; අනන්තනාවෙ, ආත්මභාවයෙහි; නිරන්තො, නිශ්ශෙෂයෙන් ඇලුනාවූ; අප්පපඤ්ඤා, මන්දබුද්ධිඇත්තේ; (හෙවත්) නුවණනැති (පුද්ගල)තෙම; දුක්ඛං, (කායිකාදි) දුඃඛයට; සදා, හැමකල්හි; සමධිගච්ඡති, පැමිණේ; ඉහ ලොකෙ, මේ (පඤ්ච ස්කන්ධසංඛ්‍යාත) ලොකයෙහි; මූළ්හස්ස එව, මූළාවූවහු සම්බන්ධවම; සුඛසඤ්ඤං, සුඛසංඥාව; (හෙවත්) සැපය යන දැනීමක්; අත්ථි, ඇත්තේය; විචාරමානෙ, (නුවණින්) විමසනකල්හි; කිං පක්කං එව, කිංඵලයක්ම; නනු හොති, නොවේද; (මෙහි කිංඵල නම් කැකෙණෙහි ජීවිතක්ෂයට සමර්ථ හිමාලයෙහි ජාත විෂඵල වර්ගයක්යයි දතයුතු.)

78 සබ්බොපභොගධනධඤ්ඤ විසෙසලාභී
රූපෙන හො සමකරද්ධජසන්නිභොපි,
යො යොබ්බනෙපි මරණං ලභතෙ අකාමං
කාමං පරත්ථ පරපාණ හරො නරො හි.

78. හො, භවත්නි! හි, යම්හෙයකින්; යොනරො, යම් මනුෂ්‍යයෙක් තෙම; පරපාණහරො, මෙරමාගේ දිවිනැසුයේද; සො, හෙතෙම; කාමං, එකාන්තයෙන්; පරත්ථ, පරලොවදී; (සබ්බොප–ලාභී) සබ්බොපභොග, සියලු (වස්ත්‍රාභරණාදි) උපභොග (වස්තු)ද; ධන, (මුක්තාමාණික්‍යාදි) ධනද; ධඤ්ඤං, (ශාලිව්‍රීහිආදි) ධාන්‍යද; (යන මොවුන්) විසෙසලාභී, විශෙෂයෙන් ලබන සුලුවේද; රූපෙන, රූපයෙන්; මකරද්ධජසන්නිභො, අනඞ්ගයා හා සමවීද; අපි, නමුත්; යොබ්බනෙ අපි, යොවුන් බැවිහිම; අකාමං, නොකමැති පරිද්දෙන්; මරණං, මරණය; ලභතෙ, ලබයි.

79 යො යාචකො භවති භින්නකපාලහත්ථො
මුණ්ඩො ධිගකබ්බරසතෙහි ච තජ්ජයන්තො,
භික්ඛං සදාරිභවනෙ සකුචෙලවාසො
දෙහෙ පරත්ථ පරවිත්තහරො නරො සො.

79. යො නරො, යම්මනුෂ්‍යයෙක් තෙම; දෙහෙ, ශරීරය නිමිත්තකොටගෙණ; පරවිත්තහරො, මෙරමාගේ වස්තු (ථෙය්‍යචිත්තයෙන්) හැරගත්තෙක් (වීද); සො, ඒ (මනුෂ්‍ය)තෙම; පරත්ථ, පරලෙව්හිදී; (නොහොත්) අන්‍යාත්මයෙහි; මුණ්ඩො, මුඩුවූයේ; භින්නකපාල හත්ථො, බිඳුනාලද කබල් ගත් අත්ඇත්තේ; ධිගකබ්බරසතෙහිච, නින්දාවචන සියගණනින්ද; තජ්ජයන්තො, තර්ජනය කරණු (භයගන්වනු) ලබන්නේ; කුචෙලවාසො, කුත්සිතවස්ත්‍රනිවාසනය කරන්නේ (නොහොත්) කුනු (කඩ) රෙදිඅඳින්නේ; අරිභවනෙ, ශත්‍රුභවනයෙහි; භික්ඛං, භික්ෂාව; සදා, හැමකල්හි; යාචකො, යාඥකරන්නෙක් (හෙවත්) සිඟන්නෙක්; භවති, වෙයි.

80 ඉත්ථී නමුච්චති සදා පුන ඉත්ථිභාවා
නාරී සදා භවති සො පුරිසො පරත්ථ,
යො ආචරෙය්‍ය පරදාරමලඞ්ඝනීයං
ඝොරඤ්ච වින්දති සදා ව්‍යසනං ච නෙකං.

80. යො, යම් (මනුෂ්‍ය)යෙක්තෙම; අලඞ්ඝනීයං, නොඉක්මවියහැක්කාවූ; පරදාරං, පරස්ත්‍රිය කෙරෙහි; ආචරෙය්‍ය, හැසිරෙන්නේද; (නොහොත්) පරදාරං, පරස්ත්‍රිය කෙරෙහි; ආචරෙය්‍ය, සෙවනයකෙරේද; සා ඉත්ථී, ඒ ස්ත්‍රී තොමෝ; පුන, නැවත; සදා, හැමකල්හි; ඉත්ථීභාවා, ස්ත්‍රීභාවයෙන්; නමුච්චති, නොමිදේ; සො පුරිසො, ඒ පුරුෂතෙම; පරත්ථ, පරලෙව්හි; සදා, සර්‍වකාලයෙහි; නාරී භවති, ස්ත්‍රියක්වේ; ඝොරංච, දරුණුවූම (හෙවත්) භයානකවූම; අනෙකං, නොයෙක්; ව්‍යසනංච, (භොගාදි) විපත්තිද; සදා, සැමකල්හි; වින්දති, (හෙතෙම) විඳී.

81 දීනො විගන්ධවදනො ච ජළො අපඤ්ඤො
මූගො සදා භවති අප්පියදස්සනො ච,
පප්පොති දුක්ඛමතුලඤ්ච මනුස්සභූතො
වාචං මුසා භණති සො හි අපඤ්ඤසත්තො.

81. හි, යම්හෙයකින්; යො අපඤ්ඤසත්තො, යම් අප්‍රාඥසත්වයෙක්; මුසාවාචං, මුසවා; භණති, බෙණේද; (එහෙයින්) මනුස්සභූතොච, (හෙතෙම) මනුෂ්‍යවූයේද; දීනො, දිළින්දෙක්; (නොහොත්)

බැගෑපත් වූවෙක්ද; විගන්ධවදනොච, දුර්ගන්ධමුඛඇත්තෙක්ද; ජලෝ, මූඪයෙක්ද; (නොහොත්) ජඩයෙක්ද; අපඤ්ඤො, අප්‍රාඥයෙක්ද; මූගො, කොලුවෙක්ද; අප්පියදස්සනොච, අප්‍රිය දර්ශන ඇත්තෙක්ද; සදා, හැමකල්හි; භවති, වේ; අතුලං, අතුල්‍යවූ; (නොහොත්) ප්‍රමාණරහිතවූ; දුක්ඛංච, (කායිකාදි) දුකවන්; පප්පොති, (හෙතෙම) පැමිණේ.

82 උම්මත්තකා විගතලජ්ජගුණා භවන්ති
දීනා සදා ව්‍යසනසොකපරායනා ච,
ජාතා භවෙසු විවිධෙසු විරූපදෙහා
පීත්වා හලාහලවිසංව සුරං විපඤ්ඤා.

82. විපඤ්ඤා, අඥනයෝතුමූ; හලාහලවිසං ඉව, හලාහල විෂයක් මෙන්වූම; සුරං, (ප්‍රමාදයට හෙතුවූ) සුරාව; පීත්වා, පානයකොට; උම්මත්තකා, (අන්‍යජාතියෙහි) උමතුවූවාහු; විගතලජ්ජගුණා, පහවූ ලජ්ජාවහා (ඔතප්සංඛ්‍යාත) ගුණඇත්තාහු; (නොහොත්) සාධුගුණ ඇත්තාහු; දීනා, බැගෑපත්වූවාහු; සදා, හැමකල්හි; (ව්‍යසන-පරායනා ච) ව්‍යසන, (ඥාතිව්‍යසනාදි) ව්‍යසනද; සොක, (පුත්‍රාදි)සොකද (යන මොවුන්) පරායනාච, පිහිටකොට ඇත්තාහුද; විවිධෙසු, අනෙකප්‍රකාරවූ; භවෙසු, භවයන්හි; ජාතා, උපන්නාහු; විරූපදෙහා, විරූප ශරීර ඇත්තාහු; භවන්ති, වෙත්.

83 පාපානි යෙන ඉහ ආචරිතානි යානි
සො වස්සකොටිනහුතානි අනප්පකානි,
ලද්ධාන ඝොරමතුලං නරකෙසු දුක්ඛං
පප්පොති චෙව විවිධව්‍යසනඤ්චනෙකං

83. යෙන, යමෙක්හුවිසින්; යානි, යම්බඳුවූ; පාපානි, (ප්‍රාණවධාදි) පාප (කර්ම) යෝ; ඉහ, මෙහිදී; ආචරිතානි, කරණලද්දේ (වෙත්) ද; සො, ඒ (පාපකාරී) පුද්ගලතෙම; නරකෙසු, (සඤ්ජීවාදි) නරකයන්හි; අනප්පකානි, ස්වල්පනොවූ (හෙවත්) බොහෝවූ; වස්සකොටිනහුතානි, වර්ෂකොටි නහුත (සංඛ්‍යා) මුලුල්ලෙහි; ඝොරං, භයානකවූ; අතුලං, අසදෘශවූ (හෙවත්) බොහෝවූ; දුක්ඛං, දුක; ලද්ධාන, ලැබ; (නොහොත්) අනුභවකොට; චෙව, මේ (අත්බැව්) හිද; අනෙකං, කෙවලනොවූ; විවිධව්‍යසනංච, අනෙකප්‍රකාරවූ ව්‍යසන (විපත්ති) සටිද; පප්පොති, පැමිණේ.

84 ලොකත්තයෙසු සකලෙසු සමං න කිඤ්චි
ලොකස්ස සන්තිකරණං රතනත්තයෙන,
තනෙනජසා සුමහතා ජිනසබ්බපාපො
සොහං සදාධිගතසබ්බසුඛො භවෙය්‍යං.

84. සකලෙසු, සියලු; ලොකත්තයෙසු, තුන්ලෙව්හි; රතනත්තයෙන, රතනත්‍රයහා; සමං, සමවූ; ලොකස්ස, ලොකයාහට; සන්තිකරණං, ශාන්තිකරවූ (හෙවත්) සැපඇතිකරන්නාවූ; කිඤ්චි, කිසිවක්; න (අත්ථි) නැත්තේය; සුමහතා, අතිශයින් මහත්වූ; තනෙනජසා, ඒ රතනත්‍රයසම්බන්ධිවූ තෙජසින්; (ආනුභාවයෙන්) ජිනසබ්බපාපො, දිනනලද සියලු පව්ඇති; සො අහං, ඒ මම; සදා, හැමකල්හි; අධිගතසබ්බසුඛො, පැමිණෙනලද සියලු (ලෞකිකලොකොත්තර) සැපඇත්තෙක්, භවෙය්‍යං, වන්නෙම්වා.

85 ලොකත්තයෙසු සකලෙසු ච සබ්බසත්තා
මිත්තා ච මජ්ඣ රිපු බන්ධුජනා ච සබ්බෙ,
තෙ සබ්බදා විගතරොගභයා විසොකා
සබ්බං සුඛං අධිගතා මුදිතා භවන්තු.

85. සකලෙසු, සියලු; ලොකත්තයෙසු, තුන්ලෙව්හි; සබ්බසත්තාච, සියලු (ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍රාදි) සත්වයෝද; මිත්තාච, (හිත) මිත්‍රයෝද; (මජ්ඣජනාච) මජ්ඣ, මධ්‍යස්ථයෝද; රිපු, සතුරෝද; බන්ධුජනාච, ඤාතිජනයෝද; (යන) තෙ සබ්බෙ, ඒ සියල්ලෝ; සබ්බදා, හැමකල්හි; විගතරොගභයා, අපගතරොගභයඇත්තාහු; විසොකා, සොකනැත්තාහු; සබ්බං, සියලු; සුඛං, (ලෞකිකලොකොත්තර) සැපයට; අධිගතා, පැමිණියාහු; මුදිතා, සතුටුවූවාහු; භවන්තු, වෙත්වා.

86 කායො කරීසභරිතො විය භින්නකුම්භො
කායො සදා කලිමලව්‍යසනාධිවාසො,
කායො විහඤ්ඤති ච සබ්බසුඛන්ති ලොකෙ
කායො සදා මරණරොගජරාධිවාසො.

86. කායො, ශරීරයතෙම; කරීසභරිතො, වර්චසින් භරිතවූ; (හෙවත්) අසුචියෙන් පිරුණාවූ; භින්නකුම්භො විය, බුන්කලයක්වැනිවේ; කායො, ශරීරයතෙම; සදා, හැමකල්හි; (කලි-වාසො) කලි, පාපය (නොහොත්) පරාජය; මල, ගූථය; ව්‍යසන, වැනසීම්ය (යනමොවුන්ට) අධිවාසො, නිවාසස්ථානවේ; කායො, කයතෙම; ලොකෙ, සත්ව ලොකයෙහි; සබ්බසුඛන්තිච, සියල්ල සැපයයිද; විහඤ්ඤති, වැනසේ;(නොහොත්) පෙළෙයි; කායො, ශරීරයතෙම; සදා, හැමකල්හි; (මරණ–වාසො)මරණ, මරණය; රොග, රොගය; ජරා, ජරාවස;(යන මූන් රැසට)අධිවාසො, ප්‍රධාන වාසස්ථානයක්;(නොහොත්)පිහිට වේ.

87 සො යොබ්බනොත්‍ථවිරොපි ච බාලකොපි
සන්තො න පෙක්ඛති විහඤ්ඤතිරෙව මච්චු,
සොහං ඨිතොපි සයිතොපිච පක්කමන්තො
ගච්ඡාමි මච්චුවදනං නියතං තථා හි.

87. සො මච්චු, ඒ මරනෙම; යොබ්බනො ඉති, යෞවන (තරුණ) යයිද; ථවිරො ඉතිච, ස්ථවිර (වෘඩ)යයිද; බාලකො ඉති, බාල (ළදරු) යයිද; සන්තො, සත්‍වයන්; න පෙක්ඛති, නොබලයි; විහඤ්ඤති එව, (සත්‍වයන්) පෙළාමිය (හෙවත්) නසාමය; සො අහං, ඒ මම ඨිතො අපි, සිටියෙම් නමුදු; සයිතො අපි, හොත්නෙම් නමුදු; ච, චශබ්දයෙන් (හුන්නෙම් නමුදු) පක්කමන්තො, යන්නෙම් නමුදු; මච්චුවදනං, මරුමුවට; නියතං, නියමයෙන්; (නොහොත්) ඒකාන්තයෙන්; ගච්ඡාමි, යමි; තථා හි, ඒ එසේමය.

88 එවං යථා විතිනදෙසමිදං සරීරං
නිච්චංව තග්ගතමනා හදයෙ කරොථ,
මෙත්තං පරිත්තමසුභං මරණස්සතිඤ්ච
භාවෙථ භාවනරතා සතතං යතත්තා.

88. එවං, මෙසේ; තග්ගතමනා, ඒ (ශරීරානුස්මරණයට) පැමිණි සිත් ඇත්තාවූ; (නොපි) යථා විතිනදෙසං, උකතාකාර දෙස් ඇති; ඉදං සරීරං, මේ සිරුර; නිච්චං එව, සතතයෙන්ම; හදයෙ කරොථ, මෙනෙහි කරව්; (හෙවත්) ත්‍රිලක්ෂණාරූපය සදහන් කරව්; භාවනරතා, භාවනාවෙහි ඇලුනාවූ; යතත්තා, සංයමකරණලද සිත් ඇත්තාවූ; (නොපි) මෙත්තං, මෛත්‍රී (භාවනාව) ද; පරිත්තං, පිරිතද; (නොහොත්) බුද්ධධර්මානුස්මෘතියද; අසුභං, අසුභානුස්මෘතියද; මරණසතිඤ්ච, මරණානුස්මෘතියද; සතතං, නිරන්තරයෙන්; භාවෙථ, භාවනා කරව්; (හෙවත්) සිත්හිලා වඩව්.

89 දානාදිපුඤ්ඤකිරියානි සුභද්‍රයානි
කත්වා ච තප්ඵලමසෙසමිහප්පමෙය්‍යං,
දෙය්‍යං සදා පරහිතාය සුඛාය චෙව
ඛිප්පා තදෙව තනුහඤ්ඡනං හි සාරං

89. සුභද්‍රයානි, සැපඵලවත්නාවූ; දානාදිපුඤ්ඤකිරියානි, දානාදිවූ පුණ්‍යකර්මයන්; ඉහ, මෙහිදී; කත්වාච, (මනුෂ්‍යයෝ) කොටම; අප්පමෙය්‍යං, ප්‍රමාණයක්නැති; අසෙසං, සියලු; තප්ඵලං, ඒ (කුසලයාගේ) විපාකය (විඳින්); සදා, හැමකල්හි; පරහිතාය, මෙරමාහට හිතපිණිසද; සුඛාය ච, (තමහට) සැපපිණිසද; දෙය්‍යං එව, දන්දිය

යුත්තේමය; හො, භවන්ති! කිං, කිමෙක්ද! තං එව, එ (දූනය) ම්; හඞ්ගතං, අනවපැමිණියාවූ: සාරං ති, සාරය (වස්තුව) ක්ම; නනු (හොති) නොවේද.

90 හෙතුං විනා න භවතීති ච කිඤ්චි ලොකෙ
සදෙදූව පාණිතලඝට්ටන හෙතු ජාතො,
එවං ච හෙතු ඵලභාවවිභාගභිනෙනා
ලොකො උදෙති ච විනස්සති තිට්ඨති ච.

90 ලොකෙ, (සබ්බ) ලොකයෙහි; හෙතුං විනා,ප්‍රත්‍යයෙන්තොර වූ; කිඤ්චි, කිසි (වස්තු) වක්; න භවතීච, නොවේමය; (කෙසේද යත්) (පාණි-ජාතො) පාණිතල, හස්තතලවයාගේ; ඝට්ටනහෙතු, ගැටීම් (හැපීම්) හෙතුවෙන්; ජාතො, හටගත්තාවූ; සද්දොඉව, ශබ්ද යමෙනි; එවංච, මෙසේම; (හෙතු-භිනෙනා) හෙතු, (අවිද්‍යාදි) හෙතු ය; ඵල, (සංස්කාරාදි)ඵලය;(යන දෙදෙනාගේ) භාව, ඇතිවීමෙන්; විභාග, විභාගභාවයෙ (බෙදීමෙ)න්; භිනෙනා, වෙනස්වූ; ලොකො, ලොකයතෙම; උදෙතිච, උපදනේද; විනස්සතිච, නස්නේද; තිට්ඨ තිච, සිටිනේද වෙයි; (අවිද්‍යාදිප්‍රත්‍යයෙන්ද සංස්කාරාදිඵලයෙන්ද භිනනාවූ ලොකය උත්පාදස්ථිතිභඞ්ග යන ක්ෂණත්‍රයෙන් යුක්තවෙයි යේසි)

91 කම්මස්ස කාරණමයං හි යථා අවිජ්ජා
සො කම්මතො සමධිගච්ඡති ජාතිභෙදං,
ජාතිං පටිච්චච ජරාමරණාදිදුක්ඛං
සත්තා සදා පටිලභන්ති අනාදිකාලෙ.

91. හො, භවන්ති; අයං අවිජ්ජා, මේ (දුඃඛාදිචතුරාර්‍ය්‍යසත්‍ය යන්නොදන්නම ලක්ෂණකොටඇති) අවිද්‍යාතොමේ; කම්මස්ස, (කුස ලාකුසල) කර්‍මයට; යථා, යම්සේ; කාරණංහි, කරුණක්ම වේද; සා මමතා,(එසේම) (කුසලාකුසල) කර්‍මය හෙතුකොටගෙණ; ජාතිභෙදං, (ක්ෂත්‍රියාදි) ජාතිභෙදයට (නොහොත්) කාමාවචරාදි ජාතිභෙදයට; සමධිගච්ඡති, (සත්වතෙම) පැමිණෙයි; ජාතිං පටිච්චච, ජාතිය (ඉප දීම) නිසාම; ජරාමරණාදිදුක්ඛං, ජරාමරණසොකාදිදුක; සත්තා, සත්වයෝ; අනාදිකාලෙ, අනාදිමත්කාලයෙහි; (හෙවත්) අනවරාග්‍ර සංසාරයෙහි; සදා, හැමකල්හි; පටිලභන්ති, ලබත්; (හෙවත්) විඳිත්; (උත්පත්තිහෙතුවෙන් නැවතනැවත ජරාමරණාදිදුක්ලැබෙය යුතුයි.)

92 කම්මං යථා න භවතීහ ච මොහනාසා
කම්මක්ඛයාපිච න හොති භවෙසු ජාති,
ජාතික්ඛයා ඉහ ජරාමරණාදිදුක්ඛං
සබ්බක්ඛයං භවති දීප ඉවානිලෙන.

92 ඉහ, මෙ (ප්‍රතීත්‍ය සමුත්පාදදීයෙ)හි; යථා, යම්සේ; මොහනාසා, මොහයාගේ නැසීමෙන්; (හෙවත්) අවිද්‍යාහුගේ නිරවශෙෂප්‍රහාණීයහෙතුකොටගෙණ; කම්මං, (කුසලාකුසල) කර්මය; න භවති, නොවේද; (එසේම) කම්මක්ඛයා, කර්මයා (ක්‍රියාහු) ගේ ක්‍ෂය කිරීමෙන්; (නොහොත්) කර්ම නිරොධය හෙතුකොටගෙණ; භවෙසු, (කාමාදි) භවයන්හි; ජාති අපි, ඉපදීමත්; න හොතිච, නොවේමය: ඉහ, මේ භවයෙහි; ජාතික්ඛයා, ජාතිහුගේ ක්‍ෂයකිරීමෙන්,(හෙවත්) පුනරුත්පත්තිනිරොධය හෙතුකොටගෙණ; ජරාමරණාදිදුක්ඛං, දිරීමය මැරීමය යනාදිදුඃඛය; සබ්බක්ඛයං, සර්වප්‍රකාරයෙන් නිරුද්ධකිරීම; භවති, වේ; (කුමක්මෙන්ද) අනිලෙන, පවනින්; දීපො ඉව, (නිවියන) ප්‍රදීපයක්මෙනි; (යම්සේ මාරුතයෙන් ප්‍රදීපය නිවීයේද එසේම මාර්ගඥානයෙන් අවිද්‍යානිරොධය හිමිකොට කර්මාදීන්ගේ නිරවශෙෂ නිරොධය වේය යනු භාවයි.)

93 යො පස්සතීහ සතතං මුනිධම්මකායං
බුද්ධං ස පස්සති නරො ඉති සො අවොච,
බුද්ධං ච ධම්මමමලං ච තිලොකනාථං
සම්පස්සිතුං විචිනථාපිච ධම්මතා හො.

93. හො, භවන්ති ! ඉහ, මේ ලොකයෙහි; යො, යම් (මිනුෂ්‍ය) කෙනෙක්තෙම; මුනිධම්මකායං, සර්වඥයන්වහන්සේගේ (සීලාදිගුණ සඞ්ඛ්‍යාත) ධර්මකාය; සතතං, නිරන්තරයෙන්; පස්සති, දකිද; සො නරො, ඒ මනුෂ්‍යතෙම; බුද්ධං, සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ; පස්සති ඉති, දක්නේයයි; සො, ඒ (සර්වඥ)තෙම; අවොච, වදාළසේක; තිලොකනාථං, තුන්ලොවට පිහිටවූ; බුද්ධං ච, බුදුන්ද; අමලං, නිර්මලවූ (හෙවත්) (කෙලශ) මලාභාවයෙන් පරිසුද්ධවූ; ධම්මංච, (සපර්‍ය්‍යාප්තිකනව ලොකොත්තර)ශ්‍රී සද්ධර්මයද; සම්පස්සිතුං, මොනාවට බලනුපිණිස; විචිණාථ, (තොපි) උත්සාහ කරව්; අපිච, යලිදු; ධම්මතා, (සත්පුරුෂ) ධර්මස්වභාවක්(ද) වේ; (සීලාදිගුණධර්මායුහතායම සත්පුරුෂසම්මත බුද්ධාදිමහොත්තමයන් වහන්සේලාගේ ධර්මතාවයක යනුයි.)

94 සල්ලංව භො සුනිසිතං හදයෙ නිමුග්ගං
දොසත්තයං විවිධපාපමලෙන ලිත්තං,
නානාවිධව්‍යසනභාජනමප්පසන්නං
පඤ්ඤාමයෙන බලිසෙන නිරාකරොථ.

94. භො, භවත්නි ! සුනිසිතං, අතිශයින්තියුණුවූ; හදයෙ, හෘදයෙහි; නිමුග්ගං, ගිලුනාවූ (හෙවත්) ඇතුනාවූ; සල්ලංඉව, හුලක් බදුවූ; විවිධපාපමලෙන, අනෙකප්‍රකාරපාපමලයෙන්; ලිත්තං, ආලෙපකරණලද්දාවූ; නානාවිධව්‍යසනභාජනං, නන්වැදෑරුම්වැනසුම්වලට ආධාරවූ; අප්පසන්නං, ප්‍රසාදරහිතවූ (හෙවත්) කිලුටුවූ; දොසත්තයං, (ලොභ වෙෂ මොහ යන) තුන්දොස; පඤ්ඤාමයෙන, ප්‍රඥාමයවූ (හෙවත්) නුවණින් කළාවූ; බලිසෙන, බිළියෙන් (හෙවත්) වෛද්‍යයන්ගේ වක්කටුවෙන්; නිරාකරොථ, බැහැරකරව්; (හෙවත්) ලොභාදි ලාමකධර්මයන් ප්‍රඥවෙන් වනසව්.

95 නාකම්පයන්ති සකලාපි ච ලොකධම්මා
චිත්තං සදාපගතපාපකිලෙසසල්ලං,
රූපාදයො ච විවිධා විසයා සමග්ගා
ධුතංව මෙරුසිඛරං මහතානිලෙන.

95. සකලා අපි, සියලුම; ලොකධම්මා ච, (ලාභය අලාභය අයශය යශසය නින්දය ප්‍රශංසාය සැපය දුකයයි කියනලද අටපරිදිවූ) ලොකධර්මයෝද; විවිධා, අනෙකප්‍රකාරවූ; සමග්ගා, සියලු; (නොහොත්) සම්පූර්ණවූ; රූපාදයොච, රූපශබ්දාදිවූ; විසයාච, (පඤ්චකාම) විසයෝද; (හෙවත්) ආරම්මණයෝද; මහතා, මහත්වූ; අනිලෙන, මාරුතයෙන්; ධුතං, පහස්නා (හැපෙනා)ලද; මෙරුසිඛරං ඉව, මෙරුපර්වතමස්තකයවැනිවූ; (අපගත-සල්ලං) අපගත, පහවූ; පාප, ලාමකවූ; කිලෙසසල්ලං, කෙලෙස්නමැතිහුල්ඇති (හෙවත්) ලාමකවූ කෙලෙස්නමැති හුල්පහකොට්න් නිර්මලව පැවැත්නාවූ; චිත්තං, සිත; සදා, හැමකල්හි; නාකම්පයන්ති, කම්පා නොකරෙත්; (චණ්ඩ මාරුතයෙන් අකම්පිතමෙරුපර්වතශිඛරයමෙන් ලොලශභාවාපගමනයෙන් නිර්මලවූ චිත්තය අෂ්ටලොකධර්මයෝද දිව්‍යමනුෂ්‍යාදී ප්‍රභෙදවූ අනෙකවිධරූපාදි පඤ්චකාමයෝද සොලවාපියනොහැකිවෙන් යනු භාවයි.)

96 සංසාරදුක්ඛමගණෙය්‍ය යථා මුනින්දො
ගම්භීරපාරමිතසාගරමුත්තරිත්වා,
ඤෙය්‍යං අබොධි නිපුණං හතමොහජාලො
තස්මා සදා පරහිතං පරමං චිණාථ.

96. හතමොහජාලො, නසනලදමොහනමැති දැල්ඇත්තාවූ; (නොහොත්) අවිද්‍යාස්කන්ධයනැසුවාවූ; මුනින්‍ද්‍ර, මුනීන්‍ද්‍රයෙක්තෙම; සංසාරදුක්ඛං, (ස්කන්ධාදීන්ගේ නොසිඳපැවැත්මයයි කියූ) සංසාරදුඃඛය; අගණෙය්‍ය, සඞ්ඛ්‍යානොකොට (නොහොත්) ප්‍රමාණනොකොට; ගම්භීරපාරමිතාසාගරං, ගැඹුරුවූ (සමතිස්) පෙරුම්නාමැතිසයුර; උත්තරිත්වා, තරණයකොට (හෙවත්) පරතෙරට පැමිණ; නිපුනං, සූක්ෂමවූ; ඤෙය්‍යං, (සංස්කාරවිකාරලක්ෂණනිර්වාණප්‍රඥප්තිසංඛ්‍යාත සමස්ත) ඥෙය්‍ය (මණ්ඩල)ය; (හෙවත්) දතයුතුසර්වධර්මය; යථා, යම්සේ; අබොධි, (පරොපදෙශරහිතව ස්වයම්භූඥානයෙන්)අවබොධයාත්‍රසේක්ද; තස්මා, එහෙයින්; සදා, හැමකල්හි; පරමං, අත්‍යර්ථයෙන්; (නොහොත්) උතුම්වූ; පරහිතං, පරවැඩ; චිණ්ණෝ, රුස්කරව; (හෙවත් පරාර්ථසම්පාදනයෙහි නිරත වව්) සසරදුක්නොසලකා ආත්මනිරපෙක්ෂකවපාරමිතාසම්භරණය කොට සම්‍යක්සම්බොධිසමධිගමයෙන් පරාර්ථසිද්ධියම කළහෙයින් තොපිත් අනුන්ට වැඩ සලසාලව්.

97 ඔහාය සොධිගතමොක්ඛසුඛං පරෙසං
අත්‍ථාය සංචරි භවෙසු මහබ්භයෙසු,
එවං සදා පරහිතං පුරතො කරිත්‍වා
ධම්මං මයානුචරිතං ජගතත්‍ථමෙව.

97. සො, ඒ (සර්වඥ) තෙම;(අධි–සුඛං) අධිගත, (දීපංකර බුදුන් හමුයෙහිදී) පැමිණියාවූ; මොක්ඛසුඛං, මිදීමවූ (නිවන්) සැපය; ඔහාය, (මහාකරුණාවෙන්) හැරපියා; මහබ්භයෙසු, මහත්බියඇති; භවෙසු, භවයන්හි; පරෙසං, මෙරමාහට; අත්‍ථාය, වැඩපිණිස; සංචරි, (යම්හෙයකින්) සංසරණයකෙළේද; (හෙවත්) ඇවිද්දේද; එවං, මෙසේහෙයින්; මයා, මාවිසින්; සදා, හැමකල්හි; පරහිතං, පරහටවැඩ; පුරතො කරිත්‍වා, පෙරටුකොට; (නොහොත්) ප්‍රධානකොට; ජගතත්‍ථං එව, ලොකාර්ථය පිණිසම; ධම්මං, ධර්මය; අනුචරිතං, අනුවකරණලද්දේය.

98 ලද්ධාන දුල්ලභතරඤ්ච මනුස්සයොනිං
සබ්බං පපඤ්චරහිතං ඛණසම්පදඤ්ච,
ඤත්‍වාන ආසවනුදෙකහිතඤ්ච ධම්මං
කො පඤ්ඤවා අනවරං න භජෙය්‍ය ධම්මං.

98. පඤ්ඤවා, ප්‍රාඥවූ; කො, කවරෙක්තෙම; දුල්ලභතරං, අතිශයින් දුර්ලභවූ (හෙවත්) අතිශයින්ම දුකසේලැබියයුතුවූ; මනුස්සයොනිංච, මනුෂ්‍යස්කන්ධ (පුඤ්ජ) යද (හෙවත්) මිනිසත්බවද; පපඤ්චරහිතං, ප්‍රමාදයක්නැත්තාවූ; (හේවත්) අෂ්ටදුෂ්ටක්ෂණයෙන් තොරවූ; සබ්බං, සියලූ; ඛණසම්පදංච, ක්ෂණසම්පත්තියද; ලද්ධාන,

ලබාගෙණ; ආසවනුදං, (කාමාදි) ආශ්‍රවයන්පහකරන්නාවූ; එක ඛිතං, අසහායතිතවූ (නොහොත්) ශ්‍රෙෂ්ඨකරණයවූ; ධම්මංච, ධර්‍මයද; සුණිත්වාන, දැනගෙණ; අනවරං, (උත්තරිතරයක්නැත්තෙත්) උත්තමවූ (නොහොත්) නිරන්තරයෙන්; ධම්මං, (සත්පුරුෂ) ධර්‍මය; න භජෙය්‍ය, නොසෙවූනේද? (ප්‍රඥවන්තෙමේ සම්‍යක්ප්‍රතිපදාවෙන් සත්පුරුෂ ධර්‍මයට අනුව ක්‍රියාකෙරෙයි සේයි.)

---

99 ලද්ධාන බුද්ධසමයං අතිදුල්ලභඤ්ච
සද්ධම්මමග්ගමසමං සිවදං තථෙව,
කල්‍යාණමිත්තපවරෙ මතිසම්පදඤ්ච
කො බුද්ධිමා අවිරතං න භජෙය්‍ය ධම්මං.

99. අතිදුල්ලභඤ්ච, අතිශයින් දුකසේ ලැබියයුතුවූම; බුද්ධ සමයං, සම්‍යක්සම්බුද්ධකාලයද; (හෙවත්) සම්බුදුකෙනෙකුගේ උප දීම් කාලයද; තථාඑව, එසේ(දුර්ලභවූ)ම; සිවදං, නිවනදෙන්නාවූ; අග්ගං, උතුම්වූ; අසමං, අසදෘශවූ; සද්ධම්මං, ශ්‍රීසද්ධර්‍මයද; කල්‍යාණ මිත්තපවරෙ, උතුම් යහපත් මිතුරන්ද; මතිසම්පදඤ්ච, ප්‍රඥසම්පත්ති සද; ලද්ධාන, ලබාගෙණ; කො බුද්ධිමා, කවරනම් නැනැතියෙක් තෙම; ධම්මං, (දශකුසලකර්‍මපථ) ධර්‍මය; අවිරතං, නිරතුරුව; න භජෙය්‍ය, සෙවනය නොකෙරේද; කෙරේමය.

100 එවම්පි දුල්ලභතරෙ විභවෙ සුලද්ධා
මච්ඡෙරදොසවිරතා උභයත්ථකාමා,
සද්ධාදිධම්මසහිතා සතතප්පමත්තා
භො භො කරොථ අමතාධිගමාය පුඤ්ඤං.

100. භො භො, පින්වත්නි! පින්වත්නි! එවම්පි, මෙසේද; දුල්ලභතරෙ, අතිශය දුර්ලභවූ; විභවෙ, සම්පත්; සුලද්ධා, මනාසේ ලැබූවාහු; මච්ඡෙරදොසවිරතා, මසුරුමලයෙන් පහවූවෝව; උභ යත්ථකාමා, ආත්මාර්ථ පරාර්ථය කැමැත්තෝ; (නොහොත්) මෙලෝ පරලෝ දෙකේ වැඩකැමතිව; සද්ධාදිධම්මසහිතා, ශ්‍රද්ධාශීලශ්‍රුත ත්‍යාග ප්‍රඥ (සඞ්ඛ්‍යාතපඤ්ච) ධර්‍මඇත්තෝව; සතතප්පමත්තා, නිත ර (කුසලක්‍රියාවෙහි) පමානැතිව; අමතාධිගමාය, නිර්වාණාවබොධය පිණිස; (නොහොත්) නිවන්(පුර)යාම්ට; පුඤ්ඤං, කුසල්; කරොථ, කරව්.

නිමි.

---

උඩුගොඩ පියතිස්ස ඒකනායකතෙර විරචිත,
විසුද්ධජනානං කථා ව්‍යාඛ්‍යා සද්ධම්මට්ඨිතිකාමිනා.

# සත්තසූරියුග්ගමන සුත්තං.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

ඒවම්මෙසුතං එකං සමයං භගවා වෙසාලියං විහරති අම්බපාලිවනෙ෴ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච෴ අනිච්චා භික්ඛවෙ සංඛාරා අද්ධුවා භික්ඛවෙ සංඛාරා අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං෴ සිනෙරු පබ්බතරාජා භික්ඛවෙ ආයාමෙන චතුරාසීති යොජනසහස්සානි විත්ථාරෙන චතුරාසීති යොජනසහස්සානි මහාසමුද්දෙ෴ අජ්ඣොගාළ්හො චතුරාසීති යොජන සහස්සානි මහාසමුද්දා අච්චුග්ගතො චතුරාසීති යොජනසහස්සානි෴ හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි බහූනිවස්සසතානි බහූනිවස්සසහස්සානි බහූනිවස්සසතසහස්සානි දෙවො න වස්සති දෙවෙ ඛො පන භික්ඛවෙ අවස්සන්තෙ යෙකෙචි බීජගාම භූතගාම ඔසධී වනප්පතයො තෙ උස්සුස්සන්ති විසුස්සන්ති නභවන්ති එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා එවං අද්ධුවා භික්ඛවෙ සංඛාරා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං෴ හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන දුතියො සූරියො පාතුභවති දුතියස්ස භික්ඛවෙ සූරියස්ස පාතුභාවා යා කාචි කුන්නදියො කුස්සුබ්භා උස්සුස්සන්ති විසුස්සන්ති නභවන්ති එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා එවං අද්ධුවා භික්ඛවෙ සංඛාරා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං෴ හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන තතියො සූරියො පාතුභවති තතියස්ස භික්ඛවෙ සූරියස්ස පාතුභාවා යාකාචි මහානදියො සෙය්‍යථිදං ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී තා උස්සුස්සන්ති විසුස්සන්ති නභවන්ති එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා එවං අද්ධුවා භික්ඛවෙ සංඛාරා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං෴ හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො

අච්චයෙන චතුත්ථො සුරියො පාතුභවති චතුත්ථස්ස භික්ඛවෙ සුරියස්ස පාතුභාවා යෙ තෙ මහාසරා යතො ඉමානි මහානදියො සම්භවන්ති සෙය්‍යථිදං ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී තා උස්සුස්සන්ති විසුස්සන්ති නභවන්ති එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා එවං අධුවා භික්ඛවෙ සංඛාරා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවච්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං ෴ හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන පඤ්චමො සුරියො පාතුභවති පඤ්චමස්ස භික්ඛවෙ සුරියස්ස පාතුභාවා යොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති ද්වියොජන සතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, තියොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති චතුයොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, පඤ්චයොජන සතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, ඡයොජන සතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, සත්තයොජනසතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, අට්ඨයොජන සතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, නවයොජන සතිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, සහස්සයොජනිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, දසසහස්සයොජනිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති, වීසතිසහස්සයොජනිකානිපි මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති තිංසති සහස්සයොජනිකානිපි, චත්තාලීසසහස්ස යොජනිකානිපි, පඤ්ඤාසසහස්සයොජනිකානිපි, සට්ඨිසහස්ස යොජනිකානිපි, සත්තතිසහස්ස යොජනිකානිපි, අසීතිසහස්ස යොජනිකානිපි, මහාසමුද්දෙ උදකානි ඔගච්ඡන්ති චතුසහස්ස යොජනිකං මහාසමුද්දෙ උදකං සණ්ඨාති ෴ සහස්සයොජනිකම්පි විසහස්ස යොජනිකම්පි තිසහස්ස යොජනිකම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති නවසත යොජනිකම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති අට්ඨසත යොජනිකම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති සත්තසත යොජනිකම්පි ඡසතයොජනිකම්පි, පඤ්චසත යොජනිකම්පි, චතුසත යොජනිකම්පි, තිසතයොජනිකම්පි, විසත යොජනිකම්පි, සතයොජනිකම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති පඤ්ඤාසයොජනිකම්පි, සත්තතාලම්පි, ඡතාලම්පි, පඤ්චතාලම්පි, චතුතාලම්පි, තිතාලම්පි, විතාලම්පි, තාලමත්තම්පි, මහාසමුද්දෙ උදකං සණ්ඨාති, සත්තපොරිසම්පි ඡපොරිසම්පි පඤ්චපොරිසම්පි චතුපොරිසම්පි තිපොරිසම්පි විපොරිසම්පි පොරිසම්පි අඩ්ඪපොරිසම්පි කටිමත්තම්පි ජන්නුකමත්තම්පි ගොප්පකමත්තම්පි මහාසමුද්දෙ උදකං සණ්ඨාති ෴ සෙය්‍යථාපි භික්ඛවෙ සරදසමයෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ තහං තහං ගොපදෙසු උදකානි ඨිතානි හොන්ති එවමෙව ඛො භික්ඛවෙ තහං තහං ගොපදමත්තම්පි මහාසමුද්දෙ උදකානි

ඨිතානි හොන්ති පඤ්චමස්ස භික්ඛවෙ සූරියස්ස පාතුභාවා අඞ්ගුලි පබ්බතෙ මනමත්තම්පි මහාසමුද්දෙ උදකානි ඨිතානි හොන්ති එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා එවං අධුවා භික්ඛවෙ සංඛාරා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විමුච්චිතුං.—

හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන ඡට්ඨො සූරියො පාතුභවති ඡට්ඨස්ස භික්ඛවෙ සූරියස්ස පාතුභාවා, අයංච මහාපඨවී සිනෙරුච පබ්බතරාජා ධූපායන්ති සන්ධූපායන්ති සම්පධූපායන්ති සෙය්‍යථාපි භික්ඛවෙ කුම්භකාරපාකො ආලිම්පිතො පඨමං ධූපෙති සන්ධූපෙති සම්පධූපෙති එවමෙව ඛො භික්ඛවෙ ඡට්ඨස්සසූරියස්ස පාතුභාවා අයඤ්චමහාපඨවී සිනෙරුච පබ්බතරාජා ධූපායන්ති සන්ධූපායන්ති සම්පධූපායන්ති එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා එවං අධුවා භික්ඛවෙ සංඛාරා එවං අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං.—

හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන සත්තමො සූරියො පාතුභවති සත්තමස්ස භික්ඛවෙ සූරියස්ස පාතුභාවා අයඤ්ච මහාපඨවී සිනෙරුච පබ්බතරාජා ආදිප්පන්ති පජ්ජලන්ති එකජාලී භවන්ති ඉමිස්සාච භික්ඛවෙ මහාපඨවියා සිනෙරුස්සච පබ්බතරාජස්ස ඣායමානානං ධූමායමානානං විනස්සමානානං අග්ගිවාතෙන ඛිත්තා යාව බ්‍රහ්මලොකාපි ගච්ඡන්ති සිනෙරුස්සච භික්ඛවෙ පබ්බතරාජස්ස ඣායමානස්ස ධූමායමානස්ස විනස්සමානස්ස මහතා තෙජක්ඛන්ධෙන අභිභූතස්ස යොජනසතිකානිපි කූටානි රලුජ්ජන්ති, ද්වියොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති, තියොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති, චතුයොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති, පඤ්චයොජනසතිකානිපි කූටානි පලුජ්ජන්ති ඉමිස්සාච, භික්ඛවෙ මහාපඨවියා සිනෙරුස්සච භික්ඛවෙ පබ්බතරාජස්ස ඣායමානානං ධූමායමානානං විනස්සමානානං නෙව ඡාරිකා පඤ්ඤායති න මසි—සෙය්‍යථාපි භික්ඛවෙ සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස ධූමායමානස්ස නෙව ඡාරිකා පඤ්ඤායති න මසි එවමෙවඛො භික්ඛවෙ ඉමිස්සාච මහාපඨවියා සිනෙරුස්සච පබ්බතරාජස්ස ඣායමානානං ධූමායමානානං විනස්සමානානං නෙවඡාරිකා පඤ්ඤායති න මසි එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා එවං අධුවා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුන්ති—

තත්‍ර භික්ඛවෙ කො මන්තා කො සද්ධාතා අයඤ්ච මහාපඨවී සිනෙරුච පබ්බතරාජා උඩ්ඩය්හිස්සන්ති විනස්සිස්සන්ති න භවිස්සන්ති

අඤ්ඤත්‍ර දිට්ඨපදෙහි— භූතපුබ්බං භික්ඛවෙ සුනෙත්තො නාම සත්ථා අහොසි තිත්ථකරො කාමෙසු වීතරාගො. සුනෙත්තස්ස ඛො පන භික්ඛවෙ සත්ථුනො අනෙකානි සාවකසතානි අහෙසුං. සුනෙත්තො සත්ථා සාවකානං බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙසි— යෙ ඛො පන භික්ඛවෙ සුනෙත්තස්ස සත්ථුනො බ්‍රහ්මලොකසහබ්‍යතාය ධම්මං දෙසෙන්තස්ස සබ්බෙන සබ්බං සාසනං අජානිංසු තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං බ්‍රහ්මලොකං උපපජ්ජිංසු— යෙ න සබ්බෙන සබ්බං සාසනං අජානිංසු තෙ කායස්ස භෙදා පරම්මරණා අප්පෙකච්චෙ පරනිම්මිතවසවත්තීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු; අප්පෙකච්චෙ නිම්මානරතීනං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු; අප්පෙකච්චෙ තුසිතානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු; අප්පෙකච්චෙ යාමානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු; අප්පෙකච්චෙ තාවතිංසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු; අප්පෙකච්චෙ චාතුම්මහාරාජිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජිංසු; අප්පෙකච්චෙ ඛත්තියමහාසාලානං සහබ්‍යතං උපපජ්ජිංසු; අප්පෙකච්චෙ බ්‍රාහ්මණමහාසාලානං සහබ්‍යතං උපපජ්ජිංසු, අප්පෙකච්චෙ ගහපතිමහාසාලානං සහබ්‍යතං උපපජ්ජිංසූති.

අථ ඛො භික්ඛවෙ සුනෙත්තස්ස සත්ථුනො එතදහොසි න ඛො පනෙතං පතිරූපං යොහං සාවකානං සමසමගතියො අස්සං අභිසම්පරායං යන්නූනාහං උත්තරිං මග්ගං භාවෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ සුනෙත්තො සත්ථා සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙසි සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙත්වා සත්ත සංවට්ටවිවට්ටකප්පෙ නයිමං ලොකං පුනරාගමාසි— සංවට්ටමානෙ සුදං භික්ඛවෙ ලොකෙ ආභස්සරූපගො හොති විවට්ටමානෙ ලොකෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජති. තත්‍ර සුදං භික්ඛවෙ බ්‍රහ්මා හොති මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්ති ඡත්තිංසක්ඛත්තුං ඛො පන භික්ඛවෙ සක්කො අහොසි දෙවානමින්දො, අනෙකසතක්ඛත්තුං රාජා අහොසි චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො සෙය්‍යථිදං චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ගහපතිරතනං ඉත්ථිරතනං පරිණායකරතනං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා අහෙසුං සූරා වීරංගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසි— සොපි නාම භික්ඛවෙ සුනෙත්තො සත්ථා එවං දීඝායුකො සමානො එවං චිරට්ඨිතිකො අපරිමුත්තො අහොසි ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි අපරිමුත්තො දුක්ඛස්මාති වදමී.

තං කිස්ස හෙතු? චතුන්නං ධම්මානං අනනුබොධා කතමෙසං චතුන්නං අරියස්ස සීලස්ස අනනුබොධා අප්පටිවෙධා අරියස්ස

සමාධිස්ස අනනුබොධා අප්පටිවෙධා අරියාය පඤ්ඤාය අනනුබොධා අප්පටිවෙධා අරියාය විමුත්තියා අනනුබොධා අප්පටිවෙධා තයිදං භික්ඛවෙ අරියං සීලං අනුබුද්ධං පටිවිද්ධං අරියො සමාධි අනුබුද්ධො පටිවිද්ධො අරියා පඤ්ඤා අනුබුද්ධා පටිවිද්ධා අරියා විමුත්ති අනුබුද්ධා පටිවිද්ධා උච්ඡින්නා භවතණ්හා ඛීණා භවනෙත්ති නත්ථිදානි පුනබ්භවොති ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

සීලං සමාධිපඤ්ඤාච විමුත්තිච අනුත්තරා
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා
ඉති බුද්ධො අභිඤ්ඤාය ධම්මං මක්ඛාසි භික්ඛුනං
දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතොති.

**සත්තසුරියුග්ගමන සුත්තං නිට්ඨිතං.**

---

# සප්තසූර්‍ය්‍යෝද්ගමන සූත්‍ර සන්නය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

එවංමෙසුතං මෙ, එම්බා ආයුෂ්මත්වූ මහා කාශ්‍යප ස්ථවිර යන්වහන්සේ මාවිසින් දිව්‍යබ්‍රහ්මනරනාගෙන්ද්‍රාදි සමස්තජන කර්ණරසායනවූ මේ සප්තසූර්‍ය්‍යෝද්ගමන සූත්‍රාන්ත ධර්මදෙශනා; එවං සුතං, මේ ආකාරයෙන් අසනලදී මෙසේ අසනලදී නොහොත්; මෙ, මාගේ; සුතං ශ්‍රැතිය; එවං මෙන්මැයි; එකංසමයං, සංවත්සර සෘතු මාසඬමාස පූර්වාණ්හපරාණ්හාදි කාලයක් අතුරෙන් එකෙක් නොහොත් ගර්භාවක්‍රාන්ති සමය, ජාතිසමය, සංවේගසමය, අභිනිෂ්ක්‍රමණසමය, දුෂ්කරක්‍රියා සමය, මාරවිජය සමය, සම්‍යක්සම්බොධි සමධිගමකාල සමය, දෘෂ්ටධර්ම්ම සුඛවිහාර සමය, අත්තහිත පටිපත්ති සමය, පරහිතපටිපත්ති සමය, දෙශනා සමය, පරිනිර්වාණ සමය, යනාදී දිව්‍ය මනුෂ්‍යයන් කෙරෙහි විශෙෂයෙන් ප්‍රකාශිතවූ සමයන් අතුරෙන් කරුණාකෘත්‍ය සමය, සංඛ්‍යාතවූ එක් ධර්මදෙශනා සමයෙක්හි; භගවා; රාග ද්වේෂ මොහාදි අකුශලධර්මයන් භග්න කළ හෙයින්ද, අනල්පකල්පොපචිත දානසීලනෛෂ්ක්‍රම්‍ය ප්‍රඥාවීර්‍ය්‍ය

ක්ෂාන්ති සත්‍යාධිෂ්ඨාන මෛත්‍රෝපේක්ෂාදි සමතිංශත් පාරමිතානුභාව
යෙන් සඤ්ජාත ද්වාත්‍රිංශත්වර මහා පුරුෂලක්ෂණ අශීත්‍යානුව්‍යඤ්ජන
ව්‍යාමප්‍රභාකේතු මාලාලංකාරාදි සර්වඥරූපානුලක්ෂණයන් හෙතු
කොටගෙණ භගවත්නම්වූ සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ;
වෛශාලියං, නානාරක්ෂදේවතා නිවාසභූතවූ කෛලාසකූටසඛර ප්‍රති
භාගවූ සුවර්ණරජතාදි නීලස්ඵටික ප්‍රවාලකර්මෝජ්වලිත ප්‍රාසාද
කූටාගාර සහස්‍රයෙන් හා මඩපාඩ යොගසිඛාව තවාව චංක්‍රමණ
කොෂ්ඨාගාර තොරණෝත්තුංග යෂ්ටිසිඛරානුබද්ධ හෙමධ්වජ කිං
කිනිකාරාවප්‍රතිරාව සමුපශෝභිත මධුරනණවීපී වින්‍යාස සපතශ්‍රෙති
හාරගාර මණෙතක ජනනන්දනශ්‍යන්ද ද්‍රිස වික්‍රමප්‍රබල පාබල චතු
රංග සේනාසමාකීර්ණවූ නානාවිරංග පංචවර්ණ විචිත්‍ර වස්ත්‍රාභරණ
විභූෂිතවූ තව්තිංසාදිව්‍යසේනාවක්සේ සකල ජනරංජනකෙරෙමින්
වසන්නාවූ සත්දහස්සත්සියසත්දෙනෙකු ප්‍රමාණ ලිච්ඡවිරාජ සමූහ
යන්ගෙන් ශොභමානවූ පුලුන අන්නපාන වස්ත්‍රාභරණයෙන් හා,
සකල නගරාශ්‍රී ශෝභාසමෘද්ධ සම්පන්න විශාලවූ ශාලා ඇති විශාල
මහනුවර සමීපයෙහිවූ; අම්බපාලිවනෙහි, මනුෂ්‍ය රූපයට නොපැමිනී
දිව්‍යරූපයට ඇතුලත්ව දිව්‍යාඞ්ගනාවක්සේ ඖපපාතිකව අම්බරුකමූල
පහළවූ හෙයින් අම්බපාලී නම් ගණිකාව විසින් තමාගේ උද්‍යාන
යෙහි පිළිගන්වනලද අම්බපාලිවනාරාමයෙහි; විහරති, චතුර්විධායති
බ්‍රහ්මවිහරණයෙන් යුක්තව වැඩවාසය කරණසේක. ඒ මේ
දිව්‍යාඞ්ගණ ස්වරූපවූ අම්බපාලිනම් ස්ත්‍රීරත්නය කුමක් හෙයින්
ගණිකානම් විදයත්?

ඇතොමෝ මේ කල්පයට එක්තිස්වන කල්පයෙහි බුදුවූ සිඛී
නම් බුදුන්ට නෑගනිව රාජවංශයෙහි ඉපිද රජසැපත්හැර මෙහෙනි
සස්නෙහි මහනව බොහෝ මෙහෙනින්නන් වහන්සේලා හා සමග
චෛත්‍යයක් වැද පැදකුණුකොට යන්නාහු පෙරටුව ගිය රහත්
මෙහෙනින්වහන්සේ කෙනෙක් කිඹිසිමින් කෙලපිඩක් මළුවෙලා
නොදැක ගියාහ; පසුවගිය මෙහෙනින්දූ දැක අහෝ මළුවේ කෙල
පිඩක් දමා ගියේ අනාචාරයෙක කවර වේසියක්දැයි කියා බිනූහ;
මේ භික්ෂුනීන්දැත් කවර කෙනෙකුතැයි නොදත් බැවිනි ක්ෂමා
කොට ගතනුහුනුදූය බොහෝකාලයක් උපසම්පදා ශීලය නිර්මලව
රක්ෂාකිවාත් මාතුකුච්ඡප්‍රතිසන්ධ්‍යාමෙධ්‍යනරකයෙහි වීසීමක් හා ඉතා
පිළිකුල්වන්නේය එසේහෙයින් මා මිනිසත්හි උපදනාකල දෙව්යන්
මෙන් ඕපාතිකව උපදිම් කියා ප්‍රාර්ථනාකොටපියාත් අයෙනීපවාද
අකුශලයනම් ඉතා බලවත් බැවින් ශීලයෙන් ලබන ස්වර්ගමොක්ෂ
සම්පත් වැලකී නරකයෙහි ඉපිද අනන්ත දීර්ඝකාලයක් මුලුල්ලෙහි
අනන්ත නරකදුක්විඳපියා මිනිස්පියට පැමිණ සියදහස්ගණන්
ජාතියෙහි සිඟන්නියකමෙන් කෘපණදිලිඳුව උපන්හ; දසදහසක්
ජාතියෙහි වේශ්‍යාස්ත්‍රීව උපන්හ; තැවත ලොකාලොක දිවාකරවූ

කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ ශාසන පවතින කාලයෙහි බ්‍රහ්ම චරියාව නිර්මලව රක්ෂාකෙරෙමින් දෙව්ලොව ඉපිද දිව්‍යසම්පත් වළඳා අප බුදුරජුන්ගේ දවස දෙව්ලොවින් චුතව විශාලා මහනුවර ලිච්ඡවිරජුන්ගේ රාජෝද්‍යානයෙහි අඹතුරක මූල දෙවඟනකමෙන් ඕපපාතිකව පහළවූහ— උද්‍යානපාලයා ඒ දැක ලිච්ඡවිරජුන්කරා ගොස් කීය; ලිච්ඡවිහු ඒ අසා වහවහා උයනට ගොස් ඈ දැක විස්ම පත්ව සියදහස්ගණන් රජකුමාරවරු ඈගේ රූපශ්‍රීන් මත්ව තම තමහට සරණමගුල්කරණුවස් මහත්කොට කලහවැඩූහ; එකල විවාදයෙහි කෙළවරක් නොදැක උපායෙහි දක්ෂවූ ප්‍රධාන ලිච්ඡවිහු මෑ සර්වසාධාරණකොට වෛශ්‍යාතනතුරෙහි තබම්හයි සම්මතකොට දවස මසුරන් දහසක් දෙනසේ වෛශ්‍යා තනතුරෙහි තමන්සතු රාජෝද්‍යානය ඈටම නිලකොටදෙමින් ගෘහමණ්ඩපාදිය නිර්මිත කොට දුන්හ.

ඒ අඹපාලිගණිකාවෝද අප්‍රමාණවූ ඓශ්චර්‍ය්‍යවිඳිමින් දෙවඟ නකමෙන් කල්යවත්නීය; එකල සමස්තලෝකාලෝකදිවාකරවූ කරුණානිධානවූ සුගත තථාගතවූ සද්ධර්මචක්‍රවර්ති සර්වඥරාජෝත්තම යාණන්වහන්සේ බැලූබැලූවන් සිතූසිතූවන් ඇසූඇසූවන් ඇස් නිම වමින් සිත් නිමවමින් හාත්පසින් එකපැහැර මල්පිපී සැදීගිය ශාල දුමරජයක්හුසේ සමත්‍රිංසත් පාරමිතා නමැති විචිත්‍ර චිත්‍රාචාරීන් විසින් නිර්මිත කරණලද්දාවූ ද්වාත්‍රිංශත්වරමහාපුරුෂලක්ෂණාශීතිව්‍යානු ව්‍යඤ්ජනබ්‍යාමප්‍රභාකේතුමාලාලංකාරාදීන් කරණකොටගෙණ සන්ධ්‍යා වලා ඉන්ද්‍රචාප විද්‍යුල්ලතා සතසහශ්‍රයෙන් වැළඳගිය කනකගිරිසිඛර යක්සේ දිලිසෙමින් හෙවත් බ්‍රහ්මසමූහයා පිරිවැරූ හාරිත නම් බ්‍රහ්ම රාජයාසේ බබලමින් සකල ගුණගණාභරණ විභූසිත සාරිපුත්‍රානන්ද නන්දෝපනන්දගොපලරාහුලාදි අෂ්ටාර්‍ය්‍යපුද්ගල මහාසඞ්ඝයා පිරිවරා විශාලාමහනුවරාසන්නයෙහි වූ කොටිග්‍රාමයට වැඩවදාළසේක—

එපවත්අසා ලිච්ඡවිරජදරුවෝ පංචවර්ණප්‍රභාසිතවූ වස්ත්‍රාභ රණයෙන් සැරසී විචිත්‍ර භද්‍රාභිසන්ධාරූඪව බුදුන්දක්නට නික්මුනා හුය; එකල අම්බපාලි නම් ගණිකාවෝද විසිතුරුවූ රථවාහනයකට නැගී ලිච්ඡවීන්ට පළමුකොට බුදුන්කරා ගොස් වැඳිවැටී දෙකොන් නගාගෙණ එකත්පස්ව උන්හ; එකල සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ අම්බපාලි ගණිකාවට මෙලොව පරලොව වැඩදක්වදක්වා ඒවැඩෙහි සමාදන්කරවා සමාදන්වූ පිළිවෙත් සිත තියුණුකරවා ඒපිළිවෙත් යහපත යහපතැයි කියා ප්‍රශංසා කරවා ධර්මදේශනාකර වදාළකල්හි, අම්බපාලිගණිකාවෝ සතුටුසිත් ඇතිව ස්වාමිනි දැසියට සෙට උදය අනුග්‍රහකරවදාළ මැනවයි කියා බුදුන් ප්‍රමුඛවූ මහාසඞ්ඝ යාට බතින් නිමන්ත්‍රණකොට සමුගෙණ වහවහා එමින් මාර්ගයෙහි

රථනැති තරුණ ලිච්ඡවිරජුන්ගේ රථහිසින් රථචක්‍රයෙන් ඝට්ට
ණයකොට ඉවත්කෙරෙමින් වහා ගෙට අවුත් අනේකවිධ ප්‍රනීතා
හාර සූපව්‍යඤ්ජන පිළියෙලකොට තුබූහ; ඒ ලිච්ඡවි රජදරුවෝ රථ
වාහනයෙන් යායුතුතැන් ගොස් දුරින්ම බුදුන්දැක නැමිනැමී යෙති;
එකල සර්වඥයන්වහන්සේ නීලවර්ණවූ වස්ත්‍රාභරණයෙන් සැරසී නීල
වර්ණයෙන් එන්නාවූ සුවර්ණවර්ණවූ වස්ත්‍රාභරණයෙන් සැරසී සුවර්ණ
වර්ණයෙන් එන්නාවූ, රක්තවර්ණවූ මනෝහර වස්ත්‍රාභරණයෙන්
සැරසී රක්තවර්ණයෙන් එන්නාවූ; සේවතස්ඵටික මනෝහර වස්ත්‍රා
භරණයෙන් සැරසී සේවතවර්ණයෙන් ධූත්නාවූ; මාංජේෂ්ඨික වර්ණ
යෙන් දිලිහීඑන්නාවූ සත්දහස්සත්සියසත්දෙනෙකු පමණ ලිච්ඡවි
රජ සමූහයා බලාවදාරමින් ඔලොකෙථ භික්ඛවෙ ලිච්ඡවීපරිසෙ
උපසංහරථ භික්ඛවෙ ලිච්ඡවීපරිසෙ පටිසංහරථ අදිට්ඨපුබ්බා තාව
තිංස පරිසන්ති" යනාදීන් මහණෙනි, තවුතිසා වැසි දෙවියන් පෙර
නුදුටුවාහු තෙල ලිච්ඡවිරජු බලවූ, මහණෙනි, වස්ත්‍රාභරණ රූපශ්‍රී
ඓශ්වර්ය්‍ය සම්පත්තීන් බබලන ලිච්ඡවි රජපිරිස් බලා තවුතිසාවැසි
දිව්පිරිස් දැන ගණිනුයි වදාළසේක.—එකල ලිච්ඡවිහු අවුත් බුදුන්
වැද එකත්පස්ව සැදී උන්නාහ; බුදුරජාණන්වහන්සේ ඔවුන්ට
ධර්මදේශනාකොට සමුදෙමින් එයින් නික්ම නාදිකානම් නිජකා
වාසයට වැඩිසේක.—අම්බපාලි ගණිකාවෝද දෙවනදවස් බුදුන්ට
කල්දන්වා බුදුන් රහතුන් මහ පෙළහරින් වඩා ගෙණවුත් වඩා
හිඳුවා සකස්කොට දන්වළඳවා අනුමෙවෙනි බණඅසා පැහැද තමා
ගේ උද්‍යානය බුද්ධප්‍රමුඛවූ මහසඞ්ඝයාවහන්සේට පුදකොට මැත
භාගයෙහි එම උද්‍යානයෙහි සුගතානුරූපකොට විසිතුරු විහාරයක්
කරවා බුදුන්ට පූජාකර තමාද සියලු සම්පත් හැර ගිහිගෙන් නික්ම
පරිවාර ස්ත්‍රීපුරුෂයන්ගෙන් කොටියක්දෙනා ගෙණ බුදුන්කරා
ගොස් සමුගෙණ භික්ෂුනී ශාසනයෙහි මහණව රහත්වූහ.—මෙසේ
අම්බපාලිගණිකාවන් අතීතයෙහි නොදැනම සිද්ධවූ වාග්දුශ්චරිතමය
ආර්‍ය්‍යෝපවාද අකුශලයෙන් එක්තිස් කපක් මුලුල්ලෙහි අනන්ත
නරක දුක්විඳ දුකින්ම සසර හැසිරෙමින් මෙම රහත්වන ජාති
යෙහින් වෛශ්‍යාස්ත්‍රීව උපන්හයි දතයුතු.

"තත්‍රඛො භගවා භික්ඛු ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති
තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං භගවා එතදවොච."

තත්‍රඛො, එහිවනාහි; භගවා නානා පරසමයවාදි හකුමහනීභේද
ඝන කෙසරීන්ද්‍රයමානවූ ශ්‍රීමත් සුගත තථාගත භාග්‍යවත් සර්වඥරා
ජෝත්තමයානන්වහන්සේ; භික්ඛවොති, මහණෙනි කියා; භික්ඛු සං
සාරයෙහි භයදක්නාඅර්ථයෙන් භික්ඛුනම්ලද භික්ෂුන්ට; ආමන්තෙසි,

ආමන්ත්‍රණය කර වදාළසේක; භික්ඛවෝ! ඒ භික්ෂූන්වහන්සේලා හඳුනතී, ස්වාමීන්වහන්සැයි කියා එකාපැහැර දෙහොත් නගා; භගවත්තෝ, විජාතක්ෂණයෙහි කනකවර්ණ ස්වභාවානුරඤ්ජිත ශ්‍රීශරීරයෙන් නික්මුනාවූ ස්වර්ණවර්ණාලෝකයෙන් දසසහශ්‍රී ලෝකධාතුව ස්වර්ණකල්කාලේපකළාක්මෙන් රන්වන්කළාවූ භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචනදුන්සේක්ලාය; භගවා, සකලලෝකවාසි අනන්ත සත්වයන් විසින් සියක් සියක්වර කළ කුසල් පමණ කුසල් ඒ කළාවූතමන්වහන්සේ කරවදාළබැවින් සියපින්ලකුණෙන් යුක්තවූ ඒ භාග්‍යවතුන්වහන්සේ සම්බුද්ධාංකුර මාර නරනාගාදීන්ගේ කර්ණරසායනයවූ මේ සප්තසූර්යෝද්ගමන සූත්‍රාන්ත ධර්මදේශනාව අවොච, වදාළසේක.— මෙසේ ශාන්තසුඛප්‍රතීත පරමාර්ථධර්මදේශනා ඇති මාගේ නිර්මල්ගුරුසම්බුද්ධරාජෝත්තමයාණන්වහන්සේ අළුයම්හි නැගීසිට මහාකරුණා සමාපත්තියටසමවැද අදුකොසේකම ලෝකයා බත් කෙරෙම්දෝහෝයි බුදුඇසින් මුළුලොව බලනසේක් අනිත්‍ය කර්මස්ථානයෙහි වසන පන්සියයක් භික්ෂූන් දැක ඔවුන්ගේ ශ්‍රද්ධාදී පංචේන්ද්‍රියයෝ ඉතා මෘදු බැවින් අධිගමය පමාවෙයි තවර ධර්මදේශනාවකින් මොවුන්ගේ පංචේන්ද්‍රියය තීක්ෂණවූ තන්වූ පරිද්දෙන් අනිත්‍ය කර්මස්ථාන වඩා මාර්ගඵලාධිගමයට පැමිණෙද්දෝහෝයි බලා ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධ සර්වසංස්කාර ප්‍රවෘත්ති ධර්මයන්ගේ අනිත්‍යතාව ප්‍රකාශිත සප්තසූර්යෝද්ගමනය සෙසණහැර දක්වාලීම්තම් මේ භික්ෂූහු හුන් හුන් පළම හිඳ සකලකෙලශයන් නසා අර්හත්ඵලයට පැමිණෙති සෙසුත් සෙසුත් බොහෝදෙන මාර්ගඵලාධිගමයට පැමිණෙති. සියලු දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍යයන්ගේ ලෝකසන්ථාන විනාසකාරණයෙහි සංකාප්‍රභානය වෙයි, මතු පන්දහස් හවුරුදු මුළුල්ලෙහි මා කී බනැයි ලොව පවත්නේයයි. දැන මහත්වූ කරුණාවෙන් එදවස්පස්වරුකල පෙරවරු කළමනා සියලු බුද්ධකෘත්‍යයන් කොට නිමවා පස්වරු වේලෙහි සංඝසන්නිපාතවූ ධර්මසභාමණ්ඩපයෙහි ප්‍රඥප්තවර බුද්ධාසන මස්තකයෙහි යුගන්ධරොදිත බාලාර්කමණ්ඩලය මෙන් දිලිසෙමින් වැඩහිඳ මහණෙනි කියා බණනැගි බසින් සියලුදම්සභාමණ්ඩපය සුවඳ කෙරෙමින් "අනිච්චාභික්ඛවෙ සංඛාරා" යන පාඨය වදාළසේක.

"අනිච්චා භික්ඛවෙ සංඛාරා අද්ධුවා භික්ඛවෙ සංඛාරා අනස්සාසිකා භික්ඛවෙ සංඛාරා යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුං"— භික්ඛවෙ, මහණෙනි, සංඛාරා, ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධසර්වසංස්කාර ප්‍රවෘත්ති ධර්මයෝ; අනිච්චා, ඉපද නස්නා හෙයින් අනිත්‍යයහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සර්වසංස්කාරධර්මයෝ; අද්ධුවා; අස්ථිරහෙයින් අද්‍රුවයහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, පඤ්චස්කන්ධාදි සර්වසංස්කාරධර්මයෝ;

අනස්සාසිකා, අනිස්සර බැවින් සුඛාස්වාදවිරහිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවචඉදං, යම්තාක් අනිත්‍යකෙලවරකොට ඇති මේ කාරණයද; සබ්බසංඛාරෙසු, භවත්‍රයෙහි උපන්නාවූ සියලුම සංස්කාරයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුත්තේමය; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, යුත්තේමය; විමුච්චිතුං, මිදෙන්නට; අලං, යුක්තේමය.

මෙසේ භූතභවිෂ්‍යාත් වර්තමානසථාවරජං ශමතිත්‍යා නිත්‍යාදි සර්වසංස්කාර ප්‍රවෘත්තිධර්මයන් කරතලාමලක ක්‍රමයෙන් ස්වයම්භූ ඥානයෙන් අවබොධකරවදාළාවූ සර්වඥරාජොත්තමයානන්වහන්සේ සකල සත්ත්වයන් අනාදිමත් සසර පිහිටුවා අනන්තසංසාර දුකට භාජනකරවාලූ රූපස්කන්ධය, වෙදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධයයි කියා දක්වාලූ මේ පංචස්කන්ධයන් අතුරෙන් රූපස්කන්ධනම්-පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු චක්ඛුසොත ඝාන ජිව්හා කාය, රූප: සද්ද, ගන්ධ, රස, පොට්ඨබ්බං ඉත්ථත්තං පුරිසත්තං හදයවත්ථු ජීවිතින්ද්‍රියං ආකාශධාතු කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති ලහුතා මුදුතා කම්මඤ්ඤතා උපචය සන්තති ජරතා අනිච්චතායයි විසිඅටවිධ වේ.

එයින් හිසකේ ලොම් නිය දත් සම් මස් නහර ඇට මිදුළු වකුගඩු හෘදයවස්තු අක්මා දලබු බඩදිව් පපු බඩවැල් අතුනුබහන් උදර අසුචි හිස් මුල් යන විසිකොට්ඨාසය පඨවිධාතු නම්වේ.-පිත් සෙම් සැරව රුධිර ඩහදිය මෙදතෙල් කඳුළු වුරුනුතෙල් කෙල සොටු සඳමිදුළු මූත්‍රයයි යන දොළොස් කොට්ඨාස අපොධාතුනම් වේ.-මාංශයක් කුණුනොවෙනසේ ලුනක් මෙන් මේශරීරය කුණුවියනොදී පවත්නා උෂ්ණගතියෙක් ඇද්ද හෙවත් යම් තෙජොගතියකින් මේ ශරීරසන්තානය සොකපරිදෙවාදිය ඇතිකල තැවේද; යම් තෙජොගුණයකින් ශරීරය දවාද, යම් තොජොගුණයකින් ශරීරය ජරාවට පැමිණේද; යම් තෙජොගුණයකින් අනුභවකල ෂඩ්විධවූ සියලුම ආහාර ජාතීහු පැසෙද්ද යන මේ සතර කොට්ඨාසගතවූ උෂ්ණගතියෙක් ඇද්ද ඒ තෙජොධාතු නම්වේ.-මේ ශරීරය දරදණ්ඩක් මෙන් සිටියනොදී ඒ ඒ ක්‍රියායෙහි පවතින්නාවූ යම් වායුගුණයෙක් ඇද්ද හෙවත් දෙපත්ල පටන් සිරස දක්වා පවත්නා උද්ධංගම නම් වාතයද, සිරස පටන් දෙපතුල දක්වා පවත්නා අධොගම නම් වාතයද කුක්ෂිගත බඩවැලපිට හැසිරෙණ කුක්ෂිනම් වාතයද, බඩවැල ඇතුලත හැසිරෙණ කොෂ්ටක නම් වාතද දෙඅත් දෙපා ආදිවූ අඟප්‍රත්‍යඞ්ගයන් හැසුරුකරණ අංගමඞ්ගානුශාරි නම් වාතයද ඉහල පහල නගණ ආශ්වාස ප්‍රාශ්වාස නම් වාතයද යන මේ ෂඩ්විධවූ වාතය ප්‍රධානකොට ඇති මේ ශරීරය ගමණාසණ භෝජනාදී සියලු ක්‍රියාවෙහි පවත්වන

චිත්තක්‍රියා වායොධාතුයෙක් ඇද්ද සේ වායුධාතු නම්වේ. නීල පීතාදී රූපදර්ශනයට කාරණාවූ චක්ෂුප්‍රසාදයද; භෙරිවීනා මෙඝගර්ජනාදි ශබ්දශ්‍රවණයට කාරණාවූ ශ්‍රොත්‍රප්‍රසාදයද; සුගන්ධ දුර්ගන්ධාදිය අඝ්‍රාණයට කාරණාවූ ඝ්‍රාණප්‍රසාදයද; ආහාර පානාදී රසාස්වාදයට කාරණාවූ ජිව්හා ප්‍රසාදයද; වස්ත්‍රාභරණ ස්ත්‍රී පුරුෂාදි ස්පර්ශග්‍රහණයට කාරණාවූ කායප්‍රසාදයද යන ප්‍රසාද රූප පසද. චක්ෂුවට ගොචරවූ රූපාලම්බනයද; ශ්‍රොත්‍රයට ගොචරවූ ශ්‍රොත්‍රාලම්බනයද, ඝ්‍රාණයට විෂයවූ ගන්ධාලම්බනයද, දිවට විශයවූ රසාලම්බනයද; කායෙන්ද්‍රියට විෂයවූ ස්පර්ශාලම්බනයද, යන විෂයරූප පසද; ස්ත්‍රී භාවය පුරුෂභාවය මනොවිඥාන ධාතුන්ට ආධාරවූ හෘදය වස්තුවය දෙහටසිතියට කාරණාවූ රූපජීවිතෙන්ද්‍රියද. දෙකන්සිදුරු නාස බිල මුඛවාර උගුර මලමූත්‍රමාර්ගයෝය යන අවසිදුරු හා කනබොන දෙය පිහිටන උදර පටලය යන මේ නමය ආකාශ ධාතු නම්වේ. කායින් අභිප්‍රාය හඟවන්නාවූ කායවිඥප්තියද වචනයෙන් ඒ ඒ අභිප්‍රාය හඟවන්නාවූ වාක්විඥප්තියද, දවසක් මුළුල්ලෙහි රත්වූ යකඩකදක් මෙන් ශරීරයාගේ සැහැල්ලුබවයයි කියනලද කායලහුත්වයද; සුමර්දිත චර්මයක් මෙන් තොදැඩිබව යයි කියනලද කායමෘදුතාවයද; යහපත්කොට තැවූ ස්වර්ණයක් මෙන් ශරීරයෙන් කටයුතු ක්‍රියාවට අනුකූලබවයයි කියන ලද කාය කර්මාන්‍යතාවද ගඟබඩ කැපූ කූපයාගේ අපරිපූර්ණොදකොත් ගමනය මෙන් දූරසන්තිකාදිවූ එකාදසරූපා යතනයන්ගේ මතුමත්තෙහි උත්පත්තිවශයෙන් අභිවෘද්ධියකැයි කියනලද උපචයද, පරිපූර්ණකූපයෙන් ඉතිරි උදකයාගේ පිටත ඉතිරියාමක් මෙන් උක්තක්‍රමයෙන් උපචිතරූපයන්ගේ නැවත නැවතත් ප්‍රබන්ධොත්පත්තිවශයෙන් ප්‍රවෘත්තියැයි කියනලද සන්තතියද, රූපයන්ගේ උත්පාදවස්ථානන්තයෙන් මත්තෙහි ජීර්ණවන භාගාභිමුඛාවස්ථාවයයි කියනලද ජරතාවද; රූපයන්ගේ පරිභෙද ස්වභාවවූ අනිත්‍යතාවදැයි යන මේ අටවිසිරූපයෝ ශීතොෂ්ණාදීන් රූපපනාර්ථයෙන් විකාරයට යනු රූපනම් වෙයි; රාසි අර්ථයෙන් රූපස්ඛන්ධ නම්වේ-ඉෂ්ටානිෂ්ට මධ්‍යාලම්බනයෙක්වීනම් සවැදෑරුම් ගෝ, ත්‍රිවිධවෙදනා උපදනේය නොහොත් මනාරූපයන් දක සැප වෙදනාව උපදනේය, අමනාපවූ රූපයන් දැක දුක්ඛවෙදනාව උපදනේය, ප්‍රියමප්‍රිය විරහිත භූමිපර්වත කැටකැබිලිති ආදී මධ්‍යස්ථ රූපයන් දැක උපෙක්ෂා වේදනාව උපදනේය, මෙසෙයින්ම මනාප ශබ්දයද අසා මනාප ගන්ධාඝ්‍රාණයකොට මනාප රසවලඳා සවිඥානකක අවිඥානකක ප්‍රියවස්තු ස්පර්ශකිරීමෙන් මනාප දෙය සිතීමෙන් සැපවේදනාව උපදී, අමනාප විරහිත චින්තාවෙන් උපෙක්ෂාව උපදී, මෙසේ නානාවස්ථාවට ගියාවූ චක්ෂුරාදී සදෙරින්

උපදනා වේදනාව වෙදනාස්කන්ධ නම්වේ-ඇසින් දුටු නීලපීතාදි රූපයන් මේ අසවල් රූපය යනාදි වශයෙන් හැඳිනීමය, එසේම කනින් ඇසූ භේරි වීණා මෘදංගාදි ශබ්දයන් වෙන්වෙන්කොට හැඳිනීමය; නාසයෙන් ආඝ්‍රාණය කළ සුගඳ දුගඳ වෙන්කොට හැඳිනීමය, දිවින් විඳි රසය එනු ඇඹුල් පැණිතෙල් කිරිරසය යනාදිවශයෙන් වෙන් වෙන්කොට හැඳිනීමය; කයින් ප්‍රෂ්ටව්‍යය ස්පර්ශකොට මේ සුඛස්පර්ශය මේ දුක්ඛස්පර්ශය යනාදි වශයෙන් තේරුම්කොට හැඳිනීමය, මනසින් යමක් චින්තනයකොට මේ අසවල්දේයයි යනාදි වශයෙන් වෙන්කොට සිතිවිලි හැඳිනීමය, යන මේ ෂඩ්විධවූ සංඥව සංඥාස්කන්ධ නම්වේ.—

"සංඛාරෝ චෙතනාඵස්සෝ මනක්කාරෝ සුසනයිති
තක්කො චාරෝච වායාමෝ පීති ඡන්දාධිමොක්ඛතා—

සද්ධා සති හිරෝත්තප්පං චාගෝ මෙත්තා මති පුන
මජ්ඣත්තතාච පස්සද්ධි කාය චිත්ත වසාදුවෙ

මානොඉස්සාච මච්ඡෙරෝ කුක්කුච්චං පිතම්ඛකං
ඉති එතානි පඤ්ඤාස සංඛාරක්ඛන්ධ සඤ්ඤිතා"යි—

යනුහෙයින් ප්‍රථමකොට උදුසන්හි හිකති ආදියෙහි පැසිරවැද ස්පර්ශවන අව්රැස්මියක්සේ ප්‍රථමකොටම චක්ෂු ශ්‍රොත්‍රාදීහු රූප ශබ්දාදිය දැක අසා ඒ ඒ අරමුණු ස්පර්ශකරණ ඵස්සයද; සුභොජන රස අනුභවකරණ රජහුමෙන් ආලම්බන රසානුභවකරණ වෙදනාවද; වඩුකී ආදීන්ගේ දුව ආදියෙහි සලකුණු කිරීමක් මෙන් නීලපීතාදි භෙදවූ අරමුණු හඳුනන ආකාරයෙන් පවත්නාවූ සංඥාවද-ගොවියෙකු තමන් පනස්පස්දෙනෙකු හා සමග සීසෑම් ගොයම්කැපීමාදියකට තමන් කුඹුරට ගියේය. සෙසු පනස්පස් දෙනාට වඩා ඔහුකම්ත් මහත් උත්සාහයෙන් යෙදී ඒ ඒ කටයුතු කෙරේද එපරිද්දෙන් සෙසු පනස්පස් ධර්මයන්ට වඩා මහත් උත්සාහවත් ලක්ෂණයෙන් යුක්තව සියලුධර්මයන් ආරම්මනයෙහි හසුරුවන්නාවූ චෙතනාවද; අජානීය අශ්වයන් මෙහෙයන්නාවූ සාරථියක්හු මෙන් සහජාත ධර්මයන් ආලම්බනාභිමුඛකොට මෙහෙයන්නාවූ මනස්කාරයද; උත්පලාදීන්ට ජලයක් මෙන් සහජාත අරූප පරිපාලනයෙහි ආධිපත්‍ය කරණ ආයුසංඛ්‍යාත ජීවිතෙන්ද්‍රියද—යුධමඩුලයට මහතරෙන්ද්‍රයකු පිරිවරාගණිගිය සෙනගක් ඒ මහරජ්ජුරුවෝ වැඩිය වැඩිය තැනකට යෙද්ද ඒ සියලු සෙනඟ එකරාශිකිරීමට ප්‍රධානවූනරෙන්ද්‍රයන්සේ එසොදී සෙසුසියලු ධර්මයන් විසිරයානොදී එක්ආරම්මණයෙක සම්පිණ්ඩනයකරණ චිත්තෙකාග්‍රතාවද, ගණ්ඨාදියෙහි ප්‍රථමකොට වදින පහරක්මෙන් අරමුනට ප්‍රථමකොටම චිත්තය නැගීම ලක්ෂණකොට විතර්කයද අරමුනට නැගුණ චිත්තයාගේ නැවත නැවත පවත්නා ලක්ෂණ

ස්වභාවවූ විචාරයද; සියලු කටයුතු කෘත්‍යයෙහි පසුබට නොවන යෝධයකුගේ හැමක්‍රියායෙහි උත්සහවත් ලක්ෂණවූ වීර්‍ය්‍යයද පැන් නැති ග්‍රීෂ්මකාලයෙහි කාන්තාරමාර්ගයෙහි පිපාසයෙන් මිරිකී යන පුරුෂයක්හට පස්පියුමෙන් ගැවසුනු සිසිල් පැන් පොකුණක් දුටු කල උපදනා චිත්තප්‍රීතියක්සේ ඉෂ්ටාරම්මණයෙහි උපදනා චිත්තප්‍රීතියද; ආරම්මන ග්‍රහණයෙහි සිතින් අත දිගුකරන්නාක් මෙන් කර්තුකාමීතාලක්ෂණවූ ඡන්දයද; නිශ්චලවූ ඉන්ද්‍රඛීලයක් මෙන් අරමුනේ සන්නිෂ්ඨාන ලක්ෂණවූ අධිමොක්ඛ්‍යයද; චක්‍රවර්ත්ති චතුරඞ්ගිනි සේනා ගමනින් කැලඹිගිය මඩදියක් ප්‍රසන්නකරණ උදකප්‍රසාද මාණික්‍යරත්නයක්සේ ලෝභාදි කෙලශයන් පහදවන ලක්ෂණවූ ශ්‍රද්ධාවද; මහරජක්හට කළමනා නොකළමනා සියලු කටයුතු සඳහන් කරවන විශ්වාස අමාත්‍යයකුසේ අකුසල ධර්මයන් හරිනසේ කුසලධර්මයන් කාරණසේ සිහිකරවන ලක්ෂණවූ ස්මෘතියද; අකුසල ක්‍රියාවෙහි ලජ්ජා ස්වභාවවූ හිරියද; අකුසලක්‍රියාවෙහි භය ස්වාභාවවූ ඔත්තප්පයද; පියුම්පත්‍රයක්හි පතිත ජලබින්දුවක්සේ දුවූඇසූ සිය අරමුණෙහි ඇලීම නොකරන්නාවූ අලොභයද; අනුකූල මිත්‍රයකුගේ අවිරුද්ධ ස්වභාවවූ අද්වේෂයද; අන්ධකාරයෙහි රූපයන්ගේ ප්‍රකාශකාරණ ප්‍රදීපයක්සේ අවිද්‍යාන්ධකාරය විධමනයකොට සියලු හොඳ නොහොඳප්‍රකාශකරණ ලක්ෂණවූ ප්‍රඥාවද;සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන් ස්වකීය කෘත්‍යයෙහි සම්ප්‍රවෘත්තියට හෙතුවූ තත්‍රමධ්‍යස්ථතාවද; වේදනාදී ස්කන්ධත්‍රයාගේද රථයයි කියනලද උද්ධච්චාදී කෙලශයන් සංසිඳුවන කායප්‍රශ්‍රබ්ධියද; විඤ්ඤාණස්කන්ධයාගේද රථයයි කියනලද උද්ධච්චාදී කෙලශයන් සංසිඳුවන චිත්තප්‍රශ්‍රබ්ධියද; එසේම කාමච්ඡන්දාදී කෙලශයන් සන්සිඳුවන කායකර්මණ්‍යතාවද කාමච්ඡන්දාදීන් සන්සිඳුවන චිත්ත කර්මණ්‍යතාවද අශ්‍රද්ධ ආදීන් සංසිඳුවන කාය ප්‍රාගුණ්‍යතාවද, අශ්‍රද්ධ ආදීන් සංසිඳුවන චිත්ත ප්‍රාගුණ්‍යතාවද; කායසංඛ්‍යාතවූ වෙදනා සංස්කාර ස්කන්ධත්‍රයාගේ කුටිලභාවකරවූ මායා සාඨෙය්‍යාදී අකුසලයන් සන්සිඳුවන කාය ඍජුකයද; මායා සාඨෙය්‍යාදී අකුසලයන් සංසිඳුවන චිත්තඍජුකයද; දුක්ඛිතයන්ගේ දුක් පහකරණු කැමැත්තාවූ කරුණාවද; පරලාභසත්කාර කීර්තිප්‍රසංසායෙහි මොදන * ලක්ෂණවූ මුදිතාවද; බොල් සුළඟෙ ඇර වියක් රැස්කරණ ගොවියකුගේ මුසාවාදදිය දුරුකොට වාක්සත්‍යාදිය පැවැත්වීම ලක්ෂණවූ සම්‍යක්වචනයද; අසූචි මලමූත්‍රාදිය අතගාතා ලදරුවෙකුගේ නොකොට කළමනා සාරවත් කටයුතුම කරණ ප්‍රඥාවන්තයෙකුගේ යහපත් කර්මස්වභාවවූ සම්‍යක් ස්වභාව සම්‍යක් කර්මාන්තයද; රත්‍රං දිවා පුඩකරණ ස්වර්ණකාරයකුගේ ජීවිකාව පිරිසිදුකරණ ලක්ෂණවූ

* සතුටුවීම.

සම්‍යක් ආජීවයද; රූපශබ්දාදීයෙහි පඤ්චේන්ද්‍රියන්ගේ ඇලීම ලක්ෂණකොට ඇති ලෝභයද; දණ්ඩෙන් ගැසූ නයෙකු කිපෙන්නාසේ කිපීම ලක්ෂණකොට ඇති ද්වේෂයද; චතුස්සත්‍යය නොදන්නා මෝහයද; මෙලොව පරලොව නැත යනාදීන් ගන්නා මිථ්‍යාදෘෂ්ටියද; සිත නොසන්සුන් බව ලක්ෂණවූ උද්ධච්චයද; ග්‍රාම්සූකරයා අසූචියට කැත නැත්තාසේ පාපයට ලජ්ජා නැති ලක්ෂණවූ අහිරිකයද; ප්‍රදීපයට සල භයානොබව පතින්නාසේ පාපයට භය නැති ලක්ෂණවූ අනොත්තප්පයද; බුද්ධ ධර්ම සඞ්ඝ ශික්ෂා පූර්වාන්ත අපරාන්ත පූර්වාපරාන්ත ඉදප්පච්චයතා ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මය යන අටතැන සැකසිතන්නාවූ විචිකිච්ඡාවද; මම සියල්ලන්ට වැඩිතරමැයි සිතන්නාවූ මානයද; අනුන් කෙරෙහි කරණ ඊර්ෂ්‍යාවද; තමාගේ සියලු ඓශ්වර්යය වෙන කෙනෙකුට නොවේවායි සිතන්නාවූ මාත්සර්යයද කළනොකළදෑ සන්තාපලක්ෂණවූ කුක්කුච්චයද; චිත්තය හැකිලීම ලක්ෂණවූ කායකර්මන්‍ය ලක්ෂණවූ ථීනයද; අකර්මන්‍ය ලක්ෂණවූ මිද්ධයද; යනමේ පනස් ධර්මයන් හා වේදනා සංඥාදී පනස්පස් ධර්මයෝ සංස්කාරස්කන්ධය නම් වේ. විඥානස්කන්ධය නම්;

ඇසෙහි උකුණුහිසක් ප්‍රමාණවූ අභිමුඛගත රූපයන් දක්නා චක්ෂුප්‍රසාදයෙන් දුටු නීලස්වර්ණාදී වර්ණයන් දැනගන්නාවූ චක්ෂුර්විඥානයද; ශ්‍රොත්‍රයෙහි සිඟින් තඹ මූඳුක් ප්‍රමාණවූ රෝමයෙන් නොයෙක් ශබ්ද අසා දැනගන්නා ශ්‍රොත්‍රවිඥානයද; නාසිකාවෙහි එළුවන්ගේ පියවර සටහන් බඳුවූ සුගඳ දුගඳ අසා දැනගන්නාවූ ඝ්‍රාණවිඥානයද; දිවෙහි මානෙල් පෙත්තකට බඳුවූ සටහන් ඇති නොයෙක් රසවිඳින්නාවූ ජිව්හාප්‍රසාදයෙන් රසයන් විඳ දැනගන්නාවූ ජිව්හාවිඥානයද; කයින් ලැබූ ස්පර්ශයන් දැනගන්නාවූ කායවිඥානයද; සිතින් සිතූ නොයෙක් සිතිවිලි දැනගන්නාවූ මනොවිඥානයද යන මේ ෂඩ්විධවිඥානයද;

සතර අපායෙහි පිළිසිඳ දැනගන්නා අකුසල විපාක අහේතුක මනො විඥාන ධාතු චිත්තයද; දෙවියන් හා මිනිස්ලොව ජාත්‍යන්ධ බධිර උමතු ගොළු ආදී සත්වයන්ගේ පිළිසිඳගන්නාවූ කුසලවිපාක අහෙතුක මනොවිඥානධාතු චිත්තයද; දෙවියන් හා මිනිස්ලොව පින්වත් සත්වයන්ගේ පිළිසිඳගැනීමට හෙතුවූ හෙතුක කාමාවචර විපාකසිත් අටද; රූපී බ්‍රහ්මලොකයෙහි උපදවන රූපාවචර විපාක අහෙතුක මනොවිඥානධාතු චිත්තයද; දෙවියන් හා මිනිස්ලොව පින්වත් සත්වයන්ගේ පිළිසිඳගැනීමට හෙතුවූ හෙතුක කාමාවචර විපාකසිත්අටද; රූපීබ්‍රහ්මලොකයෙහි උපදවන රූපාවචර විපාක සිත් පසද; අරූපී බ්‍රහ්මලොකයෙහි උපදවන අරූපාවචර විපාක සිත් සතරද; "සොමනස්ස සහගතං" යනාදී ඉෂ්ටානුභව ලක්ෂණ

කොට ඇති සෝමනස්සසහගියාවූ අනිත්‍යාදී ධම්මසවභාවගැර නිත්‍ය
සුඛ සුභාදී වශයෙන් විපරිතවූ මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූ තමාවිසින්
හෝ අන්‍යයන් විසින් හෝ කරණලද ප්‍රයොග විරහිත හෙයින් අසං
ඛාරිකවූ එක් අකුශල චිත්තයෙක; තමා විසින් හෝ අන්‍යයන්
විසින් හෝ කරණලද පූර්වප්‍රයොග සහිතවූ හෙයින් සසඞ්ඛාරික
එක් අකුසල චිත්තයෙක; සෝමනස් සහගතවූ කාමයෙහි ආදීනව
යෙක් නැතැයි යනාදීන්ගත් මිථ්‍යාදෘෂ්ටිය හා අමිශ්‍රවූ අතික්ෂෙනෙ
තූන් විසිත් උත්සාහයක් නැතිව සවභා තීක්ෂණවූ සිතින්ම කාම
සේවනාදිය කරණ කල උපදනා අසඞ්ඛාරිකවූ එක් අකුසල චිත්ත
යෙක; එසේම සෝමනස් සහගියාවූ මිථ්‍යාදෘෂ්ටිය හා අන්‍යොත්සාහ
සහිතවූ සිතින් කාමසේවනාදිය හෝ දුෂ්ටමඞ්ගලාදිය හෝ සාරයයි
ගන්නාකල උපදනා සසංඛාරිකවූ එක් අකුසල චිත්තයෙක; මධ්‍ය
ස්ථානුභව ලක්ෂණවූ උපෙක්ෂා වේදනාව හා එකොත්පාදදී භාවයට
ගියාවූවිපරිතමිථ්‍යාදෘෂ්ටියෙන් සම්ප්‍රයුක්තවූඑක්සසංඛාරික අකුසල
චිත්තයෙක;එසේමසසඞ්ඛාරිකවූඅකුසලචිත්තයෙක;උපෙක්ෂාසහගතවූ
විපරිත මිථ්‍යාදෘෂ්ටිය හා මිශ්‍රනොවූ අසංඛාරිකවූ එක්අකුසල චිත්ත
යෙක;ප්‍රතිඝයෙන් සම්ප්‍රයුක්තවූ දොසසහගතවූ අසඞ්ඛාරිකවූ අකුසල
චිත්තයෝ දෙදෙනාද; උපෙක්ෂා සහගියාවූ බුඩාදී අටතන්හි ඇද්ද
නැද්දෝහෝයි උපදනාසංසයලක්ෂණවූ විචිකිච්ඡාවෙන්සම්ප්‍රයුක්තවූ
එක් අකුසල චිත්තයෙක යන මොහ චිත්තයෝ දෙදෙනද; රූප
ශබ්දාදියෙහි සිත නොසන්සුන් බවයයි කියනලද උද්ධච්චය හා
එකොත්පාදදී ප්‍රකාරයෙන් යුක්තවූ එක්අකුසලචිත්තයෙක; මෙකී
දොළොස් අකුසලචිත්තයෝද-උපෙක්ෂා වෙදනාව හා එකොත්පාදදී
භාවයට ගියාවූ රූපදශීනයට කාරණවූ චක්ෂුප්‍රසාදය ආශ්‍රයකොට
පවත්නාවූ චක්ෂුර්විඥානයද; එසේම ශ්‍රොත්‍රවිඥානයද; ජිව්හා
විඥානයද; කාය විඥානයද; උපෙක්ෂා සහිතවූ රූපාදීන් උප
දනා සන්තීරණ චිත්තයද යන මේ අකුසලවිපාක චිත්තයෝ සදෙ
නද; උපෙක්ෂා සහගතවූ රූපසන්දර්ශනයට හේතුවූ චක්ෂුප්‍රසාදය
ආශ්‍රයකොට පවත්නා චක්ෂුර්විඥානයද; එසේම ශ්‍රොත්‍රවිඥාන
යද; ඝ්‍රාණවිඥානයද; කාය විඥානයද; උපෙක්ෂා සහගතවූ
රූපාදී අරමුණු පිළිගන්නා සම්පටිච්ඡන චිත්තයද; එසේම පිළිගත්
රූපශබ්දාදී අරමුණු විමසන්නාවූ සන්තීරණ චිත්තයයි කියනලද
කුසලවිපාක අහෙතුක මනොවිඥාන ධාතුවද; සෞම්මනශ්‍ය
සහගතවූ සැපවෙදනා ඇති සන්තීරණ චිත්තයද යන මේ සත්විධවූ
කුසලවිපාක අහෙතුක චිත්තයෝද; උපෙක්ෂාසහගතවූ මනොවාර
යට හමුවූ රූපාදී අරමුණට චිත්තසන්තතිය යොමුකරණ මනො
වාරාවර්ජන චිත්තයද; සෝමනස් සහගියාවූ මණොවාරික ආලම්බන

යෙහි රහතුන්ට සිනා උපදවන හසිතොත්පාද චිත්තයද යන මේ අහේතුක ක්‍රියා සිත් තුනද; යන මේ සමතිස් චිත්තයෝද; නිර්ලාානි ශංස දක්වන බැවින් හා සඤ්ජාත මානසික සුඛවේදනාවෙන් යුක්තහෙයින් සොමනස්ස සහගත බැවින් විශුද්ධ ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියන්ගේ මුහුකිරීමෙන් ඤාණය හා සම්ප්‍රයුක්තවූ අන්‍යයන්ගේ සිත් සාහයක් නැති ස්වකීය ස්වභාවවූ සිතින්ම දන සීලාදි පින්කරණකල උපදනා අසඞ්ඛාරිකවූ එක් කුශලචිත්තයෙක; සොමනස්ස සහගතවූ ඤාණසම්ප්‍රයුක්තවූ දන්දෙව පින්කරව යනාදි අන්‍යයන්ගේ උත්සාහයක් ඇති ස්වකීයවූ ස්වභ.වවූ සිතින්ම දන සීලාදි පින්කරණකල සසඞ්ඛාරිකවූ එක් කුශල චිත්තයෙක; දෙමව්පියන්ගේ පුණ්‍යක්‍රියා දශීණයෙහි සඤ්ජාත දර්ශණ පරිචය ඇති බාල දරුකයෝ සගුන් දුක සොම්නස් උපදවා වහා දිවගොස් අතතුවූ කිසිවක් දන්දෙත්ද එකල ඔවුන්ට සොම්නස් සහගතවූ ඤාණ විප්‍රයුක්තවූ අසඞ්ඛාරිකවූ එක් කුශල චිත්තයෙක් උපදනේය.

විශුද්ධ ශ්‍රද්ධාබුද්ධිසම්පන්න සත්පුරුෂ ජනයෝ තමන් දරුවන් ලංකාට පුතඬ අප බුදුන් සගුරුව වඳුව පුදව යනාදීන් උත්සාහිතව වඳිද්ද සතුටුව වඳිද්ද එකල ඔවුන්ට සොම්නස්සහගතවූ ඤාණවිප්‍රයුක්ත සසඞ්ඛාරිකවූ එක් කුශල චිත්තයෙක් උපදනේය; උපෙක්ෂාසහගතවූ ඤාණසම්ප්‍රයුක්තවූ අසඞ්ඛාරික සසඞ්ඛාරික කුසල චිත්තයෝ දෙදෙනෙක; උපෙක්ෂා සහගතවූ ඤාණවිප්‍රයුක්තවූ අසඞ්ඛාරික චිත්තයෝ දෙදෙනෙක; බලවත් ශ්‍රද්ධාවය විශුද්ධීන්ද්‍රියය දෘෂ්ටිය ආනිසංස දර්ශණය ප්‍රත්‍යය ප්‍රතිග්‍රාහකයා යන සොම්නස් උපදවීමට හේතුවූ මේ සතර අඞ්ගවිකල්පයෙහි සොම්නස් සහිතවූ සිත් ඇතිවෙද්ද එකල මේ සතර සිත උපෙක්ෂාසහගතව උපදනේය යන මේ කාමාවචර කුසල් සිත් අටද; "සොමනස්සසහගතං" යනාදීන් දක්වූකාමාවචර සහෙතුකකුසල් විපාකසිත් අටෙක; කාමාවචර සහෙතුක ක්‍රියා සිත් අටෙකැයි කියා කාමාවචර කුසල් සූවිස්සෙක;— විතක්කවිචාර ප්‍රීති සුඛෙකාග්‍රතා සහිත ප්‍රථමධ්‍යාන කුසල චිත්තයද; විචාරප්‍රීතිසුඛෙකාග්‍රතා සහිතවූ පඨමධ්‍යාන කුසල චිත්තයද; මෙසේ යථොක්ත ක්‍රමයෙන්ම විපාක සිත් පසලොසෙක; අරූපාවචර කුසල්සිත් සතලොසෙක් වෙයි, "සොතාපත්තිමග්ගචිත්තං" යනාදී දෙශනානුක්‍රමයෙන් මාර්ග සිත් සතරෙක; ඵලසිත් සතරෙකැයි ලොකොත්තර සිත් අටක්වේ

මෙකී එකුන් අනූවක් පමණ චිත්තයෝ විඤ්ඤාණස්කන්ධ නම් වේ. මෙකී පඤ්චස්කන්ධාදී සඞ්ඛයෝ ධර්මයෝ සියලුම සත්වයන් සංසාරයෙහි ලා අනන්ත සංසාර දුකට භාජන කරවාලූ බව විසඳුවූ සර්වඥතාඥාණයෙන් දුන ආදිත්‍ය බන්ධු ගොත්‍රවූ සර්වඥයන්වහන්සේ රූපස්කන්ධය ක්‍රමයෙන් නැඟ නැතිවන පෙණ පිඬකට බඳුවූ උපමා

වේදනාස්කන්ධය දියබුබුළකට බඳුවූ උපමා ඇත්තේය, සඤ්ඤාස්කන්ධය අව්වෙහි පෙණෙන මිරිඟු ජලයකට බඳුවූ උපමා ඇත්තේය; සංස්කාරස්කන්ධය කදලිස්කන්ධයකට බඳුවූ උපමා ඇත්තේය, විඤ්ඤාණස්කන්ධය මායාරූපයක් වැන්නේයයි කියා පඤ්චස්කන්ධයාගේ අනිත්‍යතාව ප්‍රකාශකරණ ලද්දේය –එයින් වදාළාහ.

"ඵෙනපිණ්ඩූපමං රූපං වේදනා බුබ්බුළූපමං
මරීචිකූපමා සඤ්ඤා සංඛාරා කදලූපමා
මායූපමාච විඤ්ඤාණං දෙසිතාදිච්ච බන්ධුනායි"

මෙසේ පඤ්චස්කන්ධ සංඛ්‍යාත ජීවිතෙන්ද්‍රිය ප්‍රතිබද්ධ සංස්කාරධර්මයන්ගේ අනිත්‍යතාව ප්‍රකාශකරවදාරමින් අනින්ද්‍රිය ප්‍රතිබද්ධ සංස්කාරධර්මයන් ප්‍රකාශකොට වදාරණසේක් "සිනෙරුභික්ඛවෙ" යනාදී පාඨය වදාළසේක.

"භික්ඛවෙ, මහණෙනි; සිනෙරුපබ්බතරාජා, මහමේරුපර්වතරාජතෙම; ආයාමෙන, දිගින්; චතුරාසීතියොජනසහස්සානි, සුවාසූදහසක් යොදුන; විත්ථාරෙන, පළලින්; චතුරාසීතියොජනසහස්සානි, සුවාසූදහසක් යොදුන; චතුරාසීතියොජනසහස්සානි, සුවාසූදහසක් යොදුන්; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; අජ්ඣොගාල්හො, ගැලීසිටියේය; චතුරාසීතියොජනසහස්සානි, සුවාසූදහසක් යොදුන්; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහිපටන්; අච්චුග්ගතො, (ශක්‍රභවනය දක්වා) ඉතා උස්ව සිටියේයි.

ඒ මහමෙර කොතනක පිහිටියේදයත් යට අජටාකාශයෙහි තුන්ලක්ෂ සැටදහසක් යොදුන් ඝනය ඇති වාතපොළොව පිහිටියේය, ඒ මත්තෙහි සාරලක්ෂ අසූදහසක් යොදුන් ජලපොළොව පිහිටියේය; ඊමත්තෙහි දියපිට තිබූ මහා විසාල මූඛ ඇති මහසැලක් සෙයින් සතිස්ලක්ෂ දශදහස් තුන්සියපණස්යොදුන් වට ඇති චක්‍රවාටපර්වතය හාත්පසින් දෙලාසූදහසක් යොදුන් උස්වපිහිටියේය; එහි ඇතුළත දෙලක්ෂ සතලිස්දහසක් යොදුන් ඝන මහපොළොව පිහිටියේය; එහි එක්සිය සතිස් මහනරක හා නාලොව පිහිටියේය; මහසමුද්‍ර හා ත්‍රිකූටපර්වත පිහිටියේය; ඊපිට මධ්‍යයෙහි මහත්වූ මිහිඟු බෙරයක් මෙන් එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් උසඇති මහමේරුපර්වතය පිහිටියේය; ඒ මහමෙර මුදුනේ දසදහසක් යොදුන් ශක්‍රභවන පිහිටියේය; මෙර යට දසදහසක් යොදුන් අසුරභවන පිහිටියේය. ඒ මහමෙරවටා යුගන්ධර පර්වතය දෙසාලිස්දහසක් යොදුන් මුහුදගැලී ඒතාක් උස්ව චාතුර්මහාරාජිකයදක්වා පිහිටියේය; ඊෂධර, කරවීක, සුදස්සන, නේමින්ධර, විනතක, අශ්වකර්ණ, යන සප්තවිධපර්වතයෝ අර්ධාර්ධප්‍රමාණයෙන් එකිනෙකට මිටිමිටිව පිහිටියේය; ඒ පර්වතවලඑ අනන්තරන්තරයෙහි සප්තමහාසීදන්තසාගර පිහිටියේය.

මහමෙරට එකාබඩව පන්දහසක් පන්දහසක් යොදුන් පලලහා ඝනය ඇති තාන ගරුඬ කුම්භාණ්ඩ යක්ෂගන්ධර්ව සැදී සක්දෙව්ඳුහට අරග්ගෙනසිටින, එනම්; ආලින්දසතරෙක් ඒ මතුමත්තෙහි මහමෙරවටා පිහිටියේය; මහමෙර පූර්වදික්පාර්ශ්වය රජතවර්ණය, දකුණුදික් පාර්ශ්වය ඉන්ද්‍රනීලමනිවර්ණය, පැලදික්පාර්ශ්වය ඵලිකවර්ණය, උතුරුදික්පාර්ශ්වය සුවර්ණමය—එයින් කීහ.

පාචීනපස්සං රජතං දක්ඛිනං ඉන්ද්‍රනීලකං
පච්ඡිමං ඵලිකංඑස්සං උත්තරා කච තාමයං'' සි

මෙසේ මහමෙර පිහිටි ත්‍රිකූටපර්වතය පටන් යට මහාපෘථිවිය ක්‍රමක්‍රමයෙන් උස්වෙමින් අවුත් හිමාලප්‍රදෙශයට හා සතරමහද්වීපයිනට කඩඉම් දක්වා උස්ව නැගී දෙදහසක් කොදෙව්තල සලකුන් දක්වා නැගී සක්වලගල දිසාවට ක්‍රමක්‍රමයෙන් මිරිවෙමින් ගොස් සමුද්‍රය අසූහාරදහසක් යොදුන් ගැඹුරුවිය; පුළුලින් අසංඛ්‍යාත පටන් සක්වලගලට තුන්ලක්ෂ එකොළොස්දහස් පන්සියසැත්තෑ යොදුන් ත්‍රිගාවුතප්‍රමාණවේ.—ඒ සත්මුහුදු වටකෙරෙමින් සිටි පර්වතමස්තකයෙහි ධෘතරාෂ්ට, විරූඪ විරූපාක්ෂ, වෛශ්‍රවණය යන සිව්වරම් රජුන්ගේ උද්‍යාන විමාන කල්පවෘක්ෂ පුෂ්කරණී දිව්‍යසභා මන්දිර මන්ඩපාදීන් හා අනන්ත සුර සුන්දර කනක රජත මානික්‍යප්‍රවාලාදී අනේකරත්න විමානපන්තීන් සමාකීර්ණවිය, යුගන්ධරපර්වතය පටන් සක්වලගල දක්වා හාත්පසින් මූළුඅහස පිහිටි අන්තරීක්ෂ විමනින් ගහණවිය

මහමෙර පටන් දෙලක්ෂ සතලිස්අටදහස් එකසිය පනස් යොදුන් ගාවුතප්‍රමානතැන් මහා අසංඛ්‍යාණ්ණයෙන් මෙපිටත කරදිය මුහුද පිහිටියේය; එහි ජලය අවිචිමහනරකාග්නියෙන් දුවි දුවී කාරපාකයට ගොස් ලවනය හා ජලය සමභාගවූ බැවින් සමුද්‍රනම් විය—මහබෝමැඩ පිහිටිතැන හැමට යට පිහිටි සියක් යොදුන් අවිචිනම් මහනරකයෙහි ගිනිගෙන දිලිසෙන තමයොදුන් බොල යකිත්තීන් වත්තිජාලා නිගීනව ඇතුළු නිරිසතුන් දවා පිටත සියක් යොදුන් තැන් පැතිර දිවෙයි; ඒ අවිචිමහනරකයට පිරිවර සතරදෙසින් සතර සතර බැගින් පිහිටි ඔසුපත් නරක සොළස හා අවිචිමහනරකය දසදහසක් යොදුනැයි කියත්—ඒ අවිචිමහනරකය මධ්‍යය පටන් දසනවදහස් සාරසියයක් ගවුගෙවා හැමට කෙලවර පිහිටියේය; ඒ ඔසුපත් නරකයෙහි මහදුක් අනුභවකරන අනන්ත නිරිසතුන්ගේ කම්බලයෙන් අවිචිනම් ඔසුපත් නරකයෙහි දොර නිරන්තරනිරන්තරයෙන් ඇරෙයි වැසෙයි ඇරුණු දොරින් මහ ගිනිකඳෙක් නිගීනව මාරාභිමුඛයෙහි නොයෙක් යොදුන්ගනන් යට මහසමුද්‍රජලය දක්වා කුහරකෙරෙයි; එකල මත්තෙහි සමුද්‍ර

ජලය ආවෘතාකාරයෙන් භ්‍රමනයවෙමින් අසනිපාතසහශ්‍ර ගර්ජනාසෙයින් භීතිජනකශබ්දයෙන් වාරුසිමූබව වැටෙයි, මත්තෙහි ගවු ගනන් මුහුදුජලය හාත්පසින් ඒ වළභාමුඛය කරා ඇදී ඇදී දීවෙයි; ඒ ජලයට පැමිණි නැව් විනාශවෙයි; සුප්පාරකනම් ශ්‍රීමහා බෝධිසත්වයන්වහන්සේ සත්සියයක් වෙළඳුන් හා සමග නැව්නැගී හොස් පත්සියයක් කොදෙව් ඉක්ම දුක්මුලාව සාරමාසයක් මුළුල්ලෙහි පරතෙරක් නැතිව මහමුහුද මුලාව හැසිරෙමින් සත්රුවන් මුහුද දක සත්රුවනින් නැව්පුරුගෙණ වළභාමුඛප්‍රාපතවූ ජලයට පැමිණි සත්සියසක් වෙළඳහු අවීචිමහනරකභයින් හඬන කල්හි—

"යතොසරාමි අත්තානං යතොපත්තොස්මි විඤ්ඤුතං
නාභිජානාමි සංචිච්ච එකපානම්පි හිංසිතං
එතෙනසච්චවජ්ජෙන බිප්පං නාවාතිවත්තතු,,

යනාදී සත්‍යක්‍රියාකළකල්හි සාරමසක් දුක්මුලාවූ ඒ සත්රුවන් නැව දඹදිවටගැරී සෘඩිමත්ව මහකෙලතෙ මුහුදුපිට දිවන්නාසේ එකදවසින් මහාභාරුකච්චපිතම පටුනට පැමිණ හොඩින් අටඹුස් බක් ගොස් මහබෝධිසත්වයන්ගේ සරවාරයෙහි පිහිටියේයි. තවද ඒ මහසමුද්‍රයෙහි දහසක් යොදුන් පන්සියයක් යොදුන්තැන් ජලය කැලඹී මහා රළකඩු දිවෙයි මහින්දකනම් රළෙක් සැටයොදුනක් තැන් නැගීවැටෙයි, ගංගානම් රළෙක් පනස් යොදුනක් තැන් නැගීවැටෙයි; රොගනම් රළෙක් සතලිස්යොදුනක් තැන් නැගී වැටෙයි, තවද වාතවේගයෙන් ජලය සච්නාගයෙන් මහා ප්‍රපාත කෙරෙමින් ජලය අහසට නැගී මහහඬින් වැටෙයි, එයින් ජලය උසසිතවෙමින් දිවගොස් චක්‍රවාටයෙහි වැද දශයොදුනක් අහසට නැගී වැටෙයි; එසේම අශ්වකර්ණපර්වතයෙහිදු වැදී දශයොදුනක් තැන් අහසට නැගී මහහඬින් වැටෙයි, එකල මුහුදු ගිගුම් දෙමින් සැටදහස් පන්සිය තුන්යොදුනකින් මොබ පිහිටි දඹදිව හා කොදෙව් වටකෙරෙමින් නොයෙක් සියගනන් ගවු ජලය ගිලීම නැගී දිවෙයි, ගේ වරගිළුම් ජලයයි කියත්.

තවද ඒ සමුද්‍රයෙහි අනගි විදුරු බහුලවූ ප්‍රදේශයෙහි මනුෂ්‍ය දෙහ වැනි ශරීර ඇති තියුනුකර ඉවගත් වැනි නාසාකුහර ඇති මත්ස්‍යයන්ගේ ගැලීම් ඉපිලීම් ඇති සමුද්‍රය ඛුරුමාලිනම්වෙයි; සවර්ණරශ්මින්ගෙන් බහුලබැවින් ජ්වලිත ගිනිකඳක්මෙන්ද මධ්‍යාහන හිරුමඬල මෙන්ද සවර්ණාභාස පැතිරෙණ සමුද්‍රය අග්නිමාලිනම් වෙයි; රජත රශ්මින්ගෙන් බහුල බැවින් ක්ෂීරයමෙන් දධිමෙන් සෙවනොභාස පැතිරෙණ සමුද්‍රය දධිමාලිනම්වෙයි; නීලමානික්‍ය රශ්මින්ගෙන් බහුල බැවින් කුසතනමෙන්ද, නීලසශ්‍යමෙන්ද; බබලන මුහුද කුසමාලිනම් වෙයි; වංශරාග වෛඩූර්ය බහුල බැවින්

හුනව්නය බට වනය මෙන් නීලොභාෂ පැතිරෙණ සමුද්‍රය නලමාලිනම් වෙයි; ප්‍රවාල රාසීන්ගෙන් බහුල බැවින් රක්තාභාෂ පැතිරෙණ ප්‍රවාල සාගරය ප්‍රවාල නලමාලිනම්වෙයි. — තවද මරකත කර්ජුර වෛරං ඉන්ද්‍රනීල මහනීල ජොතිරසගස්ඵටික පද්මරාග මුක්තාදී අනෙකවිධ රක්තනීලාදී රත්නාකූතයෙන් අලඞ්කෘතවූ මුහුදු වැද චක්‍රවර්ති නාදෙවෙන්ද්‍රයො තමන්ගේ චක්‍රරත්නානුභාවයෙන් මුහුද ජලය සතර ගවුතැන් ඉවත්කොට ජලඉවුරැ කෙරෙමින් සපිරිවරින් මුහුදු බැස සිත්සේ සත්රුවන් හැරගෙණ පෙරකළ කුසලඵල ගෙනයන්නාසේ අහසින් යෙත්. — මෙසේ නරෙන්ද්‍ර නාගෙන්ද්‍ර දෙවෙන්ද්‍රාදී ජීවිතෙන්ද්‍රිය ප්‍රතිබද්ධවූ සත්වලොකයාහට ප්‍රතිෂ්ඨාධාරවූ මහමෙරැ යුගන්ධර චක්‍රවාට හිමවත් පෘථිවි සමුද්‍රාදී විශාලවූ සඞ්ස්කාර වස්තූන් දක්වා වදාරමින් වර්ෂාවෙන් රැකී ජීවත්වන සත්වලෝකයන්ගේ හා වෘක්ෂලතාදීන්ගේ අනිත්‍යබව ප්‍රකාශකර වදාරණසේක් "හොතිඛො සො භික්ඛවෙ,, යනාදී පාඨය වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; බහූනිවස්සසතානි, බොහෝ හවුරුදු සියගණනක් මුළුල්ලෙහිදු; බහූනිවස්ස සහස්සානි, බොහෝ වර්ෂ දහස් ගණනක් මුළුල්ලෙහිදු; බහූනි වස්සසතසහස්සානි, බොහෝවූ වර්ෂ ශතසහශ්‍රයක් මුළුල්ලෙහිදු; දෙවො නවස්සති, වැසිනොවසීද; අයං මේ උක්තප්‍රකාරවූ; සො සමයො, එබදු විනාශකාලයෙක්; හොති ඛො, වන්නේමය; භික්ඛවෙ, මහණෙනි; දෙවෙඛොපන, වර්ෂාව වනෑගී; අවස්සන්තෙ, නොවස්නාකල්හි; ඔසධිං, (කසා ඉඟුරැ මිරිස් හරීටකාදී) ඖෂධජාතිහුද; වන, ආරණ්‍යයද; තිණ, තාල කුනතාල හින්තාල තල් පොල් ප්‍රමුඛ සැවන්ද්‍රාදි ත්‍රිණද, වනස්පතයො, නිග්‍රොධාස්වාත්‍ථාදී වනස්පතීහුද යන; යෙකෙචි, යම්කිසි; බීජගාමා, මූලබීජය ඛන්ධබීජය ඵලබීජය අග්‍රබීජය බිජ බීජයයි කියනලද පංච බීජ සඞ්ඛ්‍යාතවූ; භූතගාමා, ත්‍රිණවෘක්ෂලතාදීයෙක් ඇද්ද; තෙ, ඒ වෘක්ෂලතාදීහු; උස්සුස්සනති, මූලස්කන්ධ විටපාදිය සුස්කව වියළෙන්නාහුය; නභවනති, නැවත උත්පත්ති නොවන්නාහුය; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සඞ්ස්කාරයෝ; එවං, මෙපරිද්දෙන්; අනිච්චා; අනිත්‍යයහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා; සියලු සඞ්ස්කාරයො; එවං, මෙපරිද්දෙන්; අද්ධුවා, අස්ථිර බැවින් අධ්‍රැවහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, රූපස්කන්ධය වෙදනාස්කන්ධය සංඥාස්කන්ධය සංඛාරස්කන්ධය විඥානස්කන්ධය යන පචස්කන්ධාදි සර්ව්වසංස්කාර ධර්මයෝ; එවං, මෙපරිද්දෙන්; අනස්සාසිකා, අසාසවත බැවින් සුඛාස්වාද විරහිතය; භික්ඛවෙ, මහණෙනි, යාවඤ්චිදං, යම්තාක්; අනිත්‍ය කෙලවරකොට ඇති මේකාරණයද; සබ්බසංඛාරෙසු, සියලු

සඞ්ස්කාරයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුත්තෝමය; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, යුත්තෝමය; විමුච්චිතුං, මිදෙන්නට; අලං, යුත්තේසි.

මෙසේ ත්‍රිභුවනජන කර්ණාමෘත සම්භාර ධර්මදෙශනාවෙන් විපත්තිකර මහමේඝය පටන් සකල සත්ත්වවිනාශය දක්වා වදාළ සෙස්කාණ්ඩ ඒ විපත්තිකර මෙඝයනම් කල්පවිනාශසට අවුරුදු ලක්ෂයක් තිබියදී දෙවසන්නිපාතය කරවන ලොකබ්‍යුහනම් කාමාවචර දෙවතාවෝ රතුපිළිහැද හිසඋනා හිසකේ විදුගෙන හැඬුම්ගත් මුහුණු ඇතිව දෑතින් කඳුලු පිසිමින් ඉතා විරූප අවමඟුල් වෙස් ගෙන මිනිස්ලොවකරා අවුත් අහසසිට එම්බා පින්වත්නි, මෙයින් හවුරුදු ලක්ෂයක් ගියතැන කල්පය නස්නේය, මහාසමුද්‍රය වියලෙන්නේය, මේ මහපොළොවද මහමෙරද චක්‍රවාටයද ගින්නෙන් දවන්නේය, දෙව්ලොව හා බඹලොවත් නස්නේය, එහෙයින් පින්වත්නි මෛත්‍රීභාවනාකරව්, කරුණා මුදිතා උපෙක්ෂා භාවනාකරව්, මැනියන්ට උපස්ථානකරව්, පියානන්ට උපස්ථානකරව්, කුලදෙටු නැදිමයිලන්ට පුදව්, අප්‍රමාදව දානාදී කුසල් කරව් කියකියා හැවිදිති, ඒ අසා මනුෂ්‍යයෝ භයින් තැතිගෙන දෙවියන්ගේ ආසන්නයට රැස්ව දෑහොත් නගාගෙන ස්වාමීනි කල්පවිනාශය කෙසේ දත්තුද, තමන්ගේ ස්වයම්භූඥානයෙන් දැනකිවුද, ගුරූපදෙශයක් අසා කියවුද? එකල දෙවතාවෝ පින්වත්නි! බොහෝ කල්පස්ථායි දීර්ඝායුෂ්කබ්‍රහ්මරාජයන් විසින් අප එවනලදූයි කියමින් කෙලලක්ෂයක් සක්වල මෙසේ ඇවිදිති.

ඒකල මනුෂ්‍යයෝද භූමාටු දේවතාවෝද භයින් තැතිගෙණ ඔවුනොවුන් කෙරෙහි මුදුසිත් ඇතිව මෛත්‍රීභාවනාදී කුසල්කොට සදෙව්ලොව ඉපිද වායොකසිණ උපදවා ධ්‍යානලාභිව බඹලොව උපදිත් දෙවියන් කී හවුරුදු ලක්ෂය ඉකුත්වීමෙන් විපත්තිකර මහාමෙඝයනැගී කෙලලක්ෂයක් සක්වල එකපැහැර වර්ෂා කෙරෙති, එකල මනුෂ්‍යයෝ සතුටුව ක්ෂෙත්‍රාදියෙහි නොයෙක් ධාන්‍යාදිය වපුරති ගවයන් කාපියනපෙණ ගොයම්වූකල වැසිබිඳුවකුත් නොවැටී මේඝය අන්තර්ධානව නොයෙක් සියදහස් ලක්ෂගණන් හවුරුදු වැසි නොවසින්නේය, සියලු වනාන්තර වියලී සුසනවෙයි, මනුෂ්‍යයෝ ආහාර පැන් නොලැබ මහත් දුක්විඳ මිය දෙව්ලොව උපදිති, පුෂ්පඵලාදියෙන් ජීවත්වන දෙවතාවෝද, යක්ෂයෝද, ගරුඬයෝද, නාගයෝද, නොයෙක් වෙහෙස විඳිමින් මිය සදෙව්ලොව උපදිති, සතර අපායගත සත්ත්වයෝද මිය අපරාපරවේදනීය *

---

* ඉදිරිපසු ආත්මවල විඳයුතුවූ.

කුසලකර්මයන් කරණකොටගෙණ දෙව්ලොව ඉපිද සුධාභොජන අනුභවකොට සැපසේ වායොකසිනය වඩා ධ්‍යාන උපදවා බඹලොව උපදිති, කිසි පිනක් නොකල උන්හා බලවත් පවුකලාහු මිය පර සක්වල සතර අපායෙහි ඉපිද අනන්ත දුක් විඳිත්. මෙසේ හරිහර හිරණ්‍ය ගර්භප්‍රතිග්‍රතිකර සර්වසුරාසුරවර භෘඞ්ගාලිසේවිත පාදූරවින්ද වනෙදූප සොභිතවූ භාග්‍යවත් සර්වඥරාජොත්තමයානන්වහන්සේ සකල සත්ත්වවර්ගයා කෙරෙහි පතල මහාකරුණාවෙන් කල්පාන්තයෙහි වන සත්ත්වවිනාශය ගෙණහැර දක්වා සර්වසංස්කාර ප්‍රවෘත්තිය අනිත්‍යයයි දක්වමින් සකල සත්ත්වයන් කුසලධර්මයෙහි පිහිටුවා දෙවන සූර්යයෝද්ගමන පාඨය වදාළසේක

භික්ඛවෙ, මහණෙනි; දීඝස්ස අද්ධුනො අච්චයෙන, බොහෝ දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන්; කදාචිකරහචි, කිසියම් දවසෙක; දුතියොසුරියො, දෙවනසූර්යයතෙම; පාතුභවති, ප්‍රාදුර්භූතවේද; අයං, යථොක්තප්‍රකාරවූ; සො සමයො, ඒ විනාශකාලය; හොතිබෙ වත්නේමය; භික්ඛවෙ, මහණෙනි; දුතියස්සසුරියස්ස, දෙවනසූර්යයාගේ; පාතුභාවා, පහලවීමෙන්; යථා, යම්; එකුනනදීයො, එකොලොස්දහස් පන්සියපන්සැත්තෑවක් පුලුනංගාවොද; කුසුබ්භා, සුලුවූ හෙප්විල් පුෂ්කරණීහු; තා, ඒ නදීපුෂ්කරණීහු; උස්සුස්සන්ති, ජලය සිඳී වියලෙන් නාහුය; විසුස්සන්ති, සුදුවැලි නැගී වියලෙන් නාහුය; නභවන්ති, නැවත නොවන්නාහුය; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සංස්කාරයෝ; අනිච්චා, අනිත්‍යයහ; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සංස්කාරයෝ; අද්ධුවා, අද්ධ්‍රුවයහ; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සංස්කාරයෝ; අනස්සාසිකා; සුඛාස්වාද විරහිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්චිදං, විනාශය කෙලවර කොට ඇති මේ කාරණයද; සබ්බසංඛාරෙසු, සියලු සංස්කාරයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුක්තේමැයි; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, යුතුය; විමුච්චිතුං, මිදෙන්නට අලං යුක්තේයි. මෙසේ සර්වානර්ථපරිහාර පූර්වාගමනිරවශෙෂ හිත, සුඛප්‍රධාන තත්පරතිරතාසිසය ප්‍රයොගසම්පත්තියෙන්; දෙව්මිනිසුන් සහිත සමස්තසත්ත්වලොකයා සතනමින් "හොතිඛො සො භික්ඛවෙ" යනාදී පාඨය වදාළසේක

භික්ඛවෙ, මහණෙනි; දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන්; කදාචිකරහචි, කිසිකලෙක්හි; තතියො, සුරියො, තෘතීයසූර්යයෙක්; පාතුභවති, පහලවේද; අයං, මේ යථොක්තප්‍රකාරවූ; සො සමයො, ඒ විනාශකාලය; හොතිඛො, වත්නේමය; භික්ඛවෙ, මහණෙනි, තතියස්සසුරියස්ස, තෘතීයසූර්යයා

යාගේ; පාතුභාවා, ප්‍රාදුර්භූතවීමෙන්; යාකාචි, යම්කිසි; මහා නදියො, මහානදීහු කෙතෙක් ඇද්ද; සෙය්‍යථිදං, ඒ කවරහ; ගඞ්ගා, ගංගානම් ගඟය; යමුනා, යමුනාවය; අචිරවතී, අචිරවතීය; සරභූ, සරභූය; මහී, මහීය; යත මොච්හු; තා, ඒ පචමහා ගඟාවෝ; උසසුසසනති, වියළෙන්නාහුය; විසසුසසනති, විශෙෂයෙන් විය ළෙන්නාහුය; නභවනති, නැවත නොවන්නාහුය; ඒ පචමහා නදීහු කෙසේ සඹුතගත්‍යභදන වෙද්දයත්?

මහමෙර දකුණුභාගයෙහි දසදහසක් යොදුන් දඹදිව පිහිටි යේය; එයින් මනුෂ්‍යයන්ගේ අපුන්‍යතාවයෙන් සාරදහසක් යොදුන් සමුද්‍රගතවිය, තුන්දහසක් යොදුන් හිමවත් පර්වත පිහිටියේය, තුන්දහසක් යොදුන් මනුෂ්‍යවාසවිය, එයින් මනුෂ්‍යවාසවූ දඹදිව හා එකාබද්ධවූ හිමවත් පර්වත ක්‍රමක්‍රමයෙන් උස්උස්ව උසින් පන් සියයක් යොදුන්විය, ගන්ධමාදන කෛලාස චිත්‍රකූටාදී අනන්ත දෙව යක්‍ෂ නිවාසභූතවූ සුවාසූදහසක් පර්වතකූටයෙන් හා සිසිරනීප ධාරපූරිත පන්සියක් ගංගාවෙන් හා අනොතප්තාදි සත්මහසරින් සොභාමානවිය, ඒ අනොතප්තවිල දෙසියයක් දෙසියයක් ගවු දිග පුළුල ඇත්තේය, මානික්‍යමය මනොඥවූ පාගැටපනති ඇත්තේය, සොභාමානවූ ඵලිකම්මය නහනතොට ඇත්තේය, බුදුපසේබුදු රහතුන්වහන්සේ ඒ තොටින් පැන් නහනසේක, ඍද්ධිමත් සෘෂිහු දෙවියන් හා යක්‍ෂයෝද පැන් නහයෙති, ඒ විල සතරදෙසින් පිහිටී පර්වතසතරින්දෙසියයක්යොදුන් උසඇති සුවර්ණමය සුදර්ශනපර්වතය කාකමුඛවුඛාකාරයෙන් විලවසා සූර්‍ය්‍යතාපය වලකමින් සිටියේය, සර්වරත්නමය චිත්‍රකූටපර්වතයද අඤ්ජනවර්ණවූ කාලකූට පර්වතයද, රක්තවර්ණවූ ගන්ධමාදන පර්වතයද, ඒ ඒ දෙසින් සෙ හාමත්ව සිට ගතාමූලගන්ධාදී සර්වසුගන්ධයෙන් ගන්ධිතවූ ඒ ගන්ධමාදන පර්වතයෙහි බුද්ධප්‍රත්‍යෙකබුද්ධ මහාගතන්වහන්සේලා වැඩවසන නන්දමූලක නම්වූ සුවර්ණගුහාවෙක, මැණික්ගුහාවෙක, රජත ගුහාවෙකැයි අසුන් පැනවූ ගුහාත්‍රයෙක් විය, ඒ මැණික් ගුහාවාරයෙහි යොදුනක් පමණ උසඇති මඤ්ජුසකනම් වෘක්‍ෂයෙක් විය, ඒ වෘක්‍ෂයෙහි දියගොඩ ඇතිතාක් සියලු මල්පිපෙයි, පසේ බුදුන් වඩනා දවස ඒ රුක ඉදිරිපිට සර්වරත්නමය මඩපමාලයෙන් සෑදීයෙයි, එහි එක් වාතයෙක් හමදිමින් යෙයි, එක්වාතයෙක් සත්රුවන්වැලි සමකෙරෙයි, එක්වාතයෙක් අනොතප්තවිලින් පැන්ගෙනවුත් ඉසිමින් යෙයි, එක්වාතයෙක් සර්වසුගන්ධ වෘක්‍ෂලතාදීන්ගේ මල් ගෙනවුත් රුස්කොරෙමින් අතුරමින් සමකෙරෙයි, ප්‍රත්‍යෙකබුද්ධවරයෝ එහි පුෂ්පත ආසනයෙහි වැඩහිඳ ධ්‍යාන සමවදිත්

ඒ අනොතප්තවිලින් සතරදිගට සිංහමුඛය, අශ්වමුඛය, හස්තිමුඛය, වෘෂභමුඛයයි ගංගා ජලය නික්මෙන මුහුණු සතරෙක් විය,

පූර්වෝත්තර පශ්චිම දිගට ගිය ගංගා එකිනෙකට නොපැහැර තුන් යලක් අනොතප්තය පැදකුණුකොට පූර්වෝත්තර පශ්චිම දික්බලා ගොස් අමනුෂ්‍ය පථයට වැද එයින් සමුද්‍රගතවිය. මේ දකුණුදිගට නික්මුනුගංගාව අනොතප්තවිල තුන්යලක් ප්‍රදක්ෂිණකොට දකුණු දිගට හැරී මහගල්තලයක් මධ්‍යයෙන් සැටයොදුනක් තැන් සෘජුව ගොස් පර්වතයක වැදී අහසට නැගී ගව්වට මැණික්කදක්සේ සැට යොදුනක් තැන් අහසින් ගොස් තියග්ගලා නම් ගල්තලයෙහි වැදී සැරවේගයෙන් ගලබිඳගෙණ පනස්යොදුනක් තැන් ගොස් ඒ ගල් ඉවුරබිඳගෙණ මහගල්තලයක්පිටින් සැටයොදුනක්තැන් ගොසින් එයින් ඝනතර පර්වතයක් වැදී බිඳගෙණ සැටයොදුනන් තැන් උම ගින් ගොස් සරස්වසිටි විඤ්ඣනම් පර්වතය පැහැර හස්තාඞ්ගුලි පසක් මෙන් ජලධාරා පසක් බෙදී ගංගා යමුනා අචිරවතී සරභූ මහී යන නමින් ප්‍රසිද්ධව දඹදිව රාජධානි ජනපද සරහාගෙණ සමුද්‍රගතවූහ.

ඒ අනොතප්තවිල තුන්යලක් ප්‍රදක්ෂිණාකොට දකුණටහැරුණ තැන් දක්වා ආවෘතගංගා නම් විය; සැටයොදුනක් ගල්තලයපිටින් ගොස් පර්වතයටවැද අහසට නික්මුනුතැන් දක්වා කන්හගංගා නම් විය; අහසින් සැටයොදුනක් ගියතැන් ආකාශගංගා නම්විය; තියග්ගලනම් ගල්තලය ගැඹුරුකොට බිඳගෙණ පනස්යොදුනක් ගිය තැන තියග්ගලනම් පුෂ්කරණියවිය; පොකුණ ඉවුර බිඳගෙණ ගල් තලායෙහි සැටයොදුනක ගියතැන් බහල ගංගානම්විය; ඝණබහල පෘථිවිය බිඳගෙණ උමගින් සැටයොදුනක් ගියතැන් උම්මඟගංගා නම් විය; මෙසේ ආවෘතීනම් ගංගාව දකුණබලා ආතැන් පටන් එක්දහස් එකසිය සැටගවුවක් හිමවතයෙහි සෘජුව අවුත් විඤ්ඣ නම් පර්වතය පැහැර ජලධාරාපඤ්චව ගංගා යමුනා අචිරවතී සරභූ මහී යන නමින් ප්‍රසිද්ධවූහ; හිමවත පූර්වෝත්තර පශ්චිම මහ ගංගාත්‍රය හා මේ පඤ්චමහා ගංගාවෝ වියළී සුසකවන්නාහුය.

භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සංස්කාර ධර්මයෝ; එවං, මෙයා කාරයෙන්; අනිච්චා, අනිත්‍යයහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සංස්කාරයෙ: එවං, මෙයාකාරයෙන්; අද්ධුවා, අස්ථිරබැවින් අධ්‍රැව යහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සංස්කාරධර්මයො; එවං, මෙයා කාරයෙන්; අනස්සාසිකා, අස්වාද නැතිවන බැවින් සැපාස්වාද විර හිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්චිදං, යම්තාක් අනිත්‍ය කොළවර කොට ඇති මේ කාරණයද; සබ්බසංඛාරෙසු, සියලු සංස්කාරයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලං එව, යුක්තේමය; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, යුතුය; විමුච්චිතුං, මිදෙන්නට; අලං, යුක්තේමය. මෙසේ තෘතීයසූර්‍ය්‍යා උදකල්හි, එක් සූර්‍ය්‍යයෙක් උදාවෙයි, එක්සූර්‍ය්‍යයෙක්අස්තංගතවෙයි, එක්සූර්‍ය්‍යයෙක්නභොමධ්‍ය

ගතවෙයි, සතරමහ දිවයින අවිච්ඡින්නසූර්‍යතාපවෙයි, පළමු සූර්‍ය
විමානයෙහි හුන් සූර්‍යදිව්‍යපුත්‍රතෙම ග්‍රීෂ්මාභිතප්තව භයින් තැති
ගෙණ ධ්‍යානවඩා බ්‍රහ්මලෝකූපගතවෙයි, සප්තසූර්‍ය සූර්‍යමණ්ඩල
ප්‍රභාසවර්තරව අහසගැසීරෙයි, ශක්‍රසුයාමාදී සියලු දෙවියෝ වායො
කසින සමාපත්ති උපදවා ධ්‍යානයෙන් මිය බ්‍රහ්මලෝකූපගතවෙයි,
පරිත්තාභාදි මතුමත්තෙහි බඹලොව උපදිත්, මෙසේවන සකල
සත්වවිනාශය බුදුඇසින් දැක ත්‍රිභුවනෛකතිලක සකලඥෙයසාගර
පාරගතාශේෂ ගුණරත්නමඤ්ජුරායමානවූ භාග්‍යවත් සර්වඥරජෝ
ත්තමයාණන්වහන්සේ තෘතීය සූර්‍යොද්ගමණය වදරණසේක්
''හොතිබොසො භික්ඛවෙ'' යනාදී පාඨය වදාළසේක.

කදාචිකරහචි, කිසිකලෙක්හි; චතුත්ථොසුරියො, සතරවණසූර්‍ය
යෙක්; පාතුභවති, පහළවේද්ද; අයං, මේ යථොක්තවූ; සොසමයො,
ඒ විනාශකාලය; හොතිබො, වන්නේමය; භික්ඛවෙ, මහණෙනි;
චතුත්ථස්සසුරියස්ස, සතරවනසූර්‍යයාගේ; පාතුභාවා, පහළවීමෙන්;
යෙතමහාසරා, යම් ඒ මහවිල්නම් වෙද්ද; යතො, යම්හෙයකින්;
ඉමාමහානදියො, මේ මහානදීහු, සම්භවන්ති, පහලවෙද්ද; සෙය්‍ය
ථිදං, ඒ කවරේද; ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන මොහු;
තා, ඒ පඤ්චමහාසරින් වැටුනාවූ; ඒ සත්තමහා විල්හු; උස්සුස්සන්ති,
පතස් පතස් යොදුන් දිගපුළුල හැඹුරුඇති ජලයසිඳී වියලෙන්නා,
හුය; විසුස්සන්ති, ගින්නෙන් රත්කල බඳුන් සෙයින් උෂ්ණතැගී
වියලෙන්නාහුය; නභවන්ති, නැවත ප්‍රකෘති නොවන්නාහුය;
භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සංස්කාරයෝ; යට අවීචියෙහි පටන්
මහාබ්‍රහ්මනම් බඹලොවදක්වා ගැසීසිටි පඤ්චස්කන්ධ නිශ්‍රිතවූ සියලු
සත්වයෝ මරනින් මැකෙන්නාහ; එසේ හෙයින්; එවං, මෙයාකාර
යෙන්; අනිච්චා, අනිත්‍යයහ; භික්ඛවෙ, මහණෙනි; සංඛාරා, සංස්කා
රයෝ; එවං, මෙයාකාරයෙන්; අද්ධුවා, අස්ථිරයහ; භික්ඛවෙ, මහ
ණෙනි; සංඛාරා, සංස්කාරයො; එවං, මෙයාකාරයෙන්; අනස්සා
සිකා, සාතස්වාද විරහිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවචිදං, විනාස
කාලය කෙළවරකොටඇති මේ කාරණයද; සබ්බසංඛාරෙසු, සියලු
සංස්කාරයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව,
යුත්තේමය; විමුච්චිතුං, මිදෙන්නට; අලං, යුත්තේමය

ඒ සප්තමහවිල්නම් අනොතප්තවිලය, කණ්ණමුණ්ඩවිලය, රථ
කාරවිලය, ඡද්දන්තවිලය, කුනාලවිලය, සිංහප්‍රපාතවිලය, මන්දාකිනි
විලය, එයින් අනොතප්තවිල ආවෘත ගඞ්ගා දෙලොස් වලල්ලකින්
හා පර්වත සතරකින් සොභමානවිය, ඡද්දන්තනම්විල මධ්‍යයෙහි
දොළොස් යොදුනක්තැන් ආදර්ශතලයක්මෙන් ප්‍රසන්නොදකවිය, ඒ
දොළොස් යොදුන් ජලය සිසාරා සතරගවු පුළුලැති කල්හාරනම්

සුපුෂ්පිත කෙල්මැලිවනයෙක් පිහිටියේය. එසේම සතරගවු සතරගවු පුළුලැති නීලොත්පලවනය, රක්තොත්පලවනය, සේතොත්පලවනය, නෙළුම්වනය, සුදුනෙළුම්වනය, කුමුදුනාලවූ ඇඹුල වනය, මෙකී සියල්ලෙන් මිශ්‍රවූ මිශ්‍රකවනයයි ජලජපුෂ්ප අට වනයෙක් පිහිටියේය. ඊට අනතුරුව ඇතුන්ට පයින් යාහැකිතරම් ජලයෙහි එදතිස් ගවු පුළුලැති අටවනය සිසාරා සතරගවු පුළුලැති රත්හැල් වනයෙක් පිහිටියේය. මුළුමහත් දඹදිව වැසියෝ කරල් කපා ඇදපියාත් නිමාලිය නොහැකිවෙයි ඒ රත්හැල්වනය සිසාරා ජලය කෙලවර නීලවර්ණ රක්ත සේවත සුරභි සුගන්ධ මකරන්ද පූරිතකුසුම සමාකීර්ණවූ, සතරගවුපුළුලැති නොරගළුලාවද මරුත් මාලාදි කච්ඡුරකවනුක්තමාලාදී සුළුගස්වනයෙක් පිහිටියේය, ඉන් පිටත් සතරගවු සතරගවු පුළුලැති නානා කදලිවනයෙක් පිහිටියේය. ඊට අනතුරුවම සැලතාලි ප්‍රමාන ඵලඇති පණසාරැ මාතා වනය පිහිටියේය, මෙසේ ඉන් පිටත නාරගඵරඟ සත්තිරුම්බු පිළුකාදී නානා මධුර ඵලහරිත වනයාදී සුවිසිවනයෙක් හා සවර්ණ වර්ණ පර්වතයද ජීවුල් වනය හා අඹ මිශ්‍රක වනය පිහිටියේය, මේ හැමවනයන් වටකොරෙමින් හුනවනයෙක් පිහිටියේය, මෙසේ යථොක්තප්‍රකාරවූ සුවිසි වනයෙක් හා සවර්ණවර්ණ පර්වතාදී සප්තමහාපර්වතයකින් ඡද්දන්තවිල ශොභාමානවිය.

මන්දකිනීනම්විල මධ්‍යයෙහි පස්විසි යොදුනක් තැන් පමණ ආදර්ශතලයක් මෙන් ප්‍රසන්නොදකයවිය, ඉන් පිටත ඇතුන් ඤපාවනතාරම් ජලයෙහි දෙගවු පමණ පුළුලැති සුදුනෙළුම් වනයෙක් ඒ ජලය සිසාරා පිහිටියේය, එසේම දෙගවු පමණ පුළුලැති රත්නෙළුම් වනයෙක් ඒ ජලය සිසාරා පිහිටියේය, එසේම දෙගවු පමණ රක්තකුමුදුවනය, සේවතකුමුදුවනය, රත්තෝත්පලවනය, නීලොත්පලවනය, සේවතොත්පල වනයයි සත් වනයෙක් පිහිටියේය, එහි සරස දූවිත නෙළුම්දලී නගුලිස් ප්‍රමාණවෙයි, පුරුක් ගැට මහනෙරිමුබ ප්‍රමාණවෙයි. මල්කැකුළු මහසට ප්‍රමාණවෙයි, පිපුනුමල් රතසක් ප්‍රමාණවෙයි, වාතප්‍රහරණයෙන් සුවඳ මකරන්ද කෙසුරු නගා පියුම් පත්‍රයෙහි හෙලයි, එහි ජලබින්දුහිමෙන කැටි වෙයි, සූර්‍ය්‍යතාපයෙන් කැකෑරී ගින්නෙන් ඉදුන් යකඩ ගුලිමෙන් ශොභාමත්ව පොකුරුමීයයි දිව්‍යරසවත්ව තිබෙයි, හිමවත වසන උපොසථ ඡද්දන්ත නාගේන්ද්‍රයෝ ඒ පොකුරු මී ගෙණ පසේ බුදුන්ට පිළිගන්වත්, ඉර්ධිමත්හු ගෙණ වළඳත්, සිද්ධවිද්‍යාධරයෝ අහසින් ගෙණයෙත්. ඒ සත්වනය සිසාරා දෙගවු පුළුලැති උක් මල්සා කරල් ඇති සුවඳ රත්හැල් වනයෙක් පිහිටියේය, ඊපිටත දෙගවු පුළුලැති තිඹරු, සකවනය, කක්කාරිවනය, ලාබුවනය, කුම්බඩුවනය, ආදි වැල්වනය පිහිටියේය.

ඒ සුවිසි හවු පුළුලැති දෙළොස්වනය සිසාරා දෙගවු පුළුලැති පූගවෘක්ෂප්‍රමාණ මහළුක්වනයෙක් පිහිටියේය, හිමවත වසන හස්ති නාගේන්ද්‍රයෝ ඒ මහළුක්රැක් බිඳ ගල්පිට හෙලා පයින් මඩිති. එකල උක්පැනි සුවඳ ගල් පොකුණු පිහිටි ගල්වැසිලි පිරෙයි, ගේ සූර්‍ය්‍යතාපයෙන් වියලී ඛීරපාෂාණ පිඩු සෙයින් සුදුවණ් දිව්‍යරසවත්ව තිබෙයි, හස්ති නාගයෝ ඒ මධුර පිඩු ගෙණ පසේ බුදුවරයන්වහන්සේලාට පිළිගන්වත්. ඒ උක්වනය සිසාරා දෙගවු පුළුලැති කදලිවනයෙක් පිහිටියේය, ඒ කදලිවනය සිසාරා දෙගවු පුළුලැති ඌරුමාතාම්බු ජම්බු ජම්බිර ඒරඬ වරාඹල සන්නීර පූගමුද්දිකාදී කූතතාලතම් දේතුලාදී නානා මධුර ඵලහරිත වෘක්ෂලතා වනයෙන් පිහිටියේය, මෙසේ හෙයින් ඒ මනකිනිවිල සොභාමානවිය. ඒ හිමාල වන යෙහි මේ දඹදිවට සංකුණුවූ සියයක් යොදුන් උසඇති දඹ රුකෙක්විය, සතරදිගට ගිය අතුසතර හා අතුසතර සාඛාමණ්ඩලය වට තුන්සියයක් යොදුන්විය, අතුසතරින් හා රුකින් මහත් ගඞ්ගා නිති වැහෙයි, කල්පස්ථායුකවූ ඒ දඹරුක මාදියකල සං නිත්‍යාමෘත ඵලහරිතවෙයි, ඒ දඹ රුකින් වැහුනු ගඞ්ගාවෙහි දෙගං ඉවුර ගහබඩ වැටුනු ඵලබීජයෙන් සුවර්ණාංකුර නැගෙයි, ගේ සුවර්ණාංකුර ක්‍රමයෙන් ගඟින්ගොස් මුහුදුවෙරළට පැමිණ මාහැඟිවූ ජාම්බෝනද සුවර්ණයයි ලොක සම්මතවිය.

ඒ හිමවත්හි දෙළොස්හවු තැන් සියලු සතුන් තැතිගන්වමින් සිංහනාදකරණ සිංහයන්ගෙන් හා අහසින්යන ඡද්දන්ත උපෝසථ වලාහක අශ්වයන්ගෙන් හා මධුර නාදකරණ කරවික සතුන් ගිරා මයුර කිඳුරු නාරිලතාදීන්ගෙන් සොභාමන්විය, හැල්වන පියුම් වනාදියෙහි හැසිරෙණ සුවර්ණහංසාදීන්ගෙන් සමාකීර්ණවිය, මෙසේ හිමාල විස්තරය කියන්නේ බෙනෙව පොළොන්නරු පුර පරක්කම් බාහුනම්රජ හිමාල විස්තරය අසා මරණාසන්නයෙහි බුදුසසුන් වැඩි කුසලානුභාවයෙන් හිමාලයෙහි කල්පස්ථායුකව තරුද්ව නම් භූමාවූ දේවතාවෙක්ව ඉපිද එවුහු මෛත්‍රීබුදුන් දකින්නේමැයි.

මෙසේ සකලසත්ව මනෝහර දර්ශණ ශ්‍රී සොභාසමුපසොභිත වෘක්ෂ පර්වත ගඞ්ගා හැලි දෙළින් වැලිතලා ගල්තලා ලියම්ඩුළු ගල් ගුහා රුක්සෙවන මිණිගුහා රංගුහාදියෙන් හා නිත්‍යාමෘත ඵල හරිත නොයෙක් වනපන්තියෙන් සැදුම්ලත් අනොතප්ත ඡද්දන්ත මන්දකිනි රථකාර කර්ණමුණ්ඩ ශිංහප්‍රපාතය යන සප්තමහ විල්ම චතුර්මු සූර්‍ය්‍යෝද්ගමනයෙන් සුසකව වියළෙන්නාහුය. මෙසේ චතුර්මු සූර්‍ය්‍යෝද්ගමනය ගෙණහැර දක්වා සර්වසඞ්ඛාරයන්ගේ අනිත්‍යතාව ප්‍රකාශකොට සියලු සත්වයන් දානසීලාදී කුසල ධර්ම යෙහි යොදා පස්වන සූර්‍ය්‍යෝද්ගමනය දක්වා වදාරණසේක්; "හොතිසො සො භික්ඛවෙ" යනාදී පාඨය වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීර්ඝකාලයක් හුගේ ඇවෑමෙන්; කදාචි කරහචි, කිසිකලෙක්හි; පඤ්චමො සුරියො, පස්වන සූර්ය්‍යයෙක්; පාතුභවති, පහළවේද; අයං, මේ යථොක්ත ප්‍රකාරවූ; සො සමයො, ඒ විනාශකාලයතෙම; හොතිබො, වන්නේමය; භික්ඛවෙ, මහණෙනි; පඤ්චමස්සසුරියස්ස, පස්වැනි සූර්ය්‍යයාගේ; පාතුභාවා, පහළවීමෙන්; යොජනසතිකානිපි, සියක්යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති ඌනත්වයටයෙති; ද්වියොජනසතිකානිපි, දෙසියයක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; තියොජන සතිකානිපි, තුන්සියයක් යොදුනුදු; මහා සමුද්දෙ, මහා සමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; චතුයොජනසතිකානිපි, සාරසියයක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; පඤ්චයොජන සතිකානිපි, පන්සියයක් යොදුනුදු; මහා සමුද්දෙ, මහා සමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; ඡයොජනසතිකානිපි, සසියයක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; ඡයොජනසතිකානිපි, සසියයක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; සත්තයොජනසතිකානිපි, සත්සියයක් යොදුන්; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; අට්ඨයොජන සතිකානිපි, අටසියයක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; නවයොජනසතිකානිපි, නවසියයක් යොදුනුදු: මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; සහස්සයොජනිකානිපි, දහසක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; හෙවත් ක්ෂීරසාගරය, නීලසාගරය, රක්තසාගරය, ස්වර්ණසාගරයයි කියා මහමෙර සතර දෙසින් ඒ ඒ වර්ණගණසිටි සමුද්‍රජලයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යන්නාහුය; දසසහස්සයොජනිකානිපි, දසදහසක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලය; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; විසති සහස්සයොජනිකානිපි, විසිදහසක් යොදුනුදු; තිංසති, සහස්සයොජනිකානිපි, තිස්දහස් යොදුනුදු චත්තාලිස සහස්සයොජනිකානිපි, සලිස්දහසක් යොදුනුදු; පඤ්ඤාසසහස්ස යොජනිකානිපි, පනස්දහසක් යොදුනුදු; සට්ඨිසහස්ස යොජනිකානිපි, සැටදහසක් යොදුනුදු; සත්තතිසහස්ස යොජනිකානිපි, සත්තෑදහසක් යොදුනදු: අසීතිසහස්සයොජනිකානිපි, අසූදහසක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකානි, ජලස්කන්ධයෝ; ඔගච්ඡන්ති, ඌනත්වයට යෙති; චතුසහස්සයොජනිකං, සාරදහසක් යොදුනුදු;

මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකං, සිඳී ඉතිරිවූ ජලය; සංඨාති,
සිටිනේය; තිසහස්සයොජනිකම්පි, තුන්දහසක් යොදුනුදු; ද්විසහ
ස්සයොජනිකම්පි, දෙදහසක් යොදුනුදු; සහස්සයොජනිකම්පි, දහ
සක් යොදුනුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකං, රත්වූ ජලය;
සණ්ඨාති, සිටිනේය; නවසතයොජනිකම්පි, නවසියයක් යොදු
නුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකං, උදකය; සණ්ඨාති, සිටි
නේය; පඤ්ඤාසයොජනිකම්පි, පනස්යොදුනක් පමණද; සත්තතා
ලම්පි, සත්තලක් පමණද; (තලෙක්නම් අසූරියන් තල්රුකෙක්
ප්‍රමාණය කියත්. එසේම) ඡතාලම්පි, සතලයකුදු; පචතාලම්පි, පස්
තලයකුදු; චතුතාලම්පි, සතරතලයකුදු; තිතාලම්පි, තුන්තලය
කුදු; ද්විතාලම්පි, දෙතලයකුදු; තාලමත්තම්පි, එක්තලයක් ප්‍රමා
ණද; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකං, මහමෙර සිසාරා සිටිය
සත්තමහාසාගර ජලය හා අශ්වකර්ණ පර්වතය පටන් සත්ස්ලක්ෂ
දසදහස් තුන්සිය පනස් යොදුන් චක්‍රවාට පර්වතය හාත්පසින්
ඇතුළත පැහැර සුවාසූ දහසක් යොදුන් ගැඹුරුව සිටි අහෝ මහා
සමුද්‍රජලය ක්‍රමයෙන් සිඳී සාරුවූ තාලවෘක්ෂ ප්‍රමාණවූ උදකය; සණ්
ඨාති; සිටිනේය; සත්තපොරිසම්පි, සප්තපොරිස ප්‍රමාණවද; මහා
සමුද්දෙ, මහාසමුද්‍රයෙහි ජලය; සංඨාති, සිටිනේය; (පෝරිසයෙක්
නම් පස්රියනක් හෝ නැගිඅතක් උසයයි කියත්. එසේම) ඡපොරි
සම්පි, සපොරිසයෙක්ද; පඤ්චපොරිසම්පි, පචපොරිසයෙක්ද; චතු
පොරිසම්පි, සතර පොරිස ප්‍රමාණවද; තිපොරිසම්පි, පොරිසත්‍ර
යෙක්ද; ද්විපො රිසම්පි පොරිසවයෙක්ද; පොරිසම්පි, පුරුෂප්‍රමාණ
වද; අඩ්ඪපොරිසම්පි, අර්ධපුරුෂ ප්‍රමාණවද; කටිමත්තම්පි, කටිප්‍රමා
ණවද; ජන්නුකමත්තම්පි, දනක් පමණද; ගොප්පකමත්තම්පි,
ගොප්මසමාත්‍රවද; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකං, ජලය; සණ්
ඨාති, සිටිනේය; භික්ඛවෙ, මහණෙනි; සෙය්‍යථාපි, යම්සේ; සර
දසමයෙ, බිතර වප් යන සරදසමයෙහි; ථුල්ලඵුසිතකෙ, මහත්
මහත් වැසිපොද වැදගැනීම් ඇති; දෙවෙවස්සන්තෙ, වැසිවස්නා
කල්හි; තත්‍ථ තත්‍ථ, ඒ ඒ තන්හි; ගොපදෙසු, ගවකුරවල්හි; උද
කානිඨිතානි හොන්ති, ජලයෝ පිරීසිටිනාහු වෙද්ද; භික්ඛවෙ, මහ
ණෙනි; පඤ්චමස්සසුරියස්ස, පස්වන සූර්‍ය්‍යයාගේ; පාතුභාවා, පහළ
වීමෙන්; අංගුලිපබ්බතෙමනමත්තම්පි, ඇඟිලිපුරුක් ගලා තෙමන
මාත්‍රයකුදු; මහාසමුද්දෙ, මහාසමුද්‍රයෙහි; උදකං නහොති, ජල
නැතිවන්නේය; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙසේ; සංඛාරා, ඉන්ද්‍රි
යානිද්‍රිය ප්‍රතිබද්ධසර්වසංස්කාරයෝ; අනිච්චා, අනිත්‍යයහ; භික්ඛවෙ,
මහණෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සර්වසංස්කාරයෝ,
අද්ධුවා, අස්ථිරබැවින් අවයහ; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයා
කාරයෙන්; සංඛාරා, සර්වසංස්කාරයෝ; අනස්සාසිකා, ආසසවාද

බැවින් සුඛාසවාදවිරහිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්චිදං, යම්තාක් අනිත්‍යකෙළවරකොට ඇති මේකාරණයද; සබ්බසංඛාරෙසු, සියලු සංස්කාරයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලං එව, යුත්තේමය; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, සුදුසු වන්නේය; විමුච්චිතුං, වස්තුකාමක්ලෙශකාමයෙන් මිදෙන්නට; අලං, සුදුසු වන්නේමය.

මෙසේ සර්වාකාරවරණකෙසරිඥායමානවූ සර්වඥරාජොත්තමයාණන්වහන්සේ පස්වැනිවූ සූර්යොද්ගමනයෙන් ලෙකවිනාශ කාරණය ගෙණහැරදක්වා අසූසාරදහසක් යොදුන් ගැඹුරුවූ මුහුදු සූහරය දක්වමින් අනිත්‍යප්‍රකාශකොට සවන සූර්යොද්ගමනය ගෙණ හැර දක්වනසේක් "හොතිඛො සො භික්ඛවෙ" යනාදී පාඨය වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීර්ඝකාලයක්හුගේ අවෑමෙන්; කදාචිකරහචි, කිසිකලෙක්හි; ඡට්ඨො සුරියො, සවන සූර්යයෙක්; පාතුභවති, පහළවේද; අයං, මේ යථොක්ත ප්‍රකාරවූ සොසමයො, ඒ විනාශකාලය තෙම; හොතිඛො, වන්නේමය; භික්ඛවෙ, මහණෙනි; ඡට්ඨස්ස සුරියස්ස, සවන සූර්යයාගේ; පාතුභාවා, පහළවීමෙන්; අයංච මහාපඨවි, මේ මහා පෘථිවියද; සිනෙරුපබ්බතරාජා, සිනෙරු පර්වතරාජයාද යන දෙදෙන; ධූපායන්ති, නෙමේ දුම් නැගෙයි; සන්ධූපායන්ති, හාත්පසින් දුම් නැගෙති; සම්පධූපායන්ති, එකම ධූමස්කන්ධයක්මෙන් විශෙෂයෙන් දුම් නැගෙති; භික්ඛවෙ, මහණෙනි; සෙය්‍යථාපි, යම්සේ; ආලිම්පිතො, ගිණිදල්වන ලද්දාවූ; කුම්භකාරපාකො, කුඹල්පාකය හෙවත් කුම්භකාරයන්ගේ වළන් පච්චලය; පඨම පඨමං, ප්‍රථම ප්‍රථමව; ධූමෙති, දුම්නැගේද; සන්ධූමෙති, හාත්පස දුම්නැගේද; සම්පධූමෙති, එකම ධූමජ්වාලයක්මෙන්; විශෙෂයෙන් දුම්නැගේද; භික්ඛවෙ, මහණෙනි; එවමෙවඛො, එපරිද්දෙන්ම; ඡට්ඨස්සසුරියස්ස, සවන සූර්යයාගේ; පාතුභාවා, පහළවීමෙන්; අයංච මහාපඨවි, යම්සක්වළ ගල පවත් මේ මහා පෘථිවියද; සිනෙරුපබ්බතරාජා, ශක්‍රභවනය දක්වා මහමෙරු පර්වත රාජයාද; ධූපායන්ති, උෂ්ණාභිතප්තව කකියා දුම්නැගෙති; සන්ධූපායන්ති, හාත්පසින් දුම්නැගෙති; සම්පධූපායන්ති, එකම ධූමජ්වාලාවක්මෙන් විශෙෂයෙන් දුම් නැගෙති; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සංස්කාරයෝ; අද්ධුවා, අද්ධුවයහ; භික්ඛවෙ, මහණෙනි; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, සංස්කාරයෝ; අනස්සාසිකා, අනාශ්වාද බැවින් සුඛාස්වාද විරහිතයහ; භික්ඛවෙ, මහණෙනි; යාවඤ්චිදං, යම්තාක් අනිත්‍ය කෙළවරකොට ඇති මේ කාරණයද; සබ්බසංඛාරෙසු, සර්වසංස්කාරයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කල

කිරෙන්නට; අලංඑව, යුත්තමේව; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, යුතුය; විමුච්චිතුං, සර්‍වසංස්කාරයන් කෙරෙන් මිදෙන්නට; අලං, යුත්තමේවයයි මෙසේ බුද්ධවනාශ්‍රවක්ෂයකර නිඥ්‍යාන්තරාය කර ධර්මයන නෛර්‍යාණික ප්‍රතිපත්තිය යන චතුර්වෛශාරද්‍යඥානයෙහි විශාරදව පවත්නාවූ ඥානගති ඇති සර්‍වඥරාජෝත්තමයාණන් වහන්සේ සවන සූර්‍ය්‍යෝද්ගමනය ගෙණහැරදක්වා අනිත්‍යය ප්‍රකාශකොට සත්වන සූර්‍ය්‍යෝද්ගමනය දක්වා වදාරණසේක් "හොතිබො සො භික්ඛවෙ" යනාදී පාඨය වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; දීඝස්ස අද්ධුනො අච්චයෙන, දීර්ඝකාල යක්හුගේ ඇවෑමෙන්; කදාචිකරහචි, කිසිකලෙක්හි; සත්තමො සූරියො, සත්වන සූර්‍ය්‍යයෙක්; පාතුභවති, පහළවේද; අයං, මේ යථොක්ත ප්‍රකාරවූ; සො සමයො, ඒ විනාශකාලයතෙම; හොති බො, වන්නේමය; භික්ඛවෙ, මහණෙනි; සත්තමස්ස සූරියස්ස, සත්වන සූර්‍ය්‍යයාගේ; පාතුභාවා, පහළවීමෙන්; අයඤ්ච මහාපඨවි, මේ මහා පෘථිවියද; සිනෙරුපබ්බතරාජා, මහාමේරු පර්‍වතරාජයාද; ආදිප්පන්ති, ගිනිවැදගෙණ ඇවිලෙන්නාහුය; පජ්ජලන්ති, හාත්පසින් ගිනිගෙන ඇවිලෙන්නාහුය; එකජාලී භවන්ති, එකම වෑති ජ්වාලයක්මෙන් වන්නාහුය; භික්ඛවෙ, මහණෙනි; ඣායමානානං, ගින්නෙන් දවනලද්දාහු; ඩය්හමානානං, ගිනිගෙණ ඇවිලෙන ලද්දාවූ; විනස්සමානානං, එසේම විනාශවන ලද්දාවූ; ඉමිස්සාච මහාපඨවියා, මේ මහා පෘථිවියගේද; සිනෙරුස්සච පබ්බතරාජස්ස, මහමෙරු පර්‍වතරාජයාගේද; වාතෙන ඛිත්තො, භීතිජනක ප්‍රචණ්ඩ වාතයෙන් නගනලද්දාවූ; අග්ගි, වෑතිහු; යාවබ්‍රහ්මලොකාපි, යම්තාක් බ්‍රහ්මලොකයද; (ඒතාක් දක්වාම) ගච්ඡන්ති, යන්නාහුය; භික්ඛවෙ, මහණෙනි; ඣායමානස්ස, ගින්නෙන් දවනලද්දාවූ; ඩය්හමානස්ස විනස්සමානස්ස, එසේම විනාශවන්නාහුය; මහතා තෙජක්ඛන්ධෙන අභිභූතස්ස, මහත්වූ වෑතිස්කන්ධයෙන් මඩනා ලද්දාවූ; සිනෙරුස්ස පබ්බතරාජස්ස, මහමෙරු පර්‍වත රාජයාගේ; යොජනසතිකානිපි කූටානි, ඉපිල වැටෙන්නාවූ සියක් යොදුන් පමණවූ ගල්කුළු; පලුජ්ජන්ති, මහමෙරින් සිඳිසිඳී වැටෙමින් අහස්හිම ගින්නෙන්ද සුනුවිසුනු වන්නාහුය; ද්වියොජනසතිකානිපි, දෙසියයක් යොදුන් පමණවූද; කූටානි, මෙරින් ඉපිල වැටෙන ගල්කුළු සිඳී වැටෙමින් අහස්හිම විනාශවන්නාහුය; තියොජනසතිකානිපි, තුන්සියයක් යොදුන් පමණවූද; කූටානි, ගල්කුළු සිඳීවැටෙමින් නස්නේය; චතු යොජනසතිකානිපි, සාරසියක් යොදුන් පමණවූද; කූටානි; ගල්කුළු සිඳීවැටෙමින් විනාශවන්නාහුය; පඤ්චයොජනසතිකානිපි කූටානි, පන්සියයක් යොදුන් පමණවූ ගල්කුළු හෙවත් ප්‍රජ්වලිත ගින්නෙන් දන මහමෙර පිපිර සරසව දුවන පත්

සියයක් යොදුන් පමණවූ ගල්කුළු, පළුජ්ජන්ති, සිඳිවැටෙමින් අහස්හිම ගින්නෙන්ද සුනුවිසුනු වන්නාහුය; භික්ඛවෙ, මහනෙති; ඣායමානානං, ගින්නෙන් දැවෙනලද්දවූ; ඛයනමානානං, එසේම දනලද්දවූ; විනස්සමානානං, විනාශවනලද්දවූ; ඉමිස්සාච මහා පඨවියා, මේ මහා පෘථිවියගේද; සිනෙරුස්සච පබ්බතරාජස්ස, මහා මෙරු පර්වතරාජයාගේද; ඡාරිකා, හළු; නෙවපඤ්ඤායති, නොම දක්නාලැබෙයි; නමසි, දූලි හෝ අඟුරුද දක්නා නොලැබෙයි; භික්ඛවෙ, මහනෙති; සෙය්‍යථාපි, යම්සේ; ඣායමානස්ස, ගින්නෙන් දැවෙනලද්දවූ; ඛයනමානස්ස, ගින්නෙන් දැවෙනලද්දවූ හෝ; සප්පිස්සවා, ඝෘතයාගේ හෝ; තෙලස්සවා, තිලතෙලයාගේ හෝ; නෙවඡාරිකාපඤ්ඤායති, හළු නොමදක්නාලැබේද; නමසි, දූලි හෝ අඟුරු නොමදක්නාලැබේද; භික්ඛවෙ, මහනෙති; එවමෙව ඛො, එපරිද්දෙන්ම; ඣායමානානං, ගින්නෙන් දවනලද්දවූ හෝ; ඛයනමානානං, ගින්නෙන් දවනලද්දවූ; විනස්සමානානං' විනාශවනලද්දවූ; ඉමිස්සාච මහාපඨවියා, මේ මහාපෘථිවියගේද; සිනෙරුස්සච පබ්බතරාජස්ස, මහමෙරු පර්වතරාජයාගේද; ඡාරිකා, හළු; නෙවපඤ්ඤායති, නොමදක්නාලැබෙයි; නමසි, දූලි හෝ අඟුරු දක්නානොලැබෙයි; භික්ඛවෙ, මහනෙති; එවං, මෙයාකාර යෙන්; සංඛාරා, උපාදින්නකානුපාදින්නක සියලූ සංස්කාර ධර්මයෝ; අද්ධුවා, අස්ථිරබැවින් අධ්‍රැවයහ; භික්ඛවෙ, මහනෙති; එවං, මෙයාකාරයෙන්; සංඛාරා, උපාදින්නකාදී සියලු සංස්කාර ප්‍රවෘත්තිධර්මයෝ; අනස්සාසිකා, අනාස්වාද බැවින් සුඛාස්වාද විර හිතයහ; භික්ඛවෙ, මහනෙති; යාවඤ්චිදං, යම්තාක් අනිත්‍ය කෙළවර කොට ඇති මේ කාරණයද සබ්බසංඛාරෙසු, ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධවූ සියලු සංස්කාරධර්මයන් කෙරෙහි; නිබ්බින්දිතුං, කලකිරෙන්නට; අලංඑව, යුත්තේමය; විරජ්ජිතුං, නොඇලෙන්නට; අලං, යුතුය; විමුච්චිතුං, මිදෙන්නට; අලං යුත්තේමය.

මෙසේ චක්‍රවාටපර්වතය හා මහාපෘථිවිය හා මහමේරු යුගන්ධර ඊෂාධරාදීන් හා චාතුර්මහාරාජිකාදී සදෙව්ලොව හා බ්‍රහ්මපාරිසද්‍ය බ්‍රහ්මපුරෝහිතය මහාබ්‍රහ්මය යන තුන් බඹතලය දක්වා චක්‍රවාට පර්වත පටන් මුළුසක්වල සත්හිරුනැගී නොයෙක්වා දහස්ලක්ෂ කොටිගණන් හවුරුදු මුලුල්ලෙහි සප්තසූර්‍ය්‍යප්‍රභාවයෙන් වියලී ධූමාකූල වෙමින් ගිණිගෙන ඇවිලෙමින් දිලියෙමින් ගුගුරමින් පිපි රෙමින් අසනිපාත කොටිසතසහස්‍ර ගර්ජනාසෙයින් සමස්තලොකය භීතිජනක ශබ්දකෙරෙමින් විසිඅන්තඃකල්පයක් හවුරුදුගණන් අඩු නොකොට අනන්ත දීර්ඝකාලයක් මුළුල්ලෙහි තෙජොසංවර්තයෙන් ලොකය නැසී බඹලොව දක්වා ගිගුම් දෙමින් ගැවුලුනු ගිනි නිවී ගිතෙල් දැහිය තැන්හි හලුනැතුවාසේ ඒතාක් මුළුලොවත් දහොස්

දූහීල්ලෙන් ගසුකොට ගන්නාතරම් හළු හෝ දූලී හෝ අඟුරු හෝ නැතිව යට අජටාකාශයෙහි පටන් මතුතෙන් පරිත්තාභ නම් බඹලොව දක්වා එකඝුහරව ඝණාන්ධකාර දක්වා සිටිනේය.

එකල යට අවීචියෙහි පටන් මහා බ්‍රහ්මනම් බඹලොව ඇතුළත් කොට හැසිරුණු සියලු දිව්‍ය බ්‍රහ්ම වසවර්ති මනුෂ්‍ය තිරශ්චීන ක්ෂුද්‍රසත්ත්ව නිශ්ශාන්තනාශට සකල සත්ත්වයෝ මරනින් මැකී අදෘශ්‍යණයට ගොස් කෙළලක්ෂයක් සක්වල සත්ත්වසුන්‍යව ඝණාන්ධකාරය පැතිර පවත්නේය.

"කොටිසත සහස්සානං චක්කවාලං විලීයති
තෙජොධාතුප්පකොපෙන යදාලොකො විනස්සති"

මෙසේම උදකයෙන් කල්පයක් නස්නා කල්හි යටකී ක්‍රමයෙන් කල්පවිනාශයට හවුරුදු ලක්ෂයක්.තිබියදී ලෝකබ්‍යුහනම් කාමාවචර දේවතාවෝ කල්පවිනාශය කෙළලක්ෂයක් සක්වලට කියා හැඬිති; එතැන්පටන් හවුරුදු ලක්ෂයක් ගෙවීමෙන් කල්පවිනාශකර මහමේඝයනැගී කෙළලක්ෂයක් සක්වල එකපැහැර වර්ෂාකෙරෙමින් අනන්තඕනාවෙයි, එතැන්පටන් වැසිනැතුව ලොව නසිමින් ක්‍රමයෙන් අනන්ත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් කල්පවිනාසක ක්ෂාරොදකනම් මහ මෙඝයක්නැගී පළමුකොට සියුම් සියුම්ලෙස වසිමින් ක්‍රමයෙන්වැඩී ඇඹුල්දඹු ඝීදඹු පුවක්තුරු තල්ගස් පමණ ධාරොකද වැසිපොද වසිමින් රාජධානිජනපද සැරසරිත් සාගර මේරුයුගන්ධර හිමවත් පෘථිවි චක්‍රවාටපර්ත දෙව්ලොව බඹලොව දියවගොස් ආදශීනයටයෙහි විනාස කෙරෙයි, වැසිපොද වැකුනු වැකුනු වෘක්ෂපර්ත දියවයෙයි, කෙළලක්ෂයක් සක්වල මහවාතයෙක් රැකජලය පැතිරියානොදෙයි, දියෙහි බහාළු ලූනුකැට සෙයින් ඛාරොදකයෙන් යටවූ පෘථිවි පර්වත චක්‍රවාට දෙව්ලොව බඹලොව දියවගොස් ආදශීනයට යෙයි, මිනිස්ලොවට සැත්තෑ අටලක්ෂ අසූ දහස්සසියයක් යොදුන් මත්තෙහි පිහිටි සවන ආභස්සරනම් බඹලොව දක්වා හැම විනාශවූකල ඛාරොදකය වහා අන්තර්ධානවෙමින් යට අජටාකාශයෙහි පටන් මතුතෙන් පරිත්තසුභනම් බඹලොව දක්වා සිසව ඝනාන්ධකාරව සිටින්නේය; එකල යට අවීචියෙහි පටන් මතුතෙන් මහාබ්‍රහ්මනම් බඹලොව ඇතුලත්කොට හැසුරුණු සියලු දිව්‍ය බ්‍රහ්මාදි සකලසත්ත්වයෝම මරණින්මැකී අදෘශ්‍යයටගොස් කෙළලක්ෂයක් සක්වල සත්ත්වසුන්‍යව සිසව ඝණාන්ධකාර පැතිර පවත්නේය; ආපෝසංවර්තය නම් වේ...එයින් කීහ,

"කොටිසතසහස්සානං චක්කවාලං විලීයති
කුපිතෙන යදාලොකො සලිලෙන විනස්සති"

වාතයෙන් කල්පය නස්නාකල්හි යථොක්ත ක්‍රමයෙන් විපත්ති කර මහමේඝය පටන් අනේකවර්ෂශතසහස්‍රයක්හුගේ ඇවෑමෙන් කල්පවිනාශක මහා වාතයෙක් නැගී පළමු පටන් ක්‍රමක්‍රමයෙන් සියුම් රජස් මහා රජස් සියුම්වැලි මහවැලි බොරළු වැලිකැට ගල් මහගල් පර්වත වෘක්ෂ උපුටා අහස නඟා බිම නොහෙළා අඹරවමින් සමස්තලෝකය භීතිජනක ශබ්දඝෝෂයෙන් සඝට්ටණයෙන් සුනු විසුනුකොට අදර්ශනයට පමුණුවයි. යට මහා පෘථිවියෙන් ප්‍රචණ්ඩ වාතය නැගී සියයක් යොදුන් සාරසියයක් යොදුන් පමණ මහා පෘථිවි ප්‍රදේශයෝ බිඳ වාතවේගයෙන් අහසට නඟා සුනුවිසුනු කෙරෙයි, එසේම කෙලලක්ෂයක් සක්වල කල්පාන්ත මහාවාතය නැගී පෘථිවි හිමවත්පර්වත මහමේරු චක්‍රවාට අහසට නඟා එක පැහැර විනාශකෙරෙයි, මහපොළවින් මහපොළව හිමවතින් හිම වත මහමෙරන් මහමෙර සක්වලගලින් සක්වළගල දෙව්විමනින් දෙව්විමන බඹවිමනින් බඹවිමන සඝට්ටනයවෙමින් ඇඹරෙමින් සුනුවිසුනුවෙමින් අදර්ශනයටයෙත්, මිනිස්ලොව පටන් එක්කෝටි සලක්ෂ විසිතුන්දහස්සාරසියයක් යොදුන් මත්තෙහි පිහිටි නවවන සුභකිණ්ණකනම් බඹලොව දක්වා මුළුලෝ විනාශවෙයි, ජලපෙ ළුව වාතවේගයෙන් අහසට නැගී විසිර අන්තර්ධානවෙයි, මේ මිනිස් ලොව පටන් එක්කෝටි තිස්තුන්ලක්ෂ විසිදහස් සසියයක් යොදුන් මත්තෙහි පිහිටි දසවන වේහප්ඵලනම් බඹලොවය, අසඤ්ඤ සත්ත්වය යන බ්‍රහ්මලොකවය පැහැර යට අජටාකාශයෙහි පටන් මුළුලොව සියළු ඝණාන්ධකාර පැතිර සිටිනේය. එකල අවීචියේ පටන් නවවන සුභකිණ්ණකය ඇතුලත්කොට ගැසුරුණාවූ සකල සත්ත්වයෝ මරණින්මැකි කෙලලක්ෂයක් සක්වල ඝණාන්ධකාර පැතිර වන්නේය. එසින් කීහ.

"කොටිසතසහස්සකං චක්කවාලං විලීයති
වායොධාතුප්පකොපෙන යදාලොකො විනස්සති"

සත් සත් වරෙක ගින්නෙන් කපනැසීගියකල අටවෙනි අට වෙනිවර ජලයෙන් කපනැසී මෙම ක්‍රමයෙන් සුසැටවරක් ජලයෙන් නැසී සම්පූර්ණවූකල වාතයෙන් එක්වරෙක කප නස්නේය. එසින් කීහ.

සත්තසත්ත ග්ගිනාවාරා අට්ඨමෙ අට්ඨමෙදකා
චතුසට්ඨි යදාපුණ්ණා එකොවායුවරොසියා

මෙසේ තේජොසංවර්තය, ආපොසංවර්තය, වායොසංවර්තයයි කියා තුන්ප්‍රකාරයකින් මහකල්පය නස්නේය, එසින් සත්හිරු නැගී මේ කල්පය ගින්නෙන් නස්නේය; මේබව ප්‍රකාශකරන්නාවූ සතරාමර ලෝකෝත්තමගුරුවූ සමන්තභද්‍රවූ පරදුක්ඛදුක්ඛිත කාරුණා නිධානවූ සම්බුදුන් සර්වාකාරයෙන් විසඳන සර්වඥතාඥානයෙන්

අවබොධකළාවූ සර්වඥරාජොත්තමයානන්වහන්සේ සප්තසූර්‍යොද්ගමනය ගෙණහැර දක්වා "එවං අනිච්චා භික්ඛවෙ සංඛාරා" යනාදීන් මුලුලෝවාසීන්ට අනිත්‍ය ප්‍රකාශකොට තමන්වහන්සේ විදින ලොකවිදූ ගෙයින් ලෝකමහත්තාවය දූත ඒ ලෝකවිනාස කාරණයෙහි ආර්‍ය්‍යමාර්ගඵල ප්‍රතිලාභයෙන් නුවනමෝරාසිටි දිව්‍යමනුෂ්‍ය යන්හැර සංසාරයෙහි වැදහෙව පවකෙලශතාපයෙන් තැවෙන්නාවූ නුමුහුකල නුවනඇති සබ්බලෝකයා අතුරෙන් කවරෙක්නම් ඒ ලෝකවිනාශය මන්ත්‍රණයකොට කියන්ට සමර්ථවේද, කවරෙක් නම් ඒබව සැබෑකොට අදහන්නෙහිදැයි කියා මහත්වූ ධර්මයන් වේගයට පැමිණිලෙස් දක්වමින් "තත්‍ර භික්ඛවෙ" යනාදීන් පාඨය වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; අයමම්භාපථවී, මේ මහා පෘථිවියද, සිනෙරුපබ්බතරාජා, මේ මහාමේරු පර්වත රාජයාද යන දෙදෙනා; ඩය්හිස්සන්ති, ගිනිගෙණ ඇවිලෙන්නාහුයි ගින්නෙන්ද විනාසවන්නාහුයි; නභවිස්සන්ති, නැවත නොවන්නාහුයි ඉති, මෙසේ; තත්‍ර, ඒ ලෝකය ගින්නෙන්ද නැතිවන කාරණයෙහි; අසද්ධෝත්‍රද්වයි පදෙහි මාර්ගඵල ප්‍රතිලාභයෙන් නිර්වාණපදයදුක සිටි ආර්‍ය්‍යපුද්ගල යන් හැර සොමනතා, අනික් කවරෙක් මන්ත්‍රණයකොට කියන්ට සමර්ථවේද: කොසද්ධාත, කවරෙක් සත්‍යකොට අදහන්නෙහිද, මෙසේ ආලපන නැමති මෙඝගර්ජිත නගමින් දසසහශ්‍රීලෝකධාතු වෙහි එකපැහැර සද්ධර්මාමෘත වර්ෂාකරන්නාවූ සර්වඥරාජොත්තම යානන්වහන්සේ සප්තසූර්‍යොද්ගමනය ගෙණහැර දක්වා මුළුලෝවාසීන්ට අනිත්‍යය, දුක්ඛය, අනාත්මය, ප්‍රකාශකොට සඞ්ඛාර ලෝකපාත්‍රාධීනය ත්‍රිවිධකාරණයෙන් තීරණකොට විසිඅන්තඃ කල්පයක් ආයුගෙවෙන්තුරු ගින්නෙන් දද බඹලොව පැහැරසිට විනිජවාලොපච්ඡෙදය දක්වා සත්වතීනම් අසංඛ්‍ය කල්පයහයි වදාළසේක.

ඒ ජවාලොපච්ඡෙදනයෙහි පටන් සම්පත්කර මහමේඝය දක්වා ඒ අතර විසිඅන්තඃකල්පයක්හුගේ ආයුමදකුත් අඩුනොකට යට අජටාකාශයෙහි පටන් මත්තෙන් සතරවන පරිත්තාභ නම් බඹලොවදක්වා මුලුලොවනැසී සිසව සණ්ඨානාකාරවසිටීම සත්වතී සථායි අසංඛ්‍යකල්පය නම් වේ, ඒ සම්පත්කර මහමේඝය නම් පින්කළ සියලු සත්වයන්ගේ කුසලානුභාවයෙන් ලෝකනිර්මිතය පිණිස පහලවන මේඝයකිගේ පළමුකොට නවත් මැදින් දෙමස අතර අට් දින බානපිණිසෙයින් සියුම් සියුම්කොට වසිමින් ක්‍රම ක්‍රමයෙන් මහත්ව කුමුදුතල ගීදඹු මුසල පුවක්තුරු තල්රුක් පමණ වැසිපොද වසිමින් කෙලලක්ෂයක් සක්වල නැසීගියතාක් ලොව පිරිපිරි ජලයෙන් පුරාලමින් වැසී අන්ධකාරවසී; එකල මහවාතය

නැඟී ජලය යටින් සරසින් අඹරවමින් සිදුරුගෙණ නැගෙමින් තරඳමින් කරකවමින් හෙලුම්පාත දියසෙසින් වැරකෙරෙමින් කණයකොට විසලයි; මෙසේ අනන්ත දීඝීකාලයක්හුගේ ඇවෑමෙන් ජලය විසලී ක්ෂයවෙමින් ක්‍රමයෙන් පාත්බැස පළමු ශුක්‍රහානය පිහිටිතැනට ලත්වෙයි; එකල පළමු බඹලොව පිහිටිතැන් බඹලොව පහලවෙයි, දෙව්ලොව පිහිටිතැන් දෙව්ලොව පහළවෙයි, එකල ආභස්සරාදී මතු මතු බඹලොව වසන බ්‍රහ්මරාජයන් අතුරෙන් සමහරෙක් ආයුක්ෂයවීමෙන් හෝ පුණ්‍යක්ෂයවීමෙන් හෝ එයින් චුතව මහාබ්‍රහ්මය බ්‍රහ්මපුරෝහිතය බ්‍රහ්මපාරිසද්‍යය ප්‍රථම ධ්‍යාන තුන්තලයෙහි උපදිත්; සමහරෙක් පරනිර්මිත වසවර්තිය, නිර්මාණරතිය, තුසිතය, යාමය, යන සතර දෙව්ලොව උපදිත්.

ජලය ක්‍රමයෙන් අඩුවේ; පළමු පෘථිවිස්ථානයට බාකල්හි මහා වාතය අතිශයින් බලවත්වෙමින් දබරාවෙක පුරාවිසු දියතනක් සෙයින් හාත්පසින් නැඟී දියවටකෙරෙමින් තරඳමින් මිරිකයි; එකලක්ෂයක් වන්නාවූ මධුරරාධයක දියපිටදූමු හෙලුම්පතක් සෙයින් හාත්පසින් නැඟී දියවටකෙරෙමින් තරඳමින් මිරිකයි, එකල අමාරස පෘථිවිය තගයි, දෙදහසක් යොදුන් පෘථිවිතලය කිනිහිරි මලක්මෙන් රන්වන් වර්ණයෙන් සොභමානවෙයි, නිත්‍ය සුරභිසුගන්ධ පැතරෙයි, දිව්‍යරස ඕජස්ගෙන බහාලූකලක්මෙන් අමාරස වෙයි, එහි මහබෝධිපර්යඞ්කය පිහිටන ජයභූමිස්ථානය හැමටම පූර්වයෙන් පිහිටයි, ලොවනස්නාකල හැමවම පසුව නැසෙයි එහි පූර්වනිමිත්ත දක්වන්නාක්මෙන් හෙලුම්පැලයක් පැලවෙයි, ඉදින් බුදුකෙනෙකුන්වහන්සේ ඒ කප උපදිනසේක්වීනම් එහි මලෙක් පිපීයෙයි, නැතහොත් නොපිපිපෙයි, මේ කප එකනටුවෙ මල් පසෙක් කණිණිකාබෙදී පිපින, එහි පිරිකර පසෙක්වය; එකල දෙලොස්වන අව්හතම් බඹලොව ඇතුලුවූ පචසුඩාවාස බඹලොව අනාගාමි අරහන්ත බ්‍රහ්මරාජයෝ නමත් බුදොත්පාද ලකුණු දන්නා සෙයින් තිදුකාහෙති අපි පූර්වනිමිති දක්නාව යම්හයි සම්මනකොට ක්ෂණයකින් මුළුලොව අඳුරුබිඳ බෝමැඩකරාබැස රත්වන් හෙලුම්මල හා එහි පිරිකරපසක්දූක පසැස්ඇති පස්බුදු කෙනෙකුන්වහන්සේ උපදනාසේකැයි උපත් ප්‍රීතිසෝම්නසින් දෙඅතින් සිවුරුගෙන අහසට නැඟී පස්දෙනාවහන්සේගේම ගර්භාවක්‍රාන්තිය අභිනිෂ්ක්‍රමණය, සර්වඥතාඥනය, ප්‍රතිවේධය, ධම්මචක්‍රප්‍රවර්තනය, යමක ප්‍රාතිහාර්යය, දෙවොරොහණය, ආයුසංස්කාරොත්සර්ජනය, පරිනිර්වාන මඞ්ගල්‍යය, යන අටතන්හි දසසහශ්‍රීලෝකධාතුව කම්පනාදි බුද්ධපෙළහැර දක්වම්හයි ප්‍රතිවාක්‍ය පවත්වමින් තමතමන්ගේ පච්සුඩාවාස බඹලොවට ගියාහුය.

මෙසේ භූමිය පවත් ත්‍රිකෝටිසත්විසිලක්‍ෂ සාරදහසක් යොදුන් මත්තෙහි පිහිටි අකනිෂ්ඨකනම් බ්‍රහ්මලෝකවාසි අරහන්තනාම් බ්‍රහ්මරාජයෝ සතසහශ්‍රීලෝකධාතුව ශරීරප්‍රභාවයෙන් ඒකාලෝක කෙරෙමින් සිවුරු ගෙණෙගොස් බඹලොව තුබූහ, එකල සමෙවාත් පත්තිය පිණිස ආභස්සරනම් බඹලොවන් බ්‍රහ්මරාජයෝ ආයුක්‍ෂය වීමෙන් චුතවී අවුත් මේ මිනිස්ලොව ඕපපාතිකව උපදිත්, ඔව්හු සවකීය ශරිර ප්‍රභාවයෙන් අඳුරුබිඳ දිලියෙන්නාහ, අහසින යන ගමන් ඇත්තාහ, ප්‍රීතිසෑපම ආහාරකොට ඇත්තාහ, ස්ත්‍රී පුරුෂයයි යන ව්‍යවහාරයෙක් නැතිව අසඞ්ඛ්‍යායුෂව අනන්ත දීර්ඝකාලයක් වසන්නාහු මධුරතර සුරභිසුගන්ධ සමාකීර්ණවූ පෘථිවියෙන් මදක් ඇඟිල්ලෙන්ගෙන දිවගා ලෙහකොට ඉතා මධුරයයි පෘථිවිරසය අනුභවකරන්නාහු සිත ලොබ වැඩුත් වැඩුත් පෘථිවිරසය අනන්තකාලව අභිකැතුල් වැනි අමාරස ඇති සතුවගීයෙක් පහලවිය, ගෙද ලොභ වැඩුත් වැඩුත් අනන්තකාලව මධුර රසඇති භද්‍රලතාලිය පහල විය, ගෙද අනන්තකාලව ඔවුන්ගේ කුසලබලයෙන් කුඩුහා දහයනැති මුතුසේ පිරිසිදු මිහිරි සුවඳ ඇති සවයංජාතික හැල්පහළවිය, ඒ සයංජාතික සහල්ගෙනපහලවූ මැණික්වඳුන්හි ලා මැණික් උදුන නගා පිළියෙලවූ දිව්‍යභොජන්වැනි සුවඳබත් අනුභවකෙරෙමින් ජල මලඋපන, ඒජලමල නික්මීමට කලවගට ගන්නා පළමු කුළුසෙයින් ජලමලමාර්ගීබිඳී ඒ ඒ ස්ත්‍රී පුරුෂ ලක්ඛණවයි හටගත්තේය, එතැන් පටන් ස්ත්‍රීයයි පුරුෂයයි ව්‍යවහාරයක්විය, අහසින් යන සෘද්ධිය නැතිවිය, සඳමෙන් බැබළු ශරීරප්‍රභා නැතිවිය, මුළුලෝ අන්ධකාරවිය,එකල ඒ අන්ධකාරයට පැමිණි ප්‍රථම කල්පික මහා බ්‍රහ්මයෝ අහෝ අපි අනන්තාසංඛ්‍යාපු වලඳමින් ශරීරප්‍රභාවයෙන් මුළුලොව අඳුරුබිඳ අහස සැරිසරාලුම්හ. දැන් අපිකළකම් ඉතා බලවත්නිසායයි කියා හඬනාහ.

එකල ඔවුන්ගේ පුණ්‍යානුභාවයෙන් ඒ අන්ධකාරය විධ්වංසනය කෙරෙමින් දසාලිස් දහසක් යොදුන් මත්තෙහි අහස පනස් යොදුන් හිරුවිමනෙක් පහලවිය, ඒ දුටු මහත්වූ සුරභාවය, දක්වමින් අන්ධකාරය දුරුකලේය, එහෙයින් මොහු සූර්ය්‍යයයි නම් තැබූහ; ඒ හිරුවිමන ඉතා දුරුවගියකල පෙරසෙයින් අඳුරට පැමිණ හිරු සෙයින් තවත් ආලෝකයෙක් පහලවී නම් යහපතැයි සිතූහ; ඔවුන්ගේ සිතනා සමග සඳවිමන පහලවිය ඒ දුටු අපගේ ඡන්දයලෙසට පහලවූයේ සඳහුයයි නම් තැබූහ.—මෙසේ හිරසඳ පහලවූ දවස්හිම ඉදිරිපසුනොවී එකවිටම මහමේරු චක්‍රවාට හිමවත් පර්වත දිවයින් කොදෙව් සමුද්‍ර දෙදෙව්ලොව යන සියල්ලම මැදින් දින පසලොස්වක් පොහොදවස්හිම එකවිටම පහලවිය, කෙසේ පහලවීදයත්? යම්සේ තනබත් ඉඳෙනකල්හි එකුවරම බුබුළු නැඟී

වෙන් එක්පියසෙක්හි ථූපාථූපයෙහි එක්පියසෙක්හි මිට්මිටියෙහි එක් පියසෙක්හි සමසමවෙයි. ථූපාථූපස්ථාන නොයෙක් පර්වතකූටවෙයි. නිම්නෝන්නතස්ථාන නොයෙක් සරසරිත්සාගරවෙයි, සමස්ථාන දිවයින් දඹදිව් දෙදහසක් කොදෙව්වෙයි, මෙසේ සම්පත්තිකර මහමේඝය පවත් විසිඅන්තඃ කල්පයක්හුගේ ආයු අඩුනොකොට ක්‍රමයෙන් මලාව තැනෙමින් ප්‍රථමකල්පික මානුෂ්‍යක මහාබ්‍රහ්මයෝ සන්නිධිකාරයට පැමිණ හඬමින් හිරසඳ මහමෙර සක්වලගල් පහළවනතැන් දක්වා විවර්ති අසඛ්‍යකල්පය නම් වේ,

එතැන් පටන් හිරසඳ මහමෙර ඇතිව දෙව්ලොව ඇතිව බඹලොව ඇතිව දිවයින් ඇතිව හිමවත් සක්වලගල් ඇතිව තුන් දහසක් යොදුන් දඹදිව් සුවාසූදහසක් රාජධානි ඇතිව නොයෙක් සත්ත්වසමාකීර්ණ අසංඛ්‍ය ආයුෂ්කවසිටි මිනිසුන්ගේ ක්‍රමයෙන් ආයු පිරිහී දසවර්ෂායුෂ්කව රෝග දුර්භික්ෂ ශස්ත්‍ර අන්තඃකල්පය යන එකකින් අතුරුකපක සතුන් නැසී ඉතිරි මිනිසුන් ආයුවැඩී අසංඛ්‍යයටගොස් නැවත ආයු පිරිහී දසවර්ෂගතවෙමින් මෙසේ වසිතුරු කපක් මුලුල්ලෙහි ගෙවා මහකල්පය නස්නට හවුරුදු ලක්ෂයක් තිබියදී ඇත්තා විපත්තිකර මහමේඝය දක්වා විවර්තස්ථායික අසඛ්‍ය කල්පපය නම්වේ.

මෙසේ සන්වර්තය, සන්වර්තස්ථායිකය, විවර්තය, විවර්තස්ථායික යයි කියා මහාකල්පය අසංඛ්‍යකල්ප සතරෙක්වේ෴ එයින් වදාළහ.

“චත්තාරෝ මෙ භික්ඛවෙ මහාකප්පා කතමෙ චත්තාරෝ සංවට්ටො සංවට්ටට්ඨායි විවට්ටො විවට්ටට්ඨායි ඉමෙඛො භික්ඛවෙ චත්තාරෝ මහාකප්පාති” මේ සතර අසංඛ්‍යකල්පයෝ එක් මහා කල්පයෙක් නම්වේ. හේ පර්වතෝපමාදීන් හා සදෘශවන බැවින් කල්ප නම්වේ෴ මෙසේ දිගින් යොදුනැති පළලින් යොදුනැති උසින් යොදුනැති අච්ඡිද්‍රවූ අසුෂිරවූ එකඝනවූ මහපර්වතයෙක් වේද ඒ පර්වතය යම් පුරුෂයෙක්තෙම වර්ෂසියක්හුගේ හෝ වර්ෂ සහශ්‍රයක්හුගේ හෝ ඇවෑමෙන් ඉතා සියුම්වූ කාසික වස්ත්‍රයකින් වරක්වරක් බැගින් පිරිමදින්නේ වීනම් මේ උපක්‍රමයෙන් නොබෝ කලකින්ම ඒ මහා පර්වතය ක්ෂයභාවයට යන්නේමය. මහාකල්පය නොගෙවෙන්නේයි එයින් වදාළාහ—සුපිළිපන් භික්ෂූනව,

සෙය්‍යථාපිභික්ඛු මහාසෙලො පබ්බතො අයාමෙන යොජනං විත්ථාරෙණ යොජනං උබ්බෙධෙන යොජනං අච්ඡිද්දො අසුසිරො එකඝනො තමෙනං පුරිසො වස්සසතං වස්සසහස්සං අච්චයෙන කාසිකෙන වත්ථෙන සකිං සකිං පරිමජ්ජෙය්‍ය ඛිප්පතරං ඛො සො භික්ඛු මහාසෙලො පබ්බතො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය නත්වෙව කප්පො” මෙසේ සතරගව්‍ දිගපුළලැති ඝණය ඇති ශෛලමය පර්වතය අහසින් යන සිද්ධපුරුෂයෙකු හැඳි

කාසික වස්ත්‍රයෙන් සීයක් හවුරුද්දෙන් දහසක් හවුරුද්දෙන් වරක් පිරිමැදීමෙන් ගෙවී වගානැතිවෙයි, මහාකල්පය එයට අනන්ත දීර්ඝකාලයක් වනබව විසඳවූ සර්වඥතාඥානයෙන් දුක එබඳුවූ සත් කපක් මුලුල්ලෙහි තමන්වහන්සේ මිනිස්ලොවට ලන්නොවී බඹසුර ඉසුරු විඳිමින් හැසුරුණුබව දක්වමින් "භූත පුබ්බං භික්ඛවෙ" යනාදි පාඨය වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි: භූතපුබ්බං, පෙරවදෙයක් කියමි: ඒ කාල රහතිත්ථකරෝ, තමා දෘෂ්ටිය ගත් සියල්ලන්ට ගුරුවූ ස්ථානය කරන්නාවූ; කාමේසු විතරාගො, වස්තුකාමහන වසයෙන් කාමරාගය ප්‍රහාණය කළබැවින් වීතරාගිවූ: සුනෙත්තො සත්ථානාම අහොසි, දිව්‍යමනුෂ්‍යයන්ට අනුශාසනාකරණ සුනෙත්‍රනම් ශාස්තෲකෙනෙක් වූයේය; භික්ඛවෙ, මහණෙනි; සුනෙත්තස්ස සත්ථුනො බොපන, සුනෙත්‍රනම් ශාස්තෲහුගේ වනාහි; අනෙකානි සාවකසතානි අහෙසුං, නොයෙක් සියගණන් ශ්‍රාවකයෝවූහ; සුනෙත්තො සත්ථා, සුනෙත්‍ර නම් ශාස්තෲතෙමේ; සාවකානං, තමාගේ ශ්‍රාවකයන්ට; බ්‍රහ්මලෝක සහව්‍යතාය, බ්‍රහ්මලෝකවාසීන් හා එක්භාවය පිණිස හෙවත් බ්‍රහ්මලෝකොත්පත්තිය පිණිස; ධම්මංදෙසෙසි, ධර්මය දේශනා කරන්නේය.

භික්ඛවෙ, මහණෙනි; බ්‍රහ්මලොක සහව්‍යතාය, බ්‍රහ්මලෝක වාසීන් හා එකී භාවය පිණිස හෙවත් බ්‍රහ්මලෝකයෙහි උපදනා පිණිස; ධම්මංදෙසෙන්තස්ස, ධර්ම දේශනාකරන්නාවූ; සුනෙත්තස්ස සත්ථුනො, සුනෙත්‍රනම් ශාස්තෲහුගේ සබ්බෙනසබ්බං සාසනං, සර්ව ප්‍රකාරයෙන්ම සියලු අනුශාසනාව; යෙකෙචි පන, යම්කෙනෙක් වනාහි; අජානිංසු, අනුශාසනාව දැනගත්තාහුද හෙවත් බ්‍රහ්ම ලෝකයට යන මාර්ගය පිළිපන්නාහුද; තෙ, ධ්‍යානයට පැමිණි ඒ ශ්‍රාවකයෝ; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින්මත්තෙහි; සුගතිං, ශොභනගති ඇති සුගති නම්වූ; සග්ගං, අග්‍රවූ; ප්‍රීතිසැප ඇතිහෙයින් ස්වර්ගනම්වූ; බ්‍රහ්ම ලොකං, ප්‍රථමධ්‍යාන බ්‍රහ්මලෝකයෙහි; උපපජ්ජිංසු, උපන්නාහුයි. යෙ, යම්කෙනෙක්; සබ්බෙනසබ්බං සාසනං, සර්වප්‍රකාරයෙන්ම ඒ සියලුම අනුශාසනාව; න අජානිංසු, නොදන්නාහුද; තෙ, ඒ මනුෂ්‍යයෝ; කායස්සභෙදා, කරජකායයාගේ භෙදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; අප්පෙකච්චෙ, සමහර සත්වකෙනෙක්; පරනිම්මිත වසවත්තීනං දෙවානං, භූමියට තිස්අටලක්ෂ සැටදහස් දෙසියයක් යොදුන් මත්තෙහි පිහිටි පරනිර්මිත වසවර්තිනම් දෙව්ලොව දෙවියන් හා සම්බන්ධව; සහව්‍යතං, එකීභාවයට පැමිණ; උපපජ්ජිංසු, උපන්නාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; නිම්මානරතීනං දෙවානං, භූමියට විසිලක්ෂ තිස්අටදහස් සසියයක් යොදුන් මත්තෙහි පිහිටි; නිර්මාණරතිනම් දෙවියන් හා සම්බන්ධව;

සහව්‍යතං, එකීභාවයට පැමිණ; උපපජ්ජිංසු, උපනනාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; තුසිතානං දෙවානං, භූමියට තෙලෙස් ලක්‍ෂ තුන්දහස් සාරසියයක් යොදුන් මත්තෙහි පිහිටි තුසිත දෙව්ලොව දෙවියන් හා සම්බන්ධව; සහව්‍යතං, එකීභාවයට පැමිණ; උපපජ්ජිංසු, උපනනාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; යාමානං දෙවානං, පස්ලක්‍ෂදසඅටදහස් සාරසියයක් යොදුන් මත්තෙහි පිහිටි යාමනම් දිව්‍යලෝකයෙහි දෙවියන් හා සම්බන්ධව; සහව්‍යතං, එකීභාවයට පැමිණ; උපපජ්ජිංසු, උපනනාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; තාවතිංසානං දෙවානං, තව්තිසා දිව්‍යලොක වාසීන් හා සම්බන්ධව සහව්‍යතං, එකීභාවයට පැමිණ; උපපජ්ජිංසු, උපනනාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; චාතුම්මහාරාජිකානං දෙවානං, චාතුම්මහාරාජික දෙවියන් හා සම්බන්ධව; සහව්‍යතං, එකීභාවයට පැමිණ: උපපජ්ජිංසු, උපනනාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; ඛත්තියමහාසාලානං, මිනිස්ලොව දවස සියක්කෝටියක් කහවනු නිධානකොට තබමින් විසිඅමුණක් කහවනු දවසකට ප්‍රයොජන විඳින්නාවූ ක්‍ෂත්‍රිය මහාසාරකුලයන් හා සම්බන්ධව සහව්‍යතං, එකීභාවයට පැමිණ; උපපජ්ජිංසු, උපනනාහුය; අප්පෙකච්චෙ, සමහරකෙනෙක්; බ්‍රාහ්මණ මහාසාලානං, අසූකෝටියක් කහවණු නිධාන කෙරෙමින් දවස දසඅමුණක් කහවනු වළඳන්නාවූ බ්‍රාහ්මණ මහාසාර කුලයන් හා සම්බන්ධව; සහව්‍යතං, එකීභාවයට පැමිණ; උපපජ්ජිංසු, උපනනාහුය; අප්පෙකච්චෙ. සමහරකෙනෙක්; ගහපති මහාසාලානං, සතලිස්කෝටියක් කහවනු නිධානකෙරෙමින් පසමුනක් කහවනු දවස වළඳන්නාවූ; ගෘහපති මහාසාර කුලයන්හා; සහව්‍යතං, එකීභාවයට පැමිණ; උපපජ්ජිංසු, උපනනාහුයි.

මෙසේ සුනෙත්‍ර ශාස්තෘවූ ශ්‍රීමහබොධිසත්වයන්වහන්සේ සසර වැද බුද්ධකාරක ධර්මයන් පූරණයකරණසේක් කලෙක මිනිස්ලොව මහධනසම්පත්ති ඇති ලොකප්‍රසිද්ධවූ; මහාසාර කුලයෙක ඉපිද වැඩිවිය පැමිණ සියළුම සැපත් හැර මහභිනික්මන්කොට ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමවත් වැද කායචිත්ත විවේකයෙන් අප්‍රමාදව සිත එකඟකොට ගෙණ ඒකවීසමාපත්ති සම්‍යක්මනස්කාර යෙන් යෙදී භාවනාකොට කසිනාලොක උපදවා පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති ලාභීවූ සුනෙත්‍රනම් ශාස්තෘහයි දෙව්මිනිසුන් කෙරෙහි ප්‍රසිද්ධව වසනුයේ මුළුමහත් දඹදිව වාසීන්ට මෙලොව පරලොව වැඩ දක්වා ධර්මදෙශනා කරණකල්හි ඒ ධර්මදේශනාවෙහි අයි ප්‍රසන්නව තමන්වහන්සේ කරා අවුත් අඳුං දිවිසම් පෙරවාගෙණ ජටාමඬුලු දරා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූ සියදහස් ගණන් ඍෂීන් පිරිවරා බුද්ධොත්පාද කාලයක් මෙන් ලොව බබුලු වමින් වැඩවසනසේක් දිව්‍ය මනුෂ්‍යයන්ට බ්‍රහ්මසම්පත්ති ප්‍රති

ලාභය පිණිස මාර්ගප්‍රතිපත්තිය දක්වා ධර්මදේශනාකරණකල්හි ඒ සෘෂිසමූහයා අප්‍රමාදව ඒ මාර්ගප්‍රතිපත්තිය සර්වප්‍රකාරයෙන් අවබොධකොට ධ්‍යාන උපදවා ප්‍රථමධ්‍යාන හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් වඩමින් බ්‍රහ්මපාරිසද්‍යය, බ්‍රහ්මපුරොහිතය, මහාබ්‍රහ්මය, යන බ්‍රහ්ම ලෝකත්‍රයෙහි උපන්නාහ; ඒ බ්‍රහ්මලෝකයෙහි උපදනා මාර්ගප්‍රතිපත්තිය සර්වප්‍රකාරයෙන් අවබොධකොටගත නුහුනු සමහර සෘෂිහු සදෙව්ලොව උපන්හ; සෘෂින්ට වැඳපුදා උපස්ථානකළ මනුෂ්‍යයෝ බොහෝ සෙයින් සදෙව්ලොව උපන්හ; සමහරෙක් මිනිස්ලොව ත්‍රිවිධ මහාසාර කුලයෙහි උපන්හ; සෘෂීන් දැක චිත්තප්‍රෙමය කළ තිරිසන්ගත සත්වයෝ දෙදෙව්ලොව උපන්හ

එකල සුනෙත්‍රනම් ශාස්තෘන්වහන්සේ එපවත් දිවැසින් දැක ඒ මාගේ ශ්‍රාවකයන් හා පරලොව සමසම ගතිවීනම් හේ මට තරම් නොවෙයි, එහෙයින් මම එයට අධිකතරවූ මාර්ගභාවනාවක් කලේ වීනම් යෙහෙකැයි සිතා ප්‍රථමධ්‍යානයෙන් ද්විතීය, තෘතීය චතුර්ථ ධ්‍යානය දක්වා ප්‍රනීතවශයෙන්ම උපදවා "සබ්බෙ සත්තා අවෙරා හොන්තු අව්‍යාපජ්ඣා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු" යනාදීන් සියලු සත්වයන් කෙරෙහි කරුණාමෛත්‍රී පතුරුවා සත්අවුරුද්දක් මුළුල්ලෙහි මෛත්‍රීභාවනාකොට නොපිරිහුනාවූ ධ්‍යානචිත්තයෙන් ගොස් ආභස්වරාදී බ්‍රහ්මරාජයන් කෙරෙහි උපන්සේක; ඒ බව ප්‍රකාශකර වදාරන්නාවූ ත්‍රිභුවනජනනිඛිල රාජහංස නිෂෙවිත සරෝරුහාකාර පාදපද්මොප සොභිත අභීෂ් සම්‍යක්සම්බුද්ධ සර්වඥ රාජොත්තමයාණන්වහන්සේ "අථඛො භික්ඛවෙ" යනාදී පාඨය වදාළසේක.

භික්ඛවෙ, මහණෙනි; අථඛො, ඉක්බිත්තෙන්; සුනෙත්තස්ස සත්ථුනො, සුනෙත්‍රනම් ශාස්තෘන්හට; එතං, සියල්ලන්ට ගුරුස්ථානයෙහි පිහිටියාවූ ඒ මම; සාවකානං, මාගේ ශ්‍රාවකයන් හා; අභිසම්පරායං, පරලොවෙහි; සමසමගතිකො අස්ස, සමසමගතිවීන්නම්; එතම්පන, මේකාරණය වනාහි; නඛො පතිරූපං, සුදුසු නොවන්නේය; එහෙයින්; අහං, මම; උත්තරිං මග්ගං භාවෙය්‍යං, ප්‍රථමධ්‍යානයෙන් මතු අධිකතරමාර්ගභාවනාවක් කලේවීනම්; යන්නූන ඉති, ඉතා මැනවයිකියා; එතං, මෙබඳුවූ සිතක්; අභොසිං, වූයේය; භික්ඛවෙ, මහණෙනි; අථඛො, ඉක්බිත්තෙන්; සුනෙත්තො සත්ථා, සුනෙත්‍රනම් ශාස්තෘතෙම පැමිණිසිටි ප්‍රථමධ්‍යානයෙන් මතු ද්විතීය තෘතීය චතුර්ථ ධ්‍යානදක්වා ප්‍රනීතවශයෙන් උපදවා; සත්තවස්සානි, සත්හවුරුද්දක් මුළුල්ලෙහි; මෙත්තචිත්තං භාවෙසි, මෛත්‍රීචිත්තය වැඩුයේය; හෙවත් මෛත්‍රීභාවනා කෙළේය; සත්තවස්සානි මෙත්තචිත්තං භාවෙත්වා, සත්හවුරුද්දක් මෛත්‍රීභාවනාකොට; නොපිරිහුනු ධ්‍යානයෙන්ගොස් රන්වන් වලාපටලයෙන් නික්මුනාවූ විජ්ජුලතා සෙයින්ද දසදිසානතරයෙහි දුවන ශරීරප්‍රභාසවර ඇතිවන

බැවින් ආභස්සරනම්වූ බඹලොව ඉපද; සත්තසංවට්ටවිවට්ටකප්පෙ, සත්තසංවට්ට විවට්ටකල්පයක් හෙවත් සප්තසූර්‍ය්‍යොද්ගමනයෙන් ගින්නෙන්ද නසිමින් සම්පත්තිකර මහමේඝය පටන් ලොව හටගනිමින් සිටි කල්පසතක් ගෙවෙනතුරු; ඉමං ලොකං, මේ මනුෂ්‍ය ලෝකයට; නපුන ආගමාසි, ප්‍රතිසන්ධිග්‍රහණයට නොආයේය; භික්ඛවෙ, මහණෙනි; සංවට්ටමානෙ ලොකෙ, ලොකය ගින්නෙන්ද නස්නාකල්හි; ආභස්සරූපගො හොති, ආභස්සර ලොකූපගතවන්නේය; විවට්ටමානෙ ලොකෙ, ලෝකය ක්‍රමයෙන් හටගන්නාකල්හි; සුඤ්ඤං බ්‍රහ්මවිමානං, පාතපගළුවූ ශූන්‍ය බ්‍රහ්මවිමන්හි; උපපජ්ජති, උපදනේය; භික්ඛවෙ, මහණෙනි; තත්‍ර, ඒ බ්‍රහ්මලෝකයෙහි; බ්‍රහ්මා හොති, බ්‍රහ්මරාජයෙක් වන්නේය; මහාබ්‍රහ්මා, ප්‍රථමයෙන් උපන් බැවින් මහාබ්‍රහ්ම වන්නේය; අභිභූ, සියල්ලවුන් මැඩපවත්වන සුළුය; අනභිභූතො, අන්‍යයන් විසින් මැඩපැවැත්විය නොහැක්කේය; අඤ්ඤදත්ථුදසො, ඒකාන්තයෙන් සියල්ල දක්නාසුළුය; වසවත්ති, සියල්ලන් තමාගේ වසහයෙහි පවත්වා ලන්නේය; සුදන්, යනු නිපාතයි.

මෙසේ අනන්ත දීර්ඝකාලයක් බ්‍රහ්මසම්පත් වළඳා හැවත භික්ඛවෙ, මහණෙනි; ඡත්තිංසක්ඛත්තුංබො පණ,සතිස්වරෙක වනාහි; දෙවානමින්දො, දෙදෙව්ලොව දෙවියන්ට අධිපති ශක්‍රදෙවෙන්ද්‍ර වූයේය; මෙසේ සත්අවුරුද්දක් මෛත්‍රීභාවනාකොට; එම කුසලානුභාවයෙන් මිනිස්ලොව ඉක්ම බඹලොව ඉපද සත්තසංවට්ට විවට්ට කල්පයක් ගෙවෙනතුරු අනන්ත යසශ්‍රී ධ්‍යාන ප්‍රීතිසැප ඇතිව දසසහශ්‍රී ලෝකධාතුවෙහි රැස්වළුන් සියල්ලන්ගේ සිත් චෙතොපරණයෙන් සිතින් සිත පිරිසිඳ දක්නා චෙතොපරණය ඒතාක් ලෝකධාතුවෙහි කසිනා ලෝක වඩන්නට සමර්ථවූ කසිනපරණය, දිව්‍ය පතුරුවා ඒතාක් ලොව ක්ෂුද්‍රස්ථූල වස්තූන් දක්නට සමර්ථවූ ආලෝකපරණය යන මේ පරණයෙන් සමන්විතව බ්‍රහ්මසම්පත් විඳ එයින් චුතව දෙව්ලොව ඉපද සතිස්වරෙක ශක්‍රදෙවෙන්ද්‍රව දිව්‍යරාජශ්‍රීවිඳ වළඳා සේක. එකම මහකල්පයක ආයු බොහෝවන පරිදි වදාරන්නාවූ ලොව්තුරු බුදුරජාණන්වහන්සේ විසින් සතරගවු දිගපුළුල උස ඇති මහකොට්ඨුවක සම්පූර්ණකොට පුරවාලූ හබ සියක්හවුරුද්දෙන් දහසක් යවුරුද්දෙන් එක්ඇටයක් බැගින් බැහැර්දැම්මෙන් සියලු සෂීපරුසිය නිමවායෙයි කල්පයෙක ආයුෂ නොගෙවෙයි කියා වදාළ උපමාවයෙන් කල්පයෙක්නම් ඉතා බොහෝ දීර්ඝකාලයෙක් වෙයි, එබඳුවූ මහාකල්ප සතක් මුළුල්ලෙහි සුනෙත්‍රනම් ශාස්තෘහු බ්‍රහ්මසම්පත් ශක්‍රසම්පත් විඳිමින් එයින් මිනිස්ලොව මහාසම්මත රාජවංශයෙහි ඉපද නොයෙක් සියගණන්වාරයෙහි චක්‍රවර්තිරාජ

ජයශ්‍රී ලද්දේයි, මේ මහසම්මත රාජවංසය නම් වේ. ප්‍රථමයෙන් පෘථිවීය නැතුනුකල මෙයට සත්‍යාඅටලක්‍ෂ අසූදහස් සසියයක් යොදුන් මත්තෙහි පිහිටි ආභස්සර නම් බඹලොවින් චුතව බ්‍රහ්මයෝ මිනිස් ලොව නැගූ පහන්සිළා සෙයින් ඕපපාතිකව උපන්හ; ඔවුන්ගේ ශරීරප්‍රභාවයෙන් මුළුලොව ඝනාන්ධකාරය විධ්වංශනවිය, අහසින් යන ගමන ඇතිවිය ප්‍රීතිසැප ආහාරවිය, අනාදිමත් සසර දික් කරණ සත්‍රීත්නැති බඹලොවක්මෙන් විය, බඹසිරි ලෙසින් අනන්ත දීර්ඝ කාලයක් ප්‍රීතිසැපයෙන් කල්යවන්නාහු ක්‍රමයෙන් පෘථිවි අමා රස වළඳමින් භූමිපපටක වළඳමින් භද්‍රලතා වළඳමින් ස්වයංජාත වළඳමින් ලෝභ වඩුත් වඩුත් හැම අන්තර්ධානවිය, මහී අමාරසාදී සියුම් ආහාර වැළඳූකල ජඨරාග්නිය ඉපද දව්‍ය රසනහරගතව අතුරුදන්විය, කුඩුමිශ්‍ර ඕළාරිකසාලේ භෝජන වැළඳීමෙන් මල හා මූත්‍ර උපන ඒ මලමූත්‍ර නෙගීමනයට ස්ත්‍රීපුරුෂ අභාවකවූ බ්‍රහ්ම රාජයන් වැනි මෘදු මොළොක් ශරීරයෙහි කලට හටගන්නා එල මුකුළු සෙයින් මලමූත්‍රමාර්ග බිඳීම හා ස්ත්‍රීපුරුෂලක්‍ෂණවය පහළවිය, එසින් බොහෝ කාලාන්තරයක් ඔවුනොවුන්ගේ දර්ශණ සංසර්ගයෙන් ආශිවිෂයෙක්කිපී නැගිකලක්මෙන් අනාදිමත් සසරභාවිතවූ කාමරාගෝත්සන්නාව දෙදෙනෙක් කාමසේවනයෙහි හැසුරුනාහ; ඒ දුටුවෝ අහෝ මොවුන් නුසුදුසු නොකළමනා දෙයක් කරන්නාහයි කියා කැටපහර දෙමින් සාඛා දඬුමුගුරුගෙණ එහුබැඳගත්නාහ; එකල ඔවුන් දණ්ඩනිග්‍රහ වෙමින් වෙහෙසවිඳ වනවැද එහි විසියනොහී සරසින් උඩින්වසා ගෘහයක්කොට අපනොකළමනාව සිත්සේ කෙරෙමින් සියල්ලන් සමඟ වසම්හයි කියා ගෘහයක් කොටගෙණ විසූහ. එතැන්පටන් කාමරාගය හා ගෘහකර්මාන්ත පහළවිය.

ඒ ප්‍රථමකල්පික මනුෂ්‍යයෝ බ්‍රහ්මරාජයන්වැනි සීලාචාර රූපශ්‍රී ශරීරප්‍රභා ඇතිහෙයින් ප්‍රථමකල්පික බ්‍රහ්මයෝයයි කියත්, ඔව්හු බඹලොවින් අවුත් උපන්හෙයින් ජන්මභාෂාවූ පාලිභාෂා වෙම්ම කථාව උපදවාලූහ; රවි, චන්ද්‍ර, කුජ, බුධ, ගුරු, ශුක්‍ර, ශනිය යන සප්තග්‍රහ මඬුළු ඇතිව රාත්‍රි දින මාස ඍතු සංවත්සර ඇතිව බොහෝ කලක් සයංජාතහැල් අනුභවකරමින් වසන්නාහු ලෝභ වඩුත් වඩුත් මුතුවන් සහල් කුඩුනටගත්හ; දහයියා හටගත්හ; නැවත නොවපුල බිජු නොනැගෙයි එකල කොත්වක්කොට දියබැඳ ගොවිකම් කෙරෙමින් හැල්වීබෙදාගෙණ මට මටයයි ආරක්‍ෂා තබා ගත්හ; එකක්හුගේ හැල් නැතිකල අනිකක්හුගේ හැල් දෙවරෙක සොරාගත්තෝය; ඒ දැක මෙවක්පටන් මෙසේ නොකරවයි කියා නිග්‍රහකොට හැරියෝය; තුන්වර හසුකොටගෙණ අතින් පයින් කැටින් ඉපලින් තලා කෙරපූහ; එතැන් පටන් අදිනාදානය

උපන. ගර්භාව උපන, චද්දණ්ඩණය උපන, එකල ඒ ගැමිදෙන එක්වගෙණ දූන් මෙබඳු නොකළමනා පාපකර්ම උපන, එහෙයින් අප හැම්දෙනම සම්මතකොට නොපවැති දෙයකළවුන්ට නිග්‍ර ගර්හාපබ්බාජනිය කාරණයේ එක්කෙනෙකු තිලකොට තබම්හ ඔබට අපි හැල් අමුනු බැගින් දෙම්හයි කියා සම්මතකොට සූර්යපුත්‍රනම්වූ මහබෝධිසත්වයන්වහන්සේ තෝරාගෙණ ත්‍රිවිධශංඛයෙන් පැන් වඩා රාජාභිෂේකයෙහි තැබූහ; හේ රජක්ෂෙත්‍රාධිපති හෙයින් ඛත්තියනම් විය, දැහැමින් සෙමෙන් ජනයන් රංජනය කරණ හෙයින් රාජනම්විය, සියලු ජනයාගේ සම්මතයෙන් රජවූ හෙයින් මහාසම්මතනම් විය෴ ඔහුගේ වංසය මහසම්මත රාජවංශය නම්විය; මේ මහාසම්මතවූ රාජවංශයෙහි සුනෙත්‍රනම්වූ මහාබෝධිසත්වයන් වහන්සේ ඉපද නොයෙක් සියගණින් වාරයෙහි චක්‍රවර්ති රාජ්‍යශ්‍රී කරවදාළසේක෴ ඒ බව දක්වා වදාරන්නාවූ ත්‍රිභුවනභවනෛක තිලක සකලශ්‍රේයස්සාකර පරශුනාශෙස ගුණරත්නමන්දිරායමානවූ සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ "අනෙකසතසඛ්‍යාතං රාජා අහොසි" යනා පාඨය වදාළසේක෴

චක්කවත්ති, දිව්‍යමය චක්‍රරත්නය හා සමග පවත්නාවූ; ධම්මිකො, දසවිධ චක්‍රවර්තිවත් පුරා දැහැමින්ම ප්‍රතිලබ්ද හෙයින් ධාර්මිකවූ; ධම්මරාජා, දසරාජධර්මයෙන් රාජ්‍යශ්‍රී කරණහෙයින් ධර්මරාජන්වූ; චාතුරන්තො, මහමෙර සතරදෙසින් චක්‍රවාටය කෙළවරකොට සතරමහ දිවයින ඇතුළත්කොට ඇත්තාවූ; විජිතාවී, සකල පෘථිවිය ජයග්‍රහණය කළාවූ; ජනපදත්ථාවරියප්පත්තො, අකුපිත ජන සමාකීර්ණතාවෙන් ස්ථිරව පිහිටියාවූ ජනපදත්වයට පැමිණියාවූ; සත්තරතන සමන්නාගතො, සප්තවිධරත්නයෙන් සමන්විතවූ; සෙය්‍යථිදං, ඒ කවරයත; චක්කරතනං, අහසින් යන දිව්‍යමයවූ චක්‍රරත්නය; හත්ථිරතනං, ආකාශචාරිවූ හස්තිරත්නයද; අස්සරතනං, වලාහක අශ්වරත්නය; මණිරතනං, සත්ගවුතැන් සන්තතතිමිරාන්ධකාර විධ්වංසනය කෙරෙමින් පවත්නා නිත්‍යභාසුර මාණික්‍ය රත්නය; ගහපතිරතනං, සතර ගවුවෙක පෘථිවියගත නිධාන දක්නා ග්‍රහපතිරත්නය; පරිනායකරතනං, සතිස්යොදුනෙක පැතිර සිටින මහපිරිසෙහි චරිතවිශේෂ දක්නට සමර්ථවූ පරිනායකවූ පුත්‍ර රත්නය යන මේ සප්තවිධ රත්නයෙන් යුක්තවූ; අනෙක සතසඛ්‍යාතං, නොයෙක් සියගණන් ජාතිවාරයෙහි; රාජාඅහොසි, සතරමහදිවයිනට එකඡත්‍රකොට රජවූයේය; අසස, ඒ චක්‍රවර්තී රජහට; සූරා, අතිදක්ෂවූ; වීරඞ්ගරූපා, දෙවියන් හා සමානවූ රූපශ්‍රී ඇති; පරසෙනප්පමද්දනා, පරසෙනා සේනා මඩනට සමර්ථවූ; පර සහස්සං ඛොපන, දහසකින් වැඩියක් වනාහි; පුත්තාඅහෙසුං, පුත්‍රයෝවූහ; සො, ඒ සකලවසුධාධිපති චක්‍රවර්ති නරදෙවෙන්ද්‍රතෙම; සාගරපරියන්තං, එපින් සාගරය කෙළවරකොට ඇති; ඉමංපඨවිං,

මේ සියලුම පෘථිවිය; අදණ්ඩෙන, සත්වයන්ට කිසි දණ්ඩනයක් නැතිව; අසත්ථෙන, සත්වඝාතනයට කිසි ශස්ත්‍රයක් නැතිව; ධම්මෙන, ධාර්මිකවූ රාජානුශාසනාවෙම්ම; අභිවිජිය, ජයගෙණ; අජ්ඣාවසි, වාසයකෙළේ.

භික්ඛවේ, මහණෙනි; එවං, මෙසේ; දීඝායුකො සමානො, තෙජොසංවට්ට විවට්ට කල්පසතෙක් ගෙවෙනතුරු මිනිස්ලොව නොම අවුත් බඹසුර ඉසුරුවිඳිමින් බොහෝ දීඝායුෂ්කවූයේද; එවං චිරට්ඨිතිකො, මෙසේ බොහෝකාලයක් සැපතින්ම සිටියාවූ; සොහිනාම සුනෙත්තොසත්ථා, ඒ සුනෙත්‍ර නම් ශාස්තෲහු වනාහී; ජාතියා, මනුෂ්‍ය තිරශ්චීනාදි ජාතීන්ගෙන්ද; ජරාමරණෙන, ජරාමරණයෙන්ද; අපරිමුත්තො අහොසි, නොමිදුන ලද්දේවිය; සොකෙහි, නැසුනදෙයට සෝකකිරීමෙන්ද; පරිදෙවෙහි, නැසුනු දෙයට නොලැබුනු දෙයට විලාප කියා හැඬීමෙන්ද; දුක්ඛෙහි, කායචිත්ත දුක්ඛයෙන්ද; දොමනස්සෙහි, සිතෙහි උපදනා දෞර්මනස්‍යයෙන්ද; උපායාසෙහි, නොලද්දෙම් සිතෙහි උපදනා චිත්තතාපනයෙන්ද; අපරිමුත්තො, නොමිදුනේය; එහෙයින්; දුක්ඛස්මා, සියලු සංසාරදුක්ඛයෙන්; අපරිමුත්තො ඉතිවදාමි, නොමිදුනේයයි කියමි.

මෙසේ සාන්තසුඛප්‍රනීත විසදතර දිව්‍යචක්ෂුරභිඥාණය දිව්‍ය ශ්‍රොත්‍රාඥාණය පූර්වේනිවාසානුස්මෘතිඥාණය පරචිත්ත විජානනඥාණය ඍද්ධිප්‍රභෙදගතඥාණය ආශ්‍රවක්ෂයකරාභිඥාණය යන ෂට්අභිඥාණය කෝටිප්‍රාප්තවූ සර්වඥරාජොත්තමයානන්වහන්සේ පූර්වේනිවාසානුස්මෘතිඥාණය පතුරුවා සප්තසූර්‍යොද්ගමනයෙන් සත්තසන්වර්ති විවර්ති කල්පයක් මුළුල්ලෙහි මිනිස්ලොවට් ලත් නොවී කප්ගිණිගත් රුවන් මෙරක්සේ බබලන්නාවූ දෙලොස් යොදුන් උස බ්‍රහ්මභාවයෙන් යුක්තවූ විජ්ජුලතා මෙනක ශතසහශ්‍රප්‍රහරණාකාර දශනඛකිරණ ශ්‍රෙණීන් නිෂ්ක්‍රාන්තවන කාන්තිප්‍රභාවයෙන් දසසහශ්‍රී ලෝකධාතුව ඒකාලෝක කෙරෙමින් බ්‍රහ්මසම්පත් විඳපියාත් ඒ ඒ භවයෙහි උපිදවා අනන්ත දුක්දෙන්නාවූ අප්‍රොත්‍රසන්ත ප්‍රභෙදගතවූ තෘෂ්ණාව ආර්‍යමාර්ගඥාණයෙන් සිඳනොහල බැවින්ද නෛර්වාන ධර්මය අවබොධ ප්‍රතිවෙධය නොකළ බැවින්ද ජාතිජරා මරණ දුකින් නොමිදුනේය සොකපරිදෙවදුක්ඛ දෞර්මනස්‍ය උපායාසයෙන් නොමිදුනේය. සියළු සංස්කාර දුක්ඛප්‍රවෘත්තියෙන් නොමිදුනේය. එසේහෙයින් සියලුම සංසාරදුක්ඛස්කන්ධය නෛර්වාපනය කරවන්නාවූ සාන්තප්‍රනීතාර්‍යප්‍රවර සීලය ගෙණහැරදක්වා, වදාරණ ලෙස් "තංකිස්සහෙතු" යන පාඨය වදාළසේක.

තංකිස්සහෙතු, ඒ සංසාරදුක්ඛයෙන් නොමිදුනුබවට හෙතු කවරේද; චතුන්නං ධම්මානං, ජලපාලව සෙයින් අති ගාම්භීරවූ සතර ධර්ම කෙනෙකුගේ; අනනුබොධා, සියක්වරපැලු අස්ලොම අගක්

සෙයින් අතිගාම්භීර තීක්ෂණඥාණය අවබෝධය නොකළ බැවින්ද; අප්පටිවේධා, ප්‍රතිවේධය නොකළබැවින්ද; කතමෙසං චතුන්නං, කවරනම් සතර ධර්‍ම කෙනෙකුන්ගේදයත්; අරියස්ස සීලස්ස, ආර්‍ය්‍යවූ සීලයාගේ හෙවත් පඤ්චසීලය අෂ්ටාඞ්ගසීලය දශසීලය සත් චරසීලයයි කියා කල්‍යාණ පෘථුජ්ජනයන්ගේ සීලය චතුර්විධවේ.— සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් මාර්ගඵලාධිගමයට පැමිණි උත්තමයෝ ආර්‍ය්‍යයෝනම් වෙති, ඔවුන්ගේ සීලය ආර්‍ය්‍යසීලය නම්වේ. ඒ මේ ආර්‍ය්‍යසීලයාගේ; අනනුබෝධා අවබෝධය නොකළබැවින්ද; අප්පටිවේධා, ප්‍රතිවේධය නොකළබැවින්ද; අරියස්ස සමාධිස්ස, ආර්‍ය්‍යවූ සමාධියගේ; අනනුබෝධා, අවබෝධ නොකළ බැවින්ද; අප්පටිවේධා, ප්‍රතිවේධය නොකළ බැවින්ද; අරියාය පඤ්ඤාය, ආර්‍ය්‍යවූ තුදුස් බුද්ධඥාණයාගේ; අනනුබෝධා, අවබෝධය නොකළබැවින්ද; අප්පටිවේධා, ප්‍රතිවේදය නොකළ බැවින්ද; අරියාය විමුත්තියා, සමුච්ඡේද පටිප්‍රශ්‍රබ්ධි නිස්සරණය යන ත්‍රිවිධාර්‍ය්‍යවූ විමුක්තියගේ; අනනුබෝධා, අවබෝධය නොකළබැවින්ද; අප්පටිවේධා ප්‍රතිවේධය නොකළබැවින්ද; සියලුම සංසාර දුක්ඛයෙන් නොමිදෙන්නේය.

භික්ඛවෙ, මහණෙනි; තයිදං අරියංසීලං, පරමාමෘත ශාන්තසුඛ ප්‍රනීත විසුද්ධාර්‍ය්‍යමාර්ගඵල ප්‍රතිබද්ධවූ ඒ මේ ආර්‍ය්‍යසීලයද; අනුබුද්ධං, සර්‍වඥතාඥාණය ප්‍රතිලාභය හා සමගම අවබෝධය කරණලද්දෙමි; පටිවිද්ධං ප්‍රතිවේධය කරණලද්දෙමි; අරියාය සමාධි, දුර්දෘශ දුරනු බෝධ අතර්කාවචර නිපුනපණ්ඩිත වේදනීයවූ ආර්‍ය්‍යසමාධිය; අනුබුද්ධෝ, අවබෝධය කරණලද්දෙමි; පටිවිද්ධෝ, ප්‍රතිවේධය කරණ ලද්දෙමි; අරියායපඤ්ඤාය, තුදුස් බුද්ධඥාණයහා; මහාපඤ්ඤා, පුථු පඤ්ඤා හාසුපඤ්ඤා, තික්ඛපඤ්ඤා, නිබ්බෙධිකපඤ්ඤාය යන සර්‍වඥ ෂඩ්අභිඥා ප්‍රඥාව; අනුබුද්ධා, අවබෝධය කරණලද්දෙමි; පටිවිද්ධා, ප්‍රතිවේධය කරණලද්දෙමි; අරියාවිමුත්ති, ආර්‍ය්‍යවූ අර්හත් ඵලවිමුක්තිය හෙවත් සෝවාන් සකෘදාගාමි අනාගාමි රහත් යන සතර මාර්ගයෙන් සින්දමනාවූ කෙලෙසුන් නසා සතරමාර්ගයට පැමිණීම හා සමුච්ඡේද විමුක්තියනම්වේ.— තත්තන්මාර්ගයෙන් කෙලෙසුන් කඩා සන්හුන් සෝවාන්ඵල සිතහා සතරඵලසිත් මේ පටිප්පස්සද්ධි විමුක්තියනම්වේ.— අජරාමර ශාන්තසුඛප්‍රනීතවූ අමෘතමහා නිර්වාණයතෙමෙ නිස්සරණවිමුක්තියනම් වේ; මේ ආර්‍ය්‍යවූ අර්හත්ඵල විමුක්තිය; අනුබුද්ධා, හස්තාමලක ක්‍රමයෙන් අවබෝධ කරණලද් දෙමි; පටිවිද්ධා, සර්‍වඥතාඥාණය ප්‍රතිලාභයහා සමග ප්‍රතිවේධය කරණලද්දෙමි; භවතණ්හා, භවතෘෂ්ණාදී අෂ්ටෝත්තරශතප්‍රභෙදගතවූ තෘෂ්ණාතොමෝ; උච්ඡින්නා, මූලොච්ඡින්න තාලවෘක්ෂයක් මෙන් අපුනරාවර්ත්තිකොට සිඳහරණ ලද්දේය; භවනෙත්ති, භවයෙන් භවය උපදනාවූ භවප්‍රවෘත්තිය; ඛීනා, ක්ෂය කරණලද්දේය; එනෙ

සිත් ඉදානි, දැන්; පුනබ්භවො, නැවත උපදනා පුනර්භවයෙක්; මේ, මට; නත්ථි, නැත්තේමය; ඉති, මෙසේ; භගවා, සර්වලෞකික ලොකොත්තර හිත සුඛාභි නෛර්‍ය්‍යාණික දානසීලාදී කොටිප්‍රාප්තවූ; භාග්‍යම්සන්ති භගවාන් යනාදි අර්ථයෙන් යුක්තහෙයින්ද; රාග ද්වේෂ මොහ විපරීත මනසිකාරාදී සර්ව අකුසලධර්මයන් නිරවශෙෂ කොට විසුද්ධාර්‍ය මාර්ගඵල ප්‍රතිලාභයෙන් බිඳහැර අජරාමර හෙයින්ද; දෙවපුත්‍ර මාරක්ලෙශාභිසංස්කාරස්කන්ධ මෘත්‍යුසංඛ්‍යාත පංචමාරයන් භග්නයකොට ඒ ඓශ්වර්‍ය්‍ය ප්‍රත්‍යයශශ්‍රීසංකල්පසිද්ධි ප්‍රයත්නය යන සාත්ගුණ්‍යතායෙන් පරිපූර්ණහෙයින්ද, සර්ව කුසල ධර්ම පංචස්කන්ධාවාදසායතනාෂ්ටා දසවිසතීන්ද්‍රිය චාදසාංගප්‍රතීත්‍ය සමුත්පාද චතුසමෘතිස්ථාන සම්‍යක්ප්‍රධාන දිව්‍යබ්‍රහ්මාර්‍ය්‍යවිහාර කාය විත්තාපධි විවෙකසූන්‍යතා ප්‍රතිහිත නිමිත්ත විමොක්ෂ පඤ්චාභිඥාදිවූ ලෞකික ලොකොත්තරවූ උත්තරී මනුෂ්‍යධර්මයන් භාවිතා කලහෙයින්ද; කාමරූපාරූප සංඛ්‍යාත භවත්‍රයෙහි තෘෂ්ණාගමනය අර්හත්මාර්ග ඥාණ මුඛයෙන් වානතකළහෙයින්දූයි යනාදී අනන්ත ගුණයෙන් යුක්තවූ භාග්‍යවත් සර්වඥරාජොත්තමයානන්වහන්සේ; ඉදන්, අජරාමර සමස්තජන කර්ණාමෘත ඉන්ද්‍රියාතීන්ද්‍රිය ප්‍රතිබද්ධ සර්ව සංස්කාර විකාරලක්ෂණ ප්‍රකාශකර පරමගාම්භීරාර්ථ ධර්මදෙශනාවෙන් යුක්තවූ මේ සප්තසූර්‍ය්‍යොද්ගමන සූත්‍ර ධර්මදෙසනාව; අවොච, සකලසත්ව විගීයා කෙරෙහි පතලකරුණාවෙන් දෙශනා කර වදාළසේක.

හෙවත් "අනිච්චා භික්ඛවෙ සංඛාරා" යනාදීන් සප්තසූර්‍ය්‍යොද්ගමන සූත්‍රධර්මදෙශනාවෙන් පළමුකොට පෘථිවි මේරුචක්‍රවාටාදී අනින්ද්‍රිය ප්‍රතිබද්ධ සංස්කාරධර්මයන්ගේද දිව්‍යබ්‍රහ්ම මාර නරනාගෙන්ද්‍රාදී සත්වකායපරියාපන්න ඉන්ද්‍රිය ප්‍රතිබද්ධවූ සංස්කාරධර්මයන්ගේද යන ඉන්ද්‍රියාතීන්ද්‍රිය ප්‍රතිබද්ධ සර්වසංස්කාර ධර්මයන්ගේ: අනස්සාසිකා, අස්ථිරනිත්‍යතාව ගෙණහැරදක්වා "චතුන්නං ධම්මානං අනනුබොධා අප්පටිවෙධා" යනාදීන් දුරනුබොධා තර්කාවචර නිපුන පණ්ඩිත වෙදනීය දුර්දර්ශ තීක්ෂණ ප්‍රතිවෙධ ගාම්භීරත්වයෙන් යුක්තවූ සොවාන් සකෘදාගාමි අනාගාමි අර්හත්මාර්ග ඵලාමෘත මහානිර්වාණය යන නවලොකොත්තර ශ්‍රීසද්ධර්මය ගෙණහැරදක්වා අර්හත් ඵලය කූළුගෙණ ධර්මදෙශනාකර වදාළකල්හි අනිත්‍ය ධර්මස්ථාන ගෙණ පමාදවිහාරිවූ පන්සියයක් පමණ සුගතසූනු භාවොපගතවූ භික්ෂූන්වහන්සේලා සවර්ණභාජනයෙහි පරික්ෂිප්ත සිංහතෛලයක් සෙයින් මේ සප්තසූර්‍ය්‍යොද්ගමන සූත්‍රය ආදි මධ්‍ය පරියොසානය මනාකොටම ශ්‍රවනය ප්‍රගුණ ධාරණය කෙරෙමින් දෙශනාක්‍රම නොහැරම සිට ගෙණගොස් සර්වසංසාර දුක්ගෙවා සර්ව ක්ලෙශයන් නසා රහත්වූහ. මේ ධර්මදෙශනාව සෙසුත් බොහෝ දිව්‍යමනුෂ්‍යාදීන්ට ප්‍රයොජනවිය. සුගතො, සොභනගති සංඛ්‍යාත

විසුද්ධාශ්‍රයී මාර්ග ගමනින් නෛර්‍යානයක්ෂිප්‍රාභිඥ වශයෙන් ගිය හෙයින්ද ද්වාත්‍රිංශද්වර මහා පුරුෂලක්ෂණාසීත්‍යානුව්‍යඤ්ජනව්‍යාමප්‍රභානු රඤ්ජිත රූපකායානුසම්පත්තියක් ඇතිබැවින්ද, ධ්‍රුතවිලම්බිතස් ඛලිතානුකර්ෂණ නිෂ්පීඩනෝත්කුටිතාකුලතාදි දෝෂරහිතව අපහසිත රාජ හංස වෘෂභ වරවාරණ මෘගරාජගමන විලාස ඇති සොභනවූ කාය ගමනින් හා විපුලවිමල කරුණාස්මෘති වීර්‍ය්‍යාදි ගුණ විශේෂ සහිතවූ ඥානගමනින් යුක්තහෙයින් සුගතනම්වූ අප භාග්‍යවත් සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ; ඉදංවත්වා, මේ සප්තසූත්‍රයෙහිද් ගඟන සූත්‍රය දේශනාකොට; අථ, තැවත; සත්ථා, මාර්ගඵලාධිගමයට උපනිශ්‍රය සම්පත් ඇති දිව්‍යබ්‍රහ්මයන් හා මනුෂ්‍යාදීන්ට මාර්ගඵලාදි ගමයට අභව්‍යවූ අහේතුකවූ ප්‍රතිසන්ධිගත නාග සුපර්ණ තිරශ්චීනාදීන්ට ආගති භවොපනිශ්‍රය සාදලීම් වශයෙන් මේලොව පරලොව වැඩ දක්වා අනුශාසනා කරණහෙයින්ද; සතරමර සකලලෝකවාසීන් ජාතිකාන්තාරාදීන් තරණයකොට අමෘත මහානිර්වාණ ක්ෂේමභූමියට පමුණුවන හෙයින් ශාස්තෘනම්වූ බුදුරජාණන්වහන්සේ; අපරංඑතං, තබෙහදෘහීතකෙසරීන්ද්‍ර ගර්ජිතාප්‍රතිභාග ප්‍රතිලබ්ද නෛර්‍යාණික නෛර්‍යානය ධර්මප්‍රකාශිතවූ ඉතිරි මේ උදාන ගාථාවය; අවෝච, වදාළසේක

සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා
ඉති බුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං
දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතොති

සර්වලෝක ව්‍යාපත කීර්ත්තිප්‍රතාප යසස් ඇත්තාවූ; ගොතමෙන, ගෞතම ගොත්‍රයෙහි සංජාතවූ බුදුරජාණන්වහන්සේ විසින්; සීලං, ලොකොත්තර මාර්ග සීලයද; සමාධිං, ලොකොත්තර සමාධියද; පඤ්ඤා ච, චතුර්විධ සම්බුද්ධඥානාධි ලොකොත්තර ඥානයද; විමුත්තිච, අර්හත්ඵල විමුක්තියද යන; අනුත්තරා, නිරුත්තරවූ; ඉමෙධම්මා මේ ලෝකොත්තර ගුණධර්මයෝ; අනුබුද්ධා, අනන්‍යොපදේශ විරහිතව ස්වයම්භූඥානයෙන්ම හස්තාමලක ක්‍රමයෙන් අවබොධය කරණලද්දාහුය.

ඉති, මෙසේ; බුද්ධො, සර්වසංස්කාර විකාරලක්ෂණ නෛර්‍යානප්‍රඥප්තිය යන පඤ්චවිධඥෙය්‍ය මණ්ඩලය කරතලාමලක ක්‍රමයෙන් අවබොධය කරමින් නානානයනිපුණ අනන්තාභ්‍යාස සමූපස්ථාපිත ව්‍යඤ්ජන සම්පන්න විවිධ ප්‍රාතිහාර්‍ය්‍යයෙන් යුක්ත ශ්‍රීසද්ධර්ම දේශනා ඥානවිලාස ඇති බුදුරජාණන්වහන්සේ; අභිඤ්ඤාය, සර්වධර්මයන් අවබොධයකොට දුනගෙණ; භික්ඛුනං, නෛර්‍යාණය පිණිස පිළිපන්

නාවූ ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනානන්ද අංගුලිමාල රාහුලාදී අෂ්ටාශී පුද්ගල ජීනෙන්ද්‍ර සූනුභාවොපගතවූ භික්ෂුත්ව; ධම්මං, අධිසීල අධිචිත්ත අධිපඤ්ඤාය යන සික්ෂාත්‍රය සංඛ්‍යාතවූ ශ්‍රී සද්ධර්මය; අක්ඛාසි, දේශනාකොළේය; දුක්ඛස්සන්තාකරෙරු, සර්වසංසාර දුක්ඛයන් කෙළවරකළාවූ; චක්ඛුමා මසැසය, දිවැසය, පැනැසය, බුදුඇසය, සමතැසය, යන පසැස් ඇත්තාවූ නොහොත් සිනිඳු මෘදු මොලොක්වූ දියමෙනේරිය මල්සෙසින් දර්ශනීයප්‍රසාදික සුනීලවර්ණවූ අක්ෂිරෙමයෙන් හා ඒව අනතුරුව මෘදු සිනිඳු පිරිසිදු කිනිහිරිමල් රත්වන් පැහැයෙන් ඒව අනතුරුව මෘදු සිනිඳු රතිඳුගොච්වන් පැවැති රත් පැහැසින් හා මධ්‍යයෙහි මෘදු සිනිඳු පිරිසිදු රුක්පෙතල ඇටසෙසින් කළුපැහැසින් හා ඒවාට සුපරිසුද්ධ දර්ශනීය ප්‍රසාදකවූ දහවස්තරුසෙසින් සුදුපැහැසින් හා යන මෙසේ පැහැසින් බබලන්නාවූ චතුරංගසමන්විත ඝණාන්ධකාරයෙහිදු යොදුන් ප්‍රමාණ ඝණබහලවූ විදුරුපර්වත විනිවිද දිවාරාත්‍රියෙහි සියුම් ප්‍රකෘතිදක්නා මසැසද; මේ සක්වලපටන් දසසහශ්‍රීලෝකධාතුයෙහි හැසිරෙන්නාවූ චුතවන්නාවූ උපදනාවූ හීනප්‍රණීත ක්ෂුද්‍රස්ථූලවූ කුසලාකුසලය යථාස්වරූප කර්මප්‍රත්‍යයෙන් සැපදුක් අනුභවකරන්නාවූ සියළු සත්වයන් නිරවශෙෂයෙන් දක්නා දිවැසද; අතීතානාගත වර්තමාන විෂයවූ සර්වලෞකික ලොකොත්තරවූ ධර්මයන් සර්වාකාරයෙන් දක්නාවූ පැනසද; දසසහශ්‍රීලෝකධාතුයෙහි සතරුමරසතුන් අල්පරජස්ක මහාරජස්ක තික්ඛින්ද්‍රිය මුදින්ද්‍රියාදීන් හෙතුසම්පත් විභාගකොට දක්නාවූ බුදුඇසද; නුදුටු නොදන්නා නොදතයුතු ඉතිරි දෙයක් නැතිව සර්වධර්මයන් සර්වාකාරයෙන් අවබොධයකොට සියල්ලදක්නාවූ සර්වඥතාඥාණසංඛ්‍යාතවූ සමතැසය යන මේ පසැස් ඇත්තාවූ; සත්ථා, ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ; පරිනිබ්බුතො, සමස්තලොකප්‍රශස්තාස්වාමී ශ්‍රීමහබෝධිද්‍රුමමූලයෙහි පෘථිවිතමුද්භෙදෙත්ගත අපරාජිතොත්තුඞ්ග වජ්‍රාසනාරූඪව සර්වමාරවිජයගෘහිතානන්තර ප්‍රතිලබ්ධ සර්වඥතාඥාණය හා සමග සර්වක්ලෙශ නිර්වාපන පළමයෙන් පිරිනිවීයේය; ඉති, මෙසේ; දුහිතොපෙන්ද්‍ර ඉන්ද්‍රාරි වන්ද්‍රසේකරස්වතීන්ද්‍රාදී සමස්ථලොකෙන්ද්‍රවන්දිත පාදාරවින්දොපසොභිතවූ භගවත් අර්හත් සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේ විසින් පෘථිවිමෙරු, යුගන්ධර, චක්‍රවාට, හිමවත් වෘක්ෂ සරසරිත් සාගර දිව්‍යබ්‍රහ්ම නරනාගාදී ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධ සර්වසංස්කාර ප්‍රවෘත්ති ධර්මයන්ගේ අනිත්‍යතාව ප්‍රකාශකොට ජාති ජරාව්‍යාධි මරණාදී සියලු සංසාරදුක්දෙමින් සකලසත්වයන් වෙහෙසන්නාවූ රාගාදී සකල ක්ලෙශයන්නසා ආර්‍යප්‍රවරශීලසමාධි ප්‍රඥාවිමුක්තිය යන චතුර්විධ ධර්මයන්ගේ අවබොධය ප්‍රතිවෙධය කරණයෙහි දිව්‍යමනුෂ්‍යයන්ගේ උත්සාහ උපදවමින් තමන්

වහන්සේ ඒ මේ අසීන්ද්‍රවර සීලස්ඛන්ධාදි චතුර්විධ ධර්මයන් අව බොධ ප්‍රතිවෙධකිරීමෙන් සියලුම සංසාරදුක් නසා සර්වඥතාඥාණ යට පැමිණ වදාළබව ප්‍රකාශකර වදාරමින් සමස්තජනාකීර්ණාවෘතවූ මේ සප්තසූර්‍ය්‍යොද්ගමන සූත්‍රාන්ත ධර්මදෙශනාව නිමවා වදාළ සේක.

—නිමි—

# ලෝකවිනාසය හා උත්පත්තියද

## සංක්ෂෙපයෙන් මෙසේ දතයුතු.

කෙසේදයත්? සංවර්තය සංවර්තස්ථායිය විවර්තය විවර්තස්ථායියයි කියා දක්වනලද මෙහි ආපොසංවර්තය තෙජොසංවර්තය වායො සංවර්තයයි කියා ත්‍රිවිධවෙත්, එය ආභස්සරය සුභකිණ්ණය වෙහප්ඵලය යන මොවුහු සීමාකොට ඇතිවෙත්, ඒ මෙසේ දතයුතු-යම් කලෙක්හි කප ගින්නෙන් නස්නේද එකල්හි ආභස්සරනම් බඹලොවින් යට ගින්නෙන් නස්නේය, යම් කලෙක්හි කප ජලයෙන් නස්නේද එකල්හි සුභකිණ්ණනම් බඹලොවින් යට ජලයෙන් නස්නේය, යම් කලෙක්හි වාතයෙන් නසීද එකල්හි වෙහප්ඵලයෙන් යට වාතයෙන් නස්නේය, විස්තරවශයෙන් වනාහි එකබුද්ධක්ෂෙත්‍රයක් නසීයයි දක්වනලදී—එහි බුද්ධක්ෂෙත්‍රයනම් ජාතික්ෂෙත්‍රය විෂයක්ෂෙත්‍රය ආණාක්ෂෙත්‍රයයි කියා ත්‍රිවිධවෙත්; එහි ජාතික්ෂෙත්‍රයනම් දසදහසක් සක්වළ කෙළවරකොට ඇතිවේ—තථාගතයන්වහන්සේගේ ප්‍රතිසන්ධිග්‍රහණාදියෙහි එය කම්පාවේ ආණාක්ෂෙත්‍රයනම් කෙළලක්ෂයක් සක්වළ කෙළවරකොට ඇතිවන්නේය

එහි රතන සූත්‍රය, ඛන්ධපරිත්තය, ධජග්ගපරිත්තය, ආටානාටියපරිත්තය, මොරපරිත්තය, යන මේ පිරිත් ධර්මයන්ගේ ආනුභාව පවතින්නේය. විෂයක්ෂෙත්‍රය නම් අනන්තාපරිමාණවූ යම් ලොකධාතුවෙක්හි යමක් කැමතිවනලද්දේනම් එය තත්වූ පරිද්දෙන් දන්නේය මෙසේ ත්‍රිවිධක්ෂෙත්‍රයන් අතුරෙන් එක් ආණාක්ෂෙත්‍රයක් විනාශවන්නේය, එය විනාශවනකල්හි ජාතික්ෂෙත්‍රයද විනාශවන්නේමය, විනාශවනකල්හිද එකවම විනාශවන්නේමය, හටගැණීමද එකවම හටගන්නේය, ඒ ක්ෂෙත්‍රයාගේ විනාශය හා, හටගැණීමද මෙසේ දතයුතු—හේ කෙසේදයත්? යම්කලෙක්හි කප

කින්හෙන් තන්හේද එකල්හි පළමුකොට කල්පවිනාශක මහා මේඝය නැගීමෙන් කෙළලක්ෂයක් සක්වළෙහි මහත් වැසි වස්නේය; ඒ දැක මනුෂ්‍යයෝ සතුටු සිත්ඇතිව ධාන්‍යයන් ගෙණවුත් වපුරන්නාහුය; ගවයෝ කාපියහ පමන ගොයම්වූකල ගද්‍රභ රාවයරාවදෙමින් එකබින්දුවකුදු නොවැටේ මේඝය අන්තර්ධාන වෙයි, ඒ එය සඳහා භාග්‍යවතුන්වහන්සේ විසින් මෙසේ වදාරණ ලදී. “හොති බො සො භික්ඛවෙ සමයො යං බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසතසහස්සානි දෙවො න වස්සතීති” මෙහි භාවය මහත්තනි බොහෝ අවුරුදු සියදහස්ගණන් වැසි නොවස් නේය ඒ මේ කාලය මතු අ තිවන්නේය එකල වැසිවෙත් ජීවත් වන සත්වයෝ කලුරියකොට බ්‍රහ්මලෝකයෙහි උපදිත්, පුෂ්පඵලූප යන්ගෙන් ජීවත්වන්නාවූ දෙවතාවෝද මිය බඹලොව උපදිත්, මෙසේ දීර්ඝකාලයක් ඉක්මගියකල්හි ඒ ඒ තන්හි ජලය විනාශයට යන්නේය.

එකල්හි ක්‍රමයෙන් මස්කැසුප්ආදීහුද කාලක්‍රියාකොට බඹලොව උපදිත්, සත්හිරු පහලවූකල්හි අපායගාමිවූ නිරිසත්වයෝද විනාශවන්නේය, ධ්‍යානයක් නැතිව බඹලොව උපදින එකම් සත්වයෙකුදු නොවෙති, මේ සත්වයන් අතුරෙන් වනාහි සමහරු දුර්භික්ෂයෙන් පෙලෙන්නාහුය; සමහරු ධ්‍යානාධිගමයට අභව්‍යවෙති ඔහු කෙසේ බඹලොව උපදිත්දයත්? දෙව්ලොවදී ලබනලද ධ්‍යානවශයෙන් උපදින්නාහුවෙත්, කල්පවිනාශයට හවුරුදු ලක්ෂයක් ඇවෑමෙන් කල්පොස්ථානය වන්නේයයි ලෙ කබ්‍යුහනම් කාමාවචර දෙවතාවෝ හිසකේමුදා විසුරුවාහලද්‍දුව හැඬුම් මුහුනු ඇතිව දෙඅතින් පිසිහලද කඳුලු ඇතිව රතුවස්ත්‍රා පැලද ඉතාම විරූප වෙසධාරිව මෙසේ දන්වමින් මනුෂ්‍යපථයෙහි හැසිරෙත්–නිදුකානෙනි මෙයින් හවුරුදු ලක්ෂයකගේ ඇවෑමෙන් කල්පවිනාශය වන්නේය, මේ ලොකයද විනාශවන්නේය, මහාසමුද්‍රයද වියලෙන්නේය, මේ මහා පෘථිවියද මහාමේරු පර්වතරාජයාද දැ විනාශවන්නාහුය, බ්‍රහ්මලෝකය දක්වාම ලෝකවිනාශ වන්නේය, එබැවින් පින්වත්නි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා වඩව්, මෑනියන්ට උපස්ථානකරවු පියානන්ට උපස්ථානකරවු කුලදෙටුවන්ට උපස්ථාන කරව්යයි කියන්නාහු වෙත්, ඔවුන්ගේ ඒ වචනය අසා මනුෂ්‍යයෝද භූමාටුදෙවියෝද බොහෝසෙයින් සන්වේග ඇතිව ඔවුනොවුන් මෘදුසිත් ඇතිව මෛත්‍රී ආදී පින්කොට දෙව්ලොව උපදිත්, එහිදී දිව්‍යබොජුන් අනුභවකොට වායොකසින පරිකර්මය කොට ධ්‍යාන ලබත්, එයින් අන්‍යවූවෝ වනාහි අපරායර්‍ය වෙදනීය කර්මයෙන් දෙව්ලොව උපදින්–අපරාපර්‍ය වෙදනීය කර්මරහිතවූ සත්වයෙක්නම් සසර නැත්තේය, ඒ දෙවියෝද එහිදී ධ්‍යාන ලබන්නාහුය, මෙසේ දෙව්ලොවදී ලබනලද ධ්‍යානවශයෙන් සියල්ලෝම

බ්‍රහ්මලෝකයෙහි උපදින්නාහුවෙත්; වස්සුපච්ඡෙදයෙහි පවත් දීර්ඝ කාලයක්හුගේ අවෑමෙන් දෙවෙනි සූර්‍ය්‍යයෙක් පහළවන්නේය; ඒ සඳහා භාග්‍යවතුන්වහන්සේ විසින් මෙසේ වදාරණලදී.

"හොතිඛො සො භික්ඛවෙ සමයො යං කදාචිකරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන දුතියො සුරියො පාතුභවති දුතියස්ස භික්ඛවෙ සුරියස්ස පාතුභාවා යතා කුන්නදියො...පෙ...මෙහි භාවය දෙවෙනි සූර්‍ය්‍යයා පහළවූකල්හි වනාහි රාත්‍රිපරිච්ඡෙදයෙක්ද දිවා පරිච්ඡෙද යෙක්ද නොපෙණේ එක්සූර්‍ය්‍යයෙක් පහළවේ එක්සූර්‍ය්‍යයෙක් වනාහි හස්තංගතවේ අවිච්ඡින්න සූර්‍ය්‍යසන්තාපයෙන්ම ලෝකය ඇතිවන්නේය; ප්‍රකෘති සූර්‍ය්‍යතෙමේම සූර්‍ය්‍යදිව්‍යපුත්‍රනම් වන්නේය, කල්පවිනාශක සූර්‍ය්‍යයෙක් නැත්තේය, පළමු සූර්‍ය්‍යයා ඇතිකල්හි ආකාශයෙහි වලාපටලද ධූමශිඛාද ඇතිවෙත්. නැවත පහවූ ධූම වලාහක ඇතිකල්හි කැඩපතක්මෙන් නිර්මලවූ ආකාශය ඇතිවන්නේය, එකල්හි පංචමහා ගංගාවන්හැර සෙසු කුඩාගංගාදීන් අතුරෙහි ජලය විනාශවන්නේය. නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් තුන්වෙනි සූර්‍ය්‍යයෙක් පහළවන්නේය, යම් ඒ සූර්‍ය්‍යදිව්‍යරාජයාගේ පහළවීම හෙතුකොටගෙණ ගංගා අචිරවතී සරභූ මහී යන පංචමහා ගංගාවෝද විනාශවන්නාහුය, නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් සතරවෙනි සූර්‍ය්‍යදිව්‍යරාජයෙක් පහළවන්නේය යම් ඒ සූර්‍ය්‍යදිව්‍ය රාජයාගේ පහළවීම හේතුකොටගෙණ හිමාලවනයෙහි මහා ගංගා වන් භවගන්නාවූ සීහප්‍රපාතය හංසප්‍රපාතය කණ්ණමුණ්ඩ රථකාර අනෝතත්ත ඡද්දන්න කුණාලය යන මේ සප්තමහාවිල් සිඳී විනාශ වන්නාහුය, නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් පස්වැනි සූර්‍ය්‍ය යෙක් පහළවන්නේය. යම් ඒ සූර්‍ය්‍යදිව්‍යරාජයාගේ පහළවීම හේතු කොටගෙණ ක්‍රමයෙන් මහාසමුද්‍රයෙහි ජලය සිඳී ඇඟිලි පුරුකක් තෙමන පමණකුදු ජලය නොතිබෙයි. නැවතද දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් සවෙනි සූර්‍ය්‍යදිව්‍යරාජයෙක් පහළවන්නේය; යම් ඒ සූර්‍ය්‍යදිව්‍යරාජයාගේ පහළවීම හේතුකොටගෙණ සියලු සක්වළ එකට ධූමාකුලවන්නේයි; මෙසේ කෙළලක්‍ෂයක් සක්වලවල්ද එප රිද්දෙන් අවිච්ඡින්නවූ සූර්‍ය්‍යසන්තාපයෙක් ධූමාකුලවන්නේය; නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් සත්වෙනි සූර්‍ය්‍යයෙක් පහළ වන්නේය; යම් ඒ සත්වෙනි සූර්‍ය්‍යයාගේ පහළවීම හෙතුකොට ගෙණ කෙළලක්‍ෂයක් සක්වලවල් සහිතකොට සියලුසක්වල එකම වහ්නිජ්වාලාවක් ඇතිවන්නේය; එකල්හි යොදුන් සියගණන් ගල් කුලු මහාමෙරුපර්වතයෙන් ඉපිලවැටී ආකාශයෙහිම අන්තර්ධානවන් නාහුවෙත්. තවද ඒ වහ්නිජ්වාලාව නැගී චාතුර්මහාරාජික දෙව් ලොවද ගිණිගන්නේය එහි රත්නවිමනාදී අනෙක විමානයන් දව් තව්තිසා භවනයද ගිණිගන්නේය, මේ ක්‍රමයෙන් ප්‍රථමධ්‍යාන

භූමියදක්වා ගිණිගන්නේය එහි ත්‍රිවිධ බ්‍රහ්මලෝකයන් දවා ආභස්සරබ්‍රහ්මලෝකය දක්වා ගිණිජාලාව පැතිරසිටියි;

එකල්හි යම්තාක් සංස්කාරගතවූ යම්කිසිවක් ඇතිවන්නේද ඒතාක් ගිණිජාලාව නොතිබෙන්නේය; සියලු සංස්කාරයන්ගේ ක්‍ෂයවීම වනාහි ගිතෙල් දැගිය ගිණිසුලක් මෙන් අලු අඟුරු පමණ වත් නැතිවීයන්නේය, අකාශයෙන් යට සහ මත්තෙහිද එකම මහාන්ධකාරයක් ඇතිව නැවත දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් මහා මේඝය නැගී පළමුකොටම සියුම් සියුම් වර්‍ෂාවවැස ක්‍රමයෙන් වැඩී ඇඹුලදඬු හීදඬු පුවක්තුරු තල්ගස් ප්‍රමාණ ධාරාවන්ගෙන්යුත් වර්‍ෂාව වසිමින් කෙලලක්‍ෂයක් සක්වලවල්හි දැගිය සියලුතැන් පිරී මේඝය අන්තර්ධානවන්නේය; ඒ ජලයෙහි උඩද යටසද වාතය නැගී ඝණකොට වියලී මෙසේ අනන්ත දීර්ඝකාලයක්හුගේ අවෑමෙන් ජලය වියලී ක්‍ෂයවෙමින් ක්‍රමයෙන් පාත්බැස පළමු සක්‍රභවනය පිහිටිතැනට ලන්වේ, එකල පළමු බඹලොව පිහිටිතැන් බඹලොව පහලවේ; දෙව්ලොවපිහිටිතැන් දෙව්ලොවපහලවේ; එකල ආභස්සරාදී මතු බඹතලවල වසන බ්‍රහ්මරාජයන් අතුරෙන් ඇතැම්කෙනෙක් ආයු ක්‍ෂයවීමෙන් හෝ පුණ්‍යක්‍ෂයවීමෙන් හෝ එසින් චුතව මහාබ්‍රහ්මය, බ්‍රහ්මපුරෝහිතය, බ්‍රහ්මපාරිසද්‍යය, යන ප්‍රථමධ්‍යාන තුන්තලයෙහි උපදිත්, ඇතැම් කෙනෙක් පරනිර්මිත වසවර්තිය තුසිතය යාමය යන සතර දෙව්ලොව උපදිත්, ජලය ක්‍රමයෙන් අඩුවෙමින් පළමු පෘථිවිස්ථානයට බටකල්හි මහාවාතය අතිශයින් බලවත් වෙමින් ඔබරුවකතුබූ ජලය මෙසින් නැගී දිය වටකෙරෙමින් තරඳමින් මිරිකයි එකල ක්‍ෂයවූ මධුරරුදකය දියපිටදැමූ නෙළුම්පතක් සෙයින් අමාරසවෙයි එහි මහාබෝධි පර්‍ය්‍යඞ්කය පිහිටන ජය භූමිස්ථානය හැමටම ප්‍රථමයෙන් පිහිටයි ලෝකය නස්නා කල හැමටම පසුව නැසෙයි එහි පූර්වනිමිති දක්වන්නාක්මෙන් නෙළුම්පැලයක් හටගණී; ඉදින් බුදුකෙනෙකුන්වහන්සේ ඒ කප උපදින්නාසේක්වීනම් එහි මලෙක් පිපෙයි නැතහොත් නොපිපෙයි; මේකප එකනටුවේ මල් පසෙක කර්ණිකාදිදී පිපින එහි පිරිකර පසක්වේ; එකල දෙලෙස්වන අවිහනම් බඹලොව ඇතුළුවූ පඤ්චසුද්ධාවාස බඹලොව අනාගාමී අරහන්ත බ්‍රහ්මරාජයෝ තමන් බුදුවන්නේ පාද ලකුණු දන්නා සෙයින් තිදුකානෙත් අපි පූර්වනිමිති දක්නට යම්හයි සම්මතකොට ක්‍ෂණයකින් මුලුලෝ අදුරුබිඳ බෝමැඩකරු පැමිණ රත්මල් නෙළුම්මල් හා එහි පිරිකර පසක් දැක පස්බුදු කෙනෙකුන්වහන්සේ උපදනාසේක්නැයි උපන් ප්‍රීති සොම්නසින් දෙයතින් සිවුරුගෙණ පස්දෙනාවහන්සේගේම ගර්භාවක්‍රාන්ති සමය අභිනිෂ්ක්‍රමණය සර්වඥතාඥණය ප්‍රත්‍යවෙධ ධර්‍මචක්‍රය පැවැත්මය යමක ප්‍රාතිහාර්‍ය්‍යය දෙවෝරොහණය ආයුසංඛා

රුසසජ්ජනය පරිනෙමිහම්බගල්‍යය යන අටතන්හි දසසහශ්‍රී ලොකධාතුව කම්පනාදී බුඩපෙළහර දකුම්හයි ප්‍රීතිවාක්‍ය පවත්වමින් තමතමන්ගේ පවසුධාවාස බඹලොවට ගියාහුය-මෙසේ භූමිය පටන් ත්‍රිකෝටි සත්විසිලක්‍ෂ හිස්හාර දහසක් යොදුන් මතෙතහි පිහිටි අකනිෂ්ඨක නම් බඹලොව වාසී අරහනත නම් බ්‍රහමරාජ සත සහශ්‍රී ලොකධාතුව සැරිසරා ප්‍රභාවයෙන් එකාලෝක කෙරෙමින් සිවුරු හෙණිගොස් බඹලොව තැබූහ.

එකල සත්ත්වොත්පත්තිය පිණිස ආභස්සරනම් බඹලොවින් බ්‍රහමරජයෝ ආයු ක්‍ෂයවීමෙන් හෝ පුණ්‍ය ක්‍ෂයවීමෙන් හෝ චුතව අවුත් මේ මිනිස්ලොව ඕපපාතිකව උපදිති; එවුහු සවකීයවූ ශරීර ප්‍රභාවයෙන් අඳුරුබිඳ දිලියන්නාහ,අහසින් යන ගමන් ඇත්තාහ, ප්‍රීතිසැපම ආහාරකොට ඇත්තාහ, ස්ත්‍රීපුරුෂයයි ව්‍යවහාරයෙක් නැතිව අසංඛ්‍යායුෂකව අනන්ත දීර්ඝකාලයක් වසන්නාවූ මධුරතර සුරභි සුගන්ධ සමාකීර්ණවූ පෘථිවියෙන් මදක් ඇඟිල්ලෙන් ගෙණ දිවගා ලෝභකොට ඉතා මධුරයයි පෘථිවිරසය අනුභවකරන්නාහු සිත ලෝභ වඩුත් වඩුත් පෘථිවිරසය අන්තර්ධානවිය; ඉහ සතුකැකුල්වැනි අමාරසවැනි සතුවගීයක් පහළවිය; හෙද ලොභ වඩත් වඩත් අන්තර්ධානව මධුර රස ඇති භද්‍රලතාලිය පහළවිය; ඒ අන්තර්ධානව ඔවුන්ගේ කුසලබලයෙන් කුඩුනැති දහිනැති මුතුසේ පිරිසිදු මිහිරි සුවඳැති සවයන්ජාතහැල් පහළවිය, ඒ සවයන්ජාත හැල්ගෙණ පහළවූ මැණික්බඳුන්හි ලා මැණික්උදුන් තබා පිළියෙලවූ දිවබොජුන් වැනි සුවඳබත් අනුභව කෙරෙමින් අනන්ත දීර්ඝකාලයක් වෙසෙති; මෙසේ බත් අනුභවකරණකල්හි ජලමල උපන, ඒ ජලමල නික්මීමට කලටහටගන්නා පළමුකුළු සෙයින් ජලමල මාගීබිදී ඒ ඒ ස්ත්‍රීපුරුෂ ලක්‍ෂණවය හටගත්තේය; එතැන් පටන් ස්ත්‍රීපුරුෂයයි ව්‍යවහාරවිය; අහසින් යන ඉර්ධිය නැතිවිය, සඳමෙන් බැබලූ ශරීරප්‍රභා නැතිවිය, මුළුලොව සන්ධකාරවිය, එකල සන්ධකාරය පැමිණි ප්‍රථමකල්පික මහා බ්‍රහමයෝ අහෝ අපි අනන්ත අසංඛ්‍යායුෂය වළඳමින් ශරීරප්‍රභාවයෙන් මුළුලොව අඳුරුබිඳ අහස සැරිසරාලූම්හ, දැන් අපි කළකම්ම බලවත් නිසායයි කියකියා හඬන්නාහ, එකල ඔවුන්ගේ පුණ්‍යානුභාවයෙන් සන්ධකාරය විදමනය කෙරෙමින් දෙසාලිස්දහසක් යොදුන් මත්තෙහි පණස්යොදුන් හිරුවිම්බතෙක් පහළවිය, ඒ දැක මහත්වූ සූරභාවය දක්වමින් සන්ධකාරය දුරුකෙළේය, එහෙයින් මොහු සූර්‍යයාහයි නම්තුබූහ.— ඒ හිරුවිම්බ ඉතා දුරුවගියකල්හි පෙරදෙසින් අඳුරට පැමිණ හිරුසෙයින් තවත් ආලෝකයෙක් පහළවීනම් යහපතැයි සිතූහ.— ඔවුන්ගේ සිත හා සමග සඳවිම්බ පහළවිය, ඒ දැක අපගේ ඡන්දයලෙසට පහළවූයේ සඳහුයයි නම් තුබූහ; මෙසේ

හිරසඳ පහළවූ දවස්හිම ඉදිරිපසු නොවී එකවිටම මහමේරු චක්‍රවාට හිමවත් පර්වත දිවයින් කොදෙව් සමුද්‍ර දෙදෙව්ලොව යන සියල්ලම මැදින්දින දෙපෝ දවස්හිම එකවිට පහළවිය; කෙසේ පහළවීදයත්? යම්සේ තනබත් ඉංදනකල්හි එකවරම බුබුල්නැඟී මෙන් එකපියසෙක්හී ථූපථූපවෙයි මිපිමිපියෙයි එක්පියසෙක්හී සමසමවෙයි; එපරිද්දෙන් ථූපථූපස්ථානයෙහි නොයෙක් පර්වත කඳුවේ, නිනන නිනනස්ථාන නොයෙක් සරසින් සමුද්‍රවෙයි සමසම ස්ථාන දිවයින් දඹදිව දෙදහසක් කොදෙව්වෙයි. තවද යථොක්තවූ ඒ ලොකොත්පත්තීන්ගේ දැනගැණීමට කරුණුවූ සත්වර්තාදීන් අතුරෙන් කල්පවිනාශක මහාමෙඝයා පටන් ජාලූපත්ජේදය දක්වා මේ එක් අසංඛය සංවර්තනම්වේ.

කල්පවිනාසක ජාලොපච්ජේදය පටන් කෙලලක්ෂයක් සක්වලවල් පිරෙන්නාවූ මහාමේඝය දක්වා මේ එක් අසංඛය සන්වර්තස්ථායි නම්වේ; සම්පත්කර මහාමෙඝය පටන් විසිඅනතඃකල්පයක් හුගේ ආයු අඩුනොකොට ක්‍රමයෙන් ලොව නැගෙමින් ප්‍රථමකල්පික මානුසික මහාබ්‍රහමයෝ අන්ධකාරයට පැමිණ හඩමින් හිරසඳ මහමෙර සක්වලගල් පහළවනතැන් දක්වා විවර්ත අසංඛ්‍යකල්පය නම්වේ. එතැන්පටන් හිරසඳ මහමෙර ඇතිව දෙව්ලොව ඇතිව දිවයින් ඇතිව සක්වලගල් ඇතිව තුන්දහසක් යොදුන් දඹදිව සුවාසූදහසක් රාජධානි ඇතිව, දෙදහසක් ප්‍රදෙශ රාජධානි ඇතිව, නොයෙක් සත්වසමාකීර්ණව අසංඛ්‍යායුෂ්කව සිටී මිනිසුන්ගේ ආයු ක්‍රමයෙන් පිරිහී දශවරුෂගතව රෝග දුර්භික්ෂ ශස්ත්‍රානතඃකල්පය යන එකකින් අතුරුකප සතුන් නැසී ඉතිරි මිනිසුන් ආයුවැඩි අසංඛ්‍යයටගොස් නැවත ආයු පිරිහී දශවරුෂගතවෙමින් මෙසේ විසිඅතුරු කපක්ගෙවා මහාකල්පය නස්නට හවුරුදු ලක්ෂයක් තිබියදී වස්නා විපත්තිකර මහාමේඝය දක්වා මේ විවර්තස්ථායි අසංඛ්‍ය කල්පයනම් වේයයි දතයුතු. එහින් වදාළහ– “චත්තාරො මෙ භික්ඛවෙ මහාකප්පා කතමෙ චත්තාරො සංවට්ටො සංවට්ටට්ඨායි විවට්ටො විවට්ටට්ඨායි ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො මහාකප්පා යි.”

නිමි.

601490

PLEASE DO NOT REMOVE
CARDS OR SLIPS FROM THIS POCKET

UNIVERSITY OF TORONTO LIBRARY

BQ
354
G37
1906

Gatapadaya

UTL AT DOWNSVIEW
D RANGE BAY SHLF POS ITEM C
39 12 . 01 08 02 012 5